බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 11

සූත්‍රාන්තපිටකයෙහි

05 වන ග්‍රන්ථය

මජ්ඣිමනිකාය

ද්විතීය භාගය

මජ්ඣිමපණ්ණාසකය

ලංකාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙනි

පාඨශෝධනය :

වාද්දුව, මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය්‍ය,

පණ්ඩිත, ලබුගම ලංකානන්ද

කෝට්ටේ ශ්‍රීකල්‍යාණීසාමග්‍රීධර්මමහාසංඝසභාවෙහි
අනුනායක ස්ථවිරයන් වහන්සේ

පරිවර්තනය :

අහංගම, විද්‍යාචක්‍ෂු පරිවෙණාධිපති,

පණ්ඩිත, කෝදාගොඩ ඤාණාලෝක

දක්ෂිණලංකාවෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ

හා

හිඟුල, මාකඩවර විහාරාධිවාසී

පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර

ස්ථවිරයන් වහන්සේ

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 11

The Fifth Book in the

Suttanta-Pitaka

5

MAJJHIMANIKĀYA (II)

MAJJHIMA PANNĀSAKA

Edited by

The Venerable Pandita Labugama Lankānanda Thera

Anunāyaka of the Kōtte Sri Kalyānī Sāmaggrīdharma Mahāsangha Sabha,

Vice Principal, Pravacanōdaya Pirivena, Molligoda, Wādduwa

With the Sinhala translation by

The Venerable Pandita Kodāgoda Nānāloka Thera

Chief High Priest of Southern Ceylon, Principal, Vidyacandra Pirivena, Ahangama

&

The Venerable Pandita Karahampitigoda Sumanasāra Thera

Mākadawara Vihāra, Hingula

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

“අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යෙ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ගලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ වින්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"

(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 14 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:14 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

මජ්ඣිමපණ්ණාසකො

සූත්‍රාන්තපිටකයෙහි

මජ්ඣිමනිකාය

මජ්ඣිමපණ්ණාසකය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

පටුන

CONTENTS

සංස්කාරක නිවේදනය — — —	xxi
ත්‍රිපිටකසම්පාදකමණ්ඩලය — — —	xxiii
සංකේත නිරූපණය - ABBREVIATIONS — —	xxv
පාලි හෝඩිය - PALI ALPHABET — —	xxvi
විෂය සූචි — — — —	xxvii
පෙළ හා පරිවර්තනය — — — —	2–761
ගාථාදිපාදානුක්කමණිකා — — —	763–766
සඤ්ඤානාමානුක්කමණිකා — — —	769–773
විසෙසපදානුක්කමණිකා — — —	774–782

Free Distribution www.aathaapi.org

සංස්කාරක - නිවේදනය

පරවාදමථනය විශේෂලක්ෂණ කොට ඇති මජ්ඣිමංගමයට අයත් මජ්ඣිමපණ්ණාසක - පාළියෙහි මේ සිංහල පරිවර්තනය එහි දෙවන කාණ්ඩය වේ. පිටකග්‍රන්ථසංඛ්‍යාවශයෙන් සූත්‍රාන්තපිටකයෙහි පස්වැනිවූ ද, මුද්‍රිතකාණ්ඩසංඛ්‍යාවශයෙන් බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි එකොළොස්වැනි වූ ග්‍රන්ථය ද වේ. ත්‍රිපිටක පරිවර්තන සම්පාදක මණ්ඩලයෙහි සභාපති වූ අහංගම් විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාංගීශ්වරාචාර්ය කෝදාගොඩ ශ්‍රී ඥානාලෝකාභිධාන දක්ෂිණ ලංකායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ හා ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයෙහි සාමාජික වූ රාජකීයපණ්ඩිත කරගම්පිටිගොඩ සුමනසාරස්ථවිරයන් වහන්සේ මේ පරිවර්තනකාර්ය්‍ය මැනැවින් නිම කළහ. අප විසින් මෙහි පෙළ සංශෝධනයෙන් සකස් කරන ලදී. මැදුම්සඟිය පිළිබඳ වැ කියයුතු දය ප්‍රථමභාගයෙහි ලා ලියූ සංඥාපනයෙහි පළ වැ ඇතියෙන් මෙහි නැවත සඳහන් කළයුතු නොවේ.

ත්‍රිපිටක පරිවර්තන සම්පාදකමණ්ඩලයෙහි සාමාජිකයන් වූ ද, කොළඹ විද්‍යෝදය පිරිවෙනෙහි ආචාර්ය්‍යවරයන් වූ ද, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දල්ලේ සිරිපඤ්ඤාලෝකාභිධාන අනුනායකස්ථවිරයන් වහන්සේ ද, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, වේබඩැවේ සිරි අනෝමදස්සී නායකස්ථවිරයන්-වහන්සේ ද මුද්‍රණාවස්ථායෙහි සංශෝධන කාර්ය්‍ය පිණිසැ බෙහෙවින් වෙහෙස දරැබව සඳහන් කරම්හ මුද්‍රණය වහවහා නිම කරවාලීම පිණිසැ සංස්කෘතිකකාර්ය්‍යාංශයෙහි අධිකාරීන් දැරූ සැලකිල්ල ද පැසැසියැයුතු බව සඳහන් කළ යුතු ද වෙයි. රජයෙහි මුද්‍රණ දෙපාර්ත-මේන්තුයෙහි මුද්‍රණාලයාධිපතිතුමා හා අතිරේක මුද්‍රණාලයාධිපති ඔස්වින් ජයවර්ධන මැතිතුමා හා ත්‍රිපිටක මුද්‍රණකාර්ය්‍යයෙහි නියුක්ත සේවක මහතුන් ඉතා සැලැකිල්ලෙන් මෙහිලා ක්‍රියා කළ බව විශේෂයෙන් සඳහන් කළයුතු ද වේ. මේ පින්වතුන්ගේ කාර්ය්‍යශූරභාවය ත්‍රිපිටක මණ්ඩලයෙහි සිටුනා හැමගේ චිත්තාරාධනයට සමණි ද විය. ත්‍රිපිටක කාර්ය්‍යාලය පිහිටි මහානායක වාජිරාරාමයෙහි භාරකාර වන ඇම්. ජී. ආර්. සමරසිංහ මහතා ඇතුළු සේවක පිරිස ඉතා හිතවත් වැ උපස්ථානාදියෙන් වහල් වැ සිටි බව ද මෙහි ලා කියයුතු වෙයි.

තව ද ශ්‍රීලංකාජනරජයෙහි අග්‍රාමාත්‍යවරිය වන සිරිමාවෝ-බණ්ඩාරනායක උත්තමාංව මේ පරිවර්තනකාර්ය්‍යවිෂයෙහි ලා දක්වන බලවත් ප්‍රසාදය හා තදනු වැ සංස්කෘතික අමාත්‍ය ඇස්. ඇස්. කුලතිලක මැතිතුමාණන් හා අමාත්‍යාංශයෙහි ස්ථිරලේකම් වන නිශ්ශඞ්ක-විජයරත්න මැතිතුමාණන් වෙතින් ලැබුණු වහල ද තිඹු පෙරටු කොට සඳහන් කළයුතු ද වේ.

Free Distribution www.aathaapi.org

'බුද්ධජයන්ති'ය නිමිති කොට ආරම්භ කළ ත්‍රිපිටකපරිවර්තන-කාර්‍ය්‍යයෙහි දිවාරෑය වෙහෙස බරමින් ක්‍රියා කළ, ශ්‍රී ලංකාවිද්‍යොදය විශ්වවිද්‍යාලයෙහි උපකුලපති වැ වැඩසිටි අතිගෞරවාර්හ ත්‍රිපිටක-වාගීශ්වරාචාර්‍ය්‍ය, පරවාහැර සිරිවජිරඤාණාභිධාන බස්නාහිර පළාතෙහි ප්‍රධානසංඝනායක මහාස්ථවිරයන් වහන්සේ ඇතුළු කොට, අපවත් වූ සංස්කාරක ස්ථවිරයන් වහන්සේ හැම හා මේ කාර්‍ය්‍යයෙහි නියුක්ත හැම සුධීහු ද, ආධාර උපකාර කළ සියලු භවත්හු ද, මේ ධර්මදානමයකුශලයෙන් භවනිස්තරණය කෙරෙත්වයි ආශංසනය කරමි.

මෙයට
ශාසනස්ථිතිය පතන,

ලබුගම ලංකානන්ද
ත්‍රිපිටකපරිවර්තන සම්පාදක
මණ්ඩලයෙහි ප්‍රධාන සංස්කාරක.

ත්‍රිපිටකකාර්‍ය්‍යාලය,
මහානායකවාරිකාරාමය,
අංක : 115,
විජේරාම මාවත,
කොළඹ 7.

Free Distribution www.aathaapi.org

ත්‍රිපිටක සම්පාදකමණ්ඩලය

උපදේශක :

එක්සත් අමරපුරමහානිකායෙහි සභාපති, අග්ගමහාපණ්ඩිත, බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ

සභාපති :

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රීඥානාලෝක දක්ෂිණලංකායෙහි ප්‍රධාන සංඝනායකස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක :

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, ලබුගම ශ්‍රීලංකානන්ද - ශ්‍රීකල්‍යාණිසාමග්‍රීධර්මමහාසංඝසභායෙහි අනුනායකස්ථවිරයන් වහන්සේ.

සම්පාදක :

දෙමටගොඩ ධර්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති, පණ්ඩිත, පරවාහැර සිරි පඤ්ඤානන්ද (බී. ඒ. ලණ්ඩන්) කොළඹ නවකෝරළයෙහි ප්‍රධානසංඝනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, රද්දූල්ලේ සිරිපඤ්ඤාලෝක - ශ්‍රී කල්‍යාණිසාමග්‍රීධර්මමහාසංඝසභායෙහි අනුනායකස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, වේබරුවේ සිරි අනොමදස්සි නායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිවාසී, පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරිසුමනසාර ස්ථවිරයන් වහන්සේ.

ලේඛකාධිකාරී :

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝකවිහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරිධම්මපාල - කොළඹපළාතේ ප්‍රධානසංඝනායකස්ථවිරයන් වහන්සේ.

සඞ්කේත නිරූපණය

ABBREVIATIONS

සීමු — සීහලක්ඛර මුද්දිත, හේවාවිතාරණතිපිටකගන්ථමාලාය මජ්ඣිමනිකායො 1959.

ස්‍යා — ස්‍යාමක්ඛර මුද්දිත පොත්ථකං.

මඡසං — මරම්මඡට්ඨසඞ්ගීති පොත්ථකං.

PTS — PALI TEXT SOCIETY MAJJHIMANIKAYA

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS.

VOWELS

අ a	ආ ā	ඉ i	ඊ ī	උ u	ඌ ū	එ ē	ඔ ō

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya	ර ra	ල la	ව va	ස sa	හ ha	ළ ḷa	අං aṃ

ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ kē	කො kō
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khē	ඛො khō
ග ga	ගා gā	ගි gi	ගී gī	ගු gu	ගූ gū	ගෙ gē	ගො gō

Conjunct - Consonants

ක්ක kka	ඤ්ඤ ñña	ත්‍ර tra	ම්ඵ mpha
ක්ඛ kkha	ඤ්හ ñha	ද්ද dda	ම්බ, ම්බ mba
ක්‍ය kya	ඤ්ච ñca	ද්ධ ddha	ම්භ mbha
ක්‍රි kri	ඤ්ඡ, ඤ්ඡ ñcha	ද්‍ර dra	ම්ම mma
ක්ව kva	ඤ්ජ, ඤ්ජ ñja	ද්ව, ද්ව dva	ම්හ mha
ඛ්‍ය khya	ඤ්ඣ ñjha	ධ්ව dhva	ය්‍ය, ය්ය yya
ඛ්ව khva	ට්ට ṭṭa	න්ත nta	ය්හ yha
ග්ග gga	ට්ඨ, ට්ඨ ṭṭha	න්ථ ntha	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්‍ය lya
ඞ්ක ṅka	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්හ lha
ග්‍ර gra	ණ්ණ ṇṇa	න්න nna	ව්හ wha
ඞ්ඛ ṅkha	ණ්ට ṇṭa	න්හ nha	ස්ස ssa
ඞ්ග ṅga	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ම sma
ඞ්ඝ ṅgha	ණ්ඩ, ණ්ඩ ṇḍa	ප්ඵ ppha	ස්ව sva
ච්ච cca	ණ්හ ṇha	බ්බ bba	හ්ම hma
ච්ඡ ccha	ත්ත tta	බ්භ bbha	හ්ව hva
ජ්ජ jja	ත්ථ ttha	බ්‍ර bra	ළ්හ ḷha
ජ්ඣ jjha	ත්ව tva	ම්ප mpa	

ා ā	ි i	ී ī	ු u	ූ ū	ෙ e	ො ō

Free Distribution www.aathaapi.org

මජ්ඣිමනිකායෙ මජ්ඣිමපණ්ණාසකො

විසයසූචි

1. ගහපතිවග්ගො

සුත්තසඞ්ඛ්‍යා				පිට්ඨඞ්කං
1. කන්දරක	සුත්තං	—	—	2 – 18
2. අට්ඨකනාගර	,,	—	—	20 – 26
3 සෙඛ	,,	—	—	28 – 36
4. පොතලිය	,,	—	—	38 – 52
5. ජීවක	,,	—	—	54 – 58
6. උපාලි	,,	—	—	60 – 82
7. කුක්කුරවතිය	,,	—	—	84 – 90
8. අභයරාජකුමාර	,,	—	—	92 – 98
9. බහුවෙදනීය	,,	—	—	100 – 106
10. අපණ්ණක	,,	—	—	108 – 128

ගහපතිවග්ගො පඨමො

2. භික්ඛුවග්ගො

1. අම්බලට්ඨික රාහුලොවාද	සුත්තං	—	—	130 – 140
2. මහාරාහුලොවාද	,,	—	—	142 – 150
3. චූළමාලුඞ්ක්‍ය	,,	—	—	152 – 162
4. මහාමාලුඞ්ක්‍ය	,,	—	—	164 – 172
5. භද්දාලි	,,	—	—	174 – 188
6. ලටුකිකොපම	,,	—	—	190 – 204
7. චාතුම	,,	—	—	206 – 214
8. නළකපාන	,,	—	—	216 – 226
9. ගුලිස්සානි	,,	—	—	228 – 234
10. කීටාගිරි	,,	—	—	236 – 250

භික්ඛුවග්ගො දුතියො

3. පරිබ්බාජකවග්ගො

1. තෙවිජ්ජවච්ඡගොත්ත	සුත්තං	—	—	252 – 254
2. අග්ගිවච්ඡගොත්ත	,,	—	—	256 – 264
3. මහාවච්ඡගොත්ත	,,	—	—	266 – 278
4. දීඝනඛ	,,	—	—	280 – 286
5. මාගන්දිය	,,	—	—	288 – 306
6. සන්දක	,,	—	—	308 – 330
7. මහාසකුලුදායි	,,	—	—	332 – 364
8. සමණමණ්ඩිකා	,,	—	—	366 – 374
9. චූළසකුලුදායි	,,	—	—	376 – 392
10. වෙඛනස්ස	,,	—	—	394 – 402

පරිබ්බාජකවග්ගො තතියො

Free Distribution www.aathaapi.org

4. රාජවග්ගො

සුත්තසඞ්ඛ්‍යා					පිට්ඨඞ්කො
1.	ඝටිකාර	සුත්තං	—	—	404 – 418
2.	රට්ඨපාල	,,	—	—	420 – 450
3.	මඛාදෙව	,,	—	—	452 – 464
4.	මධුර	,,	—	—	466 – 478
5.	බොධිරාජකුමාර	,,	—	—	480 – 514
6.	අඞ්ගුලිමාල	,,	—	—	516 - 528
7.	පියජාතික	,,	—	—	530 – 538
8	බාහිතික	,,	—	—	540 – 548
9.	ධම්මචෙතිය	,,	—	—	550 – 560
10.	කණ්ණකත්ථල	,,	—	—	562 – 574

රාජවග්ගො චතුත්ථො

5. බ්‍රාහ්මණවග්ගො

1.	බ්‍රහ්මායු	සුත්තං	—	—	576 – 596
2.	සෙල	,,	—	—	598 – 608
3.	අස්සලායන	,,	—	—	610 – 626
4.	ඝොටමුඛ	,,	—	—	628 – 644
5.	චඞ්කී	,,	—	—	646 – 668
6.	එසුකාරී	,,	—	—	668 – 678
7.	ධනඤ්ජානි	,,	—	—	680 - 698
8.	වාසෙට්ඨ	,,	—	—	700 – 710
9.	සුභ	,,	—	—	712 – 734
10.	සඞ්ගාරව	,,	—	—	736 – 760

බ්‍රාහ්මණවග්ගො පඤ්චමො

මජ්ඣිමපණ්ණාසකො නිට්ඨිතො.

Free Distribution www.aathaapi.org

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

මජ්ඣිමපණ්ණාසකො

සූත්‍රාන්තපිටකයෙහි

මැදුම් සඟිය

මධ්‍යම පණ්ණාසකය

සුත්තන්තපිටකෙ

මජ්ඣිමනිකායො

මජ්ඣිමපණ්ණාසකො

1. ගහපති වග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

2. 1. 1

කන්දරක සුත්තං

ඒවං මෙ සුතං එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අථ ඛො පෙස්සො ච හත්ථාරොහපුත්තො කන්දරකො ච පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පෙස්සො හත්ථාරොහපුත්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. කන්දරකො පන පරිබ්බාජකො භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො කන්දරකො පරිබ්බාජකො තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භගවන්තං එතදවොච: අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාවඤ්චිදං භොතා ගොතමෙන සම්මා භික්ඛුසඞ්ඝො පටිපාදිතො: යෙපි තෙ භො ගොතම අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො එතපරමංයෙව සම්මා භික්ඛුසඞ්ඝං පටිපාදෙසුං සෙය්‍යථාපි එතරහි භොතා ගොතමෙන සම්මා භික්ඛුසඞ්ඝො පටිපාදිතො. යෙපි තෙ භො ගොතම භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො එතපරමංයෙව සම්මා භික්ඛුසඞ්ඝං පටිපාදෙස්සන්ති සෙය්‍යථාපි එතරහි භොතා ගොතමෙන සම්මා භික්ඛුසඞ්ඝො පටිපාදිතොති.

එවමෙතං කන්දරක, එවමෙතං කන්දරක, යෙපි තෙ කන්දරක අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො එතපරමංයෙව සම්මා භික්ඛුසඞ්ඝං පටිපාදෙසුං සෙය්‍යථාපි එතරහි මයා සම්මා භික්ඛුසඞ්ඝො පටිපාදිතො. යෙපි තෙ කන්දරක භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො එතපරමංයෙව සම්මා භික්ඛුසඞ්ඝං පටිපාදෙස්සන්ති සෙය්‍යථාපි එතරහි මයා සම්මා භික්ඛුසඞ්ඝො පටිපාදිතො.

---

1. සාරණීයං - මජසං,

Free Distribution www.aathaapi.org

සූත්‍රාන්තපිටකයෙහි

මැදුම් සඟිය

මධ්‍යම පණ්ණාසකය

1. ගහපති වර්ගය

ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.

2. 1. 1

කන්දරක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා සමග චම්පා නුවර ගග්ගරා නම් පොකුණුතෙර සමීපයෙහි වැඩවාස කරන සේක. එකල්හි පෙස්ස නම් ඇතරුපුත් ද කන්දරක පිරිවැජි ද භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ පෙස්ස ඇතරුපුත් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හින. කන්දරක පිරිවැජි වැළිත් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහිකළයුතු කථාව කොට නිමවා එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි කන්දරක පරිව්‍රාජක හාත්පස තො බැණ වැඩහුන් සඟුන් බලා, භාග්‍යවතුන් වහන්සේට මෙල කී: ආශ්චර්‍ය්‍ය යැ භවත් ගෞතමයෙනි, අද්භූත යැ භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයන් විසින් භික්ෂුසඞ්ඝයා මැනැවින් යම් පමණ ප්‍රතිපාදනා කරනලද ද, භවත් ගෞතමයෙනි, අතීතකාලයෙහි යම් අර්හත් සම්‍යක්සම්බුද්ධ කෙනෙක් වූවාහු ද, ඒ භගවත්හු ද මෙල පරම කොට මැනැවින් භික්ෂුසඞ්ඝයා ප්‍රතිපාදනා කළාහ. භවත් ගෞතමයන් විසින් මෙකල යම්සේ භික්ෂු සඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරනලද ද එමෙනි. භවත් ගෞතමයෙනි, අනාගත කාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් පහළවන්නාහු ද ඒ භගවත්හු ද මෙල පරම කොට මැ භික්ෂුසඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරන්නාහ. භවත් ගෞතමයන් විසින් මෙකල යම් පරිදි භික්ෂුසඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරනලද ද එමෙනි'යි.

කන්දරකය, මෙල එසේ මැ ය, කන්දරකය මෙල එසේ මැ ය. කන්දරකය, අතීතයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වූවාහු ද, ඒ භගවත්හු මෙල පරම කොට මැ භික්ෂු සඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කළාහ. මා විසින් මෙකල යම්සේ භික්ෂුසඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරන ලද ද එමෙනි. කන්දරකය, අනාගයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් පහළවන්නාහු ද ඒ භගවත්හු ද මෙල පරම කොට මැ භික්ෂුසඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරන්නාහ. මා විසින් මෙකල යම්සේ භික්ෂුසඞ්ඝයා මැනැවින් ප්‍රතිපාදනා කරනලද ද එමෙනි.

Free Distribution www.aathaapi.org

සන්ති හි කන්දරක භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා. සන්ති පන[1] කන්දරක භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ සෙඛා[2] සන්තතසීලා සන්තතවුත්තිනො නිපකා නිපකවුත්තිනො. තෙ චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා[3] විහරන්ති. කතමෙසු චතූසු: ඉධ කන්දරක භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්ස'න්ති.

එවං වුත්තෙ පෙස්සො හත්ථාරොහපුත්තො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව සුපඤ්ඤත්තාචිමෙ භන්තෙ භගවතා චත්තාරො සතිපට්ඨානා සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං[4] සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය[5] ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය. මයම්පි හි භන්තෙ ගිහී ඔදාතවසනා කාලෙන කාලං ඉමෙසු චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා[3] විහරාම; ඉධ මයං භන්තෙ කායෙ කායානුපස්සිනො විහරාම, ආතාපිනො සම්පජානා සතිමන්තො විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සිනො විහරාම ආතාපිනො සම්පජානා සතිමන්තො විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සිනො විහරාම ආතාපිනො සම්පජානා සතිමන්තො විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සිනො විහරාම ආතාපිනො සම්පජානා සතිමන්තො විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවඤ්චිදං භන්තෙ භගවා එවං මනුස්සගහනෙ එවංමනුස්සකසටෙ එවංමනුස්සසාඨෙය්‍යෙ වත්තමානෙ සත්තානං හිතාහිතං ජානාති. ගහනං හෙතං භන්තෙ යදිදං මනුස්සා, උත්තානකං හෙතං භන්තෙ යදිදං පසවො. අහං හි භන්තෙ පහොමි හත්ථිදම්මං සාරෙතුං යාවතකෙන අන්තරෙන චම්පං ගතාගතං කරිස්සති සබ්බානි තානි සාඨෙය්‍යානි කූටෙය්‍යානි වඞ්කෙය්‍යානි ජිම්හෙය්‍යානි පාතුකරිස්සති. අම්හාකං පන භන්තෙ දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා අඤ්ඤථා ච කායෙන සමුදාචරන්ති, අඤ්ඤථා ච වාචාය[6] සමුදාචරන්ති, අඤ්ඤථා ච නෙසං චිත්තං හොති. අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවඤ්චිදං භන්තෙ භගවා එවංමනුස්සගහනෙ එවංමනුස්සකසටෙ එවංමනුස්සසාඨෙය්‍යෙ වත්තමානෙ සත්තානං හිතාහිතං ජානාති. ගහනං හෙතං භන්තෙ යදිදං මනුස්සා, උත්තානකං[7] හෙතං භන්තෙ යදිදං පසවො ති.

1. සන්ති හි - මජසං, 2 සෙක්ඛා - මජසං, 3. සුපතිට්ඨිත චිත්තා- මජසං. සුපතිට්ඨිත . . . සයා. 4. සොක පරිදෙවානං - මජසං, සයා, 5. අත්ථගමාය - PTS 6. අඤ්ඤථා ච වාචාය-අඤ්ඤථා ච නෙසං - PTS
7. උත්තානකසෙය්‍යාතං-මජසං.

කන්දරකය, මේ භික්සඟුන් කෙරෙහි ක්ෂය වූ ආස්‍රව ඇති වැස නිමවූ මහබඹසර ඇති සියුමඟින් කළ කරණී ඇති බහාතැබූ ස්කන්ධභාර ඇති පැමිණි සදර්ථ ඇති ක්ෂය කළ භවසංයෝජන ඇති මොනොවට දැන කෙලෙසුන් කෙරෙන් මිදුණු රහත්හු ඇත් මැ ය. යළිදු කන්දරකය, මේ භික් සඟුන් කෙරෙහි නිරතුරු සිල් ඇති නිරතුරු සීලයෙහි සිට දිවිවටන ප්‍රඥ ඇති ප්‍රඥයෙහි සිට දිවිවටන ශෛක්ෂ භික්ෂූහු ඇත. ඔහු සියුසිවටන්හි මැනැවින් තැබූ සිත් ඇති ව වෙසෙත්. කවර සතරෙක යත් : කන්දරකය, මෙසස්නෙහි මහණ කෙලෙස් තවන වැර ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව සිහි ඇති ව කාය සඞ්ඛ්‍යාත ලොක-යෙහි අභිධ්‍යාදොර්මනස්‍ය දුරු කොට රූපකායයෙහි කය අනුව බලමින් වෙසෙයි. සුඛදුඃඛාදි, වේදනායෙහි වේදනානුදර්ශී වැ වැර ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව සිහි ඇති ව වේදනා යෙහි අභිධ්‍යා දොර්මනස්‍ය දුරු කොට රූපකායයෙහි කය අනුව බලමින් වෙසෙයි. සුඛ දුඃඛාදි වෙදනායෙහි වෙදනානුදර්ශී වැ වැර ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව සිහි ඇති ව වෙදනා ලෝකයෙහි අභිධ්‍යා දොර්මනස්‍ය දුරු කොට වාස කෙරෙයි. සරාගාදි චිත්තයෙහි චිත්තානුදර්ශී වැ ආතාපන වීර්‍ය්‍ය ඇති ව සම්‍යක් ප්‍රඥ ඇති ව ස්මෘතිමත් ව චිත්තලොකයෙහි අභිධ්‍යා දොර්මනස්‍ය සන්හිඳුවා වාස කෙරෙයි. ස්කන්ධාදි ධර්මයෙහි ධර්මානුදර්ශී වැ ආතාපනවීර්‍ය්‍ය ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව ස්මෘතිමත් ව ධර්මලොකයෙහි අභිධ්‍යා දොර්මනස්‍ය සන්හිඳුවා වාස කෙරේ යයි.

මෙසේ වදළ කල්හි පෙස්ස ඇතරුපිත් භාග්‍යවතුන් වහන්සේට තෙල කී : වහන්ස, ආශ්චර්‍ය්‍ය යැ, වහන්ස අද්භූත යැ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සතරසිවටන්හු සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝක-පරිදේවයන් ඉක්මවාලීම පිණිස දුක්දෙම්නසුන් නැසීම පිණිස න්‍යායසඞ්ඛ්‍යාත මාර්ගය අධිගමය පිණිස නිවන් පසක්කිරීම පිණිස මැනැවින් වදරනලද්දහු මැ ය. වහන්ස, එසේ මැ ය : හෙළ පිළි හඳනා ගිහිගේවැසි වූ ඇපිදු කලින් කල මේ සතර සිවටන්හි මැනැවින් තැබූ සිත් ඇති ව වසම්හ. වහන්ස, මෙහි ඇපි රූපසමූහ සඞ්ඛ්‍යාත කයෙහි කෙලෙසුන් තවන වැර ඇති ව සම්ප්‍රජන්‍යයෙන් යුක්ත ව කය සිහිකරන සිහි ඇති ව (නැසෙන වැනැසෙන හෙයින්) ලොක නම් වූ රූපරාශියෙහි දැඩි ලොභය හා දෙම්නස දුරු කොට අනිත්‍යාදි විසින් කය පුනපුනා බලමින් වාසය කරම්හ. සුවදුක් ආදි වෙදනායෙහි කෙලෙස් තවන වැර ඇති ව සම්‍යක් ප්‍රඥ ඇති ව සිහි ඇත්තමෝ වේදනා ලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරුකොට වෙදනාවන් පුනපුනා බලමින් වාසය කරම්හ. සරාගාදි චිත්තයෙහි කෙලෙස් තවන වැර ඇති ව සම්‍යක් ප්‍රඥ ඇති ව සිහි ඇත්තමෝ චිත්තලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරුකොට සිත විදසුන් නැණින් පුනපුනා බලමින් වාසය කරම්හ. ස්කන්ධාදි ධර්මයෙහි කෙලෙසුන් තවන වැර ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව ස්මෘතිමත් ව ධර්මසඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට ධර්මානුදර්ශී ව වාසය කරම්හ.

වහන්ස, ආශ්චර්‍ය්‍ය යැ, වහන්ස අද්භූත යැ. වහන්ස, මෙසේ මිනිසුන්ගේ අධ්‍යාශයගහනය මෙසේ මිනිසුන්ගේ කෙලෙස් කසට ඇතිබව මෙසේ මිනිසුන්ගේ ශඨබව පවත්නා කල්හි භාග්‍යවතුන් වහන්සේ යම් පමණෙකින් සත්ත්වයන්ගේ හිතාහිත පිළිවෙත් දන්නාසේක් ද එහෙයිනි. වහන්ස, යම් මිනිස් කෙනෙක් ඇද්ද, තෙල ගහන (මුවහ) මැ ය, වහන්ස, යම් සියුපා කෙනෙක් ඇද්ද, තෙල නො මුවහ මැ යි. එසේ මැ ය; වහන්ස, මම දම්‍ය වූ ඇතකු මෙහෙයන්නට පොහොසත්මි, යම් ඇසිල්ලෙකින් චම්පානගරද්වාරයට ගමනාගමනය කරන්නේ ද, (ඒ ඇසිල්ලෙහි) එ හැම ශඨබව කුළුබව වක්බව ඇදබව පහළකරන්නේ ය. වහන්ස, එතෙකුදුවත් අපගේ දසයෝ වේවයි ප්‍රෙෂ්‍යයෝ වේවයි කම්කරුවෝ වේවයි ඔහු කයින් අන්පරිදි ක්‍රියා කෙරෙති, බයින් අන්පරිදි බෙණෙති, ඔවුන්ගේ සිත වූකලි අන්පරිදි වේ. වහන්ස, ආශ්චර්‍ය්‍ය යැ, වහන්ස, අද්භූත යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ මිනිසුන්ගේ අධ්‍යාශයගහනය මෙසේ මිනිසුන්ගේ කෙලෙස්කසට ඇතිබව මෙසේ මිනිසුන්ගේ ශඨබව පවත්නා කල්හි සත්ත්වයනට හිතාහිත ප්‍රතිපත් දන්නාසේක් ද එහෙයිනි. වහන්ස, යම් මිනිස් කෙනෙක් ඇද්ද තෙල (අදහස් විසින්) පිළිසන් මැ ය. වහන්ස, යම් සියුපා කෙනෙක් ඇද්ද තෙල නො පිළිසන් මැ යි.

එවමෙතං පෙස්ස, එවමෙතං පෙස්ස, ගහනං හෙතං පෙස්ස යදිදං මනුස්සා, උත්තානකං හෙතං පෙස්ස යදිදං පසවො. චත්තාරොමෙ පෙස්ස පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො: ඉධ පෙස්ස එකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන පෙස්ස එකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන පෙස්ස එකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන පෙස්ස එකච්චො පුග්ගලො නෙවත්තන්තපො හොති නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. ඉමෙසං පෙස්ස චතුන්නං පුග්ගලානං කතමො තෙ පුග්ගලො චිත්තං ආරාධෙතී'ති.

ය්වායං භන්තෙ පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො, අයං මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භන්තෙ පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො, අයම්පි මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භන්තෙ පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො, අයම්පි මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යො ච ඛො අයං පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී[1] බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. අය මෙ[2] පුග්ගලො චිත්තං ආරාධෙතී'ති.

කස්මා පන තෙ පෙස්ස ඉමෙ තයො පුග්ගලා චිත්තං නාරාධෙන්තී'ති.

ය්වායං භන්තෙ පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො, සො අත්තානං සුඛකාමං දුක්ඛපටික්කූලං ආතාපෙති, පරිතාපෙති. ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භන්තෙ පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො, සො පරං සුඛකාමං දුක්ඛපටික්කූලං ආතාපෙති, පරිතාපෙති. ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භන්තෙ පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අත්තානඤ්ච පරඤ්ච සුඛකාමං දුක්ඛපටික්කූලං[3] ආතාපෙති, පරිතාපෙති. ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යො ච ඛො අයං භන්තෙ පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. සො අත්තානං ච පරඤ්ච සුඛකාමං දුක්ඛපටික්කූලං නෙව ආතාපෙති, න පරිතාපෙති. ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං ආරාධෙති. හන්ද ච දානි මයං භන්තෙ ගච්ඡාම බහුකිච්චා, මයං බහුකරණීයා'ති.

යස්ස දානි ත්වං පෙස්ස කාලං මඤ්ඤසී'ති. අථ ඛො පෙස්සො හත්ථාරොහපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

---

1. සුඛප්පටිසංවෙදී - මජ්සං. 2. අයමෙව මෙ - මජ්සං.
3. සුඛකාමෙ දුක්ඛපටික්කූලෙ - සීමු, PTS.

පෙස්සය, තෙල (කරුණ) එසේ මැ ය. පෙස්සය, තෙල එසේ මැ ය, පෙස්සය, යම් මිනිස් කෙනෙක් ඇද්ද, තෙල ගහන මැ ය, පෙස්සය, යම් සියුපා කෙනෙක්, ඇද්ද තෙල උත්තාන මැ යි. පෙස්සය, ලොවැ මේ පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමාන වූවාහු වෙති, කවර සතරදෙනෙක යත් : පෙස්සය, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්ම තාපනයොගයෙහි යෙදුණේ තමා තවනුයේ වෙයි. තවද පෙස්සය, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් පරපරිතාපනයොගයෙහි යෙදුණේ මෙරමා තවනුයේ වෙයි. පෙස්සය, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්මපරිතාපනයොගයෙහි යෙදුණේ තමා තවනුයේත් වෙයි, පරපරිතාපනානුයෝගයෙහි යෙදුණේ මෙරමා තවනුයේත් වෙයි. තවද පෙස්සය, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්මතාපනයෝගයෙහි නො යෙදුණේ තමා නො මැ තවනුයේ වෙයි, පරපරිතාපනානුයොගයෙහි නො යෙදුණේ මෙරමා නො තවනුයේ වෙයි. හේ තමා නො තවනුයේ මෙරමා නො තවනුයේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ කෙලෙස්පිරිනිවනින් නිවුණේ (ඇතුළත තවන කෙලෙස් නැතිබැවින්) සිහිල් වූයේ (ධ්‍යාන මාර්ග ඵල නිර්වාණසුවයෙන්) සුව විඳිනුයේ ශ්‍රේෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත ව වෙසෙයි. පෙස්සය, මේ සතර පුද්ගලයන් අතුරෙන් කවර පුද්ගලයෙක් තොපගේ සිත පහදවා දැ’යි.

වහන්ස, යම් පුහුලෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණේ තමා තවනුයේ වේ ද මේ පුහුල් මාගේ සිත නො පහදවයි. වහන්ස, පරපරිතාපනානුයෝගයෙහි යෙදුණේ, මෙරමා තවන යම් පුහුලෙකුත් වේ ද, මේ පුහුල් ද මාගේ සිත නො පහදවයි. යම් පුහුලෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණේ තමා තවනුයේත්, පරපරිතාපනානුයෝගයෙහි යෙදුණේ මෙරමා තවනුයේත් වේ ද, මේ පුහුල් ද මාගේ සිත නො පහදවයි. තවද වහන්ස යම් පුහුලෙක් අත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණේ තමා නො තවනුයේත්, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණේ මෙරමා නො තවනුයේත් වේ ද, හේ තමා නො තවනුයේ මෙරමා නො තවනුයේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ (කෙලෙස් පිරිනිවනින්) නිවියේ සිහිල් වූයේ සුව විඳිනුයේ ශ්‍රේෂ්ඨ වූ ආත්මභාවයෙන් යුක්ත ව වෙසේ ද, මේ පුහුල් මා ගේ සිත පහදවා යයි.

තවද පෙස්සය, කුමක් හෙයින් මේ තුන් පුහුලෝ තොපගේ සිත නො පහදවත් දැයි.

වහන්ස, යම් පුහුලෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණේ තමා තවනුයේ වේ ද, හේ සුව කැමැති දුකට නො කැමැති තමා ආතාපන පරිතාපන කෙරෙයි, මෙ කරුණෙන් මේ පුද්ගල මාගේ සිත නො පහදවයි. වහන්ස, යම් පුහුලෙක් පරපරිතාපනානුයෝගයෙහි යෙදුණේ මෙරමා තවනු වේ ද, හේ සුව කැමැති දුකට නො කැමැති මෙරමා ආතාපන පරිතාපන කෙරෙයි, මෙ කරුණෙන් මෙ පුද්ගල මාගේ සිත නො පහදවයි. වහන්ස, යම් පුහුලෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණේ තමා තවනුයේත් පරපරිතාපනානු යෝගයෙහි යෙදුණේ මෙරමා තවනුයේත් වේ ද, හේ සුව කැමැති දුකට නො කැමැති තමාත් මෙරමාත් ආතාපන පරිතාපන කෙරෙයි. මෙ කරුණෙන් මේ පුද්ගල මාගේ සිත නො පහදවයි. වහන්ස, යම් පුහුලෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණේ ආත්මන්තප නො වේ ද, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණේ පරන්තප නො වේ ද, හේ අනාත්මන්තප වූයේ අපරන්තප වූයේ මෙ අත් බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ (කෙලෙස් ගිනි නිවූ හෙයින්) නිවුණේ සිහිල් වූයේ සුව විඳිනුයේ ශ්‍රේෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත ව වාස කෙරෙයි, මෙ කරුණෙන් මේ පුද්ගල මාගේ සිත පහදවයි. සොඳය! වහන්ස, දැන් ඇපි යම්හ. ඇපි බොහෝ කිස ඇතියම්හ, බොහෝ කරණී ඇතියම්හ’යි.

පෙස්සය, දැන් තෙපි ගමනට කල් දන්නාව’යි. ඉක්බිති පෙස්ස ඇතරුපිත් භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට නික්මගියේ ය.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ පෙස්සෙ හත්ථාරොහපුත්තෙ භික්ඛූ ආමන්තෙසි. පණ්ඩිතො භික්ඛවෙ පෙස්සො හත්ථාරොහපුත්තො, මහාපඤ්ඤො භික්ඛවෙ පෙස්සො හත්ථාරොහපුත්තො, සචෙ භික්ඛවෙ පෙස්සො හත්ථාරොහපුත්තො මුහුත්තං නිසීදෙය්‍ය යාවස්සාහං ඉමෙ චත්තාරො පුග්ගලෙ විත්ථාරෙන විභජාමි. මහතා අත්ථෙන සඤ්ඤුත්තො[1] අගමිස්ස. අපි ච භික්ඛවෙ එත්තාවතාපි පෙස්සො හත්ථාරොහපුත්තො මහතා අත්ථෙන සඤ්ඤුත්තො'ති

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා ඉමෙ චත්තාරො පුග්ගලෙ විත්ථාරෙන විභජෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී'ති. තෙන හි භික්ඛවෙ සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමී'ති. එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අචෙලකො හොති මුත්තාචාරො, හත්ථාපලෙඛනො[2], න එහිභදන්තිකො, න තිට්ඨභදන්තිකො, නාභිහටං, න උද්දිස්ස කටං[3], න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පතිගණ්හාති. න ඛළොපිමුඛා[4] පතිගණ්හාති[5]. න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සඞ්කිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිබති[6].

සො එකාගාරිකො වා හොති එකාලොපිකො, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො-පෙ-සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො. එකිස්සාපි දත්තියා යාපෙති, ද්වීහිපි දත්තීහි යාපෙති,-පෙ-සත්තහිපි දත්තීහි යාපෙති, එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වීහිකම්පි[7] ආහාරං ආහාරෙති-පෙ-සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති සො සාකභක්ඛො වා හොති. සාමාකභක්ඛො වා හොති. නීවාරභක්ඛො වා හොති. දද්දුලභක්ඛො වා හොති. හටභක්ඛො වා හොති. කණභක්ඛො වා හොති. ආචාමභක්ඛො වා හොති. පිඤ්ඤාකභක්ඛො වා හොති. තිණභක්ඛො වා හොති. ගොමයභක්ඛො වා හොති. වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී.

සො සාණානිපි ධාරෙති. මසාණානිපි ධාරෙති. ඡවදුස්සානිපි ධාරෙති. පංසුකූලානිපි ධාරෙති. තිරීටානිපි ධාරෙති. අජිනානිපි ධාරෙති. අජිනක්ඛිපම්පි ධාරෙති. කුසචීරම්පි ධාරෙති. වාකචීරම්පි ධාරෙති. ඵලකචීරම්පි ධාරෙති. කෙසකම්බලම්පි ධාරෙති. වාළකම්බලම්පි ධාරෙති. උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො. උබ්භට්ටකොපි[8] හොති ආසනපටික්ඛිත්තො. උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති. සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො.

---

1. සංයුත්තො – මජසං 2. හත්ථාවලෙඛනො – ස්‍යා. 3. කතං – මජසං
4. ඛළොපිමුඛා – සීමු 5. පටිගණ්හාති – මජසං 6. පිවති – මජසං
7. ද්වාහිකං – සීමු
8. උබ්භට්ඨකොපි — සීමු; උබ්භට්ඨකොපි — මජසං; උබ්භත්ථකොපි — ස්‍යා

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙස්ස ඇතරුපිත් නික්මැගිය නොබොහෝ වේලෙහි භික්ෂූන් ඇමතූ සේක. 'මහණෙනි, පෙස්ස ඇතරුපිත් පණ්ඩිත යැ, මහණෙනි, පෙස්ස ඇතරුපිත් මහාප්‍රාඥ යැ, ඉදින් මහණෙනි, පෙස්ස ඇතරුපිත් යම්තාක් ඔහුට මම මේ සතර පුද්ගලයන් විස්තර විසින් විභාග කෙරෙම් ද, එතෙක් මොහොතක් කල් හුන්නේ නම්, (සොතාපත්තිඵල සඞ්ඛ්‍යාත) මහත් අර්ථයෙන් යුක්ත ව ගියේ වන්නේ ය. තවද මහණෙනි පෙස්ස ඇතරුපිත් මෙතෙකිනුදු මහත් අර්ථයෙන් යුක්ත වූයේ ය'යි.

භාග්‍යවතුන් වහන්ස, මේ ඊට කලැ, සුගතයන් වහන්ස, මේ ඊට කලැ, යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ මේ සතර පුද්ගලයන් විස්තර විසින් විභාග කරනසේක් නම්, භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙන් අසා ධරන්නාහ'යි. එහෙයින් මහණෙනි, අසවු, මනා කොට මෙනෙහි කරවු, කියන්නෙමි'යි. එසේ යැ වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. බුදුහු මෙල වදළ සේක.

මහණෙනි, ආත්මන්තප වූ ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු පුද්ගල කවරේ ද : මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුහුලෙක් හළ ආචාර ඇතියේ අපේලූ වෙයි, අහරකිස නිමවා අත ලෙවන්නේ වෙයි, (භික්ෂාව සඳහා) එව වහන්සැයි කියනලදුයේ නො එනු වෙයි, සිට වහන්සැයි කියන ලදුයේ නො සිටිනු වෙයි, පළමු ගෙනඑනලද උදෙසා කරනලද පවරනලද භික්ෂාව නො ඉවසයි, හේ කළමුවින් නගා දුන් දය නො පිළිගනී, සැළමුවින් නගා දුන් දය නො පිළිගනී, එළිපත අතර කොට දුන් දය නොගනී, දඬුකඩ අතර කොට දුන් දය නොගනී, මොහොල් අතර කොට දුන් දය නොගනී, වළඳන දෙදෙනකුගෙන් එකකු නැඟී දුන් භික්ෂාව නොගනී, ගැබිනිය විසින් දෙනලද්ද නොගනී, කිරි පොවන්නිය විසින් දෙනලද්ද නොගනී, පුරුෂයන් අතරට ගිය තෙනැත්තිය දුන් දය නොගනී, සංකීර්තනය කොට දුන් කල්හි නොගනී, ශුනකයකු එළඹ සිටි තැන ඔහුට නොදී දුන් දය නොගනී, මැස්සන් ගොමු ගොමු වැ සිටි තැන දුන් දය නොගනී, (ගොඩ-දිය) මස් නො වළඳයි, රහ-මෙර-සෝවීරක පානය නො කෙරෙයි,

හේ එක් මැ ගෙයක භික්ෂාව ලැබ නවත්නේ හෝ එක් ආලෝපයකින් යැපෙනුයේ වෙයි, දෙගෙයක භික්ෂාව ලැබ නවත්නේ හෝ ආලෝප දෙකකින් යැපෙනුයේ වෙයි. . . . සත්ගෙයක භික්ෂාව ලැබ නවත්නේ හෝ සත් ආලෝපයෙකින් යැපෙනුයේ වෙයි. එක් කුඩා බත්තලියකිනුදු යැපෙයි, බත්තලි දෙකකිනුදු යැපෙයි. . . . බත්තලි සතකිනුදු යැපෙයි, දවසකට වරකුදු ආහාර ගනී, දෙදවසකට වරකුදු ආහාර ගනී, . . . සත්දවසකට වරකුදු ආහාර ගනී, මෙසේ මෙබඳු වූ අඩමසකට වරකුදු පරියායභක්තය වැළඳීමෙහි යෙදුණේ වෙයි. හේ අමුපලා වළඳනුයේ හෝ වෙයි, බොඩහමු වළඳනුයේ හෝ වෙයි, හුරුහැල් වළඳනුයේ හෝ වෙයි, සම්කසට බුදිනුයේ හෝ වෙයි, ලහටු බුදිනුයේ හෝ වෙයි, කුඩු බුදිනුයේ හෝ වෙයි, දඹුබත් බුදිනුයේ හෝ වෙයි, මුරුවට බුදිනුයේ හෝ වෙයි, තණ බුදිනුයේ හෝ වෙයි, ගොම බුදිනුයේ හෝ වෙයි, වනමුල්පල අහර කොට ඇති වැ යැපෙයි, වැටුණු පල බුදිනුයේ වෙයි.

හේ සණවැහැරිදු දරයි, මුසු රෙදිකඩ ද දරයි, මළසිරුරින් බැහැරකළ වස්ත්‍ර ද දරයි, පාංශකුල ද දරයි, තිතිරිපිළි ද දරයි, අඳුන්දිවිසමුදු දරයි, කුරසහිත අඳුන්දිවිසමුදු දරයි, කුසවැහැරිදු දරයි, නියදවැහැරිදු දරයි, පුවරුවැහැරිදු දරයි, කෙශකම්බල දු දරයි, අස්ලොම් ආදියෙන් කළ කම්බල දු දරයි, මහමුහුණු පියාපත් ගොතා කළ වස්ත්‍ර ද දරයි, කෙසමස්සුලෝචනානුයෝගයෙහි යෙදුණේ කෙහෙ රවුලු උදුරනුයේ ද වෙයි, අසුන් පිළිකෙව කෙළේ උඩුහුරු ව සිටුනේ ද වෙයි, උත්කුටික ව හිඳ කරන වීර්‍ය්‍යයෙහි යෙදුණේ උලුඑයෙන් හිඳුනේ ද වෙයි, කටුපුවරුයෙහි හිඳීම් ආදිය කරනුයේ ද වෙයි, කටුපුවරුයෙහි ශයනය කෙරෙයි, සවස තුන්වනු කොට දියෙහි ගැලීමෙහි යෙදුණේ ද වෙයි. මෙසේ මෙබඳු අනේකවිධ වූ ශරීරයාගේ ආතාපන පරිතාපනානුයෝගයෙහි යෙදුණේ වාස කෙරෙයි. මහණෙනි, මේ තෙමේ ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු ආත්මන්තප පුද්ගල යයි කියනුලැබේ.

කතමො ච භික්ඛවෙ පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඔරබ්භිකො හොති, සූකරිකො සාකුන්තිකො[1] මාගවිකො ලුද්දො මච්ඡඝාතකො චොරො චොරඝාතකො[2] බන්ධනාගාරිකො, යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා, අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො රාජා වා හොති ඛත්තියො මුද්ධාභිසිත්තො[3], බ්‍රාහ්මණො වා මහාසාලො, සො පුරත්ථිමෙන නගරස්ස නවං සන්ථාගාරං කාරාපෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා ඛරාජිනං නිවාසෙත්වා සප්පිතෙලෙන කායං අබ්භඤ්ජිත්වා මිගවිසාණෙන[4] පිට්ඨිං කණ්ඩුවමානො සන්ථාගාරං පවිසති සද්ධිං මහෙසියා බ්‍රාහ්මණෙන ච පුරොහිතෙන. සො තත්ථ අනන්තරහිතාය භූමියා හරිතුපත්තාය[5] සෙය්‍යං කප්පෙති, එකිස්සා ගාවියා සරූපවච්ඡාය යං එකස්මිං ථනෙ ඛීරං හොති, තෙන රාජා යාපෙති. යං දුතියස්මිං ථනෙ ඛීරං හොති, තෙන මහෙසි යාපෙති. යං තතියස්මිං ථනෙ ඛීරං හොති තෙන බ්‍රාහ්මණො පුරොහිතො යාපෙති. යං චතුත්ථස්මිං ථනෙ ඛීරං හොති, තෙන අග්ගිං ජුහන්ති. අවසෙසෙන වච්ඡකො යාපෙති. සො එවමාහ: එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය,[6] එත්තිකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා රුක්ඛා ඡිජ්ජන්තු යූපත්ථාය, එත්තකා දබ්භා ලූයන්තු බරිහිසත්ථායාති.[7] යෙපස්ස තෙ හොන්ති දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති: ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති

1 සාකුණිකො - මජසං
2 ගොඝාතකො - මජසං (අධිකං)
3 මුද්ධාවසිත්තො - මජසං
4 මගවිසාණෙන - මජසං
5 හරිතුපලිත්තාය - මජසං; ස්‍යා
6 (එත්තකා අස්සා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය) මජසං (අධිකං)
7 පරිසත්ථායාති - ස්‍යා

Free Distribution www.aathaapi.org

මහණෙනි, පරපරිතාපනානුයොගයෙහි යෙදුණු පරන්තප පුද්ගල කවරේ ද යත්: මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුඟුලෙක් එළුවන් නසනුයේ වෙයි, හූරන් නසනුයේ ළිහිණිවැදි වූයේ මුවවැදි වූයේ වෙයි, රෞද්‍ර වූයේ මසුන් බඳනා කෙවුළු වෙයි, සොරකම් කරනුයේ චොරඝාතක වූයේ බන්ධනාගාරයෙහි යෙදුණේ වෙයි. අන්‍ය වූත් යම් කුරිරුකම් ඇද්ද ඒ කරනුයේ වෙයි. මහණෙනි, මේ පරපරිතාපනානුයොගයෙහි යෙදුණු පරන්තප පුද්ගල යයි කියනුලැබේ.

මහණෙනි. ආත්මපරිතාපානුයෝගයෙහි යෙදුණු ආත්මන්තප වූ ද පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු පරන්තප වූ ද පුද්ගල කවරේ ද යත්: මහණෙනි, මෙ ලොවැ ඇතැම් පුද්ගලයෙක් මූර්ධාභිෂෙක කළ ක්ෂත්‍රිය රජෙක් හෝ වෙයි, මහාසාරකුලයෙහි උපන් බමුණෙක් හෝ වෙයි, හේ නුවරින් පෙරදිග නව යාගශාලාවක් කරවා කෙහෙ රවුලු බහා සරාජික පිරිස් වාස කරවා ගිතෙල් තලතෙලින් කය අභ්‍යඞ්ග කොට මුවහඟින් පිට කසමින් මෙහෙසිය හා පෙරෙවි බමුණු සමග යාගශාලාවට පිවිසෙයි. හේ එහි අමුගොම තවරගත් නො අතුළ බිමැ හෝනේ වෙයි, සමානරූප වස්සකු ඇති එක දෙනකගේ එක තනයෙක යම් කිරෙක් වේ ද, එයින් රජ යැපෙයි. දෙවැනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් මෙහෙසිය යැපෙයි, තෙවෙනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් පෙරෙවි බමුණු යැපෙයි. සිවුවැනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් ගිනි පුදති. සෙසු තනයෙහි කිරෙන් වසු යැපෙයි. හේ මෙසේ කියයි: 'යාග සඳහා මෙතෙක් වෘෂභයෝ නසනුලැබෙත්වා, යාග සඳහා මෙතෙක් වත්සතරයෝ නසනුලැබෙත්වා, යාග සඳහා මෙතෙක් වත්සතරිහු නසනු ලැබෙත්වා, යාග සඳහා මෙතෙක් බැටළුවෝ නසනුලැබෙත්වා, යාග සඳහා මෙතෙක් එළුවෝ නසනුලැබෙත්වා, යාගස්තම්භ සඳහා මෙතෙක් වෘක්ෂයෝ සිඳිනුලැබෙත්වා, පරික්ෂෙප-ආස්තරණ සඳහා මෙතෙක් කුසතණ කපනුලැබෙත්වා'යි. ඔහුගේ යම් දස කෙනෙක් හෝ ප්‍රෙෂ්‍ය කෙනෙක් හෝ කම්කරු කෙනෙක් හෝ වෙත් ද, ඔහුදු දඬුවමින් තැතිගත්තාහු භයින් තැතිගත්තාහු කඳුළුමුසු මුහුණු ඇත්තාහු හඬමින් පරිකර්ම කෙරෙත්. මහණෙනි, මේ ආත්මපරිතාපානුයොගයෙහි යෙදුණු ආත්මන්තප වූ ද පරපරිතාපනානුයොගයෙහි යෙදුණු පරන්තප වූ ද පුද්ගල යයි කියනුලැබේ.

මහණෙනි, ආත්මපරිතාපානුයෝගයෙහි නො යෙදුණු ආත්මන්තප නො වූ පරපරිතාපානුයෝගයෙහි නො යෙදුණු පරන්තප නො වූ පුද්ගල කවරේ ද යත්: හේ අනාත්මන්තප වූයේ අපරන්තප වූයේ මේ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනුයේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මභාවයෙන් යුක්ත ව වාස කෙරෙයි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිදූ අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දේවමනුෂ්‍යයනට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ මෙ ලෝකයෙහි පහළවන සේක. ඒ තථාගතයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ඇති මේ ලෝකය තුමූහු නුවණින් දැන පසක් කොට දන්නාසේක. ඒ තථාගතයෝ ආදි මධ්‍ය පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථ සව්‍යඤ්ජන වූ ධර්මය දේශනා කෙරෙති, කේවලපරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙති.

ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො; අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති, ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති, ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහනා පටිවිරතො හොති ආමකධඤ්ඤපටිග්ගහනා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහනා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහනා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහනා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහනා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහනා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහනා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහනා පටිවිරතො හොති. දූතෙය්‍යපහීනගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති.

ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන්‍යතර කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ ධර්මය අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව ලබයි, හේ ඒ ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් යුක්ත වූයේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ගෘහාවාසය සම්බාධ යැ, කෙලෙස් උපදනා තැනෙක, පැවිද්ද අභ්‍යවකාශ යැ, ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තපරිපූර්ණ වූ එකාන්තපරිශුද්ධ වූ ලිඛිත ශඞ්ඛයක් බඳු මේ සසුන්බඹසර වසන්නට පහසු නො වෙයි. මම කෙස් රවුලු බහා කහවත් හැඳපෙරෙව ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වෙම් නම් යෙහෙකැ'යි. හේ පසු කලෙක අල්ප වූ භෝගස්කන්ධය හෝ හැරපියා මහත් වූ භොගස්කන්ධය හෝ හැරපියා ස්වල්ප වූ නෑපිරිස් හෝ හැරපියා මහත් වූ නෑපිරිස් හෝ හැරපියා කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වෙයි.

හේ මෙසේ පැවිදි වූයේ භික්ෂූන්ගේ ශික්ෂාසාජීවයට පැමිණියේ ප්‍රාණවධ හැරපියා ප්‍රාණවධයෙන් වැළැකුණේ වෙයි, තැබූ දඬු ඇති ව තැබූ අවි ඇති ව (අකුශලයෙහි) ලජ්ජා ඇතියේ සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පී ව වාසකෙරෙයි. අයිනාදන් හැරපියා අයිනාදනින් වැළැකුණේ වෙයි, දුන් දය ගන්නේ දුන් දය කැමැතිවනුයේ නො සොර වූ පවිත්‍ර වූ සිතින් යුක්ත ව වෙසෙයි. අබ්‍රම්සර හැරපියා බඹසර ඇතියේ අබ්‍රම්සරින් දුරුව මෛථුන සඞ්ඛ්‍යාත ග්‍රාමධර්මයෙන් වෙන් වූයේ වෙයි. මුසවා හැරපියා මුසවායෙන් වැළකුණේ වෙයි, සත්‍යවාදී ව සත්‍යසන්ධාන ඇතියේ තිර කථා ඇතියේ හැදහියයුතු වූයේ ලොකයා නො රවටනුයේ වෙයි, පිසුනුබස් හැරපියා පිසුනුබසින් වැළැකුණේ වෙයි. මෙතැනින් අසා මුන්ගේ භේදයට තුලුන් කෙරෙහි නො කියනුයේ නොහොත් එතැනින් අසා තුලුන්ගේ භේදයට මොවුන්ට නො කියනුයේ වෙයි. මෙසේ භින්න වූවන් සමගි කරනුයේ සමග වූවනට අනුබල දෙනුයේ සමගියෙහි ඇලුම් ඇතියේ සමඟි වූවන් කෙරෙහි ඇලුණේ සමගි වූවන් දක සතුටු වනුයේ සමඟි කරන බස් කියනුයේ වෙයි. පරොස්බස් හැරපියා පරොස් බසින් වැළැකුණේ වෙයි. නිදොස් වූ කනට සුව වූ පෙම් වඩන නියරි වූ බොහෝ දෙනාහට කැමැති වූ බොහෝ දෙනාහට මනාප වූ යම් බසක් ඇද්ද, එබඳු බස් කියන්නේ වෙයි. සම්ඵප්‍රලාපය හැර පියා සම්ඵප්‍රලාපයෙන් වැළැකුණේ වෙයි, කාලවාදී භූතවාදී අර්ථවාදී ධර්මවාදී විනයවාදී වූයේ නිසි කාලයෙහි සකාරණ වූ පර්‍යන්ත ඇති අර්ථසම්පන්න වූ සිත්හි ලා ධැරියයුතු බස් කියන්නේ වෙයි.

හේ බීජග්‍රාම භූතග්‍රාමයන්ගේ සිඳීම් ආදි (විකොපන)යෙන් වෙන්වූයේ වෙයි. රාත්‍රි භොජනයෙන් වැළැකුණේ විකල්බොජුනෙන් වෙන්වූයේ එක්වේලේ වළඳනු වෙයි. නටනු ගයනු වයනු විසුලුදස්නෙන් වැළැකුණේ වෙයි. මල්ගඳවිලෙවුන් ධැරීම් සඞ්ඛ්‍යාත මණ්ඩන විභූෂණකාරණයෙන් වැළැකුණේ වෙයි. උසසුන් මහඅස්නෙන් වැළැකුණේ වෙයි. රන් රිදී පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. අමු ධාන්‍ය පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. අමු මස් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. ස්ත්‍රීන් කුමාරීන් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි, දසිදසුන් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. එළුවන් තිරෙළුවන් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි, කුකුළන් හූරන් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. කෙත්වත් පිළිගැනුමෙන් වැළැකුණේ වෙයි. දූතගමන් හා පණිවිඩ ගමන්හි යෙදීමෙන් වැළැකුණේ වෙයි. ක්‍රයවික්‍රයයෙන් වැළැකුණේ වෙයි. තුලාකූට කංසකූට මානකූටයෙන් වැළැකුණේ වෙයි. අත්ලස් වංචා රැවැටීම් යන කුටිලප්‍රයොගයෙන් වැළැකුණේ වෙයි. අත්පාආදිය සිඳීම වධ බන්ධන මංපැහැරීම ගම්පැහැරීම සාහසක්‍රියා යන මෙයින් වැළැකුණේ වෙයි.

සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන, කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති, සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි නාම පක්ඛිසකුණො යෙන යෙනෙව ඩෙති, සපත්තභාරොව ඩෙති. එවමෙවං භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන, කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා-පෙ-ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති. අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය, පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථඞ්කථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

හේ කායපරිහරණයට ප්‍රමාණ වූ චීවරයෙන් කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වෙයි. යම් යම් තැනෙක්හි මැ යේ ද පාසිවුරු ගෙන මැ යෙයි. යම්සේ පක්ෂි ශකුනයෙක් යම් දිශෙක පියාඹායේ ද, පියාපත්බර සහිත ව මැ පියාඹායෙයි. එසෙයින් මැ මහණ කායපරිහරණයට ප්‍රමාණ වූ චීවරයෙන් කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වෙයි. යම් යම් තැනෙක්හි මැ යේ ද පාසිවුරු ගෙන මැ යෙයි. හෙතෙම මේ ආර්‍ය්‍යශීලස්කන්ධයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අනවද්‍ය සුවය විඳී.

හේ ඇසින් රූ දැක නිමිත්ත විසින් නො ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වාසය කරනුවහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධම්මයෝ අනුබඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, චක්ෂුරින්ද්‍රියය රකී, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ, කනින් ශබ්ද අසා . . . . නැහැයෙන් ගඳ ආඝ්‍රාණ කොට . . . . දිවින් රස විඳ . . . කයින් පහස් පැහැසැ . . . මනසින් දහම්අරමුණු දැන නිමිති විසින් නො ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් මනඉන්ද්‍රියය අසංවෘත කොට වාසය කරනුවහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු ද, ඒ මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, මනඉන්ද්‍රියය රකී. මනඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. හේ ආර්‍ය්‍ය වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අව්‍යාසෙකසුවය විඳී.

හේ ඉදිරියට යැමෙහි පෙරළා ඊමෙහි නුවණින් දැන කරනුයේ (සම්පජානකාරී) වෙයි, අභිමුඛ ව බැලීමෙහි අවට බැලීමෙහි සම්පජානකාරී වෙයි, (අත්පා) හැකිළීමෙහි දිගු කිරීමෙහි සම්පජානකාරී වෙයි, සඟළ-පා-සිවුරු ධැරීමෙහි සම්පජානකාරී වෙයි, අසිත පීත ඛායිත සායිතයෙහි සම්පජානකාරී වෙයි, උච්චාර ප්‍රස්‍රාවකර්මයෙහි සම්පජානකාරී වෙයි, යැමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි සම්පජානකාරී වේ.

හේ මේ ආර්‍ය්‍ය වූ ශීලස්කන්ධයෙන් ද සමන්වාගත වූයේ මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්වාගත වූයේ මේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්වාගත වූයේ මේ ආර්‍ය්‍ය වූ සමෘතිසම්ප්‍රඥානයෙන් ද සමන්වාගත වූයේ අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කන්දර යැ ගිරිගුහා යැ සුසාන යැ වනප්‍රස්ථ යැ අභ්‍යවකාශ යැ පලාලපුඤ්ජ යැ යන ජන ශූන්‍ය වූ සෙනසුනක් ඇසුරුකෙරෙයි.

හේ පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැතුණේ පලක් බැඳ කය ඍජු කොට තබා සිහිය කර්මස්ථානයට අභිමුඛ කොට එළවා හිඳී. හේ ස්කන්ධලෝකයෙහි දැඩි ලෝභය දුරුකොට විගත අභිධ්‍යා ඇති සිතින් යුක්ත ව වාස කෙරෙයි, අභිධ්‍යායෙන් සිත පිරිසුදු කෙරෙයි, ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වෙශය දුරුකොට ව්‍යාපාදයට නො පැමිණි සිත් ඇති ව සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පී වැ වෙසෙයි, ව්‍යාපාද ප්‍රද්වෙශයෙන් සිත පිරිසිදු කෙරෙයි. ථීනමිද්ධය දුර කොට විගත වූ ථීනමිද්ධ ඇති වැ වෙසෙයි, ආලෝකසංඥ ඇති ව සිහි ඇති ව සම්ප්‍රඥන ඇති ව ථීනමිදධයෙන් සිත පිරිසුදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය දුරුකොට අනුද්ධත වැ වෙසෙයි, අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇතියේ උද්ධච්ච කුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරෙයි. විචිකිච්ඡාව දුරුකොට තුරු සැක ඇති වැ වෙසෙයි, කුශලධර්මවිෂයෙහි කථංකථා (සැක) රහිත වූයේ විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරෙයි.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[1] අදුක්ඛං අසුඛං[2] උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[3] උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[4] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදි එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[5] තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[4] සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

---

1. අත්ථගමා - PTS
2. අදුක්ඛමසුඛං - මජසං
3. චතුත්ථජ්ඣානං - සීමු
4. ආනෙජ්ජප්පත්තෙ - මජසං, සීමු
5. උප්පාදිං - සීමු

Free Distribution www.aathaapi.org

හේ සිතට උපක්ලේශ වූ ප්‍රඥාව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් දුරුකොට කාමච්ඡන්ද නීවරණයෙන් වෙන් වැ (ශෙෂ නීවරණ) අකුශලධර්මයන්ගෙන් වෙන් වැ විතර්කසහිත විචාරසහිත විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයා වෙසෙයි. විතර්ක-විචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදනය ඇති චිත්තයාගේ එකොදිභාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානය උපයා වෙසෙයි. ප්‍රීතිය ද ඉක්මවීමෙන් උපේක්ෂා ඇතියේ සිහි ඇතියේ සම්ප්‍රඥාන ඇති වැ වෙසෙයි. කයින් සුවය ද විඳී, ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් (ගෙන) උපෙක්ෂා ඇත, ස්මෘතිමත් යැ, සුඛවිහාර ඇතැ'යි පවසත් ද, ඒ තෘතීය ධ්‍යානය උපයා වෙසෙයි. සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පෙර මැ සොම්නස් දොම්නසුන් නැතිකිරීමෙන් නො දුක් වූ නො සුව වූ උපෙක්ෂාස්මෘතීන්ගේ පාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි.

හේ මෙසේ සිත චතුර්ථධ්‍යානසමාපත්තියෙන් සමාහිත කල්හි සමාහිත හෙයින් පරිශුද්ධ කල්හි පරිශුද්ධ හෙයින් ම පර්‍ය්‍යවදාත කල්හි එහෙයින් අනාඞ්ගණ කල්හි අනාඞ්ගණ හෙයින් විගතොපක්ලෙශ කල්හි එහෙයින් මෘදු වූ කල්හි කර්මක්ෂම කල්හි ස්ථිත කල්හි අචලප්‍රාප්ත කල්හි පූර්‍ව්වනිවාසානුස්මෘතිඥානය පිණිස සිත එළවයි, හේ අනෙකප්‍රකාර වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරයි. ඒ මෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සියදහසකුදු නොයෙක් සංවර්ත (නැසෙන) කල්පයනුදු නොයෙක් විවර්ත(හටගන්නා) කල්පයනුදු නොයෙක් සංවර්ත විවර්තකල්පයනුදු අසුවල් තැනැ මෙනම් ඇතියෙම් මෙගොත් ඇතියෙම් මෙ වන් පැහැ ඇතියෙම් මෙ වන් අහර ඇතියෙම් වීමි, මෙසේ සුවදුක් විඳිනු වූයෙමි, මෙසේ ආයුපර්‍ය්‍යන්ත ඇති වීමි. එ මම එයින් සැවැ අසුවල් තැනැ උපන්මි, එහි දු මෙනම් ඇතියෙම් මෙගොත් ඇතියෙම් මෙවන් පැහැ ඇතියෙම් මෙ බඳු අහර ඇතියෙම් වීමි. මෙසේ සුවදුක් විඳිනු වූයෙමි. මෙසේ ආයුපර්‍ය්‍යන්ත ඇති වීමි. එ මම ඉන් සැවැ මෙහි උපන්මි'යි. මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිධ වූ පූර්වනිවාස සිහිකරයි.

හේ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදාත අනාඞ්ගණ විගතෝපක්ලේශ මෘදුභූත කර්මණ්‍ය ස්ථිත කල්හි අනිඤ්ජනභාවයට පත් කල්හි සත්ත්වයන්ගේ ච්‍යුති-උපප්‍රාප්ති ඥානය පිණිස සිත එළවයි. හේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යවමාන උපපද්‍යමාන වූ සත්ත්වයන් බලයි. හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගති ඇති දුර්ගති ඇති යථාකර්මොපග සත්ත්වයන් දැනගනී : මේ භවත් සත්ත්වයෝ එකාන්තයෙන් කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාක්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදාන කළාහු වෙති. ඔහු කාබුත් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නරකයට පැමිණියාහු වෙත්. යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තවූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදානය කළාහු වෙති, ඔහු කාබුත් මරණින් මතු සුගති ස්වර්ග ලොකයට පැමිණියාහ'යි මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවඇසින් ච්‍යවමාන උපපද්‍යමාන වූ සත්ත්වයන් බලයි. හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතිගත වූ දුර්ගතිගත වූ යථාකර්මොපගත සත්ත්වයන් දැනැගනී.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා පි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී'ති

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

කන්දරක සුත්තං පඨමං

හේ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍යවදාත අනඞ්ගණ විගතෝපක්ලෙශ මෘදුභූත කල්හි කර්මක්ෂම ස්ථිත කල්හි අනිඤ්ජනභාවප්‍රාප්ත කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත එළවයි. හේ මේ දුක යැයි තත්වූ පරිදි දනගනී, මේ දුක්ඛසමුදය යි යථාභූත වැ දනගනී, මේ දුක්ඛනිරොධයැ යි යථාභූත වැ දනගනී, මේ දුක්ඛනිරොධගාමිනී පටිපද යි යථාභූත වැ දනගනී. මොහු ආස්‍රවයෝ යැයි යථාභූත වැ දනගනී, මේ ආස්‍රවසමුදය යි යථාභූත වැ දනගනී, මේ ආස්‍රවනිරොධයැ යි යථාභූත වැ දන ගනී, මේ ආස්‍රවනිරොධ-ගාමිනී ප්‍රතිපදයැයි යථාභූත වැ දනගනී, මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රව-යෙනුදු මිදෙයි, සිත භවාස්‍රවයෙනුදු මිදෙයි, සිත අවිද්‍යාස්‍රවයෙනුදු මිදෙයි, විමුක්ත කල්හි විමුක්ත යැයි ප්‍රත්‍යවෙක්ෂාඥානය වෙයි, ජාති ක්ෂය වූ යැ, බඹසර වැස නිමවන ලද, කරණීය කරනලද, මේ අර්හත්ත්වය සඳහා කටයුතු අනෙකක් නැතැයි දනගනී.

මහණෙනි, මේ ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු අනාත්මන්තප වූ පරපරි-තාපනානුයෝගයෙහි නො යෙදුණු අපරන්තප වූ පුද්ගල යැයි කියනු ලැබේ. හේ අනාත්-මන්තප වූයේ අපරන්තප වූයේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ ධ්‍යාන මගපලනිවන්සුව විඳිනුයේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මභාවයෙන් යුක්ත ව වෙසේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ වදළසේක, සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනා කළාහ'යි.

කන්දරකසූත්‍රය පළමුවැනියි.

---

2. 1. 2.

අට්ඨකනාගර සුත්තං

එවං මෙ සුතං එකං සමයං ආයස්මා ආනන්දො වෙසාලියං විහරති බෙලුවගාමකෙ. තෙන ඛො පන සමයෙන දසමො ගහපති අට්ඨකනාගරො පාටලිපුත්තං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො දසමො ගහපති අට්ඨකනාගරො යෙන කුක්කුටාරාමො යෙන අඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දසමො ගහපති අට්ඨකනාගරො තං භික්ඛුං එතදවොච: කහන්නු ඛො භන්තෙ ආයස්මා ආනන්දො එතරහි විහරති. දස්සනකාමා හි මයං තං ආයස්මන්තං ආනන්දන්ති. එසො ගහපති ආයස්මා ආනන්දො වෙසාලියං විහරති බෙලුවගාමකෙ'ති. අථ ඛො දසමො ගහපති අට්ඨකනාගරො පාටලිපුත්තෙ තං කරණීයං තීරෙත්වා යෙන වෙසාලී යෙන බෙලුවගාමකො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දසමො ගහපති අට්ඨකනාගරො ආයස්මන්තං ආනන්දං එතදවොච:

අත්ථි නු ඛො භන්තෙ ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො අක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා[1] චිත්තං විමුච්චති. අපරික්ඛීණා[2] වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තං වා[3] අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී'ති. අත්ථි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො, අක්ඛාතො, යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තඤ්චෙව චිත්තං විමුච්චති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී'ති. කතමො පන භන්තෙ ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො, අක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තඤ්චෙව චිත්තං විමුච්චති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී'ති.

---

1. අවිමුත්තං චෙව - මජසං, ස්‍යා.
2. අප්පරික්ඛීණා වා - ස්‍යා
   අපරික්ඛීණා ච - මජසං
3. අනනුප්පත්තංච - මජසං, ස්‍යා

Free Distribution www.aathaapi.org

2. 1. 2
අට්ඨකනාගර සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විශාලා මහනුවර බෙලුවගාමයෙහි වැඩ වාස කෙරෙති. එකල අට්ඨකනාගර වැසි දසම ගැහැවි කිසියම් කරුණෙකින් පැළලුප් නුවරට පැමිණියේ වෙයි. අට්ඨකනාගර වැසි දසම ගැහැවි කුක්කුටාරාමයෙහි එක්තරා මහණෙක්හු කරා එළැඹියේ යැ. එළැඹ ඒ මහණහු සකසා වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් අට්ඨකනාගර වැසි දසම ගැහැවි ඒ 'මහණහට තෙල කී : වහන්ස, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දැන් කොහි වෙසෙත් ද ? අපි ඒ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දක්නා කැමැත්තම් හ' යි. ගැහැවිය, තෙල ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විශාලා මහනුවර බෙලුවගාමයෙහි වැඩ වාස කෙරෙති'යි. එසඳ අට්ඨකනාගර වැසි දසම ගැහැවි පැළලුප් නුවර ඒ කරණී නිමවා විශාලා මහනුවර බෙලුවගාමයෙහි ආනන්ද ස්ථවිරයන් වසන්සෙ කරා එළැඹියේ. එළැඹ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් අට්ඨකනාගර වැසි දසම ගැහැවි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට තෙල කී :

'වහන්ස, ආනන්දයෙනි, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්-බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ විහරණ කරන මහණක්හුගේ යම් අරමුණෙක ලා නො මිදුණු හෝ සිත මිදේ ද, ක්‍ෂය නො වූ හෝ ආස්‍රවයෝ ක්‍ෂයට යෙත් ද, නො ලැබූ හෝ අනුත්තර යොගක්‍ෂෙමය නුවණින් ලබා ද, එබඳු එක් ධර්මයෙක් වදරන ලද්දේ වේ ද ? ගැහැවිය, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ විහරණ කරන මහණක්හුගේ යම් අරමුණෙක්හි ලා නො මිදුණ වූ ද සිත මිදේ ද, ක්‍ෂය නො වූ ආස්‍රවයෝ ක්‍ෂයට යෙත් ද, නො ලැබූ අනුත්තර යොගක්‍ෂෙමයත් නුවණින් ලබා ද එබඳු එක් ධර්මයෙක් වදරන ලද්දේ වෙයි. වහන්ස, ආනන්දයෙනි, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ විහරණ කරන මහණක්හු ගේ යම් අරමුණෙක ලා නො මිදුණ වූත් සිත මිදේ ද, ක්‍ෂය නො වූත් ආස්‍රවයෝ ක්‍ෂයට යෙත් ද, නො ලැබූත් අනුත්තර යොගක්‍ෂෙමය නුවණින් ලබා ද, එබඳු වූ වදරන ලද එක් ධර්මය කවරේ යැ.

ඉධ ගහපති භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති. ඉදම්පි ඛො පඨමං ඣානං අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරෙධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති; තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො අක්ඛාතො, යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තඤ්චෙව චිත්තං විමුච්චති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං-පෙ-දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: ඉදම්පි ඛො දුතියං ඣානං අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරෙධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො අක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තඤ්චෙව චිත්තං විමුච්චති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු පීතියා ච විරාගා-පෙ-තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉතිපටිසඤ්චික්ඛති: ඉදම්පි ඛො තතියං ඣානං අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො-පෙ-අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: ඉදම්පි ඛො චතුත්ථං ඣානං අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො -පෙ- අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො මෙත්තාචෙතොවිමුත්ති[2] අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො -පෙ- අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

---

1. සබ්බත්ථතාය - සීමු.
2. චෙතසොවිමුත්ති - සීමු.

ගැහැවිය, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසල දහමින් වෙන් වැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛ ඇති පළමු වන දහැන් උපයා වාස කෙරෙයි. හේ මෙසේ සිතයි : ' මේ ප්‍රථමධ්‍යානය ද උපදවන ලද්දෙකි. සිතින් නිපදවන ලද්දෙකි. යම් කිසිවක් කරන ලද නම් සිතින් නිපදවන ලද නම් ඒ අනිත්‍ය යැ. නිරුද්ධ වන සැහැවි ඇති'යි නුවණින් දනියි. හේ එහි සිටියේ ආස්‍රවක්‍ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවක්‍ෂයට නො පැමිණේ නම් ඒ ශමථවිදර්ශනාමය ධර්මරාගයෙන් පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇති වැ, එහි මැ පිරිනිවෙයි. ගැහැවිය, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වාස කරන මහණක්හුගේ අවිමුක්ත චිත්තය විමුක්ත වේ ද, අපරික්‍ෂීණ ආස්‍රවයෝ පරික්‍ෂියට යෙත් ද නො පැමිණි අනුත්තර යොගක්‍ෂෙමය ලබා ද එබඳු වූ මේ එක් ධර්මයෙක් වදරන ලද්දේ වෙයි.

තවද ගැහැවිය, මහණ විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් සිය සතන්හි සම්ප්‍රසාද ඇති කරන දෙවන දහැන් උපයා වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි: මේ දෙවන දහැන ද උත්පාදිත යැ ප්‍රකල්පිත යැ. යම් කිසිවක් උත්පාදිත වේ නම් ප්‍රකල්පිත වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇත්තේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ ආස්‍රවයන්ගේ ක්‍ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවක්‍ෂයට නො පැමිණේ නම් ඒ ශමථවිදර්ශනා ඡන්දරාගයෙන් මැ පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය වැ යැමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇති වැ එහි පිරිනිවන් පානේ යැ. ගැහැවිය, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ විහරණ කරන මහණක්හුගේ යම් අරමුණෙක්හි ලා අවිමුක්ත වූත් සිත විමුක්ත වේ ද අපරික්‍ෂීණ වූත් ආස්‍රවයෝ පරික්‍ෂයට යෙත් ද අප්‍රාප්ත වූත් අනුත්තර යෝග-ක්ෂේමය ලබා ද ඹෙ එබඳු වූ එක් ධර්මයෙක් ද වදරන ලද්දේ වෙයි.

තවද ගැහැවිය, මහණ . . . ප්‍රීතිවිරාගයෙනුදු තුන්වන දහැන උපයා වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙයි: මේ තුන්වන දහැන ද සිතින් නිපදවන ලද්දෙකි. සිතින් කරන ලද්දෙකි. යම් මැ දයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ . . . අනුත්තර යොගක්‍ෂෙමයට පැමිණෙයි.

තවද ගැහැවිය, මහණ සුඛප්‍රහාණයෙනුදු . . . සියුවන දහැන උපයා වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙයි. මේ සියුවන දහැන ද කරන ලද වෙයි. සිතින් නිපදවන ලද වෙයි. යම් මැ දයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ . . . අනුත්තර යෝගක්‍ෂෙමයට පැමිණෙයි.

තවද ගැහැවිය, මහණ මෛත්‍රී සහගත සිතින් එක් දිගක් පැහැස වාස කෙරෙයි. එසෙයින් මැ දෙවන දිග ද එසෙයින් මැ තුන්වන දිග ද එසෙයින් මැ සතර වන දිග ද යි මෙසේ උඩ, යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් සකල ලෝකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෛත්‍රී සහගත සිතින් පැහැස වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මේ මෙත්තාචෙතොවිමුක්තිය ද කරන ලද්දක. සිතින් නිපදවන ලද්දකි. යම් මැ දයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ . . . අනුත්තර යෝගක්ෂෙමයට පැමිණෙයි.

පුන ච පරං ගහපති භික්ඛු කරුණාසහගතෙන චෙතසා-පෙ-මුදිතා-සහගතෙන චෙතසා-පෙ-උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසඤ්චික්ඛති අයම්පි ඛො උපෙක්ඛාචෙතො විමුත්ති[2]. අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං, තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො-පෙ-අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කම, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසො ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො පන අකාසානඤ්චායතනසමාපත්ති අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො-පෙ-අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො විඤ්ඤාණඤ්චායතන සමාපත්ති අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො-පෙ-අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුන ච පරං ගහපති භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභි-සඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො, තස්මා, ලොකා අයම්පි ඛො[3] ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො, අක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තඤ්චෙව චිත්තං විමුච්චති. අපරික්ඛීණා ච ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තඤ්ච අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී' ති.

---

1. සබ්බත්ථතාය - සීමු.
2. චෙතොවිමුත්ති - සීමු.
3 අයං ඛො - සීමු.

තවද ගැහැවිය, මහණ කරුණා සහගත සිතින්... මුදිතා සහගත සිතින්... උපෙක්ඛා සහගත සිතින් එක් දිගක් අරමුණු කොට වාස කෙරෙයි. එසේ මැ දෙවන දිග ද එසෙයින් මැ තුන්වන දිග ද එසෙයින් මැ සතරවන දිග ද යි මෙසේ උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් සකල ලෝකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ උපේක්ෂා සහගත සිතින් අරමුණු කොට වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: මේ උපේක්ෂා චෙතොවිමුක්තියද සිතින් කරන ලද වෙයි. සිතින් නිපදවන ලද වෙයි. යම් මැ දෑයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ... අනුත්තර යෝගක්ෂේමයට පැමිණෙයි.

තවද ගැහැවිය, මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනසිකාරයෙන් 'අහස අනන්ත යැ'යි ආකාසානඤ්චායතනය උපයා වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මේ ආකාසානඤ්චායතන සමාපත්තිය ද කරන ලද වෙයි. සිතින් නිපදවන ලද වෙයි. යම් මැ දෑයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ... අනුත්තර යෝගක්ෂේමයට පැමිණෙයි.

තවද ගැහැවිය, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම 'විඥානය අනන්ත යැ' යි විඤ්ඤාණඤ්චායතනය උපයා වාස කෙරෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මේ විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ද කරන ලද වෙයි. සිතින් නිපදවන ලද වෙයි. යම් මැ දෑයෙක් කරන ලද වේ නම් සිතින් නිපදවන ලද වේ නම් ඒ අනිත්‍ය වේ යැයි නිරුද්ධ වන සැහැවි ඇති වේ යැයි නුවණින් දනියි. හේ එහි සිටියේ... අනුත්තර යොගක්ෂෙමයට පැමිණෙයි.

තවද ගැහැවිය, මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා පියා 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය උපයා වෙසෙයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: "මේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ද හේතුයෙන් කරන ලද වෙයි, සිතින් සිතන ලද වෙයි. වැලි යම් මැ දෑයෙක් අභිසඞ්ඛත අභිසඤ්චෙතයිත වේ නම්, එය අනිත්‍ය වෙයි, නිරුද්ධ වන සැහැවි ඇතැ'යි දනගනී. හේ ඒ ශමථවිදර්ශනාධර්මයෙහි සිටියේ ආස්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවක්ෂයට නො පැමිණේ නම්, ඒ මැ ශමථ විදර්ශනා ධර්ම රාගයෙන් ඒ ධර්මනන්දියෙන් පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ ක්‍ෂය වීමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් චවාලා නො එන සැහැවි ඇතියේ එහි මැ පිරිනිවෙයි. ගැහැවිය, (ඒ ඒ සත්ත්වයන්ගේ ආශයානුශය) දන්නා වූ (හැම ඥෙයධර්මය) දක්නා වූ අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් විසින් යම් අරමුණෙක අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වෙසෙන භික්‍ෂුහු ගේ අවිමුක්ත චිත්තයත් මිදේ ද, අපරික්‍ෂීණ ආස්‍රවයෝ ක්‍ෂයවීමට යෙත් ද, අනනුප්‍රාප්ත අනුත්තර යෝගක්ෂෙම යත් ප්‍රතිලාභ කෙරේ ද එබඳු වූ මේ ඒකධර්මය වදාරන ලද්දේ යයි.

එවං වුත්තෙ දසමො ගහපති අට්ඨකනාගරො ආයස්මන්තං ආනන්දං එතදවොච: "සෙය්‍යථාපි භන්තෙ ආනන්ද පුරිසො එකං නිධිමුඛං ගවෙසන්තො සකිදෙව එකාදස නිධිමුඛානි අධිගච්ඡෙය්‍ය, එවමෙව ඛො අහං භන්තෙ එකං අමතද්වාරං ගවෙසන්තො සකිදෙව එකාදස අමතද්වාරානි අලත්ථං සවණාය[1]. සෙය්‍යථාපි භන්තෙ පුරිසස්ස අගාරං එකාදසද්වාරං, සො තස්මිං අගාරෙ ආදිත්තෙ එකමෙකෙනපි ද්වාරෙන සක්කුණෙය්‍ය අත්තානං සොත්ථිං කාතුං, එවමෙව ඛො අහං භන්තෙ ඉමෙසං එකාදසන්නං අමතද්වාරානං එකමෙකෙනපි අමතද්වාරෙන සක්කුණිස්සාමි අත්තානං සොත්ථිං කාතුං. ඉමෙ හි නාම භන්තෙ අඤ්ඤතිත්ථියා ආචරියස්ස ආචරියධනං පරියෙසිස්සන්ති. කිංපනාහං[2] ආයස්මතො ආනන්දස්ස පූජං න කරිස්සාමී"ති.

අථ ඛො දසමො ගහපති අට්ඨකනාගරො පාටලිපුත්තකඤ්ච වෙසාලිකඤ්ච භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා[3] පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. එකමෙකඤ්ච භික්ඛුං පච්චෙකදුස්සයුගෙන අච්ඡාදෙසි. ආයස්මන්තං ආනන්දං තිචීවරෙන අච්ඡාදෙසි. ආයස්මතො ච ආනන්දස්ස පඤ්චසතං විහාරං[4] කාරාපෙසී'ති.

අට්ඨකනාගරසුත්තං දුතියං

---

1. භාවනාය – මජ්සං.
2. කිම්ඞ්ගං පනාහං – මජ්සං, ස්‍යා
3. සන්නිපාතෙත්වා – මජ්සං, ස්‍යා,
4. පඤ්චසතවිහාරං – මජ්සං, ස්‍යා.

Free Distribution www.aathaapi.org

මෙසේ වදළ කල්හි අට්ඨකනගර වැසි දශම ගෘහපති ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල සැල කළේ : ''වහන්ස, ආනන්දයෙනි, එක නිධානයක් සොයන පුරුෂයෙක් එක් මැ පියොවින් එකොළොස් නිධාන කෙනකුන් යම්සේ ලබා ද, එසෙයින් මැ වහන්ස, මම් එක් අමාදොරක් සොයනුයෙම් එක් මැ පියොවින් එකොළොස් අමෘතද්වාර කෙනකුන් අසන්නට ලත්මි. වහන්ස, යම් පරිදි මිනිසක්හට එකොළොස් දොරක් ඇති ගෙයක් වේ ද, ඒ ගෙය ඇවිළැගත් සඳ එක් එක් මැ දොරෙකින් තමහට සුව කරන්නට හැකි වේ ද, එසෙයින් මැ වහන්ස, මම් මේ එකොළොස් අමාදොර අතුරෙන් එක් එක් මැ අමාදොරෙකින් තමහට සුව කරන්නට හැකිවන්නෙමි. වහන්ස, යම්හෙයෙකින් මේ අන්‍යතීර්ථකයෝ ආචාර්‍ය්‍යහට ආචාර්‍ය්‍යධනය සොයත් නම්, වැලි කුමක්හෙයින් මම ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට පූජාවක් නො කෙරෙම් ද''යි.

ඉක්බිති අට්ඨක නගර වැසි දශම ගෘහපති පැළලුප් නුවර වූ ද විසාලා නුවර වූ ද භික්ෂු සඞ්ඝයා රැස්කරවා ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් සන්තර්පණ සම්ප්‍රවාරණ කැරැවී. යළි එකෙකි භික්ෂුවට එකෙකි වස්ත්‍ර යුග්මයක් දුන්නේ ය. ආයුෂමත් ආනන්ද තෙරණුවනට තුන්සිවුරු දුන්නේ ය. තවද ආයුෂමත් ආනන්ද තෙරුන්ට පඤ්චසතික විහාරයක් කැරැවී යයි.

දෙවැනි අට්ඨකනාගර සූත්‍රය යි.

---

2. 1. 3

සෙඛ සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන කාපිලවත්ථවානං සක්‍යානං නවං සන්ථාගාරං අචිරකාරිතං හොති අනජ්ඣාවුත්ථං[1] සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන. අථ ඛො කාපිලවත්ථවා සක්‍යා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො කාපිලවත්ථවා සක්‍යා භගවන්තං එතදවොචුං: ඉධ භන්තෙ කාපිලවත්ථවානං සක්‍යානං නවං සන්ථාගාරං අචිරකාරිතං[2] අනජ්ඣාවුත්ථං සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන, තං භන්තෙ භගවා පඨමං පරිභුඤ්ජතු, භගවතා පඨමං පරිභුත්තං පච්ඡා කාපිලවත්ථවා සක්‍යා පරිභුඤ්ජිස්සන්ති. තදස්ස කාපිලවත්ථවානං සක්‍යානං දීඝරත්තං හිතාය සුඛායා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො කාපිලවත්ථවා සක්‍යා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං සන්ථාගාරං සන්ථරිත්වා ආසනානි පඤ්ඤපෙත්වා උදකමණිකං පතිට්ඨාපෙත්වා[3] තෙලප්පදීපං ආරොපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො කාපිලවත්ථවා සක්‍යා භගවන්තං එතදවොචුං: සබ්බසන්ථරිං සන්ථතං භන්තෙ සන්ථාගාරං, ආසනානි පඤ්ඤත්තානි, උදකමණිකො පතිට්ඨාපිතො,[4] තෙලප්පදීපො ආරොපිතො; යස්සදානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී'ති. අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සන්ථාගාරං[5] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝොපි ඛො පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තංයෙව පුරක්ඛත්වා. කාපිලවත්ථවාපි ඛො සක්‍යා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡාභිමුඛා[6] නිසීදිංසු භගවන්තංයෙව පුරක්ඛත්වා. අථ ඛො භගවා කාපිලවත්ථවෙ සක්‍යෙ බහුදෙවරත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: පටිභාතු තං ආනන්ද කාපිලවත්ථවානං සක්‍යානං සෙඛො පාටිපදෙ[7] පිට්ඨිමෙ[8] ආගිලායති. තමහං ආයමිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤාපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා.

---

1 අනජ්ඣාවුත්ථපුබ්බං – ස්‍යා. අනජ්ඣාවුට්ඨං – මජසං.
2. අචිරකාරිතං හොති–ස්‍යා.
3. උපට්ඨපෙත්වා–මජසං.
4. උපට්ඨාපිතො–මජසං.
5. නවං සන්ථාගාරං–මජසං
6. පච්ඡිමාභිමුඛා – මජසං
7. පටිපදෙ–ස්‍යා
8. පිට්ඨි මෙ – මජසං, ස්‍යා

Free Distribution www.aathaapi.org

2. 1. 3

සෙඛ සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වාස කරනසේක. එසමයෙහි කිඹුල්වත්පුර වැසි ශාක්‍යයන් විසින් අභිනව සන්ථාගාරයෙක් කැරැ වූ නො බොහෝ කල් වෙයි. මහණකු විසින් වේවයි බමුණකු විසින් වේවයි යම් මැ මිනිසකු විසින් නො වසනලද වෙයි. එසඳ කිඹුල්වත් වැසි සැහැකුල වැසියෝ බුදුන් කරා එළැඹියහ. එළැඹැ සකසා බුදුන් වැඳ පසෙක හුන්හු. එකත්පසෙක හුන් කිඹුල්වත් වැසි ශාක්‍යයෝ බුදුන්ට තෙල සැල කොළෝ: 'වහන්ස, කිඹුල්වත් වැසි සැහැකුල වැසියන් විසින් අභිනව සන්ථාගාරයෙක් කැරැ වූ නො බොහෝ කල් වෙයි. මහණකු විසින් වේවයි බමුණකු විසින් වේවයි මනුෂ්‍ය වූ යම් මැ කෙනකුන් විසින් වාස නො කරනලදි යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඒ මහහල පළමු වැ ලා වළඳ කරන සේක්වා. භාග්‍යවතුන් වහන්සේ විසින් පළමු වැ ලා වළඳ කළ හල පසු වැ ලා කිඹුල්වත් වැසි සැහැකුල රජදරුවෝ වළඳ කෙරෙති. එය කිඹුල්වත් වැසි සැහැකුල රජදරුවනට හිතසුව පිණිස වැවේ'යයි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූසේක.

ඉක්බිති කිඹුල්වත් වැසි සැහැකුල රජදරුවෝ බුදුන්ගේ අධිවාසනා දැන හුනස්නෙන් නැඟී බුදුන් සකසා වැඳ පදැකුණු කොට සන්ථාගාරශාලාව කරා එළැඹියහ. එළැඹැ සන්ථාගාරය හැම තැන් ඇතිරි ලීමෙන් අතුරා අසුන් පන්වා දියසැළ තබා තෙල්පහන් නහා බුදුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් සකසා වැඳ එකත්පස් වැ සිටියෝ. එකත්පස් වැ සිටි කිඹුල්වත් වැසි සැහැකුල රජදරුවෝ බුදුන්ට තෙල සැලකොළෝ : 'වහන්ස සන්ථාගාරය සර්වසංස්තරණ කොට අතුරන ලද. ආසනයෝ පනවන ලදහ. දියසැළ එළවා තබන ලදි. තෙල් පහන් නැංවී. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ එයට දැන් කල් දන්නාසේක්ව'යි. එසඳ භාග්‍යවතුන් වහන්සේ සංවිධානයෙන් හැඳ පා සිවුරු ගෙන බික්සඟුන් සමඟ වැඩවදළහ. වැඩ වදරා පා දෙව සන්ථාගාරයට පිවිස මැදුම්ටැඹ ඇසිරි කොට පෙරදිගට මුහුණ ලා වැඩහුන්හු. බික්සඟහු ද සන්ථාගාරයට වැද පැසිම්බිත් ඇසිරි කොට පෙරදිගට මුහුණ ලා බුදුන් මැ පෙරටු කොටගෙන හුන්හු. කිඹුල්වත් වැසි සැහැරජදරුවෝ ද පා දෙවා සන්ථාගාරයට වැද පෙරදිගබිත් ඇසිරි කොට පැළදික් ලූ මුහුණු ඇති වැ බුදුන් මැ පෙරටු කොට හුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් වැසි සැහැරජුන් රෑ බොහෝ වේලෙහි දහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා පහන් කරවා ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමැතූ සේක : 'ආනන්දය, කිඹුල්වත් වැසි සැහැ රජුනට පිළිපන් සෙඛ මහණ (ගැන දෙසන්නට) තොපට වටහාව'යි. මාගේ පිට මඳක් ගිලන් වෙයි. මම් ඒ මඳක් සන්හිඳුවම් යි. වහන්ස, එසේ යයි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. එසඳ බුදුහු සඟළ සිවුගුණ කොට පනවා දකුණු පයෙහි වම්පය හයා තබා සිහි ඇති වැ සම්ප්‍රඥන ඇති වැ උත්ථාන සංඥ මෙනෙහි කොට දකුණැළයෙන් සිංහශය්‍යා කළහ.

Free Distribution www.aathaapi.org

අථ ඛො ආයස්මා ආනන්දො මහානාමං සක්‍යං ආමන්තෙසි. ඉධ මහානාම අරියසාවකො සීලසම්පන්නො හොති. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. භොජනෙ මත්තඤ්ඤූ හොති. ජාගරියං අනුයුත්තො හොති. සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති. චතුන්නං ඣානානං ආභි-චෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

කථඤ්ච මහානාම අරියසාවකො සීලසම්පන්නො හොති: ඉධ මහා-නාම අරියසාවකො සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො මහානාම අරියසාවකො සීලසම්පන්නො හොති.

කථඤ්ච මහානාම අරියසාවකො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති: ඉධ මහානාම අරියසාවකො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා-පෙ-ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධි-කරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො මහානාම අරියසාවකො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

කථඤ්ච මහානාම අරියසාවකො භොජනෙ මත්තඤ්ඤූ හොති: ඉධ මහානාම අරියසාවකො පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා ති. එවං ඛො මහානාම අරියසාවකො භොජනෙ මත්තඤ්ඤූ හොති.

කථඤ්ච මහානාම අරියසාවකො ජාගරියං අනුයුත්තො හොති: ඉධ මහානාම අරියසාවකො දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං ඛො මහානාම අරියසාවකො ජාගරියං අනුයුත්තො හොති.

ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවෝ 'මහානාම' සැහැරජු ඇමතූහ: මහානාමය, මෙ සස්නෙහි ආය්‍ය්‍යී ශ්‍රාවක පිරිපුන් සිල් ඇතියේ වෙයි. ඉඳුරන්හි පියූ දෙර ඇතියේ වෙයි, බොජුනෙහි පමණ දන්නේ වෙයි, නිදි වැරිමෙහි යෙදුණේ වෙයි, (ශ්‍රද්ධාදි) සප්ත සද්ධර්ම යෙන් සමන්වාගත වූයේ වෙයි, අධිචිත්තය ඇසිරු කළ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් රිසිසේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල ව ලබනුයේ වෙයි.

මහානාමය, කිසෙයින් ආය්‍ය්‍යීශ්‍රාවක ශීලසම්පන්න වෙයි යත්: මහානාමය, මෙ සස්නෙහි ආය්‍ය්‍යීශ්‍රාවක සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූයේ ආචාර ගෝචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර වද්‍යයෙහි බිය දක්නාසුලු ව වෙසෙයි, ශික්ෂා කොටසෙහි ඒ ඒ ශික්ෂාපදය දැඩි ව ගෙන හික්මෙයි, මෙසෙයින් මහානාමය, ආය්‍ය්‍යීශ්‍රාවක ශීලසම්පන්න වූයේ වේ.

මහානාමය, කිසෙයින් ආය්‍ය්‍යීශ්‍රාවක ඉඳුරන්හි පියූ දෙර ඇතියේ වෙයි යත් : මහානාමය, මෙ සස්නෙහි ආය්‍ය්‍යීශ්‍රාවක චක්ෂුර්විඥනයෙන් රූප දැක නිමිත්ත විසින් නො ගන්නේ අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වාස කරන තුලුහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඩඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු වෙද් ද, ඒ චක්ෂුරින්ද්‍රියයා ගේ සංවරය පිණිස පිළිපන්නේ වෙයි. චක්ෂුරින්ද්‍රිය රකියි, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙ යි. ශ්‍රොත්‍ර විඥනයෙන් ශබ්ද අසා...... ඝ්‍රාණවිඥන යෙන් ගඳ ආඝ්‍රාණය කොට...... ජිහ්වාවිඥනයෙන් රස විඳ...... කායවිඥනයෙන් ස්ප්‍රෂටව්‍යය ස්පර්ශ කොට...... මනොවිඥනයෙන් ධර්මාලම්බන දැන නිමිත්තග්‍රාහී නො වෙයි, අනුව්‍යඤ්ජනග්‍රාහී නො වෙයි, යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත කොට වාස කරන තුලුහු ලාමක අකුශලධර්ම වූ අභිධ්‍යා දෞර්මනස්‍යයෝ ලුහුබඳනාහු ද ඒ මනින්ද්‍රියයා ගේ සංවරයට පිළිපන්නේ වෙයි, මනින්ද්‍රිය රකී, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මෙසෙයින් මහානාමය, ආය්‍ය්‍යීශ්‍රාවක ඉඳුරන්හි පියූ දෙර ඇත්තේ වෙයි.

මහානාමය. කිසෙයින් ආය්‍ය්‍යීශ්‍රාවක භොජනයෙහි මාත්‍රඥ වෙයි යත් : මහානාමය, මෙසස්නෙහි ආය්‍ය්‍යීශ්‍රාවක නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට ආහාරය ආහරණ කෙරෙයි. කෙළි පිණිස නො මැ වෙයි, මද පිණිස නො වෙයි, සැරසුම් පිණිස නො වෙයි. විභූෂණ පිණිස නො වෙයි. මෙ කය සිටීම පිණිස යැපීම පිණිස වෙහෙස සන්හිඳීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස මතුයෙක් මැ වෙයි. මෙසේ පැරණි බඩගිනි වේදනා නසමි. අලුත් වේදනා නූපදවමි. මා ගේ ජීවිතයාත්‍රා ද අනවද්‍යභාවය ද පහසු විහරණ ද වන්නේ යැ යි. මෙසෙයින් මහානාමය, ආය්‍ය්‍යීශ්‍රාවක භොජනයෙහි මාත්‍රඥ වූයේ වෙයි.

මහානාමය, ආය්‍ය්‍යීශ්‍රාවක කිසෙයින් නිදිවැරිමෙහි යෙදුණේ වෙයි යත් : මහානාමය, මෙ සස්නෙහි ආය්‍ය්‍යීශ්‍රාවක දවස සක්මනින් නිෂද්‍යායෙන් යෙදී නීවරණධර්මයන් ගෙන් සිත පිරිසිදු කෙරෙයි. රාත්‍රියෙහි ප්‍රථම යාමය සක්මනින් නිෂද්‍යායෙන් යෙදී ආවරණීය ධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. රාත්‍රියෙහි මධ්‍යම යාමය දකුණුපයෙහි වම්පය මඳක් ඇද තබා සිහි නුවණ ඇති ව උත්ථානසංඥ මෙනෙහි කොට දකුණැළයෙන් සිංහ ශය්‍යා කෙරෙයි. රාත්‍රියෙහි පශ්චිම යාමය නැඟී සිට සක්මනින් නිෂද්‍යායෙන් ආවරණීය ධර්මයන් කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. මෙසෙයින් මහානාමය, ආය්‍ය්‍යීශ්‍රාවක නිදිවැරි මෙහි යෙදුණේ වෙයි.

කථඤ්ච මහානාම අරියසාවකො සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති: ඉධ මහානාම අරියසාවකො සද්ධො හොති. සද්දහති තථාගතස්ස බොධිං. "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. හිරිමා හොති. හිරීයති කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඔත්තාපී හොති, ඔත්තප්පති[1] කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො. චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. එවං ඛො මහානාම අරියසාවකො සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති.

කථඤ්ච මහානාම අරියසාවකො චතුන්නං ඣානානං ආභිචෙතසිකානං[3] දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ඉධ මහානාම අරියසාවකො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං-පෙ-තතියං ඣානං-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො මහානාම අරියසාවකො චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

යතො ඛො මහානාම අරියසාවකො එවං සීලසම්පන්නො හොති. එවං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. එවං භොජනෙ මත්තඤ්ඤූ හොති, එවං ජාගරියං අනුයුත්තො හොති. එවං සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති. එවං චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම සුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී, අකසිරලාභී. අයං වුච්චති මහානාම අරියසාවකො සෙඛො පාටිපදො[4] අපුච්චණ්ඩතාය සමාපන්නො භබ්බො අභිනිබ්භිදාය භබ්බො සම්බොධාය භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය.

---

1. ඔත්තපති - සීමු, ස්‍යා.
2. ධාතා-මජසං.
3. අභිචෙතසිකානං-සීමු.
4. පටිපදෙ-ස්‍යා.

මහානාමය, කිසෙයින් ආර්‍යශ්‍රාවක සප්ත සද්ධර්මයෙන් සමන්වාගත වෙයි යත්: මහානාමය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක ශ්‍රද්ධා ඇතියේ වෙයි. ඒ භාග්‍යවත්හු මෙ කරුණෙන් අර්හත් වූහ. සම්‍යක් සම්බුද්ධයහ. අෂ්ටවිද්‍යායෙන් පසළොස් චරණ ධර්මයෙන් සමන්වාගතයහ, සුගත වූහ, ලෝකවිද් වූහ, අනුත්තර වූ පුරුෂදම්‍යසාරථි වූහ, දේවමනුෂ්‍යයනට ශාස්තෘ වූහ, බුද්ධ වූහ, භගවත් වූහ යි තථාගතයන් වහන්සේ ගේ බුද්ධත්වය හදහයි. පාපයෙහි ජුගුප්සා ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිත යෙන් මනොදුශ්චරිතයෙන් ලජ්ජා ඇති වෙයි. ලාමක අකුශල ධර්මයන්ගේ පැමිණීමෙන් ලජ්ජා ඇති වෙයි. අපත්‍රපා ඇතියේ වෙයි. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනො දුශ්චරිතයෙන් බියපත් වෙයි. ලාමක අකුශල ධර්මයන්ගේ පැමිණීමෙන් බියපත් වෙයි. බහුශ්‍රැත වූයේ ශ්‍රැතය ධරනුයේ ශ්‍රැත සන්නිචය වූයේ වෙයි. ආදිකල්‍යාණ වූ මධ්‍ය-කල්‍යාණ වූ පර්‍යවසාන කල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ යම් ධර්ම කෙනෙක් කේවල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ මාර්ග බ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙත් ද එ බඳු වූ ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දහු වෙති. ධරන ලද්දහු වචනයෙන් පුරුදු කරන ලද්දහු සිතින් විමසන ලද්දහු නුවණින් මොනොවට පිළිවිදුනා ලද්දහු වෙති. අකුශල ධර්මයන් ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභය පිණිස දැඩි වැ ගත් වීර්‍යය ඇත්තේ වෙයි. කුශල ධර්මයන්හි වීර්‍යස්ථාමයෙන් යුක්ත වූයේ ස්ථිර පරාක්‍රම ඇතියේ නො තැබූ වීර්‍යධුර ඇතියේ වෙයි. ස්මෘතිමත් වූයේ උතුම් වූ ස්මෘතියෙන් හා ප්‍රඥයෙන් හා සමන්වාගත වෙයි. පෙර කළ දෑ ද පෙර කියූ දෑ ද සිහි කරනුයේ පුනපුනා සිහි කරනුයේ වෙයි. උදයව්‍යය ප්‍රතිවෙධ කිරීමට සමර්ථ ප්‍රඥයෙන් සමන්වාගත වූයේ ආර්‍ය වූ නිර් වෙධක වූ මොනොවට දුක් කෙළවර කිරීම පිණිස පවත්නා ප්‍රඥයෙන් ප්‍රඥ ඇතියේ වෙයි. මහානාමය, මෙසෙයින් ආර්‍යශ්‍රාවක සප්ත සද්ධර්මයෙන් සමන්වාගත වූයේ වෙයි.

මහානාමය, කිසෙයින් ආර්‍යශ්‍රාවක ආභිචෙතසික වූ ඉහාත්ම සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැති සේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල වැ ලබනුයේ වෙයි යත්: මහානාමය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක කාමච්ඡන්දයෙන් වෙන් වැ අකුශල ධර්මයන් ගෙන් වෙන් වැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානය උපයා වෙසෙයි. විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානය . . . තෘතීයධ්‍යානය . . . චතුර්ථධ්‍යානය උපයා වෙසෙයි. මහානාමය, මෙසෙයින් ආර්‍යශ්‍රාවක අභිචිත්තයෙහි උපන් ඉහාත්ම සුඛ විහරණ ඇති සතර ධ්‍යානයන් රිසි සේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල වැ ලබනුයේ වෙයි.

මහානාමය, යම් තැනෙක පටන් ආර්‍යශ්‍රාවක මෙසේ ශීල සම්පන්න වේ ද, මෙසේ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර වේ ද, මෙසේ භෝජනයෙහි මාත්‍රඥ වේ ද, මෙසේ නිදිවැරීමෙහි යෙදුණේ වේ ද, මෙසේ සප්ත සද්ධර්මයෙන් සමන්වාගත වේ ද, මෙසේ අභිචිත්තය ඇසුරු කළ ඉහාත්ම සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැති සේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල වැ ලබනුයේ වේ ද, මහානාමය, මේ ආර්‍යශ්‍රාවක ශෛක්ෂ්‍ය ප්‍රතිපත් ඇත්තේ යැ, කුණු නො වූ බිජුවට ඇති බවට පිළිපන්නේ ය. ඥනප්‍රභේදයට භව්‍ය යැ ආර්‍යමාර්ගයට භව්‍ය යැ අර්හත්ත්වප්‍රාප්තියට භව්‍ය යැ යි කියනු ලැබේ.

සෙය්‍යථාපි මහානාම කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා සම්මා අධිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි, කිඤ්චාපි තස්සා කුක්කුටියා න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වතිමෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යුං'න්ති. අථ ඛො භබ්බාව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං. එවමෙව ඛො මහානාම යතො අරියසාවකො එවං සීලසම්පන්නො හොති, එවං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති, එවං භොජනෙ මත්තඤ්ඤු හොති, එවං ජාගරියං අනුයුත්තො හොති, එවං සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති, එවං චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. අයං වුච්චති මහානාම අරියසාවකො සෙඛො පාටිපදො අපුච්චණ්ඩතාය සමාපන්නො භබ්බො අභිනිබ්භිදාය භබ්බො සම්බොධාය භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය.

ස ඛො සො මහානාම අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො-පෙ-ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. අයමස්ස පඨමා'භිනිබ්භිදා හොති කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

ස ඛො සො මහානාම අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ-පෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති. අයමස්ස දුතියා'භිනිබ්භිදා හොති කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

ස ඛො සො මහානාම අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයමස්ස තතියා'භිනිබ්භිදා හොති කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

යම්පි ඛො[1] මහානාම අරියසාවකො සීලසම්පන්නො හොති, ඉදම්පිස්ස හොති චරණස්මිං. යම්පි මහානාම අරියසාවකො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති ඉදම්පිස්ස හොති චරණස්මිං. යම්පි මහානාම අරියසාවකො භොජනෙ මත්තඤ්ඤු හොති ඉදම්පිස්ස හොති චරණස්මිං. යම්පි මහානාම අරියසාවකො ජාගරියං අනුයුත්තො හොති ඉදම්පිස්ස හොති චරණස්මිං. යම්පි මහානාම අරියසාවකො සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො හොති, ඉදම්පිස්ස හොති චරණස්මිං. යම්පි මහානාම අරියසාවකො චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ඉදම්පිස්ස හොති චරණස්මිං.

1. යම්පි-මජසං, ස්‍යා.

යම්සේ මහානාමය, කිකිළියගේ බිජුවට අටෙක් හෝ දසයෙක් හෝ දොළොසෙක් හෝ වේ ද, ඒ බිජුවටහු, කිකිළිය විසින් (අධිශයනයෙන්) මොනොවට රක්නා ලද්දාහු, මොනොවට හුණු ගන්වන ලද්දාහු, මොනොවට පරිභාවනා කරන ලද්දාහු වෙත් ද, එතෙකුදු වත් ඒ කිකිළියට මෙවන් ඉච්ඡායෙක් නූපදනේ යැ : ' මේ කුකුළු පොව්වෝ පානියඅගින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළාගෙන සුවසේ පිටතට නික්මෙන්නාහු නම් මැනැවැ'යි ඉච්ඡායෙක් නූපදනේ යැ. වැළිත් ඒ කුකුළුපොව්වෝ පානියඅගින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළාගෙන සුවසේ බැහැර නික්මෙන්නට භව්‍ය මැ වෙති. එසෙයින් මැ මහානාමය, යම් තැනෙක පටන් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සිල්සපන් වේ ද, මෙසේ ඉඳුරන්හි පියූ දොර ඇති වේ ද, මෙසේ භෝජනයෙහි මාත්‍රඥ වේ ද, මෙසේ නිදිවැරීමෙහි යෙදුණේ වේ ද, මෙසේ සප්ත සද්ධර්මයෙන් සමන්වාගත වේ ද, මෙසේ අභිචිත්තය අයිරූ කළ ඉහාත්මසුඛවිහරණ ඇති චතුර්ධ්‍යානයන් රිසිසේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල වැ ලබනුයේ වේ ද, මහානාමය, මේ ආර්‍ය්‍යශ්‍රාවක ශෛක්‍ෂ්‍යප්‍රතිපද ඇත්තේ යැ, අපූත්‍යණ්ඩභාවයට පැමිණියේ යැ, ඥානප්‍රභේදයට භව්‍ය යැ, ආර්‍ය්‍යමාර්ගාවබෝධයට භව්‍ය යැ, අනුත්තර යෝගක්ෂේමයා ගේ අධිගමයට භව්‍ය යි කියනු ලැබේ.

මහානාමය, තෙල ආර්‍ය්‍යශ්‍රාවක මෙ මැ අනුත්තර වූ උපෙක්ෂාස්මෘතිපාරිශුද්ධියට පැමිණ අනෙකප්‍රකාර වූ පූර්වනිවාසය සිහි කෙරෙයි. ඒ මෙසේ යැ : එක් ජාතියකුදු දෙජාතියකුදු... මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකප්‍රකාර පූර්වනිවාසය සිහි කෙරෙයි. අණ්ඩකොෂයෙන් කුකුළුපැටවා ගේ මෙන් මේ ඔහුගේ පළමුවන ඥාන ප්‍රභෙදය වෙයි.

මහානාමය, ඒ තෙල ආර්‍ය්‍යශ්‍රාවක මෙ මැ අනුත්තර වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධියට පැමිණ විශුද්ධ වූ මිනිසැස ඉක්මැයිටි දිව්‍ය චක්‍ෂුයින් ච්‍යවමාන උපපද්‍යමාන හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගතිගත දුර්ගතිගත සත්ත්වයන් දකී, ... කම් වූ පරිදි පැමිණි සත්ත්වයන් දැනගනී. අණ්ඩකෝෂයෙන් කුකුළුපැටවක්හුගේ සෙයින් මේ ඔහුගේ දෙවැනි ඥානප්‍රභේදය වෙයි.

මහානාමය, ඒ තෙල ආර්‍ය්‍යශ්‍රාවක මෙ මැ අනුත්තර වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධියට පැමිණ ආශ්‍රවයන්ගේ ක්‍ෂයවීමෙන් අනාශ්‍රව වූ ඵලසමාධිය ඵලප්‍රඥාව ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙයි. අණ්ඩකෝෂයෙන් කුකුළු පැටවක්හුගේ (නික්මීම) සෙයින් මේ ඔහුගේ තුන්වැනි ඥානප්‍රභේදය වෙයි.

මහානාමය, යම්හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක ශීලසම්පන්න වේ ද, මෙ ද ඔහුට චරණ නම් වෙයි. මහානාමය, යම්හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර වේ ද, මෙ ද ඔහුට චරණ නම් වෙයි. මහානාමය, යම් හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක භෝජනයෙහි මාත්‍රඥ වේ ද, මෙ ද ඔහුට චරණ නම් වෙයි. මහානාමය, යම්හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක නිදිවැරීමෙහි යෙදුණේ වේ ද, මෙ ද ඔහුට චරණ නම් වෙයි. මහානාමය, යම් හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක සප්ත සද්ධර්මයෙන් සමන්වාගත වේ ද, මෙ ද ඔහුට චරණ නම් වෙයි. මහානාමය, යම්හෙයෙකින් ආර්‍ය්‍යශ්‍රාවක ආභිචෙතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ චතුර්ධ්‍යානයන් රිසිසේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල වැ ලබනුයේ වේ ද මෙ ද ඔහුට චරණ නම් වේ.

යම්පි ඛො මහානාම අරියසාවකො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො-පෙ-ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පිස්ස හොති විජ්ජාය. යම්පි මහානාම අරියසාවකො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පිස්ස හොති විජ්ජාය. යම්පි මහානාම අරියසාවකො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඉදම්පිස්ස හොති විජ්ජාය. අයං වුච්චති මහානාම අරියසාවකො විජ්ජාසම්පන්නො ඉතිපි, චරණසම්පන්නො ඉතිපි, විජ්ජාචරණසම්පන්නො ඉතිපි. බ්‍රහ්මුනා ඛො පනෙසා[1] මහානාම සනඞ්කුමාරෙන ගාථා භාසිතා.

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙ'ති.

සා ඛො පනෙසා මහානාම බ්‍රහ්මුනා සනඞ්කුමාරෙන ගාථා සුගීතා න දුග්ගීතා, සුභාසිතා න දුබ්භාසිතා, අත්ථසංහිතා නො අනත්ථසංහිතා අනුමතා භගවතාති.

අථ ඛො භගවා උට්ඨහිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: සාධු සාධු ආනන්ද, සාධු ඛො ත්වං ආනන්ද කාපිලවත්ථවානං සක්‍යානං සෙඛං පාටිපදං අභාසීති.

ඉදමවොචායස්මා ආනන්දො. සමනුඤ්ඤො සත්ථා අහොසි. අත්තමනා කාපිලවත්ථවා සක්‍යා ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දු'න්ති.

සෙඛසුත්තං තතියං.

---

1. බ්‍රහ්මුනා පෙසා-මජසං, සහ්‍යා.

මහානාමය, යම්හෙයෙකින් ආර්‍යශ්‍රාවක අනේකවිධ වූ පූර්වනිවාසය සිහි කෙරේ ද ඒ මෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු ... මෙසෙයින් ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනේක විධ පූර්වනිවාසය නුවණින් සිහි කෙරෙයි. මෙද ඔහුට විද්‍යා වෙයි. මහානාමය, යම්හෙයෙකින් ආර්‍යශ්‍රාවක විශුද්ධ වූ මිනිසැස ඉක්මැසිටි දිවැසින් ච්‍යවමාන උපපද්‍යමාන හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගතිගත දුර්ගතිගත වූ ද සත්ත්වයන් දක්නේ වේ ද, කම් වූ පරිදි මියගිය සත්ත්වයන් දන්නේ වේ ද, මෙ ද ඔහුට විද්‍යා වෙයි. මහානාමය, යම්හෙයෙකින් ආර්‍යශ්‍රාවක ආස්‍රවක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චේතෝවිමුක්ති ප්‍රඥා විමුක්ති ඉහාත්මයෙහි මැ තෙමේ මැ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට උපයා විහරණ කෙරේ ද, මෙ ද ඔහුට විද්‍යා වේ. මහානාමය, මෙ ආර්‍යශ්‍රාවක විද්‍යා සම්පන්න යයි ද කියනු ලැබේ. මහානාමය, සනත්කුමාර මහබඹු විසින් මෙල ගාථා කියන ලදු :

"යම් ජන කෙනෙක් (ජනිත) ප්‍රජායෙහි (කසුබු ආදි) ගොත් සිහිකරනසුලු වෙත් ද, ඔවුන් කෙරෙහි ක්‍ෂත්‍රිය ශ්‍රේෂ්ඨ වෙයි. විද්‍යාචරණ සම්පන්න වූ යමෙක් ඇද්ද, දේව-මනුෂ්‍යයන් කෙරෙහි හේ ශ්‍රේෂ්ඨ වේ.

මහානාමය, සනත්කුමාර මහබ්‍රහ්ම විසින් මෙල ගාථාව මොනවට ගයන ලදු, දුර්ගීත නො වෙයි. සුභාෂිත වෙයි, දුර්භාෂිත නො වෙයි, අර්ථ සංහිත වෙයි, අනර්ථ සංහිත නො වෙයි, භගවත්හු විසිනුදු අනුමත යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැඟී ආයුෂ්මත් අනඳ තෙරණුවන් ඇමතූ සේක : ආනන්දය, මැනැව මැනැව. ආනන්දය, තෙපි කපිලවාස්තු වාසාවාස්‍ය වූ සැහැකුලනට ශෛක්‍ෂ්‍ය ප්‍රතිපද කීවහු යයි.

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මෙ සුත් දෙසූ හ. ශාස්තෲන් වහන්සේ අනුදත් සේක. (ප්‍රීතිසෞමනස්‍යයන් විසින්) ගත් සිත් ඇති කිඹුල්වත් වැසි සැහැකුලයෝ ආයුෂ්මත් අනඳ තෙරණුවන්ගේ භාෂිතය අභිනන්දනා කළහ.

තෙවැනි සෙඛ සූත්‍ර යි.

2. 1. 4

පොතලිය සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා අඞ්ගුත්තරාපෙසු විහරති ආපණං නාම අඞ්ගුත්තරාපානං නිගමො. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ආපණං පිණ්ඩාය පාවිසි. ආපණෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙනඤ්ඤතරො වනසණ්ඩො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා[1] අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.[2]

පොතලියොපි ඛො ගහපති සම්පන්නනිවාසනපාපුරණො[3] ඡත්තුපාහනාහි ජඞ්ඝාවිහාරං අනුවිචරමානො අනුචඞ්කමමානො යෙන සො වනසණ්ඩො තෙනුපසඞ්කමි. තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො පොතලියං ගහපතිං භගවා එතදවොච: 'සංවිජ්ජන්තෙ[4] ඛො ගහපති ආසනානි සචෙ ආකඞ්ඛසි නිසීද'ති. එවං වුත්තෙ පොතලියො ගහපති 'ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදාචරතී'ති කුපිතො අනත්තමනො තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා පොතලියං ගහපතිං එතදවොච 'සංවිජ්ජන්තෙ[4] ඛො ගහපති ආසනානි, සචෙ ආකඞ්ඛසි නිසීද'ති. දුතියම්පි ඛො පොතලියො ගහපති 'ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදාචරතී'ති කුපිතො අනත්තමනො තුණ්හී අහොසි. තතියම්පි ඛො භගවා පොතලියං ගහපතිං එතදවොච: 'සංවිජ්ජන්තෙ ඛො ගහපති ආසනානි, සචෙ ආකඞ්ඛසි නිසීද'ති. එවං වුත්තෙ පොතලියො ගහපති 'ගහපතිවාදෙන මං සමණො ගොතමො සමුදාචරතී'ති කුපිතො අනත්තමනො භගවන්තං එතදවොච: 'තයිදං භො ගොතම නච්ඡන්නං, තයිදං නප්පතිරූපං, යං මං ත්වං ගහපතිවාදෙන සමුදාචරසී'ති.

තෙ හි තෙ ගහපති ආකාරා තෙ ලිඞ්ගා තෙ නිමිත්තා යථා තං ගහපතිස්සාති. තථා හි පන මෙ භො ගොතම සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා, සබ්බෙ වොහාරා සමුච්ඡින්නාති. 'යථා කථං පන තෙ ගහපති සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා, සබ්බෙ වොහාරා සමුච්ඡින්නා'ති. 'ඉධ මෙ භො ගොතම යං අහොසි ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා සබ්බං තං පුත්තානං දායජ්ජං නිය්‍යාතං, තත්ථාහං අනොවාදී අනුපවාදී ඝාසච්ඡාදනපරමො විහරාමි. එවං ඛො මෙ භො ගොතම සබ්බෙ කම්මන්තා පටික්ඛිත්තා සබ්බෙ වොහාරා සමුච්ඡින්නා'ති.

---

1. අජ්ඣොගාහෙත්වා – මජසං.
අජ්ඣොගාහිත්වා – PTS.
2. රුක්ඛමූලෙ නිසීදි – PTS.
3. පාවුරණෙ – ම.
4. සංවිජ්ජන්ති – මජසං, ස්‍යා.

Free Distribution www.aathaapi.org

2. 1. 4
පෝතලිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අඞ්ගුත්තරාප ජනපදයෙහි ආපණ නම් අඞ්ගුත්තරාප නිගමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන ආපණයට පිඩු පිණිස පිවිසිසේක. ආපණයෙහි පිඩු සිහා වැඩ පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළැකුණාහු දිවා විහරණ සඳහා එක්තරා වන ලැහැබක් කරා එළැඹි සේක. ඒ වන ලැහැබට ඇතුළු වැ අන්‍යතර වෘක්ෂ මූලයෙක්හි දිවාවිහරණයට වැඩහුන්සේක.

පෝතලිය නම් ගැහැවි ද පිරිපුන් හඳනා පොරොනා ඇතියේ සතක් ගෙන වහන් නැඟී ජඞ්ඝාවිහරණයෙහි ඔබිනොබැ හැසිරෙනුයේ සක්මන් කරනුයේ ඒ වනලැහැබ කරා එළැඹියේ යැ. ඒ වන ලැහැබට ඇතුළු වැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියැයුතු සිහිකළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ සිටියේ ය. එකත්පස් වැ සිටි පෝතලිය ගැහැවි හට බුදුහු තෙල වදළහ : " ගැහැවිය අසුන් ඇත. ඉදින් රිසියෙහි නම් හිඳුව "යි මෙසේ වදළ කල්හි පෝතලිය ගැහැවි ' ශ්‍රමණ ගෞතමයෝ මට ' ගහපති ' යන බසින් වහරති ' කිපියේ නො සතුටු වූයේ තුෂ්ණීම්භූත වී. දෙවනවට ද භාග්‍යවත්හු පෝතලිය ගෘහපති හට තෙල වදළහ. : ' ගැහැවිය, අසුන් ඇත. ඉදින් රිසියෙහි නම් හිඳුව'යි දෙවනවට ද පෝතලිය ගැහැවි ශ්‍රමණ ගෞතමයෝ මා ' ගහපති ' යන බසින් වහරති ' කිපියේ නො සතුටු වූයේ තුෂ්ණීම්භූත වී. තෙවනවට ද භාග්‍යවත්හු පෝතලිය ගෘහපති හට තෙල වදළහ : ' ගැහැවිය ' අසුන් ඇත, ඉදින් කැමැත හිඳුව 'යි. මෙසේ වදළ කල්හි පෝතලිය ගැහැවි ශ්‍රමණ ගෞතමයෝ මා ' ගහපති ' යන බසින් වහරති ' කිපියේ නො සතුටු වූයේ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ' භවත් ගෞතමයෙනි, යම් හෙයෙකින් තෙපි මට ' ගහපති ' යන බසින් ව්‍යවහාර කරහු ද, එ බස් නො නිස්ස. එ බස් නො සරුප්යැ'යි

ගැහැවිය, තොපගේ ඒ ආකාරයෝ ඒ ලිඞ්ගයෝ ඒ නිමිත්තයෝ ගැහැවියක්හු ගේ යම් සේ ද එමෙනි. එසේ වතුදු භවත් ගෞතමයෙනි, මා විසින් හැම කර්මාන්තයෝ බහා තබන ලදහ. හැම ව්‍යවහාරයෝ සමුච්ඡින්න වූහ'යි. ගැහැවිය, තොප විසින් කවරපරිද්දෙකින් සියලු කර්මාන්තයෝ ප්‍රතික්ෂිප්ත වූවාහු සියලු ව්‍යවහාරයෝ සමුච්ඡින්න වූවාහු ද'යි. ' භවත් ගෞතමයෙනි, මෙහි මට යම් ධනයෙක් හෝ ධාන්‍යයෙක් හෝ රජතයෙක් හෝ ජාත රූපයෙක් හෝ වී ද, ඒ හැම පුතුනට දායාද කොට දෙනලද, එහි මම අවවාද නො කරනුයෙම් උපවාද නො කරනුයෙම් අසන වසන (කෑම් හැඳීම්) මතුවක් පරම කොට ඇතියෙම් වෙසෙමි. භවත් ගෞතමයෙනි, මෙසේ මා විසින් සියලු කර්මාන්තයෝ ප්‍රතික්ෂිප්තයහ. සියලු ව්‍යවහාරයෝ සමුච්ඡින්න වූහ'යි.

අඤ්ඤථා ඛො ත්වං ගහපති වොහාරසමුච්ඡෙදං වදෙසි[1] අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොතී'ති. යථා කථං පන භන්තෙ අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොති. සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු. යථා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදො හොතී'ති. තෙන හි ගහපති සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පොතලියො ගහපති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච;

අට්ඨ ඛො ඉමෙ ගහපති ධම්මා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්ති. කතමෙ අට්ඨ: අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බො, දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බං, සච්චං වාචං[2] නිස්සාය මුසාවාදො පහාතබ්බො, අපිසුණං වාචං නිස්සාය පිසුණා වාචා පහාතබ්බා, අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බො, අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බො, අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බො, අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බො. ඉමෙ ඛො ගහපති අට්ඨ ධම්මා සංඛිත්තෙන වුත්තා විත්ථාරෙන අවිභත්තා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්තී'ති.

යෙමෙ[3] භන්තෙ භගවතා අට්ඨ ධම්මා සංඛිත්තෙන වුත්තා විත්ථාරෙන අවිභත්තා අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්ති. සාධු මෙ භන්තෙ භගවා ඉමෙ අට්ඨ ධම්මෙ විත්ථාරෙන විභජතු අනුකම්පං උපාදායාති. තෙන හි ගහපති සුණාහි සාධුකං මනසිකරොහි. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පොතලියො ගහපති භගවතො පච්චස්සොසි භගවා එතදවොච:

'අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු පාණාතිපාතී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො; අහඤ්චෙව ඛො පන පාණාතිපාතී අස්සං අත්තාපි මං උපවදෙය්‍ය පාණාතිපාතපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං පාණාතිපාතපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා පාණාතිපාතපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං පාණාතිපාතො, යෙ ච පාණාතිපාතපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, පාණාතිපාතා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'අපාණාතිපාතං නිස්සාය පාණාතිපාතො පහාතබ්බො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බ'න්ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු අදින්නාදායී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො අහඤ්චෙව ඛො පන අදින්නාදායී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය අදින්නාදානපච්චයා.

1. වදසි - සිමු. 2. සච්චවාචං - මජ්සං. 3. යෙමෙ පන - ස්‍යා.

'ගැහැවිය, තෙපි අන් පරිද්දෙකින් ව්‍යවහාර සමුච්ඡේදය කියහු, එතෙකුදු වත් ආර්‍යවිනයෙහි අන් පරිද්දෙකින් ව්‍යවහාර සමුච්ඡේදය වේ යැ'යි. 'වහන්ස, ආර්‍ය විනයෙහි කිසෙයින් ව්‍යවහාර සමුච්ඡේදය වේ ද ? මැනැවැ වහන්ස, යම්පරිදි ආර්‍ය විනයෙහි ව්‍යවහාරසමුච්ඡේදය වේ නම්, මට භාග්‍යවත්හු එපරිදි දහම් දෙසනසේක්ව'යි. එහෙයින් ගැහැවිය, අසව, මනාකොට මෙනෙහි කරව, කියමි'යි. 'එසේ යැ, වහන්සැ'යි පොතලිය ගෘහපති භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දින. භාග්‍යවත්හු තෙල වදළසේක.

ගැහැවිය, මේ අට දහම් කෙනෙක් ආර්‍යවිනයෙහි ව්‍යවහාර සමුච්ඡේදය පිණිස පවත්නාහ. කවර අටදෙනෙක යත් : ප්‍රාණවධ නො කරනු නිසා ප්‍රාණඝාතය හළයුතු යැ, දුන් දැ ගැනීම නිසා අයිනාදන් හළයුතු යැ, සබවස නිසා මුසවා හළයුතු යැ, නො පිසුනුබස් නිසා පිසුනු බස් හළයුතු යැ, අගිද්ධිලොභය නිසා ගෙධසංඛ්‍යාතලොභය හළයුතු යැ, අනින්දරොසය නිසා නින්ද ගැරීම හළයුතු යැ, අකොධූපායාසය නිසා ක්‍රොධ උපායාස හළයුතු යැ, අනතිමානය නිසා අතිමානය හළයුතු යැ. ගැහැවිය, (මා විසින්) සැකෙවින් කියන ලද විස්තර විසින් විභාග නො කළ මේ අටදහම්හු ආර්‍යවිනයෙහි ව්‍යවහාර-සමුච්ඡේදය පිණිස පවත්නාහ'යි.

වහන්ස, භගවත්හු විසින් සැකෙවින් වදරනලද විස්තරයෙන් විභාග නො කළ යම් අෂ්ටධර්ම කෙනෙක් ආර්‍යවිනයෙහි ව්‍යවහාරසමුච්ඡේදය පිණිස පවත්නාහු ද, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මේ අෂ්ට ධර්ම විස්තර විසින් අනුකම්පා පිණිස විභාග කරනසේක්ව'යි. ගැහැවිය, එසේ වී නම් අසව, මොනොවට මෙනෙහි කරව. කියන්නෙමි'යි. 'එසේ යැ වහන්සැ'යි පොතලිය ගෘහපති භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්විය. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක.

'ප්‍රාණවධ නො කරනු නිසා ප්‍රාණඝාතය හළයුතු' යයි මෙසේ තෙල කියනලද. මේ කුමක් පිණිස කියනලද ද යත් : ගැහැවිය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : "මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට 'පාණාතිපාතී' වෙම් නම් මම් ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡේදය පිණිස පිළිපන්මි. මම් වැළිත් පාණාතිපාතී වෙම් නම් තෙමේත් මට ප්‍රාණවධ හේතුයෙන් නුගුණ කියන්නේ යැ. නුවණැත්තාහු දැන ප්‍රාණවධ හේතුයෙන් නිගා කරන්නාහු යැ. ප්‍රාණවධ හේතුයෙන් කාබුන් මරණින් මතු දුගතිය කැමැති වියයුත්තී යැ. යළි යම් ප්‍රාණවධයෙක් වේ ද මෙය මැ සංයෝජන යැ. මෙය නිවරණ යි. ප්‍රාණඝාත ප්‍රත්‍යයෙන් දුඃඛපරිදාහ ඇති යම් ආශ්‍රව කෙනෙක් උපදනාහු නම් ප්‍රාණඝාතයෙන් වෙන් වූවහුට මෙසේ ඒ විඝාතපරිදාහ වූ ආශ්‍රවයෝ නො වෙති. 'ප්‍රාණවධ නො කරනු නිසා ප්‍රාණවධ හළයුතු' යයි මෙසේ යමක් කියනලද නම් මෙය තෙල සඳහා කියනලදි.

'දුන් දැය ගනු නිසා අයිනාදන් හළයුතු'යයි මෙසේ තෙල කියනලද. තෙල කුමක් සඳහා කියනලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට 'අදින්නාදයී' වෙම් නම් මම් ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡේදය පිණිස පිළිපන්මි. මම් වැළිත් අදින්නාදයී වෙම් නම් අදින්නාදන

අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං අදින්නාදානපච්චයා. කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා අදින්නාදානපච්චයා. එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං අදින්නාදානං, යෙ ච අදින්නාදානපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අදින්නාදානා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'දින්නාදානං නිස්සාය අදින්නාදානං පහාතබ්බ'න්ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'සච්චං[1] වාචං නිස්සාය මුසාවාදො පහාතබ්බො'ති ඉති බො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං බො අහං සංයොජනානං හෙතු මුසාවාදී අස්සං. තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව බො පන මුසාවාදී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය මුසාවාදපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං මුසාවාදපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා මුසාවාදපච්චයා. එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං මුසාවාදො, යෙ ච මුසාවාදපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. මුසාවාදා පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'සච්චං වාචං නිස්සාය මුසාවාදො පහාතබ්බො'ති ඉති යං තං, වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

'අපිසුනං වාචං නිස්සාය පිසුනා වාචා පහාතබ්බා'ති ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං බො අහං සංයොජනානං හෙතු පිසුනාවාචො අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො අහඤ්චෙව බො පන පිසුනාවාචො අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය පිසුනා වාචපච්චයා[2], අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං පිසුනාවාචපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා පිසුනාවාචපච්චයා[2]. එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං පිසුනා වාචා, යෙ ච පිසුනාවාචපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා පිසුනා වාචා[3] පටිවිරතස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'අපිසුනං වාචං නිස්සාය පිසුනා වාචා පහාතබ්බා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බො'ති ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං බො අහං සංයොජනානං හෙතු ගිද්ධිලොභී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො අහඤ්චෙව බො පන ගිද්ධිලොභී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය ගිද්ධිලොභපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං ගිද්ධිලොභපච්චයා'කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා ගිද්ධිලොභපච්චයා එතදෙව බො පන සංයොජනං එතං නීවරණං යදිදං ගිද්ධිලොභො, යෙ ච ගිද්ධිලොභපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අගිද්ධිලොභිස්ස[4] එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'අගිද්ධිලොභං නිස්සාය ගිද්ධිලොභො පහාතබ්බො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. සච්චවාචං - මජසං 2. පිසුණාවාචා පච්චයා - PTS.
3. පිසුණාය වාචාය - PTS.
4. ගිද්ධිලොභා පටිවිරතස්ස-මජසං.

ප්‍රත්‍යයෙන් තෙමේත් මට දෙස් කියන්නේ යැ. නුවණැත්තාහු දැන අදින්නාදාන ප්‍රත්‍යයෙන් නිගා කරන්නාහ. අදින්නාදාන ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු දුගතිය කැමැති වියයුත්තී යැ. යළි යම් අදින්නාදානයෙක් ඇද්ද මෙය මැ සංයෝජන යැ. මෙ නීවරණ යි. අදින්නාදාන ප්‍රත්‍යයෙන් දුක්තැවුලි උපදවන යම් ආස්‍රව කෙනෙක් උපදනාහු නම් අදින්නාදානයෙන් වෙන් වූවහුට මෙසේ ඒ දුක්තැවුලි උපදවන ඒ ආස්‍රවයෝ නො වෙත්, 'දුන් දෑය ගනු නිසා අයිනාදන් හළයුතු' යයි මෙසේ යමක් කියනලද ද මේ තෙල සඳහා කියනලදි.

'සබවස නිසා මුසවා හළයුතු'යයි මෙසේ තෙල කියනලද. තෙල කුමක් සඳහා කියන ලද යැ යත් : 'ගැහැවිය' මෙ සස්නෙහි ආයර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම යම් සංයෝජන කෙනකුන් හේතු කොට 'මුසාවාදී' වෙම් නම් මම ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡේදය පිණිස පිළිපන්මි. මම් වැළිත් මුසාවාදී වෙම් නම් මුසවා හේතුයෙන් තෙමේත් මට දෙස් කියන්නේ යැ. මුසවා හේතුයෙන් විඥයෝ දැන නිගා කරන්නාහ. මුසවා හේතුයෙන් කාබුන් මරණින් මතු දුගතිය කැමැති වියයුත්තී යැ. යළි යම් මුසවායෙක් ඇද්ද මෙය මැ සංයෝජන යැ. මෙ නීවරණ යි. මුසාවාද ප්‍රත්‍යයෙන් විඝාත පරිදහකර යම් ආස්‍රව කෙනෙක් උපදනාහු නම් මුසාවාදයෙන් වෙන් වූවහුට මෙසේ ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත් 'සබවස නිසා මුසවා හළයුතු'' යයි මෙසේ යම් කරුණක් කියනලද ද මේ තෙල සඳහා කියනලදී.

'නො පිසුනුබස් නිසා පිසුනුබස් හළයුතු' යයි මෙසේ තෙල කියනලද. තෙල කුමක් සඳහා කියනලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආයර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට පිසුනුබස් ඇතියෙම් වීම් ද මම් ඒ සංයෝජනයන් ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡේදය පිණිස පිළිපන්මි. යළිදු මම පිසුනුබස් ඇතියෙම් නම් පිසුනුබස් හේතුයෙන් තෙමේත් මට දෙස් කියන්නේ යැ. විඥයෝ දැන පිසුනුබස් හේතුයෙන් ගරහන්නාහු යැ. පිසුනුබස් හේතුයෙන් කාබුන් මරණින් මතු දුර්ගති කැමැති වියයුත්තී යැ. යළි යම්, පිසුනුබසෙක් ඇද්ද. මෙය මැ සංයෝජන යැ. මේ නීවරණ යි. පිසුනුබස් හෙතුයෙන් විඝාතපරිළාහකර වූ යම් ආස්‍රව කෙනෙක් උපදනාහු නම් පිසුනු බසින් වැළකුණහුට ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත්. 'නො පිසුනුබස් නිසා පිසුනුබස් හළයුතු' යයි යම් කරුණක් කියනලද නම් මේ තෙල කරුණු සඳහා කියනලදි.

'අගිද්ධිලෝභය නිසා ගෙධ සඞ්ඛ්‍යාත ලෝභය හළයුතු' යයි මෙසේ තෙල කියනලද ද, තෙල කුමක් සඳහා කියනලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආයර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට ගෙධ සඞ්ඛ්‍යාත ලෝභ ඇති වීම් නම් මම් ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡේදය පිණිස පිළිපන්මි. යළි මම ගෙධ ලෝභ ඇති වීම් නම් ගිද්ධිලෝභ හේතුයෙන් තෙමේත් මට දෙස් කියන්නේ යැ. විඥයෝ දැන ගිද්ධිලෝභ හේතුයෙන් ගරහන්නාහු යැ. කාබුන් මරණින් මතුයෙහි ගිද්ධිලෝභ හේතුයෙන් දුර්ගති කැමැති වියයුත්තී යැ. තවද යම් ගිද්ධිලෝභයෙක් ඇද්ද මෙය මැ සංයෝජන යැ. මෙ නීවරණ යි. ගිද්ධිලෝභ හේතුයෙන් විඝාතපරිදහකර වූ යම් ආස්‍රව කෙනෙක් උපදනාහු නම් ගිද්ධිලෝභ රහිත වූවහුට මෙසේ ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත්. 'අගිද්ධිලෝභය නිසා ගෙධසංඛ්‍යාතලෝභය හළයුතු 'යයි යමක් කියනලද ද, මේ තෙල කරුණ පිණිස කියන ලදි.

'අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු නින්දාරොසී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන නින්දාරොසී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය නින්දාරොස පච්චයා, අනුවිච්ච විඤ්ඤූ[1] ගරහෙය්‍යුං නින්දාරොසපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා නින්දාරොසපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං නින්දාරොසො. යෙ ච නින්දාරොසපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අනින්දාරොසිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'අනින්දාරොසං නිස්සාය නින්දාරොසො පහාතබ්බො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු කොධූපායාසී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන කොධූපායාසී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය කොධූපායාසපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං කොධූපායාස පච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා කොධූපායාසපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං කොධූපායාසො, යෙ ච කොධූපායාසපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. අකොධූපායාසිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති 'අකොධූපායාසං නිස්සාය කොධූපායාසො පහාතබ්බො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙසං ඛො අහං සංයොජනානං හෙතු අතිමානී අස්සං, තෙසාහං සංයොජනානං පහානාය සමුච්ඡෙදාය පටිපන්නො. අහඤ්චෙව ඛො පන අතිමානී අස්සං, අත්තාපි මං උපවදෙය්‍ය අතිමානපච්චයා, අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං අතිමානපච්චයා, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා අතිමානපච්චයා. එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං අතිමානො, යෙච අතිමානපච්චයා උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, අනතිමානිස්ස එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. 'අනතිමානං නිස්සාය අතිමානො පහාතබ්බො'ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමෙ ඛො ගහපති අට්ඨ ධම්මා සඞ්ඛිත්තෙන වුත්තා විත්ථාරෙන විභත්තා[2] යෙ අරියස්ස විනයෙ වොහාරසමුච්ඡෙදාය සංවත්තන්ති. න තෙව තාව අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං වොහාරසමුච්ඡෙදො හොතීති. යථා කථං පන භන්තෙ අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං වොහාරසමුච්ඡෙදො හොති. සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං වොහාරසමුච්ඡෙදො හොතීති. තෙන හි ගහපති සුණාහි. සාධුකං මනසිකරොහි. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පොතලියො ගහපති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච :

---

1. අනුවිච්චාපි මං විඤ්ඤූ-මජසං. 2. අවිභත්තා-ස්‍යා.

අනින්දරෝෂය නිසා නින්දගැටුම හළයුතු යයි මෙසේ තෙල කියන ලද ද. තෙල කුමක් සඳහා කියන ලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : 'මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට නින්දරොෂ ඇති වීම් නම් මම් ඒ සංයෝජන-යන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡෙදය පිණිස පිළිපන්මි. යළිදු මම නින්දරොෂ ඇති වීම් නම් තෙමේත් මට නින්දරෝෂ ප්‍රත්‍යයෙන් උපවාද කරන්නේ යැ. විඥයෝ දූන නින්දරෝෂ හේතුයෙන් ගරහන්නාහු යැ. නින්දරෝෂ හේතුයෙන් කාබුන් මරණින් මතු දුර්ගති කැමැති වියයුත්තී යැ. යළි යම් නින්දරෝෂයෙක් ඇද්ද, මෙය මැ සංයෝජන යැ. මෙ නීවරණ යි. නින්දරෝෂ හේතුයෙන් විඝාතපරිදහකර වූ යම් ආස්‍රව කෙනෙක් උපදනාහු ද නින්දරෝෂ නැත්තහුට මෙසේ ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත්. 'අනින්දරෝෂය නිසා නින්දරෝෂය හළයුතු යයි මෙසේ යමක් කියන ලද ද, මෙය තෙල කරුණ සඳහා කියන ලද.

'අකෝධූපායාසය නිසා කෝධූපායාස හළයුතු යයි මෙසේ තෙල කරුණ කියනලද. තෙල කුමක් සඳහා කියන ලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම් යම් සංයෝජන කෙනකුන් හේතු කොට කෝධූපායාස ඇති වීම් නම් මම් ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡෙදය පිණිස පිළිපන්මි. මම වැළිත් කෝධූපායාස ඇති වීම් නම් තෙමේත් මට කෝධූපායාස හේතුයෙන් උපවාද කරන්නේ යැ. විඥයෝ දූන කෝධූපායාස හේතුයෙන් නිගා කරන්නාහු යැ. කෝධූපායාස හේතුයෙන් කාබුන් මරණින් මතු දුර්ගති කැමැති වියයුත්තී යැ. වැළිදු යම් කෝධූපායාසයෙක් ඇද්ද මෙය මැ සංයෝජන යැ මෙ නීවරණ යි. 'කෝධූපායාස හේතුයෙන් විඝාතපරිදහකර වූ යම් ආස්‍රව කෙනෙක් උපදනාහු ද කෝධූපායාස රහිත වුවහුට මෙසේ ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත්. අකෝධූපාසාසය නිසා කෝධූපායාස හළයුතු' යයි මෙසේ යමක් කියන ලද ද, මෙ කරුණ තෙල සඳහා කියන ලදී.

'අනතිමානය නිසා අතිමානය හළයුතු යයි යමක් මෙසේ කියන ලද ද, තෙල කුමක් සඳහා කියන ලද යැ යත් : 'ගැහැවිය, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : මම් යම් සංයෝජන කෙනෙකුන් හේතු කොට අතිමාන ඇති වීම් නම් ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස සමුච්ඡෙදය පිණිස පිළිපන්මි. මම් වැළිත් අතිමාන ඇති වීම් නම් තෙමේත් මට අතිමාන හෙතුයෙන් උපවාද කරන්නේ යැ. විඥයෝ දූන අතිමාන හෙතුයෙන් ගරහන්නාහු, යැ. අතිමාන හේතුයෙන් කාබුන් මරණින් මතු දුර්ගති කැමැති වියයුත්ති යැ. වැළිදු යම් අතිමානයෙක් ඇද්ද, මෙය මැ සංයෝජන යැ. මෙ නීවරණ යි. අතිමාන හේතුයෙන් විඝාතපරිදහකර වූ යම් ආස්‍රව කෙනෙක් උපදනාහු ද අතිමාන නැත්තහුට මෙසේ ඒ විඝාතපරිදහකර ආස්‍රවයෝ නො වෙත්. අනතිමානය නිසා අතිමානය හළයුතු යයි මෙසේ යමක් කියනලද ද, මේ තෙල කරුණ සඳහා කියන ලදි.

ගැහැවිය, ආර්‍යවිනයෙහි යම් ධර්ම කෙනෙක් ව්‍යවහාර සමුච්ඡෙදය පිණිස පවත්නාහු ද මේ අෂ්ට ධර්මයෝ සැකෙවින් කියන ලද්දූහු විස්තරයෙන් විභක්ත වූවාහු වෙති. එතෙකුදු වත් ආර්‍යවිනයෙහි සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල ව්‍යවහාරසමුච්ඡෙදය නො මැ වේ යයි. වහන්ස, ආර්‍යවිනයෙහි සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල කවර පරිද්දෙකින් ව්‍යවහාරසමුච්ඡෙදය වේ ද : මැනැව වහන්ස, මට භාග්‍යවතුන් වහන්-සේ යම් පරිදි ආර්‍යවිනයෙහි සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල ව්‍යවහාර සමුච්ඡෙදය වේ ද එපරිද්දෙන් දහම් දෙසනසේක්වා යි, එසේ නම් ගැහැවිය, අසව මොනවට මෙනෙහි කරව. කියන්නෙමි යි, 'එසේ යැ වහන්සැ යි පොතලිය ගෘහපති භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්විය. භාග්‍යවත්හු තෙල වදළ සේක.

සෙය්‍යථාපි ගහපති කුක්කුරො ජිඝච්ඡාදුබ්බල්‍යපරෙතො ගොඝාතකසූණං පච්චුපට්ඨිතො අස්ස. තමෙනං දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා අට්ඨිකඞ්කලං සුනික්කන්තනික්කන්තං[1] නිම්මංසං ලොහිතමක්ඛිත්තං උපච්ඡුභෙය්‍ය[2]. තං කිම්මඤ්ඤසි ගහපති: අපි නු සො කුක්කුරො අමුං අට්ඨිකඞ්කලං සුනික්කන්තනික්කන්තං නිම්මංසං ලොහිතමක්ඛිත්තං පලිඛාදෙන්තො[3] ජිඝච්ඡාදුබ්බල්‍යං පටිවිනෙය්‍යාති. නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: අදුං හි භන්තෙ අට්ඨිකඞ්කලං සුනික්කන්තනික්කන්තං නිම්මංසං ලොහිතමක්ඛිත්තං, යාවදෙව ච පන සො කුක්කුරො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සාති. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති. අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යො'ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං අභිනිවජ්ජෙත්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා, යත්ථ සබ්බසො ලොකාමිසූපාදානා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

සෙය්‍යථාපි ගහපති ගිජ්ඣො වා කඞ්කො වා කුලලො වා මංසපෙසිං ආදාය උඩ්ඩීයෙය්‍ය,[4] තමෙනං ගිජ්ඣාපි කඞ්කාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙය්‍යුං විරාජෙය්‍යුං;[5] තං කිම්මඤ්ඤසි ගහපති, සචෙ සො ගිජ්ඣො වා කඞ්කො වා කුලලො වා තං මංසපෙසිං න ඛිප්පමෙව පටිනිස්සජ්ජෙය්‍ය. සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛන්ති. එවං භන්තෙ, එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: මංසපෙසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං අභිනිවජ්ජෙත්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා. යත්ථ සබ්බසො ලොකාමිසූපාදානා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

සෙය්‍යථාපි ගහපති පුරිසො ආදිත්තං තිණුක්කං ආදාය පටිවාතං ගච්ඡෙය්‍ය. තං කිම්මඤ්ඤසි ගහපති, සචෙ සො පුරිසො තං ආදිත්තං තිණුක්කං න ඛිප්පමෙව පටිනිස්සජ්ජෙය්‍ය. තස්ස සා ආදිත්තා තිණුක්කා හත්ථං වා දහෙය්‍ය බාහං වා දහෙය්‍ය. අඤ්ඤතරං වා[6] අඞ්ගපච්චඞ්ගං දහෙය්‍ය. සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛන්ති. එවං භන්තෙ. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: තිණුක්කූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා -පෙ- තමෙවූපෙක්ඛං භාවෙති.

---

1. සුනික්කන්තං නික්කන්තං-සීමු. 2. උපච්ඡුභෙය්‍ය-ස්‍යා.
3. පලෙහන්තො-මජසං, ස්‍යා. 4. උඩ්ඩියෙය්‍ය-PTS, ස්‍යා
5. විස්සජ්ජෙය්‍යුං-මජසං.
6. අඤ්ඤතරං වා අඤ්ඤතරං වා-මජසං.

යම් පරිදි ගැහැවිය, බඩසා දුබල බැවින් පෙළුණු සුනඛයෙක් ගවයන් නසන වධස්ථාන යට පැමිණියේ වෙයි. ඔහුට දක්ෂ වූ ගෝඝාතකයෙක් හෝ ගෝඝාතක අතැවැසියෙක් හෝ මොනොවට මස් ලියන ලද, මස් රහිත වූ ලෙහෙයින් වැකුණු ඇටසැකිල්ලක් දමන්නේ යැ. ගැහැවිය, ඒ කිමැයි සිතව. ඒ කුක්කුරයා මොනොවට ලියන ලද මස් රහිත වූ ලෙහෙයෙන් වැකුණු තෙල ඇටසැකිල්ල ලෙවකන්නේ බඩසා දුබල බැව් නසන්නේද යි වහන්ස, තෙල නො වේ මැ යි. එ කවර හෙයින යත්: වහන්ස, යම් හෙයෙකින් තෙල ඇටසැකිල්ල මොනොවට මස් ලියන ලද ද මස් රහිත වූයේ ද ලෙහෙයෙන් වැකුණේ ද එහෙයිනි. යළි ඒ කුක්කුරයා කලමථයට මැ වෙහෙසට මැ හිමි වන්නේ යයි එසෙයින් මැ ගැහැවිය, ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, දැඩි ආයාස ඇත්තාහ. මෙහි බොහෝ ආදීනව ඇතැ'යි වදරන ලද. මෙසේ තෙල කාමය යථාභූත වැ සම්‍යග්ඥානයෙන් දැක යම් මේ උපේක්ෂාවක් නානාස්වභාව වූ ද නානා අරමුණු ඇසුරු කළා ද ඒ උපෙක්ෂාව දුරු කොට යම් චතුර්ථධ්‍යානෝපෙක්ෂාවක් එකස්වභාව වූ ද එක් අරමුණක් ඇසුරු කොට ඇත්තී ද, යම් ධ්‍යානෝපෙක්ෂායෙක සර්වප්‍රකාරයෙන් පඤ්චකාමගුණාමිසයෝ අපරිශේෂ වැ නිරුද්ධ වෙත් ද ඒ ධ්‍යානෝපෙක්ෂාව මැ වඩයි.

යම් පරිදි ගැහැවිය, ගිජුළිහිණියෙක් වේවයි ලොහොතුඩුවෙක් වේවයි උකුසෙක් වේවයි මස්වැදල්ලක් ගෙන අහසට පියාඹා යන්නේ ද, ඔහු ගිජුළිහිණියෝ ද ලොහොතුඩුවෝ ද උකුස්සෝ ද ලුහුබඳිමින් කොටන්නාහු ද (මස් වැදල්ල) හෙළන්නා හු ද, ගැහැවිය, ඒ කුමැ යි සිතව. ඉදින් ඒ ගිජුළිහිණියා හෝ ලෝතුඩුවා හෝ උකුස්සා හෝ ඒ මස්වැදල්ල වහා මැ නො හරනේ නම් හේ එ කරුණින් මරණයට හෝ මරණමාත්‍ර වූ දුකට හෝ පැමිණෙන්නේ යයි. එසේ යැ වහන්ස, එ පරිදි මැ ගැහැවිය, ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ මස්වැදල්ලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ පීඩා ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ යයි වදරන ලද. මෙසේ තෙල ඇතිසැටියෙන් සම්‍යග්ඥානයෙන් දැක යම් උපේක්ෂාවක් නානාස්වභාව ඇද්ද නානාලම්බන ඇසුරු කළා ද ඒ කාමගුණාලම්බන උපේක්ෂාව හැරපියා යම් ධ්‍යානෝපෙක්ෂාවක් එක් අරමුණක් එකාලම්බන වී ද ඒකත්වය ඇසුරු කළා ද යම් ධ්‍යානොපෙක්ෂායෙක්හි සර්වප්‍රකාරයෙන් ලෝකාමිෂ සංඛ්‍යාත පඤ්චකාමගුණොපාදනයෝ, අපරිශෙෂ වැ නිරුද්ධ වෙත් ද ඒ චතුර්ථධ්‍යානොපෙක්ෂාව මැ වඩයි.

යම් පරිදි ගැහැවිය, පුරුෂයෙක් ඇවිළැගත් තණහුලක් ගෙන ප්‍රතිවාතයට යන්නේ යැ. ගැහැවිය, ඒ කිමැ යි සිතහි ? ඉදින් ඒ පුරුෂ ඒ ඇවිළැගත් තණහුල වහා මැ නො හරනේ නම් ඒ ඇවිළැගත් තණහුල ඔහුගේ අත හෝ දවන්නේ යැ. බාහුව හෝ දවන්නේ යැ. අන්‍යතර අඟපසඟ හෝ දවන්නේ යැ. හේ ඒ හේතුයෙන් මරණයට හෝ මරණමාත්‍ර වූ දුකට හෝ පැමිණෙන්නේ යැ යි. එසේ යැ වහන්ස, එපරිදි මැ ගැහැවිය, ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ තණහුලකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ පීඩා ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ යයි වදරන ලද' යි. තෙල මෙසේ සම්‍යග්ඥානයෙන් යථාභූත කොට දැක......ඒ ධ්‍යානෝපෙක්ෂාව මැ වඩයි.

සෙය්‍යථාපි ගහපති අඞ්ගාරකාසු සාධිකපොරිසා පූරා අඞ්ගාරානං වීතච්චිකානං වීතධූමානං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො.[2] තමෙනං ද්වෙ බලවන්තො පුරිසා නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුං උපකඩ්ඪෙය්‍යුං. තං කිම්මඤ්ඤසි ගහපති, අපි නු සො පුරිසො ඉතිචිතිචෙව කායං සන්නාමෙය්‍යාති, එවං භන්තෙ තං කිස්ස හෙතු: විදිතං හි භන්තෙ තස්ස පුරිසස්ස ඉමඤ්චෙවාහං අඞ්ගාරකාසුං පතිස්සාමි. තතො නිදානං මරණං වා නිගච්ඡාමි මරණමත්තං වා දුක්ඛන්ති. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා-පෙ-තමෙවූපෙක්ඛං භාවෙති.

සෙය්‍යථාපි ගහපති පුරිසො සුපිනකං පස්සෙය්‍ය ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකං සො පටිබුද්ධො න කිඤ්චි පස්සෙය්‍ය,[3] එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: සුපිනකූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා-පෙ-තමෙවූපෙක්ඛං භාවෙති.

සෙය්‍යථාපි ගහපති පුරිසො යාචිතකං භොගං යාචිත්වා යානං වා[4] පොරොසෙය්‍යං[5] පවරමණිකුණ්ඩලං. සො තෙහි යාචිතකෙහි භොගෙහි පුරක්ඛතො පරිවුතො අන්තරාපණං පටිපජ්ජෙය්‍ය. තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය: භොගී වත භො පුරිසො, එවං කිර භොගිනො භොගානි භුඤ්ජන්තීති. තමෙනං සාමිකා යත්ථ යත්ථෙව පස්සෙය්‍යුං. තත්ථ තත්ථෙව සානි හරෙය්‍යුං. තං කිම්මඤ්ඤසි ගහපති, අලන්නු ඛො තස්ස පුරිසස්ස අඤ්ඤථත්තායාති. එවං භන්තෙ, තං කිස්ස හෙතු: සාමිනො හි භන්තෙ සානි අරහන්තීති. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාචිතකූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා-පෙ-තමෙවූපෙක්ඛං භාවෙති.

සෙය්‍යථාපි ගහපති ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ තිබ්බො වනසණ්ඩො, තත්‍රස්ස රුක්ඛො සම්පන්නඵලො ච උපපන්නඵලො ච, න චස්සු කානිචි ඵලානි භූමියං පතිතානි, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඵලත්ථිකො ඵලගවෙසී ඵලපරියෙසනං චරමානො, සො තං වනසණ්ඩං අජ්ඣොගාහෙත්වා[6] තං රුක්ඛං පස්සෙය්‍ය සම්පන්නඵලඤ්ච උපපන්නඵලඤ්ච, නත්ථි ච කානිචි ඵලානි භූමියං පතිතානි, ජානාමි ඛො පනාහං රුක්ඛං ආරුහිතුං[7] යන්නූනාහං ඉමං රුක්ඛං ආරුහිත්වා[8] යාවදත්ථඤ්ච ඛාදෙය්‍යං උච්ඡඞ්ගඤ්ච පූරෙය්‍යන්ති. සො තං රුක්ඛං ආරුහිත්වා[8] යාවදත්ථඤ්ච

2. දුක්ඛප්පටිකූලො-මජසං.
3. පටිපස්සෙය්‍ය-මජසං.
4. යානං-ස්‍යා, PTS.
5. පොරිසෙය්‍යං-මජසං.
6. අජ්ඣාගාහෙත්වා — මජසං.
7. ආරොහිතුං — මජසං, PTS. / අභිරුය්හිතුං — ස්‍යා.
8. ආරොහිත්වා — මජසං, PTS. / අභිරුය්හිත්වා — ස්‍යා.

යම් පරිදි ගැහැවිය, පුරුෂ ප්‍රමාණයෙන් අධික වූ සිළු රහිත දුම් රහිත අඟුරු පිරුණු අඞ්ගාරකර්ෂූයෙක් වෙයි. එකලැ ජීවත් වනු කැමැති නො මැරෙනු කැමැති සුව කැමැති දුකට ප්‍රතිකූල වූ පුරුෂයෙක් එන්නේ යැ. බලවත් පුරුෂයෝ දෙදෙනෙක් වෙන වෙන අත් ගෙන තෙල පුහුල්හු අඞ්ගාරකර්ෂූවට අදනාහු යැ. ගැහැවිය, ඒ කිමැ'යි සිතහි. ඒ පුරුෂ ඔබ මොබ කය නමන්නේ නො වේ ද ? එසේ යැ වහන්ස, ඒ කවර හෙයින යත් : වහන්ස, යම් හෙයෙකින් ඒ පුරුෂයා විසින් ' ඉදින් මම් මේ අඞ්ගාරකර්ෂූවට වැටෙම් නම් ඒ හෙතුයෙන් මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙමි'යි දන්නා ලද ද, එහෙයිනි. ඒ පරිදි මැ ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ අඞ්ගාරකර්ෂූපම වූහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ පීඩා ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ යයි වදරන ලදැ'යි. තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දක . . . ඒ චතුර්ථධ්‍යානොපෙක්ෂාව මැ වඩයි.

යම් පරිදි ගැහැවිය, පුරුෂයෙක් ආරාමයෙන් රමණී වූ වනයෙන් රමණී වූ භූමි විසින් රමණී වූ පුෂ්කරණීන් රමණී වූ සිහින දක්නේ යැ. හේ පිබිදියේ කිසිවක් නො දකී. ඒ පරිදි මැ ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ ස්වප්නයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ පීඩා ඇත්තාහ, මෙහි ආදීනව බොහෝ යයි වදරන ලදැ' යි තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දක . . . ඒ මැ චතුර්ථධ්‍යානොපෙක්ෂාව වඩා.

යම් පරිදි ගැහැවිය, පුරුෂයෙක් පුරුෂයනට නිසි වූ යානයක් හෝ උතුම් මිණිකොඩොල් හෝ පිරුළු කොටගත් භෝගයක් අයැද ගෙන හේ ඒ පිරුළු කොටගත් භෝගයන් පෙරටු කොට ඇතියේ පිරිවරන ලදුයේ අතුරු අවුණට පිළිපදනේ යැ. තෙල පුරුෂයා දක ජනයා මෙසේ කියන්නෙ යැ, භවත, භෝග ඇති පුරුෂයෙක් මැ යැ. භෝග ඇත්තාහු මෙසේ භෝගයන් වළඳ කෙරෙති යි. ස්වාමීහු තෙල පුරුෂයා යම් යම් තැනෙක්හි මැ දක්නාහු ද ඒ ඒ තැන්හි දී මැ තමන්ගේ භාණ්ඩයන් හැරගන්නාහු යැ. ගැහැවිය, ඒ කිමැ? යි හඟිහි. ඒ පුරුෂයාගේ අන්‍යථාත්වයට නිසි වූයේ නු ? යි. එසේ යැ වහන්ස, ඒ කුමක් හෙයින යත් : වහන්ස, යම් හෙයෙකින් ස්වාමීහු ස්වකීය භාණ්ඩයන් හැරගනිත් ද එහෙයිනි. ඒ පරිදි මැ ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකයි : භාග්‍යවතුන් විසින් කාමයෝ පිරුළුගත් භාණ්ඩයකට බඳු උපමා ඇත්තාහ, බොහෝ දුක් ඇත්තාහ, බොහෝ පීඩා ඇත්තාහ. මෙහි ආදීනව බොහෝ යයි වදරන ලද. මෙසේ තෙල යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දක . . . ඒ චතුර්ථධ්‍යානොපෙක්ෂාව මැ වඩයි.

යම් පරිදි ගැහැවිය, ගමට හෝ නිගමයට හෝ නුදුරෙහි ගහන වූ වනළැහැබෙක් වෙයි. එහි මධුර ඵල ඇති බොහෝ ඵල ඇති රුකෙක් වන්නේ යැ. බිමැ වැටුණු කිසි ඵල කෙනෙක් නො ද වූවාහ. එකල්හි ඵල අර්ථ කොට ඇති ඵල සොයන ඵල සෙවීමට හැසිරෙන පුරුෂයෙක් එන්නේ යැ. හෙ ඒ වනළැහැබට පිවිස මධුර වූ ඵල ඇති බොහෝ හටගත් ඵල ඇති ඒ රුක දක්නේ යැ. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මෙ රුක මධුර ඵල ඇත්තේ ද බොහෝ ඵල ඇත්තේ ද වෙයි. බිමැ වැටුණු කිසි ඵලයෙක් නැත. මම රුකට නඟින්නට දනිමි. මම මෙ රුකට නැඟී යැපෙන පමණ කන්නෙම් නම් හිඟැ පුරාලන්නෙම් නම් මැනැවැ යි. හෙ ඒ රුකට නැඟී යැපෙන පමණ කන්නේ යැ. හිඟ ද

ඛාදෙය්‍ය උච්ඡඞ්ගඤ්ච පූරෙය්‍ය. අථ දුතියො පුරිසො ආගච්ඡෙය්‍ය ඵලත්ථිකො ඵලගවෙසී ඵලපරියෙසනං චරමානො තිණ්හං කුඨාරිං ආදාය. සො තං වනසණ්ඩං අජ්ඣොගාහෙත්වා තං රුක්ඛං පස්සෙය්‍ය සම්පන්නඵලඤ්ච උප්පන්නඵලඤ්ච තස්ස එවමස්ස: අයං ඛො රුක්ඛො සම්පන්නඵලො ච, උප්පන්නඵලො ච, නත්ථි ච කානිචි ඵලානි භූමියං පතිතානි න ඛො පනාහං ජානාමි රුක්ඛං ආරුහිතුං, යන්නූනාහං ඉමං රුක්ඛං මූලතො ඡෙත්වා යාවදත්ථඤ්ච ඛාදෙය්‍යං උච්ඡඞ්ගඤ්ච පූරෙය්‍යන්ති. සො තං රුක්ඛං මූලතො ඡින්දෙය්‍ය. තං කිම්මඤ්ඤසි ගහපති, අසු යො සො පුරිසො පඨමං රුක්ඛං ආරූළ්හො, සචෙ සො න ඛිප්පමෙව ඔරොහෙය්‍ය[2] තස්ස සො රුක්ඛො පපතන්තො හත්ථං වා භඤ්ජෙය්‍ය. අඤ්ඤතරං වා අඞ්ගපච්චඞ්ගං භඤ්ජෙය්‍ය, සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛන්ති. එවං භන්තෙ. එවමෙව ඛො ගහපති අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා, ආදීනවො එත්ථ භිය්‍යොති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා යත්ථ සබ්බසො ලොකාමිසූපාදානා අපරිසෙසා නිරුජ්ඣන්ති. තමෙවූපෙක්ඛං භාවෙති.

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො-පෙ-ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ. හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ස ඛො සො ගහපති අරියසාවකො ඉමංයෙව අනුත්තරං උපෙක්ඛාසතිපාරිසුද්ධිං ආගම්ම ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

එත්තාවතා ඛො ගහපති අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං වොහාරසමුච්ඡෙදො හොති. තං කිම්මඤ්ඤසි ගහපති, යථා, අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං වොහාර සමුච්ඡෙදො හොති. අපි නු ත්වං එවරූපං වොහාරසමුච්ඡෙදං අත්තනි සමනුපස්සසීති. කො චාහං භන්තෙ කො ච අරියස්ස විනයෙ සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං වොහාරසමුච්ඡෙදො. මයං හි භන්තෙ පුබ්බෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ අනාජානීයෙව සමානෙ ආජානීයාති අමඤ්ඤිම්හ. අනාජානීයෙව සමානෙ ආජානීයභොජනං භොජිම්හ. අනාජානීයෙව සමානෙ ආජානීයට්ඨානෙ ඨපිම්හ. භික්ඛු පන මයං භන්තෙ ආජානීයෙව සමානෙ අනාජානීයාති අමඤ්ඤිම්හ. ආජානීයෙව සමානෙ අනාජානීයභොජනං භොජිම්හ.

1 { අමුකො යො — මජසං.
  { අමුකො — සයා.

2. ඔරුහෙය්‍ය — සීමු, සයා.

පුරාලන්නේ යැ. ඉක්බිති එලාර්ථී වූ එල ගවේෂණය කරන එල පයෝෂණයෙහි හැසි රෙන දෙවැනි පුරුෂයෙක් තිහිණි කෙටේරියක් ගෙන එන්නේ යැ. හෙ එ වනළැහැබට පිවිස මධුර එල ඇත්තා වූ ද බොහෝ එල ඇත්තා වූ ද එ රුක දක්නේ යැ. ඔහුට මෙ සිත වෙයි. මෙ රුක මධුර එල ඇත්තේ ද බොහෝ එල ඇත්තේ ද වෙයි. බිමැ වැටුණු කිසි එලයෙක් නැත්තේ ද වෙයි. මම් වැළිත් රුකට නඟින්නට නො දනිමි. මම් මෙ රුක මුලින් සිඳ යැපෙන පමණ කන්නෙම් නම් හිඟ ද පුරාලන්නෙම් නම් මැනැවැ'යි. හෙ එ රුක මුලින් සිඳින්නේ යැ. ගැහැවිය, එ කිමැ යි හඟිහි ? පළමු රුකට නැඟුණු ඒ පුරුෂයෙක් වේ ද, ඉදින් හෙතෙම වහා මැ නො බස්නේ නම් වැටෙන එ රුක ඔහුගේ අත හෝ බිඳින්නේ යැ. පය හෝ බිඳින්නේ යැ. අන්‍යතර අඩග ප්‍රත්‍යඩ්ගයක් හෝ බිඳින්නේ යැ. හේ ඒ හෙතුයෙන් මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණේ යයි ? එසේ යැ වහන්ස, එසෙයින් මැ ගැහැවිය, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ සලකයි: භාග්‍යවතුන් විසින් කාමයෝ වෘක්ෂඵලෝපම වූහ, බොහෝ දුක් ඇත්තාහ, දැඩි පීඩා ඇත්තාහ'යි වදාරන ලද. මෙහි ආදීනව බොහෝ යයි මෙසෙයින් තෙල කරුණ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දැක නානා ස්වභාව වූ නානාලම්බන ඇසුරු කළ යම් පඤ්චකාමගුණ උපෙක්ෂායෙක් ඇද්ද එය දුරු කොට එක ස්වභාව වූ එකාලම්බන වූ යම් චතුර්ත්ථධ්‍යානෝපෙක්ෂායෙක් ඇද්ද, යම් උපේක්ෂායෙක්හි සර්වප්‍රකාරයෙන් ලෝකාමිස සංඛ්‍යාත වූ පඤ්චකාම ගුණොපාදානයෝ අපරිශෙෂ වැ නිරුද්ධ වෙත් ද, ඒ ධ්‍යානෝපෙක්ෂාව මැ වඩයි.

ගැහැවිය, ඒ ආර්‍ය්‍යශ්‍රාවක නිරුත්තර වූ මෙ මැ උපේක්ෂාසමෘති පාරිශුද්ධියට නත් වැදැරුම් වූ පූර්වනිවාසය සිහි කරයි. ඒ මෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු... මෙසේ ආකාර සහිත වූ උද්දේස සහිත වූ අනේකවිධ පූර්වනිවාසය සිහි කරයි.

ගැහැවිය, ඒ ආර්‍ය්‍යශ්‍රාවක මෙ මැ අනුත්තර උපේක්ෂාසමෘතිපාරිශුද්ධියට පැමිණ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන උපපද්‍යමාන හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගතිගත දුර්ගතිගත සත්ත්වයන් දකියි. කම් වූ පරිදි මියැ පරලොව ගිය සත්ත්වයන් දකියි. කම් වූ පරිදි මියැ පරලොව ගිය සත්ත්වයන් දැනගනියි.

ගැහැවිය, ඒ ආර්‍ය්‍යශ්‍රාවක මෙ මැ අනුත්තර වූ උපේක්ෂාස්මෘති පාරිශුද්ධියට පැමිණ ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහි මැ තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට උපයා වාස කෙරෙයි.

ගැහැවිය, මෙතෙකින් ආර්‍ය්‍යවිනයෙහි සර්වථායෙන් ව්‍යවහාර සමුච්ඡේදය වෙයි. ගැහැවිය, ඒ කිමැයි සිතහි ? යම් පරිදි ආර්‍ය්‍යවිනයෙහි සර්වථායෙන් ව්‍යවහාර සමුච්ඡේදය වේ ද, කිම තෙපි මෙබඳු වූ ව්‍යවහාර සමුච්ඡේදය තමා කෙරෙහි ලා දක්නාව? යි. වහන්ස, මම් කවරෙකිම් ද? ආර්‍ය්‍යවිනයෙහි සර්වථායෙන් ව්‍යවහාර සමුච්ඡේදය කවරේ ද ? වහන්ස, මම සර්වථායෙන් ආර්‍ය්‍යවිනයෙහි ව්‍යවහාර සමුච්ඡේදයෙන් (අහසට පොළොව මෙන්) දුරු වෙමි. වහන්ස, අපි පෙර අන්තොටු පිරිවැජියන් (ගිහි ව්‍යවහාර සමුච්ඡේදයට කාරණා) නො දන්නාවුන් 'දන්නාහ' යි සිතුම්හ. නො දන්නාවුනට මැ කරුණු දන්නවුන් විසින් වැළඳියයුතු භෝජනය වැළඳවූම්හ. කාරණ නො දන්නාවුන් මැ කාරණ දන්නවුන් ගේ තන්හි තැබූම්හ. තවද වහන්ස, අපි භික්ෂූන් (ව්‍යවහාර සමුච්ඡේද) කාරණ දන්නාවුන් මැ 'නොදන්නාහ'යි සිතුම්හ. කාරණ දන්නාවුන් මැ කාරණ නො දනුවනට නිසි භොජනය වැළඳ වූම්හ.

ආජානීයෙව සමානෙ අනාජානීයට්ඨානෙ ඨපිම්හ. ඉදානි පන මයං භන්තෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ අනාජානීයෙව සමානෙ අනාජානීයාති ජානිස්සාම. අනාජානීයෙව සමානෙ අනාජානීයභොජනං භොජෙස්සාම[1] අනාජානීයෙව සමානෙ අනාජානීයට්ඨානෙ ඨපෙස්සාම භික්ඛූ පන මයං භන්තෙ ආජානීයෙව සමානෙ ආජානීයාති ජානිස්සාම ආජානීයෙව සමානෙ ආජානීයභොජනං භොජෙස්සාම. ආජානීයෙව සමානෙ ආජානීයට්ඨානෙ ඨපෙස්සාම[2] අජ්ජපි වත මෙ භන්තෙ භගවා සමණෙසු සමණපෙමං[3] සමණෙසු සමණප්පසාදං සමණෙසු සමණගාරවං.

අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං[4] වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං[5] භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

පොතලිය සුත්තං චතුත්ථං.

---

1. භොජියස්සාම - සිමු, ස්‍යා.
2. ඨපියස්සාම - සිමු
3. සමණප්පෙමං - මජසං
4. නිකුජ්ජිතං - PTS
5. එවමෙවං ඛො භන්තෙ - මජසං.

කාරණ දන්නාවුන් මැ අනාජානීය ස්ථානයෙහි තැබුම්හ. දූන් වූකලී වහන්ස, අපි අන්තොවූ පිරිවැජියන් කාරණ නො දන්නාවුන් මැ 'නො දන්නාහ'යි දනුම්හ. නො දන්නාවුන් මැ නො දන්නාවුනට නිසි භෝජනය වළඳවම්හ. අනාජානීය වූවන් මැ අනාජානීය ස්ථානයෙහි තබම්හ. යළි වහන්ස, අපි භික්ෂූන් කාරණ දන්නාවුන් මැ 'ආජානීය වූහ' යි දනුම්හ. ආජානීය වූවන් මැ ආජානීයනට නිසි භෝජනය වළඳවම්හ. ආජානීය වූවන් මැ ආජානීය ස්ථානයෙහි තබම්හ. වහන්ස, බුදුහු ඒකාන්තයෙන් මට ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රේමය දනවූසේක. ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රසාදය ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ගෞරවය දනවූ සේක.

වහන්ස, ඉතා මැනැව. වහන්ස, ඉතා කාන්ත යි. වහන්ස, යම් පරිදි යටිහුරු කරන ලද්දක් උඩුහුරු කරන්නේ හෝ වේද පිළිසන් වූවක් විවර කරන්නේ හෝ වේ ද, මුළා වූවකුට මග පවසන්නේ හෝ වේ ද, අඳුරෙහි ඇස් ඇත්තාහු රූපයන් දකින්නාහ'යි තෙල් පහනක් ධරන්නේ හෝ වේ ද, එසෙයින් මැ භාග්‍යවතුන් විසින් දහම් පවසන ලද්දේ යැ. වහන්ස, තෙල මම භාග්‍යවත්හු ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද ආදි කොට දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට මා ධරන සේක්වා යි.

සතර වැනි පෝතලිය සූත්‍ර යි.

---

2. 1. 5

ජීවක සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ. අථ ඛො ජීවකො කොමාරභච්චො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච:

සුතං මෙතං භන්තෙ, සමණං ගොතමං උද්දිස්ස පාණං ආරභන්ති, තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං[1] මංසං පරිභුඤ්ජති පටිච්චකම්මන්ති. යෙ තෙ භන්තෙ එවමාහංසු: සමණං ගොතමං උද්දිස්ස පාණං ආරභන්ති. තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජති පටිච්චකම්මන්ති. කච්චි තෙ භන්තෙ භගවතො වුත්තවාදිනො, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති. ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොන්ති. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං[2] ආගච්ඡතීති.

යෙ තෙ ජීවක එවමාහංසු: සමණං ගොතමං උද්දිස්ස පාණං ආරභන්ති. තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජති පටිච්චකම්මන්ති, න මෙ තෙ වුත්තවාදිනො, අබ්භාචික්ඛන්ති ච පන[3] මං තෙ අසතා අභූතෙන. තීහි ඛො අහං ජීවක ඨානෙහි මංසං අපරිභොගන්ති වදාමි: දිට්ඨං සුතං පරිසඞ්කිතං, ඉමෙහි ඛො අහං ජීවක තීහි ඨානෙහි මංසං අපරිභොගන්ති වදාමි. තීහි ඛො අහං ජීවක ඨානෙහි මංසං පරිභොගන්ති වදාමි: අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං, ඉමෙහි ඛො අහං ජීවක තීහි ඨානෙහි මංසං පරිභොගන්ති වදාමි.

ඉධ ජීවක භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති, සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[4] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. තමෙනං ගහපති වා ගහපතිපුත්තො වා උපසඞ්කමිත්වා ස්වාතනාය භත්තෙන නිමන්තෙති. ආකඞ්ඛමානොව[5] ජීවක භික්ඛු අධිවාසෙති. සො තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නිවෙසනං තෙනුපසඞ්කමති උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදති. තමෙනං සො ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසති. තස්ස න එවං හොති: සාධු වත මායං ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසති. අහො වත මායං ගහපති වා ගහපතිපුත්තො වා ආයතිම්පි එවරූපෙන පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසෙය්‍යාති.

---

1. උද්දිස්සකතං – මජසං
2. ගාරය්හට්ඨානං – ස්‍යා.
3. අබ්භාචික්ඛන්ති ච – මජසං.
4. සබ්බත්ථතාය – සීමු.
5. ආකඞ්ඛමානො – ස්‍යා.

Free Distribution www.aathaapi.org

2. 1. 5

ජීවක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කෞමාරභෘත්‍ය ජීවකයන්ගේ අඹවන උයන්හි වැඩවසනසේක. එකල්හි කෞමාරභෘත්‍ය ජීවක භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ වැද එකත්පස් ව හින. එකත්පස්ව හුන් කෞමාරභෘත්‍ය ජීවක භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැල කෙළේ :

වහන්ස, මා විසින් මෙල අසන ලද, ශ්‍රමණ ගෞතමයන් උදෙසා ප්‍රාණවධ කෙරෙති. ශ්‍රමණ ගෞතමයෝ දැන දැන උදෙසා කරනලද තමන් පිණිස කරනලද මාංසය වළඳත්නාහ' යි. වහන්ස, යම් කෙනෙක් මෙසේ කීහු ද; ''ශ්‍රමණ ගෞතමයන් උදෙසා ප්‍රාණවධ කෙරෙති. ශ්‍රමණ ගෞතමයෝ උදෙසා කරනලද තමන් පිණිස කරනලද ඒ මාංසය දැන දැන වළඳත්නාහ'යි. කිමෙක වහන්ස, ඔවුහු භාග්‍යවතුන් විසින් වදළ දැය කියන්නාහු ද ? භාග්‍යවතුන්, අභූතයෙන්, නො ද අභ්‍යාඛ්‍යාන කෙරෙත් ද ? භාග්‍යවතුන් වදළ කාරණයට අනුව ප්‍රකාශ කෙරෙත් ද ? සකාරණ වූ (නුඹ වහන්සේගේ) කිසි වාදානුවාදයෙක් ගැරහියයුතු කරුණකට නො ද පැමිණේ ද ? යි.

ජීවකය, යම් කෙනෙක් මෙසේ කීහු නම් : ශ්‍රමණ ගෞතමයන් උදෙසා ප්‍රාණඝාත කෙරෙති. ශ්‍රමණ ගෞතමයෝ උදෙසා කරනලද තමන් පිණිස කරන ලද ඒ මාංසය දැන දැන වළඳත්නාහ'යි. ඔහු මා විසින් කියන ලද්ද කියන්නාහු නො වෙති. යළි ඔහු මට අසත්‍ය වූ අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කෙරෙති. ජීවකය, මම කරුණු තුනෙකින් මාංසය පරිභොගාර්හ නො වේ යයි කියමි. දක්නාලද්දේ යැ අසනාලද්දෙ යැ සැක කරනාලද්දෙ යැ යනුයි. ජීවකය, මම මේ කරුණු තුනින් මාංසය පරිභෝග නො කටයුතු යයි කියමි. ජීවකය, මම කරුණු තුනෙකින් (පරිශුද්ධ වූ) මාංසය වැළඳියයුතු යයි කියමි : නො දක්නාලද්දෙ යැ නො අසන ලද්දෙ යැ සැක නො කරන ලද්දෙ යැ යනු යි. ජීවකය, මම මේ කරුණු තුනින් (පරිශුද්ධ වූ) මාංසය වැළඳියයුතු යයි කියමි.

ජීවකය, මේ සස්නෙහි මහණෙක් එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසිරි කොට වාස කෙරෙයි. හේ මෙත් සහගිය සිතින් එක් දිගක් පැහැස විහරණ කෙරෙයි. එසෙයින් මැ දෙවැනි දිග ද එසෙයින් මැ තෙවන දිග ද එසෙයින් මැ හතරවන දිග දැයි මෙසේ උඩ යට සරස හැම තැන සර්වාත්මතායෙන් සකල ලෝකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාපාද වූ මෙත් සහගිය සිතින් පැහැසැගෙන විහාර කෙරෙයි. තුලුන් කරා ගැහැවියෙක් හෝ ගැහැවිදරුවෙක් හෝ එළඹ සෙට බතින් නිමන්ත්‍රණ කෙරෙයි. ජීවකය, ඒ මහණ කැමැත්තේ මැ අධිවාසනා කෙරෙයි. හෙ ඒ රැය ඇවෑමෙන් පෙරවරු හැඳපෙරෙව පාසිවුරු ගෙන ඒ ගැහැවියාගේ හෝ ගැහැවි දරුවාගේ හෝ නිවෙස්න කරා එළඹෙයි. එළඹ පැනවූ අස්නෙහි හිඳියි. ඒ ගැහැවියා හෝ ගැහැවිදරුවා හෝ තුලුන් ප්‍රණීත පිණ්ඩපාතයෙන් වළඳවයි. උහුට මෙවන් සිතෙක් නො වෙයි : 'මෙ ගැහැවි හෝ ගැහැවිදරු හෝ ප්‍රණීත පිණ්ඩපාතයෙන් මා වළඳවා නම් මැනැවැ.' 'මෙ ගැහැවි හෝ ගැහැවිදරු හෝ මතුයෙහි මෙවන් ප්‍රණීත පිණ්ඩපාතයෙන් මා වළඳවන්නේ නම් මනා මැ නු' යි. මෙ බඳු

Free Distribution www.aathaapi.org

එවම්පිස්ස න හොති. සො තං පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො[1] ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තං කිම්මඤ්ඤසි ජීවක, අපි නු සො භික්ඛු තස්මිං සමයෙ අත්තව්‍යාබාධාය වා චෙතෙති, පරව්‍යාබාධාය වා චෙතෙති, උභයව්‍යාවාධාය වා චෙතෙති? නො හෙතං භන්තෙ. නනු සො ජීවක භික්ඛු තස්මිං සමයෙ අනවජ්ජංයෙව ආහාරං ආහාරෙති. එවං භන්තෙ. සුතං මෙතං භන්තෙ, බ්‍රහ්මා මෙත්තාවිහාරීති. තමෙම ඉදං භන්තෙ භගවා සක්ඛිදිට්ඨො, භගවා හි භන්තෙ මෙත්තාවිහාරීති. යෙන ඛො ජීවක රාගෙන යෙන දොසෙන යෙන මොහෙන බ්‍යාපාදවා අස්ස, සො රාගො සො දොසො සො මොහො තථාගතස්ස පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො අයතිං අනුප්පාදධම්මො. සචෙ ඛො තෙ ජීවක ඉදං සන්ධාය භාසිතං, අනුජානාමි තෙ එතන්ති. එතදෙව ඛො පන මෙ භන්තෙ සන්ධාය භාසිතං.

ඉධ ජීවක භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. සො කරුණාසහගතෙන චෙතසා-පෙ-මුදිතා සහගතෙන චෙතසා-පෙ-උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති තමෙනං ගහපති වා ගහපතිපුත්තො වා උපසඞ්කමිත්වාස්වාතනාය භත්තෙන නිමන්තෙති. ආකඞ්ඛමානො ව ජීවක භික්ඛු අධිවාසෙති. සො තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නිවෙසනං තෙනුපසඞ්කමති. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදති. තමෙනං සො ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසති. තස්ස න එවං හොති: සාධු වත මායං ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසති. අහො වත මායං ගහපති වා ගහපතිපුත්තො වා ආයතිම්පි එවරූපෙන පණීතෙන පිණ්ඩපාතෙන පරිවිසෙය්‍යාති. එවම්පිස්ස න හොති. සො තං පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තං කිංමඤ්ඤසි ජීවක, අපි නු සො භික්ඛු තස්මිං සමයෙ අත්තව්‍යාබාධාය වා චෙතෙති, පරව්‍යාබාධාය වා චෙතෙති, උභයව්‍යාබාධාය වා චෙතෙතී'ති. නො හෙතං භන්තෙ. නනු සො ජීවක භික්ඛු තස්මිං සමයෙ අනවජ්ජංයෙව ආහාරං ආහාරෙතී'ති. එවම්භන්තෙ. සුතං මෙතං භන්තෙ, බ්‍රහ්මා උපෙක්ඛාවිහාරීති. තමෙම ඉදං භන්තෙ භගවා සක්ඛී දිට්ඨො. භගවා හි භන්තෙ උපෙක්ඛාවිහාරීති. යෙන ඛො ජීවක රාගෙන යෙන දොසෙන යෙන මොහෙන විහෙසවා අස්ස, අරති වා අස්ස, පටිඝවා අස්ස, සො රාගො සො දොසො සො මොහො තථාගතස්ස පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. සචෙ ඛො තෙ ජීවක ඉදං සන්ධාය භාසිතං, අනුජානාමි තෙ එතන්ති. එතදෙව ඛො පන මෙ භන්තෙ සන්ධාය භාසිතං.

---

1. අනජ්ඣාපන්නො - මජසං

Free Distribution www.aathaapi.org

සිතෙකුදු නො වෙයි. හේ ඒ පිණ්ඩපාතය ග්‍රථිත නො වී මූර්ඡිත නො වී නො ගිජු වී ආදීනව දක්නාසුලු වැ නිස්සරණ ප්‍රඥ ඇති වැ වළඳ කෙරෙයි. ජීවකය, එ කිමැ'යි හඟිහි එ මහණ එ සමයෙහි ආත්මව්‍යාබාධය පිණිස හෝ සිතන්නේවේ ද ?පරව්‍යාබාධය පිණිස හෝ සිතන්නේ වේ ද ? (මෙසේ) උභයව්‍යාබාධය පිණිස හෝ සිතන්නේ වේ ද ? වහන්ස, තෙල නො වේ මැ යැ, ජීවකය, මහණ එ සමයෙහි අනවද්‍ය වූ මැ අහර වළඳන්නේ නො! වහන්ස, එසේ යැ. වහන්ස, බ්‍රහ්ම තෙම මෛත්‍රීවිහාර ඇතියෙකැ'යි තෙල මා විසින් අසනලදි. වහන්ස, ඒ ශ්‍රැතය නම් මාවිසින් භාග්‍යවතුන් වහන්සේ සාක්ෂ්‍යවශයෙන් දක්නාලදහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි මෛත්‍රීවිහරණ ඇතිසේක. ජීවකය, යම් රාගයෙකින් යම් ද්වෙෂයෙකින් යම් මෝහයෙකින් ව්‍යාපාද ඇතියෙක් වේ ද එ රාගය එ ද්වෙෂය එ මෝහය තථාගතයන්හට පුහුන් වේ, උසුන්මුල් වේ, මුදුන්සුන් තලක් සෙයින් අවස්තුක කරන ලද වේ. කළ අභාව ඇති වේ. මතුයෙහි නූපදනා සැහැවි ඇති වේ. ජීවකය, ඉදින් තා විසින් මේ සඳහා කියනලද නම් තාගේ තෙල බස් අනුදනිමි'යි. වහන්ස, තෙල සඳහා මැ මා විසින් කියනලදැ'යි.

ජීවකය, මෙ සස්නෙහි මහණෙක් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසිරි කොට වාස කෙරේ ද, හේ කරුණා සහගත සිතින් . . . මුදිතා සහගත සිතින් . . . උපේක්ෂා සහගත සිතින් එක් දිගක් පැහැසැගෙන විහරණ කෙරෙයි. එසෙයින් මැ දෙවන දිග ද එසෙයින් මැ තෙවන දිග ද එසෙයින් මැ සතරවන දිග දැ'යි මෙසේ උඩ යට සරස හැමතැන සර්‍වාත්මතායෙන් සකල ලෝකය විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ උපෙක්ෂා සහගත සිතින් පැහැසැගෙන විහරණ කෙරෙයි. ගැහැවියෙක් හෝ ගැහැවිදරුවෙක් හෝ තුලුන් කරා එළඹ සෙට බතින් නිමන්ත්‍රණ කෙරෙයි. ජීවකය, එ මහණ කැමැතියේ මැ අධිවාසනා කෙරෙයි. හෙ එ රැය ඇවැමෙන් පෙරවරු හැඳපෙරෙව පාසිවුරු ගෙන එ ගැහැවිහුගේ හෝ ගැහැවිදරුහුගේ හෝ නිවෙස්න කරා එළඹෙයි. එළඹ පැනවූ අස්නෙහි හිඳියි. එ ගැහැවි හෝ ගැහැවිදරු හෝ තුලුන් ප්‍රණීත පිණ්ඩපාතයෙන් වළඳවයි. එ මහණහට මෙ බඳු සිතෙක් නො වෙයි. 'මෙ ගැහැවි හෝ ගැහැවිදරු හෝ ප්‍රණීත පිණ්ඩ-පාතයෙන් මා වළඳවා නම් මැනැවැ' කි යායි. 'මෙ ගැහැවි හෝ ගැහැවිදරු හෝ මතුයෙහි මෙ බඳු ප්‍රණීත පිණ්ඩපාතයෙන් මා වළඳවන්නේ නම් මනා මැ නු'යි. උහුට මෙ බඳු සිතෙක් ද නො වෙයි. හෙ එ පිණ්ඩපාතය තෘෂ්ණායෙන් ග්‍රථිත නො වී තෘෂ්ණාමූර්ඡායෙන් මූර්ඡිත නො වී (එකවට ගලනු කැමැතියක්හු සෙයින්) නො ගිජු වී දෙෂ දක්නාසුලු වී (මෙ සඳහා යැ ආහාරපරිභෝගය යි ප්‍රඥයෙන් පිරිසිඳීමෙන්) නිස්සරණ ප්‍රඥ ඇති වැ වළඳ කෙරෙයි. ජීවකය, එ කිමැ'යි හඟිහි එ මහණ එ සමයෙහි ආත්මව්‍යාබෝධය පිණිස හෝ සිතන්නේ වේ ද, පරව්‍යාබාධය පිණිස හෝ සිතන්නේවේ ද, උභයව්‍යාබෝධය පිණිස හෝ සිතන්නේ වේ දැ'යි. වහන්ස, තෙල නො වේ මැ යි. ජීවකය, එ මහණ එ සමයෙහි අනවද්‍ය වූ මැ අහර වළඳන්නේ නො? වහන්ස, එසේ යැ. වහන්ස, තෙල මා විසින් අසන ලද : 'බ්‍රහ්ම උපෙක්ෂාවිහරණ ඇතියෙකැ'යි. වහන්ස, ඒ ශ්‍රැතය නම් මාවිසින් භාග්‍යවතුන් වහන්සේ සාක්ෂ්‍යවශයෙන් දක්නාලදහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උපෙක්ෂාවිහරණ ඇති සේකැ'යි ජීවකය, යම් රාගයෙකින් යම් ද්වෙෂයෙකින් යම් මොහයෙකින් විහෙස ඇති හෝ වේ ද, අරති ඇති හෝ වේ ද, ප්‍රතිඝ ඇති හෝ වේ ද ඒ රාගය එ ද්වෙෂය එ මොහය තථාගතයන්හට ප්‍රහීණ වෙයි. උසුන්මුල් වෙයි. මුදුන් සුන් තලක් සෙයින් කළ අවස්තුක භාව ඇති වෙයි. කළ අභාව ඇති වෙයි. මතුයෙහි නූපදනා සැහැවි ඇති වෙ. ජීවකය, ඉදින් තා විසින් මේ සඳහා කියනලද නම් තාගේ තෙල බස අනුදන්මි'යි. වහන්ස, මා විසින් තෙල සඳහා මැ කියනලදි.

යො ඛො ජීවක තථාගතං වා තථාගතසාවකං වා උද්දිස්ස පාණං ආරභති. සො පඤ්චහි ඨානෙහි බහුං අපුඤ්ඤං පසවති: යම්පි සො[1] එවමාහ: ගච්ඡථ අමුකං නාම පාණං ආනෙථාති. ඉමිනා පඨමෙන ඨානෙන බහුං අපුඤ්ඤං පසවති. යම්පි සො පාණො ගලප්පවෙධකෙන ආනීයමානො දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. ඉමිනා දුතියෙන ඨානෙන බහුං අපුඤ්ඤං පසවති. යම්පි සො එවමාහ: ගච්ඡථ ඉමං පාණං ආරභථාති. ඉමිනා තතියෙන ඨානෙන බහුං අපුඤ්ඤං පසවති. යම්පි සො පාණො ආරභියමානො දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. ඉමිනා චතුත්ථෙන ඨානෙන බහුං අපුඤ්ඤං පසවති. යම්පි සො තථාගතං වා තථාගතසාවකං වා අකප්පියෙන ආසාදෙති. ඉමිනා පඤ්චමෙන ඨානෙන බහුං අපුඤ්ඤං පසවති. යො ඛො ජීවක තථාගතං වා තථාගතසාවකං වා උද්දිස්ස පාණං ආරභති. සො ඉමෙහි පඤ්චහි ඨානෙහි බහුං අපුඤ්ඤං පසවති'ති.

එවං වුත්තෙ ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ. කප්පියං වත භන්තෙ භික්ඛූ ආහාරං ආහාරෙන්ති. අනවජ්ජං වත භන්තෙ භික්ඛූ ආහාරං ආහාරෙන්ති. අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ජීවකසුත්තං පඤ්චමං

---

1. යම්පි සො ගහපති - මජ්සං

ජීවකය, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයකු හෝ උදෙසා පණ නසා ද හේ කරුණු පසෙකින් බොහෝ පව් රැස් කෙරෙයි. යම් හෙයෙකින් හේ මෙසේ බෙණේ ද : 'යව. අසෝ නම් ප්‍රාණියා ගෙනෙව'යි. මේ (ආණත්ති සඞ්ඛ්‍යාත) පළමුවන කරුණින් බොහෝ පව් රැස් කෙරෙයි. යම් හෙයෙකින් ඒ ප්‍රාණියා වෙවුළන ගෙලෙන් ගෙනඑනු ලබනුයේ දුක්දෙම්නස් විඳුනේ වේ ද, මෙ දෙවන කරුණින් බොහෝ පව් රැස් කෙරෙයි. යම් හෙයෙකින් හේ මෙසේ බෙණේ ද : යව 'මේ ප්‍රාණියා නසව'යි. මෙ තුන්වන කරුණින් බොහෝ පව් රැස් කෙරෙයි. යම් හෙයෙකින් ඒ ප්‍රාණියා මරනුලබනුයේ දුක්දෙම්නස් විඳුනේ වේ ද, මෙ සතරවන කරුණින් බොහෝ පව් රැස් කෙරෙයි. යම් හෙයෙකින් හෙ තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයකු හෝ නො කැප මයින් සථා බෙණේ ද මෙ පස්වන කරුණින් බොහෝ පව් රැස් කෙරෙයි. ජීවකය, යමෙක් තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයකු හෝ උදෙසා පණ නසා ද හේ මෙ පස් කරුණින් බොහෝ පව් රැස් කෙරෙ යයි.

මෙසේ වදාළ කල්හි කෝමාරභච්ච ජීවක තෙල සැල කෙළෙ : වහන්ස, අසිරි යැ. වහන්ස, අද්භූත යැ. වහන්ස, භික්ෂූහු ඒකාන්තයෙන් කැප අහර වළඳ කෙරෙති. වහන්ස, භික්ෂූහු ඒකාන්තයෙන් අනවද්‍ය අහර වළඳ කෙරෙති. වහන්ස, ඉතා මැනැවැ . . . . භාග්‍යවතුන් වහන්ස, මා අද පටන් කොට දිවි හිමියෙන් සරණ ගිය උපාසකයකු කොට ධරනසේක්ව'යි.

පස්වැනි ජීවක සූත්‍ර යි.

2. 1. 6

උපාලි සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා නාළන්දායං විහරති පාවාරිකම්බවනෙ. තෙන ඛො පන සමයෙන නිගණ්ඨො[1] නාතපුත්තො නාළන්දායං පටිවසති මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං. අථ ඛො දීඝතපස්සී නිගණ්ඨො නාළන්දායං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන පාවාරිකම්බවනං, යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො දීඝතපස්සිං නිගණ්ඨං භගවා එතදවොච: සංවිජ්ජන්තෙ[2] ඛො තපස්සි ආසනානි, සචෙ ආකඞ්ඛසි නිසීදාති. එවං වුත්තෙ දීඝතපස්සී නිගණ්ඨො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො දීඝතපස්සිං නිගණ්ඨං භගවා එතදවොච:

කති පන තපස්සි නිගණ්ඨො[1] නාතපුත්තො[3] කම්මානි පඤ්ඤාපෙති[4] පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියාති. න ඛො අවුසො ගොතම ආචිණ්ණං නිගණ්ඨස්ස නාතපුත්තස්ස කම්මං කම්මන්ති පඤ්ඤාපෙතුං. දණ්ඩං දණ්ඩන්ති ඛො ආවුසො ගොතම ආචිණ්ණං නිගණ්ඨස්ස නාතපුත්තස්ස පඤ්ඤාපෙතුන්ති. කති පන තපස්සි නිගණ්ඨො නාතපුත්තො දණ්ඩානි පඤ්ඤාපෙති පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියාති. තීණි ඛො ආවුසො ගොතම නිගණ්ඨො නාතපුත්තො දණ්ඩානි පඤ්ඤපෙති පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා සෙය්‍යථීදං: කායදණ්ඩං වචීදණ්ඩං මනොදණ්ඩන්ති. කිම්පන තපස්සි අඤ්ඤදෙව කායදණ්ඩං අඤ්ඤං වචීදණ්ඩං අඤ්ඤං මනොදණ්ඩන්ති. අඤ්ඤදෙව ආවුසො ගොතම කායදණ්ඩං අඤ්ඤං වචීදණ්ඩං අඤ්ඤං මනොදණ්ඩන්ති.

ඉමෙසං පන තපස්සි තිණ්ණං දණ්ඩානං එවං පටිවිභත්තානං එවං පටිවිසිට්ඨානං කතමං දණ්ඩං නිගණ්ඨො නාතපුත්තො මහාසාවජ්ජතරං පඤ්ඤපෙති පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා යදි වා කායදණ්ඩං යදි වා වචීදණ්ඩං යදි වා මනොදණ්ඩන්ති. ඉමෙසං ඛො ආවුසො ගොතම තිණ්ණං දණ්ඩානං එවං පටිවිභත්තානං එවං පටිවිසිට්ඨානං කායදණ්ඩං නිගණ්ඨො නාතපුත්තො මහාසාවජ්ජතරං පඤ්ඤපෙති පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා වචීදණ්ඩං නො තථා මනොදණ්ඩන්ති. කායදණ්ඩන්ති තපස්සි වදෙසි. කායදණ්ඩන්ති ආවුසො ගොතම වදාමි. කායදණ්ඩන්ති තපස්සි වදෙසි. කායදණ්ඩන්ති ආවුසො ගොතම වදාමි. කායදණ්ඩන්ති තපස්සි වදෙසි. කායදණ්ඩන්ති ආවුසො ගොතම වදාමීති. ඉතිහ භගවා දීඝතපස්සිං නිගණ්ඨං ඉමස්මිං කථාවත්ථුස්මිං යාවතතියකං පතිට්ඨාපෙසි.

---

1. නිගන්ථො - ස්‍යා.
2. සංවිජ්ජන්ති - මජසං, ස්‍යා.
3. නාටපුත්තො - මජසං, ස්‍යා.
4. පඤ්ඤපෙති - මජසං

Free Distribution www.aathaapi.org

2. 1. 6
උපාලි සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්දායෙහි පාවාරික නම් සිටුහුගේ ආරාමයෙහි වැඩ වසනසේක. එසමයෙහි නිගණ්ඨනාතපුත්‍ර මහත් නුවට පිරිස් සමග නාලන්දායෙහි වෙසෙයි. එකල දීඝතපස්වී නුවට නාලන්දායෙහි පිඩු පිණිස හැසිර සවස්වේලෙහි පිණ්ඩපාතයෙන් වැළැකුණේ පාවාරික අඹ වෙනෙහි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එක් පසෙක සිටියේ යැ. එක් පසෙක හුන් දීඝතපස්වී නුවටුහට තෙල වදළහ. 'තපස්විය, අසුන් ඇත. ඉදින් රිසියෙහි නම් හිඳුව'යි. මෙසේ වදළ කල්හි දීඝතපස්වී නුවට එක්තරා මිටි අස්නක් ගෙන එක් පසෙක හින. එක් පසෙක හුන් දීඝතපස්වී නුවටුහට බුදුහු තෙල වදළහ :

තපස්විය, නිගණ්ඨනාතපුත්‍ර පවකම් කිරීමට පවකම් පැවැත්මට කෙතෙක් කම් පනවා ද ? යි. ඇවත්නි ගෞතමයෙනි, නිගණ්ඨනාත පුත්‍රහට 'කම් යැ කම් යැ යි' දක්වනු අනාචිණ්ණ යැ. ඇවත්නි, ගෞතමයෙනි, නිගණ්ඨනාතපුත්‍රහට 'දණ්ඩ යැ දණ්ඩ යැ'යි දක්වනු ආචිණ්ණ යැ යි. තපස්විය, නිගණ්ඨනාතපුත්‍ර පවකම් කිරීමට පවකම් පැවැත්මට කෙතෙක් දණ්ඩ දක්වා ද ?යි. ඇවත්නි, ගෞතමයෙනි, නිගණ්ඨනාතපුත්‍ර පවකම් කිරීමට පවකම් පැවැත්මට තුන් දණ්ඩයක් දක්වයි. ඒ මෙසේ යැ : කායදණ්ඩ යැ වාග්දණ්ඩ යැ මනොදණ්ඩ යි. කිමෙක තපස්විය, කායදණ්ඩය අනෙකෙකැ වාග්දණ්ඩය අනෙකෙකැ මනෝදණ්ඩය අනෙකෙකැ'යි. ඇවත්නි, ගෞතමයෙනි, කායදණ්ඩය අනෙකෙකැ වාග්දණ්ඩ අනෙකෙකැ මනෝදණ්ඩය අනෙකෙකැ'යි.

තවද තපස්විය, මෙසේ බෙදනලද මෙසේ වෙසෙසන ලද තුන් දණ්ඩයන් අතුරෙන් පවකම් කිරීමට පවකම් පැවැත්මට නිගණ්ඨනාතපුත්‍ර කවර දණ්ඩයක් මහාසාවද්‍යතර කොට පනවා ද ? කායදණ්ඩ හෝ යැ වචීදණ්ඩ හෝ යැ මනොදණ්ඩ හෝ යැ'යි. ඇවත්නි, ගෞතමයෙනි, මෙසේ බෙදනා ලද මෙසේ වෙසෙසනලද තුන් දණ්ඩයන් අතුරෙන් පවකම් කිරීමට පවකම් පැවැත්මට නිගණ්ඨනාතපුත්‍ර කායදණ්ඩය මහාසාවද්‍යතර කොට පනවයි. වචීදණ්ඩය එසේ නො වෙයි. මනොදණ්ඩය එසේ නො වේ යයි. තපස්විය, කායදණ්ඩය යි කියෙහි ද? ඇවත්නි, ගෞතමයෙනි, කායදණ්ඩ යයි කියමි. තපස්විය, කායදණ්ඩ යයි කියෙහි ද? ඇවැත්නි, ගෞතමයෙනි, කායදණ්ඩ යයි කියමි. තපස්විය, කායදණ්ඩ යයි කියෙහි ද? ඇවැත්නි, ගෞතමයෙනි, කායදණ්ඩ යයි කියමි. මෙසේ භාග්‍යවත්හු දීඝතපස්වී නුවටු මේ කථාවස්තුයෙහි තුන් වර දක්වා පිහිටි වූහ.

Free Distribution www.aathaapi.org

එවං වුත්තෙ දීඝතපස්සී නිගණ්ඨො භගවන්තං එතදවොච: ත්වං පනාවුසො ගොතම කති දණ්ඩානි පඤ්ඤපෙසි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියාති. න ඛො තපස්සී ආචිණ්ණං තථාගතස්ස දණ්ඩං දණ්ඩන්ති පඤ්ඤපෙතුං, කම්මං කම්මන්ති ඛො තපස්සී ආචිණ්ණං තථාගතස්ස පඤ්ඤපෙතුන්ති. ත්වං පනාවුසො ගොතම කති කම්මානි පඤ්ඤපෙසි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියාති. තීණි ඛො අහං තපස්සි කම්මානි පඤ්ඤපෙමි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. සෙය්‍යථීදං: කායකම්මං වචීකම්මං මනොකම්මන්ති. කිං පනාවුසො ගොතම අඤ්ඤදෙව කායකම්මං අඤ්ඤං වචීකම්මං අඤ්ඤං මනොකම්මන්ති. අඤ්ඤදෙව තපස්සි කායකම්මං අඤ්ඤං වචීකම්මං අඤ්ඤං මනොකම්මන්ති.

ඉමෙසං පනාවුසො ගොතම තිණ්ණං කම්මානං එවං පටිවිභත්තානං එවං පටිවිසිට්ඨානං කතමං කම්මං මහාසාවජ්ජතරං පඤ්ඤපෙසි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා, යදි වා කායකම්මං යදි වා වචීකම්මං යදි වා මනොකම්මන්ති. ඉමෙසං ඛො අහං තපස්සි තිණ්ණං කම්මානං එවං පටිවිභත්තානං එවං පටිවිසිට්ඨානං මනොකම්මං මහාසාවජ්ජතරං පඤ්ඤපෙමි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා කායකම්මං නො තථා වචීකම්මන්ති මනොකම්මන්ති ආවුසො ගොතම වදෙසි. මනොකම්මන්ති තපස්සි වදාමි. මනොකම්මන්ති ආවුසො ගොතම වදෙසි. මනොකම්මන්ති තපස්සි වදාමි. මනොකම්මන්ති ආවුසො ගොතම වදෙසි. මනොකම්මන්ති තපස්සි වදාමීති. ඉතිහ දීඝතපස්සී නිගණ්ඨො භගවන්තං ඉමස්මිං කථාවත්ථුස්මිං යාවතතියකං පතිට්ඨාපෙත්වා උට්ඨායාසනා යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි.

තෙන ඛො පන සමයෙන නිගණ්ඨො නාතපුත්තො මහතියා[1] ගිහිපරිසාය සද්ධිං නිසින්නො හොති බාලකිනියා උපාලි පමුඛාය. අද්දසා ඛො නිගණ්ඨො නාතපුත්තො දීඝතපස්සිං නිගණ්ඨං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන දීඝතපස්සිං නිගණ්ඨං එතදවොච: හන්ද කුතො නු ත්වං තපස්සි ආගච්ඡසි දිවා දිවස්සාති. ඉතො හි ඛො අහං භන්තෙ ආගච්ඡාමි සමණස්ස ගොතමස්ස සන්තිකාති. අහු පන තෙ තපස්සි සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. අහු ඛො මෙ භන්තෙ සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. යථා කථං පන තෙ තපස්සි අහු සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. අථ ඛො දීඝතපස්සී නිගණ්ඨො යාවතකො අහොසි භගවතා සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං නිගණ්ඨස්ස නාතපුත්තස්ස ආරොචෙසි. එවං වුත්තෙ නිගණ්ඨො නාතපුත්තො දීඝතපස්සිං නිගණ්ඨං එතදවොච: සාධු සාධු තපස්සි, යථා තං සුතවතා සාවකෙන සම්මදෙව සත්ථුසාසනං ආජානන්තෙන. එවමෙවං දීඝතපස්සිනා නිගණ්ඨෙන සමණස්ස ගොතමස්ස බ්‍යාකතං, කිං හි සොභති ඡවො මනොදණ්ඩො ඉමස්ස එවං ඔළාරිකස්ස කායදණ්ඩස්ස උපනිධාය. අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජතරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා නො තථා වචීදණ්ඩො නො තථා මනොදණ්ඩොති.

1. මහතියා මහතියා - PTS

මෙසේ වදාළ කල්හි දීඝතපස්වී නිගණ්ඨ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ඇවැත්නි, ගෞතමයෙනි, තෙපි වැළිත් පවකම් කිරීමට පවකම් පැවැත්මට කෙතෙක් දණ්ඩයන් පනවවු ද?යි. තපස්විය, තථාගතයනට දණ්ඩ යැ දණ්ඩ යැ යි දක්වනු අනාචීර්ණ යැ. තපස්විය, තථාගතයනට කර්ම යැ කර්ම යැ යි දක්වනු ආචීර්ණ යැ යි. ඇවැත්නි, ගෞතම-යෙනි, තෙපි වැළිත් පවකම් කිරීමට පවකම් පැවැත්මට කෙතෙක් කර්මයන් දක්වවු ද?යි. තපස්විය, මම් පවකම් කිරීමට පවකම් පැවැත්මට කර්ම තුනක් දක්වමි. ඒ මෙසේ යැ : කායකර්ම යැ වාක්කර්ම යැ මනඃකර්ම යැ යි. ඇවැත්නි, ගෞතමයෙනි, කායකර්ම අනෙකෙක් ද? වාක්කර්ම අනෙකෙක් ද? මනඃකර්ම අනෙකෙක් ද?යි. තපස්විය, කායකර්මය අනෙකෙකැ, වාක්කර්මය අනෙකෙකැ, මනඃකර්මය අනෙකෙකැ'යි.

තවද ඇවැත්නි ගෞතමයෙනි, මෙසේ බෙදනලද මෙසේ වෙසෙසනලද මේ තුන් කර්මයන් කෙරෙහි පවකම් කිරීමට පවකම් පැවැත්මට කවර කර්මයක් මහාසාවද්‍යතර කොට පනවවු ද? කායකර්ම හෝ යැ වාක්කර්ම හෝ යැ මනඃකර්ම හෝ යැ යි. තපස්විය, මම මෙසේ බෙදනලද මෙසේ වෙසෙසන ලද තුන් කර්මයන් කෙරෙහි පවකම් කිරීමට පවකම් පැවැත්මට මනඃකර්මය මහාසාවද්‍යතර යයි දක්වමි. කායකර්මය එසේ නො වෙයි. වාක්කර්මය එසේ නො වේ යයි. ඇවැත්නි ගෞතමයෙනි, මනඃකර්මය යි කියවු ද? තපස්විය, මනඃකර්ම යයි කියමි. ඇවැත්නි ගෞතමයෙනි, මනඃකර්ම යයි කියවු ද? තපස්විය, මනඃකර්ම යයි කියමි. ඇවැත්නි ගෞතමයෙනි, මනඃකර්ම යයි කියවු ද? තපස්විය, මනඃකර්ම යයි කියමි. මෙසේ දීඝතපස්වී නිගණ්ඨ භාග්‍යවතුන් මේ කථාවස්තුයෙහි තුන් යළ දක්වා පිහිටුවා හුනස්නෙන් නැඟී නිගණ්ඨනාතපුත්‍රයා කරා එළැඹියේ යි.

එසමයෙහි නිගණ්ඨනාතපුත්‍ර උපාලි ගෘහපති ප්‍රමුඛ කොට ඇති බාලකලොණකාර ගම්වැසි මහත් වූ ගිහිපිරිස් සමග හුන්නේ වෙයි. නිගණ්ඨනාතපුත්‍ර දීඝතපස්වී නුවටු දුර දී මැ එන්නහු දිට. දැක දීඝතපස්වී නුවටුහට තෙල කී : තපස්විය, තෙපි දෙවෙන් දහවලැ කොහි සිට එවු ද?යි. 'වහන්ස, මම මහණගොයුම්හු සමීපයෙහි සිට එමි'යි කී. තපස්විය, ශ්‍රමණගෞතමයන් සමග තොපගේ කිසියම් කථාසල්ලාපයෙක් වී ද?යි. 'වහන්ස, ශ්‍රමණ ගෞතමයන් සමග මාගේ කිසියම් කථාසල්ලාපයෙක් වී යැ'යි. තපස්විය, ශ්‍රමණ ගෞතමයන් සමග තොපගේ කිසි කථාසල්ලාපයෙක් කිසෙයින් වී ද?යි. ඉක්බිති දීඝතපස්වී නිගණ්ඨ භාග්‍යවතුන් සමග යම් පමණ කථාසලලාපයෙක් වී ද, එහැම නිගණ්ඨ-නාතපුත්‍රහට සැල කෙළේ යැ. මෙසේ කී කල්හි නිගණ්ඨනාතපුත්‍ර දීඝතපස්වී නුවටුහට තෙල කී : මැනැවැ මැනැවැ තපස්විය, මොනොවට ශාස්තෘශාසනය දන්නාවූ ශ්‍රැතවත් ශ්‍රාවකයකු යම්සේ ද එසෙයින් දීඝතපස්වී නුවටහු විසින් ශ්‍රමණ ගෞතමයනට ප්‍රකාශ කරනලද. කිම මෙසේ මහත් වූ මේ කායදණ්ඩය සඳහා ලාමක වූ මනොදණ්ඩය හොබනේ ද? වැළි පවකම් කිරීමට පවකම් පැවැත්මට කායදණ්ඩය මැ මහාසාවද්‍යතර යැ. වාග්දණ්ඩය එසේ නො වෙයි. මනොදණ්ඩය එසේ නො වේ යයි.

එවං වුත්තෙ උපාලි ගහපති නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සාධු සාධු භන්තෙ තපස්සි[1] යථා තං සුතවතා සාවකෙන සම්මදෙව සත්ථුසාසනං ආජානන්තෙන, එවමෙවං භදන්තෙන තපස්සිනා[2] සමණස්ස ගොතමස්ස බ්‍යාකතං; කිං හි සොභති ඡවො මනොදණ්ඩො ඉමස්ස එවං ඔළාරිකස්ස කායදණ්ඩස්ස උපනිධාය. අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජතරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා වචීදණ්ඩො නො තථා මනොදණ්ඩො. හන්ද චාහං භන්තෙ ගච්ඡාමි සමණස්ස ගොතමස්ස ඉමස්මිං කථාවත්ථුස්මිං වාදං ආරොපෙස්සාමි. සචෙ මෙ සමණො ගොතමො තථා පතිට්ඨිස්සති යථා භදන්තෙන තපස්සිනා පතිට්ඨාපිතං. සෙය්‍යථාපි නාම බලවා පුරිසො දීඝලොමිකං එළකං ලොමෙසු ගහෙත්වා ආකඩ්ඪෙය්‍ය, පරිකඩ්ඪෙය්‍ය, සම්පරිකඩ්ඪෙය්‍ය, එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ආකඩ්ඪිස්සාමි. පරිකඩ්ඪිස්සාමි. සම්පරිකඩ්ඪිස්සාමි. සෙය්‍යථාපි නාම බලවා සොණ්ඩිකාකම්මකරො මහන්තං සොණ්ඩිකාකිලඤ්ජං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපිත්වා කණ්ණෙ ගහෙත්වා ආකඩ්ඪෙය්‍ය, පරිකඩ්ඪෙය්‍ය, සම්පරිකඩ්ඪෙය්‍ය, එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ආකඩ්ඪිස්සාමි, පරිකඩ්ඪිස්සාමි, සම්පරිකඩ්ඪිස්සාමි. සෙය්‍යථාපි නාම බලවා සොණ්ඩිකාධුත්තො වාලං[3] කණ්ණෙ ගහෙත්වා ඔධුනෙය්‍ය, නිද්ධුනෙය්‍ය, නිච්ඡාදෙය්‍ය[4] එවමෙවාහං සමණං ගොතමං වාදෙන වාදං ඔධුනිස්සාමි, නිද්ධුනිස්සාමි, නිච්ඡාදෙස්සාමි[5] සෙය්‍යථාපි නාම කුඤ්ජරො සට්ඨිහායනො ගම්භීරං පොක්ඛරණිං ඔගාහෙත්වා සණධොවිකං[6] නාම කීළිතජාතං කීළති. එවමෙවාහං සමණං ගොතමං සණධොවිකං[6] මඤ්ඤෙ කීළිතජාතං කීළිස්සාමි. හන්ද චාහං භන්තෙ ගච්ඡාමි සමණස්ස ගොතමස්ස ඉමස්මිං කථාවත්ථුස්මිං වාදං ආරොපෙස්සාමීති. ගච්ඡ ත්වං ගහපති සමණස්ස ගොතමස්ස ඉමස්මිං කථාවත්ථුස්මිං වාදං ආරොපෙහි. අහං වා හි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍යං දීඝතපස්සී වා නිගණ්ඨො ත්වං වාති.

එවං වුත්තෙ දීඝතපස්සී නිගණ්ඨො නිගණ්ඨං නාතපුත්තං එතදවොච: 'න ඛො මෙතං භන්තෙ රුච්චති, යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍ය. සමණො හි භන්තෙ ගොතමො මායාවී, ආවට්ටනිං මායං ජානාති. යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතී'ති. අට්ඨානං ඛො එතං තපස්සි අනවකාසො යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ගච්ඡ ත්වං ගහපති සමණස්ස ගොතමස්ස ඉමස්මිං කථාවත්ථුස්මිං වාදං ආරොපෙහි. අහං වා හි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍යං දීඝතපස්සී වා නිගණ්ඨො ත්වං වාති. දුතියම්පි ඛො -පෙ- දීඝතපස්සී වා නිගණ්ඨො ත්වං වාති. තතියම්පි ඛො දීඝතපස්සී නිගණ්ඨො නිගණ්ඨං නාතපුත්තං එතදවොච: න ඛො මෙතං භන්තෙ රුච්චති යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍ය. සමණො හි භන්තෙ ගොතමො මායාවී, ආවට්ටනිං මායං ජානාති. යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතී'ති. අට්ඨානං ඛො එතං තපස්සි අනවකාසො, යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ඨානඤ්ච ඛො එතං විජ්ජති, යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ගච්ඡ ත්වං ගහපති සමණස්ස ගොතමස්ස ඉමස්මිං කථාවත්ථුස්මිං වාදං ආරොපෙහි. අහං වා හි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍යං දීඝතපස්සී වා නිගණ්ඨො ත්වං වාති.

---

1. දීඝතපස්සී - මජසං. 2. දීඝතපස්සිනා - මජසං. 3. ථාලං-සෳා.
4. නිච්ඡාදෙය්‍ය - සීමු. PTS 5. නිච්ඡාදෙස්සාමි - සීමු. PTS.
6. සාණධොවිකං - මජසං.

මෙසේ කී කල්හි උපාලිගෘහපති නිගණ්ඨනාතපුත්‍රයාහට මෙසේ කී : වහන්ස, තපස්විහු ඉතා මැනැවැ. මොහොවට ශාස්තෘශාසන දන්නා ශ්‍රැතවත් ශ්‍රාවකයක්හු විසින් යම්සේ ද එසෙයින් භදන්ත තපස්වීන් විසින් ශ්‍රමණ ගෞතමයන්හට ප්‍රකාශ කරනලද. මෙසේ මහත් වූ කායදණ්ඩය සඳහා ලාමක වූ මනොදණ්ඩය කිම හොබනේ ද? වැළි පවකම් කිරීමට පවකම් පැවැත්මට කායදණ්ඩය මැ මහාසාවද්‍යතර යැ. වාග්දණ්ඩය එසේ නො වෙයි. මනෝදණ්ඩය එසේ නො වේ. එහෙයින් යමි. වහන්ස, මම මේ කථාවස්තු යෙහි ලා ශ්‍රමණ ගෞතමයන්හට වාදරෝපණ කෙරෙමි. ඉදින් ශ්‍රමණ ගෞතමයෝ භදන්ත තපස්වීන් විසින් යම් පරිදි පිහිටුවනලද ද, එ පරිදි මාගේ කථායෙහි පිහිටා සිටිත් නම්, යම්සේ බල ඇති පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවකු ලොම් ගෙන ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කරන්නේ ද, එසෙයින් මැ මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාද කොට ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම්සේ බලඇති සුරාකරුවෙක් මහත් වූ පිටිපැදුරු ගැඹුරු දියවළෙකැ බහාතබා දෙකණ ගෙන ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරේ ද එ පරිදි මම මහණ ගොයුම්හු වාදයෙන් වාද කොට ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම්සේ බල ඇති සුරාධූර්තයෙක් මවුලුකස්ස දෙකණ ගෙන කිබිසිනි කොට පිඹපියා ද උඩුහුරු කොට පිඹපියා ද පුනපුනා ගසාපියා ද එ පරිදි මම මහණ ගොයුම්හු වාදයෙන් වාද කොට අවධූනන නිර්ධූනන නිෂ්ඵොටන කෙරෙමි. යම්සේ සැටහැවිරිදි (රජුගේ) ඇත් ගැඹුරු පොකුණට වැද සණදෙවුන්කෙළි නම් කෙළියක් කෙළී ද, එ පරිදි මම මහණ ගොයුම්හු හා සණදෙවුන්කෙළි බඳු වාදකෙළියක් කෙළිමි'යි. වහන්ස, මම යම් මැ යැ, මහණ ගොයුම්හට මේ කථාවස්තුයෙහි වාද නංවමි'යි කී. ගහපතිය, තෙපි යව. මහණ ගොයුම්හට මේ කථාවස්තුයෙහි වාද නංවව. ගහපතිය, මම හෝ මහණ ගොයුම්හට වාද නංවමි. දීඝතපස්වී නුවට හෝ නංවයි. තෝ හෝ නංවහි කී.

මෙසේ කී කලැ දීඝතපස්වී නුවට නිගණ්ඨනාතපුත්‍රයාහට මෙසේ කී : 'වහන්ස, යම් හෙයෙකින් උපාලි ගහපති මහණ ගොයුම්හට වාදරොපණය කෙරෙයි, යන මෙල මට නුරුස්නේ යැ. වහන්ස, මහණ ගොයුම්හු මායා ඇත්තාහ. යම් මායාවෙකින් අන්තොටුවන්ගේ සවුවන් ආවර්තනය කොට ගනී ද, එබඳු ආවර්තනමායාවක් දන්නාහ'යි. තපස්විය, උපාලි ගහපති මහණ ගොයුම්හුගේ සවු බවට යන්නේ යැ යන යමෙක් ඇද්ද මෙල වන්නට නො නිසි යැ. එයට අවකාශ ද නැත. 'මහණ ගොයුම්හු උපාලි ගහපති- හුගේ සවු බවට යන්නේ යැ'යන යමෙක් ඇද්ද මෙල වන්නට නිසි යැ. ගහපතිය, තෙපි යව. මහණ ගොයුම්හට මෙල කථාවස්තුයෙහි ලා වාදරෝපණ කරව. ගහපතිය, මම හෝ මහණ ගොයුම්හට වාදරොපණ කෙරෙමි. දීඝතපස්වී නුවට හෝ කෙරෙයි. තෙපි හෝ කරව'යි කී.

දෙවනවට ද . . . දීඝතපස්වී නුවට හෝ කෙරෙයි. තෙපි හෝ කරව යි. තුන්වනවට ද දීඝතපස්වී නුවට නිගණ්ඨනාතපුත්‍රයාට මෙල කී : 'වහන්ස, උපාලි ගහපති මහණ ගොයුම්හට වාදරොපණ කෙරෙයි' යන යමෙක් ඇද්ද මෙල මට නුරුස්නේ යැ. වහන්ස, මහණ ගොයුම්හු මායාවීහ. යම් මායායෙකින් අන්තොටුවන්ගේ සවුවන් ආවර්තන කෙරේ ද, එබඳු ආවර්තනමායාවක්, දන්නාහ'යි කී. තපස්විය, 'උපාලි ගහපති මහණ ගොයුම්හුගේ සවු බවට යන්නේ යැ' යන යමෙක් ඇද්ද, මෙල වන්නට නො නිසි යැ. අවකාශ ද නැත 'මහණ ගොයුම්හු උපාලිගහපතිහුගේ සවු බවට යන්නේ යැ' යන යමෙක් ඇද්ද, මෙල වන්නට නිසි යැ. ගැහැවිය තෙපි යව. මහණ ගොයුම්හට මේ කථාවස්තු- යෙහි ලා වාදරෝපණය කරව. ගැහැවිය, මම හෝ මහණ ගොයුම්හට වාදරොපණ කරන්නට නිස්සෙමි. දීඝතපස්වී නුවට හෝ නිස්ස. තෙපි හෝ නිසිව'යි, (නුවට නතපුත් කී.)

එවං භන්තෙති ඛො උපාලි ගහපති නිගණ්ඨස්ස නාතපුත්තස්ස පටිස්සුත්වා උට්ඨායාසනා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන පාවාරිකම්බවනං, යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උපාලි ගහපති භගවන්තං එතදවොච: ආගමා නු ඛ්වීධ භන්තෙ දීඝතපස්සී නිගණ්ඨොති. ආගමා ඛ්වීධ ගහපති දීඝතපස්සී නිගණ්ඨොති. අහු පන තෙ භන්තෙ දීඝතපස්සිනා නිගණ්ඨෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. අහු ඛො මෙ ගහපති දීඝතපස්සිනා නිගණ්ඨෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. යථා කථං පන තෙ භන්තෙ අහු දීඝතපස්සිනා නිගණ්ඨෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. අථ ඛො භගවා යාවතකො අහොසි දීඝතපස්සිනා නිගණ්ඨෙන සද්ධිං කථාසල්ලාපො තං සබ්බං උපාලිස්ස ගහපතිස්ස ආරොචෙසි.

එවං වුත්තෙ උපාලි ගහපති භගවන්තං එතදවොච: සාධු සාධු භන්තෙ තපස්සි, යථා තං සුතවතා සාවකෙන සම්මදෙව සත්ථුසාසනං ආජානන්තෙන, එවමෙවං දීඝතපස්සිනා නිගණ්ඨෙන භගවතො බ්‍යාකතං, කිං හි සොභති ඡවො මනොදණ්ඩො ඉමස්ස එවං ඔළාරිකස්ස කායදණ්ඩස්ස උපනිධාය. අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජතරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා වචීදණ්ඩො, නො තථා මනොදණ්ඩොති. සචෙ ඛො ත්වං ගහපති සච්චෙ පතිට්ඨාය මන්තෙය්‍යාසි, සියා නො එත්ථ කථාසල්ලාපොති සච්චෙ අහං භන්තෙ පතිට්ඨාය මන්තෙස්සාමි. හොතු නො එත්ථ කථාසල්ලාපොති

තං කිම්මඤ්ඤසි ගහපති, ඉධස්ස නිගණ්ඨො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො සීතොදකපටික්ඛිත්තො උණ්හොදකපටිසෙවී. සො සීතොදකං අලභමානො කාලං කරෙය්‍ය. ඉමස්ස පන ගහපති නිගණ්ඨො නාතපුත්තො කත්ථූපපත්තිං පඤ්ඤපෙතී'ති. අත්ථි භන්තෙ මනොසත්තා නාම දෙවා, තත්ථ සො උපපජ්ජති, තං කිස්ස හෙතු: අසු හි භන්තෙ මනොපටිබද්ධො කාලං කරොතීති. ගහපති ගහපති, මනසි කරිත්වා ඛො ගහපති බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං පච්ඡිමෙන වා පුරිමං. භාසිතා ඛො පන තෙ ගහපති එසා වාචා: සච්චෙ අහං භන්තෙ පතිට්ඨාය මන්තෙස්සාමි. හොතු නො එත්ථ කථාසල්ලාපොති. කිඤ්චාපි භන්තෙ භගවා එවමාහ, අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජ-තරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා නො තථා වචීදණ්ඩො නො තථා මනොදණ්ඩොති

තං කිම්මඤ්ඤසි ගහපති, ඉධස්ස නිගණ්ඨො[1] චාතුයාමසංවරසංවුතො සබ්බවාරිවාරිතො සබ්බවාරියුතො[2] සබ්බවාරිධුතො සබ්බවාරිඵුටො, සො අභික්කමන්තො පටික්කමන්තො බහු ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං ආපාදෙති. ඉමස්ස පන ගහපති නිගණ්ඨො නාතපුත්තො කං විපාකං පඤ්ඤපෙතීති. අසඤ්චෙතනිකං භන්තෙ නිගණ්ඨො නාතපුත්තො නො මහාසාවජ්ජං පඤ්ඤපෙතීති. සචෙ පන ගහපති, චෙතෙතීති. මහා-සාවජ්ජං භන්තෙ හොතීති. චෙතනං පන ගහපති නිගණ්ඨො නාතපුත්තො

1. නිගණ්ඨො නාටපුත්තො - මජ්ඣං.
2. සබ්බවාරියුත්තො - මජ්ඣං, ස්‍යා.

'වහන්ස, එසේ යැ'යි උපාලි ගහපති නිගණ්ඨනාතපුත්‍රයාහට පිළිවදන් දී හුනස්නෙන් නැඟී නිගණ්ඨනාතපුත්‍රයා සකසා වැඳ පැදකුණු කොට පාවාරික අඹවනයට ගොස් බුදුන් කරා එළැඹියේ යැ. එළැඹ බුදුන් සකසා වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් උපාලි ගැහැවි බුදුන්ට තෙල කී : 'වහන්ස, දීඝතපස්වී නුවට මෙහි ආ යැ හෝ? ගහපතිය, දීඝතපස්වී නුවට මෙහි ආ යැ. වහන්ස, දීඝතපස්වී නුවටහු හා තොප වහන්සේගේ කිසියම් කථාසල්ලාපයෙක් ඇත හෝ'යි. ගහපතිය, දීඝතපස්වී නුවටහු හා මාගේ කිසියම් කථා සල්ලාපයෙක් ඇත. වහන්ස, දීඝතපස්වී නුවටහු හා තොප වහන්සෙගේ කිසියම් කථාසල්ලාපය කෙසේ නම් වී ද?යි. එසඳ බුදුහු දීඝතපස්වී නුවටහු හා උපන් කථාසල්ලාපය තාක් එ හැම උපාලි ගහපතිහට වදළහ.

මෙසේ වදළ කල්හි උපාලි ගහපති බුදුන්ට තෙල කී: වහන්ස, තපස්වී සාධුතර යැ. මොනොවට ශාස්තෘශාසනය අවබෝධ කොට ගත් ශ්‍රැතවත් ශ්‍රාවකයක්හු විසින් යම් පරිදි පිළිතුරු දියැයුතු වී නම් එ පරිදි මැ දීඝතපස්වී නුවටහු විසින් භගවත්හට ප්‍රකාශ කරන ලද. මෙසේ මහත් වූ කායදණ්ඩය සඳහා ලාමක වූ මනෝදණ්ඩය කෙසේ හොබනේ වේ ද? වැළිත් පව්කම් කිරීමට පව්කම් පැවැත්මට කායදණ්ඩ මැ මහාසාවද්‍යතර යැ. වාග්දණ්ඩ එසේ නො වෙයි, මනොදණ්ඩත් එසේ නො වෙයි කී. ගහපතිය, ඉදින් තෙපි සත්‍යයෙහි පිහිටා මන්ත්‍රණය කරන්නහු වී නම් මෙහි ලා අපගේ කථාසල්ලාප වෙයි වදළෝ. වහන්ස, මම සැබැවැ පිහිටා මන්ත්‍රණ කෙරෙමි. මෙහි ලා අපගේ කථාසල්ලාප වේවයි.

ගහපතිය, ඒ කෙසේ හඟිහි? මෙලොව සිහිල්දිය පිළිකෙව් කළ උණුදිය වළඳ කරන නුවටෙක් හටගත් ආබාධ ඇත්තේ හටගත් දුක් ඇතියේ දැඩිගිලන් වූයේ වෙයි. හේ සිහිල්දිය නො ලබනුයේ කලුරිය කෙරෙයි. ගහපතිය, මුහුට නිගණ්ඨනාතපුත්‍ර කොතැන ඉපැත්ම පනවන්නේ ද?යි. වහන්ස, මනඃසත්ත්ව නම් දෙව් කෙනෙක් ඇත. එහි හේ උපදනේ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, තෙල නුවට මනඃප්‍රතිබද්ධ වැ කලුරිය කෙරෙයි. (එහෙයිනැ'යි කී.) ගැහැවිය, ගැහැවිය, මෙනෙහි කොට කියව, තාගේ පළමු කී බස හා පසු වැ කී බස ද පසු වැ කී බස හා පළමු කී බස ද සවිත නො වෙයි. ගහපතිය, තා විසින් තෙල බස කියන ලදී : 'වහන්ස, මම සත්‍යයෙහි පිහිටා මන්ත්‍රණය කරමි. අපගේ මෙහි කථාසල්ලාප වේවයි' කියා යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියතුදු වැළිත් පව්කම් කිරීමට පව්කම් පැවැත්මට කායදණ්ඩ මැ මහාසාවද්‍යතර වෙයි. වාග්දණ්ඩ එසේ නො වෙයි. මනොදණ්ඩත් එසේ නො වෙයි' කී.

ගැහැවිය, ඒ කිමැ'යි හඟිහි? මෙලොවිහි චාතුයාමසංවරයෙන් සංවෘත වූ සියලු සිහිල් දිය පිළිකෙව් කළ සියලු පව් වැළැකීමෙහි යෙදුණු සියලු පාපවාරණයෙන් වැළහූ පව් ඇති සියලු පාපවාරණයෙන් පහස්නාලද නිගණ්ඨයෙක් වන්නේ යැ. හේ ඉදිරියට යනුයේ පෙරාලා නවත්නේ බොහෝ කුඩා පණුවන් වධයට පමුණුවයි. ගැහැවිය, මොහුට වැළිත් නිගණ්ඨනාතපුත්‍ර කවර විපාකයක් පනවා ද ?යි. වහන්ස, නිගණ්ඨනාතපුත්‍ර අසංචෙතනික කර්මය මහාසාවද්‍ය කොට නො පනවා යයි. වැළි හැගැවිය, ඉදින් සිතා නම් (කෙබඳු වේ ද ?යි.) වහන්ස, මහාසාවද්‍ය වේ යයි. ගැහැවිය, චේතනාව වැළිත් නිගණ්ඨනාතපුත්‍ර

කිස්මිං පඤ්ඤපෙසීති. මනොදණ්ඩස්මිං භන්තෙති. ගහපති ගහපති, මනසිකරිත්වා ඛො ගහපති බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං පච්ඡිමෙන වා පුරිමං. භාසිතා ඛො පන තෙ ගහපති එසා වාචා, සච්චෙ අහං භන්තෙ පතිට්ඨාය මන්තෙස්සාමි. හොතු නො එත්ථ කථාසල්ලාපොති. කිඤ්චාපි භන්තෙ භගවා එවමාහ, අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජතරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා වචීදණ්ඩො නො තථා මනොදණ්ඩොති.

තං කිං මඤ්ඤසි ගහපති, අයං නාළන්දා ඉද්ධා චෙව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සාති. එවං භන්තෙ, අයං නාළන්දා ඉද්ධා චෙව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සාති. තං කිම්මඤ්ඤසි ගහපති: ඉධ පුරිසො ආගච්ඡෙය්‍ය උක්ඛිත්තාසිකො. සො එවං වදෙය්‍ය: අහං යාවතිකා ඉමිස්සා නාළන්දාය පාණා, තෙ එකෙන ඛණෙන එකෙන මුහුත්තෙන එකමංසඛලං එකමංසපුඤ්ජං කරිස්සාමීති. තං කිම්මඤ්ඤසි ගහපති, පහොති නු ඛො සො පුරිසො යාවතිකා ඉමිස්සා නාළන්දාය පාණා තෙ එකෙන ඛණෙන එකෙන මුහුත්තෙන එකමංසඛලං එකමංසපුඤ්ජං කාතුන්ති. දසපි භන්තෙ පුරිසා විසම්පි[1] පුරිසා තිංසම්පි[2] පුරිසා චත්තාරිසම්පි පුරිසා පඤ්ඤාසම්පි පුරිසා නප්පහොන්ති, යාවතිකා ඉමිස්සා නාළන්දාය පාණා, තෙ එකෙන ඛණෙන එකෙන මුහුත්තෙන එකමංසඛලං එකමංසපුඤ්ජං කාතුං. කිං හි සොභති එකො ඡවො පුරිසොති.

තං කිම්මඤ්ඤසි ගහපති, ඉධාගච්ඡෙය්‍ය සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො. සො එවං වදෙය්‍ය: අහං ඉමං නාළන්දං එකෙන මනොපදොසෙන භස්මං කරිස්සාමීති. තං කිම්මඤ්ඤසි ගහපති, පහොති නු ඛො සො සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො ඉමං නාළන්දං එකෙන මනොපදොසෙන භස්මං කාතුන්ති. දසපි භන්තෙ නාළන්දා විසතිම්පි නාළන්දා තිංසම්පි නාළන්දා චත්තාරීසම්පි නාළන්දා පඤ්ඤාසම්පි නාළන්දා පහොති සො සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො එකෙන මනොපදොසෙන භස්මං කාතුං කිං හි සොභති එකා ඡවා නාළන්දාති. ගහපති[3] ගහපති මනසි කරිත්වා ඛො ගහපති බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධියති පුරිමෙන වා පච්ඡිමං පච්ඡිමෙන වා පුරිමං. භාසිතා ඛො පන තෙ ගහපති එසා වාචා: සච්චෙ අහං භන්තෙ පතිට්ඨාය මන්තෙස්සාමි. හොතු නො එත්ථ කථාසල්ලාපොති. කිඤ්චාපි භන්තෙ භගවා එවමාහ, අථ ඛො කායදණ්ඩොව මහාසාවජ්ජතරො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා. නො තථා වචීදණ්ඩො නො තථා මනොදණ්ඩොති.

තං කිම්මඤ්ඤසි ගහපති, සුතං තෙ දණ්ඩකාරඤ්ඤං[4] කාලිඞ්ගාරඤ්ඤං මෙජ්ඣාරඤ්ඤං[5] මාතඞ්ගාරඤ්ඤං අරඤ්ඤං අරඤ්ඤභූතන්ති. එවම්භන්තෙ. සුතං මෙ දණ්ඩකාරඤ්ඤං කාලිඞ්ගාරඤ්ඤං මෙජ්ඣාරඤ්ඤං මාතඞ්ගාරඤ්ඤං අරඤ්ඤං අරඤ්ඤභූතන්ති. තං කිම්මඤ්ඤසි ගහපති,

---

1. විසතිම්පි භන්තෙ-සීමු.
2. භන්තෙ-මජසං. (අධිකං)
3. තෙන හි ගහපති-මජසං.
4. දණ්ඩකිරඤ්ඤං-මජසං, සයා.
5. මජ්ඣාරඤ්ඤං-මජසං.

කවර කොටසෙක්හි ලා පනවා ද?යි. 'වහන්ස, මනෝදණ්ඩයෙහි ලා පනවා' යයි. ගෘහපතිය, ගෘහපතිය, සිහි එළවා කියව. තා පළමු කී බස හා පසු වැ කී බස සටිත නො වෙයි. පසු වැ කී බස හා පළමු කී බස සටිත නො වෙයි. ගෘහපතිය, තොප විසින් තෙල බස් කියනලද වෙයි. 'වහන්ස, මම සත්‍යයෙහි පිහිටා මන්ත්‍රණය කරමි. අපගේ මෙහි කථා සල්ලාප වේවයි! කියා යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියතුදු වැළිත් පව්කම් කිරීමට පව්කම් පැවැත්මට කායදණ්ඩ මැ මහාසාවද්‍යතර වෙයි. වචීදණ්ඩ එසේ නො වෙයි, මනොදණ්ඩත් එසේ නො වේ යයි.

ගෘහපතිය, ඒ කිමැ'යි හඟනෙහි? මේ නාලන්දා නුවර සමෘද්ධ වූයේ ඉතා සමෘද්ධ වූයේ බොහෝ මිනිසුන් විසින් ගැවැසිගතැ'යි. එසේ යැ වහන්ස, මේ නාලන්දානුවර සමෘද්ධ වූයේ ඉතා සමෘද්ධ වූයේ බොහෝ ජනයන් ඇති වැ මිනිසුන් විසින් ආකීර්ණ වී යයි. ගෘහපතිය, ඒ කිමැ'යි හඟිහි? මෙහි ඔසවාගත් කඩු ඇති පුරුෂයෙක් එන්නේ යැ, හේ මෙසේ කියන්නේ නම් මේ නාලන්දායෙහි යම් තාක් සත්ත්වයෝ ඇද්ද, ඔවුන් එකෙණෙහි එක් මොහොතෙහි එක් මස් රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නෙමි'යි කියා නම් ගෘහපතිය, ඒ කිමැ'යි හඟිහි? ඒ පුරුෂ මේ නාලන්දායෙහි යම් තාක් ප්‍රාණීහු ඇද්ද, ඔවුන් එක් ඇසිල්ලෙකින් එක් මොහොතෙකින් එක් මස් රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නට පොහොනේ වේ ද?යි. වහන්ස, පුරුෂයෝ දසදෙනෙකුදු විසිදෙනෙකුදු තිස්දෙනෙකුදු සතලිස්දෙනෙකුදු පුරුෂයෝ පනස්දෙනෙකුදු මේ නාලන්දායෙහි යම් පමණ සත්ත්වයෝ ඇද්ද, ඔවුන් එක් ඇසිල්ලෙකින් එක් මොහොතෙකින් එක් මස් රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නට නො පොහොනාහ. එක් ලාමක පුරුෂයෙක් කිම නිසි වේ ද?යි.

ගෘහපතිය, ඒ කිමැ'යි හඟිහි? මෙලොවැ ඍද්ධි ඇති චිත්තවශීභාවයට පැමිණි මහණෙක් හෝ බමුණෙක් හෝ එන්නේ යැ. හේ මෙසේ කියන්නේ නම්, මම මේ නාලන්දාව එක් චිත්තප්‍රදොෂයෙකින් හළු කරන්නෙමි'යි. ගෘහපතිය, ඒ කිමැ'යි හඟනෙහි? ඍද්ධි ඇති චේතොවශීප්‍රාප්ත ඒ මහණ හෝ බමුණු හෝ මේ නාලන්දාව එක් චිත්තප්‍රදෙෂයෙකින් හළු කරන්නට පොහොනේ ද?යි. වහන්ස, නාලන්දා දසයකුදු විස්සකුදු තිසකුදු සතලිසකුදු නාලන්දා පනසකුදු ඍද්ධිමත් චේතොවශිප්‍රාප්ත ඒ මහණ හෝ බමුණු හෝ එක් චිත්තප්‍රදෙෂයෙකින් හළු කරන්නට පොහොනේ යැ. එක් ලාමක වූ නාලන්දාව කිම? ගෘහපතිය, ගෘහපතිය, සිහි එළවා කියහි? තාගේ පළමු කී බස හා පසු වැ කී බස ද පසුවැ කී බස හා පළමු කී බස ද නො ගැළපෙයි. ගෘහපතිය, තොප විසින් තෙල බස් කියන ලද. වහන්ස, මම සත්‍යයෙහි පිහිටා මන්ත්‍රණ කරන්නෙමි. මෙහි අපගේ කථාසල්ලාප වේවයි කියා යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියතුදු වැළිත් පව්කම් කිරීමට පව්කම් පැවැත්මට කායදණ්ඩ මැ මහාසාවද්‍යතර යැ. වාග්දණ්ඩ එසේ නො වෙයි. මනොදණ්ඩත් එසේ නො වේ යයි.

ගෘහපතිය, ඒ කිමැ'යි සිතහි? තොප විසින් දණ්ඩකාරණ්‍යය, කාලිඞ්ගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතඞ්ගාරණ්‍යය නො ගම් වැ වල් වූ පරිදි ඇසූවිරු ද?යි. එසේ යැ වහන්ස, දණ්ඩකාරණ්‍යය, කාලිඞ්ගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතඞ්ගාරණ්‍යය නො ගම් වැ වල් වූ පරිදි මා විසින් ඇසූවිරු යයි. ගෘහපතිය, ඒ කිමැ'යි සිතහි? ඒ දණ්ඩකාරණ්‍යය,

කින්ති තෙ සුතං: කෙන තං දණ්ඩකාරඤ්ඤං කාලිඞ්ගාරඤ්ඤං මෙජ්ඣාරඤ්ඤං මාතඞ්ගාරඤ්ඤං අරඤ්ඤං අරඤ්ඤභූතන්ති. සුතං මෙතං භන්තෙ ඉසීනං මනොපදොසෙන තං දණ්ඩකාරඤ්ඤං කාලිඞ්ගාරඤ්ඤං මෙජ්ඣාරඤ්ඤං මාතඞ්ගාරඤ්ඤං අරඤ්ඤං අරඤ්ඤභූතන්ති. ගහපති ගහපති, මනසිකරිත්වා ඛො ගහපති බ්‍යාකරොහි. න ඛො තෙ සන්ධීයති පුරිමෙන වා පච්ඡිමං, පච්ඡිමෙන වා පුරිමං. භාසිතා ඛො පන තෙ ගහපති එසා වාචා: සච්චෙ අහං භන්තෙ පතිට්ඨාය මන්තෙස්සාමි. හොතු නො එත්ථ කථාසල්ලාපොති.

පුරිමෙනෙවාහං භන්තෙ ඔපම්මෙන භගවතො අත්තමනො අභිරද්ධො අපි චාහං ඉමානි භගවතො විචිත්‍රානි පඤ්හපටිභාණානි සොතුකාමො එවා'හං භගවන්තං පච්චනීකාතබ්බං අමඤ්ඤිස්සං. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය. මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

අනුවිච්චකාරං ඛො ගහපති කරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති. ඉමිනා'පහං භන්තෙ භගවතො භිය්‍යොසොමත්තාය අත්තමනො අභිරද්ධො, යං මං භගවා එවමාහ: අනුවිච්චකාරං ඛො ගහපති කරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති. මං හි භන්තෙ අඤ්ඤතිත්ථියා සාවකං ලභිත්වා කෙවලකප්පං නාලන්දං පටාකං පරිහරෙය්‍යුං: උපාලි අම්හාකං ගහපති සාවකත්තුපගතොති. අථ ච පන මං භගවා එවමාහ: අනුවිච්චකාරං ඛො ගහපති කරොහි, අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති. එසාහම්භන්තෙ දුතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

දීඝරත්තං ඛො තෙ ගහපති නිගණ්ඨානං ඔපානභූතං කුලං, යෙන නෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසීති. ඉමිනාපහං භන්තෙ භගවතො භිය්‍යොසොමත්තාය අත්තමනො අභිරද්ධො, යං මං භගවා එවමාහ: දීඝරත්තං ඛො තෙ ගහපති නිගණ්ඨානං ඔපානභූතං කුලං, යෙන නෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසීති- සුතං මෙතං භන්තෙ. සමණො ගොතමො එවමාහ: මය්හමෙව දානං දාතබ්බං, නාඤ්ඤෙසං දානං දාතබ්බං, මය්හමෙව සාවකානං දානං දාතබ්බං, නාඤ්ඤෙසං සාවකානං දානං දාතබ්බං, මය්හමෙව දින්නං මහප්ඵලං, නාඤ්ඤෙසං දින්නං මහප්ඵලං, මය්හමෙව සාවකානං දින්නං මහප්ඵලං, නාඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵලන්ති. අථ ච පන මං භගවා නිගණ්ඨෙසුපි දානෙ සමාදපෙති. අපි ච භන්තෙ මයමෙත්ථ කාලං ජානිස්සාම. එසාහම්භන්තෙ තතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

කාලිඞ්ගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතඞ්ගාරණ්‍යය තොප විසින් කිමෙකින් නො ගම් වැ වල් වී යයි අසනලද ද? වහන්ස, ඒ දණ්ඩකාරණ්‍යය, කාලිඞ්ගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතඞ්ගාරණ්‍යය ඍෂීන්ගේ දූහැවිලින් නො ගම් වැ වල් වී යයි මා විසින් අසනලදැ'යි. ගැහැවිය, ගැහැවිය, සිහි එළවා කියව. තාගේ පළමු කී බස හා පසු වැ කී බස ද පසු වැ කී බස හා පළමු කී බස ද සවිත නො වෙයි. ගැහැවිය, තොප විසින් මෙල බස් කියනලද : වහන්ස, මම සත්‍යයෙහි පිහිටා මන්ත්‍රණ කරන්නෙමි. මෙහි ලා අපගේ කථාසල්ලාප වේවයි කියා යි.

වහන්ස, මම පළමු උපමායෙන් මැ භාග්‍යවතුන් වහන්සේගේ (ප්‍රශ්නව්‍යාකරණයෙහි) සතුටුසිත් ඇතියෙම් ප්‍රසන්න වීමි. එතෙකුදු වත් මම භාග්‍යවතුන් වහන්සේගේ විසිතුරු ප්‍රශ්නව්‍යාකරණයන් අසනු කැමැති වැ මෙසේ මම් භාග්‍යවතුන් වහන්සේට විරුද්ධ බස් කියයුතු යයි සිතීමි. වහන්ස, ඉතා මැනැවැ. වහන්ස, ඉතා මැනැවැ. වහන්ස, යම් පරිදි යටිහුරු කරනලද්දක් උඩුහුරු කරන්නේ හෝ වේ ද, පිළිසන්වූවක් විවර කරන්නේ හෝ වේ ද, මුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, අඳුරෙහි ඇස් ඇත්තාහු රූප දකිත්ව යි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එපරිදි මැ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් දෙසනලද. වහන්ස, මම් බුදුන් සරණ කොට යමි. ධර්මය ද සඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් කොට දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට ධරනසේක්ව'යි.

ගැහැවිය, විමසා කරව. විමසා කිරීම තොප වැනි ප්‍රසිද්ධ පුරුෂයනට සුන්දර වේ යයි. වහන්ස, මම මෙ කරුණෙනුදු භාග්‍යවතුන් වහන්සේට වෙසෙසින් සතුටු වූයෙම් ඇලුණෙම් වෙමි. භාග්‍යවතුන් වහන්සේ යම් හෙයෙකින් මට මෙසේ 'ගැහැවිය, විමසා කරව. විමසා කිරීම තොප වැනි ප්‍රසිද්ධ පුරුෂයනට සුන්දර වේ යයි, වදාළසේක් ද එහෙයිනි. වහන්ස, අන්‍යතීර්ථකයෝ මා ශ්‍රාවක කොට ලැබ 'උපාලි ගැහැවි අපගේ ශ්‍රාවක බවට පැමිණියේ යැ'යි සියලු නාලන්‍දාව වටා දද නඟා ඇවිදුති. එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ වදාළහ : "ගැහැවිය, විමසා කරව. විමසා කිරීම තොප වැනි ප්‍රසිද්ධ පුරුෂයනට සුන්දර වේ" යයි. වහන්ස, මම් දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්‍ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට මා ධරනසේක්ව'යි.

ගැහැවිය, තොපගේ ගෙය බොහෝ දවස් නුවටනට පැන්පොකුණක් මෙන් සිටියේ යැ. එහෙයින් එළැඹියා වූ ඔවුනට පිණ්ඩපාතය දියැයුතු කොට සිතව යි. වහන්ස, මම මෙ කරුණෙනුදු භාග්‍යවතුන් වහන්සේට වෙසෙසින් සතුටු වූයෙම් ඇලුණෙම් වෙමි. යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ "ගැහැවිය, තොපගේ ගෙය බොහෝ දවස් නුවටනට පැන්පොකුණක් මෙන් සිටියෙ යැ. එහෙයින් උපගත වූ ඔවුනට පිණ්ඩ-පාතය දියැයුතු කොට සිතව'යි වදාළසේක් ද එහෙයිනි. වහන්ස, මා විසින් මෙල අසනලද: "මහණ ගොයුම්හු මෙසේ කියති : 'මට මැ දන් දියැයුත්තෙ යැ. අන්‍යයනට දන් නො දියැයුත්තෙ යැ, මාගේ සවුවනට මැ දන් දියැයුත්තෙ යැ, අනුන්ගේ සවුවනට දන් නො දියැයුත්තෙ යැ, මට මැ දෙනලද්ද මහත්ඵල යැ. අනුනට දෙන ලද්ද මහත්ඵල නො වෙයි, මාගේ සවුවනට මැ දෙනලද්ද මහත්ඵල යැ. අනුන්ගේ සවුවනට දෙනලද්ද මහත්ඵල නො වේ'යයි. එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ නුවටුන් කෙරෙහි ද දනයෙහි මා සමාදන් කරවනසේක. තවද වහන්ස, මෙහි ලා අපි මැ කල් දන්නම්හ. වහන්ස, මම තෙවනවට ද භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍ය-වතුන් වහන්සේ අද පටන් දිවි හිම් වැ සරණ ගිය උපාසකයකු කොට මා ධරනසේක්ව'යි.

අථ ඛො භගවා උපාලිස්ස ගහපතිස්ස ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං, ඔකාරං සඞ්කිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි උපාලිං ගහපතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය. එවමෙවං උපාලිස්ස ගහපතිස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යඞ්කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති. අථ ඛො උපාලි ගහපති දිට්ඨධම්මො පත්තධම්මො විදිත ධම්මො පරියොගාළ්හ ධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථඞ්කථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: හන්ද ච'දානි මයං භන්තෙ ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්වං ගහපති කාලං මඤ්ඤසීති.

අථ ඛො උපාලි ගහපති භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන සකං නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා දොවාරිකං ආමන්තෙසි: අජ්ජතග්ගෙ සම්ම දොවාරික, ආවරාමි ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං, අනාවටං ද්වාරං භගවතො භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, සචෙ කොචි නිගණ්ඨො ආගච්ඡති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: තිට්ඨ භන්තෙ, මා පාවිසි, අජ්ජතග්ගෙ උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො. ආවටං ද්වාරං නිගණ්ඨානං, නිගණ්ඨීනං, අනාවටං ද්වාරං භගවතො භික්ඛූනං භික්ඛුනීනං, උපාසකානං උපාසිකානං. සචෙ තෙ භන්තෙ පිණ්ඩකෙන අත්ථො එත්ථෙව තිට්ඨ එත්ථෙව තෙ ආහරිස්සන්තීති. එවං භන්තෙති ඛො දොවාරිකො උපාලිස්ස ගහපතිස්ස පච්චස්සොසි.

අස්සොසි ඛො දීඝතපස්සී නිගණ්ඨො උපාලි කිර ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතොති. අථ ඛො දීඝතපස්සී නිගණ්ඨො යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සුතං මෙතං භන්තෙ උපාලි කිර ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතොති. අට්ඨානං ඛො එතං තපස්සී අනවකාසො යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍යාති. දුතියම්පි ඛො—පෙ— තතියම්පි ඛො දීඝතපස්සී නිගණ්ඨො නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සුතං මෙතං භන්තෙ, උපාලි කිර ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතොති. අට්ඨානං ඛො එතං තපස්සී අනවකාසො යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍යාති. හන්ද චාහං භන්තෙ ගච්ඡාමි යාව ජානාමි යදි වා උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො යදි වා නොති. ගච්ඡ ත්වං තපස්සි ජානාහි යදි වා උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො යදි වා නොති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උපාලි ගැහැවිහට පිළිවෙළ කථා වදාළසේක. ඒ මෙසේ යැ : දානකථා යැ ශීලකථා යැ ස්වර්ගකථා යැ කාමයන්ගේ ආදීනව යැ, ලමු බව යැ, කෙලෙසිලි බව යැ. නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස යැ යන මේ වදාළසේක. යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ උපාලි ගහපතිහු කල්‍ය සිත් ඇත්තහු මෘදු සිත් ඇත්තහු විනීවරණ සිත් ඇත්තහු උදග්‍ර සිත් ඇත්තහු ප්‍රසන්න සිත් ඇත්තහු දැනගත්සේක් ද එකල්හි බුදුවරුන්-ගේ යම් සාමුක්කංසික දෙශනාවක් ඇද්ද ඒ දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය වදාළසේක. යම්සේ පහ වූ කිලුටු ඇති ශුද්ධ වස්ත්‍රයෙක් මොනොවට රජන් ගන්නෙ ද එසෙයින් මැ උපාලි ගහපතිහට එ අස්නෙහි මැ විගතරජස් ඇති විගතමල ඇති ධර්මචක්ෂුස පහළ විය : 'යම්කිසි සමුදයධර්මයෙක් ඇද්ද එ හැම නිරුද්ධ වන ස්වභාව ඇතැ'යි. ඉක්බිති උපාලි ගහපති දුටු (සිව්සස්) දහම් ඇතියේ පැමිණි දහම් ඇතියේ දත් දහම් ඇතියේ බැසගත් දහම් ඇතියේ තරණය කළ විචිකිත්සා ඇතියේ පහවූ සැක ඇතියේ විශාරද බවට පැමිණියේ ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූයේ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : 'වහන්ස, අපි දැන් යම්හ. අපි බොහෝ කිස ඇතියම්හ. බොහෝ කරණී ඇතියම්හ'යි. ගැහැවිය, තෙපි දැන් එයට කල් දනුව'යි.

ඉක්බිති උපාලි ගැහැවි භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට සිය නිවෙස්න කරා එළැඹියේ යැ. එළැඹ ද්වාරපාලයා කැඳවී යැ. 'සගය, දෙවාරිකය, අද පටන් කොට තුවට තුවටු දෙපසට දෙර වසමි. අප බුදුන්ගේ මහණ මෙහෙණ උවසු උවැසියනට දෙර විවෘත වෙයි. ඉදින් යම් මැ තුවටෙක් ආ නම් තුලුන්ට තෙපි මෙසේ කියව. වහන්ස, සිටිනු මැනැවැ, නො පිවිසෙනු මැනැවැ, අද පටන් කොට උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියේ යැ. තුවට තුවටුනට දෙර ඇවිරිණ. බුදුන්ගේ මහණ මෙහෙණ උවසු උවැසියනට දෙර නො ඇවිරිණි. වහන්ස, ඉදින් තොපට පිණ්ඩයෙන් වැඩ වේ නම් මෙහි මැ සිටිනු මැනැවැ. තොපට මෙහි ලා මැ ගෙන එති'යි. (කියා ගෙට වන.) වහන්ස, එසේ යයි දෙරටු ගොවු උපාලි ගැහැවිහට පිළිවදන් දිනි.

දීඝතපස්වී තුවට 'උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට පැමිණියේ යැ'යි ඇසි. එකල්හි දීඝතපස්වී තුවට නිගණ්ඨනාතපුත්‍රයා කරා ගියෙ, ගොස් නිගණ්ඨනාතපුත්‍රයාට තෙල කී : 'වහන්ස, උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියේ ලැ 'යි තෙල මා විසින් අසනලදැ'යි. තපස්විය, උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට යන්නෙ යැ යන යමෙක් ඇද්ද, තෙල වන්නට නො නිසි යැ. අවකාශ ද නැත. 'මහණ ගොයුම් උපාලි ගැහැවිහුගේ සවු බවට යන්නෙ යැ' යන යමෙක් ඇද්ද, තෙල වන්නට නිසි යැ යි කී. දෙවනවට ද . . . . තෙවනවට ද දීඝතපස්වී තුවට නිගණ්ඨනාතපුත්‍රයාහට තෙල කී : 'වහන්ස, උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවුබවට පැමිණියේ ලැ'යි තෙල මා විසින් අසනලදි. තපස්විය, 'උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට යන්නෙ යැ' යන යමෙක් ඇද්ද, තෙල වන්නට නො නිසි යැ. 'මහණ ගොයුම් උපාලි ගැහැවිහුගේ සවු බවට යන්නෙ යැ' යන යමෙක් ඇද්ද තෙල කරුණ ඇතැ'යි කී. වහන්ස, දැන් මම යමි. උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ හෝ නොහොත් නො ගියෙ හෝ'යි දනිම් මැ යැ. තපස්විය තෙපි යව. උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ හෝ නොහොත් නොගියෙ හො'යි දත්ව යි.

අථ ඛො දීඝතපස්සී නිගණ්ඨො යෙන උපාලිස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. අද්දසා ඛො දොවාරිකො දීඝතපස්සිං නිගණ්ඨං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන දීඝතපස්සිං නිගණ්ඨං එතදවොච: තිට්ඨ භන්තෙ, මා පාවිසි. අජ්ජතග්ගෙ උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො, ආවටං ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං, අනාවටං ද්වාරං භගවතො භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං සචෙ තෙ භන්තෙ පිණ්ඩකෙන අත්ථො, එත්ථෙව තිට්ඨ. එත්ථෙව තෙ ආහරිස්සන්තීති. න මෙ ආවුසො පිණ්ඩකෙන අත්ථොති වත්වා තතො පටිනිවත්තිත්වා යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සච්චංයෙව ඛො භන්තෙ යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො. එතං ඛො තෙ අහං භන්තෙ නාලත්ථං: න ඛො මෙතං භන්තෙ රුච්චති යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍ය. සමණො හි භන්තෙ ගොතමො මායාවී, ආවට්ටනිං මායං ජානාති, යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතීති. ආවට්ටො ඛො තෙ භන්තෙ උපාලි ගහපති සමණෙන ගොතමෙන ආවට්ටනියා මායායාති. අට්ඨානං ඛො එතං තපස්සි අනවකාසො යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍යාති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො දීඝතපස්සී නිගණ්ඨො නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සච්චං යෙව ඛො භන්තෙ යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො: එතං ඛො තෙ අහං භන්තෙ නාලත්ථං: න ඛො මෙතං භන්තෙ රුච්චති, යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍ය. සමණො හි භන්තෙ ගොතමො මායාවී, ආවට්ටනිං මායං ජානාති. යාය අඤ්ඤතිත්ථියානං සාවකෙ ආවට්ටෙතීති. ආවට්ටො ඛො තෙ භන්තෙ උපාලි ගහපති සමණෙන ගොතමෙන ආවට්ටනියා මායායාති. අට්ඨානං ඛො එතං තපස්සි අනවකාසො යං උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය ඨානඤ්ච ඛො එතං විජ්ජති යං සමණො ගොතමො උපාලිස්ස ගහපතිස්ස සාවකත්තං උපගච්ඡෙය්‍ය. හන්ද චාහං තපස්සි ගච්ඡාමි යාව සාමං යෙව ජානාමි. යදි වා උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො යදි වා නොති.

අථ ඛො නිගණ්ඨො නාතපුත්තො මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං යෙන උපාලිස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. අද්දසා ඛො දොවාරිකො නිගණ්ඨං නාතපුත්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන නිගණ්ඨං නාතපුත්තං එතදවොච: තිට්ඨ භන්තෙ, මා පාවිසි. අජ්ජතග්ගෙ උපාලි ගහපති සමණස්ස ගොතමස්ස සාවකත්තං උපගතො, ආවටං ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං, අනාවටං ද්වාරං භගවතො භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං සචෙ තෙ භන්තෙ පිණ්ඩකෙන අත්ථො එත්ථෙව තිට්ඨ. එත්ථෙව තෙ ආහරිස්සන්තීති. තෙන හි සම්ම දොවාරික, යෙන උපාලි ගහපති තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා උපාලිං ගහපතිං එවං වදෙහි: නිගණ්ඨො භන්තෙ නාතපුත්තො මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං බහිද්වාරකොට්ඨකෙ ඨිතො. සො තෙ දස්සනකාමොති. එවං භන්තෙති ඛො දොවාරිකො නිගණ්ඨස්ස නාතපුත්තස්ස පටිස්සුත්වා යෙන උපාලි ගහපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උපාලිං

ඉක්බිති දීඝතපස්වී නුවට උපාලි ගැහැවිහුගේ නිවෙස්න කරා ගියෙ, දෙරටුගොවු දීඝතපස්වී නුවට එන්නහු දුරැ ලා මැ දිට. දක දීඝතපස්වී නුවටහට තෙල කී : 'වහන්ස, සිටුව. නො වදිනු මැනැවැ. අද පටන් කොට උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ යැ. නුවට නුවටුනට දෙර වැසිණ, බුදුන්ගේ මහණ මෙහෙණ උවසු උවැසියනට දෙර නො වැසිණ. වහන්ස, ඉදින් තොපට බතින් අපී ඇත් නම් මෙහි මැ සිටුව. මෙහි ලා මැ තොපට ගෙන එති'යි කී. 'ඇවත, මට බතින් වැඩෙක් නැතැ'යි කියා එයින් පෙරලා නිගණ්ඨනාතපුත්‍රයා කරා ගියෙ, ගොස් නිගණ්ඨනාතපුත්‍රයාට තෙල කී : 'වහන්ස, 'උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ යැ' යනු සැබෑ මැ යි. වහන්ස, මම තොපගේ තෙල සවු වළහනු නො ලත්මි. වහන්ස, 'උපාලි ගැහැවි මහණ-ගොයුම්හට වාදරෝපණ කරන්නෙ යැ' යන යමෙක් ඇද්ද තෙල මට නො රිසුණේ යැ. වහන්ස, මහණ ගොයුම්හු මායා ඇත්තාහ. යම් මායායෙකින් අන්තොවු වන්ගේ සවුවන් ආවත්‍ත්න කොට ගනිත් ද එබඳු ආවත්‍ත්නී මායාවක් දන්නාහ. වහන්ස, තොපගේ උපාලි ගැහැවි මහණ ගොයුම්හු විසින් අවත්‍ත්නී මායායෙන් ආවර්තිත වැ ඇතැ'යි. තපස්විය 'උපාලි ගැහැවි මහණගොයුම්හුගේ සවු බවට ගියෙ යැ' යන යමෙක් වේ ද තෙල වන්නට නො නිසි යැ. අවකාශ ද නැත. 'මහණ ගොයුම් උපාලි ගැහැවිහුගේ සවු බවට යන්නෙ යැ' යන යමෙක් වේ ද තෙල කරුණ ඇතැ'යි. දෙවනවට ද .... තුන්වනවට ද දීඝතපස්වී නුවට නිගණ්ඨනාතපුත්‍රයාට තෙල කී : 'වහන්ස, උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ යැ' යන යමෙක් වේ ද තෙල සැබෑ මැ යැ. වහන්ස, මම තොපගේ තෙල සවු වළහන්නට නො ලත්මි. වහන්ස, 'උපාලි ගැහැවි මහණ ගොයුම්හට වාදරොපණ කරන්නෙ යැ' යන යමෙක් වේ ද තෙල මට නො රිසුණේ යැ. වහන්ස, මහණ ගොයුම්හු මායාවීහ. යම් මායායෙකින් අන්තොවුවන්ගේ සවුවන් ආවත්‍ත්න කොට ගනිත් ද එබඳු ආවත්‍ත්නී මායාවක් දන්නාහ. වහන්ස, තොපගේ උපාලි ගැහැවි මහණ ගොයුම්හු විසින් ආවර්තිත වැ ඇතැ'යි කී. තපස්වීය, 'උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට යන්නෙ යැ' යන යමෙක් ඇද්ද, තෙල වන්නට නො නිසි යැ. 'මහණ ගොයුම්හු උපාලි ගැහැවිහුගේ සවු බවට යන්නාහ' යන යමෙක් වේ ද තෙල කරුණ විද්‍යමාන වෙයි. තපස්විය, එබැවින් මම යමි. උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ යැ හෝ නොහොත් නො ගියෙ යැ හො'යි මම් මැ දනිමි'යි.

ඉක්බිති නිගණ්ඨනාතපුත්‍ර මහත් නුවට පිරිස් හා සමග උපාලි ගැහැවිහුගේ නිවෙස්න කරා ගියෙ යැ. දෙරටුගොවු නිගණ්ඨනාතපුත්‍රයා එන්නහු දුර දී මැ දිටි. දක නිගණ්ඨ-නාතපුත්‍රයාට තෙල කී : 'වහන්ස, සිටුව. නො වදුව, අදපටන් කොට උපාලි ගැහැවි මහණ ගොයුම්හුගේ සවු බවට ගියෙ වෙයි. නුවට–නුවටුනට දෙර ඇවිරිණ. බුදුන්ගේ මහණ මෙහෙණ උවසු උවැසියනට දෙර නො ඇවිරිණ. වහන්ස, ඉදින් තොපට බතින් වැඩ ඇත් නම් මෙහි මැ සිටුව. මෙහි ලා මැ තොපට ගෙන එති'යි කී. සගය ,දෙවාරිකය, එහෙයින් උපාලි ගැහැවිහු කරා එළැඹෙව. එළැඹැ උපාලි ගැහැවිහට මෙසේ කියව :

ගහපතිං එතදවොච: නිගණ්ඨො භන්තෙ නාතපුත්තො මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං බහිද්වාරකොට්ඨකෙ ඨිතො, සො තෙ දස්සනකාමොති. තෙන හි සම්ම දෞවාරික, මජ්ඣිමාය ද්වාරසාලාය ආසනානි පඤ්ඤපෙහීති. එවං භන්තෙති ඛො දෞවාරිකො උපාලිස්ස ගහපතිස්ස පටිස්සුත්වා මජ්ඣිමාය ද්වාරසාලාය ආසනානි පඤ්ඤපෙත්වා යෙන උපාලි ගහපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උපාලිං ගහපතිං එතදවොච: පඤ්ඤත්තානි ඛො තෙ භන්තෙ මජ්ඣිමාය ද්වාරසාලාය ආසනානි. යස්සදානි කාලං මඤ්ඤසීති.

අථ ඛො උපාලි ගහපති යෙන මජ්ඣිමා ද්වාරසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා යං තත්ථ ආසනං අග්ගඤ්ච සෙට්ඨඤ්ච උත්තමඤ්ච පණීතඤ්ච තත්ථ නිසීදිත්වා දෞවාරිකං ආමන්තෙසි: තෙන හි සම්ම දෞවාරික යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එවං වදෙහි: උපාලි භන්තෙ ගහපති එවමාහ: පවිස කිර භන්තෙ සචෙ ආකඞ්ඛසීති. එවං භන්තෙති ඛො දෞවාරිකො උපාලිස්ස ගහපතිස්ස පටිස්සුත්වා යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: උපාලි භන්තෙ ගහපති එවමාහ: පවිස කිර භන්තෙ සචෙ ආකඞ්ඛසීති. අථ ඛො නිගණ්ඨො නාතපුත්තො මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං යෙන මජ්ඣිමා ද්වාරසාලා තෙනුපසඞ්කමි. අථ ඛො උපාලි ගහපති යං සුදං පුබ්බෙ යතො පස්සති නිගණ්ඨං නාතපුත්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන තතො පච්චුග්ගන්ත්වා යං තත්ථ ආසනං අග්ගඤ්ච සෙට්ඨඤ්ච උත්තමඤ්ච පණීතඤ්ච, තං උත්තරාසඞ්ගෙන පමජ්ජිත්වා පරිග්ගහෙත්වා නිසීදාපෙති. සො'දානි යං තත්ථ ආසනං අග්ගඤ්ච සෙට්ඨඤ්ච උත්තමඤ්ච පණීතඤ්ච තත්ථ සාමං නිසීදිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: සංවිජ්ජන්තෙ[1] ඛො භන්තෙ ආසනානි, සචෙ ආකඞ්ඛසි නිසීදාති. එවං වුත්තෙ නිගණ්ඨො නාතපුත්තො උපාලිං ගහපතිං එතදවොච: උම්මත්තොසි ත්වං ගහපති, දත්තොසි ත්වං ගහපති. ගච්ඡාමහං භන්තෙ සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙස්සාමීති ගන්ත්වා මහතාසි වාදසඞ්ඝාටෙන පටිමුක්කො ආගතො. සෙය්‍යථාපි ගහපති පුරිසො අණ්ඩහාරකො ගන්ත්වා උබ්භතෙහි අණ්ඩෙහි ආගච්ඡෙය්‍ය, සෙය්‍යථාපි වා පන ගහපති පුරිසො අක්ඛිහාරකො ගන්ත්වා උබ්භතෙහි අක්ඛීහි ආගච්ඡෙය්‍ය. එවමෙව ඛො ත්වං ගහපති ගච්ඡාමහං භන්තෙ සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙස්සාමීති ගන්ත්වා මහතාසි වාදසඞ්ඝාටෙන පටිමුක්කො ආගතො. ආවට්ටොසි ඛො ත්වං ගහපති සමණෙන ගොතමෙන ආවට්ටනියා මායායාති.

භද්දිකා භන්තෙ ආවට්ටනී මායා, කල්‍යාණී භන්තෙ ආවට්ටනී මායා, පියා මෙ භන්තෙ ඤාතිසාලොහිතා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං, පියානම්පි මෙ අස්ස ඤාතිසාලොහිතානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ ඛත්තියා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං. සබ්බෙසානම්පිස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ බ්‍රාහ්මණා-පෙ-වෙස්සා-පෙ-සුද්දා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍යුං, සබ්බෙසානම්පිස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛාය. සදෙවකො චෙපි

1. සංවිජ්ජන්ති-මජසං .2. සබ්බෙසානම්පස්ස-සීමු.

'වහන්ස, නිගණ්ඨනාතපුත්‍ර මහත් නුවටපිරිස් හා සමඟ බිහි දොරකොටුයෙහි සිටියෙ යෑ. ඹෙ තොප දක්නා කැමැතියේ යැ'යි. 'වහන්ස, එසේ යැ'යි දෙවාරික නුවටනතපුත්හට පිළිවදන් දී උපාලි ගැහැවිහු කරා එළැඹියෙ යැ. එළැඹ උපාලි ගැහැවිහට තෙල කී : 'වහන්ස, නුවටනතපුත් මහත් නුවටපිරිස් හා සමග බිහි දොරකොටුයෙහි සිටියෙ යැ. හෙ තොප දක්නා කැමැත්තැ'යි. සගය දෙවාරිකය, එහෙයින් මධ්‍යම ද්වාරශාලායෙහි අසුන් පන්වාලව යි. 'වහන්ස, එසේ යැ'යි දෙවාරිකයා උපාලි ගැහැවිහට පිළිවදන් දී මධ්‍යම ද්වාරශාලායෙහි අසුන් පන්වා උපාලි ගැහැවිහු කරා එළැඹියෙ යැ. එළැඹ උපාලි ගැහැවිහට තෙල කී : 'වහන්ස, මධ්‍යම ද්වාරශාලායෙහි තොපට අසුන් පනවනලද. දන් එයට කල් දනුව'යි කී.

ඉක්බිති උපාලි ගැහැවි මධ්‍යම ද්වාරශාලාව කරා එළැඹියෙ යැ. එළැඹ එහි අග්‍ර වූත් ශ්‍රේෂ්ඨ වූත් උත්තම වූත් ප්‍රණීත වූත් යම් අස්නෙක් වී ද එහි හිඳ දෙවාරිකයා කැඳවී· සගය, දෙවාරිකය, එහෙයින් නිගණ්ඨනාතපුත්‍රයා කරා එළැඹෙව. එළැඹ නිගණ්ඨනාත-පුත්‍රයාට මෙසේ කියව : ''වහන්ස, උපාලි ගැහැවි මෙසේ කියයි : 'වහන්ස, ඉදින් කැමැත්තෙහි නම් වදුව'යි 'වහන්ස, එසේ යැ'යි දෙවාරිකයා උපාලි ගැහැවිහට පිළිවදන් දී නිගණ්ඨනාතපුත්‍රයා කරා එළැඹියෙ යැ. එළැඹ නිගණ්ඨනාතපුත්‍රයාට තෙල කී : ''වහන්ස, උපාලි ගැහැවි මෙසේ කියයි : 'වහන්ස, ඉදින් කැමැත්තෙහි නම් වදුව'යි. එකල්හි නිගණ්ඨනාතපුත්‍ර මහත් නුවටපිරිස් හා සමග මධ්‍යම ද්වාරශාලාව කරා එළැඹියෙ යැ. ඉක්බිති උපාලි ගැහැවි යම් තැනෙකැ සිට පෙර යම් නිගණ්ඨනාතපුත්‍රයකු එන්නහු දුරැ දී මැ දක්නේ ද දක එතැන සිට පෙරගමන් කොට එහි අග්‍ර වූත් ශ්‍රේෂ්ඨ වූත් උත්තම වූත් ප්‍රණීත වූත් යම් අස්නෙක් වී නම් එය උත්තරාසඞ්ගයෙන් පිස පරිග්‍රහ කොට බලා හිඳුවාලයි. හෙ දන් එහි අග්‍ර වූත් ශ්‍රේෂ්ඨ වූත් උත්තම වූත් ප්‍රණීත වූත් යම් අස්නෙක් වී ද එහි තෙමේ හිඳ නිගණ්ඨනාතපුත්‍රයාට තෙල කී; 'වහන්ස, අසුන් ඇත. ඉදින් කැමැත්තහු නම් හිඳුව' යි මෙසේ කී කලැ නුවට නතපුත් උපාලි ගැහැවිහට තෙල කී : ගැහැවිය, තෙපි ඇළල ගියහු ? ගැහැවිය තෙපි ජඩ වැ ගියහු ? ' වහන්ස, මම යමි. මහණ ගොයුම්හට වාදරොපණ කෙරෙමි යි ගොස් මහත් වාදබන්ධනයෙන් තිර වැ ආව ? ගැහැවිය, යම් පරිදි පුරුෂයෙක් අණ්ඩහාරක වැ ගොස් උපුටා හළ අණ්ඩයෙන් යුතු වැ එන්නේ වේ ද, ගැහැවිය, යමසේ පුරුෂයෙක් අක්ඛිහාරක වැ ගොස් උපුටාහළ ඇසින් යුතු වැ එන්නේ වේ ද, ගැහැවිය, එසේ මැ තෙපි ' වහන්ස, මම යමි. මහණ ගොයුම්හට වාදරොපණ කෙරෙමි ' යි ගොස් මහත් වාදබන්ධනයෙන් ප්‍රතිමුක්ත වැ ආව. ගැහැවිය, තෙපි මහණ ගොයම්හු විසින් ආවර්තනී මායායෙන් ආවර්තිත ව ? යි.

වහන්ස, ආවර්තනී මායා හද්‍ර යැ. වහන්ස, ආවර්තනී මායා කල්‍යාණී යැ. වහන්ස, මාගේ ප්‍රිය නෑසාලේ නෑයෝ මෙ ආවර්තනී මායායෙන් ආවර්තිත වෙද්ද මාගේ ප්‍රිය වූ නෑසාලේ නෑයනට ද බොහෝ කල් හිතයට සුඛයට වැවෙයි. වහන්ස, හැම ක්ෂත්‍රියයෝ ද මේ ආවර්තනීමායායෙන් ආවර්තිත වෙද්ද, හැම ක්ෂත්‍රියයනට ද බොහෝ කල් හිතයට සුඛයට වැවෙයි. වහන්ස, හැම බමුණෝ ද . . . හැම වෛශ්‍යයෝ ද . . . හැම, ශූද්‍රයෝ ද මෙ ආවර්තනී මායායෙන් ආවර්තිත වෙද්ද එ හැම ශූද්‍රයනට ද බොහෝ කල් හිතයට සුඛයට

භන්තෙ ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා ඉමාය ආවට්ටනියා ආවට්ටෙය්‍ය, සදෙවකස්සපිස්ස[1] ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දීඝරත්තං හිතාය සුඛාය. තෙන හි භන්තෙ උපමන්තෙ කරිස්සාමි. උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති.

භූතපුබ්බං භන්තෙ අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස ජිණ්ණස්ස වුඩ්ඪස්ස මහල්ලකස්ස දහරා මාණවිකා පජාපතී අහොසි ගබ්භිනී උපවිජඤ්ඤා. අථ ඛො භන්තෙ සා මාණවිකා තං බ්‍රාහ්මණං එතදවොච: ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, ආපණා මක්කටච්ඡාපකං කිණිත්වා ආනෙහි යො මෙ කුමාරකස්ස කීළාපනකො භවිස්සතීති. එවං වුත්තෙ භන්තෙ සො බ්‍රාහ්මණො තං මාණවිකං එතදවොච: ආගමෙහි තාව භොති යාව විජායසි. සචෙ ත්වං භොති කුමාරකං විජායිස්සසි, තස්ස තෙ අහං ආපණා මක්කටච්ඡාපකං කිණිත්වා ආනෙස්සාමි.[2] යො තෙ කුමාරකස්ස කීළාපනකො භවිස්සති. සචෙ පන ත්වං භොති කුමාරිකං විජායිස්සසි, තස්සා තෙ අහං ආපණා මක්කටච්ඡාපිකං කිණිත්වා ආනෙස්සාමි. යා තෙ කුමාරිකාය කීළාපනිකා භවිස්සතීති. දුතියම්පි ඛො භන්තෙ-පෙ-කීළාපනිකා භවිස්සතීති. තතියම්පි ඛො භන්තෙ සා මානවිකා තං බ්‍රාහ්මණං එතදවොච: ගච්ඡ ත්වං බ්‍රාහ්මණ ආපණා මක්කටච්ඡාපකං කිණිත්වා ආනෙහි යො මෙ කුමාරකස්ස කීළාපනකො භවිස්සතීති. අථ ඛො භන්තෙ සො බ්‍රාහ්මණො තස්සා මාණවිකාය සාරත්තො පටිබද්ධචිත්තො ආපණා මක්කටච්ඡාපකං කිණිත්වා ආනෙත්වා තං මාණවිකං එතදවොච: අයං තෙ භොති ආපණා මක්කටච්ඡාපකො කිණිත්වා ආනීතො යො තෙ කුමාරකස්ස කීළාපනකො භවිස්සතීති. එවං වුත්තෙ භන්තෙ සා මාණවිකා තං බ්‍රාහ්මණං එතදවොච: ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, ඉමං මක්කටච්ඡාපකං ආදාය යෙන රත්තපාණී රජකපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රත්තපාණිං රජකපුත්තං එවං වදෙහි: ඉච්ඡාමහං සම්ම රත්තපාණී, ඉමං මක්කටච්ඡාපකං පීතාවලෙපනං නාම රඞ්ගජාතං රඤ්ජිතං ආකොටිතපච්චාකොටිතං උභතොභාගවිමට්ඨන්ති. අථ ඛො භන්තෙ සො බ්‍රාහ්මණො තස්සා මාණවිකාය සාරත්තො පටිබද්ධචිත්තො තං මක්කටච්ඡාපකං ආදාය යෙන රත්තපාණී රජකපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රත්තපාණිං රජකපුත්තං එතදවොච: ඉච්ඡාමහං සම්ම රත්තපාණී, ඉමං මක්කටච්ඡාපකං පීතාවලෙපනං නාම රඞ්ගජාතං[3] රඤ්ජිතං ආකොටිතපච්චාකොටිතං උභතොභාගවිමට්ඨන්ති. එවං වුත්තෙ භන්තෙ රත්තපාණී රජකපුත්තො තං බ්‍රාහ්මණං එතදවොච: අයං ඛො තෙ භන්තෙ මක්කටච්ඡාපකො රඞ්ගක්ඛමො හි ඛො, නො ආකොටනක්ඛමො නො විමජ්ජනක්ඛමොති. එවමෙව ඛො භන්තෙ බාලානං නිගණ්ඨානං වාදො රඞ්ගක්ඛමො හි ඛො බාලානං නො පණ්ඩිතානං, නො අනුයොගක්ඛමො, නො විමජ්ජනක්ඛමො. අථ ඛො භන්තෙ සො බ්‍රාහ්මණො අපරෙන සමයෙන නවං දුස්සයුගං ආදාය යෙන රත්තපාණී රජකපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රත්තපාණිං රජකපුත්තං එතදවොච : ඉච්ඡාමහං සම්ම රත්තපාණී, ඉමං නවං දුස්සයුගං පීතාවලෙපනං නාම රඞ්ගජාතං රඤ්ජිතං[3] ආකොටිතපච්චාකොටිතං උභතොභාගවිමට්ඨන්ති. එවං වුත්තෙ භන්තෙ රත්තපාණී රජකපුත්තො තං බ්‍රාහ්මණං එතදවොච : ඉදං ඛො තෙ භන්තෙ නවං දුස්සයුගං රඞ්ගක්ඛමඤ්චෙව ආකොටනක්ඛමඤ්ච විමජ්ජනක්ඛමඤ්චාති. එවමෙව ඛො භන්තෙ තස්ස භගවතො වාදො අරහතො සම්මාසම්බුද්ධස්ස රඞ්ගක්ඛමො චෙව පණ්ඩිතානං නො බාලානං, අනුයොගක්ඛමො ච විමජ්ජනක්ඛමො චාති.

1. සදෙවකස්ස පස්ස - සීමු. 2. ආණිස්සාමි - සීමු.
3. රජිතං - මජසං. ස්‍යා.

වැටෙයි.වහන්ස, මරුන් සියො බඹුන් සියො සදේවක ලෝකයා ද මහණබමුණන් සියො දෙව් මිනිසුන් සියො ප්‍රජාව ද මෙ ආවර්තනී මායායෙන් ආවර්තිත වේ ද, මරුන් සියො බඹුන් සියො සදේවක ලෝකයාහට ද මහණබමුණන් සියො දෙව්මිනිසුන් සියො ප්‍රජාවට ද බොහෝ කල් හිතයට සුඛයට වැටෙයි. වහන්ස, එ කරුණින් තොපට උපමාවක් කරමි. කිසි විඥපුරුෂ කෙනෙක්, උපමායෙනුදු භාෂිතයාගේ අර්ථය නුවණ එළවා දනිත්.

වහන්ස, වූව්රි දූයෙකි. ජීර්ණ වූ වෘද්ධ වූ මහලු වූ එක්තරා බමුණකුහට ළදරු මෙණෙවියක් භාර්‍ය්‍යා වූ යැ. ගැබ් ඇත්ති වදනා වර ළං වැ ඇත්ති වූ යැ. වහන්ස, ඉක්බිති ඒ මෙණෙවි එ බමුණුට තෙල කිවු : ' බමුණ, තෙපි යව. යම් වඳුරු පැටෙක් මාගේ කුමරහට කෙළි බඩු වේ ද, එ බඳු වඳුරු පැටකු අවුණුදෙරින්, මිල දී ගෙන එව ' යි. වහන්ස, මෙසේ කී කලැ එ බමුණු එ මෙණෙවියට තෙල කී : ' සොඳුර, වදනා තාක් බලව. සොඳුර ඉදින් තෙපි කුමරකු වදන්නවූ නම් තොපට මම අවුණුදෙරින් තොපගේ ඒ කුමරුට කෙළි බඩු වන වඳුරු පැටකු මිල දී ගෙන එමි. ඉදින් තෙපි කුමරියක වදන්නවූ නම් තොපගේ එ කුමරියට කෙළි බඩු වන වඳුරු පැටියක අවුණුදෙරින් ගෙන එමි. වහන්ස, දෙවනවට ද . . . . තෙවනවට ද වහන්ස, එ මෙණෙවි එ බමුණුහට තෙල කිවු : ' බමුණ තෙපි යව. යම් වඳුරුපැටෙක් මාගේ කුමරහට කෙළිබඩු වේ ද, එබඳු වඳුරුපැටකු මිල දී ගෙන එව ' යි. වහන්ස, ඉක්බිති එ බමුණු එ මෙණෙවිය කෙරෙහි ඇලුණෙ, පිළිබඳසිත් ඇතියේ අවුණු දෙරින් වඳුරුපැටකු මිල දී ගෙනවුත් එ මෙණෙවියට තෙල කී : ' භවතිය, තොපට වඳුරුපැටෙක් මිල දී ගෙන එන ලද. එ තොපගේ කුමරහට කෙළනට නිසි වන්නේ යයි. වහන්ස, මෙසේ කී කල්හි එ මෙණෙවි එ බමුණුහට තෙල කිවු ය: බමුණ, තෙපි මෙ වඳුරුපැටහු ගෙන රඟ පොවනා රදදරු කරා එළඹ රඟ පොවනා රදදරුහට මෙසේ කියව. යහළු රක්තපාණිය, මම් මේ වඳුරු පැටහු රත්වන් රඳනින් රඳනලදහු කොළනා පිළිකොළනා ලදහු දෙපස මට කරනලදහු කැමැත්තෙමි' යි. වහන්ස, එසඳ එ බමුණු එ මෙණෙවිය කෙරෙහි ඇලුණේ පිළිබඳසිත් ඇත්තේ එ වඳුරුපැටහු ගෙන රක්තපාණි රදදරු කරා එළැඹියෙ. එළැඹ රක්තපාණි රදදරුහට තෙල කී : ' යහළු රක්තපාණිය, මම මෙ වඳුරු පැටහු රත්වන් රඳනින් රඳනලදහු කොළනා පිළිකොළනා ලදහු දෙපස මට කරනලදහු කැමැත්තෙමි ' යි. වහන්ස, මෙසේ කී කල්හි රක්තපාණි රදදරු එ බමුණුහට තෙල කී : හිමි, තොපගෙ මෙ වඳුරුපොවු රඞ්ගක්ෂම මැ වෙයි. ආකොටනක්ෂම නො වෙයි, විමාර්ජනක්ෂම නො ද වේ යයි. වහන්ස, එසෙයින් මැ බාල නුවටුන්ගේ වාද පණ්ඩිත යනට නො වැ බාලයනට රඞ්ගක්ෂම මැ වෙයි. අනුයොගක්ෂම නො වෙයි, විමාර්ජන ක්ෂම නො ද වෙයි. වහන්ස, ඉක්බිති එ බමුණු මැතභාගයෙහි අළුත් පිළිසභලක් ගෙන රක්තපාණි රදදරු කරා එළැඹියෙ. එළැඹ රක්තපාණි රදදරුහට තෙල කී : යහළු රක්තපාණිය, මම මෙ අළුත් පිළිසභළ රත්වන් රඳනින් රඳනා ලදහු කොළනා පිළිකොළනා ලදහු දෙපස මට කරනලදහු කැමැත්තෙමි' යි. වහන්ස, මෙසේ කී කල්හි රක්තපාණි රජකපුත්‍ර එ බමුණුහට තෙල කී : හිමි, තොපගේ මෙ අළුත් පිළිසභළ රඞ්ගක්ෂම ද ආකොටනක්ෂම ද විමාර්ජනක්ෂම ද වේ යයි. වහන්ස, එහෙයින් මැ එ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ කථා බාලයනට නො ව පණ්ඩිතජනයනට රඞ්ගක්ෂම ද අනුයොගක්ෂම ද විමාර්ජනක්ෂම ද වේ යයි.

සරාජිකා ඛො තං ගහපති පරිසා එවං ජානාති: උපාලි ගහපති නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකොති. කස්ස තං ගහපති සාවකං ධාරෙමාති. එවං වුත්තෙ උපාලි ගහපති උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පනාමෙත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච : තෙන හි භන්තෙ සුණාහි යස්සා'හං සාවකො :

1. ධීරස්ස විගතමොහස්ස පභින්නඛීලස්ස විජිතවිජයස්ස,
අනීඝස්ස සුසමචිත්තස්ස වුද්ධසීලස්ස සාධුපඤ්ඤස්ස,
වෙස්සන්තරස්ස[1] විමලස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

2. අකථඞ්කථිස්ස තුසිතස්ස වන්තලොකාමිසස්ස මුදිතස්ස,
කතසමණස්ස මනුජස්ස අන්තිමසාරීරස්ස නරස්ස,
අනොපමස්ස විරජස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

3. අසංසයස්ස කුසලස්ස වෙනයිකස්ස සාරථිවරස්ස,
අනුත්තරස්ස රුචිරධම්මස්ස නික්කඞ්ඛස්ස පභාසකරස්ස,
මානච්ඡිදස්ස වීරස්ස භගවතො තස්ස සාවකො'හමස්මි

4. නිසභස්ස අප්පමෙය්‍යස්ස ගම්භීරස්ස මොනපත්තස්ස,
ඛෙමඞ්කරස්ස දෙවස්ස ධම්මට්ඨස්ස සංවුතත්තස්ස,
සඞ්ගාතිගස්ස මුත්තස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

5. නාගස්ස පන්තසෙනස්ස ඛීණසංයොජනස්ස මුත්තස්ස,
පටිමන්තකස්ස ධොනස්ස පන්නධජස්ස වීතරාගස්ස,
දන්තස්ස නිප්පපඤ්චස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

6. ඉසිසත්තමස්ස අකුහස්ස තෙවිජ්ජස්ස බ්‍රහ්මපත්තස්ස,
නහාතකස්ස[2] පදකස්ස පස්සද්ධස්ස විදිතවෙදස්ස,
පුරින්දදස්ස සක්කස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

7. අරියස්ස භාවිතත්තස්ස පත්තිපත්තස්ස වෙය්‍යාකරණස්ස,
සතිමතො විපස්සිස්ස අනභිනතස්ස නො අපනතස්ස;
අනෙජස්ස වසිප්පත්තස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

8. සම්මග්ගතස්ස ඣායිස්ස අනනුගතන්තරස්ස සුද්ධස්ස,
අසිතස්ස අප්පහීනස්ස[4] පවිවිත්තස්ස අග්ගපත්තස්ස ;
තිණ්ණස්ස තාරයන්තස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

9. සන්තස්ස භූරිපඤ්ඤස්ස මහාපඤ්ඤස්ස වීතලොභස්ස,
තථාගතස්ස සුගතස්ස අප්පටිපුග්ගලස්ස අසමස්ස;
විසාරදස්ස නිපුණස්ස භගවතො තස්ස සාවකො'හමස්මි.

10. තණ්හච්ඡිදස්ස බුද්ධස්ස වීතධූමස්ස අනුපලිත්තස්ස,
ආහුනෙය්‍යස්ස යක්ඛස්ස උත්තමපුග්ගලස්ස අතුලස්ස;
මහතො යසග්ගපත්තස්ස භගවතො තස්ස සාවකො'හමස්මීති.

1. වෙසමන්තරස්ස - මජසං, ස්‍යා.
2. න්හාතකස්ස - මජසං.
3. සම්මග්ගතස්ස - මජසං
4. අප්පහීතස්ස - මජසං
5. අග්ගප්පත්තස්ස - මජසං

ගැහැවිය සරාජිකපර්ෂද් තොප මෙසෙ දනී : ' උපාලි ගැහැවි නිගණ්ඨනාතපුත්‍රයාගේ ශ්‍රාවක යැ ' කියා යි. ගැහැවිය, තොප කවරක්හුගේ ශ්‍රාවක කොට ධරම්හ ? යි. මෙසේ කී කල්හි උපාලි ගැහැවි හුනස්නෙන් නැඟී උතුරුසළු එකස් කොට බුදුන් වසන දසට ඇඳිලි පනවා නිගණ්ඨනාතපුත්‍රයාහට තෙල කී : ' වහන්ස, එසේ වී නම් මම යම් කෙනකුන්ගේ ශ්‍රාවකයෙම් ද උන් වහන්සේගේ ගුණ අසව :

(1) ධීර වූ හෙවත් පාණ්ඩිත්‍යයෙන් සමන්වාගත වූ, විගත වූ මොහ ඇති, බිඳුනා ලද පඤ්චචෙතොඛිල ඇති, දිනන ලද මෘත්‍යුමාරාදි මාරවිජය ඇති, කෙලශදුඃඛයෙන් හා විපාකදුඃඛයෙන් නිදුක් වූ, දෙවමිනිසුන් කෙරෙහි මොනොවට සමමෙත් ඇති, වැඩූ ආචාර ශීල ඇති, සුන්දරප්‍රඥ ඇති, රාගාදි විෂමය තැරැයිවී, විගත වූ රාගාදි මල ඇති, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි. (' ඔබ මාගේ ශාස්තෘ වූහ ' යි යු සේ යි.)

(2) අකථංකථී වූ, තුටුසිත් ඇති, වමාළ කාමගුණ ඇති, මුදිතාවිහාරවශයෙන් සතුටු වූ, කරනලද මහණදම් ඇති, මනුජ වූ අන්තිමදේහධාරී වූ, උත්තම නර වූ අනුපම වූ, විගත කෙලෙස්රජස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(3) ශංසය රහිත වූ නිපුණ වූ සත්ත්වයන් විනයනය කරනු වූ උත්තම සාරථී වූ අනුත්තර වූ පවිත්‍රධර්ම ඇති නිශ්ශඞ්ක වූ ඕභාසකර වූ සිඳින ලද මාන ඇති වීර වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(4) අප්‍රතිසමාර්ථයෙන් නිසභ වූ අප්‍රමේය වූ ගම්භීර වූ මෝන සඞ්ඛ්‍යාත ඥානයට පැමිණි ක්ෂේමකර වූ වේද සඞ්ඛ්‍යාත ඥානයෙන් සමන්වාගත වූ ධර්මයෙහි පිහිටා සිටි සංවෘත වූ සිත් ඇති ක්ලෙශසඞ්ගයන් ඉක්මැ සිටි වීර වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(5) සියුකරුණෙන් නාග වූ ප්‍රාන්තශයනාසන ඇති ක්ෂීණ වූ සංයොජන ඇති කෙලෙසුන් කෙරෙන් මිදුණු ප්‍රතිමන්ත්‍රණ ප්‍රඥයෙන් සමන්වාගත වූ ධොන සඞ්ඛ්‍යාත ඥානයෙන් සමන්වාගත වූ පතිත මානධ්වජ ඇති වීතරාග වූ නිර්විශෙවන වූ ක්ලේශ ප්‍රපඤ්ච රහිත වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(6) සප්තමර්ෂි වූ කුහන නො වූ ත්‍රිවිද්‍යා ඇති ශ්‍රෙෂ්ඨස්ථානයට පැමිණි දෙවූ කෙලෙස් ඇති ගාථාපද කරණයෙහි කුශල වූ සන්හුන් කායචිත්ත ඇති විදිත වූ ඥාන ඇති හැමට පළමු කොට ධර්මදාන දායක වූ ශාක්‍ය වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(7) ආර්‍ය වූ වැඩූ සිත් ඇති පැමිණියයුතු ගුණයනට පැමිණි විස්තර කොට අර්ථ දක්වන සමෘතිමත් වූ විදර්ශක වූ අර්හත් වූ අදුෂ්ට වූ තෘෂ්ණා රහිත වූ වශීප්‍රාප්ත වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(8) සම්‍යග්ගත වූ ධ්‍යායී වූ කෙලෙසුන් විසින් අනුගත නො වූ සිත් ඇති ශුද්ධ වූ අබද්ධ වූ අප්‍රහීණ වූ ප්‍රවිවෙක ඇති අග්‍රප්‍රාප්ත වූ තරණය කළ වතුරොඝ ඇති අනුන් තරණය කරවන ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(9) ශාන්ත වූ, පොළොව සෙයින් පතළ ප්‍රඥ ඇති මහාප්‍රඥයෙන් යුක්ත වූ පහ කළ ලොභ ඇති තථාගත වූ සුගත වූ අප්‍රතිපුද්ගල වූ අසම වූ විශාරද වූ නිපුණ වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

(10) බිඳලූ තෘෂ්ණා ඇති චතුස්සත්‍යාවබොධ කළ පහ කළ කෙලෙස්දුම් ඇති කෙලෙසුන් විසින් උපලිප්ත නො වූ ආහුති පිළිගන්නට නිසි (අනුභාව වශයෙන්) යක්ෂ වූ උත්තම පුද්ගල වූ අතුල වූ මහත් වූ අගපත් යශස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

7——ඓක් 13561 (11/72)

කදා සඤ්ඤූළ්හා පන තෙ ගහපති ඉමෙ සමණස්ස ගොතමස්ස වණ්ණාති. සෙය්‍යථාපි භන්තෙ නානාපුප්ඵානං මහාපුප්ඵරාසි, තමෙනං දක්ඛො මාලාකාරො වා මාලාකාරන්තෙවාසී වා විචිත්තං මාලං ගන්ථෙය්‍ය. එවමෙව ඛො භන්තෙ සො භගවා අනෙකවණ්ණො අනෙකසතවණ්ණො කො හි භන්තෙ වණ්ණාරහස්ස වණ්ණං න කරිස්සතීති.

අථ ඛො නිගණ්ඨස්ස භගවතො සක්කාරං අසහමානස්ස තත්ථෙව උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡීති[1]

උපාලිසුත්තං ඡට්ඨං.

ගැහැවිය, මහණ ගොයුම්හුගේ මේ ගුණයෝ තොප විසින් කවර කලෙක එක්රැස් කරනලද්දාහු ද ? වහන්ස, යම් පරිදි නානා පුෂ්පයන් පිළිබඳ පුෂ්පරාශියෙක් ඇද්ද තෙල මල්රැස දක්ෂ මාලාකාරයෙක් හෝ වේවයි මල්කරු අතැවැසියෙක් හෝ වේවයි විසිතුරු මල්දමක් ගොතන්නේ වේ ද, වහන්ස, එපරිදි භාග්‍යවතුන් වහන්සේ අනේකවර්ණයහ, අනේකශත වර්ණයහ. වහන්ස කවරෙක් නම් වර්ණනීයාගේ ගුණවැනුම් නො කරන්නේ වේ ද ?

එසඳ බුදුනට සත්කාර නො සහන නුවටනාතපුත්හට එ අසුන්හි දී මැ හුණුලේ මුවින් නැඟිණි.

සවැනි උපාලිසූත්‍ර යි.

---

2. 1. 7.

කුක්කුරවතිය* සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා කොලියෙසු විහරති හලිද්දවසනං නාම කොලියානං නිගමො. අථ ඛො පුණ්ණො ච කොලියපුත්තො ගොවතිකො, අචෙලො ච සෙනියො කුක්කුරවතිකො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා පුණ්ණො කොලියපුත්තො ගොවතිකො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. අචෙලො පන සෙනියො කුක්කුරවතිකො භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා කුක්කුරොව පලිකුජ්ජිත්වා[1] එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පුණ්ණො කොලියපුත්තො ගොවතිකො භගවන්තං එතදවොච; අයං භන්තෙ අචෙලො සෙනියො කුක්කුරවතිකො දුක්කරකාරකො, ඡමානික්ඛිත්තං[2] භුඤ්ජති. තස්ස තං කුක්කුරවතං දීඝරත්තං සමත්තං සමාදින්නං, තස්ස කා ගති, කො අභිසම්පරායොති. අලං පුණ්ණ, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති. දුතියම්පි ඛො–පෙ–තතියම්පි ඛො පුණ්ණො කොලියපුත්තො ගොවතිකො භගවන්තං එතදවොච; අයං භන්තෙ අචෙලො සෙනියො කුක්කුරවතිකො දුක්කරකාරකො, ඡමානික්ඛිත්තං[2] භුඤ්ජති. තස්ස තං කුක්කුරවතං දීඝරත්තං සමත්තං සමාදින්නං, තස්ස කා ගති, කො අභිසම්පරායොති. අද්ධා ඛො තෙ අහං පුණ්ණ න ලභාමි; අලං පුණ්ණ, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති. අපි ච ඛො ත්‍යාහං බ්‍යාකරිස්සාමි.

ඉධ පුණ්ණ, එකච්චො කුක්කුරවතං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරසීලං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරචිත්තං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරාකප්පං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, සො කුක්කුරවතං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරසීලං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරචිත්තං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කුක්කුරාකප්පං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කායස්ස භෙදා පරම්මරණා කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති, සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති: ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. සාස්ස හොති මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස[3] ඛො අහං පුණ්ණ ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉති ඛො පුණ්ණ සම්පජ්ජමානං කුක්කුරවතං කුක්කුරානං සහව්‍යතං උපනෙති. විපජ්ජමානං[4] නිරයන්ති.

---

* කුක්කුරවතික – මජසං, කුක්කුරොවාද – ස්‍යා

1. පලිකුණ්ඩිත්වා – ස්‍යා.
2. { ඡමානික්ඛිත්තං භොජනං – මජසං / ඡමායං නික්ඛිත්තං භොජනං – ස්‍යා }
3. මිච්ඡාදිට්ඨිස්ස – මජසං, ස්‍යා, PTS.
4. විජ්ජමානං – සීමු.

Free Distribution www.aathaapi.org

2. 1. 7
කුක්කුරවතිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කෝලිය ජනපදයෙහි හලිද්දවසන නම් කෝලිය නියම්ගම්හි වැඩවසනසේක. එකල ගෝව්‍රත සමාදන් කළ කෝලිය පුත්‍ර පූර්ණ හා ශුනකව්‍රත සමාදන කළ සේනිය නම් නුවට හා දෙදෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ ගෝව්‍රත ගත් කෝලියපුත් පූර්ණ බුදුන් සකසා වැඳ එකත්පස් ව හින. බලුතව ගත් සේනිය නුවට බුදුන් හා සමග සතුටු විය. සමෙමා දනයට නිසි කලතුරුහි සිහි කළයුතු කථා කොට නිමවා කුකුරකු සෙයින් හැකිළීගෙන එකත්පසෙක හින. එකත්පසෙක හුන් ගෝවතික කෝලියපුත් පූර්ණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ. වහන්ස, බලුතව ගත් මේ සේනිය නුවට දුෂ්කරක්‍රියා කරන්නෙක. බිමලූවක් වළඳ කෙරෙයි. ඔහු විසින් ඒ බලුතව දීර්ඝරාත්‍රයෙහි පිරිපුන් කොට ගන්නාලදි. ඔහුගේ ගති කවර ? පරලොව උපත් කවරෙ ? යි. 'පූර්ණය. කම් නැත, තෙල පැන තිබියේවා. තෙල පැන මා නො පුළුවුස යි. දෙවනවට ද . . . , තුන්වනවට ද ගෝවතික කෝලියපුත් පූර්ණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ: 'වහන්ස, බලුතව ගත් මේ සේනිය නුවට දුෂ්කරක්‍රියා කරන්නෙක, බිම ලූවක් වළඳ කෙරෙයි. ඔහු විසින් ඒ බලුතව දීර්ඝරාත්‍රියෙහි පිරිපුන් කොට සමාදන් කරන ලදි. ඔහු ගේ ගති කවර ? පරලොව කවරෙ ? යි. 'පූර්ණය, කම් නැත, තෙල තිබියේවා. තෙල පැන මා අතින් නො පුළුවුස ' යි, (කිව ද) පූර්ණය, මම තොප බස් එකැතින් නො ලැබෙමි. වැළිත් තොපට මම ප්‍රකාශ කරමි.

පූර්ණය, මෙලොව එකෙක් බලුතව අඩුන කොට නිරතුරු කොට වඩයි. බලුසිල් අඩුන කොට නරතුරු කොට වඩයි. බලුසිත් අඩුන කොට නරතුරු කොට වඩයි. බලු වෙස් අඩුන කොට නරතුරු කොට වඩයි. හේ බලුතව අඩුන කොට නරතුරු කොට වඩා බලුසිල් අඩුන කොට නරතුරු කොට වඩා බලුසිත් අඩුන කොට නරතුරු කොට වඩා ශුනකාකල්ප අඩුන කොට නරතුරු කොට වඩා කාබුන් මරණින්මතු ශුනකයන්ගේ සභාවයට පැමිණෙයි. ඉදින් ඔහුට මෙවන් දෘෂ්ටියෙක් වේ ද : ' මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රම්සරින් හෝ දෙවි හෝ වෙම්වා අන්‍යතර දෙවියෙකිම් හෝ වෙම්වා ' යි. ඒ දෘෂ්ටිය ඔහුගේ මිසදිටු වෙයි. පූර්ණය, මම මිථ්‍යාදෘෂ්ටිකයාහට දෙගතින් අතුරින් එක්තරා ගතියක් කියමි. එනම : 'නිරය හෝ තිරිසන් යොන හෝ ' යි. පූර්ණය, මෙසේ (දෘෂ්ටියෙන් අසම්මිශ්‍ර ව) සැපයෙන බලුතව බල්ලන්ගේ සභාවයට එළවයි. වරදවාගත් දිටු නිරය එළවති වදළෝ.

එවං වුත්තෙ අචෙලො සෙනියො කුක්කුරවතිකො පරොදි, අස්සූනි පවත්තෙසි. අථ ඛො භගවා පුණ්ණං කොලියපුත්තං ගොවතිකං එතද-වොච: එතං ඛො තෙ අහං පුණ්ණ නාලත්ථං: අලං පුණ්ණ, තිට්ඨතෙතං මා මං එතං පුච්ඡීති. නාහං භන්තෙ එතං රොදාමි, යං මං භගවා එවමාහ. අපි ච මෙ ඉදං භන්තෙ කුක්කුරවතං දීඝරත්තං සමත්තං සමා-දින්නං. අයඤ්ච භන්තෙ පුණ්ණො කොලියපුත්තො ගොවතිකො තස්ස තං ගොවතං දීඝරත්තං සමත්තං සමාදින්නං. තස්ස කා ගති. කො අභිසම්පරායොති. අලං සෙනිය, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති. දුතියම්පි ඛො-පෙ-තතියම්පි ඛො අචෙලො සෙනියො කුක්කුරවතිකො භගවන්තං එතද වොච: අයං භන්තෙ පුණ්ණො කොලියපුත්තො ගොවතිකො, තස්ස තං ගොවතං දීඝරත්තං සමත්තං සමාදින්නං, තස්ස කා ගති, කො අභිසම්පරායොති. අද්ධා ඛො තෙ අහං සෙනිය න ලභාමි: අලං සෙනිය, තිට්ඨතෙතං. මා මං එතං පුච්ඡීති. අපි ච ඛො ත්‍යාහං බ්‍යාකරිස්සාමි.

ඉධ සෙනිය, එකච්චො ගොවතං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, ගොසීලං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං, ගොචිත්තං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං. ගවාකප්පං භාවෙති පරිපුණ්ණං අබ්බොකිණ්ණං. සො ගොවතං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, ගොසීලං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, ගොචිත්තං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, ගවාකප්පං භාවෙත්වා පරිපුණ්ණං අබ්බොකිණ්ණං, කායස්ස භෙදා පරම්මරණා ගුන්නං සහව්‍යතං උපපජ්ජති. සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති: ඉමිනා'හං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. සාස්ස හොති මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨිකස්ස[1] ඛො අහං සෙනිය ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉති ඛො සෙනිය සම්පජ්ජමානං ගොවතං ගුන්නං සහව්‍යතං උපනෙති විපජ්ජමානං[2] නිරයන්ති.

එවං වුත්තෙ පුණ්ණො කොලියපුත්තො ගොවතිකො පරොදි. අස්සූනි පවත්තෙසි. අථ ඛො භගවා අචෙලං සෙනියං කුක්කුරවතිකං එතදවොච: එතං ඛො තෙ අහං සෙනිය, නාලත්ථං: අලං සෙනිය, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති. නාහං භන්තෙ එතං රොදාමි, යං මං භගවා එවමාහ. අපි ච මෙ ඉදං භන්තෙ ගොවතං දීඝරත්තං සමත්තං සමාදින්නං. එවං පසන්නො අහං භන්තෙ භගවති: පහොති භගවා තථා ධම්මං දෙසෙතුං යථා අහඤ්චෙවිමං ගොවතං පජහෙය්‍යං. අයඤ්ච අචෙලො සෙනියො කුක්කුරවතිකො තං කුක්කුරවතං පජහෙය්‍යාති. තෙන හි පුණ්ණ සුණාහි. සාධුකං මනසිකරොහි. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො පුණ්ණො කොලියපුත්තො ගොවතිකො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

චත්තාරිමානි පුණ්ණ කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි, කතමානි චත්තාරි: අත්ථි පුණ්ණ කම්මං කණ්හං කණ්හවිපාකං, අත්ථි පුණ්ණ කම්මං සුක්කං සුක්කවිපාකං, අත්ථි පුණ්ණ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං, අත්ථි පුණ්ණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හා-සුක්කවිපාකං කම්මං කම්මක්ඛයාය සංවත්තති.

---

1. මිච්ඡාදිට්ඨිස්ස-මජසං, PTS   2. විජ්ජමානං-සිමු.

මෙසේ වදළ කල බලුතව ගත් සෙනිය නුවවට හැඬී. කඳුළු හෙළී. එසඳ භාග්‍යවතුන් වහන්සේ ගොව්‍රත ගත් කොලිය පුත් පුණ්ණහට මෙල වදළෝ : ' පුණ්ණය, කම් නැත, තෙල පැත තිබියේවා, මා අතින් තෙල පැත නො පුළුවුස ' යි යත තෙල පුණ්ණය, මම නො ලත්මි. භාග්‍යවතුන් වහන්සේ යම් ව්‍යාකරණයක් මා ගෙන මෙසේ වදළසේක් ද : වහන්ස, මම තෙල ව්‍යාකරණයට නො හඬමි. වහන්ස, වැළිත් මා විසින් මේ බලුතව අනූන කොට සමාදන වශයෙන් ගන්නා ලදි. වහන්ස, ගොව්‍රත සමාදන කළ කොලියපුත් මේ පුණ්ණ වේ ද ඔහු විසින් ඒ ගෝව්‍රතය දීර්ඝරාත්‍රයෙහි අනූන කොට සමාදන වශයෙන් ගන්නා ලදි. ඔහුගේ ගති කවර ? පරලෝ කවරෙ ? සේනිය කම් නැත, තෙල තිබියේවා. තෙල මා නො පුළුවුස 'යි. දෙවනවට ද . . . . තුන්වන වට ද බලුතව ගත් සේනිය නුවවට භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ : ' වහන්ස, කොලියපුත් මේ පුණ්ණ ගෝව්‍රත ඇත්තෙක. ඔහු විසින් ඒ ගෝව්‍රතය දීඝරාත්‍රයෙහි අනූන කොට මොනොවට ගන්නාලදී. ඔහුගේ ගති කවර ? පරලෝ කවරෙ ? ' සේනිය, කම් නැත, තෙල තිබියේවා, තෙල මා නො පුළුවුස ' (කිව ද) යතු සේනිය මම තොප බස් එකාන්තයෙන් නො ලබමි. වැළිත් මම තොපට ප්‍රකාශ කරමි.

සේනිය, මෙලොව කිසිවෙක් ගෝව්‍රතය අනූන කොට නරතුරු කොට වඩයි. ගෝශීලය අනූන කොට නරතුරු කොට වඩයි. ගෝචිත්තය අනූන කොට නරතුරු කොට වඩයි. ගවාකල්පය අනූන කොට නරතුරු කොට වඩයි. හේ ගෝව්‍රතය අනූන කොට නරතුරු කොට වඩා ගෝශීලය අනූන කොට නරතුරු කොට වඩා ගෝචිත්තය අනූන කොට නරතුරු කොට වඩා ගවාකල්පය අනූන කොට නරතුරු කොට වඩා කාබුත් මරණින් මතු ගෙරිත්ගේ සහභාවයට පැමිණෙයි. ඉදින් වනාහි ඕහට මෙබඳු දෘෂ්ටියෙක් වේ ද : මම මේ ආචාරයෙන් හෝ ව්‍රත සමාදනයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යයෙන් හෝ දෙවි හෝ වෙමි, දෙවාන්‍යතර හෝ වෙමි ' යි. ඒ දෘෂ්ටි ඔහුගේ මිථ්‍යාදෘෂ්ටි වෙයි. සේනිය, මම මිථ්‍යාදෘෂ්ටිකයාහට නිරයගතිය හෝ තිරිසන් යෝනිය හෝ දෙගතින් අතුරින් එක්තරා ගතියක් කියමි. සේනිය, මෙසේ සම්පජ්ජමාන ගෝව්‍රතය ගවයන්ගේ සහභාවයට එළවයි. විපද්‍යමාන ගෝව්‍රතය නිරයට එළවයි.

මෙසේ වදළ කල ගොව්‍රත සමාදන කළ කොලියපුත් පුණ්ණ හැඬී. කඳුළු හෙළී, එසඳ බුදුහු බලුතව ගත් සෙනිය අචෙලකයාහට තෙල වදළහ : ' සෙනිය, කම් නැත. තෙල තිබියේවා, තෙල කරුණ මා නො පුළුවුස්ව ' යි සෙනිය, මම තෙල කරුණ තා අතින් නො ලත්මි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට යම් කරුණක් මෙසේ වදළ සේක් ද, මම තෙල ව්‍යාකරණයට නො හඬමි. වැළිත් වහන්ස, මේ ගොව්‍රතය මා විසින් දීර්ඝරාත්‍රයෙහි මොනොවට ගන්නා ලදි, මොනවට සමාදන කරන ලදි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්නයෙමි. යම් පරිදි මමත් මේ ගෝව්‍රතය හරනෙම් ද, කුකුරුවත ගත් මේ සේනිය අචෙළකත් ඒ කුකුරුවත හරනේ වේ ද, එසේ දහම් දෙසන්නට භාග්‍යවතුන් වහන්සේ සමත්හ ' යි. පුණ්ණය, එ කරුණින් අසව, මනාකොට මෙනෙහි කරව, කියමි යි. ' වහන්ස, එසේ යැ ' යි ගෝවත ගත් කෝලියපුත් පුණ්ණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදත් ඇස්වි. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක :

' පුණ්ණය, මෙ සතර කර්ම කෙනෙක් මා විසින් තමා මැ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රවිදිත වැ ඇත. කවර සතර කෙනෙක යත් : පුණ්ණය, කෘෂ්ණ වූ කෘෂ්ණවිපාක වූ කර්මයෙක් ඇත. පුණ්ණය, ශුක්ල වූ ශුක්ලවිපාක ඇති කර්මයෙක් ඇත. පුණ්ණය, කෘෂ්ණශුක්ල වූ කෘෂ්ණශුක්ල විපාක ඇති කර්මයෙක් ඇත. පුණ්ණය, අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණ අශුක්ල විපාක ඇති කර්මක්ෂයට වැටෙන කර්මයෙක් ද ඇති ' යි.

කතමඤ්ච පුණ්ණ කම්මං කණ්හං කණ්හවිපාකං: ඉධ පුණ්ණ එකච්චො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣං වෙදනං වෙදෙති එකන්තදුක්ඛං. සෙය්‍යථාපි සත්තා නෙරයිකා ඉති ඛො පුණ්ණ භූතා භූතස්ස උපපත්ති හොති, යං කරොති තෙන උපපජ්ජති. උපපන්නමෙනං ඵස්සා ඵුසන්ති. එවම්පහං[1] පුණ්ණ කම්මදායාදා සත්තාති වදාමි. ඉදං වුච්චති පුණ්ණ කම්මං කණ්හං කණ්හවිපාකං.

කතමඤ්ච පුණ්ණ කම්මං සුක්කං සුක්කවිපාකං: ඉධ පුණ්ණ එකච්චො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති. අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති. අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති තමෙනං අබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං අබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො අබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො අබ්‍යාපජ්ඣං වෙදනං වෙදෙති එකන්තසුඛං. සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. ඉති ඛො පුණ්ණ භූතා භූතස්ස උපපත්ති හොති. යං කරොති තෙන උපපජ්ජති. උපපන්නමෙනං ඵස්සා ඵුසන්ති. එවම්පහං[1] පුණ්ණ කම්මදායාදා සත්තාති වදාමි. ඉදං වුච්චති පුණ්ණ කම්මං සුක්කං සුක්කවිපාකං.

කතමඤ්ච පුණ්ණ කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං: ඉධ පුණ්ණ එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣාපි අබ්‍යාපජ්ඣාපි ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහිපි අබ්‍යාපජ්ඣෙහිපි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වෙදනං වෙදෙති වොකිණ්ණසුඛදුක්ඛං, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. ඉති ඛො පුණ්ණ භූතා භූතස්ස උපපත්ති හොති. යං කරොති තෙන උපපජ්ජති. උපපන්නමෙනං ඵස්සා ඵුසන්ති. එවම්පහං[1] පුණ්ණ කම්මදායාදා සත්තාති වදාමි. ඉදං වුච්චති පුණ්ණ, කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං.

කතමඤ්ච පුණ්ණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හසුක්කවිපාකං කම්මක්ඛයාය[2] සංවත්තති, තත්‍ර පුණ්ණ යමිදං කම්මං කණ්හං කණ්හවිපාකං තස්ස පහානාය යා චෙතනා, යම්පිදං[3] කම්මං සුක්කං සුක්කවිපාකං තස්ස පහානාය යා චෙතනා, යම්පිදං[3] කම්මං කණ්හසුක්කං

---

1. එවංපාහං-මජසං. ස්‍යා. 2. කම්මං කම්මක්ඛයාය-සීමු.
3. යමිදං-මජසං. ස්‍යා.

පූර්ණය, කෘෂ්ණ වූ කෘෂ්ණවිපාක ඇති කර්ම කවරෙ යැ යත් : පූර්ණය, මෙලොව එකෙක් සදුඃඛ වූ කායසංස්කාර අභිසංස්කරණ කෙරෙයි. සදුඃඛ වූ වාක් සංස්කාර අභිසංස්කරණ කෙරෙයි. සදුඃඛ වූ මනඃසංස්කාර අභිසංස්කරණ කෙරෙයි. හෙ සදුඃඛ වූ කායසංස්කාර රැස් කොට සදුඃඛ වූ වාක් සංස්කාර රැස් කොට සදුඃඛ වූ මනඃසංස්කාර රැස් කොට සදුඃඛ ලොකයට එළැඹෙයි. සදුඃඛ ලෝකයට එළැඹී තුලුහු සදුඃඛ විපාක ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. හෙ සදුඃඛ විපාක ස්පර්ශයෙන් පහස්නාලද්දේ ඒකාන්ත දුඃඛ වූ සදුඃඛ වෙදනා විඳී. නිරැ උපන් සත්ත්වයන් සෙයිනි. පූර්ණය, මෙසේ යථාභූත කර්ම හේතුයෙන් සත්ත්වයාගේ උපප්‍රාප්තිය වෙයි. යමක් කෙරේ ද එයින් පරලොව එළැඹෙයි. එළැඹී තුලුහු ස්පර්ශයෝ පැහැසැගනිති'යි. පූර්ණය, මම මෙසෙයිනුදු 'සත්ත්වයෝ කර්මය දයාද කොට ඇතියහ'යි කියමි. පූර්ණය, මෙය 'කෘෂ්ණ වූ කෘෂ්ණ විපාක ඇති කර්මයැ'යි කියනු ලැබේ.

පූර්ණය, 'ශුක්ල වූ ශුක්ලවිපාක ඇති කර්මය' කවරෙ යැ යත් : පූර්ණය, මෙලොව එකෙක් නිදුක් වූ කායසංස්කාර රැස් කෙරෙයි, නිදුක් වූ වාක්සංස්කාර රැස් කෙරෙයි, නිදුක් වූ මනඃසංස්කාර රැස් කෙරෙයි. හේ නිදුක් වූ කායසංස්කාර රැස් කොට නිදුක් වූ වාක්සංස්කාර රැස් කොට නිදුක් වූ මනඃසංස්කාර රැස්කොට නිදුක් ලොවට එළැඹෙයි, නිදුක් ලොවට එළැඹියා වූ තුලුහු නිදුක් විපාක ඇති ස්පර්ශයෝ පැහැසැගනිත්. හේ නිදුක් විපාක ඇති පහසින් පහස්නා ලද්දේ මැ ඒකාන්ත සුඛ වූ නිදුක් වේදනා විඳී. සුභකිණ්හ දෙවියන් සෙයිනි. පූර්ණය, මෙසේ යථාභූත කර්ම හේතුයෙන් සත්ත්වයාගේ උප්පත්ති වෙයි. යමක් කෙරේ ද එ කර්ම හේතුයෙන් පරලොව එළැඹීම් වෙයි. එළැඹුණු තුලුහු ස්පර්ශයෝ පැහැසැගනිත්. පූර්ණය, මම මෙසෙයිනුදු 'සත්ත්වයෝ කර්මය දයාද කොට ඇතියහ'යි කියමි. පූර්ණය, මෙය ශුක්ල වූ ශුක්ලවිපාක ඇති කර්මයැ'යි කියනු ලැබේ.

පූර්ණය, කෘෂ්ණශුක්ල වූ කෘෂ්ණශුක්ලවිපාක ඇති කර්ම කවරෙ යැ යත් : පූර්ණය, මෙලොව එකෙක් සදුඃඛ වූත් අදුඃඛ වූත් කායසංස්කාර රැස් කෙරෙයි. සදුඃඛ වූත් අදුඃඛ වූත් වාක්සංස්කාර රැස් කෙරෙයි. සදුඃඛ වූත් අදුඃඛ වූත් මනඃසංස්කාර රැස් කෙරෙයි. හෙ සදුඃඛ වූත් අදුඃඛ වූත් කායසංස්කාර රැස් කොට සදුඃඛ වූත් අදුඃඛ වූත් වාක් සංස්කාර රැස් කොට සදුඃඛ වූත් අදුඃඛ වූත් මනඃසංස්කාර රැස් කොට සදුඃඛ වූත් අදුඃඛ වූත් ලෝකයට එළැඹෙයි. සදුඃඛ වූත් අදුඃඛ වූත් ලෝකයට එළැඹියා වූ තුලුහු සදුඃඛ වූත් අදුඃඛ වූත් ස්පර්ශයෝ පැහැසැගනිත්. හෙ සදුඃඛ වූත් අදුඃඛ වූත් පහසින් පුස්නාලද්දේ මැ සුඛදුඃඛ මිශ්‍ර වූ සදුඃඛ වූත් අදුඃඛ වූත් වෙදනා විඳී. මිනිසුන් සෙයිනි. ඇතැම් දෙවියනුදු සෙයිනි. ඇතැම් විනිපාතිකයනුදු සෙයිනි. පූර්ණය, මෙසේ යථාභූත කර්ම හෙතුයෙන් සත්ත්වයා ගේ උපපත්ති වෙයි. යමක් කෙරේ ද ඒ කර්ම හෙතුයෙන් උපපත්ති වෙයි. උපපන්න වූ තුලුහු පහස්හු පැහැසැගනිත්. පූර්ණය, මම මෙසෙයිනිදු 'සත්ත්වයෝ කර්මය දයාද කොට ඇතියහ'යි කියමි. පූර්ණය, මෙය 'කෘෂ්ණශුක්ල වූ කෘෂ්ණශුක්ල විපාක ඇති කර්ම යැ'යි කියනු ලැබේ.

පූර්ණය, කෘෂ්ණශුක්ල නො වූ අකෘෂ්ණශුක්ල විපාක ඇති කර්මක්ෂය පිණිස වැටෙන කර්ම කවරෙ යැ යත් : පූර්ණය, එ ත්‍රිවිධ කර්මයන් කෙරෙහි කෘෂ්ණ වූ කෘෂ්ණවිපාක ඇති යම් කර්මයෙක් ඇද්ද ඒ කර්මයාගේ ප්‍රහාණය සඳහා යම් මාර්ගචෙතනායෙක් වී නම්, ශුක්ල වූ ශුක්ලවිපාක ඇති යම් කර්මයෙක් ඇද්ද ඒ කර්මයාගේ ප්‍රහාණය සඳහා යම් මාර්ගචෙතනායෙක් වී නම්, කෘෂ්ණශුක්ල වූ කෘෂ්ණශුක්ල විපාක ඇති යම් කර්මයෙක්

කණ්හසුක්කවිපාකං තස්ස පහානාය යා චෙතනා, ඉදං වුච්චති පුණ්ණ කම්මං අකණ්හං අසුක්කං අකණ්හාසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති. ඉමානි ඛො පුණ්ණ චත්තාරි කම්මානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානීති.

එවං වුත්තෙ පුණ්ණො කොලියපුත්තො ගොවතිකො භගවන්තං එතදවොච : අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ—පෙ—උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති. අචෙලො පන සෙනියො කුක්කුරවතිකො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ—පෙ—පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යං උපසම්පදන්ති.

යො ඛො සෙනිය අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං. සො චත්තාරො මාසෙ පරිවසති චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති. සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං, ආකඞ්ඛන්තා උපසම්පදං, චත්තාරො[1] මාසෙ පරිවසන්ති. චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං මං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති. අලත්ථ ඛො අචෙලො සෙනියො කුක්කුරවතිකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා සෙනියො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනාගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි අඤ්ඤතරො ඛො පනායස්මා සෙනියො අරහතං අහොසීති.

කුක්කුරවතිය[2] සුත්තං සත්තමං.

---

1. තෙ චත්තාරො - මජසං.
2. කුක්කුරවතික - මජසං, PTS

ඇද්ද, ඒ කර්මයාගේ ප්‍රහාණය සඳහා යම් මාර්ගචේතනායෙක් වී නම්, පුණ්ණය, මෙය 'කෘෂ්ණශුක්ල නො වූ අකෘෂ්ණශුක්ලවිපාක ඇති කර්මක්ෂය පිණිස වැටෙන කර්ම යැ'යි කියනු ලැබේ. පුණ්ණය, මේ සතර කර්මයෝ තමා විසින් මැ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට මා විසින් සුවිදිතයහ'යි වදාළෝ.

මෙසේ වදාළ කල්හි ගෝවත ගත් කෝලියපුත් පුණ්ණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : වහන්ස, ඉමැනැවි, වහන්ස, ඉමැනැවි. වහන්ස, යම්සේ ... භාග්‍යවතුන් වහන්සේ අද පටන් ඉදිරියෙහි දිවි හිම් කොට සරණගිය උපාසකයකු කොට මා ධරන සේක්වා. බලුතව ගත් සේනිය අචේලක භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : 'වහන්ස, ඉතා මැනැවැ වහන්ස, ඉතා මැනැවැ, වහන්ස, යම් පරිදි ... දෙසනලද්දේ. වහන්ස, මෙසේ මම භාග්‍යවතුන්වහන්සේ සරණ යෙමි. ධර්මය හා භික්සඝයාහු සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලැබෙම්වා. උපසම්පත් ලැබෙම්ව'යි කී.

සේනිය, අන්‍යතීර්ථක වූ යමෙක් මෙ සස්නෙහි පැවිදි උපසම්පත් රුස්නේ නම් හෙ සාරමසක් මුළුල්ලෙහි පිරිවෙස් පුරයි. සාරමසක්හුගේ ඇවෑමෙන් තුටුසිත් ඇති භික්ෂූහු (ඔහු) භික්ෂුභාවයට පැවිදි උපසපන් කෙරෙති. එතෙකුදු වත් මෙහි ලා මා විසින් පුද්ගලනානාත්වය දන්නා ලදැ'යි. වහන්ස, ඉදින් අන්‍යතීර්ථක වූවාහු මෙ සස්නෙහි පැවිදි උපසම්පත් කැමැති වැ සාරමසක් කල් පිරිවෙස් පුරත් ද, සාරමසක්හුගේ ඇවෑමෙන් සිත්ගත් භික්ෂූහු (ඔහු) භික්ෂුභාව පිණිස පැවිදි උපසපන් කෙරෙත් ද, මම සතර හවුරුද්දක් පිරිවෙස් පුරන්නෙමි. සතර හවුරුද්දක් ඇවෑමෙන් සිත්ගත් භික්ෂූහු (මා) භික්ෂුභාවය පිණිස පැවිදි උපසපන් කෙරෙත් වා'යි. කුක්කුරවතික සේනිය තුවට භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි ලද, උපසම්පත් ලදි. උපසම්පත් ලද නොබෝකල් ඇති ආයුෂ්මත් සේනිය එකලා වූයේ (වස්තු කාම ක්ලෙශකාමයෙන්) වෙන් වූයේ (කමටහන්හි සිහි එළවමින්) අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇති වැ (කායජීවිත නිරපෙක්ෂ වැ) හරනලද ආත්මභාව ඇති වැ වාස කෙරෙමින් නොබෝකලෙකින් මැ යමක් සඳහා ආචාර කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සසුන් වදිත් ද, ඒ අනුත්තර වූ, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාගේ පර්‍ය්‍යවසානය වූ අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තෙමේ අභිඥායෙන් සාක්ෂාත් කොට උපයා වාස කෙළේ යි. ජාතිය ක්ෂය වූ. බඹසර වැස නිමවන ලදි, කරණී කරන ලද, මෙ අර්හත්ඵලය පිණිස කළයුතු අන් කිසෙක් නැතැ'යි දත්තේ ය. ආයුෂ්මත් සෙනිය වැළිත් රහතුන් කෙරෙහි අන්‍යතරයෙක් වී.

සත්වැනි කුක්කුරවතිය සූත්‍ර යි.

---

2. 1. 8

අභයරාජකුමාර සුත්තං

එවං මෙ සුතං, එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො අභයො රාජකුමාරො යෙන නිගණ්ඨො නාතපුත්තො[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අභයං රාජකුමාරං නිගණ්ඨො නාතපුත්තො[1] එතදවොච; එහි ත්වං රාජකුමාර, සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙහි. එවං තෙ කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති[2] අභයෙන රාජකුමාරෙන සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදො ආරොපිතොති. යථා කථං පනා'හං භන්තෙ සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදං ආරොපෙස්සාමීති.

එහි ත්වං රජකුමර, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා සමණං ගොතමං එවං වදෙහි: භාසෙය්‍ය නු ඛො භන්තෙ තථාගතො තං වාචං යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති. සචෙ තෙ සමණො ගොතමො එවං පුට්ඨො එවං බ්‍යාකරොති: භාසෙය්‍ය රජකුමාර, තථාගතො තං වාචං යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: අථ කිඤ්චරහි තෙ භන්තෙ පුථුජ්ජනෙන නානාකරණං, පුථුජ්ජනොපි හි තං වාචං භාසෙය්‍ය, යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති. සචෙ පන තෙ සමණො ගොතමො එවං පුට්ඨො එවං බ්‍යාකරොති: න රාජකුමාර තථාගතො තං වාචං භාසෙය්‍ය යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: අථ කිඤ්චරහි තෙ භන්තෙ දෙවදත්තො බ්‍යාකතො: ආපායිකො දෙවදත්තො, නෙරයිකො දෙවදත්තො, කප්පට්ඨො දෙව-දත්තො, අතෙකිච්ඡො දෙවදත්තොති. තාය ච පන තෙ වාචාය දෙව-දත්තො කුපිතො අහොසි අනත්තමනොති. ඉමං ඛො තෙ රාජකුමාර, සමණො ගොතමො උභතො කොටිකං පඤ්හං පුට්ඨො සමානො නෙව සක්ඛිති උග්ගිලිතුං. නෙව සක්ඛිති ඔගිලිතුං[3]. සෙය්‍යථාපි නාම පුරිසස්ස අයොසිඞ්ඝාටකං[4] කණ්ඨෙ විලග්ගං, සො නෙව සක්කුණෙය්‍ය උග්ගිලිතුං, නෙව සක්කුණෙය්‍ය ඔගිලිතුං. එවමෙව ඛො තෙ රාජකුමාර සමණො ගොතමො ඉමං උභතොකොටිකං පඤ්හං පුට්ඨො සමානො නෙව සක්ඛිති උග්ගිලිතුං, නෙව සක්ඛිති ඔගිලිතුන්ති.

එවං භන්තෙති ඛො අභයො රජකුමරෙ නිගණ්ඨස්ස නාතපුත්තස්ස පටිස්සුත්වා උට්ඨායාසනා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවා-දෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො අභයස්ස රජ-කුමාරස්ස සුරියං ඔලොකෙත්වා[5] එතදහොසි. අකාලො ඛො අජ්ජ භගවතො වාදං ආරොපෙතුං, ස්වෙදානාහං සකෙ නිවෙසනෙ භගවතො වාදං ආරොපෙස්සාමීති භගවන්තං එතදවොච: අධිවාසෙතු මෙ භන්තෙ

---

1. නාටපුත්තො - මජසං.
2. අබ්භුග්ගච්ඡිස්සති - මජසං.
3. ඔග්ගිලිතුං - ස්‍යා.
4. අයසිඞ්ඝාටකං - ස්‍යා.
5. සුරියං උල්ලොකෙත්වා - මජසං.

Free Distribution www.aathaapi.org

2. 1. 8
අභයරාජ කුමාර සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි (බිම්බිසාර මහරජහු පිත්) අභය රාජකුමාර නිගණ්ඨ නාතපුත්‍රයා කරා එළැඹ වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් අභය රාජකුමාරයාහට නිගණ්ඨ නාතපුත්‍ර තෙල කී : '' එව රාජකුමාරය, තෙපි ශ්‍රමණ ගෞතමයන්හට වාදරොපණය කරව, අභය රජකුමරහු විසින් මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන්හට වාදරොපණ කරන ලද' යි මෙසේ තොප ගේ කල්‍යාණ වූ යසගොස උස් ව නැඟේ ''යයි. වහන්ස, මම මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන්හට කිසෙයින් වාදරොපණය කෙරෙම් ද'යි.

එව රාජකුමාරය, තෙපි ශ්‍රමණ ගෞතමයා කරා එළැඹ ශ්‍රමණ ගෞතමයන්හට මෙසේ කියව. '' වහන්ස, යම් වචනයෙක් අන්‍යයනට අප්‍රිය අමනාප වේ ද, තථාගතයෝ ඒ වචනය කියන්නාහු ද''යි, ඉදින් තොප විසින් ශ්‍රමණ ගෞතම මෙසේ පුළුවුස්නා ලදුයේ ' රාජකුමාරය, යම් වචනයෙක් අන්‍යයනට අප්‍රිය අමනාප වේ ද, තථාගතයෝ ඒ වචනය කියන්නාහ'යි මෙසේ ප්‍රකාශ කෙරේ නම් තෙපි ඔහුට මෙසේ කියව, ' වහන්ස, එකල්හි පුහුදුන් පුහුල්හු හා තොප ගේ නානාකරණය කිමෙක් ද? පුහුදුන් පුහුල් ද යම් වචනයෙක් අන්‍යයනට අප්‍රිය අමනාප වේ ද, ඒ වචනය කියන්නේ යැ'යි යළි ඉදින් ශ්‍රමණ ගෞතම තොප විසින් මෙසේ පුළුවුස්නා ලදුයේ මෙසේ ප්‍රකාශ කෙරේ ද, රාජ කුමාරය, යම් වචනයෙක් අන්‍යයනට අප්‍රිය අමනාප වේ නම්, තථාගතයෝ ඒ වචනය නො කියන්නාහ 'යි. තෙපි ඔහුට මෙසේ කියව : '' වහන්ස, එකල්හි තොප විසින් ' දෙව්දත් අපායෙහි උපදිනුයෙක, දෙව්දත් නිරයෙහි උදපදිනුයෙක, දෙව්දත් කල්පයක් සිටිනුයෙක, දෙව්දත් (බුදුදහසුන් විසිනුදු) පිළියම් නො කළ හෙනුයෙකැයි කුමක් හෙයින් දෙවදත්ත පවසනලදුයේ ද? තවද තොප ගේ ඒ බසින් දෙව්දත් කිපියේ නො සතුටුවූයේ වී'' යයි. රාජකුමාරය, තොප විසින් ශ්‍රමණ ගෞතම මේ උභතොකොටික ප්‍රශ්නය පුළුවුසනා ලදුයේ වමාරනට හෝ ගළනට හෝ නො මැ හැකි වෙයි. පුරුෂයකුගේ කණ්ඨයෙහි ලැඟුණු යසහළුවෙක් යම් පරිදි වේ ද හේ එය වමාරන්නට හෝ ගළනට හෝ නො මැ හැකි වන්නේ යැ. එපරිදි රාජකුමාරය, තොප විසින් ශ්‍රමණ ගෞතම මේ උභතොකොටික ප්‍රශ්න පුළුවුස්නා ලදුයේ වමාරන්නට නො මැ හැකි වෙයි. ගළනට නො මැ හැකි වෙයි.

වහන්ස, එසේ යැ'යි අභයරාජකුමාර නුවට නතපුත්හට පිළිවදන් දී හුනස්නෙන් නැඟී නුවට නතපුත්හු සකසා වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙකැ හින. එකත්පසෙක හුන් අභය රාජකුමාරහට හිරු බලා තෙල සිත් වී : අද භාග්‍යවතුන් වහන්සේට වාදරොපණය පිණිස කල් නො වෙයි. දැන් මම සෙට සිය නිවසෙහි දී භාග්‍යවතුන් වහන්සේට වාදරොපණ කෙරෙමි'යි. භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ, වහන්ස, භාග්‍යවතුන්

භගවා ස්වාතනාය අත්තචතුත්ථො භත්තන්ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො අභයො රාජකුමාරො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන අභයස්ස රාජකුමාරස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො අභයො රාජකුමාරො භගවන්තං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. අථ ඛො අභයො රාජකුමාරො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අභයො රාජකුමාරො භගවන්තං එතදවොච:

'භාසෙය්‍ය නු ඛො භන්තෙ තථාගතො තං වාචං යා සා වාචා පරෙසං අප්පියා අමනාපා'ති. න ඛො'ත්ථ[1] රාජකුමාර එකංසෙනාති. එත්ථ භන්තෙ අනස්සුං නිගණ්ඨාති. කිම්පන ත්වං රාජකුමාර එවං වදෙසි: 'එත්ථ භන්තෙ අනස්සුං නිගණ්ඨා'ති. ඉධාහං භන්තෙ යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නං ඛො මං භන්තෙ නිගණ්ඨො නාතපුත්තො එතදවොච: එහි ත්වං රාජකුමාර, සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙහි එවං තෙ කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති "අභයෙන රාජකුමාරෙන සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදො ආරොපිතො''ති. එවං වුත්තෙ අහං භන්තෙ නිගණ්ඨං නාතපුත්තං එතදවොචං. යථා කථම්පනාහං භන්තෙ සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදං ආරොපෙස්සාමීති. එහි ත්වං රාජකුමාර, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණං ගොතමං එවං වදෙහි: 'භාසෙය්‍ය නු ඛො භන්තෙ තථාගතො තං වාචං, යා සා වාචා පරෙසං අප්පියා අමනාපා'ති. සචෙ තෙ සමණො ගොතමො එවං පුට්ඨො එවං බ්‍යාකරොති: භාසෙය්‍ය රාජකුමාර තථාගතො තං වාචං, යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: අථ කිඤ්චරහි තෙ භන්තෙ පුථුජ්ජනෙන නානාකරණං, පුථුජ්ජනොපි හි තං වාචං භාසෙය්‍ය, යා සා වචා පරෙසං අප්පියා අමනාපාති. සචෙ පන තෙ සමණො ගොතමො එවං පුට්ඨො එවං බ්‍යාකරොති: 'න රාජකුමාර තථාගතො තං වාචං භාසෙය්‍ය, යා සා වාචා පරෙසං අප්පියා අමනාපා'ති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: අථ කිඤ්චරහි තෙ භන්තෙ දෙවදත්තො බ්‍යාකතො: ආපායිකො දෙවදත්තො, නෙරයිකො දෙවදත්තො, කප්පට්ඨො දෙවදත්තො, අතෙකිච්ඡො දෙවදත්තොති. තාය ච පන තෙ වාචාය දෙවදත්තො කුපිතො අහොසි අනත්තමනො'ති. ඉමං ඛො තෙ රාජකුමාර සමණො ගොතමො උභතොකොටිකං පඤ්හං පුට්ඨො සමානො නෙව සක්ඛිති උග්ගිලිතුං. නෙව සක්ඛිති ඔගිලිතුං. සෙය්‍යථාපි නාම පුරිසස්ස අයොසිඞ්ඝාටකං කණ්ඨෙ විලග්ගං, සො නෙව සක්කුණෙය්‍ය උග්ගිලිතුං, නෙව සක්කුණෙය්‍ය ඔගිලිතුං එවමෙව ඛො තෙ රාජකුමාර සමණො ගොතමො ඉමං උභතොකොටිකං පඤ්හං පුට්ඨො සමානො නෙව සක්ඛිති උග්ගිලිතුං, නෙව සක්ඛිති ඔගිලිතුන්ති.

---

1. නඛ්වෙත්ථ-මජසං. ස්‍යා.

වහන්සේ සෙට තමා සිවු වැනි වැ මාගේ බත ඉවසන සේක්වා'යි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූසේක. එසඳ අභයරාජකුමාර භාග්‍යවතුන් වහන්සේගේ ඉවසුම් දැන හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහතේසේ සකසා වැඳ පැදකුණු කොට ගියේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එරය ඇවෑමෙන් පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන අභයරාජකුමාරයාගේ නිවෙස්න කරා වැඩියහ. වැඩ, පැන්වූ අස්නෙහි හුන්හ. එසඳ අභයරාජකුමාර භාග්‍යවතුන් වහන්සේ ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයෙන් සියතින් සතපාලී යැ. මොනොවට පවරාලී යැ. එසඳ අභයරාජකුමාර වළඳා නිමවූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙතැ එක්තරා මිටිඅස් නක් ගෙන එකත්පසෙක හිත. එකත්පසෙක හුන් අභයරාජකුමාර භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ

වහන්ස, තථාගතයන් වහන්සේ යම් බඳු වචනයෙක් මෙරමාහට අප්‍රිය අමනාප වේ, නම් ඒ වචන වදරනසේක් ද ? රාජකුමාරය, මෙ කරුණෙහි ලා එකාන්තයෙන් විසඳුම් නැති. වහන්ස, ඉම කරුණෙහි ලා නුවටහු නටහ යි. රාජ කුමාරය, කවර හෙයෙකින් තෝ මෙසේ කියහි ? ' වහන්ස, නුවටහු මෙහි දී නටහ'යි. වහන්ස, මම නුවට නතපුත් කරා එළැඹියෙමි. එළැඹ නුවට නතපුත්හු සකසා වැඳ එකත්පසෙකැ හිනිමි. වහන්ස, එකත්පසෙකැ හුන් මට නුවට නතපුත් තෙල කී : රාජකුමාරය, තෝ එව. මහණ ගොයුම් හට වාදරෝපණ කරව. එසේ කළ කල ' අභයරාජකුමාරයා විසින් මෙ බඳු මහ ඉද්ධි ඇති මෙ බඳු මහත් අනුභාව ඇති මහණ ගොයුම්හට වාදරෝපණ කරන ලද්'යි තාගේ කල්‍යාණ කීර්තිඝෝෂා උස් වැ නැඟී යයි. වහන්ස, මෙසේ කී කලැ මම නුවට නතපුත්හට තෙල කීමි : ' වහන්ස, මම මෙ බඳු මහත් ඍද්ධි ඇති මෙ බඳු මහත් අනුභාව ඇති මහණ ගොයුම්හට කිසෙයින් නම් වාදරෝපණ කෙරෙම් ද ?'යි රාජකුමාරය, තෝ එව. මහණ ගොයුම්හු කරා එළැඹෙව. එළැඹ මෙසේ කියව : ' වහන්ස, තථාගතයන් වහන්සේ මෙරමාහට අප්‍රිය අමනාප වූ යම් වචනයෙක් වේ නම් ඒ වචන වදරන දෑ දැ'යි. ඉදින් තා විසින් මහණ ගොයුම් මෙසේ පුළුවුස්නා ලදුයේ මෙසේ ප්‍රකාශ කෙරේ ද : රාජකුමාරය, මෙරමාහට අප්‍රිය අමනාප වූ යම් වචනයෙක් වේ නම් ඒ වචන තථාගතයන් වහන්සේ වදරන දෑ යයි. ප්‍රකාශ කෙරේ ද, තෝ එ මහණගොයුම්හට මෙසේ කියන්නෙහි : ' වහන්ස, එසේ වී නම් පෘථග්ජනයා හා තොප වහන්සේගේ නානාත්ව කිම ? යම හෙයෙකින් පෘථග්ජන තෙමේත් යම් වචනයෙක් මෙරමාහට අප්‍රිය අමනාප වේ නම් ඒ වචන කියන්නේ ද' එහෙයිනැයි. ඉදින් වැළිත් මහණ ගොයුම් තා විසින් මෙසේ පුළුවුස්නා ලද්දේ මෙසේ ප්‍රකාශ කෙරේ ද : ' රාජකුමාරය, යම් වචනයෙක් මෙරමාහට අප්‍රිය අමනාප වේ නම් තථාගතයන් වහන්සේ ඒ වචන නො වදරන දෑ යැ'යි. එ මහණ ගොයුම්හට තෝ මෙසේ කියනෙහි : '' වහන්ස, එසේ වී නම් තොප වහන්සේ විසින් ' දෙව්දත් අපායෙහි උපදිනුයෙක, දෙව්දත් නිරයෙහි උපදිනුයෙක, දෙව්දත් කල්පයක් සිටිනුයෙක, දෙව්දත් (දහසක් බුදුන් විසිනුදු) පිළියම් නො කළ හෙනුයෙකැ'යි කුමක් හෙයින් දෙවදත්ත පවසනු ලදුයේ ද ? තවද තොප වහන්සේගේ ඒ බසින් දෙව්දත් කිපියේ නො සතුටු වූයේ වී '' යයි. රාජකුමාරය, තොප විසින් ශ්‍රමණ ගෞතම මේ උභතො කොටික ප්‍රශ්නය පුළුවුස්නා ලදුයේ වමාරන්නට හෝ ගළනට හෝ නො වැ හැකි වෙයි. පුරුෂයකුගේ කණ්ඨයෙහි ලැඟුණු අයොසිඞ්ඝාටකයෙක් (යකඟුළුවෙක්) යම් පරිදි වේ ද හේ එය වමාරන්නට හෝ ගළනට නො මැ හැකි වන්නේ යැ. එපරිදි රාජකුමාරය, තොප විසින් ශ්‍රමණ ගෞතම මේ උභතෝකෝටික ප්‍රශ්න පුළුවුස්නා ලදුයේ වමාරන්නට නො මැ හැකි වෙයි, ගළනට නො මැ හැකි වෙ '' යයි.

තෙන ඛො පන සමයෙන දහරො කුමාරො මන්දො උත්තාන-සෙය්‍යකො අභයස්ස රාජකුමාරස්ස අඞ්කෙ නිසින්නො හොති. අථ ඛො භගවා අභයං රජකුමාරං එතදවොච: තං කිං මඤ්ඤසි රජකුමාර, සචා'යං කුමාරො තුය්හං වා පමාදමන්වාය ධාතියා වා පමාදමන්වාය කට්ඨං වා කඨලං වා මුඛෙ ආහරෙය්‍ය, කින්ති නං කරෙය්‍යාසීති. ආහරෙය්‍යස්සාහං භන්තෙ. සචෙ අහං භන්තෙ න සක්කුණෙය්‍යං ආදිකෙනෙව ආහත්තුං වාමෙන හත්ථෙන සීසං පග්ගහෙත්වා[1] දක්ඛිණෙන හත්ථෙන වඞ්කඞ්ගුලිං කරිත්වා සලොහිතම්පි ආහරෙය්‍යං. තං කිස්සහෙතු: අත්ථි මෙ භන්තෙ කුමාරෙ අනුකම්පාති. එවමෙව ඛො රාජකුමාර, යං තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතො වාචං භාසති. යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං. සා ච පරෙසං අප්පියා අමනාපා, තම්පි තථාගතො වාචං න භාසති. යඤ්ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං සා ච පරෙසං අප්පියා අමනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය. යං තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා, න තං තථාගතො වාචං භාසති. යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං. සා ච පරෙසං පියා මනාපා, තම්පි තථාගතො වාචං න භාසති. යඤ්ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං. සා ච පරෙසං පියා මනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය. තං කිස්ස හෙතු: අත්ථි රාජකුමාර තථාගතස්ස සත්තෙසු අනුකම්පාති.

යෙමෙ භන්තෙ ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපති පණ්ඩිතාපි සමණපණ්ඩිතාපි පඤ්හං අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති. පුබ්බෙව නු ඛො එතං භන්තෙ භගවතො චෙතසො පරිවිතක්කිතං හොති: 'යෙ මං උපසංකමිත්වා එවං පුච්ඡිස්සන්ති. තෙසාහං එවං පුට්ඨො එවං බ්‍යාකරිස්සාමී'ති උදාහු ඨානසො එතං තථාගතං පටිභාතීති. තෙන හි රාජකුමාර තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය. තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි රජකුමාර: කුසලො ත්වං රථස්ස අඞ්ගපච්චඞ්ගානන්ති. එවං භන්තෙ, කුසලො අහං රථස්ස අඞ්ගපච්චඞ්ගානන්ති, තං කිම්මඤ්ඤසි රාජකුමාර: යෙ තං උපසඞ්කමිත්වා එවං පුච්ඡෙය්‍යුං: කිං නාමිදං රථස්ස අඞ්ගපච්චඞ්ගන්ති, පුබ්බෙ නු ඛො තෙ එතං චෙතසො පරිවිතක්කිතං අස්ස: යෙ මං උපසඞ්කමිත්වා එවං පුච්ඡිස්සන්ති තෙසාහං එවං පුට්ඨො එවං බ්‍යාකරිස්සාමීති. උදාහු ඨානසොවෙතං තං පටිභාසෙය්‍යාති. අහං හි භන්තෙ රථිකො සඤ්ඤාතො කුසලො රථස්ස අඞ්ගපච්චඞ්ගානං, සබ්බානි මෙ රථස්ස අඞ්ගපච්චඞ්ගානි සුවිදිතානි, ඨානසොවෙතං මං පටිභාසෙය්‍යාති.

---

1. පරිග්ගහෙත්වා-PTS.

Free Distribution www.aathaapi.org

එසමයෙහි උඩුහුරු වැ හෝනා ළදරු කුමරෙක් අභය රාජකුමාරයාගේ ඇකයෙහි හුන්නේ වෙයි. එසඳ බුදුහු අභය රජකුමරහට මෙය වදාළහ : " රාජකුමාරයෙනි, ඒ කිමැයි හඟනාව. ඉදින් මෙ කුමර තොපගේ හෝ ප්‍රමාදය නිසා කිරිමවගේ හෝ ප්‍රමාදය නිසා කාෂ්ටයක් හෝ කැබිලිත්තක් හෝ මුවෙහි තබන්නේ නම් ඔහට කුමක් කරන්නෙහි ද ? යි. වහන්ස, ඔහුගේ එය බැහැර ලන්නෙමි. ඉදින් වහන්ස, මම පළමු පියොවින් මැ බැහැර ලන්නට නො හැකි වීම් නම් වමතින් හිස දැඩි කොට ගෙන දකුණතින් ඇඟිලි වක් කොටගෙන ලෙහෙ සහිත වැ ද බැහැර ලන්නෙමි. ඒ කවර හෙයින යත් : වහන්ස, මට කුමරු කෙරෙහි අනුකම්පායෙක් ඇත. එහෙයිනැ'යි. එසෙයින් මැ රාජකුමාර යෙනි, තථාගතයෝ යම් වචනයක් ' අභූත යැ ' අතථ්‍ය,'යැ ' අනර්ථසංහිත ' යැ යි දනිත් ද, එ ද මෙරමාහට අප්‍රිය අමනාප වේ ද, තථාගතයෝ ඒ වචනය නො කියති. තථාගතයෝ යම් වචනයකුත් ' භූත,' යැ ' තථ්‍ය,' යැ ' අනර්ථසංහිත ' යැ යි දනිත් ද, එ ද මෙරමාහට අප්‍රිය අමනාප වේ ද, තථාගතයෝ ඒ වචනය ද නො කියති. තථාගතයෝ වැළිත් යම් වචනයකුත් ' භූත ' යැ ' තථ්‍ය ' යැ ' අර්ථ සංහිත ' යැ යි දනිත් ද, එ ද මෙරමාහට අප්‍රිය අමනාප වේ ද එහිලා තථාගතයෝ එ වදන් විවරණ කරන්නට කල්දන්නාහු වෙති. තථාගතයෝ යම් වචනයක් ' අභූත ' යැ ' අතථ්‍ය ' යැ ' අනර්ථසංහිත ' යැ යි දනිත් ද එ ද මෙරමාහට ප්‍රිය මනාප වී ද තථාගතයෝ ඒ වචනය නො වදරති. තථාගතයෝ යම් වචනයකුත් ' භූත ' යැ ' තථ්‍ය ' යැ ' අනර්ථසංහිත ' යැ යි දනිත් ද එ ද මෙරමාහට ප්‍රිය මනාප වී ද, තථාගතයෝ ඒ වචනය ද නො කියති. තවද තථාගතයෝ යම් වචනයකුත් ' භූත ' යැ ' තථ්‍ය ' යැ ' අර්ථසංහිත ' යැ යි දනිත් ද එ ද මෙරමාහට ප්‍රිය මනාප වී ද එහි ලා තථාගතයෝ ඒ වචනය විවරණකරන්නට කල් දන්නාහු වෙති. ඒ කවර හෙයින යත් : රාජකුමාරය, තථාගතයනට සත්ත්වයන් කෙරෙහි අනුකම්පා ඇති හෙයිනි.

වහන්ස, යම් ක්ෂත්‍රිය පණ්ඩිත කෙනෙක් ද බ්‍රාහ්මණ පණ්ඩිත කෙනෙක් ද ගෘහපති පණ්ඩිත කෙනෙක් ද ශ්‍රමණ පණ්ඩිත කෙනෙක් ද ප්‍රශ්න ගොතාගෙන තථාගතයන් කරා එළඹ පුළුවුස්නාහු ද, වහන්ස, යම් කෙනෙක් මා කරා එළඹ මෙසේ පුළුවුස්නාහු නම් ඔවුනට මම මෙසේ පුළුවුස්නා ලද්දෙම් මෙසේ විසඳන්නෙමි'යි භාග්‍යවතුන් විසින් පෙර මැ මෙල කරුණ සිතින් සලකන ලද්දේ වේ ද නොහොත් තැනට උපන් නුවණින් මෙල තථාගතයනට වටහා ද ? යි : රාජකුමාරය, එසේ වී නම් මෙහි ලා තොප මැ පුළුවුස්මි. තොපට යම්සේ හැගේ නම් එ පරිද්දෙන් එය පවසව. රාජකුමාරය, එ කිමැ'යි හඟනාව. තෙපි රථයාගේ අවයවයන් පිළිබඳ වැ නිපුණ වූවහු නො ? යි. එසේ යැ වහන්ස, මම් රථයාගේ අවයව පිළිබඳ වැ නිපුණයෙමි යි. රාජකුමාරය, එ කිමැ'යි හඟනාව. යම් කෙනෙක් තොප කරා එළඹ මෙසේ පුළුවුස්නාහු නම් මේ රථයාගේ කිනම් අවයවයෙක් ද ? යි. යම් කෙනෙක් මා කරා එළඹ මෙසේ පුළුවුස්නාහු නම් ඔවුනට මම් මෙසේ පුළුවුස්නා ලද්දෙම් මෙසේ පවසන්නෙමි'යි තොප විසින් මෙල පෙර මැ සිතින් විමසන ලද වන්නේ ද, නොහොත් මෙල තැනට උපන් නුවණින් මැ එය තොපට වැටහෙන්නේ ද ? යි. වහන්ස, මම් වනාහි ' රථිකයෙකැ ' යි ප්‍රකටයෙමි. රථයාගේ අංගප්‍රත්‍යංග පිළිබඳ වැ නිපුණයෙමි. මා විසින් රථයාගේ සියලු අවයව මොනොවට දන්නා ලද. තැනට උපන් නුවණින් මැ මෙල මට වැටහෙන්නේ යයි.

Free Distribution www.aathaapi.org

එවමෙව ඛො රාජකුමාර යෙ තෙ ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි පඤ්හං අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති. ඨානසොචෙතං තථාගතං පටිභාති. තං කිස්ස හෙතු: සා හි රාජකුමාර තථාගතස්ස ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා ඨානසොචෙතං තථාගතං පටිභාතීති.

එවං වුත්තෙ අභයො රාජකුමාරො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. —පෙ—අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

අභයරාජකුමාරසුත්තං අට්ඨමං.

රාජකුමාරය, එසෙයින් මැ යම් ක්ෂත්‍රිය පණ්ඩිතයෝ ද බ්‍රාහ්මණ පණ්ඩිතයෝ ද ගෘහපති පණ්ඩිතයෝ ද ශ්‍රමණ පණ්ඩිතයෝ ද ප්‍රශ්න ගොතාගෙන තථාගතයන් කරා එළඹ පුළුවුස්නාහු නම් තෙල ස්ථානොත්පත්තිඥානයෙන් මැ තථාගතයනට වටහයි. එ කවර හෙයින යත් : රාජකුමාරය, යම් ධර්ම ධාතුවක් මොනොවට ප්‍රතිවෙධ කළ හෙයින් තෙල එක් ස්ථානොත්පත්තිඥානයෙන් මැ තථාගතයනට වටහා ද තථාගතයන් විසින් ඒ ධර්මස්වභාවය මොනොවට ප්‍රතිවෙධ කරන ලද යි.

මෙසේ වදළ කල්හි අභය රාජකුමාර භාග්‍යවතුන් වහන්සේ ට තෙල කී : ' වහන්ස, ඉතා මැනැවැ ! ' වහන්ස, ඉතා මැනැවැ . . . අද පටන් කොට දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට මා ධරනසේක් ව'යි.

අට වැනි අභයරාජකුමාර සූත්‍රය යි.

---

2. 1. 9

බහුවෙදනිය[1] සුත්තං

එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ බො පඤ්චකඞ්ගො ථපති යෙනායස්මා උදායි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච :

'කති නු බො භන්තෙ උදායි වෙදනා වුත්තා භගවතා'ති. තිස්සො බො ථපති.[2] වෙදනා වුත්තා භගවතා සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා බො ථපති තිස්සො වෙදනා වුත්තා භගවතාති. න බො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා, සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති.

දුතියම්පි බො ආයස්මා උදායි පඤ්චකඞ්ගං ථපතිං එතදවොච: න බො ථපති[2] ද්වෙ වෙදනා වුත්තා භගවතා, තිස්සො වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා බො ථපති, තිස්සො වෙදනා වුත්තා භගවතාති. දුතියම්පි බො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච: නබො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ වෙදනා වුත්තා භගවතා : සුඛා වෙදනා, දුක්ඛා වෙදනා. යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා, සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති.

තතියම්පි බො ආයස්මා උදායි පඤ්චකඞ්ගං ථපතිං එතදවොච: න බො ථපති ද්වෙ වෙදනා වුත්තා භගවතා, තිස්සො වෙදනා වුත්තා භගවතා : සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා, ඉමා බො ථපති, තිස්සො වෙදනා වුත්තා භගවතාති. තතියම්පි බො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච : න බො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා. යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා, සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති. නෙව බො අසක්ඛි ආයස්මා උදායි පඤ්චකඞ්ගං ථපතිං සඤ්ඤාපෙතුං. න පනාසක්ඛි පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං සඤ්ඤාපෙතුං.

අස්සොසි බො ආයස්මා ආනන්දො ආයස්මතො උදායිස්ස පඤ්චකඞ්ගෙන ථපතිනා සද්ධිං ඉමං කථා සල්ලාපං. අථ බො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො ආයස්මා ආනන්දො යාවතකො අහොසි. ආයස්මතො උදායිස්ස පඤ්චකඞ්ගෙන ථපතිනා සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි. එවං වුත්තෙ භගවා ආයස්මන්තං ආනන්දං එතදවොච :

---

1. බහුවෙදනීය – මජසං.   2. ගහපති – ස්‍යා, PTS

Free Distribution www.aathaapi.org

2. 1. 9
බහුවේදනිය සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු සිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක. එකල්හි පඤ්චකඞ්ග නම් වඩුදෙටු ආයුෂ්මත් (පණ්ඩිත) උදයි තෙරුන් කරා එළැඹ වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් පඤ්චකඞ්ග වඩුදෙටු ආයුෂ්මත් උදයි තෙරුන්ට තෙල සැලකළේ :

ආයුෂ්මත් උදයි තෙරණුවෙනි, භාග්‍යවතුන් විසින් කෙතෙක් වේදනා වදරනලද්දහු දැ'යි. ථපතිය, භාග්‍යවතුන් විසින් තුන් වේදනා කෙනෙක් වදරන ලද්දහ : සුඛවේදනා යැ, දුඃඛවේදනා යැ, අදුක්ඛමසුඛවේදනා යි. ථපතිය, භාග්‍යවතුන් විසින් මේ තුන් වේදනා වදරන ලද යි. වහන්ස, උදයි තෙරණුවෙනි, භාග්‍යවතුන් විසින් වේදනා තුනක් නො වදරනලදයැ. භාග්‍යවතුන් විසින් වේදනා දෙකක් වදරන ලද. සුඛවෙදනා යැ, දුක්ඛවේදනා යි. වහන්ස, යම් අදුක්ඛමසුඛවෙදනාවක් ඇද්ද, තෙල භාග්‍යවතුන් විසින් ශාන්ත වූ ප්‍රණීත වූ සුඛයෙහි ලා වදරන ලද්දී යැ.

දෙවනවට ද ආයුෂ්මත් උදයි තෙරණුවෝ පඤ්චකඞ්ග ථපතිහට තෙල කීහ : ථපතිය, භාගවතුන් විසින් වේදනා දෙකක් නො වදරනලද, භාග්‍යවතුන් විසින් තුන් වේදනා කෙනෙක් වදරන ලදහ: සුඛවේදනා යැ, දුකඛවේදනා යැ, අදුකඛමසුඛවෙදනා යි. ථපතිය, භාග්‍යවතුන් විසින් මේ තුන් වෙදනාවෝ වදරනලදහ යි. දෙවනවට ද පඤ්චකංග ථපති ආයුෂ්මත් උද යි තෙරණුවනට තෙල කී : ' වහන්ස, උදයි තෙරණුවෙනි, භාග්‍යවතුන් විසින් වේදනා තුනක් නො වදරනලදයැ. භාග්‍යවතුන් විසින් වේදනා දෙකක් වදරන ලදහ: සුඛවේදනා යැ දුක්ඛවේදනා යි. වහන්ස, යම් අදුක්ඛමසුඛ වේදනාවක් ඇද්ද, තෙල භාග්‍යවතුන් විසින් ශාන්ත වූ ප්‍රණීත වූ සුඛයෙහි ලා වදරන ලද්දී යි.

තෙවනවට ද ආයුෂ්මත් උදයි තෙරණුවෝ පඤ්චකංග ථපතිහට තෙල කීහ : ථපතිය, භාග්‍යවතුන් විසින් වේදනා දෙකක් නො වදරන ලදයැ, භාග්‍යවතුන් විසින් තුන් වේදනා කෙනෙක් වදරනලදහ: සුඛවෙදනා යැ, දුක්ඛවේදනා යැ, අදුක්ඛමසුඛ වේදනා යි. ථපතිය භාග්‍යවතුන් විසින් මේ තුන් වෙදනාවෝ වදරන ලදහ යි. තෙවනවට ද පඤ්චකංග ථපති ආයුෂ්මත් උදයි තෙරණුවනට තෙල කී : වහන්ස, උදයි තෙරණුවෙනි, භාග්‍යවතුන් විසින් වේදනා තුනක් නො වදරන ලදයැ. භාග්‍යවතුන් විසින් වෙදනා දෙකක් වදරන ලදහ: සුඛ වේදනා යැ දුක්ඛවේදනා යි. වහන්ස, යම් අදුක්ඛමසුඛවේදනාවක් ඇද්ද තෙල භාග්‍යවතුන් විසින් ශාන්ත වූ ප්‍රණීත වූ සුඛවේදනායෙහි ලා වදරන ලද්දී යි. ආයුෂ්මත් උදයි තෙරණුවෝ පඤ්චකංග ථපතිහට හඟවාලන්නට නො හැකි වූහ. යළි පඤ්චකංග ථපති ආයුෂ්මත් උදයි තෙරණුවනට හඟවාලන්නට නොහැකි වී.

ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පඤ්චකංග ථපති සමඟ ආයුෂ්මත් උදයි තෙරුන්ගේ මේ කථාසල්ලාපය ඇසූහ. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පඤ්චකංග ථපති සමඟ ආයුෂ්මත් උදයි තෙරුන්ගේ යම් පමණ කථාසල්ලාපයෙක් වීද එ හැම භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. මෙසේ සැලකළ කල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල වදළහ.

සන්තංයෙව ඛො ආනන්ද පරියායං පඤ්චකඞ්ගො ථපති උදායිස්ස නාබ්භනුමොදි. සන්තං යෙව ච පන පරියායං උදායි පඤ්චකඞ්ගස්ස ථපතිස්ස නාබ්භනුමොදි. ද්වෙපානන්ද වෙදනා වුත්තා මයා පරියායෙන, තිස්සොපි වෙදනා වුත්තා මයා පරියායෙන, පඤ්චපි වෙදනා වුත්තා මයා පරියායෙන, ඡපි වෙදනා වුත්තා මයා පරියායෙන. අට්ඨාරසපි වෙදනා වුත්තා මයා පරියායෙන, ඡත්තිංසාපි වෙදනා වුත්තා මයා පරියායෙන, අට්ඨසතම්පි වෙදනා වුත්තා මයා පරියායෙන, එවං පරියාය දෙසිතො ඛො ආනන්ද මයා ධම්මො. එවං පරියායදෙසිතෙ ඛො ආනන්ද මයා ධම්මෙ යෙ අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං න සමනුජානිස්සන්ති, න සමනුමඤ්ඤිස්සන්ති, න සමනුමොදිස්සන්ති, තෙසමෙතං පාටිකඞ්ඛං : භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරිස්සන්ති. එවං පරියාය දෙසිතො ඛො ආනන්ද මයා ධම්මො. එවං පරියාය දෙසිතෙ ඛො ආනන්ද මයා ධම්මෙ යෙ අඤ්ඤ-මඤ්ඤස්ස සුභාසිතං සුලපිතං සමනුජානිස්සන්ති, සමනුමඤ්ඤිස්සන්ති, සමනුමොදිස්සන්ති, තෙසමෙතං පාටිකඞ්ඛං : සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරිස්සන්තීති.

පඤ්ච ඛො ඉමෙ ආනන්ද කාමගුණා, කතමෙ පඤ්ච : චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොත-විඤ්ඤෙය්‍යා සද්දා—පෙ—ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා—පෙ—ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා—පෙ—කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො ආනන්ද පඤ්ච කාමගුණා. යං ඛො ආනන්ද ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං.

යො ඛො ආනන්ද එවං වදෙය්‍ය: එතපරමං සත්තා සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති. ඉදමස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීත තරඤ්ච: ඉධානන්ද භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො අනන්ද එවං වදෙය්‍ය: එතපරමං සත්තා සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදමස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීත-තරඤ්ච: ඉධානන්ද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

ආනන්දය, පඤ්චකංග ථපති උදයි මහණහුගේ විද්‍යමාන වූ මැ පර්‍යායදේශනාව සතුටින් නො පිළිගත්තේ යැ. උදයි මහණ පඤ්චකංග ථපතිහුගේ විද්‍යමාන වූ මැ පර්‍යායදේශනාව සතුටින් නො පිළිගති. ආනන්දය, මා විසින් පර්‍යායවශයෙන් වේදනාවෝ දෙදෙනෙක් ද දෙසන ලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ තුන් දෙනෙක් ද දෙසන ලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ පස් දෙනෙක්ද දෙසන ලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ සදෙනෙක් ද දෙසන ලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ අටළොස් දෙනෙක් ද දෙසන ලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ සතිස් දෙනෙක් ද දෙසනලදහ. මා විසින් පර්‍යායවශයෙන් වෙදනාවෝ එක්සිය අට දෙනෙක් ද දෙසන ලදහ. ආනන්දය, මෙසේ මා විසින් ධර්මය පර්‍යාය දේශිත වෙයි. ආනන්දය, මා විසින් ධර්මය මෙසේ පර්‍යාය දේශිත කල්හි යම් කෙනෙක් උනුන්ගේ සුභාෂිතය මනා වචනය නොඅනුදනිත් ද, මොනොවට නො හගිත් ද, අනුමෙවෙනි නො කෙරෙත් ද ඔවුනට මෙල කැමැති වියැයුතු ' හටගත් භණ්ඩන ඇති වැ හටගත් කලහ ඇති වැ හටගත් විවාද ඇති වැ උනුන් මුවසැතින් විදුනාහු වාස කෙරෙති ' කියා යි. ආනන්දය, මා විසින් ධර්මය මෙසේ පර්‍යායදේශිත වෙයි. ආනන්දය, මා විසින් ධර්මය මෙසේ පර්‍යාය දේශිත කල්හි යම් කෙනෙක් උනුන්ගේ සුභාෂිතය උනුන්ගේ මනා වචනය මොනොවට අනුදනිත් ද මොනොවට හගිත් ද මොනොවට අනුමෙවෙනි කෙරෙත් ද ඔවුනට මෙල කැමැති වියැයුතු : ' සමඟ වැ සම්මොදමාන වැ විවාද රහිත වැ ක්ෂීරොදක වැනි වැ උනුන් ප්‍රිය ඇසින් මොනොවට බලන්නාහු වාස කෙරෙති ' කියා යි.

ආනන්දය, මේ කාමගුණයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රිය ස්වරූප වූ කාමොපසංහිත වූ සිත් ඇලවියැයුතු වූ චක්ෂුර්විඥෙය රූපයෝ යැ...ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දයෝ යැ...ඝ්‍රාණවිඥෙය වූ ගන්ධයෝ යැ...ජිහ්වාවිඥෙය වූ රසයෝ යැ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රිය ස්වරූප වූ කාමොපසංහිත වූ සිත් ඇලවියැ යුතු වූ කායවිඥෙය ස්පර්ශයෝ යි. ආනන්දය, මේ පඤ්චකාමගුණයෝ යි. ආනන්දය, මේ පස්කම්ගුණ පිණිස යම් සුඛයෙක් සෞමනස්‍යයෙක් උපදනේ වේ ද මේ 'කාමසුඛ'යැ යි කියනු ලැබේ.

ආනන්දය, යමෙක් 'සත්ත්වයෝ මෙල පරම කොට සිටුනා සුඛ සෞමනස්‍යය විඳිති'යි මෙසේ බෙණේ ද ඔහුගේ මේ වචනය නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, මෙල සුඛයට වඩා අභිකාන්තතර වූ ද ප්‍රණීතතර වූ ද අන්‍ය සුඛයෙක් ඇත. ආනන්දය, මෙල සුඛයට වඩා අභිකාන්තතර වූ ද ප්‍රණීතතර වූ ද ඒ අන්‍ය සුඛය කවරේ යැ යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයාගෙන වාස කෙරේ. ආනන්දය, මෙල සුඛයට වඩා අභිකාන්තතර වූ ද ප්‍රණීතතර වූ ද ඒ අන්‍ය සුඛය නම් මෙ යැ.

ආනන්දය, යමෙක් මෙසේ බෙණේ ද 'සත්ත්වයෝ මෙල පරම කොට සිටුනා සුඛ-සෞමනස්‍යය විඳිති'යි. ඔහුගේ මෙ බස නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, මෙල සුඛයට වඩා අභිකාන්තතර වූ ද ප්‍රණීතතර වූ ද අන්‍ය සුඛයෙක් ඇත. ආනන්දය, මෙල සුඛයට වඩා අභිකාන්තතර වූ ත් ප්‍රණීතතර වූත් ඒ අන්‍ය සුඛය කවරේ යැ යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ විතර්කවිචාරයන්ගේ සංහිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත පිළිබඳ එකඟ බව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීති සුඛ ඇති ද්විතීයධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මෙ චනාහි මෙල සුඛයට වඩා අභිකාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති. තං[1] තතියං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා ‘අනන්තො ආකාසො’ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම ‘අනන්තං විඤ්ඤාණ’න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම ‘නත්ථි කිඤ්චී’ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද -පෙ- පණීතතරඤ්ච, ඉධානන්ද භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යො ඛො ආනන්ද එවං වදෙය්‍ය: එතපරමං සත්තා සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති ඉදමස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

---

1. තතියජ්ඣානං - සීමු.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙ සස්නෙහි මහණ ප්‍රීති විරාගයෙනුදු උපෙක්ෂක වැ ද සිහි ඇති වැ ද සම්ප්‍රඥාන ඇති වැ ද වාස කෙරෙයි. නාම කයින් සුඛය ද විඳී. ආර්‍ය්‍යයෝ යම් ඒ සුඛයක් ගෙන 'උපෙක්ෂක යැ ස්මෘතිමත් යැ සුඛ විහරණ ඇතියෙකැ'යි කියත් ද ඒ තෘතීයධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මේ සුඛය තෙල සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වේ.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙ සස්නෙහි මහණ සුඛයාගේ ප්‍රහාණයෙනුදු දුඃඛයාගේ ප්‍රහාණයෙනුදු කැල මැ සොමනස් දොම්නසුන්ගේ අස්තඩගමයෙන් අදුඃඛ වූ අසුඛ වූ උපේක්ෂායෙන් ජනිත සිහි පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මේ සුඛය තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥා සමතික්‍රම හෙතුවින් ප්‍රතිඝසංඥා අස්තඩගම හෙතුවින් නානාත්වසංඥා අමනසිකාර හේතුවින් 'ආකාශය අනන්ත යැ' යි ආකාසානඤ්චායතන උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මේ සුඛය තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රමණය කොට 'විඥානය අනන්ත යැ' යි විඤ්ඤාණඤ්චායතනය උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මේ සුඛය තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය සමතික්‍රමණය කොට 'කිසිත් නැති' යි ආකිඤ්චඤ්ඤායතන උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මෙ සුඛය තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද ... ප්‍රණීතතර වූත් (අන්‍ය සුඛයෙක් ඇත.) ආනන්දය, මෙ සස්නෙහි මහණ ආකිඤ්චඤ්ඤායතනය සමතික්‍රමණ කොට නේවසඤ්ඤා නාසඤ්ඤායතන උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මෙ සුඛය තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් සුඛය වෙයි.

ආනන්දය, යමෙක් මෙසේ බණේ ද 'සත්ත්වයෝ තෙල නේවසඤ්ඤානාසඤ්ඤා යතනය සුඛ පරම කොට සුඛසෞමනස්‍ය විඳිති' යි ඔහුගේ මෙ බස නො අනුදන්මි. ඒ කවර හෙයින? ආනන්දය, තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛයෙක් ඇත. ආනන්දය, තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය කවරේ යැ යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සමතික්‍රමණය කොට සඤ්ඤාවෙදයිත නිරොධය උපයා වාස කෙරෙයි. ආනන්දය, මේ සුඛය වනාහි තෙල කී සුඛයට වඩා අභික්‍රාන්තතර වූත් ප්‍රණීතතර වූත් අන්‍ය සුඛය වෙයි.

ඨානං ඛො පනෙතං ආනන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: සඤ්ඤාවෙදයිතනිරොධං සමණො ගොතමො ආහ. තඤ්ච සුඛස්මිං පඤ්ඤපෙති. තයිදං කිංසු, තයිදං කථංසූති. එවං වාදිනො ආනන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: න ඛො ආවුසො භගවා සුඛංයෙව වෙදනං සන්ධාය සුඛස්මිං පඤ්ඤපෙති. අපි චාවුසො යත්ථ යත්ථ සුඛං උපලබ්භති. යහිං යහිං තං තං තථාගතො සුඛස්මිං පඤ්ඤපෙතීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

බහුවෙදනිය[1]සුත්තං නවමං.

---

1. බහු වෙදනීය-මජසං

ආනන්දය, තෙල කරුණෙක් ඇත. යම් හෙයකින් අන්තොටු පිරිවැජියෝ මෙසේ බොණෙත් ද ; 'මහණ ගොයුම් සඤ්ඤාවෙදයිත නිරෝධය කියයි. එ ද සුඛයෙහි ලා පනවයි. ඒ මෙ කරුණ කිම වේ ද? ඒ මේ කරුණ කෙසේ වේ දැ? යි. ආනන්දය, මෙසේ බණනා අන්තොටු පිරිවැජියෝ මෙසේ කියැයුතු වෙති : 'ඇවත්නි, භාග්‍යවතුන් වහන්සේ සුඛවෙදනාවත් සඳහා සුඛයෙහි ලා නො පනවත්. ඇවත්නි, වැළිත් යම් යම් තැනෙක සුඛය ලැබේ ද යම් යම් තැනෙක ඒ ඒ සුඛය වේ ද ඒ ඒ සුඛය තථාගතයන් වහන්සේ නිදුක් සුඛයෙහි ලා පනවති. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

නව වැනි බහුවෙදනීය සූත්‍රයැ යි.

---

2. 1. 10

අපණ්ණක සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන සාලා නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං සාලං[1] අනුප්පත්තො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහා සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සාලෙය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ භගවා එතදවොච: අත්ථි පන වො ගහපතයො කොචි මනාපො සත්ථා යස්මිං වො ආකාරවතී සද්ධා පටිලද්ධාති. නත්ථි ඛො නො භන්තෙ කොචි මනාපො සත්ථා, යස්මිං නො ආකාරවතී සද්ධා පටිලද්ධාති. මනාපං වො ගහපතයො සත්ථාරං අලභන්තෙහි අයං අපණ්ණකො ධම්මො සමාදය වත්තිතබ්බො අපණ්ණකො හි ගහපතයො ධම්මො සමත්තො සමාදින්නො සො වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය.

කතමො ච ගහපතයො අපණ්ණකො ධම්මො: සන්ති ගහපතයො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: නත්ථි දින්නං නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං[2] කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. තෙසංයෙව ඛො ගහපතයො

---

1. සාලා–සීමු.
2. සුකතදුක්කටානං – මජසං

2. 1. 10
අපණ්ණක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි (අතුරිත චාරිකාවෙන්) සැරිසරන සේක. මහත් බික්සඟුන් සමග කොසොල් දනවූ වැසියන්ගේ සාලා නම් බමුණුගම කරා වැඩිසේක. සාලා ගම්වැසි බමුණු ගැහැවියෝ (මෙසේ) ඇසූහු මැ යැ: භවත්නි සැහැකුලයෙන් පැවිදි වූ සැහැකුල පුත් මහණ ගොයුම්හු කොසොල් දනව්වෙහි සැරිසරන සේක් මහත් බික් සඟුන් සමග සාලා බමුණුගමට පැමිණියහ. ඒ භගවත් මහණ ගොයුම්හුගේ මෙසේ කල්‍යාණ වූ කීර්තිශබ්දයෙක් උස් වැ නැඟිණ ; (කෙසේ යැ :) මේ කරුණිනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලෝකවිද්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථී ද යැ, දෙව්මිනිස්නට ශාස්තෘයහ, බුද්ධයහ, භගවත්හ'යි. ඒමහණ ගොයුම්හු දෙවියන් සියො මරුන් සියො බඹුන් සියො මෙලොව තදන්‍ය දෙව්මිනිසුන් සියො ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සත්ත්වාබ්‍යප්‍රජාව තමන් විසින් විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කොට දනිත්. ඔබ ආදි කල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ කේවල පරිපූර්ණ වූ චතුස්සත්‍ය ධර්මය දෙසත්. පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙති'යි කියායි. එබඳු රහතුන්ගේ දර්ශනය මැනැවැ'යි.

එසඳ සාලා ගම්වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. කෙනෙක් භාග්‍ය වතුන් වහන්සේ සමග සතුටු වූහ. සම්මෝදනයට නිසි කාලාන්තරයෙහි සිහි කරනට නිසි කථාව කොට නිමවා එකත්පසෙකැ හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි නමා එකත්පසෙකැ හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි නම්ගොත් අස්වා එකත් පසෙක හුන්හ. කෙනෙක් තුෂ්ණීම්භූත වැ එකත් පසෙකැ හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පසෙකැ හුන් සාලා ගම්වැසි බමුණුගැහැවියනට තෙල වදාළසේක : ගැහැවියෙනි, යම් ශාස්තෘවක්හු කෙරෙහි තොප විසින් ආකාරවත්, (සහෙතුක) ශ්‍රද්ධා ලබන ලද ද එබඳු මනාප වූ යම් මැ ශාස්තෘ කෙනෙක් ඇද්දැ'යි වහන්ස, යම් ශාස්තෘ වක්හු කෙරෙහි අප විසින් ආකාරවත් ශ්‍රද්ධා ලබන ලද ද එබඳු මනවඩන යම් මැ ශාස්තෘ කෙනෙක් අපට නැතැ'යි. ගැහැවියෙනි, මනවඩන ශාස්තෘ කෙනකුන් නො ලබන තොප විසින් මේ අපණ්ණක (අවිරුද්ධ) ධර්මය මොනොවට සමාදන් කොටගෙන පැවැතියැ යුතු යැ. ගැහැවියෙනි, අපණ්ණක ධර්මය මොනොවට ගන්නා ලද්දේ මොනොවට සමාදන් කරන ලද්දේ වේ ද හේ තොපට දීර්ඝරාත්‍රයෙහි හිතසුව පිණිස වේ යයි.

ගැහැවියෙනි, අපණ්ණක දහම කවරේ යැ යත්: ගැහැවියෙනි, මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති මහණ බමුණු කෙනෙක් ඇත: 'දුන් දෑයෙහි විපාක නැත. යාග විපාක නැත. හොමයෙහි විපාක නැත. සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක නැත, මෙලොවෙක් නැත, පරලොවෙක් නැත, මවු නැත, පියා නැත, ඕපපාතික සත් ත්වයෝ නැත. යම් කෙනෙක් මෙලෝ පරලෝ තමන් විසින් විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද, සම්‍යග්ගත සම්‍යක් ප්‍රතිපන්න එබඳු මහණ-බමුණු කෙනෙක් නැත කියා යි. ගැහැවියෙනි,

Free Distribution www.aathaapi.org

සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උජුවිපච්චනීකවාදා, තෙ එවමාහංසු: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකට-දුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරෙ ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. තං කිං මඤ්ඤථ ගහපතයො නනු’මෙ සමණබ්‍රාහ්මණා අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදාති. එවං භන්තෙ.

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරෙ ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණ-බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. තෙසමෙතං පාටිකඞ්ඛං: යමිදං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ තයො කුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, ඉමෙ තයො අකුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති. තං කිස්ස හෙතු: න හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා පස්සන්ති අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සංකිලෙසං. කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං. සන්තංයෙව ඛො පන පරං ලොකං නත්ථි පරෙ ලෙකොතිස්ස දිට්ඨි හොති, සාස්ස හොති මිච්ඡාදිට්ඨි, සන්තං යෙව ඛො පන පරං ලොකං නත්ථි පරෙ ලොකොති සඞ්කප්පෙති, ස්වාස්ස හොති මිච්ඡාසඞ්කප්පො. සන්තංයෙව ඛො පන පරං ලොකං නත්ථි පරෙ ලොකොති වාචං භාසති, සාස්ස හොති මිච්ඡාවාචා. සන්තංයෙව ඛො පන පරං ලොකං නත්ථි පරෙ ලොකොති ආහ. යෙ තෙ අරහන්තො පරලොකවිදුනො තෙසමයං පච්චනීකං කරොති. සන්තංයෙව ඛො පන පරං ලොකං නත්ථි පරෙ ලොකොති පරං සඤ්ඤාපෙති.[1] සාස්ස හොති අසද්ධම්මසඤ්ඤත්ති තාය ච පන අසද්ධම්මසඤ්ඤත්තියා අත්තානුක්කංසෙති. පරං වම්භෙති. ඉති පුබ්බෙව ඛො පනස්ස සුසීල්‍යං පහීනං හොති, දුස්සීල්‍යං පච්චුපට්ඨිතං, අයඤ්ච මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා අරියානං පච්චනීකතා අසද්ධම්මසඤ්ඤත්ති අත්තුක්කංසනා පරවම්භනා. එවංයිමෙ[2] අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති මිච්ඡාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: සචෙ ඛො නත්ථි පරෙ ලොකො එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා සොත්ථිමත්තානං කරිස්සති. සචෙ ඛො අත්ථි පරො ලොකො එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සති. කාමං ඛො පනමාහු: පරො ලොකො හොතු තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. අථ ච පනා’යං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො: දුස්සීලො පුරිසපුග්ගලො මිච්ඡාදිට්ඨි නත්ථිකවාදොති. සචෙ ඛො අත්ථෙව පරො ලොකො, එවං ඉමස්ස භොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කලිග්ගහො: යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සති. එවමස්සා’යං අපණ්ණකො ධම්මො දුස්සමත්තො සමාදින්නො එකංසං ඵරිත්වා තිට්ඨති. රිඤ්චති කුසලං ඨානං.

1. සඤ්ඤාපෙති-සීමු. ස්‍යා. 2. එවමස්සිමෙ-මජ්සං.

ඒ මහණ-බමුණන් අතුරෙන් ඇතැම් මහණ-බමුණු කෙනෙක් ඍජු විරුද්ධවාද ඇත්තාහු ද ඔහු මෙසේ කියත් : දානවිපාක ඇත, යාගවිපාක ඇත, හොමවිපාක ඇත, සුකෘතදුෂ්කෘත කර්‍මයන්ගේ ඵල විපාක ඇත, මෙලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, ඔපපාතික සත්ත්වයෝ ඇත, මෙලෝ පරලෝ තමන් විසින් විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන සම්‍යග්ගත සම්‍යක් ප්‍රතිපන්න මහණ-බමුණෝ ඇත' කියායි. ගැහැවියෙනි, ඒ කෙසේ හඟනාව ? මේ මහණ-බමුණෝ උන්නට ඍජු විරුද්ධවාද ඇත්තාහු නො? වහන්ස එසේ යැ.

ගැහැවියෙනි ,එහිලා මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති යම් මහණ-බමුණු කෙනෙක් ඇද්ද (කෙබඳු වාද යැ යත් :) දානවිපාක නැත, යාගවිපාක නැත, හෝම විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක නැත, මෙලෝ නැත, පරලෝ නැත, මවු නැත, පියා නැත, ඔපපාතික සත්ත්වයෝ නැත, මෙලොව හා පරලොව තමන් විසින් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ-බමුණෝ නැත යන වාද යි. උනට තෙල කැමැති වියයුතු යි: යම් මේ කාය සුචරිතයෙක්, වාක් සුචරිතයෙක් මනඃසුචරිතයෙක් ඇද්ද මෙ තුන් කුසල් දහම් හැරපියා යම් මේ කාය දුශ්චරිතයෙක් වාග්දුශ්චරිතයෙක් මනොදුශ්චරිතයෙක් ඇද්ද මේ තුන් අකුසල් දහම් සමාදාන වශයෙන් ගෙන පවත්නාහ, යනු යි. ඒ කවර හෙයින යත්: ඒ භවත් මහණබමුණෝ අකුශලධර්මයන්ගේ ආදීනව ලමු බව කෙලෙසීම නො දක්නාහ කුශලධර්මයන්ගේ ද අකුශලයෙන් නික්මීමෙහි අනුසස් ද එහි ව්‍යවදාන පක්ෂය ද නො දක්නාහ. විද්‍යමාන වූ මැ පරලොව ගෙන පරලොව නැති'යි ඔහුට දෘෂ්ටියෙක් වෙයි. ඒ දෘෂ්ටිය ඔහුගේ මිථ්‍යාදෘෂ්ටි වෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලොව නැති'යි සංකල්පනා කෙරෙයි. ඒ ඔහුගේ මිථ්‍යා සංකල්පයෙක. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලොව නැති'යි බෙණෙයි. ඒ ඔහුගේ මිථ්‍යාවාචා යැ. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලොව නැති'යි කියා ද (එහෙයින්) පරලොව දන්නා යම් රහත් කෙනෙක් ඇද්ද උනට මෙ තෙම විරුද්ධවාද කෙරෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලොව නැති'යි මෙරමා හඟවා ද,එහෙයින් ඒ මොහුගේ අභූතධර්මසංඥප්ති වෙයි. ඒ අභූත ධර්මසංඥපනයෙන් තමා ඔසොවයි, මෙරමා හෙලා දකී. මෙසේ කැලැ මැ ඔහුගේ සුශීලභාවය ප්‍රහීණ වෙයි, දුශ්ශීලභාවය තුළම සිටියේ වෙයි. මෙ මිථ්‍යාදෘෂ්ටි ද මිථ්‍යාසංකල්ප මිථ්‍යාවාචා ආර්‍යයනට ප්‍රත්‍යනීක හා අභූතධර්ම සංඥපන ආත්මොත්කර්ෂණ පරවම්භන ද යි මෙසේ මොහුට මිථ්‍යාදෘෂ්ටි හෙතුයෙන් මේ අනෙක පාපක අකුශලධර්මයෝ පහළ වෙත්.

ගැහැවියෙනි, එහිලා විඥ පුරුෂ තෙමේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි. ඉදින් පරලොව නැත් නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගල කායභේදයෙන් මතු තමා සවස්ති කෙරෙයි. ඉදින් පරලොව ඇත් නම් මෙසේ මේ පුරුෂ පුද්ගල කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි. පරලෝ වේවයි කීහු නම් ඒ භවත් මහණ බමුණන්ගේ වචන සබා වෙයි. වැළිත් මේ භවත් පුරුෂ පුද්ගල ඉහාත්ම යෙහි මැ ගර්හණීය වෙයි. පුරුෂ පුද්ගල දුශ්ශීල යැ මිථ්‍යාදෘෂ්ටික යැ නාස්තිකවාද ඇතියෙක කියා යි. ඉදින් පරලෝ ඇත්තේ මැ නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගලහට දෙලොව මැ පරාජයග්‍රාහ වෙයි : යම් හෙයෙකින් ඉහාත්මයෙහි මැ විඥයන් විසින් ගර්හණීය වේ ද, යම් හෙයෙකින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණේ ද එහෙයිනි. මෙසේ ඔහු විසින් මේ අපණ්ණක ධර්මය වරදවා ගන්නා ලද්දේ නපුරු කොට ගන්නා ලද්දේ සමාදින්න වූයේ එක් කොටසක් සියවාදය බැසගෙන සිටී. කුසල් කරුණ හැරපිය යි.

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණ-බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. තෙසමෙතං පාටිකඞ්ඛං: යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං ඉමෙ තයො අකුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා යමිදං කායසුචරිතං. වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ තයො කුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති තං කිස්ස හෙතු: පස්සන්ති හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං. සන්තංයෙව ඛො පන පරං ලොකං 'අත්ථි පරො ලොකො' තිස්ස දිට්ඨි හොති. සාස්ස හොති සම්මාදිට්ඨි. සන්තංයෙව ඛො පන පරං ලොකං 'අත්ථි පරො ලොකො'ති සඞ්කප්පෙති, ස්වාස්ස හොති සම්මාසඞ්කප්පො. සන්තංයෙව ඛො පන පරං ලොකං 'අත්ථි පරො ලොකො'ති වාචං භාසති, සාස්ස හොති සම්මාවාචා. සන්තංයෙව ඛො පන පරං ලොකං 'අත්ථි පරො ලොකො'ති ආහ. යෙ තෙ අරහන්තො පරලොකවිදුනො තෙසමයං න පච්චනීකං කරොති. සන්තං-යෙව ඛො පන පරං ලොකං 'අත්ථි පරො ලොකො'ති පරං සඤ්ඤාපෙති, සාස්ස හොති සද්ධම්මසඤ්ඤත්ති. තාය ච පන සද්ධම්මසඤ්ඤත්තියා නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. ඉති පුබ්බෙව ඛො පනස්ස දුස්සීල්‍යං පහීනං හොති. සුසීල්‍යං පච්චුපට්ඨිතං, අයඤ්ච සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා අරියානං අපච්චනීකතා සද්ධම්මසඤ්ඤත්ති. අනත්තුක්කංසනා අපරවම්භනා. එවංසිමෙ[1] අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති සම්මාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති : සචෙ ඛො අත්ථි පරො ලොකො එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති· කාමං ඛො පනමාහු පරො ලොකො, හොතු නෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. අථ ච පනායං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො 'සීලවා පුරිසපුග්ගලො සම්මාදිට්ඨි අත්ථිකවාදො'ති. සචෙ ඛො අත්ථෙව පරො ලොකො, එවං ඉමස්ස හොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කටග්ගහො: යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති. එවමස්සායං අපණ්ණකො ධම්මො සුසමත්තො සමාදින්නො උභයංසං ඵරිත්වා තිට්ඨති· රිඤ්චති අකුසලං ඨානං.

සන්ති ගහපතයො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො: කරොතො[2] කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො[3] සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො[4] අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං

1. එවමස්සිමෙ – මජ්සං.
2. කරතො – සීමු. ස්‍යා.
3. { පාචාපයතො – මජ්සං. පචාපයතො – ස්‍යා.
4. { පාණමතිපාපයතො – සීමු. පාණමතිපාතාපයතො – ස්‍යා.

ගැහැවියෙනි, ඒ දෘෂ්ටි අතර යම් මැ මහණ-බමුණු කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු නම් : 'දානයෙහි විපාක ඇත, යාගයෙහි විපාක ඇත. හොමයෙහි විපාක ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත. මෙලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, මැරී උපදනා සත්ත්වයෝ ඇත, මෙලෝ පරලෝ තමන් විසින් මොනොවට දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන සම්‍යග්ගත සම්‍යක් ප්‍රතිපන්න මහණ-බමුණෝ ඇතැ'යි. ඔවුන් විසින් තෙලෙ කැමැති වියැයුතු : 'යම් කායදුශ්චරිතයෙක් වාග් දුශ්චරිතයෙක් මනොදුශ්චරිතයෙක් ඇද්ද මෙ තුන් අකුසල් දහම් හැරපියා යම් කාය සුචරිතයෙක් වාක්සුචරිතයෙක් මනඃසුචරිතයෙක් ඇද්ද මෙ තුන් කුසල් දහම් සමාදාන වශයෙන් ගෙන වැටෙති' කියා යි. ඒ කවර හෙයින යත් : ඒ භවත් මහණ බමුණෝ අකුශලධර්මයන්ගේ ආදීනවය ලාමක භාවය සංක්ලෙශය, කුශලධර්මයන්ගේ අකුශලයෙන් නික්මීමෙහි ආනිසංසය ව්‍යවදානපක්ෂය දකිත් මැ යි, විද්‍යමාන වූ මැ පරලොව ගෙන පරලෝ ඇති'යි ඔහට දෘෂ්ටි වෙයි. ඒ දෘෂ්ටිය ඔහට සම්‍යග්දෘෂ්ටි වෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලෝ ඇති' යි සංකල්පනා කෙරෙයි. ඒ ඔහට සම්‍යක් සංකල්ප වෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලෝ ඇති' යි බස් බෙණෙ ද ඒ බස ඔහට සම්‍යග් වාචා වෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන 'පරලෝ ඇති'යි කියා ද පරලොව දන්නා යම් රහත් කෙනෙක් ඇත් නම් ඔවුනට මෙ තෙම විරුද්ධවාද නො කෙරෙයි. විද්‍යමාන වූ මැ පරලොව ගෙන මෙරමා හඟවා ද ඒ සංඥප්තිය ඔහට භූතධර්ම සංඥපනා වෙයි. ඒ භූතධර්මසංඥපනායෙන් තමා මැ හුවයි. මෙරමා නො හෙළයි. මෙසේ කැලැ මැ ඔහුගේ දුශ්ශීලභාවය ප්‍රහීණ වෙයි. සුශීලභාවය එළැඹ සිටියේ වෙයි. මේ සම්‍යග්දෘෂ්ටිය සම්‍යක් සංකල්පය සම්‍යග් වචනය ආර්‍ය්‍යයන්ගේ අපච්චනීකතා සංඛ්‍යාත භූතධර්ම සංඥප්ති වෙයි, ආත්මොත්කර්ෂණා නො වෙයි, පරවම්භනා නො වෙයි, මෙසේ ඔහට සම්‍යග්දෘෂ්ටී හේතුයෙන් මේ අනේක කුශල ධර්මයෝ පහළ වෙත්.

ගැහැවියෙනි, ඒ ලබ්ධීන් අතුරෙහි ලා විඥ පුරුෂ මෙසෙ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි. ඉදින් පරලෝ ඇත් නම් මෙසේ මේ භවත් පුරුෂපුද්ගල කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට එළැඹෙයි, පරලොව වේවයි කියත් නම් ඒ භවත් මහණ බමුණන්ගේ වචන සබා වෙයි. තවද මේ භවත් පුරුෂ පුද්ගල විඥයන් විසින් පැසැසියැයුතු වෙයි : සිල්වත් පුරුෂ පුද්ගලයෙක, සම්‍යග් දෘෂ්ටිකයෙක, ඉදින් පරලෝ ඇත්තේ මැ වේ නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගලයාහට දෙලොව මැ ජයග්‍රාහ වෙයි. යම් හෙයෙකින් මෙලොව මැ විඥයන් විසින් පැසැසියැයුතු වේ ද, යම් හෙයෙකින් කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලෝකයට පැමිණේ ද එහෙයිනි. මෙසේ ඔහු විසින් මේ අවිරුද්ධ ධර්මය මොනොවට ගන්නා ලද්දේ මොනොවට සමාදන් කෙළේ (සකවාද පරවාද සංඛ්‍යාත) උභයාන්තය බැසගෙන සිටුනේ යැ අකුශල ස්ථානය හරනේ යි.

ගැහැවියෙනි, මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත : "(සියතින්) කරන්නාහට මෙරමා ලවා කරවන්නාහට මෙරමාගේ අත්පා ආදිය සිඳින් නාහට සිඳුවන්නාහට දඬින් පෙළන්නාහට පෙළවන්නාහට ශොක කරන්නාහට ශෝක කරවන්නාහට ක්ලාන්ත කරන්නාහට ක්ලාන්ත කරවන්නාහට කම්පන කරන්නාහට කම්පන කරවන්නාහට ප්‍රාණවධ කරන්නාහට කරවන්නාහට අයිනාදන් කරන්නාහට ගෘහසන්ධි සිඳුනාහට මහාවිලොප කරන්නාහට එකාගාරික (එක් ගෙයක් වොලොගන්නා) කම් කරන්නාහට කඩපලා සොරකම් කරන්නාහට වීරඟුසොරකම් කරන්නාහට මුසවා

Free Distribution www.aathaapi.org

ගච්ඡතො මුසා භණතො, කරොතො න කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා[1] පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය. නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො. නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො, උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො.[2] නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො. දානෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමොති. තෙසංයෙව ඛො ගහපතයො සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උජුවිපච්චනීකවාදා. තෙ එවමාහංසු: කරොතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො. කරොතො කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, අත්ථි තතො නිදානං පාපං, අත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො, අත්ථි තතො නිදානං පාපං, අත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො. අත්ථි තතො නිදානං පුඤ්ඤං, අත්ථි පුඤ්ඤස්ස ආගමො. දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන.[3] අත්ථි පුඤ්ඤං, අත්ථි පුඤ්ඤස්ස ආගමොති. තං කිම්මඤ්ඤථ ගහපතයො: නනුමෙ සමණබ්‍රාහ්මණා අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදාති. එවං භන්තෙ.

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: කරොතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො. කරොතො න කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො, දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය, දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො. දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමොති. තෙසමෙතං පාටිකඞ්ඛං: යමිදං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ තයො කුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං

1. පඨවියා - මජසං.
2. යාජාපෙන්තො - මජසං. ස්‍යා.
3. සච්චවාචෙන - මජසං

බණනුවහට පාපයෙක් නැත 'පව් කරමි' යන සංඥ ඇති වැ කරන්නාහට ද පව් නො කෙරෙයි. ඉදින් යමෙක් කර බඳු නිම්වළලු ඇති චක්‍රයෙකින් මෙ පොළෝතෙලෙහි ප්‍රාණීන් එක් මස්රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නේ නමුදු එ හෙතුවින් පාපයෙක් නැත. පාපයාගේ ඊමෙක් නැත. ඉදින් මරමින් මරවමින් අත්පාආදිය සිදිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් ගඞ්ගායෙහි දකුණුතෙරට යේ නම් ඒ හේතුවින් පාපයෙක් නැත. පාපයාගේ ඊමෙක් නැත. ඉදින් දන් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් ගඞ්ගායෙහි උතුරු තෙරට යේ නම් එ හේතුවින් පුණ්‍යයෙක් නැත පුණ්‍යයාගේ ඊමෙක් නැත. දානයෙන් ඉන්ද්‍රියදමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පුණ්‍යයෙක් නැත. පුණ්‍යයාගේ ඊමෙක් නැත. ගැහැවියෙනි, ඒ මහණබමුණන් අතුරෙහි මැ ඇතැම් මහණ බමුණු කෙනෙක් සෘජු විරුද්ධවාද ඇත්තාහ. ඔහු මෙසේ කීහ : කරන්නාහට කරවන්නාහට අත්පා ආදිය සිදින්නාට සිඳුවන්නාට පෙළන්නාට පෙළවන්නාට ශෝක කරන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට ක්ලාන්ත කරවන්නාට කම්පන කරන්නාට කම්පන කරවන්නාට ප්‍රාණවධ කරන්නාට අයිනාදන් කරන්නාට ගෘහසන්ධි සිදින්නාට මහාවිලොප කරන්නාට එකාගාරිකකම් කරන්නාට කඩපලාසොරකම්හි සිටුනාහට වීරඹුසොරකම් කරන්නාට මුසවා කියන්නාට පව් ඇත. කරන්නාට පව් කෙරෙයි. ඉදින් යමෙක් කර බඳු නිම්වළලු ඇති චක්‍රයෙකින් මෙ පොළෝතෙලෙහි ප්‍රාණීන් එක් මස්රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නේ නම් එ හෙතුවින් පව් ඇත. පාපයාගේ ඊමෙක් ඇත. ඉදින් ප්‍රාණීන් නසමින් නස්වමින් අත්පා ආදිය සිදිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් ගඞ්ගායෙහි දකුණුතෙරට යේ නම් එ හේතුවින් පව් ඇත. පාපයාගේ ඊමෙක් ඇත. ඉදින් දන් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් ගඞ්ගායෙහි උතුරුතෙරට යේ නම් එ හේතුවින් පින් ඇත. පුණ්‍යාගම ඇත. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පින් ඇත. පුණ්‍යාගම ඇතැ'යි. ගැහැවියෙනි, ඒ කිමැ'යි හඟනාව? මෙ මහණබමුණෝ උනුනට සෘජුවිරුද්ධවාද ඇත්තාහු නො ? යි. එසේ යැ වහන්ස.

ගැහැවියෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද : '' කරන්නාට කරවන්නාට (අත්පා ආදිය) සිදින්නාට සිඳුවන්නාට පෙළන්නාට පෙළවන්නාට ශෝක කරන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට ක්ලාන්ත කරවන්නාට කම්පන කරන්නාට කම්පන කරවන්නාට ප්‍රාණවධ කරන්නාට කරවන්නාට අයිනාදන් කරන්නාට කරවන්නාට ගෘහසන්ධි සිදින්නාට මහාවිලොප කරන්නාට ඒකාගාරික කම් කරන්නාට කඩපලාසොරකම්හි සිටුනාහට පරඹුවන් කරා යන්නාට මුසවා බණන්නාට පව් නැත. කරන්නාට පව් නො කෙරෙයි. ඉදින් යමෙක් කර බඳු නිම්වළලු ඇති චක්‍රයෙකින් මෙ පොළෝතෙලෙහි ප්‍රාණීන් එක් මස්රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නේ නමුදු එ හේතුවින් පව් නැත. පාපාගමයෙක් නැත. ඉදින් ප්‍රාණවධ කරමින් කරවමින් අත්පා සිදිමින් සිඳුවමින් (දඩින්) පෙළෙමින් පෙළවමින් ගඞ්ගායෙහි දකුණුතෙරට යන්නේ නමුදු එ හේතුවින් පව් නැත. පාපාගම නැත. ඉදින් දන් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් එ ගඞ්ගායෙහි උතුරුතෙරට යන්නේ නමුදු එ හේතුවින් පින් නැත. පුණ්‍යාගම නැත. දානයෙන් ඉන්ද්‍රියදමනයෙන් ශීල සංයමයෙන් සත්‍යවචනයෙන් පින් නැත. පුණ්‍යාගම නැතැ'යි. ඔවුන් විසින් තෙල කැමැති වියැයුතු : '' යම් කායසුචරිතයෙක් වාක්සුචරිතයෙක් මනඃසුචරිතයෙක් ඇද්ද, මෙ තුන් කුශලධර්මයන් තබා යම් කායදුශ්චරිතයෙක් වාග්දුශ්චරිතයෙක් මනො

මනොදුච්චරිතං, ඉමෙ තයො අකුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති. තං කිස්ස හෙතු: න හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා පස්සන්ති අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං. කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං. සන්තංයෙව ඛො පන කිරියං 'නත්ථි කිරියා'තිස්ස දිට්ඨි හොති. සාස්ස හොති මිච්ඡාදිට්ඨි. සන්තංයෙව ඛො පන කිරියං නත්ථි කිරියා'ති සඞ්කප්පෙති, ස්වාස්ස හොති මිච්ඡා සඞ්කප්පො. සන්තංයෙව ඛො පන කිරියං 'නත්ථි කිරියා'ති වාචං භාසති, සාස්ස හොති මිච්ඡාවාචා. සන්තං යෙව ඛො පන කිරියං 'නත්ථි කිරියා'ති ආහ. යෙ තෙ අරහන්තො කිරියවාදා තෙසමයං පච්චනීකං කරොති. සන්තංයෙව ඛො පන කිරියං නත්ථි කිරියාති පරං සඤ්ඤාපෙති. සාස්ස හොති අසද්ධම්මසඤ්ඤත්ති. තාය ච පන අසද්ධම්මසඤ්ඤත්තියා අත්තානුක්කංසෙති. පරං වම්භෙති. ඉති පුබ්බෙ ඛො පනස්ස සුසීල්‍යං පහීනං හොති, දුස්සීල්‍යං පච්චුපට්ඨිතං. අයඤ්ච මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා අරියානං පච්චනීකතා අසද්ධම්මසඤ්ඤත්ති අත්තුක්කංසනා පරවම්භනා එවංසිමෙ අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති මිච්ඡාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: සචෙ ඛො නත්ථි කිරියා. එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා සොත්ථිමත්තානං කරිස්සති. සචෙ සො අත්ථි කිරියා. එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සති. කාමං ඛො පනමාහු කිරියා හොතු නෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං, අථ ච පනායං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො, දුස්සීලො පුරිසපුග්ගලො මිච්ඡාදිට්ඨි අකිරියවාදොති. සචෙ ඛො අත්ථෙව කිරියා. එවං ඉමස්ස භොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කලිග්ගහො, යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සති. එවමස්සායං අපණ්ණකො ධම්මො දුස්සමත්තො සමාදින්නො එකංසං ඵරිත්වා තිට්ඨති. රිඤ්චති කුසලං ඨානං.

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො: කරොතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරොතො කරීයති පාපං. ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය. නත්ථි තතො නිදානං පාපං නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො. දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමොති. තෙසමෙතං

දුශ්චරිතයෙක් ඇද්ද, මෙ තුන් අකුශලධර්මයන් සමාදන වශයෙන් ගෙන වැටෙති' යි කියා යි. කවර හෙයින යත් : භවත් මහණබමුණෝ අකුශලධර්මයන්ගේ ආදීනවය ලමු බව කෙලෙසීම නො දක්නාහ. කුශල ධර්මයන්ගේ අනුසස්ද අකුශලයෙන් නිෂ්ක්‍රමණයෙහි අනුසස් ද ව්‍යවදන පක්ෂය ද, නො දක්නාහ. එහෙයිනි. ඇත්තා වූ ම ක්‍රියාව ' ක්‍රියා නැති ' යි ඔහුට දෘෂ්ටි වෙයි. ඔහුගේ එ දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි වෙයි. ඇත්තා වූ මැ ක්‍රියා ' ක්‍රියා නැති'යි සංකල්පනා කෙරෙයි. හේ ඔහුට මිථ්‍යාසංකල්ප වෙයි. ඇත්තා වූ මැ ක්‍රියාව ' ක්‍රියා නැති'යි තෙපුල් බෙණෙයි. ඒ ඔහුට මිථ්‍යාවාචා වෙයි. ඇත්තාවූ මැ ක්‍රියාව ' ක්‍රියා නැති'යි කියයි. යම් රහත් කෙනෙක් ක්‍රියාවාද ඇති වෙත් ද ඔවුනට මෙ තෙම විරුද්ධකම් කෙරෙයි. ඇත්තා වූ මැ ක්‍රියාව ' ක්‍රියා නැති'යි මෙරමා ලවා හභවයි. හේ, මොහුගේ අසද්ධර්මසංඥප්ති වෙයි. එ අසද්ධර්මසංඥප්තියෙන් තමා හුවයි. මෙරමා හෙළයි. මෙසේ කැලැ මැ ඔහුගේ සුශීලභාවය ප්‍රහීණ වෙයි. දුශ්ශීලභාවය එළඹයිටියේ වෙයි. මෙ මිථ්‍යාදෘෂ්ටිය ද මිථ්‍යාසංකල්පය ද මිථ්‍යාවාචා ද ආර්‍යයනට ප්‍රත්‍යනීක බව ද අසද්ධර්මසංඥප්ති ය ද ආත්මොත්කර්ෂණය ද පරවම්භනාව ද යි මේ අනෙක පාපධර්මයෝ මිථ්‍යාදෘෂ්ටි හෙතුයෙන් ඔහුට පහළ වෙති.

ගැහැවියෙනි, එහි ලා විඥ පුරුෂ මෙසේ සලකයි : ඉදින් ක්‍රියා නැත් නම් මෙසේ මෙ භවත් පුරුෂ පුද්ගල කාබුන් මරණින් මතු තමා ස්වස්ථ කෙරෙයි. ඉදින් ක්‍රියා ඇත් නම් මෙසේ මෙ භවත් පුරුෂ පුද්ගල කාබුන් මරණින් මතු සැපයෙන්පහ වූ නපුරුගති ඇති නිරයට පැමිණෙයි. ක්‍රියාව නො වූයේ නමුදු එ භවත් මහණ බමුණන්ගේ වචන සත්‍ය හෝ වේවා වැළිත් මේ භවත් පුරුෂ පුද්ගල ඉභාත්මයෙහි මැ විඥයන් විසින් ගැරැහියැයුතු වෙයි. ' පුරුෂ පුද්ගල දුශ්ශීල යැ මිථ්‍යාදෘෂ්ටික යැ අක්‍රියවාද ඇතියෙකැ යි කියා යි. ඉදින් ක්‍රියා ඇත් නම් මෙසේ මෙ භවත් පුරුෂ පුද්ගලයාහට මෙලෝ පරලෝ දෙක්හි මැ පරාජයග්‍රාහය වෙයි. යම් හෙයෙකින් ඉභාත්මයෙහි මැ විඥයන් විසින් ගැරැහියැ යුතු වේ ද යම් හෙයෙකින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණියේ ද, එහෙයිනි. මෙසේ මොහු විසින් මෙ අපණ්ණක ධර්මය වරදවා ගන්නා ලද්දේ සමාදන වශයෙන් ගන්නා ලද්දේ එක් කොටසක් පැතිරැ ගෙන සිටී. කුශලය හැර පියයි.

ගැහැවියෙනි, ඔවුනතුරෙහි යම් මහණ බමුණු කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු ද, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද : " (ප්‍රාණඝාතාදිය) කරන්නාට කරවන්නාට (අත්පා ආදිය) සිඳින්නාට සිඳුවන්නාට පෙළන්නාට පෙළවන්නාට ශෝක කරන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට ක්ලාන්ත කරවන්නාට කම්පන කරන්නාට කම්පන කරවන්නාට ප්‍රාණවධ කරන්නාට කරවන්නාට අයිනාදන් කරන්නාට කරවන්නාට ගෘහසන්ධි සිඳින්නාට සිඳුවන්නාට මහාවිලෝප කරන්නාට කරවන්නාට ඒකාගාරික කම් කරන්නාට කරවන්නාට කඩපලාසොරකම්හි සිටුනාහට පරඹුවන් කරා යන්නාට මුසවා බණන්නාට පව් ඇත. කරන්නාට පව් කෙරෙයි. ඉදින් යමෙක් කර බඳු නිම්වළලු ඇති චක්‍රයෙකින් මෙ පොළෝතෙලෙහි ප්‍රාණින් එක් මස් රැසක් එක් මාංසපුඤ්ජයක් කරන්නේ නම් එ හෙතුවින් පව් ඇත. පාපාගම ඇත. ඉදින් මරමින් මරවමින් (අත්පා ආදිය) සිඳිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් ගඩ්ගායෙහි දකුණු තෙරට යේ නම් එ හේතුවින් පව් ඇත. පාපාගම ඇත. ඉදින් (දන්) දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් ගඩ්ගායෙහි උතුරු තෙරට යේ නම් ඒ හේතුවින් පින් ඇත. පුණ්‍යාගම ඇත. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමෙන් සත්‍යවචනයෙන් පින් ඇත. පුණ්‍යාගම ඇතැ " යි. ඔවුනට

පාටිකඞ්ඛං: යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, ඉමෙ තයො අකුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා යමිදං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ තයො කුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති. තං කිස්ස හෙතු: පස්සන්ති හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං. කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං. සන්තංයෙව ඛො පන කිරියං ‘අත්ථි කිරියා’තිස්ස දිට්ඨි හොති. සාස්ස හොති සම්මාදිට්ඨි. සන්තංයෙව ඛො පන කිරියං ‘අත්ථි කිරියා’ති සඞ්කප්පෙති. ස්වාස්ස හොති සම්මාසඞ්කප්පො. සන්තංයෙව ඛො පන කිරියං ‘අත්ථි කිරියා’ති වාචං භාසති. සාස්ස හොති සම්මාවාචා. සන්තංයෙව ඛො පන කිරියං ‘අත්ථි කිරියා’ති ආහ. යෙ තෙ අරහන්තො කිරියවාදා තෙසමයං න පච්චනීකං කරොති. සන්තං යෙව ඛො පන කිරියං ‘අත්ථි කිරියා’ති පරං සඤ්ඤාපෙති. සාස්ස හොති සද්ධම්මසඤ්ඤත්ති. තාය ච පන සද්ධම්මසඤ්ඤත්තියා නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. ඉති පුබ්බෙව ඛො පනස්ස දුස්සීල්‍යං පහීනං හොති. සුසීල්‍යං පච්චුපට්ඨිතං. අයඤ්ච සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා අරියානං අපච්චනීකතා සද්ධම්මසඤ්ඤත්ති අනත්තුක්කංසනා අපරවම්භනා. එවංසිමෙ අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති සම්මාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති. සචෙ ඛො අත්ථි කිරියා, එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති. කාමං ඛො පනමාහු කිරියා, හොතු නෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. අථ ච පනා’යං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො සීලවා පුරිසපුග්ගලො සම්මාදිට්ඨි කිරියවාදොති. සචෙ ඛො අත්ථෙව කිරියා, එවං ඉමස්ස භොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කටග්ගාහො, යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති. එවමස්සායං අපණ්ණකො ධම්මො සුසමත්තො සමාදින්නො උභයංසං ඵරිත්වා තිට්ඨති. රිඤ්චති අකුසලං ඨානං.

සන්ති ගහපතයො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සඞ්කිලෙසාය, අහෙතු අප්පච්චයා සත්තා සඞ්කිලිස්සන්ති නත්ථි හෙතු, නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසථාමො නත්ථි පුරිසපරක්කමො. සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා නියති සඞ්ගතිභාවපරිණතා[1] ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තීති. තෙසං යෙව ඛො ගහපතයො සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උජුවිපච්චනීකවාදා, තෙ එවමාහංසු: අත්ථි හෙතු අත්ථි පච්චයො සත්තානං සඞ්කිලෙසාය, සහෙතු සප්පච්චයා සත්තා සඞ්කිලිස්සන්ති. අත්ථි පච්ච-යො සත්තානං විසුද්ධියා. සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. අත්ථි බලං අත්ථි විරියං අත්ථි පුරිසථාමො අත්ථි පුරිසපරක්කමො, න සබ්බෙ[2] සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා[3] නියතිසඞ්ගතිභාවපරිණතා ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසං-වෙදෙන්තීති. තං කිං මඤ්ඤථ ගහපතයො: නනුමෙ සමණබ්‍රාහ්මණා අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදාති. එවං භන්තෙ.

---

1. නියතිසඞ්ගති සභාවපරිනතා - සීමු
2. සබ්බෙ - ස්‍යා
3. { සවසා සබලා සවිරියා - ස්‍යා / අවිරියා - මජ්සං }

තෙල කැමැති වියයුතු : යම් කායදුශ්චරිතයෙක් වාග්දුශ්චරිතයෙක් මනෝදුශ්චරිතයෙක් ඇද්ද මෙ තුන් අකුශලධර්මයන් හැරපියා යම් කායසුචරිතයෙක් වාක්සුචරිතයෙක් මනඃසුචරිතයෙක් ඇද්ද මෙ තුන් කුශලධර්මයන් සමාදන් වැ වැටෙති' යි කියා යි. එ කවර හෙයින යත් : එ භවත් මහණබමුණෝ අකුශලධර්මයන්ගේ ආදීනාවය ලමුබව කෙලෙසීම දක්නාහ. කුශලධර්මයන්ගේ අනුසස් ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද ව්‍යවදාන (විශුද්ධි) පක්ෂය ද දක්නාහ. එහෙයිනි. ඇත්තා වූ මැ ක්‍රියාව 'ක්‍රියා ඇති' යි ඔහුට දෘෂ්ටි වෙයි. එ ඔහුගේ සම්‍යග් දෘෂ්ටි වෙයි, ඇත්තා වූ මැ ක්‍රියාව 'ක්‍රියා ඇති'යි සංකල්පනා කෙරෙයි. එ ඔහුගේ සම්‍යක්සංකල්ප වෙයි. ඇත්තා වූ මැ ක්‍රියාව 'ක්‍රියා ඇති' යි තෙපුල් බෙණෙයි. එ ඔහුගේ සම්‍යග්වචන වෙයි. ඇත්තා වූ මැ ක්‍රියාව 'ක්‍රියා ඇති'යි කියයි. යම් රහත් කෙනෙක් ක්‍රියාවාද ඇති වෙත් ද ඔවුනට මෙ පුද්ගල විරුද්ධ කම් නො කෙරෙයි. ඇත්තා වූ මැ ක්‍රියාව 'ක්‍රියා ඇති' යි මෙරමා ලවා හඟවයි. එ ඔහුගේ සද්ධර්මසංඥප්ති වෙයි. එ සද්ධර්මසංඥප්තියෙනුදු තමා නො හුවයි. මෙරමා නො හෙළයි. මෙසෙයින් කැලැ මැ ඔහුගේ දුසිල්බව ප්‍රහීණ වෙයි. සුසිල් බව එළඹසිටියේ වෙයි. මෙ සම්‍යග්දෘෂ්ටි ද සම්‍යක්සංකල්ප ද සම්‍යග්වචන ද ආර්‍යයනට අවිරුද්ධභාවය ද සද්ධර්මසංඥප්ති ද ආත්මොත්කර්ෂණ රහිත බව ද පරවම්භනා රහිත බව ද යි මෙසේ මේ අනෙක කුශල ධර්මයෝ සම්‍යග්දෘෂ්ටි හෙතුයෙන් ඔහුට පහළ වෙත්.

ගැහැවියෙනි, එහි ලා විඥ පුරුෂ මෙසේ සලකයි : ඉදින් ක්‍රියා ඇත් නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගල කාබුන් මරණින් මතු සුන්දරගති ඇති ස්වර්ගලෝකයට උපපත්ති විසින් පැමිණෙන්නේ යැ. එකත්තෙන් ක්‍රියා නො වේවා. ඒ භවත් මහණ බමුණන්ගේ වචන සත්‍ය වේවා. එතෙකුදු වත් මෙ භවත් පුරුෂපුද්ගල මෙ අත්බැව්හි මැ සිල්වත් පුරුෂපුද්ගලයෙකැ සම්‍යග්දෘෂ්ටි ඇතියෙකැ ක්‍රියාවාද ඇතියෙකැ'යි නුවණැතියන් ගේ පැසැසුමට නිසි වෙයි. ඉදින් ක්‍රියා ඇත්තේ මැ වී නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගලහට දෙලොව්හි මැ ජයග්‍රාහ වෙයි : 'මෙලෙව්හි මැ නුවණැතියන්ගේ පැසැසුමට නිසි වෙයි' යන යමෙකුත් ඇද්ද, කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙන්නේ යැ' යන යමෙකුත් ඇද්ද එ දෙකයි. මෙසේ ඔහුගේ මෙ අපණ්ණකධර්මය ගන්නා ලද්දේ සමාදන් කරන ලද්දේ (සකවාද යැ පරවාද යැ යන) උභයාන්තය පැතිරගෙන සිටියි. අකුශල කාරණ හැරපියයි.

ගැහැවියෙනි, මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇත: ''සත්ත්ව යන්ගේ සංක්ලේශයට (කෙලෙසීමට) හේතු නැත, ප්‍රත්‍යය නැත. අහේතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සත්ත්වයන්ගේ විශුද්ධියට හෙතු නැත, ප්‍රත්‍යය නැත, අහේතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ විශුද්ධ වෙති. බලයෙක් නැත, වීර්‍යයෙක් නැත, පුරුෂථාමයෙක් නැත පුරුෂපරාක්‍රමයෙක් නැත, හැම සත්හු හැම (එකින්ද්‍රියාදි) ප්‍රාණීහු හැම (අණ්ඩකෝෂ වස්තිකෝෂගත) භූතයෝ හැම ජීවයෝ අවස වූවාහු අබල වූවාහු වීර්‍ය නැත්තාහු නියතියෙන් සඞගතියෙන් ස්වභාවයෙන් පරිණාමයට පැමිණියාහු අභිජාති සයෙකැ මැ සිට සුවදුක් විඳුති'' යි. ගැහැවියෙනි, එ මහණබමුණන් අතුරෙහි මැ ඇතැම් මහණබමුණෝ ඍජු විරුද්ධවාද ඇත්තාහ. ඔහු මෙසේ කීහු : ''සත්ත්වයන්ගේ සංකෙලශයට හේතු ඇත, ප්‍රත්‍යය ඇත. හේතු ප්‍රත්‍යය ඇති වැ සත්ත්වයෝ කෙලෙසෙති. සත්ත්වයන්ගේ විශුද්ධියට හේතු ඇත, ප්‍රත්‍යය ඇත. හේතු ප්‍රත්‍යය ඇති වැ සත්ත්වයෝ විශුද්ධ වෙති. බල ඇත, වීර්‍යය ඇත, පුරුෂ ස්ථාම ඇත, පුරුෂපරාක්‍රම ඇති. හැම සත්හු හැම ප්‍රාණීහු හැම භූතයෝ හැම ජීවයෝ අවස වූවාහු අබල වූවාහු වීර්‍ය නැතියාහු නියතියෙන් සඞගතියෙන් ස්වභාවයෙන් පරිණාමයට පැමිණියාහු අභිජාති සයෙකැ මැ සුවදුක් විඳුනාහු නො වෙති යි. ගැහැවියෙනි, ඒ කිමැයි හඟනාව : මෙ මහණ බමුණෝ උනුනට ඍජු විරුද්ධවාද ඇත්තාහු නො ? යි. එසේ යැ වහන්ස.

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො: නත්ථි හෙතු නත්ථි පච්චයො-පෙ-සුඛදුක්ඛං පටිසංවෙදෙන්තීති. තෙසමෙතං පාටිකඞ්ඛං: යමිදං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං ඉමෙ තයො කුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. ඉමෙ තයො අකුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති. තං කිස්ස හෙතු: න හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා පස්සන්ති අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සංකිලෙසං කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං. සන්තංයෙව ඛො පන හෙතු නත්ථි හෙතූ'තිස්ස දිට්ඨි හොති. සාස්ස හොති මිච්ඡාදිට්ඨි. සන්තං යෙව ඛො පන හෙතු නත්ථි හෙතූ'ති සඞ්කප්පෙති. ස්වාස්ස හොති මිච්ඡාසඞ්කප්පො. සන්තංයෙව ඛො පන හෙතු නත්ථි හෙතූ'ති වාචං භාසති. සාස්ස හොති මිච්ඡාවාචා. සන්තං යෙව ඛො පන හෙතු නත්ථි හෙතූ'ති ආහ. යෙ තෙ අරහන්තො හෙතුවාදා තෙසමයං පච්චනීකං කරොති. සන්තංයෙව ඛො පන හෙතු නත්ථි හෙතූ'ති පරං සඤ්ඤාපෙති. සාස්ස හොති අසද්ධම්මසඤ්ඤත්ති. තාය ච පන අසද්ධම්මසඤ්ඤත්තියා අත්තානුක්කංසෙති. පරං වම්භෙති. ඉති පුබ්බෙ ව ඛො පනස්ස සුසීල්‍යං පහීනං හොති, දුස්සීල්‍යං පච්චුපට්ඨිතං. අයඤ්ච මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා අරියානං පච්චනීකතා අසද්ධම්මසඤ්ඤත්ති අත්තුක්කංසනා පරවම්භනා: එවංසිමෙ අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති මිච්ඡාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූපුරිසො ඉති පටිසඤ්චික්ඛති: සචෙ ඛො නත්ථි හෙතු; එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා සොත්ථිමත්තානං කරිස්සති, සචෙ ඛො අත්ථි හෙතු, එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සති. කාමං ඛො පන මාහු හෙතු. හොතු නෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. අථ ච පනායං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො දුස්සීලො පුරිසපුග්ගලො මිච්ඡාදිට්ඨි අහෙතුවාදො'ති[1] සචෙ ඛො අත්ථෙව හෙතු. එවං ඉමස්ස භොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කලිග්ගහො: යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං ගාරය්හො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං. විනිපාතං නිරයං උපපජ්ජිස්සති. එවමස්සා'යං අපණ්ණකො ධම්මො දුස්සමත්තො සමාදින්නො එකංසං ඵරිත්වා තිට්ඨති. රිඤ්චති කුසලං ඨානං.[2]

තත්‍ර ගහපතයො යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවං දිට්ඨිනො: අත්ථි හෙතු අත්ථි පච්චයො-පෙ-සුඛදුක්ඛං පටිසංවෙදෙන්තීති. තෙසමෙතං පාටිකඞ්ඛං: යමිදං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, ඉමෙ තයො අකුසලෙ ධම්මෙ අභිනිවජ්ජෙත්වා. යමිදං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, ඉමෙ තයො කුසලෙ ධම්මෙ සමාදාය වත්තිස්සන්ති තං කිස්ස හෙතු: පස්සන්ති හි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අකුසලානං ධම්මානං ආදීනවං ඔකාරං සංකිලෙසං, කුසලානං ධම්මානං නෙක්ඛම්මෙ ආනිසංසං වොදානපක්ඛං සන්තංයෙව ඛො පන හෙතු අත්ථි හෙතූතිස්ස දිට්ඨි හොති, සාස්ස හොති සම්මාදිට්ඨි.

---

1. අහෙතුකවාදොති - මජසං, ස්‍යා
2. කුසලට්ඨානං - ස්‍යා

ගැහැවියෙනි, ඔවුනතුරෙහි යම් මහණ බමුණු කෙනෙක් මෙබඳු වාද, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද: "(සත්ත්වයන්ගේ කෙලෙසීමට) හෙතු නැත, ප්‍රත්‍යය නැත ... සුවදුක් විඳිති" යි. ඔවුනට තෙල කැමැති වියැයුතු : 'යම් කායසුචරිතයෙක් වාක්සුචරිතයෙක් මනඃසුචරිතයෙක් ඇද්ද මෙ තුන් කුශලධර්මයන් හැරපියා යම් කායදුශ්චරිතයෙක් වාග්දුශ්චරිතයෙක් මනෝදුශ්චරිතයෙක් ඇද්ද මෙ තුන් අකුශලධර්මයන් සමාදන් වැ ගෙන වැටෙති 'යි. එ කවර හෙයින යත් : ඒ භවත් මහණබමුණෝ අකුශල ධර්මයන්ගේ ආදීනවය ලමුබව කෙලෙසීම කුශලධර්මයන් ගේ අනුසස් ද නෛෂ්ක්‍ර-ම්‍යයෙහි අනුසස් ද ව්‍යවදාන පක්ෂය ද නො දක්නාහ. ඇත්තා වූ මැ හෙතුව 'හෙතු නැතැ' යි ඔහුට දෘෂ්ටි වෙයි. ඒ ඔහුගේ මිථ්‍යාදෘෂ්ටි වෙයි. ඇත්තා වූ මැ හේතුව 'හේතු නැතැ' යි යි සංකල්පනා කෙරෙයි. එ ඔහුගේ මිථ්‍යාසංකල්ප වෙයි. ඇත්තා වූ මැ හේතුව 'හේතු නැතැ ' යි තෙපුල් බෙණෙයි. එ ඔහුගේ මිථ්‍යාවචන වෙයි. ඇත්තා වූ මැ හේතුව 'හේතු නැතැ' යි කියයි. යම් රහත් කෙනෙක් හේතුවාද ඇති වෙත් ද ඔවුනට මෙ පුද්ගල විරුද්ධකම් කෙරෙයි. ඇත්තා වූ මැ හේතුව 'හේතු නැතැ' යි මෙරමා හඟවයි. එ ඔහුගේ අසද්ධර්ම සංඥප්ති වෙයි. එ අසද්ධර්ම සංඥපතියෙනුදු තමා හුවයි, මෙරමා හෙලයි. මෙසෙයින් කැලැ මැ ඔහුගේ සුශීලභාවය ප්‍රහීණ වූයේ වෙයි. දුශ්ශීලභාවය එළැඹැ සිටියේ වෙයි. මෙ මිථ්‍යාදෘෂ්ටි ද මිථ්‍යාසංකල්ප ද මිථ්‍යාවචන ද ආර්‍යයනට විරුද්ධභාවය ද අසද්ධර්මසංඥප්ති ද ආත්මොත්කර්‍ෂණ ද පරවම්භන ද යි මෙසේ මෙ නොයෙක් අකුශලධර්මයෝ මිථ්‍යාදෘෂ්ටි හේතුයෙන් ඔහුට පහළ වෙත්.

ගැහැවියෙනි, එහි ලා විඥ පුරුෂ මෙසේ සලකයි ; ඉදින් හේතු නැත් නම් මෙසේ මෙ භවත් පුරුෂ පුද්ගල කායභේදයෙන් මතු තමා ස්වස්ථ කෙරෙයි. ඉදින් හෙතු ඇත්නම් මෙසේ මේ භවත් පුරුෂපුද්ගල කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයට පැමිණෙයි. වැළිත් එකත්තෙන් හෙතු නො වේවා, එ භවත් මහණබමුණන්ගේ වචන සත්‍ය වේවා, එතෙකුදු වත් මේ භවත් පුරුෂපුද්ගල ඉහාත්මයෙහි මැ නුවණැතියන් විසින් ගර්හාකළයුතුබවට නිසි වෙයි: 'දුශ්ශීල පුරුෂපුද්ගලයෙක, මිථ්‍යා දෘෂ්ටි ඇතියෙක අහෙතුවාද ඇතියෙක' කියා යි. ඉදින් හේතු ඇත්තේ මැ වී නම් මෙසේ මේ භවත් පුරුෂපුද්ගලයාහට දෙලොවිහි මැ පරාජයග්‍රාහ වෙයි. 'ඉහාත්මයෙහි මැ නුවණැතියන්ගේ ගර්හාවට නිසි වෙයි' යන යමෙකුත් ඇද්ද, 'කාබුන් මරණින් මතු අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට පැමිණෙයි' යන යමෙකුත් ඇද්ද එ දෙකයි. මෙසේ ඔහුගේ මෙ අපණ්ණකධර්මය වරදවා ගත්තා ලද්දේ සමාදන් කරනලද්දේ එක් දෙසක් පැතිරගෙන සිටියි. කුශල කාරණ හැරපියයි.

ගැහැවියෙනි, ඔවුනතුරෙහි යම් මහණ බමුණු කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද ; "හේතු ඇත, ප්‍රත්‍යය ඇත... සුවදුක් විඳිති" යි ඔවුනට තෙල කැමැති වියැයුතු ; 'යම් කායදුශ්චරිතයෙක් වාග්දුශ්චරිතයෙක් මනෝදුශ්චරිතයෙක් ඇද්ද, මෙ තුන් අකුශලධර්මයන් හැරපියා යම් කායසුචරිතයෙක් වාක්සුචරිතයෙක් මනඃ සුචරිතයෙක් ඇද්ද, මෙ තුන් කුශලධර්මයන් සමාදන් කොටගෙන වැටෙති' යි. එ කවර හෙයින යත් : ඒ භවත් මහණබමුණෝ අකුශල ධර්මයන්ගේ ආදීනවය ලමුබව කෙලෙසීම් දක්නාහ. කුශලධර්මයන්ගේ අනුසස් ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද ව්‍යවදානපක්ෂය ද දක්නාහ. ඇත්තා වූ මැ හෙතු 'හෙතු ඇතැ'යි ඔහුට දෘෂ්ටි වෙයි, එ ඔහුට සම්‍යග්දෘෂ්ටි

සන්තංයෙව ඛො පන හෙතුං අත්ථි හෙතූ'ති සඞ්කප්පෙති. ස්වාස්ස හොති සම්මාසඞ්කප්පො. සන්තංයෙව ඛො පන හෙතුං අත්ථි හෙතූති වාචං භාසති, සාස්ස හොති සම්මාවාචා. සන්තංයෙව ඛො පන හෙතුං අත්ථි හෙතූති ආහ. යෙ තෙ අරහන්තො හෙතුවාදා තෙසම'යං න පච්චනීකං කරොති. සන්තංයෙව ඛො පන හෙතුං අත්ථි හෙතූති පරං සඤ්ඤාපෙති. සාස්ස හොති සද්ධම්මසඤ්ඤත්ති. තාය ච පන සද්ධම්මසඤ්ඤත්තියා නෙවත්තානුක්කංසෙති, න පරං වම්භෙති ඉති පුබ්බෙව ඛො පනස්ස දුස්සීල්‍යං පහීනං හොති. සුසීලං පච්චුපට්ඨිතං අයඤ්ච සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා අරියානං අපච්චනීකතා සද්ධම්මසඤ්ඤත්ති අනත්තුක්කංසනා අපරවම්භනා. එවංයිමෙ[1] අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති සම්මාදිට්ඨිපච්චයා.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: සචෙ ඛො අත්ථි හෙතු, එවමයං භවං පුරිසපුග්ගලො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති. කාමං ඛො පන මාහු හෙතු, හොතු තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං, අථ ච පනායං භවං පුරිසපුග්ගලො දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො: සීලවා පුරිසපුග්ගලො සම්මාදිට්ඨි හෙතුවාදො'ති. සචෙ ඛො අත්ථෙව හෙතු.[2] එවං ඉමස්ස භොතො පුරිසපුග්ගලස්ස උභයත්ථ කටග්ගහො, යඤ්ච දිට්ඨෙව ධම්මෙ විඤ්ඤූනං පාසංසො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සති. එවමස්සායං අපණ්ණකො ධම්මො සුසමත්තො සමාදින්නො උභයංසං ඵරිත්වා තිට්ඨති. රිඤ්චති අකුසලං ඨානං.

සන්ති ගහපතයො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'නත්ථි සබ්බසො ආරුප්පා'ති. තෙසංයෙව ඛො ගහපතයො සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උජුවිපච්චනීකවාදා. තෙ එවමාහංසු: 'අත්ථි සබ්බසො ආරුප්පා'ති. තං කිං මඤ්ඤථ ගහපතයො නනුමෙ සමණබ්‍රාහ්මණා අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදාති—එවම්භන්තෙ.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'නත්ථි සබ්බසො ආරුප්පා'ති. ඉදමෙම අදිට්ඨං, යෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අත්ථි සබ්බසො ආරුප්පා'ති. ඉදමෙම අවිදිතං: අහඤ්චෙව ඛො පන අජානන්තො අපස්සන්තො එකංසෙන ආදාය වොහරෙය්‍යං: 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. නමෙතං අස්ස පතිරූපං. යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො 'නත්ථි සබ්බසො ආරුප්පා'ති. සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. ඨානමෙතං විජ්ජති. යෙ තෙ දෙවා රූපිනො මනොමයා අපණ්ණකමෙම තත්‍රූපපත්ති භවිස්සති. යෙ පන තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො 'අත්ථි සබ්බසො ආරුප්පා'ති. සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. ඨානමෙතං විජ්ජති යෙ තෙ දෙවා අරූපිනො සඤ්ඤාමයා, අපණ්ණකමෙම තත්‍රූපපත්ති භවිස්සති. දිස්සන්තෙ[3] ඛො පන රූපාධිකරණං දණ්ඩාදානසත්ථාදාන - කලහ - විග්ගහ - විවාදතුවංතුවපෙසුඤ්ඤමුසාවාදා. නත්ථි ඛො පනෙතං සබ්බසො අරූපෙති. සො ඉති පටිසඞ්ඛාය රූපානංයෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

---

1. එවමස්සිමෙ - මජසං
2. අත්ථි හෙතු - මජසං.
3. දිස්සන්ති - මජසං

වෙයි. ඇත්තා වූ මැ හේතු 'හේතු ඇතැ'යි සංකල්පනා කෙරෙයි. එ ඔහුට සම්‍යක් සංකල්ප වෙයි. ඇත්තා වූ මැ හේතු 'හේතු ඇතැ'යි තෙපුල් බෙණෙයි. එ ඕහුට සම්‍යග් වචන වෙයි, ඇත්තා වූ මැ හේතු 'හේතු ඇතැ'යි කියයි. යම් රහත් කෙනෙක් හෙතුවාද ඇත්තාහු ද ඔවුනට මෙ පුද්ගල විරුද්ධ කම් නො කෙරෙයි. ඇත්තා වූ මැ හේතු 'හේතු ඇතැ'යි මෙරමා හඟවයි. එ ඔහුට සද්ධර්මසංඥප්ති වෙයි. එ සද්ධර්ම සංඥප්තියෙනුදු තමා නො මැ හුවයි. මෙරමා නො හෙළයි. මෙසෙයින් කැලැ මැ ඔහුගේ දුසිල් බව ප්‍රහීණ වූයේ වෙයි. සුසිල්බව එළැඹැ සිටියේ වෙයි. මෙ සම්‍යග් දෘෂ්ටි ද සම්‍යක් සංකල්ප ද සම්‍යග් වචන ද ආයර්‍යයනට අවිරුද්ධභාවය ද සද්ධර්මසංඥප්තිය ද ආත්මොත්කර්ෂණ රහිත බව ද පරවම්භන රහිත බව දූ යි මෙසේ ඔහුට මෙ නොයෙක් කුශල ධර්මයෝ සම්‍යග්දෘෂ්ටි හෙතුයෙන් පහළ වෙත්.

ගැහැවියෙනි, එහි ලා විඥ පුරුෂ මෙසේ සලකයි : ඉදින් හේතු ඇත් නම් මෙසේ මේ භවත් පුරුෂ පුද්ගල කාබුත් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලෝකයට පැමිණෙන් නෙ යැ. වැළිත් එකත්නෙත් හේතු නො වෙවා, එ භවත් මහණ බමුණන්ගේ වචන සත්‍ය වෙවා, එතෙකුදු වත් මෙ භවත් පුරුෂපුද්ගල ඉහාත්මයෙහි මැ නුවණැතියන්ගේ පැසැසුමට නිසි වෙයි. 'සිල්වත් පුරුෂ පුද්ගලයෙක, සම්‍යග් දෘෂ්ටි ඇතියෙක, හෙතුවාද ඇතියෙක කියා යි. ඉදින් හෙතු ඇත්තේ මැ වී නම් මෙසේ මේ භවත් පුරුෂපුද්ගලහට දෙලොවහි මැ ජයග්‍රාහ වෙයි. ඉහාත්මයෙහි මැ නුවණැතියන් ගේ පැසැසුමට නිසි වෙයි යන යමෙකුත් ඇද්ද, කාබුත් මරණින් මතු සුගති සංඛ්‍යාත සවර්ගලොකයට පැමිණෙන් නේ යැ යන යමෙකුත් ඇද්ද එ දෙක යි. මෙසේ ඔහුගේ මෙ අපණ්ණක ධර්මය මොනොවට ගන්නා ලද්දෙ සමාදන් කරන ලද්දේ උභයාන්තය පැතිරැ ගෙන සිටියි. අකුශලකාරණ හැරපියයි.

ගැහැවියෙනි, ' අරූප බ්‍රහ්මලොකය සර්වප්‍රකාරයෙන් නැතැ'යි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණෝ ඇත. ගැහැවියෙනි, එ මහණබමුණන් අතුරෙහි මැ ඇතැම් මහණ බමුණෝ ඍජු විරුද්ධවාද ඇත්තාහු වෙති. ඔහු මෙසේ කීහු : ' අරූප බ්‍රහ්මලොකය සර්වප්‍රකාරයෙන් ඇත ' කියා යි. ගැහැවියෙනි, එ කිමැ යි හඟනාව. මෙ මහණබමුණෝ උනුනට ඍජු විරුද්ධ වාද ඇත්තාහු නො ? යි. එසේ යැ වහන්ස,

ගැහැවියෙනි, එහි ලා නුවණැති පුරුෂ මෙසේ සලකයි : යම් ඒ භවත් මහණ බමුණු කෙනෙක් ' අරූප බ්‍රහ්මලෝකය සර්වප්‍රකාරයෙන් නැතැ'යි මෙසේ කියන්නාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද මෙ කරුණ මා විසින් නො දක්නා ලද. යම් ඒ භවත් මහණ බමුණු කෙනෙකුන් ' අරූප බ්‍රහ්මලෝකය සර්වප්‍රකාරයෙන් ඇතැ'යි මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, මෙ කරුණ ද මා විසින් නො දන්නා ලද. වැළිත් මම් වූකලි නො දන්නෙම් නො දක්නෙම් ' මෙ මැ සත්‍ය යැ අන්‍යය තුච්ඡ යැ'යි එකාන්ත කොටගෙන ව්‍යවහාර කරන්නෙමි. නෙල මට නො නිස්ස. යම් ඒ භවත් මහණ බමුණු කෙනෙක් ' අරූප බ්‍රහ්මලෝකය සර්ව ප්‍රකාරයෙන් නැතැ'යි මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද ඉදින් එ භවත් මහණ බමුණන්ගේ වචන සබා වේ නම් නෙල කරුණ විද්‍යමාන වෙයි. : රූපී වූ මනෝමය වූ යම් ඒ දෙව් කෙනෙක් ඇද්ද මාගේ එහි ඉපැත්ම නො සිස් වෙයි. යම් එ භවත් මහණ බමුණු කෙනෙක් ' අරූප බ්‍රහ්මලොකය සර්වප්‍රකාරයෙන් ඇතැ'යි මෙ බඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද ඉදින් එ භවත් මහණ බමුණන්ගේ වචන සත්‍ය වේ නම් නෙල කරුණ විද්‍යමාන වෙයි : අරූපී වූ සංඥමය වූ යම් එ දෙව් කෙනෙක් ඇද්ද මාගේ එහි ඉපැත්ම නො සිස් වෙයි. රූපය හෙතු කොට දඬු ගැනුම යැ සැත් ගැනුම යැ කලහ යැ විග්‍රහ යැ විවාද යැ ' තෝ තෝ ' යැ යි බිණුම යැ පිසුනු බස යැ මුසවා යැ යන මොහු දක්නා ලැබෙත් මැ යැ. සර්වප්‍රකාරයෙන් අරූපභවයෙහි නෙල නැත් මැ යයි. හෙ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට රූපයන්ගේ මැ නිර්වෙදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නෙ වෙයි.

සන්ති ගහපතයො එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: නත්ථි සබ්බසො භවනිරොධො'ති. තෙසංයෙව ඛො ගහපතයො සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උජුවිපච්චනීකවාදා, තෙ එවමාහංසු: අත්ථි සබ්බසො භවනිරොධො'ති. තං කිම්මඤ්ඤථ ගහපතයො නනුමෙ සමණබ්‍රාහ්මණා අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදාති. එවං භන්තෙ.

තත්‍ර ගහපතයො විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවංවාදිනො: එවංදිට්ඨිනො: නත්ථි සබ්බසො භවනිරොධො'ති. ඉදං මෙ අදිට්ඨං, යෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: 'අත්ථි සබ්බසො භවනිරොධො'ති. ඉදම්මෙ අවිදිතං. අහඤ්චෙව ඛො පන අජානන්තො අපස්සන්තො එකංසෙන ආදාය වොහරෙය්‍යං: 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. න මෙතං අස්ස පතිරූපං. යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො 'නත්ථි සබ්බසො භවනිරොධො'ති සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. ඨානමෙතං විජ්ජති. යෙ තෙ දෙවා අරූපිනො සඤ්ඤාමයා අපණ්ණකම්මෙ තත්‍රූපපත්ති භවිස්සති. යෙ පන තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'අත්ථි සබ්බසො භවනිරොධො'ති. සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. ඨානමෙතං විජ්ජති යං දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායිස්සාමි. යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: 'නත්ථි සබ්බසො භවනිරොධො'ති. තෙසමයං දිට්ඨි සාරාගාය[1] සන්තිකෙ, සංයොගාය සන්තිකෙ, අභිනන්දනාය සන්තිකෙ, අජ්ඣොසානාය සන්තිකෙ, උපාදානාය සන්තිකෙ. යෙ පන තෙ භොන්තො සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: 'අත්ථි සබ්බසො භවනිරොධො'ති. තෙසමයං දිට්ඨි අසාරාගාය සන්තිකෙ අසංයොගාය සන්තිකෙ අනභිනන්දනාය සන්තිකෙ අනජ්ඣොසානාය සන්තිකෙ අනුපාදානාය සන්තිකෙති. සො ඉතිපටිසඞ්ඛාය භවානංයෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

චත්තාරොමෙ ගහපතයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො: ඉධ ගහපතයො එකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගං අනුයුත්තො. ඉධ ගහපතයො එකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගං අනුයුත්තො. ඉධ ගහපතයො එකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගං අනුයුත්තො. පරන්තපො ච පරපරිතාපනානුයොගං අනුයුත්තො. ඉධ ගහපතයො එකච්චො පුග්ගලො නෙවත්තන්තපො හොති නාත්තපරිතාපනානුයොගං අනුයුත්තො. න පරන්තපො න පරපරිතාපනානුයොගං අනුයුත්තො. සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

---

1. සරාගාය - ස්‍යා.

ගැහැවියෙනි, ' සර්ව ප්‍රකාරයෙන් භවනිරෝධයෙක් නැතැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ගැහැවියෙනි, එ මහණ බමුණන්ට මැ ඍජු විරුද්ධවාද ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු මෙසේ කීහු : ' සර්ව ප්‍රකාරයෙන් භවනිරෝධය ඇතැ'යි. ගැහැවියෙනි, එ කිමැ යි හඟනාව. මේ මහණ බමුණෝ ඔවුනොවුනට ඍජුවිරුද්ධවාද ඇත්තාහු නො වෙත් ද ? යි. එසේ යැ වහන්ස,

ගැහැවියෙනි, එහි ලා නුවණැති පුරුෂ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : ' සර්ව ප්‍රකාර යෙන් භවනිරොධයෙක් නැතැ'යි මෙසේ වාද ඇති මෙසේ දෘෂ්ටි ඇති යම් භවත් මහණ බමුණු කෙනෙක් ඇද්ද මා විසින් මෙ නොදක්නා ලද. ' සර්ව ප්‍රකාරයෙන් භවනිරොධය ඇතැ'යි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති යම් භවත් මහණ බමුණු කෙනෙක් ඇද්ද මෙ මා විසින් නො දක්නා ලද, මම වැළිත් මෙය මැ සැබව, අන්‍යය තුච්ඡ යැ යි නො දන් නෙම් නො දක්නෙම් එකාන්තයෙන් ගෙන ව්‍යවහාර කෙරෙම් නම් තෙල මට නො නිසි වෙයි. ' සර්ව ප්‍රකාරයෙන් භවනිරෝධයෙක් නැතැ'යි මෙසේ වාද ඇති මෙසේ දෘෂ්ටි ඇති යම් භවත් මහණබමුණු කෙනෙක් ඇද්ද ඉදින් එ භවත් මහණබමුණන්ගේ බස සබා වි නම් තෙල කරුණ වන්නේ යැ. අරූපී වූ (අරූපධ්‍යාන සංඥයෙන්) සංඥමය වූ යම් දෙව් කෙනෙක් ඇද්ද මාගේ එහි උපත අවිරුද්ධ වන්නේ යැ. වැළි ' සර්වප්‍රකාරයෙන් භවනිරොධය ඇතැ'යි මෙසේ කියන මෙසේ දෘෂ්ටි ඇති යම් භවත් මහණබමුණු කෙනෙක් ඇද්ද ඉදින් එ භවත් මහණ බමුණන්ගේ බස සැබෑ වී නම්, ' ඉහාත්මයෙහි මැ පිරිනිවෙන් නෙමි ' යන යමක් ඇද්ද තෙල කරුණ වන්නේ යැ. ' සර්ව ප්‍රකාරයෙන් භවනිරොධ යෙක් නැතැ'යි මෙසේ වාද ඇති මෙසේ ලබ්ධි ඇති යම් භවත් මහණබමුණු කෙනෙක් ඇද්ද ඔවුන්ගේ මෙ දෘෂ්ටිය රාග වශයෙන් සසරැ ඇලීමට ළං වෙයි. සංයොජනයට සමීප වෙයි. (තෘෂ්ණා දෘෂ්ටි විසින්) අභිනන්දනයට සමීප වෙයි. බැසගැනීමට සමීප වෙයි. දෘඪග්‍රහණයට සමීප වෙයි, යළි ' සර්වප්‍රකාරයෙන් භවනිරොධය ඇතැ'යි මෙසේ වාද ඇති මෙසේ දෘෂ්ටි ඇති යම් භවත් මහණ බමුණු කෙනෙක් ඇද්ද ඔවුන්ගේ මෙ දෘෂ්ටිය සසරැ නො ඇලීමට සමීප වෙයි. අසංයෝජනයට සමීප වෙයි. අනභිනන්දනයට සමීප වෙයි ' අනධ්‍යවසානයට සමීප වෙයි, අනුපාදනයට සමීප වෙ යයි " හේ මෙසේ ප්‍රත්‍ය-වෙක්ෂා කොට භවයන්ගේ මැ නිර්වෙද පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

ගැහැවියෙනි, ලොවැ මෙ පුද්ගලයෝ සතර දෙනෙක් ඇත්තාහු (විද්‍යමාන) වෙති. කවර සතර දෙනෙක යත් : ගැහැවියෙනි, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්මය තවනුයේ ආත්මය තවන යෝගයෙහි යෙදුණේ වෙයි. ගැහැවියෙනි, මෙලොවැ ඇතැම් පුද්ගල යෙක් මෙරමා තවනුයේ මෙරමා තවන යෝගයෙහි යෙදුණේ වෙයි. ගැහැවියෙනි, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් තමා තවනුයේ තමා තවන යෝගයෙහි යෙදුණේත් මෙරමා තවනුයේ මෙරමා තවන යෝගයෙහි යෙදුණේත් වෙයි. ගැහැවියෙනි, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් තමා නොමැ තවනුයේ තමා තවන යෝගයෙහි නො යෙදුණේ මෙරමා නො තවනුයේ මෙරමා තවන යෝගයෙහි නො යෙදුණේ වෙයි. හේ තමා නො තවනුයේ මෙරමා නො තවනුයේ ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනසුලු වූයේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත වැ වාස කෙරෙයි.

කතමො ච ගහපතයො පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගං අනුයුත්තො: ඉධ ගහපතයො එකච්චො පුග්ගලො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො—පෙ—ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගං අනුයුත්තො විහරති. අයං වුච්චති ගහපතයො පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගං අනුයුත්තො .

කතමො ච ගහපතයො පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගං අනුයුත්තො: ඉධ ගහපතයො එකච්චො පුග්ගලො ඔරබ්භිකො හොති. සූකරිකො -පෙ- යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා. අයං වුච්චති ගහපතයො පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගං අනුයුත්තො

කතමො ච ගහපතයො පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගං අනුයුත්තො, පරන්තපො ච පරපරිතාපනානුයොගං අනුයුත්තො: ඉධ ගහපතයො එකච්චො පුග්ගලො රාජා වා හොති ඛත්තියො මුද්ධාවසිත්තො -පෙ- තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති. අයං වුච්චති ගහපතයො පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගං අනුයුත්තො, පරන්තපො ච පරපරිතාපනානුයොගං අනුයුත්තො.

කතමො ච ගහපතයො පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගං අනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගං අනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. ඉධ ගහපතයො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො. -පෙ- සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං ස උද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ගැහැවියෙනි, තමා තවන තමා තවන යෝගයෙහි යෙදුණු පුද්ගල කවරේ යත් : ගැහැවියෙනි, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් සෙලු වෙයි, හළ ආචාර ඇති වෙයි, අත ලෝනේ වෙයි . . . මෙසේ මෙබඳු අනේකප්‍රකාර වූ කය තවන හාත්පසින් තවන යෝග යෙහි යෙදුණේ වෙසෙයි. ගැහැවියෙනි, මෙ තෙම ආත්ම පරිතාපානුයොගයෙහි යෙදුණු ' අත්තන්තප පුද්ගල ' යයි කියනු ලැබේ.

ගැහැවියෙනි, පරපරිතාපානුයොගයෙහි යෙදුණු ' පරන්තප පුද්ගල ' කවරේ යත් : ගැහැවියෙනි, මෙලොවැ කිසි පුද්ගලයෙක් එළුවන් නසා ජීවත් වනුයේ හූරන් නසා ජීවත් වනුයේ . . . මෙයින් අන්‍ය වූත් යම්කිසි කැකුළු කම් ඇත්තාහු වෙත්. ගැහැවියෙනි, මෙ පරපරිතාපානුයොගයෙහි යෙදුණු ' පරන්තප පුද්ගල ' යයි කියනු ලැබේ.

ගැහැවියෙනි, ආත්මපරිතාපානුයොගයෙහි යෙදුණු ' අත්තන්තප ' වූ ද පරපරිතාපානු යොගයෙහි යෙදුණු ' පරන්තප ' වූ ද පුද්ගල කවරෙ යත් : ගැහැවියෙනි, මෙලොවැ මුදුනා අභිෂික්ත වූ කැත් රජෙක් හෝ වෙයි . . . ඔහුදු දඬුවමින් තැතිගත්තාහු භයින් තැතිගත්තාහු කඳුළු මුසු මුහුණු ඇත්තාහු හඬමින් පරිකර්ම කෙරෙති. ගැහැවියෙනි, මෙ ආත්ම-පරිතාපානුයෝගයෙහි යෙදුණු ' අත්තන්තප ' වූ ද පරපරිතාපානු යෝගයෙහි යෙදුණු ' පරන්තප ' වූ ද පුද්ගල යයි කියනු ලැබේ.

ගැහැවියෙනි, ආත්මපරිතාපානුයෝගයෙහි නො යෙදුණු නො මැ අත්තන්තප වූ ද පරපරිතාපානුයෝගයෙහි නො යෙදුණු පරන්තප නො වූ ද පුද්ගල කවරෙ යත් : හේ ' අත්තන්තප ' නො වූයේ ' පරන්තප ' නො වූයේ ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වූයේ කෙලෙස් පිරිනිවනින් නිවියේ එහෙයින් මැ සිහිල් වූයේ මහපල නිවන්සුව විඳිනුයේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත වැ වාස කෙරෙයි. ගැහැවියෙනි, අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ . . . තථාගතයන් වහන්සේ මෙලොව උපදනාහ. . . . . හේ සිතට උපක්ලේශ වූ, ප්‍රඥව දුර්වල කරන මෙ පඤ්චනීවරණයන් හැරපියා කාමයෙන් වෙන් වැ මැ අකුශල ධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිසුව ඇති ප්‍රථමධ්‍යානය . . . ද්විතීය ධ්‍යානය . . . තෘතීය ධ්‍යානය . . . චතුර්ත්ථ ධ්‍යානය උපයා ගෙන වාස කෙරෙයි.

හේ මෙසෙයින් සමාධිගත වූ සිත පිරිසුදු වූ කල්හි පයර්‍යවදත වත් මැ අංගණ රහිත වත් මැ පහවූ උපක්ලෙශ ඇති වත් මැ මෘදු වත් මැ කර්මණ්‍ය වත් මැ ස්ථිත වත් මැ නො සැලෙන බවට පත් වත් මැ පූර්වනිවාසානුස්මෘතිඥානය පිණිස සිත නතු කෙරෙයි. හේ අනෙක ප්‍රකාර පූර්වනිවාසය සිහි කෙරෙයි. ඒ මෙසේ යැ : එක් ජාතියක, ජාති දෙකක . . . මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනේකවිධ පූර්වනිවාසය නුවණින් සිහි කෙරෙයි.

හේ මෙසේ සමාහිත සිත පිරිසුදු කල්හි පයර්‍යවදත කල්හි අඬගණ රහිත කල්හි පහවගිය උපක්ලේශ ඇති කල්හි මෘදු වැ සිටි කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි ස්ථිත කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි සත්ත්වයන්ගේ ච්‍යුති උපප්‍රාප්ති දන්නා ඥනය පිණිස සිත නතු කෙරෙයි. හේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන උපදනා සත්ත්වයන් දකියි. හීන වූ ප්‍රණීත වූ මනා පැහැසටහන් ඇති නපුරු පැහැසටහන් ඇති සුන්දර ගති ඇති නපුරු ගති ඇති කර්මානුරූප වැ ගිය සත්ත්වයන් නුවණින් දැන ගනී.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

අයං වුච්චති ගහපතයො පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගං අනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගං අනුයුත්තො. සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති.

එවං වුත්තෙ සාලෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය. චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙති.

අපණ්ණක සුත්තං දසමං.

ගහපති වග්ගො පඨමො

තස්ස වග්ගස්ස උද්දානං

කන්දරනාගරසෙඛවතො ච පොතලියො පුන ජීවකභච්චො,
උපාලි දමථො කුක්කුර අභයො බහුවෙදනියාපණ්ණකතො දසමො.

හේ මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ වත් මැ පය්‍ර්‍යවදාත වත් මැ නිරඞ්ගණ වත් මැ මෘදු වත් මැ කර්මාර්හ වත් මැ තර වැ සිටුත් මැ නිසල බවට පත් වත් මැ ආස්‍රවයන්ගේ ක්‍ෂය ඥානය සඳහා සිත නතු කෙරෙයි. හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනගනී... 'මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත්ති යයි ඇති සැටියෙන් දනගනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවයෙනුදු මිදෙයි, භවාස්‍රවයෙනුදු මිදෙයි, අවිද්‍යාස්‍රවයෙනුදු මිදෙයි. (සිත) මිදුණු කල්හි 'විමුක්ත යැ'යි නුවණ වෙයි. ජාතිය ක්‍ෂීණ විය. මහ බඹසර වැස නිමවන ලදී. කරණී කරන ලදී. මේ අර්හත්ත්වය සඳහා කළමනා අන් කිසෙක් නැති' යි නුවණින් දනගනී.

ගැහැවියෙනි, මේ පුද්ගල ආත්මපරිතාපානුයෝගයෙහි නො යෙදුණු 'අත්තන්තප' නො වූ පරපරිතාපානුයෝගයෙහි නො යෙදුණු 'පරන්තප' නො වූ පුද්ගල යයි කියනු ලැබේ. හේ 'අත්තන්තප' නො වූයේ 'පරන්තප' නො වූයේ මේ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවියේ සිහිල් වූයේ සුව විඳිනා සුලු වැ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් විහරණ කෙරේ යයි.

මෙසේ වදාළ කල්හි 'සාලා' ගම්වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැල කළහ : ඉතා මැනැවැ භවත් ගෞතමයෙනි, ඉතා මැනැවැ භවත් ගෞතමයෙනි, යම්සේ භවත් ගෞතමයෙනි, යටිකුරු කරනලදුවක් හෝ උඩුකුරු කරන්නේ ද, පිළිසන් දයක් හෝ විවෘත කරන්නේ ද, මංමුළා වැ ගිය එකකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූ දකිත්ව'යි අඳුරෙහි හෝ තෙල් පහනක් දරන්නේ ද, එසෙයින් මැ භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද. මෙල අපි භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යම්හ. ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිම් වැ සරණ ගිය උපාසකයන් කොට අප ධරනසේක් ව'යි.

දස වැනි අපණ්ණක සූත්‍රය යි.

---

2. 2. 1

අම්බලට්ඨික[1] රාහුලොවාද සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා රාහුලො අම්බලට්ඨිකායං විහරති. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන අම්බලට්ඨිකා යෙනායස්මා රාහුලො තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා රාහුලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආසනං පඤ්ඤපෙසි[2] උදකඤ්ච පාදානං. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි. ආයස්මාපි ඛො රාහුලො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

අථ ඛො භගවා පරිත්තං උදකාවසෙසං උදකාධානෙ ඨපෙත්වා අයස්මන්තං රාහුලං ආමන්තෙසි 'පස්සසි නො ත්වං රාහුල ඉමං පරිත්තං උදකාවසෙසං උදකාධානෙ ඨපිත'න්ති. එවම්භන්තෙ, එවං පරිත්තං[3] ඛො රාහුල තෙසං සාමඤ්ඤං යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජාති.

අථ ඛො භගවා තං පරිත්තං උදකාවසෙසං ඡඩ්ඩෙත්වා ආයස්මන්තං රාහුලං ආමන්තෙසි පස්සසි නො ත්වං රාහුල තං පරිත්තං උදකාවසෙසං ඡඩ්ඩිත'න්ති. එවම්භන්තෙති. එවං ඡඩ්ඩිතං ඛො රාහුල තෙසං සාමඤ්ඤං යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජාති.

අථ ඛො භගවා තං උදකාධානං නික්කුජ්ජිත්වා ආයස්මන්තං රාහුලං ආමන්තෙසි පස්සසි නො ත්වං රාහුල ඉමං උදකාධානං නික්කුජ්ජිත'න්ති. එවම්භන්තෙ, එවං නික්කුජ්ජිතං ඛො රාහුල තෙසං සාමඤ්ඤං, යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජාති.

අථ ඛො භගවා තං උදකාධානං උක්කුජ්ජිත්වා ආයස්මන්තං රාහුලං ආමන්තෙසි. පස්සසි නො ත්වං රාහුල ඉමං උදකාධානං රිත්තං තුච්ඡන්ති. එවම්භන්තෙ. එවං රිත්තං තුච්ඡං ඛො රාහුල තෙසං සාමඤ්ඤං යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජාති.

සෙය්‍යථාපි රාහුල රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවා[4] අභිජාතො සඞ්ගාමාවචරො. සො[5] සඞ්ගාමගතො පුරිමෙහිපි පාදෙහි කම්මං කරොති, පච්ඡිමෙහිපි පාදෙහි කම්මං කරොති, පුරමෙනපි කායෙන කම්මං කරොති, පච්ඡිමෙනපි කායෙන කම්මං කරොති, සීසෙනපි කම්මං කරොති, කණ්ණෙහිපි කම්මං කරොති, දන්තෙහිපි කම්මං කරොති, නඞ්ගුට්ඨෙනපි කම්මං කරොති, රක්ඛතෙව සොණ්ඩං. තත්ථ හත්ථාරොහස්ස එවං හොති: අයං ඛො රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවා[4] අභිජාතො සඞ්ගාමාවචරො සඞ්ගාමගතො පුරිමෙහිපි පාදෙහි කම්මං කරොති, පච්ඡිමෙහිපි පාදෙහි කම්මං කරොති, පුරිමෙනපි කායෙන කම්මං කරොති, පච්ඡිමෙනපි කායෙන කම්මං කරොති, සීසෙනපි කම්මං කරොති, කණ්ණෙහිපි කම්මං කරොති, දන්තෙහිපි කම්මං කරොති, නඞ්ගුට්ඨෙනපි කම්මං කරොති, රක්ඛතෙව සොණ්ඩං, අපරිච්චත්තං ඛො රඤ්ඤො නාගස්ස ජීවිතන්ති. යතො ඛො රාහුල

---

1. අම්බලට්ඨිකා – PTS. 2. පඤ්ඤපෙසි – සීමු. 3. පරිත්තකං – මජ්සං.
4. උරූළ්හවා – මජ්සං, ස්‍යා. 5. සො – මජ්සං (ඌනං)

Free Distribution www.aathaapi.org

2. 2. 1

අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක්කලෙක බුදුහු රජගහනුවර නිසා කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් රාහුලභද්‍රයෝ අම්බලට්ඨිකා නම් පහයෙහි වාසය කෙරෙති. භාග්‍යවතුන් වහන්සේ සවස්වේලෙහි ඵලසමවතින් නැඟී සිටිසේක් අම්බලට්ඨිකායෙහි ආයුෂ්මත් රාහුලයන් වෙත එළැඹිසේක. රාහුලායුෂ්මත්හු දුරින් මැ වඩනා භාග්‍යවතුන් වහන්සේ දක අසුන් පනවා පාදෝනා පිණිස දිය ද එළැවූහ. බුදුහු පැනවූ අස්නෙහි වැඩහිඳ පා දෙවූහ. ආයුෂ්මත් රාහුලභද්‍රයෝ ද බුදුන් වැඳ එකත්පස් වැ හුන්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මඳ වූ ඉතිරි දිය දියබඳුනෙහි තබා ආයුෂ්මත් රාහුලයන් ඇමැතූසේක : ''රාහුලයෙනි, තෙපි දියබඳුනෙහි තුබූ මේ අල්ප වූ උදකශේෂය දක්නවු ද''යි. එසේ යැ වහන්සැ'යි. රාහුලයෙනි, එසෙයින් යම් කෙනක්නට දන දන මුසවා බිණීමෙහි ලජ්ජා නැත්ද, ඔවුන්ගේ ශ්‍රමණධර්මය අල්ප වෙයි.

ඉක්බිති බුදුහු ඒ අල්ප වූ උදකශේෂය බැහැර කොට ආයුෂ්මත් රාහුලයන් ඇමැතූහ : ''රාහුලයෙනි, තෙපි බැහැර කළ අල්ප වූ උදකශේෂය දක්නවු ද''යි. එසේ යැ වහන්සැයි. රාහුලයෙනි යම් කෙනකුන්ට දන දන මුසවා බිණීමෙහි ලජජා නැත් ද ඔවුන්ගේ ශ්‍රමණධර්මය බැහැර කරනලද වෙයි.

ඉක්බිති බුදුහු ඒ දියබඳුන යටිහුරු කොට තබා ආයුෂ්මත් රාහුලයන් ඇමැතූහ : ''රාහුලයෙනි, තෙපි යටිහුරු කළ මේ දියබඳුන දක්නවු ද''යි. වදළහ. එසේ යැ වහන්ස, රාහුලයෙනි, එසෙයින් යම් කෙනක්නට දන දන මුසවා බිණීමෙහි ලජ්ජා නැත් ද ඔවුන්ගේ ශ්‍රමණධර්මය යටිහුරු කරනලද වෙයි.

ඉක්බිති බුදුහු එදියබඳුන උඩුහුරු කොට තබා ආයුෂ්මත් රාහුලයන් ඇමැතූහ : ''රාහුල යෙනි තෙපි වැගුරුණු සිස් වූ මෙ දියබඳුන දක්නවු ද''යි වදළහ. එසේ යැ වහන්සැ'යි. එසෙයින් රාහුලයෙනි යම් කෙනකුනට දන දන මුසවා බිණීමෙහි ලජ්ජා නැත්ද ඔවුන් ගේ ශ්‍රමණධර්මය රික්ත යැ තුච්ඡ වේ යයි.

යම්සේ රාහුලයෙනි, රජහට රියහිස් වැනි දළ ඇති වැඩුණු සිරුරු ඇති ජාතිසම්පන්න වූ යුද බිමට බටවිරු ඇත්රජෙක් වේ ද, හේ යුදබිමට බටුයේ පෙර දෙපයිනුදු කම් කෙරෙයි, පසු දෙපයිනුදු කම් කෙරෙයි, පෙර කයිනුදු කම් කෙරෙයි, පසුකයිනුදු කම් කෙරෙයි, හිසිනුදු කම් කෙරෙයි, දෙකනිනුදු කම් කෙරෙයි, දෙදළිනුදු කම් කෙරෙයි, නඟුටිනුදු කම් කෙරෙයි, සොඬ රක්තේ මැ යැ. එහිලා ඇතරුහට මෙබඳු සිතෙක් වෙයි : ''රජුගේ මෙඇත්රජ රියහිස් වැනි දළ ඇත්තේ වැඩුණු සිරුරු ඇත්තේ ජාතිසම්පන්න වූයේ යුදට ගියවිරු වූයේ යුදබිමට ගියේ පෙර දෙපයිනුදු කම් කෙරෙයි, පසු දෙපයිනුදු කම් කෙරෙයි, හිසිනුදු කම් කෙරෙයි, දෙකනිනුදු කම් කෙරෙයි, දෙදළිනුදු කම් කෙරෙයි, නඟුටිනුදු කම් කෙරෙයි, සොඬ රක්තේ මැ යැ ඇතුගේ ජීවිතය රජුට නො හරනාලද''යි.

රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවා අභිජාතො සඞ්ගාමාවචරෙ සඞ්ගාමගතො-පෙ-නඞ්ගුට්ඨෙනපි කම්මං කරෙති. සොණ්ඩායපි කම්මං කරෙති. තත්‍ථ හත්‍ථාරොහස්ස එවං හොති: අයං ඛො රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවා[1] අභිජාතො සඞ්ගාමාවචරො සඞ්ගාමගතො-පෙ-නඞ්ගුට්ඨෙනපි කම්මං කරොති. සොණ්ඩායපි කම්මං කරොති. පරිච්චත්තං ඛො රඤ්ඤො නාගස්ස ජීවිතං, නත්‍ථිදානි කිඤ්චි රඤ්ඤො නාගස්ස කරණීයන්ති. එවමෙව ඛො රාහුල යස්ස කස්සචි සම්පජාන මුසාවාදෙ නත්‍ථි ලජ්ජා, නාහං තස්ස කිඤ්චි පාපං[2] අකරණීයන්ති වදාමි. තස්මාතිහ රාහුල[3] හස්සාපි න මුසා භණිස්සාමි'ති එවං හි තෙ රාහුල සික්ඛිතබ්බං.

තං කිම්මඤ්ඤසි රාහුල කිමත්‍ථියො ආදාසොති. පච්චවෙක්ඛනත්‍ථො භන්තෙති. එවමෙව ඛො රාහුල පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායෙන කම්මං කාතබ්බං, පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං, පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනසා කම්මං කාතබ්බං[4]

යදෙව ත්වං රාහුල කායෙන කම්මං කත්තුකාමො අහොසි[5] තදෙව තෙ කායකම්මං පච්චවෙක්ඛිතබ්බං: යන්නු ඛො අහං ඉදං කායෙන කම්මං කත්තුකාමො, ඉදං මෙ කායකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, පරව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, උභයව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජනෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං කත්තුකාමො ඉදමෙම කායකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, පරව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, උභයව්‍යාබාධායපි සංවත්තෙය්‍ය, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල කායෙන කම්මං සසක්කං න කරණීයං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං කත්තුකාමො, ඉදං මෙ කායකම්මං නෙවත්තව්‍යාබාධාය සංවත්තෙය්‍ය, න පරව්‍යාබාධා සංවත්තෙය්‍ය, න උභයව්‍යාබාධාය සංවත්තෙය්‍ය, කුසලං ඉදං කායකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල කායෙන කම්මං කරණීයං.

කරොන්තෙනපි තෙ රාහුල කායෙන කම්මං තදෙව තෙ කායකම්මං පච්චවෙක්ඛිතබ්බං: යන්නු ඛො අහං ඉදං කායෙන කම්මං කරොමි. ඉදමෙම කායකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං කරෙමි, ඉදමෙම කායකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. පටිසංහරෙය්‍යාසි ත්වං රාහුල එවරූපං කායකම්මං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං කරෙමි, ඉදමෙම කායකම්මං නෙවත්තව්‍යාබාධාය සංවත්තති, න පරව්‍යාබාධාය සංවත්තති, න උභයව්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං කායම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. අනුපදජ්ජෙය්‍යාසි ත්වං රාහුල එවරූපං කායකම්මං.

1. උරූළ්හවා - මජසං, ස්‍යා 2. පාපං කම්මං - සීමු, ස්‍යා.
3. තස්මා පන රාහුල - සීමු. 4. කත්තබ්බං - මජසං 5. හොසි - සීමු

රාහුලයෙනි, රජුගේ ඇත් රියහිස් වැනි දළ ඇත්තේ වැඩුණුසිරුරු ඇත්තේ ජාති-සම්පන්න වූයේ සඩගාමාවචර වූයේ . . . . තඟුවිතුදු කම් කෙරෙයි, සොඬිනුදු කම් කෙරෙයි, එහිලා ඇතරුහට මෙබඳු සිතෙක් වෙයි : ''රජුගේ මෙ ඇත් රියහිස් වැනි දළ ඇත්තේ වැඩුණුසිරුරු ඇත්තේ ජාතිසම්පන්න වූයේ සඩගාමාවචර වූයේ යුදබිමට ගියේ . . තඟුවිතුදු කම් කෙරෙයි, සොඬිනුදු කම් කෙරෙයි, ඇතුගේ ජීවිතය රජහට පරිත්‍යාග කරන ලදයැ, මෙවිට ඇතු විසින් රජහට කිසි කටයුත්තෙක් නැතැ''යි. එසෙයින් මැ රාහුලයෙනි, යම් කිසිවකුට දැන දැන මුසවා බිණීමෙහි ලජ්ජා නැත් ද ඔහු විසින් කිසි පවක් නො කටහැකි යයි මම් නො කියමි. එහෙයින් මෙහි ලා රාහුලයෙනි. කෙළි පිණිස ද මුසවා නො බෙණෙමි, මෙසේ රාහුලයෙනි, තොප විසින් හික්මියයුතු.

රාහුලයෙනි, ඒ කිමැයි සිතවු ද? කැටපත කුමක් ප්‍රයෝජන කොට ඇත්ද?යි. වහන්ස පිරික්සා බැලීම ප්‍රයෝජන කොට ඇතැ'යි. එසෙයින් මැ රාහුලයෙනි, පිරික්ස පිරික්සා කයින් කම් කළයුතු යැ. පිරික්ස පිරික්සා බසින් කම් කළයුතු යැ. පිරික්ස පිරික්සා මනසින් කම් කළයුතු යැ.

රාහුලයෙනි, තෙපි යම් මැ කමක් කරනුකැමැතිවූවහු ද තොප විසින් එ මැ කායකර්මය පිරික්සියයුතු යැ : ''මම කයින් යම් කර්මයක් කරනු කැමැත්තෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවත්නේ යැ පරහට දුක් පිණිස ද පවත්නේ යැ දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යැ මේ කායකර්මය අකුසල යැ දුක් වඩනේ යැ දුඃඛවිපාක ඇතැ''යි. ඉදින් රාහුලයෙනි, තෙපි පිරික්සන්නහු මෙසේ දන්නවු ද : ''මම කයින් යම් කර්මයක් කරනු කැමැත්තෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවත්නේ යැ පරහට දුක් පිණිස ද පවත්නේ යැ. දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යැ මේ කායකර්මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තොප විසින් කයින් මෙබඳු කර්මය එකත්තෙන් නො කටයුතු යැ. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නහු මෙසේ දන්නවු නම් : ''මම කයින් යම් කර්මයක් කරනු කැමැත්තෙම් ද මාගේ මේ කාය-කර්මය නො මැ තමහට දුක් පිණිස පවත්නේ යැ, පරහට දුක් පිණිස නො පවත්නේ යැ. දෙදෙනාට දුක් පිණිස නො පවත්නේ යැ. මේ කායකර්මය කුසල, සුව වඩනේ යැ, සුඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තොප විසින් කයින් මෙබඳු කර්මය කළයුතු.

රාහුලයෙනි, තොප කයින් කම් කරනුවන් විසිනුදු තොපගේ එ මැ කායකර්මය ප්‍රත්‍යවෙක්‍ෂා කළයුතු යැ : ''මම කයින් යම් කර්මයක් කෙරෙම් ද, මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවතී. පරහට දුක් පිණිස ද පවතී. දෙදෙනාට දුක් පිණිස ද පවතී. මේ කාය-කර්මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ''යි. ඉදින් රාහුලයෙනි, තෙපි ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නහු මෙසේ දන්නහු නම් : මම කයින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවතී. පරහට දුක් පිණිස ද පවතී. දෙදෙනාට දුක් පිණිස ද පවතී. මේ කායකර්මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තෙපි මෙබඳු කායකර්මය නො කරව. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නහු මෙසේ දන්නහු නම් : ''මම කයින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස නො මැ පවතී, පරහට දුක් පිණිස නො පවතී, දෙදෙනාට දුක් පිණිස නො පවතී, මේ කායකර්මය කුසල, සුව වඩනේ යැ, සුඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තෙපි මෙබඳු කායකර්මය කරව.

කත්වාපි තෙ රාහුල කායෙන කම්මං තදෙව තෙ කායකම්මං පච්චවෙක්ඛිතබ්බං: යන්නු ඛො අහං ඉදං කායෙන කම්මං අකාසිං, ඉදමෙම කායකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං අකාසිං, ඉදමෙම කායකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං කායකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති එවරූපං තෙ රාහුල කායකම්මං සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු දෙසෙතබ්බං, විවරිතබ්බං, උත්තානීකාතබ්බං, දෙසෙත්වා විවරිත්වා උත්තානීකත්වා ආයතිං සංවරං ආපජ්ජිතබ්බං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං කායෙන කම්මං අකාසිං ඉදමෙම කායකම්මං නෙවත්තබ්‍යාබාධාය සංවත්තති, න පරබ්‍යාබාධාය සංවත්තති, න උභයබ්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං කායකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. තෙනෙව ත්වං රාහුල පීතිපාමොජ්ජෙන විහරෙය්‍යාසි අහොරත්තානුසික්ඛී කුසලෙසු ධම්මෙසු.

යදෙව ත්වං රාහුල වාචාය කම්මං කත්තුකාමො අහොසි.[1] තදෙව තෙ වචීකම්මං පච්චවෙක්ඛිතබ්බං : යන්නු ඛො අහං ඉදං වාචාය කම්මං කත්තුකාමො, ඉදමෙම වචීකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, පරබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, උභයබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං කත්තුකාමො ඉදමෙම වචීකම්මං—පෙ—උභයබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල වාචාය කම්මං සසක්කං න කරණීයං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං කත්තුකාමො, ඉදමෙම වචීකම්මං නෙවත්තබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, න පරබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, න උභයබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, කුසලං ඉදං වචීකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල වාචාය කම්මං කරණීයං.

කරොන්තෙනපි තෙ රාහුල වාචාය කම්මං තදෙව තෙ වචීකම්මං පච්චවෙක්ඛිතබ්බං : යන්නු ඛො අහං ඉදං වාචාය කම්මං කරොමි, ඉදමෙම වචීකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං කරොමි, ඉදමෙම වචීකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති,[2] පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. පටිසංහරෙය්‍යාසි ත්වං රාහුල එවරූපං වචීකම්මං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං කරොමි. ඉදමෙම වචීකම්මං නෙවත්තබ්‍යාබාධාය සංවත්තති, න පරබ්‍යාබාධාය සංවත්තති, න උභයබ්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං වචීකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. අනුපදජ්ජෙය්‍යාසි ත්වං රාහුල එවරූපං වචීකම්මං.

---

1. හොසි - සිමු. 2 සංවත්තති - PTS.

රාහුලයෙනි, තෙපි කයින් කර්මය කොට ද තොපගේ එ මැ කායකර්මය පිරික්සියයුතු යෑ : "මම යම් කර්මයක් කයින් කෙළෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ කායකර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු නම් : "මම් කයින් යම් කර්මයක් කෙළෙම් නම් මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති, මේ කායකර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් මෙබඳු කාය-කර්මය ශාස්තෘන් කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි හෝ දෙසියයුතු යෑ, විවරණය කළයුතු යෑ, හෙළි කළ යුතු යෑ, දෙශනා කොට විවරණය කොට හෙළි කොට ආයතිසංවරයට පැමිණිය යුතු. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද; "මම් කයින් යම් කර්මයක් කෙළෙම් ද මාගේ මේ කායකර්මය තමහට දුක් පිණිස නො මැ පවති. පරහට දුක් පිණිස නො පවති, දෙදෙනාට දුක් පිණිස නො පවති. මේ කායකර්මය කුසල, සුව වඩනේ යෑ, සුඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තෙපි එ මැ ප්‍රීතිප්‍රමෝදයෙන් කුසල්දහම්හි දවරැය හික්මෙමින් වෙසෙන්නාහු යෑ.

රාහුලයෙනි, තෙපි බයින් යම් මැ කර්මයක් කරනු කැමැත්තාහු ද, තොප විසින් එ මැ වාක්කර්මය පිරික්සිය යුතු යෑ : "මම යම් කර්මයක් කරනු කැමැතියෙම් ද මාගේ මේ වාක්කර්මය තමහට දුක් පිණිස ද පවත්නේ යෑ, පරහට දුක් පිණිස ද පවත්නේ යෑ, දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යෑ. මේ වාක්කර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුඃඛවිපාක ඇතැ"යි. ඉදින් රාහුලයෙනි, තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් බයින් යම් කර්මයක් කරනු කැමැතියෙම් ද මාගේ මේ වාක්කර්මය . . . . . දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යෑ, මේ වාක්කර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුක්ඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් බයින් මෙබඳු කම් එකත්තෙන් නො කළයුතු. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු නම් : "මම් බයින් යම් කර්මයක් කරනු කැමැතියෙම් ද මාගේ මේ වාක්කර්මය තමහට දුක් පිණිස ද නො මැ පවත්නේ යෑ, පරහට දුක් පිණිස ද නො පවත්නේ යෑ, දෙදෙනාට දුක් පිණිස ද නො පවත්නේ යෑ, මේ වාක්කර්මය කුසල, සුව වඩනේ යෑ, සුඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් බයින් මෙබඳු කම් කටයුතු.

රාහුලයෙනි, තොප බයින් කම් කරනුවත් විසිතුදු තොපගේ එ මැ වාක්කර්මය පිරික්සිය යුතු යෑ : "මම බයින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ වාක්කර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති, මේ වාක්කර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුඃඛවිපාක ඇතැ"යි. ඉදින් රාහුලයෙනි, තෙපි පිරික්සන්නාහු මෙසේ දනිවු ද : "මම් බයින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ වාක්කර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවතී. මේ වාක්කර්මය අකුසල, දුක් වඩනේ යෑ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තෙපි මෙබඳු වාක්කර්මය නො කරව. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් බයින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ වාක්කර්මය තමහට දුක් පිණිස ද නො මැ පවති, පරහට දුක් පිණිස ද නො පවති, දෙදෙනාට දුක් පිණිස ද නො පවති. මේ වාක්කර්මය කුසල, සුව වඩනේ යෑ. සුඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තෙපි මෙබඳු වාක්කර්මය කරව.

කත්වාපි තෙ රාහුල වාචාය කම්මං තදෙව තෙ වචීකම්මං පච්චවෙක්ඛිතබ්බං : යන්නු ඛො අහං ඉදං වාචාය කම්මං අකාසිං, ඉදමෙම වචීකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති.[1] පරබ්‍යාබාධායපි සංවත්තති. උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං අකාසිං, ඉදමෙම වචීකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං වචීකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල වචීකම්මං සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු දෙසෙතබ්බං, විවරිතබ්බං උත්තානීකාතබ්බං. දෙසෙත්වා විවරිත්වා උත්තානීකත්වා ආයතිං සංවරං ආපජ්ජිතබ්බං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං වාචාය කම්මං අකාසිං, ඉදමෙම වචීකම්මං නෙවත්තබ්‍යාබාධාය සංවත්තති. න පරබ්‍යාබාධාය සංවත්තති, න උභයබ්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං වචීකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. තෙනෙව ත්වං රාහුල පීතිපාමුජ්ජෙන විහරෙය්‍යාසි අහො රත්තානුසික්ඛී කුසලෙසු ධම්මෙසු.

යදෙව ත්වං රාහුල මනසා කම්මං කත්තුකාමො අහොසි.[2] තදෙව තෙ මනොකම්මං පච්චවෙක්ඛිතබ්බං : යන්නු ඛො අහං ඉදං මනසා කම්මං කත්තුකාමො, ඉදමෙම මනොකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, පරබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, උභයබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං මනසා කම්මං කත්තුකාමො, ඉදමෙම මනොකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, පරබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය, උභයබ්‍යාබාධායපි සංවත්තෙය්‍ය අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල මනසා කම්මං සසක්කං න කරණීයං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො පන අහං ඉදං මනසා කම්මං කත්තුකාමො, ඉදං මෙ මනොකම්මං නෙවත්තබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, න පරබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, න උභයබ්‍යාබාධාය සංවත්තෙය්‍ය, කුසලං ඉදං මනොකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. එවරූපං තෙ රාහුල මනසා කම්මං කරණීයං.

කරොන්තෙනාපි තෙ රාහුල මනසා කම්මං තදෙව තෙ මනොකම්මං පච්චවෙක්ඛිතබ්බං : යන්නු ඛො අහං ඉදං මනසා කම්මං කරොමි, ඉදමෙම මනොකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං මනසා කම්මං කරොමි, ඉදමෙම මනොකම්මං අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති, අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. පටිසංහරෙය්‍යාසි ත්වං රාහුල එවරූපං මනොකම්මං.

---

1. සංවත්තති - PTS 2. හොසි - සීමු.

රාහුලයෙනි, තොප විසින් බසින් කර්‍මය කොට ද තොපගේ එ මැ වාක්කර්‍මය පිරික්සිය යුතු යැ : "මම් බසින් යම් කර්‍මයක් කෙළෙම් ද මාගේ මේ වාක්කර්‍මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ වාක්කර්‍මය අකුසල, දුක් වඩනේ යැ, දුක්ඛවිපාක ඇතැ"යි. ඉදින් රාහුලයෙනි, තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් බසින් යම් කර්‍මයක් කෙළෙම් ද මාගේ මේ වාක්කර්‍මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ වාක්කර්‍මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් මෙබඳු වාක්කර්‍මය ශාස්තෘන් කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි හෝ දෙසියයුතු යැ, විවරණය කළයුතු යැ, හෙළිකළ යුතු යැ, දේශනා කොට විවරණය කොට හෙළි කොට ආයතිසංවරයට පැමිණියයුතු. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් බසින් යම් කර්‍මයක් කෙළෙම් ද මාගේ මේ වාක්කර්‍මය තමහට දුක් පිණිස ද නො මැ පවති, පරහට දුක් පිණිස ද නො පවති, දෙදෙනාට දුක් පිණිස ද නො පවති. මේ වාක්කර්‍මය කුසල, සුව වඩනේ යැ සුඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තෙපි එ මැ ප්‍රීතිප්‍රමෝද්‍යයෙන් කුසල්දහම්හි දවරය හික්මෙමින් වාසය කරව.

රාහුලයෙනි, තෙපි මනසින් යම් මැ කර්‍මයක් කරනු කැමැති වවු ද, තොප විසින් එ මැ මනඃකර්‍මය පිරික්සියයුතු යැ : "මම මනසින් යම් කර්‍මයක් කරනු කැමැතියෙම් ද මාගේ මේ මනඃකර්‍මය තමහට දුක් පිණිස ද පවත්නේ යැ, පරහට දුක් පිණිස ද පවත්නේ යැ දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යැ. මේ මනඃකමය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛ-විපාක ඇතැ"යි. රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම මනසින් යම් කර්‍මයක් කරනු කැමැතියෙම් ද මාගේ මේ මනඃ කර්‍මය තමහට දුක් පිණිස ද පවත්නේ යැ, පරහට දුක් පිණිස ද පවත්නේ යැ. දෙදෙනාට දුක් පිණිස ද පවත්නේ යැ. මේ මනඃකර්‍මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් මනසින් මෙබඳු කර්‍ම ඒකාන්තයෙන් නො කටයුතු. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම මනසින් යම් කර්‍මයක් කරනු කැමැතියෙම ද මාගේ මේ මනඃකර්‍මය තමහට දුක් පිණිස ද නො මැ පවත්නේ යැ, පරහට දුක් පිණිස ද නො පවත්නේ යැ, දෙදෙනාට දුක් පිණිස ද නො පවත්නේ යැ, මේ මනඃකමය කුසල, සුව වඩනේ යැ, සුඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තොප විසින් මනසින් මෙබඳු කර්‍ම කටයුතු.

රාහුලයෙනි, තොප මනසින් කර්‍ම කරනුවන් විසිනුදු තොපගේ එ මැ මනඃකමය පිරික්-සියයුතු යැ : "මම් මනසින් යම් කර්‍මයක් කෙරෙම් ද මාගේ මේ මනඃකර්‍මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ මනඃකර්‍මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ"යි. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් මනසින් යම් කර්‍මයක් කෙරෙම් ද මාගේ මේ මනඃකර්‍මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති, මේ මනඃකර්‍මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ"යි. රාහුලයෙනි, තෙපි මෙබඳු

සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි : යං ඛො අහං ඉදං මනසා කම්මං කරොමි. ඉදමෙම මනොකම්මං නෙවත්ත-ව්‍යාබාධාය සංවත්තති, න පරව්‍යාබාධාය සංවත්තති, න උභයව්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං මනොකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. අනු-පදජ්ජෙය්‍යාසි ත්වං රාහුල එවරූපං මනොකම්මං.

කත්වාපි තෙ රාහුල මනසා කම්මං තදෙව තෙ මනොකම්මං පච්චවෙක්ඛිතබ්බං: යන්නු ඛො අහං ඉදං මනසා කම්මං අකාසිං. ඉදමෙම මනොකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යාබාධායපි සංවත්තති,[1] අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති. සචෙ ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං මනසා කම්මං අකාසිං. ඉදමෙම මනොකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තති, පරව්‍යාබාධායපි සංවත්තති, උභයව්‍යා-බාධායපි සංවත්තති, අකුසලං ඉදං මනොකම්මං දුක්ඛුද්‍රයං දුක්ඛවිපාකන්ති එවරූපෙ[2] තෙ රාහුල මනොකම්මෙ[3] අට්ටියිතබ්බං, හරායිතබ්බං, ජිගුච්ඡිතබ්බං, අට්ටියිත්වා හරායිත්වා ජිගුච්ඡිත්වා ආයතිං සංවරං ආපජ්ජිතබ්බං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි: යං ඛො අහං ඉදං මනසා කම්මං අකාසිං. ඉදමෙම මනොකම්මං නෙවත්තව්‍යාබාධාය සංවත්තති, න පරව්‍යාබාධාය සංවත්තති, න උභයව්‍යාබාධාය සංවත්තති, කුසලං ඉදං මනොකම්මං සුඛුද්‍රයං සුඛවිපාකන්ති. තෙනෙව ත්වං රාහුල පීතිපාමුජ්ජෙන විහරෙය්‍යාසි අහොරත්තානුසික්ඛී කුසලෙසු ධම්මෙසු.

යෙ හි කෙචි රාහුල අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා කායකම්මං පරිසොධෙසුං, වචීකම්මං පරිසොධෙසුං, මනොකම්මං පරිසොධෙසුං, සබ්බෙ තෙ එවමෙවං පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායකම්මං පරිසොධෙසුං. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වචීකම්මං පරිසොධෙසුං. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනොකම්මං පරිසොධෙසුං.

යෙහිපි කෙචි රාහුල අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා කායකම්මං පරිසොධෙස්සන්ති, වචීකම්මං පරිසොධෙස්සන්ති, මනොකම්මං පරිසොධෙස්සන්ති, සබ්බෙ තෙ එවමෙවං පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායකම්මං පරිසොධෙස්සන්ති. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වචීකම්මං පරිසොධෙස්සන්ති. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනොකම්මං පරිසොධෙස්සන්ති.

යෙහිපි කෙචි රාහුල එතරහි සමණා වා බ්‍රහ්මණා වා කායකම්මං පරිසොධෙන්ති, වචීකම්මං පරිසොධෙන්ති, මනොකම්මං පරිසොධෙන්ති, සබ්බෙ තෙ එවමෙවං පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායකම්මං පරිසොධෙන්ති. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වචීකම්මං පරිසොධෙන්ති. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනොකම්මං පරිසොධෙන්ති.

---

1. සංවත්තතීති - සීමු. සංවත්තති - PTS
2. එවරූපං පන - මජසං. එවරූපං පන - ස්‍යා.
3. මනොකම්මං - මජසං.

මනෝකර්මය නො කරව. තවද රාහුලයෙනි, ඉදින් තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : "මම් මනසින් යම් කර්මයක් කෙරෙම් ද මාගේ මේ මනෝකර්මය තමහට දුක් පිණිස නො මැ පවති, පරහට දුක් පිණිස නො පවති, දෙදෙනාට දුක් පිණිස නො පවති, මේ මනෝකර්මය කුසල, සුව වඩනේ යැ, සුඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තෙපි මෙබඳු මනෝකර්මය කරව.

රාහුලයෙනි, තොප විසින් මනසින් කර්මය කොට ද තොපගේ එ මැ මනෝකර්මය පිරික්සියයුතු යැ : ''මම මනසින් යම් කර්මයක් කෙළෙම් ද, මාගේ මේ මනෝකර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ මනෝකර්මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ''යි. ඉදින් රාහුලයෙනි, තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : මම් මනසින් යම් කර්මයක් කෙළෙම් ද මාගේ මේ මනෝකර්මය තමහට දුක් පිණිස ද පවති, පරහට දුක් පිණිස ද පවති, දෙදෙනාට දුක් පිණිස ද පවති. මේ මනෝකර්මය අකුසල, දුක් වඩනේ යැ, දුඃඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි තොප විසින් මෙසේ මනෝකර්මයෙහි පීඩිත වියයුතු යැ ලජ්ජා වියයුතු යැ ජුගුප්සා ඉපැදවියයුතු යැ. පීඩිත වැ ලජ්ජිත වැ ජුගුප්සා කොට ආයතිසංවරයට පැමිණියයුතු යැ. තවද රාහුලයෙනි, ඉදින්-තෙපි පිරික්සන්නාහු මෙසේ දන්නාහු ද : ''මම මනසින් යම් කර්මයක් කෙළෙම් ද මාගේ මේ මනෝකර්මය තමහට දුක් පිණිස ද නො මැ පවති, පරහට දුක් පිණිස ද නො පවති, දෙදෙනාට දුක් පිණිස ද නො පවති. මේ මනෝකර්මය කුසල, සුව වඩනේ යැ සුඛවිපාක ඇතැ''යි. රාහුලයෙනි, තෙපි එ මැ ප්‍රීතිප්‍රමෝද්‍යයෙන් කුසල්දහම්හි දවරැය හික්මෙමින් වාසය කරව.

රාහුලයෙනි, අතීතකාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් වේවයි බ්‍රාහ්මණ කෙනෙක් වේවයි කායකර්ම පිරිසුදු කළාහු නම් වාක්කර්මය පිරිසුදු කළාහු නම් මනෝකර්මය පිරිසුදු කළාහු නම් එහැමදෙන මෙසෙයින් මැ පිරික්ස පිරික්සා කායකර්මය පිරිසුදු කළාහු යැ පිරික්ස පිරික්සා වාක්කර්මය පිරිසුදු කළාහු යැ පිරික්ස පිරික්සා මනෝකර්මය පිරිසුදු කළාහු යැ.

රාහුලයෙනි, අනාගතකාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් වේවයි බ්‍රාහ්මණ කෙනෙක් වේවයි කායකර්මය පිරිසුදු කරන්නාහු නම් වාක්කර්මය පිරිසුදු කරන්නාහු නම් මනෝකර්මය පිරිසුදු කරන්නාහු නම් එහැමදෙන මෙසෙයින් මැ පිරික්ස පිරික්සා කායකර්මය පිරිසුදු කරන්නාහු යැ පිරික්ස පිරික්සා වාක්කර්මය පිරිසුදු කරන්නාහු යැ පිරික්ස පිරික්සා මනෝකර්මය පිරිසුදු කරන්නාහු යි.

රාහුලයෙනි, මෙකල්හි යම් කිසි ශ්‍රමණ කෙනෙක් වේවයි බ්‍රාහ්මණ කෙනෙක් වේවයි කායකර්මය පිරිසුදු කෙරෙත් ද වාක්කර්මය පිරිසුදු කෙරෙත් ද මනෝකර්මය පිරිසුදු කෙරෙත් ද එහැමදෙන මෙසෙයින් මැ පිරික්සපිරික්සා කායකර්මය පිරිසුදු කෙරෙති පිරික්ස පිරික්සා වාක්කර්මය පිරිසුදු කෙරෙති, පිරික්සපිරික්සා මනෝකර්මය පිරිසුදු කෙරෙත්.

තස්මාතිහ රාහුල, පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායකම්මං පරිසොධෙස්සාම[1] පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වචීකම්මං පරිසොධෙස්සාම.[1] පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනොකම්මං පරිසොධෙස්සාමාති[2] එවං හි වො[3] රාහුල සික්ඛිතබ්බන්ති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා රාහුලො භගවතො භාසිතං අභිනන්දීති.

අම්බලට්ඨික රාහුලොවාද සුත්තං පඨමං.

---

1. පරිසොධෙස්සාමි - මජසං. ස්‍යා.
2. පරිසොධෙස්සාමීති - මජසං. ස්‍යා.
3. එවං හි තෙ - මජසං. ස්‍යා.

එහෙයින් රාහුලයෙනි, මෙහි පිරික්සපිරික්සා කායකර්මය පිරිසුදු කරම්හ, පිරික්ස පිරික්සා වාක්කර්මය පිරිසුදු කරම්හ. පිරික්ස පිරික්සා මනඃකර්මය පිරිසුදු කරම්හ'යි රාහුලයෙනි, තොප විසින් මෙසේ මැ හික්මියයුතු.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුසිත් ඇති රාහුලායුෂ්මත්හු භාග්‍යවතුන්ගේ භාෂිතයට සතුටු වූහ'යි.

පළමු වැනි අම්බලට්ඨිකරාහුලෝවාදසූත්‍රය යි.

---

2. 2. 2.

මහාරාහුලොවාද සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. ආයස්මාපි ඛො රාහුලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. අථ ඛො භගවා අපලොකෙත්වා ආයස්මන්තං රාහුලං ආමන්තෙසි:

යං කිඤ්චි රාහුල රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං තං රූපං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බන්ති. රූපමෙව නු ඛො භගවා, රූපමෙව නු ඛො සුගතාති. රූපම්පි රාහුල, වෙදනාපි රාහුල, සඤ්ඤාපි රාහුල, සඞ්ඛාරාපි රාහුල, විඤ්ඤාණම්පි රාහුලාති.

අථ ඛො ආයස්මා රාහුලො 'කොන'ජ්ජ භගවතා සම්මුඛා ඔවාදෙන ඔවදිතො ගාමං පිණ්ඩාය පවිසිස්සතී'ති තතො පටිනිවත්තිත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අද්දසා ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං රාහුලං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. දිස්වාන ආයස්මන්තං රාහුලං ආමන්තෙසි: ආනාපානසතිං රාහුල භාවනං භාවෙහි. ආනාපානසති රාහුල භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

අථ ඛො ආයස්මා රාහුලො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච: කථං භාවිතා නු ඛො භන්තෙ ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

යං කිඤ්චි රාහුල අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං, සෙය්‍යථීදං: කෙසා ලොමා නඛා දන්තා තචො මංසං න්හාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං, අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා පඨවීධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවීධාතු යා ච බාහිරා පඨවීධාතු පඨවීධාතුරෙවෙසා. තං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවීධාතුයා නිබ්බින්දති. පඨවීධාතුයා චිත්තං විරාජෙති.

Free Distribution www.aathaapi.org

2. 2. 2

මහාරාහුලෝවාද සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් කලෙකැ භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැත්නුවරට පිඩු පිණිස වැඩිසේක. ආයුෂ්මත් රාහුලභද්‍රයෝ ද පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන භාග්‍යවතුන් වහන්සේ පසුපස නුහුබන්හ. එකල්හි බුදුහු පෙරලා බලා ආයුෂ්මත් රාහුලභද්‍රයන් ඇමැතූහ : ''රාහුලය, ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි, යම් කිසි අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ රූපයෙක් ඇද්ද, දුරු වූ හෝ ළඟැ වූ හෝ යම් රූපයෙක් ඇද්ද එ හැම රූපය ''තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්මය නො වේ'' යයි තෙල මෙසේ තත් වූ පරිදි සම්‍යග්ඥනයෙන් දක්කයුතු යයි වදළහ. 'රූපය මැ ද භාග්‍යවතුන් වහන්ස, රූපය මැ ද භාග්‍යවතුන් වහන්සැ'යි. රාහුලය, රූපයත් වේදනාවත් සංඥවත් සංස්කාරයෝත් විඥනයත් දක්ක යුතු යැ'යි.

එකල්හි ආයුෂ්මත් රාහුලභද්‍රයෝ කවරෙක් අද භාග්‍යවතුන් වහන්සේ විසින් හමුයෙහි අවවාදයෙන් අවවාද කරන ලද්දේ ගමට පිඩු පිණිස පිවිසියේ ඇද්ද'යි එයින් මැ නැවැති එක්තරා රුක්මුලෙකැ පලක් බැඳ කය සෘජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා හුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එක්තරා රුක්මුලෙකැ පලක් බැඳ කය සෘජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා හුන් ආයුෂ්මත් රාහුලභද්‍රයන් දුටහ. දැක ආයුෂ්මත් රාහුලභද්‍රයන් ඇමැතූහ : ''රාහුලයෙනි, ආනාපානසති භාවනාව වඩව. රාහුලයෙනි, වඩනලද පුනපුනා වඩනලද ආනාපානසතිය මහත්ඵල වෙයි, මහත් අනුසස් වේ''යයි.

ඉක්බිති ආයුෂ්මත් රාහුලභද්‍රයෝ සවස් වේලෙහි සමවතින් නැඟී සිටියාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාහුලභද්‍රයෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ : ''වහන්ස, කිසෙයින් වඩනලද, කිසෙයින් බහුල කරනලද ආනාපානසතිය මහත්ඵල වේ ද, මහත් අනුසස් වේ ද?යි.

රාහුලයෙනි, තමා පිළිබඳ වූ තමා නිසා හටගත් කර්කශ වූ තද බවට පැමිණි මහාභූතයන් නිසා හටගත් යම් කිසි රූපයෙක් වේ ද ඒ මෙසේ යැ : කෙස් ලොම් නිය දත් සිවි මස් නහර ඇට ඇටමිදුළු වකුගඩු හදමස් අක්මා දලබු බඩදිව පපුමස අතුණු අතුණුබහන් නො පැසුණු අහර පැසුණු අහර යන මෙ ද, තවද අන්‍ය වූ ත් තමා පිළිබඳ තමා නිසා හටගත් කර්කශ වූ තද බවට පැමිණි මහාභූතයන් නිසා හටගත් යම් කිසි රූපයෙකුත් ඇද්ද, රාහුලය, මේ ආධ්‍යාත්මික පෘථිවිධාතු යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික පෘථිවිධාතුවක් ඇද්ද, යම් බාහිර වූ පෘථිවිධාතුවකුත් ඇද්ද, තෙල පෘථිවි ධාතු මැ යි. ඒ පෘථිවිධාතුව ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ'' යයි තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥනයෙන් දක්කයුතු යැ. තෙල මෙසේ යථාභූත කොට සම්‍යග් ඥනයෙන් දැක පෘථිවිධාතුයෙහි උකටලී වෙයි, පෘථිවිධාතුයෙහි සිත් නො අලවයි.

Free Distribution www.aathaapi.org

කතමා ච රාහුල ආපොධාතු: ආපොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච රාහුල අජ්ඣත්තිකා අපොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං, සෙය්‍යථීදං: පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං, අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා ආපොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආපොධාතු, යා ච බාහිරා ආපොධාතු ආපොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අපොධාතුයා නිබ්බින්දති. ආපොධාතුයා චිත්තං විරාජෙති.

කතමා රාහුල තෙජොධාතු: තෙජොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච රාහුල අජ්ඣත්තිකා තෙජොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං, සෙය්‍යථීදං: යෙන ච සන්තප්පති, යෙන ච ජීරියති, යෙන ච පරිඩය්හති, යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති. යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං, අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා තෙජොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා තෙජොධාතු, යා ච බාහිරා තෙජොධාතු, තෙජොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා තෙජොධාතුයා නිබ්බින්දති. තෙජොධාතුයා චිත්තං විරාජෙති.

කතමා ච රාහුල වායොධාතු: වායොධාතු සියා අජ්ඣත්තිකා, සියා බාහිරා. කතමා ච රාහුල අජ්ඣත්තිකා වායොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං, සෙය්‍යථීදං: උද්ධඞ්ගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨසයා[1] වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා අස්සාසො පස්සාසො ඉති. යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං, අයං වුච්චති රාහුල අජ්ඣත්තිකා වායොධාතු යා චෙව ඛො පන අජ්ඣත්තිකා වායොධාතු, යා ච බාහිරා වායොධාතු, වායොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති. වායොධාතුයා චිත්තං විරාජෙති.

කතමා ච රාහුල ආකාසධාතු: ආකාසධාතු සියා අජ්ඣත්තිකා, සියා බාහිරා. කතමා ච රාහුල අජ්ඣත්තිකා ආකාසධාතු: යං අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං උපාදින්නං, සෙය්‍යථීදං කණ්ණච්ඡිද්දං නාසච්ඡිද්දං මුඛද්වාරං, යෙන ච අසිතපීතඛායිතසායිතං අජ්ඣොහරති යත්ථ ච අසිතපීතඛායිතසායිතං සන්තිට්ඨති, යෙන ච අසිතපීතඛායිතසායිතං අධොභාගා[2] නික්ඛමති. යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං උපාදින්නං[3] අයං වුච්චති රාහුල

---

1. කොට්ඨාසයා - මජ්සං
2. අධොභාගං - මජ්සං.
3. අඝං අඝගතං විවරං විවරගතං අසම්ඵුට්ඨං මංසලොහිතෙහි උපාදින්නං - මජ්සං. ස්‍යා.

Free Distribution www.aathaapi.org

රාහුලය, ආපොධාතු කවර යත් "ආපොධාතු ආධ්‍යාත්මික ද වන්නී යැ බාහිර ද වන්නී යැ. රාහුලය, ආධ්‍යාත්මික ආපොධාතු කවර යත් : තමා පිළිබඳ වූ තමා අයත් වූ යම් ආපයෙක් ආපොගතයෙක් උපාදින්න වූ ස්‍රුෂභාවලක්ෂණයෙක් ඇද්ද, ඒ කෙසේ යැ යත් : පිත, සෙම, පූයා යැ ලෙහෙ යැ සෝදිය යැ මේදතෙල ,කඳුළු යැ වුරුණුතෙල, කෙළ යැ මුකුණු යැ සඳමිදුළු යැ මූ යැ යන මේ යි. තමා පිළිබඳ වූ තමා අයත් වූ යම් කිසි අන්‍ය වූත් ආපයෙක් ආපොගතයෙක් උපාදින්න වූ ස්‍රුෂභාව ලක්ෂණයෙක් ඇද්ද, රාහුලය, මේ ආධ්‍යාත්මික ආපොධාතු යයි කියනු ලැබේ. තවද යම් ආධ්‍යාත්මික ආපෝධාතුයෙක් ඇද්ද, යම් බාහිර ආපෝධාතුයෙකුත් ඇද්ද, තෙලෙ ආපෝධාතු මැ යි. ඒ ආපෝධාතුව "තෙලෙ මාගේ නො වෙයි තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්මය නො වේ" යයි තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දක්කයුතු යැ. තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දුන ආපෝධාතුයෙහි උකටලි වෙයි. ආපොධාතුයෙහි සිත් නො අලවයි.

රාහුලයෙනි, තේජෝධාතු කවර යත් : තේජෝධාතු ආධ්‍යාත්මික ද වන්නී යැ බාහිර ද වන්නී යැ. රාහුලයෙනි, ආධ්‍යාත්මික තේජෝධාතු කවර යත් : තමා පිළිබඳ වූ තමා අයත් වූ තේජසෙක් තේජෝගතයෙක් උපාදින්න වූ යම් තේජසෙක් වේ ද, ඒ මෙසේ යැ : (කිපුණු) යම් තේජෝගතයෙකින් මෙ කය තැවේ ද, යම් තේජසෙකින් මෙ කය දිරා ද, යම් තේජසෙකින් මෙ කය දැවේ ද, යමෙකින් බුදිනලද පානය කරනලද, කනලද රසවිඳිනලද ආහාරය (රස රක්තාදි විසින්) පරිණාමයට යේ ද, (එ ද), තවද අන්‍ය වූත් තමා පිළිබඳ වූ තමා අයත් තේජසෙක් තේජෝගතයෙක් උපාදින්න වූ යම් තේජසෙක් වේ ද, රාහුලයෙනි, මේ ආධ්‍යාත්මික තේජෝධාතු යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික තේජෝධාතුවක් වේ ද, යම් බාහිර තේජෝධාතුවකුත් වේ ද, මේ තේජෝධාතු මැ යි. ඒ තේජෝධාතුව 'තෙල මා ගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මා ගේ ආත්මය නො වේ'. යයි තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥානයෙන් දක තේජෝ ධාතුයෙහි උකටලි වෙයි. තේජෝධාතුයෙහි සිත් නො අලවයි.

රාහුලයෙනි, වායෝධාතු කවර යත්; වායෝධාතු ආධ්‍යාත්මික ද වන්නී යැ බාහිර ද වන්නී යැ, රාහුලයෙනි, ආධ්‍යාත්මික වායෝධාතු කවර යත් : අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ වායුවෙක් වායෝගතයෙක් උපාදින්න වූ වායුවෙක් වේ ද, ඒ කෙසේ යැ යත් : උඩට නැඟෙන වාත යැ, යටට බස්නා වාත යැ, අතුණින් බැහැර පවත්නා. වාත යැ, අතුණු තුළ පවත්නා වාත යැ, අඟපසඟ සරනා වාත යැ, ආශ්වාස යැ, ප්‍රශ්වාස යැ යන මොහු යි. යළි අන්‍ය වූත් කිසි අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ වායුවෙක් වායෝගතයෙක් උපාදින්න වායුවෙක් ඇද්ද, රාහුලයෙනි, මේ ආධ්‍යාත්මික වායෝධාතු යයි කියනුලැබේ. තවද යම් ආධ්‍යාත්මික වායෝධාතුවක් වේ ද, යම් බාහිර වායෝධාතුවකුත් වේ ද, තෙල වායෝධාතු මැ යැ, ඒ වායෝධාතුව 'තෙල මා ගේ නො වෙයි, තෙලෙ මම් නොවෙමි. තෙලෙ මා ගේ ආත්මය නො වේ යයි තෙල මෙසේ ඇති සැටියෙන් සම්‍යග්ඥානයෙන් දක්ක යුතු යැ තෙල මෙසේ සම්‍යග්ඥානයෙන් දක වායොධාතුයෙහි උකටලි වෙයි, වායෝධාතුයෙහි සිත් නො අලවයි.

රාහුලයෙනි, ආකාශධාතු කවර යත් : ආකාශධාතු ආධ්‍යාත්මික ද වන්නී යැ බාහිර ද වන්නී යැ, රාහුලයෙනි, ආධ්‍යාත්මික ආකාශධාතු කවර යත් : තමා පිළිබඳ වූ තමා අයත් වූ ආකාශයෙක් ආකාශගතයෙක් උපාදින්න වූ ආකාශයෙක් වේ ද, ඒ මෙසේ යැ : කන්සිදු යැ නැහැසිදු යැ මුවදොර යැ යමෙකින් අසිතපීත ඛායිතසායිතය ඇතුළත ප්‍රවෙශ කෙරේ ද, යම් අවකාශයෙකැ අසිතපීතඛායිතසායිතය පිහිටාසිටී ද යමක් කරණ කොට අසිතපීතඛායිත සායිතය අධොභාගයෙන් නික්මේ ද (එතැන් ද,) යළි අන්‍ය වූත් යම් කිසි අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ ආකාශයෙක් ආකාශගතයෙක් උපාදින්නයෙක් වේ ද,

අජ්ඣත්තිකා ආකාසධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආකාසධාතු යා ච බාහිරා ආකාසධාතු, ආකාසධාතුරෙවෙසා. තං 'නෙතං මම, නෙ'සොහමස්මි. න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආකාසධාතුයා නිබ්බින්දති. ආකාසධාතුයා චිත්තං විරාජෙති.

පඨවිසමං රාහුල භාවනං භාවෙහි, පඨවිසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති. සෙය්‍යථාපි රාහුල පඨවියා සුචිම්පි නික්ඛිපන්ති, අසුචිම්පි නික්ඛිපන්ති, ගූථගතම්පි නික්ඛිපන්ති, මුත්තගතම්පි නික්ඛිපන්ති, ඛෙළගතම්පි නික්ඛිපන්ති, පුබ්බගතම්පි නික්ඛිපන්ති, ලොහිතගතම්පි නික්ඛිපන්ති. න ච තෙන පඨවි අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො ත්වං රාහුල පඨවිසමං භාවනං භාවෙහි. පඨවිසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති.

ආපොසමං රාහුල භාවනං භාවෙහි, ආපොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති. සෙය්‍යථාපි රාහුල ආපස්මිං සුචිම්පි ධොවන්ති, අසුචිම්පි ධොවන්ති, ගූථගතම්පි ධොවන්ති, මුත්තගතම්පි ධොවන්ති, ඛෙළගතම්පි ධොවන්ති, පුබ්බගතම්පි ධොවන්ති, ලොහිතගතම්පි ධොවන්ති. න ච තෙන ආපො අට්ටීයති වා, හරායති වා, ජිගුච්ඡති වා. එවමෙව ඛො ත්වං රාහුල ආපොසමං භාවනං භාවෙහි. -පෙ- ඨස්සන්ති.

තෙජොසමං රාහුල භාවනං භාවෙහි, තෙජොසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති. සෙය්‍යථාපි රාහුල තෙජො සුචිම්පි ඩහති[1] අසුචිම්පි ඩහති, ගූථගතම්පි ඩහති, මුත්තගතම්පි ඩහති, ඛෙළගතම්පි ඩහති, පුබ්බගතම්පි ඩහති. ලොහිතගතම්පි ඩහති. න ච තෙන තෙජො අට්ටීයති වා, හරායති වා, ජිගුච්ඡති වා. එවමෙව ඛො ත්වං රාහුල තෙජොසමං භාවනං භාවෙහි. —පෙ— ඨස්සන්ති.

වායොසමං රාහුල භාවනං භාවෙහි, වායොසමං හි තෙ රාහුල භාවනං භාවයතො[2] උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති. සෙය්‍යථාපි රාහුල වායො සුචිම්පි උපවායති, අසුචිම්පි උපවායති, ගූථගතම්පි උපවායති, මුත්තගතම්පි උපවායති, ඛෙළගතම්පි උපවායති, පුබ්බගතම්පි උපවායති, ලොහිතගතම්පි උපවායති. න ච තෙන වායො අට්ටීයති වා, හරායති වා, ජිගුච්ඡති වා. එවමෙව ඛො ත්වං රාහුල වායොසමං භාවනං භාවෙහි. —පෙ— ඨස්සන්ති.

ආකාසසමං රාහුල භාවනං භාවෙහි. ආකාසසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපාමනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති, සෙය්‍යථාපි රාහුල ආකාසො න කත්ථචි පතිට්ඨිතො, එවමෙව ඛො ත්වං රාහුල ආකාසසමං භාවනං භාවෙහි. ආකාසසමං හි තෙ රාහුල භාවනං භාවයතො උප්පන්නා මනාපා'මනාපා ඵස්සා චිත්තං න පරියාදය ඨස්සන්ති.

---

1. දහති - මජසං. 2. චිත්තං භාවයතො - PTS.

රාහුලයෙනි, මේ ආධ්‍යාත්මික ආකාශධාතු යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික ආකාශ ධාතුවක් වේ ද, යම් බාහිර ආකාශධාතුවකුත් වේ ද, තෙල ආකාශධාතු මැ යැ. ඒ ආකාශ ධාතුව 'තෙල මා ගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි. තෙලෙ මා ගේ ආත්මය නො වේ'යයි තෙල මෙසේ යථාභූත කොට සම්‍යග්ඥනයෙන් දක්ක යුතු යැ. තෙල මෙසේ සම්‍යග්ඥානයෙන් දක ආකාශධාතුයෙහි උකටලී වෙයි. ආකාශධාතුයෙහි සිත් නො අලවයි.

රාහුලයෙනි, පෘථිවිය හා සම කොට බවුන් වඩව. රාහුලයෙනි, පෘථිවිය සම කොට බවුන් වඩන තොප ගේ සිතැ උපන් ඉෂ්ටානිෂ්ට වූ ස්පර්ශයෝ සිත හාත්පසින් මැඩගෙන නො සිටුනාහ. රාහුලයෙනි, යම්සේ පෘථිවියෙහි පවිත්‍ර දයත් බහාලත් ද, අපවිත්‍ර දයත් බහාලත් ද, ගූථයත් බහාලත් ද, මූත්‍රයත් බහාලත් ද, කෙළත් බහාලත් ද, පූයාත් බහාලත් ද ලොහිතයත් බහාලත් ද එයින් පෘථිවිය නො ද පෙළෙයි නො ද ලජ්ජිත වෙයි නො ද පිළිකුල් කෙරෙයි. එසෙයින් මැ රාහුලයෙනි, තෙපි පෘථිවිය සම කොට බවුන් වඩව, රාහුලයෙනි, යම් හෙයෙකින් පෘථිවි සම කොට බවුන් වඩන තොප ගේ සිතැ උපන් ඉෂ්ටානිෂ්ට වූ ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො 'සිටිත් ද (එහෙයිනි).

රාහුලයෙනි, ආපය සම කොට බවුන් වඩව. රාහුලයෙනි, ආපය සම කොට බවුන් වඩන තොප ගෙ සිත උපන් ඉෂ්ටානිෂ්ට වූ ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො සිටුනාහ. රාහුලයෙනි, යම්සේ ආපයෙහි පවිත්‍රයත් අපවිත්‍රයත් දෙවිත් ද ගූථයත් දෙවිත් ද මූත්‍රයත් දෙවිත් ද කෙළත් දෙවිත් ද පූයාත් දෙවිත් ද ලෙයත් දෙවිත් ද එයින් ආපය නො ද පෙළේ ද නො ද ලජ්ජිත වේ ද නො ද පිළිකුල් කෙරේ ද එසෙයින් මැ රාහුලයෙනි, තෙපි ආපය සම කොට බවුන් වඩව . . . . නො සිටිත් ද (එහෙයිනි).

රාහුලයෙනි, තේජස් සම කොට බවුන් වඩව. තේජස් සම කොට බවුන් වඩන තොප ගේ සිතැ උපන් මනාප වූ ද අමනාප වූ ද ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො සිටුනාහ. රාහුලයෙනි, යම්සේ තේජස පවිත්‍රයත් දවා ද අපවිත්‍රයත් දවා ද ගූථයත් දවා ද මූත්‍රයත් දවා ද කෙළත් දවා ද පූයාත් දවා ද ලෙයත් දවා ද එයින් තේජස නො ද පෙළේ ද නො ද ලජ්ජිත වේ ද නො ද පිළිකුල් කෙරේ ද එසෙයින් මැ රාහුලයෙනි, තෙපි තේජස් සම කොට බවුන් වඩව . . . නො සිටිත් ද (එහෙයිනි).

රාහුලයෙනි, වායු සම කොට බවුන් වඩව, රාහුලයෙනි, වායෝධාතු සම කොට බවුන් වඩන තොප ගේ සිතැ උපන් ඉෂ්ටානිෂ්ට වූ ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො සිටුනාහ. යම්සේ වායුව පවිත්‍රය කරාත් හමා ද අපවිත්‍රය කරාත් හමා ද ගූථය කරාත් හමා ද මූත්‍රය කරාත් හමා ද ඛෙළය කරාත් හමා ද පූයා කරාත් හමා ද ලෙහෙය කරාත් හමා ද එයින් වායුව නො ද පෙළේ ද නො ද ලජ්ජිත වේ ද නො ද පිළිකුල් කෙරේ ද, එසෙයින් මැ රාහුලයෙනි, තෙපි වායු සම කොට බවුන් වඩව. . . . . නො සිටිත් ද (එහෙයිනි).

රාහුලයෙනි, ආකාශය සම කොට බවුන් වඩව. ආකාශය සම කොට බවුන් වඩන තොප සිත උපන් මනාප වූ ද අමනාප වූ ද ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො සිටුනාහ. රාහුලයෙනි, යම්සේ අහස කිසි තැනෙක නො පිහිටියේ වේ ද, එසෙයින් මැ රාහුලයෙනි, තෙපි අහස සම කොට බවුන් වඩව. අහස සම කොට බවුන් වඩන තොප සිත උපන් ඉෂ්ටානිෂ්ට ස්පර්ශයෝ හාත්පසින් මැඩගෙන නො සිටිත්,

මෙත්තං රාහුල භාවනං භාවෙහි. මෙත්තං හි තෙ රාහුල භාවනං භාවයතො යො ව්‍යාපාදො සො පහීයිස්සති. කරුණං රාහුල භාවනං භාවෙහි. කරුණං හි තෙ රාහුල භාවනං භාවයතො යා විහෙසා සා පහීයිස්සති. මුදිතං රාහුල භාවනං භාවෙහි. මුදිතං හි තෙ රාහුල භාවනං භාවයතො යා අරති සා පහීයිස්සති. උපෙක්ඛං රාහුල භාවනං භාවෙහි. උපෙක්ඛං හි තෙ රාහුල භාවනං භාවයතො යො පටිඝො සො පහීයිස්සති.

අසුභං රාහුල භාවනං භාවෙහි. අසුභං හි තෙ රාහුල භාවනං භාවයතො යො රාගො සො පහීයිස්සති. අනිච්චසඤ්ඤං රාහුල භාවනං භාවෙහි. අනිච්චසඤ්ඤං හි තෙ රාහුල භාවනං භාවයතො යො අස්මිමානො සො පහීයිස්සති.

ආනාපානසතිං[1] රාහුල භාවනං භාවෙහි. ආනාපානසති රාහුල[2] භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච රාහුල ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ රාහුල භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති, සතො පස්සසති, දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, සමාදහං

---

1. ආනාපානස්සතිං - මජසං.
2. ආනාපානස්සති හි තෙ රාහුල - මජසං.

Free Distribution www.aathaapi.org

රාහුලයෙනි, මෛත්‍රීභාවනා වඩව. රාහුලයෙනි, මෛත්‍රීභාවනා වඩන තොප ගේ යම් ව්‍යාපාදයෙක් වේ නම් එය ප්‍රහීණ වන්නේ යැ, රාහුලයෙනි, කරුණාභාවනා වඩව. රාහුලයෙනි, කරුණාභාවනා වඩන තොප ගේ යම් විහිංසාවක් වේ ද, එය ප්‍රහීණ වන්නේ යැ. රාහුලයෙනි, මුදිතාභාවනා වඩව. රාහුලයෙනි, මුදිතාභාවනා වඩන තොප ගේ යම් (ප්‍රාන්තසෙනාසනයන්හි හා අධිකුශල ධර්මයන්හි) උකටලිබවෙක් වේ ද, එය ප්‍රහීණ වන්නේ යැ, රාහුලයෙනි, උපේක්ෂාභාවනා වඩව. රාහුලයෙනි, උපේක්ෂාභාවනා වඩන තොපට යම් ප්‍රතිඝයෙක් වේ නම් එය ප්‍රහීණ වන්නේ යැ.

රාහුලයෙනි, අශුභභාවනා වඩව. රාහුලයෙනි, අශුභභාවනා වඩන තොපට යම් රාගයෙක් වේ නම් එය ප්‍රහීණ වන්නේ යැ, රාහුලයෙනි, අනිත්‍යසංඥ වඩව. රාහුලයෙනි, අනිත්‍යසංඥා වඩන තොපට යම් අස්මිමානයෙක් වේ නම් එය ප්‍රහීණ වන්නේ යැ.

රාහුලයෙනි, ආනාපානසති භාවනා වඩව, රාහුලයෙනි, වඩනලද පුනපුනා වඩනලද ආනාපානසතිය මහත්ඵල වෙයි. මහත් අනුසස් ඇති වෙයි. රාහුලයෙනි, කිසෙයින් වඩනලද බහුල කරන ලද ආනාපානසතිය මහත්ඵල වේ ද මහත් අනුසස් ඇති වේ ද? රාහුලයෙනි, මෙ සස්නෙහි මහණ වනසෙනසුනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශුන්‍යාගාරයට ගියේ හෝ පලක් බැඳ කය සෘජු කොට තබා සිහිය කර්මස්ථානාභිමුඛ කොට එළවා හිඳියි. හේ සිහි ඇති වැ ආශ්වාස කෙරෙයි, සිහි ඇති වැ ප්‍රශ්වාස කෙරෙයි, දීඝ කොට හෝ ආශ්වාස කරන්නේ 'දීඝ කොට ආශ්වාස කෙරෙමි' දනියි. දීඝ කොට හෝ ප්‍රශ්වාස කරන්නේ 'දීඝ කොට ප්‍රශ්වාස කෙරෙමි' දනියි. හ්‍රස්ව කොට හෝ ආශ්වාස කරන්නේ 'හ්‍රස්ව කොට ආශ්වාස කෙරෙමි' දනියි. හ්‍රස්ව කොට හෝ ප්‍රශ්වාස කරන්නේ 'හ්‍රස්ව කොට ප්‍රශ්වාස කෙරෙමි' දනියි. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. ආශ්වාස ප්‍රශ්වාස කය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ආශ්වාස ප්‍රශ්වාස කය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. සුඛය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. සුඛය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. චිත්තසංස්කාරයන් ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. චිත්තසංස්කාරයන් ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. චිත්තසංස්කාරයන් සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. චිත්තසංස්කාරයන් සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි. ධ්‍යාන චිත්තය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ධ්‍යානචිත්තය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. සිත ප්‍රමුදිත කෙරෙමින් ආශ්වාස කරන් නෙමි හික්මෙයි. සිත ප්‍රමුදිත කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි. සිත මොනොවට

චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො රාහුල ආනාපානසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. එවං භාවිතාය ඛො රාහුල ආනාපානසතියා එවං බහුලීකතාය යෙපි තෙ චරිමකා අස්සාසපස්සාසා[1] තෙපි විදිතාව නිරුජ්ඣන්ති නො අවිදිතාති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා රාහුලො භගවතො භාසිතං අභිනන්දීති.

මහාරාහුලොවාදසුත්තං දුතියං.

---

1. අස්සාසා - මජසං.

පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. සිත මොනොවට පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. කෙලෙසුන් කෙරෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. කෙලෙසුන් කෙරෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. අනිත්‍ය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. අනිත්‍ය අනුව බලමින් ප්‍රශ්වාස කරන්-නෙමි' හික්මෙයි. විරාගය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. විරාගය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. කෙල්ශනිරෝධය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. කෙල්ශනිරෝධය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. ප්‍රතිනිස්සර්ගය (විදර්ශනාව හා මාර්ගය) අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ප්‍රතිනිස්සර්ගය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. රාහුලයෙනි, මෙසේ වඩනලද මෙසේ පුනපුනා වඩනලද ආනාපානසතිය මහත් ඵල වෙයි, මහත් අනුසස් ඇති වෙයි. රාහුලයෙනි, ආනාපානසතිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි යම් පශ්චිම ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් ඇද්ද, ඔහු ද ප්‍රකට වූවාහු මැ නිරුද්ධ වෙති, අප්‍රකට වූවාහු නිරුද්ධ නො වෙත්.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් රාහුලභද්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනා කළහ'යි.

දෙ වැනි මහාරාහුලොවාදසුත්‍ර යි.

2. 2. 3

චූළමාලුඞ්ක්‍ය සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මතො මාලුඞ්ක්‍යපුත්තස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: යානි'මානි දිට්ඨිගතානි භගවතා අබ්‍යාකතානි ඨපිතානි පටික්ඛිත්තානි. සස්සතො ලොකො ඉතිපි, අසස්සතො ලොකො ඉතිපි, අන්තවා ලොකො ඉතිපි, අනන්තවා ලොකො ඉතිපි, තං ජීවං තං සරීරං ඉතිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉතිපි, හොති තථාගතො පරම්මරණා ඉතිපි, න හොති තථාගතො පරම්මරණා ඉතිපි, හොති ච න ච හොති තථාගතො පරම්මරණා ඉතිපි, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉතිපි, තානි මෙ භගවා න බ්‍යාකරොති. යානි මෙ භගවා න බ්‍යාකරොති, තමෙම න රුච්චති, තමෙම න ඛමති, සො'හං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡිස්සාමි. සචෙ මෙ භගවා බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා එවා'හං භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි. නො චෙ මෙ භගවා බ්‍යාකරොති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා—පෙ— නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, එවාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමීති.

අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවන්තං එතදවොච:

ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: යානිමානි දිට්ඨිගතානි භගවතා අබ්‍යාකතානි ඨපිතානි පටික්ඛිත්තානි: සස්සතො ලොකො ඉතිපි, අසස්සතො ලොකො ඉතිපි—පෙ—නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉතිපි, තානි මෙ භගවා න බ්‍යාකරොති. යානි මෙ භගවා න බ්‍යාකරොති, තමෙම න රුච්චති, තමෙම න ඛමති. සොහං භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡිස්සාමි. සචෙ මෙ භගවා බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා—පෙ—නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, එවාහං භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි. නො චෙ මෙ භගවා බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා—පෙ— නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, එවාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමීති.

Free Distribution www.aathaapi.org

2. 2. 3

චූලමාලුඞ්ක්‍ය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන නම් අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි එකලා වූ විවේකයෙන් හුන් ආයුෂ්මත් චූළමාලුඞ්ක්‍ය තෙරුනට මෙසේ සිතට විතර්කයෙක් උපන. භාග්‍යවතුන් විසින් : "ලෝකය ශාශ්වත යයි ද ලෝකය අශාශ්වත යයි ද ලෝකය අන්තවත් යයි ද ලෝකය අනන්තවත් යයි ද එ මැ ජීව යැ එ මැ ශරීර යයි ද ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි ද සත්ත්ව තෙම මරණින් මතු වේ යයි ද සත්ත්ව තෙම මරණින් මතු නො වේ යයි ද සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් වෙයි නො වන්නේත් වේ යයි ද සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි. නො වන්නේ නො වේ යයි ද"යි යම් දෘෂ්ටිගත කෙනෙක් ප්‍රකාශ නො කරන ලද්දහු ද තබනලද්දහු ද ප්‍රතික්ෂෙප කරන ලද්දහු ද ඒ දෘෂ්ටිගතයන් බුදුහු මට ප්‍රකාශ නො කෙරෙති. යම් දෘෂ්ටිගත කෙනකුන් බුදුහු මට ප්‍රකාශ නො කෙරෙත් නම් එය මට නො රිසි වෙයි. එය මට නො කැමැති වෙයි. මම බුදුන් කරා එළැඹ මෙ කරුණ පුළුවුස්නෙමි. ඉදින් මට බුදුහු : "ලෝකය ශාශ්වත යැ හෝ ලෝකය අශාශ්වත යැ හෝ ලෝකය අන්තවත් යැ හෝ ලෝකය අනන්තවත් යැ හෝ එ මැ ජීව යැ එ මැ ශරීරයැ යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්ව තෙම මරණින් මතු වෙයි හෝ සත්ත්ව තෙම මරණින් මතු නො වෙයි හෝ සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් වෙයි නො වන්නේත් වෙයි හෝ සත්ත්ව තෙම මරණින් මතු නො මැ වන්නේත් නො ද නො වන්නේත් වෙයි හෝ ප්‍රකාශ කෙරෙත් නම් මෙසෙයින් මම බුදුන් කෙරෙහි බඹසර වෙසෙමි. ඉදින් මට බුදුහු : "ලෝකය ශාශ්වත යැ හෝ ලෝකය අශාශ්වත යැ හෝ . . . . සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වෙයි හෝ ප්‍රකාශ නො කෙරෙත් නම් මෙසෙයින් මම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට වැටෙමි"

ඉක්බිති ආයුෂ්මත් මාලුඞ්ක්‍ය පුත්‍ර, සවස් වේලෙහි විවේකයෙන් නැඟිටියේ බුදුන් කරා එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙල කී යැ :

"වහන්ස, මෙහි එකලා වැ විවේකයෙන් හුන් මාගේ සිතට මෙබඳු විතර්කයෙක් උපන. "ලෝකය ශාශ්වත යයි ද ලෝකය අශාශ්වත යයි ද . . . සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ යයි ද යම් දෘෂ්ටිගත කෙනෙක් භාග්‍යවතුන් විසින් ප්‍රකාශ නො කරන ලද්දහු ද තබන ලද්දහු ද ප්‍රතික්ෂෙප කරන ලද්දහු ද ඒ දෘෂ්ටිගතයන් බුදුහු මට ප්‍රකාශ නො කෙරෙති. බුදුහු යම් දෘෂ්ටිගත කෙනකුන් මට ප්‍රකාශ නො කෙරෙත් ද එය මට නො රිසි වෙයි. එය මට නො කැමැති වෙයි. මම බුදුන් කරා එළැඹ මෙකරුණ පුළුවුස්නෙමි. ඉදින් මට බුදුහු : "ලෝකය ශාශ්වත යැයි හෝ ලෝකය අශාශ්වත යයි හෝ . . . . සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නොවේ යයි හෝ ප්‍රකාශ කෙරෙත් නම් මෙසෙයින් මම බුදුන් කෙරෙහි බඹසර වෙසෙමි. ඉදින් මට බුදුහු : 'ලොකය ශාශ්වත යයි හෝ ලොකය අශාශ්වත යයි හෝ . . . . සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ යයි හෝ ප්‍රකාශ නො කෙරෙත් නම් මෙසෙයින් මම ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට වැටෙමි'යි.

Free Distribution www.aathaapi.org

සචෙ භගවා ජානාති, 'සස්සතො ලොකො'ති, සස්සතො ලොකොති මෙ භගවා බ්‍යාකරොතු. සචෙ භගවා ජානාති, 'අසස්සතො ලොකො'ති අසස්සතො ලොකොති මෙ භගවා බ්‍යාකරොතු. නො චෙ භගවා ජානාති, 'සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා, අජානතො ඛො පන අපස්සතො එතදෙව උජුකං හොති යදිදං, 'න ජානාමි න පස්සාමී'ති.

සචෙ භගවා ජානාති 'අන්තවා ලොකො'ති. අන්තවා ලොකොති මෙ භගවා බ්‍යාකරොතු. සචෙ භගවා ජානාති 'අනන්තවා ලොකො'ති. අනන්තවා ලොකොති මෙ භගවා බ්‍යාකරොතු. නො චෙ භගවා ජානාති 'අන්ත වා ලොකො'ති වා අනන්ත වා ලොකොති වා. අජානතො ඛො පන අපස්සතො එතදෙව උජුකං හොති යදිදං 'න ජානාමි න පස්සාමී'ති.

සචෙ භගවා ජානාති 'තං ජීවං තං සරීර'න්ති. තං ජීවං තං සරීරන්ති මෙ භගවා බ්‍යාකරොතු. සචෙ භගවා ජානාති 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති මෙ භගවා බ්‍යාකරොතු. නො චෙ භගවා ජානාති 'තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති වා, අජානතො ඛො පන අපස්සතො එතදෙව උජුකං හොති යදිදං 'න ජානාමි න පස්සාමී'ති.

සචෙ භගවා ජානාති 'හොති තථාගතො පරම්මරණා'ති. හොති තථාගතො පරම්මරණාති මෙ භගවා බ්‍යාකරොතු. සචෙ භගවා ජානාති 'න හොති තථාගතො පරම්මරණා'ති. න හොති තථාගතො පරම්මරණාති මෙ භගවා බ්‍යාකරොතු. නො චෙ භගවා ජානාති හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා අජානතො ඛො පන අපස්සතො එතදෙව උජුකං හොති යදිදං 'න ජානාමි න පස්සාමී'ති.

සචෙ භගවා ජානාති 'හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති. හොති ච න ච හොති තථාගතො පරම්මරණාති මෙ භගවා බ්‍යාකරොතු. සචෙ භගවා ජානාති 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති. නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති මෙ භගවා බාකරොතු. නො චෙ භගවා ජානාති හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, අජානතො ඛො පන අපස්සතො එතදෙව උජුකං හොති, යදිදං න ජානාමි න පස්සාමී'ති.

කින්නු[1] තාහං මාලුඞ්ක්‍යපුත්ත එවං අවචං: එහි ත්වං මාලුඞ්ක්‍යපුත්ත මයි බ්‍රහ්මචරියං චර, අහන්තෙ බ්‍යාකරිස්සාමි: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා —පෙ— නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. — නො හෙතං භන්තෙ. ත්වං වා පන මං එවං අවච: අහං භන්තෙ භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි, භගවා මෙ බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා—පෙ— නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති නො හෙතං භන්තෙ.

1. කින්නු ඛො - ස්‍යා.

ඉදින් බුදුහු 'ලෝකය ශාශ්වත යැ'යි දනිත් නම් 'ලෝකය ශාශ්වත යැ'යි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : 'ලෝකය අශාශ්වත යැ'යි දනිත් නම් 'ලෝකය අශාශ්වත යැ'යි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ''ලෝකය ශාශ්වත යැ'යි හෝ 'ලෝකය අශාශ්වත යැ'යි හෝ නො දන්නාහු නම් නො දන්නාහට නො දක්නාහට වැළිත් 'නො දන්මි නො දක්මි, යන තෙල වදන් මැ සෘජු වෙයි.

ඉදින් බුදුහු : ''ලොකය අන්තවත් යැ'යි දනිත් නම් 'ලෝකය අන්තවත් යැ'යි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : 'ලෝකය අනන්තවත් යැ'යි දනිත් නම් 'ලෝකය අනන්තවත් යැ'යි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : 'ලෝකය අන්තවත් යැ'යි හෝ 'ලෝකය අනන්තවත් යැ'යි හෝ නො දන්නාහු නම් නො දන්නාහට නො දක්නාහට වැළිත් 'නො දන්මි නො දක්මි, යන තෙල වදන් මැ සෘජු වෙයි.

ඉදින් බුදුහු : එ මැ ජීව යැ එ මැ ශරීර යැ'යි දනිත් නම් බුදුහු මට 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ'යි ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි දනිත් නම් බුදුහු මට : 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු 'එමැ ජීව යැ එ මැ ශරීර යැ'යි හෝ ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි හෝ නො දන්නාහු නම් නො දන්නාහට නො දක්නාහට වැළිත් 'නො දන්මි නො දක්මි, යන තෙල වදන් මැ සෘජු වෙයි.

ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු වේ''යයි දනිත් නම් ''සත්ත්ව තෙම මරණින් මතු වේ'' යයි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු නො වේ''යයි දනිත් නම් සත්ත්ව තෙම මරණින් මතු නො වේ''යයි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු වෙයි හෝ සත්ත්ව තෙම මරණින් මතු නො වෙයි හෝ නො දන්නාහු නම් නො දන්නාහට නො දක්නාහට වැළිත් 'නො දන්මි නො දක්මි' යන තෙල වදන් මැ සෘජු වෙයි.

ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො වන්නේත් වේ'' යයි දනිත් නම් ''සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො වන්නේත් වේ''යයි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ''යයි දනිත් නම් ''සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ''යයි බුදුහු මට ප්‍රකාශ කෙරෙත්වා. ඉදින් බුදුහු : ''සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො ද වන්නේත් වෙයි හෝ 'සත්ත්ව තෙම මරණින් මතු නොමැ වෙයි නො ද නො වෙයි හෝ නො ද දන්නාහු නම් නො දන්නාහට නො දක්නාහට 'නො දන්මි නොදක්මි, යන තෙල වදන් මැ සෘජු වේ''යයි.

මාලුඞ්ක්‍යපුත්‍රයෙනි, කිම තට මම මෙසේ කීයෙම් ද : ''එව මාලුඞ්ක්‍යපුත්‍රයෙනි, තෙපි මා කෙරෙහි බඹසර වෙසෙව මම තොපට ''ලෝකය ශාශ්වත යැ'යි හෝ 'ලෝකය අශාශ්වත යැ'යි හෝ . . . 'සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නොවෙයි හෝ ප්‍රකාශ කෙරෙමි'' යයි. වහන්ස, තෙල නො වේ මැ යැ. තවද තෙපි හෝ මට මෙසේ කීවහු ද : ''වහන්ස, මම බුදුන් කෙරෙහි බඹසර වෙසෙමි. බුදුහු මට : ''ලෝකය ශාශ්වත යැ'යි හෝ ලෝකය අශාශ්වත යැ'යි හෝ . . .'සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වෙයි හෝ ප්‍රකාශ කරත්තේ''යයි. වහන්ස, තෙල නො වේ මැ යැ.

ඉති කිර මාලුඞ්ක්‍යපුත්ත නෙවාහං තං වදාමි: එහි ත්වං මාලුඞ්ක්‍යපුත්ත මයි බ්‍රහ්මචරියං චර අහං තෙ බ්‍යාකරිස්සාමි: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. නපි කිර මං ත්වං වදෙසි: අහං භන්තෙ භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි භගවා මෙ බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. එවං සන්තෙ මොඝපුරිස කො සන්තො කං පච්චාචික්ඛසි.

සො ඛො මාලුඞ්ක්‍යපුත්ත එවං වදෙය්‍ය: න තාවාහං භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි, යාව මෙ භගවා න බ්‍යාකරිස්සති: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. අබ්‍යාකතමෙව තං මාලුඞ්ක්‍යපුත්ත තථාගතෙන අස්ස. අථ සො පුග්ගලො කාලං කරෙය්‍ය, සෙය්‍යථාපි මාලුඞ්ක්‍යපුත්ත පුරිසො සල්ලෙන විද්ධො අස්ස සවිසෙන ගාළ්හපලෙපනෙන. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨපෙය්‍යුං, සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි, යාව න තං පුරිසං ජානාමි, යෙනම්හි විද්ධො: ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වාති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං පුරිසං ජානාමි, යෙනම්හි විද්ධො: එවංනාමො එවංගොත්තො ඉතිවාති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං පුරිසං ජානාමි, යෙනම්හි විද්ධො දීඝො වා රස්සො වා මජ්ඣිමො වාති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි යාව න තං පුරිසං ජානාමි යෙනම්හි විද්ධො: කාළො වා සාමො වා මඞ්ගුරච්ඡවි වාති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි, යාව න තං පුරිසං ජානාමි, යෙනම්හි විද්ධො: අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වාති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි යාව න තං ධනුං ජානාමි, යෙනම්හි විද්ධො: යදි වා චාපො යදිවා කොදණ්ඩොති.

සො එවං වදෙය්‍ය: න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි, යාව න තං ජියං ජානාමි යායම්හි විද්ධො: යදි වා අක්කස්ස යදි වා සණ්ඨස්ස[1] යදි වා න්හාරුස්ස යද වා මරුවාය යදි වා ඛීරපණ්ණිනොති.

1. සණ්හස්ස - මජසං.

මෙසේ මාලුඞ්ක්‍යපුත්‍රය මම තොපට තො මැ කියෙම් නම් : "එව තෙපි මාලුඞ්ක්‍යපුත්‍රයෙනි, මා කෙරෙහි බඹසර වෙසෙව, මම් තොපට 'ලෝකය ශාශ්වත යැ'යි හෝ 'ලෝකය අශාශ්වත යැ'යි හෝ . . . . සත්ත්ව තෙම මරණින් මතු තො මැ වෙයි තො ද තො වේ යැ'යි හෝ ප්‍රකාශ කෙරෙමි යයි. තො ද මට තො කියෙහි නම් : "වහන්ස, මම් බුදුන් කෙරෙහි බඹසර වෙසෙමි, බුදුහු මට : "ලෝකය ශාශ්වත යැ'යි හෝ 'ලෝකය අශාශ්වත යැ'යි හෝ . . . . සත්ත්ව තෙම මරණින් මතු තො මැ වෙයි තො ද තො වේ යැ'යි හෝ ප්‍රකාශ කරන්නේ යැ"යි. මෙසේ ඇති කල්හි තුච්ඡපුරුෂය, (යාචිතක හෝ යාචක) කවරෙක් වූයෙහි (යාචිතක හෝ යාචක වූ) කවරක්හට ප්‍රකාශ කරන්නෙහි ද.

මාලුඞ්ක්‍යපුත්‍රය, යමෙක් මෙසේ කියා නම් : "යම් තාක් බුදුහු මට "ලෝකය ශාශ්වත යැ'යි හෝ 'ලෝකය අශාශ්වත යැ'යි හෝ . . . සත්ත්ව තෙම මරණින් මතු තො මැ වෙයි තො ද තො වේ"යයි හෝ ප්‍රකාශ තො කෙරෙත් නම් ඒතාක් මම් බුදුන් කෙරෙහි බඹසර තො වෙසෙමි" කියා නම් මාලුඞ්ක්‍යපුත්‍රය එය තථාගතයන් විසින් ප්‍රකාශ තො කරනලද මැ වන්නේ යැ. එකල්හි ඒ පුද්ගල කලුරිය කරන්නේ යැ යම්සේ මාලුඞ්ක්‍යපුත්‍රය, පුරුෂයෙක් බොල් කොට තැවැරූ විෂසහිත හියෙකින් විදුනාලද්දේ වන්නේ ද ඔහුගේ සගයහළුවෝ නෑසහලේනෑයෝ ශල්‍යවෛද්‍යයකු එළවන්නාහු නම් හේ මෙසේ කියන්නේ යැ :"ක්ෂත්‍රිය වේවයි බ්‍රාහ්මණ වේවයි වෛශ්‍ය වේවයි ශූද්‍ර වේවයි යමක්හු විසින් මම් විදුනාලදුයෙම් ද යම්තාක් ඒ පුරුෂයා තො දනිම් ද ඒ තාක් මම් මේ ශල්‍යය තො ගනිමි'යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමක්හු විසින් මම් විදුනාලදුයෙම් ද හේ මෙබඳු නම් ඇත්තේ යැ මෙබඳු ගෝත්‍ර ඇත්තේ යැ'යි යම් තාක් මම් ඒ පුරුෂයා තො දනිම් ද ඒ තාක් මම් මේ ශල්‍යය තො ගනිමි"යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමක්හු විසින් මම් විදුනාලදුයෙම් ද හේ දීඝ යැ හෝ හ්‍රස්ව යැ හෝ මධ්‍යම යැ හෝ යි ඒ පුරුෂයා යම්තාක් තො දනිම් ද ඒ තාක් මම් මේ ශල්‍යය තො ගනිමි"යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමක්හු විසින් මම විදුනාලදුයෙම් ද හේ කළු යැ හෝ සම්වන් යැ හෝ කබරසිවි ඇත්තේ යැ හො'යි ඒ පුරුෂයා යම්තාක් තො දනිම් ද ඒ තාක් මම් මේ ශල්‍යය තො ගනිමි"යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමක්හු විසින් මම් විදුනාලදුයෙම් ද හේ අසුවල්ගම්හි හෝ යැ නියම්ගම්හි හෝ යැ නුවරෙහි හෝ'යි ඒ පුරුෂයා යම්තාක් මම් තො දනිම ද ඒ තාක් මම් මේ ශල්‍ය තො ගනිමි' යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමෙකින් මම් විදුනාලදුයෙම් ද ඉදින් චාපයෙක් වේවයි ඉදින් කොදණ්ඩයෙක් වේවයි යම්තාක් මම් ඒ දුන්න තො දනිම ද ඒතාක් මම් මේ ශල්‍ය තො ගනිමි'යි.

හේ මෙසේ කියන්නේ යැ : "යමෙකින් මම් විදුනාලදුයෙම් ද ඉදින් වරාහුයින් කරනලද වේවයි ඉදින් හුණරැහැතින් කරනලද වේවයි ඉදින් නහරින් කරනලද වේවයි ඉදින් මරුවා (සණ) වැහැරින් කරනලද වේවයි ඉදින් කිරුපනින් කරනලද වේවයි යම් තාක් ඒ දුනුදිය තො දනිම් ද ඒ තාක් මම් මේ ශල්‍යය තො ගනිමි'යි.

සො එවං වදෙය්‍ය : න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං කණ්ඩං ජානාමි. යෙනම්හි විද්ධො : යදි වා කච්ඡං යදි වා රොපිමන්ති.

සො එවං වදෙය්‍ය : න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං කණ්ඩං ජානාමි යෙනම්හි විද්ධො : යස්ස පත්තෙහි වාජිතං, යදි වා ගිජ්ඣස්ස යදි වා කඞ්කස්ස යදි වා කුලලස්ස යදි වා මොරස්ස යදි වා සිථිලහනුනොති.

සො එවං වදෙය්‍ය : න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං කණ්ඩං ජානාමි. යෙනම්හි විද්ධො : යස්ස නහාරුනා[2] පරික්ඛිත්තං, යදි වා ගවස්ස යදි වා මහිසස්ස[2] යදි වා රොරුවස්ස. යදි වා සෙම්හාරස්සාති.

සො එවං වදෙය්‍ය : න තාවාහං ඉමං සල්ලං ආහරිස්සාමි. යාව න තං සල්ලං ජානාමි. යෙනම්හි විද්ධො : යදි වා සල්ලං යදි වා ඛුරප්පං යදි වා වෙකණ්ඩං යදි වා නාරාචං යදි වා වච්ඡදන්තං යදි වා කරවීරපත්තන්ති. අඤ්ඤාතමෙව තං මාලුඞ්ක්‍යපුත්ත තෙන පුරිසෙන අස්ස. අථ සො පුරිසො කාලං කරෙය්‍ය.

එවමෙව ඛො මාලුඞ්ක්‍යපුත්ත යො එවං වදෙය්‍ය : න තාවාහං භගවති බ්‍රහ්මචරියං චරිස්සාමි, යාව මෙ භගවා න බ්‍යාකරිස්සති : සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. අබ්‍යාකතමෙව තං මාලුඞ්ක්‍යපුත්ත තථාගතෙන අස්ස. අථ සො පුග්ගලො කාලං කරෙය්‍ය.

සස්සතො ලොකොති වා මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරිය-වාසො අභවිස්සාති. එවං නො. අසස්සතො ලොකොති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවම්පි නො. සස්සතො ලොකොති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති අසස්සතො ලොකොති වා දිට්ඨියා සති අත්ථෙව ජාති, අත්ථි ජරා, අත්ථි මරණං, සන්ති සොක-පරිදෙවදුක්ඛදොමනස්සුපායාසා යෙසාහං දිට්ඨෙව ධම්මෙ නිඝාතං පඤ්ඤපෙමි.

අන්තවා ලොකොති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවං නො. අනන්තවා ලොකොති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවම්පි නො. අන්තවා ලොකොති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති අනන්තවා ලොකොති වා දිට්ඨියා සති අත්ථෙව ජාති, අත්ථි ජරා, අත්ථි මරණං, සන්ති සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා යෙසා'හං දිට්ඨෙව ධම්මෙ නිඝාතං පඤ්ඤපෙමි.

2. නහාරුනා - මජසං. 2. මහිංසස්ස - මජසං.

හේ මෙසේ කියන්නේ යැ: "යමෙකින් මම විද්නාලදුයෙම ද ඉදින් කැසෙහි උපන් වේවයි රෝපණය කොට වඩනලද වේවයි යම්තාක් ඒ හීය නො දනිම ද ඒ තාක් මම මේ ශල්‍යය නො ගනිමි'යි.

හේ මෙසේ කියන්නේ යැ: "යමෙකින් මම විද්නාලදුයෙම ද ඉදින් ගිජුලිහිණියකු ගේ වේවයි ඉදින් ලොහොතුඩුවකුගේ වේවයි ඉදින් උකුසකුගේ වේවයි ඉදින් මොනරකුගේ වේවයි ඉදින් සිථිලහනු ලිහිණියකුගේ වේවයි යමක්හුගේ පතින් වෙග දනවන ලද ද ඒ හීය යම්තාක් නො දනිම ද ඒ තාක් මම මේ ශල්‍යය නො ගනිමි'යි.

හේ මෙසේ කියන්නේ යැ: "යමෙකින් මම විද්නාලදුයෙම ද ඉදින් ගවයකුගේ වේවයි ඉදින් මිහිවකුගේ වේවයි ඉදින් වලසකුගේ වේවයි ඉදින් වඳුරකු ගේ වේවයි යමකුගේ නහරින් වෙළන ලද නම් ඒ හීය යම් තාක් නො දනිම ද ඒ තාක් මම මේ ශල්‍යය නො ගනිමි"යි.

හේ මෙසේ කියන්නේ යැ: "යමෙකින් මම විද්නාලදුයෙම ද ඉදින් ශල්‍ය වේවයි ඉදින් ඛුරප්ප වේවයි ඉදින් වෙකණ්ඩ වේවයි ඉදින් නාරාච වේවයි ඉදින් වච්ඡදන්ත වේවයි ඉදින් කරවීරපත්‍ර වේවයි ඒ ශල්‍යය යම්තාක් නො දනිම ද ඒතාක් මම මේ ශල්‍යය නො ගනිමි'යි කියන්නේ නම්, මාලුඞ්ක්‍යපුත්‍රය, ඒ පුරුෂයා විසින් තෙලෙ නො දන්නාලද මැ වන්නේ ද ඉක්බිති එපුරිස් කලුරිය කරන්නේ යැ.

එසෙයින් මැ මාලුඞ්ක්‍යපුත්‍රය, යමෙක් මෙසේ කියා නම්: "යම්තාක් බුදුහු මට ලොකය ශාශ්වත යැ' හෝ 'ලෝකය අශාශ්වත යැ' හෝ .... සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වෙයි හෝ ප්‍රකාශ නො කෙරෙත් ද ඒ තාක් මම බුදුන් කෙරෙහි බඹසර නො වෙසෙමි"යි. මාලුඞ්ක්‍යපුත්‍රය, තථාගතයන් විසින් ඒ ප්‍රකාශ නො කරනලද මැ වෙයි. ඉක්බිති ඒ පුද්ගල තෙම කලුරිය කරන්නේ යැ.

මාලුඞ්ක්‍යපුත්‍රය, 'ලෝකය ශාශ්වත යැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි. එසේ නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, 'ලෝකය අශාශ්වත යැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේද'යි. එසේත් නැත. මාලුඞ්ක්‍යපුත්‍රය 'ලෝකය ශාශ්වත යැ' හෝ දෘෂ්ටිය ඇති කල්හි 'ලෝකය අශාශ්වත යැ' හෝ දෘෂ්ටිය ඇති කල්හි 'මම යම් ධර්මකෙනකුන්ගේ ඉහාත්මයෙහි මැ විනාශය පනවම් ද ඒ ජාතිය ඇත් මැ යැ ජරාව ඇත් මැ යැ මරණය ඇත් මැ යැ සොක පරිදෙව දුක්ඛදෙමනස්ස උපායාසයෝ ඇත්තාහු මැ යි.

මාලුඞ්ක්‍යපුත්‍රය, 'ලෝකය අන්තවත් යැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවායසයෙක් වන්නේ ද'යි එසේ නැත. 'ලෝකය අනන්තවත් යැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරිය වාසයෙක් වන්නේ ද'යි. එසේත් නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, 'ලෝකය අන්තවත් යැ'යි හෝ 'ලෝකය අනන්තවත් යැ'යි හෝ දෘෂ්ටිය ඇති කල්හි මම යම් ධර්ම කෙනකුන්ගේ ඉහාත්මයෙහි මැ විනාශය පනවම් නම් ඒ ජාතිය ඇත් මැ යැ. ජරාව ඇත් මැ යැ. මරණය ඇත් මැ යැ, සෝකපරිදෙව දුක්ඛදෙමනස්සඋපායාසයෝ ඇත්තාහු මැ යි.

තං ජීවං තං සරීරන්ති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවං නො. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති මලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවම්පි නො. තං ජීවං තං සරීරන්ති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා දිට්ඨියා සති අත්ථෙව ජාති, අත්ථි ජරා, අත්ථි මරණං, සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා යෙසාහං දිට්ඨෙව ධම්මෙ නිඝාතං පඤ්ඤපෙමි.

හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවං නො. න හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවම්පි නො. හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති. න හොති තථාගතො පරම්මරණාති වා දිට්ඨියා සති අත්ථෙව ජාති, අත්ථි ජරා, අත්ථි මරණං, සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසා. යෙසා'හං දිට්ඨෙව ධම්මෙ නිඝාතං පඤ්ඤපෙමි.

හොති ච න ච හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවං නො. නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවම්පි නො. හොති ච න ච හොති තථාගතො පරම්මරණාති මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨියා සති නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා දිට්ඨියා සති අත්ථෙව ජාති අත්ථි ජරා, අත්ථි මරණං, සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, යෙසා'හං දිට්ඨෙව ධම්මෙ නිඝාතං පඤ්ඤපෙමි.

තස්මාතිහ මාලුඞ්ක්‍යපුත්ත අබ්‍යාකතඤ්ච මෙ අබ්‍යාකතතො ධාරෙථ. බ්‍යාකතඤ්ච මෙ බ්‍යාකතතො ධාරෙථ. කිඤ්ච මාලුඞ්ක්‍යපුත්ත මයා අබ්‍යාකතං: සස්සතො ලොකොති මලුඞ්ක්‍යපුත්ත මයා අබ්‍යාකතං, අසස්සතො ලොකොති මයා අබ්‍යාකතං, අන්තවා ලොකොති මයා අබ්‍යාකතං, අනන්තවා ලොකොති මයා අබ්‍යාකතං, තං ජීවං තං සරීරන්ති මයා අබ්‍යාකතං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති මයා අබ්‍යාකතං, හොති තථාගතො පරම්මරණාති මයා අබ්‍යාකතං, න හොති තථාගතො පරම්මරණාති මයා අබ්‍යාකතං, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති මයා අබ්‍යාකතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති මයා අබ්‍යාකතං කස්මා චෙතං මාලුඞ්ක්‍යපුත්ත මයා අබ්‍යාකතං: න හෙතං මාලුඞ්ක්‍යපුත්ත අත්ථසංහිතං, නාදිබ්‍රහ්මචරියකං, නෙතං[1] නිබ්බිදාය. න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා අබ්‍යාකතං.

1. න නිබ්බිදාය - PTS මජසං.

Free Distribution www.aathaapi.org

මාලුඞ්ක්‍යපුත්‍රය, එ මැ ජීවයැ එ මැ ශරීර යැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි, එසේ නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි. එසේත් නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, එ මැ ජීව යැ එ මැ ශරීර යැ හෝ දෘෂ්ටිය ඇති කල්හි ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ යි හෝ දෘෂ්ටිය ඇති කල්හි "මම යම ධර්ම කෙනකුන්ගේ ඉහාත්මයෙහි මැ විනාශය පනවම් නම් ඒ ජාතිය ඇත් මැ යැ ජරාව ඇත් මැ යැ, මරණය ඇත් මැ යැ, සෝකපරිදේව දුක්ඛදෞමනස්ස උපායාසයෝ ඇත්තාහු මැ යි.

මාලුඞ්ක්‍යපුත්‍රය, 'සත්ත්ව තෙම මරණින් මතු වේ යයි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි. එසේ නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, 'සත්ත්ව තෙම මරණින් මතු නො වේ යයි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි. එසේත් නැත. මාලුඞ්ක්‍යපුත්‍රය, 'සත්ත්ව තෙම මරණින් මතු වෙයි හෝ දෘෂ්ටිය ඇති කල්හි 'සත්ත්ව තෙම මරණින් මතු නො වෙයි හෝ දෘෂ්ටිය ඇති කල්හි මම යම ධර්ම කෙනකුන්ගේ ඉහාත්මයෙහි මැ විනාශය පනවම් නම් ඒ ජාතිය ඇත් මැ යැ ජරාව ඇත් මැ යැ, මරණය ඇත් මැ යැ සෝකපරිදෙවදුක්ඛදෞමනස්සඋපායාසයෝ ඇත්තාහු මැ යි.

මාලුඞ්ක්‍යපුත්‍රය, 'සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො ද වන්නේත් වේ යයි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි. එසේ නො වෙයි. මාලුඞ්ක්‍යපුත්‍රය, සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ යයි දෘෂ්ටිය ඇති කල්හි බ්‍රහ්මචරියවාසයෙක් වන්නේ ද'යි, එසේ නො වෙයි. මාලුඞ්ක්‍යපුත්‍රය, සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො ද වන්නේත් වේ යයි දෘෂ්ටිය ඇති කල්හි හෝ සත්ත්ව තෙම නො මැ වෙයි නො ද නො වේ යයි දෘෂ්ටිය ඇති කල්හි හෝ මම යම කෙනකුන්ගේ ඉහාත්මයෙහි මැ විනාශය පනවම් ද ඒ ජාතිය ඇත් මැ යැ ජරාව ඇත් මැ යැ මරණය ඇත් මැ යැ සොක පරිදෙවදුක්ඛදෞමනස්ස උපායාසයෝ ඇත්තාහු මැ යි.

එහෙයින් මාලුඞ්ක්‍යපුත්‍රය, මෙහි මා විසින් ප්‍රකාශ නො කරනලද්ද ද ප්‍රකාශ නො කරනලද හෙයින් දරන්නේ යැ. මා විසින් ප්‍රකාශ කරනලද්ද ද ප්‍රකාශ කරනලද හෙයින් දරන්නේ යැ. මාලුඞ්ක්‍යපුත්‍රය, වැළිත් මා විසින් කුමක් අව්‍යාකෘත ද? මාලුඞ්ක්‍යපුත්‍රය, 'ලොකය ශාශ්වත යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'ලෝකය අශාශ්වත යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'ලෝකය අන්තවත් යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'ලෝකය අනන්තවත් යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ'යි මා විසින් අව්‍යාකෘත යැ. සත්ත්ව තෙම මරණින් මතු වන්නේ යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'සත්ත්ව තෙම මරණින් මතු නො වන්නේ යැ'යි මා විසින් අව්‍යාකෘත යැ. 'සත්තව තෙම මරණින් මතු වන්නේත් නො ද වන්නේත් වේ යයි මා විසින් අව්‍යාකෘත යැ. 'සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි නො ද නො වේ' යයි මා විසින් අව්‍යාකෘත යැ. මාලුඞ්ක්‍යපුත්‍රය, කුමක් හෙයින් මෙතෙලෙ මා විසින් නොපනවන ලද යත් : මාලුඞ්ක්‍යපුත්‍රය, මෙතල අර්ථසංහිත නො වෙයි. මහබඹසරට ආදි වූ ශීලමාත්‍ර ද නො වෙයි. මෙසෙයින් ඒ නිර්වේදය පිණිස නො වෙයි විරාගය පිණිස නො වෙයි. නිරොධය පිණිස නො වෙයි. ව්‍යුපශම පිණිස නො වෙයි. අභිඥ පිණිස නො වෙයි. සම්බොධිය පිණිස නො වෙයි. නිර්වාණය පිණිස නො පවතී, එහෙයින් මා විසින් ඒ අව්‍යාකෘත වේ.

Free Distribution www.aathaapi.org

කිඤ්ච මාලුඞ්ක්‍යපුත්ත මයා බ්‍යාකතං: ඉදං දුක්ඛන්ති මාලුඞ්ක්‍යපුත්ත මයා බ්‍යාකතං, අයං දුක්ඛසමුදයොති මයා බ්‍යාකතං, අයං දුක්ඛනිරොධොති මයා බ්‍යාකතං, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති මයා බ්‍යාකතං. කස්මා චෙතං මාලුඞ්ක්‍යපුත්ත මයා බ්‍යාකතං: එතඤ්හි මාලුඞ්ක්‍යපුත්ත අත්ථසංහිතං, එතං ආදිබ්‍රහ්මචරියකං එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා බ්‍යාකතං. තස්මාතිහ මාලුඞ්ක්‍යපුත්ත අබ්‍යාකතඤ්ච මෙ අබ්‍යාකතතො ධාරෙථ. බ්‍යාකතඤ්ච මෙ බ්‍යාකතතො ධාරෙථාති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

චූලමාලුඞ්ක්‍යසුත්තං තතියං.

මාලුඞ්ක්‍යපුත්‍රය, මා විසින් වැළිත් කිමෙක් ව්‍යාකෘත ද යත් : මාලුඞ්ක්‍යපුත්‍රය, 'මෙ දුකැ'යි මා විසින් ව්‍යාකෘත යැ. 'මෙ දුක්ඛසමුදය යැ'යි මා විසින් ව්‍යාකෘත යැ. 'මෙ දුක්ඛනිරොධ යැ'යි මා විසින් ව්‍යාකෘත යැ' 'මෙ දුක්ඛනිරොධ ගාමිනීප්‍රතිපද යැ'යි මා විසින් ව්‍යාකෘත යැ. මාලුඞ්ක්‍යපුත්‍රය, මා විසින් වැළිත් කුමක් හෙයින් තෙලෙ ව්‍යාකෘත ද යත් : මාලුඞ්ක්‍යපුත්‍රය යම් හෙයෙකින් තෙලෙ අර්ථසංහිත ද තෙලෙ මහබඹසරට ආදිවූ ශීලමාත්‍ර වේ ද මෙසෙයින් ඒ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස ව්‍යුපශම පිණිස අභිඥ පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස පවතී ද එහෙයින් ඒ මා විසින් ව්‍යාකෘත යැ. එහෙයින් මාලුඞ්ක්‍ය පුත්‍රය, මෙහි මා විසින් අව්‍යාකෘතය ද අව්‍යාකෘත හෙයින් දරන්නේ යැ. මා විසින් ව්‍යාකෘතය ද ව්‍යාකෘත හෙයින් දරන්නේ යයි.

බුදුහු මෙය වදළහ. සතුටුසිත් ඇති ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර භාග්‍යවතුන්ගේ භාෂිතයට සතුටු වී යයි.

තුන් වැනි චූලමාලුඞ්ක්‍යසූත්‍ර යි.

2. 2. 4

මහාමාලුඞ්ක්‍යසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: ධාරෙථ නො තුම්හෙ භික්ඛවෙ මයා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානීති.

එවං වුත්තෙ ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවන්තං එතදවොච: 'අහං ඛො භන්තෙ ධාරෙමි භගවතා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානී'ති, යථා කථං පන ත්වං මාලුඞ්ක්‍යපුත්ත ධාරෙසි මයා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානී'ති. සක්කායදිට්ඨිං ඛො අහං භන්තෙ භගවතා ඔරම්භාගියං සංයොජනං දෙසිතං ධාරෙමි, විචිකිච්ඡං ඛො අහං භන්තෙ භගවතා ඔරම්භාගියං සංයොජනං දෙසිතං ධාරෙමි, සීලබ්බතපරාමාසං ඛො අහං භන්තෙ භගවතා ඔරම්භාගියං සංයොජනං දෙසිතං ධාරෙමි, කාමච්ඡන්දං ඛො අහං භන්තෙ භගවතා ඔරම්භාගියං සංයොජනං දෙසිතං ධාරෙමි, බ්‍යාපාදං ඛො අහං භන්තෙ භගවතා ඔරම්භාගියං සංයොජනං දෙසිතං ධාරෙමි. එවං ඛො අහං භන්තෙ ධාරෙමි භගවතා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානීති.

කස්ස ඛො නාම ත්වං මාලුඞ්ක්‍යපුත්ත මයා එවං පඤ්චොරම්භාගියානි සංයොජනානි දෙසිතානි ධාරෙසි. නනු මාලුඞ්ක්‍යපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඉමිනා තරුණූපමෙන උපාරම්භෙන උපාරම්භිස්සන්ති. දහරස්ස හි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස සක්කායොතිපි න හොති. කුතො පනස්ස උප්පජ්ජිස්සති සක්කායදිට්ඨි. අනුසෙතිත්වෙවස්ස සක්කායදිට්ඨානුසයො.

දහරස්ස හි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස ධම්මාතිපි න හොති. කුතො පනස්ස උප්පජ්ජිස්සති ධම්මෙසු විචිකිච්ඡා, අනුසෙතිත්වෙවස්ස විචිකිච්ඡානුසයො,

දහරස්ස හි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස සීලාතිපි න හොති. කුතො පනස්ස උප්පජ්ජිස්සති සීලෙසු සීලබ්බතපරාමාසො. අනුසෙතිත්වෙවස්ස සීලබ්බතපරාමාසානුසයො.

දහරස්ස හි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස කාමාතිපි න හොති. කුතො පනස්ස උප්පජ්ජිස්සති කාමෙසු කාමච්ඡන්දො, අනුසෙතිත්වෙවස්ස කාමරාගානුසයො.

දහරස්ස හි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස සත්තාතිපි න හොති, කුතො පනස්ස උප්පජ්ජිස්සති සත්තෙසු බ්‍යාපාදො, අනුසෙතිත්වෙවස්ස බ්‍යාපාදානුසයො. නනු මාලුඞ්ක්‍යපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඉමිනා තරුණූපමෙන උපාරම්භෙන උපාරම්භිස්සන්තීති.

Free Distribution www.aathaapi.org

2. 2. 4

මහාමාලුඞ්ක්‍ය සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක් කලෙක බුදුහු සැවැත්නුවර නිසා ජෙතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහි දී බුදුහු 'මහණෙනි'යි භික්‍ෂූන් ඇමතූහ. ඒ භික්‍ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. බුදුහු මෙසේ වදළහ : ''මහණෙනි, තෙපි මා විසින් දෙසූ පඤ්චොරම්භාගිය සංයොජනයන් ධරවූ ද?''යි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කීහ : ''වහන්ස, මම භාග්‍යවතුන් වදළ පඤ්චොරම්භාගිය සංයොජන දරමි''යි. ''මාලුඞ්ක්‍යපුත්‍රය, කිසෙයින් තෙපි මා කී පඤ්චොරම්භාගිය සංයෝජන ධරවූ ද?''යි. ''වහන්ස, මම 'සක්කායදිට්ඨිය' බුදුන් වදළ ඕරම්භාගිය සංයෝජනයෙකැ'යි දරමි. වහන්ස මම 'විචිකිච්ඡාව' බුදුන් වදළ ඕරම්භාගිය සංයෝජනයෙකැ'යි දරමි. වහන්ස, 'මම සීලබ්බත පරාමාස'ය බුදුන් වදළ ඕරම්භාගිය සංයෝජනයෙකැ'යි දරමි. වහන්ස, මම 'කාමච්ඡන්දය' බුදුන් වදළ ඕරම්භාගිය සංයෝජනයෙකැ'යි දරමි. වහන්ස, මම 'ව්‍යාපාදය' බුදුන් වදළ ඕරම්භාගිය සංයෝජනයෙකැ'යි දරමි. වහන්ස, මම මෙසෙයින් බුදුන් වදළ පඤ්චොරම්භාගිය සංයෝජනයන් දරමි'යි කීහ.

මාලුඞ්ක්‍යපුත්‍රය, තෙපි මා විසින් මෙසේ පඤ්චොරම්භාගිය සංයෝජනයන් කවරක්හට දෙසනලද'යි ධරවූ ද? මාලුඞ්ක්‍යපුත්‍රය, අන්තොටු පිරිවැජියෝ මේ තරුණොපමා උපාරම්භ (නිග්‍රහපූර්වකදෝෂාරොපණ) යෙන් උපාරම්භ කරන්නාහු නො වෙත් ද? '' ''මාලුඞ්ක්‍යපුත්‍රය, උඩුහුරු වැ හෝනා වූ මුග්ධ වූ ළදරු කමරහට 'සක්කාය''යයි ද දැනුමෙක් නො වෙයි. ඔහට වැළිත් සත්කායදෘෂ්ටියෙක් කොයින් උපදනේ ද ඔහුට සත්කාය දෘෂ්ටි අනුශය වේ මැ යි.

මාලුඞ්ක්‍යපුත්‍රය, තරුණ වූ මුග්ධ වූ උඩුහුරු වැ හෝනා වූ කුමරහට 'ධර්මය' යන සිතෙකුදු නො වෙයි. ඔහට වැළිත් ධර්මයෙහි විචිකිත්සායෙක් කොයින් උපදනේ ද? ඔහට විචිකිත්සානුශය තෙමේ අනුශය වේ මැ යි.

මාලුඞ්ක්‍යපුත්‍රය, තරුණ වූ මුග්ධ වූ උඩුහුරු වැ හෝනා වූ කුමරහට 'ශීල' යයි සිතෙකුදු නො වෙයි. ඔහට වැළිත් ශීලයෙහි ශීලව්‍රතපරාමර්ශයෙක් කොයින් උපදනේ ද? ඔහට ශීලව්‍රතපරාමර්ශය තෙමේ අනුශය වේ මැ යැ.

මාලුඞ්ක්‍යපුත්‍රය, තරුණ වූ මුග්ධ වූ උඩුහුරු වැ හෝනා වූ කුමරහට 'කාම' යයි සිතෙකුදු නො වෙයි. ඔහට වැළිත් කාමයෙහි කාමච්ඡන්දය කොයින් උපදනේ ද? ඔහට කාමරාගානුශය තෙමේ අනුශය වේ මැ යැ.

මාලුඞ්ක්‍යපුත්‍රය. තරුණ වූ මුග්ධ වූ උඩුහුරු වැ හෝනා වූ කුමරහට 'සත්ත්ව' යයි සිතෙකුදු නො වෙයි. ඔහට වැළිත් සත්ත්වයන් කෙරෙහි ව්‍යාපාදයෙක් කොයින් උපදනේ ද? ඔහට ව්‍යාපාදානුශය තෙමේ අනුශය වේ මැ යි. මාලුඞ්ක්‍යපුත්‍රය, අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ මේ තරුණොපමඋපාරම්භයෙන් උපාරම්භ කරන්නාහු නො වෙත් ද'යි.

Free Distribution www.aathaapi.org

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා පඤ්චොරම්භාගියානි සංයොජනානි දෙසෙය්‍ය. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති, තෙන හානන්ද සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති. එවං භන්තෙති. ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

ඉධානන්ද අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, සක්කායදිට්ඨිපරියුට්ඨිතෙන චෙතසා විහරති සක්කායදිට්ඨිපරෙතෙන, උප්පන්නාය ච සක්කායදිට්ඨියා නිස්සරණං යථාභූතං නප්පජානාති. තස්ස සා සක්කායදිට්ඨි ථාමගතා අප්පටිවිනීතා ඔරම්භාගියං සංයොජනං, විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්ස සා විචිකිච්ඡා ථාමගතා අප්පටිවිනීතා ඔරම්භාගියං සඤ්ඤොජනං. සීලබ්බතපරාමාසපරියුට්ඨිතෙන චෙතසා විහරති සීලබ්බතපරාමාසපරෙතෙන, උප්පන්නස්ස ච සීලබ්බතපරාමාසස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. තස්ස සො සීලබ්බතපරාමාසො ථාමගතො අප්පටිවිනීතො ඔරම්භාගියං සංයොජනං. කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්ස සො කාමරාගො ථාමගතො අප්පටිවිනීතො ඔරම්භාගියං සංයොජනං. බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති බ්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, තස්ස සො බ්‍යාපාදො ථාමගතො අප්පටිවිනීතො ඔරම්භාගියං සංයොජනං.

සුතවා ච ඛො ආනන්ද අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො, න සක්කායදිට්ඨිපරියුට්ඨිතෙන චෙතසා විහරති න සක්කායදිට්ඨිපරෙතෙන, උප්පන්නාය ච සක්කායදිට්ඨියා නිස්සරණං යථාභූතං පජානාති, තස්ස සා සක්කායදිට්ඨි සානුසයා පහීයති[1]

න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති න විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති. තස්ස සා විචිකිච්ඡා සානුසයා පහීයති[1]

න සීලබ්බතපරාමාසපරියුට්ඨිතෙන චෙතසා විහරති න සීලබ්බතපරාමාසපරෙතෙන, උප්පන්නස්ස ච සීලබ්බතපරාමාසස්ස නිස්සරණං යථාභූතං පජානාති, තස්ස සො සීලබ්බතපරාමාසො සානුසයො පහීයති[1]

න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති න කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති, තස්ස සො කාමරාගො සානුසයො පහීයති[1]

න බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති න බ්‍යාපාදපරෙතෙන, උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං පජානාති, තස්ස සො බ්‍යාපාදො සානුසයො පහීයති[1].

---

1. පහීයිස්සති - සීමු.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ : "භාග්‍යවතුන් වහන්ස, යම් හෙයෙකින් බුදුහු පඤ්චඕරම්භාගියසංයෝජනයන් දෙසනසේක් නම් භාග්‍යවතුන් වහන්ස, එයට කලි. සුගතයන් වහන්ස, එයට කලි. භාග්‍යවතුන්ගේ දේශනාව අසා භික්ෂූහු ධරත්" යයි. එසේ වී නම් ආනන්දයෙනි. අසව, මොනොවට මෙනෙහි කරව, වදරමි'යි. 'එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදත් ඇස්වූහ. බුදුහු තෙල වදළහ.

ආනන්දයෙනි, මෙලොවැ අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ (බුදධාදි) ආර්‍ය්‍යයන් නො දක්නේ ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණේ සත්පුරුෂයන් නො දක්නේ සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූයේ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණේ සත්කායදෘෂ්ටියෙන් මඩනාලද සත්කායදෘෂ්ටිය අනුව ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් සත්කාය දෘෂ්ටියගේ ද නිස්සරණය (නිවන) ඇති සැටියෙන් නො දනී. ඔහට සත්කායදෘෂ්ටිය ස්ථිර බවට ගියා නො බැහැර කළා ඕරම්භාගිය සංයෝජන වෙයි. විචිකිත්සායෙන් මඩනාලද විචිකිත්සාව අනුව ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් විචිකිත්සාවගේ ද නිස්සරණය ඇති සැටියෙන් නො දනී. ඔහට ඒ විචිකිත්සාව ස්ථිර බවට ගියා නො බැහැර කළා ඕරම්භාගියසංයෝජන වෙයි. ශීලව්‍රතපරාමර්ශයෙන් මඩනාලද ශීලව්‍රතපරාමර්ශය අනුව ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ශීලව්‍රතපරාමර්ශයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් නො දනී. ඔහට ඒ ශීලව්‍රතපරාමර්ශය තෙමේ ස්ථිර බවට ගියේ නො බැහැර කෙළේ ඕරම්භාගියසංයෝජන වෙයි. කාමරාගයෙන් මඩනාලද කාමරාගය අනුව ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් කාමරාගයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් නො දනී. ඔහට ඒ කාමරාගය ස්ථිර බවට ගියේ නො බැහැර කෙළේ ඕරම්භාගියසංයෝජන වෙයි. ව්‍යාපාදයෙන් මඩනාලද ව්‍යාපාදය අනුව ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ව්‍යාපාදයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් නො දනී. ඔහට ඒ ව්‍යාපාදය ස්ථිර බවට ගියේ නො බැහැර කෙළේ ඕරම්භාගියසංයෝජන වේ.

තවද ආනන්දයෙනි, ශ්‍රැතවත් වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ (බුදධාදි) ආර්‍ය්‍යයන් දක්නේ ආර්‍ය්‍යධර්මයට නිපුණ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි මොනොවට හික්මුණේ සත්පුරුෂයන් දක්නේ සත්පුරුෂධර්මයට නිපුණ වූයේ සත්පුරුෂධර්මයෙහි මොනොවට හික්මුණේ සත්කායදෘෂ්ටියෙන් නො මඩනාලද සත්කායදෘෂ්ටි අනුගත නො වූ සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් සත්කායදෘෂ්ටියගේ ද නිස්සරණය ඇති සැටියෙන් දනියි. ඔහට ඒ සත්කායදෘෂ්ටිය අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ.

විචිකිත්සායෙන් නො මඩනාලද විචිකිත්සාව අනුව නො ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් විචිකිත්සාවගේ ද නිස්සරණය ඇති සැටියෙන් දකී. ඔහට ඒ විචිකිත්සාව අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ.

ශීලව්‍රතපරාමර්ශයෙන් නො මඩනාලද ශීලව්‍රතපරාමර්ශානුගත නො වූ සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ශීලව්‍රතපරාමර්ශයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් දනී. ඔහට ඒ ශීලව්‍රතපරාමර්ශය අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ.

කාමරාගයෙන් නො මඩනාලද, කාමාරාගානුගත නො වූ සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් කාමරාගයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් දනී. ඔහට ඒ කාමරාගය අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ.

ව්‍යාපාදයෙන් නො මඩනාලද ව්‍යාපාදය අනුව නො ගිය සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ව්‍යාපාදයාගේ ද නිස්සරණය ඇති සැටියෙන් දනී. ඔහට ඒ ව්‍යාපාදය අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ.

යො ආනන්ද මග්ගො යා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය; තං මග්ගං තං පටිපදං අනාගම්ම පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි ඤස්සති වා දක්ඛිති[1], වා පජහිස්සති[2] වාති නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි ආනන්ද මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො තචං අච්ඡෙත්වා ඵෙග්ගුං අච්ඡෙත්වා සාරච්ඡෙදො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. එවමෙව ඛො ආනන්ද යො මග්ගො යා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය තං මග්ගං තං පටිපදං අනාගම්ම පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි ඤස්සති වා දක්ඛිති[1] වා පජහිස්සති වාති නෙතං ඨානං විජ්ජති. යො ච ඛො ආනන්ද මග්ගො යා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානාය තං මග්ගං තං පටිපදං ආගම්ම පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි ඤස්සති වා දක්ඛිති[1] වා පජහිස්සති වාති ඨානමෙතං විජ්ජති සෙය්‍යථාපි ආනන්ද මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො තචං ඡෙත්වා ඵෙග්ගුං ඡෙත්වා සාරච්ඡෙදො භවිස්සතීති ඨානමෙතං විජ්ජති එවමෙව ඛො ආනන්ද යො මග්ගො යා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය තං මග්ගං තං පටිපදං ආගම්ම පඤ්චොරම්භාගියානි සංයොජනානි ඤස්සති වා දක්ඛිති වා පජහිස්සති වාති ඨානමෙතං විජ්ජති.

සෙය්‍යථාපි ආනන්ද ගඞ්ගා නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, අථ දුබ්බලකො පුරිසො ආගච්ඡෙය්‍ය අහං ඉමිස්සා ගඞ්ගාය නදියා තිරියං බාහාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගච්ඡාමී'ති[3]. සො න සක්කුණෙය්‍ය ගඞ්ගාය නදියා තිරියං බාහාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගන්තුං. එවමෙව ඛො ආනන්ද යස්ස කස්සචි සක්කායනිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. සෙය්‍යථාපි සො දුබ්බලකො පුරිසො එවමෙතෙ දට්ඨබ්බා.

සෙය්‍යථාපි ආනන්ද ගඞ්ගා නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. අථ බලවා පුරිසො ආගච්ඡෙය්‍ය අහං ඉමිස්සා ගඞ්ගාය නදියා තිරියං බාහාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගච්ඡාමී'ති.[3] සො සක්කුණෙය්‍ය ගඞ්ගාය නදියා තිරියං බාහාය සොතං ඡෙත්වා සොත්ථිනා පාරං ගන්තුං. එවමෙව ඛො ආනන්ද යස්ස කස්සචි සක්කායනිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. සෙය්‍යථාපි සො බලවා පුරිසො එවමෙතෙ දට්ඨබ්බා.

කතමො චානන්ද මග්ගො කතමා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය : ඉධානන්ද භික්ඛු උපධිවිවෙකා අකුසලානං ධම්මානං පහානා සබ්බසො කායදුට්ඨුල්ලානං පටිප්පස්සද්ධියා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං.

---

1. දක්ඛීති.
2. පජිහිස්සති - සීමු.
3 ගච්ඡිස්සාමීති - මජ්ඣං, ස්‍යා.

ආනන්‍දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට යම් මාර්ගයෙක් ඇද්ද, යම් ප්‍රතිපදාවක් ඇද්ද, ඒ මාර්ගයට ඒ ප්‍රතිපදාවට නො පැමිණ පඤ්චොරම්භාගිය සංයෝජනයන් දන්නේ යැ හෝ දක්නේ යැ හෝ දුරලන්නේ යැ හෝ යන තෙල කරුණ නො පැනේ. ආනන්‍දය, යම්සේ ස්ථිර වැ සිටුනා, හර ඇති මහත් රුකක්හුගේ සිවි නො සිඳ එලය නො සිඳ හර සිඳුමෙක් වන්නේ යැ යන මෙ කරුණ නො වන්නේ ද, එසෙයින් මැ ආනන්‍දය පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට යම් මඟෙක් යම් පිළිවෙතෙක් වේ ද, එමඟට එ පිළිවෙතට නො පැමිණ පඤ්චොරම්භාගිය සංයෝජනයන් දන්නේ යැ හෝ දක්නේ යැ හෝ දුරලන්නේ යැ හෝ යන තෙල කරුණ නො වෙයි. තවද ආනන්‍දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට යම් මඟෙක් ඇද්ද යම් පිළිවෙතෙක් ඇද්ද, එමඟට එ පිළිවෙතට පැමිණ පඤ්චොරම්භාගිය සංයෝජනයන් දන්නේ යැ හෝ දක්නේ යැ හෝ දුරලන්නේ යැ හෝ යන තෙල කරුණ පැනෙයි. ආනන්‍දය, යම්සේ ස්ථිර වැ සිටුනා හර ඇති මහත් රුකෙකැ සිවි සිඳ එලය සිඳ හර සිඳිම වන්නේ යැ යන තෙල කරුණ පැනේ ද, එසෙයින් මැ ආනන්‍දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට යම් මඟෙක් ඇද්ද, යම් පිළිවෙතෙක් ඇද්ද, එ මඟට ඒ පිළිවෙතට පැමිණ පඤ්චොරම්භාගිය සංයෝජනයන් දන්නේ යැ හෝ දක්නේ යැ හෝ දුරලන්නේ යැ හෝ යන තෙල කරුණ පැනෙයි.

ආනන්‍දය, යම්සේ ගඞ්ගානදිය දියෙන් පිරුණී ඉවුරු සම වැ සිටියා කවුඩන් විසින් පිය හැකි වන්නී ද, එකල්හි දුර්වල පුරුෂයෙක් ''මම මේ ගඞ්ගානදියෙහි සරස බාහුයෙන් දිය වතුරු සිඳ සුවසේ පරතෙරට යෙමි''යි එන්නේ යැ. හේ ගඞ්ගානදියෙහි සරස බාහුයෙන් දියවතුරු සිඳ සුවසේ පරතෙරට යන්නට නො හැකි වන්නේ යැ. ආනන්‍දය, එපරිද්දෙන් මැ සත්කාය නිරෝධය පිණිස දහම් දෙසනු ලබන කල්හි යම් කිසිවක්හු ගේ සිත ((එයට) නො බැස සිටී ද, නො පහදී ද, නො පිහිටාසිටී ද, නො මිදේ ද, ඒ දුර්වල පුරුෂයා සෙයින් තෙල මෙබඳු පුද්ගලයෝ දක්ක යුත්තාහ.

ආනන්‍දය, යම්සේ ගඞ්ගානදිය දියෙන් පිරුණී ඉවුරු සම වැ සිටියා කවුඩන් විසින් පියහැකි වන්නි ද, එකල්හි බලවත් පුරුෂයෙක් ''මම මේ ගඞ්ගානදියෙහි සරස බාහුයෙන් දියවතුරු සිඳ සුවසේ පරතෙරට යෙමි''යි එන්නේ යැ, හේ ගඞ්ගානදියෙහි සරස බාහුයෙන් දියවතුරු සිඳ සුවසේ පරතෙරට යන්නට හැකි වන්නේ යැ. එසෙයින් මැ ආනන්‍දය, සත්කාය නිරෝධය පිණිස දහම් දෙසනුලබන කල්හි යම් කිසිවක්හු ගේ සිත (එහි) බැසගනී ද, පහදී ද, පිහිටාසිටී ද, මිදේ ද, ඒ බලවත් පුරුෂයා සෙයින් තෙල මෙ බඳු පුද්ගලයෝ දක්ක යුත්තාහ.

ආනන්‍දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට මාර්ගය කවරේ ද, ප්‍රතිපද කවර යත් : ආනන්‍දය, මෙ සස්නෙහි මහණ උපධි සඞ්ඛ්‍යාත කාමගුණයෙන් වෙන් වීමෙන් අකුශලධර්ම සඞ්ඛ්‍යාත නිවරණයන් ගේ ප්‍රහාණයෙන් සර්වප්‍රකාරයෙන් කය පිළිබඳ අලසබව සන්හිඳීමෙන් කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ එහි ඇතුළුසමවත්හි යම් රූපගතයෙක් වේදනාගතයෙක් සංඥාගතයෙක්

තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති, සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙති.[1] සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙත්වා[2] අමතාය ධාතුයා චිත්තං උපසංහරති. එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. සො තත්ථට්ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති. තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා අයම්පි ඛො ආනන්ද මග්ගො අයං පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය.

පුන ච පරං ආනන්ද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං -පෙ- තතියං ඣානං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං -පෙ- අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො ආනන්ද මග්ගො අයං පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානාය.

පුන ච පරං ආනන්ද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං -පෙ- අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො ආනන්ද මග්ගො අයං පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය.

පුන ච පරං ආනන්ද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති. සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙති.[1] සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙත්වා[2] අමතාය ධාතුයා චිත්තං උපසංහරති : එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. සො තත්ථට්ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පපුණාති. තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයං ඛො ආනන්ද මග්ගො අයං පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානායාති.

1. පටිපාපෙති - ස්‍යා.
2. පටිපාපෙත්වා - ස්‍යා

සංස්කාරගතයෙක් විඥානගතයෙක් වේ ද ඒ රූපාදි ධර්මයන් අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන් රෝග වශයෙන් ගණ්ඩ වශයෙන් ශල්‍ය වශයෙන් අඝ (දුඃඛස්වභාව) වශයෙන් ආබාධ වශයෙන් පරායත්ත වශයෙන් නැසෙනපියවි ඇති වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් මනා කොට බලයි. හේ ඒ (තිලකුණට නඟා දක්නාලද ඇතුළුසමවත්හි වූ පඤ්චස්කන්ධ) ධර්මයන්ගෙන් සිත හකුළුවාලයි. (බැහැර කෙරෙයි,) හේ එ දහමින් සිත හකුළුවා ''තෙල සියලු සංස්කාරයන් ගේ සන්හිඳීමෙක් සියලු උපධීන් ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්‍ෂය වීමෙන් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ ද, තෙල ශාන්ත යැ තෙල ප්‍රණීත යැ''යි අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත එළවයි. හේ එහි (ත්‍රිලක්ෂණාලම්බනවිදර්ශනායෙහි) සිටියේ ආශ්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආශ්‍රවක්ෂයට නො පැමිණේ නම් එ මැ (ශමථවිදර්ශනා) ධර්මයෙහි ඡන්දරාගයෙන් එ මැ ධර්මනන්දියෙන් පඤ්චොරම්භාගිය ධර්මයන් ක්‍ෂය වීමෙන් ඒ ශුද්ධාවාසලෝකයෙන් (උපප්‍රාප්ති වශයෙන්,) පෙරළා නො එනසුලු, එහි මැ පිරිනිවෙනසුලු ඖපපාතිකයෙක් වේ. ආනන්දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට මෙ ද මාර්ගයෙක, මෙ ද ප්‍රතිපදවකි.

තවද ආනන්දය, මහණ විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති, විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට . . . . තෘතීයධ්‍යානයට . . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ එහි ඇතුළු සමවත්හි යම් රූපගතයෙක් වේදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාරගතයෙක් විඥානගතයෙක් වේ ද . . . ඒ ශුද්ධාවාසලෝකයෙන් උපප්‍රාප්ති වශයෙන් පෙරළා නො එනසුලු වූයේ වේ. ආනන්දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට මෙ ද මාර්ගයෙක, මෙ ද ප්‍රතිපදවකි.

තවද ආනන්දය, මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥවන් නැසීමෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාසය අනන්ත යැ'යි ආකාසානඤ්චායතනය උපදවා වෙසෙයි. හේ එහි යම් වෙදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාරගතයෙක් විඥානගතයෙක් වේ ද . . . . ඒ ශුද්ධාවාසලෝකයෙන් පෙරළා නො එනසුලු වූයේ වෙයි. ආනන්දය, පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට මෙ ද මාර්ගයෙක මේ ප්‍රතිපද යි.

තවද ආනන්දය, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත යැ'යි විඤ්ඤාණඤ්චායතනය උපදවා වෙසෙයි . . . සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වෙසෙයි. හේ එහි යම් වෙදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාරගතයෙක් විඥානගතයෙක් වේද ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන් රෝග වශයෙන් ගණ්ඩ වශයෙන් ශල්‍ය වශයෙන් අඝ වශයෙන් ආබාධ වශයෙන් පරායත්ත වශයෙන් නැසෙනසුලු වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් විදර්ශනාඥානයෙන් බලයි. හේ ඒ ධර්මයන්ගෙන් සිත හකුළුවාගනියි. හේ ඒ ධර්මයන්ගෙන් සිත හකුළුවාගෙන තෙල සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය වීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද 'තෙල ශාන්ත යැ තෙල ප්‍රණීත යැ'යි නිර්වාණධාතුයෙහි සිත එළවයි, හේ එහි සිටීයේ ආශ්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආශ්‍රවක්ෂයට නො පැමිණේ නම් එ මැ ධර්මරාගයෙන් එ මැ ධර්මනන්දියෙන් පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ක්ෂය වීමෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවෙනසුලු වූයේ ඒ ශුද්ධාවාස ලොකයෙන් (උපප්‍රාප්ති විසින්) පෙරළා නො එන සුලු වූයේ වෙයි. ආනන්දය, පඤ්චොරම්භාගිය සංයොජනයන් ගේ ප්‍රහාණයට මෙ ද මාර්ගයෙක, මේ ප්‍රතිපද යි.

එසො චෙ භන්තෙ මග්ගො එසා පටිපදා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය අථ කිඤ්චරහි ඉධෙකච්චෙ භික්ඛූ චෙතොවිමුත්තිනො එකච්චෙ භික්ඛූ පඤ්ඤාවිමුත්තිනොති. එත්ථ ඛො තෙසාහං[1] ආනන්ද ඉන්ද්‍රියවෙමත්තතං වදාමීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මහාමාලුඞ්ක්‍යසුත්තං චතුත්ථං.

---

1. පනෙසාහං - මජසං.

Free Distribution www.aathaapi.org

වහන්ස, ඉදින් පඤ්චොරම්භාගිය සංයෝජනයන් ගේ ප්‍රහාණයට තෙල මාර්ග වී නම් තෙල ප්‍රතිපත් වී නම් එකල්හි කුමක් හෙයින් මෙසස්නෙහි ඇතැම් මහණ කෙනෙක් චෙතෝවිමුක්ති ඇත්තාහු ඇතැම් මහණ කෙනෙක් ප්‍රඥවිමුක්ති ඇත්තාහු වෙත් ද ?යි. ආනන්දය, මම මෙහි ලා ඔවුන් ගේ ඉන්ද්‍රියයන් පිළිබඳ වෙනස් බව කියමි'යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටුසිත් ඇති ආයුෂ්මත් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ'යි.

සතර වැනි මහාමාලුඞ්ක්‍යසූත්‍ර යි.

---

2. 2. 5

භද්දාලිසුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: අහං ඛො භික්ඛවෙ එකාසනභොජනං භුඤ්ජාමි. එකාසනභොජනං ඛො අහං භික්ඛවෙ භුඤ්ජමානො අප්පාබාධතඤ්ච සඤ්ජානාමි අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ තුම්හෙපි භික්ඛවෙ එකාසනභොජනං භුඤ්ජථ, එකාසනභොජනං ඛො භික්ඛවෙ තුම්හෙපි භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චාති.

එවං වුත්තෙ ආයස්මා භද්දාලි භගවන්තං එතදවොච: 'අහං ඛො භන්තෙ න උස්සහාමි එකාසනභොජනං භුඤ්ජිතුං. එකාසනභොජනං හි මෙ භන්තෙ භුඤ්ජතො සියා කුක්කුච්චං, සියා විප්පටිසාරොති. තෙන හි ත්වං භද්දාලි යත්ථ නිමන්තිතො අස්සසි තත්ථ එකදෙසං භුඤ්ජිත්වා එකදෙසං නීහරිත්වාපි භුඤ්ජෙය්‍යාසි. එවම්පි ඛො ත්වං භද්දාලි භුඤ්ජමානො[2] යාපෙස්සසීති. එවම්පි ඛො අහං භන්තෙ න උස්සහාමි භුඤ්ජිතුං. එවම්පි හි මෙ භන්තෙ භුඤ්ජතො සියා කුක්කුච්චං සියා විප්පටිසාරොති. අථ ඛො ආයස්මා භද්දාලි භගවතා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ[3] භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසි. අථ ඛො ආයස්මා භද්දාලි සබ්බන්තං තෙමාසං න භගවතො සම්මුඛීභාවං අදාසි යථා තං සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී.

තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති, නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතීති. අථ ඛො ආයස්මා භද්දාලි යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි භික්ඛූහි සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං භද්දාලිං තෙ භික්ඛූ එතදවොචුං: 'ඉදං ඛො ආවුසො භද්දාලි භගවතො චීවරකම්මං කරීයති. නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සති'ති. ඉඞ්ඝාවුසො භද්දාලි එතං දෙසකං[4] සාධුකං මනසි කරොහි. මා තෙ පච්ඡා දුක්කරතරං අහොසීති.

---

2. භුඤ්ජමානො එකාසනො - මජසං.
3. පඤ්ඤපෙයමානෙ - සිමු.
4. දෙසකං - සිමු, මජසං. දෙසං - ස්‍යා

Free Distribution www.aathaapi.org

2. 2. 5

භද්දාලි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද, එක් කලෙකැ බුදුහු සැවත් නුවර නිසා ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එහි දී බුදුහු 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. බුදුහු මෙය වදළ හ. මහණෙනි මම් එකාසන (පෙරබත්හි වළඳන) භෝජනය වළඳමි· එකාසනභෝජනය වළඳන මම අල්පාබාධබව ද නිදුක් බව ද ශරීරයාගේ සැහැල්ලු පැවැත්ම ද කායබලය ද සුඛවිහරණය ද දනිමි. 'එව මහණෙනි තෙපි ද එකාසනභෝජනය වළඳවු මහණෙනි තෙපි ද එකාසනභෝජනය වළඳන්නහු අල්පාබාධ බව ද නිදුක් බව ද ශරීරයාගේ සැහැල්ලු පැවැත්ම ද කායබලය ද පහසු විහරණය ද දන්නහු යැ.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් භද්දාලි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී යැ: "වහන්ස මම් එකාසනභෝජනය වළඳන්නට නො හැක්කෙමි. වහන්ස එකාසනභෝජනය වළඳනා වූ මට (දිවිතෙක් බඹසර හැසිරෙන්නට හැක්කෙම් ද නො හැක්කෙම් ද යි මෙසේ) කුකුසෙක් වන්නේ යැ විපිළිසරයෙක් වන්නේ යැ"යි. එසේ වී නම් භද්දාලිය තෙපි යම් තැනෙක පවරන ලදහු වළඳවු ද එහි දී එක් කොටසක් වළඳා එක් කොටසක් බැහැර ගෙන ගොස් ද වළඳවු. භද්දාලි මෙසේ වළඳන්නා වූ තෙපි යැපෙන්නවු ය. වහන්ස, මම් මෙසේ ද වළඳන්නට නො හැකි වෙමි. වහන්ස මෙසේ ද වළඳන්නා වූ මට කුකුස් වන්නේ මැ යැ විපිළිසර වන්නේ මැ යි. ඉක්බිති ආයුෂ්මත් භද්දාලි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඞ්ඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි නො හැකි බව ප්‍රකාශ කෙළේය. එකල්හි ආයුෂ්මත්, භද්දාලි ස්ථවිර තෙමේ ශාස්තෘශාසනයෙහි ශික්ෂා නො පුරන්නකු සෙයින් ඒ සියලු තුන්මස භාග්‍යවතුන් වහන්සේගේ හමුවීමට නො පැමිණියේ යැ.

එසමයෙහි බොහෝ භික්ෂූහු "කොට නිමවූ සිවුරු ඇති බුදුහු තෙමසක්හුගේ ඇවෑමෙන් චාරිකායෙහි වඩනාසේකැ"යි භාග්‍යවතුන් වහන්සේට සිවුරු කෙරෙති. එකල්හි ආයුෂ්මත් භද්දාලි ස්ථවිර තෙමේ ඒ භික්ෂූන් කරා එළැඹ ඒ භික්ෂූන් සමග සතුටු වී යැ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ආයුෂ්මත් භද්දාලි තෙරුන්ට ඒ භික්ෂූහු මෙය කීහු : "ඇවැත්නි, භද්දාලි, 'කොට නිමවූ සිවුරු ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමසක් ඇවෑමෙන් චාරිකාවෙහි වඩනාසේකැ'යි මේ භාග්‍යවතුන් වහන්සේට සිවුරු කරනුලැබෙයි. ඇවැත්නි භද්දාලිය, එහෙයින් මෙය අපරාධය මැනැවින් මෙනෙහි කරව. පසුවැ තොපට නහමක් දුෂ්කරතර වේව'යි. කීහු.

එවමාවුසොති ඛො ආයස්මා භද්දාලි තෙසං භික්ඛූනං පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා භද්දාලි භගවන්තං එතදවොච: අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යොහං භගවතා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායාති.

තග්ඝ ත්වං භද්දාලි අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යං ත්වං මයා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසි.

සමයොපි ඛො තෙ භද්දාලි අප්පටිවිද්ධො අහොසි, භගවා ඛො සාවත්ථියං විහරති. භගවාපි මං ජානිස්සති භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරීති. අයම්පි ඛො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසි.

සමයොපි ඛො තෙ භද්දාලි අප්පටිවිද්ධො අහොසි. සම්බහුලා ඛො භික්ඛූ සාවත්ථියං වස්සං උපගතා, තෙපි මං ජානිස්සන්ති: 'භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී'ති. අයම්පි ඛො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසි.

සමයොපි ඛො තෙ භද්දාලි අප්පටිවිද්ධො අහොසි: 'සම්බහුලා ඛො භික්ඛුනියො සාවත්ථියං වස්සං උපගතා, තාපි මං ජානිස්සන්ති භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී'ති. අයම්පි ඛො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසි.

සමයොපි ඛො තෙ භද්දාලි අප්පටිවිද්ධො අහොසි: 'සම්බහුලා ඛො උපාසකා සාවත්ථියං පටිවසන්ති. තෙපි මං ජානිස්සන්ති —පෙ— සම්බහුලා ඛො උපාසිකා සාවත්ථියං පටිවසන්ති. තාපි මං ජානිස්සන්ති: භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී'ති. අයම්පි ඛො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසි.

සමයොපි ඛො තෙ භද්දාලි අප්පටිවිද්ධො අහොසි: සම්බහුලා ඛො නානා තිත්ථියා සමණබ්‍රාහ්මණා සාවත්ථියං වස්සං උපගතා, තෙපි මං ජානිස්සන්ති: 'භද්දාලි නාම භික්ඛු සමණස්ස ගොතමස්ස සාවකො ථෙරඤ්ඤතරො සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී'ති. අයම්පි ඛො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසීති.

අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යො'හං භගවතා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායාති, තග්ඝ ත්වං භද්දාලි අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යං ත්වං මයා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසි.

ආයුෂ්මත් භද්දලි ස්ථවිර තෙමේ 'එසේ යැ ඇවැත්නි'යි ඒ භික්ෂූන්ට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ආයුෂ්මත් භද්දලි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙල කී යැ : "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඬ්ඝයා සිකපද සමාදන් වන කල්හි එහි උත්සාහ රහිත බව පැවැසූයෙමි ද වහන්ස, බාලයකු සෙයින් මූඪයකු සෙයින් අදක්ෂයකු සෙයින් අපරාධය මා ඉක්ම ගියේ යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආයතිසංවරය පිණිස මාගේ ඒ දෝෂය දෝෂ විසින් පිළිගන්නා සේක්වා'යි කී යැ.

භද්දලිය ඒකාන්තයෙන් තෙපි මා විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඬ්ඝයා ශික්ෂාපද සමාදන් වන කල්හි එහි උත්සාහ රහිත බව පැවැසූවහු ද බාලයකු සෙයින් මූඪයකු සෙයින් අදක්ෂයකු සෙයින් අපරාධය තොප ඉක්ම ගියේ යැ.

භද්දලිය, තා විසින් සමය ද (තා විසින් සැලකියයුතු කරුණෙක් ඇත. එ ද) නො සලකන ලද විය : "බුදුහු සැවැත්නුවර වෙසෙති, 'භද්දලි නම් මහණ බුදුසසුන්හි ශික්ෂාපද සපුරා නො කරන්නෙකැ'යි බුදුහු ද මා දන්නාහ'යි භද්දලිය තා විසින් මෙ කරුණ ද නො සලකන ලද විය.

භද්දලිය, තා විසින් (අන්) කරුණෙකුදු නො සලකන ලද විය : "බොහෝ භික්ෂූහු සැවැත්නුවර වස් එළැඹියහ, භද්දලි නම් මහණ බුදුසසුන්හි ශික්ෂාපද සපුරා නො කරන්නෙකැ'යි ඒ භික්ෂූහු ද මා දන්නාහ"යි භද්දලිය, තා විසින් මෙ කරුණ ද නො සලකන ලද විය.

භද්දලිය, තා විසින් (අන්) කරුණෙකුදු නො සලකන ලද විය : "බොහෝ භික්ෂුණීහු ද සැවැත්නුවර වස් එළැඹියාහ. භද්දලි නම් මහණ බුදුසසුන්හි ශික්ෂාපද සපුරා නො කරන්නෙකැ'යි ඒ භික්ෂුණීහු ද මා දන්නාහ"යි භද්දලිය, තා විසින් මෙ කරුණ ද නො සලකන ලද විය.

භද්දලිය, තා විසින් (අන්) කරුණෙකුදු නො සලකන ලද විය : "බොහෝ උවසුවෝ සැවැත්නුවර වෙසෙති, ඔහු ද මා දන්නාහ"යි . . . "බොහෝ උවැසියෝ සැවැත්නුවර වෙසෙති. භද්දලි නම් මහණ බුදුසසුන්හි ශික්ෂාපද සපුරා නො කරන්නෙකැ'යි ඔහු ද මා දන්නාහ"යි මෙ කරුණ ද භද්දලිය, තා විසින් නො සලකන ලද විය.

භද්දලිය, තා විසින් (අන්) කරුණෙකුදු නො සලකන ලද විය : "බොහෝ වූ නානා තීර්ථක ශ්‍රමණබ්‍රාහ්මණයෝ සැවැත්නුවර වස් එළැඹියහ. 'ශ්‍රමණගෞතමයන්ගේ ශ්‍රාවක වූ ස්ථවිරනායතර වූ භද්දලි නම් මහණ බුදුසසුන්හි ශික්ෂාපද සපුරා නො කරන්නෙකැ'යි ඔහු ද මා දන්නාහ'යි මෙ කරුණ ද භද්දලිය, තා විසින් නො සලකන ලද වී' යයි.

වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඬ්ඝයා ශික්ෂාපද සමාදන් වන කල්හි උත්සාහ රහිත බව ප්‍රකාශ කෙළෙමි. ඒ මා බාලයකු සෙයින් මූඪයකු සෙයින් අදක්ෂයකු සෙයින් අපරාධය තෙමේ ඉක්ම ගියේ යැ. වහන්ස, බුදුහු ඒ මාගේ දෝෂය දෝෂ විසින් ආයතිසංවරය පිණිස ඉවසනසේක්වා. භද්දලිය, තෝ මා විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඬ්ඝයා ශික්ෂාපද සමාදන් වන කල්හි උත්සාහ රහිත බව ප්‍රකාශ කෙළෙහි යැ. භද්දලිය, ඒකාන්තයෙන් අපරාධය තෙමේ ඒ තා ඉක්මැ ගියේ යැ.

තං කිං මඤ්ඤසි භද්දාලි ඉධස්ස භික්ඛු උභතොභාගවිමුත්තො, තමහං එවං වදෙය්‍යං: 'එහි මෙ ත්වං භික්ඛු පඞ්කෙ සඞ්කමො හොහී'ති. අපිනු සො සඞ්කමෙය්‍ය වා අඤ්ඤෙන වා කායං සන්නාමෙය්‍ය, නොති වා වදෙය්‍යාති. නො හෙතං භන්තෙ. තං කිං මඤ්ඤසි භද්දාලි: 'ඉධස්ස භික්ඛු පඤ්ඤාවිමුත්තො - පෙ - කායසක්ඛී - පෙ- දිට්ඨිප්පත්තො - පෙ - සද්ධාවිමුත්තො-පෙ-ධම්මානුසාරී-පෙ-සද්ධානුසාරී, තමහං එවං වදෙය්‍යං: 'එහි මෙ ත්වං භික්ඛු පඞ්කෙ සඞ්කමො හොහී'ති. අපි නු සො සඞ්කමෙය්‍ය වා අඤ්ඤෙන වා කායං සන්නාමෙය්‍ය, නොති වා වදෙය්‍යාති. නො හෙතං භන්තෙ. තං කිම්මඤ්ඤසි භද්දාලි: 'අපි නු ත්වං භද්දාලි තස්මිං සමයෙ උභතොභාගවිමුත්තො වා හොසි, පඤ්ඤාවිමුත්තො වා කායසක්ඛී වා දිට්ඨිප්පත්තො වා සද්ධාවිමුත්තො වා ධම්මානුසාරී වා සද්ධානුසාරී වාති. නො හෙතං භන්තෙ. නනු ත්වං භද්දාලි තස්මිං සමයෙ රිත්තො තුච්ඡො අපරද්ධොති. එවං භන්තෙ. අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යොහං භගවතා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසි. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පටිග්ගණ්හාතු ආයතිං සංවරායාති.

තග්ඝ ත්වං භද්දාලි අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං යං ත්වං මයා සික්ඛාපදෙ පඤ්ඤාපියමානෙ භික්ඛුසඞ්ඝෙ සික්ඛං සමාදියමානෙ අනුස්සාහං පවෙදෙසි. යතො ච ඛො ත්වං භද්දාලි අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි. තං තෙ මයං පටිග්ගණ්හාම. වුද්ධි හෙසා භද්දාලි අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, ආයතිං සංවරං ආපජ්ජති.

ඉධ භද්දාලි එකච්චො භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී[1] හොති, තස්ස එවං හොති: යන්නූනාහං විවිත්තං සෙනාසනං භජෙය්‍යං, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. අප්පෙවනාමාහං උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරෙය්‍යන්ති. සො විවිත්තං සෙනාසනං භජති, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. තස්ස තථා වූපකට්ඨස්ස විහරතො සත්ථාපි උපවදති. අනුවිච්ච පි විඤ්ඤූ සබ්‍රහ්මචාරී උපවදන්ති. දෙවතාපි උපවදන්ති. අත්තාපි අත්තානං උපවදති. සො සත්ථාරාපි උපවදිතො අනුවිච්ච විඤ්ඤූහි සබ්‍රහ්මචාරීහි උපවදිතො දෙවතාහිපි උපවදිතො අත්තනාපි අත්තානං උපවදිතො න උත්තරිමනුස්සධම්මා[2] අලමරියඤාණදස්සන-විසෙසං සච්ඡිකරොති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති, යථා තං සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරිස්ස.

---

1. සත්ථුසාසනෙ අපරිපූරකාරී හොති - PTS.
2. උත්තරිං මනුස්සධම්මා - ස්‍යා.

Free Distribution www.aathaapi.org

භද්දලිය, ඒ කුමැ'යි සිතයි ද? ''මෙසස්නෙහි මහණෙක් උභතොභාගවිමුක්ත වූයේ අරූපසමාපත්තියෙන් රූප කයින් ද මාර්ගභාවනායෙන් නාම කයින් ද මිදුණේ වෙයි. ඕහට මම මෙසේ කියන්නෙමි : ''එව මහණ තෙපි මට මඩෙහි හෙයක් වවූ''යයි. කිම එමහණ හෙයක් වන්නේ හෝ වේ ද අන් දසක හෝ කය නමන්නේ ද 'නො හැක්කෙමි' හෝ කියන්නේ වේද ? යි. වහන්ස, තෙල නොවේ මැ යැ. භද්දලිය එය කුමැ'යි සිතවූ ද: මෙසස්නෙහි මහණෙක් ප්‍රඥවිමුක්ත . . . කායසාක්ෂි . . දෘෂ්ටප්‍රාප්ත . . ශ්‍රද්ධාවිමුක්ත . . ධර්මානුසාරි . . . ශ්‍රද්ධානුසාරි වේ ද, ඕහුට මම මෙසේ කියන්නෙමි : 'එව මහණ තෙපි මට මඩෙහි හෙයක් වව''යි. කිම එමහණ හෙයක් වන්නේ හෝ කය අන්දසකට නමන්නේ හෝ 'නො හැක්කෙමි' හෝ කියන්නේ වේ ද?යි, වහන්ස, තෙලෙ නො වේ මැ යැ. භද්දලිය, එය කුමැ'යි සිතවූ ද? කිම භද්දලිය, තෙපි එසමයෙහි උභතොභාග විමුක්ත හෝ වවූ ද ප්‍රඥවිමුක්ත හෝ කායසාක්ෂි හෝ දෘෂ්ටප්‍රාප්ත හෝ ශ්‍රද්ධාවිමුක්ත හෝ ධර්මානුසාරි හෝ ශ්‍රද්ධානුසාරි හෝ වවූ ද?යි. තෙලෙ නැත් මැ යැ වහන්ස.. භද්දලිය එකල්හි තෙපි රික්ත වූවහු තුච්ඡ (සිස්)වූවහු අපරාධ ඇතියහු නො වේ ද'යි එසේ යැ වහන්ස. මම බුදුන් විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඞ්ඝයා ශික්ෂාපද සමාදන් වන කල්හි උත්සාහ රහිත බව ප්‍රකාශ කෙළෙමි. වහන්ස, බාලයකු සෙයින් මූඪයකු සෙයින් අදක්ෂයකු සෙයින් අපරාධය මා ඉක්ම ගියේ යැ. වහන්ස, ඒ මට ආයතිසංවරය පිණිස බුදුහු අපරාධය අපරාධ විසින් කමනසේක්ව'යි.

භද්දලිය, තෙපි මා විසින් ශික්ෂාපද පනවනු ලබන කල්හි භික්ෂුසඞ්ඝයා ශික්ෂාපද සමාදන් වන කල්හි උත්සාහ රහිත බව ප්‍රකාශ කළවූ යැ. භද්දලිය ඒ තොප එකත්තෙන් බාලයකු සෙයින් මූඪයකු සෙයින් අදක්ෂයකු සෙයින් අපරාධය ඉක්ම ගියේ යැ. යම් හෙයෙකින් භද්දලිය තෙපි අපරාධය අපරාධ හෙයින් දැක දහම් නො ඉක්ම පිළියම් කරව. තොපගේ ඒ අපරාධය අපි ඉවසම්හ. භද්දලිය, යමෙක් අපරාධය අපරාධ විසින් දැක දහම් නො ඉක්ම පිළියම් කෙරේ ද ආයතිසංවරයට පැමිණේ ද තෙල ආර්‍ය්‍යවිනයෙහි වෘද්ධිය මැ වෙයි.

භද්දාලිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ශාස්තෘශාසනයෙහි ශික්ෂායෙහි අපරිපූරකාරි වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි : ' මම අරණ්‍ය යැ, වෘක්ෂමූල යැ පර්වත යැ ගිරිකඳුරු යැ ගිරි ගුහා යැ සොහොන වනපෙත අබ්වස, පිදුරුකිළි යැ යන විවේක සෙනසුන් භජනය කෙරෙම් නම් මනා මැ නු' යි. මම මිනිස්දහමින් මතුයෙහි ආර්‍ය්‍යභාව කරණයට සමර්ථ ඥනදර්ශන විශෙෂයක් පසක් කරන්නෙම් නම් මැනැවැ යි කියා යි. හේ අරණ රුක් මුල, පවු යැ ගිරිකඳුරු යැ ගිරිගුහා යැ සොහොන, වනපෙත අබ්වස පිදුරුකිළි යැ යන ජනශූන්‍ය සේනාසන ඇසිරි කෙරෙ යි. එසේ එකලා වැ විහරණ කරන ඔහට ශාස්තෘන්වහන්සේ ද උපවාද කෙරෙති. විඥ සබ්‍රම්සරහු නුවණින් දැනැ අයුණු කියත්. දෙවියෝ ද අයුණු කියත්. තෙමේත් තමහට දොස් කියයි. හේ බුදුන් විසිනුදු උපවාද කරන ලදුයේ නුවණින් දන විඥ සබ්‍රම් සරුන් විසින් උපදවාද කරන ලදුයේ තමා විසිනුදු තමා හට දොස් නඟනලදුයේ දශකුශලධර්ම සංඛ්‍යාත මනුෂ්‍ය ධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්ථ ඥනදර්ශන විශේෂය පසක් නො කෙරෙයි. ඒ කවර හෙයින යත් : භද්දාලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂායෙහි අපරිපූරකාරි මහණක් හට යම්සේ වේද තෙල එසේ මැ වෙයි.

ඉධ පන භද්දාලි එකච්චො, භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරී හොති. තස්ස එවං හොති: යන්නූනාහං විවිත්තං සෙනාසනං භජෙය්‍යං. අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. අප්පෙවනාමා'හං උත්තරි මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරෙය්‍යන්ති. සො විවිත්තං සෙනාසනං භජති. අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. තස්ස තථා වූපකට්ඨස්ස විහරතො, සත්ථාපි න උපවදති අනුවිච්චපි විඤ්ඤූ සබ්‍රහ්මචාරී න උපවදන්ති. දෙවතාපි න උපවදන්ති. අත්තාපි අත්තානං න උපවදති. සො සත්ථාරාපි අනුපවදිතො අනුවිච්ච විඤ්ඤූහි සබ්‍රහ්මචාරීහි අනුපවදිතො දෙවතාහිපි අනුපවදිතො අත්තනාපි අත්තානං අනුපවදිතො උත්තරිමනුස්සධම්මා අලමරියඤාණ-දස්සනවිසෙසං සච්ඡිකරොති.

සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිස්ස හෙතු: එවංහෙතං භද්දාලි හොති යථාතං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

පුන ච පරං භද්දාලි භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථා තං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

පුන ච පරං භද්දාලි භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතියං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථාතං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

පුන ච පරං භද්දාලි භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථාතං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථා තං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

භද්දලිය, මෙසස්නෙහි ඇතැම් මහණෙක් ශාස්තෘශාසනයෙහි ලා ශික්ෂායෙහි පරිපූරකාරී වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි : මම අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ ගිරිකන්දර යැ ගිරිගුහා යැ සුසානයැ වනපෙත අබවස පිදුරුකිළි යැ යන විවේක සෙනසුන් භජනය කෙරෙම් නම් මනා මැ නු යි. මම මනුෂ්‍ය ධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්ථ ඥාන දර්ශන විශෙෂය පසක් කෙරෙම් නම් ඉතා මැනැවැ යි. හේ අරන, රුක්මුල, පව් යැ ගිරිකඳුරු යැ ගිරිගුහා යැ සොහොන, වනපෙත අබවස, පිදුරුකිළි යැ යන එකලා සෙනසුන් සෙවුනේ යැ එසේ ගණසංගණිකාදීන් වෙන් වැ වාස කරන ඔහුට ශාස්තෘහු වහන්සේ ද උපවාද නො කෙරෙති. නුවණැති සබ්‍රම්සරහු නුවණින් දැන උපවාද නො කෙරෙති. දෙවියෝ ද උපවාද නො කෙරෙති. තෙමේත් තමහට උපවාද නො කෙරෙයි. හේ බුදුන් විසිනුදු දෙස් නො නඟන ලදුයේ නුවණින් දැන විඥ සබ්‍රම්සරුන් විසින් දෙස් නො නඟනු ලදුයේ තමා විසිනුදු තමහට දෙස් නො නඟනු ලදුයේ මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්ථ ඥානදර්ශනවිශෙෂය ප්‍රත්‍යක්ෂ කෙරෙයි.

හෙතෙම කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. ඒ කවර හෙයින යත් : භද්දලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වෙයි.

තවද භද්දලිය, මහණ තෙම විතර්කවිචාරයන් සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදය ඇති චිත්තයාගේ එකඟ බව ඇති විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. ඒ කවර හෙයින යත් : භද්දලිය, ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වෙයි.

තවද භද්දලිය, මහණ තෙම ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇති වැ වෙසෙයි. (සම්ප්‍රයුක්ත) සුඛය ද (නාම) කයින් විඳියි. ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් හෙතු කොට 'උපෙක්ෂා ඇත්තේ යැ සිහි ඇත්තේ යැ සුඛවිහරණ ඇත්තේ යැ'යි, කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. ඒ කවර හෙයින යත් : භද්දලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වෙයි.

තවද භද්දලිය, මහණ තෙම සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස්දෙම්නසුන් ගේ නැසීමෙන් නිදුක් වූ නො සුව වූ උපේක්ෂායෙන් උපන් ස්මෘතියෙන් පරිශුද්ධ භාවය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. ඒ කවර හෙයින යත් : භද්දලිය ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ මැ වෙයි.

හේ මෙසෙයින් සිත සමාධිගත කල්හි පිරිසිදු වූ කල්හි ප්‍රභාස්වර වූ කල්හි අඞ්ගණ රහිත කල්හි පහවූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි පෙර විසූ කඳ පිළිවෙළ දන්නා පිණිස සිත නමයි. හේ අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි. හෙමෙසේ යැ : එක්ජාතියකුදු දෙජාතියකුදු . . . මෙසෙයින් ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි. ඒ කවර හෙයින යත් : භද්දලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වෙයි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ —පෙ— යථාකම්මූපගෙ සත්තෙ පජානාති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථා තං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්ස.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. තං කිස්ස හෙතු: එවං හෙතං භද්දාලි හොති යථා තං සත්ථුසාසනෙ සික්ඛාය පරිපූරකාරිස්සාති.

එවං වුත්තෙ ආයස්මා භද්දාලි භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චං භික්ඛුං පවය්හ පවය්හ කාරණං කරොන්ති. කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චං භික්ඛුං නො තථා පවය්හ පවය්හ[1] කාරණං කරොන්තීති.

ඉධ භද්දාලි එකච්චො භික්ඛු අභිණ්හාපත්තිකො හොති ආපත්තිබහුලො. සො භික්ඛූහි වුච්චමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. බහිද්ධා කථං අපනාමෙති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. න සම්මා වත්තති. න ලොමං පාතෙති. න නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති නාහ. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: අයං ඛො ආවුසො භික්ඛු අභිණ්හාපත්තිකො ආපත්තිබහුලො, සො භික්ඛූහි වුච්චමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. බහිද්ධා කථං අපනාමෙති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. න සම්මා වත්තති. න ලොමං පාතෙති. න නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති නාහ. සාධු වතායස්මන්තො ඉමස්ස භික්ඛුනො තථා තථා උපපරික්ඛථ යථාස්සිදං[2] අධිකරණං න ඛිප්පමෙව වූපසමෙය්‍යාති. තස්ස ඛො එතං භද්දාලි භික්ඛුනො භික්ඛූ තථා තථා උපපරික්ඛන්ති යථාස්සිදං[2] අධිකරණං න ඛිප්පමෙව වූපසම්මති.

ඉධ පන භද්දාලි එකච්චො භික්ඛු අභිණ්හාපත්තිකො හොති ආපත්තිබහුලො. සො භික්ඛූහි වුච්චමානො නාඤ්ඤෙනඤ්ඤං පටිචරති. න බහිද්ධා කථං අපනාමෙති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති ආහ. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: 'අයං ඛො ආවුසො භික්ඛු අභිණ්හාපත්තිකො ආපත්තිබහුලො, සො භික්ඛූහි වුච්චමානො නාඤ්ඤෙනඤ්ඤං පටිචරති.

1. පසය්හ පසය්හ - මජසං. 2. යථයිදං - ස්‍යා.

හේ මෙසේ සිත සමාධිගත කල්හි පිරිසුදු කල්හි ප්‍රභාස්වර කල්හි අඞ්ගණ රහිත කල්හි පහවූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි භාවනාකර්මයට නිසි කල්හි සිටි කල්හි අචල කල්හි සත්ත්වයන්ගේ ච්‍යුතිඋපප්‍රාප්ති දන්නා පිණිස සිත නමයි. හේ පිරිසුදු වූ මිනිසැස ඉක්ම පැවැති දිවැසින් ච්‍යුත වන උපදනා හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්තවයන් දකියි . . . . කම් වූ පරිදි මියගිය සත්ත්වයන් දනියි. ඒ කවර හෙයින යත් : භද්දලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වෙයි.

හෙ මෙසේ සිත සමාධිගත කල්හි පිරිසුදු කල්හි ප්‍රභාස්වර කල්හි අඞ්ගණ රහිත කල්හි පහවූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය කල්හි සිටි කල්හි අචල කල්හි ආස්‍රව-ක්ෂයකරඥානය පිණිස සිත නමයි. හෙතෙම 'මේ දුකැ'යි ඇතිසැටියෙන් දැනගනියි : . . . 'මේ දුක් නසන පිළිවෙතැ'යි ඇතිසැටියෙන් දනියි. 'මොහු ආස්‍රවහ'යි ඇති සැටියෙන් දැනගනියි. ... 'මේ ආස්‍රවයන් නිරුද්ධ කරන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දැනගනියි. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු ගේ සිත කාමාස්‍රවයෙනුදු මිදෙයි, භවාස්‍රවයෙනුදු මිදෙයි, අවිද්‍යාස්‍රවයෙනුදු මිදෙයි, මිදුණු කල්හි මිදිණැ'යි ඥානය වෙයි. ජාතිය ක්ෂය වූවා යැ බඹසර වැස නිමවන ලද, කටයුතු කරන ලද, රහත්බව පිණිස අන් කිසෙක් නැතැ යි දැනගනී. ඒ කවර හෙයින යත් : භද්දලිය ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සපුරා කරනුවක්හට යම්සේ ද තෙල එසෙයින් මැ වේ'යයි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් භද්දාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළෝ : වහන්ස, යම් කරුණෙකින් මෙසස්නෙහි ඇතැම් මහණක්හට අල්පමාත්‍ර දෝෂයෙහි දු දෙස් දක්ව දක්වා කාරණා කෙරෙත් නම් එයට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද, වහන්ස, යම් කරුණෙකින් මෙසස්නෙහි ඇතැම් මහණක්හට (මහත්වූ දෝෂයෙහි දු) එසේ දෙස් දක්ව දක්වා කාරණා නො කෙරෙත් නම් එයට හෙතු කවරේ ද ප්‍රත්‍යය කවරේ ද යි.

භද්දලිය මෙසස්නෙහි ඇතැම් මහණෙක් නිරතුරු ඇවැත් අවදනේ ආපත්තිබහුල වෙයි. හේ භික්ෂූන් විසින් චොදනා වශයෙන් කියනු ලබන්නේ අන් කථායෙකින් අනෙක වසයි. කථාව බැහැරට නමයි. කෝපයත් ද්වෙශයත් නොසතුටත් පහළ කෙරෙයි. මැනැවින් වනෙහි නො පවතී. අනුලොම් වනෙහි නො සිටී. නිස්තරණ වනෙහි නො පවතී. යම් කරුණෙකින් සංඝයා සතුටු වේ ද එය කරමි නො කියයි. භද්දලිය එහිලා භික්ෂූන්ට මෙබඳු සිතෙක් වෙයි : ඇවැත්නි, මෙ මහණ නිරතුරු ඇවැත් අවදනේ ආපත්ති බහුල වෙයි. හේ භික්ෂූන් විසින් කියනු ලබනුයේ අනෙකකින් අනෙක වසයි. කථාව බැහැර කරයි. කෝපයත් ද්වෙශයත් නොසතුටත් පහළ කෙරෙයි. මොනොවට වනෙහි නො පවතිති. අනුලොම්වනෙහි නො සිටී. නිස්තරණ වනෙහි නො පවතී. යම් කරුණෙකින් සංඝයා සතුටු වෙ නම් එය කරමි නො කියයි. ආයුෂ්මත්නි, මොහුගේ මේ අධිකරණය යම් සේ වහා නො සන්හිඳේ නම් මේ මහණහු පිළිබඳ වැ ඒ ඒ පරිද්දෙන් පිරික්සවයි. භද්දාලිය. ඒ මහණහුගේ මේ අධිකරණය යම් සේ වහා නො සන්හිඳේ නම් භික්ෂූහු ඒ ඒ පරිද්දෙන් ඒ මහණුන්ගේ මේ අධිකරණය විමසති.

භද්දාලිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් නිරතුරු ඇවැත් අවදනේ ඇවැත් බහුල වෙයි. හේ භික්ෂූන් විසින් කියනු ලබන්නේ අනෙකකින් අනෙකක් නො වසයි. කථාව බැහැර නො නමයි. කෝපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මොනොවට වනෙහි පවතී. අනුලොම් වනෙහි සිටී. නිස්තරණ වනෙහි පවතී. යම් කරුණෙකින් සංඝයා සතුටු වෙ නම් එය කරමි කියයි. භද්දලිය එහි ලා භික්ෂූන්ට මෙබඳු සිතෙක් වෙයි : ' ඇවැත්නි, මෙ මහණ නිරතුරු අවදනා ඇවැත් ඇත්තේ ආපත්ති බහුල වෙයි. හේ භික්ෂූන් විසින් චොදනා කරනු ලබනුයේ අනෙකකින් අනෙක නො වසයි.

න බහිද්ධා කථං අපනාමෙති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති ආහ. සාධු වතායස්මන්තො ඉමස්ස භික්ඛුනො තථා තථා උපපරික්ඛථ යථාස්සිදං[1] අධිකරණං ඛිප්පමෙව වූපසමෙය්‍යාති. තස්ස ඛො එතං භද්දාලි භික්ඛුනො භික්ඛූ තථා තථා උපපරික්ඛන්ති යථාස්සිදං[1] අධිකරණං ඛිප්පමෙව වූපසම්මති.

ඉධ භද්දාලි එකච්චො භික්ඛු අධිච්චාපත්තිකො හොති අනාපත්තිබහුලො. සො භික්ඛූහි වුච්චමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. බහිද්ධා කථං අපනාමෙති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. න සම්මා වත්තති. න ලොමං පාතෙති. න නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති නාහ. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: අයං ඛො ආවුසො භික්ඛු අධිච්චාපත්තිකො අනාපත්තිබහුලො, සො භික්ඛූහි වුච්චමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. බහිද්ධා කථං අපනාමෙති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. න සම්මා වත්තති. න ලොමං පාතෙති. න නෙත්ථාරං වත්තති යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති නාහ. සාධු වතායස්මන්තො ඉමස්ස භික්ඛුනො තථා තථා උපපරික්ඛථ යථාස්සිදං අධිකරණං න ඛිප්පමෙව වූපසමෙය්‍යාති. තස්ස ඛො එතං භද්දාලි භික්ඛුනො භික්ඛූ තථා තථා උපපරික්ඛන්ති යථාස්සිදං අධිකරණං න ඛිප්පමෙව වූපසම්මති.

ඉධ පන භද්දාලි එකච්චො භික්ඛු අධිච්චාපත්තිකො හොති අනාපත්තිබහුලො. සො භික්ඛූහි වුච්චමානො නාඤ්ඤෙනඤ්ඤං පටිචරති. න බහිද්ධා කථං අපනාමෙති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති ආහ. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: 'අයං ඛො ආවුසො භික්ඛු අධිච්චාපත්තිකො අනාපත්තිබහුලො. සො භික්ඛූහි වුච්චමානො නාඤ්ඤෙනඤ්ඤං පටිචරති. න බහිද්ධා කථං අපනාමෙති. න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. යෙන සඞ්ඝො අත්තමනො හොති තං කරොමීති ආහ. සාධුවතායස්මන්තො ඉමස්ස භික්ඛුනො තථා තථා උපපරික්ඛථ යථාස්සිදං අධිකරණං ඛිප්පමෙව වූපසමෙය්‍යාති. තස්ස ඛො එතං භද්දාලි භික්ඛුනො භික්ඛූ තථා තථා උපපරික්ඛන්ති යථාස්සිදං අධිකරණං ඛිප්පමෙව වූපසම්මති.

ඉධ භද්දාලි එකච්චො භික්ඛු සද්ධාමත්තකෙන වහති පෙමමත්තකෙන. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: 'අයං ඛො ආවුසො භික්ඛු සද්ධාමත්තකෙන වහති පෙමමත්තකෙන. සචෙ මයං ඉමං භික්ඛුං පචය්හ පචය්හ[2] කාරණං කරිස්සාම. මා'යම්පිස්ස තං සද්ධාමත්තකං පෙමමත්තකං තම්හාපි පරිහායීති. සෙය්‍යථාපි භද්දාලි පුරිසස්ස එකං චක්ඛුං තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා තං එකං චක්ඛුං රක්ඛෙය්‍යුං: මා යම්පිස්ස තං එකං චක්ඛුං තම්හාපි පරිහායී'ති. එවමෙව ඛො භද්දාලි ඉධෙකච්චො භික්ඛු සද්ධාමත්තකෙන වහති පෙමමත්තකෙන. තත්‍ර භද්දාලි භික්ඛූනං එවං හොති: 'අයං ඛො ආවුසො භික්ඛු සද්ධාමත්තකෙන වහති පෙමමත්තකෙන. සචෙ මයං ඉමං භික්ඛුං පචය්හ පචය්හ[1]

1. යථයිදං - ස්‍යා. 2. පසය්හ පසය්හ - මජසං.

කථාව බැහැර නො නමයි. කෝපය ද ද්වේෂය ද නොසතුට ද පහළ නො කෙරෙයි. මොනවට පවතී. අනුලොම් වතෙහි සිටී. නිස්තරණ වතෙහි පවතී. යම් කරුණෙකින් සංඝයා සතුටු වේ නම් එය කරමී කියයි. මොහුගේ මේ අධිකරණය යම්සේ වහා සන්හිඳේ නම් ආයුෂ්මත්නි, මේ භික්ෂුහුගේ අධිකරණ එසේ පරීක්ෂා කරවූ නම් ඉතා මැනැවැ යි. භද්දලිය භික්ෂූහු ඒ භික්ෂුහුගේ තෙල අධිකරණය ඒ ඒ පරිදි පරීක්ෂා කරත් ඔහුගේ මේ අධිකරණය යම් සේ වහා සන්හිඳේ ද එපරිද්දෙනි.

භද්දලිය, මෙසස්නෙහි ඇතැම් මහණෙක් කිසි කලෙක අවදනා ඇවැත් ඇත්තේ ආපත්ති බහුල නො වෙයි. හේ භික්ෂූන් විසින් චෝදනා කරනු ලබන්නේ අනෙකකින් අනෙක වසයි. කථාව බැහැර නතු කෙරෙයි කෝපය ද ද්වේෂය ද නොසතුට ද පහළ කෙරෙයි. මොනවට නො පවතී. අනුලොම් වතෙහි නො සිටී. නිස්තරණ වතෙහි නො පවතී. යමෙකින් සංඝයා සතුටු වේ ද එය කරමී නො කියයි. භද්දලිය, එහිලා භික්ෂූන්ට මෙබඳු සිතෙක් වෙයි. ඇවැත්නි, මේ මහණ කලෙකැ අවදනා ඇවැත් ඇතියේ ආපත්ති බහුල නොවූයේ වෙයි. හේ භික්ෂූන් විසින් චෝදනා කරනු ලබන්නේ අනෙකකින් අනෙක වසයි. කථාව බැහැර නතු කෙරෙයි. කෝපය ද ද්වේෂය ද නො සතුට ද පහළ කෙරෙයි. මොනොවට නො පවතී. අනුලොම් වතෙහි නො සිටී. නිස්තරණ වතෙහි නො පවතියි. යමෙකින් සංඝයා කැමැති වේ ද එය කරමී නො කියයි. ඇවැත්නි, යම් පරිදි ඔහුගේ මේ අධිකරණය වහා නො සන්හිඳේ ද මේ මහණහුගේ ඒ අධිකරණය ඒ ඒ පරිදි පරීක්ෂා කරවූ නම් මැනැවැ යි භද්දාලිය භික්ෂූහු ඒ භික්ෂුහුගේ තෙල අධිකරණය ඒ ඒ පරිදි පරීක්ෂා කෙරෙත්. යම් පරිදි ඔහුගේ මේ අධිකරණය වහා නො සන්හිඳේ ද එපරිද්දෙනි.

භද්දලිය, මෙසස්නෙහි කිසි මහණෙක් කිසි කලෙකැ අවදනා ඇවැත් ඇත්තේ ඇවැත් බහුල නො වූයේ වෙයි. ඒ මහණ භික්ෂූන් විසින් කියනු ලබන්නේ අනෙක් කරුණෙකින් අනෙක්කරුණක් නො වසයි. කථාව බැහැරට යොමු නො කෙරෙයි. කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මැනැවින් වතෙහි පවතියි. අනුලොම් වතෙහි පවතියි. නිස්තරණ වතෙහි පවතියි. යම් කරුණෙකින් සඞසයා සතුටු වේ ද එය කරමී කියයි. භද්දලිය එහි දී භික්ෂූන්ට මෙසිත වෙයි : ''ඇවැත්නි, මෙමහණ කිසි කලෙකැ අවදනා ඇවැත් ඇත්තේ ඇවැත්බහුල නො වූයේ වෙයි. ඒ මහණ භික්ෂූන් විසින් කියනු ලබන්නේ අනෙකකින් අනෙකක් නො වසයි. කථාව බැහැරට යොමු නො කෙරෙයි. කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මැනැවින් වතෙහි පවතියි අනුලොම් වතෙහි පවතියි. නිස්තරණ වතෙහි පවතියි. යම් කරුණෙකින් සඞසයා සතුටු වේද එය කරමී කියයි. ආයුෂ්මත්නි, මොහු ගේ මේ අධිකරණය යම්සේ වහා සන්හිඳේ නම් ඉතා මැනැවැ. මේ මහණහු පිළිබඳ වැ ඒ ඒ පරිද්දෙන් විමසව''යි. භද්දලිය, ඒ මහණහුගේ මේ අධිකරණය යම්සේ වහා සන්හිඳේ නම් භික්ෂූහු ඒ ඒ පරිද්දෙන් ඒ මහණහු ගේ මේ අධිකරණය විමසති.

භද්දලිය, මෙ සස්නෙහි කිසි මහණෙක් ශ්‍රද්ධාමාත්‍රයෙන් ප්‍රේමමාත්‍රයෙන් යැපෙයි. භද්දලිය, එහි දී භික්ෂූන්ට මෙසිත වෙයි : ''ඇවැත්නි, මෙ මහණ ශ්‍රද්ධාමාත්‍රයෙන් ප්‍රේම-මාත්‍රයෙන් යැපෙයි. ඉදින් ඇපි මෙමහණහට දෙස් දක්වදක්වා කාරණා කරමෝ නම් මොහුගේ යම් ශ්‍රද්ධාමාත්‍රයෙක් ප්‍රේමමාත්‍රයෙක් වී ද එයිනුදු මේ තෙමේ නහමක් පිරිහේව'යි. භද්දලිය, යම්සේ පුරුෂයක්හට එක් ඇසෙක් වේ ද ඔහුගේ සගයහළුවෝ ද නෑසහලේ නෑයෝ ද මොහුට ඒ එක් ඇසෙක් වී නම් එයිනුදු මේතෙමේ නහමක් පිරිහේව'යි ඒ එක් ඇස රක්නාහු ද, භද්දලිය, එපරිද්දෙන් මැ මෙසස්නෙහි කිසි මහණෙක් ශ්‍රදධාමාත්‍රයෙන් ප්‍රේමමාත්‍රයෙන් යැපෙයි. භද්දලිය, එහි දී භික්ෂූන්ට මෙසිත වෙයි : ''ඇවැත්නි, මෙමහණ සැදැහැ මතුයෙන් ප්‍රේම මතුයෙන් යැපෙයි. ඉදින් මෙමහණහට දෙස් දක්ව දක්වා

කාරණං කරිස්සාම, මායම්පිස්ස තං සද්ධාමත්තකං පෙමමත්තකං තම්හාපි පරිහායී'ති. අයං ඛො භද්දාලි හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චං භික්ඛුං පවය්හ පවය්හ කාරණං කරොන්ති. අයං පන භද්දාලි හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චං භික්ඛුං නො තථා පවය්හ පවය්හ කාරණං කරොන්තීති.

කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙන පුබ්බෙ අප්පතරානි චෙව සික්ඛාපදානි අහෙසුං, බහුතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහිංසු. කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනෙතරහි බහුතරානි චෙව සික්ඛාපදානි හොන්ති. අප්පතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහන්තීති.

එවං හෙතං භද්දාලි හොති: සත්තෙසු හායමානෙසු සද්ධම්මෙ අන්තරධායමානෙ බහුතරානි චෙව සික්ඛාපදානි හොන්ති. අප්පතරා ච භික්ඛූ අඤ්ඤාය සණ්ඨහන්ති.

න තාව භද්දාලි සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. යාව න ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. යතො ච ඛො භද්දාලි ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. තෙසං යෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය.

න තාව භද්දාලි ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, යාව න සඞ්ඝො මහත්තං පත්තො හොති. යතො ච ඛො භද්දාලි සඞ්ඝො මහත්තං පත්තො හොති. අථ ඉධෙකච්චෙ අසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති තෙසං යෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය.

න තාව භද්දාලි ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති යාව න සඞ්ඝො ලාභග්ගං පත්තො හොති -පෙ- යසග්ගං පත්තො හොති -පෙ- බාහුසච්චං පත්තො හොති -පෙ- රත්තඤ්ඤුතං පත්තො හොති. යතො ච ඛො භද්දාලි සඞ්ඝො රත්තඤ්ඤුතං පත්තො හොති. අථ ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති තෙසං යෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය.

අප්පකා ඛො තුම්හෙ භද්දාලි තෙන සමයෙන අහුවත්ථ යදා වො අහං ආජානීයසුසූපමං ධම්මපරියායං දෙසෙසිං, සරසි තං[1] භද්දාලීති. නො හෙතං භන්තෙ. තත්‍ර භද්දාලි කං හෙතුං පච්චෙසීති. සො හි නූනාහං භන්තෙ දීඝරත්තං සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරී අහොසින්ති. න ඛො භද්දාලි එසෙව හෙතු එස පච්චයො, අපි ච මෙ ත්වං භද්දාලි දීඝරත්තං චෙතසා චෙතො පරිච්ච විදිතො. න චායං[2] මොඝපුරිසො මයා ධම්මෙ දෙසියමානෙ අට්ඨිකත්වා[3] මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාතීති. අපි ච තෙ අහං භද්දාලි ආජානීයසුසූපමං ධම්මපරියායං දෙසිස්සාමි තං සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා භද්දාලි භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

1. තං සරසි - මජසං, ස්‍යා.
2. න චායං - PTS
3. අට්ඨිං කත්වා - මජසං.

කාරණා කරන්නමෝ නම් ඔහට යම් ශ්‍රද්ධාමාත්‍රයෙක් ප්‍රේමමාත්‍රයෙක් වී නම් මේ තෙමේ එයිනුදු නහමක් පිරිහේව'යි. භද්දාලිය, මෙහි කිසි මහණක්හට යම් කරුණෙකින් දෙස් දක්ව දක්වා කාරණා කෙරෙත් නම් ඊට මේ හේතු යැ ඊට මේ ප්‍රත්‍යය යි. භද්දාලිය, මෙහි කිසි මහණක්හට යම් කරුණෙකින් එසේ දෙස් දක්ව දක්වා කාරණා නො කෙරෙත් නම් ඊට මේ හේතු යැ ඊට මේ ප්‍රත්‍යය යි.

වහන්ස, යම් හෙයෙකින් පෙර ඉතා අල්ප වූත් ශික්ෂාපදයෝ වූහු නම් ඉතා බොහෝ භික්ෂූහු රහත්පෙලෙහි පිහිටියාහු නම් ඊට හේතු කවරද ඊට ප්‍රත්‍යය කවරද? තවද වහන්ස, යම් හෙයෙකින් මෙකලැ ඉතා බොහෝ වූත් ශික්ෂාපදයෝ වෙත් නම් ඉතා අල්ප වූත් භික්ෂු කෙනෙක් රහත්පෙලෙහි පිහිටත් නම් ඊට හේතු කවරද ඊට ප්‍රත්‍යය කවරද'යි.

භද්දාලිය, තෙල මෙසේ මැ වෙයි : සත්ත්වයන් පිළිවෙතින් හෙන කල්හි පිළිවෙත් සදහම් නැසෙන කල්හි ඉතා බොහෝ ශික්ෂාපදයෝත් වෙති. ඉතා අල්ප වූ භික්ෂු කෙනෙකුත් රහත්පෙලෙහි පිහිටත්.

භද්දාලිය, යම්තාක් මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි ආශ්‍රවයනට කරුණු වූ ධර්මයෝ පහළ වෙත් ද ඒතාක් බුදුහු ශ්‍රාවකයනට ශික්ෂාපද නො පනවති. යම් කලෙකැ වැළිත් භද්දාලිය, මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි ආශ්‍රවයනට කරුණු වූ ධර්මයෝ පහළ වෙත් ද එකල්හි බුදුහු එ මැ ආශ්‍රවස්ථානීය ධර්මයන් නසන පිණිස ශ්‍රාවකයනට ශික්ෂාපද පනවත්.

භද්දාලිය, යම් තාක් සඞ්ඝයා මහත්බවට නො පැමිණියේ වේ ද ඒ තාක් මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි කිසි ආශ්‍රවස්ථානීයධර්ම කෙනෙක් පහළ නො වෙති. යම් කලෙකැ වැළිත් භද්දාලිය, සඞ්ඝයා මහත් බවට පැමිණියේ වේ ද එකල්හි මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි කිසි ආශ්‍රවස්ථානීයධර්ම කෙනෙක් පහළ වෙති. එකල්හි එ මැ ආශ්‍රවස්ථානීය-ධර්මයන් නසන පිණිස බුදුහු ශ්‍රාවකයනට ශික්ෂාපද පනවත්.

භද්දාලිය, යම් තාක් සඞ්ඝයා ලාභයෙහි අගතැන් නො පැමිණියේ වේ ද . . . යසස්හි අගතැන් නො පැමිණියේ වේ ද . . . බහුශ්‍රැත බවට නො පැමිණියේ වේ ද . . . රාත්‍රඥ බවට නො පැමිණියේ වේ ද ඒ තාක් මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි කිසි ආශ්‍රවස්ථානීය ධර්මයෝ පහළ නො වෙති. යම් කලෙකැ වැළිත් භද්දාලිය, සඞ්ඝ තෙමේ රාත්‍රඥ බවට පැමිණියේ වේ ද එකල්හි මෙසස්නෙහි සඞ්ඝයා කෙරෙහි කිසි ආශ්‍රවස්ථානීයධර්ම කෙනෙක් පහළ වෙති. එකල්හි බුදුහු එ මැ ආශ්‍රවස්ථානීයධර්මයන් නසන පිණිස ශික්ෂාපද පනවත්.

භද්දාලිය, යම් කලෙකැ මම තොපට තරුණ ආජානීයෝපම ධර්මපර්‍යාය දෙසුයෙම් ද එසමයෙහි තෙපි අල්ප වූවහු යැ භද්දාලිය, තෝ එය සිහිකරයි ද?යි. වහන්ස තෙල නැත් මැ යැ. භද්දාලිය, එහි ලා කවරහේතුවක් සලකයි ද'යි. වහන්ස, එකත්තෙනෙන් ඒ මම දිගුකලක් බුදුසස්නෙහි ශික්ෂාපද සපුරා නො කරන්නෙම් වීමි'යි. භද්දාලිය තෙලෙ මැ හේතු නො වෙයි. තෙලෙ ප්‍රත්‍යය නො වෙ යි. එතෙකුදුවත් භද්දාලිය, මා විසින් තෝ දිගුකලක් මුළුල්ලෙහි සිතින් සිත විමසා දන්නා ලද්දෙහි යැ : ''මේ තුච්ඡපුරුෂ තෙම මා විසින් දහම් දෙසනු ලබන කල්හි අර්ථවත් කොට මෙනෙහි කොට සියල්ල සිතින් සමනා එළැවූ කන් ඇති වැ දහම් නො අසා යයි දන්නා ලද්දෙහි යැ. එතෙකුදුවත් භද්දාලිය, මම තට තරුණආජානීයෝපම ධර්මපර්‍යාය දෙසමි. එය අස, මොනොවට මෙනෙහි කර, කියමි වදළහ. 'එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් භද්දාලිස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක :

සෙය්‍යථාපි භද්දාලි දක්ඛො අස්සදම්මකො භද්‍රං අස්සාජානීයං ලභිත්වා පඨමෙනෙව මුඛාධානෙ කාරණං කාරෙති. තස්ස මුඛාධානෙ කාරණං කාරියමානස්ස හොන්තියෙව විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, යථා තං අකාරිතපුබ්බං කාරණං කාරියමානස්ස. සො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බායති. යතො ඛො භද්දාලි භද්‍රො අස්සාජානීයො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බුතො හොති. තමෙනං අස්සදම්මකො උත්තරිං[1] කාරණං කාරෙති යුගාධානෙ. තස්ස යුගාධානෙ කාරණං කාරියමානස්ස හොන්තියෙව විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, යථා තං අකාරිතපුබ්බං කාරණං කාරියමානස්ස. සො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බායති. යතො ඛො භද්දාලි භද්‍රො අස්සාජානීයො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බුතො හොති. තමෙනං අස්සදම්මකො උත්තරිං[1] කාරණං කාරෙති අනුක්කමෙ මණ්ඩලෙ ඛුරකාසෙ[2] ධාවෙ[3] රවත්තෙ[4] රාජගුණෙ රාජවංසෙ උත්තමෙ ජවෙ උත්තමෙ හයෙ උත්තමෙ සාඛල්‍යෙ. තස්ස උත්තමෙ ජවෙ උත්තමෙ හයෙ උත්තමෙ සාඛල්‍යෙ කාරණං කාරියමානස්ස හොන්තියෙව විසූකායිතානි විසෙවිතානි විප්ඵන්දිතානි කානිචි කානිචි, යථා තං අකාරිතපුබ්බං කාරණං කාරියමානස්ස. සො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බායති යතො ච ඛො භද්දාලි භද්‍රො අස්සාජානීයො අභිණ්හකාරණා අනුපුබ්බකාරණා තස්මිං ඨානෙ පරිනිබ්බුතො හොති. තමෙනං අස්සදම්මකො උත්තරිං[1] වණ්ණියඤ්ච වලියඤ්ච[5]. අනුප්පවෙච්ඡති ඉමෙහි ඛො භද්දාලි දසහඞ්ගෙහි සමන්නාගතො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භද්දාලි දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුණෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි දසහි: ඉධ භද්දාලි භික්ඛු අසෙක්ඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති. අසෙක්ඛෙන සම්මාසඞ්කප්පෙන සමන්නාගතො හොති. අසෙක්ඛාය සම්මාවාචාය සමන්නාගතො හොති. අසක්ඛෙන සම්මාකම්මන්තෙන සමන්නාගතො හොති. අසෙක්ඛෙන සම්මාආජීවෙන සමන්නාගතො හොති. අසෙක්ඛෙන සම්මාවායාමෙන සමන්නාගතො හොති. අසෙක්ඛාය සම්මාසතියා සමන්නාගතො හොති. අසෙක්ඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති. අසෙක්ඛෙන සම්මාඤාණෙන සමන්නාගතො හොති. අසෙක්ඛාය සම්මාවිමුත්තියා සමන්නාගතො හොති. ඉමෙහි ඛො භද්දාලි දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුණෙය්‍යො හොති, පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා භද්දාලි භගවතො භාසිතං අභිනන්දීති.

භද්දාලි සුත්තං පඤ්චමං

---

1. උත්තරි - මජසං.
2. ඛුරකායෙ - සීමු, PTS.
3. ධාවනෙ - පු.
4. දවත්තෙ - සීමු, මජසං.
5. පාණියඤ්ච - මජසං

"යම්සේ භද්දලිය, දක්ෂ වූ අස්දමුයෙක් භද්‍ර වූ ආජානීය අශ්වයකු ලැබ පළමු මැ මුවවළලු ලීමෙහි ක්‍රියා කරවයි. මුවවළලු ලීමෙහි ක්‍රියා කරවතු ලබන ඔහට තො කළවිරූ ක්‍රියා කරනුලබනුවක්හට සෙයින් යම් කිසි විලොම ආකාර කෙනෙක් විසම හැසිරීම් කෙනෙක් විලොම චලිත කෙනෙක් වෙත් මැ යැ. හේ නිරතුරුකිරීමෙන් පිළිවෙළින් කිරීමෙන් එකරුණෙහි නිෂ්ඨාවට යෙයි. යම් කලෙකැ භද්දලිය, භද්‍රවූ ආජානීය අශ්ව තෙම නිරතුරු කිරීමෙන් අනුපූර්වකාරණයෙන් එකරුණෙහි නිෂ්ඨාවට පැමිණියේ වේ ද ඒ මොහු අස්දමු තෙමේ මත්තෙහි විය තැබීමෙහි ක්‍රියා කරවයි. විය තැබීමෙහි ක්‍රියා කරවනු ලබන ඕහට තො කළ විරූ ක්‍රියා කරවන ලබනුවක්හට සෙයින් යම් කිසි විලෝම ආකාරයෝ විසමචරිතයෝ විලෝමචලිතයෝ වෙත් මැ යැ. හේ නිරන්තර කාරණයෙන් අනුපූර්වකාරණයෙන් එකරුණෙහි නිෂ්ඨාවට යෙයි. යම් කලෙකැ භද්දලිය. භද්‍ර වූ ආජානීය අශ්ව තෙමේ නිරන්තර කාරණයෙන් අනුපූර්වකාරණයෙන් එකරුණෙහි නිෂ්ඨාවට පැමිණියේ වේ ද ඒ මොහුට අස්දමු තෙමේ මත්තෙහි අනුක්‍රමයෙහි (එක්වට සිව්පා නැඟීමෙහි තැබීමෙහි) ... මණ්ඩලයෙහි–... කුරගින් යැමෙහි ... ශීඝ්‍රජවයෙහි ... රවයෙහි තො බා පිවිසීමෙහි ... රජු විසින් දතයුතු ගුණයෙහි ... අශ්වරාජවංශයෙහි ... ජවසම්පත්තියෙහි ... උතුම් අස් බැව්හි උත්තම වූ සබිලභාවයෙහි (සිලිටි වචනයෙහි) ක්‍රියා කරවයි. ඔහට උත්තමජවයෙහි උතුම් අස් බැව්හි උත්තමසතිලභාවයෙහි ක්‍රියා කරවනලබනුවාට තො කළවිරූ ක්‍රියා කරවන ලබනුවක්හට සෙයින් යම් කිසි විලොම ආකාරයෝ විසමචරිතයෝ විලොමචලිතයෝ වෙත් මැ යැ. හේ නිරන්තරයෙන් අනුපූර්වකාරණයෙන් එකරුණෙහි නිමාවට යෙයි. යම් කලෙකැ භද්දලිය, භද්‍ර වූ ආජානීය අශ්ව තෙමේ නිරන්තරකාරණයෙන් අනුපූර්වකාරණයෙන් එකරුණෙහි නිමාවට ගියේ වේ ද ඒ මොහු අස්දමු තෙමේ මත්තෙහි . . . . භද්දලිය, මේ දශ අඞ්ගයෙන් සමන්වාගත වූ භද්‍ර වූ ආජානීය අශ්ව තෙමේ රාජාර්හ වෙයි. රාජභෝග්‍ය වූයේ රාජාවයව සඞ්ඛ්‍යාවට යෙයි.

එසෙයින් මැ භද්දලිය, දශ ධර්මයෙකින් සමන්වාගත මහණ දුරු සිට ගෙනවුත් දෙන දන් පිළිගැනීමට නිසි වූයේ අමුතු දන් පිළිගැනීමට නිසි වූයේ දක්ෂිණාවට නිසි වූයේ ඇඳිලි බඳනට නිසි වූයේ, ලොවට අනුත්තර පින්කෙත් වූයේ වෙයි. කවර දශ ධර්මයෙකින යත් : භද්දලියැ, මෙ සස්නෙහි මහණ අශෛක්ෂ සම්‍යග්දෘෂ්ටියෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යක්සඞ්කල්පයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යග්වචනයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යක්කර්මාන්තයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යගාජීවයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යග්ව්‍යායාමයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යක්ස්මෘතියෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යක්සමාධියෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යග්ඥනයෙන් සමන්වාගත වෙයි, අශෛක්ෂ සම්‍යග් විමුක්තියෙන් සමන්වාගත වෙයි. භද්දලිය, මේ දස දහමින් යුත් මහණ දුරින් අළ දන් පිළිගැනීමට නිසි වූයේ අමුතු දන් පිළිගැනීමට නිසි වූයේ දක්ෂිණාවට නිසි වූයේ ඇඳිලි බඳනට නිසි වූයේ ලොවට අනුත්තර පින්කෙත් වූයේ වේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව වදළ සේක, සතුටු සිත් ඇති ආයුෂ්මත් භද්දලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

පස්වැනි භද්දලි සූත්‍ර යි.

---

2. 2. 6

ලටුකිකොපම සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා අඞ්ගුත්තරාපෙසු විහරති ආපණං නාම අඞ්ගුත්තරාපානං නිගමො. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ආපණං පිණ්ඩාය පාවිසි. ආපණෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙනඤ්ඤතරො වනසණ්ඩො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා[1] අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

ආයස්මාපි ඛො උදායි පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ආපණං පිණ්ඩාය පාවිසි. ආපණෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන සො වනසණ්ඩො තෙනුපසඞ්කමි දිවාවිහාරාය, තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා[1] අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මතො උදායිස්ස රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'බහුන්නං වත නො භගවා දුක්ඛධම්මානං අපහත්තා, බහුන්නං වත නො භගවා සුඛධම්මානං උපහත්තා, බහුන්නං[2] වත නො භගවා අකුසලානං ධම්මානං අපහත්තා බහුන්නං[2] වත නො භගවා කුසලානං ධම්මානං උපහත්තා'ති.

අථ ඛො ආයස්මා උදායි සායන්හසමයං පතිසල්ලානාවුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උදායි භගවන්තං එතදවොච. "ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'බහුන්නං වත නො භගවා–පෙ–කුසලානං ධම්මානං උපහත්තා'ති.

මයං හි භන්තෙ පුබ්බෙ සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. අහු ඛො සො භන්තෙ සමයො යං භගවා භික්ඛූ ආමන්තෙසි: 'ඉඞ්ඝ තුම්හෙ භික්ඛවෙ එතං දිවාවිකාලභොජනං පජහථා'ති. තස්ස මය්හං භන්තෙ අහුදෙව අඤ්ඤථත්තං අහු[3] දෙමනස්සං. යම්පි නො සද්ධා ගහපතිකා[4] දිවා විකාලෙ පණීතං ඛාදනීයං භොජනීයං දෙන්ති. තස්සපි නො භගවා පහානමාහ. තස්සපි නො සුගතො පටිනිස්සග්ගමාහාති.

---

1. අජ්ඣොගාහෙත්වා - මජසං, PTS.
2. බහුනං - මජසං.
3. අහුදෙව - මජසං, සයා.
4. ගහපති - සිමු.

Free Distribution www.aathaapi.org

2. 2. 6
ලටුකිකොපම සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක් කලෙකැ භාග්‍යවත් බුදුහු අඞ්ගුත්තරාපජනපදයෙහි අඞ්ගුත්තරාපවාසීන් ගේ ආපණ නම් නියම්ගම්හි වැඩවසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන ආපණයට පිඩු පිණිස පිවිසිසේක. ආපණයෙහි පිඩු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැතුණුසේක් දිවාවිහරණය සඳහා එක්තරා වනලැහැබකට පිවිසිසේක. ඒ වනලැබැබට පිවිස එක්තරා රුක්මුලෙකැ දිවාවිහරණයට වැඩහුන්සේක.

ආයුෂ්මත් උදයි ස්ථවිර තෙමේ ද පෙරවරුයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන ආපණයට පිඩු පිණිස පිවිසියේ ය. ආපණයෙහි පිඩු සිගා හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැතුණේ දිවාවිහරණය පිණිස ඒ වනලැහැබට පැමිණියේ ය. ඒ වනලැහැබට පිවිස එක්තරා රුක්මුලෙකැ දිවාවිහරණයට හිඳගත. එකල්හි එකලා වැ විවේකයෙන් හුන් ආයුෂ්මත් උදයි තෙරුන්ට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන : "ඒකාන්තයෙන් බුදුහු අපගේ බොහෝ දුක් දුරුකරනුවහ, ඒකාන්තයෙන් බුදුහු අපට බොහෝ සුව එළවනුවහ. ඒකාන්තයෙන් බුදුහු අපගේ බොහෝ අකුශලධර්මයන් දුරුකරනුවහ. ඒකාන්තයෙන් බුදුහු අපට බොහෝ කුශලධර්මයන් එළවනුවහ"යි.

ඉක්බිති ආයුෂ්මත් උදයී ස්ථවිර තෙමේ පස්වරුයෙහි පලසමවතින් නැගීසිටියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ආයුෂ්මත් උදයී ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී යැ : "වහන්ස, මෙහි එකලා වැ විවේකයෙන් හුන් මා ගේ චිත්තයෙහි මෙබඳු පරිවිතර්කයෙක් උපන : භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපට බොහෝ වූ ... කුශලධර්මයන් එළවනසේකැ"යි

වහන්ස, අපි පෙර සවස්හිදු උදසන දු දවල්හි දු විකාලයෙහි වැළඳුම්හ. වහන්ස, යම් කලෙකැ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, තෙපි තෙල දිවා විකල්බොජුන් හැර පියව"යි භික්ෂූන් ඇමැතූසේක් ද එබඳු කලෙක් විය. වහන්ස, (එකල්හි) මට (සිත්හි) අන්‍යථාත්වය වී මැ යැ, දෙමනස් වී මැ යැ : "ශ්‍රද්ධාවත් ගෘහපතිහු අපට දහවල් විකාලයෙහි යම් ප්‍රණීත වූ කෑයුතු බිදියයුතු දය දෙති, භාග්‍යවතුන් වහන්සේ අපට ඒ භොජනයාගේ ප්‍රහාණය වදළසේක. සුගතයන් වහන්සේ අපට ඒ භොජනයාගේ ද දුරැලීම වදළසේකැ"යි

Free Distribution www.aathaapi.org

තෙ මයං භන්තෙ භගවති පෙමඤ්ච ගාරවඤ්ච හිරිඤ්ච ඔත්තප්පඤ්ච සම්පස්සමානා එවං තං දිවාවිකාලභොජනං පජහිම්හා[1]. තෙ මයං භන්තෙ සායඤ්චෙව භුඤ්ජාම පාතො ච. අහු ඛො සො භන්තෙ සමයො යං භගවා භික්ඛූ ආමන්තෙසි: ඉඞ්ඝ තුම්හෙ භික්ඛවෙ එතං රත්තිං විකාලභොජනං පජහථා'ති. තස්ස මය්හං භන්තෙ අහුදෙව අඤ්ඤථත්තං. අහු[2] දොමනස්සං යම්පි නො ඉමෙසං ද්වින්නං භත්තානං පණීතසඞ්ඛාතතරං තස්සපි නො භගවා පහානමාහ. තස්සපි නො සුගතො පටිනිස්සග්ගමාහා'ති.

භූතපුබ්බං භන්තෙ අඤ්ඤතරො පුරිසො දිවා සූපෙය්‍යං ලභිත්වා එවමාහ: 'හන්ද ච ඉමං නික්ඛිපථ, සායං සබ්බෙව සමග්ගා භුඤ්ජිස්සාමා'ති. යා කාචි භන්තෙ සඞ්ඛතියො සබ්බා තා රත්තිං, අප්පා දිවා. තෙ මයං භන්තෙ භගවති පෙමඤ්ච ගාරවඤ්ච හිරිඤ්ච ඔත්තප්පඤ්ච සම්පස්සමානා එවං තරෙත්තිං, විකාලභොජනං පජහිම්හා.

භූතපුබ්බං භන්තෙ භික්ඛූ රත්තන්ධකාරතිමිසායං පිණ්ඩාය චරන්තා චන්දනිකම්පි පවිසන්ති. ඔළිගල්ලෙපි පපතන්ති. කණ්ටකාවාටම්පි[2] ආරොහන්ති, සුත්තම්පි ගාවිං ආරොහන්ති. මාණවෙහිපි සමාගච්ඡන්ති කතකම්මෙහිපි අකතකම්මෙහිපි. මාතුගාමොපි තෙ අසද්ධම්මෙන නිමන්තෙති.

භූතපුබ්බාහං භන්තෙ රත්තන්ධකාරතිමිසායං පිණ්ඩාය චරාමි අද්දසා ඛො මං භන්තෙ අඤ්ඤතරා ඉත්ථි විජ්ජන්තරිකාය භාජනං ධොවන්ති. දිස්වා මං භීතා විස්සරමකාසි: 'අභුං මෙ[3], පිසාචො වත ම'න්ති. එවං වුත්තෙ අහං භන්තෙ තං ඉත්ථිං එතදවොචං: නාහං භගිනි, පිසාචො, භික්ඛු පිණ්ඩාය ඨිතො'ති. භික්ඛුස්ස ආතුමාරි, භික්ඛුස්ස මාතුමාරි, වරන්තෙ භික්ඛු තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡී පරිකන්තො, නත්වෙව[4] යං[5] රත්තන්ධකාරතිමිසායං කුච්ඡිහෙතු පිණ්ඩාය චරසීති[6].

තස්ස මය්හං භන්තෙ තදනුස්සරතො එවං හොති: 'බහුන්නං වත නො භගවා දුක්ඛධම්මානං අපහත්තා, බහුන්නං වත නො භගවා සුඛධම්මානං උපහත්තා, බහුන්නං වත නො භගවා අකුසලානං ධම්මානං අපගත්තා. බහුන්නං වත නො භගවා කුසලානං ධම්මානං උපහත්තා'ති.

එවමෙව පනුදායි ඉධෙකච්චෙ මොඝපුරිසා: 'ඉදං පජහථා'ති මයා වුච්චමානා තෙ එවමාහංසු: 'කිම්පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස අධිසල්ලිඛතෙවායං සමණො'ති. තෙ තඤ්චෙව නප්පජහන්ති. මයි ච අප්පච්චයං උපට්ඨාපෙන්ති. යෙ ච භික්ඛූ සික්ඛාකාමා, තෙසං තං උදායි හොති බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො[7] කලිඞ්ගරො.

1. පජහිම්හ – සීමු.
2. කණ්ටකවාටම්පි – සීමු, මජ්ඣං. කණ්ටකරාජිම්පි – ස්‍යා.
3. අභුං මෙ – මජ්ඣං.
4. නත්වෙවවරං – මජ්ඣං.
5. නත්වෙවයා – සීමු.
6. චරසාති – සීමු.
7. ථූලො – මජ්ඣං, ස්‍යා, PTS

වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ද ගෞරවය ද ලජ්ජාව ද බිය ද දක්නමෝ මෙසේ ඒ දිවාවිකල්බොජුන දුරු කළමහ. වහන්ස, අපි සවස ද උදයන ද වැළැඳුමහ. යම් කලෙකැ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, තෙපි තෙල රාත්‍රී විකල් බොජුන හැරපියව"යි භික්ෂූන් ඇමැතුසේක් ද එබඳු කලෙක් විය. වහන්ස, (එකල්හි) මට (සිත්හි) අන්‍යථාත්වය වී මැ යැ, දොම්නස් වීමැ ය : "මේ දෙවැදෑරුම් බත් අතුරෙන් යම් බතක් අතිශයින් ප්‍රණීත යයි කියනලද ද භාග්‍යවතුන් වහන්සේ අපට ඒ භෝජනයා ගේ ප්‍රහාණය වදළසේක. සුගතයන් වහන්සේ අපට ඒ භෝජනයාගේ හැරපීම ද වදළසේකැ"යි

වහන්ස, පෙර එක්තරා පුරුෂයෙක් දහවල්හි සූපයට තිසි (මත්ස්‍යමාංසාදි)යක් ලැබ මෙසේ කී යැ : "දන් මෙය තබාපියව, සවස්කලැ හැම දෙනාමෝ එක් වැ පියා වළඳමහ"යි වහන්ස, යම් කිසි සකස් කළ කැයුතු දැ වේ ද, එ හැම රාත්‍රියෙහි වෙයි. දහවල්හි ස්වල්පයෙක් වේ. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ද ගෞරවය ද ලජ්ජාව ද බිය ද දක්නමෝ මෙසේ තෙල රෑ විකල් බොජුන් හැරපීම්හ.

වහන්ස, පෙර භික්ෂූහු රැය ඝනඳුරෙහි පිඬුසිඟා යන්නාහු ඉඳුල්දිය හෙළන තැනට ද පිවිසෙති. ගම්දොර ගවරවළෙහි ද වැටෙති, කටුවැටට ද නැඟෙති, නිදන ගවයන් පිට ද නැඟෙති, කළ සොරකම් ඇත්තා වූ ද කළ සොරකම් නැත්තා වූ ද සොරුන්ට ද හමු වෙති, මාගම ද ඔවුන් මෙවුන්දම්න් පවරයි.

වහන්ස, මම් පෙර රැය බොල්අඳුරෙහි පිඬු සිඟා ගියෙමි. වහන්ස, බඳුන් සෝදන එක්තරා ස්ත්‍රියක් විදුලියඑළියෙන් මා දුටුවා යැ. මා දක බියපත් වූවා "මට වනසෙක, පිශාචයෙක් මා කන්නට ආයේ වනැ"යි මහහඬ නැඟු යැ. වහන්ස, මෙසේ කී කල්හි මම් ඒ ස්ත්‍රියට තෙල කීමි : "නැඟැණිය, මම පිශාච නො වෙමි, පිඬු පිණිස සිටි මහණෙක්මි" කීමි. මහණහුගේ පියා මළේ වන, මහණහුගේ මව මළා වන, මහණ, තියුණු වූ ගෙරිකපන කැත්තෙන් තාගේ කුස කපනලද්දේ මැනැවැ, යම් හෙයකින් මේ රෑ බොල්අඳුරෙහි උදර හේතුවෙන් පිඬු පිණිස හැසිරෙයි ද ඒ නො මනා මැ යි.

වහන්ස, එය සිහිකරන මට මේ සිත වෙයි : "ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ දුක් දුරලනසේක, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අපට බොහෝ සුව එළවනසේක, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ අකුසල් දුරලනසේක, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අපට කුසල්දහම් එළවනසේකැ"යි.

උදයිය, ඒ එසේ මැ යැ. ලොවැ ඇතැම් තුච්ඡපුරුෂයෝ 'මෙය හැරපියව"යි මා විසින් කියනුලබන්නාහු ඔහු මෙසේ කියති : "කුමක් හෙයින් මේ මහණහු ඉතා අල්ප වූ මද පමණ වූ මෙකරුණට ඉතා වැයම් කෙරෙත් ද"යි. ඔහු එකරුණ වැලිත් නො හැරපියති. මා කෙරෙහිදු නො සතුට උපදවත්. (සාරිපුත්තාදි) යම් භික්ෂු කෙනෙක් හික්මෙනු කැමැති වෙත් ද, (ඔවුන් කෙරෙහිදු නො සතුට) එළවත්. උදයිය, ඔවුන්ට එය බලවත් බන්ධනයෙක් දැඩි බන්ධනයෙක් ස්ථිර බන්ධනයෙක් නො දිරූ බන්ධනයෙක් ගෙල බැඳි මහාකාෂ්ටයෙක් වෙයි.

සෙය්‍යථාපි උදායි ලටුකිකා සකුණිකා පූතිලතාය බන්ධනෙන බද්ධා තත්ථෙව වධං වා බන්ධං වා මරණං වා ආගමෙති. යො නු ඛො උදායි එවං වදෙය්‍ය: 'යෙන සා ලටුකිකා සකුණිකා පූතිලතාය බන්ධනෙන බද්ධා තත්ථෙව වධං වා බන්ධං වා මරණං වා ආගමෙති, තං හි තස්සා අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධන'න්ති. සම්මා නු ඛො සො උදායි වදමානො වදෙය්‍යා'ති. නො හෙතං භන්තෙ. යෙන සා භන්තෙ ලටුකිකා සකුණිකා පූතිලතාය බන්ධනෙන බද්ධා තත්ථෙව වධං වා බන්ධං වා මරණං වා ආගමෙති. තං හි තස්සා බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො[1] කලිඞ්ගරො'ති.

එවමෙව ඛො උදායි ඉධෙකච්චෙ මොඝපුරිසා: 'ඉදං පජහථා'ති මයා වුච්චමානා තෙ එවමාහංසු: කිං පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස අධිසල්ලිඛතෙවායං සමණො'ති. තෙ තඤ්චෙව නප්පජහන්ති, මයි ච අප්පච්චයං උපට්ඨාපෙන්ති. යෙ ච භික්ඛූ සික්ඛාකාමා තෙසං තං උදායි හොති බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො කලිඞ්ගරො.

ඉධ පනුදායි එකච්චෙ කුලපුත්තා: 'ඉදං පජහථා'ති මයා වුච්චමානා තෙ එවමාහංසු: කිම්පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස පහාතබ්බස්ස යස්ස නො භගවා පහානමාහ. යස්ස නො සුගතො පටිනිස්සග්ගමාහා'ති. තෙ තඤ්චෙව පජහන්ති, මයි ච න අප්පච්චයං උපට්ඨාපෙන්ති. යෙ ච භික්ඛූ සික්ඛාකාමා. තෙ තං පහාය අප්පොස්සුක්කා පන්නලොමා පරදවුත්තා[2] මිගභූතෙන චෙතසා විහරන්ති. තෙසන්තං උදායි හොති අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධනං. සෙය්‍යථාපි උදායි රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවාභිජාතො[3] සඞ්ගාමාවචරො දළ්හෙහි වරත්තෙහි[4] බන්ධනෙහි බද්ධො ඊසකඤ්ඤෙව කායං සන්නාමෙත්වා තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා යෙන කාමං පක්කමති. යො නු ඛො උදායි එවං වදෙය්‍ය: යෙහි සො රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවාභිජාතො[3] සඞ්ගාමාවචරො දළ්හෙහි වරත්තෙහි බන්ධනෙහි බද්ධො ඊසකඤ්ඤෙව කායං සන්නාමෙත්වා තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා යෙන කාමං පක්කමති. තං හි තස්ස බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො[1] කලිඞ්ගරොති. සම්මා නු ඛො සො උදායි වදමානො වදෙය්‍යාති. නො හෙතං භන්තෙ. යෙහි සො භන්තෙ රඤ්ඤො නාගො ඊසාදන්තො උබ්බූළ්හවාභිජාතො[3] සඞ්ගාමාවචරො දළ්හෙහි වරත්තෙහි බන්ධනෙහි බද්ධො ඊසකඤ්ඤෙව කායං සන්නාමෙත්වා තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා යෙන කාමං පක්කමති. තං හි තස්ස අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධනන්ති.

---

1. ථූලො – මජසං, ස්‍යා.
2. පරදත්තවුත්තා – මජසං.
3. { උරූළ්හවා අභිජාතො – මජසං.
   { උරූළ්හවාභිජාතො – ස්‍යා.
4. වාරත්තෙහි – සීමු.

උදායිය, යම්සේ කැටකිරිල්ලක් කිඳිලිය බැඳුමින් බැඳුණී එහි මැ වධයට හෝ බන්ධනයට හෝ මරණයට හෝ පැමිණේ ද, උදායිය, යමෙක් ඒ කැටකිරිල්ල යම් කිඳිලිය බැඳුමෙකින් බඳනාලද්දී එහි දී මැ වධයට හෝ බන්ධනයට හෝ මරණයට හෝ පැමිණේ ද, එයම ඇට අබල බන්ධනයෙක් දුබල බන්ධනයෙක් පූතිබන්ධනයෙක් අසාර බන්ධනයෙක් වේ යයි. කියා නම්, උදායිය, හේ කියනුයේ සැබැවක් මැ කියා දැ'යි. වහන්ස, තෙල නො වේ මැ යැ. වහන්ස, ඒ කැටකිරිල්ල යම් කිඳිලිය බැඳුමෙකින් බඳනාලද්දී එහි මැ වධයට හෝ බන්ධනයට හෝ මරණයට හෝ පැමිණේ ද එය ඇට බලවත් බන්ධනයෙක් දැඩි බන්ධනයෙක් සථිර බන්ධනයෙක් නො දිරූ බන්ධනයෙක් ස්ථූලකලිඞ්ගරයෙක් වේ ද එහෙයිනි.

එසෙයින් මැ උදායිය, මේ ඇතැම් තුච්ඡ පුරුෂයෝ 'මෙය හැරපියව'යි මා විසින් කියනු ලබන්නාහු ඔහු මෙසේ කියති : "මේ ඉතා මඳ දෑයකට කුමක් හෙයින් මේ මහණහු ඉතා වැයම් කෙරෙත් දැ"යි. ඔහු එය නො ද හැරපියති. මා කෙරෙහි ද නො සතුට පහළ කෙරෙත් හික්මෙනු කැමැති වූ යම් භික්ෂු කෙනෙක් වෙත් ද (ඔවුන් කෙරෙහි ද නො සතුට) පහළ කෙරෙත්. උදායිය, එය ඔවුන්ට බලවත් බන්ධනයෙක් දැඩි බන්ධනයෙක් සථිර බන්ධනයෙක් නො දිරූ බන්ධනයෙක් ගෙල බැඳි මහාකලිඞ්ගරයෙක් වෙයි.

තවද උදායිය, මෙසස්නෙහි කිසි කුලපුත්‍ර කෙනෙක් 'මෙය හැරපියව'යි මා විසින් කියනු ලබන්නාහු ඔහු මෙසේ කියති : "භාග්‍යවතුන් වහන්සේ අපට යමක්හු ගේ ප්‍රහාණය වදරනසේක් ද, සුගතයන් වහන්සේ අපට යමක්හු ගේ දුරලීම වදරනසේක් ද මේ ඉතා අල්ප වූ මඳ පමණ වූ ප්‍රහාතව්‍යයාගේ (බුදුන් විසින් වදළයුතු) කිමැ"යි ඔහු එ ද හැරපියති. මා කෙරෙහි ද නො සතුට නො පහළ කෙරෙති. හික්මෙනු කැමැති වූ (ශාරිපුත්‍රාදි) යම් භික්ෂු කෙනෙක් වෙත් ද ඔවුන් කෙරෙහි ද නො සතුට නො පහළ කෙරෙත්. ඔහු එය හැරපියා උත්සාහ රහිත වැ පතිතලොම ඇති වැ මෙරමා දුන් ප්‍රත්‍යයෙන් යැපෙමින් මෘගසම වූ (බලාපොරොත්තු රහිත) සිතින් යුක්ත වැ වාසය කෙරෙත්. උදායිය, එය ඔවුන්ට අබල බන්ධනයෙකි, දුබල බන්ධනයෙකි, පූතික (දිරූ) බන්ධනයෙකි, අසාර බන්ධනයෙකි. උදායිය, යම්සේ රියහිස් වැනි දළ ඇති වැඩුණු සිරුරු ඇති ජාතිසම්පන්න වූ සඞ්ග්‍රාමාවචර වූ රජුගේ ඇත් තෙමේ දැඩි වරපට බැඳුමින් බඳනා ලද්දේ මඳක් මැ කය නමා ඒ බැඳුම් සිඳ බිඳ කැමැති සේ යේ ද උදායිය, යමෙක් මෙසේ කියා නම් : "රියහිස් වැනි දළ ඇති වැඩුණු සිරුරු ඇති ජාතිසම්පන්න වූ සඞ්ග්‍රාමාවචර වූ රජුගේ ඒ ඇත් තෙමේ යම් දැඩි වරපට බැඳුමෙකින් බඳනාලද්දේ මඳක් මැ කය නමා ඒ බැඳුම් සිඳ බිඳ කැමැති සේ යෙයි. එය ඔහුට බලවත් බන්ධනයෙක, දැඩි බන්ධනයෙක, සථිර බන්ධනයෙක, අපූතික බන්ධනයෙක, ස්ථූලකලිඞ්ගරයෙකැ"යි කියා නම් උදායිය, කියන්නා වූ හේ සැබැවක් මැ කියා ද?යි. වහන්ස, තෙල නො වේ මැ යැ. වහන්ස, රියහිස් වැනි දළ ඇති වැඩුණු සිරුරු ඇති ජාතිසම්පන්න වූ සඞ්ග්‍රාමාවචර වූ රජුගේ ඒ ඇත් තෙමේ යම් දැඩි වූ වරපට බැඳුමෙකින් බඳනා ලද්දේ මඳක් මැ කය නමා ඒ බැඳුම් සිඳ බිඳ කැමැති සේ යේ ද, එය උහුට අබල බන්ධනයෙක, දුබල බන්ධනයෙක, පූතික බන්ධනයෙක, අසාර බන්ධනයෙකි.

එවමෙව ඛො උදායි ඉධෙකච්චෙ කුලපුත්තා ඉදං පජහථා’ති මයා වුච්චමානා තෙ එවමාහංසු: කිං පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස පහාතබ්බස්ස යස්ස නො භගවා පහානමාහ. යස්ස නො සුගතො පටිනිස්සග්ගමාහාති. තෙ තඤ්චෙව පජහන්ති. මයි ච න අප්පච්චයං උපට්ඨාපෙන්ති. යෙ ච භික්ඛූ සික්ඛාකාමා තෙ තම්පහාය අප්පොස්සුක්කා පන්නලොමා පරදවුත්තා[1] මිගභූතෙන චෙතසා විහරන්ති. තෙසං තං උදායි හොති අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධනං.

සෙය්‍යථාපි උදායි පුරිසො දළිද්දො අස්සකො අනාළ්හියො[2] තස්සස්ස එකං අගාරකං ඔලුග්ගවිලුග්ගං කාකාතිදායිං න පරමරූපං. එකා ඛටොපිකා ඔලුග්ගවිලුග්ගා න පරමරූපා, එකිස්සා කුම්භියා ධඤ්ඤසමවාපකං න පරමරූපං, එකා ජායිකා න පරමරූපා. සො ආරාමගතං භික්ඛුං පස්සෙය්‍ය සුධොතහත්ථපාදං මනුඤ්ඤං භොජනං භුත්තාවිං සීතාය ඡායාය නිසින්නං අධිචිත්තෙ යුත්තං. තස්ස එවමස්ස: සුඛං වත භො සාමඤ්ඤං, ආරොග්‍යං වත භො සාමඤ්ඤං, සො වතස්සං[3] යොහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො න සක්කුණෙය්‍ය එකං අගාරකං ඔලුග්ගවිලුග්ගං කාකාතිදායිං න පරමරූපං පහාය, එකං ඛටොපිකං ඔලුග්ගවිලුග්ගං න පරමරූපං පහාය, එකිස්සා කුම්භියා ධඤ්ඤසමවාපකං න පරමරූපං පහාය, එකං ජායිකං න පරමරූපං පහාය, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං.

යො නු ඛො උදායි එවං වදෙය්‍ය: යෙහි සො පුරිසො බන්ධනෙහි බද්ධො න සක්කොති, එකං අගාරකං ඔලුග්ග-විලුග්ගං-පෙ-එකං ජායිකං න පරමරූපං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. තං හි තස්ස අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධන’න්ති. සම්මා නු[4] ඛො සො උදායිවදමානො වදෙය්‍යාති. නො හෙතං භන්තෙ. යෙහි සො භන්තෙ පුරිසො බන්ධනෙහි බද්ධො න සක්කොති එකං අගාරකං ඔලුග්ගවිලුග්ගං කාකාතිදායිං න පරමරූපං පහාය, එකං ඛටොපිකං ඔලුග්ගවිලුග්ගං න පරමරූපං පහාය; එකිස්සා කුම්භියා ධඤ්ඤසමවාපකං න පරමරූපං පහාය, එකං ජායිකං න පරමරූපං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. තං හි තස්ස බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො කලිඞ්ගරොති.

එවමෙව ඛො උදායි ඉධෙකච්චෙ මොඝපුරිසා ඉදං පජහථා’ති මයා වුච්චමානා තෙ එවමාහංසු: කිං පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස. අධිසල්ලිඛතෙවායං සමණො’ති. තෙ තඤ්චෙව නප්පජහන්ති. මයි ච අප්පච්චයං උපට්ඨාපෙන්ති යෙ ච භික්ඛූ සික්ඛාකාමා තෙසන්තං උදායි හොති බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථුල්ලො කලිඞ්ගරො.

---

1. පරදත්තවුත්තා - මජසං. 2. අනාළ්හියො - ස්‍යා
3. වතස්ස - පසු. 4. සම්මන්නුඛො - මූසි.

Free Distribution www.aathaapi.org

එසෙයින් මැ උදායිය, මෙසස්නෙහි ඇතැම් කුලපුත්‍රයෝ 'මෙය දුරු කරව'යි මාවිසින් කියනු ලබන්නාහු ඔහු "භාග්‍යවතුන් වහන්සේ අපට යමක් පිළිබඳ ප්‍රහාණය වදරණසේක් ද, සුගතයන් වහන්සේ අපට යමක්හු ගේ දුරලීම වදරණසේක් ද, කුමක් හෙයින් මේ අල්පමාත්‍ර වූ මඳ පමණ වූ ප්‍රහාතව්‍යය හේතු කොට ගෙන වදරනසේක් ද'යි. ඔහු එ ද දුරු කෙරෙති, මා කෙරෙහි ද නො සතුට නො පහළ කෙරෙති, හික්මෙනු කැමැති වූ යම් භික්ෂු කෙනෙක් වෙත් ද ඔවුන් කෙරෙහි ද නො සතුට හෝ පහළ කෙරෙත්. ඔහු එය හැරපියා උත්සාහ රහිත වැ පතිතලොම ඇති වැ පරා අයත් පැවැතුම් ඇති වැ මෘගසදෘශ (බලාපොරොත්තු රහිත) සිතින් යුක්ත වැ වාසය කෙරෙත්. උදායිය, එය ඔවුන්ට අබල බන්ධනයෙක, දුබල බන්ධනයෙක, පූතිකබන්ධනයෙක, අසාරබන්ධනයෙක.

යම්සේ උදායි ය, තමා සතු කිසිවක් නැති ආඪ්‍ය නො වූ දිළිඳු පුරුෂයෙක් වේ ද, ඔහට ගිලිහුණු ගොනැස් ඇති කවුඩන් රිසිසේ හැසිරිය හැකි උත්තමස්වරූප නො වූ එක් ගෙයෙක් වන්නේ යැ. උස්පහත් වූ (වැල් ඇති) නො මනා වූ හුණුදඬුමුවා හැඳෙක් වන්නේ යැ, එක් සැළෙකැ නො මනා වූ (හමු ආදි ධාන්‍ය හා ලබු ආදි) බිජුවට වෙයි. නො මනාරූ ඇති එක් දුගී බිරිඳක් වන්නී යැ. හෙතෙම ආරාමයෙහි හුන් මොනොවට දෙවූ අත්පා ඇති මනා බොජුන් වැළැඳූ සිහිල් සෙවෙනැ හුන් ධ්‍යානභාවනායෙහි යෙදුණු මහණක්හු දක්නේ යැ. ඔහට මෙබඳු සිතෙක් වෙයි : "භවත, ශ්‍රමණභාවය එකාන්තයෙන් සැපයෙක භවත, ශ්‍රමණභාවය ඒකාන්තයෙන් ආරොග්‍යයෙකි. යම් බඳු වූ මම් ගිහිගෙන් නික්මැ කෙහෙරැවුළු බහා කහවත් හැඳ පෙරෙවැ සස්නෙහි පැවිදි වීම් නම් එකාන්තයෙන් පුරුෂ-යෙක් නම් වන්නේ යයි. හේ ගිලිහුණු ගොනැස් ඇති කවුඩන් රිසිසේ හැසිරිය හැකි උත්තමස්වරූප නො වූ එක් කුඩා ගෙය හැරපියා, උස්පහත් වූ (වැල් ඇති) නො මනා වූ හුණදඬුමුවා එක් හැඳ හැරපියා, එක් සැළෙකැ ලූ (හමු, ලබුබිජුවට ආ) ධාන්‍යසමවාපකය හැරපියා පිළිකුල් කටයුතු එක් බිරිඳ හැරපියා ගිහිගෙන් නික්ම කෙහෙරැවුළු බහා කහවත් හැඳ පෙරෙවැ පැවිදි වන්නට නො හැකි වන්නේ යැ.

උදායිය, යමෙක් මෙසේ කියා ද : "ඒ පුරුෂ තෙම යම් බන්ධනයෙකින් බැඳුණේ ගිලිහුණු ගොනැස් ඇති එක් කුඩා ගෙය . . . පිළිකුල් කටයුතු වූ එක් බිරිඳ හැරපියා ගිහිගෙන් නික්මැ කෙහෙරැවුළු බහා කහවත් හැඳ පැවිදිවන්නට නො හැක්කේ"යයි කියා නම් එය ඔහට අබල බන්ධනයෙක, දුබල බන්ධනයෙක, පූතික බන්ධනයෙක, අසාර වූ බන්ධනයෙකැ"යි. උදායිය, කියන්නා වූ හෙතෙම සැබැවක් මැ කියන්නේ ද?යි. වහන්ස, නෙල නො වේ මැ යැ. වහන්ස, යම් බන්ධනයෙකින් බැඳුණු ඒ පුරුෂ තෙමේ ගිලිහුණු ගොනැස් ඇති කවුඩන් රිසිසේ පිවිසිය හැකි නො මනා වූ එක් කුඩා ගෙපැල හැරපියා, උස්මිටි වූ නො මනා වූ එක් හුණදඬු හැඳ හැරපියා, එක් සැළෙකැ ලූ නො අගනා (හමු, ලබුබිජු ආ) ධාන්‍යසමවාපය හැරපියා, පිළිකුල් කටයුතු වූ එක් බිරිඳ හැරපියා ගිහිගෙන් නික්මැ කෙහෙරැවුළු බහා කසටවත් හැඳ පෙරෙවැ සස්නෙහි පැවිදි වන්නට නො පොහොසත් වන්නේ යැ. එය ඔහට බලවත් බන්ධනයෙක, දෘඪ බන්ධනයෙක, ස්ථිර බන්ධනයෙක, නො දිරූ බන්ධනයෙක, ගෙලෙ බැඳි මහදඬුකඬෙකි.

උදායිය, එසෙයින් මැ මෙලොවැ ඇතැම් තුච්ඡපුරුෂයෝ මා විසින් 'මෙය හැරපියව'යි කියනු ලබන්නාහු ඔහු මෙසේ කියති : මේ අල්පමාත්‍ර වූ මඳපමණ වූ කරුණක් හේතු කොට කුමක් කියයුතු ද? මේ මහණහු අධික වැ වෑයම් කෙරෙත්"යයි. ඔහු ඒ අල්ප-මාත්‍රය ද නොහැරපියති, මා කෙරෙහි ද නො සතුට පහළ කෙරෙති. හික්මෙනු කැමැති වූ යම් භික්ෂු කෙනෙක් වෙත් ද, ඔවුන් කෙරෙහි ද නො සතුට පහළ කෙරෙත්. උදායිය, එය ඔවුන්ට බලවත් බන්ධනයෙක, දෘඪ බන්ධනයෙක, ස්ථිර බන්ධනයෙක, අපූතික බන්ධනයෙක, ගෙලෙ බැඳි මහා කලිඞ්ගරයෙකි.

සෙය්‍යථාපි උදායි ගහපති වා ගහපතිපුත්තො වා අඩ්ඪො මහද්ධනො මහාභොගො, නෙකානං නික්ඛගණානං චයො නෙකානං ධඤ්ඤගණානං චයො නෙකානං ඛෙත්තගණානං චයො නෙකානං වත්ථුගණානං චායො නෙකානං භරියාගණානං චයො නෙකානං දාසගණානං චයො නෙකානං දාසිගණානං චයො, සො ආරාමගතං භික්ඛුං පස්සෙය්‍ය සුධොතහත්ථපාදං මනුඤ්ඤං භොජනං භුත්තාවිං සීතාය ඡායාය නිසින්නං අධිචිත්තෙ යුත්තං, තස්ස එවමස්ස: සුඛං වත භො සාමඤ්ඤං, ආරොග්‍යං වත භො සාමඤ්ඤං, සො වතස්සං යොහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. සො සක්කුණෙය්‍ය නෙකානි නික්ඛගණානි පහාය, නෙකානි ධඤ්ඤගණානි පහාය, නෙකානි ඛෙත්තගණානි පහාය, නෙකානි වත්ථුගණානි පහාය, නෙකානි භරියාගණානි පහාය, නෙකානි දාසගණානි පහාය, නෙකානි දාසිගණානි පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං.

යො නු ඛො උදායි එවං වදෙය්‍ය: යෙහි සො ගහපති වා ගහපතිපුත්තො වා බන්ධනෙහි බද්ධො සක්කොති-පෙ-නෙකානි දාසිගණානි පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං තං හි තස්ස බලවං බන්ධනං දළ්හං බන්ධනං ථිරං බන්ධනං අපූතිකං බන්ධනං ථූලො කලිඞ්ගරොති. සම්මා නු[1] ඛො සො උදායි වදමානො වදෙය්‍යා'ති. නො හෙතං භන්තෙ. යෙහි සො භන්තෙ ගහපති වා ගහපතිපුත්තො වා බන්ධනෙහි බද්ධො සක්කොති නෙකානි නික්ඛගණානි පහාය, නෙකානි ධඤ්ඤගණානි පහාය, නෙකානි ඛෙත්තගණානි පහාය, නෙකානි වත්ථුගණානි පහාය, නෙකානි භරියාගණානි පහාය, නෙකානි දාසගණානි පහාය, නෙකානි දාසිගණානි පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. තං හි තස්ස අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධනන්ති. එවමෙව ඛො උදායි ඉධෙකච්චෙ කුලපුත්තා, ඉදං පජහථාති මයා වුච්චමානා තෙ එවමාහංසු: 'කිං පනිමස්ස අප්පමත්තකස්ස ඔරමත්තකස්ස පහාතබ්බස්ස යස්ස නො භගවා පහානමාහ. යස්ස නො සුගතො පටිනිස්සග්ගමාහා'ති තෙ තඤ්චෙව පජහන්ති. මයි ච න අප්පච්චයං උපට්ඨාපෙන්ති. යෙ ච භික්ඛූ සික්ඛාකාමා තෙ තං පහාය අප්පොස්සුක්කා පන්නලොමා පරදවුත්තා මිගභූතෙන චෙතසා විහරන්ති. තෙසං තං උදායි හොති අබලං බන්ධනං දුබ්බලං බන්ධනං පූතිකං බන්ධනං අසාරකං බන්ධනං.

චත්තාරො මෙ උදායි පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො: ඉධුදායි එකච්චො පුග්ගලො උපධිපහානාය පටිපන්නො හොති උපධිපටිනිස්සග්ගාය. තමෙනං උපධිපහානාය පටිපන්නං උපධිපටිනිස්සග්ගාය උපධිපටිසඤ්ඤුත්තා සරසඞ්කප්පා සමුදාචරන්ති. සො තෙ අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න බ්‍යන්තීකරොති. න අනභාවං ගමෙති. ඉමං ඛො අහං උදායි පුග්ගලං සඤ්ඤුත්තො'ති වදාමි නො විසඤ්ඤුත්තො. තං කිස්ස හෙතු: ඉන්ද්‍රියවෙමත්තතා හි මෙ උදායි ඉමස්මිං පුග්ගලෙ විදිතා.

---

1. සම්මන්නු - සීමු.

යම්සේ උදයිය, ධනයෙන් ආඪ්‍ය වූ මහද්ධන ඇති මහත් උපභෝගපරිභෝග ඇති නොයෙක් සියගණන් සුවර්ණනිෂ්ක ඇති නොයෙක් සියගණන් ධාන්‍යශකටරාශි ඇති නොයෙක් සියගණන් කෙත් සමූහ ඇති නොයෙක් සියගණන් වතුසමූහ ඇති නොයෙක් සියගණන් භාර්‍ය්‍යාසමූහ ඇති නොයෙක් සියගණන් දසසමූහයා ඇති නොයෙක් සියගණන් දසීසමූහයා ඇති ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ වෙයි. හේ අරම්හි හුන් මොනොවට දෙවී අත්පා ඇති මනහර බොජුන් වැළඳූ සිහිල් සෙවණෙහි හුන් ධ්‍යාන භාවනායෙහි යෙදුණු මහණක්හු දක්නේ යැ. එකල්හි ඔහට මෙසිත වෙයි. ''භවත එකත්තෙන් ශ්‍රමණභාවය සුවයෙක. භවත, එකත්තෙන් ශ්‍රමණ භාවය ආරෝග්‍යයෙකි. මම් කෙසෙ දළිරවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වෙම් නම් මැනැවැ''යි. හේ නොයෙක් සියගණන් සුවර්ණනිෂ්කරාශින් හැරපියා, නොයෙක් සියගණන් ධාන්‍යශකටරාශීන් හැරපියා, නොයෙක් සියගණන් කෙත් සමූහයන් හැරපියා නොයෙක් සියගණන් වතු සමූහයන් හැරපියා, නොයෙක් සියගණන් භාර්‍ය්‍යාසමූහයන් හැරපියා, නොයෙක් සියගණන් දසගණයා හැරපියා, නොයෙක් සියගණන් දසීගණයා හැරපියා, කෙසෙ දළිරවුළු බහා කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වන්නට හැකි වන්නේ යැ.

උදයිය, යමෙක් මෙසේ කියා නම් : ''ඒ ගැහැවි හෝ ගැහැවිපුත් හෝ යම් බන්ධනයෙකින් බැඳුණේ . . . නොයෙක් සියගණන් දසීගණයා හැරපියා කෙස් රවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්මැ ශාසනයෙහි පැවිදි වන්නට හැකි වේ ද, එය ඔහට බලවත් බන්ධනයෙක, දෘඪබන්ධනයෙක, ස්ථිරබන්ධනයෙක, අපූතිකබන්ධනයෙක, (ගෙල බැඳි) ස්ථූල වූ කලිඞ්ගරයෙකැ''යි කියා නම්, මෙසේ හෙතෙම සැබවක් මැ කියා ද?යි. වහන්ස, තෙල නො වේ මැ යැ. වහන්ස, යම් බන්ධනයෙකින් බැඳුණු ඒ ගැහැවි හෝ ගැහැවිපිත් හෝ නොයෙක් සියගණන් සුවර්ණනිෂ්කරාශීන් හැරපියා නොයෙක් සියගණන් ධාන්‍යශකටරාශීන් හැරපියා නොයෙක් සියගණන් කෙත් සමූහයන් හැරපියා නොයෙක් සියගණන් වතු සමූහයන් හැරපියා නොයෙක් සියගණන් භාර්‍ය්‍යාසමූහයන් හැරපියා නොයෙක් සියගණන් දසගණයා හැරපියා නොයෙක් සියගණන් දසීගණයා හැරපියා කෙසෙ රවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වන්නට පොහොසත් වේ ද, එය ඔහට අබල බන්ධනයෙක, දුබල බන්ධනයෙක, පූතික බන්ධනයෙක, අසාර බන්ධනයෙකැ'යි . එසෙයින් මැ උදයිය, මෙහි කිසි කුලපුත්‍ර කෙනෙක් ''මෙය හැරපියව''යි මා විසින් කියනු ලබන්නාහු ඔහු මෙසේ කියති : ''භාග්‍යවතුන් වහන්සේ අපට යමක් පිළිබඳ ප්‍රහාණය වදරණසේක් ද සුගතයන් වහන්සේ අපට යමක් පිළිබඳ දුරලීම වදරණසේක් ද, මේ අල්පමාත්‍ර වූ පරිත්තමාත්‍ර වූ ප්‍රහාතව්‍යයට වදළයුතු කිමැ''යි. ඔහු එ ද හැරපියති. මා කෙරෙහි ද නො සතුට නො පහළ කෙරෙති. හික්මෙනු කැමැති යම් භික්ෂු කෙනෙක් වෙත් නම් ඔවුන් කෙරෙහි ද නො සතුට නො පහළ කෙරෙත්. ඔහු එය හැරපියා උත්සාහ රහිත වැ පතිතලොම ඇති වැ මෙරමා දුන් ප්‍රත්‍යයෙන් යැපෙමින් මෘගසම වූ (බලාපොරොත්තු රහිත) සිතින් යුක්ත වැ වාසය කෙරෙත්. උදයිය, එය ඔවුනට අබල බන්ධනයෙක, දුබල බන්ධනයෙක, පූතික (දිරූ) බන්ධනයෙක, අසාර බන්ධනයෙකැ''යි.

උදයිය, මෙලොවැ විද්‍යමාන වූ පුද්ගලයෝ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙකැ යත් : උදයිය, මෙලොවැ එක් පුද්ගලයෙක් (ස්කන්ධාදි) උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන්නේ වෙයි. උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන් මොහු උපධිප්‍රතිසංයුක්ත වූ (උපධි අනුව දිවෙන) (හී බඳු) විතර්කයෝ මැඩලති. හේ ඔවුන් ඉවසයි, නො හරියි, දුරු නො කෙරෙයි, විගතාන්ත නො කෙරෙයි, අනභාවයට නො පමුණුවයි, උදයිය, මම මේ පුද්ගලයා 'ක්ලෙශසංයුක්ත' යයි කියමි. 'විසංයුක්ත'යයි නො කියමි. ඒ කවර හෙයින යත් : යම් හෙයකින් උදයිය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉන්ද්‍රියනානාත්වය දන්නාලද ද එහෙයිනි.

ඉධ පනුදායි එකච්චො පුග්ගලො උපධිපහානාය පටිපන්නො හොති උපධිපටිනිස්සග්ගාය. තමෙනං උපධි පහානාය පටිපන්නං උපධිපටිනිස්සග්ගාය, උපධිපටිසඤ්ඤුත්තා සරසඞ්කප්පා සමුදාචරන්ති. සො තෙ නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. ඉමම්පි ඛො අහං උදායි පුග්ගලං සඤ්ඤුත්තොති වදාමි නො විසඤ්ඤුත්තො. තං කිස්ස හෙතු: ඉන්ද්‍රියවෙමත්තතා හි මෙ උදායි ඉමස්මිං පුග්ගලෙ විදිතා.

ඉධ පනුදායි එකච්චො පුග්ගලො උපධිපහානාය පටිපන්නො හොති උපධිපටිනිස්සග්ගාය. තමෙනං උපධිපහානාය පටිපන්නං උපධිපටිනිස්සග්ගාය කදාචි කරහචි සතිසම්මොසා උපධිපටිසඤ්ඤුත්තා සරසඞ්කප්පා සමුදාචරන්ති. දන්ධො උදායි සතුප්පාදෙ. අථ ඛො නං ඛිප්පමෙව පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. සෙය්‍යථාපි උදායි පුරිසො දිවසසන්තත්තෙ අයොකටාහෙ ද්වෙ වා තීණි වා උදකඵුසිතානි නිපාතෙය්‍ය. දන්ධො උදායි උදකඵුසිතානං නිපාතො. අථ ඛො නං ඛිප්පමෙව පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. එවමෙව ඛො උදායි ඉධෙකච්චො පුග්ගලො උපධිපහානාය පටිපන්නො හොති උපධිපටිනිස්සග්ගාය. තමෙනං උපධිපහානාය පටිපන්නං උපධිපටිනිග්ගාය, කදාචි කරහචි සතිසම්මොසා උපධිපටිසඤ්ඤුත්තා සරසඞ්කප්පා සමුදාචරන්ති. දන්ධො උදායි සතුප්පාදෙ. අථ ඛො නං ඛිප්පමෙව පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. ඉමම්පි ඛො අහං උදායි පුග්ගලං සඤ්ඤුත්තො'ති වදාමි නො විසඤ්ඤුත්තො, තං කිස්ස හෙතු: ඉන්ද්‍රියවෙමත්තතා හි මෙ උදායි ඉමස්මිං පුග්ගලෙ විදිතා.

ඉධ පනුදායි එකච්චො පුග්ගලො 'උපධි දුක්ඛස්ස මූල'න්ති ඉති විදිත්වා නිරූපධි හොති උපධිසඞ්ඛයෙ විමුත්තො. ඉමං ඛො අහං උදායි පුග්ගලං විසඤ්ඤුත්තො'ති වදාමි නො සඤ්ඤුත්තො. තං කිස්ස හෙතු: ඉන්ද්‍රියවෙමත්තතා හි මෙ උදායි ඉමස්මිං පුග්ගලෙ විදිතා.

පඤ්ච ඛො ඉමෙ උදායි කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා[1]. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො උදායි පඤ්ච කාමගුණා. යං ඛො උදායි ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති කාමසුඛං මීළ්හසුඛං පුථුජ්ජනසුඛං අනරියසුඛං න සෙවිතබ්බං[2] න භාවෙතබ්බං න බහුලීකාතබ්බං. භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමි.

ඉධුදායි භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධසුඛං ආසෙවිතබ්බං භාවෙතබ්බං බහුලීකාතබ්බං. න භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමි.

---

1. රජනීයා - සීමු.
2. ආසෙවිතබ්බං - PTS.

තවද උදයිය, මෙලොවැ එක් පුද්ගලයෙක් උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන්නේ වෙයි. උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන් මොහු උපධිප්‍රතිසංයුක්ත වූ ශරසංකල්ප (විතර්ක) යෝ මැඩලති. හේ ඒ විතර්කයන් නො ඉවසයි, හැරපියයි, දුරු කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි. උදයිය, මම මේ පුද්ගල ද 'සංයුක්ත'යයි කියමි. 'විසංයුක්ත' යයි නො කියමි. ඒ කවර හෙයින යත් : යම් හෙයෙකින් උදයිය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉන්ද්‍රිය නානාත්වය දන්නාලද ද, එහෙයිනි.

තවද උදයිය, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන්නේ වෙයි. උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන් මොහු කිසි කලෙකැ ස්මෘති විප්‍රවාසයෙන් උපධිප්‍රතිසංයුක්ත වූ ශරසංකල්පයෝ මැඩලති, උදයිය, ස්මෘතිහුගේ උපැත්ම ලස් වෙයි. එතෙකුදුවත් එය යුහුව මැ හැරපියයි, දුරු කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනු අභාවයට පමුණුවයි. යම්සේ උදයිය, දවස මුළුල්ලෙහි මොනොවට තවනලද යකබලෙක්හි දියබිඳු දෙකක් හෝ තුනක් හෝ හෙළා නම් උදයිය, දියබිඳු හෙළීම ලස් වෙයි, එතෙකුදුවත් එය යුහුවැ මැ ක්ෂයට විනාශයට යන්නේ ද, එසෙයින් මැ උදයිය, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන්ගේ දුරලීම පිණිස පිළිපන්නේ වෙයි. උපධීන්ගේ ප්‍රහාණය පිණිස උපධීන් ගේ දුරලීම පිණිස පිළිපන් මොහු කිසි කලෙකැ ස්මෘති විප්‍රවාසයෙන් උපධිප්‍රතිසංයුක්ත වූ ශරසංකල්පයෝ මැඩලති. උදයිය ස්මෘතිහුගේ උපැත්ම ලස් වෙයි, එතෙකුදුවත් එය යුහුවැ මැ හැරපියයි දුරු කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි. උදයිය, මම මේ පුද්ගල ද 'සංයුක්ත' යයි කියමි. 'විසංයුක්ත' යයි නො කියමි, ඒ කවර හෙයින යත් : යම් හෙයෙකින් උදයිය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉන්ද්‍රියනානාත්වය දන්නාලද ද එහෙයිනි.

උදයිය, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් ස්කන්ධොපධිය දුකට මුලැ'යි මෙසේ දැන උපධිසඞ්ඛ්‍ය සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි ආලම්බන හෙයින් මිදුණේ උපධි රහිත වූයේ වෙයි. උදයිය, මේ පුද්ගලයා විසංයුක්ත යැ යි මම් කියමි. සංයුක්ත යැ'යි නො කියමි. ඒ කවර හෙයින යත් : යම් හෙයකින් උදයිය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉන්ද්‍රිය-නානාත්වය දන්නාලද ද එහෙයිනි. උදයිය, මේ සතර පුහුල්හු ලොවැ ඇත්තාහු විද්‍යමාන වෙත්.

උදයිය, මේ කාමගුණයෝ පස් දෙනෙකි : කවර පස් දෙනෙක යත් : ඇසින් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාවය ඇති කාමනිශ්‍රිත වූ රාගොත්පත්තියට කරුණු වූ රූපයෝ යැ කනින් දතයුතු වූ ශබ්දයෝ යැ . . . නැහැයෙන් දතයුතු වූ ගන්ධයෝ යැ . . . දිවින් දතයුතු වූ රසයෝ යැ . . . කයින් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාවය ඇති කාමනිශ්‍රිත වූ රාගොත්පත්තියට කරුණු වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. උදයිය, මොහු පස්කම්ගුණයෝ යි. උදයිය, මේ පස්කම්ගුණයන් පිණිස යම් සුවයෙක් සොම්-නසෙක් උපදි ද මේ කාමසුඛ යැ අමෙධ්‍ය (අපවිත්‍ර) සුඛ යැ පෘථග්ජන සුඛයැ අනාර්‍ය්‍යසුඛ යැ යි කියනු ලැබෙයි. නො සෙවියයුතු යැ, නො වැඩියයුතු යැ, පුනපුනා නො වැඩියයුතු යැ, තෙල සුඛයට බියවියයුතු යැ යි කියමි.

උදයිය, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසල්දහමින් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟබව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට . . . . තෘතීයධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මේ නෛෂ්ක්‍රම්‍යසුඛ යැ, ප්‍රවිවෙකසුඛ යැ, ව්‍යුපශමසුඛ යැ, සම්බොධසුඛ යැ යි කියනු ලැබෙයි. සෙවන කටයුතු යැ, භාවනා කටයුතු යැ, බහුල කටයුතු යැ, තෙල සුඛයට බිය නො වියයුතු යයි කියමි.

ඉධුදායි භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො අහං උදායි ඉඤ්ජිතස්මිං වදාමි. කිඤ්ච තත්‍ථ ඉඤ්ජිතස්මිං: යදෙව තත්‍ථ විතක්කවිචාරා අනිරුද්ධා හොන්ති, ඉදං තත්‍ථ ඉඤ්ජිතස්මිං.

ඉධුදායි භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ-දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පි ඛො අහං උදායි ඉඤ්ජිතස්මිං වදාමි. කිඤ්ච තත්‍ථ ඉඤ්ජිතස්මිං: යදෙව තත්‍ථ පීතිසුඛං අනිරුද්ධං හොති, ඉදං තත්‍ථ ඉඤ්ජිතස්මිං.

ඉධුදායි භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදම්පි ඛො අහං උදායි ඉඤ්ජිතස්මිං වදාමි. කිඤ්ච තත්‍ථ ඉඤ්ජිතස්මිං: යදෙව තත්‍ථ උපෙක්ඛාසුඛං අනිරුද්ධං හොති. ඉදං තත්‍ථ ඉඤ්ජිතස්මිං.

ඉධුදායි භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො අහං උදායි අනිඤ්ජිතස්මිං වදාමි.

ඉධුදායි භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො. ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො. ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි. පජහථාති වදාමි. සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො. ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්‍ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො. ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, අයං තස්ස සමතික්කමො, ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්‍ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො. ඉදම්පි ඛො අහං උදායි අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං තස්ස සමතික්කමො, ඉදම්පි ඛො අහං උදායි

උදයිය, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙයි. උදයිය, 'මේ ඉඤ්ජිත යැ'යි මම කියමි. එහි ඉඤ්ජිතය (කම්පනය) කිමෙක යත් : එහි යම් මැ විතර්කවිචාර කෙනෙක් නිරුද්ධ නො වූවාහු වෙත් ද, මේ එහි ඉඤ්ජිතය වෙයි.

උදයිය, මෙ සස්නෙහි මහණ විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානය උපදවා වෙසෙයි. උදයිය, මෙ ද මම 'ඉඤ්ජිත යැ'යි කියමි. එහි 'ඉඤ්ජිත' නම් කිමෙක යත් : එහි යම්මැ ප්‍රීතිසුඛයෙක් නිරුද්ධ නො වූයේ වේ ද, මේ එහි 'ඉඤ්ජිත' වෙයි.

උදයිය, මෙ සස්නෙහි මහණ ප්‍රීතියගේ ද විරාගයෙන් . . . තෘතීයධ්‍යානය උපදවා වෙසෙයි, උදයිය, මෙ ද මම 'ඉඤ්ජිත' යයි කියමි. එහි ඉඤ්ජිත නම් කිමෙක යත් : එහි යම් මැ උපෙක්ෂාසුඛයෙක් නිරුද්ධ නො වූයේ වේ ද මේ එහි 'ඉඤ්ජිත' වෙයි.

උදයිය, මෙ සස්නෙහි මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානය උපදවා වෙසෙයි. උදයිය, 'මේ 'අනිඤ්ජිත'යයි මම කියමි.

උදයිය, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙමි. උදයිය, මම මේ නො කටයුතු ආලය ඇත්තකැ'යි කියමි. හැරපියව යි කියමි. ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි මහණ විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් . . . . ද්විතීයධ්‍යානය උපදවා වෙසෙයි. මෙ එහි සමතික්‍රමණ වෙයි. උදයිය මෙ ද මම නො කටයුතු ආලය ඇත්තකැ යි කියමි. හැරපියව යි කියමි. ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි ප්‍රීතියගේ ද විරාගයෙන් . . . තෘතීයධ්‍යානය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම නො කටයුතු ආලය ඇත්තකැ යි කියමි. හැරපියව යි කියමි. ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . . චතුර්ථධ්‍යානය උපදවා වෙසෙයි. මෙ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම නො කටයුතු ආලය ඇත්තකැ යි කියමි. හැරපියව යි කියමි. ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් නැසීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්ත යැ'යි ආකාසානඤ්චායතනය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම නො කටයුතු ආලය ඇත්තකැ යි කියමි. හැරපියව යි කියමි. ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාර යෙන් ආකාසානඤ්චායතනය ඉක්ම 'විඥානය අනන්ත යැ'යි විඤ්ඤාණඤ්චායතනය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම නො කටයුතු ආලය ඇත්තකැ'යි කියමි හැරපියව යි කියමි, ඉක්මව යි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදයිය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම ආලය නො කටයුත්තකැ'යි කියමි, 'හැරපියව'යි කියමි, 'ඉක්මව'යි කියමි. එහි සමතික්‍රමණ කවරෙයත් : උදයිය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤා යතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. උදයිය, මෙ ද මම 'නො කටයුතු ආලය ඇත්තකැ'යි කියමි, හැරපියව'යි කියමි,

අනලන්ති වදාමි, පජහථාති වදාමි, සමතික්කමථාති වදාමි. කො ච තස්ස සමතික්කමො: ඉධුදායි භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, අයං තස්ස සමතික්කමො. ඉති ඛො අහං උදායි නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්සපි පහානං වදාමි. පස්සසි නො ත්වං උදායි තං සංයොජනං අණුං වා ථූලං වා, යස්සාහං නො පහානං වදාමීති. නො හෙතං භන්තෙති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා උදායි භගවතො භාසිතං අභිනන්දීති.

ලටුකිකොපම සුත්තං ඡට්ඨං.

ඉක්මවයි කියමි. එහි සමතික්‍රමණ කවරෙ යත් : උදායිය, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සංඥාවෙදයිතනිරොධය උපදවා වෙසෙයි. මේ එහි සමතික්‍රමණ වෙයි. මෙසෙයින් උදායිය, මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ද ප්‍රහාණය කියමි. මෙසෙයින් උදායිය, මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ද ප්‍රහාණය කියමි. උදායිය, මම යම් සංයෝජනයක්හු ගේ ප්‍රහාණය නො කියම් නම් අණුමාත්‍ර වූ හෝ ස්ථූල වූ හෝ ඒ සංයෝජනයක් තෙපි දක්නාවූ ද'යි. වහන්ස, නෙලෙ නැත් මැ යි.

බුදුහු මෙය වදාළහ. සතුටුසිත් ඇති ආයුෂ්මත් උදායි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතයට සතුටු වූහ යි.

සවැනි ලටුකිකොපම සූත්‍ර යි.

---

2. 2. 7

චාතුම සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා චාතුමායං විහරති ආමලකීවනෙ තෙන ඛො පන සමයෙන සාරිපුත්තමොග්ගල්ලානපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි චාතුමං අනුප්පත්තානි හොන්ති භගවන්තං දස්සනාය. තෙ ච ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා අහෙසුං. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි[1]: 'කෙ පනෙතෙ ආනන්ද උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ'ති.

'එතානි භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි චාතුමං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙ ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා'ති. තෙන හානන්ද මම වචනෙන තෙ භික්ඛූ ආමන්තෙහි. සත්ථායස්මන්තෙ ආමන්තෙතී'ති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: 'සත්ථායස්මන්තෙ ආමන්තෙතී'ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: 'කින්නු තුම්හෙ භික්ඛවෙ උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ'ති.

'ඉමානි භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි චාතුමං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙමෙ ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා'ති. 'ගච්ඡථ භික්ඛවෙ පණාමෙමි වො, න වො මම සන්තිකෙ වත්ථබ්බ'න්ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය පක්කමිංසු.

තෙන ඛො පන සමයෙන චාතුමෙය්‍යකා සක්‍යා සන්ථාගාරෙ සන්නිපතිතා හොන්ති කෙනචිදෙව කරණීයෙන, අද්දසංසු[1] ඛො චාතුමෙය්‍යකා සක්‍යා තෙ භික්ඛූ දූරතොව ගච්ඡන්තෙ, දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොචුං: 'හන්ද කහං පන තුම්හෙ ආයස්මන්තො ගච්ඡථා'ති. 'භගවතා ඛො ආවුසො භික්ඛුසඞ්ඝො පණාමිතො'ති. 'තෙන හායස්මන්තො මුහුත්තං නිසීදථ, අප්පෙව නාම මයං සක්කුණෙය්‍යාම භගවන්තං පසාදෙතු'න්ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ චාතුමෙය්‍යකානං සක්‍යානං පච්චස්සොසුං.

---

1. අද්දසාසුං – සීමු, PTS.

Free Distribution www.aathaapi.org

ඪ. 2. 7

චාතුම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ 'චාතුමා' නම් ගම්හි වූ ඇඹුළු වෙනෙහි වැඩ වසනසේක. එසමයෙහි සැරියුත්මුගලන් දෙතෙරණුවන් ප්‍රමුඛ පන්සියක් පමණ (නව පැවිදි) මහණහු චාතුමාවට භාග්‍යවතුන් දක්නා පිණිස පැමිණියාහු වෙති. ඒ අමුතු මහණහු ද නේවාසික භික්ෂූන් හා සමග පිළිසඳරකථා කරන්නාහු සෙනසුන් පනවන්නාහු පාසිවුරු සඟවන්නාහු උස්හඬ මහහඬ ඇති වූහ. එකල්හි බුදුහු ආනන්දය, මසුන් වොලොගැන්මෙහි කෙවුළන් සෙයින් තෙලෙ කවුරු උස්හඬ මහහඬ ඇත්තාහු දැ'යි ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමැතූහ.

වහන්ස, තෙල සැරියුත්මුගලන් ප්‍රමුඛ පන්සියක් පමණ මහණහු භාග්‍යවතුන් දක්නා පිණිස චාතුමාවට පැමිණියාහ. ඒ අමුතු මහණහු නිවැසි මහණුන් හා සමග පිළිසඳර කථා කරන්නාහු සෙනසුන් පනවන්නාහු පාසිවුරු සඟවන්නාහු උස්හඬ මහහඬ ඇත්තාහ'' යි කීහ. එසේ වී නම් ආනන්දය 'බුදුහු ආයුෂ්මතුන් අමතන්නාහ'යි මාගෙ වචනයෙන් ඒ මහණුන් කැඳව'යි වදළහ. 'එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ඒ මහණුන් කරා එළැඹ 'බුදුහු ආයුෂ්මතුන් අමතන්නාහ'යි තෙල වදන් කීහ. 'එසේ යැ ඇවැත්නි'යි ආයුෂ්මත් අනඳතෙරුන්ට පිළිවදන් අස්වා බුදුන් කරා එළැඹ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ භික්ෂූන්ට බුදුහු මෙය වදළහ : කිම මහණෙනි, තෙපි මසුන් වොලොගැන්මෙහි කෙවුළන් සෙයින් උස්හඬ මහහඬ ඇති වූහු දැ'යි.

වහන්ස, මේ සැරියුත්මුගලන් දෙතෙරණුවන් ප්‍රමුඛ පන්සියක් පමණ මහණහු භාග්‍ය-වතුන් දක්නා පිණිස චාතුමාවට පැමිණියාහ. ඒ අමුතු මහණහු නේවාසික භික්ෂූන් හා සමඟ පිළිසඳර කථා කරන්නාහු සෙනසුන් පනවන්නාහු පාසිවුරු සඟවන්නාහු උස්හඬ මහහඬ ඇත්තාහ'යි. යව මහණෙනි, තොප පණාමන (බැහැර) කෙරෙමි. තොප මා'වෙත නො විසියයුතු'යයි. වදළහ. 'එසේ යැ වහන්සැ'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා අසුනින් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට සෙනසුන ගොපනය කොට පාසිවුරු ගෙන නික්ම ගියහ.

එසමයෙහි චාතුම වැසි ශාක්‍යයෝ කිසි කටයුත්තෙකින් සන්ථාගාරයෙහි රැස්වූවාහු වෙති, චාතුමාවැසි ශාක්‍යයෝ දුරින් මැ යන ඒ භික්ෂූන් දුටුවාහු ය. දැක, ඒ භික්ෂූන් කරා එළඹියාහු ය. එළඹ, ඒ භික්ෂූන්ට මෙපවත් කීහ : ''සොඳය, ආයුෂ්මත්නි තෙපි (දූන්ම අවුත්) කොහි යවු දැ''යි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂුසඞ්ඝයා පණාමන කරන ලදැයි කීහ. එසේ නම් ඇවැත්නි මොහොතක් හුන මැනැව, අපි භාග්‍ය-වතුන් වහන්සේ පහදවාලන්නට හැකි වන්නමෝ නම් යෙහෙකැ'යි කීහු, 'එසේ යැ ඇවැත්නි, ඒ භික්ෂූහු චාතුමාවැසි සැහැරජුනට පිළිවදන් ඇස්වූහු.

Free Distribution www.aathaapi.org

අථ ඛො චාතුමෙය්‍යකා සක්‍යා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො චාතුමෙය්‍යකා සක්‍යා භගවන්තං එතදවොචුං: 'අභිනන්දතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං, අභිවදතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං, සෙය්‍යථාපි භන්තෙ භගවතා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො, එවමෙව[1] භගවා එතරහි අනුගණ්හාතු භික්ඛුසඞ්ඝං. සන්තෙත්ථ භන්තෙ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං දස්සනාය අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො. සෙය්‍යථාපි භන්තෙ බීජානං තරුණානං උදකං අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො, එවමෙව ඛො භන්තෙ සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං දස්සනාය අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො.

සෙය්‍යථාපි භන්තෙ වච්ඡස්ස තරුණස්ස මාතරං අපස්සන්තස්ස සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො, එවමෙව ඛො භන්තෙ සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො. අභිනන්දතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං. අභිවදතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං. සෙය්‍යථාපි භන්තෙ භගවතා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො. එවමෙව භගවා එතරහි අනුගණ්හාතු භික්ඛුසඞ්ඝ'න්ති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: අභිනන්දතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං, අභිවදතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං. සෙය්‍යථාපි භන්තෙ භගවතා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො. එවමෙව භගවා එතරහි අනුගණ්හාතු භික්ඛුසඞ්ඝං. සන්තෙත්ථ භන්තෙ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්ම විනයං. තෙසං භගවන්තං දස්සනාය අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො.

සෙය්‍යථාපි භන්තෙ බීජානං තරුණානං උදකං අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො. එවමෙව ඛො භන්තෙ සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්ම විනයං, තෙසං භගවන්තං දස්සනාය අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො.

සෙය්‍යථාපි භන්තෙ වච්ඡස්ස තරුණස්ස මාතරං අපස්සන්තස්ස සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො. එවමෙව ඛො භන්තෙ සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිනාමො. අභිනන්දතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං, අභිවදතු භන්තෙ භගවා භික්ඛුසඞ්ඝං. සෙය්‍යථාපි භන්තෙ භගවතා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො, එවමෙව භගවා එතරහි අනුගණ්හාතු භික්ඛු සඞ්ඝ'න්ති

---

1. එවමෙවං - සීමු.

ඉක්බිති චාතුමාවැසි සැහැරජහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියාහු ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ අභිවාදන කොට එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් චාතුමාවැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල කරුණ සැළකළහ : ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා අභිනන්දන කෙරෙත්වා (ඊම රුස්මීන් තුටු වෙත්වා) වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ස්වාගත කොට බෙණෙත්වා, වහන්ස භාග්‍යවතුන් විසින් යම්සේ පෙර භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කරනලද නම් එසෙයින් මැ භාග්‍යවත්හු දැන් භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කරන සේක්වා. වහන්ස, මෙහි පැවිදි වූ නො බෝකල් ඇති මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත. භාග්‍යවතුන් දක්නට නො ලැබෙන ඔවුනට ප්‍රසාද අන්‍යථාත්වය වන්නේ ය. විපරිණාමාන්‍යථාත්වය වන්නේ ය. වහන්ස, යම්සේ දියවර නො ලැබෙන තරුණබීජයන්ගේ (මලානයෙන්) අන්‍යථාත්වය වන්නේ ද විපරිණාමය වන්නේ ද, එසෙයින් මැ වහන්ස, මෙහි පැවිදි වූ නො බෝකල් ඇති මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත. භාග්‍යවතුන් දක්නට නො ලැබෙන ඔවුනට අන්‍යථාත්වය වන්නේ යැ විපරිණාමය වන්නේ යැ.

වහන්ස, යම්සේ මව නො දක්නා තුරුණු වස්සාට අන්‍යථාත්වය වන්නේ ද. විපරිණාමය වන්නේ ද, එසෙයින් මැ වහන්ස මෙහි පැවිදි වූ නො බෝකල් ඇති මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත.. භාග්‍යවතුන් නො දක්නා ඔවුනට අන්‍යථාත්වය වන්නේ යැ, විපරිණාමය වන්නේ යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා අභිනන්දන කෙරෙත්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ස්වාගත කොට බෙණෙත්වා. වහන්ස, යම්සේ භාග්‍යවතුන් විසින් පෙර භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කරන ලද ද, එසෙයින් මැ භාග්‍යවත්හු දැන් භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කෙරෙත්වා''යි කීහ.

එකල්හි සහම්පතිබ්‍රහ්ම තමාගේ සිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිවිතර්කය දැන යම්සේ නම් බලවත් පුරුෂයෙක් වක් කළ අතක් දික් කරන්නේ හෝ වේ ද දික් කළ අතක් වක් කරන්නේ හෝ වේ ද, එසෙයින් මැ බඹලොවිහි අතුරුදහන් වූයේ බුදුන් හමුයෙහි පැළ වී. එක්බිති සහම්පතිබ්‍රහ්ම උතුරුසඟ එකස් කොට පෙරෙවැ බුදුන් දෙසට ඇඳිලි බැඳ මෙපවත් කී : ''වහන්ස, භාග්‍යවත්හු භික්ෂුසඞ්ඝයා අභිනන්දනය කෙරෙත්වා, වහන්ස භාග්‍යවත්හු භික්ෂුසඞ්ඝයා ස්වාගත කොට බෙණෙත්වා. වහන්ස, යම්සේ භාග්‍යවතුන් විසින් පෙර භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කරනලද ද, එසෙයින් මැ භාග්‍යවත්හු දැන් භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කෙරෙත්වා. වහන්ස, මෙහි පැවිදි වූ නොබෝකල් ඇති, මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත. බුදුන් දක්නට නො ලැබෙන ඔවුනට අන්‍යථාත්වය වන්නේ යැ, විපරිණාමය වන්නේ යි.

වහන්ස, යම්සේ දියවර නො ලැබෙන තරුණබීජයන්ගේ අන්‍යථාත්වය වන්නේ ද විපරිණාමය වන්නේ ද, එසෙයින් මැ වහන්ස, මෙහි පැවිදි වූ නොබෝකල් ඇති මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත. බුදුන් දක්නට නො ලැබෙන ඔවුනට අන්‍යථාත්වය වන්නේ යැ, විපරිණාමය වන්නේ යි.

වහන්ස, යම්සේ මව නො දක්නා තුරුණු වස්සාට අන්‍යථාත්වය වන්නේ ද විපරිණාමය වන්නේ ද, එසෙයින් මැ වහන්ස, මෙහි පැවිදි වූ නොබෝකල් ඇති මෙසස්නට අළුත පැමිණි නවකභික්ෂුහු ඇත. බුදුන් නො දක්නා ඔවුනට අන්‍යථාත්වය වන්නේ යැ විපරිණාමය වන්නේ යි. වහන්ස, භාග්‍යවත්හු භික්ෂුසඞ්ඝයා අභිනන්දන කෙරෙත්වා වහන්ස, භාග්‍යවත්හු භික්ෂුසඞ්ඝයා ස්වාගත කොට බෙණෙත්වා. වහන්ස, යම්සේ භාග්‍යවතුන් විසින් පෙර භික්ෂුසඞ්ඝයා අනුග්‍රහ කරනලද ද එසෙයින් මැ බුදුහු දැන් භික්ෂු-සඞ්ඝයා අනුග්‍රහ කෙරෙත්වා''යි කී.

Free Distribution www.aathaapi.org

අසක්ඛිංසු ඛො චාතුමෙය්‍යකා ච සක්‍යා බ්‍රහ්මා ච සහම්පති භගවන්තං පසාදෙතුං බීජූපමෙන ච තරුණූපමෙන ච. අථ ඛො ආයස්මා මහා මොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි: 'උට්ඨෙථාවුසො, ගණ්හාථ පත්තචීවරං, පසාදිතො භගවා චාතුමෙය්‍යකෙහි ච සක්‍යෙහි බ්‍රහ්මුනා ච සහම්පතිනා බීජූපමෙන ච තරුණූපමෙන චා'ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පටිස්සුත්වා උට්ඨායාසනා පත්තචීවරං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච: කින්ති තෙ සාරිපුත්ත අහොසි මයා භික්ඛුසඞ්ඝෙ පණාමිතෙ'ති. එවං ඛො මෙ භන්තෙ අහොසි භගවතා භික්ඛුසඞ්ඝෙ පණාමිතෙ[1] අප්පොස්සුක්කොදා'නි භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරිස්සති. මයම්පිදානි අප්පොස්සුක්කා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තා විහරිස්සාමා'ති. ආගමෙහි ත්වං සාරිපුත්ත, ආගමෙහි ත්වං සාරිපුත්ත, දිට්ඨධම්මසුඛවිහාරන්ති න ඛො තෙ සාරිපුත්ත පුනපි එවරූපං චිත්තං උප්පාදෙතබ්බන්ති[2].

අථ ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං ආමන්තෙසි. 'කින්ති තෙ මොග්ගල්ලාන අහොසි මයා භික්ඛුසඞ්ඝෙ පණාමිතෙති එවං ඛො මෙ භන්තෙ අහොසි භගවතා භික්ඛුසඞ්ඝෙ පණාමිතෙ අප්පොස්සුක්කො'දානි භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරිස්සති. අහඤ්චදානි ආයස්මා ච සාරිපුත්තො භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමා'ති. සාධු සාධු මොග්ගල්ලාන, අහං වා හි මොග්ගල්ලාන භික්ඛුසඞ්ඝං පරිහරෙය්‍යං සාරිපුත්ත මොග්ගල්ලානා වාති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: චත්තාරිමානි භික්ඛවෙ භයානි උදකොරොහන්තෙ පාටිකඞ්ඛිතබ්බානි, කතමානි චත්තාරි: ඌම්මිභයං කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානි උදකොරොහන්තෙ පාටිකඞ්ඛිතබ්බානි. එවමෙව ඛො භික්ඛවෙ චත්තාරිමානි භයානි ඉධෙකච්චෙ පුග්ගලෙ ඉමස්මිං ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතෙ පාටිකඞ්ඛිතබ්බානි. කතමානි චත්තාරි: ඌම්මිභයං කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං.

කතමඤ්ච භික්ඛවෙ ඌම්මිභයං: ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, 'ඔතිණ්ණොම්හි ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. තමෙනං තථා පබ්බජිතං සමානං සබ්‍රහ්මචාරී ඔවදන්ති අනුසාසන්ති: 'එවන්තෙ අභික්කමිතබ්බං. එවන්තෙ පටික්කමිතබ්බං. එවන්තෙ ආලොකිතබ්බං. එවන්තෙ විලොකිතබ්බං. එවන්තෙ සම්මිඤ්ජිතබ්බං. එවන්තෙ පසාරෙතබ්බං.[3] එවන්තෙ සඞ්ඝාටිපත්තචීවරං ධාරෙතබ්බ'න්ති. තස්ස එවං හොති:

---

1. භික්ඛුසඞ්ඝො පණාමිතො - මජසං.
2. න ඛො තෙ -පෙ- උප්පාදෙතබ්බං - මජසං තාසි.
3. පසාරිතබ්බං - මජසං.

චාතුමවැසි ශාක්‍යයෝ ද සහම්පතිබ්‍රහ්ම ද බීජෝපමායෙන් හා තරුණෝපමායෙන් භාග්‍යවතුන් පහදවන්නට හැකි වූහ. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භික්ෂූන් ඇමැතූහ : "ඇවැත්නි නැඟෙව, පාසිවුරු ගනුව, චාතුමවැසි ශාක්‍යයන් විසිනුදු සහම්පතිබ්‍රහ්ම විසිනුදු බීජෝපමායෙන් හා තරුණෝපමායෙන් හා භාග්‍යවත්හු පහදවන ලදහ"යි. 'එසේ යැ ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් දී හුනස්නෙන් නැඟී පාසිවුරු ගෙන බුදුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට බුදුහු මෙය වදළහ : "ශාරිපුත්‍රයෙනි, මා විසින් භික්ෂුසඞ්ඝයා පණාමන (බැහැර) කළ කල්හි තොපට කෙබඳු සිතෙක් වී ද"යි. "වහන්ස, මට මෙබඳු සිතෙක් වී : "බුදුහු දන් අල්පොත්සුක වැ ඵලසමවත්සුව විහරණයෙහි යෙදී වෙසෙති, ඇපිදු දන් අල්පොත්සුක වැ ඵලසමවත්සුව විහරණයෙහි යෙදී වසම්හ"යි නවතුව තෙපි ශාරිපුත්‍රයෙනි, නවතුව තෙපි ශාරිපුත්‍රයෙනි. ශාරිපුත්‍රයෙනි, තොප විසින් වටාලා මෙබඳු සිතෙක් නො ඉපැදවියයුතු"යයි. වදළහ.

ඉක්බිති බුදුහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් ඇමැතූසේක : "මොග්ගල්ලානයෙනි, මා විසින් භික්ෂුසඞ්ඝයා පණාමන කළ කල්හි තොපට කෙබඳු සිතෙක් වී ද"යි. වහන්ස, භාග්‍යවතුන් විසින් භික්ෂුසඞ්ඝයා පණාමන කළ කල්හි මට මෙබඳු සිතෙක් වී : "බුදුහු දන් අල්පොත්සුක වැ ඵලසමවත්සුව විහරණයෙහි යෙදී වෙසෙති, දන් මම ද ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද භික්ෂුසඞ්ඝයා පරිහරණ කරම්හ"යි කීහ. සාධු සාධු මොද්ගල්‍යායනයෙනි, මම හෝ මොද්ගල්‍යායනයෙනි, භික්ෂුසඞ්ඝයා පරිහරණ කරන්නෙමි. සැරියුත් මුගලන් දෙදෙන හෝ පරිහරණ කරන්නාහ'යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූසේක : "මහණෙනි, දියට බස්නා පුඟුල්හු කෙරෙහි මේ සතර බිය කෙනෙක් කැමැති වියයුත්තාහ. කවර සතරෙක යත් : ඌර්මිභය කුම්භීලභය ආවර්තභය සුසුකාභය යයි. මහණෙනි, මෙසතර භය දියට බස්නා පුඟුල්හු කෙරෙහි කැමැති වියයුත්තාහ. එසෙයින් මැ මහණෙනි, ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය වූ මෙසස්නෙහි පැවිදි වූ ඇතැම් පුඟුලක්හු කෙරෙහි මෙසතර බිය කෙනෙක් කැමැති වියයුත්තාහ. කවර සතරෙක යත් : ඌර්මිභය කුම්භීලභය ආවර්තභය සුසුකාභය යන මොහු යි.

මහණෙනි, ඌර්මිභය කවරෙ යත් : මහණෙනි, මෙලොවැ ඇතැම් කුලපුත්‍රයෙක් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. ජාතිදුකින් ජරායෙන් හා මරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් කායිකදුකින් චෛතසික දුකින් උපායාසයෙන් දුකට බටුයෙම් දුකින් මඩනාලද්දෙයම් වෙමි. මෙහැම දුඃඛරාශිහුගේ කෙළවර කිරීමෙක් පැනේ නම් ඉතා යෙහෙකැ'යි කියා යි. එසේ පැවිදි වූ ඔහුට සබ්‍රහ්මචාරීහු : "තොප විසින් මෙසේ ඉදිරියට යායුතු යැ තොප විසින් මෙසේ පෙරළා ඉයයුතු යැ තොප විසින් මෙසේ ඉදිරිය බැලියයුතු යැ තොප විසින් මෙසේ අත්පා හැකිළිය යුතු යැ තොප විසින් මෙසේ අත්පා දිගුකළයුතු යැ, තොප විසින් මෙසේ සඟළ පාසිවුරු දැරියයුතු යයි අවවාද කෙරෙති අනුශාසනා කෙරෙත්. ඔහුට මෙබඳු සිතෙක් වෙයි : ඇපි පෙර ගිහිගෙයි

මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා අඤ්ඤෙ ඔවදමපි[1] අනුසාසාමපි[2] ඉමෙ පනම්හාකං පුත්තමත්තා මඤ්ඤෙ, නත්තමත්තා මඤ්ඤෙ, අම්හෙ ඔවදිතබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්තීති. සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ ඌමිභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. ඌමිභයන්ති ඛො භික්ඛවෙ කොධූපායාසස්සෙතං අධිවචනං.

කතමඤ්ච භික්ඛවෙ කුම්භීලභයං: ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, ඔතිණ්ණොම්හි ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති.

තමෙනං තථා පබ්බජිතං සමානං සබ්‍රහ්මචාරී ඔවදන්ති. අනුසාසන්ති: ඉදං තෙ ඛාදිතබ්බං, ඉදං තෙ න ඛාදිතබ්බං, ඉදං තෙ භුඤ්ජිතබ්බං, ඉදං තෙ න භුඤ්ජිතබ්බං, ඉදං තෙ සායිතබ්බං, ඉදං තෙ න සායිතබ්බං, ඉදං තෙ පාතබ්බං, ඉදං තෙ න පාතබ්බං, කප්පියං තෙ ඛාදිතබ්බං, අකප්පියං තෙ න ඛාදිතබ්බං, කප්පියං තෙ භුඤ්ජිතබ්බං, අකප්පියං තෙ න භුඤ්ජිතබ්බං, කප්පියං තෙ සායිතබ්බං, අකප්පියං තෙ න සායිතබ්බං, කප්පියං තෙ පාතබ්බං, අකප්පියං තෙ න පාතබ්බං, කාලෙ තෙ ඛාදිතබ්බං, විකාලෙ තෙ න ඛාදිතබ්බං, කාලෙ තෙ භුඤ්ජිතබ්බං, විකාලෙ තෙ න භුඤ්ජිතබ්බං, කාලෙ තෙ සායිතබ්බං, විකාලෙ තෙ න සායිතබ්බං, කාලෙ තෙ පාතබ්බං, විකාලෙ තෙ න පාතබ්බ'න්ති තස්ස එවං හොති : මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා යං ඉච්ඡාම තං ඛාදාම, යං න ඉච්ඡාම න තං ඛාදාම, යං ඉච්ඡාම තං භුඤ්ජාම, යං න ඉච්ඡාම න තං භුඤ්ජාම, යං ඉච්ඡාම තං සායාම, යං න ඉච්ඡාම න තං සායාම, යං ඉච්ඡාම තං පිවාම[3] යං න ඉච්ඡාම න තං පිවාම. කප්පියම්පි ඛාදාම, අකප්පියම්පි ඛාදාම, කප්පියම්පි භුඤ්ජාම, අකප්පියම්පි භුඤ්ජාම, කප්පියම්පි සායාම, අකප්පියම්පි සායාම, කප්පියම්පි පිවාම, අකප්පියම්පි පිවාම. කාලෙපි ඛාදාම, විකාලෙපි ඛාදාම, කාලෙපි භුඤ්ජාම විකාලෙපි භුඤ්ජාම, කාලෙපි සායාම, විකාලෙපි සායාම, කාලෙපි පිවාම, විකාලෙපි පිවාම. යම්පි නො සද්ධා ගහපතිකා දිවා විකාලෙ පණීතං ඛාදනීයං භොජනීයං දෙන්ති, තත්‍රපි මෙ මුඛාවරණං මඤ්ඤෙ කරොන්තී'ති. සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ කුම්භීලභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. කුම්භීලභයන්ති ඛො භික්ඛවෙ ඔදරිකත්තස්සෙතං අධිවචන

---

1. ඔවදාම - මජසං.
2. අනුසාසාම - මජසං.
3. පිපාම - සිමු, PTS

වැසි වූවමෝ අන්හට අවවාදත් කරම්හ, අනුශාසනාත් කරම්හ. මොහු වැලිත් අපගේ පුතුන් වැන්නහ. මුනුබුරන් වැන්නහ. අප අවවාද කටයුතු කොට අනුශාසනා කටයුතු කොට සිතන්නාහ'යි මේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට හීන වූ ගිහි බවට වැටෙයි. මහණෙනි, මේ තෙම ඌර්මි බියෙන් බියපත් වූයේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට හීන වූ ගිහි බවට වැටුණේ යයි කියනු ලැබේ. මහණෙනි, ඌර්මිභය යනු ක්‍රෝධූපායාසයට තෙල නමෙකි.

මහණෙනි, කුම්භීලභය කවරේ යත්: මහණෙනි, මෙලොවැ ඇතැම් කුලපුත්‍රයෙක් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම අනාගාර්‍ය වූ ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් කායිකදුකින් දෞමනසින් උපායාසයෙන් දුකට බටුයෙම් දුකින් මඩනාලදුයෙම් වෙමි. මේ සියලු දුඃඛරාශිහුගේ කෙළවර කිරීම පැනේ නම් ඉතා යෙහෙකැ'යි

එසේ පැවිදි වූ ඔහුට සබ්‍රම්සරහු: ''තොප විසින් මේ නො කැයුතු යැ මේ තොප විසින් බිදියයුතු යැ මේ තොප විසින් නො බිදියයුතු යැ මේ තොප විසින් ආස්වාද කටයුතු යැ මේ තොප විසින් ආස්වාද නො කටයුතු යැ මේ තොප විසින් පියයුතු යැ මේ තොප විසින් නො පියයුතු යැ කැප දය තොප විසින් කැයුතු යැ නො කැප දය තොප විසින් නො කැයුතු යැ කැප දය තොප විසින් බිදියයුතු යැ නො කැප දය තොප විසින් නො බිදියයුතු යැ කැප දය තොප විසින් ආස්වාද කටයුතු යැ නො කැප දය තොප විසින් ආස්වාද නො කටයුතු යැ කැප දය තොප විසින් පියයුතු යැ නො කැප දය තොප විසින් නො පියයුතු යැ කාලයෙහි තොප විසින් කැයුතු යැ විකාලයෙහි තොප විසින් නො කැයුතු යැ කාලයෙහි තොප විසින් බිදියයුතු යැ විකාලයෙහි තොප විසින් නො බිදියයුතු යැ කාලයෙහි තොප විසින් ආස්වාද කටයුතු යැ විකාලයෙහි තොප විසින් ආස්වාද නො කටයුතු යැ. කාලයෙහි තොප විසින් පියයුතු යැ විකාලයෙහි තොප විසින් නො පියයුතු''යයි අවවාද කෙරෙති අනුශාසනා කෙරෙති. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ''ඇපි පෙර ගිහිගෙයි වසන්නමෝ යමක් කැමැතියමෝ නම් එය කම්හ, යමක් නො කැමැත්තමෝ නම් එය නො කම්හ, යමක් කැමැත්තමෝ නම් එය බුදිම්හ, යමක් නො කැමැත්තමෝ නම් එය නො බුදිම්හ, යමක් කැමැත්තමෝ නම් එය ආස්වාද කරම්හ, යමක් නො කැමැත්තමෝ නම් එය ආස්වාද නො කරම්හ, යමක් කැමැත්තමෝ නම් එය පානය කරම්හ, යමක් නො කැමැත්තමෝ නම් එය පානය නො කරම්හ. කැප දය ද කම්හ, අකැප දය ද කම්හ, කැප දය ද බුදිම්හ, අකැප දය ද බුදිම්හ, කැප දය ද ආස්වාද කරම්හ, අකැප දය ද ආස්වාද කරම්හ, කැප දය ද පානය කරම්හ, අකැප දය ද පානය කරම්හ, කාලයෙහි ද කම්හ, විකාලයෙහි ද කම්හ, කාලයෙහි ද බුදිම්හ, විකාලයෙහි ද බුදිම්හ, කාලයෙහි ද ආස්වාද කරම්හ. විකාලයෙහි ද ආස්වාද කරම්හ, කාලයෙහි ද පානය කරම්හ, විකාලයෙහි ද පානය කරම්හ, සැදැහැති ගැහැවියෝ දහවල් විකාලයෙහි යම් ප්‍රණීත ඛාද්‍යයක් භෝජ්‍යයක් අපට දෙත්ද, එහිදු මොවුන් මුඛාවරණය කරන්නවුන් මෙනැ''යි. මේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිබවට වැටෙයි. මහණෙනි, මේ තෙම කුම්භීලභීතියෙන් (කිඹුල්බියෙන්) බියපත් වූයේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිබවට පැමිණියේ යයි කියනු ලැබේ. මහණෙනි, 'කුම්භීලභය'යි ඖදරික බවට තෙල නමෙකි.

කතමඤ්ච භික්ඛවෙ ආවට්ටභයං, ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති. ඔතිණ්ණොම්හි ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. සො එවං පබ්බජිතො සමානො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන, අරක්ඛිතාය වාචාය, අනුපට්ඨිතාය සතියා, අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්ථ පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං. තස්ස එවං හොති: මයං ඛො පුබ්බෙ අගාරියභූතා සමානා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරිම්හ. සංවිජ්ජන්තෙ[1] ඛො කුලෙ[2] භොගා, සක්කා භොගෙ ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතු'න්ති. සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ ආවට්ටභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. ආවට්ටභයන්ති ඛො භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං.

කතමඤ්ච භික්ඛවෙ සුසුකාභයං, ඉධ භික්ඛවෙ එකච්චො කුලපුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, ඔතිණ්ණොම්හි ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. සො එවං පබ්බජිතො සමානො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන, අරක්ඛිතාය වාචාය, අනුපට්ඨිතාය සතියා, අසංවුතෙහි ඉන්ද්‍රියෙහි සො තත්ථ පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරුතං වා. තස්ස මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරුතං වා රාගො චිත්තං අනුද්ධංසෙති, සො රාගානුද්ධස්තෙන[3] චිත්තෙන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. අයං වුච්චති භික්ඛවෙ සුසුකාභයස්ස භීතො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තො. සුසුකාභයන්ති ඛො භික්ඛවෙ මාතුගාමස්සෙතං අධිවචනං.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි භයානි ඉධෙකච්චෙ පුග්ගලෙ ඉමස්මිං ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතෙ පාටිකඞ්ඛිතබ්බානීති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චාතුම සුත්තං සත්තමං.

---

1. සංවිජ්ජන්ති - මජසං.
2. පන මෙ කුලෙ - මජසං.
3. රාගානුද්ධංසෙන - මජසං.

මහණෙනි, 'ආවට්ටභය' කවරෙ යත් : ''මහණෙනි මෙලොවැ ඇතැම් කුලපුත්‍රයෙක් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. ''ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් මඩනාලද්දූයෙමි. දුකට බටුයෙම් දුකින් මඩනාලද්දූයෙම් වෙමි. මේ අසම්මිශ්‍ර වූ දුඃඛරාශිහුගේ කෙළවර කිරීමෙක් පැනේ නම් මැනැවැ''යි කියායි. හේ මෙසේ පැවිදි වූයේ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන ගමකට හෝ නිගමයකට හෝ නො රක්නාලද කය ඇති වැ නො රක්නාලද වචන ඇති වැ නො එළවූ කාගියායී ඇති වැ සංවර නො කළ ඉඳුරන් ඇති වැ පිඩුසිහා පිවිසෙයි. හේ එහි දී පස්කම්ගුණයෙන් යුක්ත වූ සමන්විත වූ ඉඳුරන් පිණවන ගැහැවියකු හෝ ගැහැවිපුතකු හෝ දකියි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි : ''ඇපි වනාහි පෙර ගිහිගෙයි වසන්නමෝ පස්කම් ගුණයෙන් යුක්ත වැ සමන්විත වැ ඉඳුරන් පිණවූමහ. කුලයෙහි භොගයෝ ඇත් මැ යැ. භොගයන් පරිභොග කරන්නට ද පින් කරන්නට ද හැක්කැ''යි. හේ ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට වැටෙයි. මහණෙනි, මේ තෙම 'ආවට්ට (දියසුළි) භයින් බියපත් වූයේ ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට වැටීණැ'යි කියනු ලැබේ. මහණෙනි, 'ආවට්ටභය'යි තෙල පස්කම් ගුණයනට නමෙකි.

මහණෙනි, 'සුසුකාභය' කවරෙ යත් : ''මහණෙනි, මෙලොවැ ඇතැම් කුලපුත්‍රයෙක් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි : ''ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් මඩනාලද්දූයෙමි. දුකට බටුයෙම් දුකින් මඩනාලද්දූයෙම් වෙමි. මේ සියලු දුඃඛරාශිහුගේ කෙළවර කිරීමෙක් පැනේ නම් මැනැවැ''යි කියා යි. හේ මෙසේ පැවිදි වූයේ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන ගමකට හෝ නිගමයකට හෝ නො රක්නාලද කය ඇති වැ නො රක්නාලද වචන ඇති වැ නො එළවූ කාගියායී ඇති වැ සංවර නො කළ ඉඳුරන් ඇති වැ පිඩුසිහා පිවිසෙයි. හේ එහි දී මාගමක නපුරු කොට හැඳියා හෝ නපුරු කොට පෙරෙවියා දකියි. මාගම නපුරු කොට හැඳියා හෝ නපුරු කොට පෙරෙවියා දක රාගය ඔහුගේ සිත ක්ලාන්ත කෙරෙයි. හේ රාගයෙන් කලකුළුසිතින් යුතු වැ ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට වැටෙයි. මහණෙනි, මේ තෙම සුසුකා(සැඩමසු) භයෙන් භීත වැ ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට වැටුණේ'' යයි කියනු ලැබේ. මහණෙනි, තෙල ''සුසුකාභය' යනු මාගමට නමෙකි.

මහණෙනි, මොහු මෙලොවැ ගිහිගෙන් නික්ම අනගාරයෙහි වූ මෙ සස්නෙහි පැවිදි වූ ඇතැම් පුඟුලන් කෙරෙහි කැමැති වියයුතු සතර බිය වෙත් යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටු සිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු වූහයි.

සත් වැනි චාතුමසූත්‍ර යි.

2. 2. 8

නළකපාන සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා කොසලෙසු විහරති නළකපානෙ පලාසවනෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා කුලපුත්තා භගවන්තං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා හොන්ති. ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච භද්දියො ආයස්මා ච කිම්බිලො[1] ආයස්මා ච භගු ආයස්මා කුණ්ඩධානො[2] ආයස්මා ච රෙවතො ආයස්මා ච ආනන්දො; අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා කුලපුත්තා.

තෙන ඛො පන සමයෙන භගවා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තෙ කුලපුත්තෙ ආරබ්භ භික්ඛූ ආමන්තෙසි, යෙ තෙ භික්ඛවෙ කුලපුත්තා මමං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, කච්චි තෙ භික්ඛවෙ භික්ඛූ අභිරතා බ්‍රහ්මචරියෙ'ති. එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං. දුතියම්පි-පෙ-තුණ්හී අහෙසුං. තතියම්පි ඛො භගවා තෙ කුලපුත්තෙ ආරබ්භ භික්ඛූ ආමන්තෙසි, යෙ තෙ භික්ඛවෙ කුලපුත්තා මමං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා, කච්චි තෙ භික්ඛවෙ භික්ඛූ අභිරතා බ්‍රහ්මචරියෙ'ති. තතියම්පි ඛො තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

අථ ඛො භගවතො එතදහොසි: යන්නූනාහං තෙව[3] කුලපුත්තෙ පුච්ඡෙය්‍යන්'ති. අථ ඛො භගවා ආයස්මන්තං අනුරුද්ධං ආමන්තෙසි: කච්චි තුම්හෙ අනුරුද්ධා අභිරතා බ්‍රහ්මචරියෙ'ති. තග්ඝ මයං භන්තෙ අභිරතා බ්‍රහ්මචරියෙති. සාධු සාධු අනුරුද්ධා එතං ඛො අනුරුද්ධා තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං යං තුම්හෙ අභිරමෙය්‍යාථ බ්‍රහ්මචරියෙ. යෙන තුම්හෙ අනුරුද්ධා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා සුසු කාළකෙසා කාමෙ පරිභුඤ්ජෙය්‍යාථ. තෙන තුම්හෙ අනුරුද්ධා භද්‍රෙන[4] යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා සුසු කාළකෙසා අගාරස්මා අනගාරියං පබ්බජිතා. තෙ ඛො[5] පන තුම්හෙ අනුරුද්ධා නෙව රාජාභිනීතා අගාරස්මා අනගාරියං පබ්බජිතා, න චොරාභිනීතා අගාරස්මා අනගාරියං පබ්බජිතා, න ඉණට්ටා අගාරස්මා අනගාරියං පබ්බජිතා, න භයට්ටා අගාරස්මා අනගාරියං පබ්බජිතා, න ආජීවිකාපකතා අගාරස්මා අනගාරියං පබ්බජිතා. අපි ච ඛොම්හි ඔතිණ්ණා ජාතියා ජරය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. නනු තුම්හෙ අනුරුද්ධා එවං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා'ති. එවං භන්තෙ. එවං පබ්බජිතෙන ච පන අනුරුද්ධා කුලපුත්තෙන කිමස්ස

1. කිම්බිලො - මජසං.
2. කොණ්ඩඤ්ඤො - මජසං.
3. තෙ - මජසං.
4. භද්‍රෙනපි - මජසං.
5. තෙ ච ඛො - මජසං

Free Distribution www.aathaapi.org

2. 2. 8

නළකපාන සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසල ජනපදයෙහි නළකපාන ගමැ කැලවෙනෙහි වැඩවසනසේක. එසමයෙහි ඉතා ප්‍රසිද්ධ වූ බොහෝ කුලපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ උදෙසා සැදැහැයෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහු වෙති. ආයුෂ්මත් අනුරුද්ධ යැ ආයුෂ්මත් භද්දිය යැ ආයුෂ්මත් කිම්බිල යැ ආයුෂ්මත් භගු යැ ආයුෂ්මත් කුණ්ඩධාන යැ ආයුෂ්මත් රෙවත යැ ආයුෂ්මත් ආනන්‍ද යැ අන්‍ය වූ ද ඉතා ප්‍රසිද්ධ වූ කුලපුත්‍රයෝ යි.

තවද එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලද්දහු අභ්‍යවකාශයෙහි වැඩහුන්සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ කුලපුත්‍රයන් අරභයා භික්ෂූන් ඇමැතූසේක : ''මහණෙනි, යම් කුලපුත්‍ර කෙනෙක් මා උදෙසා සැදැහැයෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහු වෙත් ද, කිමෙක මහණෙනි, ඒ මහණහු බඹසරවස්හි අභිරත වූවාහු ද යි විචාළසේක. මෙසේ වදළ කල්හි ඒ මහණහු නො බැණ හුන්හු. දෙවනවටද . . . නො බැණ හුන්හු. තෙවනවටදු බුදුහු ඒ කුලපුත්‍රයන් අරභයා මහණුන් ඇමැතූසේක : ''මහණෙනි, යම් කුලපුත්‍ර කෙනෙක් මා උදෙසා සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වූවාහු ද, කිමෙක මහණෙනි, ඒ මහණහු බඹසරවස්හි ඇලුම් ඇත්තාහු ද'යි වදළහ. තෙවනවටදු ඒ මහණහු නො බැණ හුන්හු.

එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිත උපන : 'මම ඒ මැ කුලපුත්‍රයන්. පුළුවුස්-නෙම් නම් මැනැවැ'යි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ඇමැතූසේක : 'කිමෙක අනුරුද්ධයෙනි, තෙපි බඹසරවස්හි අභිරත වූහු ද'යි. වහන්ස, ඒකාන්තයෙන් ඇපි බඹසරවස්හි ඇලුණම්හ'යි කී. සාධු සාධු අනුරුද්ධයෙනි, යම් හෙයෙකින් තෙපි බඹසරවස්හි සිත් අලවවු ද අනුරුද්ධයෙනි, සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වූ කුලපුත්‍ර වූ තොපට මෙබඳු නිසි වෙයි. අනුරුද්ධයෙනි, තෙපි යම් භද්‍ර යෞවනයෙකින් යුක්ත වූවහු ප්‍රථම වයසින් සමන්වාගත වූවහු මනා කළුකෙහෙ ඇතියවුහු කාමයන් පරිභෝග කරවු ද, අනුරුද්ධයෙනි, තෙපි ඒ භද්‍රයෞවනයෙන් යුක්ත වූවහු ප්‍රථම වයසින් සමන්විත වූවහු මනා කළුකෙහෙ ඇතියවුහු ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවහු ය. අනුරුද්ධයෙනි, ඒ තෙපි රජුන් විසින් අභිනීත වූවහු (අනභිමුඛ කොට කැඳවන ලදුවහු) ගිහිගෙන් නික්ම ශාසනයෙහි නො මැ පැවිදි වූවහු යැ. සොරුන් විසින් අභිනීත වූවහු නො පැවිදි වූවහු යැ. ණයින් මඩනාලදු වැ ගිහිගෙන් නික්ම ශාසනයෙහි නො පැවිදි වූවහු යැ. රාජාදි භයින් මඩනාලදු වැ නො පැවිදි වූවහු යැ. ජීවිකා හෙතුයෙන් මඩනාලදු වැ නො පැවිදි වූවහු යැ. වැලිදු ''ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් මඩනාලදුයෙම් වෙම් දුකට බටුයෙම් දුකින් මඩනාලදුයෙම් වෙම්. මේ සියලු දුඃඛරාශිහුගේ කෙළවර කිරීමෙක් පැනේ නම් ඉතා යෙහෙකැ''යි අනුරුද්ධයෙනි, තෙපි මෙසේ සැදැහැයෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූවහු නො ද'යි. එසේ යැ වහන්ස. තවද අනුරුද්ධයෙනි,

Free Distribution www.aathaapi.org

කරණීයං: 'විවෙකං අනුරුද්ධා කාමෙහි විවෙකං අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං. තස්ස අභිජ්ඣාපි චිත්තං පරියාදාය තිට්ඨති. බ්‍යාපාදොපි චිත්තං පරියාදාය තිට්ඨති. ථිනමිද්ධම්පි චිත්තං පරියාදාය තිට්ඨති. උද්ධච්චකුක්කුච්චම්පි චිත්තං පරියාදාය තිට්ඨති. විචිකිච්ඡාපි චිත්තං පරියාදාය තිට්ඨති. අරතීපි චිත්තං පරියාදාය තිට්ඨති. තන්දීපි චිත්තං පරියාදාය තිට්ඨති. විවෙකං අනුරුද්ධා කාමෙහි විවෙකං අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං නාධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං. විවෙකං අනුරුද්ධා කාමෙහි විවෙකං අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං. තස්ස අභිජ්ඣාපි චිත්තං න පරියාදාය තිට්ඨති. බ්‍යාපාදොපි චිත්තං න පරියාදාය තිට්ඨති. ථිනමිද්ධම්පි චිත්තං න පරියාදාය තිට්ඨති. උද්ධච්චකුක්කුච්චම්පි චිත්තං න පරියාදාය තිට්ඨති. විචිකිච්ඡාපි චිත්තං න පරියාදාය තිට්ඨති. අරතීපි චිත්තං න පරියාදාය තිට්ඨති. තන්දීපි චිත්තං න පරියාදාය තිට්ඨති. විවෙකං අනුරුද්ධා කාමෙහි විවෙකං අකුසලෙහි ධම්මෙහි පීතිසුඛං අධිගච්ඡති අඤ්ඤං වා තතො සන්තතරං.

කින්ති වො අනුරුද්ධා මයි හොති: යෙ ආසවා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, අප්පහීනා තෙ තථාගතස්ස. තස්මා තථාගතො සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙතී'ති.

න ඛො නො භන්තෙ භගවති එවං හොති: 'යෙ ආසවා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, අප්පහීනා තෙ තථාගතස්ස. තස්මා තථාගතො සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙතී'ති.

එවං ඛො නො භන්තෙ භගවති හොති: යෙ ආසවා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, පහීනා තෙ තථාගතස්ස. තස්මා තථාගතො සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙතී'ති. සාධු සාධු අනුරුද්ධා, තථාගතස්ස අනුරුද්ධා, යෙ ආසවා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, පහීනා තෙ උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා. සෙය්‍යථාපි අනුරුද්ධා තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුනවිරූළ්හියා එවමෙව ඛො අනුරුද්ධා තථාගතස්ස යෙ ආසවා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. පහීනා තෙ උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා. තස්මා තථාගතො සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙතී'ති

1. අනභාවං කතා - මජ්ඣසං.

මෙසේ පැවිදි වූ කුලපුත්‍රයා විසින් කුමක් කටයුතු වේ ද යත් : අනුරුද්ධයෙනි, වස්තුකාම ක්ලේශකාම (කාමච්ඡන්දනීවරණ)යෙන් වෙන් වැ අකුශලධර්මයන් ගෙන් වෙන් වැ (ප්‍රථමද්විතීයධ්‍යාන සඞ්ඛ්‍යාත) ප්‍රීතිය හා සුඛය නො ලබා ද ඊට වඩා ඉතා ශාන්ත වූ තෘතීයධ්‍යානාදි සුවය හෝ නො ලබා ද, ඔහු ගේ සිත අභිධ්‍යාව ද මැඩගෙන සිටී, ව්‍යාපාදය ද සිත මැඩගෙන සිටී, ථීනමිද්ධය ද සිත මැඩගෙන සිටී, උද්ධච්ච කුක්කුච්චය ද සිත මැඩගෙන සිටී, විචිකිච්ඡාව ද සිත මැඩගෙන සිටී, අධිකුශලධර්මයෙහි උකටලී බව (අරතිය) ද සිත මැඩගෙන සිටී, ආලස්‍යය (තන්දිය) ද සිත මැඩගෙන සිටී. අනුරුද්ධයෙනි, කාමච්ඡන්දයෙන් වෙන් වැ අකුශලධර්මයන්ගෙන් වෙන් වැ ප්‍රීතිය හා සුඛය නො ලබයි. ඊට වඩා ශාන්තතර වූ සුඛයක් හෝ නො ලබයි. අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන් වැ අකුශලධර්මයන් ගෙන් වෙන් වැ ප්‍රීතිය හා සුඛය ලබා ද ඊට වඩා ශාන්තතර වූ සුවයක් හෝ ලබා ද අභිධ්‍යාව ද ඔහුගේ සිත මැඩගෙන නො සිටී, ව්‍යාපාදය ද සිත මැඩගෙන නො සිටී, ථීනමිද්ධය ද සිත මැඩගෙන නො සිටී, උද්ධච්චකුක්කුච්චය ද සිත මැඩගෙන නො සිටී, විචිකිච්ඡාව ද සිත මැඩගෙන නො සිටී, අරතිය ද සිත මැඩගෙන නො සිටී, ආලස්‍යය ද සිත මැඩගෙන නො සිටී. අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන් වැ අකුශලධර්මයන් ගෙන් වෙන් වැ ප්‍රීතිය හා සුවය ලබයි, ඊට වඩා ශාන්තතර වූ අන් සුවයක් හෝ ලබයි.

අනුරුද්ධයෙනි, තොපට මා කෙරෙහි කෙබඳු සිතෙක් වේ ද ''සාංක්ලේශික වූ පුනර්භවය ඇති කරන්නා වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණ පිණිස පවත්නා වූ යම් ආශ්‍රව කෙනෙක් ඇද්ද ඔහු තථාගතයන්ට අප්‍රහීණයහ, එහෙයින් තථාගතයෝ ඇතැම් ආශ්‍රවයක් දැනගෙන සෙවුණාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන ඉවසන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන දුරු කරන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන බැහැර කරන්නාහ''යි. සිතේ ද?

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපට මෙබඳු සිතෙක් නො වෙයි : ''සාංක්ලේශික වූ පුනර්භවික වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණ පිණිස පවත්නා වූ යම් ආශ්‍රව කෙනෙක් ඇද්ද, ඒ ආශ්‍රවයෝ තථාගතයන්ට අප්‍රහීණයහ, එහෙයින් තථාගතයෝ ඇතැම් ආශ්‍රවයක් දැනගෙන සෙවුණාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන අධිවාසනා කරන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන පරිවර්ජන කරන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැනගෙන විනොදනා කරන්නාහ''යි මෙබඳු සිතෙක් නො වෙයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපට මෙබඳු සිතෙක් වෙයි : ''සාංක්ලේශික වූ පුනර්භවික වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණ පිණිස පවත්නා වූ යම් ආශ්‍රව කෙනෙක් ඇද්ද ඒ ආශ්‍රවයෝ තථාගතයන්ට ප්‍රහීණයෝ යැ. එහෙයින් තථාගතයෝ ඇතැම් ආශ්‍රවයක් දැන සෙවුණාහ, ඇතැම් ආශ්‍රවයක් දැන අධිවාසනා කරන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැන පරිවර්ජන කරන්නාහ, ඇතැම් ආශ්‍රවයක් දැන විනොදනාය කරන්නාහ''යි. සාධු සාධු අනුරුද්ධයෙනි. අනුරුද්ධයෙනි, සාංක්ලේශික වූ පුනර්භවික වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණ පිණිස වූ යම් ආශ්‍රව කෙනෙක් ප්‍රහීණ වූවාහු උසුන්මුල් ඇත්තාහු මුදුනාසුන් තාලයක් මෙන් කරන ලද්දාහු අභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා සැහැවි ඇත්තාහු වෙත් ද, යම්සේ අනුරුද්ධයෙනි, මුදුන සුන් තල්රුක නැවත වැඩීමට අභව්‍ය වේ ද එසෙයින් මැ අනුරුද්ධයෙනි, තථාගතයන්හට සාංක්ලේශික වූ පුනර්භවික වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරා මරණ පිණිස වූ යම් ආශ්‍රව කෙනෙක් ප්‍රහීණ වූවාහු ද ඒ ආශ්‍රවයෝ උසුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා සැහැවි ඇත්තාහු වෙති. එහෙයින් තථාගතයෝ ඇතැම් ආශ්‍රවයක් දැනගෙන සෙවුණාහ. ඇතැම් ආශ්‍රවයක් දැන අධිවාසනාය කරන්නාහ. ඇතැම් ආශ්‍රවයක් දැන පරිවර්ජන කරන්නාහ. ඇතැම් ආශ්‍රවයක් දැන විනොදනාය කරන්නාහ'යි.

තං කිම්මඤ්ඤසි අනුරුද්ධා කං අත්ථවසං සම්පස්සමානො තථාගතො සාවකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති: 'අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නො'ති.

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා, භගවම්පටිසරණා. සාධු වත භන්තෙ භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී'ති.

න ඛො අනුරුද්ධා තථාගතො ජනකුහනත්ථං න ජනලපනත්ථං න ලාභසක්කාරසිලොකානිසංසත්ථං, න ඉති මං ජනො ජානාතූ'ති සාවකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති: 'අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නො'ති. සන්ති ච ඛො අනුරුද්ධා කුලපුත්තා සද්ධා උළාරවෙද උළාරපාමොජ්ජා[1] 'තෙ තං සුත්වා තථත්තාය චිත්තං උපසංහරන්ති. තෙසන්තං අනුරුද්ධා හොති දීඝරත්තං හිතාය සුඛාය.

ඉධානුරුද්ධා භික්ඛු සුණාති: 'ඉත්ථන්නාමො භික්ඛු කාලකතො[2] සො භගවතා බ්‍යාකතො 'අඤ්ඤාය සණ්ඨහී'ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවසුතො වා, 'එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො සො ආයස්මා අහොසි ඉතිපි, එවම්පඤ්ඤො සො ආයස්මා අහොසි ඉතිපි, එවංවිහාරී සො ආයස්මා අහොසි ඉතිපි, එවං විමුත්තො සො ආයස්මා අහොසි ඉතිපීති. සො තස්ස සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරන්තො තථත්තාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනො ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා භික්ඛු සුණාති: 'ඉත්ථන්නාමො භික්ඛු කාලකතො, සො භගවතා බ්‍යාකතො: පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා'ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවසුතො[3] වා: 'එවං-සීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො -පෙ- එවංපඤ්ඤො-පෙ-එවංවිහාරී-පෙ-එවංවිමුත්තො සො ආයස්මා අහොසි ඉතිපී'ති. සො තස්ස සද්ධඤ්ච -පෙ-පඤ්ඤඤ්ච අනුස්සරන්තො තථත්තාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනො ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා භික්ඛු සුණාති: 'ඉත්ථන්නාමො භික්ඛු කාලකතො, සො භගවතා බ්‍යාකතො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාග-දොසමොහානං තනුත්තා සකදාගාමී, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතී'ති. සො ඛොපනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවසුතො[3] වා. එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො -පෙ- එවං පඤ්ඤො-පෙ-එවංවිහාරී -පෙ- එවංවිමුත්තො සො ආයස්මා අහොසි ඉතිපී'ති. සො තස්ස සද්ධඤ්ච -පෙ-පඤ්ඤඤ්ච අනුස්ස-රන්තො තථත්තාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනො ඵාසුවිහාරො හොති

1. පාමුජ්ජා - සීමු.
2. කාලංකතො - මජසං.
3. අනුස්සවස්සුතො - මජසං.

අනුරුද්ධයෙනි, ඒ කිමෙකැ'යි සිතවු ද? කවර කරුණක් දක්නා වූ තථාගතයෝ 'අසුවල් අසුවල් තැනැ උපන, අසුවල් අසුවල් තැනැ උපනැ'යි ඉක්මගිය කලුරිය කළ ශ්‍රාවකයන් උපප්‍රාප්තියෙහි ලා ප්‍රකාශ කෙරෙත් දැ?යි.

වහන්ස, අපට මේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නෙතෘ කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, ඒකාන්තයෙන් තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට මැ වැටහේවා. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අසා භික්ෂූහු ධරන්නාහ'යි.

අනුරුද්ධයෙනි, තථාගතයෝ ජනයා විස්මය කරනු සඳහා නො වැ ජනයා නැළැවීම පිණිස නො වැ ලාභසත්කාර ප්‍රශංසා අනුසස් පිණිස නො වැ 'මෙසේ මහාජනයා මා දනිව'යි නො වැ ''අසුවල් අසුවල් තැනැ උපන, අසුවල් අසුවල් තැනැ උපනැ'යි ඉක්මගිය කලුරිය කළ ශ්‍රාවකයන් උපප්‍රාප්තියෙහි ලා ප්‍රකාශ කරන්නාහ. තවද අනුරුද්ධයෙනි, සැදැහැති මහත් වූ සතුටු ඇති මහත් වූ ප්‍රමොදය ඇති කුලපුත්‍රයෝ වෙති. ඔහු එදහම් අසා එබඳු උපප්‍රාප්තිය පිණිස සිත එළවති. අනුරුද්ධයෙනි, ඔවුනට ඒ චිත්තොපසංහාරය බොහෝ කලක් හිතයට සුවයට වේ.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මහණෙක් ''මෙනම් මහණ කලුරිය කෙළේ යැ හේ භාග්‍යවතුන් විසින් අර්හත්ත්වයෙහි පිහිටියේ ප්‍රකාශ කරන ලදැයි අසයි. ඒ පිරිනිවි ආයුෂ්මත් මේ ආයුෂ්මත්හු විසින් තමා දක්නාලද හෝ වෙයි. අනුශ්‍රවයෙන් අසනාලද හෝ වෙයි. ''එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද එ ආයුෂ්මත් මෙබඳු (සමාධි පක්ෂයෙහි) දහම් ඇති වී යයි ද එ ආයුෂ්මත් මෙබඳු ප්‍රඥ ඇති වී යයි ද එ ආයුෂ්මත් මෙබඳු සමාපත්තිවිහාර ඇති වී යයි ද එ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි ද අසයි. එ මහණ ඔහුගේ ශ්‍රද්ධාව ද ශීලය ද ශ්‍රුතය ද ත්‍යාගය ද ප්‍රඥව ද සිහි කෙරෙමින් එ බව පිණිස සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මහණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මහණෙක් : ''මෙ නම් මහණ කලුරිය කෙළේ යැ හෙ පස් ඔරම්භාගීය සංයොජනයන් ගේ ක්ෂය වීමෙන් ඔපපාතික වූයේ එහි පිරිනිවෙනසුලු වූයේ එලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලද''යි අසයි. එ (අනගැමි) ආයුෂ්මත් මෙ මහණ විසින් තමා මැ දක්නාලද හෝ අනුශ්‍රවයෙන් අසනාලද හෝ වෙයි. එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇත්තේ වී යයි ද මෙ බඳු දහම් ඇතියේ . . . මෙබඳු ප්‍රඥ ඇතියේ . . . මෙබඳු විහාර ඇතියේ . . . ඒ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි ද අසයි. එ මහණ ඔහුගේ ශ්‍රද්ධාව ද . . . ප්‍රඥව ද සිහි කෙරෙමින් තථාත්වයට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මහණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මහණෙක් : ''මෙනම් මහණ කලුරිය කෙළේ යැ. හේ තුන් සංයොජනයන් ක්ෂය කිරීමෙන් රාගද්වෙෂමොහයන්ගේ තනුභාවයෙන් සෙදගැමි වූයේ එක් වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නේ යැ යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලද''යි අසයි. එ (සෙදගැමි) ආයුෂ්මත් මෙ මහණ විසින් තමා මැ දක්නා ලද හෝ අනුශ්‍රවයෙන් අසනලද හෝ වෙයි. එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද, මෙබඳු දහම් ඇතියේ . . . මෙබඳු ප්‍රඥ ඇතියේ . . . මෙබඳු විහරණ ඇතියේ . . . ඒ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි ද අසයි. එ මහණ ඔහුගේ ශ්‍රද්ධාව ද . . . ප්‍රඥව ද සිහි කෙරෙමින් එ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මහණහට ඵාසුවිහරණ වෙයි.

ඉධානුරුද්ධා භික්ඛු සුණාති: 'ඉත්ථන්නාමො භික්ඛු කාලකතො, සො භගවතා බ්‍යාකතො: 'තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවසුතො වා: 'එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො -පෙ- එවංපඤ්ඤො -පෙ- එවං විහාරී-පෙ-එවංවිමුත්තො සො අයස්මා අහොසි ඉතිපී'ති. සො තස්ස සද්ධඤ්ච-පෙ-පඤ්ඤඤ්ච අනුස්සරන්තො තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනො ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා භික්ඛුනී සුණාති: 'ඉත්ථන්නාමා භික්ඛුනී කාලකතා, සා භගවතා බ්‍යාකතා: 'අඤ්ඤාය සණ්ඨහී'ති. සා ඛො පනස්ස භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා: 'එවංසීලා සා භගිනී අහොසි ඉතිපි, එවංධම්මා සා භගිනී අහොසි ඉතිපි, එවංපඤ්ඤා සා භගිනී අහොසි ඉතිපි, එවංවිහාරිනී සා භගිනී අහොසි ඉතිපි. එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරන්තී තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනියා ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා භික්ඛුනී සුණාති: 'ඉත්ථන්නාමා භික්ඛුනී කාලකතා[1] සා භගවතා බ්‍යාකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනී අනාවත්තිධම්මා තස්මා ලොකා'ති. සා ඛො පනස්සා භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා. එවංසීලා සා භගිනී අහොසි ඉතිපි, එවංධම්මා-පෙ-එවංපඤ්ඤා-පෙ-එවංවිහාරිනී එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච -පෙ- පඤ්ඤඤ්ච අනුස්සරන්තී තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනියා ඵාසුවිහාරෙ හොති.

ඉධානුරුද්ධා භික්ඛුනී සුණාති: 'ඉත්ථන්නාමා භික්ඛුනී කාලකතා, සා භගවතා බ්‍යාකතා: 'තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනී, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතී'ති. සා ඛො පනස්සා භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා: 'එවංසීලා සා භගිනී අහොසි ඉතිපි. එවංධම්මා -පෙ- එවංපඤ්ඤා-පෙ-එවංවිහාරිනී-පෙ-එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච -පෙ-පඤ්ඤඤ්ච අනුස්සරන්තී තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනියා ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා භික්ඛුනී සුණාති: 'ඉත්ථන්නාමා භික්ඛුනී කාලකතා, සා භගවතා බ්‍යාකතා: 'තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා'ති. සා ඛො පනස්සා භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා: 'එවංසීලා සා භගිනී අහොසි ඉතිපි, එවංධම්මා -පෙ- එවං පඤ්ඤා-පෙ-එවං විහාරිනී-පෙ-එවං විමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච -පෙ- පඤ්ඤඤ්ච අනුස්සරන්තී තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා භික්ඛුනියා ඵාසුවිහාරො හොති.

---

1. කාලංකතා - මජසං

අනුරුද්ධයෙනි, මෙ සස්නෙහි මහණෙක් : ''මෙ නම් මහණ කලුරිය කෙළේ යැ. හේ තුන් සංයොජනයන් ක්ෂය කිරීමෙන් සෝවාන් වූයේ විනිපාතධම් (සතරඅපායකට වැටෙන සැහැවි) නැතියේ (සම්මත්තනියාමයෙන්) නියත වූයේ (උපරිමාර්ගත්‍රයසඞ්ඛ්‍යාත) සම්බොධිය පිහිට කොට ඇත්තේ යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනලදැ''යි අසයි. එ(සෝවන්) ආයුෂ්මත් මෙ මහණු විසින් තමා මැ දක්නාලද හෝ අනුශ්‍රවයෙන් අසනලද හෝ වෙයි. ''එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද මෙබඳු දහම් ඇතියේ . . . මෙබඳු ප්‍රඥා ඇතියේ . . . මෙබඳු විහරණ ඇතියේ . . . එ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි ද අසයි. එ මහණ ඔහුගේ ශ්‍රද්ධාව ද . . . ප්‍රඥාව ද සිහි කෙරෙමින් එ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මහණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මෙහෙණක් අසයි : ''මෙ නම් මෙහෙණ කලුරිය කළා යැ. හො අර්හත්ත්වයෙහි පිහිටියා යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනලදැ''යි. ඒ (රහත්) මෙහෙණ වැළිත් මෙ මෙහෙණ විසින් තමා මැ දක්නා ලදු හෝ අනුශ්‍රවයෙන් අසනලදු හෝ වෙයි : ''ඒ බුහුනා මෙබඳු සිල් ඇති වූ යයි ද, ඒ බුහුනා මෙබඳු දහම් ඇති වූ යයි ද, ඒ බුහුනා මෙබඳු ප්‍රඥා ඇති වූ යයි ද ඒ බුහුනා මෙබඳු විහරණ ඇති වූ යයි ද හො බුනැණි මෙසේ විමුක්ත වූ යයි දැ''යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් ශීලයත් ශ්‍රැතයත් ත්‍යාගයත් ප්‍රඥාවත් සිහි කෙරෙමින් එ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මෙහෙණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මෙහෙණක් අසයි : ''මෙ නම් මෙහෙණ කලුරිය කළා. හො ඕරම්භාගීය සංයොජන පස ප්‍රහීණ කිරීමෙන් ඕපපාතික වූවා එහි පිරිනිවෙන්නී එලොවින් පෙරළා නො එන සැහැවි ඇත්තී යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලදැ''යි. ඒ (අනාගැමි) බූනා වැළිත් මෙ මෙහෙණ විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසනලදු හෝ වෙයි : ''එ බූනා මෙබඳු සිල් ඇති වූ යයි ද මෙ බඳු දහම් ඇත්තී . . මෙබඳු ප්‍රඥා ඇත්තී . . මෙබඳු විහරණ ඇත්තී ඒ බුහුනා මෙසේ විමුක්ත වූ යයි දැ''යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් . . ප්‍රඥාවත් සිහි කෙරෙමින් එ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මෙහෙණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි මෙහෙණක් අසයි : ''මෙ නම් මෙහෙණ කලුරිය කළා, හො සංයොජන තුනක් ප්‍රහීණ කිරීමෙන් රාගද්වෙෂමොහයන්ගේ තනුභාවයෙන්සෙදගැමිනි වූවා එක් වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නී යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලදැ''යි. ඒ (සෙදගැමි) බූනා ඒ මෙහෙණ විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසන ලදු හෝ වෙයි : ''ඒ බුහුනා මෙබඳු සිල්ඇති වූ යයි ද' මෙබඳු දහම් ඇත්තී . . . මෙබඳු ප්‍රඥා ඇත්තී . . . මෙබඳු විහරණ ඇත්තී . . . ඒ බුහුනා මෙසේ විමුක්ත වූවා යයි දැ''යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් . . . ප්‍රඥාවත් සිහි කෙරෙමින් ඒ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මෙහෙණහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙ සස්නෙහි මෙහෙණක් අසයි : ''මෙ නම් මෙහෙණ කලුරිය කළා, හො සංයෝජන තුනක් ප්‍රහීණ කිරීමෙන් සෝවන් වූවා විනිපාතධම් නැත්තී (සම්මත්ත-නියාමයෙන්) නියත වූවා සම්බෝධිය පිහිට කොට ඇත්තී යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලදැ''යි. ඒ (සොවන්) බූනා වැළිත් එ මෙහෙණ විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසනලදු හෝ වෙයි : ''ඒ බුහුනා මෙබඳු සිල් ඇති වූ යයි ද, මෙ බඳු දහම් ඇත්තී . . . මෙබඳු ප්‍රඥා ඇත්තී . . . මෙබඳු විහරණ ඇත්තී . . . ඒ බුහුනා මෙසේ විමුක්ත වූවා යයි දැ''යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් . . . ප්‍රඥාවත් . . . සිහි කෙරෙමින් එ බවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, මෙහෙණහට ඵාසුවිහරණ වෙයි.

ඉධානුරුද්ධා උපාසකො සුණාති: ඉත්ථන්නාමො උපාසකො කාලකතො, සො භගවතා බ්‍යාකතො: ‘පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා’ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවස්සුතො වා: ‘එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි. එවංධම්මො සො ආයස්මා අහොසි ඉතිපි. එවංපඤ්ඤො සො ආයස්මා අහොසි ඉතිපි, එවංවිහාරී සො ආයස්මා අහොසි ඉතිපි, එවංවිමුත්තො සො ආයස්මා අහොසි ඉතිපී’ති. සො තස්ස සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරන්තො තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා උපාසකස්ස ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා උපාසකො සුණාති: ‘ඉත්ථන්නාමො උපාසකො කාලකතො, සො භගවතා බ්‍යාකතො: තිණ්ණං සංයොජනානං පරික්ඛයා, රාගදොසමොහානං තනුත්තා සකදාගාමී, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතී’ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවස්සුතො වා. එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො -පෙ- එවංපඤ්ඤො-පෙ- එවංවිහාරී-පෙ-එවංවිමුත්තො සො ආයස්මා අහොසි ඉතිපී’ති. සො තස්ස සද්ධඤ්ච -පෙ- පඤ්ඤඤ්ච අනුස්සරන්තො තදත්ථාය චිත්තං උපසංහරති, එවම්පි ඛො අනුරුද්ධා උපාසකස්ස ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා උපාසකො සුණාති: ඉත්ථන්නාමො උපාසකො කාලකතො, සො භගවතා බ්‍යාකතො: ‘තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො’ති. සො ඛො පනස්ස ආයස්මා සාමං දිට්ඨො වා හොති අනුස්සවස්සුතො වා: ‘එවංසීලො සො ආයස්මා අහොසි ඉතිපි, එවංධම්මො-පෙ-එවංපඤ්ඤො-පෙ-එවංවිහාරී-පෙ-එවංවිමුත්තො සො ආයස්මා අහොසි ඉතිපී’ති. සො තස්ස සද්ධඤ්ච -පෙ-පඤ්ඤඤ්ච අනුස්සරන්තො තදත්ථාය චිත්තං උපසංහරති එවම්පි ඛො අනුරුද්ධා උපාසකස්ස ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා උපාසිකා සුණාති: ‘ඉත්ථන්නාමා උපාසිකා කාලකතා[1] සා භගවතා බ්‍යාකතා: පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනී අනාවත්තිධම්මා තස්මා ලොකා’ති. සා ඛො පනස්ස භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවස්සුතා වා: ‘එවංසීලා සා භගිනී අහොසි ඉතිපි, එවංධම්මා සා භගිනී අහොසි ඉතිපි, එවංපඤ්ඤා සා භගිනී අහොසි ඉතිපි, එවංවිහාරිනී සා භගිනී අහොසි ඉතිපි. එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී’ති. සා තස්සා සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරන්තී තදත්ථාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා උපාසිකාය ඵාසුවිහාරො හොති

1. කාලංකතා - මජසං.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවසුවෙක් අසයි : ''මෙ නම් උවසු කලුරිය කෙළේ යැ. හේ ඔරම්භාගීය සංයොජ න පස ප්‍රහීණ කිරීමෙන් ඕපපාතික වූයේ එහි පිරිනිවෙනසුලු වූයේ එලොවින් පෙරළා නො එන සැහැවි ඇත්තේ යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනලද''යි. එ (අනාගැමි) උවසු වැළින් එ උවසුහු විසින් තමා මැ දක්නාලද හෝ අනුශ්‍රවයෙන් අසනලද හෝ වෙයි ' ''එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද, එ ආයුෂ්මත් මෙබඳු දහම් ඇති වී යයි ද, එ ආයුෂ්මත් මෙබඳු ප්‍රඥ ඇති වී යයි ද, එ ආයුෂ්මත් මෙබඳු විහරණ ඇති වී යයි ද, ඒ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි දැ''යි. හෙ ඔහුගේ ශ්‍රද්ධාවත් ශීලයත් ශ්‍රැතයත් ත්‍යාගයත් ප්‍රඥවත් සිහි කෙරෙමින් එබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවසුහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවසුවෙක් අසයි : ''මෙ නම් උවසු කලුරිය කෙළේ යැ, හේ සංයෝජන තුනක් ප්‍රහීණ කිරීමෙන් රාගද්වෙෂමොහයන්ගේ තනුභාවයෙන් සෙදගැමි වූයේ එක් වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නේ යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනලද''යි. ඒ ආයුෂ්මත් වැළිත් මොහු විසින් තමා මැ දක්නාලද හෝ අනුශ්‍රවයෙන් අසන ලද හෝ වෙයි : ''එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද, මෙබඳු දහම් ඇත්තේ . . . මෙබඳු ප්‍රඥ ඇත්තේ . . . මෙබඳු විහරණ ඇත්තේ . . . එ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි දැ''යි. හෙ ඔහුගේ ශ්‍රද්ධාවත් . . . ප්‍රඥවත් සිහි කෙරෙමින් එබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවසුහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවසුවෙක් අසයි : ''මෙ නම් උවසු කලුරිය කෙළේ යැ, හේ සංයෝජන තුනක් ප්‍රහීණ කිරීමෙන් සෝවන් වූයේ විනිපාතධම් නැත්තේ නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලදැ''යි. එ ආයුෂ්මත් වැළිත් මොහු විසින් තමා මැ දක්නාලද හෝ අනුශ්‍රවයෙන් අසනලද හෝ වෙයි, ''එ ආයුෂ්මත් මෙබඳු සිල් ඇති වී යයි ද, මෙබඳු දහම් ඇත්තේ . . . මෙබඳු ප්‍රඥ ඇත්තේ. . . මෙබඳු විහරණ ඇත්තේ . . . එ ආයුෂ්මත් මෙසේ විමුක්ත වී යයි දැ''යි. හෙ ඔහුගේ ශ්‍රද්ධාවත් . . . ප්‍රඥවත් සිහි කෙරෙමින් ඒබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවසුහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවැසියක් අසයි : ''මෙ නම් උවැසි කලුරිය කළා, හේ ඔරම්භාගීය සංයෝජන පස ප්‍රහීණ කිරීමෙන් ඕපපාතික වූවා එහි පිරිනිවෙනසුලු වූවා එලොවින් පෙරළා නො එන සැහැවි ඇත්තී යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනලදැ''යි. ඒ (අනාගැමි) බුහුන වැලිත් ඇය විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසනලදු හෝ වෙයි : ''ඒ බුහුන මෙබඳු සිල් ඇති වූ යයි ද, ඒ බුහුන මෙබඳු දහම් ඇති වූ යයි ද ඒ බුහුන මෙබඳු ප්‍රඥ ඇති වූ යයි ද, ඒ බුහුන මෙබඳු විහරණ ඇති වූ යයි ද, ඒ බුහුන මෙසේ විමුක්ත වූ යයි දැ''යි. හෝ ඇයගේ ශ්‍රද්ධාවත් ශීලයත් ශ්‍රැතයත් ත්‍යාගයත් ප්‍රඥවත් සිහි කෙරෙමින් එබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවැසිහට ඵාසුවිහරණ වෙයි.

Free Distribution www.aathaapi.org

ඉධානුරුද්ධා උපාසිකා සුණාති: ඉත්ථන්නාමා උපාසිකා කාලකතා[1], සා භගවතා බ්‍යාකතා: 'තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනී සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සතී'ති. සා ඛො පනස්සා භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා: එවංසීලා සා භගිනී අහොසි ඉතිපි, එවංධම්මා-පෙ-එවංපඤ්ඤා-පෙ- එවංවිහාරිනී-පෙ-එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච -පෙ- පඤ්ඤඤ්ච අනුස්සරන්තී තථත්තාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා උපාසිකාය ඵාසුවිහාරො හොති.

ඉධානුරුද්ධා උපාසිකා සුණාති: 'ඉත්ථන්නාමා උපාසිකා කාලකතා සා භගවතා බ්‍යාකතා: 'තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා'ති. සා ඛො පනස්සා භගිනී සාමං දිට්ඨා වා හොති අනුස්සවසුතා වා: එවංසීලා සා භගිනී අහොසි ඉතිපි. එවංධම්මා සා භගිනී අහොසි ඉතිපි. එවංපඤ්ඤා සා භගිනී අහොසි ඉතිපි. එවංවිහාරිනී සා භගිනී අහොසි ඉතිපි. එවංවිමුත්තා සා භගිනී අහොසි ඉතිපී'ති. සා තස්සා සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරන්තී තථත්තාය චිත්තං උපසංහරති. එවම්පි ඛො අනුරුද්ධා උපාසිකාය ඵාසුවිහාරො හොති.

ඉති ඛො අනුරුද්ධා තථාගතො න ජනකුහනත්ථං, න ජනලපනත්ථං, න ලාභසක්කාරසිලොකානිසංසත්ථං, න ඉති මං ජනො ජානාතූ'ති සාවකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති: 'අසු අමුත්‍ර උපපන්නො අසු අමුත්‍ර උපපන්නො'ති. සන්ති ච ඛො අනුරුද්ධා කුලපුත්තා සද්ධා උළාරවෙදා උළාරපාමොජ්ජා. තෙ තං සුත්වා තථත්තාය චිත්තං උපසංහරන්ති. තෙසං තං අනුරුද්ධා හොති දීඝරත්තං හිතාය සුඛායාති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා අනුරුද්ධො භගවතො භාසිතං අභිනන්දීති.

නළකපාන සුත්තං අට්ඨමං.

---

1. කාලං කතා - මජසං.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවැසියක් අසයි : "මෙ නම් උවැසි කලුරිය කළා, හො සංයෝජන තුනක් ප්‍රහීණ කිරීමෙන් රාගද්වේෂමෝහයන්ගේ තනුභාවයෙන් සෙදගැමි වූවා එක් වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නී යැ'යි භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරන ලද"යි. ඒ බුහුනා වැළිත් ඇය විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසනාලදු හෝ වෙයි : "ඒ බුහුනා මෙබඳු සිල් ඇති වූ යයි ද, මෙබඳු දහම් ඇත්තී . . . මෙබඳු ප්‍රඥ ඇත්තී . . . මෙබඳු විහරණ ඇත්තී . . . . ඒ බුහුනා මෙසේ විමුක්ත වූවා යයි දැ"යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් . . . ප්‍රඥවත් සිහි කෙරෙමින් එබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවැසිහට ඵාසුවිහරණ වෙයි.

අනුරුද්ධයෙනි, මෙසස්නෙහි උවැසියක් අසයි : "මෙ නම් උවැසි, කලුරිය කළා, හො සංයොජන තුනක් ප්‍රහීණ කිරීමෙන් සෝවන් වූවා විනිපාතධම් නැත්තී නියත වූවා සම්බොධිය පිහිට කොට ඇත්තී යැ'යි. භාග්‍යවතුන් විසින් ප්‍රකාශ කරනාලද"යි. ඒ බුහුනා වැලිත් ඇය විසින් තමා මැ දක්නාලදු හෝ අනුශ්‍රවයෙන් අසනාලදු හෝ වෙයි : "ඒ බුහුනා මෙබඳු සිල් ඇති වූ යයි ද, ඒ බුහුනා මෙබඳු දහම් ඇතිවූ යයි ද ඒ බුහුනා මෙබඳු ප්‍රඥ ඇති වූ යයි ද, ඒ බුහුනා මෙබඳු විහරණ ඇති වූ යයි ද ඒ බුහුනා මෙසේ විමුක්ත වූ යයි ද"යි. හො ඇයගේ ශ්‍රද්ධාවත් ශීලයත් ශ්‍රැතයත් ත්‍යාගයත් ප්‍රඥවත් සිහි කෙරෙමින් එබවට සිත එළවයි. මෙසේත් අනුරුද්ධයෙනි, උවැසිහට ඵාසුවිහරණ වේ.

මෙසෙයින් අනුරුද්ධයෙනි, තථාගතයෝ 'ජනයා විස්මය කරනු පිණිස නො වැ ජනයා නළවනු පිණිස නො වැ ලාභ සත්කාර ප්‍රශංසා අනුසස් පිණිස නො වැ මෙසෙයින් මා මහජනයා දනිව'යි කියා නො වැ' අසුවල් අසුවල්තැනැ උපන, අසුවල් අසුවල් තැනැ උපනැ'යි ඉකුත් වූ කලුරිය කළ ශ්‍රාවකයන් උපප්‍රාප්තියෙහි ලා ප්‍රකාශ කෙරෙති. අනුරුද්ධයෙනි, සැදැහැති මහත් වූ තුෂ්ටි ඇති මහත් වූ ප්‍රාමෝද්‍ය ඇති කුලපුත්‍රයෝ ඇත. ඔහු එය අසා එබවට සිත එළවති. අනුරුද්ධයෙනි, ඔවුනට ඒ දිඝකලක් හිත පිණිස සුව පිණිස වේ යයි.

බුදුහු මේ සූත්‍රාන්තය වදාළහ. සතුටුසිත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු වූහ'යි.

අට වැනි නළකපාන සූත්‍ර යි.

---

2. 2. 9

ගුලිස්සානි සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ගුලිස්සානි[1] නාම භික්ඛු ආරඤ්ඤකො[2] පදරසමාචාරො[3] සඞ්ඝමජ්ඣෙ ඔසටො හොති කෙනචිදෙව කරණීයෙන. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො ගුලිස්සානිං භික්ඛුං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි.

ආරඤ්ඤකෙන'හාවුසො[4] භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන සබ්‍රහ්මචාරීසු සගාරවෙන භවිතබ්බං සප්පතිස්සෙන. සචෙ ආවුසො ආරඤ්ඤකො[2] භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො සබ්‍රහ්මචාරීසු අගාරවො හොති අප්පතිස්සො. තස්ස භවන්ති වත්තාරො: 'කිම්පනිමස්ස ආයස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමා- යස්මා සබ්‍රහ්මචාරීසු අගාරවො[5] අප්පතිස්සො'තිස්ස[6] භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන සබ්‍රහ්මචාරීසු සගාරවෙන භවිතබ්බං සප්පතිස්සෙන.

ආරඤ්ඤකෙන'හාවුසො[4] භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන ආසනකුසලෙන භවිතබ්බං 'ඉති ථෙරෙ ච භික්ඛූ නානුපඛජ්ජ නිසී- දිස්සාමි. නවෙ ච භික්ඛූ න ආසනෙන පටිබාහිස්සාමී'ති. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො න ආසනකුසලො[7] හොති. තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්ස ආයස්මතො ආරඤ්ඤ- කස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා ආභිසමාචාරිකම්පි ධම්මං න ජානාතී'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන ආසනකුසලෙන භවිතබ්බං.

ආරඤ්ඤකෙන'හාවුසො[4] භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන නාතිකාලෙන ගාමො පවිසිතබ්බො. නාති දිවා පටික්කමිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො අතිකාලෙන ගාමං පවිසති. අතිදිවා[7] පටික්කමති. තස්ස භවන්ති වත්තාරො. කිම්පනිමස්ස ආයස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා අතිකාලෙන ගාමං පවිසති, අතිදිවා පටික්කමතී'තිස්ස[6] භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන නාතිකාලෙන ගාමො පවිසිතබ්බො. නාති දිවා පටික්කමිතබ්බං.

---

1. ගොලියානි – මජ්ඣං. / ගොලිස්සානි – ස්‍යා.
2. ආරඤ්ඤිකො – මජ්ඣං.
3. පදසමාචාරො – මජ්ඣං
4. අරඤ්ඤකෙනාවුසො – මජ්ඣං, ස්‍යා.
5. අගාරවො හොති – මජ්ඣං.
6. තස්ස – මජ්ඣං, සීමු, ස්‍යා.
7. ආසනකුසලො න හොතීති – මජ්ඣං, සීමු.
8. දිවා – PTS

Free Distribution www.aathaapi.org

2. 2. 9
ගුලිස්සානි සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කළන්‍දකනිවාප නම් වේළුවනයෙහි වැඩ වසනසේක. එසමයෙහි ආරණ්‍යක වූ ඖදරික ආචාර ඇති 'ගුලිස්සානි' නම් මහණ කිසියම් කටයුත්තෙකින් සඟමැදට පැමිණියේ වෙයි. එහි දී ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගුලිස්සානි මහණහු අරභයා භික්ෂූන් ඇමතූසේක :

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව සහිත වූවකු ප්‍රතිෂ්ඨා සහිත වූවකු වියයුතු යි. ඉදින් ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණ සබ්‍රම්සරුන් කෙරෙහි අගෞරව ඇතියේ යටත් පැවැතුම් රහිත වූයේ වේ ද, ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මේ ආයුෂ්මත්-හට වෙනෙහි එකලා වැ සෛවරිවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් සබ්‍රම්සරුන් කෙරෙහි නො ගරු වූයේ යටත් පැවැතුම් නැතියේ වේ''යයි ඔහුට නුගුණ කියන්නාහු වෙති. එහෙයින් සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් සබ්‍රම්සරුන් කෙරෙහි සගරු වූවකු යටත් පැවැතුම් ඇතියකු වියයුතු යි.

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් : ''මෙසේ ස්ථවිර භික්ෂූන් ද නො ගටා හිඳින්නෙමි, නවකභික්ෂූන් ද ආසනයෙන් නො නෙරනෙමි''යි ආසනකුසල වූවකු වියයුතු යි. ඉදින් ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණ ආසනකුසල නො වූයේ වේ ද, ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මේ ආයුෂ්මත්හට එකලා වැ වෙනෙහි සෛවරිවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් ආභිසමාචාරික වත පවා නො දනී'' යයි ඔහුට නුගුණ කියන්නාහු වෙති. එහෙයින් සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් ආසනකුසලයකු වියයුතු යි.

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු ඉතා උදැසන ගම් නො වැදියයුතු යැ. ඉතා දහවල් වැ ගමින් නො නික්මියයුතු යැ. ඉදින් ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණ ඉතා උදැසන ගම් වදී ද, ඉතා දහවල් වැ පෙරළා යේ ද, ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මෙ ආයුෂ්මත්හට එකලා වැ වනසෙනසුන්හි සෛවරිවිහරණයෙන් කිම? මෙ ආයුෂ්මත් ඉතා උදැසන ගම් වදී. ඉතා දහවල් වැ පෙරළා යේ''යයි ඔහුට නුගුණ කියන්නාහු වෙති. එහෙයින් සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් ඉතා උදැසන ගම් නො වැදියයුතු යැ. ඉතා දහවල් වැ පෙරළා නො යායුතු.

ආරඤ්ඤකෙන'ාවුසො භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන න පුරෙභත්තං පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො[1] භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො පුරෙභත්තං පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජති, තස්ස භවන්ති වත්තාරො: අයන්නූනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන විහරතො විකාලචරියා බහුලීකතා, තමෙනං සඞ්ඝගතම්පි සමුදාචරතී'ති තස්ස[2] භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන න පුරෙභත්තං පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිතබ්බං.

ආරඤ්ඤකෙන'ාවුසො භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන අනුද්ධතෙන භවිතබ්බං අචපලෙන. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො උද්ධතො හොති. චපලො තස්ස භවන්ති වත්තාරො: 'ඉදන්නූනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන විහරතො උද්ධච්චං චාපල්‍යං බහුලීකතං, තමෙනං සඞ්ඝගතම්පි සමුදාචරතී'ති තස්ස[2] භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන අනුද්ධතෙන භවිතබ්බං අචපලෙන.

ආරඤ්ඤකෙන'ාවුසො භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන අමුඛරෙන භවිතබ්බං අවිකිණ්ණවාචෙන. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො මුඛරො හොති විකිණ්ණවාචො. තස්ස භවන්ති වත්තාරො: 'කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා මුඛරො විකිණ්ණවාචො'ති තස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන අමුඛරෙන භවිතබ්බං අවිකිණ්ණවාචෙන.

ආරඤ්ඤකෙන'ාවුසො භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන සුබ්බචෙන[3] භවිතබ්බං කල්‍යාණමිත්තෙන. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු සඞ්ඝගතො සඞ්ඝෙ විහරන්තො දුබ්බචො හොති පාපමිත්තො, තස්ස භවන්ති වත්තාරො: 'කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන. යො අයමායස්මා දුබ්බචො පාපමිත්තො'ති තස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සඞ්ඝගතෙන සඞ්ඝෙ විහරන්තෙන සුබ්බචෙන[3] භවිතබ්බං කල්‍යාණමිත්තෙන.

ආරඤ්ඤකෙන'ාවුසො භික්ඛුනා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරෙන භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො'ති තස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරෙන භවිතබ්බං.

---

1. ආරඤ්ඤිකො - මජසං
2. තස්ස - මජසං. සීමු. ස්‍යා.
3. සුවචෙන - මජසං, ස්‍යා, PTS.

ඇවැත්නි සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් පෙරබත්හි හෝ පසුබත්හි හෝ (නො පැවැරූ) කුලයන්හි හැසිරීමට නො පැමිණිය යුතු යැ. ඉදින් ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණ පෙරබත්හි හෝ පසුබත්හි හෝ නො පැවැරූ කුලයන්හි සැරිසරා නම් ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මේ ආයුෂ්මත්හු එකලා වැ වෙසෙති ස්වච්ඡන්ද.විහාරයෙන් වාසය කරන්නාහු විසින් ඒකාන්තයෙන් මේ විකාලචර්‍යාව බහුලකරතලද, සඟමැදට ගියා වූ ද තුලුන් (ඒ විකාල චර්‍යාව) මැඩගෙන සිටී''යයි ඔහුට නුගුණ කියන්නාහු වෙති. එහෙයින් සඟමැදට ගියා වූ සඟමැද වාසය කරන ආරණ්‍යක මහණහු විසින් පෙරබත්හිදු පසුබත්හිදු කුලයන්හි හැසිරීමට නො පැමිණිය යුතු යැ.

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැදවසන ආරණ්‍යක මහණහු විසින් උඩඟු නො වූවකු චපල නො වූවකු වියයුතු යැ. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ සඟමැදට පැමිණියේ සඟමැද වාසය කරනුයේ උද්ධත වූයේ චපල වූයේ වේ ද, එකල්හි ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මෙ ආයුෂ්මත්හු එකලා වැ අරණ්‍යයෙහි ස්වච්ඡාවිහරණයෙන් වාසය කරන්නාහු විසින් ඒකාන්තයෙන් මේ උඩඟු බව චපල බව බහුල කරතලද. සඟ මැදට ගියා වූ ද තුලුන් (ඒ උඩඟු බව චපල බව) මැඩගෙන සිටී''යයි ඔහුට නුගුණකියන්නාහු වෙති. එහෙයින් සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු අනුද්ධත වූවකු අචපල වූවකු වියයුතු යැ.

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු දෙඩමලු නො වූවකු නො විසිරුණු වචන ඇතියකු විය යුතු ය, ඉදින් ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණ දෙඩමලු වූයේ විසිරුණු වචන ඇතියේ වේ ද, එකල්හි ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මේ ආයුෂ්මත්හුගේ එකලා වැ අරණ්‍යයෙහි ස්වච්ඡන්ද විහරණයෙන් කිම? මේ ආයුෂ්මත් මුඛරයෙක විකිණ්ණවචන ඇත්තෙකැ''යි ඔහුට නුගුණ කියන්නාහු වෙති. එහෙයින් සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු විසින් දෙඩමලු නො වූවකු නො විසිරුණු වචන ඇත්තකු විය යුතු යැ.

ඇවැත්නි, සඟමැදට පැමිණි සඟමැද වසන ආරණ්‍යක මහණහු සුවච වූවකු කලණමිතුරන් ඇතියකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ සඟමැදට ගියේ සඟමැද වසනුයේ දුර්වච වූයේ පාපමිත්‍රයන් ඇත්තේ වේ ද, ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ අරණ්‍යයෙහි ස්වච්ඡන්දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් දුර්වචයෙක පාපමිත්‍රයන් ඇත්තෙකැ'යි ඔහුට නුගුණකියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු සඟමැදට ගියහු සඟමැද වසන්නාහු සුවච වූවකු කලණමිතුරන් ඇතියකු වියයුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු ඉඳුරන්හි පියූ දෙර ඇතියකු වියයුතු ය, ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ ඉඳුරන්හි නො පියූ දෙර ඇතියේ වේ ද, ඔහුට නුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යක වූවහුට එකලා වැ වෙසෙති ස්වච්ඡන්දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් ඉඳුරන්හි නො පියූ දෙර ඇත්තෙකැ''යි ඔහුට නුගුණ කියන්නාහු වෙති, එහෙයින් ආරණ්‍යක මහණහු ඉඳුරන්හි පියූ දෙර ඇතියකු වියයුතු යැ.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා භොජනෙ මත්තඤ්ඤුනා භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු භොජනෙ අමත්තඤ්ඤූ හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා භොජනෙ අමත්තඤ්ඤූ'තිස්ස[1] භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා භොජනෙ මත්තඤ්ඤුනා භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා ජාගරියං අනුයුත්තෙන භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු ජාගරියං අනනුයුත්තො හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා ජාගරියං අනනුයුත්තො'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා ජාගරියං අනුයුත්තෙන භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා ආරද්ධවිරියෙන භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු කුසීතො හොති. තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා කුසීතො'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා ආරද්ධවිරියෙන භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා උපට්ඨිතසතිනා[2] භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු මුට්ඨස්සති හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා මුට්ඨස්සතී'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා උපට්ඨිතසතිනා භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා සමාහිතෙන භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු අසමාහිතො හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා අසමාහිතො'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා සමාහිතෙන භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා පඤ්ඤවතා භවිතබ්බං. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු දුප්පඤ්ඤො හොති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා දුප්පඤ්ඤො'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා පඤ්ඤවතා භවිතබ්බං.

ආරඤ්ඤකෙන'පාවුසො භික්ඛුනා අභිධම්මෙ අභිවිනයෙ යොගො කරණීයො. සන්තාවුසො ආරඤ්ඤකං භික්ඛුං අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං පුච්ඡිතාරො. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං පුට්ඨො න සම්පායති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං පුට්ඨො න සම්පායති, තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා අභිධම්මෙ අභිවිනයෙ යොගො කරණීයො.

---

1. අමත්තඤ්ඤූති'තස්ස - සීමු, මජසං, ස්‍යා.
2. උපට්ඨිතස්සතිනා - මජසං.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු භෝජනයෙහි පමණ දන්නකු වියයුතු ය. ඉදින් ඇවැත්නි ආරණ්‍යක මහණ භෝජනයෙහි මාත්‍රඥ නොවූයේ වේ ද, ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් භෝජනයෙහි මාත්‍රඥ නොවූයෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් භෝජනයෙහි මාත්‍රඥ වූවකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු විසින් නිදි දූරුකිරීමෙහි යෙදුණකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ නිදි දූරුකිරීමෙහි නො යෙදුණේ වේ ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ ආරණ්‍යයෙහි සවච්ඡන්‍ද විහරණයෙන් කිම? මේ ආයුෂ්මත් නිදි දූරුකිරීමෙහි නො යෙදුණෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු නිදි වැරීමෙහි යෙදුණකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු විසින් ආරබ්ධවීර්‍ය්‍ය ඇතියකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ කුසීතයෙක් වේ ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම? මේ කුසීතයෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් ආරබ්ධවීර්‍ය්‍ය ඇතියකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු එළැඹසිටි සිහි ඇතියකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ මුළා සිහි ඇතියේ වේ ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂමත් ආරණ්‍යක හට එකලා වැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම, මේ ආයුෂ්මත් මුළාසිහි ඇත්තෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු එළැඹ සිටි සිහි ඇතියකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු එකඟ කළ සිත් ඇත්තකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ සමාධි රහිත වූයේ වේ ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලාවැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් අසමාහිතයෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් එකඟ කළ සිත් ඇතියකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු කටයුත්තෙහි උපායප්‍රඥයෙන් යුක්ත වූවකු විය යුතු ය. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ දුෂ්ප්‍රාඥ වේ ද එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥයෙකැ''යි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු උපායප්‍රඥ ඇත්තකු විය යුතු යැ.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු විසින් අභිධර්මපිටකයෙහි ද විනයපිටකයෙහි ද පෙළ විසින් අටුවා විසින් යෝග කටයුතු ය. ඇවැත්නි, ආරණ්‍යක මහණහු අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නාහු ඇත. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නා ලදුයේ සම්පාදනය කොට නො කියහෙයි ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මෙ ආයුෂ්මත් ආරණ්‍යකහට එකලා වැ අරණ්‍යයෙහි සවච්ඡන්‍දවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නා ලදුයේ සම්පාදනය කොට නො කිය හේ''යයි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් අභිධර්මයෙහි අභිවිනයෙහි යෝග කටයුත්තේ යැ.

ආරඤ්ඤකෙන'හාවුසො භික්ඛුනා යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තත්ථ යොගො කරණීයො. සන්තාවුසො ආරඤ්ඤකං භික්ඛුං යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තත්ථ පඤ්හං පුච්ඡිතාරො. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තත්ථ පඤ්හං පුට්ඨො න සම්පායති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තත්ථ පඤ්හං පුට්ඨො න සම්පායතී'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තත්ථ යොගො කරණීයො.

ආරඤ්ඤකෙන හාවුසො භික්ඛුනා උත්තරිමනුස්සධම්මෙ යොගො කරණීයො. සන්තාවුසො ආරඤ්ඤකං භික්ඛුං උත්තරිමනුස්සධම්මෙ පඤ්හං පුච්ඡිතාරො. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු උත්තරිමනුස්සධම්මෙ පඤ්හං පුට්ඨො න සම්පායති, තස්ස භවන්ති වත්තාරො: කිම්පනිමස්සායස්මතො ආරඤ්ඤකස්ස එකස්සාරඤ්ඤෙ සෙරිවිහාරෙන, යො අයමායස්මා යස්සත්ථාය පබ්බජිතො තමත්ථං න ජානාතී'තිස්ස භවන්ති වත්තාරො. තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා උත්තරිමනුස්සධම්මෙ යොගො කරණීයොති.

එවං වුත්තෙ ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: ආරඤ්ඤකෙනෙව නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනා ඉමෙ ධම්මා සමාදාය වත්තිතබ්බා උදාහු ගාමන්තවිහාරිනාපීති. ආරඤ්ඤකෙනාපි ඛො ආවුසො මොග්ගල්ලාන භික්ඛුනා ඉමෙ ධම්මා සමාදාය වත්තිතබ්බා. පගෙව ගාමන්තවිහාරිනාති.

ගුලිස්සානි සුත්තං නවමං.

ඇවැත්නි, ආරණ්‍යක මහණහු විසින් රූපසමාපත්තීන් ඉක්මවා සිටි ආරූප්‍ය වූ යම් ශාන්තවිමෝක්ෂ කෙනෙක් ඇද්ද, එහි යෝග කටයුතු යැ. ඇවැත්නි, රූපසමාපත්තීන් ඉක්මවා සිටි ආරූප්‍ය වූ යම් ශාන්තවිමෝක්ෂ කෙනෙක් ඇද්ද, එහිලා ආරණ්‍යක මහණහු පැන පුළුවුස්නාහු ඇත. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ රූපසමාපත්තීන් ඉක්මසිටි ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, එහි ලා පැන පුළුවුස්නාලදුයේ සම්පාදනය කොට නො කිය හේ ද, ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''මේ ආයුෂ්මත් ආරණ්‍යක මහණහට එකලා වැ අරණ්‍යයෙහි සෛවරිවිහරණයෙන් කිම? රූපසමාපත්තීන් ඉක්මවා සිටි ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, මේ ආයුෂ්මත් එහි ලා පැන පුළුවුස්නාලදුයේ සම්පාදනය කොට නො කියහේ''යයි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් රූපසමාපත්තීන් ඉක්මවා සිටි ආරූප්‍ය වූ යම් ඒ ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, එහි යෝග කටයුතු යැ.

ඇවැත්නි ආරණ්‍යක මහණහු විසින් උතුරුමිනිස්දම්හි යොග කටයුතු යැ. ඇවැත්නි, ආරණ්‍යක මහණහු උතුරුමිනිස්දම්හි පැන පුළුවුස්නාහු ඇත. ඉදින් ඇවැත්නි, ආරණ්‍යක මහණ උතුරුමිනිස්දම්හි පැන පුළුවුස්නාලදුයේ සම්පාදනය කොට නො කියහේ ද, එකල්හි ඔහුට තුගුණ කියන්නාහු වෙති : ''ආරණ්‍යක වූ මේ ආයුෂ්මත්හට එකලා වැ අරණ්‍යයෙහි සෛවච්ඡාවිහරණයෙන් කිම? මේ ආයුෂ්මත් යම් උතුරුමිනිස්දහමක් සඳහා පැවිදි වූයේ ද, ඒ අර්ථය නොදනී''යයි ඔහුට තුගුණ කියන්නාහු වෙති. එහෙයින් ආරණ්‍යක මහණහු විසින් උතුරුමිනිස්දම්හි යොග කටයුතු යයි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට තෙල කීහ : ''ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, ආරණ්‍යක මහණහු විසින් මැ මේ දහම්හු සමාදන් වැ ගෙන පැවැත්ත යුත්තාහු ද, නොහොත් ග්‍රාමාන්ත සෙනසුන්හි වසන මහණහු විසිනුදු සමාදන් වැ ගෙන වැටිය යුත්තාහු දැ''යි. ඇවැත්නි මෞද්ගල්‍යායනයෙනි, ආරණ්‍යක මහණහුදු විසින් මේ දහම්හු සමාදන් වැ ගෙන වැටිය යුත්තාහ. ග්‍රාමාන්තවිහාරී මහණහු විසින් කියනු කිමැ''යි.

නව වැනි ගුලිස්සානි සූත්‍ර යි.

2. 2. 10

කීටාගිරි සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා කාසීසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: අහං ඛො භික්ඛවෙ අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජාමි, අඤ්ඤත්‍ර ඛො පනාහං භික්ඛවෙ රත්තිභොජනා භුඤ්ජමානො අප්පාබාධතඤ්ච සඤ්ජානාමි අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ තුම්හෙපි භික්ඛවෙ අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ, අඤ්ඤත්‍ර ඛො පන භික්ඛවෙ තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. අථ ඛො භගවා කාසීසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කීටාගිරි නාම කාසීනං නිගමො තදවසරි. තත්‍ර සුදං භගවා කීටාගිරිස්මිං විහරති කාසීනං නිගමෙ.

තෙන ඛො පන සමයෙන අස්සජිපුනබ්බසුකා නාම භික්ඛූ කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුං: භගවා ඛො ආවුසො අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච, අඤ්ඤත්‍ර ඛො පනාවුසො රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ තුම්හෙපි ආවුසො අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ, අඤ්ඤත්‍ර ඛො පනාවුසො තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ, අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති. එවං වුත්තෙ අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං: 'මයං ඛො ආවුසො සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච, තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම, සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ'ති. යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං. අථ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං.

"ඉධ මයං භන්තෙ යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුම්හ: 'භගවා ඛො ආවුසො අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති -පෙ- ඵාසුවිහාරඤ්චා'ති. එවං වුත්තෙ භන්තෙ අස්සජිපුනබ්බසුකා භික්ඛූ අම්හෙ එතදවොචුං: 'මයං ඛො ආවුසො -පෙ- දිවා ච විකාලෙ'ති. යතො ඛො මයං භන්තෙ නාසක්ඛිම්හ අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං. අථ මයං එතමත්ථං භගවතො ආරොචෙමා"ති.

Free Distribution www.aathaapi.org

2. 2. 10
කීටාගිරි සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් වූ සඟපිරිස් පිරිවරා කාසිජනපදයෙහි සැරි සරනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූසේක : ''මහණෙනි, මම් වූකලි රාත්‍රිභෝජනය හැරපියා මැ වළඳමි. මහණෙනි, රාත්‍රිභොජනය හැරපියා වළඳනා මම නීරෝග බවද නිදුක් බව ද ශරීරයාගේ සැහැල්ලු පැවැත්ම ද කායබලය ද සුඛවිහරණය ද දනිමි. එව, තෙපිදු මහණෙනි, රාත්‍රිභෝජනය හැරපියා මැ වළඳවූ, මහණෙනි, තෙපිදු රාත්‍රිභෝජනය හැරපියා වළඳන්නාහු නීරෝග බව ද නිදුක්බව ද සැහැල්ලු පැවැත්ම ද කායබලය ද සුඛවිහරණය ද දැනගන්නාවූ යැ. ඒ මහණහු 'එසේ යැ වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් කසී දනාවුවෙහි සැරිසරනසේක් කීටාගිරි නම් වූ කසී දනාවු වැසියන්ගේ නියම්ගමට පිළිපන්සේක. භාග්‍යවතුන් වහන්සේ කසීරටවැසියන්ගේ කීටාගිරි නම් වූ නියම්ගමෙහි වාසය කරනසේක.

එසමයෙහි අස්සජි යැ පුනබ්බසුක යැ යන නම් ඇති මහණහු කීටාගිරියෙහි ආවාසිකයෝ වෙති. එකල්හි බොහෝ භික්ෂූහු අස්සජිපුනබ්බසුක භික්ෂූන් වෙත එළඹියාහු යැ. එළඹ අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට මෙල පවත් දන්වූහ : ''ඇවැත්නි, බුදුහු රාත්‍රිභොජනය හැරපියා මැ වළඳති, භික්ෂුසඞ්ඝ තෙමේ ද රාත්‍රිභෝජනය හැරපියා වළඳයි. ඇවැත්නි, රාත්‍රිභෝජනය හැරපියා වළඳන්නාහු නීරොග බව ද නිදුක්බව ද සැහැල්ලු පැවැත්ම ද සුඛවිහරණය ද දැනගන්නාහ. එව, ඇවැත්නි, තෙපිදු රාත්‍රිභොජනය හැරපියා මැ වළඳවූ. රාත්‍රිභෝජනය හැරපියා වළඳනා තෙපිදු නීරොග බව ද නිදුක්බව ද සැහැල්ලු පැවැත්ම ද කායබලය ද සුඛවිහරණය ද දැනගන්නාවූ යැ, මෙසේ කී කල්හි අස්සජිපුනබ්බසුක මහණහු ඒ භික්ෂූන්ට මෙල වදන් කීහු : ''ඇවැත්නි, ඇපි සවස්හිදු රැයිම්දු දහවල් විකාලයෙහිදු වළඳම්හ. එ සවස්හිදු රැයිම්දු දහවල් විකාලයෙහිදු වළඳනා ඇපි නිරාබාධ බව ද නිදුක් බව ද සැහැල්ලු පැවැතුම ද කායබලය ද සුඛවිහරණය ද දනුම්හ. අපි සාංදෘෂ්ටික වූ අනුසස් හැරපියා මතුලැබියයුතු අනුසසට කුමක් හෙයින් දුවමෝ ද ඇපි සවස්හිදු උදැසනදු දහවල් විකාලයෙහිදු වළඳම්හ'යි. යම් හෙයකින් ඒ භික්ෂූහු අස්සජිපුනබ්බසුක මහණුන් ගිවිස්වාලන්නට නො හැකි වූවාහු ද එකල්හි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේට වැද එකත්පස් වැ හුන්නාහු මෙල පවත් දන්වූහ.

''වහන්ස, අපි මෙ කීටාගිරියෙහි අස්සජිපුනබ්බසුක භික්ෂූන් වෙත එළඹ අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට මෙල පවත් දන්වූම්හ: 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ රාත්‍රි භෝජනය හැරපියා මැ වළඳන සේක . . . සුඛවිහරණය ද දන්නාසේකැ'යි. වහන්ස, මෙසේ කීකල්හි අස්සජිපුනබ්බසුක මහණහු අපට මෙල පවත් කීහ : ''ඇවැත්නි, ඇපි වූකලි . . . දහවල්හිදු විකාලයෙහි වළඳම්හ'යි. වහන්ස, යම් හෙයකින් අපි අස්සජි පුනබ්බසුක මහණුන් ගිවිස්වාලන්නට නො හැකි වූවමෝ ද, එකල්හි ඇපි මෙල පවත් භාග්‍යවතුන් වහන්සේට සැලකරම්හ'යි.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: 'එහි ත්වං භික්ඛු මම වචනෙන අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආමන්තෙහි, සත්ථායස්මන්තෙ ආමන්තෙතී'ති. එවම්භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොච: 'සත්ථායස්මන්තෙ ආමන්තෙතී'ති. එවමාවුසොති ඛො අස්සජිපුනබ්බසුකා භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නෙ ඛො අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ භගවා එතදවොච,

'සච්චං කිර භික්ඛවෙ සම්බහුලා භික්ඛූ තුම්හෙ උපසඞ්කමිත්වා එතදවොචුං: භගවා ඛො අවුසො අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච. අඤ්ඤත්‍ර ඛො පනාවුසො රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච, එථ තුම්හෙපි ආවුසො අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ, අඤ්ඤත්‍ර ඛො පනාවුසො තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති. එවං වුත්තෙ කිර භික්ඛවෙ තුම්හෙ තෙ භික්ඛූ එවං අවචුත්ථ: 'මයං ඛො ආවුසො සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ, තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ, අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානතඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච, තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම, සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ'ති. එවම්භන්තෙ.

කින්නු මෙ තුම්හෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ. යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්ස අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. නො'හෙතං භන්තෙ. නනු මෙ තුම්හෙ භික්ඛවෙ එවං ධම්මං දෙසිතං ආජානාථ, 'ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදියතො[1] අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. ඉධ පනෙකච්චස්ස එව රූපං සුඛං වෙදනං වෙදියතො[1] අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො[1] අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. ඉධ පනෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. ඉධ පනෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති එවම්භන්තෙ.

---

1. වෙදයතො - මජසං, සයා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණෙකුට ඇමැතූසේක : ''එව මහණ, තෙපි මාගේ බසින් 'ශාස්තෘහු ආයුෂ්මතුන් කැඳවාලති' අස්සජි පුනබ්බසුක මහණුන් කැඳවාලව'' යි වදාළසේක. 'එසේ යැ වහන්සැ'යි එ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී අස්සජි පුනබ්බසුක මහණුන් කරා එළඹ අස්සජිපුනබ්බසුක මහණුන්ට 'ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවනසේකැ'යි මෙ පවත් කීහ. 'එසේ යැ ඇවැත්නි'යි අස්සජි පුනබ්බසුක භික්ෂූහු එ මහණහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් අස්සජිපුනබ්බසුක මහණුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක.

සැබැද මහණෙනි, බොහෝ භික්ෂූහු තොප කරා එළඹ තෙල කීවාහු ඇපි ද : ''ඇවැත්නි, භාග්‍යවත්හු රාත්‍රිභෝජනය හැරපියා මැ වළඳති, භික්ෂුසඞ්ඝයා ද රාත්‍රිභෝජනය හැරපියා වළඳයි. තවද ඇවැත්නි, රාත්‍රිභොජනය හැරපියා වළඳන්නාහු නීරෝග බව ද නිදුක්බව ද සැහැල්ලු පැවැතුම් ද කායබලය ද සුවවිහරණය ද දන්නාහ. එව ඇවැත්නි, තෙපිදු රාත්‍රිභොජනය හැරපියා මැ වළඳව. ඇවැත්නි, තෙපිදු රාත්‍රිභොජනය හැරපියා වළඳන්නහු නීරෝග බව ද, නිදුක්බව ද සැහැල්ලු පැවැත්ම ද කායබලය ද සුවවිහරණය ද දනිවු''යයි. මෙසේ කී කල්හි මහණෙනි, තෙපි ඒ භික්ෂූන්ට ඇවැත්නි, අපි සවස්හිදු උදසනහි දු දහවල් විකාලයෙහි දු වළඳම්හ. ඇපි සවස්හිදු උදසනහි දු දහවල් විකාලයෙහි දු වළඳන්නාමෝ නිරාබාධ බව ද නිරාතඞ්ක බව ද සැහැල්ලු පැවැතුම් ද කායබලය ද සුඛවිහරණය ද දනුම්හ. අපි කුමක් හෙයින් සාන්දෘෂ්ටික වූ සුවය හැරපියා කාලික වූ සුවය අනුධාවනය කරමෝ ද අපි සවස්හි දු උදසනහි දු දහවල් විකාලයෙහි දු වළඳම්හ'යි මෙසේ කීවහු ද''යි, එසේ යැ වහන්ස.

කිම මහණෙනි, තෙපි මෙසේ දහම් දෙසනලද විරූ දන්නවු ද? ''මෙ පුරුෂපුද්ගල යම්කිසි සුවයක් හෝ දුකක් හෝ නො දුක් නො සුවයක් හෝ විඳී ද, ඔහුට අකුසල් දහම්හු පිරිහෙති, කුසල්දහම්හු වැඩෙති''යයි. වහන්ස, තෙල නැත් මැ යැ. මහණෙනි, තෙපි මා විසින් මෙසේ දහම් දෙසනලද විරූ දන්නහු නො ද? මෙලොවැ මෙබඳු වූ සුඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල් දහම්හු වැඩෙති, කුසල්දහම්හු පිරිහෙත්, තවද මෙලොවැ මෙබඳු වූ සුඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසල්දහම්හු වැඩෙත්. මෙලොවැ මෙබඳු දුඃඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල්දහම්හු වැඩෙති, කුසල්දහම්හු පිරිහෙත්. තවද මෙලොවැ මෙබඳු වූ දුඃඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල්දහම්හු පිරිහෙති, කුසල්දහම්හු වැඩෙත්. මෙලොවැ මෙබඳු වූ නො දුක් නො සුව වෙදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල්දහම්හු වැඩෙති, කුසල්දහම්හු පිරිහෙත්. තවද මෙලොවැ මෙබඳු වූ නො දුක් නො සුව වේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙත්''යයි. එසේ යැ වහන්ස.

සාධු භික්ඛවෙ මයා චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය: ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්තීති. එවමහං අජානන්තො 'එවරූපං සුඛං වෙදනං පජහථා'ති වදෙය්‍යං, අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සා'ති. නො හෙතං භන්තෙ, යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, 'ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තී'ති. තස්මාහං 'එවරූපං සුඛං වෙදනං පජහථා'ති වදාමි.

මයා'චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය: 'ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. එවම්හං අජානන්තො 'එවරූපං සුඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදෙය්‍යං. අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සාති. නො හෙතං භන්තෙ. 'යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය 'ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. තස්මාහං එවරූපං සුඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදාමි.

මයා'චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය 'ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තී'ති. එවමහං අජානන්තො 'එවරූපං දුක්ඛං වෙදනං පජහථා'ති වදෙය්‍යං, අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සා'ති. නො'හෙතං භන්තෙ. යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය 'ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තී'ති. තස්මාහං එවරූපං දුක්ඛං වෙදනං පජහථාති වදාමි.

මයා'චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය: 'ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. එවමහං අජානන්තො 'එවරූපං දුක්ඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදෙය්‍යං 'අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සා'ති. නො හෙතම්භන්තෙ, යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය: 'ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. තස්මාහං 'එවරූපං දුක්ඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදාමි.

මයා චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය: ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තී'ති. එවමහං අජානන්තො එවරූපං අදුක්ඛමසුඛං වෙදනං පජහථා'ති වදෙය්‍යං. අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සා'ති. නො හෙතම්භන්තෙ. යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය: ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්තී'ති. තස්මාහං එවරූපං අදුක්ඛමසුඛං වෙදනං පජහථා'ති වදාමි.

Free Distribution www.aathaapi.org

මැනැවැ මහණෙනි. මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ සුඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු වැඩෙති, කුසලදහම්හු පිරිහෙති''යන තෙල කරුණ මා විසිනුදු ප්‍රඥයෙන් අවබෝධ නො කරනලද නො දක්නාලද නො දන්නාලද නො පසක් කරන ලද නො පහස්නාලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ සුඛවේදනාව හැරපියව'යි කියම් නම්, මහණෙනි, තෙල මට කිම අනුරූප වන්නේ ද'යි? වහන්ස, තෙල නො වේ මැ යැ. මහණෙනි, යම් හෙයෙකින් ''මෙලොවැ මෙබඳු සුඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු වැඩෙති, කුසලදහම්හු පිරිහෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ කරන ලද දක්නා ලද දන්නාලද පසක් කරනලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ සුඛවේදනාව හැරපියව'යි කියමි.

මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ සුඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙති''යන තෙල කරුණ මා විසිනුදු ප්‍රඥයෙන් අවබෝධ නො කරනලද නො දක්නාලද නො පසක් කරනලද නො පහස්නාලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ සුඛවේදනාව උපදවා වාස කරව'යි කියම් නම් මහණෙනි, තෙල මට කිම අනුරූප වන්නේ ද'යි. වහන්ස, තෙල නො වේ මැ යැ. යම් හෙයෙකින් මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ සුඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ කරනලද දක්නාලද දන්නාලද පසක් කරනලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ සුඛවේදනාව උපදවා වාස කරව'යි කියමි.

තවද මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ දුඃඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල් දහම්හු වැඩෙති, කුසල්දහම්හු පිරිහෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ නො කරන ලද නො දක්නාලද නො දන්නාලද නො පසක් කරන ලද නො පහස්නා ලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ දුඃඛවේදනාව හැරපියව'යි කියම් නම් කිම මහණෙනි, තෙල මට නිසිවන්නේ ද'යි? වහන්ස, නො වේ මැ යැ. යම් හෙයෙකින් මහණෙනි, ''මෙලොවැ මෙබඳු දුක්ඛවේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල දහම්හු වැඩෙති, කුසලදහම්හු පිරිහෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ කරනලද දක්නාලද දන්නාලද පසක් කරන ලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ දුඃඛවේදනාව හැරපියව'යි කියමි.

තවද මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ දුඃඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසල දහම්හු පිරිහෙති කුසලදහම්හු වැඩෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ නො කරනලද නො දක්නාලද නො දන්නාලද නො පසක් කරනලද නො පහස්නාලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ දුඃඛවේදනාව උපදවා වාස කරව'යි කියම් නම්, මහණෙනි, කිම තෙල මට නිසි වන්නේ ද'යි? වහන්ස, තෙල, නො වේ මැ යැ. යම් හෙයෙකින් මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ දුඃඛවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙති'' යන මෙ කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ කරනලද දක්නාලද දන්නාලද පසක් කරනලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ දුඃඛවේදනාව උපදවා වාස කරව'යි කියමි.

තවද මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ නොදුක් නොසුව වේදනා විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු වැඩෙති, කුසල දහම්හු පිරිහෙති''යන තෙල කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ නො කරනලද නො දක්නාලද නො දන්නාලද නො පසක් කරනලද නො පහස්නාලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ අදුක්ඛමසුඛවේදනාව හැරපියව'යි කියම් නම්, කිම මහණෙනි, තෙල මට නිසි වේ ද'යි? වහන්ස, නො වේ මැ යැ. යම් හෙයෙකින් මහණෙනි, ''මෙලොවැ මෙබඳු වූ නොදුක් නොසුවවේදනාව විඳුනා ඇතැම් පුහුලක්හට අකුසලදහම්හු වැඩෙති, කුසලදහම්හු පිරිහෙති'' යන මෙ කරුණ මා විසින් ප්‍රඥයෙන් අවබෝධ කරනලද දක්නාලද දන්නාලද පසක් කරනලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ අදුක්ඛමසුඛවේදනාව හැරපියව'යි කියමි.

Free Distribution www.aathaapi.org

මයා චෙතං භික්ඛවෙ අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය; ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති. එවමහං අජානන්තො එවරූපං අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදෙය්‍යං අපි නු මෙ එතං භික්ඛවෙ පතිරූපං අභවිස්සාති. නො හෙතං භන්තෙ. යස්මා ච ඛො එතං භික්ඛවෙ මයා ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තී'ති, තස්මාහං එවරූපං අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරථා'ති වදාමි.

නාහං භික්ඛවෙ සබ්බෙසංයෙව භික්ඛූනං අප්පමාදෙන කරණීයන්ති වදාමි. න පනාහං භික්ඛවෙ සබ්බෙසංයෙව භික්ඛූනං නාප්පමාදෙන කරණීයන්ති වදාමි. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා. තථාරූපානාහං භික්ඛවෙ භික්ඛූනං නාප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: කතං තෙසං අප්පමාදෙන අභබ්බා තෙ පමජ්ජිතුං.

යෙ ච ඛො තෙ භික්ඛවෙ භික්ඛූ සෙක්ඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තථාරූපානාහං භික්ඛවෙ භික්ඛූනං අප්පමාදෙන කරණීය'න්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙවනාමිමෙ ආයස්මන්තො අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානා කල්‍යාණමිත්තෙ භජමානා ඉන්ද්‍රියානි සමන්නානයමානා යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යු'න්ති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමෙසං භික්ඛූනං අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

සත්තිමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ සත්ත: උභතොභාගවිමුත්තො පඤ්ඤාවිමුත්තො කායසක්ඛී දට්ඨප්පත්තො[1] සද්ධාවිමුත්තො ධම්මානුසාරී සද්ධානුසාරී.

කතමො ච භික්ඛවෙ පුග්ගලො උභතොභාගවිමුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵස්සිත්වා[2] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො උභතොභාගවිමුත්තො. ඉමස්ස ඛො අහං භික්ඛවෙ භික්ඛුනො න අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: කතං තස්ස අප්පමාදෙන අභබ්බො සො පමජ්ජිතුං.

1. දිට්ඨිප්පත්තො - සීමු, මජසං, ස්‍යා.
2. ඵුසිත්වා - සීමු, මජසං, ස්‍යා.

තවද මහණෙනි, "මෙලොවැ මෙ බඳු වූ තොදුක් තොසුව වේදනාව විඳුනා ඇතැම් පුඟුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙති" යන තෙල කරුණ මා විසින් ප්‍රඥායෙන් අවබෝධ නො කරනලද නො දක්නාලද නො දන්නාලද නො පසක් කරනලද නො පහස්නාලද වී නම් මෙසේ නො දන්නා වූ මම මෙබඳු වූ අදුක්ඛමසුඛවේදනාව උපදවා වාස කරව'යි කියම් නම් කිම මහණෙනි, තෙල මට නිසි වන්නේ ද''යි? වහන්ස, තෙල නො වේ මැ යැ. යම් හෙයෙකින් මහණෙනි, "මෙලොවැ මෙබඳු වූ තොදුක් නො සුව වේදනාව විඳුනා ඇතැම් පුඟුලක්හට අකුසලදහම්හු පිරිහෙති, කුසලදහම්හු වැඩෙති" යන මෙ කරුණ මා විසින් ප්‍රඥායෙන් අවබෝධ කරන ලද දක්නාලද දන්නාලද පසක් කරනලද පහස්නාලද ද, එහෙයින් මම මෙබඳු වූ තොදුක් තොසුව වේදනාව උපදවා වාසය කරව'යි කියම්.

මහණෙනි, මම් හැම මහණුන් විසින් මැ අප්‍රමාදයෙන් කෘත්‍යය කටයුතු යැයි නො කියම්. එතෙකුදුවත් මහණෙනි, මම හැම මහණුන් විසින් මැ අප්‍රමාදයෙන් නො කටයුතු යැ යි නො කියම්. මහණෙනි, අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ වැස නිම වූ මහබඹසර ඇති සිවුමඟින් කළ කිස ඇති බහා තැබූ ස්කන්ධාදි බර ඇති රහත් බවට පැමිණි ක්ෂය වූ භවසංයෝජන ඇති මොනවට දත කෙලෙසුන් කෙරෙන් මිදුණු යම් මහණ කෙනෙක් වෙත් ද මහණෙනි, මම් එබඳු මහණුන්ට අප්‍රමාදයෙන් කෘත්‍ය කටයුතු යැ යි නො කියම්. ඒ කවරහෙයින යත් : ඔවුන් විසින් අප්‍රමාදයෙන් කෘත්‍ය කරනලද. ඔහු පමා වන්නට නො නිස්සහ.

තවද මහණෙනි, ශෛක්ෂ වූ අර්හත්වයට නො පැමිණි සිත් ඇති යම් මහණ කෙනෙක් අනුත්තර වූ යොගක්ෂෙමය ප්‍රාර්ථනා කෙරෙමින් වාසය කෙරෙත් ද, මහණෙනි, මම් එබඳු මහණුන් විසින් අප්‍රමාදයෙන් කෘත්‍ය කටයුතු යැයි කියම්. ඒ කවරහෙයින යත් : "මේ ආයුෂ්මත්හු අනුලොම් වූ සෙනසුන් සේවනය කරන්නාහු කල්‍යාණමිත්‍රයන් භජනය කරන්නාහු ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් සම කෙරෙමින් යමක් පිණිස කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද ඒ අනුත්තර වූ බඹසරවස් කෙළවර ආයතිඵලය ඉහාත්මයෙහි මැ උත්තමප්‍රඥයෙන් ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරන්නාහු නම් මැනැවැ''යි. මහණෙනි, මම මෙ මහණුන්ට මේ අප්‍රමාදඵලය දක්මින් අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියම්.

මහණෙනි, ලෝකයෙහි විද්‍යමාන වූ මේ පුද්ගලයෝ සත් දෙනෙක් ඇත. කවර සත් දෙනෙක යත් : උභතොභාග විමුක්ත යැ ප්‍රඥවිමුක්ත යැ කායසාක්ෂි යැ දෘෂ්ටිප්‍රාප්ත යැ ශ්‍රද්ධාවිමුක්ත යැ ධර්මානුසාරී යැ ශ්‍රද්ධානුසාරී යැ යන සත් දෙනා යි.

මහණෙනි, උභතොභාගවිමුක්තපුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් වෙත් නම් ඒ විමොක්ෂයන් නාමකයින් ස්පර්ශ කොට වෙසෙයි. ඔහු විසින් ප්‍රඥයෙනුදු ආර්‍ය්‍ය- සත්‍යයන් දැක ආශ්‍රවයෝ ක්ෂය කරන ලද වෙති. මහණෙනි, මේ පුද්ගල උභතොභාග විමුක්ත යැ යි කියනු ලැබේ. මහණෙනි, මෙ මහණහට මම අප්‍රමාදයෙන් කෘත්‍ය කටයුතු යැ යි නො කියම්. ඒ කවර හෙයින යත් : ඔහු විසින් අප්‍රමාදයෙන් කෘත්‍ය කරන ලද, හේ පමා වන්නට නො නිස්ස.

කතමො ච භික්ඛවෙ පුග්ගලො පඤ්ඤාවිමුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො පඤ්ඤාවිමුත්තො. ඉමස්ස පි ඛො අහං භික්ඛවෙ භික්ඛුනො න අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: කතං තස්ස අප්පමාදෙන, අභබ්බො සො පමජ්ජිතුං.

කතමො ච භික්ඛවෙ පුග්ගලො කායසක්ඛී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො කායසක්ඛී. ඉමස්ස ඛො අහං භික්ඛවෙ භික්ඛුනො අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

කතමො ච භික්ඛවෙ පුග්ගලො දිට්ඨප්පත්තො[2] ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො දිට්ඨප්පත්තො[2] ඉමස්සපි ඛො අහං භික්ඛවෙ භික්ඛුනො අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙව නාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සද්ධාවිමුත්තො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. තථාගතෙ චස්ස සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො සද්ධාවිමුත්තො. ඉමස්සපි ඛො අහං භික්ඛවෙ භික්ඛුනො අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙව නාම අයමායස්මා

1. ඵුසිත්වා - සීමු, මජ්සං, ස්‍යා.
2. දිට්ඨිප්පත්තො - සීමු, මජ්සං, ස්‍යා.

මහණෙනි, ප්‍රඥාවිමුක්ත පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇත් ද ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට නො වෙසෙයි. එතෙකුදු වත් ඔහු විසින් ප්‍රඥායෙන් ආර්‍යසත්‍යයන් දැක ආස්‍රවයෝ ක්ෂය කරන ලද වෙති. මහණෙනි, මේ පුද්ගල ප්‍රඥාවිමුක්ත යැ යි කියනු ලැබේ. මහණෙනි, මෙ මහණහට ද මම අප්‍රමාදයෙන් කෘත්‍ය කටයුතු යැ යි නො කියමි. ඒ කවරහෙයින යත් : ඔහු විසින් අප්‍රමාදයෙන් කෘත්‍ය කරනලද. හේ පමදින්නට අභව්‍ය යි.

මහණෙනි, කායසාක්ෂී පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකායයෙන් ස්පර්ශ කොට වෙසෙයි. ඔහු විසින් ප්‍රඥායෙනුදු ආර්‍ය සත්‍යයන් දැක ඇතැම් ආස්‍රවයෝ ක්ෂය කරනලද වෙති. මහණෙනි, මේ පුද්ගල කායසාක්ෂී යැ යි කියනු ලැබේ. මහණෙනි, මෙ මහණහට මම අප්‍රමාදයෙන් කටයුතු කළයුතු යයි කියමි. ඒ කවර හෙයින යත් : මෙ ආයුෂ්මත් අනුලොම් සෙනසුන් සේවනය කෙරෙමින් කලණමිතුරන් භජනය කෙරෙමින් ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් සම කෙරෙමින් කුලපුත්‍රයෝ යමක් සඳහා මොනොවට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද, ඒ අනුත්තර වූ බ්‍රහමචර්‍යයාගේ පර්‍යවසානය වූ අර්හත්ඵලය මෙ අත්බැව්හි මැ උත්තම ප්‍රඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ නම් මැනැවැ'යි. මහණෙනි, මම මෙ මහණහට මේ අප්‍රමාද ඵලය දකිමින් අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි.

මහණෙනි, දෘෂ්ටිප්‍රාප්ත පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට නො වෙසෙයි. එතෙකුදු වත් ඔහු විසින් ප්‍රඥායෙන් ආර්‍යසත්‍යයන් දැක ඇතැම් ආස්‍රව කෙනෙක් ක්ෂය කරනලද වෙති. ඔහු විසින් තථාගතප්පවෙදිත ධර්මයෝ ප්‍රඥායෙන් මොනොවට දක්නාලද මොනොවට සරනලද වෙති. මහණෙනි, මේ පුද්ගල දෘෂ්ටිප්‍රාප්ත යැ යි කියනු ලැබේ. මහණෙනි, මෙ මහණහට ද මම අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි. ඒ කවර හෙයින යත් : මෙ ආයුෂ්මත් අනුලොම් සෙනසුන් සේවනය කෙරෙමින් කල්‍යාණමිත්‍රයන් භජනය කෙරෙමින් ඉන්ද්‍රියයන් සම කෙරෙමින් කුලපුත්‍රයෝ යමක් සඳහා මොනොවට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද ඒ අනුත්තර වූ බ්‍රහ්මචර්‍යයාගේ පර්‍යවසානය වූ අර්හත්ඵලය මෙ අත්බැව්හි මැ තෙමේ උත්තමප්‍රඥායෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ නම් මැනැවැ'යි. මහණෙනි, මම මෙ මහණහට මේ අප්‍රමාදඵලය දක්මින් අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි.

මහණෙනි, ශ්‍රද්ධාවිමුක්ත පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් රූප සමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට වාසය කෙරෙයි. ඔහු විසින් ප්‍රඥායෙන් ද සිව්සස් දැක ඇතැම් ආස්‍රවයෝ ක්ෂය කරන ලද වෙති. තථාගතයන් කෙරෙහි ඔහු ගේ ශ්‍රද්ධාව ද බැසගත්තී හටගත්මුල් ඇති වැ පිහිටියා වෙයි. මහණෙනි, මේ පුද්ගල ශ්‍රද්ධාවිමුක්ත යැ යි කියනු ලැබේ. මහණෙනි, මෙ මහණහට ද මම අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි. ඒ කවර හෙයින යත් "මෙ ආයුෂ්මත් අනුලොම් සෙනසුන් සේවනය කෙරෙමින්

අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ධම්මානුසාරී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා අපරික්ඛීණා[1] හොන්ති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති. අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති, සෙය්‍යථීදං: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ධම්මානුසාරී. ඉමස්සපි ඛො අහං භික්ඛවෙ භික්ඛුනො අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙවනාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සද්ධානුසාරී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ න කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා අපරික්ඛීණා[1] හොන්ති, තථාගතෙ චස්ස සද්ධාමත්තං හොති පෙමමත්තං. අපි චස්ස ඉමෙ ධම්මා හොන්ති. සෙය්‍යථීදං: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො සද්ධානුසාරී. ඉමස්සපි ඛො අහං භික්ඛවෙ භික්ඛුනො අප්පමාදෙන කරණීයන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පෙවනාම අයමායස්මා අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානො කල්‍යාණමිත්තෙ භජමානො ඉන්ද්‍රියානි සමන්නානයමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති. ඉමං ඛො අහං භික්ඛවෙ ඉමස්ස භික්ඛුනො අප්පමාදඵලං සම්පස්සමානො අප්පමාදෙන කරණීයන්ති වදාමි.

නාහං භික්ඛවෙ ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි. අපි ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති.

---

1. එකච්චෙ ආසවා පරික්ඛීණා - මජසං, ස්‍යා.

කල්‍යාණමිතුරන් භජනය කෙරෙමින් ඉන්ද්‍රියයන් සම කෙරෙමින් කුලපුත්‍රයෝ යමක් සඳහා මොනවට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද, ඒ අනුත්තර වූ මහබඹසර කෙළවර වූ අර්හත්ඵලය මෙ අත්බැව්හි මැ තෙමේ උත්තම ප්‍රඥයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා වාසය කරන්නේ නම් මැනැවැ''යි. මහණෙනි, මම මෙ මහණහට මේ අප්‍රමාද අනුසස් දක්මින් අප්‍රමාදයෙන් කෘත්‍ය කටයුතු යැ යි කියමි.

මහණෙනි, ධර්මානුසාරී පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගල-යෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් ස්පර්ශ කොට වාසය කෙරෙයි. ඔහු විසින් ප්‍රඥයෙනුදු සිව්සස් දැක ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. තථාගතප්‍රවිදිත වූ ධර්මයෝ ද ප්‍රඥයෙන් අවධි වශයෙන් වටහත්. තවද ඔහුට මේ ධර්මයෝ වෙති, හෙ මෙසේ යැ : ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි. මහණෙනි, මේ පුද්ගල ධර්මානුසාරී යැ යි කියනු ලැබේ. මහණෙනි, මම මෙ මහණහු විසිනුදු අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි. ඒ කවර හෙයින යත් : ''මෙ ආයුෂ්මත් අනුලොම් සෙනසුන් සෙවන කෙරෙමින් කල්‍යාණමිතුරන් භජනය කෙරෙමින් ඉන්ද්‍රියයන් සම- කෙරෙමින් කුලපුත්‍රයෝ යමක් සඳහා මොනොවට ගිහිගෙන් නිකම සස්නෙහි පැවිදි වෙත් ද ඒ අනුත්තර වූ බ්‍රහ්මචර්‍යයාගේ පර්‍යවසානය වූ අර්හත්ඵලය මෙ අත්බැව්හි මැ තෙමේ උත්තමප්‍රඥයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා වාසය කරන්නේ නම් මැනැවැ''යි. මහණෙනි, මම මෙ මහණහට මේ අප්‍රමාද අනුසස් දක්මින් අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි.

මහණෙනි, ශ්‍රද්ධානුසාරී පුද්ගල කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ඇතැම් පුද්ගල යෙක් රූපසමාපත්තීන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ශාන්තවිමොක්ෂ කෙනෙක් ඇද්ද, ඒ සමාපත්තීන් නාමකයින් අරමුණු කොට නො වෙසෙයි. ඔහු විසින් ප්‍රඥයෙනුදු සිව්සස් දැක ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු නො වෙති. තථාගතයන් කෙරෙහිදු ඔහු ගේ ශ්‍රද්ධා-මාත්‍රයෙක් ප්‍රේමමාත්‍රයෙක් වෙයි: තවද ඔහුට මෙ ධර්මයෝ වෙති. හේ මෙසේ යැ : ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යැ. මේ පුද්ගල ශ්‍රද්ධානුසාරී යැ යි කියනු ලැබේ. මහණෙනි, මම මෙ මහණහු විසිනුදු අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි. ඒ කවර හෙයින යත් : ''මෙ ආයුෂ්මත් අනුලොම් සෙනසුන් සෙවනය කෙරෙමින් කල්‍යාණමිතුරන් භජනය කෙරෙමින් ඉඳුරන් සම කෙරෙමින් කුලපුත්‍රයෝ යමක් සඳහා මොනොවට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද, ඒ අනුත්තර වූ බඹසර කෙළවර වූ අර්හත්ඵලය මෙ අත්බැව්හි මැ තෙමේ උත්තමප්‍රඥයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා වාසය කරන්නේ නම් මැනැවැ''යි. මහණෙනි, මම මෙ මහණහට මේ අප්‍රමාද අනුසස් දක්මින් අප්‍රමාද වැ කෘත්‍ය කටයුතු යැ යි කියමි.

මහණෙනි, මම පළමු කොට මැ රහත් බැව්හි පිහිටීම නො කියමි. එතෙකුදු වත් අනුපූර්ව ශික්ෂායෙන් අනුපූර්වක්‍රියායෙන් අනුපූර්වප්‍රතිපදයෙන් අර්හත්වයෙහි පිහිටීම වෙයි.

කථඤ්ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති: ඉධ භික්ඛවෙ සද්ධාජාතො උපසඞ්කමති, උපසඞ්කමන්තො පයිරුපාසති, පයිරුපාසන්තො සොතං ඔදහති, ඔහිතසොතො[1] ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති, ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සහිත්වා[2] තුලෙති, තුලයිත්වා පදහති, පහිතත්තො[3] සමානො කායෙන චෙව පරමං සච්චං සච්ඡිකරොති; පඤ්ඤාය ච නං පටිවිජ්ඣ[4] පස්සති.

සාපි නාම භික්ඛවෙ සද්ධා නාහොසි. තම්පි නාම භික්ඛවෙ උපසඞ්කමනං නාහොසි. සාපි නාම භික්ඛවෙ පයිරුපාසනා නාහොසි. තම්පි නාම භික්ඛවෙ සොතාවධානං නාහොසි. තම්පි නාම භික්ඛවෙ ධම්මසවනං නාහොසි. සාපි නාම[5] භික්ඛවෙ ධම්මධාරණා නාහොසි. සාපි නාම භික්ඛවෙ අත්ථූපපරික්ඛා නාහොසි. සාපි නාම භික්ඛවෙ ධම්මනිජ්ඣානක්ඛන්ති නාහොසි. සොපි නාම භික්ඛවෙ ඡන්දො නාහොසි. සොපි නාම භික්ඛවෙ උස්සාහො නාහොසි. සාපි නාම භික්ඛවෙ තුලනා නාහොසි. තම්පි නාම භික්ඛවෙ පධානං නාහොසි. විප්පටිපන්නා'ත්ථ භික්ඛවෙ. මිච්ඡාපටිපන්නා'ත්ථ භික්ඛවෙ. කීවදූරෙවිමෙ භික්ඛවෙ මොඝ පුරිසා අපක්කන්තා ඉමස්මා ධම්මවිනයා.

අත්ථි භික්ඛවෙ චතුප්පදං වෙය්‍යාකරණං යස්සුද්දිට්ඨස්ස විඤ්ඤූ පුරිසො න චිරස්සෙව පඤ්ඤාය'ත්ථං ආජානෙය්‍ය. උද්දිසිස්සාමි වො භික්ඛවෙ. ආජානිස්සථ මෙතන්ති. කෙ ච මයං භන්තෙ, කෙ ච ධම්මස්ස අඤ්ඤාතාරොති. යොපි සො භික්ඛවෙ සත්ථා ආමිසගරු ආමිසදායාදො ආමිසෙහි සංසට්ඨො විහරති, තස්සපායං එවරූපී පණොපණවියා න උපෙති. එවඤ්ච නො අස්ස, අථ නං කරෙය්‍යාම. න ච නො එවමස්ස, න නං කරෙය්‍යාමාති. කිම්පන භික්ඛවෙ යං තථාගතො සබ්බසො ආමිසෙහි විසංසට්ඨො විහරති. සද්ධස්ස භික්ඛවෙ සාවකස්ස සත්ථුසාසනෙ පරියොගාය[6] වත්තතො අයමනුධම්මො හොති: සත්ථා භගවා, සාවකො හමස්මි. ජානාති භගවා, නාහං ජානාමීති. සද්ධස්ස භික්ඛවෙ සාවකස්ස සත්ථුසාසනෙ පරියොගාය වත්තතො රුළ්හනීයං[7] සත්ථුසාසනං හොති ඔජවන්තං. සද්ධස්ස භික්ඛවෙ සාවකස්ස සත්ථුසාසනෙ පරියොගාය[5] වත්තතො අයමනුධම්මො හොති: 'කාමං තචො ච න්හාරු ච අට්ඨි ච අවසිස්සතු උපසුස්සතු සරීරෙ මංසලොහිතං. යං තං පුරිසත්ථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී'ති. සද්ධස්ස භික්ඛවෙ සාවකස්ස සත්ථුසාසනෙ පරියොගාය වත්තතො ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති.

---

1. ඔදහිතසොතො – සීමු.
2. උස්සාහෙත්වා – මජසං.
3. පදහිතත්තො – සීමු.
4. අතිවිජ්ජ – මජසං PTS.
5. තම්පිනාම – සීමු.
6. පරියොගාහිය – මජසං.
   පරියොගය්හ – ස්‍යා.
7. රුළ්හනීයං – මජසං, ස්‍යා.

කිසෙයින් මහණෙනි, අනුපූර්වශික්ෂායෙන් අනුපූර්වක්‍රියායෙන් අනුපූර්වප්‍රතිපදයෙන් අර්හත්ත්වයෙහි පිහිටීම වෙයි යත් : මහණෙනි, මෙලොව්හි උපන් සැදැහැ ඇත්තේ ගුරුන් කරා එළඹෙයි, ගුරුන් කරා එළඹෙනුයේ උපාසන කෙරෙයි, (සමීපයෙහි හිඳියි.) උපාසන කරනුයේ ඇසීමට කන් නතු කෙරෙයි, නතු කළ කන් ඇත්තේ දහම් අසයි, අසා දහම් පුගුණ කොට ධරයි, ධැරූ ධර්මයන් ගේ අර්ථය නුවණින් විමසයි, අරුත් විමසන්නාහට ධර්මයෝ වටහත්, ධර්මයන්ගේ වැටහීම ඇති කල්හි කත්තුකම්‍යතාකුසලච්ඡන්දය උපදී, උපන් කුසලච්ඡන්ද ඇත්තේ වැර වඩයි, වැර වඩා (අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්මය යැ යි) තුලනය කෙරෙයි, (තීරණප්‍රඥයෙන්) තුලනය කරනුයේ ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි, නිවනට මෙහෙයූ සිත් ඇත්තේ නාමකයිනුදු පරමසත්‍යය ප්‍රත්‍යක්ෂ කෙරෙයි, (නාමකායසම්ප්‍රයුක්ත වූ) මාර්ගප්‍රඥයෙනුදු එ නිවන ප්‍රතිවෙධ කොට දකී.

මහණෙනි, (තොපට) ඒ ශ්‍රද්ධා නමුදු නො වී. මහණෙනි, ඒ එළැඹීම නමුදු නො වී. මහණෙනි, ඒ පර්යුපාසන නමුදු නො වී. මහණෙනි, ඒ කන් නතු කිරීම නමුදු නො වී. මහණෙනි, ඒ ධර්මශ්‍රවණ නමුදු නො වී. මහණෙනි, ඒ දහම් ධැරීම නමුදු නො වී. මහණෙනි, ඒ අර්ථ විමසීම නමුදු නො වී. මහණෙනි, ඒ දහම් වැටහීම නමුදු නො වී. මහණෙනි, ඒ කුසලච්ඡන්ද නමුදු නො වී. මහණෙනි, ඒ උත්සාහය නමුදු නො වී. මහණෙනි, ඒ (අනිත්‍යාදි විසින්) තුලනය නමුදු නො වී. මහණෙනි, ඒ ප්‍රධන්වීර්‍ය්‍ය නමුදු නො වී. මහණෙනි, (තෙපි) විප්‍රතිපන්න වවු යැ. මහණෙනි, (තෙපි) මිථ්‍යා ප්‍රතිපන්න වවු යැ. මහණෙනි, මේ මෝඝපුරුෂයෝ මෙ සස්නෙන් කෙතෙක් දුර ඉක්ම ගියාහු ද?

මහණෙනි, විඥ වූ පුරුෂ උදෙසනලද යම් වෙය්‍යාකරණයක්හුගේ අර්ථය මඳ කලෙකින් මැ ප්‍රඥයෙන් දැන ගන්නේ ද, එබඳු වූ චතුස්සත්‍ය ව්‍යාකරණයෙක් ඇත. මහණෙනි, තොපට එය උදෙසන්නෙමි. මා ගේ තෙල වෙය්‍යාකරණය දැනගනිවු දැ? යි. වහන්ස, ඇපි කවරයම්හ, දහම් අවබෝධ කරන්නාහු කවරහු දැ'යි. මහණෙනි, යම් ශාස්තෘවරයෙක් ආමිෂය ගරු කොට ඇත්තේ ආමිෂය දයාද කොට ඇත්තේ ආමිෂය හා හැනී වෙසේ ද, ඔහුට ද මෙ බඳු වූ අගය වැඩි අඩු කිරීමෙක් නො පැමිණේ. 'අපට මෙසේ වන්නේ නම් එය කරම්හ. අපට මෙසේ නො ද වන්නේ නම් එය නො කරම්හ'යි. කිම මහණෙනි, යම් හෙයකින් තථාගතයෝ සර්වප්‍රකාරයෙන් ආමිෂයෙන් විසංසෘෂ්ට වැ වාස කෙරෙත් ද එකල්හි මහණෙනි, ශාස්තෘශාසනයෙහි හාත්පසින් නහාගෙන සිටුනා ශ්‍රාවකයාගේ මේ අනුධර්මය වෙයි : බුදුහු ශාස්තෘහ. මම ශ්‍රාවකයෙමි. බුදුහු දන්නාසේක. මම නො දනිමි'යි. මහණෙනි, ශාස්තෘශාසනයෙහි හාත්පසින් නහාගෙන වැටෙන සැදැහැති ශ්‍රාවකයක්හට ශාස්තෘශාසනය ස්නේහවත් වැ වැඩෙනුයේ වෙයි, මහණෙනි, ශාස්තෘශාසනයෙහි හාත්පසින් නහාගෙන සිටුනා ශ්‍රාවකයාගේ මේ අනුධර්මය වෙයි : 'එකාන්තයෙන් සම ද නහර ද ඇට ද ශේෂ වේවයි සිරුරෙහි මස්ලේ වියළේවයි යම් උත්තමාර්ථයක් පුරුෂ ශක්තියෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් ලැබියයුතු ද, ඊට නො පැමිණ වීර්‍ය්‍යයාගේ තැබීමෙක් නො වන්නේ යයි. මහණෙනි, ශාස්තෘශාසනයෙහි හාත්පසින් නහාගෙන සිටුනා සැදැහැති ශ්‍රාවකයක්හට දෙ ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමැති වියයුතු යැ. ඉහාත්මයෙහි අර්හත්ත්වය හෝ උපාදිශෙෂය ඇති කල්හි අනාගාමිත්වය හෝ යි.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

කීටාගිරිසුත්තං දසමං.

භික්ඛුවග්ගො දුතියො

තස්ස වග්ගස්ස උද්දානං

කුඤ්ජර රාහුල සස්සත ලොකා මාලුඞ්ක්‍යපුත්තො ච භද්දාලි නාමො.
බුද්ධදිජාථ සහම්පතී යාවං නාලක රද්දදීකීටාගිරිනාමො

බුදුහු මෙය වදාළසේක. සතුටුයිත් ඇති මහණහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ යි.

දස වැනි කීටාගිරි සූත්‍ර යි.

දෙ වැනි භික්ඛුවග්ගය යි.

එහි උද්දානය :

කුඤ්ජරොපම රාහුලොවාද හෙවත් අම්බලට්ඨික රාහුලොවාද සූත්‍ර යැ, ලොකය ශාශ්වත යැ ආදි දෘෂ්ටි ගත් මාලුඞ්ක්‍යපුත්‍ර උදෙසා වදාළ චූළමාලුඞ්ක්‍ය සූත්‍රය හා මහාමාලුඞ්ක්‍ය සූත්‍ර යැ, එසේ ම භද්දලි සූත්‍ර යැ, ක්ෂුද්‍රද්විජ වූ ලටුකිකොපම සූත්‍ර යැ, සහම්පතිහුගේ ආයාචනා එන චාතුම සූත්‍ර යැ, නළකපාන සූත්‍ර යැ, ආරණ්‍යක වත් සඳහන් ගුලිස්සානි සූත්‍ර යැ, භද්‍ර වූ අනුපූර්ව ප්‍රතිපත්ති සඳහන් කීටාගිරි සූත්‍ර යි.

2. 3. 1

තෙවිජ්ජවච්ඡගොත්ත සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො, තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි.

අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා, ස්වාගතං භන්තෙ භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ, සමණො ගොතමො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති. යෙ තෙ භන්තෙ එවමාහංසු: සමණො ගොතමො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති. කච්චි තෙ භන්තෙ භගවතො වුත්තවාදිනො, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති. ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොන්ති. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතී'ති.

යෙ තෙ වච්ඡ, එවමාහංසු: සමණො ගොතමො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිත'න්ති. න මෙ තෙ වුත්තවාදිනො, අබ්භාචික්ඛන්ති ච පන මං තෙ අසතා අභූතෙනා'ති.

කථං බ්‍යාකරමානා පන මයං භන්තෙ වුත්තවාදිනො චෙව භගවතො අස්සාම, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාම. ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යාම. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යා'ති.

Free Distribution www.aathaapi.org

2. 3. 1
තෙවිජ්ජවච්ඡගොත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර සමීපයෙහි වූ මහාවනයෙහි කූටාගාරශාලායෙහි වැඩ වසනසේක. එසමයෙහි වච්ඡගොත්ත පරිව්‍රාජක තෙමේ (එක් හෙළඹ ගසක්) ඇතියෙන් ඒකපුණ්ඩරීක නම් පිරිවැජි අරම්හි වෙසෙයි. එකල්හි බුදුහු පෙරබත්හි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන විශාලා නුවරට පිඩුසිඟා වැඩිසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. විශාලා නුවර පිඩු සිඟා යන්නට තව උදැසන වෙයි. මම 'ඒකපුණ්ඩරීක' නම් පරිව්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිව්‍රාජක යම් තැනෙක්හි ද එහි එළැඹෙම් නම් මැනැවැ යි. එකල්හි බුදුහු ඒකපුණ්ඩරීක නම් පරිව්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිව්‍රාජක යම් තැනෙක්හි ද එහි එළැඹිසේක.

වච්ඡගොත්ත පරිව්‍රාජක දුරින් මැ වඩනා භාග්‍යවතුන් වහන්සේ දක භාග්‍යවතුන් වහන්සේට තෙල වදන් කී යැ : "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පැමිණෙනසේක්වා වහන්ස, භාග්‍යවතුන් වහන්සේට ස්වාගත යැ, වහන්ස, භාග්‍යවත්හු මෙහි පැමිණීමෙන් බොහෝ කලෙකින් මේ පරියාය (කරුණ) කළසේක. වහන්ස, බුදුහු වැඩහිඳිනා සේක්වා මේ අස්න පනවනලද්'යි. බුදුහු පැනවූ අස්නෙහි වැඩහුන්සේක. වච්ඡගොත්තපරිව්‍රාජක ද එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හුන. එකත්පස් වැ හුන් වච්ඡගොත්ත පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කී යැ : "වහන්ස, මා විසින් තෙල අසනලද: 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සර්වඥයහ, සර්වදර්ශීහ, නිරවශෙෂ වූ ඥානදර්ශනය පිළින කරන්නාහ : ඇවිදිනා වූ ද සිටුනා වූ ද හෝනා වූ ද නිදිවැරූ ද මට හැම කල්හි ඥානදර්ශනය එළැඹසිටියේ යැ'යි. වහන්ස, යම් කෙනෙක් මෙසේ කීහු ද : "ශ්‍රමණ ගෞතමයෝ සර්වඥයහ, සර්වදර්ශීහ, 'ඇවිදිනා වූ ද සිටුනා වූ ද හෝනා වූ ද නිදිවැරූ ද මට හැම කල්හි ඥානදර්ශනය එළැඹැසිටියේ වනැ'යි නිරවශෙෂ වූ ඥානදර්ශනය ප්‍රතිඥ කෙරෙති'යි කීහු ද කිම වහන්ස, ඔහු භාග්‍යවතුන් විසින් වදළ දය කියනසුලු වෙත් ද, නො ද භාග්‍යවතුන් අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කෙරෙත් ද, සර්වඥතාඥාන ධර්මයට අනුරූප වූවක් ප්‍රකාශ කෙරෙත් ද, සකාරණ වූ කිසි වාදානුවාදයෙක් ගැරහියයුතු කරුණකට නො ද පැමිණේ ද''යි.

වච්ඡය, යම් කෙනෙක් මෙසේ කීහු ද : "ශ්‍රමණගෞතම සර්වඥ යැ සර්වදර්ශී යැ 'ඇවිදිනා වූ ද සිටුනා වූ ද හෝනා වූ ද නිදිවැරූ ද මට හැම කල්හි ඥානදර්ශනය එළැඹසිටියේ වනැ'යි. නිරවශෙෂ කොට ඥානදර්ශනය ප්‍රතිඥ කෙරේ''යයි කීහු ද, ඔහු මා විසින් කියන ලද්ද කියන්නාහු නො වෙති, වැලි ඔවුහු මට අසත්‍ය වූ අභූතයෙන් අභ්‍යාඛ්‍යාන ද කෙරෙත්''යයි.

වහන්ස, ඇපි කිසෙයින් ප්‍රකාශ කරන්නමෝ භාග්‍යවතුන් වහන්සේට උක්තවාදීත් වන්නමෝ ද භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කරන්නමෝ ද ධර්මයට අනුධර්ම වූවක් ප්‍රකාශ කරන්නමෝ ද සකාරණ වූ කිසි වාදානුවාදයෙක් ගැරහියයුතු කරුණකට නො ද පැමිණේ ද''යි.

'තෙවිජ්ජො සමණො ගොතමො'ති ඛො වච්ඡ බ්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ අස්ස, න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුවාදො[1] ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍ය. අහං හි වච්ඡ යාවදෙව ආකඞ්ඛාමි අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අහං හි වච්ඡ යාවදෙව ආකඞ්ඛාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ —පෙ— යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. අහං හි වච්ඡ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි. 'තෙවිජ්ජො සමණො ගොතමො'ති ඛො වච්ඡ බ්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ අස්ස න ච මං අභූතෙන අබ්භාචික්ඛෙය්‍ය, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍ය, න ච කොචි සහධම්මිකො වාදානුවාදො[1] ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යා'ති.

එවං වුත්තෙ වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අත්ථි නු ඛො භො ගොතම කොචි ගිහී ගිහිසඤ්ඤොජනං අප්පහාය කායස්ස භෙදා දුක්ඛස්සන්තකරො'ති[2]. නත්ථි ඛො වච්ඡ කොචි ගිහී ගිහිසඤ්ඤොජනං අප්පහාය කායස්ස භෙදා දුක්ඛස්සන්තකරො'ති[2].

අත්ථි පන භො ගොතම කොචි ගිහී ගිහිසඤ්ඤොජනං අප්පහාය කායස්ස භෙදා සග්ගූපගො'ති. න ඛො වච්ඡ එකඤ්ඤෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි, අථ ඛො භිය්‍යොව යෙ ගිහී ගිහිසඤ්ඤොජනං අප්පහාය කායස්ස භෙදා සග්ගූපගා'ති.

අත්ථි නු ඛො භො ගොතම කොචි ආජීවකො කායස්ස භෙදා දුක්ඛස්සන්තකරො'ති. නත්ථි ඛො වච්ඡ කොචි ආජීවකො කායස්ස භෙදා දුක්ඛස්සන්තකරො'ති.

අත්ථි පන භො ගොතම කොචි ආජීවකො කායස්ස භෙදා සග්ගූපගො'ති. ඉතො ඛො සො වච්ඡ එකනවුතො කප්පො යමහං අනුස්සරාමි. නාභිජානාමි කඤ්චි ආජීවකං සග්ගූපගං අඤ්ඤත්‍ර එකෙන, සොපාසි කම්මවාදී කිරියවාදීති.

එවං සන්තෙ භො ගොතම සුඤ්ඤං අදුං තිත්ථායතනං අන්තමසො සග්ගූපගෙනාපීති. එවං සන්තෙ වච්ඡ සුඤ්ඤං අදුං තිත්ථායතනං අන්තමසො සග්ගූපගෙනාපීති.

ඉදමවොච භගවා. අත්තමනො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවතො භාසිතං අභිනන්දීති.

තෙවිජ්ජවච්ඡගොත්ත සුත්තං පඨමං.[3]

---

1. වාදානුපාතො - සිමු.
2. දුක්ඛස්සන්තං කරොති - සිමු.
3. තෙවිජ්ජවච්ඡසුත්තං නිට්ඨිතං පඨමං - මජසං.

වච්ඡය, ශ්‍රමණගෞතම ත්‍රිවිද්‍යා ඇත්තේ යැ යි ප්‍රකාශ කරනුයේ මා විසින් කියනලද්ද කියන්නේත් වන්නේ යැ, නො ද මා අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කරන්නේ යැ, ධර්මයට ද අනුධර්ම වූවක් ප්‍රකාශ කරන්නේ යැ. සකාරණ වූ කිසි වාදනුවාදයෙක් ගැරහියයුතු කරුණකට නො ද පැමිණෙන්නේ යැ. වච්ඡය, මම් වූකලි යම් පමණ රිසියෙම් නම් අනේකප්‍රකාර වූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහි කරමි. ඒ මෙසේ යැ; එක් ජාතියකුදු ජාති දෙකකුදු . . . මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකප්‍රකාර පූර්වනිවාස සිහි කරමි. වච්ඡය, මම් වූ කලි යම් පමණ රිසියෙම් ද, විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ ශෝභන ගති ඇති දුගති ඇති සත්ත්වයන් දක්මි . . . කර්‍ම වූ පරිදි මියැපරලොව ගිය සත්ත්වයන් දනගනිමි. වච්ඡය, මම් වූකලි ආස්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි මැ තමා විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙමි. වච්ඡය, ශ්‍රමණ ගෞතම ත්‍රිවිද්‍යා ඇත්තේ යයි. ප්‍රකාශ කරනුයේ මට උක්තවාදීත් වන්නේ යැ, නො ද මා අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කරන්නේ යැ, ධර්මයට ද අනුධර්ම කොට ප්‍රකාශ කරන්නේ යැ. නො ද කිසි සකාරණ වූ වාදනුවාදයෙක් ගැරහියයුතු තැනට පැමිණේ''යයි.

මෙසේ වදළ කල්හි වච්ඡගොත්ත පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකෙළේ ය : ''භවත් ගෞතමයන් වහන්ස, ගිහිබැඳුම් නොපියා කය බිඳීමෙන් පසු දුක් කෙළවර කළ කිසි ගිහිගේවැසියෙක් ඇද්ද''යි. ''වච්ඡය, ගිහිබැඳුම් නොපියා කය බිඳීමෙන් පසු දුක් කෙළවර කළ කිසි ගිහිගේ වැසියෙක් නැතැ''යි.

''යළි භවත් ගෞතමයන් වහන්ස, ගිහිබැඳුම් නොපියා කය බිඳීමෙන් පසු ස්වර්ගයට පැමිණි කිසිගිහිගේවැසියෙක් ඇද්ද''යි. ''වච්ඡය, යම් ගිහිගේවැසි කෙනෙක් ගිහිබැඳුම් නොපියා කය බිඳීමෙන් පසු ස්වර්ගයට පැමිණියාහු ද, ඔහු, එක් සියෙක් නො මැ වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සිව්සියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි, වැලි බොහෝ වෙත් මැ''යි.

''භවත් ගෞතමයන් වහන්ස, කය බිඳීමෙන් පසු දුක් කෙළවර කළ කිසි ආජීවකයෙක් ඇද්ද''යි. ''වච්ඡය, කය බිඳීමෙන් පසු දුක් කෙළවර කළ කිසි ආජීවකයෙක් නැතැ''යි.

''යළි භවත් ගෞතමයන් වහන්ස, කිසි ආජීවකයෙක් කය බිඳීමෙන් පසු ස්වර්ගයට ගියේ ඇද්ද''යි. ''වච්ඡය, මම් යම් තැනක් සිහි කෙරෙම් ද, එ මෙයින් එක්අනූවන කල්ප යයි, (එකල් තුළ) එක් ආජීවකයක්හු තබා ස්වර්ගයට පැමිණි කිසි ආජීවකයකු නො දක්මි. හෙ ද කර්මවාදී ක්‍රියාවාදී වී යයි වදළහ.

මෙසේ ඇති කල්හි භවත් ගෞතමයන් වහන්ස, මෙල තීර්ථායතනය යටත්පිරිසෙයින් ස්වර්ගයට පැමිණෙනුවක්හුගෙනුදු සිස් වනැ''යි. ''මෙසේ කල්හි වච්ඡය, මෙල තීර්ථායතනය යටත්පිරිසෙයින් ස්වර්ගයට පැමිණෙනුවක්හුගෙනුදු සිස් යැ''යි වදළහ.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළසේක. සතුටු සිත්ඇති වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගත්තේ යයි.

පළමුවැනි තෙවිජ්ජවච්ඡගොත්ත සූත්‍ර යි.

2. 3. 2

අග්ගිවච්ඡගොත්ත සුත්තං

එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

කින්නු ඛො භො ගොතම 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමො'ති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

කිම්පන භො ගොතම 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති එවංදිට්ඨි භවං ගොතමො'ති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි. 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කින්නු ඛො භො ගොතම, 'අන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, 'අන්තවා ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කිම්පන භො ගොතම, 'අනන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, අනන්තවා ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කින්නු ඛො භො ගොතම, 'තං ජීවං තං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, තං ජීවං තං සරීරං ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කිම්පන භො ගොතම, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කින්නු ඛො භො ගොතම, හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, 'හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

Free Distribution www.aathaapi.org

2. 3. 2

අග්ගිවච්ඡගොත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩවසනසේක. එකල්හි වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ සතුටු විය. සතුටු උපදවන සිහිකටයුතු වූ කථාව කොට නිමවා ,එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කී ය :

''කිම භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'ලෝකය ශාශ්වත යැ, මේ මැ සත්‍ය ය, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'ලෝකය ශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ 'ලෝකය අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්හාහු ද ?යි. වච්ඡය, 'ලෝකය, අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ; 'ලෝකය අන්තවත් යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'ලෝකය අන්තවත් යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : ලෝකය අනන්තවත් (අන්ත නැති) යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'ලෝකය අනන්තවත් යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'එ මැ ජීව යැ, එ මැ ශරීර යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ 'ජීවය අනෙකෙකැ, ශරීරය අනෙකෙකැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'ජීවය අනෙකෙකැ, ශරීරය අනෙකෙකැ මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම, භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'සත්ත්ව තෙම මරණින් මතු (උපදනේ) වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'සත්ත්ව තෙම මරණින් මතු වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

18—ෙක් 13561 (11/72)

Free Distribution www.aathaapi.org

කිම්පන භො ගොතම ‘න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, ‘න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති.

කින්නු ඛො භො ගොතම, ‘හොති ච න ච හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, ‘හොති ච න ච හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති.

කිම්පන භො ගොතම, ‘නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති. න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, ‘නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති.

කින්නු ඛො භො ගොතම, ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති[1] ඉති පුට්ඨො සමානො න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති’ති වදෙසි[2] කිම්පන භො ගොතම ‘අසස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො, න ඛො අහං වච්ඡ එවංදිට්ඨි ‘අසස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති’ති වදෙසි.

කින්නු ඛො භො ගොතම, ‘අන්තවා ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො ‘න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, අන්තවා ලොකො ඉදමෙව සච්චං. මොඝමඤ්ඤන්ති’ති වදෙසි. කිම්පන භො ගොතම ‘අනන්තවා ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො ‘න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, අනන්තවා ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති’ති වදෙසි.

කින්නු ඛො භො ගොතම, ‘තං ජීවං තං සරීරං, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො න ඛො අහං වච්ඡ එවංදිට්ඨි ‘තං ජීවං තං සරීරං, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති’ති වදෙසි. කිම්පන භො ගොතම ‘අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො ‘න ඛො අහං වච්ඡ එවංදිට්ඨි ‘අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති’ති වදෙසි.

---

1. සමණො ගොතමො PTS.
2. මොඝමඤ්ඤන්ති වදෙසි - මජසං. සයා.

කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'සත්ත්ව තෙම මරණින් මතු නො වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන් ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'සත්ත්ව තෙම මරණින් මතු නො වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම, භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'සත්ත්ව තෙම මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි, නො ද නො වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි. වච්ඡය, මම : 'සත්ත්ව තෙම මරණින් මතු නො මැ වෙයි. නො ද නො වෙයි, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි.

කිම, භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'ලෝකය ශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ?යි පුළුවුස්නාලදහු 'වච්ඡය, මම ලෝකය ශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි'යි කියව. කිම වැළිත් භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ : 'ලෝකය අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද'යි පුළුවුස්නාලදහු 'වච්ඡය, මම : ලෝකය අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ, යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි'යි කියව.

කිම, භවත් ගෞතමයෙනි, 'ලෝකය අන්තවත් යැ, මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ'යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද'යි මෙසේ පුළුවුස්නාලදහු 'වච්ඡය, මම : 'ලෝකය අන්තවත් යැ, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව. කිම වැළිත් භවත් ගෞතමයෙනි, 'ලෝකය අනන්තවත් යැ, මේ මැ සැබව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද'යි පුළුවුස්නාලදහු 'වච්ඡය මම ලෝකය අනන්තවත් යැ, මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව.

කිම, භවත් ගෞතමයෙනි, 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ' මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද'යි මෙසේ පුළුවුස්නාලදහු වච්ඡය, මම : එ මැ ජීව යැ එ මැ ශරීර යැ, මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව. කිම, වැළිත් භවත් ගෞතමයෙනි, 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද'යි මෙසේ පුළුවුස්නාලදහු වච්ඡය, මම : 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ මේ මැ සැබැව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව.

කින්නු ඛො භො ගොතම 'හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං වච්ඡ එවංදිට්ඨි 'හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති'ති වදෙසි. කිම්පන භො ගොතම 'න හොති තථාගතො පරම්මරණා. ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, 'න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති'ති වදෙසි.

කින්නු ඛො භො ගොතම 'හොති ච න ච හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති'ති වදෙසි. කිම්පන භො ගොතම 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති එවංදිට්ඨි භවං ගොතමොති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං වච්ඡ එවංදිට්ඨි, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති'ති වදෙසි. කිම්පන භවං ගොතමො ආදීනවං සම්පස්සමානො එවං ඉමානි සබ්බසො දිට්ඨිගතානි අනුපගතොති.

සස්සතො ලොකොති ඛො වච්ඡ දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරං දිට්ඨිවිසූකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං, සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං. න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. අසස්සතො ලොකොති ඛො වච්ඡ-පෙ-අන්තවා ලොකොති ඛො වච්ඡ-පෙ-අනන්තවා ලොකොති ඛො වච්ඡ-පෙ-තං ජීවං තං සරීරන්ති ඛො වච්ඡ-පෙ-අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති ඛො වච්ඡ-පෙ-හොති තථාගතො පරම්මරණාති ඛො වච්ඡ-පෙ-න හොති තථාගතො පරම්මරණාති ඛො වච්ඡ-පෙ-හොති ච න ච හොති තථාගතො පරම්මරණාති ඛො වච්ඡ-පෙ-නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඛො වච්ඡ දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරං දිට්ඨිවිසූකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං, සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. ඉමං ඛො අහං වච්ඡ ආදීනවං සම්පස්සමානො එවං ඉමානි සබ්බසො දිට්ඨිගතානි අනුපගතොති.

'අත්ථි පන භොතො ගොතමස්ස කිඤ්චි දිට්ඨිගත'න්ති. දිට්ඨිගතන්ති ඛො වච්ඡ අපනීතමෙතං තථාගතස්ස. දිට්ඨං හෙතං වච්ඡ තථාගතෙන: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථඞ්ගමො, ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො, ඉති සඞ්ඛාරා, ඉති සංඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථංගමො, ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. තස්මා තථාගතො සබ්බමඤ්ඤිතානං සබ්බමථිතානං සබ්බඅහිඞ්කාර-මමිඞ්කාරමානානුසයානං[1] ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා අනුපාදා විමුත්තොති වදාමීති.

---

1. සබ්බඅහංකාරමමංකාරමානානුසයානං - මජසං.
සබ්බාහංකාර . . . ස්‍යා:

Free Distribution www.aathaapi.org

'කිම, භවත් ගෞතමයෙනි, සත්ත්ව මරණින් මතු (උපදනේ) වෙයි, මේ මැ සැබෑව අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු දැ'යි මෙසේ පුළුවුස්නාලදහු 'වච්ඡය, මම : සත්ත්ව මරණින් මතු වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන් ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව. 'කිම වැළිත් භවත් ගෞතමයෙනි, සත්ත්ව මරණින් මතු නො වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු දැ'යි මෙසේ පුළුවුස්නාලදහු : 'වච්ඡය, මම සත්තව මරණින් මතු නො වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව.

කිම, භවත් ගෞතමයෙනි, සත්ත්ව මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු දැ'යි මෙසේ පුළුවුස්නාලදහු 'වච්ඡය, මම : 'සත්ත්ව මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ, යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව. 'කිම වැළිත් භවත් ගෞතමයෙනි, සත්ත්ව මරණින් මතු නො මැ වෙයි නො ද නො වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ, යි භවත් ගෞතමයෝ මෙබඳු දෘෂ්ටි ඇත්තාහු දැ'යි මෙසේ පුළුවුස්නාලදහු වච්ඡය, මම : සත්ත්ව මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි, මේ මැ සැබෑව, අන්‍යයන්ගේ වචන තුච්ඡ යැ යි මෙබඳු දෘෂ්ටි ඇත්තෙම් නො වෙමි' කියව. භවත් ගෞතමයන් වහන්සේ කවර ආදීනවයක් දක්මින් මෙසේ සර්වප්‍රකාරයෙන් මේ දෘෂ්ටිගතයන්ට නො පැමිණියාහු දැ'යි.

වච්ඡය, 'ලෝකය ශාශ්වත යැ යන තෙල දෘෂ්ටිගතයෙකි, දෘෂ්ටිගහනයෙකි, දෘෂ්ටි කාන්තාරයෙකි, දෘෂ්ටිවිසූකයෙකි, දෘෂ්ටිවිෂ්පන්දිතයෙකි, දෘෂ්ටිසංයෝජනයෙකි, (කෙලශ දුඃඛයෙන් හා විපාකදුඃඛයෙන්) දුක් සහිත යැ, (එයින් මැ) පීඩා සහිත යැ, දැඩි ආයාස සහිත යැ, පරිදහ සහිත යැ (වට්ටයෙහි) නිර්වේදය පිණිස නො වෙයි, විරාගය පිණිස නො වෙයි, (රාගාදීන්ගේ) නිරෝධය පිණිස නො වෙයි, කෙලෙස් සන්හිඳීම පිණිස නො වෙයි, (අනිත්‍යාදි වශයෙන්) අභිඥව පිණිස නො වෙයි, සත්‍යාවබෝධය පිණිස නො වෙයි, නිවන් පසක් කිරීම පිණිස නො පවති. වත්සය, 'ලෝකය අශාශ්වත යැ යන . . ලෝකය අන්තවත් යැ යන . . . ලෝකය අනන්තවත් යැ යන . . . එ මැ ජීව යැ එ මැ ශරීර යැ යන . . . ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ යන . . . සත්ත්ව මරණින් මතු වෙයි යන . . . සත්ත්ව මරණින් මතු නො වෙයි යන . . සත්ත්ව මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි යන . . . වත්සය, සත්ත්ව මරණින් මතු නො මැ වෙයි, නො ද නො වෙයි යන තෙල දිට්ඨිගතයෙකැ දෘෂ්ටිගහනයෙකැ දෘෂ්ටිකාන්තාරයෙකැ දෘෂ්ටිවිසූකයෙකැ දෘෂ්ටිවිෂ්පන්දිතයෙකැ දෘෂ්ටිසංයෝජනයෙකැ (කෙලෙස් විපා දුකින්) දුක් සහිත යැ විඝාත සහිත යැ උපායාස සහිත යැ පරිදහ සහිත යැ (වට්ටයෙහි) නිර්වේදයට නො වැටෙයි, විරාගයට නො වැටෙයි, නිරෝධයට නො වැටෙයි, කෙලෙස් සන්හිඳීමට නො වැටෙයි, සත්‍යාවබෝධයට නො වැටෙයි, නිර්වාණය පිණිස නොවැටෙයි; වත්සය, මම් මේ ආදීනව දක්නෙම් මෙසේ සර්වප්‍රකාර යෙන් මේ දෘෂ්ටිගතයන්ට නො පැමිණියෙම් වෙමි'යි.

වැළිත් භවත් ගෞතමයන් වහන්සේට කිසි දෘෂ්ටිගතයෙක් ඇද්දැ'යි. වත්සය, 'දෘෂ්ටිගත' යැ යන තෙල කරුණ තථාගතයන් විසින් බැහැර කරන ලද යැ. වත්සය, තථාගතයන් විසින් තෙල දක්නාලද මැ යැ. මෙතෙක් රූප යැ, මෙසේ රූපසමුදය වෙයි, මෙසේ රූපයාගේ අස්තඞ්ගමය වෙයි. මෙතෙක් වේදනාව වෙයි, මෙසේ වේදනාසමුදය වෙයි, මෙසේ වෙදනානිරෝධය වෙයි, මෙතෙක් සංඥව යැ, මෙසේ සංඥසමුදය වෙයි, මෙසේ සංඥවගේ නිරෝධය වෙයි, මෙතෙක් සංස්කාරයෝ යැ, මෙසේ සංස්කාරසමුදය වෙයි, මෙසේ සංස්කාරනිරෝධය වෙයි, මෙතෙක් විඥන යැ, මෙසේ විඥනසමුදය වෙයි, මෙසේ විඥනනිරෝධය වේ යැ යි. එහෙයින් තථාගතයෝ සියලු දෘෂ්ටි–තෘෂ්ණා–මාන මඤ්ඤිතයන්ගේ සියලු මථිතයන්ගේ සියලු දෘෂ්ටිතෘෂ්ණාමානානුසයන්ගේ ක්ෂය වීමෙන් විරාගයෙන් නිරෝධයෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් උපාදන රහිත වැ විමුක්ත වූහ'යි කියමි.

එවං විමුත්තචිත්තො පන භො ගොතම භික්ඛු කුහිං උපපජ්ජතීති? උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙති. තෙන හි භො ගොතම න උපපජ්ජතීති? න උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙති. තෙන හි භො ගොතම උපපජ්ජති ච න ච උපපජ්ජතීති? උපපජ්ජති ච න ච උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙති. තෙන හි භො ගොතම නෙව උපපජ්ජති න නුපපජ්ජතීති? නෙව උපපජ්ජති න නුපපජ්ජතීති ඛො වච්ඡ න උපෙතීති.

එවං විමුත්තචිත්තො පන භො ගොතම භික්ඛු කුහිං උපපජ්ජතීති ඉති පුට්ඨො සමානො 'උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙතී'ති වදෙසි. තෙන හි භො ගොතම න උපපජ්ජතී'ති ඉති පුට්ඨො සමානො 'න උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙතී'ති වදෙසි. තෙන හි භො ගොතම උපපජ්ජති ච න ච උපපජ්ජතීති ඉති පුට්ඨො සමානො 'උපපජ්ජති ච න ච උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙතී'ති වදෙසි තෙන හි භො ගොතම නෙව උපපජ්ජති න නුපපජ්ජතීති ඉති පුට්ඨො සමානො 'නෙව උපපජ්ජති, න නුපපජ්ජතීති ඛො වච්ඡ න උපෙතී'ති වදෙසි. එත්ථාහං භො ගොතම අඤ්ඤාණමාපාදිං, එත්ථ සම්මොහමාපාදිං. යාපි මෙ එසා භොතො ගොතමස්ස පුරිමේන කථාසල්ලාපෙන අහු පසාදමත්තා, සාපි මෙ එතරහි අන්තරහිතාති.

අලං හි තෙ වච්ඡ අඤ්ඤාණාය, අලං සම්මොහාය. ගම්භීරොහායං[1] වච්ඡ ධම්මො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවේදනීයො. සො තයා දුජ්ජානො අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රයොගෙන අඤ්ඤත්‍රාචරියකෙන.[2] තෙන හි වච්ඡ තඤ්ඤෙ'වෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි.

තං කිං මඤ්ඤසි වච්ඡ, සචෙ තෙ පුරතො අග්ගි ජලෙය්‍ය, ජානෙය්‍යාසි ත්වං අයං මෙ පුරතො අග්ගි ජලතීති? සචෙ මෙ භො ගොතම පුරතො අග්ගි ජලෙය්‍ය, ජානෙය්‍යාහං 'අයං මෙ පුරතො අග්ගි ජලතී'ති. සචෙ පන තං වච්ඡ එවං පුච්ඡෙය්‍ය, 'යො තෙ අයං පුරතො අග්ගි ජලති, අයං අග්ගි කිං පටිච්ච ජලතී'ති. එවං පුට්ඨො ත්වං වච්ඡ කින්ති බ්‍යාකරෙය්‍යාසීති? සචෙ මං භො ගොතම එවං පුච්ඡෙය්‍ය 'යො තෙ අයං පුරතො අග්ගි ජලති, අයං අග්ගි කිං පටිච්ච ජලතී'ති. එවං පුට්ඨො අහං භො ගොතම එවං බ්‍යාකරෙය්‍යං. 'යො මෙ අයං පුරතො අග්ගි ජලති, අයං අග්ගි තිණකට්ඨුපාදානං පටිච්ච ජලතීති. සචෙ තෙ වච්ඡ පුරතො සො අග්ගි නිබ්බායෙය්‍ය, ජානෙය්‍යාසි ත්වං අයං මෙ පුරතො අග්ගි නිබ්බුතොති? සචෙ මෙ භො ගොතම පුරතො සො අග්ගි නිබ්බායෙය්‍ය, ජානෙය්‍යාහං අයං මෙ පුරතො අග්ගි නිබ්බුතොති. සචෙ පන තං වච්ඡ එවං පුච්ඡෙය්‍ය 'යො තෙ අයං පුරතො අග්ගි නිබ්බුතො සො අග්ගි ඉතො කතමං දිසං ගතො, පුරත්ථිමං වා පච්ඡිමං වා උත්තරං වා දක්ඛිණං වාති. එවං පුට්ඨො ත්වං වච්ඡ කින්ති බ්‍යාකරෙය්‍යාසීති? න උපෙති භො ගොතම. යං හි සො ගොතම අග්ගි තිණකට්ඨුපාදානං පටිච්ච අජලි[3] තස්ස ච පරියාදානා අඤ්ඤස්ස ච අනුපහාරා අනාහාරො නිබ්බුතො'තෙව සඞ්ඛං ගච්ඡතී'ති.

---

1. ගම්භීරෙ හයං - ස්‍යා.
2. අඤ්ඤත්‍රාචරියකෙන - මජසං.
3. ජලති - ස්‍යා.

භවත් ගෞතමයන් වහන්ස, මෙසේ විමුක්ත වූ සිත් ඇති මහණ කොහි උපදනේ වේ ද ? යි. වත්සය, 'උපදී' යනු නො යෙදෙයි, එසේ නම් භවත් ගෞතමයෙනි, නූපදනේ වේ ද ? යි. වත්සය, 'නූපදී, යනු නො යෙදෙයි. එසේ නම් භවත් ගෞතමයෙනි, උපදනේත් නො ද උපදනේත් වේ ද ?යි. වත්සය, 'උපදනේත් නූපදනේත් වෙයි' යනු නො යෙදෙයි. එසේ නම් භවත් ගෞතමයෙනි, නො මැ උපදනේ නො ද නූපදනේ වේ ද ?යි. වත්සය, 'නො මැ උපදනේ නො ද නූපදනේ වෙයි' යනු නො යෙදේ යයි.

භවත් ගෞතමයෙනි, මෙසේ විමුක්ත වූ සිත් ඇති මහණ කොහි උපදනේ ද? යි . මෙසේ පුළුවුස්නා ලදහු 'වත්සය, උපදී යනු නො යෙදේ යැ'යි කියව. එසේ නම් භවත් ගෞතමයෙනි, නූපදනේ ද ?යි මෙසේ පුළුවුස්නාලදහු 'වත්සය, නූපදී යනු නො යෙදේ යැ'යි කියව. එසේ නම් භවත් ගෞතමයෙනි, 'උපදනේත් නො උපදනේත් වේ ද? යි මෙසේ පුළුවුස්නාලදහු 'වත්සය, උපදනේත් නො ද උපදනේත් වෙයි යනු නො යෙදේ යැ'යි කියව, එසේ නම් භවත් ගෞතමයෙනි, නො මැ උපදනේ නො ද නූපදනේ වේ ද? යි මෙසේ පුළුවුස්නා ලදහු ,වත්සය, නො මැ උපදනේ වෙයි නො ද නූපදනේ වෙයි යනු නො යෙදේ යැ'යි කියව. භවත් ගෞතමයෙනි, මෙහි ලා මම නො දැනීමට පැමිණියෙමි, මෙහි ලා සම්මෝහයට පැමිණියෙමි . . . භවත් ගෞතමයන්ගේ පූර්වකථා සංලාපයෙන් මා ගේ යම් ප්‍රසාදමාත්‍රයෙක් වී නම් දැන් එ ද අතුරුදහන් වී යැ'යි.

වත්සය, තොපගේ නො දැන්මට පමණ මැ යි. මුළාවට පමණි. වත්සය, යම් හෙයෙකින් මේ ප්‍රත්‍යයාකාරධර්මය ගම්භීර යැ එහෙයින් මැ දුද්දශී යැ අවබෝධ නො කළ හැක්ක. ශාන්ත යැ ප්‍රණීත යැ තර්කයෙන් නො පැමිණිය හැකි යැ සිලිටි යැ (සම්‍යක්ප්‍රතිපන්න) පණ්ඩිතයන් විසින් දක්ක යුතු යැ. ඒ දහම අන්‍යදෘෂ්ටික වූ අන්‍යමතික වූ අන්‍යරුචික වූ අන් දහමෙකැ යෙදීම් ඇති අන්‍ය ආචාර්යයන් කෙරෙහි වසන තොප විසින් නො දතහැක්ක, එහෙයින් වත්සය මෙහි ලා තොප මැ පුළුවුස්මි. යම්සේ තොපට වැටහේ නම් එසේ එය ප්‍රකාශ කරව.

වත්සය, ඒ කිමැයි සිතව, ඉදින් තොප ඉදිරියෙහි ගින්නක් දිලියේ - නම් 'මා හමුයෙහි මේ ගින්න දිලේ යැ'යි තෙපි දන්නහු ද'යි ඉදින් භවත් ගෞතමයෙනි, ගිනි දිලියේ නම් 'මේ ගින්න මා හමුයෙහි දිලියේ' යයි මම් දත හෙමි, ඉදින් වච්ඡය, තොප මෙසේ පුළුවුස්නේ නම් : 'තොප ඉදිරියෙහි යම් ගින්නක් දිලියේ ද, මේ ගින්න කුමක් නිසා දිලියේ ද'යි වච්ඡය, මෙසේ පුළුවුස්නාලද තෙපි කුමකැ'යි, ප්‍රකාශ කරන්නහු ද? ඉදින් භවත් ගෞතමයෙනි, මා මෙසේ විචාරා නම් : 'තොප ඉදිරියෙහි යම් ගින්නක් දිලියේ ද, ඒ ගින්න කුමක් නිසා දිලියේ ද'යි. භවත් ගෞතමයෙනි, මම් මෙසේ විචාරන ලද්දෙම් මෙසේ ප්‍රකාශ කරන්නෙමි : 'මා හමියෙහි යම් ගින්නෙක් දිලියේ ද, මේ ගින්න තෘණකාෂ්ටොපාදනය නිසා දිලේ'යයි. මෙසේ ප්‍රකාශ කරමි. ඉදින් වත්සය, ඒ ගින්න තොප හමියෙහි නිවේ නම් මේ ගින්න මා හමුවෙහි නිවිණැ'යි දන්නහු ද? ඉදින් භවත් ගෞතමයෙනි, ඒ ගින්න මා හමුවෙහි නිවියේ නම්, මම මේ ගින්න මා හමුවෙහි නිවිණැයි දනගනිමි. යළි වත්සය, ඉදින් තොප පුළුවුස්නේ නම්; 'තොප හමියෙහි යම් ගින්නක් නිවියේ නම් ඒ ගින්න මෙයින් කවර දිගකට ගියේ ද පෙරදිගට හෝ අවරදිගට හෝ උතුරුදිගට හෝ දකුණු දිගට හෝ යැ'යි. වච්ඡය, මෙසේ පුළුවුස්නාලද තෙපි කිමැ යි ප්‍රකාශ කරහු ද'යි. භවත් ගෞතමයෙනි නො යෙදෙයි. යම් හෙයෙකින් භවත් ගෞතම-යෙනි, ඒ ගින්න යම් තෘණකාෂ්ටොපාදනයක් නිසා දිලිණි ද ඒ උපාදනයාගේ ක්ෂය වීමෙන් ද අන්‍ය උපාදනයක්හුගේ නො එළැවීමෙන් ද, අප්‍රත්‍යය වැ නිවිණැ යි කියා මැ ගණනට යේ යැ' යි.

එවමෙව ඛො වච්ඡ යෙන රූපෙන තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තං රූපං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. රූපසඞ්ඛාවිමුත්තො[1] ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො[2] සෙය්‍යථාපි මහාසමුද්දො, උපපජ්ජතීති න උපෙති, න උපපජ්ජතීති න උපෙති, උපපජ්ජති ච න ච උපපජ්ජතීති න උපෙති, නෙව උපපජ්ජති න නුපපජ්ජතීති න උපෙති. යාය වෙදනාය තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, සා වෙදනා තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. වෙදනාසඞ්ඛාවිමුත්තො[3] ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො, උපපජ්ජතීති න උපෙති, න උපපජ්ජතීති න උපෙති, උපපජ්ජති ච න ච උපපජ්ජතීති න උපෙති, නෙව උපපජ්ජති න නුපපජ්ජතීති න උපෙති. යාය සඤ්ඤාය තථාගතං පඤ්ඤාපයමනො පඤ්ඤපෙය්‍ය, සා සඤ්ඤා තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා අයතිං අනුප්පාදධම්මා. සඤ්ඤාසඞ්ඛාවිමුත්තො ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො, සෙය්‍යථාපි මහාසමුද්දො, උපපජ්ජතීති න උපෙති, න උපපජ්ජතීති න උපෙති, උපපජ්ජති ච න ච උපපජ්ජතීති න උපෙති, නෙව උපපජ්ජති න නුපපජ්ජතීති න උපෙති. යෙහි සඞ්ඛාරෙහි තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තෙ සඞ්ඛාරා තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. සඞ්ඛාරසඞ්ඛාවිමුත්තො ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො, උපපජ්ජතීති න උපෙති, න උපපජ්ජතීති න උපෙති, උපපජ්ජති ච න ච උපපජ්ජතීති න උපෙති, නෙව උපපජ්ජති න නුපපජ්ජතීති න උපෙති. යෙන විඤ්ඤාණෙන තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තං විඤ්ඤාණං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. විඤ්ඤාණසඞ්ඛාවිමුත්තො ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො, උපපජ්ජතීති න උපෙති, න උපපජ්ජතීති න උපෙති, උපපජ්ජති ච න ච උපපජ්ජතීති න උපෙති, නෙව උපපජ්ජති න නුපපජ්ජතීති න උපෙතීති.

එවං වුත්තෙ වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: සෙය්‍යථාපි භො ගොතම ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහාසාලරුක්ඛො, තස්ස අනිච්චතා සාඛාපලාසං[4] පලුජ්ජෙය්‍ය තචපපටිකං[5] පලුජ්ජෙය්‍ය[6] ඵෙග්ගු පලුජ්ජෙය්‍ය. සො අපරෙන සමයෙන අපගතසාඛාපලාසො අපගතතචපපටිකො අපගතඵෙග්ගුකො සුද්ධො අස්ස සාරෙ පතිට්ඨිතො, එවමෙවිදං භොතො ගොතමස්ස පාවචනං අපගතසාඛාපලාසං අපගත තචපපටිකං අපගතඵෙග්ගුකං සුද්ධං සාරෙ පතිට්ඨිතං. අභික්කන්තං භො ගොතම. අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණඞ්ගතන්ති.

අග්ගිවච්ඡගොත්ත සුත්තං දුතියං.

---

1. රූපසඞ්ඛයවිමුත්තො - මජසං.
2. දුප්පරියොගාළ්හො - මජසං.
3. වෙදනාසඞ්ඛය - මජසං.
4. සාඛාපලාසා - සීමු, මජසං.
5. තචපපටිකා - සීමු, මජසං.
6. පලුජ්ජෙය්‍යුං - සීමු, මජසං.

එසෙයින් මැ වත්සය, යම් රූපයෙකින් සත්ත්ව සඞ්ඛ්‍යාත තථාගත පනවනුයෙක් රූපී යැ යි පනවා නම් තථාගතයන්හට ඒ රූපය ප්‍රහීණ යැ, උදුන්මුල් ඇත්තෙ යැ, තාලවස්තුවක් මෙන් කරන ලද, අනාභාවය කරනලද, මත්තෙහි නූපදනා සැහැවි ඇත්තේ යැ. වත්සය, රූපය නුවණින් දත විමුක්ත වූ තථාගත ගුණ හෙයින් ගැඹුරු යැ ප්‍රමාණ කළ නො හැක්ක, නො දත හැක්ක, මහාසමුද්‍රය මෙනි, 'උපදනේ යැ'යි නො යෙදෙයි, 'නූපදනේ යැ'යි නො යෙදෙයි, 'උපදනේත් වෙයි නූපදනේත් වේ යැ'යි නො යෙදෙයි, 'නො මැ උපදී පනවානූපදනේ නො වේ යැ'යි නොයෙදෙයි. යම් වේදනායෙකින් සත්ත්වයා පනවනුයෙක් පනවා නම් ඒ වේදනාව තථාගතයන්හට ප්‍රහීණ යැ උදුන්මුල් ඇත්ති යැ, තාලවස්තුවක් මෙන් කරනලද, අනාභාවය කරනලද මත්තෙහි නූපදනා සැහැවි ඇත්තියැ. වත්සය,වේදනාව නුවණින් දත විමුක්ත වූ තථාගත ගුණයෙන් ගැඹුරු යැ ප්‍රමාණ කළ නො හැක්ක, නො දත හැක්ක, මහසමුදුර වැන්න, 'උපදී යැ'යි නො යෙදේ, 'නූපදී යැ'යි නො යෙදෙයි, 'උපදනේත් නො ද උපදනේත් වේ යැ'යි නො යෙදෙයි, 'නො මැ උපදී නූපදනේ නො වේ යැ''යි නො යෙදෙයි. යම් සංඥවකින් සත්ත්වයා පනවනුයේ පනවා නම් ඒ සංඥව තථාගතයන්ට ප්‍රහීණ යැ, උදුන්මුල් ඇත්ති යැ, තාලවස්තුවක් මෙන් කරනලද, අනාභාවය කරනලද, මත්තෙහි නූපදනා සැහැවි ඇත්ති යැ. වත්සය, සංඥව නුවණින් දත විමුක්ත වූ තථාගත ගැඹුරු යැ, ප්‍රමාණ නො කට හැක්කේ යැ, නො දත හැක්කේ යැ, මහසමුදුර මෙනි 'උපදී යැ' යනු නොයෙදෙයි, 'නූපදී යැ' යනු නො යෙදෙයි, 'උපදනේත් නූපදනේත් වෙයි' යනු නො යෙදෙයි, 'නො මැ උපදී නො ද නූපදී'යනු නො යෙදේ. යම් සංස්කාර කෙනකුන් කරණ කොට සත්ත්වයා පනවනුයේ පනවා නම් ඒ සංස්කාරයෝ තථාගතයන්ට ප්‍රහීණයහ, උදුන්මුල් ඇතියහ, තාලවස්තුවක් මෙන් කරනලදහ, අනාභාවය කරනලදහ. මත්තෙහි නූපදනා ස්වභාව ඇතියහ. වත්සය, සංස්කාරයන් නුවණින් දත විමුක්ත වූ තථාගත ගම්භීර යැ, ප්‍රමාණ නො කට හැක්කේ යැ, නො දත හැක්කේ යැ, මහසමුදුර වැන්න, 'උපදී' යනු නො යෙදෙයි, 'නූපදී' යනු නො යෙදෙයි, 'උපදනේත් නූපදනේත් වෙයි' යනු නො යෙදෙයි, 'නො මැ උපදී නො ද නූපදී'යනු නො යෙදේ. යම් විඥන-යෙකින් සත්ත්වයා පනවනුයේ පනවා නම් ඒ විඥනය තථාගතයන්ට ප්‍රහීණ යැ, උදුන්මුල් ඇත්තේ යැ, තාලවස්තුවක් මෙන් කරන ලද ,අනාභාවය කරන ලද, මත්තෙහි නූපදනා සැහැවි ඇත්තේ යැ. වත්සය, විඥනය නුවණින් දත විමුක්ත වූ තථාගත ගැඹුරු යැ, ප්‍රමාණ නො කට හැක්කේ යැ, නො දත හැක්කේ යැ, මහසමුදුර මෙනි, 'උපදී' යනු නො යෙදෙයි, 'නූපදී' යනු නො යෙදෙයි, 'උපදනේත් නූපදනේත් වෙයි' යනු නො යෙදෙයි, නො මැ උපදී නො ද නූපදී' යනු නො යෙදේ යයි.

මෙසේ වදළ කල්හි වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ යැ යම්සේ භවත් ගෞතමයන් වහන්ස, ගමකට හෝ නියම්ගමකට හෝ නුදුරෙහි මහසල්-රුකෙක් වේ ද, අනිත්‍ය බැවින් එහි අතුකොළ නස්නේ යැ සිවිපතුරු නස්නේ යැ බොරුදු නස්නේ යැ එරුක මැතභාගයෙහි පහ වූ අතුකොළ ඇත්තේ පහවූ සිවිපොතු ඇත්තේ පහවූ බොරුදු ඇත්තේ ශුද්ධ වූයේ හර මතුයෙහි සිටියේ වෙයි. එහෙයින් මැ භවත් ගෞතමයන් වහන්සේගේ ප්‍රවචනය අපගත වූ කොළ අතු ඇතියේ අපගත වූ ත්වක්පපටිකා ඇතියේ අපගත වූ එල්ගු ඇතියේ ශුද්ධ වූයේ ලෝකොත්තර ධර්ම සාරයෙහි පිහිටියේ වේ. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මනහර යැ, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මනහර යැ . . . . භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිම් වැ සරණ ගිය උපාසකයකු කොට මා ධරනසේක්ව'යි.

දෙවැනි අග්ගිවච්ඡගොත්ත සූත්‍ර යි.

---

2. 3. 3

මහාවච්ඡගොත්ත සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

දීඝරත්තාහං භොතා ගොතමෙන සහකථී, සාධු මෙ භවං ගොතමො සඞ්ඛිත්තෙන කුසලාකුසලං දෙසෙතූ'ති.

සඞ්ඛිත්තෙනපි ඛො තෙ අහං වච්ඡ කුසලාකුසලං දෙසෙය්‍යං, විත්ථාරෙනපි ඛො තෙ අහං වච්ඡ කුසලාකුසලං දෙසෙය්‍යං. අපි ච තෙ අහං වච්ඡ සඞ්ඛිත්තෙන කුසලා-කුසලං දෙසිස්සාමි. තං සුණාහි, සාධුකං මනසි කරොහි භාසිස්සාමීති.

එවං භොති ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

ලොභො ඛො වච්ඡ අකුසලං, අලොභො කුසලං. දොසො ඛො වච්ඡ අකුසලං, අදොසො කුසලං. මොහො ඛො වච්ඡ අකුසලං, අමොහො කුසලං. ඉති ඛො වච්ඡ ඉමෙ තයො ධම්මා අකුසලා, තයො ධම්මා කුසලා. පාණාතිපාතො ඛො වච්ඡ අකුසලං, පාණාතිපාතා වෙරමණී කුසලං අදින්නාදානං ඛො වච්ඡ අකුසලං, අදින්නාදානා වෙරමණී කුසලං. කාමෙසුමිච්ඡාචාරො ඛො වච්ඡ අකුසලං, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී කුසලං. මුසාවාදො ඛො වච්ඡ අකුසලං, මුසාවාදා වෙරමණී කුසලං පිසුනා වාචා ඛො වච්ඡ අකුසලං, පිසුනා වාචා[1] වෙරමණී කුසලං. ඵරුසා වාචා ඛො වච්ඡ අකුසලං, ඵරුසා වාචා[2] වෙරමණී කුසලං. සම්ඵප්පලාපො ඛො වච්ඡ අකුසලං, සම්ඵප්පලාපා වෙරමණී කුසලං. අභිජ්ඣා ඛො වච්ඡ අකුසලං, අනභිජ්ඣා කුසලං. බ්‍යාපාදො ඛො වච්ඡ අකුසලං, අබ්‍යාපාදො කුසලං. මිච්ඡාදිට්ඨි ඛො වච්ඡ අකුසලං, සම්මාදිට්ඨි කුසලං. ඉති ඛො වච්ඡ ඉමෙ දස ධම්මා අකුසලා, දස ධම්මා කුසලා.

යතො ඛො වච්ඡ භික්ඛුනො තණ්හා පහීනා හොති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[3] ආයතිං අනුප්පාදධම්මා. සො හොති භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

---

1. පිසුණාය වාචාය - මජසං, ස්‍යා, PTS.
2. ඵරුසාය වාචාය - මජසං ස්‍යා, PTS.
3. { අනභාවං කතා - මජසං.
   { අනභාවංගතා - ස්‍යා.

Free Distribution www.aathaapi.org

2. 3. 3
මහාවච්ඡගොත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසනලදද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කළන්‍දකනිවාප නම් වූ වේළුවනවිහාරයෙහි වැඩ වසනසේක. එකල්හි වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවියයුතු සිහිකළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හිත. එකත්පස් වැ හුන් වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැල කෙළේ යැ.

මම් භවත් ගෞතමයන් වහන්සේ සමග කථා කෙළෙම් බොහෝ කල් වෙයි. භවත් ගෞතමයන් වහන්සේ මට සැකෙවින් කුසල් අකුසල් දේශනා කරන සේක්ව'යි අයදිමි.

වත්සය, මම් තොපට සැකෙවිනුදු කුසල් අකුසල් දෙසිය හෙමි, වත්සය මම් තොපට විතරිනුදු කුසල් අකුසල් දෙසිය හෙමි. එතෙකුදු වුවත් වත්සය, මම් තොපට සැකෙවින් කුසල් අකුසල් දෙසන්නෙමි, ඒ අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි'යි.

'එසේ යැ භවත්නි'යි වත්සගොත්‍රපරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දීනා· භාග්‍යවතුන් වහන්සේ මෙල දේශනාව වදළසේක :

''වත්සය, ලෝභය අකුශලයෙක, අලෝභය කුශලයෙක. වත්සය, ද්වේෂය අකුශලයෙක· අද්වේෂය කුශලයෙක. වත්සය, මෝහය අකුශලයෙක, අමෝහය කුශලයෙකි. මෙසෙයින් වත්සය, මේ තුන් ධර්මයෝ අකුශලයෝ යැ, තුන් ධර්මයෝ කුශලයෝ යි. වත්සය, ප්‍රාණඝාතය අකුශලයෙක, ප්‍රාණඝාතයෙන් වෙන් වීම කුශලයෙක. වත්සය, අදත්තාදනය අකුශලයෙක, අදත්තාදනයෙන් වෙන්වීම කුශලයෙක. වත්සය, කාමයෙහි මිසහසර අකුශලයෙක, කාමයෙහි මිසහසරින් වෙන්වීම කුශලයෙක. වත්සය, මෘෂාවාදය අකුශලයෙක, මෘෂාවාදයෙන් වෙන්වීම කුශලයෙක. වත්සය, පිශුනවචනය අකුශලයෙක, පිශුනවචයෙන් වෙන්වීම කුශලයෙක. වත්සය, පරුෂවචනය අකුශලයෙක, පරුෂ වචනයෙන් වෙන්වීම කුශලයෙක. වත්සය, සම්ප්‍රලාපය අකුශලයෙක, සම්ප්‍රලාපයෙන් වෙන්වීම කුශලයෙක. වත්සය, අභිධ්‍යාව අකුශලයෙක, අනභිධ්‍යාව කුශලයෙක. වත්සය, ව්‍යාපාදය අකුශලයෙක, අව්‍යාපාදය කුශලයෙක. වත්සය, මිථ්‍යාදෘෂ්ටිය අකුශල යෙක, සම්‍යග්දෘෂ්ටිය කුශලයෙකි. මෙසෙයින් වත්සය, මේ දශධර්මයෝ අකුශලයෝ යැ, දශධර්මයෝ කුශලයෝ යි·

වත්සය, යම් තැනෙක පටන් මහණහට තෘෂ්ණා ප්‍රහීණ වී ද උදුරුන්මුල් ඇත්ති තාලවස්තුවක් මෙන් කරනලද්දී අනභාවය කරනලද්දී මත්තෙහි නූපදනා සොභාව ඇත්තී ද ඒ මහණ අර්හත් වූයේ ක්ෂය වූ ආශ්‍රව ඇත්තේ වැස නිම වූ බඹසරවස් ඇත්තේ කළ සිවුමහකිසඇතියේ බහා තැබූ ස්කන්ධාදි බර ඇතියේ පැමිණි අර්හත්ත්වය ඇතියේ ක්ෂය වූ භවසංයෝජන ඇත්තේ මොනොවට දැන අර්හත්ඵල විමුක්තියෙන් විමුක්ත වූයේ යයි.

තිට්ඨතු භවං ගොතමො. අත්ථි පන භොතො ගොතමස්ස එකභික්ඛුපි සාවකො[1] ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි, අථ ඛො භිය්‍යොව යෙ භික්ඛූ මම සාවකා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

තිට්ඨතු භවං ගොතමො, තිට්ඨන්තු භික්ඛූ. අත්ථි පන භොතො ගොතමස්ස එකභික්ඛුනීපි සාවිකා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි. අථ ඛො භිය්‍යොව යා භික්ඛුනියො මම සාවිකා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

තිට්ඨතු භවං ගොතමො, තිට්ඨන්තු භික්ඛූ, තිට්ඨන්තු භික්ඛුනියො. අත්ථි පන භොතො ගොතමස්ස එකූපාසකොපි සාවකො ගිහී ඕදාතවසනො බ්‍රහ්මචාරී පඤ්චන්නං[2] ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකාති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි. අථ ඛො භිය්‍යොව යෙ උපාසකා මම සාවකා ගිහී ඕදාතවසනා බ්‍රහ්මචාරිනො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්ති ධම්මා තස්මා ලොකාති.

තිට්ඨතු භවං ගොතමො, තිට්ඨන්තු භික්ඛූ, තිට්ඨන්තු භික්ඛුනියො, තිට්ඨන්තු උපාසකා ගිහී ඕදාතවසනා බ්‍රහ්මචාරිනො. අත්ථි පන භොතො ගොතමස්ස එකූපාසකොපි ගිහී ඕදාතවසනො කාමභොගී සාසනකරො ඔවාදපතිකරො තිණ්ණවිචිකිච්ඡො[3] විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ විහරතීති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි. අථ ඛො භිය්‍යොව යෙ උපාසකා මම සාවකා ගිහී ඕදාතවසනා කාමභොගිනො සසනකරා ඔවාදපතිකරා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථු-සාසනෙ විහරන්තී'ති.

---

1. සාවකො යො - මජසං.
2. යො පඤ්චන්නං - මජසං.
3. යො තිණ්ණවිචිකිච්ඡො - මජසං.

භවත් ගෞතමයන් වහන්සේ සිටිනසේක්වා. භවත් ගෞතමයන්ගේ ශ්‍රාවක වූ එක් මහණෙකුදු ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි තමා විසින් මැ දන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසේ ද එබඳු මහණෙක් ඇද්ද ?යි.

වත්සය, එක් සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි. තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ ශ්‍රාවක වූ යම් මහණ කෙනෙක් ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි තමන් විසින් මැ දන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙත් ද එබඳු මහණහු බොහෝ වෙත් මැ යි.

භවත් ගෞතමයන් වහන්සේ සිටිත්වා, මහණහු සිටිත්වා. භවත් ගෞතමයන්ගේ ශ්‍රාවිකා වූ එක් මෙහෙණකුදු ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චේතෝවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි මැ තමා විසින් අවබෝධ කොට ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වෙසේ ද එබඳු එක් මෙහෙණකුදු ඇද්ද ?යි.

වත්සය, එක්සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ සැව් වූ යම් මෙහෙණ කෙනෙක් ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චේතෝවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි මැ තමන් විසින් අවබෝධ කොට ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වෙසෙත් ද, එබඳු මෙහෙණහු බොහෝ වෙත් මැ යි.

භවත් ගෞතමයන් වහන්සේ සිටිනසේක්වා, මහණහු සිටිත්වා, මෙහෙණහු සිටිත්වා. භවත් ගෞතමයන් වහන්සේගේ සවු වූ ගිහි වූ හෙළපිළී හඳනා බඹසර ඇති එක් උවසුයෙක් පවා පස් ඔරම්භාගියසංයෝජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වූයේ ඒ ශුද්ධාවාසයෙහි පිරිනිවෙනසුලු වූයේ එලොවින් පෙරලා නො එනුයේ ඇද්ද ?යි.

වත්සය, එක්සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ සවු වූ ගිහි වූ හෙළපිළී හඳනා බඹසර ඇති යම් උවසු කෙනෙක් පඤ්චොරම්භාගිය සංයෝජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වූවාහු එහි පිරිනිවෙනසුලු වූවාහු එලොවින් පෙරලා නො එන සැහැවි ඇත්තාහු ද එබඳු උවසුවෝ බොහෝ වෙත් මැ යි.

භවත් ගෞතමයන් වහන්සේ සිටිත සේක්වා, මහණහු සිටිත්වා, මෙහෙණහු සිටිත්වා, ගිහි වූ හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ සිටිත්වා. භවත් ගෞතමයන්ගේ ගිහිගේ වැසි හෙළපිළී හඳනා කාමභෝගී වූ සසුන් කරන අවවාද පිළිගෙන කරන තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ සැක ඇති, විශාරද බවට පැමිණි ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූ එක් උපාසකයෙක් නමුදු වෙසේ ද ?යි.

වත්සය, එක්සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ ශ්‍රාවක වූ ගිහිගේ වැසි හෙළපිළී හඳනා කාමභෝගී වූ ශාසනකර වූ අවවාද පිළිගෙන කරන තරණය කළ විචිකිත්සා ඇති පහ වූ සැක ඇති විශාරද බවට පැමිණි ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූ යම් උපාසක කෙනෙක් වෙසෙත් ද, එබඳු උපාසකයෝ බොහෝ වෙත් මැ යි.

තිට්ඨතු භවං ගොතමො, තිට්ඨන්තු භික්ඛූ, තිට්ඨන්තු භික්ඛුනියො, තිට්ඨන්තු උපාසකා ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො, තිට්ඨන්තු උපාසකා ගිහී ඔදාතවසනා කාමභොගිනො. අත්ථි පන භොතො ගොතමස්ස එකූපාසිකාපි සාවිකා ගිහිනී ඔදාතවසනා බ්‍රහ්මචාරිණී පඤ්චන්නං[1] ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනී අනාවත්තිධම්මා තස්මා ලොකාති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි. අථ ඛො භිය්‍යොව යා උපාසිකා මම සාවිකා ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනියො අනාවත්තිධම්මා තස්මා ලොකාති.

තිට්ඨතු භවං ගොතමො, තිට්ඨන්තු භික්ඛූ, තිට්ඨන්තු භික්ඛුනියො, තිට්ඨන්තු උපාසකා ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො, තිට්ඨන්තු උපාසකා ගිහී ඔදාතවසනා කාමභොගිනො, තිට්ඨන්තු උපාසිකා ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො. අත්ථි පන භොතො ගොතමස්ස එකූපාසිකාපි සාවිකා ගිහිනී ඔදාතවසනා කාමභොගිනී[2] සාසනකරා ඔවාදපතිකරා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථු සාසනෙ විහරතීති.

න ඛො වච්ඡ එකංයෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්චසතානි. අථ ඛො භිය්‍යොව යා උපාසිකා මම සාවිකා ගිහිනියො[3] ඔදාතවසනා කාමභොගිනියො සාසනකරා ඔවාදපතිකරා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විහරන්තීති.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස. නො ච ඛො භික්ඛූ ආරාධකා අභවිංසු. එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො භික්ඛූ ච ආරාධකා. එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස, භික්ඛූ ච ආරාධකා අභවිංසු, නො ච ඛො භික්ඛුනියො ආරාධිකා අභවිංසු, එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො භික්ඛූ ච ආරාධකා, භික්ඛුනියො ච ආරාධිකා, එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

1. යා පඤ්චන්නං - මජසං.
2. කාමභොගිනියො - සීමු.
3. ගිහී - සීමු.

Free Distribution www.aathaapi.org

භවත් ගෞතමයන් වහන්සේ සිටිනසේක්වා, මහණහු සිටිත්වා, මෙහෙණහු සිටිත්වා, ගිහිගේවැසි හෙළපිළී හඳනා බ්‍රහ්මචාරී උපාසකයෝ සිටිත්වා, ගිහිගේවැසි හෙළපිළී හඳනා කාමභොගී වූ උපාසකයෝ සිටිත්වා. භවත් ගෞතමයන් වහන්සේගේ සැව් වූ හෙළපිළී හඳනා බඹසර ඇති පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ ක්ෂය වීමෙන් ඖපපාතික වූ එහි පිරිනිවෙනසුලු එලොවින් නො නවත්නා සැහැවි ඇති එක් උවැසියකුදු ඇද්ද ?යි

වත්සය, එක්සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ සැව් වූ ගිහිගේවැසි හෙළපිළී හඳනා බඹසර ඇති පඤ්චොරම්භාගිය සංයෝජනයන් ක්ෂය වීමෙන් ඖපපාතික වූ එහි පිරිනිවෙනසුලු ඒ සුදවැසි බඹලොවින් පෙරලා නො එනසුලු යම් උවැසි කෙනෙක් වෙත් ද එබඳු උවැසියෝ බොහෝ වෙත් මැ යි.

භවත් ගෞතමයන් වහන්සේ සිටිනසේක්වා, මහණහු සිටිත්වා, මෙහෙණහු සිටිත්වා, ගිහිගේවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ සිටිත්වා, ගිහිගේ වැසි හෙළපිළී හඳනා කාමභොගී වූ උවසුවෝ සිටිත්වා, ගිහිගේවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවැසියෝ සිටිත්වා, යළි භවත් ගෞතමයන් වහන්සේගේ සැව් වූ ගිහිගේ වැසි හෙළපිළී හඳනා කම්සුව විඳින සසුන්කරු වූ ඕවා පිළිගෙන කරන තරණය කළ විචිකිත්සා ඇති පහ වූ සැක ඇති විශාරද බවට පැමිණි ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූ එක් උවැසි-යකුදු වෙසේ ද ?යි.

වත්සය, එක්සියෙක් මතු නො වෙයි, දෙසියෙක් නො වෙයි, තුන්සියෙක් නො වෙයි, සාරසියෙක් නො වෙයි, පන්සියෙක් නො වෙයි. වැළි මාගේ ශ්‍රාවිකා වූ ගිහිගේවැසි හෙළපිළී හඳනා කම්සුව විඳින සසුන්කරු වූ ඕවා පිළිගෙන කරන තරණය කළ විචිකිත්සා ඇති විගත කථංකථා ඇති වෛශාරද්‍යයට පැමිණි ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූ යම් උපාසිකා කෙනෙක් ඇද්ද, එබඳු උපාසිකාවෝ බොහෝ වෙත් මැ යි.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මේ ලොව්තුරා දහම භවත් ගෞතමයන් වහන්සේ මතු සම්පාදනය කළාහු වෙත් නම් මහණහු නො ද ආරාධනය කළාහු නම් මෙසෙයින් මේ මහ බඹසර එ අඟින් අපරිපූර්ණ විය. තවද යම් හෙයෙකින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොව්තුරු දහම භවත් ගෞතමයන් වහන්සේත් සම්පාදනය කළාහු මහණහු ද ආරාධනය කළාහු වෙත් ද, මෙසෙයින් මේ මහබඹසර එ අඟින් පරිපූර්ණ වී.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොව්තුරු දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු වූහ. මහණහු ද ආරාධනය කළාහු වූහ. එතෙකුදු වත් මෙහෙණහු ආරාධනය කළාහු නො වූහු නම්, මෙසෙයින් මෙ මහබඹසර එ අඟින් අපරිපූර්ණ වූයේ යැ. යම් හෙයෙකින් වැළිත් භවත් ගෞතමයන් වහන්ස, මෙ දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු මහණහු ද සම්පාදනය කළාහු මෙහෙණහු ද සම්පාදනය කළාහු වෙත් ද, මෙසෙයින් මෙ මහබඹසර එ අඟින් පරිපූර්ණ විය.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස, භික්ඛූ ච ආරාධකා අභවිංසු, භික්ඛුනියො ච ආරාධිකා අභවිංසු, නො ච ඛො උපාසකා ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා අභවිංසු, එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො, භික්ඛූ ච ආරාධකා, භික්ඛුනියො ච ආරාධිකා, උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා, එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස, භික්ඛූ ච ආරාධකා අභවිංසු, භික්ඛුනියො ච ආරාධිකා අභවිංසු, උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා අභවිංසු, නො ච ඛො උපාසකා ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා අභවිංසු, එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො, භික්ඛූ ච ආරාධකා, භික්ඛුනියො ච ආරාධිකා, උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා උපාසකා ච ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා, එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස, භික්ඛූ ච ආරාධකා අභවිංසු, භික්ඛුනියො ච ආරාධිකා අභවිංසු, උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා අභවිංසු, උපාසකා ච ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා අභවිංසු, නො ච ඛො උපාසිකා ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො ආරාධිකා අභවිංසු, එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො භික්ඛූ ච ආරාධකා භික්ඛුනියො ච ආරාධිකා උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා උපාසකා ච ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා උපාසිකා ච ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො ආරාධිකා, එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

සචෙ හි භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො අභවිස්ස, භික්ඛූ ච ආරාධකා අභවිංසු, භික්ඛුනියො ච ආරාධිකා අභවිංසු, උපාසකා ච ගිහී ඔදාතවසකා බ්‍රහ්මචාරිනො ආරාධකා අභවිංසු, උපාසකා ච ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා අභවිංසු, උපාසිකා ච ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො ආරාධිකා අභවිංසු, නො ච ඛො උපාසිකා ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො ආරාධිකා අභවිංසු, එවමිදං බ්‍රහ්මචරියං අපරිපූරං අභවිස්ස තෙනඞ්ගෙන. යස්මා ච ඛො භො ගොතම ඉමං ධම්මං භවඤ්චෙව ගොතමො ආරාධකො භික්ඛූ ච ආරාධකා භික්ඛුනියො ච ආරාධිකා උපාසකා ච ගිහී ඔදාතවසනා බ්‍රහ්මචාරිනො ආරාධකා උපාසකා ච ගිහී ඔදාතවසනා කාමභොගිනො ආරාධකා උපාසිකා ච ගිහිනියො ඔදාතවසනා බ්‍රහ්මචාරිණියො ආරාධිකා උපාසිකා ච ගිහිනියො ඔදාතවසනා කාමභොගිනියො ආරාධිකා. එවමිදං බ්‍රහ්මචරියං පරිපූරං තෙනඞ්ගෙන.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොවුතුරු දහම භවත් ගෞතමයන් වහන්සේ සම්පාදනය කළාහු වූහ. මහණහු ද සම්පාදනය කළාහු වූහ. මෙහෙණහු ද සම්පාදනය කළාහු වූහ. එතෙකුදු වත් ගිහිගෙවැසි හෙළපිළී හඳනා බ්‍රහ්මචාරීඋපාසකයෝ සම්පාදක නො වූහු නම් මෙසෙයින් මෙ මහබඹසර එ අඟින් අපරිපූර්ණ විය. යම් හෙයෙකින් වැළිත් භවත් ගෞතමයන් වහන්ස, මෙ දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු මහණහු ද සම්පාදනය කළාහු මෙහෙණහු ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා බ්‍රහ්මචාරී උපාසකයෝ ද සම්පාදනය කළාහු වෙත් ද, මෙසෙයින් මෙ මහබඹසර එ අඟින් පරිපූර්ණ විය.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොවුතුරුදහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු වූහ. මහණහු ද සම්පාදනය කළාහු වූහ. මෙහෙණහු ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා බ්‍රහ්මචාරී උවසුවෝ ද සම්පාදනය කළාහු වූහ. එතෙකුදු වත් ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභොගී උවසුවෝ සම්පාදක නො වූහු නම් මෙසෙයින් මෙ බඹසර එ අඟින් අපරිපූර්ණ වූයේ යැ. යම් හෙයෙකින් වැළිත් භවත් ගෞතමයන් වහන්ස, මෙ දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු මහණහු ද සම්පාදනය කළාහු මෙහෙණහු ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසරවස් ඇති උවසුවෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභෝගී උවසුවෝ ද සම්පාදනය කළාහු වෙත් ද, මෙ සෙයින් මෙ බඹසර පරිපූර්ණ විය.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොවුතුරු දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු වූහ. මහණහු ද සම්පාදනය කළාහු වූහ. මෙහෙණහු ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභෝගී උවසුවෝ ද සම්පාදනය කළාහු වූහ. එතෙකුදු වත් ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවැසියෝ (මෙදහම) සම්පාදනය කළාහු නො වූහු නම් මෙසෙයින් මෙ බඹසර ඒ අඟින් අපරිපූර්ණ විය. යම් හෙයෙකින් වැළිත් භවත් ගෞතමයන් වහන්ස, මෙ දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු මහණහු ද සම්පාදනය කළාහු මෙහෙණහු ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභොගී උවසුවෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළි හඳනා බඹසර ඇති උවැසියෝ ද සම්පාදනය කළාහු වෙත් ද, මෙසෙයින් මෙ බඹසර එ අඟින් පරිපූර්ණ වී.

ඉදින් භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොවුතුරුදහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු වූහ. මහණහු ද සම්පාදනය කළාහු වූහ. මෙහෙණහු ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභොගී උවසුවෝ ද සම්පාදනය කළාහු වූහ. ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවැසියෝ ද සම්පාදනය කළාහු වූහ. එතෙකුදු වත් ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභොගී උවැසියෝ මෙදහම සම්පාදනය කළාහු නො වූහු නම් මෙ සෙයින් මෙ මහබඹසර එ අඟින් අපරිපූර්ණ විය. යම් හෙයෙකින් වැළිත් භවත් ගෞතමයන් වහන්ස, මෙ දහම භවත් ගෞතමයන් වහන්සේ ද සම්පාදනය කළාහු මහණහු ද සම්පාදනය කළාහු මෙහෙණහු ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවසුවෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභෝගී උවසුවෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා බඹසර ඇති උවැසියෝ ද සම්පාදනය කළාහු ගිහිගෙවැසි හෙළපිළී හඳනා කාමභොගී උවැසියෝ ද සම්පාදනය කළාහු වෙත් ද, මෙසෙයින් මෙ මහබඹසර එ අඟින් පරිපූර්ණ වී.

19—කේ 13561 (11/72)

Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි භො ගොතම ගඞ්ගානදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා සමුද්දං ආහච්ච තිට්ඨති. එවමෙවායං භොතො ගොතමස්ස පරිසා සගහට්ඨපබ්බජිතා නිබ්බානනින්නා නිබ්බානපොණා නිබ්බානපබ්භාරා නිබ්බානං ආහච්ච තිට්ඨති. අභික්කන්තං—පෙ—එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

යො ඛො වච්ඡ අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං. සො චත්තාරො මාසෙ පරිවසති. චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති. චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං මං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති. අලත්ථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං.

අචිරූපසම්පන්නො ඛො පනායස්මා වච්ඡගොත්තො අද්ධමාසූපසම්පන්නො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා වච්ඡගොත්තො භගවන්තං එතදවොච: 'යාවතකං භන්තෙ සෙඛෙන ඤාණෙන සෙඛාය විජ්ජාය පත්තබ්බං, අනුප්පත්තං තං මයා උත්තරිං[1] මෙ භගවා ධම්මං දෙසෙතූ'ති. තෙන හි ත්වං වච්ඡ, ද්වෙ ධම්මෙ උත්තරිං[1] භාවෙහි, සමථඤ්ච විපස්සනඤ්ච. ඉමෙ ඛො තෙ වච්ඡ ද්වෙ ධම්මා උත්තරිං[1] භාවිතා, සමථො ච විපස්සනා ච. අනෙකධාතුපටිවෙධාය සංවත්තිස්සන්ති. සො ත්වං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි, අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං, එකොපි හුත්වා බහුධා අස්සං, බහුධාපි හුත්වා එකො අස්සං, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි ආකාසෙ පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරෙය්‍යං සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභෙජ්ජමානෙ[2] ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි පථවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමෙය්‍යං සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසෙය්‍යං, පරිමජ්ජෙය්‍යං, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍ය'න්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙ.

සො ත්වං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි: දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණෙය්‍යං, දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ චාති තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙ.

---

1. උත්තරි - මජසං.
2. අභෙජ්ජමානො - සීමු.

යම්සේ භවත් ගෞතමයන් වහන්ස, ගඞ්ගානදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා මුහුද පැහැර සිටී ද, එසෙයින් මැ භවත් ගෞතමයන් වහන්සේගේ මේ පිරිස ගිහිපැවිද්දන් සහිත වූවා නිවනට නම්න වැ නිවනට නැඹුරු වැ නිවනට බර වැ නිවන පැහැර සිටී. ඉතා කාන්ත යැ . . . . ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ කෙරෙහි පැවිද්ද ලබන්නෙම් මැනැවැ, උපසපුව ලබන්නෙම් මැනැවැ'යි.

වත්සය, අන්තොටුවිරු යමෙක් මෙසස්නෙහි පැවිද්ද කැමැති වේ ද මහලුපැවිද්ද කැමැති වේ ද, හෙ සාර මසක් පිරිවෙස් වසයි. සාරමසක්හුගේ ඇවෑමෙන් තුටුයිත් ඇති මහණහු ඔහු පැවිදි කෙරෙති, භික්ෂුභාවය පිණිස මහලුපැවිදි කෙරෙති. එතෙකුදු වත් මෙහි ලා මා විසින් පුද්ගල නානාත්වය දන්නාලදැ'යි.

ඉදින් වහන්ස, පෙර අන්‍යතීර්ථික වූවාහු මෙ සස්නෙහි පැවිදි කැමැත්තාහු මහලුපැවිදි කැමැත්තාහු සාරමසක් පිරිවෙස් වසත් ද, සාරමසක්හුගේ ඇවෑමෙන් තුටුයිත් ඇති මහණහු ඔවුන් පැවිදි කෙරෙත් ද, භික්ෂුභාවය පිණිස මහලුපැවිදි කෙරෙත් ද, මම් සතර හවුරුද්දක් පිරිවෙස් වසමි, සතර හවුරුද්දක් ඇවෑමෙන් තුටුයිත් ඇති මහණහු (මා) පැවිදි කෙරෙත්වා, භික්ෂුභාවය පිණිස මහලුපැවිදි කෙරත්ව'යි.

වත්සගොත්‍ර පරිව්‍රාජක භාග්‍යවතුන් කෙරෙහි පැවිදි ලද, මහලුපැවිදි ලත්. යළි උපසපන් නො බෝකල් ඇති ආයුෂ්මත් වත්සගොත්‍ර උපසපන් අඩමස් ඇතියේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ආයුෂ්මත් වත්සගොත්‍ර භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ කී : ''වහන්ස, ශෛක්ෂඥානයෙන් ශෛක්ෂවිද්‍යායෙන් යම් පමණ ලදයුතු නම් මා විසින් එය ලබන ලද. මත්තෙහි (ඵලප්‍රාප්තිය පිණිස) මට භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනසේක්ව''යි. එසේ වී නම් වත්සය, තෙපි මත්තෙහි ශමථය ද විදර්ශනාව ද යන දෙ දහම වඩව. වත්සය, තොප විසින් ශමථය ද, විදර්ශනාව ද යන මේ දෙදහම්හු වඩනාලද්දහු අනේකධාතු ප්‍රතිවේධය පිණිස පවතිත්. වත්සය, තෙපි යම්තාක් කැමැත්තහු නම් : ''නන්වැදෑරුම් සෘද්ධිවිධ අනුභව කරන්නෙම්, එකක් වැ ද බහුප්‍රකාර වන්නෙමි, බහුප්‍රකාර වැ ද එකෙක් වන්නෙමි. ආවිර්භාවයට තිරොභාවයට යන්නෙමි, බිත්සරස පවුරුසරස පර්වත සරස අහස්හි මෙන් නො ගැටෙමින් යන්නෙමි, පොළොවහිදු දියෙහි මෙන් ගැලීම් නැඟීම් කරන්නෙමි, නො බිඳෙන දියෙහිදු පොළොවහි මෙන් යන්නෙමි, අහස්හිදු පක්ෂීන් සෙයින් පලගින් යන්නෙමි, මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මෙ සඳහිරු දෙදෙනා ද අතින් පිරිමසන්නෙමි, පිරිමදින්නෙමි, බඹලොව හිම් කොට කයින් වශයෙහි පවත්වන්නෙමි''යි. කැමැත්තහු නම් ඒ ඒ තන්හි මැ කරුණ ඇති වත් මැ සාක්ෂ්‍ය විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යැ.

වත්සය, තෙපි කැමැත්තහු නම්; 'මිනිස්බව ඉක්ම සිටි විශුද්ධ වූ දිව්‍යශ්‍රොත්‍රධාතුයෙන් දුරු වූ හෝ ළඟ වූ හෝ දිව්‍ය වූත් මානුෂික වූත් උභය ශබ්දයන් ශ්‍රවණය කරන්නෙමි'යි කැමැත්තහු නම් ඒ ඒ තන්හි මැ කරුණු ඇති වත් මැ සාක්ෂ්‍ය විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යැ.

සො එවං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි: පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානෙය්‍යං. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යං, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානෙය්‍යං, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානෙය්‍යං, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානෙය්‍යං, සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානෙය්‍යං, වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානෙය්‍යං, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානෙය්‍යං, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානෙය්‍යං, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානෙය්‍යං, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානෙය්‍යං, ස උත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානෙය්‍යං, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානෙය්‍යං, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානෙය්‍යං, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානෙය්‍යං, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානෙය්‍යං, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙ.

සො එවං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි: අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවන්නාමො එවඞ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවඞ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙ.

සො එවං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි: දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යං, ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන[1] භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙ.

1. ඉමෙ වත - සීමු.

Free Distribution www.aathaapi.org

වත්සය, තෙපි යම් තාක් කැමැත්තහු නම්: ''පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දැනගන්නෙමි, සරාග(රාග සහිත) සිත ද 'සරාග සිතැ'යි දැනගන්නෙමි, වීතරාග (පහ වූ රාග ඇති) සිත ද 'වීතරාග සිතැ'යි දැනගන්නෙමි, සදෙස සිත ද 'සදෙස සිතැ'යි දැනගන්නෙමි, වීතදෙස සිත ද 'වීතදෙස සිතැ'යි දැනගන්නෙමි, සමෝහ සිත ද 'සමෝහ සිතැ'යි දැනගන්නෙමි, වීතමෝහ සිත ද 'වීතමෝහ සිතැ'යි දැනගන්නෙමි, සංක්ෂිප්ත සිත ද 'සංක්ෂිප්ත සිතැ'යි දැනගන්නෙමි, වික්ෂිප්ත සිත ද 'වික්ෂිප්ත සිතැ'යි දැනගන්නෙමි, මහද්ගත සිත ද 'මහද්ගත සිතැ'යි දැනගන්නෙමි, මහද්ගත නො වූ සිත ද 'මහද්ගත නො වූ සිතැ'යි දැනගන්නෙමි, සඋත්තර සිත ද 'සඋත්තර සිතැ'යි දැනගන්නෙමි, අනුත්තර සිත ද 'අනුත්තර සිතැ'යි දැනගන්නෙමි, සමාහිත සිත ද 'සමාහිත සිතැ'යි දැනගන්නෙමි, සමාහිත නො වූ සිත ද 'සමාහිත නො වූ සිතැ'යි දැනගන්නෙමි, විමුක්ත සිත ද 'විමුක්ත සිතැ'යි දැනගන්නෙමි, විමුක්ත නො වූ සිත ද 'විමුක්ත නො වූ සිතැ'යි දැනගන්නෙමි'යි කැමැත්තහු නම් ඒ ඒ තන්හි මැ කරුණු ඇති වත් මැ සාක්ෂ්‍ය විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යැ.

වත්සය, තෙපි යම්තාක් කැමැත්තහු නම්: 'නන්වැදෑරුම් වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කරන්නෙමි, හෙමෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සුවහසකුදු නොයෙක් සංවර්තකල්පයනුදු නොයෙක් විවර්තකල්පයනුදු නොයෙක් සංවර්තවිවර්තකල්පයනුදු අසුවල් තැන මෙබඳු නම් ඇති වීමි, මෙබඳු ගොත්‍ර ඇති වීමි, මෙබඳු පැහැසටහන් ඇති වීමි, මෙබඳු ආහාර ඇති වීමි, මෙබඳු සුවදුක්විඳුනාසුලු වීමි, මෙබඳු ආයුෂ්පර්‍ය්‍යන්ත ඇති වීමි, ඒ මම එයින් සැව අසුවල් තන්හි උපන්මි, එහිදු මෙබඳු නම් ඇති වීමි, මෙබඳු ගෝත්‍ර ඇති වීමි, මෙබඳු පැහැසටහන් ඇති වීමි, මෙබඳු ආහාර ඇති වීමි, මෙබඳු සුවදුක් විඳුනාසුලු වීමි, මෙබඳු ආයුෂ්පර්‍ය්‍යන්ත ඇති වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මි'යි. මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ නන්වැදෑරුම් පූර්වනිවාසය සිහි කරන්නෙමි''යි කැමැත්තහු නම් ඒ ඒ තන්හි මැ කරුණු ඇති වත් මැ සාක්ෂ්‍ය විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යැ.

වත්සය, තෙපි යම්තාක් මැ කැමැත්තහු නම් : ''මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිවැසින් සත්ත්වයන් : ච්‍යුත වනුවන් උපදනුවන් හීනයන් ප්‍රණීතයන් සුවර්‍ණයන් දුර්වර්‍ණයන් සුන්දරගති ඇතියන් දුර්ගති ඇතියන් දක්නෙමි, කර්මානුරූප වැ ගිය සත්ත්වයන් : 'මේ භවත් සත්ත්වයෝ එකාන්තෙන් කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්වාගතයහ, මනෝදුශ්චරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද කරනුවහ, මිථ්‍යාදෘෂ්ටි ඇතියහ ,මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇතියහ, ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයෙහි උපන්හ. මේ භවත් සත්ත්වයෝ එකාන්තෙන් කායසුචරිතයෙන් සමන්වාගතයහ, වාක්සුචරිතයෙන් සමන්වාගතයහ, මනස්සුචරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද නො කරනුවහ. සම්‍යග්දෘෂ්ටි ඇතියහ, සම්‍යග්දෘෂ්ටි කර්මසමාදාන ඇතියහ, ඔහු කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණියහ'යි දැනගන්නෙමි, මෙසේ මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිවැසින් සත්ත්වයන් : ච්‍යුත වනුවන් උපදනුවන් හීනයන් ප්‍රණීතයන් සුවර්‍ණයන් දුර්වර්‍ණයන් සුන්දර ගති ඇතියන් දුර්ගති ඇතියන් දක්නෙමි, කර්මානුරූප වැ ගිය සත්ත්වයන් දැනගන්නෙමි''යි කැමැත්තහු නම් ඒ ඒ තන්හි මැ කරුණු ඇති වත් මැ සාක්ෂ්‍ය විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යැ.

සො ත්වං වච්ඡ යාවදෙව ආකඞ්ඛිස්සසි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණිස්සසි සති සති ආයතනෙති.

අථ ඛො ආයස්මා වච්ඡගොත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො ආයස්මා වච්ඡගොත්තො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා වච්ඡගොත්තො අරහතං අහොසි.

තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවන්තං දස්සනාය ගච්ඡන්ති අද්දසා ඛො ආයස්මා වච්ඡගොත්තො තෙ භික්ඛූ දූරතොව ගච්ඡන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: හන්ද කහං පන තුම්හෙ ආයස්මන්තො ගච්ඡථා'ති භගවන්තං ඛො මයං ආවුසො දස්සනාය ගච්ඡාමාති. තෙන'හායස්මන්තො මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දථ, එවං ච වදෙථ. 'වච්ඡගොත්තො භන්තෙ භික්ඛු භගවතො පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති, පරිචිණ්ණො මෙ භගවා, පරිචිණ්ණො මෙ සුගතො'ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො වච්ඡගොත්තස්ස පච්චස්සොසුං. අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ආයස්මා භන්තෙ වච්ඡගොත්තො භගවතො පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති: පරිචිණ්ණො මෙ භගවා, පරිචිණ්ණො මෙ සුගතො'ති.

පුබ්බෙව මෙ භික්ඛවෙ වච්ඡගොත්තො භික්ඛු චෙතසා චෙතො පරිච්ච විදිතො. තෙවිජ්ජො වච්ඡගොත්තො භික්ඛු මහිද්ධිකො මහානුභාවො'ති. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසුං: තෙවිජ්ජො භන්තෙ වච්ඡගොත්තො භික්ඛු මහිද්ධිකො මහානුභාවො'ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාවච්ඡගොත්තසුත්තං තතියං

Free Distribution www.aathaapi.org

වත්සය, තෙපි යම්තාක් මැ කැමැත්තහු නම් : 'ආස්‍රවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඉහාත්මයෙහි මැ තමා විසින් දැන පසක් කොට උපදවා වාසය කරන්නෙමි'යි, ඒ ඒ තන්හි මැ කරුණු ඇතිවත් මැ සාක්ෂා විසින් භව්‍යතාවට පැමිණෙන්නහු යයි.

ඉක්බිති ආයුෂ්මත් වත්සගොත්‍ර භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු වැ අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී බුදුන් වැඳ පැදකුණු කොට නික්ම ගියේ යැ. ඉක්බිති ආයුෂ්මත් වත්සගොත්‍ර එකලා වූයේ (වස්තුකාම කෙලශකාමයෙන්) වෙන් වූයේ අප්‍රමත්ත (කමටහන්හි සිහි එළවූයේ) වූයේ කෙලෙසුන් තවන වැර ඇතියේ (කායජීවිත නිරපෙක්ෂ-තායෙන්) හළ අත්බැව් ඇති වැ වෙසෙමින් යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට මැ ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වෙත් ද ඒ අනුත්තර වූ බඹසරවස් කෙළවර වූ අර්හත්ඵලය නො බෝකලකින් මැ ඉහාත්මයෙහි මැ තමා විසින් දැන ප්‍රත්‍යක්ෂ කොට උපදවා විසී. ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලද, (සිවුමඟ) කරණී කරන ලද, මෙ බව පිණිස අනෙක් මාර්ගභාවනා කිසෙක් නැතැ'යි දැනගති. තවද ආයුෂ්මත් වත්සගොත්‍ර රහතුන් අතුරෙහි අන්‍යතරයෙක් වී.

එසමයෙහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නට යෙති. ආයුෂ්මත් වත්ස-ගොත්‍ර ඒ භික්ෂූන් යනුවත් දුරින් මැ දැක ඒ භික්ෂූන් කරා එළැඹියේ යැ. එළැඹ ඒ භික්ෂූන්ට තෙල කරුණ කී : "ආයුෂ්මත්නි, දන් තෙපි කොහි යවු ද"යි. ආයුෂ්මත්නි ඇපි භාග්‍යවතුන් දක්නට යම්හ'යි. එසේ වී නම් ආයුෂ්මත්නි, මාගේ වචනයෙන් භාග්‍යවතුන්ගේ පාසහළ මුදුනින් වඳිවු : "වහන්ස, වත්සගොත්‍ර මහණ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ මුදුනින් වඳී, මෙසේත් කියයි : 'මා විසින් බුදුහු (පරිචයනී විසින්) සෙවුනා ලදහ, මා විසින් සුගතයන් වහන්සේ සෙවුනාලදහ"යි වඳිවු. 'එසේ යැ ඇවැත්නි'යි ඒ මහණහු ආයුෂ්මත් වත්සගොත්‍රයනට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති ඒ මහණහු බුදුන් කරා එළැඹ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ මහණහු භාග්‍යවතුන්ට තෙල කරුණ සැලකළහ : "වහන්ස, ආයුෂ්මත් වත්සගොත්‍ර භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ මුදුනින් වඳී. මෙසේත් කියයි : 'මා විසින් භාග්‍යවතුන් වහන්සේ සෙවුනාලදහ, මා විසින් සුගතයන් වහන්සේ සෙවුනාලදහ"යි.

මහණෙනි, මා විසින් පළමු මැ වත්සගොත්‍ර මහණ සිතින් සිත පිරිසිඳ දත්නාලද යැ : "වත්සගොත්‍ර මහණ ත්‍රිවිද්‍යා ඇත්තේ යැ, මහත් සෘද්ධි ඇත්තේ යැ, මහත් අනුභාව ඇත්තේ යැ"යි. දෙවියෝ ද මට තෙල කරුණ දන්වූහ : "වහන්ස, වත්සගොත්‍ර මහණ ත්‍රිවිද්‍යා ඇත්තේ යැ මහත් සෘද්ධි ඇත්තේ යැ, මහත් අනුභාව ඇත්තේ යැ"යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දන කළහ'යි.

තුන් වැනි මහාවච්ඡගොත්ත සූත්‍ර යි.

---

2. 3. 4.

දීඝනඛ සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ සූකරඛතායං.[1] අථ ඛො දීඝනඛො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො දීඝනඛො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

අහං හි භො ගොතම එවං වාදී එවංදිට්ඨි, සබ්බං මෙ න ඛමතීති. යාපි ඛො තෙ එසා අග්ගිවෙස්සන දිට්ඨි සබ්බං මෙ න ඛමතීති, එසාපි තෙ දිට්ඨි න ඛමතීති. එසා චෙ මෙ භො ගොතම දිට්ඨි ඛමෙය්‍ය තම්පස්ස තාදිසමෙව, තම්පස්ස තාදිසමෙවාති. අතො ඛො තෙ අග්ගිවෙස්සන බහූහි බහුතරා ලොකස්මිං යෙ එවමාහංසු: තම්පස්ස තාදිසමෙව, තම්පස්ස තාදිසමෙවාති. තෙ තඤ්චෙව දිට්ඨිං නප්පජහන්ති, අඤ්ඤඤ්ච දිට්ඨිං උපාදියන්ති. අතො ඛො තෙ අග්ගිවෙස්සන තනූහි තනුතරා ලොකස්මිං යෙ එවමාහංසු: තම්පස්ස තාදිසමෙව, තම්පස්ස තාදිසමෙවාති. තෙ තඤ්චෙව දිට්ඨිං පජහන්ති, අඤ්ඤඤ්ච දිට්ඨිං න උපාදියන්ති.

සන්තග්ගිවෙස්සන එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො සබ්බං මෙ ඛමතී'ති. සන්තග්ගිවෙස්සන එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො සබ්බං මෙ න ඛමතී'ති. සන්තග්ගිවෙස්සන එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතීති.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො සබ්බං මෙ ඛමතී'ති. තෙසමයං දිට්ඨි සාරාගාය සන්තිකෙ සංයොගාය සන්තිකෙ අභිනන්දනාය සන්තිකෙ අජ්ඣොසානාය සන්තිකෙ උපාදානාය සන්තිකෙ.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො සබ්බං මෙ න ඛමතී'ති. තෙසමයං දිට්ඨි අසාරාගාය සන්තිකෙ අසං-යොගාය සන්තිකෙ අනභිනන්දනාය සන්තිකෙ අනජ්ඣොසානාය සන්තිකෙ අනුපාදානාය සන්තිකෙති.

එවං වුත්තෙ දීඝනඛො පරිබ්බාජකො භගවන්තං එතදවොච: උක්කංසති මෙ භවං ගොතමො දිට්ඨිගතං සමුක්කංසති මෙ භවං ගොතමො දිට්ඨිගත'න්ති.

1. ගිජ්ඣකූටෙ සූකරඛතායං - PTS

Free Distribution www.aathaapi.org

2. 3. 4

දීඝනඛ සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර නිසා ගිජ්ඣකූළපව්වෙහි සූකරඛත ලෙන්හි වැඩ වාසය කරන සේක. එකල්හි දීඝනඛ නම් පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් වැ සිටියේ යැ. එකත්පස් වැ සිටි දීඝනඛ පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණු කී :

භවත් ගෞතමයෙනි, මම් වූ කලි 'සියල්ල (උපත්) මට නො රුස්නේ යැ' යන මෙබඳු වාද ඇත්තෙමි, මෙබඳු දෘෂ්ටි ඇත්තෙමි'යි. ගිහිවෙස්න, තෙල 'සියල්ල මට නො රුස්නේ යැ' යන තොපගේ යම් දෘෂ්ටියක් ඇද්ද, තෙල දෘෂ්ටියත් තොපට නො රුස්නේ ද? යි. ඉදින් භවත් ගෞතමයෙනි, තෙල දෘෂ්ටිය මට රුස්නේ වී නම් එ (දෘෂ්ට්‍යර්පිය)ද එසේ මැ වන්නේ යැ, එ ද එසේ මැ වන්නේ යැ. (සර්වග්‍රහණයෙන් ගන්නා ලද නමුදු දෘෂ්ටිය රුචි වෙයි, එසෙයින් මැ දෘෂ්ට්‍යර්පියත් රුචි වේ යන අර්ථ යි.) ගිහිවෙස්න, ලොවැ (දෘෂ්ටි හැර පියන) යම් කෙනෙක් 'එ ද එබඳු මැ වන්නේ යැ, එ ද එබඳු මැ වන්නේ යැ'යි මෙසේ කියත් නම් (දෘෂ්ටි හැරපියන) ඔවුනට වඩා (දෘෂ්ටි නො හරනා) ඔහු මැ බොහෝහ, බහුතරයහ. ඔහු ඒ දෘෂ්ටිය ද නො හරිති, අන්‍යදෘෂ්ටියකුදු දැඩි වැ ගනිත්. ගිහිවෙස්න, ලොවැ දෘෂ්ටි නො හරනා යම් කෙනෙක් 'එ ද එබඳු මැ වන්නේ යැ, එ ද එබඳු මැ වන්නේ යැ'යි මෙසේ කියත් නම් (දෘෂ්ටි නො හරනා) ඔවුනට වඩා (දෘෂ්ටි හැරපියන) ඔහු මැ අල්පයහ, අල්පතරයහ. ඔහු ඒ දෘෂ්ටිය ද හැරපියති, අන්‍යදෘෂ්ටියකුදු උපාදන නො කෙරෙති.

ගිහිවෙස්න, 'සියල්ල මට රුස්නේ යැ' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණෝ ඇත, ගිහිවෙස්න, 'සියල්ල මට නො රුස්නේ යැ' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණෝ ඇත. ගිහිවෙස්න, 'ඇතැම් ප්‍රතිසන්ධියක් මට රුස්නේ යැ, ඇතැම් ප්‍රතිසන්ධියක් මට නො රුස්නේ යැ' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණෝ ඇති.

ගිහිවෙස්න, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් : 'සියල්ල මට රුස්නේ යැ' යන මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුන්ගේ මේ දෘෂ්ටිය සංරාගයට ආසන්න යැ, සංයෝජනයට ආසන්න යැ, (තෘෂ්ණාදෘෂ්ටි) අභිනන්දනයට ආසන්න යැ, අධ්‍යවසානය (ගිලගැනීම)ට ආසන්න යැ. උපාදනය(දෘඪග්‍රහණ)යට ආසන්න යැ. එහි ලා ගිහිවෙස්න, යම් මහණබමුණු කෙනෙක් ''සියල්ල මට නො රුස්නේ යැ'යන මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුන්ගේ මේ දෘෂ්ටිය අසංරාගයට ආසන්න යැ, අසංයෝජනයට ආසන්න යැ (තෘෂ්ණාදෘෂ්ටි විසින්) අනභිනන්දනයට ආසන්න යැ, අනධ්‍යවසානයට ආසන්න යැ, අනුපාදනයට ආසන්න යැ යි.

මෙසේ වදළ කල්හි දීඝනඛ පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ කී : ''භවත් ගෞතමයෝ මාගේ දෘෂ්ටිය උත්කර්ෂ කෙරෙති භවත් ගෞතමයෝ මාගේ දෘෂ්ටිය මැනැවින් උත්කර්ෂ කෙරෙති''යි.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතී'ති. යා හි ඛො තෙසං ඛමති සායං දිට්ඨි සාරාගාය සන්තිකෙ සංයොගාය සන්තිකෙ අභිනන්දනාය සන්තිකෙ අජ්ඣොසානාය සන්තිකෙ උපාදානාය සන්තිකෙ. යාහි ඛො තෙසං න ඛමති සායං දිට්ඨි අසාරාගාය සන්තිකෙ අසංයොගාය සන්තිකෙ අනභිනන්දනාය සන්තිකෙ අනජ්ඣොසානාය සන්තිකෙ අනුපාදානාය සන්තිකෙ.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො සබ්බං මෙ ඛමතී'ති. තත්‍ර විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: යා ඛො මෙ අයං දිට්ඨි සබ්බං මෙ ඛමතී'ති. ඉමඤ්චෙව අහං දිට්ඨිං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරෙය්‍යං: ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති. ද්වීහි මෙ අස්ස විග්ගහො. යො චායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: සබ්බං මෙ න ඛමතීති. යොචායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතී'ති. ඉමෙහි මෙ අස්ස ද්වීහි විග්ගහො, ඉති විග්ගහෙ සති විවාදො, විවාදෙ සති විඝාතො, විඝාතෙ සති විහෙසා. ඉති සො විග්ගහඤ්ච විවාදඤ්ච විඝාතඤ්ච විහෙසඤ්ච අත්තනි සම්පස්සමානො තඤ්චෙව දිට්ඨිං පජහති. අඤ්ඤඤ්ච දිට්ඨිං න උපාදියති. එවමෙතාසං දිට්ඨීනං පහානං හොති. එවමෙතාසං දිට්ඨීනං පටිනිස්සග්ගො හොති.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'සබ්බං මෙ න ඛමතී'ති. තත්‍ර විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: යා ඛො මෙ අයං දිට්ඨි 'සබ්බං මෙ න ඛමතී'ති. ඉමඤ්චෙව අහං දිට්ඨිං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරෙය්‍යං: 'ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති. ද්වීහි මෙ අස්ස විග්ගහො. යො චායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: 'සබ්බං මෙ ඛමතී'ති. යො චායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: 'එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතී'ති. ඉමෙහි මෙ අස්ස ද්වීහි විග්ගහො, ඉති විග්ගහෙ සති විවාදො, විවාදෙ සති විඝාතො, විඝාතෙ සති විහෙසා. ඉති සො විග්ගහඤ්ච විවාදඤ්ච විඝාතඤ්ච විහෙසඤ්ච අත්තනි සම්පස්සමානො තඤ්චෙව දිට්ඨිං පජහති. අඤ්ඤඤ්ච දිට්ඨිං න උපාදියති. එවමෙතාසං දිට්ඨීනං පහානං හොති. එවමෙතාසං දිට්ඨීනං පටිනිස්සග්ගො හොති.

තත්‍රග්ගිවෙස්සන යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො: 'එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතී'ති. තත්‍ර විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති. යා ඛො මෙ අයං දිට්ඨි: එකච්චං මෙ ඛමති, එකච්චං මෙ න ඛමතීති. ඉමඤ්චෙව අහං දිට්ඨිං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරෙය්‍යං: 'ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති. ද්වීහි මෙ අස්ස විග්ගහො, යො චායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: 'සබ්බං මෙ ඛමතී'ති. යො චායං සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී එවංදිට්ඨී: 'සබ්බං මෙ න ඛමතී'ති. ඉමෙහි මෙ අස්ස ද්වීහි විග්ගහො, ඉති විග්ගහෙ සති විවාදො, විවාදෙ සති විඝාතො, විඝාතෙ සති විහෙසා. ඉති සො විග්ගහඤ්ච විවාදඤ්ච විඝාතඤ්ච විහෙසඤ්ච අත්තනි සම්පස්සමානො තඤ්චෙව දිට්ඨිං පජහති, අඤ්ඤඤ්ච දිට්ඨිං න උපාදියති. එවමෙතාසං දිට්ඨීනං පහානං හොති, එවමෙතාසං දිට්ඨීනං පටිනිස්සග්ගො හොති.

Free Distribution www.aathaapi.org

ගිනිවෙස්න, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් : ''ඇතැම් ප්‍රතිසන්ධියක් මට රුස්නේ යැ, ඇතැම් ප්‍රතිසන්ධියක් මට නො රුස්නේ යැ'' යන මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, යම් දෘෂ්ටියක් ඔවුනට රුස්නේ ද, ඒ මේ දෘෂ්ටිය සංරාගයට ආසන්න යැ, සංයෝජනයට ආසන්න යැ, අභිනන්දනාවට ආසන්න යැ, අධ්‍යවසානයට ආසන්න යැ, උපාදානයට ආසන්න යි. යම් දෘෂ්ටියක් ඔවුනට නො රුස්නේ නම් ඒ මේ දෘෂ්ටිය අසංරාගයට ආසන්න යැ, අසංයෝජනයට ආසන්න යැ, අනභිනන්දනාවට ආසන්න යැ, අනධ්‍යවසානයට ආසන්න යැ, අනුපාදානයට ආසන්න යි.

ගිනිවෙස්න, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් 'සියල්ල (හැම ප්‍රතිසන්ධිය) මට රුස්නේ යැ' යන මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුනතුරෙහි නුවණැති පුරුෂයෙක් මෙසේ නුවණින් සලකයි : ''මාගේ මේ 'සියල්ල මට රුස්නේ යැ' යන යම් දෘෂ්ටියක් ඇද්ද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වැ පරාමර්ශ කොට ගෙන අභිනිවෙශ කොට ගෙන 'මේ මැ සත්‍ය යැ අන්‍යය තුච්ඡ යැ'යි කියන්නෙම් නම් මට දෙදෙනකුන්ගෙන් කලහ වන්නේ යැ : 'සියල්ල මට නො රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් ඇද්ද, 'සමහරක් මට රුස්නේ යැ, සමහරක් මට නො රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් ඇද්ද, මෙ දෙදෙනාගෙන් මට කලහ වන්නේ යැ. මෙසේ කලහ ඇති කල්හි විවාද වෙයි, විවාද ඇති කල්හි දුක් වෙයි, දුක් ඇති කල්හි වෙහෙස වේ. මෙසෙයින් හේ කලහයත් විවාදයත් දුකත් වෙහෙසත් තමා කෙරෙහි දක්මින් එ මැ දෘෂ්ටියත් හැරපියයි, අන්‍යදෘෂ්ටියකුදු නො ගනී. මෙසෙයින් තෙල දෘෂ්ටීන්ගේ ප්‍රහාණය වෙයි, මෙසෙයින් තෙල දෘෂ්ටීන්ගේ දුරැලීම වේ.

ගිනිවෙස්න, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් : 'සියල්ල මට නො රුස්නේ යැ' යන මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුනතුරෙහි නුවණැති පුරුෂයෙක් මෙසේ නුවණින් සලකයි : ''මාගේ මේ 'සියල්ල මට නො රුස්නේ යැ' යන යම් දෘෂ්ටියක් ඇද්ද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වැ පරාමර්ශ කොට ගෙන අභිනිවෙශ කොට ගෙන 'මේ මැ සත්‍ය යැ, අන්‍යය තුච්ඡ යැ'යි කියන්නෙම් නම් මට දෙදෙනකුන් ගෙන් කලහ වන්නේ යැ : 'සියල්ල මට රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් ඇද්ද, 'සමහරක් මට රුස්නේ යැ; සමහරක් මට නො රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් ඇද්ද, මේ දෙදෙනාගෙන් මට කලහ වන්නේ යැ, මෙසේ කලහ ඇති කල්හි විවාද වෙයි, විවාද ඇති කල්හි දුක් වෙයි, දුක් ඇති කල්හි වෙහෙස වේ. මෙසෙයින් හේ කලහයත් විවාදයත් දුකත් වෙහෙසත් තමා කෙරෙහි දකිමින් එ මැ දෘෂ්ටියත් හැරපියයි, අන්‍යදෘෂ්ටියකුත් නො ගනී. මෙසෙයින් තෙල දෘෂ්ටීන්ගේ ප්‍රහාණය වෙයි, මෙසෙයින් තෙල දෘෂ්ටීන්ගේ දුරැලීම වේ.

ගිනිවෙස්න, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක්; 'සමහරක් මට රුස්නේ යැ, සමහරක් මට නො රුස්නේ යැ'යන මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුන් කෙරෙහි නුවණැති පුරුෂයෙක් මෙසේ නුවණින් සලකයි : 'සමහරක් මට රුස්නේ යැ, සමහරක් මට නො රුස්නේ යැ' යන මාගේ යම් දෘෂ්ටියක් වේ ද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වැ පරාමර්ශ කොට ගෙන අභිනිවෙශ කොට ගෙන 'මේ මැ සත්‍යයැ, අන්‍යය තුච්ඡ යැ'යි කියන්නෙම් නම්, දෙදෙනකුන්ගෙන් මට කලහ වන්නේ යැ :'සියල්ල මට රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් වේ ද, 'සියල්ල මට නො රුස්නේ යැ' යන මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙකුත් වේ ද, මෙදෙදෙනාගෙන් මට කලහ වන්නේ යැ. මෙසෙයින් කලහ ඇති කල්හි විවාද වෙයි, විවාද ඇති කල්හි දුක් වෙයි, දුක් ඇති කල්හි වෙහෙස වේ. මෙසෙයින් හේ කලහයත් විවාදයත් දුකත් වෙහෙසත් තමා කෙරෙහි දකිමින් ඒ දෘෂ්ටියත් හැරපියයි, අන්‍යදෘෂ්ටියකුදු නො ගනී. මෙසේ තෙල දෘෂ්ටීන්ගේ ප්‍රහාණය වෙයි, මෙසේ තෙල දෘෂ්ටීන්ගේ දුරැලීම වේ.

අයං ඛො පනග්ගිවෙස්සන කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො, අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සිතබ්බො. තස්සිමං කායං අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සතො යො කායස්මිං කායච්ඡන්දො කායස්නෙහො කායන්වයතා සා පහීයති.

තිස්සො ඛො ඉමා අග්ගිවෙස්සන වෙදනා: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. යස්මිං අග්ගිවෙස්සන සමයෙ සුඛං වෙදනං වෙදෙති. නෙව තස්මිං සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති. න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, සුඛංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. යස්මිං අග්ගිවෙස්සන සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති, නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති, න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, දුක්ඛංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. යස්මිං අග්ගිවෙස්සන සමයෙ අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති, න දුක්ඛං වෙදනං වෙදෙති. අදුක්ඛමසුඛංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති.

සුඛාපි ඛො අග්ගිවෙස්සන වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, දුක්ඛාපි ඛො අග්ගිවෙස්සන වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, අදුක්ඛමසුඛාපි ඛො අග්ගිවෙස්සන වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා, වයධම්මා, විරාගධම්මා, නිරොධධම්මා.

එවං පස්සං අග්ගිවෙස්සන සුතවා අරිය සාවකො සුඛායපි වෙදනාය නිබ්බින්දති, දුක්ඛායපි වෙදනාය නිබ්බින්දති, අදුක්ඛමසුඛායපි වෙදනාය නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන භික්ඛු න කෙනචි සංවදති. න කෙනචි විවදති. යඤ්ච ලොකෙ වුත්තං තෙනෙව වොහරති අපරාමසන්ති.

තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො භගවතො පිට්ඨිතො ඨිතො හොති භගවන්තං වීජයමානො.[1] අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: තෙසං තෙසං කිර නො භගවා ධම්මානං අභිඤ්ඤා පහාණමාහ. තෙසං තෙසං කිර නො සුගතො ධම්මානං අභිඤ්ඤා පටිනිස්සග්ගමාහාති. ඉති'හිදං ආයස්මතො සාරිපුත්තස්ස පටිසඤ්චික්ඛතො අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. දීඝනඛස්ස පන පරිබ්බාජකස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්මන්ති.

---

1. වීජමානො - PTS.

තවද ගිනිවෙස්න, මෙ කය රූපවත් වූයේ සතර මහාභූතයෙන් නිපන්නේ මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් සම්භව වූයේ බතින් කොමුයෙන් වැඩුණේ අනිත්‍යස්වභාව ඇතියේ ඉලීම පිරිමැදීම බිඳීම විසිරීම පියවි කොට ඇතියේ අනිත්‍ය විසින් දුඃඛ විසින් රෝග විසින් ගණ්ඩ (ගඩු) විසින් ශල්‍ය විසින් අඝ(දුඃඛස්වභාව) විසින් ආබාධ විසින් පර (තමා අයත් නැති) විසින් නැසෙන විසින් ශූන්‍ය විසින් අනාත්ම විසින් දක්කයුත්තේ යැ. ඔහු මෙ කය අනිත්‍ය විසින් දුඃඛ විසින් රොග විසින් ගණ්ඩ විසින් ශල්‍ය විසින් අඝ විසින් ආබාධ විසින් පර විසින් නැසෙන විසින් ශූන්‍ය විසින් අනාත්ම විසින් දක්නාහට කයෙහි යම් කාය තෘෂ්ණාවක් කායස්නෙහයෙක් කායන්වය (කයඅනුවයන) බවෙක් වේ ද, ඒ ප්‍රහීණ වෙයි.

ගිනිවෙස්න, මෙ තුන් වේදනායෙක් ඇත : සුඛවේදනා යැ දුඃඛවේදනා යැ උපෙක්ෂා වේදනා යි. ගිනිවෙස්න, යම් කලෙකැ සුඛවේදනාව විඳී ද, එසමයෙහි දුඃඛවේදනාව නො මැ විඳී, උපෙක්ෂාවේදනාව නො මැ විඳී, එසමයෙහි සුඛවේදනාව මැ විඳී. ගිනිවෙස්න, යම් කලෙකැ දුඃඛවේදනාව විඳී ද, එසමයෙහි සුඛවේදනාව නො මැ විඳී, උපෙක්ෂාවේදනාව නො මැ විඳී, එසමයෙහි දුඃඛවේදනාව මැ විඳී. ගිනිවෙස්න, යම් කලෙකැ උපෙක්ෂාවේදනාව විඳී ද, එසමයෙහි සුඛවේදනාව නො මැ විඳී, දුඃඛවේදනාව නො මැ විඳී, එසමයෙහි උපේක්ෂාවෙදනාව මැ විඳී.

ගිනිවෙස්න, සුඛවේදනා ද අනිත්‍ය යැ ප්‍රත්‍යයන් එක් වැ කරනලද යැ, ප්‍රත්‍යයන් නිසා උපන, ක්ෂයස්වභාව ඇත ව්‍යයස්වභාව ඇත විරාගස්වභාව ඇත, නිරෝධස්වභාව ඇත. ගිනිවෙස්න, දුඃඛවේදනා ද අනිත්‍ය යැ ප්‍රත්‍යයන් එක් වැ කරනලද යැ ප්‍රත්‍යයන් නිසා උපන, ක්ෂයස්වභාව ඇත, ව්‍යයස්වභාව ඇත, විරාගස්වභාව ඇත, නිරෝධස්වභාව ඇත. උපෙක්ෂාවේදනා ද ගිනිවෙස්න, අනිත්‍ය යැ ප්‍රත්‍යයන් එක් වැ කරන ලද යැ, ප්‍රත්‍යයන් නිසා උපන, ක්ෂයස්වභාව ඇත. ව්‍යයස්වභාව ඇත. විරාගස්වභාව ඇත. නිරෝධ ස්වභාව ඇත.

ගිනිවෙස්න, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක සුඛවේදනායෙහි දු කලකිරයි, දුඃඛ වේදනායෙහි දු කලකිරෙයි, උපෙක්ෂාවේදනායෙහි දු කලකිරෙයි. කලකිරුණේ විරක්ත (නො ඇලුණේ) වෙයි, විරාගයෙන් විමුක්ත වෙයි, විමුක්ත කල්හි 'විමුක්තයෙමි' යන ඥනය වෙයි, ජාතිය ගෙවිණ, මහබඹසර වැස නිමවන ලද, (සිවුමඟ) කරණී කරනලද, මෙබව පිණිස අන් කිසෙක් නැතැ'යි දැනගනී. මෙසෙයින් ගිනිවෙස්න, විමුක්තසිත් ඇති මහණ කිසිවකු සමග සංවාද නො කෙරෙයි, කිසිවකු සමග විවාද නො කෙරෙයි, ලොවැ යමක් කියන ලද නම් පරාමර්ෂ නැති වැ එයින් මැ ව්‍යවහාර කෙරෙයි.

එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් පිටිපසැ භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියාහු වෙති. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේට මෙසිත විය : ''භාග්‍යවතුන් වහන්සේ අපට ඒ ඒ ධර්මයන් ප්‍රඥයෙන් දැන ප්‍රහාණය වදළහ, සුගතයන් වහන්සේ අපට ඒ ඒ ධර්මයන් නුවණින් දැන දුරලීම වදළහ''යි. මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නා වූ ආයුෂ්මත්ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ සිත උපාදාන රහිත කොට ආශ්‍රවයන් කෙරෙන් මිදිණ. දීඝනඛපරිව්‍රාජකයන්ට කෙලෙස් රජස් රහිත වූ පහ වූ කෙලෙස්මල ඇති දහම් ඇස උපන : ''යම් කිසි ප්‍රත්‍යයොත්පන්නධර්මයෙක් ඇද්ද, එහැම නිරුද්ධ වන පියවි ඇතැ''යි.

අථ ඛො දීඝනඛො පරිබ්බාජකො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථඞ්කථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච:

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

දීඝනඛසුත්තං චතුත්ථං.

Free Distribution www.aathaapi.org

ඉක්බිති දීඝනඛ පරිව්‍රාජක දුටු දහම් ඇතියේ පත් දහම් ඇතියේ පිළිවිදි දහම් ඇතියේ බැසගත් දහම් ඇතියේ තරණය කළ විචිකිත්සා ඇතියේ පහ වූ සැක ඇතියේ විශාරද බවට පැමිණියේ ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූයේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය :

''ඉතා මැනැව භවත් ගෞතමයෙනි, ඉතා මැනැව භවත් ගෞතමයෙනි, යම්සේ භවත් ගෞතමයෙනි, යටිකුරු කරනලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, පිළිසන් වූවක් විවර කරන්නේ හෝ වේ ද, මුළා වූවක්හට මග පවසන්නේ හෝ වේ ද, ඇස් ඇත්තාහු රූප දකිත්වා'යි අඳුරෙහි තෙල්පහනක් හෝ දල්වන්නේ ද, එසෙයින් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් පවසනලද. මෙසේ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද සඞ්ඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට ධරනසේක්වා'යි.

සිව් වැනි දීඝනඛ සූත්‍ර යි.

2. 3. 5

මාගන්දිය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං[1] නාම කුරූනං නිගමො භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස අග්‍යාගාරෙ තිණසන්ථරකෙ[2]. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කම්මාසදම්මං[1] පිණ්ඩාය පාවිසි. කම්මාසදම්මෙ[1] පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙනඤ්ඤතරො වනසණ්ඩො තෙනුපසඞ්කමි දිවාවිහාරාය. තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො මාගන්දියො[3] පරිබ්බාජකො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස අග්‍යාගාරං තෙනුපසඞ්කමි. අද්දසා ඛො මාගන්දියො පරිබ්බාජකො භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස අග්‍යාගාරෙ තිණසන්ථරකං[2] පඤ්ඤත්තං, දිස්වාන භාරද්වාජගොත්තං බ්‍රාහ්මණං එතදවොච: 'කස්ස න්වයං භොතො භාරද්වාජස්ස අග්‍යාගාරෙ තිණසන්ථරකො පඤ්ඤත්තො. සමණසෙය්‍යා-රූපං මඤ්ඤෙති.

අත්ථි භො මාගන්දිය සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තස්සෙසා භොතො ගොතමස්ස සෙය්‍යා පඤ්ඤත්තාති. දුද්දිට්ඨං වත භො භාරද්වාජ අද්දසාම[4] යෙ මයං තස්ස භොතො ගොතමස්ස භූනහුනො[5] සෙය්‍යං අද්දසාමාති. 'රක්ඛස්සෙතං මාගන්දිය වාචං, රක්ඛස්සෙතං මාගන්දිය වාචං, බහූහි තස්ස භොතො ගොතමස්ස ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි අභිප්පසන්නා විනීතා අරියෙ ඤායෙ ධම්මෙ කුසලෙ'ති. සම්මුඛා චෙපි මයං භො භාරද්වාජ තං භවන්තං ගොතමං පස්සෙය්‍යාම, සම්මුඛාපි නං වදෙය්‍යාම: 'භූනහු සමණො ගොතමො'ති. තං කිස්ස හෙතු: එවං හි නො සුත්තෙ ඔචරතීති. සචෙ තං භොතො මාගන්දියස්ස අගරු ආරොචෙය්‍යමෙතං[6] සමණස්ස ගොතමස්සාති. අප්පොස්සුක්කො භවං භාරද්වාජො වුත්තොව නං වදෙය්‍යාති.

---

1. කම්මාසධම්මං - මජසං. ස්‍යා.
2. තිණසන්ථාරකෙ - මජසං.
3. මාගණ්ඩියො - ස්‍යා. මජසං.
4. ද්වික්ඛත්තුම්මුදීරණං - මජසං.
5. භූනහනස්ස - ස්‍යා.
6. ආරොචෙස්සාමිතං - මජසං.
   ආරොචෙස්සාමි තසං - ස්‍යා.

2. 3. 5
මාගන්දිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු ජනපදයෙහි කල්මාෂදම්‍ය නම් වූ කුරුරටවැසියන්ගේ නියම්ගම්හි භාරද්වාජගෝත්‍ර බමුණුගේ අග්නි හෝත්‍රශාලායෙහි තණඇතිරියෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරබත් වේලෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන කල්මාෂදම්‍යනිගමයට පිඩු පිණිස පිවිසියහ. කල්මාෂදම්‍යයෙහි පිඩුසිඟා පසුබත් වේලෙහි පිඩුවායෙන් නැවැතිසේක් එක්තරා වනළැහැබක් කරා දිවාවිහාර පිණිස එළැඹියහ. එ වනළැහැබට වැද එක්තරා රුක්මුලෙකැ දිවාවිහාරයෙන් වැඩහුන් සේක.

එකල්හි මාගන්දිය පරිව්‍රාජක ජඞ්ඝාවිහරණයෙහිලා සක්මන් කරනුයේ හැසිරෙනුයේ භාරද්වාජගෝත්‍රයෙහි වූ බමුණුහුගේ ගිනිදෙවොල කරා එළැඹියේ යැ. මාගන්දිය පරිව්‍රාජක භාරද්වාජගොත්‍ර බ්‍රාහ්මණයාගේ ගිනිදෙවොලෙහි පනවනලද තණඇතිරියක් දුටුයේ යැ, දැක භාරද්වාජගොත්‍ර බමුණුහට මෙල කී යැ : භවත් භාරද්වාජයන්ගේ ගිනිදෙවොලෙහි මේ තණඇතිරිය කවරක්හට පනවනලද ද? 'ශ්‍රමණයක්හට අනුරූප වූ ශයනයෙකැ'යි සිතමි.

භවත් මාගන්දිය, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ ගෞතම නම් ශ්‍රමණ කෙනෙක් ඇත. ඒ භාග්‍යවත් ගෞතමයන්ගේ මෙබඳු කල්‍යාණ වූ කීර්තිශබ්දය උස් වැ පැනනැංගේ යැ : ''ඒ භාග්‍යවත්හු මෙකරුණෙන් අර්හත් වූහ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යා චරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර වූ පුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිසුනට ශාස්තෘ වූහ, බුද්ධයහ, භගවත් වූහ''යි ඒ භවත් ගෞතමයන්ට මෙල යහන පනවනලද්'යි. භවත් භාරද්වාජය, ඇපි හතවෘද්යි ඇති ඒ භවත් ගෞතමයන්ගේ යහන දුටුවමෝ ද, එකාන්තයෙන් නො නිසි දක්මක් දුටුවම්හ'යි. මාගන්දිය, මෙල වචනය රකුව, මාගන්දිය මෙල වචනය රකුව. ඒ භවත් ගෞතමයන්හට බොහෝ වූ මැ ක්ෂත්‍රියපණ්ඩිතයෝ ද බ්‍රාහ්මණපණ්ඩිතයෝ ද ගෘහපතිපණ්ඩිතයෝ ද ශ්‍රමණපණ්ඩිතයෝ ද අතිශයින් ප්‍රසන්න වූහ. පරිශුද්ධ වූ අනවද්‍ය වූ හේතුධර්මයෙහි විනීතයහ'යි. භවත් භාරද්වාජය, ඇපි ඒ භවත් ගෞතමයන් හමුයෙහි නමුදු දක්නමෝ නම් හමුයෙහි දු ඔවුන්ට (මෙසේ) කියම්හ : ''ශ්‍රමණ ගෞතමයෝ හතවෘද්යි ඇත්තාහ''යි. ඒ කවර හෙයින යත් : යම් හෙයෙකින් අපගේ සූත්‍රයෙහි මෙසේ එන්නේ ද එහෙයිනි. ඉදින් භවත් මාගන්දියහට එය බරෙක් නො වේ නම් ශ්‍රමණගෞතමයන්හට මෙල සැල කරන්නෙමි'යි. (මා රක්නට) අනුත්සුක වැ භවත් භාරද්වාජ මා විසින් කියනලදුයේ මැ කියාව'යි.

20—පක් 13561 (11/72)

Free Distribution www.aathaapi.org

අස්සොසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය[1] භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස මාගන්දියෙන පරිබ්බාජකෙන සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස අග්‍යාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිසීදි[2] පඤ්ඤත්තෙ[3] තිණසන්ථරකෙ. අථ ඛො භාරද්වාජගොත්තො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො භාරද්වාජගොත්තං බ්‍රාහ්මණං භගවා එතදවොච: 'අහු පන තෙ භාරද්වාජ මාගන්දියෙන පරිබ්බාජකෙන සද්ධිං ඉමංයෙව තිණසන්ථරකං ආරබ්භ කොචිදෙව කථාසල්ලාපො'ති. එවං වුත්තෙ භාරද්වාජගොත්තො[4] බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො භගවන්තං එතදවොච: 'එතදෙව ඛො පන මයං භොතො ගොතමස්ස ආරොචෙතුකාමා, අථ ච පන භවං ගොතමො අනක්ඛාතංයෙව අක්ඛාසීති. අයඤ්ච හිදං[5] භගවතො භාරද්වාජගොත්තෙන බ්‍රාහ්මණෙන සද්ධිං අන්තරා කථා විප්පකතා හොති. අථ මාගන්දියො පරිබ්බාජකො ජඞ්ඝාවිහාරං අනුචඞ්කම්මානො අනුවිචරමානො යෙන භාරද්වාජගොත්තස්ස බ්‍රාහ්මණස්ස අග්‍යාගාරං, යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො මාගන්දියං පරිබ්බාජකං භගවා එතදවොච.

චක්ඛුං ඛො මාගන්දිය රූපාරාමං රූපරතං රූපසම්මුදිතං. තං තථාගතස්ස දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. ඉදං නු තෙ එතං මාගන්දිය සන්ධාය භාසිතං: 'භූනහු සමණො ගොතමො'ති. එතදෙව ඛො පන මෙ භො ගොතම සන්ධාය භාසිතං: 'භූනහු සමණො ගොතමො'ති. තං කිස්ස හෙතු: එවං හි නො සුත්තෙ ඔචරතීති.

සොතං ඛො මාගන්දිය සද්දාරාමං-පෙ-ඝානං ඛො මාගන්දිය ගන්ධාරාමං-පෙ-ජිව්හා ඛො මාගන්දිය රසාරාමා රසරතා රසසම්මුදිතා. සා තථාගතස්ස දන්තා ගුත්තා රක්ඛිතා සංවුතා. තස්සා ච සංවරාය ධම්මං දෙසෙති. ඉදං නු තෙ එතං මාගන්දිය සන්ධාය භාසිතං: 'භූනහු සමණො ගොතමො'ති. එතදෙව ඛො මෙ භො ගොතම සන්ධාය භාසිතං: 'භූනහු සමණො ගොතමො'ති. තං කිස්ස හෙතු: 'එවං හි නො සුත්තෙ ඔචරතී'ති.

කායො ඛො මාගන්දිය ඵොට්ඨබ්බාරාමො -පෙ- මනො ඛො මාගන්දිය ධම්මාරාමො ධම්මරතො ධම්මසම්මුදිතො. සො තථාගතස්ස දන්තො ගුත්තො රක්ඛිතො සංවුතො. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. ඉදං නු තෙ එතං මාගන්දිය සන්ධාය භාසිතං: 'භූනහු සමණො ගොතමො'ති. එතදෙව ඛො පන මෙ භො ගොතම සන්ධාය භාසිතං. භූනහු සමණො ගොතමො'ති. තං කිස්ස හෙතු: එවං හි නො සුත්තෙ ඔචරතී'ති.

---

1. අතික්කන්තමානුසිකාය - සීමු. මජසං.
2. නිසීදිභගවා - මජසං.
3. පඤ්ඤත්තෙව - සීමු.
4. භාරද්වාජො - සීමු.
5. අයඤ්ච හි - මජසං

බුදුහු විශුද්ධ වූ ඉක්මගිය මිනිස්බව ඇති දිවසෝඨයින් මාගන්දිය පරිව්‍රාජක සමග (කරනලද) භාරද්වාජගෝත්‍ර බ්‍රාහමණයාගේ මේ කථාසල්ලාපය ඇසූසේක. ඉක්බිති බුදුහු සවස්කාලයෙහි ඵලසමවතින් නැගී සිටි සේක් භාරද්වාජගොත්‍ර බ්‍රාහ්මණයාගේ ගිනිදෙවොල කරා එළැඹි සේක. එළැඹ පනවනලද්දවූ මැ තණඇතිරියෙහි වැඩ හුන් සේක. ඉක්බිති භාරද්වාජගෝත්‍ර බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙකැ හින. බුදුහු එකත්පස් වැ හුන් භාරද්වාජගෝත්‍ර බමුණුහට මේ වදළහ. භාරද්වාජය, මාගන්දිය පරිව්‍රාජක සමග මේ තණඇතිරිය මැ අරභයා තොපගේ කිසියම් කථාසල්ලාපයෙක් වී ද ?යි වදළහ. මෙසේ වදළ කල්හි භාරද්වාජ බ්‍රාහ්මණ (ප්‍රීතිසංවේගයෙන්) කම්පිත වූයේ හටගත් ලොමුදහ ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් කී යැ : ''ඇපි මෙය මැ භවත් ගෞතමයන් වහන්සේට සැලකරන රිසියම්හ. එතෙකුදු වත් ගෞතමයන් වහන්සේ නො කියන ලද්ද මැ කිහ'යි. භාරද්වාජගෝත්‍ර බ්‍රාහ්මණයා සමග භාග්‍යවතුන් වහන්සේ ගේ මේ අතුරු කථාව කොට අඩාළ විය. එකල්හි මාගන්දිය පරිව්‍රාජක ජඞ්ඝාවිහරණයෙහි සක්මන් කරනුයේ හැසිරෙනුයේ භාරද්වාජ බ්‍රාහ්මණයාගේ ගිනිදෙවොලෙහි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් මාගන්දිය පරිව්‍රාජකයන්හට බුදුහු තෙල වදළ සේක.

''මාගන්දිය, ඇස වැළිත් රූපය ආරාම කොට ඇත. රූපයෙහි ඇලුණේ යැ. රූපයෙන් පිනවනලද. ඒ චක්ෂුස තථාගතයන් විසින් දමනය කරන ලද, ගෝපනය කරන ලද, රක්නාලද, සංවර කරනලද වෙයි. ඒ චක්ෂුස සංවරය පිණිස දහම් දෙසන සේක. මාගන්දිය තොප විසින් මේ සඳහා තෙල 'ශ්‍රමණ ගෞතම වෘද්ධිනාශකයෙකැ'යි කියන ලදදූ ?යි. භවත් ගෞතමයන් වහන්ස, මා විසින් මේ සඳහා මැ 'ශ්‍රමණ ගෞතම හතවෘද්ධි ඇත්තෙකැ'යි කියනලද. ඊට හේතු කවරැ යත් : යම් හෙයෙකින් අපගේ සූත්‍රයෙහි මෙසේ එයි ද, එහෙයිනැ'යි.

මාගන්දිය, ශ්‍රෝත්‍රය වැළිත් ශබ්දය ආරාම කොට ඇත . . . මාගන්දිය, ඝ්‍රාණය වූකලි ගන්ධය ආරාම කොට ඇත . . . මාගන්දිය, ජිව්හාව වූකලි රසය ආරාම කොට ඇත. රසයෙහි ඇලුණි යැ, රසයෙන් පිනවනලද, ඒ ජිව්හාව තථාගතයන් විසින් දාන්ත යැ ගුප්ත යැ සංවෘත යැ. ඒ ජිව්හා සංවරයට දහම් දෙසති. මාගන්දිය, තොප විසින් තෙල ''ශ්‍රමණ ගෞතම හතවෘද්ධි ඇත්තෙකැ'යි මේ සඳහා කියනලද දූ ?යි. භවත් ගෞතමයන් වහන්ස, මා විසින් මේ සඳහා මැ ''ශ්‍රමණ ගෞතම හතවෘද්ධි ඇත්තෙකැ'යි කියනලද. ඒ කවර හෙයින යත් : යම් හෙයෙකින් අපගේ සූත්‍රයෙහි මෙසේ එයි ද, එහෙයිනැ'යි.

මාගන්දිය, කය වැළිත් ස්ප්‍රෂ්ටව්‍යය ආරාම කොට ඇත....මාගන්දිය, මනස වැළිත් ධර්මය ආරාම කොට ඇත, ධර්මයෙහි ඇලුණේ යැ, ධර්මයෙන් පිනවනලද, ඒ මනස තථාගතයන් විසින් දමනය කරනලද, ගෝපනය කරනලද, රක්නාලද, සංවර කරනලද. එ මනස සංවරයට දහම් දෙසති. මාගන්දිය, තොප විසින් තෙල ''ශ්‍රමණ ගෞතම හතවෘද්ධි ඇත්තෙකැ'යි මේ සඳහා කියනලද දූ ?යි. භවත් ගෞතමයන් වහන්සේ මා විසින් මේ සඳහා මැ ''ශ්‍රමණ ගෞතම හතවෘද්ධි ඇත්තෙකැ'යි කියනලද. ඒ කවර හෙයින යත් : අපගේ සූත්‍රයෙහි මෙසේ එන හෙයිනැ'යි.

තං කිං මඤ්ඤසි මාගන්දිය ඉධෙකච්චො චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි පරිචාරිතපුබ්බො අස්ස, ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සො අපරෙන සමයෙන රූපානංයෙව සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා රූපතණ්හං පහාය රූපපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහරෙය්‍ය. ඉමස්ස පන තෙ මාගන්දිය කිමස්ස වචනීයන්ති: න කිඤ්චි භො ගොතම.

තං කිං මඤ්ඤසි මාගන්දිය: ඉධෙකච්චො සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි -පෙ- කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි පරිචාරිතපුබ්බො අස්ස, ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සො අපරෙන සමයෙන ඵොට්ඨබ්බානංයෙව සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා ඵොට්ඨබ්බතණ්හං පහාය ඵොට්ඨබ්බපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහරෙය්‍ය ඉමස්ස පන තෙ මාගන්දිය කිමස්ස වචනීයන්ති: න කිඤ්චි භො ගොතම.

අහං ඛො පන මාගන්දිය පුබ්බෙ අගාරියභූතො සමානො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙසිං. චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි—ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි—කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. තස්ස මය්හං මාගන්දිය තයො පාසාදා අහෙසුං: එකො වස්සිකො එකො හෙමන්තිකො එකො ගිම්හිකො. සො ඛො අහං මාගන්දිය වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරෙ මාසෙ නිප්පුරිසෙහි තූරියෙහි පරිචාරයමානො න හෙට්ඨාපාසාදං ඔරොහාමි. සො අපරෙන සමයෙන කාමානංයෙව සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා කාමතණ්හං පහාය කාමපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහරාමි. සො අඤ්ඤෙ සත්තෙ පස්සාමි කාමෙසු අවීතරාගෙ කාමතණ්හාහි ඛජ්ජමානෙ කාමපරිළාහෙන පරිඩය්හමානෙ කාමෙ පටිසෙවන්තෙ. සො තෙසං න පිහෙමි. න තත්ථ අභිරමාමි. තං කිස්ස හෙතු: යා හයං මාගන්දිය රති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි අපි දිබ්බං සුඛං සමධිගය්හ තිට්ඨති, තාය රතියා රමමානො හීනස්ස න පිහෙමි. න තත්ථ අභිරමාමි.

සෙය්‍යථාපි මාගන්දිය ගහපති වා ගහපතිපුත්තො වා අඩ්ඪො මහද්ධනො මහාභොගො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙය්‍ය. චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි-පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි-පෙ-කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය දෙවානං තාවතිංසානං සහව්‍යතං.

මාගන්දිය, ඒ කිමැ'යි සිතයි ද? මෙලොවැ කිසිවෙක් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමයන් අරමුණු කොට ඇති රාගෝත්පත්තියට කරුණු වූ චක්ෂුර්විඥෙය-යෙන් දතයුතු රූපයන්ගෙන් සිත් අලවා විසූවිරූ වෙයි. හේ මෑතකාලයෙහි රූපයන්ගේ මැ සමුදය ද අත්ථඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තත් වූ පරිද්දෙන් දැන රූපතෘෂ්ණාව හැරපියා රූපය අරභයා උපන් පරිදාහය දුරු කොට පහවූ තෘෂ්ණා ඇතියේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වාසය කරන්නේ නම්, මාගන්දිය තොප විසින් මොහුට කුමක් කියයුතු වන්නේ ද?යි. භවත් ගෞතමයෙනි, කිසි කියයුත්තෙක් නැත.

මාගන්දිය, ඒ කිමැ'යි සිතයි ද? මෙලොවැ කිසිවෙක් ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දයෙන් . . . . ඝ්‍රාණවිඥෙය වූ ගන්ධයෙන් . . . ජිහ්වාවිඥෙය වූ රසයෙන් . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති, කාමයන් අරමුණු කොට ඇති, රාගෝත්පත්තියට කරුණු වූ කාය-විඥෙය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් අභිරමණය කළ විරූ විය. හේ මෑතභාගයෙහි ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ මැ සමුදය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තත් වූ පරිදි දැන ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාව හැරපියා සප්‍රෂ්ටව්‍යයන් නිසා උපදනා පරිදාහය දුරු කොට පහවූ තෘෂ්ණා ඇතියේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වාසය කෙරේ නම්, මාගන්දිය තොප විසින් මේ ක්ෂීණාස්‍රවයන්හට කුමක් කියයුතු වන්නේ ද?යි. භවත් ගෞතමයෙනි, කියයුතු කිසිවක් නැත.

මාගන්දිය, මම් වූකලි පෙර ගිහිගේවැසි වූයෙම් පස්කම්ගුණයෙන් යුක්ත වූයෙම් සමන්විත වූයෙම් සිත් අලවා විසීමි. චක්ෂුර්විඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමූපසංහිත වූ රජනීය වූ රූපයෙන් ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දයෙන් . . . ඝ්‍රාණවිඥෙය වූ ගන්ධයෙන් . . . ජිහ්වාවිඥෙය වූ රසයෙන් . . . කායවිඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව වූ කාමූපසංහිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් සිත් අලවා විසීමි. මාගන්දිය, ඒ මට තුන් පහයෙක් විය. එකෙක් වැසිකලට නිසි වෙයි. එකෙක් හිමන්කලට නිසි වෙයි. එකෙක් ගිමන්කලට නිසි වේ. මාගන්දිය, ඒ මම වැසිකලට නිසි වූ පහයෙහි වැසි සාරමස පුරුෂයන් රහිත වූ තූර්‍යයෙන් සතුටු වෙමින් යට පහයට නො බස්මි. ඒ මම මෑතභාගයෙහි කාමයන්ගේ මැ සමුදය ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද තත් වූ පරිදි දැන කාමතෘෂ්ණාව හැරපියා පහවූ තෘෂ්ණා ඇතියෙම් අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇතියෙම් වාසය කෙරෙමි. ඒ මම කාමයන්හි අවීතරාග වූ කාමතෘෂ්ණා විසින් කනුලබන කාමපරිදාහයෙන් දවනුලබන කාමයන් සේවනය කරන අන්‍ය සත්ත්වයන් දක්මි. ඒ මම ඔවුනට නො රිසියෙමි, එහි නො ඇලෙමි, ඒ කවර හෙයින යත් : මාගන්දිය, යම් හෙයෙකින් යම් මේ සමාපත්ති රතියක් වේ ද, එය කාමයන්ගෙන් වෙන් වූයේ මැ යැ, අකුශලධර්‍ම යන්ගෙන් වෙන් වූයේ මැ යැ, දිව්‍යසුඛය පවා මැඩැගෙන සිටී, ඒ චතුර්ථධ්‍යානික ඵලසමාපත්තිරතියෙන් සිත් අලවා වසනුයෙම් හීන වූ පඤ්චකාමසුවයට නො සතුටු වෙමි, එහි සිත් අලවා නො වෙසෙමි.

යම්සේ මාගන්දිය, ආඪ්‍ය වූ මහත් ධන ඇති මහාභෝග ඇති ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පස්කම්ගුණයෙන් යුක්ත වූයේ සමන්විත වූයේ සිත් අලවා වාසය කරන්නේ යැ, චක්ෂුර්විඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමූපසංහිත වූ රජනීය වූ රූපයෙන්, ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දයෙන් . . . ඝ්‍රාණවිඥෙය වූ ගන්ධයෙන් . . . ජිහ්වාවිඥෙය වූ රසයෙන් . . . . කායවිඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමයන් අරමුණු කොට ඇති රාගෝත්පත්තියට කරුණු වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් (සිත් අලවා වාසය කරන්නේ යැ.) හේ කයින් සුචරිතය කොට වචනයෙන් සුචරිතය කොට මනසින් සුචරිතය කොට කාබුන් මරණින් මතු සුන්දරගති ඇති ස්වර්ගලෝකයට, තව්තිසාවැසි දෙවියන්ගේ සහවාසයට පැමිණෙන්නේ යැ. හේ ඒ නන්දනවනයෙහි දෙවඟනන් සමූහයා විසින්

සො තත්ථ නන්දනෙ වනෙ අච්ඡරාසඞ්ඝපරිවුතො දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙය්‍ය. සො පස්සෙය්‍ය ගහපතිං වා ගහපතිපුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං. තං කිං මඤ්ඤසි මාගන්දිය, අපි නු සො දෙවපුත්තො නන්දනෙ වනෙ අච්ඡරාසඞ්ඝපරිවුතො දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරයමානො අමුස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා පිහෙය්‍ය මානුසකානං වා පඤ්චන්නං කාමගුණානං, මානුසකෙහි වා කාමෙහි ආවට්ටෙය්‍යාති. නො හිදං භො ගොතම, තං කිස්ස හෙතු: මානුසකෙහි භො ගොතම කාමෙහි දිබ්බා කාමා අභික්කන්තතරා පණීතතරා චාති.

එවමෙව ඛො අහං මාගන්දිය පුබ්බෙ අගාරියභූතො සමානො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙසිං: චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි-පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි-පෙ- කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සො අපරෙන සමයෙන කාමානංයෙව සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා කාමතණ්හං පහාය කාමපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහරාමි. සො අඤ්ඤෙ සත්තෙ පස්සාමි කාමෙසු අවීතරාගෙ කාමතණ්හාහි ඛජ්ජමානෙ කාමපරිළාහෙන පරිඩය්හමානෙ කාමෙ පටිසෙවන්තෙ. සො තෙසං න පිහෙමි, න තත්ථ අභිරමාමි, තං කිස්ස හෙතු: යා හ'යං මාගන්දිය රති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි අපි දිබ්බං සුඛං සමධිගය්හ තිට්ඨති, තාය රතියා රමමානො හීනස්ස න පිහෙමි. න තත්ථ අභිරමාමි.

සෙය්‍යථාපි මාගන්දිය කුට්ඨී පුරිසො අරුගත්තො පක්කගත්තො කිමීහි ඛජ්ජමානො නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානො අඞ්ගාරකාසුයා කායං පරිතාපෙය්‍ය, තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං, තස්ස සො භිසක්කො සල්ලකත්තො භෙසජ්ජං කරෙය්‍ය, සො තං භෙසජ්ජං ආගම්ම කුට්ඨෙහි පරිමුච්චෙය්‍ය අරොගො අස්ස සුඛී සෙරී සයංවසී යෙන කාමඞ්ගමො. සො අඤ්ඤං කුට්ඨිං පුරිසං පස්සෙය්‍ය අරුගත්තං පක්කගත්තං කිමීහි ඛජ්ජමානං නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානං අඞ්ගාරකාසුයා කායං පරිතාපෙන්තං. තං කිං මඤ්ඤසි මාගන්දිය, 'අපි නු සො පුරිසො අමුස්ස කුට්ඨිස්ස පුරිසස්ස පිහෙය්‍ය, අඞ්ගාරකාසුයා වා භෙසජ්ජපටිසෙවනාය වා'ති. නො හිදං භො ගොතම, තං කිස්ස හෙතු: රොගෙ හි භො ගොතම සති භෙසජ්ජෙන කරණීයං හොති, රොගෙ අසති භෙසජ්ජෙන කරණීයං න හොතී'ති. එවමෙව ඛො අහං මාගන්දිය පුබ්බෙ අගාරියභූතො සමානො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙසිං. චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි —පෙ— ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි —පෙ— කායවිඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි. සො අපරෙන සමයෙන කාමානංයෙව සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං

පිරිවරනලද්දූ වැ දිව්‍යමය පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්විත වැ සිත් අලවන්නේ යැ. පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්විත වැ සිත් අලවන ගෘහපතියකු හෝ ගෘහපතිපුත්‍රයකු හෝ දක්නේ යැ. මාගන්දිය, ඒ කිමැ'යි සිතහි ? කිම ඒ දිව්‍යපුත්‍ර නන්‍දනවනයෙහි දෙවසරන් සමූහයා විසින් පිරිවරන ලද්දූ වැ දිව්‍යපඤ්චකාමගුණයෙන් යුක්ත වැ සමන්විත වැ සිත් අලවනුයේ තෙල ගෘහපතිහුගේ හෝ ගෘහපතිපුත්‍රයාගේ හෝ මානුෂපඤ්චකාමගුණයට රුස්නේ ද? මානුෂකාමයන් හේතු කොටගෙන පෙරළා එන්නේ ද ?යි. භවත් ගෞතම-යන් වහන්ස, මෙය නො වේ මැය. ඒ කුමක් හෙයින යත් : භවත් ගෞතමයන් වහන්ස, මිනිසුන් පිළිබඳ කාමයනට වඩා දිව්‍යකාමයෝ අතිශයින් සුන්‍දර වූවාහු ද අතිශයින් ප්‍රණීත වූවාහු ද එහෙයිනි.

මාගන්දිය, එසෙයින් ම මම පෙර ගිහි වූයෙම් පස්කම්ගුණයෙන් යුක්ත වූයෙම් සමන්විත වූයෙම් සිත් අලවා විසීමි : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමයන් අරමුණු කොට ඇති රාගෝත්පත්තියට කාරණ වූ චක්ෂුර්විඥනයෙන් දතයුතු රූපයන් ගෙන් . . . ශ්‍රෝත්‍රවිඥනයෙන් දතයුතු ශබ්දයන්ගෙන් . . . ඝ්‍රාණවිඥනයෙන් දතයුතු ගන්ධයන්ගෙන් . . . ජිහ්වාවිඥනයෙන් දතයුතු රසයන්ගෙන් . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමෝපසංහිත වූ රාගෝත්පත්තියට කාරණ වූ කායවිඥනයෙන් දතයුතු ස්ප්‍රෂ්ටව්‍යයන්ගෙන් (සිත් අලවා විසීමි.) එ මම පසු කාලයෙහි කාමයන්ගේ මැ සමුදය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තතුපරිදි දැන කාමතෘෂ්ණාව හැරපියා කාමපරිදහය දුරු කොට පහවූ තෘෂ්ණා ඇතියෙම් අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇත්තෙම් වෙසෙමි. ඒ මම කාමයන්හි අවීතරාග වූ කාමතෘෂ්ණායෙන් පෙළනු ලබන කාමපරිදහයෙන් දවනු ලබන කාමයන් සෙවුනා අන්‍ය සත්ත්වයන් දක්මි. ඒ මම ඒ කාමයන් නො පතමි, එහි නො ඇලෙමි. එ කවර හෙයින යත් : මාගන්දිය, යම්හෙයෙකින් කාමයන්ගෙන් වෙන් වූ අකුශලධර්මයන්ගෙන් වෙන් වූ මේ (චතුර්ථධ්‍යානිකඵලසමා පත්ති) රතිය දිව්‍යසුඛය පවා මැඩැගෙන සිටී ද එහෙයින් ඒ සමාපත්තිරතියෙන් සිත් අලවා වසනුයෙම් හීන වූ කාමය නො පතමි, එහි නො ඇලෙමි.

යම්සේ මාගන්දිය, කුෂ්ඨ ඇති වණසිරුරු ඇති පැසුණු සිරුරු ඇති පුරුෂයෙක් කෘමීන් විසින් කනුලබන්නේ නියෙන් වණමුව කසමින් අඟුරුකබලෙකින් කය තවන්නේ ද, ඔහුගේ සගයහළුවෝ නෑසහලේනැයෝ ශල්‍ය වෛද්‍යයකු එළවන්නාහ, ඔහුට ඒ ශල්‍ය වෛද්‍ය තෙමේ බෙහෙත් කරන්නේ යැ, හේ ඒ බෙහෙත් ලැබ කුෂ්ඨයෙන් මිදෙන්නේ යැ, අරෝග වූයේ සුවපත් වූයේ ස්වෛරී වූයේ තමහට වසඟ වූයේ කැමැති තැනෙක යනසුලු වන්නේ යැ. හේ වණසිරුරු ඇති, පැසුණුසිරුරු ඇති, කෘමීන් විසින් කනුලබන, නියෙන් වණමුව කසන, අඟුරැකබලින් කය තවන අනෙක් කුෂ්ඨී පුරුෂයකු දක්නේ යැ. මාගන්දිය, ඒ කිමැ'යි හඟනෙහි ද? ඒ පුරුෂ තෙම තෙල කුෂ්ඨීපුරුෂහට රුස්නේ ද? අඟුරුකබලට හෝ බෙහෙත් සෙවුමට හෝ රුස්නේ ද ?යි. මේ නො වෙ මැ යැ භවත් ගෞතමයෙනි, ඒ කවර හෙයින යත් : 'භවත් ගෞතමයෙනි, රොගය ඇති කල්හි මැ බෙහෙදින් කටයුතු වෙයි. රොගය නැති කල්හි බෙහෙදින් කටයුතු නො වේ යයි. එසෙයින් මැ මාගන්දිය, මම පෙර ගිහිගෙවැසි වූයෙම් පස්කම්ගුණයෙන් යුක්ත වූයෙම් සමන්විත වූයෙම් සිත් ඇලවීමි. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමයන් අරමුණු කොට ඇති රාගෝත්පත්තියට කරුණු වූ චක්ෂුර්විඥනයෙන් දතයුතු රූපයන්ගෙන් . . . ශ්‍රොත්‍රවිඥනයෙන් දතයුතු ශබ්දයන්ගෙන් . . . ඝ්‍රාණවිඥනයෙන් දත යුතු ගන්ධයන්ගෙන් . . . ජිහ්වාවිඥනයෙන් දතයුතු රසයන්ගෙන්, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමෝපසංහිත වූ රාගෝත්පත්තියට කරුණු වූ කායවිඥනයෙන් දතයුතු ස්ප්‍රෂ්ටව්‍යයන්ගෙන් (සිත් ඇලවීමි.) ඒ මම මැතභාගයෙහි කාමයන්ගේ මැ සමුදය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තතු සේ දැන කාමතෘෂ්ණාව

විදිත්වා කාමතණ්හං පහාය කාමපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහරාමි. සො අඤ්ඤෙ සත්තෙ පස්සාමි කාමෙසු අවීතරාගෙ කාමතණ්හාහි ඛජ්ජමානෙ කාමපරිළාහෙන පරිඩය්හමානෙ කාමෙ පටිසෙවන්තෙ. සො තෙසං න පිහෙමි. න තත්ථ අභිරමාමි. තං කිස්ස හෙතු: යාහ'යං මාගන්දිය රති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි අපි දිබ්බං සුඛං සමධිගය්හ තිට්ඨති, තාය රතියා රමමානො හීනස්ස න පිහෙමි. න තත්ථ අභිරමාමි.

සෙය්‍යථාපි මාගන්දිය කුට්ඨී පුරිසො අරුගත්තො පක්කගත්තො කිමීහි ඛජ්ජමානො නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානො අඞ්ගාරකාසුයා කායං පරිතාපෙය්‍ය. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං. තස්ස සො භිසක්කො සල්ලකත්තො භෙසජ්ජං කරෙය්‍ය. සො තං භෙසජ්ජං ආගම්ම කුට්ඨෙහි පරිමුච්චෙය්‍ය. අරොගො අස්ස සුඛී සෙරී සයංවසී යෙන කාමඞ්ගමො. තමෙනං ද්වෙ බලවන්තො පුරිසා නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුං උපකඩ්ඪෙය්‍යුං. තං කිං මඤ්ඤසි මාගන්දිය, අපි නු සො පුරිසො ඉති චිති චෙව කායං සන්නාමෙය්‍යා'ති. එවං භො ගොතම. තං කිස්ස හෙතු: 'අසු හි භො ගොතම අග්ගි දුක්ඛසම්ඵස්සො චෙව මහාභිතාපො ච මහාපරිළාහො චා'ති. තං කිං මඤ්ඤසි මාගන්දිය, ඉදානෙව නු ඛො සො අග්ගි දුක්ඛසම්ඵස්සො චෙව මහාභිතාපො ච මහාපරිළාහො ච, උදාහු පුබ්බෙපි සො අග්ගි දුක්ඛසම්ඵස්සො චෙව මහාභිතාපො ච මහාපරිළාහො චාති. ඉදානි චෙව භො ගොතම සො අග්ගි දුක්ඛසම්ඵස්සො චෙව මහාභිතාපො ච මහාපරිළාහො ච. පුබ්බෙපි සො අග්ගි දුක්ඛසම්ඵස්සො චෙව මහාභිතාපො ච මහාපරිළාහො ච, අසු හි ච භො ගොතම කුට්ඨී පුරිසො අරුගත්තො පක්කගත්තො කිමීහි ඛජ්ජමානො නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානො උපහතින්ද්‍රියො දුක්ඛසම්ඵස්සෙයෙව අග්ගිස්මිං සුඛමිති විපරීතසඤ්ඤං පච්චලත්ථාති. එවමෙව ඛො මාගන්දිය අතීතම්පි අද්ධානං කාමා දුක්ඛසම්ඵස්සා චෙව මහාභිතාපා ච මහාපරිළාහා ච. අනාගතම්පි අද්ධානං කාමා දුක්ඛසම්ඵස්සා චෙව මහාභිතාපා ච මහාපරිළාහා ච, එතරහිපි පච්චුප්පන්නං අද්ධානං කාමා දුක්ඛසම්ඵස්සා චෙව මහාභිතාපා ච මහාපරිළාහා ච. ඉමෙ ච මාගන්දිය සත්තා කාමෙසු අවීතරාගා කාමතණ්හාහි ඛජ්ජමානා කාමපරිළාහෙන පරිඩය්හමානා උපහතින්ද්‍රියා දුක්ඛසම්ඵස්සෙසෙව[1] කාමෙසු සුඛමිති විපරීතසඤ්ඤං පච්චලත්ථුං.

සෙය්‍යථාපි මාගන්දිය කුට්ඨී පුරිසො අරුගත්තො පක්කගත්තො කිමීහි ඛජ්ජමානො නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානො අඞ්ගාරකාසුයා කායං පරිතාපෙති. යථා යථා ඛො මාගන්දිය අසු කුට්ඨී පුරිසො අරුගත්තො පක්කගත්තො කිමීහි ඛජ්ජමානො නඛෙහි වණමුඛානි විප්පතච්ඡමානො අඞ්ගාරකාසුයා කායං පරිතාපෙති, තථා තථාස්ස තානි වණමුඛානි අසුචිතරානි චෙව හොන්ති දුග්ගන්ධතරානි ච පූතිකතරානි ච. හොති චෙව කාචි සාතමත්තා අස්සාදමත්තා යදිදං වණමුඛානං කණ්ඩුවනහෙතු. එවමෙව ඛො මාගන්දිය සත්තා කාමෙසු අවීතරාගා කාමතණ්හාහි ඛජ්ජමානා කාමපරිළාහෙන පරිඩය්හමානා කාමෙ පටිසෙවන්ති. යථා යථා ඛො මාගන්දිය සත්තා කාමෙසු අවීතරාගා කාමතණ්හාහි ඛජ්ජමානා කාමපරිළාහෙන පරිඩය්හමානා කාමෙ පටිසෙවන්ති, තථා තථා තෙසං සත්තානං කාමතණ්හා චෙව පවඩ්ඪති, කාමපරිළාහෙන ච පරිඩය්හන්ති. හොති චෙව කාචි සාතමත්තා අස්සාදමත්තා යදිදං පඤ්චකාමගුණෙ පටිච්ච.

1. දුක්ඛසම්ඵස්සෙසු යෙව - මජසං. ස්‍යා.

හැරපියා කාමපරිදාහය දුරු කොට පහ වූ තෘෂ්ණා ඇතියෙම් අධ්‍යාත්මයෙහි සන්හුන්සිත් ඇති වැ වෙසෙමි. එ මම කාමයෙහි අවීතරාග වූ, කාමතෘෂ්ණා විසින් කනුලබන, කාමපරිදාහයෙන් දැවෙන කාමයන් සෙවුනා අන්‍ය සත්ත්වයන් දක්මි. ඒ මම ඔවුන් නො පතමි. එහි නො ඇලෙමි. ඒ කවර හෙයින යත් : මාගන්දිය, යම් හෙයෙකින් කාමයෙන් වෙන් වූ අකුශලධර්මයෙන් වෙන් වූ මේ (චතුර්ථජ්ඣානික ඵලසමාපත්ති) රතිය දිව්‍යසුඛය පවා මැඩැගෙන සිටී ද, එහෙයින් ඒ සමාපත්තිරතියෙහි සිත් අලවා වසනුයෙම් හීන වූ කාමය නො පතමි. එහි නො ඇලෙමි.

යම්සේ මාගන්දිය වණසිරුරු ඇති පැසුණුසිරුරු ඇති කුෂ්ඨීපුරුෂයෙක් කෘමීන් විසින් කනුලබන්නේ නියෙන් වණමුව කසමින් අඟුරුකබලින් කය තවන්නේ ද, ඕහට සග යහළුවෝ නෑසහලේනැයෝ ශල්‍යවෛද්‍යයකු එළවන්නාහ, ඔහට ඒ ශල්‍යවෛද්‍ය තෙමේ බෙහෙත් කරන්නේ යැ, හේ එ බෙහෙත් ලැබ කුෂ්ඨයෙන් මිදෙන්නේ යැ, අරෝග වූයේ සුවපත් වූයේ සෛවරී වැ තමහට වසහ වැ කැමැති තැනෙකැ යනසුලු වන්නේ යැ. ඒ මොහු බලැති පුරුෂයෝ දෙදෙනෙක් වෙන වෙන අත්හි ගෙන අඟුරු කබලක් වෙත අදනාහ. මාගන්දිය, එය කිමැ 'යි හඟිහි ද? ඒ පුරුෂ ඔබට මොබට කය නමා ද ?යි. එසේ යැ භවත් ගෞතමයෙනි, ඒ කවර හෙයින යත් : භවත් ගෞතමයෙනි, තෙල ගින්න දුක්පහස් ඇත්තේ ද මහ තැවුලි ඇත්තේ ද මහත් පරිදාහ ඇත්තේ ද වෙයි. එහෙයිනැ'යි. මාගන්දිය, ඒ කිමැ'යි හඟිහි ද? දැන් පමණක් ඒ ගින්න දුක්පහස් ඇත්තේත් මහතැවුලි ඇත්තේත් මහත් පරිදාහ ඇත්තේත් වේ ද, නොහොත් පෙරත් ඒ ගින්න දුක්පහස් ඇත්තේත් මහතැවුලි ඇත්තේත් මහත්පරිදාහ ඇත්තේත් වී ද ?යි. දැනුදු භවත් ගෞතමයෙනි ඒ ගින්න දුක්පහස් ද මහතැවුලි ද මහත් පරිදාහ ද ඇති වෙයි. පෙරදු එ ගිනි දුක් පහස් ද මහතැවුලි ද මහත් පරිදාහ ද ඇති වී. එතෙකුදුවත් භවත් ගෞතමයෙනි, තෙල කුෂ්ඨී පුරුෂ වණසිරුරු ඇත්තේ පැසුණුසිරුරු ඇත්තේ කෘමීන්විසින් කනුලබනුයේ නියෙන් වණමුව කසනුයේ නට කායප්‍රසාද ඇතියේ දුක්පහස් මැ ඇති ගින්නෙහි 'සුව'යයි විපරීතසංඥා ලැබී'යයි. එසෙයින් මැ මාගන්දිය, අතීතකාලයෙහිදු කාමයෝ දුක්පහස් ද මහතැවුලි ද මහත් පරිදාහ ද ඇති වූහ. අනාගතකාලයෙහිදු කාමයෝ දුක්පහස් ද මහතැවුලි ද මහත් පරිදාහ ද ඇති වන්නාහ. මෙ වත්මන්කල්හිදු කාමයෝ දුක්පහස් ද මහතැවුලි ද මහත් පරිදාහ ද ඇත්තාහ. මාගන්දිය මෙසත්හු වැළිත් කාමයෙහි අවීතරාග වූවාහු කාම තෘෂ්ණා විසින් කනු ලබන්නාහු කාමපරිදාහයෙන් දැවෙන්නාහු නට ඉඳුරන් ඇත්තාහු දුක්පහස් මැ ඇති කාමයෙහි 'සුඛ'යන විපරීතසංඥා ලැබූහ.

යම්සේ මාගන්දිය, වණසිරුරු ඇති, පැසුණුසිරුරු ඇති, කෘමීන් විසින් කනුලබන, නියෙන් වණමුව කසන කුෂ්ඨී පුරුෂ අඟුරු කබලින් කය තවා ද, යම් යම් සෙයෙකින් තෙල කුෂ්ඨී පුරුෂ වණසිරුරු ඇත්තේ පැසුණු සිරුරු ඇත්තේ කෘමීන් විසින් කනු ලබන්නේ නියෙන් වණමුව කසනුයේ අඟුරුකබලින් කය තවා ද, ඒ ඒ පරිද්දෙන් ඔහුගේ ඒ වණමුව ඉතා අපිරිසුදු ද දුර්ගන්ධතර ද පූති(කුණු) තර ද වෙයි. වණමුව කැසීම් හෙයින් කිසි මිහිරිමතුයෙකුත් ආස්වාදමාත්‍රයෙකුත් වෙයි. එසෙයින් මැ මාගන්දිය, කාමයෙහි අවීතරාග වූ කාමතෘෂ්ණා විසින් කනුලබන කාමපරිදාහයෙන් දැවෙන සත්ත්වයෝ කාම සේවන කෙරෙති. මාගන්දිය, කාමයෙහි අවීතරාග වූ කාමතෘෂ්ණා විසින් කනුලබන කාම පරිදාහයෙන් දැවෙන සත්ත්වයෝ යම් යම් සෙයෙකින් කාම සේවන කෙරෙත් ද, ඒ ඒ පරිද්දෙන් ඒ සත්ත්වයන්ගේ කාමතෘෂ්ණාවත් වැඩෙයි. (ඔහු) කාමපරිදාහයෙන් දැවෙනු ද වෙති. පස්කම්ගුණ නිසා කිසි යම්තම් මිහිරෙකුත් ආස්වාද මාත්‍රයෙකුත් වෙයි.

තං කිං මඤ්ඤසි මාගන්දිය: අපි නු තෙ දිට්ඨො වා සුතො වා රාජා වා රාජමහාමත්තො වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරයමානො කාමතණ්හං අප්පහාය කාමපරිළාහං අප්පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහාසි වා, විහරති වා, විහරිස්සති වාති. නො හිදං භො ගොතම. සාධු මාගන්දිය, මයාපි ඛො එතං මාගන්දිය නෙව දිට්ඨං න සුතං රාජා වා රාජමහාමත්තො වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරයමානො කාමතණ්හං අප්පහාය කාමපරිළාහං අප්පටිවිනොදෙත්වා විගතපිපාසො අජ්ඣත්තං වූපසන්තචිත්තො විහාසි වා, විහරති වා, විහරිස්සති වා. අථ ඛො මාගන්දිය යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා විගතපිපාසා අජ්ඣත්තං වූපසන්තචිත්තා විහංසු[1] වා, විහරන්ති වා, විහරිස්සන්ති වා. සබ්බෙ තෙ කාමානංයෙව සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා කාමතණ්හං පහාය කාමපරිළාහං පටිවිනොදෙත්වා විගතපිපාසා අජ්ඣත්තං වූපසන්තචිත්තා විහංසු[1] වා, විහරන්ති වා, විහරිස්සන්ති වාති.

අථ ඛො භගවා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛං,
අට්ඨඞ්ගිකො ච මග්ගානං ඛෙමං අමතගාමිනන්ති.

එවං වුත්තෙ මාගන්දියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: 'අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාව සුභාසිතඤ්චිදං භොතා ගොතමෙන:

'ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛ'න්ති.

මයාපි ඛො එතං භො ගොතම සුතං පුබ්බකානං පරිබ්බාජකානං ආචරියපාචරියානං භාසමානානං:

'ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛ'න්ති,

තයිදං භො ගොතම සමෙතීති.

යම්පන තෙ එතං මාගන්දිය සුතං පුබ්බකානං පරිබ්බාජකානං ආචරියපාචරියානං භාසමානානං:

'ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛ'න්ති,

'කතමන්තං ආරොග්‍යං, කතමන්තං නිබ්බාන'න්ති. එවං වුත්තෙ මාගන්දියො පරිබ්බාජකො සකානෙව සුදං ගත්තානි පාණිනා අනොමජ්ජති. ඉදන්තං භො ගොතම ආරොග්‍යං, ඉදන්තං නිබ්බානං. අහං හි භො ගොතම එතරහි අරොගො සුඛී, න මං කිඤ්චි ආබාධතී'ති.

---

1. විහරිංසු - සීමු.
විහාසුං - මජ්සං.

ඒ කිමැ'යි හඟිහි ද මාගන්දිය, පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්විත වැ සිත් අලවා වෙසෙන රජෙක් හෝ රජමහ ඇමැත්තෙක් හෝ කාමතෘෂ්ණාව නො හැරපියා කාමපරිදාහය දුරු නො කොට පහ වූ තෘෂ්ණා ඇති වැ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වාසය කෙළේ යැ හෝ වාසය කෙරෙයි හෝ වාසය කරන්නේ යැ හෝ'යි තොප විසින් දුටුයේ හෝ ඇසුයේ ඇද්ද ?යි. මේ නො වේ මැ යැ භවත් ගෞතමයෙනි, මැනැව මාගන්දිය, මා විසිතුදු මාගන්දිය, පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්විත වැ සිත් අලවා වෙසෙන රජෙක් හෝ රජමහඇමැත්තෙක් හෝ කාමතෘෂ්ණාව නො හැරපියා කාමපරිදාහය දුරු නො කොට පහ වූ තෘෂ්ණා ඇති වැ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ විසී යැ හෝ වෙසෙයි හෝ වසන්නේ යැ හෝ'යි. එ තෙල කරුණ නො මැ දක්නා ලද යැ, නො අසනලදී. මාගන්දිය, වැළිත් යම්කිසි මහණ කෙනෙක් වේවයි බමුණු කෙනෙක් වේවයි පහ වූ තෘෂ්ණා ඇති වැ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වුසූහු නම් හෝ වෙසෙත් නම් හෝ වසන්නාහු නම් හෝ එ හැම දෙන කාමයන්ගේ මැ සමුදයත් විනාශයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දැන කාමතෘෂ්ණාව හැරපියා කාමපරිදාහය දුරු කොට පහ වූ තෘෂ්ණා ඇති වැ අධ්‍යාත්මයෙහි සන්හුන්සිත් ඇති වැ වාසය කළාහු හෝ වාසය කරන්නාහු හෝ මත්තෙහි වාසය කරන්නාහු හෝ වෙති'යි.

ඉක්බිති බුදුහු එ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළහ :

''ලාභයෝ ආරෝග්‍යය පරම කොට ඇත්තාහ, සුවය නිවන පරම කොට ඇත්තේ යැ, නිවනට යන මාර්ගයන් අතුරෙතුදු අෂ්ටාඞ්ගිකමාර්ගය ක්ෂෙම වේ''යයි.

මෙසේ වදළ කල්හි මාගන්දිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණු සැල කෙළේ යැ : ''ආශ්චර්ය්‍ය යැ භවත් ගෞතමයෙනි, අද්භූත යැ භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයන් විසින් :

''ලාභයෝ ආරෝග්‍යය පරම කොට ඇත්තාහ, සුවය නිවන පරම කොට ඇතැ''යි.

මේ වදළතාක් සුභාෂිත වෙයි.

මා විසිතුදු භවත් ගෞතමයෙනි, ආචාර්ය්‍යප්‍රාචාර්ය්‍ය වූ' පූර්වපරිව්‍රාජකයන් කියනුවන් ගේ තෙල :

''ලාභයෝ ආරෝග්‍යය පරම කොට ඇත්තාහ, සුවය නිවන පරම කොට ඇත්තේ යැ' යන-බස් අසන ලද.

භවත් ගෞතමයෙනි, ඒ මේ වචනය සම වේ'යයි.

මාගන්දිය, තා විසින් ආචාර්ය්‍යප්‍රාචාර්ය්‍ය වූ පූර්වපරිව්‍රාජකයන් කියනුවන්ගේ තෙල:

''ලාභයෝ ආරෝග්‍යය පරම කොට ඇත්තාහ, සුවය නිවන පරම කොට ඇත්තේයැ'' යන-යම් වචනයෙක් අසනලද ද,

ඒ ආරෝග්‍යය කවරෙ යැ? එ නිවන් කවරෙ යැ ?යි. මෙසේ වදළ කල්හි මාගන්දිය පරිව්‍රාජක තමාගේ මැ සිරුරු අවයවයන් අත්ලෙන් පිරිමදී : ''භවත් ගෞතමයෙනි, මේ ඒ ආරෝග්‍ය යැ, මේ ඒ නිවන යි. භවත් ගෞතමයෙනි, මම වූ කලි දැන් අරෝගයෙමි, සුවපත්මි. කිසිවක් (රෝවෙක්) මා නොපෙළා'' යයි.

සෙය්‍යථාපි මාගන්දිය ජච්චන්ධො පුරිසො, සො න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි, න පස්සෙය්‍ය නීලකානි රූපානි, න පස්සෙය්‍ය පීතකානි රූපානි, න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි, න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨකානි[1] රූපානි, න පස්සෙය්‍ය සමවිසමං, න පස්සෙය්‍ය තාරකරූපානි, න පස්සෙය්‍ය චන්දිමසුරියෙ. සො සුණෙය්‍ය චක්ඛුමතො භාසමානස්ස : 'ඡෙකං වත භො ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචින්ති[2]. සො ඔදාතපරියෙසනං චරෙය්‍ය. තමෙනං අඤ්ඤතරො[3] පුරිසො තෙලමසිකතෙන[4] සාහුලචීවරෙන[5] වඤ්චෙය්‍ය : ඉදන්තෙ අම්භො පුරිස ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචින්ති.[2] සො තං පටිගණ්හෙය්‍ය, පටිග්ගහෙත්වා පාරුපෙය්‍ය, පාරුපිත්වා අත්තමනො අත්තමනවාචං නිච්ඡාරෙය්‍ය : 'ඡෙකං වත භො ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචි'න්ති. තං කිං මඤ්ඤසි මාගන්දිය, අපි නු සො ජච්චන්ධො පුරිසො ජානන්තො පස්සන්තො අමුං තෙලමසිකතං සාහුලචීවරං පටිගණ්හෙය්‍ය, පටිග්ගහෙත්වා පාරුපෙය්‍ය, පාරුපිත්වා අත්තමනො අත්තමනවාචං නිච්ඡාරෙය්‍ය : 'ඡෙකං වත භො ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචි'න්ති, උදාහු චක්ඛුමතො සද්ධායාති. අජානන්තො හි භො ගොතම අපස්සන්තො සො ජච්චන්ධො පුරිසො අමුං තෙලමසිකතං සාහුලචීවරං පටිගණ්හෙය්‍ය, පටිග්ගහෙත්වා පාරුපෙය්‍ය, පාරුපිත්වා අත්තමනො අත්තමනවාචං නිච්ඡාරෙය්‍ය : ඡෙකං වත භො ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචින්ති, චක්ඛුමතො සද්ධායාති. එවමෙව ඛො මාගන්දිය අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා, අජානන්තා ආරොග්‍යං, අපස්සන්තා නිබ්බානං. අථ ච පනි'මං ගාථං භාසන්ති.

'ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛ'න්ති.

පුබ්බකෙහෙසා මාගන්දිය අරහන්තෙහි සම්මාසම්බුද්ධෙහි ගාථා භාසිතා.

'ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛං,
අට්ඨඞ්ගිකො ච මග්ගානං ඛෙමං අමතගාමින'න්ති.

සා එතරහි අනුපුබ්බෙන පුථුජ්ජනගතා. අයං ඛො පන මාගන්දිය කායො රොගභූතො ගණ්ඩභූතො සල්ලභූතො අඝභූතො ආබාධභූතො. සො ත්වං ඉමං කායං රොගභූතං ගණ්ඩභූතං සල්ලභූතං අඝභූතං ආබාධභූතං 'ඉදං තං භො ගොතම ආරොග්‍යං ඉදං තං නිබ්බාන'න්ති වදෙසි. තං හි තෙ මාගන්දිය අරියං චක්ඛුං නත්ථි යෙන ත්වං අරියෙන චක්ඛුනා ආරොග්‍යං ජානෙය්‍යාසි, නිබ්බානං පස්සෙය්‍යාසීති.

එවං පසන්නො අහං භොතො ගොතමස්ස, පහොති මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතුං, යථාහං ආරොග්‍යං ජානෙය්‍යං, නිබ්බානං පස්සෙය්‍ය'න්ති.

1. මඤ්ජිට්ඨකානි - මජසං.
2. සුචිති - මජසං.
3. තමෙනඤ්ඤතරො - සීමු.
4. තෙලමලිකතෙන - මජසං.
5. සාහුළිචීරෙන - මජසං.

යම්සේ මාගන්දිය ජාත්‍යන්ධ පුරුෂයෙක් වේ ද, හේ කෘෂ්ණශුක්ල රූපයන් නො දක්නේ යැ : නිල්වන් රූ නො දක්නේ යැ, කසාවන් රූ නො දක්නේ යැ, ලේවන් රූ නො දක්නේ යැ, මදටවන් රූ නො දක්නේ යැ, සමවිෂමය නො දක්නේ යැ, තාරකරූපයන් නො දක්නේ යැ, සඳහිරු නො දක්නේ යි. හේ "සුදුවත ප්‍රසන්න යැ අභිරූප යැ නිර්මල යැ පිරිසුදු යැ"යි ඇස් ඇති පුරුෂයකු කියනුවා අසන්නේ යැ, හේ ශ්වේත වස්ත්‍ර පර්යේෂණය කරන්නේ යැ. ඒ මොහු එක්තරා පුරුෂයෙක් තෙල්දූලි තැවැරුණු දළ කළු එළලොම් සිවුරින් නුළු කරන්නේ යැ (රවටයි.) : "එම්බා පුරුෂය, තොප ගේ මේ ශ්වේතවස්ත්‍රය අභිරූප යැ, නිර්මල යැ, පිරිසුදු යැ"යි. හේ එය පිළිගන්නේ යැ, පිළිගෙන පොරෝනේ යැ, පෙරෙවැ තුටුසිත් ඇත්තේ සතුටුවදන් පවසන්නේ යැ : "භවත්නි, ශ්වේතවස්ත්‍රය ඒකාන්තයෙන් ප්‍රසන්න යැ, අභිරූප යැ නිර්මල යැ පිරිසුදු යැ"යි. මාගන්දිය, ඒ කිමැ'යි හඟි ද, ඒ දැඅඳ පුරිස් දනිමින් දක්මින් තෙල තෙල්දූලි වැකුණු දළ කළු එළලොම් සිවුර පිළිගන්නේ ද, පිළිගෙන පොරෝනේ ද, පෙරෙවැ සතුටුසිත් ඇත්තේ "භවත්නි ශ්වේත වස්ත්‍රය ඒකාන්තයෙන් ප්‍රසන්න යැ, අභිරූප යැ නිර්මල යැ පිරිසුදු යැ"යි සතුටුවදන් පවසන්නේ ද, නොහොත් ඇස් ඇතියාගේ බස්හි සැදැහැයෙන් පවසන්නේ දැ?යි. භවත් ගෞතමයෙනි, තෙල දැඅඳ පුරිස් නො දන්නේ මැ නො දක්නේ මැ තෙල තෙල්දූලි වැකුණු දළ කළු එළලොම් සිවුර පිළිගන්නේ යැ, පිළිගෙන පෙරෝනේ යැ පෙරෙව සතුටුසිත් ඇති වැ "භවත්නි සුදුවත එකත්තෙන් ප්‍රසන්න යැ, අභිරූප යැ, නිර්මල යැ පිරිසුදු යැ"යි තුටුවදන් පවසන්නේ යැ, ඇස් ඇතියාගේ වදන්හි සැදැහැයෙන් පවසන්නේ යැ'යි. එසෙයින් මැ මාගන්දිය අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ අඳ වූවාහු ඇස් නැතියාහු ආරෝග්‍යය නො දන්නාහු නිර්වාණය නො දක්නාහු එතෙකුදු වත්-

"ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛං"යි

මේ ගාථාව කියති. මාගන්දිය; පෙර වීසූ අතීත් සම්‍යක් සම්බුදුන් විසින් තෙල :

"ආරොග්‍යපරමා ලාභා නිබ්බානං පරමං සුඛං
අට්ඨඞ්ගිකො ච මග්ගානං ඛෙමං අමතගාමිනං"

යන ගාථාව භාෂිත යැ.

ඒ දන් අනුක්‍රමයෙන් පෘථග්ජනගත වී. මාගන්දිය මෙ කය වූකලි රෝගයක් වැනි වූයේ ගණ්ඩයක් වැනි වූයේ ශල්‍යයක් වැනි වූයේ අඝ(දුඃඛ)යක් වැනි වූයේ ආබාධයක් වැනි වූයේ වෙයි. තෙපි රොවක් වැනි වූ ගඩක් වැනි වූ හුලක් වැනි වූ දුකක් වැනි වූ ආබාධයක් වැනි වූ මෙ කය (ගෙන) : "භවත් ගෞතමයෙනි, මේ ඒ ආරෝග්‍ය යැ, මේ ඒ නිර්වාණ යැ'යි කියෙහි. මාගන්දිය, තෙපි යම් ආර්‍ය්‍ය වූ ඇසෙකින් ආරෝග්‍යය දන්නෙහි නම් නිර්වාණය දක්නෙහි නම් තොපට ඒ ආර්‍ය්‍යචක්ෂුස නැතැ"යි වදළහ.

මෙසෙයින් මම් භවත් ගෞතමයනට ප්‍රසන්නයෙමි. යම්සේ මම් ආරෝග්‍යය දන්නෙම් නම් නිර්වාණය දක්නෙම් නම් මට එසේ දහම් දෙසන්නට භවත් ගෞතමයන් වහන්සේ පොහොනාසේකැ'යි.

සෙය්‍යථාපි මාගන්දිය ජච්චන්ධො පුරිසො, සො න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි, න පස්සෙය්‍ය නීලකානි රූපානි, න පස්සෙය්‍ය පීතකානි රූපානි, න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි, න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨකානි රූපානි, න පස්සෙය්‍ය සමවිසමං, න පස්සෙය්‍ය තාරකරූපානි, න පස්සෙය්‍ය චන්දිමසුරියෙ. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං. තස්ස සො භිසක්කො සල්ලකත්තො භෙසජ්ජං කරෙය්‍ය. සො තං භෙසජ්ජං ආගම්ම න චක්ඛුනි උප්පාදෙය්‍ය, න චක්ඛුනි විසොධෙය්‍ය. තං කිං මඤ්ඤසි මාගන්දිය, නනු සො වෙජ්ජො යාවදෙව කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවං භො ගොතම. 'එවමෙව ඛො මාගන්දිය අහඤ්චෙ[1] තෙ ධම්මං දෙසෙය්‍යං ඉදන්තං ආරොග්‍යං, ඉදන්තං නිබ්බානන්ති. සො ත්වං ආරොග්‍යං න ජානෙය්‍යාසි, නිබ්බානං න පස්සෙය්‍යාසි. සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසා'ති.

එවං පසන්නො අහං භොතො ගොතමස්ස, පහොති මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතුං, යථාහං ආරොග්‍යං ජානෙය්‍යං නිබ්බානං පස්සෙය්‍යන්ති.

සෙය්‍යථාපි මාගන්දිය ජච්චන්ධො පුරිසො, සො න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි, න පස්සෙය්‍ය නීලකානි රූපානි, න පස්සෙය්‍ය පීතකානි රූපානි, න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි, න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨකානි රූපානි, න පස්සෙය්‍ය සමවිසමං, න පස්සෙය්‍ය තාරකරූපානි, න පස්සෙය්‍ය චන්දිමසුරියෙ. සො සුණෙය්‍ය චක්ඛුමතො භාසමානස්ස 'ඡෙකං වත භො ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචි'න්ති. සො ඔදාතපරියෙසනං චරෙය්‍ය. තමෙනඤ්ඤතරො පුරිසො තෙලමසිකතෙන සාහුලචීවරෙන[2] වඤ්චෙය්‍ය, ඉදන්තෙන අම්භො පුරිස ඔදාතං වත්ථං අභිරූපං නිම්මලං සුචින්ති. සො තං පටිග්ගණ්හෙය්‍ය, පටිග්ගහෙත්වා පාරුපෙය්‍ය. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං. තස්ස සො භිසක්කො සල්ලකත්තො භෙසජ්ජං කරෙය්‍ය: උද්ධවිරෙචනං[3] අධොවිරෙචනං අඤ්ජනං පච්චඤ්ජනං නත්ථුකම්මං. සො තං භෙසජ්ජං ආගම්ම චක්ඛුනි උප්පාදෙය්‍ය, චක්ඛුනි විසොධෙය්‍ය. තස්ස සහ චක්ඛුප්පාදා යො අමුස්මිං තෙලමසිකතෙ සාහුලචීවරෙ ඡන්දරාගො, සො පහීයෙථ. තඤ්ච නං පුරිසං අමිත්තතොපි දහෙය්‍ය. පච්චත්ථිකතොපි දහෙය්‍ය. අපි ච ජීවිතා වොරොපෙතබ්බං මඤ්ඤෙය්‍ය, 'දීඝරත්තං වත භො අහං ඉමිනා පුරිසෙන තෙලමසිකතෙන සාහුලචීවරෙන නිකතො වඤ්චිතො පලුද්ධො. 'ඉදන්තෙන අම්භො පුරිස ඔදාතං වත්ථං ඡෙකං අභිරූපං[4] නිම්මලං සුචින්ති. එවමෙව ඛො මාගන්දිය අහඤ්චෙ තෙ ධම්මං දෙසෙය්‍යං: 'ඉදන්තං ආරොග්‍යං, ඉදන්තං නිබ්බා-න'න්ති. සො ත්වං ආරොග්‍යං ජානෙය්‍යාසි, නිබ්බානං පස්සෙය්‍යාසි. තස්ස තෙ සහ චක්ඛුප්පාදා යො පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගො, සො පහීයෙථ, අපි ච තෙ එවමස්ස දීඝරත්තං වත භො අහං ඉමිනා චිත්තෙන නිකතො වඤ්චිතො පලුද්ධො, අහං හි රූපංයෙව උපාදියමානො

1. අහඤ්ච - මජසං.
2. සාහුලචීරෙන - මජසං.
3. උද්ධං විරෙචනං - මජසං.
4. වත්ථං අභිරූපං - මජසං. PTS.

යම්සේ මාගන්දිය ජාත්‍යන්ධ පුරුෂයෙක් වේ ද, හේ කළුසුදු රූ නො දක්නේ යැ, නිල්වන් රූ නො දක්නේ යැ, කසාවන් රූ නො දක්නේ යැ, ලෙහෙවන් රූ නො දක්නේ යැ, මදටවන් රූ නො දක්නේ යැ, සමවිෂමය නො දක්නේ යැ, තාරකරූපයන් නො දක්නේ යැ, සඳහිරු නො දක්නේ යි. ඔහට සගයහළුවෝ නෑසහලේනෑයෝ ශල්‍යවෛද්‍යයකු එළවන්නාහ. ඔහුට ඒ ශල්‍යවෛද්‍ය තෙමේ බෙහෙත් කරන්නේ යැ, හේ ඒ බෙහෙත් ලැබ ඇස් නූපදවා නම් ඇස් විශුද්ධ නො කෙරේ නම්, මාගන්දිය, ඒ කිමැ'යි හඟී ද, ඒ වෙද තෙම ඒතාක් පීඩාවට වෙහෙසට හිමි වන්නේ නො වේ ද ?යි. එසේ යැ භවත් ගෞතමයන් වහන්ස, එසෙයින් මැ මාගන්දිය, මමත් තොපට : ''මේ ඒ ආරොග්‍ය යැ, මේ ඒ නිර්වාණ යැ''යි දහම් දෙසන්නෙමි. තෙපි ආරොග්‍යය නො දන්නහු නිර්වාණය නො දක්නහු නම්, ඒ මට පීඩා වන්නේ යැ, ඒ මට වෙහෙස වන්නේ යැ'යි.

මෙසෙයින් මම් භවත් ගෞතමයනට පහන්මි : 'යම්සේ මම ආරෝග්‍යය දන්නෙම් නම් නිර්වාණය දක්නෙම් නම් එසේ මට දහම් දෙසන්නට භවත් ගෞතමයන් වහන්සේ පොහොනා සේකැ'යි.

යම්සේ මාගන්දිය ජාත්‍යන්ධ පුරුෂයෙක් වේ ද, හේ කෘෂ්ණශුක්ල රූපයන් නො දක්නේ යැ, නිල්වන් රූ නො දක්නේ යැ, කසාවන් රූ නො දක්නේ යැ, ලෙහෙවන් රූ නො දක්නේ යැ, මදටවන් රූ නො දක්නේ යැ, සමවිෂමය නො දක්නේ යැ තාරකරූපයන් නො දක්නේ යැ, සඳහිරු නො දක්නේ යි. හේ ''භවත්නි, අවදාතවස්ත්‍රය පහන් යැ අභිරූප යැ නිර්මල යැ ශුද්ධ යැ''යි ඇස් ඇතියකු කියනුවා අසන්නේ යැ. හේ අවදාතවස්ත්‍ර පර්යේෂණය කරන්නේ යැ. ඒ මොහු එක්තරා පුරුෂයෙක් තෙල්දූලි වැකි දළ කළු එළුලොම් සිවුරෙකින් නළවන්නේ යැ : ''එම්බා පුරුෂය, මේ තොපගේ අවදාතවස්ත්‍රය අභිරූප යැ නිර්මල යැ ශුද්ධ යැ''යි. හේ එය පිළිගන්නේ යැ. පිළිගෙන පොරෝනේ යැ. ඔහට සගයහළුවෝ නෑසහලේනෑයෝ ශල්‍යවෛද්‍යයකු එළවන්නාහ. ඔහට ඒ ශල්‍යවෛද්‍ය තෙම බෙහෙත් කරන්නේ යැ : ඌර්ධ්වවිරේචන අධොවිරේචන අඤ්ජන ප්‍රත්‍යඤ්ජන නශ්‍යකර්ම කරන්නේ යැ. හේ ඒ බෙහෙත් ලැබ ඇස් උපදවන්නේ යැ විශුද්ධ කරන්නේ යැ ඔහට චක්ෂුරුත්පාදය හා සමග තෙල තෙල්දූලි වැකි දළ කළු එළුලොම් සිවුරෙහි යම් ඡන්දරාගයෙක් වේ ද, ඒ පහ වන්නේ යැ. ඒ ඡන්දරාගයත් ඒපුරුෂයාත් අමිත්‍ර වශයෙනුදු තබන්නේ යැ. ශත්‍රු වශයෙනුදු තබන්නේ යැ, තවද (ඔහු) දිවි ගැළවිය යුතු කොට හඟනේ යැ : ''භවත, එකත්තෙන් මම් බොහෝ කලක් මෙ පුරිස් විසින් ''එම්බා පුරුෂය, මේ තොපගේ හෙළපිළිය ප්‍රසන්න යැ අභිරූප යැ නිර්මල යැ ශුද්ධ යැ''යි තෙල්දූලි වැකි දළ කළු එළුලොම් සිවුරින් රවටනලද්දූයෙම් වඤ්චිතයෙම් පොළොඹන ලද්දූයෙමි'යි. එසෙයින් මැ මාගන්දිය, මමත් තොපට 'මේ ඒ ආරෝග්‍ය යැ, මේ ඒ නිර්වාණ යැ'යි දහම් දෙසන්නෙමි, තෙපි ආරෝග්‍යය දැනගන්නවු යැ නිර්වාණය දක්නවු යැ. ඒ තොපට ඇස් පහළවීම හා සමග පඤ්චෝපාදනස්කන්ධයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් ඒ පහවන්නේ යැ. තවද තොපට මෙබඳු සිතෙක් වන්නේ යැ : ''භවත, එකත්තෙන් මම් දිගුකලක් මෙ සිත විසින් රවටනලද්දූයෙම් වඤ්චිතයෙම් පොළොඹනලද්දූයෙමි. මම් වූකලි දූඩි කොට ගනුයෙම් රූපය මැ දූඩි කොට ගතිමි. දූඩි කොට ගනුයෙම් වේදනාව

උපාදියිං, වෙදනංයෙව උපාදියමානො උපාදියිං, සඤ්ඤංයෙව උපාදියමානො උපාදියිං, සඞ්ඛාරෙයෙව උපාදියමානො උපාදියිං, විඤ්ඤාණංයෙව උපාදියමානො උපාදියිං. තස්ස මෙ උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී'ති.

එවං පසන්නො අහං භොතො ගොතමස්ස: පහොති මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතුං, යථාහං ඉමම්හා ආසනා අනන්ධො වුට්ඨහෙය්‍ය'න්ති.

තෙන හි ත්වං මාගන්දිය සප්පුරිසෙ භජෙය්‍යාසි, යතො ඛො ත්වං මාගන්දිය සප්පුරිසෙ භජිස්සසි, තතො ත්වං මාගන්දිය සද්ධම්මං සොස්සසි. යතො ඛො ත්වං මාගන්දිය සද්ධම්මං සොස්සසි, තතො ත්වං මාගන්දිය ධම්මානුධම්මං පටිපජ්ජිස්සසි. යතො ඛො ත්වං මාගන්දිය ධම්මානුධම්මං පටිපජ්ජිස්සසි, තතො ත්වං මාගන්දිය සාමංයෙව ඤස්සසි, සාමං දක්ඛිසි.[1] ඉමෙ රොගා ගණ්ඩා සල්ලා, ඉධ රොගා ගණ්ඩා සල්ලා අපරිසෙසා නිරුජ්ඣන්ති, තස්ස මෙ උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී'ති.

එවං වුත්තෙ මාගන්දියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පද'න්ති.

යො ඛො මාගන්දිය අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං, සො චත්තාරො මාසෙ පරිවසති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං, චත්තාරො මාසෙ පරිවසන්ති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති. උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං මං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති.

---

1. දක්ඛිස්සසි - මජසං, සීමු.

මැ දැඩි කොට ගතිමි. දැඩි කොට ගනුයෙම් සංඥාව මැ දැඩි කොට ගතිමි. දැඩි කොට ගනුයෙම් සංස්කාරයන් මැ දැඩි කොට ගතිමි. දැඩි කොට ගනුයෙම් විඥානය මැ දැඩි කොට ගතිමි. ඒ මට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණශොකපරිදෙවදුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ වෙති. මෙසෙයින් මෙතෙල සකල දුඃඛස්කන්ධයාගේ සමුදය වේ''යයි.

මෙසෙයින් මම භවත් ගෞතමයනට ප්‍රසන්නයෙමි : ''යම්සේ මම මෙ අස්නෙන් නො අද වැ නැඟෙන්නෙමි නම් භවත් ගෞතමයන් වහන්සේ මට එසේ දහම් දෙසන්නට පොහොනා සේකැ''යි.

එසේ වී නම් මාගන්දිය, තෙපි සත්පුරුෂයන් භජනය කරව. යම් කලෙකැ පටන් මාගන්දිය, තෙපි සත්පුරුෂයන් භජනය කරන්නහු ද, එදවස පටන් මාගන්දිය, තෙපි සදහම් අසන්නහු යැ. යම් කලෙකැ පටන් මාගන්දිය තෙපි සදහම් අසන්නහු ද, එදවස පටන් මාගන්දිය තෙපි ධර්මානුධර්මයට (නිසි පිළිවෙතට) බස්නහු යැ. යම් කලෙකැ පටන් මාගන්දිය තෙපි ධර්මානුධර්මයට බස්නහු ද, එ දවස පටන් මාගන්දිය තෙපි ''මොහු රොගයෝ යැ ගණ්ඩයෝ යැ ශල්‍යයෝ යැ, මෙහි (නිවනෙහි) රොගයෝ ගණ්ඩයෝ ශල්‍යයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති, ඒ මට උපාදාන නිරොධයෙන් භවනිරොධය වෙයි, භවනිරොධයෙන් ජාතිනිරොධය වෙයි, ජාතිනිරොධයෙන් ජරාමරණශොකපරිදෙවදුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති, මෙසෙයින් මේ සියලු දුඃඛරාශීහුගේ නිරෝධය වේ''යයි තුමූ ම දන්නහු යැ තුමූ මැ දක්නහු යැ.

මෙසේ වදළ කල්හි මාගන්දිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙතෙල කරුණු සැල කෙළේ යැ : ''ඉතා මැනැව භවත් ගෞතමයෙනි, ඉතා මැනැව භවත් ගෞතමයෙනි. යම්සේ භවත් ගෞතමයෙනි, යටිහුරු කරනලද්දක් හෝ උඩුහුරු කරන්නේ ද, ප්‍රතිච්ඡන්න වූවක් හෝ විවර කරන්නේ ද, මුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකිත්ව'යි අඳුරෙහි හෝ තෙල්පහනක් දරන්නේ ද, එසෙයින් මැ භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය ප්‍රකාශ කරනලද. මෙතෙල මම භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යෙමි. ධර්මයත් භික්ෂුසඞ්ඝයාත් සරණ කොට යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ වෙත පැවිදි ලබන්නෙමි මහලුපැවිදි ලබන්නෙම මැනැවැ''යි.

'මාගන්දිය, අන්තොටුවිරු යමෙක් මෙසස්නෙහි ප්‍රව්‍රජ්‍යා කැමැති වෙ ද, උපසම්පත් කැමැති වෙ ද, හෙ සාරමසක් පිරිවසයි, සාරමසෙකැ ඇවෑමෙන් ආරාධිත සිත් ඇති මහණහු (ඔහු) පැවිදි කරවති, භික්ෂුභාවයට උපසපන් කරවත්, එතෙකුදුවත් මෙහිලා මා විසින් පුද්ගලනානාත්වය දන්නාලද'යි.

''ඉදින් වහන්ස, අන්තොටුවිරුහු මෙසස්නෙහි ප්‍රව්‍රජ්‍යා කැමැත්තාහු උපසම්පත් කැමැත්තාහු සාරමසක් පරිවාස කෙරෙත් ද, සාරමසෙකැ ඇවෑමෙන් ආරාධිත සිත් ඇති මහණහු භික්ෂුභාවයට පැවිදි කරවත් ද, උපසපන් කරවත් ද, මම සතර හවුරුද්දක් පිරිවසන්නෙමි, සතර හවුරුද්දෙකැ ඇවෑමෙන් ආරාධිත සිත් ඇති මහණහු (මා) පැවිදි කරවත්වා, භික්ෂුභාවයට උපසපන් කරවත්ව''යි.

අලත්ථ ඛො මාගන්දියො පරිබ්බාජකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා මාගන්දියො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපි පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා මාගන්දියො අරහතං අහොසීති.

මාගන්දියසුත්තං පඤ්චමං.[1]

---

1. මාගන්දිය සුත්තං නිට්ඨිතං - මජසං,

මාගන්දිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ වෙත ප්‍රව්‍රජ්‍යා ලද, උපසම්පත් ලද. උපසපන් නොබෝකල් ඇති ආයුෂ්මත් මාගන්දිය එකලා වූයේ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට අළ සිත් ඇති වැ වසනුයේ : කුලපුත්‍රයෝ යමක් සඳහා මොනොවට ගිහිගෙන් නික්ම සස්නට වදිත් ද, ඒ අනුත්තර වූ බ්‍රහ්මචර්‍ය්‍යාවසාන සඞ්ඛ්‍යාත අර්හත්වය නොබෝ කලෙකින් මැ ඉහාත්මයෙහි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කෙළේ යැ. 'ජාතිය ක්ෂය වූ මහබඹසර වැස නිමවන ලදි, සතරමහ කිස කරන ලද, මෙ බව පිණිස අන් කිසෙක් නැතැ'යි දැනගත්තේ යැ. ආයුෂ්මත් මාගන්දිය තෙරණුවෝ වැළිත් රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වූහ'යි.

පස් වැනි වූ මාගන්දිය සූත්‍ර යි.

---

2. 3. 6

සන්දක සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන සන්දකො පරිබ්බාජකො පිලක්ඛ ගුහායං පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං පඤ්චමත්තෙහි පරිබ්බාජකසතෙහි. අථ ඛො ආයස්මා ආනන්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි 'ආයාමාවුසො යෙන දෙවකටසොබ්භො[1] තෙනුපසඞ්කමිස්සාම ගුහාදස්සනායා'ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං, අථ ඛො ආයස්මා ආනන්දො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන දෙවකටසොබ්භො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සන්දකො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය[2] අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං[3] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා.

අද්දසා ඛො සන්දකො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි[4] අප්පසද්දා භොන්තො හොන්තු, මා භොන්තො සද්දමකත්ථ, අයං සමණස්ස ගොතමස්ස සාවකො ආගච්ඡති සමණො ආනන්දො. යාවතා ඛො පන සමණස්ස ගොතමස්ස සාවකා කොම්බියං පටිවසන්ති අයං තෙසං අඤ්ඤතරො සමණො ආනන්දො. අප්පසද්දකාමා ඛො පන තෙ ආයස්මන්තො අප්පසද්දවිනීතා අප්පසද්දස්ස වණ්ණවාදිනො, අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යා'ති. අථ ඛො තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන සන්දකො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො සන්දකො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච: එතු ඛො භවං ආනන්දො, ස්වාගතං[5] භොතො ආනන්දස්ස චිරස්සං ඛො භවං ආනන්දො ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය,

---

1. දෙවකතසොබ්භො - සීමු, මජසං, ස්‍යා
2. උච්චාසද්දාය මහාසද්දාය - PTS.
3. පුරිසකථං - මජසං, ස්‍යා, PTS, ඌතං
4. සණ්ඨාපෙසි - මජසං
5. සාගතං සීමු.

Free Distribution www.aathaapi.org

2. 3. 6

සන්දක සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර නිසා ඝෝෂිතාරාමයෙහි වැඩ වසනසේක. එසමයෙහි සන්දක පරිව්‍රාජක පන්සියක් පමණ වූ මහත් පිරිවැජි පිරිස් හා සමග පුලිල ගුහායෙහි වෙසෙයි. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ සවස්වේලෙහි පිළිසලනින් නැඟී සිටිසේක් 'ඇවැත්නි දෙවකටසොබ්භ (වැසිදියෙන් වළහුන් හෙබ) යම් තැනෙක්හි ද එහි ගුහාදර්ශනයට යමුහ'යි භික්ෂූන් ඇමැතුසේක. 'එසේ යැ ඇවැත්නි'යි ඒ මහණහු ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට පිළිවදන් දුන්හ. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග දෙවකටසොබ්භය කරා එළඹිසේක. එසමයෙහි සන්දක පිරිවැජි තෙම උද්ඝතනාද ඇති උස්හඬ මහහඬ නඟන අනෙකප්‍රකාර තිරශ්චීන කථා කරන මහත් පිරිවැජිපිරිස් හා සමග හුන්නේ වෙයි. ඒ කෙබඳු කථා යැ යත් : රජුන් පිළිබඳ කථා යැ සොරුන් පිළිබඳ කථා යැ මහඇමැතියන් පිළිබඳ කථා යැ සේනා පිළිබඳ කථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාරකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥතීන් පිළිබඳ කථා යැ යානකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීන් පිළිබඳ කථා යැ ශූරයන් පිළිබඳ කථා යැ වීථිකථා යැ කුම්භසථාන (පැන්තොට) කථා යැ (කුම්භදසීන් පිළිබඳ හෝ කථා යැ) පූර්වප්‍රේතකථා යැ නන්වැදෑරුම් නිරර්ථකකථා යැ ලෝකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ (ශාශ්වත උච්ඡෙදදි සවැදෑරුම්) භවාභවකථා යැ යන මේ යි.

සන්දක පිරිවැජි තෙමේ දුරින් මැ වඩනා ආයුෂ්මත් ආනන්ද තෙරුන් දුටුයේ යැ. දැක සියපිරිස සන්හුන් කරවී ය, 'භවත්නි, නිශ්ශබ්ද වෙත්වා, භවත්හු නහමක් ශබ්ද කරවූ, ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක වූ මේ ශ්‍රමණ ආනන්දයෝ පැමිණෙති, කොසඹෑනුවර ශ්‍රමණගෞතමයන්ගේ යම් පමණ ශ්‍රාවකයෝ වෙසෙත් ද, මේ ශ්‍රමණ ආනන්දයෝ ඔවුනතර එක්තරා කෙනෙක, ඒ ආයුෂ්මත්හු වැළින් නිහඬ බව කැමැත්තාහ, නිහඬ වූ බුදුරදුන් විසින් විනීතයහ, නිහඬ තැන්හි ගුණ කියන්නාහ, නිහඬපිරිස දැන එළැඹියයුතු කොට සිතා නම් මැනැවැ'යි. එකල්හි ඒ පරිව්‍රාජකයෝ නිහඬ වූහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ සන්දක පරිව්‍රාජක වෙත එළැඹියහ. ඉක්බිති සන්දක පරිව්‍රාජක ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කී : ''භවත් ආනන්දයෝ පැමිණෙන සේක්වා, භවත් ආනන්දයනට ස්වාගත යැ, භවත් ආනන්දයෝ මෙහි ඊමෙන් බොහෝ කලෙකින් මේ පරියාය (කරුණ) කළහ, භවත් ආනන්දයෝ වැඩහිඳිනා සේක්වා,

නිසීදතු භවං ආනන්දො, ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි ඛො ආයස්මා ආනන්දො පඤ්ඤත්තෙ ආසනෙ. සන්දකොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සන්දකං පරිබ්බාජකං ආයස්මා ආනන්දො එතදවොච: 'කායනුත්ථ සන්දක එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතා'ති. තිට්ඨතෙසා භො ආනන්ද කථා, යාය මයං එතරහි කථාය සන්නිසින්නා. නෙසා භොතො ආනන්දස්ස කථා දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. සාධු වත භවන්තංයෙව ආනන්දං පටිභාතු සකෙ ආචරියකෙ ධම්මී කථා'ති. තෙන හි සන්දක සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී'ති. එවං භොති ඛො සන්දකො පරිබ්බාජකො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. ආයස්මා ආනන්දො එතදවොච:

'චත්තාරොමෙ සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අබ්‍රහ්මචරියවාසා අක්ඛාතා, චත්තාරි ච අනස්සාසිකානි බ්‍රහ්මචරියානි අක්ඛාතානි, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා[1] න ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසල'න්ති.

කතමෙ පන තෙ භො ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො අබ්‍රහ්මචරියවාසා අක්ඛාතා, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා[1] න ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති:

ඉධ සන්දක එකච්චො සත්ථා එවංවාදී හොති එවංදිට්ඨී: 'නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඕපපතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති, චාතුම්මහාභූතිකො[2] අයං පුරිසො යදා කාලං කරොති පඨවී පඨවීකායං අනුපෙති අනුපගච්ඡති. ආපො ආපොකායං අනුපෙති අනුපගච්ඡති, තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති, වායො වායොකායං අනුපෙති අනුපගච්ඡති, ආකාසං ඉන්ද්‍රියානි සඞ්කමන්ති, ආසන්දිපඤ්චමා පුරිසා මතං ආදාය ගච්ඡන්ති, යාව ආළාහනා පදානි පඤ්ඤායන්ති, කාපොතකානි අට්ඨීනි භවන්ති, භස්සන්තාහුතියො, දත්තුපඤ්ඤත්තං යදිදං දානං තෙසං තුච්ඡං මුසා විලාපො යෙ කෙචි අත්ථිකවාදං වදන්ති, බාලෙ ච පණ්ඩිතෙ ච කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති න හොන්ති පරම්මරණා'ති. තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: 'අයං ඛො භවං සත්ථා එවංවාදී එවංදිට්ඨී. 'නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඕපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති, චාතුම්මහාභූතිකො අයං පුරිසො, යදා කාලං කරොති පඨවී පඨවීකායං අනුපෙති අනුපගච්ඡති, ආපො ආපොකායං අනුපෙති අනුපගච්ඡති, තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති,

1. වසන්තො ච - මජසං. ස්‍යා.
2. චාතුමහාභූතිකො - මජසං.

Free Distribution www.aathaapi.org

මේ අස්න පනවනලද්ද''යි. ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ පනවනලද අස්නෙහි වැඩහුන්හ. සන්දක පරිව්‍රාජක ද එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සන්දක පරිව්‍රාජකහට ආයුෂ්මත් අනඳ තෙරණුවෝ මෙලවදන් කීහ : ''සන්දකයෙනි, දැන් කවර නම් කථාවෙකින් යුක්ත වැ උන්හු ද, තොප විසින් කවර නම් කථාවක් අඩාළ කරනලද ද?''යි. භවත් ආනන්දයෙනි, මෙල කථාව තිබේවා, ඇපි දැන් යම් කථාවෙකින් යුක්ත වැ හුන්නමෝ නම් මෙල කථාව භවත් ආනන්දයනට පසු වත් ඇසීමට දුලබ නො වෙසි. භවත් ආනන්දයනට මැ ස්වකීය ආචාර්‍යවංශයෙහි දහැම් කථා වැටහේව'යි ආරාධනා කරමි. ''එසේ වී නම් සන්දකයෙනි, අසව, මොනොවට මෙනෙහි කරව, කියමි''යි. ''එසේ යැ භවත්නි'යි සන්දක පරිව්‍රාජක ආයුෂ්මත් අනඳ තෙරුන්ට පිළිවදන් ඇස්වී. ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ මෙල කරුණු වදළහ :

''සන්දකයෙනි, සත්ත්වයන්ගේ ආශයානුශය දන්නා වූ ඥෙයධර්මයන් දක්නා වූ ප්‍රත්‍යර්‍ථීන්ට නිසි හෙයින් අර්හත් වූ සත්‍යාවබොධය කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවත්හු විසින් සතර අබ්‍රම්සරවස් කෙනෙක් වදරනලද්දහ, අස්වැසිලි රහිත වූ සතර බ්‍රම්සරවස් කෙනෙක් ද වදරනලද්දහ : ''යම් බ්‍රහ්මචරිය වාසයෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසරවස් නො වසන්නේ ය, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය නො කරන්නේ යැ''යි.

භවත් ආනන්දයෙනි, නුවණින් දන්නා වූ ඇසින් දක්නා වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් කවර සතර අබ්‍රහ්මචරියවාස කෙනෙක් වදරනලද්දහු ද, ''යම් තැනෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසරවස් නො වසන්නේ යැ වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය නො කරන්නේ ද''යි:

සන්දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි: ''දුන් දෙය ඵල නැත, පූජායෙහි ඵල නැත, පඬුරු කොට අළ දෑයෙහි ඵල නැත, සුකෘත දුෂ්කෘත කර්මයන් ගේ ඵලයෙක් විපාකයෙක් නැත, මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, ඕපපාතික සත්ත්වයෝ නැත, සම්‍යග්ගත වූ සම්‍යක් ප්‍රතිපන්න වූ මහණබමුණු කෙනෙක් නැත, ලොවැ යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ මැ දැන ප්‍රත්‍යක්ෂ කොට පවසත් නම් ඔහු යි. මේ පුරුෂ සතර මහාභූතයෙන් උපන. යම් කලෙක කලුරිය කෙරේ ද එකල පෘථිවිධාතුව බාහිර පෘථිවිධාතුවට එක් වෙයි අනුව යෙයි, ආධ්‍යාත්මික අබ්ධාතුව බාහිර අබ්ධාතුවට එක් වෙයි, ආධ්‍යාත්මික තෙජොධාතුව බාහිර තෙජොධාතුවට එක්වෙයි, ආධ්‍යාත්මික වායෝධාතුව බාහිර වායොධාතුවට එක්වෙයි, ඉන්ද්‍රියයෝ ආකාශධාතුවට දිවෙති, හොත් ඇඳ පස්වනු කොට ඇති පුරුෂයෝ සිව් දෙනෙක් මළහු ගෙන යෙති, සොහොන දක්වා ගුණපදයෝ පැනෙති, පරෙවිපැහැ ඇති ඇට ශේෂ වෙයි, දනාදි සත්කාරයෝ භස්මය අන්ත කොට ඇත්තාහ, යම් දීමෙක් වේ ද එය බාලයන් විසින් පනවනලද්දෙක, යම් කෙනෙක් ආස්තිකවාද පවසත් ද එය උන් ගේ සිස් වූ මෘෂායෙක විලාපයෙක, බාලයෝ ද පණ්ඩිතයෝ ද කය බිඳීමෙන් උච්ඡෙදයට විනාශයට පැමිණෙති, මරණින් මතු නො වෙත්''යයි. සන්දකය, විඥ වූ පුරුෂ එහිලා මෙසේ නුවණින් සලකයි : ''මේ භවත් ශාස්තෘ තෙම මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තෙක : දෙනලද්දෙහි ඵල නැත, පුදනා ලද්දෙහි ඵල නැත, පඬුරු කොට අළ දෑයෙහි ඵල නැත, සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත, මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, ඕපපාතික සත්ත්වයෝ නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ මැ දැන ප්‍රත්‍යක්ෂ කොට පවසත් ද එබඳු වූ සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණබමුණු කෙනෙක් නැත, මේ පුරුෂ සතර මහාභූතයෙන් උපන, යම් කලෙකැ කලුරිය කෙරේ ද, එකල පෘථිවිධාතුව පෘතුවිධාතුවට පැමිණෙයි, අබ්ධාතුව

වායො වායොකායං අනුපෙති අනුපගච්ඡති, ආකාසං ඉන්ද්‍රියානි සඞ්කමන්ති, ආසන්දි පඤ්චමා පුරිසා මතං ආදාය ගච්ඡන්ති, යාව ආළාහනා පදානි පඤ්ඤායන්ති, කාපොතකානි අට්ඨීනි භවන්ති, භස්සන්තාහුතියො, දත්තුපඤ්ඤත්තං යදිදං දානං, තෙසං තුච්ඡං මුසා විලාපො යෙ කෙචි අත්ථිකවාදං වදන්ති, බාලෙ ච පණ්ඩිතෙ ච කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණාති. සචෙ ඉමස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අකතෙන මෙ එත්ථ කතං, අබ්‍රූසිතෙන[1] මෙ එත්ථ වුසිතං, උභොපි මයං එත්ථ සමසමා සාමඤ්ඤං පත්තා, යො චාහං න වදාමි: 'උභො කායස්ස භෙදා උච්ඡිජ්ජිස්සාම විනස්සිස්සාම, න භවිස්සාම පරම්මරණා'ති. අතිරෙකං ඛො පනිමස්ස භොතො සත්ථුනො නග්ගියං මුණ්ඩියං උක්කුටිකප්පධානං කෙසමස්සුලොචනං, යොහං පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තො කාසිකචන්දනං පච්චනුභොන්තො මාලාගන්ධවිලෙපනං ධාරෙන්තො ජාතරූපරජතං සාදියන්තො ඉමිනා භොතා සත්ථාරා සමසමගතිකො භවිස්සාමි අභිසම්පරායං, සොහං කිංජානන්තො කිංපස්සන්තො ඉමස්මිං සත්ථරි බ්‍රහ්මචරියං චරිස්සාමි, සො අබ්‍රහ්මචරියවාසො අය'න්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. අයං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමො අබ්‍රහ්මචරියවාසො අක්ඛාතො යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුනචපරං සන්දක ඉධෙකච්චො සත්ථා එවංවාදී හොති එවංදිට්ඨි: 'කරතො[2] කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො[3] සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසාභණතො, කරතො[2] න කරීයති පාපං ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං[4] එකමංසපුඤ්ජං[5] කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො[6] නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො, උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො[7] නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො'ති.

---

1. අවුසිතෙන - මජ්සං. PTS.
2. කරොතො - මජ්සං.
3. පචාපයතො - මජ්සං. ස්‍යා.
4. එකං මංසඛලං - මජ්සං. ස්‍යා.
5. එකං පුඤ්ජං - මජ්සං. ස්‍යා.
6. පාචාපෙන්තා - මජ්සං.
7. යජාපෙන්තො - මජ්සං. ස්‍යා.

අබ්ධාතුවට පැමිණෙයි, වායෝධාතුව වායෝධාතුවට පැමිණෙයි, ඉන්ද්‍රියයෝ ආකාශ ධාතුවට දිවෙති, හොත් ඇඳ පස්වනු කොට ඇති පුරුෂයෝ මළහු ගෙන යෙති, සොහොන දක්වා ගුණපදයෝ පැනෙති, පරෙවිපැහැ ඇති ඇට ශේෂ වෙයි, දනාදි සත්කාරයෝ භස්මය අන්ත කොට ඇත්තාහ, දනය බාලයන් විසින් පනවන ලද, යම් කෙනෙක් ආස්තික වාදය පවසත් ද එය උන් ගේ සිස් වූ මෘෂායෙක, විලාපයෙක, බාලයෝ ද පණ්ඩිතයෝ ද කය බිඳීමෙන් උච්ඡේදයට විනාශයට පැමිණෙති, මරණින් මතු නො වෙත්''යයි. ඉදින් මේ භවත් ශාස්තෘහු ගේ වචනය සැබැවෙක් නම් මොහු ගේ ශාසනයෙහි මහණදම් නො කළ මා විසින් කරන ලද, මොහු ගේ ශාසනයෙහි බඹසරවස් නො විසූ මා විසින් බඹසරවස් වසන ලද, මේ ශ්‍රමණධර්මයෙහි ඇපි දෙදෙන මැ සමසම වූම්හ, සමාන බවට පැමිණියම්හ, මම වූකලී ඇපි දෙදෙන මැ කය බිඳීමෙන් උච්ඡේදයට පැමිණෙම්හ, වැනැසෙම්හ, මරණින් මතු නො වම්හ'යි නො කියමි. යළි මේ භවත් ශාස්තෘහු ගේ නග්න බව මුඩු බව උළුලුපදහන, කෙස්රවුළු සිඳීම අතිරේකයෙකි, මම් පුත්‍රසම්බාධශයනයෙහි වසන්නෙමි කසීසඳුන් වළඳනුයෙම් මල්ගඳ විලෙවුන් දරනුයෙම් රන්රිදී ඉවසනුයෙම් පරලොව දී මේ භවත් ශාස්තෘහු හා සමානගති ඇති වන්නෙමි, ඒ මම් කුමක් දන්නෙම් කුමක් දක්නෙම් මේ ශාස්තෘහු කෙරෙහි බඹසර වෙසෙම් ද?යි. හේ 'මේ අබ්‍රහ්මචර්‍ය්‍යවාසයෙකැ'යි මෙසේ දන ඒ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් කලකිරී නික්ම යෙයි. සන්දකය, දන්නා වූ දක්නා වූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් මේ පළමු වන අබ්‍රහ්මචර්‍ය්‍යවාසය වදරන ලද්දේ යැ, යම් බඹසරෙකැ විඥ වූ පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය ආරාධනය නො කරන්නේ යි.

තවද සන්දකයෙනි, මෙලොවැ ඇතැම් ශාස්තෘ කෙනෙක් මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙති : ''(සියතින්) කරන්නාහට (අණින්) කරවන්නාහට සිඳින්නාට සිඳුවන්නාට (දඬින්) පෙළන්නාට පෙළවන්නාට ශෝක කරන්නාට කරවන්නාට ක්ලාන්ත කරන්නාට කරවන්නාට එන්දනය කරන්නාහට කරවන්නාහට ප්‍රාණවධ කරන්නාහට නුදුන්දය ගන්නාහට ගෘහසන්ධි සිඳින්නාහට ගම් පහරනුවහට එක්ගෙයක් පැහැර ගන්නාහට මංපහරනුවහට පරඹුවන් කරා යන්නහුට මුසවා කියනුවහුට (පව් කෙරෙමි හැඟ) කරන්නාහට ද පව් නැති. යමෙක් ක්‍ෂුරධාරා නිම්වලලු කොට ඇති චක්‍රයෙන් මෙ පොළොවහි ප්‍රාණින් එක් මස්රැසක් එක් මාංශපුඤ්ජයක් කරන්නේ නම් එ හේතුවෙන් පව් නැත, පාපයාගේ පැමිණීමෙක් නැත, නසමින් නස්වමින් සිඳමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් ඉදින් ගඞ්ගානදියෙහි දකුණු ඉවුරට යන්නේ නමුදු එ හෙතුවෙන් පාපයෙක් නැත, පාපයාගේ පැමිණීමෙක් නැත. දෙමින් දෙවමින් යාග කරමින් කරවමින් ඉදින් ගඞ්ගානදියෙහි උතුරු ඉවුරට යන්නේ නමුදු එ හේතුවෙන් පිනෙක් නැත, පුණ්‍යයාගේ පැමිණීමෙක් නැත, දනයෙන් ඉන්ද්‍රිය දමනයෙන් කායවාක් සංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත, පුණ්‍යයාගේ පැමිණීමෙක් නැතැ''යි,

තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: අයං ඛො භවං සත්ථා එවංවාදී එවංදිට්ඨී: ‘කරතො කාරයතො ඡින්දතො ඡේදාපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසාභණතො කරතො න කරීයති පාපං. ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡේදාපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමොති.

සචෙ ඉමස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අකතෙන මෙ එත්ථ කතං, අවුසිතෙන මෙ එත්ථ වුසිතං. උභොපි මයං එත්ථ සමසමා සාමඤ්ඤං පත්තා, යො චාහං න වදාමි, ‘උභින්නං කුරුතං න කරීයති පාප’න්ති. අතිරෙකං ඛො පනිමස්ස භොතො සත්ථුනො නග්ගියං මුණ්ඩියං උක්කුටිකප්පධානං කෙසමස්සුලොචනං, යොහං පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තො කාසිකචන්දනං පච්චනුභොන්තො මාලාගන්ධවිලෙපනං ධාරෙන්තො ජාතරූපරජතං සාදියන්තො ඉමිනා භොතා සත්ථාරා සමසමගතිකො භවිස්සාමි අභිසම්පරායං. සොහං කිංජානන්තො කිංපස්සන්තො ඉමස්මිං සත්ථරි බ්‍රහ්මචරියං චරිස්සාමි, සො ‘අබ්‍රහ්මචරියවාසො අයන්ති’ ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති.[1] අයං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දුතියො අබ්‍රහ්මචරියවාසො අක්ඛාතො, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා න ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුනචපරං සන්දක ඉධෙකච්චො සත්ථා එවංවාදී හොති එවංදිට්ඨී: ‘නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සඞ්කිලෙසාය, අහෙතූ අප්පච්චයා සත්තා සඞ්කිලිස්සන්ති. නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා, අහෙතූ අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසත්ථාමො නත්ථි පුරිසපරක්කමො, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා නියතිසඞ්ගතිභාවපරිණතා ඡස්වෙවාභිජාතිසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී’ති.

1. නිබ්බිජ්ජාපක්කමති - සීමු.

සන්දකය, එහිලා නුවණැති පුරුෂ මෙසේ නුවණින් සලකයි : ''මේ භවත් ශාස්තෘ තෙම මෙවන් වාද ඇත්තෙක, මෙවන් දෘෂ්ටි ඇත්තෙක : ''කරන්නාහට කරවන්නාහට සිඳින්නාහට සිඳුවන්නාහට වෙහෙසන්නාහට වෙහෙසවන්නාහට ශොක කරවන්නාහට ක්ලාන්ත කරවන්නාහට සලන්නාහට සලවන්නාහට ප්‍රාණවධ කරන්නාහට නුදුන් දෑ ගන්නාහට ගෘහසන්ධි සිඳින්නාහට ගම් පහරන්නාහට එක් ගෙයක් පැහැර ගන්නාහට මං පහරන්නාහට පරඹුන් කරා යන්නාහට මුසවා බණන්නහුට දන දන පව් කරන්නාහට පාපයෙක් නැති. ඉදින් යමෙක් ක්ෂුරපර්‍යන්ත චක්‍රයෙන් මේ පොළොවෙහි ප්‍රාණීන් එක් මස්රැසක් එක් මාංශපුඤ්ජයක් කරන්නේ නමුදු ඒ හේතුවෙන් පාපයෙක් නැත, පාපයාගේ පැමිණීමෙක් නැත, ඉදින් නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් ගඞ්ගානදියෙහි දකුණු ඉවුරට යන්නේ නමුදු ඒ හේතුවෙන් පාපයෙක් නැත, පාපයාගේ පැමිණීමෙක් නැත, ඉදින් දෙමින් දෙවමින් යාග කෙරෙමින් කරවමින් ගඞ්ගානදියෙහි උතුරු ඉවුරට යේ නමුදු එ හේතුවෙන් පිනෙක් නැත, පුණ්‍යයාගේ පැමිණීමෙක් නැත. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත, පින් පැමිණීමෙක් නැතැ',යි.

ඉදින් මේ භවත් ශාස්තෘහුගේ වචනය සැබෑවෙක් වේ නම් මෙහි මහණදම් නො කළ මා විසින් කරන ලද, මෙහි බඹසරවස් නො විසූ මා විසින් වසනලද, තෙල මහණදහමිහි ඇපි දෙදෙන මැ ගුණයෙන් සමසම වම්හ, සමබවට පැමිණියම්හ, මම් වූකලි 'පව් කරන දෙදෙනාහට පාපය නො කැරේ'යයි නො කියමි. මේ භවත් ශාස්තෘහු ගේ වැළිත් නග්න බව මුඩු බව උළුපදහන කෙහෙරවුළු සිඳීම අතිරේකයෙකි. මම පුත්‍රසම්බාධශයනයෙහි වාසය කරන්නෙම් කසීසඳුන් වළඳනෙම් මල්ගඳවිලෙවුන් දරන්නෙම් රන්රිදී ඉවසන්නෙම් මේ භවත් ශාස්තෘහු හා සමග පරලොව දී සමානගති ඇත්තෙකිඹ වෙමි. ඒ මම කුමක් දන්නෙම් කුමක් දක්නෙම් මේ ශාස්තෘහු කෙරෙහි බඹසර වෙසෙම් ද? හෙ තෙම මේ අබ්‍රහ්මචරියවාසයෙකැ'යි මෙසේ දැන ඒ බ්‍රහ්මචරියයෙන් නිර්වේදයට පැමිණ නික්ම යෙයි. සන්දකය, ඒ සියල්ල දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් මේ දෙ වැනි අබ්‍රහ්මචරියවාසය වදරනලද්දේ යැ. යම් තැනෙකැ විඥ වූ පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය නො කරන්නේ යැ.

තවද සන්දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘ කෙනෙක් මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙති : ''සත්ත්වයන් ගේ කෙලෙසීමට හෙතුයෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති, අහෙතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සත්ත්වයන් ගේ විශුද්ධියට හේතුයෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති, අහේතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ විශුද්ධ වෙති. බලයෙක් නැත, වීර්‍ය්‍යයෙක් නැත, පුරුෂශක්තියෙක් නැත, පුරුෂපරාක්‍රමයෙක් නැති. හැම සත්හු හැම ප්‍රාණීහු හැම භූතයෝ හැම ජීවයෝ වසඟ නො වූවාහු බල රහිත වූවාහු වීර්‍ය්‍ය රහිත වූවාහු නියතිසඞ්ගති ස්වභාවයෙන් පරිණත වූවාහු අභිජාති සයෙකැ මැ සිට සුවදුක් විඳිත්''යයි.

තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: ‘අයං ඛො භවං සත්ථා එවංවාදී එවංදිට්ඨී: නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සඞ්කිලෙසාය. අහෙතු අප්පච්චයා සත්තා සඞ්කිලිස්සන්ති. නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා. අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසත්ථාමො නත්ථි පුරිසපරක්කමො, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා නියතිසඞ්ගතිභාවපරිණතා ඡස්සෙවාභිජාතිසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී’ති. සචෙ ඉමස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අකතෙන මෙ එත්ථ කතං, අබ්බුසිතෙන මෙ එත්ථ වුසිතං. උභොපි මයං එත්ථ සමසමා සාමඤ්ඤං පත්තා, යොචාහං න වදාමි, උභො අහෙතු අප්පච්චයා විසුජ්ඣිස්සාමා’ති. අතිරෙකං ඛො පනිමස්ස භොතො සත්ථුනො නග්ගියං මුණ්ඩියං උක්කුටිකප්පධානං කෙසමස්සු ලොචනං. යොහං පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තො කාසිකචන්දනං පච්චනුභොන්තො මාලාගන්ධවිලෙපනං ධාරෙන්තො ජාත-රූපරජතං සාදියන්තො ඉමිනා භොතා සත්ථාරා සමසමගතිකො භවිස්සාමි අභිසම්පරායං. සොහං කිංජානන්තො කිංපස්සන්තො ඉමස්මිං සත්ථරි බ්‍රහ්මචරියං චරිස්සාමි. සො අබ්‍රහ්මචරියවාසො අය’න්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. අයං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තතියො අබ්‍රහ්ම-චරියවාසො අක්ඛාතො, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුනචපරං සන්දක ඉධෙකච්චො සත්ථා එවංවාදී හොති එවංදිට්ඨී: ‘සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති න විපරිනමන්ති.[1] නාඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති. නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. කතමෙ සත්ත: පඨවිකායො ආපොකායො තෙජොකායො වායො-කායො සුඛෙ දුක්ඛෙ ජීවෙ සත්තිමෙ. ඉමෙ සත්ත කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිනමන්ති,[1] නාඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. තත්ථ නත්ථි හන්තා වා ඝාතෙතා වා සොතා වා සාවෙතා වා විඤ්ඤාතා වා විඤ්ඤාපෙතා වා. යෙපි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති. න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති. සත්තන්නං ත්වෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපතති.

1. විපරිනාමෙන්ති - මජ්සං. ස්‍යා

සන්‍දකය, එහි ලා විඥ වූ පුරුෂ මෙසේ නුවණින් සලකයි : මේ භවත් ශාස්තෘ තෙම මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි : ''සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුයෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති, අහේතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සත්ත්වයන්ගේ විශුද්ධියට හේතුයෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති, අහේතු අප්‍රත්‍යයෙන් සත්ත්වයෝ විශුද්ධ වෙති. බලයෙක් නැත, වීය්‍ර්‍යයෙක් නැත, පුරුෂ ශක්තියෙක් නැත, පුරුෂ පරාක්‍රමයෙක් නැති. හැම සත්හු හැම ප්‍රාණීහු හැම භූතයෝ හැම ජීවයෝ අවශයහ, අබලයහ, අවීය්‍ර්‍යයහ. නියතිසඞ්ගතිස්වභාවයෙන් පරිණත වූවාහු අභිජාති සයෙක්හි මැ සුවදුක් විඳුති. ඉදින් මේ භවත් ශාස්තෘහු ගේ වචනය සැබෑවෙක් වී නම්, මොහුගේ ශාසනයෙහි මහණදම් නො කළ මා විසින් කරන ලද, බඹසරවස් නො විසූ මා විසින් වසන ලද. මේ ශ්‍රමණධර්මයෙහි ඇපි දෙදෙන මැ සමසම වූම්හ, සමාන බවට පැමිණියම්හ. මම වූකලි ඇපි දෙදෙන මැ අහේතු අප්‍රත්‍යයෙන් විශුද්ධ වම්හ'යි නො කියමි. මේ භවත් ශාස්තෘහුගේ වැළිත් නග්න බව මුඩු බව උළුලුපදභන කෙස්රවුළු සිඳීම අතිරේකයෙකි. ඒ මම් පුත්‍රසම්බාධ ශයනයෙහි වසනෙම් කසීසඳුන් වළඳනෙම් මල්ගඳවිලෙවුන් ධරනුයෙම් රන්රිදී ඉවසනුයෙම් මේ භවත් ශාස්තෘහු හා සමග පරලොවහි සමසම ගති ඇත්තෙම් වෙමි. ඒ මම් කවර ගුණයක් දන්නෙම් දක්නෙම් මේ ශාස්තෘහු කෙරෙහි බඹසරවස් වසනෙම් ද? හෙතෙම මේ 'අබ්‍රහ්මචරියවාසයෙකැ'යි දැන ඒ බ්‍රහ්මචය්‍ර්‍යයෙන් නිර්වේදයට පැමිණ නික්ම යෙයි. සන්‍දකය, ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ තුන් වැනි අබ්‍රහ්මචරිය වාසය වදාරනලද්දේ යැ. යම් තැනෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසරවස් නො වසන්නේ යැ වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍ය ධර්මය සම්පාදනය නො කරන්නේ යි,

තවද සන්‍දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘ කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති : (කිසිවකු විසින්) නො කරන ලද නො කළ විධාන ඇති (සෘද්ධියෙනුදු) නො මවන ලද නො මවවන ලද වඳ වූ ගිරිකුළු මෙන් සිටියා වූ එෂිකාස්තම්භයක් මෙන් සිටි මේ සත් කාය කෙනෙක් වෙති. ඔහු නො සැලෙති, පියවි නො හරිති, ඔවුනොවුන් නො පෙළති, උනුනට සුව පිණිස වේවයි දුක් පිණිස වේවයි සුවදුක් පිණිස වේවයි නො සමත් වෙති. කවර සත් දෙනෙක යත් : පෘථිවිකාය යැ ආපෝකාය යැ තේජෝ කාය යැ වායෝකාය යැ සුඛ යැ දුක්ඛ යැ ජීව යැ යන මේ සත යි. මේ සප්තකායයෝ ආකෘතයහ, අකෘතවිධානයහ, අනිර්මිතයහ, අනිර්මාතෘයහ, අවන්ධ්‍යයහ, කූටස්ථයහ, එෂිකාස්ථායීස්ථිතයහ. ඔහු නො සැලෙති, නො පෙරළෙති, ඔවුනොවුන් නො පෙළති, උනුනට සුව පිණිස වේවයි දුක් පිණිස වේවයි සුවදුක් පිණිස වේවයි නො සමත් වෙත්. ඒ සප්තකායයන් අතුරෙහි නසන්නෙක් හෝ නස්වන්නෙක් හෝ අසන්නෙක් හෝ අස්වන්නෙක් හෝ දන්නෙක්හෝ දන්වන්නෙක් හෝ නැති යමෙක් තියුණු සැතින් හිස සිඳි නමුදු කිසිවෙක් කිසිවකු දිවියෙන් තොර නො කෙරෙයි. වැළි සත් වැදෑරුම් කායයන් අතුරෙන් මැ ශස්ත්‍රය විවරයට පිවිසෙයි.

චුද්දස ඛො පනිමානි යොනිපමුඛසතසහස්සානි සට්ඨිඤ්ච සතානි ඡ ච සතානි. පඤ්ච ච කම්මුනො සතානි පඤ්ච ච කම්මානි තීණි ච කම්මානි කම්මෙ ච අඩ්ඪකම්මෙ ච, ද්වට්ඨි පටිපදා, ද්වට්ඨන්තරකප්පා, ඡළාභිජාතියො, අට්ඨපුරිසභූමියො, එකූනපඤ්ඤාස ආජීවසතෙ,[1] එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ, එකූනපඤ්ඤාස නාගාවාසසතෙ, වීසෙ ඉන්ද්‍රියසතෙ, තිංසෙ නිරයසතෙ, ඡත්තිංස රජොධාතුයො, සත්ත සඤ්ඤීගබ්භා, සත්ත අසඤ්ඤීගබ්භා, සත්ත නිගණ්ඨිගබ්භා,[2] සත්ත දෙවා, සත්ත මානුසා, සත්ත පෙසාචා,[3] සත්ත සරා, සත්ත පවුටා,[4] සත්ත පපාතා, සත්ත පපාතසතානි, සත්තසුපිනා, සත්තසුපිනසතානි, චුල්ලාසීතිමහාකප්පුනො[5] සතසහස්සානි යානි බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. තත්ථ නත්ථි ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි, පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරිස්සාමීති[6]. හෙවං නත්ථි දොණමිතෙ සුඛදුක්ඛෙ, පරියන්තකතෙ සංසාරෙ, නත්ථි හායනවඩ්ඪනෙ, නත්ථි උක්කංසාවකංසෙ. සෙය්‍යථාපි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙවං බාලෙ ච පණ්ඩිතෙ වා සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.

තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: අයං ඛො භවං සත්ථා එවංවාදී එවංදිට්ඨී: සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිනමන්ති, නාඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. කතමෙ සත්ත: පඨවීකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ සත්තිමෙ. ඉමෙ සත්ත කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිනමන්ති, නාඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති. නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. තත්ථ නත්ථි හන්තා වා ඝාතෙතා වා සොතා වා සාවෙතා වා විඤ්ඤාතා වා විඤ්ඤාපෙතා වා යොපි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති, න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති, සත්තන්නං යෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපතති.

චුද්දස ඛො පනිමානි යොනි පමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි පඤ්ච ච කම්මුනො සතානි පඤ්ච ච කම්මානි තීණි ච කම්මානි කම්මෙ ච අඩ්ඪකම්මෙ ච ද්වට්ඨිපටිපදා ද්වට්ඨන්තරකප්පා ඡළාභිජාතියො අට්ඨ පුරිසභූමියො එකූනපඤ්ඤාස ආජීවසතෙ[1] එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ එකූනපඤ්ඤාස නාගාවාසසතෙ වීසෙ ඉන්ද්‍රියසතෙ තිංසෙ නිරයසතෙ ඡත්තිංස රජොධාතුයො සත්ත සඤ්ඤීගබ්භා සත්ත අසඤ්ඤීගබ්භා සත්ත නිගණ්ඨිගබ්භා සත්ත දෙවා සත්ත මානුසා සත්ත පෙසාචා සත්ත සරා සත්ත පවුටා සත්ත පපාතා සත්ත පපාතසතානි සත්ත සුපිනා සුපිනසතානි චුල්ලාසීති මහාකප්පුනො සතසහස්සානි. යානි බාලෙ ච

1. ආජීවකසතෙ - සීමු, මජසං.
2. නිගන්ථගබ්භා - ස්‍යා.
3. පිසාචා - මජසං, ස්‍යා.
4. පමුටා - සීමු.
5. මහාකප්පිනො - මජසං, ස්‍යා.
6. බ්‍යන්තිං කරිස්සාමීති - මජසං

තවද මේ උත්තමයෝනිහු තුදුස්සියදහසක් ද සදහසක් ද සසියයක් ද වෙති. කර්‍ම පන්සියයක් ද, කර්‍ම පසක් ද, කර්‍ම තුනක් ද කර්‍මයක් ද අර්‍ධකර්‍මයක් ද වෙයි. දෙසැට ප්‍රතිපදයෙක. දෙසැට අන්තරකල්පයෙක. ෂට් අභිජාතියෙක. අෂ්ට පුරුෂභූමියෙක. එකුන්පනස් ආජීවවෘත්තිශතයෝයැ, එකුන්පනස් පිරිවැජිපැවිදිසියයෝයැ, එකුන්පනස් නාමඩුලුසියයෙක, විසි ඉඳුරන්සියයෙක, තිස් නිරැසියයෙක, සතිස් රජස්ධාතූහු ය, (ඔටු ආදි සත් වැදෑරුම්) සංඥිගර්‍භයෝ ය, (හැල් ආදි) සත් අසංඥි ගර්‍භයෝ ය, උඟු ආදි සත් නිගණ්ඨි ගර්‍භයෝ යැ, සත් දෙව්යෝ ය, සත් මිනිස්හු ය, සත් පිශාචයෝ ය, සත් මහවිල්හු ය, සත් ගණ්ඨිකයෝ ය, මහාප්‍රපාත සතෙක, කුඩා ප්‍රපාත සත්සියයෙක, මහා සිහින සතෙක, කුඩා සිහින සත්සියයෙක, යම් කල්ප කෙනෙක් බාලයෝ ද පණ්ඩිතයෝ ද සංධාවනය කොට සංසරණය කොට දුක් කෙළවර කරන්නාහු ද ඒ මහාකල්පයෝ සුවාසූසියදහසෙකි. එහි මම් මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ නො මුහු කළ කර්‍මය හෝ මුහුකුරු වන්නෙමියි නැත. මුහුකළ කර්‍මය හෝ පැහැස පැහැස කෙළවර කරන්නෙමි'යි මෙසේ නැත් මැ යි. සුවදුක් ද්‍රෝණයෙන් මනනලද වැන්න, (කි පමණ කලෙකින්) සසර පිරියත් කරනලද යැ, වෘද්ධිහානි නැති, (බාලපණ්ඩිතයනට සසර අඩුවැඩි නො වෙයි සේයි) උත්කර්‍ෂාවකර්‍ෂයෙක් නැති, යම්සේ හූවට (ගලක් හෝ ගසක් උඩ සිට) දමනලදුයේ (හූ පමණින්) වෙළුම් හරිමින් මැ යේ ද එසෙයින් මැ බාලයෝ ද පණ්ඩිතයෝ ද සංධාවන සංසරණ කොට දුක් කෙළවර කරන්නාහ'යි.

සන්දකය, එහි ලා විඥ පුරුෂ මෙසේ සලකයි : ''මේ භවත් ශාස්තෘ තෙම මෙබඳු වාද ඇත්තෙක, මෙබඳු දෘෂ්ටි ඇත්තෙක : නො කළ, නො කළ විධාන ඇති, නො මැවූ, නො මවවනලද, වඳ වූ, ගිරිකුළු මෙන් සිටියා වූ, එෂිකාස්තම්භයක් මෙන් සිටි, මේ සත් කාය කෙනෙක් වෙති. ඔහු නො සැලෙති, පියවි නො හරිති, ඔවුනොවුන් නො පෙළති, උනුනට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො සමත් වෙති. කවර සත් දෙනෙක යත් : පෘථිවිකාය යැ ආපෝකාය යැ තේජෝකාය යැ වායෝකාය යැ සුඛ යැ දුක්ඛ යැ ජීව යැ යන මේ සත යි. මේ සප්තකායයෝ අකෘතයහ, අකෘත විධානයහ, අනිර්මිතයහ අනිර්මාතෘයහ, වන්ධ්‍යයහ, කූටස්ථයහ, එෂිකාස්ථායිස්ථිතයහ. ඔහු නො සැලෙති නො පෙරැළෙති, ඔවුනොවුන් නො පෙළති, උනුනුට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො සමත් වෙති, ඒ සප්තකායයන් අතුරෙහි නසන්නෙක් හෝ නස්වන්නෙක් හෝ අසන්නෙක් හෝ අස්වන්නෙක් හෝ දන්නෙක් හෝ දන්වන්නෙක් හෝ නැති. යමෙක් තිහිණි සැතින් හිස සිඳී නමුදු කිසිවෙක් කිසිවකු දිවියෙන් තොර නො කෙරෙයි, වැළි සත්වැදෑරුම් කායයන් අතුරෙන් මැ ශස්ත්‍රය විවරයට පිවිසෙයි.

තවද මේ උත්තමයෝනිහු තුදුස්සියදහසක් ද සදහසක් ද සසියයක් ද වෙති. කර්‍ම පන්සියක් ද කර්‍මපසක් ද කර්‍ම තුනක් ද කර්‍මයක් ද අර්‍ධකර්‍මයක් ද වෙයි, දෙසැට ප්‍රතිපදයෙක දෙසැට අන්තරකල්පයෙක ෂට් අභිජාතියෙක අෂ්ට පුරුෂභූමියෙක, එකුන් පනස් ආජීව වෘත්තිශතයෝ යැ එකුන්පනස් පරිව්‍රාජකශතයෝ යැ එකුන්පනස් නාමඩුලුසියයෝ යැ විංශත් ඉන්ද්‍රියශතයෝ යැ ත්‍රිංශත් නිරයශතයෝ යැ ෂට්ත්‍රිංශත් රජස්ධාතූහු යැ සත් වැදෑරුම් සංඥිගර්‍භයෝ යැ සත් අසංඥි ගර්‍භයෝ යැ සත් නිර්ග්‍රන්ථිගර්‍භයෝ යැ සත් දෙව්යෝ යැ සත් මිනිස්හු යැ සත් පිශාචයෝ යැ සත් මහවිල්හු යැ සත් ගණ්ඨිකයෝ යැ මහාප්‍රපාත සතෙක, කුඩා ප්‍රපාත සත්සියයෙක, මහා සිහින සතෙක, කුඩා සිහින සත්සියයෙක, යම් කල්ප කෙනෙක් බාලයෝ ද පණ්ඩිතයෝ ද සංධාවන සංසරණ කොට දුක් කෙළවර

පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. තත්ථ නත්ථි ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි, පරිපක්කං වා ඵුස්ස ඵුස්ස ව්‍යන්තීකරිස්සාමීති හෙවං නත්ථි දොණමිතෙ සුඛදුක්ඛෙ, පරියන්තකතෙ සංසාරෙ, නත්ථි හායනවඩ්ඪනෙ නත්ථි උක්කංසාවකංසෙ. සෙය්‍යථාපි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති. එවමෙවං බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තී’ති.

සචෙ ඉමස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අකතෙන මෙ එත්ථ කතං අවුසිතෙන මෙ එත්ථ වුසිතං. උභොපි මයං එත්ථ සමසමා සාමඤ්ඤං පත්තා, යො චාහං න වදාමි: උභො සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සාමා’ති. අතිරෙකං ඛො පනිමස්ස භොතො සත්ථුනො නග්ගියං මුණ්ඩියං උක්කුටිකප්පධානං කෙසමස්සුලොචනං, යොහං පුත්තසම්බාධසයනං[1] අජ්ඣාවසන්තො කාසිකචන්දනං පච්චනුභොන්තො මාලාගන්ධවිලෙපනං ධාරෙන්තො ජාතිරූපරජතං සාදියන්තො ඉමිනා භොතා සත්ථාරා සමසමගතිකො භවිස්සාමි අභිසම්පරායං. සොහං කිංජානන්තො කිංපස්සන්තො ඉමස්මිං සත්ථරි බ්‍රහ්මචරියං චරිස්සාමි. සො අබ්‍රහ්මචරියවාසො අයන්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති අයං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චතුත්ථො අබ්‍රහ්මචරියවාසො අක්ඛාතො යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං. ඉමෙ ඛො තෙ සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො අබ්‍රහ්මචරියවාසා අක්ඛාතා යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති.

අච්ඡරියං භො ආනන්ද, අබ්භුතං භො ආනන්ද, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො අබ්‍රහ්මචරියවාසා වසමානා අබ්‍රහ්මචරියවාසාති අක්ඛාතා යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති.

කතමානි පන තානි භො ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරි අනස්සාසිකානි බ්‍රහ්මචරියානි අක්ඛාතානි යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති :

1. වසනං - සීමු, මජසං

කෙරෙත් ද ඒ මහා කල්පයෝ සුවාසූසියදහසෙක, එහි මම මේ ශීලයෙන් වේවයි ව්‍රතයෙන් වේවයි තපසින් වේවයි බ්‍රහ්මචර්‍ය්‍යයෙන් වේවයි නො මුහුකළ කර්‍මය හෝ මුහුකුරු වන්නෙමි'යි නැත, මුහුකළ කර්‍මය හෝ පැහැස පැහැස කෙළවර කරන්නෙමි'යි මෙසේ නැති. සුවඳුක් ද්‍රොණයෙන් මනනලද වැන්න, (කී පමණ කලෙකින්) සසර පිරියත් කරනලද යැ අඩුවැඩි නැත, උත්කර්‍ෂාවකර්‍ෂ නැති. යම්සේ හුවටෙක් (ගලක් හෝ ගසක් මතුයෙහි සිට) දමන ලදුයේ වෙළුම් හරිමින් මැ යේ ද එසෙයින් මැ බාලයෝ ද පණ්ඩිතයෝ ද සංධාවන සංසරණ කොට දුක් කෙළවර කරන්නාහ''යි.

ඉදින් මේ භවත් ශාස්තෘහු ගේ වචනය සැබැවෙක් වී නම්, ''ඇපි දෙදෙන සංධාවන කොට සංසරණය කොට දුක් කෙළවර කරම්හ''යි මම් නො කියමි, නමුදු තෙල සස්නෙහි මහණුවම් නො කළ මා විසින් මහණුවම් කරන ලද, තුලුන්ගේ සස්නෙහි බඹසරවස් නො විසූ මා විසින් බඹසර වසන ලද, මෙහි ලා ඇපි දෙදෙන මැ සමසමයම්හ, සම බවට පැමිණියම්හ. මේ භවත් ශාස්තෘහුගේ අතිරේකය වැළිත් නග්න බව මුඩු බව උළුපදගත කෙස්රවුළු සිඳීම යි. මම අඹුදරුවන් විසින් සම්බාධ වූ ශයනයෙහි වසනුයෙම් කසීසඳුන් වළඳනුයෙම් මල්ගඳවිලෙවුන් ධරනුයෙම් රන්රිදී ඉවසනුයෙම් පරලොව දී මේ භවත් ශාස්තෘහු සමග සමසමගති ඇති වන්නෙම් ද ඒ මම් කුමක් දන්නෙම් කුමක් දක්නෙම් මේ ශාස්තෘහු කෙරෙහි බඹසර වෙසෙම් ද? හෙතෙම මේ 'අබ්‍රහ්මචරියවාස-යෙකැ'යි මෙසේ දැන එ සස්නෙන් කලකිරී නික්ම යෙයි. සන්දකය, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් මේ සතර වැනි අබ්‍රහ්මචරියවාසය වදරනලද්දේ යැ. යම් අබ්‍රහ්මචරියයෙකැ විඥ වූ පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වෙසේ ද වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්‍මය නො සපයන්නේ ද එය යි. සන්දකය, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් මේ සතර අබ්‍රහ්මචරියවාසයෝ වදරනලද්දහු යැ, මේ සස්නෙහි විඥවූ පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්‍මය සම්පාදනය නො කරන්නේ යි.

භවත් ආනන්දයෙනි, ආශ්චර්‍ය්‍ය යැ, භවත් ආනන්දයෙනි, අද්භූත යැ, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් යම් තැනෙකැ විඥ වූ පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ ද, වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්‍මය ආරාධනය නො කරන්නේ ද (එබඳු වූ) අස්වැසිලි රහිත වූ මැ සිව් වැදෑරුම් අබ්‍රහ්මචරිය වාසයෝ වදරනලද්දහු යැ.

භවත් ආනන්දයෙනි, සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් විසින් යම් තැනෙකැ විඥ වූ පුරුෂ බ්‍රම්සරවස් නො වසන්නේ ද වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්‍මය සම්පාදනය නො කරන්නේ ද එබඳු අස්වැසිලි රහිත වූ කවර සතර බඹසරවස් කෙනෙක් වදරනලද්දහු ද?යි.

Free Distribution www.aathaapi.org

ඉධ සන්දක එකච්චො සත්ථා සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති. සො සුඤ්ඤම්පි අගාරං පවිසති, පිණ්ඩම්පි න ලභති, කුක්කුරොපි ඩසති,[1] චණ්ඩෙනපි හත්ථිනා සමාගච්ඡති, චණ්ඩෙනපි අස්සෙන සමාගච්ඡති, චණ්ඩෙනපි ගොණෙන සමාගච්ඡති, ඉත්ථියාපි පුරිසස්සපි නාමම්පි ගොත්තම්පි පුච්ඡති, ගාමස්සපි නිගමස්සපි නාමම්පි මග්ගම්පි පුච්ඡති. සො කිමිදන්ති පුට්ඨො සමානො සුඤ්ඤං මෙ අගාරං පවිසිතබ්බං අහොසි, තෙන පාවිසිං. පිණ්ඩං මෙ අලද්ධබ්බං අහොසි, තෙන නාලත්ථං. කුක්කුරෙන ඩසිතබ්බං අහොසි, තෙනම්හි දට්ඨො. චණ්ඩෙන හත්ථිනා සමාගන්තබ්බං අහොසි, තෙන සමාගමං.[2] චණ්ඩෙන අස්සෙන සමාගන්තබ්බං අහොසි, තෙන සමාගමං. චණ්ඩෙන ගොණෙන සමාගන්තබ්බං අහොසි, තෙන සමාගමං. ඉත්ථියාපි පුරිසස්සපි නාමම්පි ගොත්තම්පි පුච්ඡිතබ්බං අහොසි, තෙන පුච්ඡිං. ගාමස්සපි නිගමස්සපි නාමම්පි මග්ගම්පි පුච්ඡිතබ්බං අහොසි, තෙනාපුච්ඡින්ති. තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: ‘අයං ඛො භවං සත්ථා සබ්බඤ්ඤූ සබ්බදස්සාවී—පෙ—අහොසි. තෙනා-පුච්ඡින්ති. සො අනුස්සාසිකං ඉදං බ්‍රහ්මචරියන්ති, ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. ඉදං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං අනස්සාසිකං බ්‍රහ්මචරියං අක්ඛාතං, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුන ච පරං සන්දක ඉධෙකච්චො සත්ථා අනුස්සවිකො හොති අනුස්සව සච්චො. සො අනුස්සවෙන ඉතිහිතිහ පරම්පරාය පිටකසම්පදාය ධම්මං දෙසෙති. අනුස්සවිකස්ස ඛො පන සන්දක සත්ථුනො අනුස්සවසච්චස්ස සුස්සුතම්පි හොති, දුස්සුතම්පි හොති. තථාපි හොති. අඤ්ඤථාපි හොති. යත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: ‘අයං ඛො භවං සත්ථා අනුස්සවිකො අනුස්සවසච්චො. සො අනුස්සවෙන ඉතිහිතිහ පරම්පරාය පිටකසම්පදාය ධම්මං දෙසෙති, අනුස්සවිකස්ස ඛො පන සත්ථුනො අනුස්සවසච්චස්ස සුස්සුතම්පි හොති, දුස්සුතම්පි හොති, තථාපි හොති, අඤ්ඤථාපි හොති. සො අනස්සාසිකං ඉදං බ්‍රහ්මචරියන්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. ඉදං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දුතියං අනස්සාසිකං බ්‍රහ්මචරියං අක්ඛාතං, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුන ච පරං සන්දක ඉධෙකච්චො සත්ථා තක්කී හොති වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ධම්මං දෙසෙති. තක්කිස්ස ඛො පන සන්දක සත්ථුනො වීමංසිස්ස සුතක්කිතම්පි හොති, දුත්තක්කිතම්පි හොති, තථාපි හොති, අඤ්ඤථාපි හොති. තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති: අයං ඛො භවං සත්ථා තක්කී වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ධම්මං දෙසෙති. තක්කිස්ස ඛො පන සත්ථුනො වීමංසිස්ස සුතක්කිතම්පි හොති, දුත්තක්කිතම්පි හොති, තථාපි හොති, අඤ්ඤථාපි හොති. සො අනස්සාසිකං ඉදං බ්‍රහ්මචරියන්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. ඉදං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තතියං අනස්සාසිකං බ්‍රහ්මචරියං අක්ඛාතං යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය. වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

---

1. ඩංසති - මජසං
2. සමාගමිං - මජසං

සන්දකය, මෙලොවැ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ ඇතැම් ශාස්තෘවරයෙක් "ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදි වරන්නා වූ ද මට නිරතුරු ඥානදර්ශනය එළැඹ සිටියේ යැ"යි නිරවශේෂ ඥානදර්ශනය පිළින කෙරෙයි. හෙ ශූන්‍යාගාරයට ද පිවිසෙයි, පිඬුවා ද නො ලබයි, ශුනක ද ඔහු ඩහයි, සැඩ ඇතකු හා ද එක්වෙයි, සැඩ අසකු හා ද එක් වෙයි, සැඩ ගොනකු හා ද එක් වෙයි, ස්ත්‍රියක ගේත් පුරුෂයකුගේත් නමුදු ගොතුදු විචාරයි, ගම්හි දු නියම්ගම්හි දු නමුදු මග ද විචාරයි, හෙ 'මේ කිමෙකැ'යි විචාරන ලද්දේ මැ: "මා විසින් ශූන්‍යාගාරයට පිවිසියයුතු විය, එයින් පිවිසියෙමි; මා විසින් පිඬුවා නො ලදයුතු විය, එයින් නො ලත්මි; ශුනකයා විසින් ඩැහියයුතු විය, එයින් ඩහගනලදුයෙමි; සැඩ ඇතකු හා එක්වියයුතු විය, එයින් එක්වීමි; සැඩ අසකු හා එක්වියයුතු විය, එයින් එක්වීමි; සැඩ ගොනකු හා එක්වියයුතු විය, එයින් එක් වීමි; ස්ත්‍රියගේ ද පුරුෂයාගේ ද නමුදු ගොතදු විචාළයුතු විය, එයින් විචාළෙමි, ගම්හි දු නියම්ගම්හි දු නමුදු මග ද විචාළයුතු විය, එයින් විචාළෙමි"යි. එහි ලා සන්දකය, නුවණැති පුරුෂ මෙසේ සලකයි: "මේ භවත් ශාස්තෘ තෙම සර්වඥ යැ සර්වදර්ශී යැ නිරවශේෂ ඥානදර්ශනය පිළින කෙරෙයි . . . ගම්හි දු නියම්ගම්හි දු නමුදු මඟ ද විචාළයුතු විය, එයින් විචාළෙමි"යි යෙයි. හෙ "මෙ බඹසර අස්වැසිලි නැතැ"යි මෙසේ දැන ඒ බඹසරෙන් කලකිරී නික්ම යෙයි. සන්දකය, මේ වූකලි ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරනලද පළමු වැනි අනාස්සාසික බ්‍රහ්මචරිය වෙයි. එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ වසනුයේ නමුදු න්‍යාය වූ කුශලධර්මය සම්පාදනය නො කරන්නේ යි.

තවද සන්දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘවරයෙක් ශ්‍රැතය ඇසිරි කෙළේ වෙයි, ශ්‍රැතිය සත්‍යය කොට ඇත්තේ වෙයි. හෙ අනුශ්‍රවයෙන් මෙසේ මෙසේ යයි පරම්පරායෙන් පිටකසම්පත්තීන් දහම් දෙසයි. සන්දකය, අනුශ්‍රවය ඇසිරි කළ ඇසූ දය සත්‍යය කොට ගත් ශාස්තෘහට මනා කොට අසනලද්ද ද වෙයි, නො මනා කොට අසනලද්ද ද වෙයි, එසෙයිනුදු වෙයි, අන් සෙයිනුදු වෙයි. එහි ලා සන්දකය, නුවණැති පුරුෂ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : "මේ භවත් ශාස්තෘ තෙම අනුශ්‍රවික ය, අනුශ්‍රවය සත්‍ය කොට ගත්තේ ය, හෙ ශ්‍රැතියෙන් මෙසේ මෙසේ යයි පරම්පරායෙන් පිටකසම්පදයෙන් දහම් දෙසයි, ශ්‍රැතිය ඇසිරි කළ ශ්‍රැතිය සත්‍යය කොට ගත් ශාස්තෘහට මනා කොට අසන ලද්ද ද වෙයි, නො මනා කොට අසනලද්ද ද වෙයි, එසෙයිනුදු වෙයි, අන් සෙයිනුදු වෙයි. හෙ "මෙ බඹසර අස්වැසිලි නැතැ"යි මෙසේ දැන එ බඹසරින් කලකිරී නික්ම යෙයි. සන්දකය, මේ වූකලි ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරනලද දෙ වැනි වූ අනාස්සාසිකබ්‍රහ්මචරිය වෙයි. එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ වසන්නේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය නො කරන්නේ යි.

තවද සන්දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘවරයෙක් තර්කයෙන් ගන්නේ වීමංසායෙන් ගන්නේ වෙයි. හෙ තර්කයෙන් ගන්නාලද වීමංසාව අනුවගිය සිය වැටහීම වූ දහම් දෙසයි. සන්දකය, තර්කයෙන් ගන්නා වීමංසායෙන් ගන්නා ශාස්තෘහට වැළිත් මොනොවට තර්ක කරනලද්ද ද වෙයි, නො මනා කොට තර්ක කරන ලද්ද ද වෙයි, එසෙයිනුදු වෙයි, අන් සෙයිනුදු වෙයි. එහි ලා සන්දකය, විඥ වූ පුරුෂ මෙසේ සලකයි : "මේ භවත් ශාස්තෘ වූකලි තර්කයෙන් ගන්නේ වෙයි, වීමංසායෙන් ගන්නේ වෙයි, හෙ තර්කයෙන් ගන්නා ලද වීමංසාව අනුව ගිය සවයම් ප්‍රතිභානය වූ දහම් දෙසයි. තර්කයෙන් ගන්නා වීමංසායෙන් ගන්නා ශාස්තෘහට මොනොවට තර්ක කරනලද්ද ද වෙයි, නො මනා කොට තර්ක කරන ලද්ද ද වෙයි, එසෙයිනුදු වෙයි, අන් සෙයිනුදු වෙයි. හෙ 'මෙ බඹසර අස්වැසිලි නැතැ'යි මෙසේ දැන එ බඹසරින් නිර්වේදයට පැමිණ නික්ම යෙයි. සන්දකය, යම් සත්තෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසා නම් වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍ය ධර්මය සම්පාදනය නො කෙරේ නම් මේ වූකලි ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් වදරනලද තුන් වැනි වූ අනාස්සාසික බ්‍රහ්මචරිය යි.

පුන ච පරං සන්දක ඉධෙකච්චො සත්ථා මන්දො හොති මොමූහො. සො මන්දත්තා මොමූහත්තා තථා තථා[1] පඤ්හං පුට්ඨො සමානො වාචා වික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං, එවම්පි[2] මෙ නො, තථාපි[3] මෙ නො, අඤ්ඤථාපි[4] මෙ නො, නොතිපි මෙ නො, නො නොතිපි මෙ නොති. තත්‍ර සන්දක විඤ්ඤූ පුරිසො ඉති පටිසඤ්චික්ඛති. අයං ඛො භවං සත්ථා මන්දො මොමූහො, සො මන්දත්තා මොමූහත්තා තථා තථා පඤ්හං පුට්ඨො සමානො වාචාවික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං. එවම්පි[2] මෙ නො, තථාපි[3] මෙ නො, අඤ්ඤථාපි[4] මෙ නො, නොතිපි මෙ නො, නො නො තිපි මෙ නොති. සො අනස්සාසිකං ඉදං බ්‍රහ්මචරියන්ති ඉති විදිත්වා තස්මා බ්‍රහ්මචරියා නිබ්බිජ්ජ පක්කමති. ඉදං ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චතුත්ථං අනස්සාසිකං බ්‍රහ්මචරියං අක්ඛාතං, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

ඉමානි ඛො සන්දක තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන චත්තාරි අනස්සාසිකානි බ්‍රහ්මචරියානි අක්ඛාතානි, යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති.

අච්ඡරියං භො ආනන්ද අබ්භුතං භො ආනන්ද, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරි අනස්සාසිකානෙව බ්‍රහ්මචරියානි අනස්සාසිකානි බ්‍රහ්මචරියානීති අක්ඛාතානි. යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං න වසෙය්‍ය, වසන්තො වා නාරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං. යො පන සො භො ආනන්ද සත්ථා කිංවාදී කිමක්ඛායී යත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති.

ඉධ සන්දක තථාගතො ලොකෙ උප්පජ්ජති 'අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති -පෙ- මජ්ඣෙකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. -පෙ- සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං ඛො[5] සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං[6] අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

---

1. තත්ථ තත්ථ - මජසං.
2. එවන්තිපි - මජසං.ස්‍යා.
3. තථාතිපි - මජසං. ස්‍යා.
4. අඤ්ඤථාතිපි - මජසං. ස්‍යා.
5. ඛො පන - ස්‍යා.
6. උළාරවිසෙසං - මජසං.

තවද සන්දකය, මෙලොවැ ඇතැම් ශාස්තෘවරයෙක් මඳ නුවණැත්තේ වෙයි, අතිමූඪ වෙයි. හේ මඳනුවණැති බැවින් අතිමූඪ බැවින් ඒ ඒ ප්‍රකාරයෙන් පැන පුළුවුස්නා ලද්දේ "මෙසේත් මට (ලබ්ධි) නැති, එසේත් මට නැති, අන්සේත් මට නැති, 'නැතැ'යි ද මට නැති, 'නො නැතැ'යි ද මට (ලබ්ධි)නැතැ"යි වචනයෙන් වික්ෂේපයට අපයර්‍යන්ත වික්ෂේපයට පැමිණෙයි. එහි ලා සන්දකය, නුවණැති පුරුෂ මෙසේ සලකයි : "මේ භවත් ශාස්තෘ වූකලි මඳ නුවණැත්තේ යැ ඉතා මූඪ යැ. හේ මඳ නුවණැති බැවින් ඉතා මූඪ බැවින් ඒ ඒ ප්‍රකාරයෙන් පැන පුළුවුස්නා ලද්දේ "මෙසේත් මට (ලබ්ධි)නැති, එසේත් මට නැති, අන්සෙයිනුත් මට නැති, 'නැතැ'යිදු මට නැති, 'නො නැතැ'යිදු මට නැතැ"යි වාචාවික්ෂෙපයට අමරාවික්ෂෙපයට පැමිණෙයි. හේ 'මෙ බඹසර අස්වැසිලි නැතැ'යි මෙසේ දැන ඒ බඹසරින් නිර්වේදයට පැමිණ නික්ම යෙයි. සන්දකය, යම් සස්නෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසා නම් වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍ය ධර්මය සම්පාදනය නො කෙරේ නම් මේ වූකලි ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුන් විසින් වදරනලද සතර වැනි වූ අනස්සාසික බ්‍රහ්මචරිය යි.

සන්දකය, මොහු වූකලි ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරනලද සතර අනස්සාසික බ්‍රහ්මචරියයෝ යි. එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය නො කරන්නේ යයි.

ආශ්චර්‍යයැ භවත් ආනන්දයෙනි, ආශ්චර්‍ය යැ භවත් ආනන්දයෙනි, යම් පමණ ඒ සියල්ල දන්නා වූ දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් අනස්සාසික වූ මැ සතර බ්‍රහ්මචරිය කෙනෙක් 'අනස්සාසික බ්‍රහ්මචරියයෝ' යයි වදරන ලද්දාහු ද, එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර නො වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍ය ධර්මය සම්පාදනය නො කරන්නේ යි. භවත් ආනන්දයෙනි, යම් සසුනෙකැ නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසා නම්, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය කෙරේ නම් ඒ ශාස්තෘ කිබඳු වාද ඇත්තේ ද, කුමක් කියන්නේ ද ?යි.

සන්දකය, තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයෙන් යුක්ත වූ සුන්දරගමන් ඇති ලෝක දන්නා වූ අනුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්මිනිසුනට ශාස්තෘ වූ භාග්‍යවත් බුදුහු මෙලොවැ උපදිති. උන් වහන්සේ මේ සදේවක ලෝකය. . . . තුමූ අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති. . . . මධ්‍යකල්‍යාණ වූ . . . බ්‍රහ්මචර්‍යය පවසති. ඒ දහම ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එක්තරා කුලයෙකැ උපන්නෙක් හෝ අසයි, ... හෙතෙම චිත්තයට උපක්ලේශ වූ ප්‍රඥව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් හැරපියා කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙයි. සන්දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක තෙම මෙබඳු උදර විශෙෂයක් ලබා නම් ඒ සස්නෙහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍ය ධර්මය සම්පාදනය කරන්නේ යි.

පුන ච පරං සන්දක භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං[1] අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුන ච පරං සන්දක භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

පුන ච පරං සන්දක භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං[1] අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරොධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලං.

1. උළාරවිසෙසං - මජසං.

තවද සන්‍දකය, මහණ තෙම විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් . . . . ද්විතියධ්‍යානයට පැමිණ වෙසෙයි. සන්‍දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක තෙම මෙබඳු උදර විශේෂයක් ලබා නම්, එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය කරන්නේ යි.

තවද සන්‍දකය, මහණ තෙම ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්ෂක වැ ද වෙසෙයි, ... තෘතියධ්‍යානය උපදවා වෙසෙයි. සන්‍දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක මෙබඳු උදර විශේෂයක් ලබා නම් එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්මය ආරාධනය කරන්නේ යි.

තවද සන්‍දකය, මහණ තෙම සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානය උපදවා වෙසෙයි. සන්‍දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි මෙබඳු උදර විශේෂයක් ලබා නම් එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්මය සම්පාදනය කරන්නේ යි.

හෙතෙම මෙසෙයින් (විදර්ශනාපාදක චතුර්ථධ්‍යාන) සිත පිරිසු වූ කල්හි පර්‍යවදාත කල්හි අඞ්ගණ (කෙලෙස්) රහිත කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි පූර්වනිවාසානුස්මෘතිඥනයට සිත එළවයි. හෙතෙම අනේකවිධ පූර්වනිවාස සිහි කෙරෙයි, හෙමෙසේ යි : එක් ජාතියකුදු දෙ ජාතියකුදු . . . . මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ පූර්වනිවාස සිහි කෙරෙයි. සන්‍දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක මෙබඳු උදර විශේෂයක් ලබා නම් ඒ ශාස්තෘන්ගේ ශාසනයෙහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ කුශලධර්මය සම්පාදනය කරන්නේ යි.

හෙ මෙසේ සිත පිරිසුදු වූ කල්හි පර්‍යවදාත කල්හි අනඞ්ගණ කල්හි පහ වූ උපක්ලෙශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි සත්ත්වයන් ගේ ච්‍යුතිඋපපත්ති දන්නා පිණිස සිත එළවයි. හෙ මිනිසැස ඉක්මැසිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ මනා පැහැසටහන් ඇති නො මනා පැහැසටහන් ඇති මනා ගති ඇති නො මනා ගති ඇති සත්ත්වයන් දකියි. කර්මානුරූප වැ ගිය සත්ත්වයන් දනගනියි. සන්‍දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක මෙබඳු උදර විශෙෂයක් ලබා ද, එහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ කුශල ධර්මය සම්පාදනය කරන්නේ යි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති අයං ආසව සමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. යස්මිං ඛො සන්දක සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. තත්ථ විඤ්ඤූ පුරිසො සසක්කං බ්‍රහ්මචරියං වසෙය්‍ය, වසන්තො වා ආරාධෙය්‍ය ඤායං ධම්මං කුසලන්ති.

යො පන සො භො ආනන්ද භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. පරිභුඤ්ජෙය්‍ය සො කාමෙති.

යො සො සන්දක භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. අභබ්බො සො පඤ්චට්ඨානානි අජ්ඣාචරිතුං: අභබ්බො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකං කාමෙ පරිභුඤ්ජිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරියභූතො. යො සො සන්දක භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. අභබ්බො සො ඉමානි පඤ්චට්ඨානානි අජ්ඣාචරිතු’න්ති.

යො පන සො භො ආනන්ද භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස චරතො චෙව තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතං: ‘ඛීණා මෙ ආසවා’ති.

තෙන හි සන්දක උපමන්තෙ කරිස්සාමි, උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි සන්දක පුරිසස්ස හත්ථපාදා ඡින්නා, තස්ස චරතො චෙව තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඡින්නා ච හත්ථපාදා. අපි ච ඛො පන තං පච්චවෙක්ඛමානො ජානාති: ඡින්නා මෙ හත්ථපාදාති. එවමෙව ඛො සන්දක යො සො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස චරතො චෙව තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඛීණාව ආසවා. අපි ච ඛො නං පච්චවෙක්ඛමානො ජානාති: ඛීණා මෙ ආසවාති.

හේ මෙසේ සිත පිරිසුදු කල්හි පර්‍ය්‍යවදාත කල්හි ක්ලෙශාඞ්ගණ රහිත කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙනබවට පැමිණි කල්හි ආශ්‍රවක්ෂයඥානයට (විදර්ශනා)සිත එළවයි. හෙ 'මෙ දුකැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ දුක්ඛසමුදය යැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ දුක්ඛනිරෝධ යැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ දුක්ඛනිරෝධගාමිනී පටිපද යැ'යි ඇති සැටියෙන් දැන ගනියි, 'මොහු ආශ්‍රවහ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ ආශ්‍රවසමුදය යැ'යි ඇති සැටි-යෙන් දැනගනියි, 'මෙ ආශ්‍රවනිරෝධ යැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ ආශ්‍රවනිරෝධ ගාමිනීප්‍රතිපද යැ'යි ඇති සැටියෙන් දැනගනියි. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙනුදු විමුක්ත වෙයි, භවාශ්‍රවයෙනුදු සිත විමුක්ත වෙයි, අවිද්‍යාශ්‍රවයෙනුදු සිත විමුක්ත වෙයි. විමුක්ත කල්හි (ඵලක්ෂණයෙහි) 'විමුක්ත යැ' යන (ප්‍රත්‍යවේක්ෂා) ඥානය වෙයි. ජාතිය ක්ෂය වූ යැ මහබඹසර වැස නිමවන ලද, සිවුමඟින් කටයුතු කරනලද. මේ බව පිණිස අනෙක් මාර්ගභාවනායෙක් නැතැ'යි දැනගනී. සන්දකය, යම් ශාස්තෘ කෙනකුන් කෙරෙහි ශ්‍රාවක මෙවන් උදර විශේෂයක් ලබා නම් ඒ ශාස්තෘන්ගේ සස්නෙහි නුවණැති පුරුෂ ඒකාන්තයෙන් බඹසර වසන්නේ යැ, වසනුයේ හෝ න්‍යාය වූ අනවද්‍යධර්මය සම්පාදනය කරන්නේ යි.

භවත් ආනන්දයෙනි, ක්ෂය වූ ආශ්‍රව ඇති වැස නිමවූ බඹසර ඇති සියුමඟින් කළ කරණී ඇති බහාතැබූ(ස්කන්ධ ක්ලේශ අභිසංස්කාර) බර ඇති පැමිණි රහත් බව ඇති ක්ෂය වූ භවසංයෝජන ඇති මොනොවට දැන (කෙලෙසුන්ගෙන්) විමුක්ත වූ යම් රහත් මහණෙක් ඇද්ද, හේ කාමයන් වළඳ දැ?යි.

සන්දකය, ක්ෂය වූ ආශ්‍රව ඇති වැස නිමවූ බඹසර ඇති සියුමඟින් කළ කරණී ඇති බහා තැබූ බර ඇති පැමිණි රහත් බව ඇති ක්ෂය වූ භවසංයෝජන ඇති මැනැවින් දැන විමුක්ත වූ යම් රහත් මහණෙක් ඇද්ද, හේ කරුණු පසක් කරන්නට නො නිස්ස, රහත් මහණ දැන දැන ප්‍රාණියකු දිවියෙන් ගලවන්නට නො නිස්ස, රහත් මහණ ස්තෙය සඞ්ඛ්‍යාත වූ නුදුන්දැය ගන්නට නො නිස්ස, රහත් මහණ මෛථුනධර්ම සේවන කරන්නට නො නිස්ස, රහත් මහණ දැන දැන මුසවා කියන්නට නො නිස්ස, රහත් මහණ පෙර ගිහි වූ සෙයින් වස්තුකාමයන් සන්නිධිකොට වළඳන්නට නො නිස්ස. සන්දකය, ක්ෂීණාශ්‍රව වූ වැස නිම වූ බඹසර ඇති සියුමඟින් කළ කිස ඇති බහා තැබූ බර ඇති පැමිණි රහත් බව ඇති ක්ෂය කළ භවසංයෝජන ඇති මොනොවට දැන කෙලෙසුන් කෙරෙන් විමුක්ත වූ යම් රහත් මහණෙක් වේ ද, හේ මෙ පස් කරුණු කරන්නට නො නිසි වේ.

භවත් ආනන්දයෙනි, ක්ෂීණාශ්‍රව වූ වැස නිම වූ බඹසර ඇති කළ කරණී ඇති බහා තැබූ බර ඇති පැමිණි රහත් බව ඇති ක්ෂය කළ භවසංයෝජන ඇති මැනැවින් දැන කෙලෙසුන් කෙරෙන් විමුක්ත වූ යම් රහත් මහණෙක් වේ ද ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදිවරන්නා වූ ද ඔහට 'මාගේ ආශ්‍රවයෝ ක්‍ෂය වූහ'යි හැමද හැම කල්හි ඥානදර්ශන එළැඹසිටියේ දැ?යි.

එසේ වී නම් සන්දකය, තොපට උපමාවක් කරන්නෙමි. මෙලොවැ ඇතැම් විඥ-පුරුෂයෝ උපමායෙනුදු කියනලද්දෙහි අර්ථ දැනගනිති. යම්සේ සන්දකය, පුරුෂයකු ගේ අත්පා සිඳිනලද ද ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදිවරන්නා වූ ද ඔහුගේ හස්ත-පාදයෝ හැම කල්හි හැම විට සිඳුනාලද්දහු මැ වෙති. එතෙකුදුවත් එය ප්‍රත්‍යවේක්ෂා කරනුයේ 'මාගේ හස්තපාදයෝ සුන්හ'යි දැනගනී. එසෙයින් මැ සන්දකය, ක්ෂීණාශ්‍රව වූ වැස නිමවූ මහබඹසර ඇති කළ කරණී ඇති බහා තැබූ බර ඇති පැමිණි රහත් බව ඇති ක්‍ෂය කළ භවසංයෝජන ඇති මැනැවින් දැන කෙලෙසුන් කෙරෙන් විමුක්ත වූ යම් රහත් මහණෙක් වේ ද ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදිවරන්නා වූ ද ඔහට හැම කල්හි ආශ්‍රවයෝ ක්‍ෂය වූවාහු මැ යි. එතෙකුදුවත් එය ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ 'මාගේ ආශ්‍රවයෝ ක්‍ෂය වූහ'යි දැනගනී.

කීව බහුකා පන භො ආනන්ද ඉමස්මිං ධම්මවිනයෙ නිය්‍යාතාරොති. 'න ඛො සන්දක එකං යෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්ච සතානි. අථ ඛො භිය්‍යොව යෙ ඉමස්මිං ධම්මවිනයෙ නිය්‍යාතාරො'ති. අච්ඡරියං භො ආනන්ද, අබ්භුතං භො ආනන්ද, න ච නාම සධම්මොක්කංසනා භවිස්සති න පරධම්මාවසාදනා[1] ආයතනෙ ච ධම්මදෙසනා. තාව බහුකා ච නිය්‍යාතාරො පඤ්ඤායිස්සන්ති. ඉමෙ පනා'ජීවකා පුත්තමතාය පුත්තා. අත්තානඤ්චෙව උක්කංසෙන්ති, පරෙ ච වම්භෙන්ති. තයො චෙව නිය්‍යාතාරො පඤ්ඤපෙන්ති. සෙය්‍යථීදං: 'නන්දං වච්ඡං, කිසං සඞ්කිච්චං, මක්ඛලිගොසාල'න්ති.

අථ ඛො සන්දකො පරිබ්බාජකො සකං පරිසං ආමන්තෙසි : 'චරන්තු භොන්තො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියවාසො, නදානි සුකරං අම්හෙහි ලාභසක්කාරසිලොකෙ පරිච්චජිතු'න්ති. ඉතිහිදං සන්දකො පරිබ්බාජකො සකං පරිසං උය්‍යොජෙසි භගවති බ්‍රහ්මචරියෙති.

සන්දකසුත්තං ඡට්ඨං.

---

1. නපරධම්මවම්භනා - මජ්සං, PTS

භවත් ආනන්දයෙනි, මෙසස්නෙහි නිර්යාතෘහු (සසරින් නික්මගියාහු) කිපමණ බොහෝ වෙත් ද ?යි. සන්දකය, එක් මැ සියක් නො වෙයි, දෙසියක් නො වෙයි, තුන්සියක් නො වෙයි, සාරසියක් නො වෙයි, පන්සියක් නො වෙයි, වැළිත් මෙ සස්නෙහි නිර්යාතෘහු බොහෝ මැ යි. ආශ්චර්ය යැ භවත් ආනන්දයෙනි, අද්භූත යැ භවත් ආනන්දයෙනි, තමාගේ ලබ්ධිය නඟා තැබීමෙක් නම් නො ද වන්නේ යැ මෙරමා ලබ්ධි හෙළා තැබීමෙක් නො වන්නේ යැ, කාරණයෙහි මැ ධර්මදේශනා වෙයි, එපමණ බොහෝ නිර්යාතෘහු ද පැනෙති. මේ ආජීවකයෝ වැළිත් පුතුන් මළ මවගේ පුත්‍රයෝ යි. (ඔහු) තමා මැ උත්කර්ෂ කෙරෙති, මෙරමා ද ගරහති, නිර්යාතෘන් තිදෙනකුන් මැ පනවති. හේ මෙසේ යැ: 'නන්දවච්ඡ යැ කිසසඞ්කිච්ච යැ මක්ඛලිගොසාල යැ'යි.

එකල්හි සන්දක පරිව්‍රාජක සියපිරිස් ඇමැතී යැ : ''භවත්නි, ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බඹසරවස් වසව, දූන් අප විසින් ලාභසත්කාරශ්ලෝක හැරපියන්නට පහසු නො වේ.'' යයි, මෙසේ සන්දකපරිව්‍රාජක සිය පිරිස් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචරිය වාසයෙහි උද්‍යොග කරවී යයි.

සවැනි සන්දක සූත්‍ර යි.

---

2. 3. 7

මහාසකුලුදායි සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා මොරනිවාපෙ පරිබ්බාජකාරාමෙ පටිවසන්ති. සෙය්‍යථීදං: අන්නභාරො[1] වරධරො[2] සකුලුදායී ච පරිබ්බාජකො අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා පරිබ්බාජකා. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: 'අතිප්පගො ඛො තාව රාජගහෙ පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන මොරනිවාපො, පරිබ්බාජකාරාමො, යෙන සකුලුදායි පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන මොරනිවාපො පරිබ්බාජකාරාමො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සකුලුදායි පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය[3] අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා. සෙය්‍යථීදං: 'රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉති භවාභවකථං' ඉති වා.

අද්දසා ඛො සකුලුදායි පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි: 'අප්පසද්දා භොන්තො හොන්තු මා භොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති. අප්පසද්දකාමො ඛො පන සො ආයස්මා අප්පසද්දස්ස වණ්ණවාදී, අප්පෙව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යා'ති. අථ ඛො තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං. අථ ඛො භගවා යෙන සකුලුදායි පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො සකුලුදායි පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා, ස්වාගතං භන්තෙ භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. සකුලුදායී ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සකුලුදායිං පරිබ්බාජකං භගවා එතදවොච:

---

1. අන්නභාරා - මජ්ඣං. / අනුගාරො - සීමු, PTS.
2. වරචරො - සීමු, වරතරො - ස්‍යා.
3. උච්චාසද්දමහාසද්දාය - සීමු, මජ්ඣං. / උච්චාසද්දාය, මහාසද්දාය - PTS.

2. 3. 7

මහා සකුලුදායී සූත්‍රය

මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්‍දකනිවාප නම් වූ වේළුවනයෙහි වැඩවසනසේක. එසමයෙහි බොහෝ වූ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පරිව්‍රාජකයෝ මොරනිවාප නම් වූ පරිව්‍රාජකාරාමයෙහි වෙසෙති, හේමෙසේ යැ : ''අන්නභාර ද වරධර ද සකුලුදායී පරිව්‍රාජක ද අන්‍යවූ ද ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පරිව්‍රාජකයෝ ද''යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන රජගහ නුවරට පිඩු පිණිස පිවිසියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතෙක් විය : ''රජගහනුවර පිඬු පිණිස සරනට තව ඉතා අලුයම. මම මොරනිවාප නම් වූ පර්ව්‍රාජකාරාමයෙහි සකුලුදායි පරිව්‍රාජක කරා එළැඹෙන්නෙම් නම් ඉතා යෙහෙකැ''යි. එක්බිති භාග්‍යවතුන් වහන්සේ මොරනිවාප නම් පරිව්‍රාජකාරාමය වෙත එළැඹියහ. එසමයෙහි සකුලුදායී පරිව්‍රාජක උද්ගතනාද ඇති උස්හඬ මහහඬ නඟන අනේකප්‍රකාර තිරශ්චීනකථා කරන මහපිරිවැජිපිරිස් හා සමග හුන්නේ වෙයි. ඒ කෙබඳු කථා යැ යත් : රජුන් පිළිබඳ කථා යැ සොරුන් පිළිබඳ කථා යැ මහඇමැතියන් පිළිබඳ කථා යැ සේනා පිළිබඳ කථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාරකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥතීන් පිළිබඳ කථා යැ යානකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීන් පිළිබඳකථා යැ ශූරයන් පිළිබඳ කථා යැ වීථි පිළිබඳකථා යැ කුම්භස්ථාන(පැන්තොට) කථා යැ පූර්වප්‍රේත(අතීතඥති) කථා යැ නන් වැදෑරුම් නිරර්ථක කථා යැ ලෝකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ (ශාශ්වත උච්ඡෙදදි) භවාභවකථා යැ යන මේ කථා යි.

සකුලුදායී පිරිවැජි දුරින් මැ වඩනා භාග්‍යවතුන් දුටුයේ යැ. දැක සියපිරිස සන්හුන් කරවී : ''භවත්නි, නිහඬ වෙත්වා, භවත්හු නහමක් හඬනගවු, මේ ශ්‍රමණ ගෞතමයෝ එති, ඒ ආයුෂ්මත්හු වූකලි නිහඬ බව කැමැතියහ, නිහඬබැව්හි ගුණකියනුවහ. නිහඬ පිරිස දැන එළැඹියැයුතු කොට සිතා නම් මැනැවැ''යි. එකල්හි ඒ පිරිවැජියෝ නිහඬ වූහ. එක්බිති භාග්‍යවතුන් වහන්සේ සකුලුදායී පිරිවැජි කරා එළැඹියහ. එකල්හි සකලුදායී පිරිවැජි භාග්‍යවතුන්ට තෙල වදන් කී : සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක්වා, සවාමීනි, භාග්‍යවතුන්ට සවාගත යැ, සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි ඊමෙන් බොහෝ කලෙකින් මේ පරියාය කළහ, සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ හිඳුනාසේක්වා මේ අස්න පනවනලද''යි. බුදුහු පැනවූ අස්නෙහි වැඩහුන්සේක. සකුලුදායී පිරිවැජි එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සකුලුදායී පිරිවැජිහට භාග්‍යවතුන්! වහන්සේ තෙල කරුණ වදළහ :

Free Distribution www.aathaapi.org

කායනුත්ථ[1] උදායි එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා’ති? තිට්ඨතෙසා භන්තෙ කථා යාය මයං එතරහි කථාය සන්නිසින්නා, නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතූහලසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං. අයමන්තරා කථා උදපාදි: ලාභා වත භො අඞ්ගමගධානං, සුලද්ධං[2] වත භො අඞ්ගමගධානං, යත්‍ථිමෙ සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස, රාජගහං වස්සාවාසං ඔසටා,[3] අයම්පි ඛො පූරණො කස්සපො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස, සොපි රාජගහං වස්සාවාසං ඔසටො. අයම්පි මක්ඛලිගොසාලො -පෙ- අජිතො කෙසකම්බලී -පෙ- පකුධො කච්චායනො -පෙ- සඤ්ජයො බෙල්ලට්ඨිපුත්තො[4] -පෙ- නිගණ්ඨො නාතපුත්තො[5] සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච, ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස, සොපි රාජගහං වස්සාවාසං ඔසටො. අයම්පි ඛො සමණො ගොතමො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච, ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස, සොපි රාජගහං වස්සාවාසං ඔසටො. කොනු ඛො ඉමෙසං භවතං සමණබ්‍රාහ්මණානං සඞ්ඝීනං ගණීනං ගණාචරියානං ඤාතානං යසස්සීනං තිත්ථකරානං සාධුසම්මතානං බහුජනස්ස. සාවකානං සක්කතො ගරුකතො මානිතො පූජිතො. කථඤ්ච පන සාවකා සක්කත්වා ගරුකත්වා[6] උපනිස්සාය විහරන්තී’ති?

තත්‍රෙකච්චෙ එවමාහංසු: ‘අයං ඛො පූරණො කස්සපො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සො ච ඛො සාවකානං න සක්කතො න ගරුකතො න මානිතො න පූජිතො. න ච පන පූරණං කස්සපං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. භූතපුබ්බං පූරණො කස්සපො අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති. තත්‍රඤ්ඤතරො පූරණස්ස කස්සපස්ස සාවකො සද්දමකාසි: මා භොන්තො පූරණං කස්සපං එතමත්ථං පුච්ඡිත්ථ. නෙසො එතං ජානාති, මයමෙතං ජානාම, අම්හෙ එතමත්ථං පුච්ඡථ. මයමෙතං භවන්තානං[7] බ්‍යාකරිස්සාමාති. භූතපුබ්බං පූරණො කස්සපො බාහා පග්ගය්හ කන්දන්තො න ලභති: අප්පසද්දා භොන්තො හොන්තු මා භොන්තො සද්දමකත්ථ. නෙතෙ භවන්තෙ පුච්ඡන්ති. අම්හෙ එතෙ පුච්ඡන්ති. මයමෙතෙසං බ්‍යාකරිස්සාමාති. බහූ ඛො පන පූරණස්ස කස්සපස්ස සාවකා වාදං ආරොපෙත්වා අපක්කන්තා: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි, කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි,

---

1. කායනෙත්ථ – ස්‍යා.
2. සුලද්ධලාභා – සීමු, මජසං.
3. උපගතා – ස්‍යා
4. බෙලට්ඨපුත්තො – මජසං.
5. නාථපුත්තො – සීමු. / නාටපුත්තො – මජසං.
6. ගරුංකත්වා – මජසං.
7. භවතං – PTS.

උදායි, දැන් තෙපි කවර නම් කථාවෙකින් යුක්ත වැ උන්නු ද? තොප විසින් කවර නම් කථාවක් අඩාළ කරනලද ද?යි. වහන්ස, තෙල කථා තිබියේවා, ඇපි දැන් යම් කථායෙකින් යුක්ත වැ උන්නමෝ නම් වහන්ස, තෙල කථා පසුවත් භාග්‍යවතුන් වහන්සේට ඇසීමට දුලබ නො වෙයි. වහන්ස, ඊයේ පෙරෙයිද දිනයන්හි කුතුහලශාලායෙහි රැස්වැ හුන් නානාතීර්ථක ශ්‍රමණබ්‍රාහ්මණයන් අතුරෙහි මේ අතුරු කථාව උපන : "භවත්නි, අඟුමගධ දෙරටවැසියනට ඒකාන්තයෙන් ලාභයෙක. භවත්නි, අඟුමගධ දෙරටවැසියනට ඒකාන්තයෙන් මහා ලාභයෙක. යම් තැනෙක ප්‍රව්‍රජිත සමූහ සඞ්ඛ්‍යාත සඞසයා ඇති ආචාරගණ ඇති ගණදුරු වූ ප්‍රසිද්ධ වූ නැඟීසිටි යශස් ඇති ලබ්ධිකර වූ බොහෝ දෙනාට මැනැවැ'යි සම්මත වූ මේ ශ්‍රමණබ්‍රාහ්මණයෝ රජගහනුවර වස්සාවාස කොට ඔසළෝ (රැස්වූහු) ද ඒ අඟුමගධ දෙරට යි. මේ පූරණකාශ්‍යප ද සඞසයා ඇත්තේත් ගණ ඇත්තේත් ගණාචාර්‍ය්‍ය වූයේත් ප්‍රසිද්ධ වූ යශස් ඇති තීර්ථකර වූයේත් බොහෝදෙනාට මැනැවැ යි සම්මත වූයේත් වෙයි. හෙ ද රජගහනුවර වස්සාවාස කොට ඔසළේ යැ. මේ මක්ඛලිගෝසාලද . . . . අජිත කේසකම්බලී ද. . . පකුධ කච්චායන ද . . . . සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත ද . . . නිගණ්ඨ නාතපුත්ත ද සඞසයා ඇත්තේත් ගණයා ඇත්තේත් ගණදුරු වූයේත් ප්‍රසිද්ධ වූ යශස් ඇති තීර්ථකර වූයේත් බොහෝ දෙනාට මැනැවැ'යි සම්මත වූයේත් වෙයි. හේ ද රජගහනුවර වස්සාවාස කොට ඔසළේ යැ. මේ ශ්‍රමණගෞතම ද සඞසයා ඇත්තේත් ගණයා ඇත්තේත් ගණාචාර්‍ය්‍ය වූයේත් ප්‍රකට වූ යශස් ඇති ලබ්ධිකර වූ බොහෝ දෙනාට මැනැවැ'යි සම්මත වූයේත් වෙයි. හේ ද රජගහනුවර වස්සාවාස කොට ඔසළේ යි. මේ සඞසයා ඇති ගණයා ඇති ගණදුරු වූ ප්‍රකට වූ යශස් ඇති වූ ලබ්ධිකර වූ බොහෝ දෙනාට මැනැවැ,යි සම්මත වූ භවත් මහණබමුණන් අතුරෙහි කවරෙක් ශ්‍රාවකයන් විසින් සත්කෘත ගුරුකෘත මානිත පූජිත වේ ද? කෙසේ නම් ශ්‍රාවකයෝ සත්කාර කොට ගරුකාර කොට ඇසිරි කොට වෙසෙත් ද?යි.

එහි ඇතැම් කෙනෙක් මෙසේ කීහ : මේ පූරණකාශ්‍යප සඞසයා ඇත්තේ ද ගණ ඇත්තේ ද ගණාචාර්‍ය්‍ය ද වෙයි, ප්‍රසිද්ධ යැ යශස් ඇත්තේ යැ ලබ්ධිකර යැ බොහෝ දෙනා විසින් සාධුසම්මත යි. එතෙකුදු වත් හේ ශ්‍රාවකයන් විසින් සත්කෘත නො වෙයි, ගුරුකෘත නො වෙයි, මානිත නො වෙයි, පූජිත නො වෙයි. ශ්‍රාවකයෝ, පූරණකාශ්‍යප සත්කාර කොට ගරුකාර කොට නො ද ඇසිරි කොට වෙසෙත්. පෙර පූරණකාශ්‍යප නොයෙක් සියගණන් ඇති පිරිස්හි දහම් දෙසයි. එහි පූරණකාශ්‍යපගේ එක්තරා ශ්‍රාවකයෙක් "භවත්නි තෙල කරුණ නහමක් පූරණකාශ්‍යප විචාරව, තෙලෙ එය නො දනි, ඇපි එය දනුම්හ, තෙල කරුණ අප විචාරව, ඇපි තෙල කරුණ භවත්නට ප්‍රකාශ කරම්හ"යි. හඬ නැඟී යැ. පෙර පූරණකාශ්‍යප දෙඅත් බැඳ හඬ නගනුයේ "භවත්හු නිහඬ වෙත්ව භවත්හු නහමක් හඬ නඟවු, තුලුහු භවතුන් නො පුළුවුස්ති, තුලුහු අප පුළුවුයිත්, ඇපි තුලුනට ප්‍රකාශ කරම්හ"යි හඬ නගනුයේ අවකාශ නො ලැබෙයි. පූරණකාශ්‍යපගේ බොහෝ ශ්‍රාවකයෝ වාද නඟා නික්ම ගියහ : "තෙපි මෙ සස්න නො දන්නහු යැ, මම මෙ සස්න දනිමි, කිම තෙපි මෙ සස්න දන්නහු ද? තෙපි මිථ්‍යාප්‍රතිපන්නවවූ, මම් සම්‍යක් ප්‍රතිපන්නයෙමි, මාගේ වචනය අර්ථසංහිත යැ, තොපගේ වචනය අර්ථසංහිත නො වෙයි,

අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ, අසහිතං තෙ. පුරෙවචනීයං පච්ඡා අවච, පච්ඡාවචනීයං පුරෙ අවච, ආචිණ්ණං[1] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො, නිග්ගහිතොසි, චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි[2] වා සචෙ පහොසී'ති. ඉති පූරණො කස්සපො සාවකානං න සක්කතො න ගරුකතො න මානිතො න පූජිතො. න ච පන පූරණං කස්සපං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. අක්කුට්ඨො[3] ච පන පූරණො කස්සපො ධම්මක්කොසෙනාති.

එකච්චෙ එවමාහංසු: අයම්පි ඛො මක්ඛලි ගොසාලො -පෙ- අජිතො කෙසකම්බලී[4] -පෙ- පකුධො කච්චායනො-පෙ- සඤ්ජයො බෙල්ලට්ඨිපුත්තො-පෙ-නිගණ්ඨො නාතපුත්තො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සොපි සාවකානං න සක්කතො න ගරුකතො න මානිතො න පූජිතො. න ච පන නිගණ්ඨං නාතපුත්තං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. භූතපුබ්බං නිගණ්ඨො නාතපුත්තො අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති. තත්‍රඤ්ඤතරො නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකො සද්දමකාසි: 'මා භොන්තො නිගණ්ඨං නාතපුත්තං එතමත්ථං පුච්ඡිත්ථ, නෙසො එතං ජානාති, මයමෙතං ජානාම, අම්හෙ එතමත්ථං පුච්ඡථ, මයමෙතං භවන්තානං බ්‍යාකරිස්සාමා'ති. භූතපුබ්බං නිගණ්ඨො නාතපුත්තො බාහා පග්ගය්හ කන්දන්තො න ලභති. අප්පසද්දා භොන්තො හොන්තු, මා භොන්තො සද්දමකත්ථ, නෙතෙ භවන්තෙ පුච්ඡන්ති, අම්හෙ එතෙ පුච්ඡන්ති, මයමෙතං බ්‍යාකරිස්සාමා'ති. බහූ ඛො පන නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකා වාදං ආරොපෙත්වා අපක්කන්තා: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි, කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො, සහිතං මෙ, අසහිතං තෙ, පුරෙවචනීයං පච්ඡා අවච, පච්ඡාවචනීයං පුරෙ අවච, ආචිණ්ණන්තෙ විපරාවත්තං, ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි, චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. ඉති නිගණ්ඨො නාතපුත්තො සාවකානං න සක්කතො න ගරුකතො න මානිතො න පූජිතො න ච පන නිගණ්ඨං නාතපුත්තං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. අක්කුට්ඨො ච පන නිගණ්ඨො නාතපුත්තො ධම්මක්කොසෙනා'ති.

එකච්චෙ එවමාහංසු: 'අයං ඛො සමණො ගොතමො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සො ච ඛො සාවකානං සක්කතො ගරුකතො මානිතො පූජිතො. සමණඤ්ච පන ගොතමං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. භූතපුබ්බං සමණො ගොතමො අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති. තත්‍රඤ්ඤතරො සමණස්ස ගොතමස්ස සාවකො උක්කාසි. තමෙනඤ්ඤතරො සබ්‍රහ්මචාරී ජණ්ණුකෙ[5] ඝට්ටෙයි[6] අප්පසද්දො ආයස්මා හොතු, මායස්මා සද්දමකාසි, සත්ථා නො භගවා ධම්මං දෙසෙතී'ති. යස්මිං සමයෙ සමණො ගොතමො අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති.

---

1. අධිචිණ්ණං - සීමු, මජසං.
2. නිබ්බෙධෙහි - ස්‍යා.
3. අක්කුඨො.
4. කෙසකම්බලො - මජසං
5. ජන්නුකෙන - සීමු.
6. ඝට්ටෙසි - ස්‍යා.

Free Distribution www.aathaapi.org

පළමු කියයුත්ත පසු වැ කීවහු යැ, පසු වැ කියයුත්ත පළමු කීවහු යැ, තොපගේ ආචීර්‍ණය (දීඝකලක් ප්‍රගුණ කළ දය) පෙරළිණ. තොපට වාද නඟන ලද, නිග්‍රහ කරන ලද වවූ, වාදයෙන් මිදෙනුවට ඇවිද උගතුව, ඉදින් සමත් වවුනම් නිවේෂ්ටන කරව''යි නික්ම ගියහ. මෙසෙයින් පූරණකාශ්‍යප ශ්‍රාවකයන් විසින් සත්කෘත නො වෙයි, ගුරුකෘත නො වෙයි, මානිත නො වෙයි, පූජිත නො වෙ. ශ්‍රාවකයෝ පූරණකාශ්‍යප සත්කාර කොට ගුරුකාර කොට නො ඇසිරි කෙරෙත්. පූරණකාශ්‍යප ස්වභාවාක්‍රෝශයෙන් ආක්‍රෝශ කරනලද්දේ ද වේ'' යයි.

ඇතැම් කෙනෙක් මෙසේ කීහ : මේ මක්ඛලි ගෝසාල ද . . . . අජිත කේසකම්බලී ද . .. පකුධකච්චාන ද . . . සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත ද . . . නිගණ්ඨනාතපුත්ත ද සඞ්ඝයා ඇත්තේ ද වෙයි, ගණ ඇත්තේ ද වෙයි, ගණාචාර්‍ය්‍ය ද වෙයි, ප්‍රසිද්ධ යැ යශස් ඇත්තේ යැ තීර්ථකර යැ බොහෝ දෙනා විසින් මැනැවැ යි සම්මත යි. හේ ද ශ්‍රාවකයන් විසින් සත්කෘත නො වෙයි, ගුරුකෘත නො වෙයි, මානිත නො වෙයි, පූජිත නො වෙයි. ශ්‍රාවකයෝ නිගණ්ඨනාතපුත්ත සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට නො ද වෙසෙත්. පෙර නිර්ග්‍රන්ථනාතපුත්‍ර නොයෙක් සිය ගණන් ඇති පිරිස්හි දහම් දෙසයි. එහි නිර්ග්‍රන්ථනාතපුත්‍රගේ එක්තරා ශ්‍රාවකයෙක් : ''භවත්හු තෙල කරුණ නිර්ග්‍රන්ථනාතපුත්‍ර නො විචාරවූ, තෙලෙ එය නො දනි, ඇපි තෙල කරුණ දනුම්හ, තෙල කරුණ අප විචාරව, ඇපි තෙල කරුණ භවත්නට පවසම්හ''යි හඬ නැඟී යැ. පෙර නිගණ්ඨනාතපුත්ත දෙඅත් බැඳ හඬ නඟනුයේ : ''භවත්හු නිහඬ වෙත්වා, භවත්හු නාහමක් හඬ නඟවූ, තුලුහු භවතුන් නො විචාරති, තුලුහු අප විචාරති, ඇපි තෙල කරුණ පවසම්හ''යි කියාත් අවකාශ නො ලැබෙයි. වැළිත් නිගණ්ඨනාතපුත්තගේ බොහෝ ශ්‍රාවකයෝ වාද නඟා නික්ම ගියහ : ''තෙපි මේ සස්න නො දන්නහු යැ. මම මේ සස්න දනිමි, කිම තෙපි මේ සස්න දන්නහු ද? තෙපි මිථ්‍යාප්‍රතිපන්න වවූ යැ, මම සම්‍යක් ප්‍රතිපන්නයෙමි, මාගේ වචනය අර්ථසංහිත යැ තොපගේ වචනය අර්ථසංහිත නො වෙයි, පළමු කියයුත්ත පසු වැ කීවහු යැ, පසු වැ කියයුතු පළමු කීවහු යැ, තොපගේ ආචීර්‍ණය පෙරළිණ, තොපට වාදරොපිත යැ, නිග්‍රහ කරන ලදුවහු යැ, වාදමොක්ෂ පිණිස ඇවිද උගතුව, ඉදින් සමත් වවූ නම් නිවේෂ්ටන කරව''යි නික්ම ගියහ. මෙසෙයින් නිගණ්ඨනාතපුත්ත ශ්‍රාවකයන් විසින් සත්කෘත නො වෙයි, ගුරුකෘත නො වෙයි, මානිත නො වෙයි, පූජිත නො වෙයි, ශ්‍රාවකයෝ නිගණ්ඨනාතපුත්ත සත්කාර කොට ගරුකාර කොට නොද ඇසුරු කෙරෙති, නිගණ්ඨනාතපුත්ත ධර්මාක්‍රෝශයෙන් ආක්‍රෝශ කරනලද්දේ ද වේ'' යයි .

ඇතැම් කෙනෙක් මෙසේ කීහ : ''මේ ශ්‍රමණ ගෞතම සඟුන් ඇත්තේ වෙයි, ගණ ඇත්තේ වෙයි, ගණාචාර්‍ය්‍ය වෙයි, ප්‍රසිද්ධ යැ යශස් ඇත්තේ යැ ලබ්ධිකර යැ බොහෝ දෙනා විසින් සාධුසම්මත යි. හේ වැළිත් ශ්‍රාවකයන් විසින් සත්කෘත යැ ගුරුකෘත යැ මානිත යැ පූජිත යි. ශ්‍රාවකයෝ වැළිත් ශ්‍රමණ ගෞතම සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වෙසෙත්. පෙර ශ්‍රමණ ගෞතම නොයෙක් සියගණන් ඇති පිරිස්හි දහම් දෙසයි. එහි ශ්‍රමණ ගෞතමයන්ගේ එක්තරා ශ්‍රාවකයෙක් කැසි හඬ නැඟී. එක්තරා සබ්‍රම්සර මහණෙක් ''ආයුෂ්මත් නිහඬ වේවා, ආයුෂ්මත් නාහමක් හඬ නඟව, අපට ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසති'' ඔහු දණමඬලෙහි ගැටී. යම් කලෙකැ ශ්‍රමණ ගෞතම නොයෙක් සියගණන් ඇති පිරිස්හි දහම් දෙසා ද, එකල්හි ශ්‍රමණ ගෞතමයන්ගේ

Free Distribution www.aathaapi.org

නෙව තස්මිං සමයෙ සමණස්ස ගොතමස්ස සාවකානං ඛිපිතසද්දො වා හොති උක්කාසිතසද්දො වා. තමෙනං ජනකායො පච්චාසිංසමානරූපො පච්චුපට්ඨිතො හොති: 'යං නො භගවා ධම්මං භාසිස්සති, තං නො සොස්සාමා'ති. සෙය්‍යථාපි නාම පුරිසො චාතුම්මහාපථෙ ඛුද්දං මධුං[1] අනෙලකං පපීළෙය්‍ය[2] තමෙනං මහාජනකායො පච්චාසිංසමානරූපො පච්චුපට්ඨිතො අස්ස. එවමෙවං යස්මිං සමයෙ සමණො ගොතමො අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති. නෙව තස්මිං සමයෙ සමණස්ස ගොතමස්ස සාවකානං ඛිපිතසද්දො වා හොති උක්කාසිතසද්දො වා, තමෙනං මහාජනකායො පච්චාසිංසමානරූපො පච්චුපට්ඨිතො හොති: යං නො භගවා ධම්මං භාසිස්සති, තං නො සොස්සාමාති. යෙපි සමණස්ස ගොතමස්ස සාවකා සබ්‍රහ්මචාරීහි සම්පයොජෙත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තන්ති, තෙපි සත්ථු වණ්ණවාදිනො හොන්ති, ධම්මස්ස වණ්ණවාදිනො හොන්ති, සඞ්ඝස්ස වණ්ණවාදිනො හොන්ති. අත්තගරහිනො යෙව හොන්ති අනඤ්ඤගරහිනො: මයමෙවෙත්ථ[3] අලක්ඛිකා, මයං අප්පපුඤ්ඤා යෙ මයං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා නාසක්ඛිම්හ යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුන්ති. තෙ ආරාමිකභූතා වා උපාසකභූතා වා පඤ්චසු සික්ඛාපදෙසු සමාදාය වත්තන්ති. ඉති සමණො ගොතමො සාවකානං සක්කතො ගරුකතො මානිතො පූජිතො, සමණඤ්ච පන ගොතමං සාවකා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තීති.

කති පන ත්වං උදායි, ධම්මෙ සමනුපස්සසි යෙහි මම සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තීති?

පඤ්ච ඛො අහං භන්තෙ භගවති ධම්මෙ සමනුපස්සාමි යෙහි භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. කතමෙ පඤ්ච:

භගවා හි භන්තෙ, අප්පාහාරො අප්පාහාරතාය ච වණ්ණවාදී. යම්පි භන්තෙ භගවා අප්පාහාරො අප්පාහාරතාය ච වණ්ණවාදී[4] ඉමං ඛො අහං භන්තෙ. භගවති පඨමං ධම්මං සමනුපස්සාමි යෙන භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං භන්තෙ භගවා සන්තුට්ඨො ඉතරීතරෙන චීවරෙන ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී. යම්පි භන්තෙ, භගවා සන්තුට්ඨො ඉතරීතරෙන චීවරෙන ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී. ඉමං ඛො අහං භන්තෙ භගවති දුතියං ධම්මං සමනුපස්සාමි යෙන භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

---

1. ඛුද්දමධුං – මජ්සං.
2. { උප්පීළෙය්‍ය – සීමු.
   { පීළෙය්‍ය – මජ්සං. ස්‍යා. PTS.
3. මයමෙවම්හා – ඉ. මජ්සං. ස්‍යා.
4. යම්පි භන්තෙ භගවා අප්පාහාරො අප්පාහාරතාය වණ්ණවාදී–PTS. (ඌනං)

ශ්‍රාවකයන්ගේ කිවිසි හඬෙක් වේවයි උකැසි හඬෙක් වේවයි නො මැ වෙයි. ජනකාය පතාගෙන මෙන් ඔහු වෙත එළැඹසිටියේ වෙයි : "භාග්‍යවතුන් වහන්සේ යම් දහමක් අපට දේශනා කරනසේක් ද, එය අසම්හ"යි. යම්සේ නම් පුරුෂයෙක් සතර මං සන්ධියෙක්හි නිමැසි දඬුවැල්බෑ මීයක් මිරිකා දෙන්නේ ද, මහාජනකාය පතාගෙන මෙන් තුලුහු වෙත එළැඹසිටියේ වේ ද, එසෙයින් මැ යම් කලෙකැ ශ්‍රමණ ගෞතම නොයෙක් සියගණන් ඇති පිරිස්හි දහම් දෙසා ද, එකල්හි ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයන් ගේ කිවිසි හඬෙක් හෝ උකැසි හඬෙක් නො මැ වෙයි. මහා ජනකාය පතාගෙන මෙන් "භාග්‍යවතුන් වහන්සේ අපට යම් දහමක් දේශනා කරන සේක් ද, එය අසම්හ"යි තුලුහු වෙත එළැඹසිටියේ වෙයි. ශ්‍රමණ ගෞතමයන්ගේ යම් ශ්‍රාවක කෙනෙකුත් සබ්‍රම්සරුන් හා සමග අල්පමාත්‍ර විවාද කොට ගෙන ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි වෙත් ද, ඔහු දු ශාස්තෲන් වහන්සේ ගේ ගුණ කියන්නාහු වෙති, ධර්මයෙහි ගුණ කියන්නාහු වෙති, සඞ්ඝයාගේ ගුණ කියන්නාහු වෙති. 'ඇපි මැ මෙහි නිශ්ශ්‍රීකයම්හ, ඇපි අල්පපුණ්‍ය ඇතියම්හ, ඇපි මෙවන් ස්වාඛ්‍යාත ධර්මවිනයෙහි පැවිදි වැ දිවිහිම් කොට පිරිපුන් පිරිසුදු බඹසර රක්නට නො හැකි වූම්හ'යි අනෙකකු නො ගරහන්නාහු තමා මැ ගරහන්නාහු වෙති. ඔහු ආරාමික වූවාහු හෝ උපාසක වූවාහු හෝ පඤ්චශික්ෂාපදයන් සමාදන් වැ ගෙන දිවි රකිති. මෙසෙයින් ශ්‍රමණ ගෞතම ශ්‍රාවකයන් විසින් සත්කෘත යැ ගුරුකෘත යැ මානිත යැ පූජිත යි. ශ්‍රාවකයෝ වැළිත් ශ්‍රමණ ගෞතමයන් සත්කාර ගරුකාර කොට ඇසුරු කොට වෙසෙත්" යයි.

උදායී, තෙපි 'යම් ධර්ම කෙනකුන් හේතු කොට ගෙන ශ්‍රාවකයෝ මට සත්කාර ගරුකාර මානන පූජා කෙරෙත් ද, සත්කාර ගරුකාර කොට මා නිසා වෙසෙත් ද එබඳු වූ කෙනෙක් දහම් දක්නහු ද? යි.

වහන්ස, යම් ධර්ම කෙනකුන් හේතු කොට ගෙන ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් ද, සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් ද මම භාග්‍යවතුන් කෙරෙහි එබඳු දහම් පසක් දක්මි. කවර පසෙක යත් :

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අල්පාහාර ඇතියහ, අල්පාහාරතායෙහි ද ගුණ කියනුවහ. වහන්ස, 'භාග්‍යවත්හු අල්පාහාර ඇතියහ, අල්පාහාරතායෙහි ද ගුණ කියනුවහ' යන යම් කරුණෙක් ඇද්ද, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් නම් සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් නම් වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි ඒ මේ පළමු වන දහම දක්මි.

තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඉතිරිතරචීවර ප්‍රත්‍යයෙන් සන්තුෂ්ටයහ, ඉතරීතර චීවරසන්තුෂ්ටියෙහි දු ගුණ කියනුවහ. වහන්ස, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ඉතරීතරචීවරප්‍රත්‍යයෙන් සන්තුෂ්ට සේක් ද, ඉතරීතරචීවරසන්තුෂ්ටියෙහි දු ගුණ කියන සේක් ද, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් නම් සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් නම් වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි මේ දෙ වන දහම දක්මි.

පුන ච පරං භන්තෙ, භගවා සන්තුට්ඨො ඉතරීතරෙන පිණ්ඩපාතෙන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී. යම්පි භන්තෙ, භගවා සන්තුට්ඨො ඉතරීතරෙන පිණ්ඩපාතෙන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී. ඉමං ඛො අහං භන්තෙ භගවති තතියං ධම්මං සමනුපස්සාමි යෙන භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං භන්තෙ, භගවා සන්තුට්ඨො ඉතරීතරෙන සෙනාසනෙන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී. යම්පි භන්තෙ, භගවා සන්තුට්ඨො ඉතරීතරෙන සෙනාසනෙන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී. ඉමං ඛො අහං භන්තෙ. භගවති චතුත්ථං ධම්මං සමනුපස්සාමි යෙන භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං භන්තෙ, භගවා පවිවිත්තො පවිවෙකස්ස ච වණ්ණවාදී. යම්පි භන්තෙ, භගවා පවිවිත්තො පවිවෙකස්ස ච වණ්ණවාදී. ඉමං ඛො අහං භන්තෙ භගවති පඤ්චමං ධම්මං සමනුපස්සාමි යෙන භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. ඉමෙ ඛො අහං භන්තෙ භගවති පඤ්චධම්මෙ සමනුපස්සාමි යෙහි භගවන්තං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තීති.

අප්පාහාරො සමණො ගොතමො අප්පාහාරතාය ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං[1] මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. සන්ති ඛො පන මෙ උදායි, සාවකා කොසකාහාරාපි අඩ්ඪකොසකාහාරාපි බෙලු-වාහාරාපි අඩ්ඪබෙලුවාහාරාපි අහං ඛො පනුදායි, අප්පෙකදා ඉමිනා පත්තෙන සමතිත්තිකම්පි භුඤ්ජාමි, භිය්‍යොපි භුඤ්ජාමි. අප්පාහාරො සමණො ගොතමො අප්පාහාරතාය ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. යෙ තෙ උදායි, මම සාවකා කොසකාහාරාපි අඩ්ඪකොසකාහාරාපි බෙලුවාහාරාපි අඩ්ඪබෙලුවාහාරාපි, න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං.

සන්තුට්ඨො සමණො ගොතමො ඉතරීතරෙන චීවරෙන ඉතරීතර-චීවරසන්තුට්ඨියා ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. සන්ති ඛො පන මෙ උදායි, සාවකා පංසුකූලිකා ලූඛචීවරධරා තෙ සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා[2] වා නන්තකානි උච්චිනිත්වා[3] සඞ්ඝාටිං කරිත්වා ධාරෙන්ති. අහං ඛො පනුදායි, අප්පෙකදා ගහපති-චීවරානි[4] ධාරෙමි දළ්හානි සත්ථ ලූඛානි අලාපුලොමසානි[5]. සන්තුට්ඨො, සමණො ගොතමො ඉතරීතරෙන චීවරෙන ඉතරීතර චීවර සන්තුට්ඨියා

---

1. ගරුං කරෙය්‍යුං - මජසං.
2. පාපණිකානි - සීමු.
3. උච්චිණිත්වා - සීමු.
4. ගහපතානි චීවරානි - ස්‍යා, PTS
5. සත්ථලූඛානි අලාබුලොමසානි - මජසං. / සුත්තලූඛානි අලාපුලොමසානි - ස්‍යා.

Free Distribution www.aathaapi.org

තවද, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඉතරීතරපිණ්ඩපාත ප්‍රත්‍යයෙන් සන්තුෂ්ටයහ, ඉතරීතරපිණ්ඩපාතසන්තුෂ්ටියෙහි ද ගුණ කියවනුවහ. වහන්ස, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ඉතරීතරපිණ්ඩපාතප්‍රත්‍යයෙන් සන්තුෂ්ට සේක් ද, ඉතරීතරපිණ්ඩපාත සන්තුෂ්ටියෙහි ද ගුණ කියන සේක් ද, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් නම් සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් නම් වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි ඒ මේ තුන් වන දහම දක්මි.

තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඉතරීතර සේනාසන ප්‍රත්‍යයෙන් සන්තුෂ්ටයහ, ඉතරීතරසේනාසන සන්තුෂ්ටියෙහි ද ගුණ කියනුවහ. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ඉතරීතරසේනාසනප්‍රත්‍යයෙන් සන්තුෂ්ට සේක් ද, ඉතරීතර සේනාසනසන්තුෂ්ටියෙහි ද ගුණ කියන සේක් ද, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් නම්, සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් නම් වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි ඒ මේ සතර වන දහම දක්මි.

තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උපධි විවේක ඇතියහ, උපධිවිවේකයෙ (නිවනෙ) හි ද ගුණකියනුවහ. යම් හෙයකින් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උපධි විවේක ඇති සේක් ද උපධිවිවේකයෙහි ද ගුණ කියන සේක් ද, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් නම් සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් නම් වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි ඒ මේ පස් වන දහම දක්මි. වහන්ස, මම 'යම් ධර්ම කෙනකුන් හේතු කොට ගෙන ශ්‍රාවකයෝ භාග්‍යවතුන්ට සත්කාර ගුරුකාර මානන පූජා කෙරෙත් ද සත්කාර ගුරුකාර කොට නිසා වෙසෙත් ද' ඒ මේ දහම්පස භාග්‍යවතුන් කෙරෙහි දක්මි'යි.

උදායි, 'ශ්‍රමණ ගෞතම අල්පාහාර ඇත්තේ යැ අල්පාහාර බැවිහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගුරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජන කරන්නාහු වෙත් නම් සත්කාර කොට ගුරුකාර කොට නිසා වෙසෙත් නම්, උදායි, මාගේ ශ්‍රාවකයෝ සරළුවක් පමණ අහර වළඳන්නාහු ද අඩ සරළුවක් පමණ අහර වළඳන්නාහු ද බෙලිගෙඩියක් පමණ අහර වළඳන්නාහු ද අඩබෙලි ගෙඩියක් පමණ අහර වළඳන්නාහු ද ඇත. උදායි, මම් වූකලි ඇතැම් දවසෙකැ මේ පාත්‍රයෙන් මුවවිට යටහිර දක්වා වූ අහර ද වළඳමි, අධික ව ද වළඳමි. උදායි, 'ශ්‍රමණ ගෞතම අල්පාහාර ඇත්තේ යැ අල්පාහාරතායෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගුරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම් සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදායි, සරළුවක් පමණ අහර වළඳන්නා වූ ද අඩ සරළුවක් පමණ අහර වළඳන්නා වූ ද බෙලිගෙඩියක් පමණ අහර වළඳන්නා වූ ද අඩ බෙලිගෙඩියක් පමණ අහර වළඳන්නා වූ ද යම් මාගේ ශ්‍රාවක කෙනෙක් ඇද්ද, ඔහු මට මෙ කරුණින් සත්කාර නො කරන්නාහ, ගරුකාර නො කරන්නාහ, මානන නො කරන්නාහ, පූජා නො කරන්නාහ. සත්කාර කොට ගරුකාර කොට නිසා නො වසන්නාහු යැ.

උදායි, ,ශ්‍රමණ ගෞතම ඉතරීතරචීවර ප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතරචීවර-සන්තුෂ්ටියෙහි ද ගුණ කියනේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාරකරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම්, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදායි, මාගේ ශ්‍රාවකයෝ වැළිත් පසුල් දරන්නාහු රළුසිවුරු දරන්නාහු ඇත. ඔහු සොහොනින් වෙවයි කසළගොඩින් වෙවයි අවුළුදෙරින් වෙවයි මහලුපිළී අවුලාගෙන සඟළසිවුරු කොට ධරති. උදායි, මම් වූකලි ඇතැම් දවසෙකැ යම් සිවුරෙකැ රළුහු ලබුලොම් බඳු වේ ද එබඳු වූ, දළ ගැහැවිසිවුරු ධරමි. උදායි, ශ්‍රමණ ගෞතම ඉතරීතරචීවරප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතරචීවරසන්තුෂ්ටියෙහි ද ගුණ

ච වණ්ණවාදීති. ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. යෙ තෙ උදායි, මම සාවකා පංසුකූලිකා ලූඛචීවරධරා තෙ සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං කරිත්වා ධාරෙන්ති, න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං.

සන්තුට්ඨො සමණො ගොතමො ඉතරීතරෙන පිණ්ඩපාතෙන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි, සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. සන්ති ඛො පන මෙ උදායි සාවකා පිණ්ඩපාතිකා සපදානචාරිනො උඤ්ඡෙපකෙ[1] වතෙ රතා, තෙ අන්තරඝරං පවිට්ඨා සමානා ආසනෙනපි නිමන්තියමානා න සාදියන්ති. අහං ඛො පනුදායි, අප්පෙකදා නිමන්තනෙපි භුඤ්ජාමි සාලීනං ඔදනං විචිතකාළකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං. සන්තුට්ඨො සමණො ගොතමො ඉතරීතරෙන පිණ්ඩපාතෙන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. යෙ තෙ උදායි මම සාවකා පිණ්ඩපාතිකා සපදානචාරිනො උඤ්ඡෙපකෙ[1] වතෙ රතා, අන්තරඝරං පවිට්ඨා සමානා ආසනෙනපි නිමන්තියමානා න සාදියන්ති, න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං.

සන්තුට්ඨො සමණො ගොතමො ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. සන්ති ඛො පන මෙ උදායි, සාවකා රුක්ඛමූලිකා අබ්භොකාසිකා, තෙ අට්ඨමාසෙ ඡන්නං න උපෙන්ති. අහං ඛො පනුදායි, අප්පෙකදා කූටාගාරෙසුපි විහරාමි උල්ලිත්තාවලිත්තෙසු නිවාතෙසු ඵුසිතග්ගළෙසු[2] පිහිතවාතපානෙසු. සන්තුට්ඨො සමණො ගොතමො ඉතරීතරෙන සෙනාසනෙන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි, සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. යෙ තෙ උදායි මම සාවකා රුක්ඛමූලිකා අබ්භොකාසිකා තෙ අට්ඨමාසෙ ඡන්නං න උපෙන්ති. න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං.

---

1. උච්ඡෙපකෙ - PTS. උඤ්ඡාසකෙ - මජ්සං. උච්චාපකෙ වතෙන - ස්‍යා
2. ඵුසිතග්ගළෙසු - මජ්සං.

කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම් සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදයි, මාගේ යම් ශ්‍රාවක කෙනෙක් පසුල් දරන්නාහු ද රළුසිවුරු දරන්නාහු ද, ඔහු සොහොනින් වේවයි කසළ ගොඩින් වේවයි අවුළුදෙරින් වේවයි මහලුපිළී (හිරා) අවුලා ගෙන සඟළසිවුරු කොට දරත් ද ඔහු මට මෙ කරුණින් සත්කාර නො කරන්නාහ, ගරුකාර නො කරන්නාහ, මානන නො කරන්නාහ, පූජා නො කරන්නාහ, සත්කාර කොට ගුරුකාර කොට නිසා නො වසන්නාහු යැ.

ඉදින් උදයි, 'ශ්‍රමණ ගෞතම ඉතරීතරපිණ්ඩපාත ප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතර පිණ්ඩපාතසන්තුෂ්ටියෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම් සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදයි, මාගේ ශ්‍රාවකයෝ වැළිත් පිණ්ඩපාතිකඞ්ග ඇත්තාහු ගෙපිළිවෙළින් පිඩුසිඟා යන්නාහු ඇවිලිලි අහරෙහි ඇලුණාහු ඇත, ඔහු ඇතුළුගමට පිවිසියාහු අසුනෙනුදු පවරනුලබන්නාහු නො ඉවසති. උදයි, මම වූකලි ඇතැම් දවසෙකැ නිමන්ත්‍රණයෙහි ද නොයෙක් සූප ඇති නොයෙක් ව්‍යඤ්ජන ඇති නිවුඩු හළ හැල් බත් වළඳමි. ඉදින් උදයි, 'ශ්‍රමණ ගෞතම ඉතරීතර පිණ්ඩපාත ප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතරපිණ්ඩපාතසන්තුෂ්ටියෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම්, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදයි, මාගේ යම් ශ්‍රාවක කෙනෙක් පිණ්ඩපාතිකඞ්ග ඇත්තාහු ගෙපිළිවෙළින් පිඩු සිඟා යන්නාහු ඇවිලිලි අහරෙහි ඇලුණාහු වෙත් ද ,ඇතුළුගමට පිවිසියාහු අසුනෙනුදු පවරනු ලබන්නාහු නො ඉවසත් ද, ඔහු මට මෙ කරුණින් සත්කාර නො කරන්නාහ, ගරුකාර නො කරන්නාහ, මානන නො කරන්නාහ, පූජා නො කරන්නාහ, සත්කාර කොට ගරුකාර කොට නිසා නො වසන්නාහු යැ.

ඉදින් උදයි, 'ශ්‍රමණ ගෞතම ඉතරීතරසේනාසන ප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතර සේනාසනසන්තුෂ්ටියෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම්, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදයි, මාගේ ශ්‍රාවකයෝ වැළිත් රුක්ඛමූලිකඞ්ග ඇත්තාහු අබ්භෝකාසිකඞ්ග ඇත්තාහු ඇත. ඔහු අට මසක් කල් සියත් යටට නො එළැඹෙත්. උදයි, මම වූකලි ඇතැම් දවසෙකැ ඇතුළත පිටත පිරියම් කළ වළහන ලද වාතප්‍රවෙශ ඇති මොනොවට පැහැසූ අගුළු ඇති පියන ලද වාකවුළු ඇති කුළුගෙහි ද වෙසෙමි. ඉදින් උදයි, 'ශ්‍රමණ ගෞතම ඉතිරිතර සේනාසන ප්‍රත්‍යයෙන් සන්තුෂ්ට යැ ඉතරීතරසේනාසන සන්තුෂ්ටියෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම්, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදයි, මාගේ යම් ශ්‍රාවක කෙනෙක් රුක්ඛමූලිකඞ්ග ඇත්තාහු අබ්භොකාසිකඞ්ග ඇත්තාහු වෙත් ද, ඔහු අටමසක් කල් සියත් යටට නො එළැඹෙත් ද, ඔහු මට මෙකරුණින් සත්කාර නො කරන්නාහ, ගරුකාර නො කරන්නාහ, මානන නො කරන්නාහ, පූජා නො කරන්නාහ, සත්කාර කොට ගරුකාර කොට නිසා නො වසන්නාහු යැ.

පවිවිත්තො සමණො ගොතමො පවිවෙකස්ස ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි, සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. සන්ති ඛො පන මෙ උදායි සාවකා ආරඤ්ඤකා පන්තසෙනාසනා අරඤ්ඤවනපත්ථානි[1] පන්තානි සෙනාසනානි අජ්ඣොගාහෙත්වා විහරන්ති. තෙ අන්වද්ධමාසං[2] සඞ්ඝමජ්ඣෙ ඔසරන්ති පාතිමොක්ඛුද්දෙසාය. අහං ඛො පනුදායි අප්පෙකදා ආකිණ්ණො විහරාමි භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රඤ්ඤා[3] රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. පවිවිත්තො සමණො ගොතමො පවිවෙකස්ස ච වණ්ණවාදීති ඉති චෙ මං උදායි, සාවකා සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුං. යෙ තෙ උදායි මම සාවකා ආරඤ්ඤකා පන්තසෙනාසනා අරඤ්ඤවනපත්ථානි[1] පන්තානි සෙනාසනානි අජ්ඣොගාහෙත්වා[4] විහරන්ති අන්වද්ධමාසං සඞ්ඝමජ්ඣෙ ඔසරන්ති පාතිමොක්ඛුද්දෙසාය. න මං තෙ ඉමිනා ධම්මෙන සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුන්ති.

ඉති ඛො උදායි, න මමං සාවකා ඉමෙහි පඤ්චහි ධම්මෙහි සක්කරොන්ති. ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

අත්ථි ඛො උදායි, අඤ්ඤෙ ච පඤ්ච ධම්මා යෙහි[5] මමං සාවකා[6] සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති. කතමෙ පඤ්ච:

ඉධුදායි, මමං සාවකා අධිසීලෙ සම්භාවෙන්ති: සීලවා සමණො ගොතමො පරමෙන සීලක්ඛන්ධෙන සමන්නාගතොති යම්පුදායි[7] මමං සාවකා[8] අධිසීලෙ සම්භාවෙන්ති: සීලවා සමණො ගොතමො පරමෙන සීලක්ඛන්ධෙන සමන්නාගතොති. අයං ඛො උදායි, පඨමො ධම්මො යෙන මමං සාවකා[8] සක්කරොන්ති ගරුකරොන්ති. මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං උදායි, මමං සාවකා අභික්කන්තෙ ඤාණදස්සනෙ සම්භාවෙන්ති. ජානංයෙවාහ සමණො ගොතමො ජානාමීති, පස්සංයෙවාහ සමණො ගොතමො පස්සාමීති, අභිඤ්ඤාය සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනභිඤ්ඤාය, සනිදානං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනිදානං, සප්පාටිහාරියං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අප්පාටිහාරියන්ති. යම්පුදායි මමං සාවකා අභික්කන්තෙ ඤාණදස්සනෙ සම්භාවෙන්ති. ජානංයෙවාහ සමණො ගොතමො

---

1. ආරඤ්ඤවනපත්ථානි - PTS.
   අරඤ්ඤවනපත්ථානි - මජසං.
2. අන්වඩ්ඪමාසං - සයා.
3. රඤ්ඤො - PTS
4. අජ්ඣොගාහෙත්වා - මජසං.
5. යෙහි පඤ්චහි ධම්මෙහි - මජසං සයා.
6. මම සාවකා - PTS සයා.
7. යම්හුදායි -සයා, යම්පනුදායි - PTS.
8. මම සාවකා - සීමු, සයා, PTS.

Free Distribution www.aathaapi.org

ඉදින් උදායි, 'ශ්‍රමණ ගෞතම ප්‍රවිවේක ඇත්තේ යැ ප්‍රවිවේකයෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම් සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදායි, මාගේ ශ්‍රාවකයෝ වැළිත් ආරණ්‍යකාඞ්ග ඇත්තාහු වනසෙනසුන් ඇසුරු කරන්නාහු ඇත. ඔහු වනසෙනසුනට වනයෙහි දුරසෙනසුනට වනයෙහි ඉතා දුර සෙනසුනට වැද වාසය කෙරෙති. ඔහු අඩමසක් පාසා පාමොක් උදෙසුමට සහමැද රැස් වෙති. උදායි, මම් වූකලි ඇතැම් දවසෙකැ මහණුන් විසින් මෙහෙණින් විසින් උවසුවන් විසින් උවැසියන් විසින් රජු විසින් රජමහඇමැතියන් විසින් තිර්ථකයන් විසින් තිර්ථකශ්‍රාවකයන් විසින් ආකුල වැ වෙසෙමි. ඉදින් උදායි, 'ශ්‍රමණ ගෞතම ප්‍රවිවේක ඇත්තේ යැ ප්‍රවිවේකයෙහි ද ගුණ කියන්නේ යැ'යි මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නාහු මානන කරන්නාහු පූජා කරන්නාහු වෙත් නම්, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් නම්, උදායි, මාගේ යම් ශ්‍රාවක කෙනෙක් ආරණ්‍යකාඞ්ග ඇත්තාහු වනසෙනසුන් ඇසුරු කරන්නාහු වෙත් ද, වනසෙනසුනට වනයෙහි දුර සෙනසුනට වනයෙහි ඉතා දුර සෙනසුනට වැද වාසය කෙරෙත් ද, අඩමසක් පාසා පාමොක් උදෙසුමට සහමැද රැස් වෙත් ද, ඔහු මෙකරුණින් මට සත්කාර නො කරන්නාහ, ගරුකාර නො කරන්නාහ, මානන නො කරන්නාහ, පූජා නො කරන්නාහ, සත්කාර කොට ගරුකාර කොට නිසා නො වන්නාහ''යි.

මෙසෙයින් උදායි, ශ්‍රාවකයෝ මට මෙ පස් කරුණින් සත්කාර ගරුකාර මානන පූජා නො කෙරෙති, සත්කාර ගරුකාර කොට නිසා නො වෙසෙත්.

උදායි, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ මට සත්කාර කෙරෙත් ද ගරුකාර කෙරෙත් ද මානන කෙරෙත් ද පූජා කෙරෙත් ද සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් ද එබඳු වූ අනෙකුදු කරුණු පසෙක් ඇති, කවර පසෙක යත් :

උදායි, මෙසස්නෙහි ශ්‍රාවකයෝ 'ශ්‍රමණ ගෞතම සිල්වත් යැ උත්තම ශීලස්කන්ධයෙන් සමන්වාගත යැ'යි මා අධිශීලයෙහි සම්භාවන කෙරෙති. උදායි, යම්හෙයකින් ශ්‍රාවකයෝ 'ශ්‍රමණ ගෞතම සිල්වත් යැ උත්තම ශීලස්කන්ධයෙන් සමන්වාගත යැ'යි මා අධිශීලයෙහි සම්භාවන කෙරෙත් ද, උදායි, 'යම් කරුණෙකින් ශ්‍රාවකයෝ මට සත්කාර කෙරෙත් ද ගරුකාර කෙරෙත් ද මානන කෙරෙත් ද පූජා කෙරෙත් ද සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් ද මේ වූකලි ඒ පළමු වන කරුණ වෙයි.

තවද උදායි, ශ්‍රාවකයෝ සර්වඥතාඥානදර්ශනයෙහි මා සම්භාවන කෙරෙති : ''ශ්‍රමණ ගෞතම දන්නේ මැ දනිමී කියයි, ශ්‍රමණ ගෞතම දක්නේ මැ දක්මී කියයි, ශ්‍රමණ ගෞතම ප්‍රත්‍යක්ෂ නො කොට නොවැ ප්‍රත්‍යක්ෂ කොට දහම් දෙසයි, ශ්‍රමණ ගෞතම අකාරණ වැ නො වැ සකාරණ වැ දහම් දෙසයි, ශ්‍රමණ ගෞතම අහෙතුක වැ නො වැ සහෙතුක වැ දහම් දෙසා''යයි. යම් හෙයකින් උදායි, ශ්‍රාවකයෝ : ''ශ්‍රමණ ගෞතම දන්නේ මැ දනිමී කියයි, ශ්‍රමණ ගෞතම දක්නේ මැ දක්මී කියයි, ශ්‍රමණ ගෞතම ප්‍රත්‍යක්ෂ නො කොට නො වැ ප්‍රත්‍යක්ෂ කොට දහම් දෙසයි, ශ්‍රමණ ගෞතම අකාරණ වැ නො වැ සකාරණ වැ දහම් දෙසයි, ශ්‍රමණ ගෞතම අහේතුක වැ නො වැ සහේතුක වැ දහම් දෙසා''යයි සර්වඥතා ඥානදර්ශනයෙහි මා සම්භාවන කෙරෙත් ද, උදායි, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ ම සත්කාර කෙරෙත් ද ගරුකාර කෙරෙත් ද මානන කෙරෙත් ද පූජා කෙරෙත් ද, සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් ද මේ වූකලි ඒ දෙවන කරුණ වෙයි.

ජානාමීති. පස්සංයෙවාහ සමණො ගොතමො පස්සාමීති. අභිඤ්ඤාය සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනභිඤ්ඤාය, සනිදානං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනිදානං, සප්පාටිහාරියං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අප්පාටිහාරියන්ති. අයං ඛො උදායි, දුතියො ධම්මො යෙන මමං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං උදායි, මමං සාවකා[1] අධිපඤ්ඤාය සම්භාවෙන්ති: පඤ්ඤවා සමණො ගොතමො පරමෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො. තං වත අනාගතං වා වාදපථං න දක්ඛති උප්පන්නං වා පරප්පවාදං න සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හිස්සතීති[2] නෙතං ඨානං විජ්ජති. තං කිං මඤ්ඤසි උදායි? අපි නු මෙ සාවකා එවං ජානන්තා, එවං පස්සන්තා අන්තරන්තරා කථං ඔපාතෙය්‍යුන්ති? නො හෙතං භන්තෙ. න ඛො පනාහං උදායි සාවකෙසු අනුසාසනිං පච්චාසිංසාමි අඤ්ඤදත්‍ථු මමංයෙව සාවකා අනුසාසනිං පච්චාසිංසන්ති. යම්පුදායි[3] මමං සාවකා අධිපඤ්ඤාය සම්භාවෙන්ති පඤ්ඤවා සමණො ගොතමො පරමෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො. තං වත අනාගතං වා වාදපථං න දක්ඛති උප්පන්නං වා පරප්පවාදං න සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හිස්සතීති[2] නෙතං ඨානං විජ්ජති. අයං ඛො උදායි, තතියො ධම්මො යෙන මමං සාවකා[1] සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං උදායි, මම සාවකා යෙන දුක්ඛෙන දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා තෙ මං උපසඞ්කමිත්වා දුක්ඛං අරියසච්චං පුච්ඡන්ති. තෙසාහං දුක්ඛං අරියසච්චං පුට්ඨො ව්‍යාකරොමි, තෙසාහං චිත්තං ආරාධෙමි පඤ්හස්ස වෙය්‍යාකරණෙන. තෙ මං දුක්ඛසමුදයං -පෙ- දුක්ඛනිරොධං -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං පුච්ඡන්ති. තෙසාහං දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං පුට්ඨො ව්‍යාකරොමි, තෙසාහං චිත්තං ආරාධෙමි පඤ්හස්ස වෙය්‍යාකරණෙන. යම්පුදායි[3], මමං සාවකා යෙන දුක්ඛෙන දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා තෙ මං උපසඞ්කමිත්වා දුක්ඛං අරියසච්චං පුච්ඡන්ති, තෙසාහං දුක්ඛං අරියසච්චං පුට්ඨො ව්‍යාකරොමි. තෙසාහං චිත්තං ආරාධෙමි පඤ්හස්ස වෙය්‍යාකරණෙන. තෙ මං දුක්ඛසමුදයං -පෙ- දුක්ඛනිරොධං -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං පුච්ඡන්ති. තෙසාහං දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං පුට්ඨො ව්‍යාකරොමි. තෙසාහං චිත්තං ආරාධෙමි පඤ්හස්ස වෙය්‍යාකරණෙන. අයං ඛො උදායි, චතුත්ථො ධම්මො යෙන මමං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා චත්තාරො සතිපට්ඨානෙ භාවෙන්ති. ඉධුදායි භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

---

1. මම සාවකා - ස්‍යා, PTS. 2. නිග්ගහිස්සති - ස්‍යා, PTS.
3 යම්මුදායි - ස්‍යා. යමපනුදායි - PTS.

Free Distribution www.aathaapi.org

තවද උදායි, ශ්‍රාවකයෝ මා අධිප්‍රඥයෙහි (තත්වැයිතුවණෙහි) සම්භාවන කෙරෙති ''ශ්‍රමණ ගෞතම ප්‍රඥ ඇත්තේ යැ, උත්තම ප්‍රඥස්කන්ධයෙන් සමන්වාගත යැ, 'ඒ අනාගත වාදපථය හෝ නො දක්නේ යැ උපන්නා වූ හෝ පරවාද සකාරණ වැ මොනොවට නිග්‍රහ කරන ලද කොට නො නිගන්නේ යැ' යන තෙල කරුණ නො පැනෙයි.'' උදායි, එය කිමැ'යි හඟී ද? මාගේ ශ්‍රාවකයෝ මෙසේ දන්නාහු මෙසේ දක්නාහු අතුරතුරෙහි කථා ඔවත් දැ?යි. තෙල කරුණ නො වෙ මැ යි වහන්ස, උදායි, මම් වැළිත් ශ්‍රාවකයන් කෙරෙහි අනුශාසනාව නො පතමි. ඒකාන්තයෙන් ශ්‍රාවකයෝ මාගෙන් මැ අනුශාසනාව පතති. යම් හෙයකින් උදායි, ශ්‍රාවකයෝ මා අධිප්‍රඥයෙහි සම්භාවන කෙරෙත් ද : ''ශ්‍රමණ ගෞතම ප්‍රඥවත් යැ, උත්තම වූ ප්‍රඥස්කන්ධයෙන් සමන්වාගත යැ, ඒ' අනාගත වාදපථය හෝ නො දක්නේ යැ උපන්නා වූ හෝ පරවාද සකාරණ වැ මොනොවට නිග්‍රහ කරන ලද කොට නො නිගන්නේ යැ' යන තෙල කරුණ නො පැනේ''යයි. උදායි, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ මට සත්කාර කෙරෙත් ද ගරුකාර කෙරෙත් ද මානන කෙරෙත් ද පූජා කෙරෙත් ද සත්කාර කොට ගරුකාර කොට නිසා වෙසෙත් ද මේ වූකලි ඒ තුන්වන කරුණ වෙයි.

තවද උදායි, මාගේ ශ්‍රාවකයෝ යම් දුකෙකින් දුකට බටුවාහු දුකින් මැඩුණාහු ද, ඔහු මා කරා එළැඹ දුඃඛාර්‍ය්‍යසත්‍යය පුළුවුස්ති, මම ඔවුන් විසින් දුඃඛාර්‍ය්‍යසත්‍යය පුළුවුස්නාලද්දෙම් ප්‍රකාශ කෙරෙමි, මම් ප්‍රශ්නව්‍යාකරණයෙන් ඔවුන්ගේ සිත් ගනිමි. ඔහු මා දුඃඛසමුදය . . . දුඃඛනිරෝධය . . . දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය පුළුවුස්ති, මම් ඔවුන් විසින් දුඃඛ-නිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය පුළුවුස්නා ලද්දෙම් ප්‍රකාශ කෙරෙමි, මම ප්‍රශ්නව්‍යාකරණ-යෙන් ඔවුන්ගේ සිත් ගනිමි. යම් හෙයකින් උදායි, මාගේ ශ්‍රාවකයෝ යම් දුකෙකින් දුකට බටුවාහු දුකින් මැඩුණාහු ද ඔහු මා කරා එළැඹ දුඃඛාර්‍ය්‍යසත්‍යය පුළුවුසිත් ද, මම ඔවුන් විසින් දුඃඛාර්‍ය්‍යසත්‍යය පුළුවුස්නා ලද්දෙම් ප්‍රකාශ කෙරෙම් ද, මම ප්‍රශ්න ව්‍යාකරණ-යෙන් ඔවුන් ගේ සිත් ගනිම් ද ඔහු මා දුඃඛසමුදය . . . . දුඃඛනිරෝධය . . . . දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය පුළුවුසිත් ද, මම ඔවුන් විසින් දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය පුළුවුස්නා ලද්දෙම් ප්‍රකාශ කෙරෙම් ද ,මම ප්‍රශ්නව්‍යාකරණයෙන් ඔවුන්ගේ සිත් ගනිම් ද, උදායි, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ මට සත්කාර ගරුකාර මානන පූජා කෙරෙත් නම් සත්කාර ගරුකාර කොට නිසා වෙසෙත් නම් මේ වූ කලී ඒ සතර වන කරුණ වෙයි.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද යැ; යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ සතර සිවටන් වඩති : උදායි, මෙ සස්නෙහි මහණ කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට කයෙහි කය අනුව බලමින් වෙසෙයි. වේදනාවන්හි . . . චිත්තයෙහි ... ධර්මයන්හි කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට ධර්මයන්හි ධර්මානුදර්ශී වැ වෙසෙයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥාවසාන අභිඥාපාරමී සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථාපටිපන්නා මෙ සාවකා චත්තාරො සම්මප්පධානෙ භාවෙන්ති. ඉධුදායි, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති. පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා චත්තාරො ඉද්ධිපාදෙ භාවෙන්ති. ඉධුදායි භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි —පෙ— චිත්තසමාධි —පෙ— වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථාපටිපන්නා මෙ සාවකා පඤ්චින්ද්‍රියානි භාවෙන්ති. ඉධුදායි භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. විරියින්ද්‍රියං භාවෙති -පෙ- සතින්ද්‍රියං භාවෙති -පෙ- සමාධින්ද්‍රියං භාවෙති -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසාන පාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා පඤ්චබලානි භාවෙන්ති. ඉධුදායි, භික්ඛු සද්ධාබලං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. විරියබලං භාවෙති-පෙ-සතිබලං භාවෙති -පෙ- සමාධිබලං භාවෙති -පෙ- පඤ්ඤාබලං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසාන පාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්ති. ඉධුදායි, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති —පෙ— විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්ති. ඉධුදායි, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති, සම්මාසඞ්කප්පං භාවෙති, සම්මාවාචං භාවෙති, සම්මාකම්මන්තං භාවෙති, සම්මාආජීවං භාවෙති, සම්මාවායාමං භාවෙති, සම්මාසතිං භාවෙති, සම්මාසමාධිං භාවෙති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ සතර සම්‍යක් ප්‍රධානයන් වඩති. උදායි, මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුසල් දහම් නූපදනා පිණිස කත්තුකම්‍යතා කුසලච්ඡන්දය උපදවයි, ප්‍රයෝග කෙරෙයි, වීර්‍ය්‍ය කෙරෙයි, සිත නහයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරේ. උපන් ලමු අකුසල්දහම් දුරු කරන පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, සිත නහයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරේ. නූපන් කුසල්දහම් උපදනා පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍ය කෙරෙයි, සිත නහයි, ප්‍රධන් වීර්‍ය්‍ය කෙරේ. උපන් කුසල් දහම් සිටුනා පිණිස නො නස්නා පිණිස බහුල බව පිණිස විපුලබව පිණිස වඩනා පිණිස පිරිපුන් බව පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍ය කෙරෙයි, සිත නහයි, ප්‍රධන් වීර්‍ය්‍ය කෙරේ. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන අභිඥපාරමී සඞ්ඛ්‍යාත රහත් බවට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ සතර සෘද්ධිපාදයන් වඩති. උදායි, මෙ සස්නෙහි මහණ ඡන්දාධිපති සමාධියෙන් හා ප්‍රධානසංස්කාරයන් ගෙන් සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යාධිපතිසමාධියෙන්. . . . . චිත්තාධිපති සමාධියෙන් . . . වීමංසාධිපති සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයන් ගෙන් සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන අභිඥපාරමී සඞ්ඛ්‍යාත රහත් බවට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද, යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ පඤ්චෙන්ද්‍රියයන් වඩති. උදායි, මෙ සස්නෙහි මහණ කෙලෙසුන් සන්හිඳුවනසුලු සම්බෝධියට පමුණුවනසුලු ශ්‍රද්ධෙන්ද්‍රිය වඩයි, . . . වීර්‍ය්‍යෙන්ද්‍රිය වඩයි . . . . ස්මෘතින්ද්‍රිය වඩයි . . . . සමාධීන්ද්‍රිය වඩයි, කෙලෙසුන් සන්හිඳුවනසුලු සම්බෝධියට පමුණුවනසුලු ප්‍රඥෙන්ද්‍රිය වඩයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන අභිඥපාරමී සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ පඤ්චබලයන් වඩති. උදායි, මෙ සස්නෙහි මහණ කෙලෙසුන් සන්හිඳුවනසුලු සම්බොධියට පමුණුවනසුලු ශ්‍රද්ධාබලය වඩයි . . . . වීර්‍ය්‍යබලය වඩයි . . . . ස්මෘතිබලය වඩයි . . . . සමාධිබලය වඩයි, කෙලෙසුන් සන්හිඳුවනසුලු සම්බෝධියට පමුණුවනසුලු ප්‍රඥබලය වඩයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන අභිඥපාරමී සඞ්ඛ්‍යාත අර්හත්ත්වයට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ සප්ත බෝධ්‍යඞ්ගයන් වඩති. උදායි, මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ ක්ලේශපරිත්‍යාග හා නිර්වාණාලම්බන සඞ්ඛ්‍යාත වොස්සග්ගයට පිරිනැමෙනසුලු ස්මෘතිසම්බොධ්‍යඞ්ගය වඩයි. . . . . ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වඩයි . . . වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වඩයි . . . . ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩයි . . . . ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි . . . . සමාධිසම්බොධ්‍යඞ්ගය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ වොස්සග්ගයට පිරිනැමෙනසුලු උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය වඩයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසානය ද අභිඥපාරමී ද වූ අර්හත්ත්වයට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වඩති. උදායි, මෙ සස්නෙහි මහණ සම්‍යග්දෘෂ්ටිය වඩයි, සම්‍යක් සංකල්පය වඩයි, සම්‍යග්වචනය වඩයි, සම්‍යක්කර්මාන්තය වඩයි, සම්‍යගාජීවය වඩයි, සම්‍යග්ව්‍යායාමය වඩයි, සම්‍යක්ස්මෘතිය වඩයි, සම්‍යක්සමාධිය වඩයි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසානය සහ අභිඥපාරමී සඞ්ඛ්‍යාත රහත් බවට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා අට්ඨ විමොක්ඛෙ භාවෙන්ති. රූපී රූපානි පස්සති. අයං පඨමො විමොක්ඛො. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. අයං දුතියො විමොක්ඛො. සුභන්තෙව අධිමුත්තො හොති. අයං තතියො විමොක්ඛො. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[1] නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො විමොක්ඛො. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො. සබ්බසො නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථා පටිපන්නා මෙ සාවකා අට්ඨ අභිභායතනානි භාවෙන්ති. අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. ඉදං පඨමං අභිභායතනං.

අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. එවංසඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. ඉදං චතුත්ථං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි. සෙය්‍යථාපි නාම උමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං[2] නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං[3] එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීල-නිභාසානි. තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං.

1. අත්ථඞ්ගමා - සීමු.
2. උභතොභාගවිමඨ්ඨං - PTS.
3. නීලදස්සනං නීලභාසං - PTS.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ අෂ්ට විමොක්ෂයන් වඩති : රූපධ්‍යාන ඇත්තේ (බාහිර) රූපයන් (ධ්‍යාන ඇසින්) දකී. මේ පළමු වන විමෝක්ෂය වෙයි. අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ (තමාගේ කේශාදියෙහි නො ඉපැදවූ රූපධ්‍යාන ඇත්තේ) බාහිර රූපයන් දකී. මේ දෙවන විමෝක්ෂය වෙයි. (වර්ණ කසිණයෙහි) ශුභ යයි අධිමුක්ත වූයේ වෙයි, මේ තුන් වන විමෝක්ෂය වෙයි. සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් ඉක්ම ප්‍රතිඝසංඥවන් ගේ අස්තඩගම-යෙන් (නැසීමෙන්) නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්ත යැ'යි ආකාසානඤ්චායතනය උපදවා වෙසෙයි. මේ සතර වන විමෝක්ෂය වෙයි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම 'විඥනය අනන්ත යැ'යි විඤ්ඤාණඤ්චා යතනය උපදවා වෙසෙයි. මේ පස් වැනි විමෝක්ෂය වෙයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤණා ඤ්චායතනය ඉක්ම 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වෙසෙයි. මේ ස වැනි විමොක්ෂය වෙයි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නේවසඤ්ඤ නාසඤ්ඤායතනය උපදවා වෙසෙයි. මේ සත් වැනි විමොක්ෂය වෙයි. සර්වප්‍රකාරයෙන් නේවසඤ්ඤනාසඤ්ඤායතනය ඉක්ම සංඥවේදයිතනිරෝධය උපදවා වෙසෙයි. මේ අට වැනි විමෝක්ෂය වේ. එහි ද මාගේ ශ්‍රාවකයෝ අභිඥවසානය හා අභිඥපාරමී සඩඛ්‍යාත රහත් බවට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ අෂ්ට අභිභායතනයන් වඩති : අධ්‍යාත්මයෙහි රූපසංඥ ඇති එකෙක් අල්පමාත්‍ර (නො වැඩූ) වූ සුවර්ණ(පරිශුද්ධ) දුර්වර්ණ (අපරිශුද්ධ) වූ බාහ්‍යරූපයන් දකී. එ රූපයන් මැඩගෙන දනිමි දක්මි යන මෙ බඳු සංඥ ඇති වෙයි. මේ පළමු වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි රූපසංඥ ඇති එකෙක් අප්‍රමාණ (වැඩුණු) වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දක්මි යන මෙ බඳු සංඥ ඇති වෙයි. මේ දෙ වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් අල්පමාත්‍ර වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දක්මි යන මෙ බඳු සංඥ ඇති වෙයි. මේ තුන් වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි අරූප සංඥ ඇති එකෙක් අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දක්මි යන මෙ බඳු සංඥ ඇති වෙයි. මේ සතර වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් නිල් වූ නිල්වන් වූ නීලනිදර්ශන (නො මුසු නිල්වන්) වූ නීලප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. යම්සේ නම් උමා (දියමෙරලිය) කුසුම නිල් වූයේ නිල්වන් වූයේ නීලනිදර්ශන වූයේ නීලප්‍රභා ඇත්තේ ද, තවද යම්සේ හෝ කසීරට උපන් දෙපස මට කළ ඒ වස්ත්‍රය නිල් වූයේ නිල්වන් වූයේ නීලනිදර්ශන වූයේ නීලප්‍රභා ඇත්තේ ද, එසෙයින් මැ අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් නිල් වූ නිල්වන් වූ නීලනිදර්ශන වූ නීලප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දක්මි යන මෙබඳු සංඥ ඇති වෙයි. මේ පස් වැනි අභිභායතන යැ.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. ඉදං ඡට්ඨං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි. සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං. එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි. තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං සත්තමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. සෙය්‍යථාපි නාම ඔසධිතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං. එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. ඉදං අට්ඨමං අභිභායතනං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථා පටිපන්නා මෙ සාවකා දසකසිණායතනානි භාවෙන්ති. පථවිකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. ආපොකසිණමෙකො සඤ්ජානාති-පෙ-තෙජොකසිණමෙකො සඤ්ජානාති-පෙ-වායොකසිණමෙකො සඤ්ජානාති -පෙ- නීලකසිණමෙකො සඤ්ජානාති-පෙ- පීතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ලොහිතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ඔදාතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ආකාසකසිණමෙකො සඤ්ජානාති -පෙ- විඤ්ඤාණකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් කහපැහැති කහවන් වූ නුමුසු කහපැහැති කහකැලුම් ඇති බාහ්‍යරූපයන් දකී. යම්සේ නම් කිණිහිරි කුසුම කසාපෑ ඇත්තේ කසාවන් වූයේ නුමුසු කහපැහැ ඇත්තේ කසාකැලුම් ඇත්තේ ද, තවද යම්සේ හෝ කයිරට නිපන් දෙපස මට කළ ඒ වස්ත්‍රය කසාපෑ ඇත්තේ කසාවන් වූයේ නුමුසු කසාපෑ ඇත්තේ කසාකැලුම් ඇත්තේ වේ ද, එසෙයින් මැ අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් කසාපෑ ඇති කසාවන් වූ නුමුසු කසාපෑ ඇති කසා කැලුම් ඇති බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දකිමි යන සංඥ ඇති වෙයි. මේ ස වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් ලෙහෙපැහැ වූ ලේවන් වූ ලෝහිතනිදර්ශන වූ ලෝහිතප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. යම්සේ නම් බඳුවද කුසුම ලෙහෙපැහැ ඇත්තේ ලේවන් වූයේ ලෝහිතනිදර්ශන වූයේ ලෝහිතප්‍රභා ඇත්තේ ද, තවද යම්සේ හෝ කයිරට නිපන් දෙපස මට කළ ඒ වස්ත්‍රය ලෙහෙපැහැ ඇත්තේ ලේවන් වූයේ ලෝහිතනිදර්ශන වූයේ ලෝහිතප්‍රභා ඇත්තේ වේ ද එසෙයින් මැ අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් ලෙහෙපැහැති ලේවන් වූ ලෝහිතනිදර්ශන වූ ලෝහිතප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දකිමි යන මෙ බඳු සංඥ ඇති වෙයි. මේ සත් වැනි අභිභායතන යැ.

අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් අවදත (සුදු) වූ අවදතවන් වූ අවදතනිදර්ශන වූ අවදතප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. යම්සේ නම් දවහත් තරුව අවදත වූයේ අවදතවන් වූයේ අවදතනිදර්ශන වූයේ අවදතප්‍රභා ඇත්තේ ද, තවද යම්සේ හෝ කයිරට නිපන් දෙපස මට කළ ඒ වස්ත්‍රය අවදත වූයේ අවදතවර්ණ ඇත්තේ අවදතනිදර්ශන වූයේ අවදතප්‍රභා ඇත්තේ ද, එසෙයින් මැ අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති එකෙක් අවදත වූ අවදතවර්ණ ඇති අවදත නිදර්ශන වූ අවදතප්‍රභා ඇති බාහ්‍යරූපයන් දකී. එ රූ මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥ ඇති වෙයි. මේ අට වැනි අභිභායතනය යි. එහිදු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත විඥ්ණවසී බවට පැමිණ වෙසෙත්.

තවද උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද, යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ දස කසිණායතනයන් වඩති. ඇතැමෙක් උඩ යට සරස අද්වය වූ අප්‍රමාණ වූ පෘථිවිකසිණය දනගනී. ඇතැමෙක් ආපොකසිණය දනගනී . . . . ඇතැමෙක් තේජෝ කසිණය දනගනී . . . ඇතැමෙක් වායෝකසිණය දනගනී . . . . ඇතැමෙක් නීලකසිණය දනගනී . . . ඇතමෙක් පීතකසිණය දනගනී . . . ඇතැමෙක් ලෝහිතකසිණය දනගනී . . . ඇතැමෙක් ඔදාතකසිණය දනගනී . . . ඇතැමෙක් ආකාසකසිණය දනගනී . . . ඇතැමෙක් උඩ යට සරස අද්වය වූ අප්‍රමාණ වූ විඥ්ඤාණකසිණය දනගනී. එහිදු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී වූ විඥවශීභාවයට පැමිණ වෙසෙත්.

24—ෆක් 13561 (5/72)

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථාපටිපන්නා මෙ සාවකා චත්තාරි ඣානානි භාවෙන්ති. ඉධුදායි, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති[2] පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. සෙය්‍යථාපි උදායි, දක්ඛො නහාපකො[4] වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[5] සන්නෙය්‍ය.[6] සාස්ස නහානීයපිණ්ඩි[7] සෙනහානුගතා සෙනහපරෙතා[8] සන්තරබාහිරා[9] ඵුටා[10] සෙනහෙන, න ච පග්ඝරණී[11] එවමෙව ඛො උදායි, භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති, පරිසන්දෙති[2] පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

පුන ච පරං උදායි, භික්ඛු විතක්කවිචාරානං වූපසමා-පෙ-දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි උදායි, උදකරහදො[12] උබ්භිදොදකො.[13] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සායමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්සායමුඛං, න උත්තරාය දිසාය උදකස්සායමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්සායමුඛං. දෙවො ච කාලෙන කාලං න සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය. නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො උදායි, භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

පුන ච පරං උදායි, භික්ඛු පීතියා ච විරාගා-පෙ-තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි උදායි, උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනී.[14] තානි යාව චග්ගා යාව ච

---

1. පඨමජ්ඣානං - සීමු, PTS.
2. අභිසන්නෙති, පරිසන්නෙති - ස්‍යා.
3. අප්ඵුතං - සීමු, ස්‍යා, PTS.
4. නහාපකො - මජසං.
5. පරිප්ඵොසකං - ස්‍යා (එකං පදං)
6. අභිසන්නෙය්‍ය - ස්‍යා.
7. සායං, නහානීයපිණ්ඩි - මජසං.
8. සුහානුගතා සුහපරෙතා - සීමු.
9. සමන්තන්තරබාහිරා - සීමු
10. ඵුටා - ස්‍යා
11. { සුහෙන ච පග්ඝරති - සීමු. / —න ච පග්ඝරිනී - PTS. ස්‍යා. / න ච පග්ඝරිණී - මජසං. }
12. ගම්භීරො උදකරහදො - මජසං, ස්‍යා.
13. උබ්භිතොදකො - ස්‍යා.
14. { නිමුග්ගපොසිතානි - සීමු. / නිමුග්ගපොසිතානි - ස්‍යා. }

තවද උදායී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද, ඒ වූ පරිදි පිළිපන් මාගේ ශ්‍රාවකයෝ සතර ධ්‍යානයන් වඩති. උදායී, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසල්දහමින් වෙන් මැ වැ විතර්කසහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථම ධ්‍යානය උපදවා වෙසෙයි, හේ මෙ මැ කරජකය විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරවයි, හාත්පසින් පහසයි. මෙ මහණහුගේ සියලු අවයව ඇති සිරුරෙහි නො පහස්නාලද කිසි තැනෙක් නො වෙයි. යම්සේ උදායී, දක්ෂ වූ නැහැවියෙක් හෝ නැහැවි අතැවැසියෙක් හෝ කස්ලොහොතලියෙකැ නහනුසුනු එව දියෙන් ඉස ඉස තෙමාද, ඒ නහනුපිඩ ස්නෙහය අනුවගියේ ස්නෙහයෙන් මැඩුණේ ඇතුළත පිටත ස්නෙහයෙන් පහසනලද්දේ නො වැගිරෙනසුලු වන්නේ ද, එසෙයින් මැ උදායී, මහණ තෙම මෙ මැ කය විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි හාත්පසින් තෙමයි, පුරවයි, හාත්පසින් පහසයි. එ මහණහුගේ සියලු අවයව ඇති සිරුරෙහි විවෙකජ ප්‍රීතිසුඛයෙන් නො පහස්නාලද කිසි තැනෙක් නො වන්නේ යැ.

තවද උදායී, මහණ තෙම විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මෙ මැ කය සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරවයි, හාත්පසින් පහසයි. එ මහණහුගේ සියලු අවයව ඇති සිරුරෙහි සමාධිජ ප්‍රීතිසුඛයෙන් නො පහළ කිසි තැනෙක් නො වෙයි. යම්සේ උදායී, නැඟි උල්පත් ඇති දියවිලෙක් වේ ද, එ විල්හි පෙරදිග දිය එන මඟෙක් නො මැ වෙයි. පැළ දිග දිය එන මඟෙක් නො වෙයි, උතුරුදිග දිය එන මඟෙක් නො වෙයි, දකුණු දිග දිය එන මඟෙක් නො වෙයි, මේඝය ද කලින් කල මැනැවින් වැසිදහර නො වස්නේ යැ. එතෙකුදු වත් එ මැ දියවිලින් සිහිල් දියදහර නැඟී එ මැ දියවිල සිහිල්දියෙන් තෙමා ද හාත්පසින් තෙමා ද පුරවා ද හාත්පසින් පහසා ද එ හැම කොටසින් යුතු දියවිල්හි සිහිල්දියෙන් නො පහළ කිසි තැනෙක් නො වන්නේ ද, එසෙයින් මැ උදායී, මහණ තෙම මෙ මැ කය සමාධිජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරයි, හාත්පසින් පහසයි. එ මහණහුගේ හැම අවයව ඇති සිරුරෙහි සමාධිජ ප්‍රීතිසුඛයෙන් නො පහළ තැනෙක් නො වන්නේ යැ.

තවද උදායී, මහණ තෙම ප්‍රීතියගේ ද විරාගයෙන් . . . . තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මෙ මැ කය නිෂ්ප්‍රීතිකසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරාලයි, හාත්පසින් පහසයි, එ මහණහුගේ හැම අවයව ඇති සිරුරෙහි නිෂ්ප්‍රීතික සුඛයෙන් නො පහළ කිසි තැනෙක් නො වෙයි. යම්සේ උදායී, උපුල්විලෙකැ වේවයි පියුම් විලෙකැ වේවයි පඬෙරවිලෙකැ වේවයි ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැඟුණාහු ඇතුළත ගැලී වැඩුණාහු ද, ඔහු අග සිට මුල තෙක්

මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි[1] පරිපූරානි පරිප්ඵුටානි.[2] න තෙසං[3] කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො උදායි, භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

පුන ච පරං උදායි, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[4] අදුක්ඛං අසුඛං උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි උදායි, පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස. එවමෙව ඛො උදායි, භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා එවං පජානන්ති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො[5] මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො, ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධං[6] සෙය්‍යථාපි උදායි මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො, තදිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වාති. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථා පටිපන්නා මෙ සාවකා එවං ජානන්ති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො. ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

---

1. අභිසන්දෙති - පරිසන්දෙති - සීමු, මජසං.
2. පරිප්ඵුතානි - සීමු.
3. නාස්ස - මජසං, ස්‍යා, PTS.
4. අත්ථගමා - සීමු.
5. චාතුමහාභූතිකො - මජසං, ස්‍යා.
6. පටිබන්ධං - ස්‍යා.

සිහිල් දියෙන් තෙමුණාහු හාත්පසින් තෙමුණාහු පිරුණාහු හාත්පසින් පැහැසුණාහු වෙත් ද, ඒ සියලු අවයව ඇති උත්පලයන්ගේ හෝ පද්මයන්ගේ හෝ පුණ්ඩරීකයන්ගේ හෝ සිහිල් දියෙන් නො පහළ කිසි තැනෙක් නො වන්නේ යැ. එ සෙයින් මැ උදයී, මහණ තෙම මෙ මැ කය නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරවයි, හාත්පසින් පහසයි. එ මහණහුගේ සියලු අවයව ඇති සිරුරෙහි නිෂ්ප්‍රීතික සුඛයෙන් නො පහළ කිසි තැනෙක් නො වන්නේ යැ.

තවද උදයී, මහණ තෙම සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැලැ මැ සොම්නස් දොම්නසුන්ගේ නැසීමෙන් උපේක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මෙ මැ කය පරිශුද්ධ වූ පර්‍ය්‍යවදාත වූ සිතින් ස්පර්‍ශ කොට හුන්නේ වෙයි. එ මහණහුගේ සකල ශරීරයෙහි පරිශුද්ධ වූ පර්‍ය්‍යවදාත වූ සිතින් නො පහළ කිසි තැනෙක් නො වන්නේ යැ. යම්සේ උදයී, පුරුෂයෙක් හෙළපිළියෙන් හිස සහිත වැ පෙරෙවැ හුන්නේ වේ ද ඔහුගේ සකල ශරීරයෙහි හෙළපිළියෙන් නො පහළ කිසි තැනෙක් නො වන්නේ ද එ සෙයින් මැ උදයී මහණ තෙම මෙ මැ කය පරිශුද්ධ වූ පර්‍ය්‍යවදාත වූ සිතින් ස්පර්‍ශ කොට හුන්නේ වෙයි. එ මහණහුගේ සියලු අවයව ඇති සිරුරෙහි පරිශුද්ධ වූ පර්‍ය්‍යවදාත වූ සිතින් නො පහළ කිසි තැනෙක් නො වේ. එහිදු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥාවසාන හා අභිඥාපාරමී සඞ්ඛ්‍යාත වශීවශීභාවයට පැමිණ වෙසෙත්.

තවද උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ මෙසේ දනගනිති : මාගේ මෙ කය වූකලි රූපවත් වූයේ සතර මහා භූතයෙන් නිපන්නේ මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් හටගත්තේ බතින් කොමුයෙන් වැඩුණේ අනිත්‍යස්වභාව ඇත්තේ ඉලීම් පිරිමැදීම් බිඳීම් විසිරීම් පියවි කොට ඇත්තේ යැ. මා ගේ මේ විඥානය වැළිත් මේ චාතුර්මහාභූතික කයෙහි නිශ්‍රිත වූයේ යැ මෙහි ප්‍රතිබද්ධ වූයේ යැ. යම්සේ උදයී වෛරොඩි මිණ සුන්දර වූයේ ජාතිමත් වූයේ අෂ්ටාස්‍ර වූයේ මැනැවින් පිරියම් කෙළේ පැහැපත් වූයේ ප්‍රසන්න වූයේ සර්වාකාරසම්පන්න වූයේ වේ ද එහි නිල් වේවයි රත්වන් වේවයි ලෙහෙවන් වේවයි සුදු වේවයි පඬුපැහැ වේවයි හුයක් අවුණන ලද වන්නේ යැ. එය ඇස් ඇති පුරුෂයෙක් අත්හි ලා විමසන්නේ යැ : ''මෙ වෛරොඩි මිණ වූකලි සුන්දර යැ ජාතිමත් යැ අටැස් ඇත්තේ යැ මොනොවට පිරියම් කෙළේ යැ පැහැපත ප්‍රසන්න යැ සර්වාකාර සම්පන්න යි. නිල්වන් වේවයි රත්වන් වේවයි ලේවන් වේවයි සුදුපැහැ වේවයි පඬුපැහැ වේවයි මෙ හුය අවුණන ලදැ''යි. එ සෙයින් මැ උදයී මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ මෙසේ දනිති : ''මා ගේ මෙ කය වූකලි රූපවත් වූයේ සතර මහාභූතයෙන් නිපන, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් හටගත්තේ යැ බත් කොමුයෙන් වැඩුණේ යැ අනිත්‍යස්වභාව ඇත්තේ ඉලීම් පිරිමැදීම් බිඳීම් විසිරීම් සැහැවි ඇත්තේ යැ. යළි මාගේ මේ විඥානය මෙ සිරුරෙහි නිශ්‍රිත යැ. මෙහි බැඳුණේ යැ'යි. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥාවසාන හා අභිඥාපාරමී සඞ්ඛ්‍යාත රහත් බවට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනන්ති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං[1] සෙය්‍යථාපි උදායි, පුරිසො මුඤ්ජම්හා ඊසිකං[2] පබ්බාහෙය්‍ය. තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[3], අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[3] මුඤ්ජම්හා ත්වෙව ඊසිකා පබ්බාළ්හාති. සෙය්‍යථාපි වා පනුදායි පුරිසො අසිං කොසියා පබ්බාහෙය්‍ය[4]. තස්ස එවමස්ස: අයං අසි, අයං කොසි, අඤ්ඤො අසි, අඤ්ඤා කොසි, කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති. සෙය්‍යථාපි වා පනුදායි, පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤො අහි, අඤ්ඤො කරණ්ඩො, කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථා පටිපන්නා මෙ සාවකා ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනන්ති. රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්ති: එකොපි හුත්වා බහුධා හොන්ති, බහුධාපි හුත්වා එකො හොන්ති[5]. ආවීභාවං[6] තිරොභාවං තිරොකුඩ්ඩං[7] තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා ගච්ඡන්ති සෙය්‍යථාපි ආකාසෙ, පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොන්ති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡන්ති සෙය්‍යථාපි පථවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමන්ති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසුරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසන්ති පරිමජ්ජන්ති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්ති. සෙය්‍යථාපි උදායි දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යඤ්ඤදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, සෙය්‍යථාපි වා පනුදායි දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යඤ්ඤදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, සෙය්‍යථාපි වා පනුදායි දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යඤ්ඤදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්ති: එකොපි හුත්වා බහුධා හොන්ති, බහුධාපි හුත්වා එකො හොන්ති[5] ආවීභාවං[6] තිරොභාවං තිරොකුඩ්ඩං[7] තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානා ගච්ඡන්ති සෙය්‍යථාපි ආකාසෙ, පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොන්ති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡන්ති සෙය්‍යථාපි පථවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමන්ති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසුරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසන්ති පරිමජ්ජන්ති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්ති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

---

1. අහීනනින්ද්‍රියං – PTS.
2. ඉසිකං – සීමු. PTS.
3. ඉසිකා – සීමු. PTS.
4. උබ්බාහෙය්‍ය – ස්‍යා.
5. හොති – මජසං.
6. ආවිභාවං – සීමු, මජසං, ස්‍යා, PTS
7 තිරොකුට්ටං – මජසං.

Free Distribution www.aathaapi.org

තවද උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ මෙ කයින් රූපවත් වූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති නො හුන් ඉඳුරන් ඇති අන් කයක් මවති. යම්සේ උදයී, පුරුෂයෙක් මුදුතණයෙන් ඊසිකාවක් බැහැර කරන්නේ ද ඔහට මෙ සිත් වෙයි : ''මෙ මුදුතණ යැ මෝ ඊසිකා යැ මුදුතණය අනෙකක ඊසිකාව අනෙකක මුදුතණයෙන් මැ ඊසිකාව බැහැර කරන ලද''යි. තවද යම්සේ හෝ උදයී, පුරුෂයෙක් කොපුයෙන් කඩුවක් බැහැර කරන්නේ ද ඔහට මෙ සිත් වෙයි : ''මෙ කඩුව යැ මෙ කොපුව යැ කඩුව අනෙකෙක කොපුව අනෙකෙක කොපුයෙන් මැ කඩුව බැහැර කරන ලද''යි. තවද යම්සේ හෝ උදයී, පුරුෂයෙක් කරඬුයෙකින් සර්පයකු නඟන්නේ ද ඔහට මෙ සිත් වන්නේ යැ : ''මෙ සර්ප යැ මෙ කරඬුව යැ, සර්පයා අනෙකෙක කරඬුව අනෙකෙක කරඬුයෙන් මැ සර්පයා නඟනලද''යි. එසෙයින් මැ උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ මෙ කයින් රූපවත් වූ මනෝමය වූ හැම අඟපසඟ ඇති නො හුන් ඉඳුරන් ඇති අන් කයක් මවති. එහිදු මා ගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසානය හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත වීර්‍ය වශීභාවයට පැමිණ වෙසෙත්.

තවද උදයි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ නන් වැදෑරුම් වූ ඍද්ධිවිධ අනුභව කරති : තෙමේ එකෙක් වැ ද බහුප්‍රකාරයෙන් වෙති. බහුප්‍රකාර වැ ද එකෙක් වෙති, ආවිර්භාවයට තිරොභාවයට යෙති, බිතු සරස පවුරු සරස ගල් සරස අහස්හි සෙයින් නො ගැටෙමින් යෙති. පොළොව්හි දු දියෙහි සෙයින් ගැලීම් නැඟීම් කෙරෙති, අභිද්‍යමාන උදකයෙහි දු පොළොව්හි සෙයින් යෙති අහස්හි දු ලිහිණියන් සෙයින් පලඟින් යෙති මෙවන් මහ ඉදුහ ඇති මෙවන් මහත් අනුහාව ඇති මෙ සඳහිර දෙදෙන ද අත්ලෙන් පිරිමසති පිරිමදිති, බඹලොව පවා කයින් වශයට වැටෙති. යම්සේ උදයී සමත් කුඹල්කරුවෙක් වේවයි කුඹල්කරුඅතැවැසියෙක් වේවයි මොනොවට පිරියම් කළ මැටියෙන් යම් මැ බඳුන් වෙසෙසක් කැමැති වන්නේ නම් ඒ ඒ බඳුන් මැ කරන්නේ ද නිපයන්නේ ද, තවද යම්සේ උදයී, සමත් දළකඩකරුවෙක් වේවයි දළකඩකරු අතැවැසියෙක් වේවයි මොනොවට පිරියම් කළ දළකඩෙහි යම් යම් මැ දළකඩකම් වෙසෙසක් රුස්නේ නම් ඒ ඒ දය මැ කරන්නේ ද නිපයන්නේ ද, තවද යම්සේ හෝ උදයී, සමත් රන්කරුවෙක් වේවයි රන්කරුඅතැවැසියෙක් වේවයි මොනොවට පිරියම් කළ රන්හි යම් යම් මැ ස්වර්ණ විකෘතියක් රුස්නේ නම් ඒ ඒ දය මැ කරන්නේ ද නිපයන්නේ ද, එසෙයින් මැ උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ නන් වැදෑරුම් වූ ඍද්ධිවිධ අනුභව කරති : තෙමේ එකෙක් වැ ද බහුප්‍රකාරයෙන් වෙති බහුප්‍රකාර වැ ද එකෙක් වෙති. ආවිර්භාවයට තිරොභාවයට යෙති බිතු සරස පවුරු සරස පවු සරස අහස්හි සෙයින් නො ගැටෙමින් යෙති. පොළොව්හි දු දියෙහි මෙන් ගැලීම් නැගීම් කෙරෙති අභිද්‍යමාන උදකයෙහි දු පොළොව්හි සෙයින් යෙති අහස්හි දු පක්ෂීන් සෙයින් පලඟින් යෙති මෙවන් මහඉදුහ ඇති මෙවන් මහත් අනුහාව ඇති මෙ සඳහිර දෙදෙන ද අත්ලෙන් පිරිමසති පිරිමදිති බඹලොව පවා කයින් වශයට පමුණුවත්. එහිදු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත වීර්‍යවශීභාවයට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[1] උභො සද්දෙ සුණන්ති දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ ච. සෙය්‍යථාපි උදායි, බලවා සඞ්ඛධමකො[2]. අප්පකසිරෙනෙව චාතුද්දිසා විඤ්ඤාපෙය්‍ය. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණන්ති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානන්ති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානන්ති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානන්ති, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානන්ති, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානන්ති, සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානන්ති, වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානන්ති, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානන්ති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානන්ති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානන්ති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානන්ති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානන්ති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානන්ති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානන්ති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානන්ති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානන්ති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානන්ති. සෙය්‍යථාපි උදායි, ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො[3] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ[4] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං වා සකණිකන්ති[5] ජානෙය්‍ය. අකණිකං වා අකණිකන්ති[6] ජානෙය්‍ය එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථා පටිපන්නා මෙ සාවකා පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානන්ති, සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානන්ති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානන්ති, සදොසං වා චිත්තං-පෙ-වීතදොසං වා චිත්තං-පෙ-සමොහං වා චිත්තං-පෙ-වීතමොහං වා චිත්තං-පෙ-සඞ්ඛිත්තං වා චිත්තං-පෙ-වික්ඛිත්තං වා චිත්තං-පෙ-මහග්ගතං වා චිත්තං-පෙ-අමහග්ගතං වා චිත්තං-පෙ-සඋත්තරං වා චිත්තං-පෙ-අනුත්තරං වා චිත්තං-පෙ-සමාහිතං වා චිත්තං-පෙ-අසමාහිතං වා චිත්තං-පෙ-විමුත්තං වා චිත්තං-පෙ-අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානන්ති තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

---

1. අතික්කන්තමානුසකාය - ස්‍යා.
2. සඞ්ඛධමො - PTS.
3. මණ්ඩනජාතිකො - PTS.
4. උදකපත්තෙ - සීමු, මජසං, ස්‍යා, PTS.
5. සකණිකඞ්ගං - සීමු.
6. අකණිකඞ්ගං - සීමු

තවද උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ මිනිස් කන ඉක්ම සිටි විශුද්ධ වූ දිව්‍යශ්‍රෝත්‍රධාතුයෙන් දුරු වූ ද ළඟ වූ ද දිව්‍ය හා මානුෂ හා දෙවැදෑරුම් ශබ්දයන් අසති. යම්සේ උදයී බලඇති සක්පිඹින්නෙක් නිදුකින් මැ සතර දිග හඟවන්නේ ද එසෙයින් මැ උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ මිනිස් කන ඉක්ම සිටි විශුද්ධ වූ දිව්‍යශ්‍රෝත්‍ර ධාතුයෙන් දුරු වූ ද ළඟ වූ ද දෙවියන් පිළිබඳ වූ ත් මිනිසුන් පිළිබඳ වූ ත් දෙ හඬ අසත්. එහි දු මා ගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත විශිෂ්ටභාවයට පැමිණ වෙසෙත්.

තවද උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ පරසත්ත්වයන් ගේ පරපුද්ගලයන් ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දනිති : සරාග සිත ද 'සරාග සිතැ'යි දැනගනිති, වීතරාග සිත ද 'වීතරාග සිතැ'යි දැනගනිති, සදෙස සිත ද 'සදෙස සිතැ'යි දැනගනිති, වීතදෙස සිත ද 'වීතදෙස සිතැ'යි දැනගනිති, සමොහ සිත ද 'සමොහ සිතැ'යි දැනගනිති, වීතමෝහ සිත ද 'වීතමෝහ සිතැ'යි දැනගනිති, සංක්ෂිප්ත සිත ද 'සංක්ෂිප්ත සිතැ'යි දැනගනිති, වික්ෂිප්ත සිත ද 'වික්ෂිප්ත සිතැ'යි දැනගනිති, මහද්ගත සිත ද 'මහද්ගත සිතැ'යි දැනගනිති, මහද්ගත නො වූ සිත ද 'මහද්ගත නො වූ සිතැ'යි දැනගනිති, සඋත්තර සිත ද 'සඋත්තර සිතැ'යි දැනගනිති, අනුත්තර සිත ද 'අනුත්තර සිතැයි දැනගනිති, සමාහිත සිත ද 'සමාහිත සිතැ'යි දැනගනිති, සමාහිත නො වූ සිත ද 'සමාහිත නො වූ සිතැ'යි දැනගනිති, විමුක්ත සිත ද 'විමුක්ත සිතැ'යි දැනගනිති, විමුක්ත නො වූ සිත ද 'විමුක්ත නො වූ සිතැ'යි දැනගනිති. යම්සේ උදයී, තරුණ වූ යොවුන් වූ මණ්ඩනශීල වූ ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි නො කිලිටි වූ පැහැපත් වූ කැටපතෙකැ හෝ පහන් දියබඳුනෙකැ හෝ තමා ගේ මුඛනිමිති පිරික්සනුයේ කැලැල් සහිත මුඛාවයව ද 'කැලැල් සහිත මුඛාවයවැ'යි දැනගන්නේ ද, කැලැල් රහිත මුඛාවයව ද කැලැල් රහිත මුඛාවයවැ'යි දැනගන්නේ ද, එසේ මැ උදයී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ පරසත්ත්වයන් ගේ පරපුද්ගලයන් ගේ සිත තමන් ගේ සිතින් පිරිසිඳ දනිති : සරාග සිත ද 'සරාග සිතැ'යි දැනගනිති, වීතරාග සිත ද 'වීතරාග සිතැ'යි දැනගනිති, සදෙස සිත ද . . . . වීතදෙස සිත ද . . . . සමොහ සිත ද . . . . වීත මොහ සිත ද . . . සංක්ෂිප්ත සිත ද . . . වික්ෂිප්ත සිත ද . . . . මහද්ගත සිත ද . . . . අමහද්ගත සිත ද . . . සඋත්තර සිත ද . . . . අනුත්තර සිත ද . . . සමාහිත සිත ද . . . . අසමාහිත සිත ද . . . . විමුක්ත සිත ද . . . . අවිමුක්ත සිත ද 'අවිමුක්ත සිතැ'යි දැනගනිති. එහි දු මා ගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත විශිෂ්ට-භාවයට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටිපන්නා මෙ සාවකා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරන්ති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරන්ති. සෙය්‍යථාපි උදායි, පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය. තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගඤ්ඡිං[1] තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං. එවං අභාසිං. එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගඤ්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගතොති. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා යථාපටිපන්නා මෙ සාවකා අනෙකවිහිතං පුබ්බෙ නිවාසං අනුස්සරන්ති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං. ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරන්ති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථාපටින්නා මෙ සාවකා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සන්ති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානන්ති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචී-පෙ-මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී-පෙ-මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සන්ති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානන්ති. සෙය්‍යථාපස්සුදායි[2] ද්වෙ අගාරා සද්වාරා. තත්ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං[3] පවිසන්තෙපි නික්ඛමන්තෙපි අනුසඤ්චරන්තෙපි[4] අනුවිචරන්තෙපි. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථාපටිපන්නා මෙ සාවකා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සන්ති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානන්ති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති.

---

1. අගච්ඡිං - මජසං, ස්‍යා. 2. සෙය්‍යථාපි උදායි - මජසං.
3. මනුස්සෙ ගෙහෙ ස්‍යා, PTS.
4. අනුචඞ්කමන්තෙපි - මජසං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ අනේකවිධ වූ පූර්වේනිවාස සිහි කෙරෙති, හෙ මෙසේ යැ : ''එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසක් ද ජාති සතලිසක් ද ජාති පනසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද නොයෙක් සංවර්ත කල්පයතුදු නොයෙක් විවර්තකල්පයතුදු නොයෙක් සංවර්තවිවර්ත කල්පයතුදු අසෝ තැන්හි මෙබඳු නම් මෙබඳු ගොත් මෙබඳු පැහැසටහන් මෙබඳු ආහාර ඇති වීමි. මෙබඳු සුවදුක් විඳුනාසුලු වීමි, මෙබඳු ආයුපර්‍ය්‍යන්ත ඇති වීමි. ඒ මම එයින් ච්‍යුත වැ අසෝ තැන උපන්මි. එහිදු මෙබඳු නම් මෙබඳු ගොත් මෙබඳු පැහැසටහන් මෙබඳු ආහාර ඇති වීමි. මෙබඳු සුවදුක් විඳුනාසුලු වීමි. මෙබඳු ආයුපර්‍ය්‍යන්ත ඇති වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මි''යි. මෙසෙයින් ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ වූ පූර්වේනිවාස සිහි කෙරෙති. යම්සේ උදායි, පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුදු අන් ගමකට යන්නේ ද, හේ ඒ ගමින් සිය ගමට මැ පෙරළා එන්නේ ද, ඔහට මෙ සිත් වන්නේ යැ : මම් වූකලි සියගමින් අසුවල් ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි. මෙසේ කීයෙමි. මෙසේ නිහඬ වීමි, ඒ ගමිනුදු අසුවල් ගමට ගියෙමි. එහි දු මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කීයෙමි, මෙසේ නිහඬ වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට මැ පෙරළා ආයෙමි''යි. එසෙයින් මැ උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියන ලද. යථාප්‍රතිපන්න වූ මාගේ ශ්‍රාවකයෝ අනේකවිධ වූ පූර්වේනිවාස සිහි කෙරෙති, හෙ මෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු . . . . මෙසෙයින් ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනේකවිධ වූ පූර්වේනිවාස සිහි කෙරෙති. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත වීර්‍ය්‍යවර්‍ගිභාවයට පැමිණ වෙසෙත්.

තවද උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ මනා පැහැසටහන් ඇති නො මනා පැහැසටහන් ඇති සුන්‍දර ගති ඇති නපුරු ගති ඇති සත්ත්වයන් දකිති. කර්‍මානුරූප වැ යන සත්ත්වයන් දනගනිති : ''මේ භවත් සත්ත්වයෝ ඒකාන්තයෙන් කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ වාක් . . . . මනොදුශ්චරිතයෙන් සමන්වාගතයහ. ආර්‍ය්‍යයනට උපවාද කරනුවහ, මිථ්‍යාදෘෂ්ටි ඇතියහ. මිථ්‍යාදෘෂ්ටි කර්‍මසමාදන ඇතියහ. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට පැමිණියහ. තවද මේ භවත් සත්ත්වයෝ හෝ කායසුචරිතයෙන් සමන්වාගතයහ, වාක් . . . . මනොසුචරිතයෙන් සමන්වාගතයහ, ආර්‍ය්‍යයනට උපවාද නො කරනුවහ, සම්‍යක්දෘෂ්ටි ඇතියහ, සම්‍යග්දෘෂ්ටිකර්‍මසමාදන ඇතියහ, ඔහු කාබුන් මරණින් මතු සුන්‍දර ගති ඇති සවර්‍ගලෝකයට පැමිණියහ''යි. මෙසෙයින් මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ මනා වර්‍ණ ඇති නො මනා වර්‍ණ ඇති සුන්‍දර ගති ඇති නපුරු ගති ඇති සත්ත්වයන් දකිති. යථාකර්‍මොපග සත්ත්වයන් දනගනිති. යම්සේ උදායි, දොර සහිත ගෘහ දෙකක් ඇද්ද එහි ඇස් ඇති පුරුෂයෙක් මධ්‍යයෙහි සිටියේ ගෙට පිවිසෙන්නා වූ ද ගෙන් නික්මෙන්නා වූ ද හැසිරෙන්නා වූ ද ඇවිදිනා වූ ද මිනිසුන් දක්නේ ද, එසෙයින් මැ උදායි, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්‍ණ දුවර්‍ණ සුගත දුර්‍ගත සත්ත්වයන් දකිති. යථාකර්‍මොපග සත්ත්වයන් දනගනිති. එහි දු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඥවසාන හා අභිඥපාරමී සඞ්ඛ්‍යාත වීර්‍ය්‍යවර්‍ගී බවට පැමිණ වෙසෙත්.

පුන ච පරං උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා, යථා පටිපන්නා මෙ සාවකා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. සෙය්‍යථාපි උදායි, පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකාපි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපීති. එවමෙව ඛො උදායි, අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථා පටිපන්නා මෙ සාවකා ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසානපාරමිප්පත්තා විහරන්ති. අයං ඛො උදායි, පඤ්චමො ධම්මො යෙන මමං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති. සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්ති.

ඉමෙ ඛො උදායි, පඤ්ච ධම්මා යෙහි මමං[1] සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති. සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරන්තීති.

ඉදමවොච භගවා. අත්තමනො සකුලුදායි පරිබ්බාජකො භගවතො භාසිතං අභිනන්දීති.

මහාසකුලුදායි සුත්තං සත්තමං.

---

1. මම - ස්‍යා, PTS

තවද උදායී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් මෙ අත්බැව්හි මැ තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වෙසෙත්. යම්සේ උදායී, ගල්මුදුනෙකැ පහන් වූ වෙසෙසින් පහන් වූ නො කැළඹුණු දියවිලෙක් ඇද්ද, එහි ඇස් ඇති පුරුෂයෙක් ඉවුරෙහි සිටියේ සරනා වූ ද සිටුනා වූ ද සිප්පිබෙල්ලන් ද සක්බෙල්ලන් ද කැටකැබිලිති ද මත්ස්‍යසමූහයා ද දක්නේ යැ. ඔහට මෙ සිත් වන්නේ යැ : ''මෙ දියවිල වූකලි ප්‍රසන්න යැ, ඉතා ප්‍රසන්න යැ, නො කැළැඹුණේ යැ, එහි මේ සිප්පි බෙල්ලෝ ද සක් බෙල්ලෝ ද කැට කැබිලිති ද මත්ස්‍ය සමූහයා ද සරනාහු ද සිටුනාහු ද වෙත්''යයි. එසෙයින් මැ උදායී, මා විසින් ශ්‍රාවකයනට පිළිවෙත් කියනලද. යථාප්‍රතිපන්න වූ මා ගේ ශ්‍රාවකයෝ ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් මෙ අත්බැව්හි මැ තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වෙසෙත්. එහි දූ මාගේ බොහෝ ශ්‍රාවකයෝ අර්හත්ඵල සඞ්ඛ්‍යාත අභිඥාවසානයට හා අභිඥාපාරමියට පැමිණ වාසය කෙරෙත්. උදායී, යම් කරුණෙකින් ශ්‍රාවකයෝ මට සත්කාර ගරුකාර මානන පූජා කෙරෙද්ද, සත්කාර ගරුකාර කොට නිසා වෙසෙද්ද, මේ වූකලි ඒ පස් වැනි දහම වේ.

උදායි, යම් හෙයෙකින් මට ශ්‍රාවකයෝ සත්කාර ගරුකාර මානන පූජා කෙරෙත් ද, සත්කාර ගරුකාර කොට නිසා වෙසෙත් ද මොහු වූ කලි එ පඤ්චධර්මයෝ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුසිත් ඇති සකුලුදායී පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතයට තුටු වූයේ යි.

සත් වැනි මහා සකුලුදායි සූත්‍ර යි.

---

2. 3. 8

සමණමණ්ඩිකා සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන උග්ගාහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං සත්තමත්තෙහි[1] පරිබ්බාජකසතෙහි.

අථ ඛො පඤ්චකඞ්ගො ථපති සාවත්ථියා නික්ඛමි දිවා දිවස්ස භගවන්තං දස්සනාය. අථ ඛො පඤ්චකඞ්ගස්ස ථපතිස්ස එතදහොසි: අකාලො ඛො තාව භගවන්තං දස්සනාය, පටිසල්ලීනො භගවා, මනොභාවනීයානම්පි භික්ඛූනං අසමයො දස්සනාය, පටිසල්ලීනා මනොභාවනීයා[2] භික්ඛූ, යන්නූනාහං යෙන සමයප්පවාදකො තින්දුකා-චීරො[3] එකසාලකො මල්ලිකාය ආරාමො යෙන උග්ගාහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො පඤ්චකඞ්ගො ථපති යෙන සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය ආරාමො යෙන උග්ගාහමානො පරිබ්බාජකො සමණ-මණ්ඩිකාපුත්තො තෙනුපසඞ්කමි.

තෙන ඛො පන සමයෙන උග්ගාහමානො පරිබ්බාජකො සමණ-මණ්ඩිකාපුත්තො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා.

අද්දසා ඛො උග්ගාහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො පඤ්චකඞ්ගං ථපතිං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි: "අප්පසද්දා භොන්තො හොන්තු, මා භොන්තො සද්දමකත්ථ. අයං සමණස්ස ගොතමස්ස සාවකො ආගච්ඡති පඤ්චකඞ්ගො ථපති. යාවතා ඛො පන සමණස්ස ගොතමස්ස සාවකා ගිහී ඔදාතවසනා සාවත්ථියං පටිවසන්ති, අයං තෙසං අඤ්ඤතරො පඤ්චකඞ්ගො ථපති. අප්පසද්දා ඛො පන තෙ ආයස්මන්තො අප්පසද්දවිනීතා අප්පසද්දස්ස වණ්ණවාදිනො, අප්පෙව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යා"ති. අථ ඛො තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

---

1. නිමත්තෙහි - PTS. පඤ්චමත්තෙහි - සය්‍යා, මජසං.
2. {. . . භාවනිය්‍යා - සීමු. / . . . භාවනියා - මජසං, PTS.
3. තින්දුකාචීරං - සීමු.

Free Distribution www.aathaapi.org

2. 3. 8
සමණමණ්ඩිකා සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාස කරන සේක. එසමයෙහි සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන නම් පරිව්‍රාජක (විවිධ දෘෂ්ටිවාදීන් එක් වැ සමය පවසන හෙයින්) සමයප්පවාදක නම් වූ (තිඹිරිරුකින් පිරිකෙව් කරනලද බැවින්) තින්දුකාචීර නම් වූ ඒකසාලක නම් මල්ලිකා දේවියගේ ආරාමයෙහි පරිව්‍රාජකයන් සත්සියක් පමණ වූ මහත් පිරිවැජි පිරිස් හා සමග වෙසෙයි.

එකල්හි පඤ්චකඞ්ග නම් වඩුදෙටු භාග්‍යවතුන් වහන්සේ දක්නට දෙවෙන්දවහල්හි සැවැත්නුවරින් නික්මුණ. ඉක්බිති පඤ්චකඞ්ග වඩුදෙටු හට මෙ සිත් විය : ''තව බුදුන් දක්නට තො කලි, බුදුහු විවික්තයහ. මනවඩනා භික්ෂූන් ද දක්නට තො කලි, මනවඩනා භික්ෂූහු විවික්තයහ. මම සමයප්පවාදක වූ තින්දුකාචීර නම් වූ ඒකසාලක නම් මල්ලිකා දේවිය ගේ ආරාමයෙහි සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක වෙත එළැඹෙන්නෙම් නම් මැනැවැ''යි. ඉක්බිති පඤ්චකඞ්ග වඩුදෙටු සමයප්පවාදක වූ තින්දුකාචීර නම් වූ ඒකසාලක නම් මල්ලිකාදේවිය ගේ ආරාමයෙහි සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක වෙත එළැඹියේ යැ.

එසමයෙහි සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක උද්ගතනාද ඇති උස්හඬින් මහහඬින් නන්වැදැරුම් තිරිසන්කථා කියන මහත් වූ පිරිවැජි පිරිස් හා සමග හුන්නේ වෙයි. කවර තිරිසන් කථා ද යත් : රජුන් පිළිබඳ කථා යැ සොරුන් පිළිබඳ කථා යැ මහඇමැතියන් පිළිබඳ කථා යැ සේනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාර පිළිබඳ කථා යැ පාන පිළිබඳ කථා යැ වස්ත්‍ර පිළිබඳ කථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධ කථා යැ ඥාතිකථා යැ යානකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ ශූරකථා යැ වීථි පිළිබඳ කථා යැ කුම්භස්ථානකථා යැ පූර්වප්‍රේතකථා යැ සෙසු නන්වැදැරුම් කථා යැ ලෝකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ භවාභවය මෙසේ යැ යන කථා යැ'යි හෝ යි.

සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක පඤ්චකඞ්ග වඩුදෙටු දුරින් මැ එන්නා දුටුයේ යැ. දැක සියපිරිස් සන්හුන් කරවී : ''භවත්හු නිහඬ වෙත්වා, භවත්නි තෙපි නහමක් හඬ නඟවූ. මේ ශ්‍රමණගෞතමයන් ගේ ශ්‍රාවක පඤ්චකඞ්ගස්ථපති එයි. යම් පමණ ශ්‍රමණගෞතමයන් ගේ ශ්‍රාවක වූ ෙහළපිළී හඳනා ගැහැවියෝ සැවැත්නුවර වෙසෙත් ද මේ පඤ්චකඞ්ගස්ථපති ඔවුනතුරෙහි එක්තරයෙක. තවද ඒ ආයුෂ්මත්හු නිහඬයහ, නිහඬ වූ බුදුරදුන් විසින් විනීතයහ, නිහඬ බැව්හි ගුණකියනුවහ. නිහඬ පිරිස් දැන එළැඹියයුතු කොට සිතා නම් ඉතා මැනැවැ''යි. එකල්හි ඒ පරිව්‍රාජකයෝ නිහඬ වූහ.

Free Distribution www.aathaapi.org

අථ ඛො පඤ්චකඞ්ගො ථපති යෙන උග්ගාහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උග්ගාහමානෙන පරිබ්බාජකෙන සමණමණ්ඩිකාපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පඤ්චකඞ්ගං ථපතිං උග්ගාහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො එතදවොච :

"චතූහි ඛො අහං ථපති, ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. කතමෙහි චතූහි: ඉධ ථපති න කායෙන පාපකං කම්මං කරොති, න පාපිකං වාචං භාසති, න පාපකං සඞ්කප්පං සඞ්කප්පෙති, න පාපකං ආජීවං ආජීවති. ඉමෙහි ඛො අහං ථපති, චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣ"න්ති.

අථ ඛො පඤ්චකඞ්ගො ථපති උග්ගාහමානස්ස පරිබ්බාජකස්ස සමණමණ්ඩිකාපුත්තස්ස භාසිතං නෙව අභිනන්දි, නප්පටික්කොසි. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමි. භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමීති. අථ ඛො පඤ්චකඞ්ගො ථපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පඤ්චකඞ්ගො ථපති යාවතකො අහොසි උග්ගාහමානෙන පරිබ්බාජකෙන සමණමණ්ඩිකාපුත්තෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි. එවං වුත්තෙ භගවා පඤ්චකඞ්ගං ථපතිං එතදවොච: එවං සන්තෙ ඛො ථපති, දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො සම්පන්නකුසලො භවිස්සති පරමකුසලො උත්තමපත්තිපත්තො සමණො අයොජ්ඣො, යථා උග්ගාහමානස්ස පරිබ්බාජකස්ස සමණමණ්ඩිකාපුත්තස්ස වචනං. දහරස්ස හි ථපති, කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස කායොතිපි න හොති, කුතො පන කායෙන පාපකං කම්මං කරිස්සති අඤ්ඤත්‍ර ඵන්දිතමත්තා. දහරස්ස හි ථපති කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස වාචාතිපි න හොති. කුතො පන පාපිකං වාචං භාසිස්සති අඤ්ඤත්‍ර රොදිතමත්තා. දහරස්ස හි ථපති, කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස සඞ්කප්පොතිපි න හොති, කුතො පන පාපිකං සඞ්කප්පං සඞ්කප්පිස්සති අඤ්ඤත්‍ර විකූජිතමත්තා[2]. දහරස්ස හි ථපති, කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස ආජීවො තිපි න හොති, කුතො පන පාපකං ආජීවං ආජීවිස්සති අඤ්ඤත්‍ර මාතුථඤ්ඤා. එවං සන්තෙ ඛො, ථපති, දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො සම්පන්නකුසලො භවිස්සති පරමකුසලො උත්තමපත්තිපත්තො සමණො අයොජ්ඣො, යථා උග්ගාහමානස්ස පරිබ්බාජකස්ස සමණමණ්ඩිකාපුත්තස්ස වචනං.

චතූහි ඛො අහං ථපති, ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි න චෙව සම්පන්නකුසලං න පරමකුසලං න උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. අපිචිමං දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං සමධිගය්හ තිට්ඨති. කතමෙහි චතූහි: ඉධ ථපති න කායෙන පාපකං කම්මං කරොති, න පාපිකං වාචං භාසති, න පාපකං සඞ්කප්පං සඞ්කප්පෙති. න පාපකං ආජීවං ආජීවති. ඉමෙහි ඛො අහං ථපති, චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි න චෙව සම්පන්නකුසලං න පරමකුසලං න උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. අපිචිමං දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං සමධිගය්හ තිට්ඨති.

1. සාරාණීයං - මජසං.
2. {විකූජ්ජනමත්තා - සීමු.
{විකූජ්ජිතමත්තා - ස්‍යා, PTS.

ඉක්බිති පඤ්චකඞ්ග වඩුදෙටු සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක කරා එළැඹියේ යැ. එළැඹ සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක හා සමඟ සතුටු විය. සතුටු වියයුතු කලතුරුහි සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් පඤ්චකඞ්ග වඩුදෙටුහට සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක තෙල කරුණ කී යැ :

"ස්ථපතිය, මම් සතර කරුණෙකින් සමන්වාගත පුරුෂපුද්ගල පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් වාදයුදට නො නිසි (වාදයෙන් නො සැලිය හෙන) ශ්‍රමණ යයි දක්වමි (පනවමි). කවර සතර කරුණෙකින යත් : ස්ථපතිය, මෙලොවැ කිසිවෙක් කයින් පවකම් නො කෙරේ ද, ලාමක වචන නො කියා ද, ලාමක සංකල්ප නො කෙරේ ද, ලාමක ආජීව නො කෙරේ ද, ස්ථපතිය, මම් මෙ සතර කරුණින් සමන්වාගත පුරුෂපුද්ගල පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් වාදයුදට නො නිසි ශ්‍රමණ යැ යි පනවමි.

එකල්හි පඤ්චකඞ්ගස්ථපති ශ්‍රමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක ගේ භාෂිතයට නො මැ සතුටු විය, නො ද ප්‍රතික්ෂෙප කෙළේ යැ. අභිනන්‍දන නො කොට ප්‍රතික්ෂෙප නො කොට හුනස්නෙන් නැඟී 'භාග්‍යවතුන් වහන්සේ වෙත තෙල භාෂිතයා ගේ අර්ථය දනිමී නික්ම ගියේ යැ. ඉක්බිති පඤ්චකඞ්ගස්ථපති භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් පඤ්චකඞ්ගස්ථපති සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක හා සමග යම් පමණ කථා සල්ලාපයෙක් වී ද, එ හැම භාග්‍යවතුන් වහන්සේට දැන්වී. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ පඤ්චකඞ්ග ස්ථපතිහට තෙල කරුණ වදළහ : යම්සේ සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක ගේ වචනය වේ ද, එසේ ඇති කල්හි ස්ථපතිය, බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමර පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් අයෝධ්‍යශ්‍රමණ වන්නේ යැ. ස්ථපතිය, බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරුහට (සත්කාය පරකාය විසින්) කායවිඥනයෙකුදු නො වෙයි, වැළි ස්පන්‍දනමාත්‍රය හැර කොයින් කයින් පවකම් කරන්නේ ද? ස්ථපතිය, බාල වූ උත්තානසෙය්‍යක වූ ළදරු කුමරුහට (මිථ්‍යා සම්‍යක් භෙද) වචන දු නො වෙයි. යළි හැඬීම් පමණ මිස කොයින් ලාමක වචන කියන්නේ ද? ස්ථපතිය, බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරුහට (මිථ්‍යා සම්‍යක් භෙද) සංකල්ප දු නො වෙයි. වැළි විකූජන (හැඬීම් සිනාසීම්) මාත්‍රයක් මිස කොයින් ලාමක සංකල්ප කරන්නේ ද? ස්ථපතිය, බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරුහට (මිථ්‍යා සම්‍යක් භෙද ඇති) ආජීව ද නො වෙයි. වැළිදු මව ගේ තනකිරි මිස කොයින් ලාමක ආජීව කරන්නේ ද? ස්ථපතිය, සමණමණ්ඩිකාපුත්‍ර උග්ගාහමාන පරිව්‍රාජක ගේ වචනය යම්සේ ද එසේ ඇති කල්හි බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමර පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තම ප්‍රාප්තියට පැමිණි අයොධ්‍යශ්‍රමණ වන්නේ යි.

ස්ථපතිය, මම වූකලි සතර කරුණෙකින් සමන්වාගත පුරුෂ පුද්ගල නො ද පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් නැති උත්තමප්‍රාප්තියට නො පත් අයෝධ්‍ය (වාද යුදයෙන් නො සැලිය හෙන) ශ්‍රමණ යැ'යි පනවමි. එතෙකුදු වත් (හේ මේ බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරු වෙසෙසා (යට කොට) සිටී. කවර සතර කරුණෙකින යත් : ස්ථපතිය, මෙලොව (කිසිවෙක්) කයින් පවකම් නො කෙරෙයි, ලමු බස් නො බෙණෙයි, ලාමක සංකල්ප නො කෙරෙයි, ලාමක ආජීව නො කෙරෙයි. ස්ථපතිය, මම මෙ සතර කරුණින් සමන්වාගත පුරුෂ පුද්ගල නො ද පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් නැති උත්තම ප්‍රාප්තියට නො පත් අයෝධ්‍යශ්‍රමණ යැ'යි දක්වමි. එතෙකුදු වත් (හෙ තෙම) මෙ බාල වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරු වෙසෙසා සිටී.

දසහි ඛො අහං ථපති, ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං.

ඉමෙ අකුසලසීලා[1]. තාහං[2] ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉතොසමුට්ඨානා අකුසලසීලා. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉධ අකුසලසීලා අපරිසෙසා නිරුජ්ඣන්ති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. එවං පටිපන්නො අකුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි.

ඉමෙ කුසලසීලා[3]. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉතොසමුට්ඨානා කුසලසීලා. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉධ කුසලසීලා අපරිසෙසා නිරුජ්ඣන්ති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. එවං පටිපන්නො කුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි.

ඉමෙ අකුසලසඞ්කප්පා[4]. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉතොසමුට්ඨානා අකුසලසඞ්කප්පා. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉධ අකුසලසඞ්කප්පා අපරිසෙසා නිරුජ්ඣන්ති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. එවං පටිපන්නො අකුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි.

ඉමෙ කුසලසඞ්කප්පා[5]. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉතොසමුට්ඨානා කුසලසඞ්කප්පා. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. ඉධ කුසලසඞ්කප්පා අපරිසෙසා නිරුජ්ඣන්ති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි. එවං පටිපන්නො කුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති. තාහං ථපති, වෙදිතබ්බන්ති වදාමි.

කතමෙ ච ථපති, අකුසලසීලා: අකුසලං කායකම්මං, අකුසලං වචීකම්මං, පාපකො ආජීවො. ඉමෙ වුච්චන්ති ථපති, අකුසලසීලා. ඉමෙ ච ථපති, අකුසලසීලා කිංසමුට්ඨානා: සමුට්ඨානම්පි නෙසං වුත්තං චිත්තසමුට්ඨානාතිස්ස වචනීයා[6]. කතමං චිත්තං: චිත්තම්පි හි බහුං[7] අනෙකවිධං නානප්පකාරකං. තං චිත්තං සරාගං සදොසං සමොහං. ඉතොසමුට්ඨානා අකුසලසීලා. ඉමෙ ච ථපති, අකුසලසීලා කුහිං අපරිසෙසා නිරුජ්ඣන්ති. නිරොධොපි නෙසං වුත්තො. ඉධ ථපති, භික්ඛු කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. මිච්ඡාආජීවං පහාය

1. අකුසලා සීලා - මජසං, ස්‍යා.
2. කහං - සිමු. තහං - PTS.
   තමහං - මජසං, ස්‍යා.
3. කුසලා සීලා - මජසං, ස්‍යා.
4. අකුසලා සඞ්කප්පා - මජසං ස්‍යා.
5. කුසලා සඞ්කප්පා - මජසං, ස්‍යා.
6. වචනීයා - සිමු.
7. බහු - ස්‍යා. PTS.

ස්ථපතිය, මම වූකලි දස කරුණෙකින් සමන්වාගත පුරුෂ පුද්ගල පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් අයොධ්‍යශ්‍රමණ යැ'යි පනවමි.

මොහු අකුසලසීලයෝ (දුශ්ශීලස්වභාවයෝ) යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. අකුසලසීලයෝ මෙයින් (සරාගාදිසිතින්) උපදනාහු යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙහි අකුසලසීලයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙසේ පිළිපන්නේ අකුසලසීලයන්ගේ නිරොධයට පිළිපන්නේ වෙයි. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි.

මොහු කුසලසීලයෝ යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. කුසලසීලයෝ මෙයින් උපදනාහු යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙහි කුසලසීලයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙසේ පිළිපන්නේ කුසලසීලයන්ගේ නිරොධයට පිළිපන්නේ වෙයි. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි.

මොහු අකුශලසංකල්පයෝ යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. අකුශල සංකල්පයෝ මෙයින් උපත ඇතියහ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙහි අකුශලසංකල්පයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙසේ පිළිපන්නේ අකුශලසංකල්පයන්ගේ නිරොධයට පිළිපන්නේ වෙයි. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි.

මොහු කුශලසංකල්පයෝ යැ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. කුශලසංකල්පයෝ මෙයින් උපත ඇතියහ. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙහි කුශල සංකල්පයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි. මෙසේ පිළිපන්නේ කුශලසංකල්පයන්ගේ නිරොධයට පිළිපන්නේ වෙයි. ස්ථපතිය, මම එය දතයුතු යැ'යි කියමි.

ස්ථපතිය, අකුශලශීලයෝ කවරහ යත්: අකුශල වූ කායකර්ම යැ, අකුශල වූ වාක්කර්ම යැ ලාමක වූ ආජීව යි. ස්ථපතිය, මොහු 'අකුශලශීලහ'යි කියනු ලැබෙත්. ස්ථපතිය, වැළිත් මේ අකුශලශීලයෝ කුමක් සමුත්ථාන කොට ඇත්තාහු යත්: උන්ගේ සමුත්ථාන ද කියන ලද. චිත්තසමුත්ථානයෝ යයි කියයුතු වන්නාහ. 'චිත්තය' කවරේ යත්: චිත්ත ද බොහෝ යැ නානාවිධ යැ නානාප්‍රකාර යි. එසිත රාග සහිත වූයේ යැ ද්වෙෂ සහිත වූයේ යැ මෝහ සහිත වූයේ යැ, අකුශලශීලයෝ මෙයින් උපත් ඇතියහ. තවද ස්ථපතිය, මේ අකුශලශීලයෝ කොහි නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් ද? උන්ගේ නිරොධය ද කියන ලද. ස්ථපතිය, මෙසස්නෙහි මහණ කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරිතය හැරපියා මනස්සුචරිතය වඩයි. මිථ්‍යා ආජීවය හැරපියා සම්‍යග් ආජීවයෙන් ජීවිකාව කෙරෙයි,

සම්මාආජීවෙන ජීවිකං කප්පෙති, එත්ථෙතෙ අකුසලසීලා අපරිසෙසා නිරුජ්ඣන්ති කථං පටිපන්නො ච ථපති අකුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති: ඉධ ථපති භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති. පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති. පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං පටිපන්නො ඛො ථපති අකුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති.

කතමෙ ච ථපති කුසලසීලා : කුසලං කායකම්මං, කුසලං වචීකම්මං. ආජීවපාරිසුද්ධිම්පි ඛො අහං ථපති, සීලස්මිං වදාමි. ඉමෙ වුච්චන්ති ථපති කුසලසීලා. ඉමෙ ච ථපති, කුසලසීලා කිංසමුට්ඨානා, සමුට්ඨානම්පි නෙසං වුත්තං. චිත්තසමුට්ඨානාතිස්ස වචනීයා. කතමං චිත්තං : චිත්තම්පි හි බහුං අනෙකවිධං නානප්පකාරකං. තං චිත්තං වීතරාගං වීතදොසං වීතමොහං, ඉතො සමුට්ඨානා කුසලසීලා. ඉමෙ ච ථපති, කුසලසීලා කුහිං අපරිසෙසා නිරුජ්ඣන්ති : නිරොධොපි නෙසං වුත්තො, ඉධ ථපති, භික්ඛු සීලවා හොති නො ච සීලමයො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස තෙ කුසලසීලා අපරිසෙසා නිරුජ්ඣන්ති. කථං පටිපන්නො ච ථපති කුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති : ඉධ ථපති භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං පටිපන්නො ඛො ථපති, කුසලානං සීලානං නිරොධාය පටිපන්නො හොති.

කතමෙ ච ථපති, අකුසලසඞ්කප්පා : කාමසඞ්කප්පො බ්‍යාපාදසඞ්කප්පො විහිංසාසඞ්කප්පො, ඉමෙ වුච්චන්ති ථපති අකුසලසඞ්කප්පා, ඉමෙ ච ථපති. අකුසලසඞ්කප්පා කිංසමුට්ඨානා : සමුට්ඨානම්පි නෙසං වුත්තං. සඤ්ඤාසමුට්ඨානාතිස්ස වචනීයා. කතමා සඤ්ඤා: සඤ්ඤාපි හි බහූ අනෙකවිධා නානප්පකාරකා[1] කාමසඤ්ඤා බ්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා, ඉතො සමුට්ඨානා අකුසලසඞ්කප්පා. ඉමෙ ච ථපති, අකුසලසඞ්කප්පා කුහිං අපරිසෙසා නිරුජ්ඣන්ති: නිරොධොපි නෙසං වුත්තො. ඉධ ථපති භික්ඛු විවිච්චෙව කාමෙහි-පෙ-පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, එත්ථෙතෙ අකුසලසඞ්කප්පා අපරිසෙසා නිරුජ්ඣන්ති. කථං පටිපන්නො ච ථපති, අකුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති: ඉධ ථපති, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය-පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය-පෙ-උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං පටිපන්නො ඛො ථපති, අකුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති.

---

1 නානප්පකාරිකා - PTS

මෙහි මෙතෙල අකුශලශීලයෝ නිරවශේෂයෙන් නිරුද්ධ වෙති. තවද ස්ථපතිය, කෙසේ පිළිපන්නේ අකුශලශීලයන්ගේ නිරෝධයට පිළිපන්නේ වේ ද? ස්ථපතිය, මේ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස කර්තුකම්‍යතාකුශලච්ඡන්දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ. උපන් ලාමක අකුශලධර්මයන් දුරු කරන පිණිස ඡන්දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ. නූපන් කුශලධර්මයන් උපදනා පිණිස කුශලච්ඡන්දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. උපන් කුශලධර්මයන්ගේ සිටීමට නො නැස්මට බහුල බවට විපුලබවට වැඩීමට පරිපූර්ණභාවයට කුශලච්ඡන්දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍ය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ. ස්ථපතිය, මෙසේ පිළිපන්නේ අකුශලශීලයන්ගේ නිරෝධයට පිළිපන්නේ වෙයි.

ස්ථපතිය, කුශලශීලයෝ කවරහ යත්: කුශල වූ කායකර්මයැ කුශල වූ වාක්කර්ම යැ. ස්ථපතිය, මම වූකලි ආජීවපාරිශුද්ධි ද ශීලයෙහි ලා කියමි. ස්ථපතිය, මොහු 'කුශලයෝ'යි කියනු ලැබෙති. තවද ස්ථපතිය, මේ කුශලශීලයෝ කුමක් සමුත්ථාන කොට ඇත්තාහු ද? ඔවුනට සමුත්ථාන ද කියනලද, 'චිත්තසමුත්ථානහ'යි කියයුතු වන්නාහ. 'චිත්ත' කවරෙ යත්: චිත්ත ද බොහෝ යැ නානාවිධ යැ නානාප්‍රකාර යැ. එ සිත වීතරාග යැ වීතදෙස යැ වීතමොහ යි. අකුශලයෝ මෙ සිත සමුත්ථාන කොට ඇතියහ. ස්ථපතිය, වැළිත් මේ කුශලශීලයෝ කොහි නිරවශේෂ වැ නිරුද්ධ වෙත් ද? ඔවුනට නිරෝධ ද කියනලද. ස්ථපතිය, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. එතෙකුදු වත් (මේ මෙ පමණි, මෙයින් මතු කරණී නැතැ'යි) ශීලමය නො වෙයි. යම් තැනෙක ඒ කුශලයෝ නිරවශේෂ වැ නිරුද්ධ වෙත් නම් ඒ චෙලසමාධියත් චලප්‍රඥාවත් ඇති සැටියෙන් දනගනී. ස්ථපතිය, වැළිත් කිසෙයින් පිළිපන්නේ කුශලශීලයන්ගේ නිරෝධයට පිළිපන්නේ වේ ද යත්: ස්ථපතිය, මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස කුශලච්ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණයට . . . නූපන් කුශලධර්මයන් උපදනා පිණිස . . . උපන් කුශලධර්මයන් සිටීමට නො නැස්මට බහුල බවට විපුල බවට භාවනාවට පිරිපුන් බවට ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. ස්ථපතිය, මෙසේ පිළිපන්නේ කුශලශීලයන්ගේ නිරෝධයට පිළිපන්නේ වෙයි.

ස්ථපතිය, වැළිත් අකුශලසංකල්පයෝ කවරහ යත්: කාමසංකල්ප යැ ව්‍යාපාදසංකල්ප යැ විහිංසාසංකල්ප යි. ස්ථපතිය, මොහු 'අකුශලසංකල්පයෝ'යි කියනු ලැබෙත්. ස්ථපතිය වැළිත් කුමක් සමුත්ථාන කොට ඇත්තාහු ද? උන්ගේ සමුත්ථාන ද කියන ලද. සංඥව සමුත්ථාන කොට ඇතැයි කියයුතු වන්නාහ. සංඥා කවර යත්: සංඥා ද බොහෝ යැ නානාවිධ යැ නානාප්‍රකාර යි. කාමසංඥා යැ ව්‍යාපාදසංඥා යැ විහිංසාසංඥා යි. අකුශල සංකල්පයෝ මේ සංඥව සමුත්ථාන කොට ඇතියහ. ස්ථපතිය, වැළිත් මේ අකුශලසංකල්පයෝ කොහි නිරවශේෂ වැ නිරුද්ධ වෙත් ද? ඔවුන්ගේ නිරෝධය ද කියනලද. ස්ථපතිය මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මෙ (අනාගැමිඵලයෙ)හි මෙතෙල අකුශලසංකල්පයෝ නිරවශේෂ වැ නිරුද්ධ වෙති. ස්ථපතිය වැළිත් කිසෙයින් පිළිපන්නේ අකුශලසංකල්පයන්ගේ නිරෝධයට පිළිපන්නේ වේ ද යත්: ස්ථපතිය, මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ. උපන් ලාමක අකුශලධර්මයන් ගේ ප්‍රහාණයට . . . . නූපන් කුශලධර්මයන් උපදනා පිණිස . . . . උපන් කුශලධර්මයන්ගේ සිටීමට නො නැස්මට බහුලභාවයට විපුල භාවයට පරිපූර්ණ බවට කුශලච්ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ. ස්ථපතිය, මෙසෙයින් පිළිපන්නේ අකුශලසංකල්පයන්ගේ නිරෝධයට පිළිපන්නේ වෙයි.

කතමෙ ච ථපති, කුසලසඞ්කප්පා: නෙක්ඛම්මසඞ්කප්පො අබ්‍යාපාදසඞ්කප්පො, අවිහිංසාසඞ්කප්පො. ඉමෙ වුච්චන්ති ථපති, කුසලසඞ්කප්පා. ඉමෙ ච ථපති, කුසලසඞ්කප්පා කිංසමුට්ඨානා: සමුට්ඨානම්පි නෙසං වුත්තං සඤ්ඤාසමුට්ඨානාතිස්ස වචනීයා. කතමා සඤ්ඤා: සඤ්ඤාපි හි බහූ අනෙකවිධා නානප්පකාරකා[1] නෙක්ඛම්මසඤ්ඤා අබ්‍යාපාදසඤ්ඤා අවිහිංසාසඤ්ඤා, ඉතො සමුට්ඨානා කුසලසඞ්කප්පා. ඉමෙ ච ථපති කුසලසඞ්කප්පා කුහිං අපරිසෙසා නිරුජ්ඣන්ති: නිරොධොපි නෙසං වුත්තො. ඉධ ථපති, භික්ඛු විතක්කවිචාරානං වූපසමා-පෙ-දුතියං ඣානං උපසම්පජ්ජ විහරති එත්ථෙතෙ කුසලසඞ්කප්පා අපරිසෙසා නිරුජ්ඣන්ති. කථං පටිපන්නො ච ථපති කුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති: ඉධ ථපති, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං පටිපන්නො ඛො ථපති, කුසලානං සඞ්කප්පානං නිරොධාය පටිපන්නො හොති.

කතමෙහි චාහං[2] ථපති, දසහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤාපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං: ඉධ ථපති, භික්ඛු අසෙඛාය[3] සම්මාදිට්ඨියා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාසඞ්කප්පෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මාවාචාය සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාකම්මන්තෙන සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාආජීවෙන සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාවායාමෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මාසතියා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාඤාණෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මාවිමුත්තියා සමන්නාගතො හොති. ඉමෙහි ඛො අහං ථපති, දසහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤාපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣන්ති.

ඉදමවොච භගවා. අත්තමනො පඤ්චකඞ්ගො ථපති භගවතො භාසිතං අභිනන්දීති.

සමණමණ්ඩිකා සුත්තං[4] අට්ඨමං.

---

1. නානප්පකාරිකා - PTS.
2. 'චාහං' - ස්‍යාමපොත්ථකෙ නත්ථි.
3. අසෙක්ඛාය - සීමු:
4. සමණමුණ්ඩිකසුත්තං - මජසං, ස්‍යා.

ස්ථපතිය, වැළිත් කුශලසංකල්පයෝ කවරහ යත් : නෛෂ්ක්‍රම්‍යසංකල්ප යැ අව්‍යාපාද සංකල්ප යැ අවිහිංසා සංකල්ප යි. ස්ථපතිය, මොහු කුශලසංකල්ප යයි කියනු ලැබෙත්. ස්ථපතිය, වැළිත් මේ කුශලසංකල්පයෝ කුමක් සමුත්ථාන කොට ඇත්තාහු ද? උන්ගේ සමුත්ථාන ද කියන ලද, සංඥාව සමුත්ථාන කොට ඇතැයි කියයුතු වන්නාහ. සංඥා කවර යත් : සංඥා ද බොහෝ යැ, අනේකවිධ යැ නානාප්‍රකාර යැ : නෛෂ්ක්‍රම්‍යසංඥා යැ අව්‍යාපාද සංඥා යැ අවිහිංසාසංඥා යි. කුශලසංකල්පයෝ මේ සංඥාව සමුත්ථාන කොට ඇතියහ. ස්ථපතිය, මේ කුශලසංකල්පයෝ වැළිත් කොහි නිරවශෙෂ වැ නිරුද්ධ වෙත් ද? උන්ගේ නිරොධය ද කියනලද. ස්ථපතිය, මෙ සස්නෙහි මහණ විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් . . . . ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. මෙහි (අර්හත්ඵලයෙහි) මෙල කුශලසංකල්පයෝ නිරවශේෂ වැ නිරුද්ධ වෙති. ස්ථපතිය, කෙසේ පිළිපන්නේ වැළිත් කුශල සංකල්පයන්ගේ නිරෝධයට පිළිපන්නේ වේ ද යත් : ස්ථපතිය, මෙ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස කුශලච්ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍ය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරේ. උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණයට . . . නූපන් කුශලධර්මයන් උපදනා පිණිස . . . උපන් කුශලධර්මයන්ගේ සිටීමට නො නැස්මට බහුලභාවයට විපුලභාවයට භාවනාවට පරිපූර්ණ බවට කුශලච්ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍ය පවත්වයි, සිත නඟාලයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරේ. ස්ථපතිය, මෙසේ පිළිපන්නේ කුශලසංකල්පයන්ගේ නිරෝධයට පිළිපන්නේ වෙ.

තවද ස්ථපතිය, මම් කවර දස කරුණෙකින් සමන්වාගත පුරුෂපුද්ගල පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් අයෝධ්‍යාශ්‍රමණ යයි පනවම් ද යත් : ස්ථපතිය, මේ සස්නෙහි මහණ අශෛක්ෂ වූ සම්‍යග්දෘෂ්ටියෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යක්සංකලපයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යග්වචනයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යක්කර්මාන්තයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යගාජීවයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යග්ව්‍යායාමයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යක්ස්මෘතියෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යක්සමාධියෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යග්ඥානයෙන් සමන්වාගත වූයේ වෙයි, අශෛක්ෂ වූ සම්‍යග්විමුක්තියෙන් සමන්වාගත වූයේ වෙ. ස්ථපතිය, මම් වූකලි මෙ දස කරුණින් සමන්වාගත පුරුෂපුද්ගල පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තමප්‍රාප්තියට පත් අයෝධ්‍යාශ්‍රමණ යයි පනවම්''යයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුසිත් ඇති පඤ්චකාඞ්ග වඩුදෙවූ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයෙහි තුටු වූයේ යි.

අට වැනි සමණමණ්ඩිකා සූත්‍ර යි.

2. 3. 9

චූළසකුලුදායි සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන සකුලුදායී පරිබ්බාජකො මොරනිවාපෙ පරිබ්බාජකාරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: අතිප්පගො ඛො තාව රාජගහං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන මොරනිවාපො පරිබ්බාජකාරාමො යෙන සකුලුදායී පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන මොරනිවාපො පරිබ්බාජකාරාමො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන සකුලුදායී පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය[1] අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා, සෙය්‍යථීදං: 'රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉති භවාභවකථං ඉති වා. අද්දසා ඛො සකුලුදායී පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි: 'අප්පසද්දා භොන්තො හොන්තු මා භොන්තො සද්දමකත්ථ අයං සමණො ගොතමො ආගච්ඡති, අප්පසද්දකාමො ඛො පන සො ආයස්මා අප්පසද්දස්ස වණ්ණවාදී, අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යා'ති. අථ ඛො තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

අථ ඛො භගවා යෙන සකුලුදායී පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො සකුලුදායී පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා: 'ස්වාගතං භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා, ඉදමාසනං පඤ්ඤත්ත'න්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. සකුලුදායීපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සකුලුදායිං පරිබ්බාජකං භගවා එතදවොච:

කායනුත්ථ උදායි, එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතාති? තිට්ඨතෙසා භන්තෙ කථා යාය මයං එතරහි කථාය සන්නිසින්නා. නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. යදාහං භන්තෙ ඉමං පරිසං අනුපසඞ්කන්තො හොමි. අථායං පරිසා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තී නිසින්නා

1. උච්චාසද්දාය මහාසද්දාය - සීමු. PTS.

Free Distribution www.aathaapi.org

2. 3. 9

චූලසකුලුදායි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර නිසා කලන්දකනිවාප නම් වූ වෙළුවන විහාරයෙහි වැඩ වසන සේක. එසමයෙහි සකුලුදායි පරිව්‍රාජක මහත් වූ පිරිවැජිපිරිස් හා සමග මොරනිවාප නම් පරිව්‍රාජකාරාමයෙහි වෙසෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරබත් වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන රජගහ නුවරට පිඩු පිණිස පිවිසියහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිත විය : ''රජගහ නුවර පිඩුසිඟා යන්නට තව ඉතා උදෑසන. මම මොරනිවාප නම් පරිව්‍රාජකාරාමයෙහි සකුලුදායි පරිව්‍රාජක වෙත එළැඹෙන්නෙම් නම් මැනැවැ''යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මොරනිවාප නම් පරිව්‍රාජකාරාමය කරා එළැඹියහ. එසමයෙහි සකුලුදායි පරිව්‍රාජක උද්ගත නාද ඇති උස්හඬින් මහහඬින් අනේකවිධ තිරිසන් කථා කියන මහත් වූ පරිව්‍රාජක පිරිස් හා සමග හුන්නේ වෙයි. ඒ කවර තිරිසන් කථා යැ යත් : රජුන් පිළිබඳ කථා යැ සොරුන් පිළිබඳ කථා යැ මහඇමැතියන් පිළිබඳ කථා යැ සේනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ අන්නකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ යානකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ ශූරකථා යැ වීථි පිළිබඳ කථා යැ කුම්භස්ථානකථා යැ පූර්වප්‍රේත කථා යැ නානාත්ව කථා යැ ලෝකාඛ්‍යානකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ මෙසේ වෘද්ධිහානි වෙයි යන කථා යි. සකුලුදායි පරිව්‍රාජක දුරින් මැ වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ යැ. දැක සිය පිරිස් සන්හුන් කරවී : ''භවත්හු නිහඬ වෙත්වා, භවත්නි, තෙපි නහමක් හඬ නඟවු, මේ ශ්‍රමණ ගෞතම එයි, ඒ ආයුෂ්මත් වූකලි නිහඬ බැව් කැමැත්තේ යැ. නිහඬ බැවහි ගුණ කියන්නේ යැ. නිහඬ පිරිස් දැන එළැඹියයුතු කොට සිතා නම් මැනැවැ''යි. ඉක්බිති ඒ පිරිවැජියෝ නිහඬ වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සකුලුදායි පරිව්‍රාජක වෙත එළැඹියහ. ඉක්බිති සකුලුදායි පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙසේ වදාළ කී : ''වහන්ස, භාග්‍යවත්හු වඩනා සේක්වා, වහන්ස, භාග්‍යවත්නට ස්වාගත යැ. වහන්ස, භාග්‍යවත්හු මෙහි ඊමෙන් බොහෝ කලෙකින් මෙකරුණ කළසේක. වහන්ස භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳිනා සේක්වා, මෙ අස්න පනවන ලදැ''යි. බුදුහු පැනවූ අස්නෙහි වැඩහුන් සේක. සකුලුදායි පරිව්‍රාජක ද එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සකුලුදායි පරිව්‍රාජකහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කරුණු වදාළහ :

''උදායී, තෙපි දැන් කවර නම් කථායෙකින් යුක්ත වැ උන්නු ද? තොප විසින් කවර නම් අතුරු කථාවක් අඩාළ කරන ලද ද?''යි. වහන්ස, ඇපි දැන් යම් කථායෙකින් යුක්ත වැ උනුමෝ නම් මෙසේ කථාව තිබියේවා. වහන්ස, මෙසේ කථා භාග්‍යවතුන්ට පසු වැ ද අසන්නට දුර්ලභ නො වන්නේ යැ. වහන්ස, යම් කලෙකැ මම මෙපිරිසට නො එළැඹෙන්නෙම් වෙම් ද එකල්හි මෙ පිරිස අනේකවිධ තිරිසන් කථා කියමින්

Free Distribution www.aathaapi.org

හොති. යදා ච ඛො අහං භන්තෙ, ඉමං පරිසං උපසඞ්කන්තො හොමි. අථායං පරිසා මමංයෙව මුඛං උල්ලොකෙන්තී[1] නිසින්නා හොති: යං නො සමණො උදායී ධම්මං භාසිස්සති. තං නො සොස්සාමාති. යදා පන භන්තෙ භගවා ඉමං පරිසං උපසඞ්කන්තො හොති, අථ අහඤ්චෙව අයඤ්ච පරිසා භගවතොව[2] මුඛං උල්ලොකෙන්තා[1] නිසින්නා හොම[3]: යං නො භගවා ධම්මං භාසිස්සති, තං නො සොස්සාමා'ති.

තෙනහුදායි, තඤ්ඤෙවෙත්ථ පටිභාතු, යථා මං පටිභාසෙය්‍යාති. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානමානො: 'චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිත'න්ති, සො මයා පුබ්බන්තං ආරබ්භ පඤ්හං පුට්ඨො සමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරි. බහිද්ධා කථං අපනාමෙසි. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසි. තස්ස මය්හං භන්තෙ, භගවන්තංයෙව ආරබ්භ පීති උදපාදි: 'අහො නූන භගවා, අහො නූන සුගතො, යො ඉමෙසං ධම්මානං කුසලො'ති.

කො පනෙසො උදායි, සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානමානො: 'චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිත'න්ති, යො තයා[4] පුබ්බන්තං ආරබ්භ පඤ්හං පුට්ඨො සමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරි, බහිද්ධා කථං අපනාමෙසි. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාත්වාකාසී'ති? නිගණ්ඨො භන්තෙ නාතපුත්තො'ති.

යො ඛො උදායි, අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය. සො වා මං පුබ්බන්තං ආරබ්භ පඤ්හං පුච්ඡෙය්‍ය තං වාහං පුබ්බන්තං ආරබ්භ පඤ්හං පුච්ඡෙය්‍යං. සො වා මෙ පුබ්බන්තං ආරබ්භ පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය, තස්ස වාහං පුබ්බන්තං ආරබ්භ පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍යං.

යො ඛො[5] උදායි, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍ය: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ -පෙ-. යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය. සො වා මං අපරන්තං ආරබ්භ පඤ්හං පුච්ඡෙය්‍ය. තං වාහං අපරන්තං ආරබ්භ පඤ්හං පුච්ඡෙය්‍යං. සො වා මෙ අපරන්තං ආරබ්භ පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය. තස්ස වාහං අපරන්තං ආරබ්භ පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍යං. අපිචුදායි, තිට්ඨතු පුබ්බන්තො තිට්ඨතු අපරන්තො, ධම්මං තෙ දෙසෙස්සාමි: 'ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣතී'ති. අහං හි

---

1. ඔලොකෙන්තී - ස්‍යා.
2. භගවතො - මජසං.
3. හොති - ස්‍යා.
4. සො තයා - ස්‍යා.
5. සො ඛො - සීමු, PTS.

හුන්නී වෙයි. වහන්ස, මම යම් කලෙකැ මෙ පිරිසට එළැඹෙන්නෙම් වෙම් ද එකල්හි මෙ පිරිස 'ශ්‍රමණ උදායී අපට යම් දහමක් දෙසන්නේ ද එ දහම ඇපි අසම්හ'යි මාගේ මැ මුහුණ බලමින් හුන්නී වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් කලෙක මෙ පිරිසට පැමිණිසේක් ද, එතැන් පටන් මමත් මෙ පිරිසත් 'බුදුහු අපට යම් දහමක් දෙසනසේක් ද, අපි ඒ දහම අසම්හ'යි භාග්‍යවතුන් වහන්සේ ගේ මැ මුහුණ බලමින් හුන්නමෝ වම්හ.

එසේ වී නම් උදායි, යම් කරුණෙකින් මට ධර්මදේශනාව වටහා නම් එ කරුණෙහි ලා තොපට මැ වැටහේව'යි. වහන්ස, හීයේ පෙරෙයිද දිනයන්හි සර්වදර්ශී වූ සර්වඥ 'ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදි වරන්නා වූ ද මට හැමද හැම කල්හි ඥානදර්ශනය එළැඹ සිටියේ යැ'යි නිරවශේෂ ඥානදර්ශනය පිළිත කරනුයේ, හේ මා විසින් පූර්වාන්තය ඇරබැ පැන පුළුවුස්නා ලද්දේ අනෙකෙකින් අනෙකක් වසාලී යැ, කථාව බැහැරට නැමී යැ, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙළේ යි. වහන්ස, ඒ මට යමෙක් මෙ දහම්හි සමත් වී නම් 'අහො යහභ එ බුදුහු, අහො යහභ එ සුගතහු'යයි භාග්‍යවතුන් මැ ඇරබැ ප්‍රීති උපනැ'යි.

උදායි, යමෙක් තොප විසින් පූර්වාන්තය ඇරබැ පැන පුළුවුස්නා ලද්දේ අනෙකෙකින් අනෙකක් වැයි ද කථාව බැහැරට නැමී ද, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙළේ ද, 'ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදිවරන්නා වූ ද මට හැමද හැම කල්හි ඥානදර්ශනය එළැඹසිටියේ යැ''යි නිරවශේෂ ඥානදර්ශනය පිළිත කෙරෙන තෙල සර්වදර්ශී සර්වඥ කවරෙක් ද ?යි. වහන්ස, 'නිගණ්ඨනාතපුත්‍ර යැ'යි.

උදායි, යමෙක් අනේකවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරේ ද, හේ කෙසේ ද යත් : එක් ජාතියකුදු ජාති දෙකකුදු . . . මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනේකවිධ පූර්වේ-නිවාස සිහි කරන්නේ ද, හෙ තෙම හෝ පූර්වාන්තය ඇරබැ මා පැන පුළුවුස්නේ යැ මම හෝ පූර්වාන්තය ඇරබැ ඔහු පැන පුළුවුස්නෙම්. හේ හෝ පූර්වාන්තය ඇරබැ මා ගේ පැන විසඳුමින් සිත් ගන්නේ යැ මම හෝ පූර්වාන්තය ඇරබැ ඔහු ගේ පැන විසඳුමින් සිත් ගන්නෙම්.

උදායි, යමෙක් වනාහි මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ මනා පැහැසටහන් ඇති නො මනා පැහැසටහන් ඇති සුන්දර ගති ඇති නපුරු ගති ඇති සත්ත්වයන් දක්නේ ද . . . කර්මානුරූප වැ ගිය සත්ත්වයන් දැනගන්නේ ද, හෙතෙම හෝ අපරාන්තය ඇරබැ මා පැන පුළුවුස්නේ යැ, මම හෝ අපරාන්තය ඇරබැ ඔහු පැන පුළුවුස්නෙම්. හේ හෝ අපරාන්තය ඇරබැ මා ගේ පැන විසඳුමින් සිත් ගන්නෙ යැ, මම හෝ අපරාන්තය ඇරබැ ඔහුගේ පැන විසඳුමින් සිත් ගන්නෙම්. (පහදනෙම්.) එතෙකුදු වත් උදායි, පූර්වාන්තය සිටීවා, අපරාන්තය සිටීවා. තොපට දහම් දෙසනෙම්. ''මේ (අවිද්‍යාදි ප්‍රත්‍යය) ඇති කල්හි මේ (සංස්කාරාදි ඵල) වෙයි, මේ (අවිද්‍යාදි ප්‍රත්‍යයාගේ) උපැත්මෙන් මේ (සංස්කාරාදි ඵලය) උපදී. මේ (අවිද්‍යාදි ප්‍රත්‍යය) නැති කල්හි මේ (සංස්කාරදි ඵල) නො වෙයි. මේ (අවිද්‍යාදි ප්‍රත්‍යයාගේ) නිරෝධයෙන් මේ (සංස්කාරාදි ඵල) නිරුද්ධ වේ''යයි. වහන්ස, මම මාගේ මෙ අත්බැවින් යම් පමණ (අරමුණු)

භන්තෙ[1] යාවතකම්පි මෙ ඉමිනා අත්තභාවෙන පච්චනුභූතං, තම්පි නප්පහොමි සාකාරං[2] සඋද්දෙසං අනුස්සරිතුං. කුතො පනාහං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සාමි, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරිස්සාමි සෙය්‍යථාපි භගවා. අහං හි භන්තෙ එතරහි පංසුපිසාචකම්පි න පස්සාමි, කුතො පනාහං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සිස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානිස්සාමි. සෙය්‍යථාපි භගවා. යං පන මං භන්තෙ භගවා එවමාහ: අපි චුදායි තිට්ඨතු පුබ්බන්තො තිට්ඨතු අපරන්තො, ධම්මං තෙ දෙසෙස්සාමි: 'ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣතී'ති. තඤ්ච පන මෙ භිය්‍යොසොමත්තාය න පක්ඛායති අප්පෙවනාමාහං භන්තෙ සකෙ ආචරියකෙ භගවතො චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණෙනා'ති.

කින්ති පන තෙ උදායි, සකෙ ආචරියකෙ හොතීති?

අම්හාකං භන්තෙ, සකෙ ආචරියකෙ එවං හොති: 'අයං පරමො වණ්ණො, අයං පරමො වණ්ණො'ති.

යං පන තෙ එතං උදායි, සකෙ ආචරියකෙ එවං හොති: 'අයං පරමො වණ්ණො, අයං පරමො වණ්ණො'ති. කතමො සො පරමො වණ්ණො'ති?

යස්මා, භන්තෙ, වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති.

කතමො පන සො උදායි වණ්ණො,[3] යස්මා වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති?

යස්මා, භන්තෙ වණ්ණා, අඤ්ඤො වණ්ණො, උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති.

දීඝාපි ඛො තෙ එසා උදායි, ඵරෙය්‍ය. යස්මා භන්තෙ, වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති වදෙසි. තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසි. සෙය්‍යථාපි උදායි පුරිසො එවං වදෙය්‍ය: අහං යා ඉමස්මිං ජනපදෙ ජනපදකල්‍යාණී තං ඉච්ඡාමි තං කාමෙමී'ති. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස, යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි. ජානාසි ත්වං ජනපදකල්‍යාණිං ඛත්තියී වා බ්‍රාහ්මණී වා වෙස්සී වා සුද්දී වාති? ඉති පුට්ඨො, නොති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස, යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි ජානාසි ත්වං ජනපදකල්‍යාණිං එවංනාමා එවංගොත්තා ඉති වාති -පෙ- දීඝා වා රස්සා වා මජ්ඣිමා වාති.-පෙ-කාළී වා සාමා වා මඞ්ගුරච්ඡවී වාති-පෙ-අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වාති ඉති පුට්ඨො, නොති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස, යං ත්වං න ජානාසි න පස්සසි, තං ත්වං ඉච්ඡසි කාමෙසීති ඉති පුට්ඨො ආමාති වදෙය්‍ය. තං කිං මඤ්ඤසි උදායි, නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකං[4] භාසිතං සම්පජ්ජතීති?

---

1. අහං භන්තෙ - සීමු, PTS.
2. ඉති සාකාරං - සීමු, PTS.
3. සො පරමො වණ්ණො - මජසං.
4. { අප්පාටිහිරීකතං - මජසං, PTS. / අප්පාටිහිරීකතං - ස්‍යා. }

විද්‍යානාලද ද, එ ද මෙසේ ආකාර සහිත කොට උද්දේස සහිත කොට සමරන්නට නො පොහොනෙමි. වැළිත් කොයින් මම අනේකවිධ පූර්වේනිවාසයන් සමරන්නෙම් ද? හේ කෙසේ යැ යත් : එක් දියකුදු දෙදියකුදු . . . . මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනේකවිධ පූර්වේනිවාසය භාග්‍යවතුන් සෙයින් සිහි කරන්නෙම් ද? වහන්ස, මම මේ කල්හි පාංශුපිශාචයකුදු නො දක්මි. වැළිත් කොයින් මම මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිවැසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුන්දර ගති ඇති දුගති ඇති සත්ත්වයන් දක්නෙම් ද, යථාකර්මෝපග සත්ත්වයන් භාග්‍යවතුන් සෙයින් දන්නෙම් ද වහන්ස, වැළිත් භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ : "එතෙකුදු වත් උදයි, පූර්වාන්තය සිටීවා, අපරාන්තය සිටීවා, තොපට දහමක් දෙසමි : "මේ (ප්‍රත්‍යය) ඇති කල්හි මේ (ඵලය) වෙයි, මේ (ප්‍රත්‍යය) උපැත්මෙන් මේ (ඵලය) උපදී, මේ (ප්‍රත්‍යය) නැති කල්හි මේ (ඵලය) නො වෙයි, මේ (ප්‍රත්‍යයාගේ) නිරෝධයෙන් මේ (ඵලය) නිරුද්ධ වේ"යයි යමක් කියා ද, එ ද මට බෙහෙවින් නො වැටහෙයි. වහන්ස මම සිය ඇදුරොල්හි ප්‍රශ්න-ව්‍යාකරණයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිත පහදනෙම් නම් මැනැවැ'යි.

උදයි, වැළිත් තොපට සිය ඇදුරොල්හි කෙ සේ වේ ද ?යි.

වහන්ස, අපට සිය ඇදුරොල්හි මෙසේ වෙයි : "මේ පරමවර්ණ යැ මේ පරමවර්ණ යැ"යි.

උදයි, වැළිත් තොපට තෙල සිය ඇදුරොල්හි "මේ පරමවර්ණ යැ මේ පරමවර්ණ යැ'යි මෙසේ යමක් වේ ද, ඒ පරමවර්ණය කවරෙ ද?

වහන්ස, යම් වර්ණයකට වඩා උත්තරිතර හෝ ප්‍රණීතතර අනෙක් වර්ණයෙක් නැද්ද, 'ඒ පරමවර්ණ නම් වේ'යයි.

උදයි, යම් වර්ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන්‍යවර්ණයෙක් නැද්ද, ඒ වර්ණය කවරේ ද?

වහන්ස, යම් වර්ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන්‍ය වර්ණයෙක් නැද්ද, ඒ පරමවර්ණ වේ'යයි.

උදයි (තෙපි) "වහන්ස, යම් වර්ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන්‍ය වර්ණයෙක් නැද්ද, 'ඒ පරමවර්ණ යැ'යි කියව, ඒ වර්ණය ද නො පනවව, තොපගේ තෙල කථාව දික්වන්නේ යැ. යම්සේ උදයි. පුරුෂයෙක් මෙසේ කියයි : "මම මෙ දනව්යෙහි යම් දනවුකලණක් ඇත් නම් ඇය රුස්නෙමි, ඇය කැමැත්තෙමි"යි. ඒ මොහුට කියි කෙනෙක් මෙසේ කියන්නාහ : "එම්බා පුරුෂය, තෙපි යම් දනවුකලණක රුස්නහු ද කැමැත්තහු ද තෙපි දනවුකලණ ක්ෂත්‍රියාවක හෝ බ්‍රාහ්මණියක හෝ වෛශ්‍යාවක හෝ ශුද්‍රියක හෝ යි දනිවු ද ?යි. මෙසේ පුළුවුස්නා ලද්දේ නො දනිමි' කියන්නේ යැ. ඒ මොහුට මෙසේ කියන්නාහ : එම්බා පුරුෂය, තෙපි යම් දනවුකලණක රුස්නහු ද කැමැත්තහු ද, තෙපි දනවුකලණ මෙ නම් ඇත මෙවන් ගෝත්‍ර ඇතැ යි හෝ . . . දික් යැ හෝ මිටි යැ හෝ මැදුම් යැ හෝ'යි . . . කැළි යැ හෝ සමවනැ හෝ මඟුරුසිවි ඇත්තී යැ හො'යි, අසුවල් ගම්හි යැ හෝ නියම්ගම්හි යැ හෝ නුවරෙහි යැ හෝ'යි දනිවු ද?"යි. මෙසේ පුළුවුස්නා ලද්දේ 'නො දනිමි' කියන්නේ යැ. ඒ මොහුට මෙසේ කියන්නාහ : "එම්බා පුරුෂය, තෙපි යම් තැනැත්තියක නො දන්නහු ද නො දක්නහු ද, තෙපි ඇය රුස්නහු ද කැමැත්තහු ද ?"යි. මෙසේ පුළුවුස්නාලද්දේ 'එසේ යැ'යි කියන්නේ යැ. උදයි, එය කුමකැයි හඟී ද? මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ භාෂිතය නිරර්ථක වන්නේ නො වේ ද ?යි.

අද්ධා ඛො භන්තෙ, එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකං භාසිතං සම්පජ්ජතීති.

එවමෙව ඛො උදායි, යස්මා භන්තෙ, වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති වදෙසි, තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසීති.

සෙය්‍යථාපි භන්තෙ, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසති ච තපති ච විරොචති ච[1]. එවං වණ්ණො අත්තා හොති අරොගො පරම්මරණාති.

තං කිං මඤ්ඤසි උදායි, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසති ච තපති ච විරො-චති ච[1] යො වා රත්තන්ධකාරතිමිසායං කිමි ඛජ්ජොපනකො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො වාති?

ය්වායම්භන්තෙ, රත්තන්ධකාරතිමිසායං කිමි ඛජ්ජොපනකො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො වාති.

තං කිං මඤ්ඤසි උදායි, යො වා රත්තන්ධකාරතිමිසායං[2] කිමි ඛජ්ජොපනකො. යො වා රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරොච පණීතතරො වාති?

ය්වායං භන්තෙ, රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො වාති.

තං කිං මඤ්ඤසි උදායි, යො වා රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො යො වා රත්තන්ධකාරතිමිසායං මහාඅග්ගික්ඛන්ධො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො වාති?

ය්වායං භන්තෙ, රත්තන්ධකාරතිමිසායං මහාඅග්ගික්ඛන්ධො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො වාති.

තං කිං මඤ්ඤසි උදායි, යො වා රත්තන්ධකාරතිමිසායං මහා-අග්ගික්ඛන්ධො, යා වා රත්තියා පච්චූසසමයං විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ඔසධීතාරකා, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො වාති?

යායං භන්තෙ, රත්තියා පච්චූසසමයං විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ඔසධීතාරකා, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො වාති.

තං කිං මඤ්ඤසි උදායි, යා වා රත්තියා පච්චූසසමයං විද්ධෙ විගත වලාහකෙ දෙවෙ ඔසධීතාරකා, යො වා තදහුපොසථෙ පන්නරසෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො[3] අඩ්ඪරත්තසමයං චන්දො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො වාති?

---

1. භාසතෙ ච තපතෙ ච - සීමු, මජසං.
විරොචතෙ ච සීමු
භාසතෙච තපතෙච විරොචතෙච - ස්‍යා.
2. රත්තන්ධකාරතිමිසාය - මජසං, PTS, ස්‍යා.
3. අභිදෙ - සීමු.

වහන්ස, ඒකාන්තයෙන් මැ මෙසේ ඇති කල්හි ඒ පුරුෂයා ගේ භාෂිතය නිරර්ථක වන්නේ මැ යි.

එසෙයින් මැ උදායි, තෙපි : "වහන්ස, යම් වර්ණයකට වඩා උත්තරිතර හෝ ප්‍රණීතතර හෝ අන්‍යවර්ණයෙක් නැද්ද, ඒ පරමවර්ණ යැ යි කියව, ඒ වර්ණය ද නො පනව"යි.

වහන්ස, යම්සේ සුන්දර වූ ජාතිමත් වූ අටැස් ඇති වෛරෟඩීමාණික්‍යක් මැනවින් පිරියම් කරන ලද්දේ පඬුඇඹුලෙකැ බහාලන ලද්දේ බබළන්නේ ත් දීප්ත වන්නේ ත් වෙසෙයින් දීප්ත වන්නේත් වේ ද, මෙබඳු වර්ණ ඇති ආත්මය මරණින් මතු ආරොග වේ යයි.

උදායි, ඒ කිමැයි හඟිවු ද? සුන්දර වූ ජාතිමත් වූ අටැස් ඇති මොනොවට පිරියම් කළ වෛරෟඩීමාණික්‍යක් පඬුඇඹුලෙකැ බහාලන ලද්දේ බබළන්නේ ත් දීප්ත වන්නේ ත් වෙසෙයින් දීප්ත වන්නේ ත් වේ ද, රාත්‍රි බහලාන්ධකාරයෙහි යම් කදෝපැණි කෘමියෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ ද ?යි.

වහන්ස, රැය බොල් අඳුරෙහි යම් කදෝපැණි කෘමියෙක් වේ ද, මේ තෙමේ මේ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදායි, ඒ කිමැයි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් කදෝපැණි කෘමියෙක් හෝ වේ ද, රැය බොල් අඳුරෙහි යම් තෙල්පහනෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ ද ?යි.

වහන්ස, රැය බොල් අඳුරෙහි යම් තෙල් පහනෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් අතිසුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදායි, ඒ කිමැ යි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් තෙල්පහනෙක් හෝ වේ ද, රැය බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතර ත් ප්‍රණීතරතර ත් වේ ද ?යි.

වහන්ස, රැය බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදායි, ඒ කිමැ යි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් හෝ වේ ද, රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි යම් ඕසධිතාරකාවක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් ඉතා සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ දැ ?යි.

වහන්ස, රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි යම් ඕසධිතාරකාවක් වේ ද මේ මෙ වර්ණ දෙක අතුරින් ඉතා සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදායි, ඒ කිමැ යි හඟිවු ද? රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි යම් ඕසධිතාරකාවක් හෝ වේ ද, ඒ පසළොස්වකපොහෝ දවස්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි තුබූත් අඩරාත්‍රිසමයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් ඉතා සුන්දරතර ත් ප්‍රණීතතර ත් වේ ද ?යි

සෙය්‍යථාපි භන්තෙ, තදහුපොසථෙ පණ්ණරසෙ විසුද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො[1] අඩ්ඪරත්තසමයං චන්දො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

තං කිං මඤ්ඤසි උදායි, යො වා තදහුපොසථෙ පණ්ණරසෙ විසුද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො අඩ්ඪරත්තසමයං චන්දො. යො වා වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විසුද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො මජ්ඣන්තිකං සමයං සුරියො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො ච වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති.

සෙය්‍යථාපි භන්තෙ, වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විසුද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො මජ්ඣන්තිකං සමයං සුරියො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

අතො[2] ඛො තෙ උදායි, බහූ හි බහුතරා දෙවා යෙ ඉමෙසං චන්දිමසුරියානං ආභා[3] නානුභොන්ති, ත්‍යාහං පජානාමි. අථ ච පනාහං න වදාමි: යස්මා වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථී'ති. අථ ච පන ත්වං උදායි: යවායං වණ්ණො කිමිනා ඛජ්ජොපනකෙන හීනතරො[4] ච පතිකිට්ඨතරො ච, සො පරමො වණ්ණොති වදෙසි, තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසීති.

අච්ඡිදං භගවා කථං, අච්ඡිදං සුගතො කථන්ති.

කිං පන ත්වං උදායි, එවං වදෙසි : අච්ඡිදං භගවා කථං, අච්ඡිදං සුගතො කථන්ති?

අම්හාකං භන්තෙ, සකෙ ආචරියකෙ එවං හොති: 'අයං පරමො වණ්ණො අයං පරමො වණ්ණො'ති. තෙ මයං භන්තෙ, භගවතා සකෙ ආචරියකෙ සමනුයුඤ්ජියමානා සමනුගාහියමානා සමනුභාසියමානා රිත්තා තුච්ඡා අපරද්ධා'ති.

කිං පනුදායි, අත්ථි එකන්තසුඛො ලොකො, අත්ථි ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති?

අම්හාකං භන්තෙ, සකෙ ආචරියකෙ එවං හොති: අත්ථි එකන්තසුඛො ලොකො, අත්ථි ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායා'ති.

කතමා පන සා උදායි, ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති?

ඉධ භන්තෙ, එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, අඤ්ඤතරං වා පන තපොගුණං සමාදාය වත්තති, අයං ඛො සා භන්තෙ, ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති.

---

1. අභිදෙ - සීමු.
2. තතො - ස්‍යා.
3. ආභා තෙ - සීමු.
4. නිහීනතරො - මජ්ඣසං, ස්‍යා.

වහන්ස, ඒ පණ්ඩුරසිපොහෝ දවස්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි තුබුන් අර්ධරාත්‍රිසමයෙහි යම් චන්ද්‍රයෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් ඉතා සුන්‍දරතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදයී, ඒ කිමැ යි හඟිවු ද? ඒ පණ්ඩුරසිපොහෝ දවස්හි පහ වැ ගිය වලා ඇති දුරැ වූ වලා ඇති අහස්හි තුබුන් අර්ධරාත්‍රිසමයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේ ද, වර්ෂාඍතුව පිළිබඳ පශ්චිමමාසයෙහි සරා කල්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි තුබුන් මධ්‍යාහ්න සමයෙහි යම් සූර්‍ය්‍යයෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිසුන්‍දරතර ත් ප්‍රණීතතර ත් වේ ද?යි.

වහන්ස, වර්ෂාඍතුව පිළිබඳ පශ්චිමමාසයෙහි සරත්කාලයෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි තුබුන් මධ්‍යාහ්න සමයෙහි යම් සූර්‍ය්‍යයෙක් වේ ද, මේ මේ වර්ණ දෙක අතුරින් අතිකාන්තතර ත් ප්‍රණීතතර ත් වේ යයි.

උදයී, යම් කෙනෙක් මේ සඳහිරු දෙදෙනා ගේ අවභාසය නො විඳිත් ද ඒ දෙව්යෝ සඳහිරු දෙදෙනාගේ අවභාසය විඳිනවුනට වඩා බොහෝ යැ, බහුතරයහ. මම් ඔවුන් දනිමි. එතෙකුදු වත් මම "යම් වර්ණයකට වඩා උත්තරිතර වූ ප්‍රණීතතර වූ අන්‍ය වර්ණයෙක් නැතැ"යි නො කියමි. එතෙකුදු වත් උදයී, තෙපි කඳෝපැණි කිමියකුටත් වඩා හීනතර වූ ලාමකතර වූ යම් වර්ණයෙක් වේ ද ඒ පරම වර්ණ යයි කියව, එ වර්ණය ද නො පනව'යි.

"බුදුහු කථාව සිඳලූහ, සුගත්හු කථාව සිඳලූහ"යි.

උදයී, තෙපි "බුදුහු කථාව සිඳලූහ. සුගත්හු කථාව සිඳලූහ"යි මෙසේ කුමට කියව?

වහන්ස, අපට සිය ඇදුරොල්හි මේ පරමවර්ණ යැ, මේ පරමවර්ණ යැ'යි මෙසේ වෙයි. වහන්ස. ඒ ඇපි භාග්‍යවතුන් විසින් ස්වකීය ආචාර්‍ය්‍යසමයෙහි අනුයෝග වතට නගනු ලබන්නමෝ කරුණු ගන්වනු ලබන්නමෝ කරුණු විචාරනු ලබන්නමෝ සිස් වූම්හ, තුච්ඡ වූම්හ, වැරදුණම්හ'යි.

කිමෙක් ද උදයී, ඒකාන්තසුව ඇති ලෝකයෙක් ඇද්ද?යි. ඒකාන්තසුව ඇති ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපදයෙක් ඇද්ද?යි.

වහන්ස, සිය ඇදුරොල්හි මෙසේ වෙයි : "ඒකාන්තසුව ඇති ලොවෙක් ඇත, ඒකාන්තසුව ඇති ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපදයෙක් ඇතැ"යි.

උදයී, ඒකාන්තසුව ඇති ලොක්‍ය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වූ ඒ ආකාරවත් ප්‍රතිපද කවරැ?යි

වහන්ස, මෙලොව කිසිවෙක් පණිවා හැරපියා පණිවායෙන් වෙන් වූයේ වෙයි, අයිනාදන් හැරපියා අයිනාදනින් වෙන් වූයේ වෙයි, කාමයෙහි මිසහසර හැරපියා කාමයෙහි මිසහසරින් වෙන් වූයේ වෙයි, මුසවා හැරපියා මුසවායෙන් වෙන් වූයේ වෙයි, එක්තරා තපෝගුණයක් හෝ සමාදන් වැ වැටෙයි. වහන්ස, මේ වූකලි ඒකාන්තසුව ඇති ලෝකය සාක්ෂාත් කිරීම පිණිස වූ ඒ ආකාරවත් ප්‍රතිපද වේ යයි.

තං කිං මඤ්ඤසි උදායි, යස්මිං සමයෙ පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, එකන්තසුඛී වා තස්මිං සමයෙ අත්තා හොති සුඛදුක්ඛී වාති?

සුඛදුක්ඛී භන්තෙ.

තං කිං මඤ්ඤසි උදායි, යස්මිං සමයෙ අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, එකන්තසුඛී වා තස්මිං සමයෙ අත්තා හොති සුඛදුක්ඛී වාති?

සුඛදුක්ඛී භන්තෙ.

තං කිං මඤ්ඤසි උදායි, යස්මිං සමයෙ කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, එකන්තසුඛී වා තස්මිං සමයෙ අත්තා හොති සුඛදුක්ඛී වාති?

සුඛදුක්ඛී භන්තෙ.

තං කිං මඤ්ඤසි උදායි, යස්මිං සමයෙ මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, එකන්තසුඛී වා තස්මිං සමයෙ අත්තා හොති සුඛදුක්ඛී වාති?

සුඛදුක්ඛී භන්තෙ.

තං කිං මඤ්ඤසි උදායි, යස්මිං සමයෙ අඤ්ඤතරං තපොගුණං සමාදාය වත්තති, එකන්තසුඛී වා තස්මිං සමයෙ අත්තා හොති සුඛදුක්ඛී වාති?

සුඛදුක්ඛී භන්තෙ.

තං කිං මඤ්ඤසි උදායි, අපි නු ඛො වොකිණ්ණසුඛදුක්ඛං පටිපදං ආගම්ම එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියා හොතීති?

අච්ඡිදං භගවා කථං, අච්ඡිදං සුගතො කථන්ති.

කිං පන ත්වං උදායි, එවං වදෙසි: 'අච්ඡිදං භගවා කථං, අච්ඡිදං සුගතො කථ'න්ති.

අම්හාකං භන්තෙ, සකෙ ආචරියකෙ එවං හොති: 'අත්ථි එකන්තසුඛො ලොකො, අත්ථි ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායා'ති. තෙ මයං භන්තෙ, සකෙ ආචරියකෙ සමනුයුඤ්ජියමානා සමනුගාහියමානා සමනුභාසියමානා රිත්තා තුච්ඡා අපරද්ධාති.[1]

කිං පන භන්තෙ, අත්ථි එකන්තසුඛො ලොකො අත්ථි ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති?

අත්ථි ඛො උදායි, එකන්තසුඛො ලොකො, අත්ථි ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති.

කතමා පන සා භන්තෙ, ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති?

---

1. අපරද්ධාපි - ස්‍යා, PTS.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? යම් කලෙකැ පණිවා හැරපියා පණිවායෙන් වෙන් වූයේ වේ ද, එකල්හි තෙමේ ඒකාන්තසුව ඇත්තේ හෝ වේ ද, සුවදුක් මුසු වූයේ හෝ වේ ද ?යි.

වහන්ස, සුවදුක් මුසු වූයේ වෙයි.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? යම් කලෙකැ අයිනාදන් හැරපියා අයිනාදනින් වෙන් වූයේ වේ ද එකල්හි තෙමේ ඒකාන්තසුව ඇත්තේ හෝ වේ ද, සුවදුක් ඇත්තේ හෝ වේ ද ?යි.

වහන්ස, සුවදුක් ඇත්තේ වෙයි.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? යම් කලෙකැ කාමයෙහි මිසහසර හැරපියා කාමයෙහි මිසහසරින් වෙන් වූයේ වේ ද, එසමයෙහි තෙමේ ඒකාන්තසුව ඇත්තේ හෝ වේ ද, සුවදුක් ඇත්තේ හෝ වේ ද ?යි.

වහන්ස, සුවදුක් ඇත්තේ වෙයි.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? යම් කලෙකැ මුසවා හැරපියා මුසවායෙන් වෙන් වූයේ වේ ද, එකල්හි තෙමේ ඒකාන්තසුව ඇත්තේ හෝ වේ ද, සුවදුක් ඇත්තේ හෝ වේ ද ?යි,

වහන්ස, සුවදුක් ඇත්තේ වෙයි.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? යම් කලෙකැ එක්තරා තපෝගුණයක් සමාදන් වැ වැවේ ද, එකල්හි තෙමේ ඒකාන්තසුව ඇත්තේ හෝ වේ ද, සුවදුක් ඇත්තේ හෝ වේ ද ?යි.

වහන්ස, සුවදුක් ඇත්තේ වෙයි.

උදායී, ඒ කිමැ'යි හඟිවූ ද? මුසු වූ සුවදුක් ඇති පිළිවෙතකට පැමිණ ඒකාන්තසුව ඇති ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වේ යැ නු ?යි.

''බුදුහු කථාව සිඳලූහ, සුගත්හු කථාව සිඳලූහ''යි.

උදායී, තෙපි ''බුදුහු කථාව සිඳලූහ, සුගත්හු කථාව සිඳලූහ''යි මෙසේ කුමට කියව ?

වහන්ස, අපට සිය ඇදුරොල්හි මෙසේ වෙයි : ''ඒකාන්තසුව ඇති ලොවෙක් ඇත, ඒකාන්තසුව ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපද ඇතැ''යි. වහන්ස, එ අපි භාග්‍යවතුන් විසින් සිය ඇදුරොල්හි අනුයෝග වතට නඟනු ලබන්නමෝ කරුණු ගන්නවනු ලබන්නමෝ කරුණු විචාරනු ලබන්නමෝ සිස් වූම්හ, තුච්ඡ වූම්හ, වැරදුණම්හ'යි.

කිම වහන්ස, ඒකාන්තසුව ඇති ලොවෙක් ඇද්ද, ඒකාන්තසුව ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපද ඇද්ද ?යි.

''උදායී, ඒකාන්තසුව ලෝකයෙක් ඇත, ඒකාන්ත සුව ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපද ඇතැ''යි.

වහන්ස, ඒකාන්තසුව ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට යම් ආකාරවත් ප්‍රතිපදයෙක් ඇත් නම් ඒ ප්‍රතිපද කවරැ ?යි.

ඉධුදායි භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං ඛො සා උදායි, ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති.

න ඛො[1] සා භන්තෙ, ආකාරවතී පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. සච්ඡිකතො හිස්ස භන්තෙ, එත්තාවතා එකන්තසුඛො ලොකො හොතීති.

නඛ්වාස්ස උදායි, එත්තාවතා එකන්තසුඛො ලොකො සච්ඡිකතො හොති, ආකාරවතීත්වෙව සා පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති.

එවං වුත්තෙ සකුලුදායිස්ස පරිබ්බාජකස්ස පරිසා උන්නාදිනී උච්චාසද්දා මහාසද්දා[2] අහොසි: එත්ථ මයං අනස්සාම සාචරියකා, එත්ථ මයං පනස්සාම[3] සාචරියකා, න මයං ඉතො භිය්‍යො උත්තරිතරං පජානාමාති.

අථ ඛො සකුලුදායි පරිබ්බාජකො තෙ පරිබ්බාජකෙ අප්පසද්දෙ කත්වා භගවන්තං එතදවොච: 'කිත්තාවතා පනස්ස භන්තෙ, එකන්තසුඛො ලොකො සච්ඡිකතො හොතී'ති.

ඉධුදායි, භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. යාවතා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා තාහි දෙවතාහි සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති, එත්තාවතා ඛ්වාස්ස උදායි, එකන්තසුඛො ලොකො සච්ඡිකතො හොතී'ති.

එතස්ස නූන භන්තෙ, එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්තීති?

න ඛො උදායි, එතස්ස[4] එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. අත්ථි ඛො උදායි, අඤ්ඤෙ ච[5] ධම්මා උත්තරිතරා ච පණීතතරා ච, යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

කතමෙ පන තෙ භන්තෙ, ධම්මා උත්තරිතරා ච පණීතතරා ච, යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්තීති?

ඉධුදායි, තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා -පෙ- සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො උදායි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

---

1. කිං නු ඛො - ස්‍යා.
2. උච්චාසද්දා මහාසද්දා - ස්‍යා, මජසං.
3. අනස්සාම - මජසං, PTS.
4. එතස්ස - මජසං (නත්ථි)
5. අඤ්ඤෙව - මජසං, PTS.

උදායි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ . . . . ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් . . . . . . ද්විතීයධ්‍යානයට . . . . . . තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ ද, උදායි, මේ චූකලි ඒකාන්තසුඛ ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට ඒ කාරණවත් ප්‍රතිපද යි.

"වහන්ස, ඒ ඒකාන්තසුඛලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමට කාරණවත් ප්‍රතිපද මතු නො වෙයි, ඔහු විසින් මෙතෙකින් ඒකාන්තසුඛ ලෝකය සාක්ෂාත් කරනලද මැ වේ" යයි.

උදායි, මෙතෙකින් ඒකාන්තසුඛ ලෝකය සාක්ෂාත් කරනලද නො වෙයි. ඒ ඒකාන්තසුඛ ලෝකය සාක්ෂාත් කිරීමට කාරණවත් ප්‍රතිපද මැ වේ යයි.

මෙසේ වදාළ කල්හි සකුළුදායි පරිව්‍රාජකගේ පිරිස උද්ගතනාද ඇති උස්හඬ මහහඬ ඇති විය : "මෙ කරුණෙහි ලා අපි ඇදුරන් සහිත වැ නැසෙම්හ. මෙ කරුණෙහි ලා අපි ඇදුරන් සහිත වැ වැනැසෙම්හ. අපි මෙයින් වැඩියක් නො දනුම්හ"යි.

ඉක්බිති සකුළුදායි පරිව්‍රාජක ඒ පරිව්‍රාජකයන් නිහඬ කොට භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් කී : "වහන්ස, වැළිත් කිපමණෙකින් ඒකාන්තසුඛ ලෝකය ප්‍රත්‍යක්ෂ කරනලද වේ ද ?යි.

උදායි, මෙ සස්නෙහි මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන්. . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, යම් පමණ දෙවියෝ ඒකාන්තසුඛ ලෝකයට පැමිණියාහු නම්, ඒ දෙවියන් හා සමග එක් වැ සිටී ද, සල්ලාප කෙරේ ද, සාකච්ඡාවට පැමිණේ ද, මෙපමණෙකින් උදායි, ඔහු විසින් ඒකාන්තසුඛ ලෝකය ප්‍රත්‍යක්ෂ කරන ලද වේ" යයි.

'වහන්ස, තෙල ඒකාන්තසුඛ ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීම කරුණු කොට භික්ෂූහු භාග්‍යවතුන් කෙරෙහි බඹසර වසන්නාහු වනැ'යි.

'උදායි, තෙල ඒකාන්තසුඛ ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීම කරුණු කොට භික්ෂූහු මා කෙරෙහි බඹසර නො වෙසෙති. උදායි, යම් ධර්ම කෙනකුන් ප්‍රත්‍යක්ෂ කිරීම කරුණු කොට භික්ෂූහු මා කෙරෙහි බඹසර වෙසෙත් නම්, එබඳු උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් අන්‍යධර්මයෝ ඇතැ'යි.

වහන්ස, යම් ධර්ම කෙනකුන් ප්‍රත්‍යක්ෂ කිරීම කරුණු කොට භික්ෂූහු භාග්‍යවතුන් කෙරෙහි බඹසර වෙසෙත් නම්, උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් ඒ ධර්මයෝ කවරහ ?යි.

උදායි, මෙලොවැ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ (අෂ්ට) විද්‍යා (පසළොස්) චරණ ධර්මයෙන් යුක්ත වූ සුගත වූ ලෝකය දන්නා වූ අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිසුනට ශාස්තෘ වූ (චතුස්සත්‍යාවබෝධයෙන්) බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගත උපදී. . . . මෙ චිත්තයට උපක්ලේශ වූ ප්‍රඥාව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් හැරපියා කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. උදායි, යම් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කිරීම හේතු කොට භික්ෂූහු මා කෙරෙහි බඹසර සරත් නම් මෙ ද උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් ධර්මයෙකි.

පුන ච පරං උදායි, භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, අයම්පි ඛො උදායි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, අයම්පි ඛො උදායි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච, යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති, සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. අයම්පි ඛො උදායි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච, යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති -පෙ- අයං දුක්ඛනිරොධොති පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථාභූතං පජානාති අයං ආසවසමුදයොති -පෙ- අයං ආසවනිරොධොති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවඤ්ජානතො එවම්පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං ඛො උදායි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච, යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. ඉමෙ ඛො උදායි, ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියා හෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

එවං වුත්තෙ සකුලුදායී පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

තවද උදායි, මහණ විතර්ක්විචාරයන් ගේ සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානයට . . . තෘතීයධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට පැමිණ වෙසේ ද, උදායි, යම් ධර්මයක් ප්‍රත්‍යක්ෂ කිරීම හේතු කොට භික්‍ෂූහු මා කෙරෙහි බඹසර වෙසෙද්ද, මෙ ද එබඳු උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් ධර්මයෙකි.

හේ මෙසේ සිත සමාහිත (එකඟ) කල්හි පිරිසුදු කල්හි හාත්පසින් පිරිසුදු කල්හි ක්ලේශාඞගණ රහිත කල්හි පහ වැ ගිය උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥානයට සිත නමයි. හේ අනේකවිධ පූර්වේනිවාස සිහි කෙරෙයි, හෙ මෙසේ යැ : එක් දයකුදු දෙ දයකුදු . . . . මෙසේ ආකාර සහිත වූ උද්දේස සහිත වූ අනේකවිධ පූර්වේනිවාස සිහි කෙරෙයි. උදායි, යම් දහමක් ප්‍රත්‍යක්‍ෂ කිරීම හේතු කොට භික්‍ෂූහු මා කෙරෙහි බඹසර සෙරෙත් ද, මෙ ද එබඳු උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් දහමෙකි.

හෙ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදත අනාඞගණ විගතෝපක්ලේශ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පත් කල්හි සත්ත්වයන් ගේ ච්‍යුති උපප්‍රාප්ති ඥනයට සිත නමයි. හේ මිනිසැස ඉක්ම සිටි විශුද්ධ වූ දිවැසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ මනා පැහැසටහන් ඇති නොමනා පැහැසටහන් ඇති සුඥර ගති ඇති දුගති ඇති සත්ත්වයන් දකි. . . . . කර්මානුකූල වැ ගිය සත්ත්වයන් දනි. උදායි, යම් දහමක් ප්‍රත්‍යක්ෂ කිරීම හේතු කොට භික්‍ෂූහු මා කෙරෙහි බඹසර වෙසෙත් ද, මෙ ද එබඳු උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් දහමෙකි.

හෙ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදත අනාඞගණ විගතෝපක්ලේශ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පත් කල්හි ආස්‍රවයන් ගේ ක්‍ෂයඥනයට සිත නමයි. හෙ මේ (පස්කඳ) දුකැ'යි ඇති සැටියෙන් දනගනී. මෙ (තෘෂ්ණාසමුදය) දුක් උපදනා හේතුව යයි ඇති සැටියෙන් දනගනී, . . . මෙ දුක්ඛනිරොධ යයි . . . මෙ දුක් නැති කරන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනගනී. මොහු ආස්‍රවහ'යි ඇති සැටියෙන් දනගනී. මේ' ආස්‍රවසමුදය'යි . . . 'මේ ආස්‍රව නිරෝධය'යි . . . . 'මේ ආස්‍රවනිරෝධගාමිනිප්‍රතිපද'යයි ඇති සැටියෙන් දනගනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු ගේ සිත කාමාස්‍රවයෙනුදු විමුක්ත වෙයි, භවාස්‍රවයෙනුදු සිත විමුක්ත වෙයි, අවිද්‍යාස්‍රව යෙනුදු සිත විමුක්ත වෙයි. විමුක්ත කල්හි විමුක්ත ය යන ඥනය වෙයි. ජාතිය ක්‍ෂය වූ යැ, මහබඹසර වැස නිමවන ලදි, කරණී කරනලද, මෙ බව පිණිස අන් කිසෙක් නැතැ'යි දනගනී. උදායි, යම් දහමක් ප්‍රත්‍යක්ෂ කිරීම හේතුයෙන් භික්‍ෂූහු මා කෙරෙහි බඹසර වෙසෙත් ද, මේ වූකලි එබඳු උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් දහමෙකි. උදායි, යම් ධර්ම කෙනකුන් ගේ ප්‍රත්‍යක්ෂ කිරීම හේතුයෙන් භික්‍ෂූහු මා කෙරෙහි බඹසර වෙසෙත් නම් මොහු එ උත්තරිතර වූ ත් ප්‍රණීතතර වූ ත් ධර්මයෝ යයි.

මෙසේ වදළ කල්හි සකුලුදායි පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල වදන් කී : ඉතා මැනැව වහන්ස, ඉතා මැනැවැ වහන්ස. වහන්ස, යම්සේ යටිහුරු කරන ලද්දක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් වූවක් හෝ විවර කරන්නේ ද, මුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, අඳුරෙහි හෝ 'ඇස් ඇත්තාහු රූප දකිත්ව'යි තෙල්පහනක් දරන්නේ ද, එසෙයින් මැ භාග්‍යවතුන් විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද. වහන්ස, තෙල මම් බුදුනුදු දහමුදු සඟුනුදු සරණ කොට යෙමි. වහන්ස, මම් භාග්‍යවතුන් වෙත පැවිදි ලබන්-නෙම් මැනැව, උපසපුව ලබන්නෙම් මැනැවැ'යි.

එවං වුත්තෙ සකුලුදායිස්ස පරිබ්බාජකස්ස පරිසා සකුලුදායිං පරිබ්බාජකං එතදවොච: මා භවං උදායි, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චරි, මා භවං උදායි, ආචරියො හුත්වා අන්තෙවාසීවාසං වසි. සෙය්‍යථාපි නාම උදකමණිකො[1] හුත්වා උදඤ්චනිකො[2] අස්ස. එවං සම්පදමිදං[3] හොතො උදායිස්ස භවිස්සති. මා භවං උදායි සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චරි. මා භවං උදායි ආචරියො හුත්වා අන්තෙවාසීවාසං වසීති. ඉති හිදං සකුලුදායිස්ස පරිබ්බාජකස්ස පරිසා සකුලුදායිං පරිබ්බාජකං අන්තරායමකාසි භගවති බ්‍රහ්මචරියෙති.

චූළසකුලුදායිසුත්තං නවමං.

---

1. මණිකො - PTS.
2. උදෙඤ්චනිකො - ස්‍යා, PTS
3. සම්පදමෙකං - PTS.

මෙසේ කී කල්හි සකුලුදායී පරිබ්‍රාජක ගේ පිරිස සකුලුදායී පරිබ්‍රාජකහට තෙල වදත් කී : භවත් උදායී, ශ්‍රමණ ගෞතම කෙරෙහි නහමක් බඹසර වසව, භවත් උදායී ආචාර්‍ය්‍ය වැ (සිට) අතැවැසිවස් නො වසව, යම්සේ නම් දියසැළක් වැ සිට එවක් වන්නේ ද තෙල භවත් උදායීහට මෙබඳු උපමා සම්පත් වන්නේ යැ. භවත් උදායී, ශ්‍රමණ ගෞතම කෙරෙහි නහමක් බඹසර වසව, භවත් උදායී, ආචාර්‍ය්‍ය වැ සිට අතැවැසි වාස නො කරව'යි. මෙසේ සකුලුදායී පරිබ්‍රාජක ගේ පිරිස සකුලුදායී පරිබ්‍රාජක හට භාග්‍යවතුන් කෙරෙහි බඹසරවස්හි අන්තරාය කළා.

නව වැනි චූළසකුලුදායි සූත්‍ර යි.

---

2. 3. 10

වෙඛනස්ස සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො වෙඛනසො[1] පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො වෙඛනසො[1] පරිබ්බාජකො භගවතො සන්තිකෙ උදානං උදානෙසි : 'අයං පරමො වණ්ණො, අයං පරමො වණ්ණො'ති.

කිං පන ත්වං කච්චාන, එවං වදෙසි: 'අයං පරමො වණ්ණො අයං පරමො වණ්ණො'ති. කතමො කච්චාන, සො පරමො වණ්ණො'ති?

යස්මා භො ගොතම වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති.

කතමො පන සො කච්චාන, වණ්ණො යස්මා වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථීති?

යස්මා භො ගොතම, වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණොති.

දීඝාපි ඛො තෙ එසා කච්චාන, ඵරෙය්‍ය. යස්මා භො ගොතම, වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි. සො පරමො වණ්ණොති වදෙසි. තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසි. සෙය්‍යථාපි කච්චාන, පුරිසො එවං වදෙය්‍ය: අහං යා ඉමස්මිං ජනපදෙ ජනපද-කල්‍යාණී, තං ඉච්ඡාමි තං කාමෙමී'ති. තමෙනං එවං වදෙය්‍යුං : අම්භො පුරිස, යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි, ජානාසි ත්වං ජනපද-කල්‍යාණී ඛත්තියී වා බ්‍රාහ්මණී වා, වෙස්සී වා සුද්දී වා'ති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය. තමෙනං වදෙය්‍යුං : අම්භො පුරිස, යං ත්වං ජනපද-කල්‍යාණිං ඉච්ඡසි කාමෙසි, ජානාසි ත්වං ජනපදකල්‍යාණිං එවන්නාමා එවංගොත්තා ඉති වා'ති. -පෙ- දීඝා වා රස්සා වා, මජ්ඣිමා වා, කාළී වා සාමා වා, මඞ්ගුරච්ඡවී වා'ති? අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වා'ති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස, යං ත්වං න ජානාසි න පස්සසි, තං ත්වං ඉච්ඡසි කාමෙසීති? ඉති පුට්ඨො ආමාති වදෙය්‍ය. තං කිං මඤ්ඤසි කච්චාන, නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී'ති?

අද්ධා ඛො භො ගොතම, එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටි-හීරකතං භාසිතං සම්පජ්ජතීති.

---

1. වෙඛනසො – මජසං, වෙඛණසො – ස්‍යා.

Free Distribution www.aathaapi.org

2. 3. 10
වෙඛනස්ස සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන නම් වූ අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි වෙඛනස්ස පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් හා සමග සතුටු විය. සතුටුවියයුතු කාලාන්තරයෙහි සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් වැ සිටියේ යැ. එකත්පස් වැ සිටි වෙඛනස්ස පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ‹මේ පරම (උත්තම) වර්‍ණ යැ මේ පරමවර්‍ණ යැ'යි උදනයක් කෙළේ යැ.

කාත්‍යායනයෙනි, තෙපි 'මේ පරමවර්‍ණ යැ මේ පරමවර්‍ණ යැ'යි මෙසේ කුමට කියව කාත්‍යායනයෙනි, ඒ පරමවර්‍ණ කවරේ ද?යි.

භවත් ගෞතමයෙනි, යම් වර්‍ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වර්‍ණයෙක් නැද්ද, හේ පරමවර්‍ණ යැ'යි.

කච්චානයෙනි, යම් වර්‍ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වර්‍ණයෙක් නැත් නම් ඒ වර්‍ණය කවරේ ද?යි.

භවත් ගෞතමයෙනි, යම් වර්‍ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වර්‍ණයෙක් නැද්ද, ඒ පරමවර්‍ණ යැ'යි.

භවත් කාත්‍යායනයෙනි, (තෙපි) ''භවත් ගෞතමයෙනි යම් වර්‍ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අනෙක් වර්‍ණයෙක් නැද්ද, ඒ 'පරමවර්‍ණ යැ'යි කියව, ඒ වර්‍ණය ද නො පනවව, තොප ගේ තෙල කථාව දික් වැ යන්නේ යැ. යම්සේ කාත්‍යායනයෙනි, පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ : ''මට මෙ දනව්යෙහි යම් දනව්කලණක් ඇත් නම් ඇය රුස්නෙමි, ඇය කැමැත්තෙමි''යි. ඒ මොහුට කිසි කෙනෙක් මෙසේ කියන්නාහ : ''එම්බා පුරුෂය, තෙපි යම් දනව්කලණක් රුස්නවු ද කැමැත්තවු ද, තෙපි දනවුකලණ ක්ෂත්‍රියාවක හෝ බ්‍රාහ්මණියක හෝ වෛශ්‍යාවක හෝ ශූද්‍රියක හෝ'යි දනිවු ද?යි. මෙසේ පුළුවුස්නා ලද්දේ නො දනිමි කියන්නේ යැ. ඒ මොහුට මෙසේ කියන්නාහ : ''එම්බා පුරුෂය, තෙපි යම් දනව්කලණක් රුස්නවු ද කැමැත්තවු ද, තෙපි දනව්කලණ මෙ නම් ඇත, මෙවන් ගෝත්‍ර ඇතැ යි හෝ . . . දික් යැ හෝ මිටි යැ හෝ මැදුම් යැ හෝ කැළි යැ හෝ සම්වනැ හෝ මඟුරුසිවි ඇත්තී යැ හො'යි, අසුවල් ගම්හි යැ හෝ නියම්ගම්හි යැ හෝ නුවරෙහි යැ හො'යි දනිවු ද?යි මෙසේ පුළුවුස්නා ලද්දේ නො දනිමි කියන්නේ යැ. මොහුට මෙසේ කියන්නාහ : එම්බා පුරුෂය, තෙපි යම් තැනැත්තියක නො දන්නවු නම් නො දක්නවු නම් ඇය තෙපි රුස්නවු ද, කැමැත්තවු ද?යි මෙසේ පුළුවුස්නා ලද්දේ එසේ යැ'යි කියන්නේ යැ. කාත්‍යානයෙහි ඒ කිමැ'යි හඟිවු ද? මෙසේ ඇති කල්හි ඒ පුරුෂයා ගේ භාෂිතය නිරර්‍ථක වන්නේ නො වේ ද?යි,

භවත් ගෞතමයෙනි, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් මැ ඒ පුරුෂයාගේ භාෂිතය නිරර්‍ථක වන්නේ මැ යි.

එවමෙව බො ත්වං කච්චාන, යස්මා හො ගොතම වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො වා පණීතතරො වා නත්ථි, සො පරමො වණ්ණො'ති වදෙසි, තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසීති.

සෙය්‍යථාපි භො ගොතම, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසති ච තපති ච විරොචති ච[1] එවංවණ්ණො අත්තා හොති අරොගො පරම්මරණාති.

තං කිං මඤ්ඤසි කච්චාන, යො වා මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසති ච තපති ච විරොචති ච[1], යො වා රත්තන්ධකාරතිමිසායං[2] කිමි ඛජ්ජොපණකො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති?

ය්වායං භො ගොතම, රත්තන්ධකාරතිමිසායං[2] කිමි ඛජ්ජොපණකො අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

තං කිං මඤ්ඤසි කච්චාන, යො වා රත්තන්ධකාරතිමිසායං කිමි ඛජ්ජොපණකො, යො වා රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති?

ය්වායං භො ගොතම, රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

තං කිං මඤ්ඤසි කච්චාන, යො වා රත්තන්ධකාරතිමිසායං තෙලප්පදීපො, යො වා රත්තන්ධකාරතිමිසායං මහාඅග්ගික්ඛන්ධො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති?

ය්වායං භො ගොතම, රත්තන්ධකාරතිමිසායං මහා අග්ගික්ඛන්ධො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

තං කිං මඤ්ඤසි කච්චාන, යො වා රත්තන්ධකාරතිමිසායං මහාඅග්ගික්ඛන්ධො, යා වා රත්තියා පච්චූසසමයං විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ඔසධීතාරකා, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති.

ය්වායං භො ගොතම, රත්තියා පච්චූසසමයං විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ඔසධීතාරකා, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

---

1. භාසතෙ ච තපතෙ ච - සීමු, මජ්සං.
තපතෙ ච - සීමු.
භාසතෙව තපතෙව විරොචතෙව - ස්‍යා.
2. රත්තන්ධකාරතිමිසාය - මජ්සං, ස්‍යා, PTS.

එසෙයින් මැ කාත්‍යායනයෙනි, තෙපි ''භවත් ගෞතමයෙනි, යම් වර්ණයකට වඩා උත්තරිතර වූ හෝ ප්‍රණීතතර වූ හෝ අන්‍යවර්ණයෙක් නැත් ද ඒ 'පරමවර්ණ යැ'යි කියව, ඒ වර්ණය ද නො පනවව'යි.

යම්සේ භවත් ගෞතමයෙනි, සුන්දර වූ ජාතිමත් වූ අටැස් ඇති වෛරෑඩීමණික් මැනැවින් පිරියම් කරන ලද්දේ පඬුඇඹුලෙකැ (රත් පලසෙකැ) බහාලන ලද්දේ බබළන්නේත් දිප්ත වන්නේත් වෙසෙසින් දිප්ත වන්නේත් වේ ද, මෙබඳු වර්ණ ඇති ආත්මය මරණින් මතු ආරෝග වේ යයි.

කාත්‍යායනයෙනි, ඒ කිමැ'යි හඟිවු ද? සුන්දර වූ ජාතිමත් වූ අටැස් ඇති මොනොවට පිරියම් කළ යම් වෛරෑඩීමණික් පඬුඇඹුලෙකැ බහන ලද්දේ බබළන්නේත් දිප්ත වන්නේත් වෙසෙසින් දිප්ත වන්නේත් හෝ වේ ද, රාත්‍රි බහලාන්ධකාරයෙහි යම් කදෝපැණි කෘමියෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ ද?යි.

භවත් ගෞතමයෙනි, රැය බොල් අඳුරෙහි යම් කදෝපැණි කෘමියෙක් වේ ද, මේ තෙමේ මෙ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

කාත්‍යායනයෙනි, ඒ කිමැ'යි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් කදෝපැණි කෘමියෙක් හෝ වේ ද, රැය බොල් අඳුරෙහි යම් තෙල්පහනෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ ද?යි.

භවත් ගෞතමයෙනි, රැය බොල් අඳුරෙහි යම් තෙල්පහනෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

කාත්‍යායනයෙනි, ඒ කිමැ'යි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් තෙල්පහනෙක් හෝ වේ ද, රැය බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ ද?යි.

භවත් ගෞතමයෙනි, රැය. බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

කාත්‍යායනයෙනි, ඒ කිමැ'යි හඟිවු ද? රැය බොල් අඳුරෙහි යම් මහගිනිකඳෙක් හෝ වේ ද, රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි යම් ඕසධී (පහන්) තාරකාවක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ ද?යි.

භවත් ගෞතමයෙනි, රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි යම් ඔසධීතාරකාවක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් අතිශයින් සුන්දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

තං කිං මඤ්ඤසි කච්චාන, යා වා රත්තියා පච්චූසසමයං විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ඔසධීතාරකා, යො වා තදහුපොසථෙ පණ්ණරසෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො[1] අඩ්ඪරත්තසමයං චන්දො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති?

ය්වායං භො ගොතමො, තදහුපොසථෙ පණ්ණරසෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදො[1] අඩ්ඪරත්තසමයං චන්දො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

තං කිං මඤ්ඤසි කච්චාන, යො වා තදහුපොසථෙ පණ්ණරසෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදෙ අඩ්ඪරත්තසමයං චන්දො, යො වා වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදෙ මජ්ඣන්තිකසමයං සුරියො, ඉමෙසං උභින්නං වණ්ණානං කතමො වණ්ණො අභික්කන්තතරො ච පණීතතරො චාති?

ය්වායං භො ගොතම, වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ අභිදෙ මජ්ඣන්තිකසමයං සුරියො, අයං ඉමෙසං උභින්නං වණ්ණානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

අතො ඛො[2] තෙ කච්චාන, බහූ හි බහුතරා දෙවා, යෙ ඉමෙසං චන්දිමසුරියානං ආභා නානුභොන්ති, ත්‍යාහං පජානාමි. අථ ච පනාහං න වදමි: යස්මා වණ්ණා අඤ්ඤො වණ්ණො උත්තරිතරො ච පණීතතරො ච නත්ථීති. අථ ච පන ත්වං කච්චාන, ය්වායං වණ්ණො කිමිනා ඛජ්ජොපනකෙන හීනතරො[3] ච පතිකිට්ඨතරො ච සො පරමො වණ්ණොති වදෙසි, තඤ්ච වණ්ණං න පඤ්ඤපෙසි.

පඤ්ච ඛො ඉමෙ කච්චාන, කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා-පෙ-ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා-පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා-පෙ-කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො කච්චාන, පඤ්ච කාමගුණා. යං ඛො කච්චාන, ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති කාමසුඛං. ඉති කාමෙහි කාමසුඛං, කාමසුඛා කාමග්ගසුඛං තත්ථ අග්ගමක්ඛායතීති.

එවං වුත්තෙ වෙඛනසො[4] පරිබ්බාජකො භගවන්තං එතදවොච: අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාවසුභාසිතඤ්චිදං[5] භොතා ගොතමෙන: කාමෙහි කාමසුඛං, කාමසුඛා කාමග්ගසුඛං තත්ථ අග්ගමක්ඛායතීති.

---

1. අභිදෙ - සීමු.
2. අථ ඛො - සීමු. තතො ඛො - ස්‍යා
3. නිහීනතරො - මජ්සං, ස්‍යා.
4. වෙඛනසො - මජ්සං. / වෙඛණසො - ස්‍යා.
5. යාවසුභාසිතමිදං - සීමු.

කාත්‍යායනයෙනි, ඒ කිමැ යි හඟිවු ද? රැය අලුයම් වේලෙහි පහ වැ ගිය වලා ඇති බුන් වලා ඇති අහස්හි යම් ඕසධීතාරකාවක් හෝ වේ ද, ඒ පඤුරැසිපොහෝ දවස්හි පහවැ ගිය වලා ඇති බුන් වලා ඇති අහස්හි නුබුන් අඩ්රාත්‍රිසමයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් ඉතා සුන්‍දරතරත් ප්‍රණීතතරත් වේ දැ?යි.

භවත් ගෞතමයෙනි, ඒ පඤුරැසිපොහෝ දවස්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි නුබුන් අඩ්රාත්‍රියෙහි යම් චන්ද්‍රයෙක් වේ ද, මේ මෙ වර්ණ දෙක අතුරින් ඉතා සුන්‍දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

කාත්‍යායනයෙනි, ඒ කිමැ යි හඟිවු ද? ඒ පඤුරැසි පොහෝ දවස්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි නුබුන් අඩ්රාත්‍රිසමයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේ ද, වර්ෂාසෘතුව පිළිබඳ පශ්චිමමාසයෙහි සරා කල්හි පහ වැ ගිය වලා ඇති දුරු වූ වලා ඇති අහස්හි නුබුන් මධ්‍යාහ්නසමයෙහි යම් සූර්‍ය්‍යයෙක් හෝ වේ ද, මේ වර්ණ දෙක අතුරින් කවර වර්ණයෙක් ඉතා සුන්‍දරතරත් ප්‍රණීතතරත් වේ දැ?යි.

භවත් ගෞතමයෙනි, වර්ෂා සෘතුව පිළිබඳ පශ්චිමමාසයෙහි සරා කල්හි පහ වැ ගිය වලා ඇති බුන් වලා ඇති අහස්හි නුබුන් මධ්‍යාහ්න සමයෙහි යම් සූර්‍ය්‍යයෙක් වේ ද, මේ තෙමේ මේ වර්ණ දෙක අතුරින් ඉතා සුන්‍දරතරත් ප්‍රණීතතරත් වේ යයි.

කාත්‍යායනයෙනි, යම් කෙනෙක් මේ සඳහිරු දෙදෙනාගේ අවභාසය නො විඳිත් ද ඒ දෙවියෝ සඳහිරු දෙදෙනාගේ අවභාසය විඳිනවුනට වඩා බොහෝ යැ බහුතරයහ. මම ඔවුන් දනිමි. එතෙකුදු වත් මම ''යම් වර්ණයකට වඩා උත්තරිතර වූ ප්‍රණීතතර වූ අන්‍ය වර්ණයෙක් නැතැ''යි නො කියමි. එතෙකුදු වත් කාත්‍යායනයෙනි, තෙපි කදෝපැණි කෘමියකුටත් වඩා හීනතර වූ ලාමකතර වූ යම් වර්ණයෙක් වේ ද, ඒ 'පරමවර්ණ යැ'යි කියව, ඒ වර්ණය ද නො පනව'යි.

කාත්‍යායනයෙනි, මේ කාමගුණ පසෙක් වෙයි. කවර පසෙක යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාව ඇති කාමෝපසංහිත වූ රාගෝත්පත්තියට කරුණු වූ ඇසින් දතයුතු රූපයෝ යැ . . . . කනින් දතයුතු ශබ්දයෝ යැ, ... නැහැයෙන් දතයුතු ගන්ධයෝ යැ . . . . දිවින් දතයුතු රසයෝ යැ . . . කයින් දතයුතු ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාවය ඇති කාමෝපසංහිත වූ රාගෝත්පත්තියට කරුණු වූ සප්‍රෂ්ටව්‍යයෝ යි. කාත්‍යායනයෙනි, මොහු පස්කම්ගුණයෝ යි. මේ පස්කම්ගුණ නිසා සුව සොමනස් උපදී, මේ කාමසුඛ යැ යි කියනු ලැබේ. මෙසේ කාමයෙන් කාමසුඛය වෙයි. එහි කාමසුඛයට වඩා කාමග්ගසුඛය(නිවන) අග්‍ර යයි කියනු ලැබේ.

මෙසේ වදළ කල්හි වෙඛනස්ස පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කී: ආශ්චර්‍ය්‍ය යැ භවත් ගෞතමයෙනි, අද්භූත යැ භවත්, ගෞතමයෙනි, භවත් ගෞතමයන් විසින් 'කාමයෙන් කාමසුඛය වෙයි, එහි කාමසුඛයට වඩා කාමග්ග සුඛය අග්‍ර යයි කියනු ලැබේ යන මේ සුභාෂිත මැ වේ යි.

දුජ්ජානං ඛො එතං කච්චාන, තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රයොගෙන[1] අඤ්ඤත්‍රාචරියකෙන කාමා වා කාමසුඛං වා කාමග්ගසුඛං වා. යෙ ඛො තෙ කච්චාන, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, තෙ ඛො එතං ජානෙය්‍යුං කාමා වා කාමසුඛං වා කාමග්ගසුඛං වාති.

එවං වුත්තෙ වෙඛනසො පරිබ්බාජකො කුපිතො අනත්තමනො භගවන්තංයෙව ඛුංසෙන්තො භගවන්තංයෙව වම්භෙන්තො භගවන්තංයෙව වදමානො සමණො ච ගොතමො පාපිතො[2] භවිස්සති'ති භගවන්තං එතදවොච: එවමෙව පනිධෙකෙ[3] සමණබ්‍රාහ්මණා අජානන්තා පුබ්බන්තං, අපස්සන්තා අපරන්තං, අථ ච පන: ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාමා'ති පටිජානන්ති[4] තෙසමිදං භාසිතං හස්සකංයෙව සම්පජ්ජති, ලාමකංයෙව සම්පජ්ජති, රිත්තකංයෙව සම්පජ්ජති, තුච්ඡකංයෙව සම්පජ්ජතී'ති.

යෙ ඛො තෙ කච්චාන, සමණබ්‍රාහ්මණා අජානන්තා පුබ්බන්තං අපස්සන්තා අපරන්තං ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමා'ති පටිජානන්ති, තෙසං සොයෙව සහධම්මිකො නිග්ගහො හොති. අපි ච කච්චාන, තිට්ඨතු පුබ්බන්තො, තිට්ඨතු අපරන්තො. එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි, යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො න චිරස්සෙව සාමඤ්ඤෙව ඤස්සති, සාමං දක්ඛිති. එවං කිර සම්මා[5] බන්ධනා විප්පමොක්ඛො හොති යදිදං අවිජ්ජාබන්ධනා[6]. සෙය්‍යථාපි කච්චාන, දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බද්ධො අස්ස සුත්තබන්ධනෙහි, තස්ස වුඩ්ඪිමන්වාය ඉන්ද්‍රියානං පරිපාකමන්වාය තානි බන්ධනානි මුච්චෙය්‍යුං[7] සො මොක්ඛොම්හීති ඛො ජානෙය්‍ය නො ච බන්ධනං. එවමෙව ඛො කච්චාන, එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජුජාතිකො. අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානො න චිරස්සෙව සාමඤ්ඤෙව ඤස්සති. සාමං දක්ඛිති. එවං කිර සම්මා බන්ධනා විප්පමොක්ඛො හොතී යදිදං අවිජ්ජාබන්ධනාති.

---

1. අඤ්ඤත්ථයොගෙන ස්‍යා.
2. පාපිකො - සීමු.
3. පනිධෙකමෙව - මජ්ඣං, ස්‍යා.
4. ඉත්ථත්තායාති පටිජානන්ති - PTS
5. එවං කිරායසම්මා - ස්‍යා.
6. අවිජ්ජාබන්ධනන්ති - සීමු.
7. මුඤ්චෙය්‍යුං - ස්‍යා.

Free Distribution www.aathaapi.org

කාත්‍යායනයෙනි, අන්‍යදෘෂ්ටික වූ අන්‍යලබ්ධික වූ අන්‍යරුචික වූ අන්‍යප්‍රතිපත් ඇති අන්‍යතීර්ථායතනයෙකැ ආචාර්‍ය්‍ය වූ තොප විසින් 'කාමයෝ වෙත්වයි කාමසුඛය වේවයි කාමාග්‍රසුඛය වේවයි' තෙල කරුණු නො දත හැක්ක කාත්‍යායනයෙනි, අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ වැස නිමවූ බඹසරවස් ඇති කළ කරණී ඇති බහා තැබූ බර ඇති පැමිණි සවාර්ථ ඇති ක්‍ෂය වූ භවසංයෝජන ඇති මොනොවට දැන කෙලෙසුන් කෙරෙන් මිදුණු යම් මහණ කෙනෙක් ඇද්ද, ඔහු මැ කාමයෝ හෝ කාමසුඛය හෝ කාමාග්‍රසුඛය හෝ තෙල කරුණ දන්නාහ'යි.

මෙසේ වදළ කල්හි වෙඛනස්ස පරිබ්‍රාජක කිපියේ නො සතුටුයිත් ඇත්තේ භාග්‍යවතුන් මැ ගටමින් භාග්‍යවතුන්ට මැ පරිභව බෙණෙමින් භාග්‍යවතුන්ට මැ කියනුයේ : ශ්‍රමණ ගෞතම ද නො දන්නාබවට පමුණුවනලද වනැ'යි භාග්‍යවතුන්ට තෙල වදන් කී : මෙසෙයින් මැ මෙලොවැ ඇතැම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තය නො දන්නාහු අපරාන්තය නො දක්නාහු, එතෙකුදු වත් ජාතිය ක්ෂය වූ යැ, බඹසර වැස නිමවනලද, කරණී කරනලද, මෙබවට කළයුතු අන් කිසෙක් නැතැ'යි දනුම්හ'යි පිළිත කෙරෙත්. ඔවුන් ගේ මේ භාෂිතය හාස්‍යයක් මැ උපදවයි, ලාමකබවක් මැ උපදවයි, අර්ථශූන්‍ය බවක් මැ උපදවයි, සිස් බවක් මැ උපදවා යයි.

කාත්‍යායනයෙනි, යම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තය නො දන්නාහු අපරාන්තය නො දක්නාහු 'ජාතිය ක්ෂය වූ යැ, බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මෙබවට අන් කිසෙක් නැතැ'යි දනුම්හ'යි පිළිත කෙරෙත් ද, ඔවුනට එ මැ සකාරණ නිග්‍රහ වෙයි. එතෙකුදු වත් කාත්‍යායනයෙනි, පූර්වාන්තය සිටිවා, අපරාන්තය සිටිවා, ශඨ නො වූ මායා නැති ඍජුස්වභාව ඇති නුවණැති පුරුෂ ඒවා, මම් අනුශාසනා කෙරෙමි, මම් දහම් දෙසමි, අනුශාසනා කළ සේ පිළිපදනේ නොබෝ කලෙකින් මැ 'මේ අවිද්‍යාබන්ධනයෙන් මෙසේ මොනොවට මිදෙන්නේ වේ ල'යි තෙමේ මැ දන්නේ යැ තෙමේ දක්නේ යැ. යම්සේ කාත්‍යායනයෙනි, බොළඳ වූ උඩුකුරු වැ හෝනා ළදරු කුමරෙක් හුබඳනෙන් කණ්ඨය පස්වනු කොට ඇති බැඳුමින් බඳනා ලද වේ ද, වෘද්ධියට පැමිණ ඉන්ද්‍රිය පරිපාකයට පැමිණ ඔහුගේ ඒ බන්ධනයෝ මිදෙන්නාහු ද, හේ මිදුණෙමි'යි දන්නේ ද, බන්ධනය නො දන්නේ ද, එසෙයින් මැ කාත්‍යායනයෙනි, සළ නො වූ මායා නැති ඉදු සැහැවි ඇති නුවණැති පුරුෂ ඒවා, මම් අනුසස්මි, මම් දහම් දෙසමි, අනුශාසිත සේ පිළිපදනේ නොබෝ කලෙකින් මැ 'මෙසේ මේ අවිද්‍යාබන්ධන සඞ්ඛ්‍යාත බන්ධනයෙන් මොනොවට මිදෙන්නේ වේ ල'යි තෙමේ මැ දන්නේ යැ තෙමේ දක්නේ යැ'යි.

27—මක් 13561 (11/72)

Free Distribution www.aathaapi.org

එවං වුත්තෙ වේඛනසෙ පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණඞ්ගතන්ති.

වෙඛනස්සසුත්තං දසමං

පරිබ්බාජකවග්ගො තතියො

තස්ස වග්ගස්ස උද්දානං

පුණ්ඩරී අග්ගි සභා කපිනාමො, දීඝනඛො පුන භාරද්වාජගොත්තො සන්දක උදායි මණ්ඩිකපුත්තො, මණිකො තථා කච්චානො වරවග්ගො.

---

*පුණ්ඩරී අග්ගි සමාකපිනාමො දීඝනඛො පුන භාරද්වාජ ගොත්තො. සන්දක උදායි මුණ්ඩිකපුත්තො මණිකො තථා කච්චානො වරවග්ගො-මජ්ඣං.

මෙසේ වදාළ කල්හි වෙඛනස්ස පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට මෙල වදාත් කී: ''භවත් ගෞතමයෙනි, ඉතා කාන්ත යෑ, භවත් ගෞතමයෙනි, ඉතා කාන්ත යෑ, ... භවත් ගෞතමයෝ මා අද පටන් දිවිහිම් කොට සරණගිය උවසුවකු කොට ධරත්වා'යි.

දස වැනි වෙඛනස්ස සූත්‍ර යි.

තුන් වැනි පරිව්‍රාජක වර්ගය යි.

එහි උද්දානය :

පුණ්ඩරීක (තෙවිජ්ජවච්ඡගොත්ත) සූත්‍ර යෑ අග්ගිවච්ඡගොත්ත සූත්‍ර යෑ සහකථී (මහා වච්ඡගොත්ත) සූත්‍ර යෑ දීඝනඛ සූත්‍ර යෑ භාරද්වාජගොත්ත (මාගන්දිය) සූත්‍ර යෑ සන්දක සූත්‍ර යෑ උදායි (මහාසකුළුදායි) සූත්‍ර යෑ මණ්ඩිකාපුත්ත (සමණමණ්ඩිකා) සූත්‍ර යෑ මණික (චූළ සකුළුදායි) සූත්‍ර යෑ කච්චාන (වෙඛනස්ස) සූත්‍ර යි.

---

4. රාජවග්ගො

2. 4. 1

ඝටිකාරසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: ‘කො නු ඛො හෙතු, කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය, න අකාරණෙ[1] තථාගතා සිතං පාතුකරොන්තී’ති. අථ ඛො ආයස්මා ආනන්දො එකංසං චීවරං[2] කත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: ‘කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය, න අකාරණෙ[1] තථාගතා සිතං පාතුකරොන්තී’ති.

භූතපුබ්බං ආනන්ද, ඉමස්මිං පදෙසෙ වෙහලිඞ්ගං[3] නාම ගාමනිගමො අහොසි ඉද්ධො චෙව ඵීතො ච බහුජනො ආකිණ්ණමනුස්සො. වෙහලිඞ්ගං[3] ඛො ආනන්ද, ගාමනිගමං කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො උපනිස්සාය විහාසි. ඉධ සුදං ආනන්ද, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ආරාමො අහොසි, ඉධ සුදං ආනන්ද කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො නිසින්නකො භික්ඛුසඞ්ඝං ඔවදතීති.

අථ ඛො ආයස්මා ආනන්දො චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා භගවන්තං එතදවොච: තෙන හි භන්තෙ, භගවා නිසීදතු, එවා’යං භූමිප්පදෙසො ද්වීහි අරහන්තෙහි සම්මාසම්බුද්ධෙහි පරිභුත්තො භවිස්සතී’ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි:

‘භූතපුබ්බං ආනන්ද, ඉමස්මිං පදෙසෙ වෙහලිඞ්ගං නාම ගාමනිගමො අහොසි ඉද්ධො චෙව ඵීතො ච බහුජනො ආකිණ්ණමනුස්සො. වෙහලිඞ්ගං ඛො ආනන්ද, ගාමනිගමං කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො උපනිස්සාය විහාසි. ඉධ සුදං ආනන්ද, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ආරාමො අහොසි. ඉධ සුදං ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො නිසින්නකො භික්ඛුසඞ්ඝං ඔවදති.

වෙහලිඞ්ගෙ ඛො ආනන්ද ගාමනිගමෙ ඝටිකාරො නාම කුම්භකාරො කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. ඝටිකාරස්ස ඛො ආනන්ද, කුම්භකාරස්ස ජොතිපාලො නාම මාණවො සහායො අහොසි පියසහායො. අථ ඛො ආනන්ද, ඝටිකාරො කුම්භකාරො ජොතිපාලං මාණවං ආමන්තෙසි: ‘ආයාම සම්ම

---

1. න අකාරණෙන - මජසං, ස්‍යා, PTS. 2. උත්තරාසඞ්ගං - ස්‍යා.

3. { වෙගලිඞ්ගං - මජසං.
   { වෙහලිඞ්ගං - ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

4. රාජවර්ගය

2. 4. 1
ඝටීකාර සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් වූ සඟපිරිස් හා සමඟ කොසොල් දනව්වෙහි සැරි සරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මඟින් බැහැර ව එක්තරා පියෙසෙක්හි දී සිනා පහළ කළ සේක. එකල්හි ආයුෂ්මත් ආනඳ තෙරුන්ට මෙවන් සිතෙක් විය : "භාග්‍යවතුන් වහන්සේගේ සිනා පාළ කිරීමට හේතු කවරේ යැ? ප්‍රත්‍යය කවරේ යැ? බුදුහු නො කරුණෙහි සිනා පාළ නො කෙරෙති"යි. ඉක්බිති ආයුෂ්මත් ආනඳ තෙරණුවෝ උතුරුසඟ එකස් කොට බුදුන් දසට ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට තෙල වදන් කීහ : "වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ සිනා පාළ කිරීමට හේතු කවරේ යැ? ප්‍රත්‍යය කවරේයැ ? බුදුහු නො කරුණෙහි සිනා පහළ නො කෙරෙත් නු?"යි.

ආනන්‍දය, යටගිය දවස මෙ පෙදෙස්හි 'වෙහලිඞ්ග' නම් වූ සමෘද්ධ වූ සැපත් පිරුණු බොහෝ ජනයා ඇති මිනිසුන් ගැවැසිගත් නිගමයෙක් වී. ආනන්‍දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප බුදුහු වෙහලිඞ්ග නිගමය නිසා වැඩවිසූහ. ආනන්‍දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප බුදුහු මෙතැන්හි වැඩහිඳ බික්සඟනට ඔවා දෙන සේකැ'යි.

එකල්හි ආයුෂ්මත් ආනඳ තෙරණුවෝ සඟළ සිවුර සියුඟුණ කොට පනවා භාග්‍යවතුන් වහන්සේට තෙල වදන් කීහ : "වහන්ස, එසේ වී නම් භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳුනා සේක්වා, මෙසෙයින් මෙ බිම්පෙදෙස අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දෙදෙනකුන් විසින් පරිභෝග කරනලද වන්නේ යැ"යි. බුදුහු පැනවූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ බුදුහු ආයුෂ්මත් ආනඳ තෙරුන් ඇමැතූසේක :

"ආනන්‍දය, යටගිය දවස මෙ පෙදෙස්හි 'වෙහලිඞ්ග' නම් වූ සමෘද්ධ වූ ඉතා සමෘද්ධ වූ බොහෝ ජනයා ඇති මිනිසුන්ගෙන් ගැවැසීගත් නිගමයෙක් වී. ආනන්‍දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප බුදුහු වෙහලිඞ්ග නිගමය නිසා විසූසේක. ආනන්‍දය, මෙතැන්හි අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප බුදුන්ට ආරාමයෙක් වී. ආනන්‍දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප බුදුහු මෙහි වැඩහිඳ බික්සඟනට ඔවා දෙති.

ආනන්‍දය, වෙහලිඞ්ග නම් නිගම ග්‍රාමයෙහි ඝටීකාර නම් කුම්භකාර අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හට උපස්ථායක වී, එ ද අග්‍රෝපස්ථායක යි. ආනන්‍දය, ඝටීකාර කුම්භකාරයාහට ජෝතිපාල නම් මණවු යහළු වී, එ ද ප්‍රියසහාය යි. ඉක්බිති ආනන්‍දය, ඝටීකාර කුම්භකාර තෙමේ ජෝතිපාල මණවු ඇමැතී : "යම්හ යහළු ජෝති-පාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවතුන් වහන්සේ දක්නට එළැඹෙම්හ.

ජෝතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම. සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සා’ති. එවං වුත්තෙ ආනන්ද, ජෝතිපාලො මාණවො ඝටීකාරං කුම්භකාරං එතදවොච: ‘අලං සම්ම ඝටීකාර, කිං පන තෙන මුණ්ඩකෙන සමණකෙන දිට්ඨෙනා’ති? දුතියම්පි ඛො ආනන්ද —පෙ— තතියම්පි ඛො ආනන්ද, ඝටීකාරො කුම්භකාරො ජෝතිපාලං මාණවං එතදවොච: ‘ආයාම සම්ම ජෝතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම. සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සා’ති. තතියම්පි ඛො ආනන්ද, ජෝතිපාලො මාණවො ඝටීකාරං කුම්භකාරං එතදවොච: ‘අලං සම්ම ඝටීකාර, කිං පන තෙන මුණ්ඩකෙන සමණකෙන දිට්ඨෙනා’ති. තෙන හි සම්ම ජෝතිපාල, සොත්තිං සිනානිං[1] ආදාය නදිං ගමිස්සාම සිනායිතුන්ති. එවං සම්මා’ති ඛො ආනන්ද, ජෝතිපාලො මාණවො ඝටීකාරස්ස කුම්භකාරස්ස පච්චස්සොසි. අථ ඛො ආනන්ද, ඝටීකාරො ච කුම්භකාරො ජෝතිපාලො ච මාණවො සොත්තිං සිනානිං[1] ආදාය නදිං අගමංසු සිනායිතුං.

අථ ඛො අනන්ද, ඝටීකාරො කුම්භකාරො ජෝතිපාලං මාණවං ආමන්තෙසි: අයං සම්ම ජෝතිපාල, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අවිදූරෙ ආරාමො, ආයාම සම්ම ජෝතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම. සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සා’ති.

එවං වුත්තෙ ආනන්ද ජෝතිපාලො මාණවො ඝටීකාරං කුම්භකාරං එතදවොච: අලං සම්ම ඝටීකාර, කිං පන තෙන මුණ්ඩකෙන සමණකෙන දිට්ඨෙනා’ති? දුතියම්පි ඛො අනන්ද -පෙ- තතියම්පි ඛො අනන්ද ඝටීකාරො කුම්භකාරො ජෝතිපාලං මාණවං එතදවොච: අයං සම්ම ජෝතිපාල, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අවිදූරෙ ආරාමො. ආයාම සම්ම ජෝතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම. සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සා’ති. තතියම්පි ඛො අනන්ද, ජෝතිපාලො මාණවො ඝටීකාරං කුම්භකාරං එතදවොච: අලං සම්ම ඝටීකාර, කිං පන තෙන මුණ්ඩකෙන සමණකෙන දිට්ඨෙනා’ති?

අථ ඛො ආනන්ද, ඝටීකාරො කුම්භකාරො ජෝතිපාලං මාණවං ඔවට්ටිකාය[2] පරාමසිත්වා එතදවොච: අයං සම්ම ජෝතිපාල, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අවිදූරෙ ආරාමො, ආයාම සම්ම ජෝතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සා’ති.

අථ ඛො ආනන්ද, ජෝතිපාලො මාණවො ඔවට්ටිකං විනිවෙඨෙත්වා[3] ඝටීකාරං කුම්භකාරං එතදවොච: අලං සම්ම ඝටීකාර, කිං පන තෙන මුණ්ඩකෙන සමණකෙන දිට්ඨෙනාති?

---

1. සොත්තිසිනානිං - මජසං. / සොත්තිසිනානං - ස්‍යා.
2. ඔවට්ටිකායං - මජසං.
3. විනිවෙඨෙත්වා - මජසං.

අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භගවත්හුගේ දැක්ම මා විසින් සාධු සම්මත වේ''යයි. ආනන්‍දයෙනි, මෙසේ කී කල ජෝතිපාල මාණවක ඝටිකාර කුම්භකාරහට මෙසේ තෙල බස් කී : ''යහළු ඝටිකාරය, කම් නැත, දුටු ඒ මුඩුමහණහු විසින් කිනම් වැඩෙක් වේ ද?''යි. ආනන්‍දයෙනි, දෙවනවට ද . . . ආනන්‍දයෙනි, තුන්වනවට ද ඝටිකාර කුම්භකාර ජෝතිපාල මාණවකහට තෙල බස් කී : ''යම්හ යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දක්නා සඳහා එළැඹෙම්හ. අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් දැක්ම මා විසින් සාධුසම්මත වේ''යයි. ආනන්‍දය, තුන්වනවට ද ජෝතිපාල මණෙවු ඝටිකාර කුම්භකාරයාහට තෙල බස් කී : ''යහළු ඝටිකාරය, කම් නැත, දුටු ඒ මුඩුමහණහු විසින් කිනම් වැඩෙක් වේ ද?''යි. යහළු ජෝතිපාලයෙනි, ඉදින් එසේ වී නම් නහනුවස් කළ කුරුඳුවැළ ගෙන නහනු සඳහා ගොයට යම්හ. ආනන්‍දයෙනි, ජෝතිපාල මාණවක 'යහළුව, එසේ මැනැවැ'යි ඝටිකාර කුම්භකාරහට පිළිවදන් ඇස්වී. ඉක්බිති ආනන්‍දයෙනි, ඝටිකාර කුම්භකාර ද ජෝතිපාල මාණවක ද නහන කුරුඳුවැළ ගෙන නහනු සඳහා ගොයට ගියෝ.

ඉක්බිති ආනන්‍දයෙනි, ඝටිකාර කුම්භකාර තෙමේ දෝපල් මණෙවු ඇමැතී : ''යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හුගේ මේ අරම නුදුරෙහි ඇත. යම්හ යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දක්නට එළැඹෙම්හ. අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ දැක්ම මා විසින් සාධු සම්මත වේ'' යයි.

ආනන්‍දයෙනි, මෙසේ කී කල්හි ජෝතිපාල මාණවක තෙමේ ඝටිකාර කුම්භකාරහට තෙලබස් කී : ''යහළු ඝටිකාරය, පිළිකෙව් කරමි. දක්නා ලද ඒ මුඩු මහණහු විසින් කිනම් වැඩ වේ ද?''යි. ආනන්‍දයෙනි, දෙවනවට ද . . . ආනන්‍දයෙනි, තුන්වනවට ද ඝටිකාර කුම්භකාර තෙමේ දෝපල් මණෙවු හට තෙල බස් කී : ''යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුබු බුදුන්ගේ මේ අරම අසල ඇත. යම්හ යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් දක්නා සඳහා එළැඹෙම්හ. අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භගවත්හුගේ දස්න මා විසින් සාධුසම්මත යැ''යි. ආනන්‍දයෙනි, තුන්වනවට ද ජෝතිපාල මාණවක තෙමේ ඝටිකාර කුම්භකාරහට තෙල බස් කී : ''යහළු ඝටිකරය, කම් නැත, දක්නා ලද ඒ මුඩු මහණහු විසින් කවර වැඩ වේ ද?''යි.

එ සඳ ආනන්‍දය, ඝටිකාර කුම්භකාර තෙමේ හිස ඉණකඩ අත්ලා ගෙන තෙල බස් කී : ''යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ගේ මේ අරම අසලෙහි ඇත, යම්හ යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුබු බුදුන් දක්නට එළැඹෙම්හ. අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් වහන්සේගේ දැක්ම මා විසින් සාධු සම්මත ය''යි.

ඉක්බිති ආනන්‍දයෙනි, ජෝතිපාල මාණවක තෙමේ හිස ඉණකඩ මුදගෙන ඝටිකාර කුම්භකාරයාහට තෙල බස් කී : ''යහළු ඝටිකාරය, පිළිකෙව් කරමි. දක්නාලද ඒ මුඩු මහණහු විසින් කිමැ''යි.

අථ ඛො ආනන්ද, ඝටීකාරෙ කුම්භකාරෙ ජොතිපාලං මාණවං සසීසං නහාතං[1] කෙසෙසු පරාමසිත්වා එතදවොච: අයං සම්ම ජොතිපාල, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අවිදූරෙ ආරාමො. ආයාම සම්ම ජොතිපාල, කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය උපසඞ්කමිස්සාම. සාධුසම්මතං හි මෙ තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

අථ ඛො ආනන්ද, ජොතිපාලස්ස මාණවස්ස එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, යත්‍ර හි නාමායං ඝටීකාරෙ කුම්භකාරො ඉත්තරජච්චො සමානො අම්හාකං සසීසං නහාතානං[2] කෙසෙසු පරාමසිතබ්බං මඤ්ඤිස්සති. න වතිදං[3] ඔරකං මඤ්ඤෙ භවිස්සතීති. ඝටීකාරං කුම්භකාරං එතදවොච: යාවෙතදෙහිපි[4] සම්ම ඝටීකාරා'ති. යාවෙතදෙහිපි සම්ම ජොතිපාල, තථා හි පන මෙ සාධුසම්මතං තස්ස භගවතො දස්සනං අරහතො සම්මාසම්බුද්ධස්සාති. තෙන හි සම්ම ඝටීකාර, මුඤ්ච ගමිස්සාමාති.

අථ ඛො ආනන්ද, ඝටීකාරෙ ච කුම්භකාරෙ ජොතිපාලො ච මාණවො යෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ඝටීකාරො කුම්භකාරො කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. ජොතිපාලො පන මාණවො කස්සපෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආනන්ද, ඝටීකාරො කුම්භකාරො කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: අයං මෙ භන්තෙ, ජොතිපාලො මාණවො සහායො පියසහායො, ඉමස්ස භගවා ධම්මං දෙසෙතූ'ති. අථ ඛො ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො ඝටීකාරඤ්ච කුම්භකාරං ජොතිපාලඤ්ච මාණවං ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. අථ ඛො ආනන්ද, ඝටීකාරො ච කුම්භකාරො ජොතිපාලො ච මාණවො කස්සපෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

අථ ඛො ආනන්ද, ජොතිපාලො මාණවො ඝටීකාරං කුම්භකාරං එතදවොච: ඉධස නු ත්වං[5] සම්ම ඝටීකාර, ධම්මං සුණන්තො, අථ ච පන අගාරස්මා න අනගාරියං[6] පබ්බජසීති[7]

නනු මං සම්ම ජොතිපාල, ජානාසි: අන්ධෙ ජිණ්ණෙ මාතාපිතරෙ පොසෙමී'ති?

තෙන හි සම්ම ඝටීකාර, අහං අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමීති.

1. සීසං නහාතං - මජසං. / සීසනහාතං - PTS / සීසනහාතං - ස්‍යා.
2. සීසං නහාතානං - මජසං. / සීසනහතානං - PTS. / සීසනහාතානං - ස්‍යා.
3. න වතිදං කිර - මජසං.
4. යාවතාදෙහිපි - මජසං.
5. ඉමං නු ත්වං - ස්‍යා, PTS, මජසං.
6. ආගාරස්මා අනගාරියං - සීමු, මජසං.
7. පබ්බජිස්සසීති - සීමු, මජසං. පබ්බජ්ජසීති - ස්‍යා.

ඉක්බිත්තෙන් ආනන්‍දයෙනි, ඝටිකාර කුම්භකාර තෙමේ ඉස් සෝද නහා සිටි ජෝතිපාල මාණවක කෙහෙයෙහි ගෙන තෙල බස් කී : "යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ මේ අරම නුදුරෙහි ඇත, යම්හ යහළු ජෝතිපාලයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් දක්නට එළැඹෙම්හ, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ දක්ම මා විසින් සාධු සම්මත ය"යි.

එකල්හි ආනන්‍දයෙනි, ජෝතිපාල මාණවකහට තෙල සිත් වී : "භවත්නි, ආශ්චර්‍ය්‍ය මැ යැ, භවත්නි, අද්භූත මැ යි. යම් හෙයෙකින් මේ ඝටිකාර කුම්භකාර ලාමකජාති ඇත්තේ මැ ඉස් සෝද නහා සිටි අපගේ කෙස්වැටිය ගතයුතු කොට සිතා ද, ඒකාන්තයෙන් මේ අපගේ ගමන ලාමක නො වනසේ"යයි ඝටිකාර කුම්භකාරහට තෙල බස් කී : "යහළු ඝටිකාරයෙනි, (මෙතෙක් ද කෙළෙ) තෙල ගමන් සඳහා මැ වේ ද"යි. "යහළු ජෝතිපාලයෙනි, තෙල ගමන් සඳහා මැ වෙයි. එසේ මැ යැ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ ගේ දස්න මා විසින් සාධුසම්මත යැ"යි කී. යහළු ඝටිකාරයෙනි, එසේ වී නම් කෙහෙ ගැනුම් පියව, යම්හ'යි.

එසද ආනන්‍දයෙනි, ඝටිකාරකුම්භකාර හා ජෝතිපාල මාණවක හා දෙදෙනා අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුබු බුදුන් කරා එළැඹියහ. එළැඹ ඝටිකාර කුම්භකාර තෙමේ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් සකසා වැඳ එකත්පස් වැ හින. ජෝතිපාල මාණවක වනාහි අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් හා සමග සතුටු වී. සම්මොදනායට නිසි සිහි කරනට නිසි කථා කොට නිමවා එකත්පස් වැ හින. ආනන්‍දය, එකත්පස් වැ හුන් ඝටිකාර කුම්භකාර තෙමේ අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හට තෙල සැල කෙළේ: වහන්ස, මේ ජෝතිපාල මාණවක තෙමේ මාගේ යහළු යැ, ප්‍රිය යහළු යැ, භාග්‍යවතුන් වහන්සේ මුහුට දහම් දෙසන සේක්වා'යි. එසද ආනන්‍දයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු ඝටිකාර කුම්භකාර හා ජෝතිපාල මාණවකහට දැහැමි කථායෙන් කරුණු දක්වූහ, සමාදන් කරවූහ, තෙද ගැන්වූහ, පහටු කරවූහ. ඉක්බිති ආනන්‍දය, ඝටිකාර කුම්භකාර හා ජෝතිපාල මාණවක හා දෙදෙනා අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු විසින් දැහැමි කථායෙන් කරුණු දක්වන ලද්දහු සමාදන් කරවන ලද්දහු තෙද ගන්වන ලද්දහු පහටු කරවන ලද්දහු අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු ගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු සකසා වැඳ පැදකුණු කොට ගියෝ.

එසද ආනන්‍දය, ජෝතිපාල මාණවක තෙමේ ඝටිකාර කුම්භකාරහට තෙල බස් කී : "යහළු ඝටිකාරයෙනි, තෙපි මෙ දහම් අසන්නහු නො ද? එතෙකුදු වත් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි නො වව"යි.

යහළු ජෝතිපාලයෙනි, තෙපි මා "අද වූ මහලු මාපියන් පුස්නෙමි"යි දන්නහු නො ද?

"යහළු ඝටිකාරයෙනි, එසේ වී නම් මම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙමි"යි.

අථ ඛො ආනන්ද, ඝටිකාරො ච කුම්භකාරො ජොතිපාලො ච මාණවො යෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආනන්ද, ඝටිකාරො කුම්භකාරො කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: අයං මෙ භන්තෙ, ජොතිපාලො මාණවො සහායො පියසහායො, ඉමං භගවා පබ්බාජෙතූ'ති. අලත්ථ ඛො ආනන්ද, ජොතිපාලො මාණවො කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං.

අථ ඛො ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො අචිරූපසම්පන්නෙ ජොතිපාලෙ මාණවෙ අඩ්ඪමාසූපසම්පන්නෙ[1] වෙහලිඞ්ගෙ යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී තදවසරි.

තත්‍ර සුදං ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ. අස්සොසි ඛො ආනන්ද, කිකී කාසිරාජා: කස්සපො කිර භගවා අරහං සම්මාසම්බුද්ධො බාරාණසිං අනුප්පත්තො, බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙති. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං අභිරූහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි බාරාණසියා නිය්‍යාසි මහතා රාජානුභාවෙන කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං දස්සනාය. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආනන්ද කිකිං කාසිරාජානං කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො කස්සපං භගවන්තං අරහන්තං සම්මා-සම්බුද්ධං එතදවොච: 'අධිවාසෙතු මෙ භන්තෙ, භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි ඛො ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො තුණ්හීභාවෙන. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අධිවාසනං විදිත්වා උට්ඨායාසනා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා පණ්ඩුමුටිකස්ස[2] සාලිනො විචිතකාලකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස කාලං ආරොචාපෙසි: 'කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත'න්ති.

අථ ඛො ආනන්ද, කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන කිකිස්ස කාසිරඤ්ඤො නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි.

---

1. අචිරූපසම්පන්නො ජොතිපාලො මාණවො අඩ්ඪමාසූපසම්පන්නො-සිමු.
2. පණ්ඩුමූටිකස්ස - ස්‍යා.

එසද ආනන්දය, ඝටිකාර කුම්භකාර හා ජෝතිපාල මාණවක හා දෙදෙන අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හුන්හ. ආනන්දය, එකත්පස් වැ හුන් ඝටිකාර කුම්භකාර අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැල කෙළේ : ''වහන්ස, මේ ජෝතිපාල මාණවක මා ගේ යහළු යැ ප්‍රිය යහළු යැ. භාග්‍යවතුන් වහන්සේ මුහු පැවිදි කෙරෙත්ව'යි. ආනන්දය, ජෝතිපාල මාණවක අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වෙත පැවිදි ලද, උපසම්පත් ලද.

ඉක්බිති ආනන්දය, අර්හත්සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ජොතිපාල මාණවක උපසපත් නොබෝ කල් වූ උපසපත් අඩමසක් ඇති කල්හි වෙහළිඞගයෙහි කැමැති තාක් වාසය කොට බරණැස් නුවර කරා චාරිකායෙහි වැඩියෝ, අනුක්‍රමයෙන් සැරිසරන සේක් බරණැස්නුවරට බටහ.

ආනන්දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුහු එ බරණැස් නුවර ඉසිපතන නම් වූ මුවළැව්හි වැඩ වෙසෙති. ආනන්දය, කිකී නම් කසීරජ ''අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කසුප් බුදුහු බරණැස් නුවරට වැඩියාහු බරණැස් නුවර ඉසිපතන නම් මුවළැව්හි වැඩ වෙසෙත් ල'' යි ඇසී. එසද ආනන්දය, කිකී කසීරජ සුන්දර සුන්දර යානයන් යොදවා ගෙන සුන්දර යානයෙකැ නැඟී අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් දක්නට සුන්දර සුන්දර යානයෙන් යුතු වැ මහත් වූ රාජානුභාවයෙන් නික්ම ගියේ යැ. යානභූමි තාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් මැ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් කරා එළැඹ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් වැඳ එකත්පස් වැ හින. ආනන්දය, එකත්පස් වැ හුන් කිකී කසීරජහට අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුහු දැහැමි කථායෙන් කරුණු දක්වූහ, සමාදන් කරවූහ, තෙද ගැන්වූහ, පහවු කරවූහ. ඉක්බිති ආනන්දය, කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් විසින් දැහැමි කථායෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ පහවු කරවන ලද්දේ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන්ට තෙල බස් සැල කෙළේ : ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෙට දවසට භික්ෂුසඞ්ඝයා හා සමග මා ගේ බත ඉවසන සේක්ව''යි. ආනන්දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුහු තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ. එසද ආනන්දය, කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කසුප් බුදුන්ගේ අධිවාසනය දැන හුනස්නෙන් නැඟී අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් වැඳ පැදකුණු කොට නික්ම ගියේ යැ. ඉක්බිති ආනන්දය, කිකී කසීරජ එ රැය පහන් වූ කල්හි සිය නිවෙස්නෙහි තෙවැසි සුවඳ රත්හැල්හි කුඩු නැති සහල් ගෙන නොයෙක් සූප ව්‍යඤ්ජන ඇති ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයන් පිළියෙල කරවා අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන්ට ''වහන්ස, වඩනට කලි, බත්කිස නිම වන ලද''යි කල් දැන්වී.

එකල්හි ආනන්දය, අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුහු පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන කිකී කසීරජහු ගේ නිවෙස්න කරා එළැඹියහ. එළැඹ පැනවූ අස්නෙහි භික්ෂුසඞ්ඝයා හා සමග වැඩ හුන්හ. ඉක්බිති ආනන්දය, කිකී කසීරජ බුදුපාමොක් මහසඟන ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයෙන් සියතින් සතැප්වී, පැවැරී.

අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: ‘අධිවාසෙතු මෙ භන්තෙ, භගවා බාරාණසියං වස්සාවාසං, එවරූපං සඞ්ඝස්ස උපට්ඨානං භවිස්සතී’ති. ‘අලං මහාරාජ, අධිවුත්ථො[1] මෙ වස්සාවාසො’ති. දුතියම්පි ඛො ආනන්ද —පෙ— තතියම්පි ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: ‘අධිවාසෙතු මෙ භන්තෙ, භගවා බාරාණසියං වස්සාවාසං එවරූපං සඞ්ඝස්ස උපට්ඨානං භවිස්සතී’ති. ‘අලං මහාරාජ, අධිවුත්ථො මෙ වස්සාවාසො’ති. අථ ඛො ආනන්ද, කිකිස්ස කාසිරඤ්ඤො: ‘න මෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො අධිවාසෙති බාරාණසියං වස්සාවාස’න්ති අහුදෙව අඤ්ඤථත්තං, අහු දොමනස්සං. අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා කස්සපං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: ‘අත්ථි නු තෙ භන්තෙ, අඤ්ඤො කොචි මයා උපට්ඨාකතරො’ති.

අත්ථි මහාරාජ, වෙහලිඞ්ගං නාම ගාමනිගමො. තත්ථ ඝටීකාරො නාම කුම්භකාරො. සො මෙ උපට්ඨාකො අග්ගුපට්ඨාකො. තුය්හං ඛො පන මහාරාජ: ‘න මෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො අධිවාසෙති බාරාණසියං වස්සාවාස’න්ති, අත්ථි අඤ්ඤථත්තං අත්ථි දොමනස්සං. තයිදං ඝටීකාරෙ කුම්භකාරෙ නත්ථි ච න ච භවිස්සති.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො, ධම්මෙ -පෙ- සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො, අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො දුක්ඛෙ නික්කඞ්ඛො, දුක්ඛසමුදයෙ නික්කඞ්ඛො, දුක්ඛනිරොධෙ නික්කඞ්ඛො, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය නික්කඞ්ඛො.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො එකභත්තිකො බ්‍රහ්මචාරී සීලවා කල්‍යාණධම්මො.

ඝටීකාරො ඛො මහාරාජ, කුම්භකාරො නික්ඛිත්තමණිසුවණ්ණො, අපෙතජාතරූපරජතො.

---

1. අධිවුට්ඨො - ස්‍යා

ඉක්බිති ආනන්දය, කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන් වැළඳුවත් පාත්‍රයෙන් බැහැර කළ අත් ඇතියන් දුන එක්තරා මීටි අස්නක් ගෙන එකත්පස් වැ හින. ආනන්දයෙනි, එකත්පස් වැ හුන් කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන්ට තෙල බස් සැල කෙළේ : "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා ගේ බරණැස්පුර වස්විසීම ඉවසන සේක්වා, මහසඟනට මෙවන් උවටැන් වන්නේ යැ"යි. "කම් නැත මහරජ, මා විසින් වස්විසීම ඉවසන ලද"යි. දෙවනවට ද ආනන්දය, . . . තුන්වනවට ද ආනන්දය, කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන්ට තෙල බස් සැල කෙළේ : "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා ගේ බරණැස්පුර වස්විසීම ඉවසන සේක්වා, මහසඟනට මෙවන් උවටැන් වන්නේ යැ"යි. "කම් නැත මහරජ, මා විසින් වස්සාවාස ඉවසන ලද"යි. එසඳ ආනන්දය, කිකී කසීරජහට : "අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු මා ගේ බරණැස් නුවර වස්විසීම නො ඉවසති" විපරිතසිත් වී, දෙම්නස් වී. ඉක්බිති ආනන්දය, කිකී කසීරජ අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුන්ට : "වහන්ස, මට වඩා උපස්ථායකතර වූ අන් කිසිවෙක් මුබ වහන්සේට ඇද්ද ?යි මෙවදන් කී.

මහරජ, වෙහලිඞ්ග නම් නියම්ගමෙක් ඇත. එහි ඝටීකාර නම් කුම්භකාරයෙක් ඇති. හෙ තෙම මා ගේ උපස්ථායක යැ අග්‍රෝපස්ථායක යි. මහරජ, තොපට වැළිත් "අර්හත් සම්‍යක් සම්බුද්ධ කසුප් බුදුහු මා ගේ බරණැස් නුවර වස්සාවාස නො ඉවසති" විපරිත සිතෙක් ඇත, දෙම්නසෙක් ඇති. ඒ මෙ දෙම්නස ඝටීකාර කුම්භකාර කෙරෙහි නැත, නො ද වන්නේ යි.

මහරජ, ඝටීකාර කුම්භකාර වූකලි බුදුන් සරණ කොට ගියේ යැ, දහම් සරණ කොට ගියේ යැ, සඟුන් සරණ කොට ගියේ යි.

මහරජ, ඝටීකාර කුම්භකාර පණිවායෙන් වෙන් වූයේ වෙයි, අයිනාදනින් වෙන් වූයේ වෙයි, කාමයෙහි මිසහසරින් වෙන් වූයේ වෙයි, මුසවායෙන් වෙන් වූයේ වෙයි, මදපමා දෙකට කරුණු වූ රහමෙරින් වෙන් වූයේ වෙයි.

මහරජ, ඝටීකාර කුම්භකාර බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වෙයි, ධර්මය කෙරෙහි . . . . සඞ්ඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වෙයි, ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි.

මහරජ ඝටීකාර කුම්භකාර දුඃඛසත්‍යයෙහි නිසැක වූයේ දුඃඛසමුදයසත්‍යයෙහි නිසැක වූයේ දුඃඛනිරොධසත්‍යයෙහි නිසැක වූයේ දුඃඛනිරොධ ගාමිනීප්‍රතිපදසත්‍යයෙහි නිසැක වූයේ වෙයි.

මහරජ, ඝටීකාර කුම්භකාර එකභත්තික වැ බ්‍රම්සර ඇති වැ සිල්වත් වැ කලණදහම් ඇති වැ සිටින සුලු වෙයි.

මහරජ, ඝටීකාර කුම්භකාර හැරපි මණි සවණී ඇතියේ හැරපි රන්රිදී ඇතියේ වේ.

ඝටිකාරො ඛො මහාරාජ, කුම්භකාරො පත්තමූසලො[1]. න සහත්ථා පඨවිං[2] ඛණති. යං හොති කූලපලුග්ගං වා යො හොති මූසිකුක්කාරො වා[3] තං කාජෙන[4] ආහරිත්වා භාජනං කරිත්වා එවමාහ: 'එත්ථ යො ඉච්ඡති තණ්ඩුලපටිභස්තානි[5] වා මුග්ගපටිභස්තානි[6] වා කලාය[7] පටිභස්තානි[8] වා නික්ඛිපිත්වා යං ඉච්ඡති තං හරතූ'ති.

ඝටිකාරො ඛො මහාරාජ, කුම්භකාරො අන්ධෙ ජිණ්ණෙ මාතාපිතරො පොසෙති.

ඝටිකාරො ඛො මහාරාජ, කුම්භකාරො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

එකමි'දාහං මහාරාජ, සමයං වෙහලිඞ්ග ගාමනිගමෙ විහරාමි. අථ ඛ්වාහං මහාරාජ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන ඝටිකාරස්ස කුම්භකාරස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ඝටිකාරස්ස කුම්භකාරස්ස මාතාපිතරො එතදවොචං: හන්ද කො නු ඛො අයං භග්ගවො[9] ගතොති. නික්ඛන්තො ඛො තෙ භන්තෙ උපට්ඨාකො, අතො කුම්භියා ඔදනං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජාති. අථ ඛ්වාහං මහාරාජ, කුම්භියා ඔදනං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කමිං[10] අථ ඛො මහාරාජ, ඝටිකාරො කුම්භකාරො යෙන මාතාපිතරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මාතාපිතරො එතදවොච: කො කුම්භියා ඔදනං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කන්තො'ති. කස්සපො තාත, භගවා අරහං සම්මාසම්බුද්ධො කුම්භියා ඔදනං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කන්තො'ති. අථ ඛො මහාරාජ, ඝටිකාරස්ස කුම්භකාරස්ස එතදහොසි: ලාභා වත මෙ, සුලද්ධං වත මෙ යස්ස මෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො එවං අභිවිස්සත්ථො'ති[11]. අථ ඛො මහාරාජ, ඝටිකාරං කුම්භකාරං අද්ධමාසං[12] පීතිසුඛං න විජහි[13] සත්තාහං මාතාපිතුන්නං.

එකමි'දාහං මහාරාජ, සමයං තත්ථෙව වෙහලිඞ්ග ගාමනිගමෙ විහරාමි. අථ ඛ්වාහං මහාරාජ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන ඝටිකාරස්ස කුම්භකාරස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා ඝටිකාරස්ස කුම්භකාරස්ස මාතාපිතරො එතදවොචං: හන්ද කො නු ඛො අයං භග්ගවො[9] ගතො'ති. නික්ඛන්තො ඛො තෙ භන්තෙ, උපට්ඨාකො, අතො ඛළොපියා කුම්මාසං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජාති. අථ ඛ්වාහං මහාරාජ, ඛළොපියා කුම්මාසං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කමිං.

---

1. න මුසලෙන - ස්‍යා, PTS.
2. පඨවිඤ්ච - ස්‍යා.
3. මූසිකුක්කරො - මජ්සං. මූසිකුක්කුරො - සිමු, ස්‍යා, PTS.
4. කාමෙන සිමු, - PTS.
5. තණ්ඩුලපතිභස්තානි - ස්‍යා. තණ්ඩුපතිවත්තානි - PTS.
6. මුග්ගපතිවත්තානි - PTS.
7. කාලාය - සිමු.
8. කාලායපතිභස්තානි - ස්‍යා. කාලායපතිවත්තානි - PTS.
9. භගවො - ස්‍යා.
10. පක්කාමිං - ස්‍යා, PTS.
11. අභිවිස්සට්ඨොති - ස්‍යා.
12. අඩ්ඪමාසං - ස්‍යා.
13. න විජහති - මජ්සං.

මහරජ, ඝටීකාර කුම්භකාර බහාතැබූ මොහොල් ඇතියේ සියතින් පොළෝ නො කණියි. ඉවුරෙන් ගිලිහුණු යම් මැ මැටියෙක් වේවයි මීයන් නැඟූ යම් මැ මැටියෙක් වේවයි ඇද්ද, එය කදින් ගෙනවුත් බඳුන් තනා මෙසේ කියයි : ''යමෙක් කැමැති වේ නම් සහල්පිහිවා වේවයි, මුංපිහිවා වේවයි කඩලපිහිවා වේවයි මෙහි බහා යම් බඳුනක් කැමැති වේ නම් එය ගෙන යේවා''යි.

මහරජ, ඝටීකාර කුම්භකාර අදමහලු මවුපියන් පුස්නේ යැ.

මහරජ, ඝටීකාර කුම්භකාර පඤ්චඔරම්භාගීය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් ඔපපාතික වැ එ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇති වැ එහි මැ පිරිනිවන් පානාසුලු වෙයි.

මහරජ, මම එක් කලෙක වෙහලිඞග නියම්ගමෙහි වාස කරමි. ඉක්බිති මහරජ මම පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන ඝටීකාර කුම්භකාරයා ගේ මාපියන් කරා එළැඹියෙමි. එළැඹැ ඝටීකාර කුම්භකාරයාගේ මාපියනට මෙල බස් කීමි : ''දැන් මේ භාර්ගව කොහි ගියේ වේ දැ''යි. වහන්ස, ඔබ ගේ උපස්ථායක බැහැර ගියේ යැ. තෙල සැළියෙන් බත් ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳන්නේ යැ''යි. ඉක්බිති මහරජ මම සැළියෙන් බත් ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳ කොට හුනස්නෙන් නැඟී බැස ගියෙමි. ඉක්බිති මහරජ, ඝටීකාර කුම්භකාර මාපියන් කරා එළැඹියේ යැ, එළැඹ මවුපියනට තෙලබස් කී : ''සැළියෙන් බත් ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳා හුනස්නෙන් නැඟී බැස ගියේ කවරෙකැ''යි. දරුව, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු සැළියෙන් බත් ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳා හුනස්නෙන් නැඟී බැස ගියහ''යි. එසඳ මහරජ, ඝටීකාර කුම්භකාරහට තෙල සිත් වී : ''මට ලාභයෙක් මැ යැ, මට මනා ලැබීමෙක් මැ යැ, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු මට මෙසේ ඉතා විස්වැසි වූහ''යි. එසඳ මහරජ, ප්‍රීතිසුඛය අඩමසක් ඝටීකාර කුම්භකාරයා නො හළේ යැ. මාපියන් ගේ ප්‍රීතිසුඛය සත්දිනක් නො හළේ යැ.

මහරජ, මම එක් කලෙක ඒ වෙහලිඞග නියම්ගමෙහි මැ වාස කරමි. එක්බිති මහරජ, මම පෙරවරු වේලෙහි හැඳපෙරෙව පාසිවුරු ගෙන ඝටීකාර කුම්භකාරයා ගේ මාපියන් කරා එළැඹියෙමි. එළැඹ ඝටීකාර කුම්භකාරයාගේ මාපියනට තෙල බස් කීමි : ''දැන් මේ භාර්ගව කොහි ගියේ වේ දැ''යි. වහන්ස, ඔබ ගේ උපස්ථායක බැහැර ගියේ යැ. තෙල සැළියෙන් කොමු ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳන්නේ යැ''යි. ඉක්බිති මහරජ මම සැළියෙන් කොමු ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳ කොට හුනස්නෙන් නැඟී

අථ ඛො මහාරාජ, ඝටීකාරො කුම්භකාරො යෙන මාතාපිතරෙ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මාතාපිතරෙ එතදවොච: කො ඛළොපියා කුම්මාසං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කන්තො'ති. කස්සපො තාත, භගවා අරහං සම්මාසම්බුද්ධො ඛළොපියා කුම්මාසං ගහෙත්වා පරියොගා සූපං ගහෙත්වා පරිභුඤ්ජිත්වා උට්ඨායාසනා පක්කන්තො'ති. අථ ඛො මහාරාජ, ඝටීකාරස්ස කුම්භකාරස්ස එතදහොසි: ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යස්ස මෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො එවං අභිවිස්සත්ථො'ති. අථ ඛො මහාරාජ, ඝටීකාරං කුම්භකාරං අඩ්ඪමාසං පීතිසුඛං න විජහි,[1] සත්තාහං මාතාපිතූනං.

එකමි'දාහං මහාරාජ, සමයං තත්ථෙව වෙහළිඞ්ගෙ ගාමනිගමෙ විහරාමි. තෙන ඛො පන සමයෙන ගන්ධකුටි[2] ඔවස්සති. අථ ඛ්වාහං මහාරාජ, භික්ඛූ ආමන්තෙසිං: ගච්ඡථ භික්ඛවෙ, ඝටීකාරස්ස කුම්භකාරස්ස නිවෙසනෙ තිණං ජානාථා'ති[3]. එවං වුත්තෙ මහාරාජ, භික්ඛූ මං එතදවොචුං: නත්ථි ඛො භන්තෙ, ඝටීකාරස්ස කුම්භකාරස්ස නිවෙසනෙ තිණං, අත්ථි ච ඛ්වාස්ස ආවෙසනං තිණච්ඡදන'න්ති. ගච්ඡථ භික්ඛවෙ ඝටීකාරස්ස කුම්භකාරස්ස ආවෙසනං[4] උත්තිණං කරෙථා'ති. අථ ඛො තෙ මහාරාජ භික්ඛූ ඝටීකාරස්ස කුම්භකාරස්ස ආවෙසනං උත්තිණමකංසු. අථ ඛො මහාරාජ, ඝටීකාරස්ස කුම්භකාරස්ස මාතාපිතරෙ භික්ඛූ එතදවොචුං: කෙ ආවෙසනං උත්තිණං කරොන්තී'ති, භික්ඛූ භගිනි, කස්සපස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ගන්ධකුටි[2] ඔවස්සතී'ති හරථ භන්තෙ, භද්‍රමුඛා'ති. අථ ඛො මහාරාජ, ඝටීකාරො කුම්භකාරො යෙන මාතාපිතරෙ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මාතාපිතරො එතදවොච: කෙ ආවෙසනං උත්තිණමකංසූ'ති. භික්ඛූ තාත, කස්සපස්ස කිර[5] භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ගන්ධකුටි[2] ඔවස්සතී'ති. අථ ඛො මහාරාජ, ඝටීකාරස්ස කුම්භකාරස්ස එතදහොසි: ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යස්ස මෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො, එවං අභිවිස්සත්ථො'ති. අථ ඛො මහාරාජ, ඝටීකාරං කුම්භකාරං අඩ්ඪමාසං පීතිසුඛං න විජහි, සත්තාහං මාතාපිතූනං. අථ ඛො තං මහාරාජ ආවෙසනං සබ්බං තෙමාසං ආකාසච්ඡදනං අට්ඨාසි, න චාතිවස්සි[6] එවරූපො ච මහාරාජ, ඝටීකාරො කුම්භකාරොති.

ලාභා භන්තෙ, ඝටීකාරස්ස කුම්භකාරස්ස, සුලද්ධං[7]. භන්තෙ, ඝටීකාරස්ස කුම්භකාරස්ස යස්ස භගවා එවං අභිවිස්සත්ථොති.

අථ ඛො ආනන්ද, කිකී කාසිරාජා ඝටීකාරස්ස කුම්භකාරස්ස පඤ්චමත්තානි තණ්ඩුලවාහසතානි පාහෙසි පණ්ඩුමුටිකස්ස සාලිනො තදූපියඤ්ච සූපෙය්‍යං. අථ ඛො තෙ ආනන්ද, රාජපුරිසා ඝටීකාරං කුම්භකාරං උපසඞ්කමිත්වා එතදවොචුං: ඉමානි තෙ භන්තෙ, පඤ්චමත්තානි තණ්ඩුලවාහසතානි කිකිනා කාසිරාජෙන පහිතානි පණ්ඩුමුටිකස්ස සාලිනො තදූපියඤ්ච සූපෙය්‍යං. තානි භන්තෙ, පතිගණ්හාතූ'ති[8], රාජා ඛො බහුකිච්චො බහුකරණීයො, අලං මෙ රඤ්ඤොව හොතූති.

---

1. න විජහති - මජසං.
2. කුටි - මජසං, ස්‍යා, කුටී - PTS.
3. ජානථාති - ස්‍යා, PTS.
4. ආවෙසනෙ - මජසං.
5. කිර - PTS (නත්ථි).
6. න දෙවො චාතිවස්සි - සිමු; න දෙවොතිවස්සි - මජසං.
7. සුලද්ධලාභා - සිමු. සුලද්ධා - මජසං.
8. පටිගණ්හාථාති - මජසං.

නික්ම ගියෙමි. ඉක්බිති මහරජ ඝටීකාර කුම්භකාර මාපියන් කරා එළැඹියේ යැ, එළැඹ මවුපියනට මෙසේ කී : "සැළියෙන් කොමු ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳා හුනස්නෙන් නැඟී බැස ගියේ කවරෙකැ"යි. දරුව, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු සැළියෙන් කොමු ගෙන සූපභාජනයෙන් සූප ගෙන වළඳා හුනස්නෙන් නැඟී බැස ගියහ"යි. එසඳ මහරජ, ඝටීකාර කුම්භකාරහට මෙසේ සිත් වී : "මට ලාභයෙක් මැ යැ, මට මනා ලැබීමෙක්මැ යැ. අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු මාහට මෙසේ ඉතා විස්වස් ඇතියහ"යි. එසඳ මහරජ, ප්‍රීතිසුඛය අඩමසක් ඝටීකාර කුම්භකාරයා නො හළේ යැ, මා පියන් ගේ ප්‍රීතිසුඛය සත් දිනක් නො හළේ යි.

මහරජ, මම එක් කලෙක ඒ වෙහලිඞ්ග නියම්ගම්හි මැ වාස කෙරෙමි. එසමයෙහි ගඳකිළිය තෙමෙයි. ඉක්බිති මහරජ, මම භික්ෂූන් ඇමැතීමි: "මහණෙනි, යව, ඝටීකාර කුම්භකාරයාගේ නිවෙස්නෙහි තණ ගෙනෙව"යි. මහරජ, මෙසේ වදළ කළ මහණහු මට මෙසේ සැල කොළෝ, "වහන්ස, ඝටීකාර කුම්භකාරයා ගේ නිවෙස්නෙහි තෘණ නැත, ඔහු ගේ නවසියන් ඇති ශිල්පශාලායෙක් ඇත"යි. "මහණෙනි යව, ඝටීකාර කුම්භකාරයාගේ ශිල්පශාලාව නිස්තෘණ කරව"යි. මහරජ, එසඳ මහණහු ඝටීකාර කුම්භකාරයාගේ සිප්හල නිස්තෘණ කළහ. එසඳ මහරජ, ඝටීකාර කුම්භකාරයාගේ මාපියෝ මහණනුට මෙසේ කීහු : "කවරහු සිප්හල නිස්තෘණ කෙරෙද්දැ"යි. මහණහු "බුහුනැණියෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ භගවත්හු ගේ ගන්ධකුටිය තෙමෙයි". වහන්ස, ගෙන යව, භද්‍රමුඛයෙනි, ගෙන යව"යි. ඉක්බිති මහරජ, ඝටීකාර කුම්භකාර මවුපියන් කරා එළැඹියේ යැ, එළැඹ මවුපියනට මෙසේ කී : "කවරහු සිප්හල නිස්තෘණ කොළෝ දැ"යි. දරුව, මහණහු යැ, අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු ගේ ගඳකිළිය තෙමේ ලැ"යි. එසඳ මහරජ, ඝටීකාර කුම්භකාරහට මෙසේ සිත් වී : "මට ලාභයෙක් මැ යැ, මට මනා ලැබීමෙක් මැ යැ. අර්හත් සම්‍යක් සම්බුද්ධ කාශ්‍යප භගවත්හු මාහට මෙසේ ඉතා විස්වස් ඇතියහ"යි. ඉක්බිති මහරජ, ප්‍රීතිසුඛය ඝටීකාර කුම්භකාරයා අඩමසක් නො හළේ යැ, මාපියන් ගේ ප්‍රීතිසුඛය සත් දිනක් නො හළේ යැ. ඉක්බිති මහරජ, ඒ සිප්හල මුළු තෙමස අහස්සෙවෙනි ඇති වැ සිටගත, නො තෙමිණ. මහරජ, ඝටීකාර කුම්භකාර තෙමේ මෙබන්දෙකැ"යි.

වහන්ස, යමක්හට භගවත්හු මෙසේ ඉතා විස්වස් ඇති වූහු ද, ඒ ඝටීකාර කුම්භකාරයාහට ලාභයෙක, ඒ ඝටීකාර කුම්භකාරයාහට සුලබ්ධ ලාභයෙකැ'යි.

ඉක්බිති ආනන්දය, කිකී කසිරජ කලප් කොට වියළ රත්හැල් පිළිබඳ සහල්ගැල් පන්සියක් පමණ යැවී, එයට නිසි සූපාර්හ දුය ද යැවී. ඉක්බිති ආනන්දය, ඒ රාජපුරුෂයෝ ඝටීකාර කුම්භකාරයා කරා එළැඹ මෙසේ කීහු : "වහන්ස, කිකී කසිරජු විසින් කලප් කොට වියළ රත්හැල් පිළිබඳ මේ පන්සියක් පමණ සහල්ගැල් එවනලද, එයට නිසි සූපාර්හ දුය ද එවන ලද'යි. වහන්ස, ඒ දුය පිළිගන්නේ යැ'යි. රජ වනාහි බොහෝ කිස ඇත්තෙක, බොහෝ කරණී ඇත්තෙක, මට කම් නැත, රජුට මැ වේව'යි.

සියා ඛො පන තෙ ආනන්ද, එවමස්ස: අඤ්ඤො නූන තෙන සමයෙන ජොතිපාලො මාණවො අහොසීති. න ඛො පනෙතං ආනන්ද, එවං දට්ඨබ්බං, අහං තෙන සමයෙන ජොතිපාලො මාණවො අහොසින්ති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

ඝටිකාරසුත්තං පඨමං.

ආනන්දය, තට මෙබඳු සිතෙක් විය හෙයි: "එසමයෙහි ජොතිපාල මාණවක නම් අනෙකෙක් වී යැ" කියා යි. ආනන්දය, තෙල මෙසේ නො දක්කයුතු යැ, මම එසමයෙහි ජොතිපාල මාණවක වීමි"යි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. සතුටුයිත් ඇති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

පළමු වැනි සච්කාරසූත්‍ර යි.

---

2. 4. 2

රට්ඨපාලසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කුරූසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන ථුල්ලකොට්ඨිතං[1] නාම කුරූනං නිගමො තදවසරි. අස්සොසුං ඛො ථුල්ලකොට්ඨිතකා[2] බ්‍රාහ්මණගහපතිකා: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කුරූසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං ථුල්ලකොට්ඨිතං අනුප්පත්තො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී''ති.

අථ ඛො ථුල්ලකොට්ඨිතකා[2] බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා, එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො ථුල්ලකොට්ඨිතකෙ[4] බ්‍රාහ්මණගහපතිකෙ භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

තෙන ඛො පන සමයෙන රට්ඨපාලො නාම කුලපුත්තො තස්මිංයෙව ථුල්ලකොට්ඨිතෙ[4] අග්ගකුලිකස්ස[5] පුත්තො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස එතදහොසි: යථා යථා ඛො භගවා ධම්මං දෙසෙති[6] නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. අථ ඛො ථුල්ලකොට්ඨිතකා[2] බ්‍රාහ්මණගහපතිකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො රට්ඨපාලො

1. ථුල්ලකොට්ඨිකං - මජසං.
2. ථුල්ලකොට්ඨිකා - මජසං.
3. සාරණීයං - සීමු, මජසං.
4. ථුල්ලකොට්ඨිතකෙ - සීමු; ථුල්ලකොට්ඨිකෙ - මජසං
5. අග්ගකුලස්ස - මජසං.
6. ඛ්වාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි - මජසං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

2. 4. 2

රට්ඨපාල සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරුජනපදයෙහි සැරි සරන සේක් මහත් වූ භික්ෂුසඞ්ඝයා හා සමග යම් තැනෙක්හි ථුල්ලකොට්ඨිත නම් කුරුජනපද වැසියන් ගේ නියම්ගමෙක් වී ද, එයට වැඩියහ. ථුල්ලකොට්ඨිත නියම්ගම් වැසි බමුණුගැහැවියෝ මෙ බස් ඇසූහ : "භවත්නි, ශ්‍රමණ ගෞතමයෝ ශාක්‍යපුත්‍ර වූ සේක් ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වැ කුරුජනපදයෙහි සැරිසරන සේක් මහත් වූ භික්ෂු සඞ්ඝයා හා සමග ථුල්ලකොට්ඨිත නියම්ගමට පැමිණියහ. ඒ භවත් ගෞතමයන් ගේ මෙවන් කල්‍යාණ කීර්තිඝෝෂයෙක් උස් වැ නැඟිණ: "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණිනුදු අර්හත් වන සේක. සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තරපුරුෂදම්‍යසාරථීහ, දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුදධයහ, භාග්‍යවත්හ" යි. උන් වහන්සේ මේ මරුන් සහිත බඹුන් සහිත සදේවක ලෝකය මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති. උන් වහන්සේ ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ දහම් දෙසති. සියල්ල පිරිපුන් පිරිසුදු බඹසර ප්‍රකාශ කෙරෙති. එබඳු රහතුන් ගේ දර්‍ශනය මනා වේ"යයි ඇසූහ.

ඉක්බිති ථුල්ලකොට්ඨිත නියම්ගම් වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැන්හි එළැඹියහ. එළැඹ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් හා සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් දසට ඇඳිලි බැඳ එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් හමුයෙහි (තමන් ගේ) නම් ගොත් අස්වා එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් තුෂ්ණීම්භූත වැ එකත්පස් වැ හුන්හ. බුදුහු එකත්පස් වැ හුන් ථුල්ලකොට්ඨිත නියම්ගම් වැසි බමුණුගැහැවියන් දැහැමි කථායෙන් කරුණු දක්වූහ, සමාදන් කරවූහ, තෙද ගැන්වූහ, සම්ප්‍රහර්ෂ කළහ.

එසමයෙහි එ මැ ථුල්ලකොට්ඨිත නියම්ගම්හි කුලදෙටුපුත් වූ රට්ඨපාල නම් කුලපුත්‍රයෙක් එ පිරිස්හි හුන්නේ වෙයි. එකල්හි රට්ඨපාල කුලපුත්‍රහට මෙවන් සිතෙක් වී : "බුදුහු යම් යම් සෙයෙකින් දහම් දෙසත් ද, ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තපරිපූර්ණ වූ එකාන්ත පරිශුද්ධ වූ මේ සඞ්ඛලිඛිත (ලියූ සකක් වැනි නොහොත් ශඞ්ඛ ලිඛිත දෙදෙනා පිළිබඳ වූ) බ්‍රහ්මචර්‍ය්‍යය කරන්නට සුකර නො වෙයි. මම කෙස් රැවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම් නම් මැනැවැ" යි. ඉක්බිති ථුල්ල කොට්ඨිත නියම්ගම් වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් විසින් දැහැමි කථායෙන් කරුණු දක්වන ලද්දාහු කරුණු ගන්වන ලද්දාහු තියුණු කරන ලද්දාහු සම්ප්‍රහර්ෂවත් කරන ලද්දාහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතයට සතුටු වැ අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට පිටත් වැ ගියහ. ඉක්බිති රට්ඨපාල කුලපුත්‍ර ථුල්ලකොට්ඨිතක

Free Distribution www.aathaapi.org

කුලපුත්තො අචිරපක්කන්තෙසු ථුල්ලකොට්ඨිතකෙසු බ්‍රාහ්මණගහපතිකෙසු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රට්ඨපාලො කුලපුත්තො භගවන්තං එතදවොච: 'යථා යථාහං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං,[1] ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පද'න්ති.

අනුඤ්ඤාතොසි පන ත්වං රට්ඨපාල, මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති?

න ඛො අහං භන්තෙ, අනුඤ්ඤාතො මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති.

න ඛො රට්ඨපාල, තථාගතා අනනුඤ්ඤාතං මාතාපිතූහි පබ්බාජෙන්තීති.

සොහං භන්තෙ තථා කරිස්සාමි යථා මං මාතාපිතරො අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති.

අථ ඛො රට්ඨපාලො කුලපුත්තො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන මාතාපිතරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මාතාපිතරො එතදවොච: 'අම්ම තාත,[2] යථා යථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, ඉච්ඡාමහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං, අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා'ති.

එවං වුත්තෙ රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: 'ත්වං ඛොසි[3] තාත රට්ඨපාල, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො[4] සුඛපරිහතො[5] න ත්වං තාත රට්ඨපාල, කස්සචි[6] දුක්ඛස්ස ජානාසි එහි ත්වං තාත රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි[7] පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මයං අකාමකා විනා භවිස්සාම, කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති?

---

1. ඉච්ඡාමහං භන්තෙ, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතං (අධිකං.) මජ්ඣසං, PTS. ස්‍යා, පොත්ථකෙසු
2. අම්මතාතා - මජ්ඣසං, PTS
3. ත්වං ඛො – PTS.
4. සුඛෙ ඨිතො – PTS.
5. සුඛපරිහතො – ස්‍යා.
6. කිඤ්චි – ස්‍යා
7. කාමෙ – මජ්ඣසං, ස්‍යා, PTS

බමුණුගැහැවියන් නික්ම ගිය නොබෝ කල්හි භාග්‍යවතුන් කරා එළැඹියේ යෑ. එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් රට්ඨපාල කුලපුත්‍ර භාග්‍යවතුන්ට මෙල බස් කී : ''වහන්ස, මම භාග්‍යවතුන් විසින් යම් යම් සෙයෙකින් දෙසූ දහම් දනිම් ද, ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්ත පරිපූර්ණ වූ ඒකාන්ත පරිශුද්ධ වූ මේ සඞ්ඛලිඛිත බ්‍රහ්මචය්‍ය්‍යීය කරන්නට සුකර නො වෙයි. වහන්ස, මම භාග්‍යවතුන් කෙරෙහි පැවිද්ද ලැබෙම්වා, උපසපුව ලැබෙම්ව''යි.

'රට්ඨපාලයෙනි, තෙපි ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිද්දට මාපියන් විසින් අනුදත්තහු ද? යි.

'වහන්ස, මම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිද්දට මාපියන් විසින් නො අනුදත්මි'යි.

'රට්ඨපාලයෙනි, තථාගතයෝ මාපියන් විසින් නො අනුදත්තහු පැවිදි නො කෙරෙති'යි.

වහන්ස, යම්සේ ගිහිගෙන් නික්ම පැවිද්දට මාපියෝ මා අනුදනිත් නම් ඒ මම එසේ කරමි'යි.

ඉක්බිති රට්ඨපාල කුලපුත්‍ර හුනස්නෙන් නැඟී බුදුන් වැඳ පැදකුණු කොට මාපියන් කරා එළැඹියේ යෑ. එළැඹ මාපියනට මෙල බස් කී : ''මෑණියෙනි, පියාණෙනි, යම් යම් සෙයෙකින් මම භාග්‍යවතුන් විසින් දෙසූ දහම් දන්නෙම් ද, ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්ත පරිපූර්ණ වූ ඒකාන්ත පරිශුද්ධ වූ මේ සඞ්ඛලිඛිත බ්‍රහ්මචය්‍ය්‍යීය කරන්නට සුකර නො වෙයි, මම කෙස්රවුළු බහා කසවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නට කැමැත්තෙමි. මා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වනු පිණිස අනුදන මැනැවැ''යි.

මෙසේ කී කල්හි රට්ඨපාල කුලපුත්‍රයන් ගේ මාපියෝ රට්ඨපාලකුලපුත්‍රහට මෙල බස් කීහු : ''දරුව රට්ඨපාලයෙනි, තෙපි අපහට ප්‍රිය වූ මනවඩන සුවසේ වැඩුණු සුවසේ පෝෂණය කළ එක් මැ පුත් වව, දරුව රට්ඨපාලයෙනි, තෙපි කිසි දුකක් නො දන්නහු යෑ. එව දරුව රට්ඨපාලයෙනි, තෙපි කව බොව සිත් අලව. කමින් බොමින් සිත් අලවමින් කාමපරිභෝග කෙරෙමින් පින් කෙරෙමින් රමණය කරව (සිත් අලව). ඇපි තොපට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිද්දට නො අනුදනුම්හ. තොප ගේ මරණයෙනුදු ඇපි නො කැමැත්තමෝ වෙන් වම්හ. කිම ඇපි තොප ජීවත් වන්නවුන් ගිහිගෙන් නික්ම සස්නට පිවිසෙනු පිණිස අනුදනුමෝ දෑ?යි.

දුතියම්පි ඛො-පෙ-තතියම්පි ඛො රට්ඨපාලො කුලපුත්තො මාතාපිතරො එතදවොච: 'අම්ම තාත, යථා යථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං, අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති. තතියම්පි ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: 'ත්වං ඛොසි තාත රට්ඨපාල, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො න ත්වං තාත රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි. එහි ත්වං තාත රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. මරණෙනපි තෙ මයං අකාමකා විනා භවිස්සාම, කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා'ති?

අථ ඛො රට්ඨපාලො කුලපුත්තො මාතාපිතූසු පබ්බජ්ජං අලභමානො[1] තත්ථෙව අනන්තරහිතාය භූමියා නිපජ්ජි, ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වාති[2].

අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: 'ත්වං ඛොසි තාත රට්ඨපාල, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං තාත රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි, උට්ඨෙහි තාත රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු, න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මයං අකාමකා විනා භවිස්සාම, කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති?

එවං වුත්තෙ රට්ඨපාලො කුලපුත්තො තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: 'ත්වං ඛොසි තාත රට්ඨපාල, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො. න ත්වං තාත රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි. උට්ඨෙහි තාත රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මයං අකාමකා විනා භවිස්සාම, කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති? තතියම්පි ඛො රට්ඨපාලො කුලපුත්තො තුණ්හී අහොසි.

---

1. න මං මාතාපිතරො අනුජානන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති - මජසං, ස්‍යා.
2. 'අථ ඛො රට්ඨපාලො කුලපුත්තො එකම්පි භත්තං න භුඤ්ජි -පෙ- සත්තපි භත්තානි න භුඤ්ජි. ඉති සුදින්නභාණවාරෙ විය - මජසං, ස්‍යාම පොත්ථකෙසු දිස්සති.

දෙවනවට ද .... තුන්වනවට ද රට්ඨපාල කුලපුත් මවුපියනට මෙසේ කීය: "මෑණියෙනි, පියාණෙනි, මම යම් මැ සැටියෙකින් භගවත්හු විසින් දෙසූ දහම් දන සිටින්නෙම් වෙ ද, ගිහිගෙයි වසනුවහු විසින් එකාන්ත පරිපූර්ණ වූ එකාන්ත පරිශුද්ධ වූ ලිඛිත සඞ්ඛයක් වැනි වූ මේ බ්‍රහ්මචර්‍ය්‍ය පුරන්නට නො හැක්ක. මම කෙහෙමස් බහා කසාවත් හැදපෙරෙව ගිහිගෙන් නික්ම සස්නට වදනා පිණිස කැමැතියෙමි. ගිහිගෙන් නික්ම සස්නට වදිනු සඳහා මා අනුදන්නේ මැනැවැ"යි. තුන්වනවට ද රට්ඨපාල කුලපුත්හු ගේ මවුපියෝ රට්ඨපාල කුලපුත්හට තෙල බස් කීහු: "දරුව රට්ඨපාලයෙනි, තෝ වනාහි සුවසේ වැඩුණු, සුවසේ පොෂණය කළ, අපගේ ප්‍රිය මනාප එක මැ පුත් වෙහි, දරුව රට්ඨපාලයෙනි, තෝ කිසිදු දුකක් නො දන්නෙහි, දරුව රට්ඨපාලයෙනි, තෝ එව, වළඳව, බොව, ඉඳුරන් පිනව, වළඳ කෙරෙමින් බොමින් ඉඳුරන් පිනවමින් පස්කම් විඳුමින් පින් කරමින් සිත් අලවා වාස කරව. අපි ගෙන් නික්ම සස්නට වදිනු පිණිස තා නො අනුදනුම්හ, අපි තාගේ මරණයෙනුදු නො කැමැත්තමෝ වියොගයට පැමිණෙම්හ. කිම, අපි ජීවත්වන තා ගෙන් නික්ම සස්නට වදිනු පිණිස අනුදනුමෝදැ?"යි.

ඉක්බිති රට්ඨපාල කුලපුත් මවුපියන් කෙරෙහි සසුන් වදනු නො ලබනුයේ එහි මැ ඇතිරි නො අතුළ බිමෙහි වැදහොත්තේ යැ. "මෙහි මැ මා ගේ මරණ වන්නේ හෝ පැවිද්ද වන්නේ හෝ"යි.

එසඳ රට්ඨපාල කුලපුත්හු ගේ මවුපියෝ රට්ඨපාල කුලපුත්හට තෙල බස් කීහු: "පුතැ රට්ඨපාලයෙනි, තෝ වනාහි සුවසේ වැඩුණු, සුවසේ පෝෂණය කළ, අප ගේ ප්‍රිය මනාප එක් මැ පුත් ව. පුතැ රට්ඨපාලයෙනි, තෝ කිසිදු දුකක් නො දන්නා ව. පුතැ රට්ඨ-පාලයෙනි, නැඟී සිටුව, වළඳව, බොව, ඉඳුරන් පිනවව. වළඳ කෙරෙමින් බොමින් ඉඳුරන් පිනවමින් පස්කම් විඳුමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කරව. අපි ගෙන් නික්ම සස්නට වදිනු පිණිස තා නො අනුදනුම්හ, තා ගේ මරණයෙනුදු අපි නො කැමැත්-තමෝ වියෝ වම්හ. කිම, අපි ජිවත්ව සිටුනා තා ගෙන් නික්ම සස්නට වදිනු පිණිස අනුදනුමෝ ද?"යි.

මෙසේ කී කල්හි රට්ඨපාල කුලපුත් නිහඬ වී. දෙවනවට ද ... තුන්වනවට ද රට්ඨපාල කුලපුත්හු ගේ මවුපියෝ රට්ඨපාල කුලපුත්හට තෙල බස් කීහු: "පුතැ රටපලු සිරෙනි, තෝ වනාහි සුවසේ වැඩුණු සුවසේ පෝෂිත වූ අපගේ ප්‍රිය මනාප එක් මැ පුත් වෙහි. පුතැ රටපලු සිරෙනි, තෝ කිසිදු දුකක් නො දනිහි. පුතැ රටපලු සිරෙනි, නැඟී සිටු, වළඳ කර, බෝ, ඉඳුරන් පිනවව, වළඳ කෙරෙමින් බොමින් ඉඳුරන් පිනවමින් පස්කම්සුව විඳුමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කර, අපි ගෙන් නික්ම සස්නට වදිනු පිණිස තා නො අනුදනුම්හ, තාගේ මරණයෙනුදු අපි නො කැමැතියමෝ වියෝග වම්හ. කිම, අපි ජීවත්ව සිටුනා තා ගෙන් නික්ම සස්නට වදිනු පිණිස අනුදනු-මෝදැ"යි. තුන් වන වට ද රට්ඨපාල කුලපුත් නිහඬ වී.

අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො යෙන රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකෙ එතදවොචුං: 'එසො තාතා, රට්ඨපාලො කුලපුත්තො අනන්තරහිතාය භූමියා නිපන්නො: 'ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. එථ[1] තාතා, යෙන රට්ඨපාලො කුලපුත්තො තෙනුපසඞ්කමථ, උපසඞ්කමිත්වා රට්ඨපාලං කුලපුත්තං එවං වදෙථ: 'ත්වං ඛො සම්ම රට්ඨපාල, මාතාපිතූන්නං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං සම්ම රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි. උට්ඨෙහි සම්ම රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මාතාපිතරො අනුජානන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මාතාපිතරො අකාමකා විනා භවිස්සන්ති, කිං පන තෙ තං ජීවන්තං අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා'ති?[2]

අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතූන්නං පටිස්සුත්වා[3] යෙන රට්ඨපාලො කුලපුත්තො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: 'ත්වං ඛො සම්ම රට්ඨපාල, මාතාපිතූන්නං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං සම්ම රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි. උට්ඨෙහි සම්ම රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මාතාපිතරො අනුජානන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මාතාපිතරො අකාමකා විනා භවිස්සන්ති, කිං පන තෙ ජීවන්තං අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායාති?

එවං වුත්තෙ රට්ඨපාලො කුලපුත්තො තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: ත්වං ඛො සම්ම රට්ඨපාල, මාතාපිතූන්නං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං සම්ම රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි. උට්ඨෙහි සම්ම රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මාතාපිතරො අනුජානන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, මරණෙනපි තෙ මාතාපිතරො අකාමකා විනා භවිස්සන්ති, කිං පන තෙ තං ජීවන්තං අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා'ති. තතියම්පි ඛො රට්ඨපාලො කුලපුත්තො තුණ්හී අහොසි.

අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා යෙන රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතරො එතදවොචුං: 'අම්ම තාත, එසො රට්ඨපාලො කුලපුත්තො තත්ථෙව අනන්තරහිතාය භූමියා නිපන්නො ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. සචෙ තුම්හෙ රට්ඨපාලං කුලපුත්තං

1. එහි - PTS.
2. අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස -පෙ- පබ්බජ්ජායාති. අයං පාඨො මජසං, ස්‍යාමපොත්ථකෙසු න දිස්සති.
3. 'රට්ඨපාලස්ස කුලපුත්තස්ස මාතාපිතූන්නං පටිස්සුත්වා' ඉති මජසං, ස්‍යාම පොත්ථකෙසු නත්ථි.

ඉක්බිති රට්ඨපාල කුලපුත්හු ගේ මවුපියෝ රට්ඨපාල කුලපුත්හු ගේ යහළුවන් කරා එළැඹියහ. එළඹ රට්ඨපාල කුලපුත්හු ගේ යහළුවනට මෙල බස් කීහු : ''දරුවෙනි, මෙල රට්ඨපාල කුලපුත් ඇතිරි නො අතුළ බිම්හි වැදහොත්තේ යැ : ''මෙහි මැ මා ගේ මරණය වන්නේ හෝ පැවිද්ද වන්නේ හෝ''යි. එව දරුවෙනි, රට්ඨපාල කුලපුතු කරා එළැඹෙව, එළැඹ රට්ඨපාල කුලපුත්හට මෙසේ කියව : ''යහළු රට්ඨපාලයෙනි, තෙපි වනාහි මාපියනට ප්‍රිය මනාප වූ සුවසේ වැඩුණු සුවසේ පෝෂණය කළ එක් මැ පුත් වව, යහළු රට්ඨපාලයෙනි, තෙපි කිසිදු දුකක් නො දන්නහු යැ' යහළු රට්ඨපාලයෙනි, නැඟී සිටුව, වළඳ කරව, බොව, ඉඳුරන් පිනවව. වළඳ කෙරෙමින් බොමින් ඉඳුරන් පිනවමින් පස්කම් සුව වළඳ කෙරෙමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කරව, ගෙන් නික්ම සස්නට වදිනු පිණිස මාපියෝ තා නො අනුදනිති'යි. තොපගේ මරණයෙනුදු මාපියෝ නො කැමැති වැ වියෝග වන්නාහ. කිම, ඔහු තොප ජීවත් වන්නවුන් ගෙන් නික්ම සස්නට වදනා පිණිස අනුදනිත් ද''යි.

ඉක්බිති රට්ඨපාල කුලපුත්හු ගේ යහළුවෝ රට්ඨපාලකුලපුත්හු ගේ මාපියනට පිළිත දී රට්ඨපාල කුලපුතු කරා එළැඹියහ. එළැඹ රට්ඨපාල කුලපුතුට මෙල බස් කීහු : ''යහළු රට්ඨපාලයෙනි, තෙපි වනාහි මාපියනට ප්‍රිය මනාප වූ සුවසේ වැඩුණු, සුවසේ පොෂණය කළ එක් මැ පුත් වව, යහළු රට්ඨපාලයෙනි, තෙපි කිසි දුකක් නො දනුව, යහළු රට්ඨපාල-යෙනි, නැඟීසිටුව. කව බොව ඉඳුරන් පිනවව, කමින් බොමින් ඉඳුරන් පිනවමින් පස්කම්සුව විඳුමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කරව. ගෙන් නික්ම සසුන් වදනා පිණිස මව්පියෝ තා නො අනුදනිති, තොප ගේ මරණයෙනුදු මව්පියෝ නො කැමැති වැ වෙන් වන්නාහ. කිම තොප ජීවත්වන්නවුන් ගෙන් නික්ම සසුන් වදනට අනුදනිත් ද ?''යි.

මෙසේ කී කල්හි රට්ඨපාල කුලපුත්‍ර නිහඬ වී. දෙවනවට ද . . . තුන්වනවට ද රට්ඨපාල කුලපුතු ගේ යහළුවෝ රට්ඨපාල කුලපුතුට මෙල බස් කීහු : ''යහළු රට්ඨපාල-යෙනි, තෙපි වනාහි මව්පියනට ප්‍රිය මනාප වූ, සුවසේ වැඩුණු, සුවසේ පොෂණය කළ එක් මැ පුත් වව. යහළු රට්ඨපාලයෙනි, තෙපි කිසි දුකක් නො දනුව. යහළු රට්ඨපාල-යෙනි, නැඟී සිටුව. කව බොව ඉඳුරන් පිනවව, කමින් බොමින් ඉඳුරන් පිනවමින් කම්සුව විඳුමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කරව. ගෙන් නික්ම සසුන් වදනට මව්පියෝ තා නො අනුදනිති. තොප ගේ මරණයෙනුදු මවුපියෝ නො කැමැති වැ වියොග වන්නාහ. කිම, ඔහු තොප ජීවත් වන්නවුන් ගෙන් නික්ම සසුන් වදනට අනුදනිත් ද?''යි. තුන්වනවට ද රට්ඨපාල කුලපුත් නිහඬ වී.

ඉක්බිති රට්ඨපාල කුලපුතු ගේ යහළුවෝ රට්ඨපාල කුලපුතු ගේ මවුපියන් කරා එළැඹියහ. එළැඹ රට්ඨපාල කුලපුතුගේ මවුපියනට මෙල බස් කීහු : දෙමාපියෙනි. ''මෙල රට්ඨපාල කුලපුත් එහි මැ ඇතිරි නො අතුළ බිමැ 'මෙහි මැ මා ගේ මරණය හෝ පැවිද්ද හෝ වන්නේ යැ'යි වැදහොත්තේ යැ. ඉදින් තෙපි ගෙන් නික්ම සසුන් වදනා

නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙවස්ස[1] මරණං ආගමිස්සති. සචෙ පන තුම්හෙ රට්ඨපාලං කුලපුත්තං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි නං දක්ඛිස්සථ. සචෙ රට්ඨපාලො කුලපුත්තො නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති, ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ රට්ඨපාලං කුලපුත්තං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා'ති.

අනුජානාම තාතා, රට්ඨපාලං කුලපුත්තං අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතෙන ච පන මාතාපිතරො උද්දස්සෙතබ්බාති.

අථ ඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා යෙන රට්ඨපාලො කුලපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා රට්ඨපාලං කුලපුත්තං එතදවොචුං: ත්වං ඛො සම්ම රට්ඨපාල, මාතාපිතූනං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං සම්ම රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි, උට්ඨෙහි සම්ම රට්ඨපාල, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච. භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමානි පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු, අනුඤ්ඤාතොසි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බජිතෙන ච තෙ මාතාපිතරො උද්දස්සෙතබ්බා'ති.

අථ ඛො රට්ඨපාලො කුලපුත්තො උට්ඨහිත්වා බලං ගාහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රට්ඨපාලො කුලපුත්තො භගවන්තං එතදවොච: 'අනුඤ්ඤාතො අහං භන්තෙ, මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බාජෙතු මං භගවා'ති. අලත්ථ ඛො රට්ඨපාලො කුලපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං.

අථ ඛො භගවා අචිරූපසම්පන්නෙ ආයස්මන්තෙ රට්ඨපාලෙ අඩ්ඪමාසූපසම්පන්නෙ, ථුල්ලකොට්ඨිතෙ යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි, අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ඛො පනායස්මා රට්ඨපාලො අරහතං අහොසි.

අථ ඛො ආයස්මා රට්ඨපාලො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා රට්ඨපාලො භගවන්තං එතදවොච: 'ඉච්ඡාමහං භන්තෙ, මාතාපිතරො උද්දස්සෙතුං, සචෙ මං භගවා අනුජානාතී'ති.

1. තත්ථෙව මරණං - මජසං, ස්‍යා, PTS.

පිණිස රට්ඨපාල කුලපුත්‍ර නො අනුදන්වූ නම් පැවිදි වූවහු ද නො දක්නහු යැ. ඉදින් රට්ඨපාල කුලපුත් ගෙන් නික්ම සසුන් පැවිද්දට සිත් නො අලවා නම් ඔහට අන් කවර ගතියක් වේ ද, මෙහි මැ වටාලා එන්නේ යැ. රට්ඨපාල කුලපුත්‍ර ගෙන් නික්ම සසුන් වදනාට අනුදත මැනැවැ''යි.

'දරුවෙනි, රට්ඨපාල කුලපුත්‍ර ගෙන් නික්ම සසුන් වදනාට අනුදනුම්හ. වැළිත්, පැවිදි වූවහු විසිනුදු මව්පියෝ මතු මත්තෙහි දක්වියයුත්තාහ'යි.

ඉක්බිති රට්ඨපාල කුලපුත්‍ර ගේ යහළුවෝ රට්ඨපාල කුලපුත් යම් තැනෙක්හි ද එතැන්හි එළැඹියහ. එළැඹ රට්ඨපාල කුලපුත්හට තෙල බස් කීහු : ''යහළු රට්ඨපාලයෙනි, තෙපි වනාහි මාපියනට ප්‍රිය මනාප වූ සුවසේ වැඩුණු, සුවසේ පුස්නාලද, එක් මැ පුත් වව. යහළු රට්ඨපාලයෙනි, තෙපි කිසිදු දුකක් නො දනුව, යහළුව රට්ඨපාලයෙනි, නැඟී සිටුව, වළඳ කරව, බොව, ඉඳුරන් පිනවව. වළඳ කෙරෙමින් බොමින් ඉඳුරන් පිනවමින් කම්සුව විඳුමින් පින් කෙරෙමින් සිත් අලවා වාස කර. මාපියන් විසින් ගෙන් නික්ම සසුන් වදනාට අනුදන්නාලද්දහු යැ. වැළි එකෙක් ඇත, තොප පැවිදි වූවහු විසින් තොපගේ මව්පියෝ මතු මත්තෙහි දක්වියයුත්තාහ''යි.

ඉක්බිති රට්ඨපාල කුලපුත් නැඟීසිට කායබල ගන්වා ගෙන භාග්‍යවතුන් කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හිඳ. එකත්පස් වැ හුන් රට්ඨපාල කුලපුත් භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැල කෙළේ යැ : ''වහන්ස, මම් ගෙන් නික්ම සසුන් වදනාට මව්පියන් විසින් අනුදන්නාලද්දෙමි. භාග්‍යවත්හු මා පැවිදි කෙරෙත්ව''යි. රට්ඨපාල කුලපුත් බුදුන් කෙරෙහි පැවිදි ලද, උපසම්පත් ලදි.

ඉක්බිති බුදුහු ආයුෂ්මත් රට්ඨපාල උපසපන් නොබෝ කල් ඇති කල්හි, උපසපන් අඩමස් ඇති කල්හි, ථුල්ලකොට්ඨිත නියම්ගම්හි අභිරති සේ වැස සැවැත්නුවර කරා චාරිකායෙහි වැඩියහ. අනුක්‍රමයෙන් සැරිසරන සේක් සැවැත්නුවරට පිවිසියහ. එහි දී භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩුසිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ එකලා වැ කාය චිත්ත විවෙක ඇති වැ (කමටහන්හි නො හළ) සිහි ඇති වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වාසය කරන සේක් යමක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගෙන් නික්ම සසුන් වදිත් ද, ඒ අනුත්තර වූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යා ගේ කෙළවර වූ රහත් ඵලය නොබෝ කලෙකින් මැ මෙ අත්බැව්හි මැ තමන් විසින් වෙසෙසින් දන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කළහ. 'ජාතිය ක්ෂය වූ යැ, මහබඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මෙ බව පිණිස අන් කිසෙක් නැතැ'යි වෙසෙසා දත්හ. ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වූහ.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ භාග්‍යවතුන් කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ භාග්‍යවතුන්හට තෙල බස් කීහු : ''වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් මම මවුපියන් දක්නට කැමැත්තෙමි''යි.

අථ ඛො භගවා ආයස්මතො රට්ඨපාලස්ස චෙතසා චෙතො පරිවිතක්කං[1] මනසාකාසි. යදා භගවා අඤ්ඤාසි : 'අභබ්බො ඛො රට්ඨපාලො කුලපුත්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිතු'න්ති අථ ඛො භගවා ආයස්මන්තං රට්ඨපාලං එතදවොච : යස්සදානි ත්වං රට්ඨපාල, කාලං මඤ්ඤසී'ති.

අථ ඛො ආයස්මා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයස්මා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි, ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති.[2] අද්දසා ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච : 'ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අම්හාකං එකපුත්තකො පියො මනාපො පබ්බාජිතො'ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්ථ, න පච්චක්ඛානං, අඤ්ඤදත්ථු අක්කොසමෙව අලත්ථ.

තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච : 'සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං[3] ඉධ මෙ පත්තෙ ආකිරා'ති.

අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී තං ආභිදොසිකං කුම්මාසං ආයස්මතො රට්ඨපාලස්ස පත්තෙ ආකිරන්තී හත්ථානඤ්ච පාදානඤ්ච සරස්ස ච නිමිත්තං අග්ගහෙසි. අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී යෙනායස්මතො රට්ඨපාලස්ස මාතා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතො රට්ඨපාලස්ස මාතරං එතදවොච : 'යග්ඝෙය්‍ය[4] ජානෙය්‍යාසි. අය්‍යපුත්තො රට්ඨපාලො අනුප්පත්තො'ති.

සචෙ ජෙ, සච්චං වදසි, අදාසි භවසී'ති.[5] අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස මාතා යෙනායස්මතො රට්ඨපාලස්ස පිතා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතො රට්ඨපාලස්ස පිතරං එතදවොච: යග්ඝෙ ගහපති ජානෙය්‍යාසි, රට්ඨපාලො කිර කුලපුත්තො අනුප්පත්තො'ති.

තෙන ඛො පන සමයෙන ආයස්මා රට්ඨපාලො තං ආභිදොසිකං කුම්මාසං අඤ්ඤතරං කුඩ්ඩං[6] නිස්සාය පරිභුඤ්ජති. අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා යෙනායස්මා රට්ඨපාලො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං රට්ඨපාලං එතදවොච: අත්ථි නාම තාත රට්ඨපාල, ආභිදොසිකං කුම්මාසං පරිභුඤ්ජිස්සසි, නනු තාත රට්ඨපාල, සකං ගෙහං ගන්තබ්බන්ති.

---

1. පරිවච්ච - මජසං, ස්‍යා.
2. උල්ලික්ඛාපෙති - ස්‍යා.
3. ආභිදෙසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමාසි - සීමු.
4. යග්ඝෙය්‍ය - ස්‍යා.
5. භණසි අදාසිං තං කරොමීති - සීමු, මජසං, ස්‍යා.
6. කුට්ටමූලං - මජසං.

Free Distribution www.aathaapi.org

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තමන් සිතින් ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ චිත්ත-පරිවිතර්කය මෙනෙහි කළ සේක. යම් කලෙකැ භාග්‍යවතුන් වහන්සේ දැනගත්සේක් නම් "රට්ඨපාල කුලපුත් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට වැටෙන්නට අභව්‍ය යැ"යි එකල්හි බුදුහු ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ට තෙල බස් වදළහ : "රට්ඨපාලයෙනි, තෙපි එයට කල් දනුව"යි.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ හුනස්නෙන් නැඟී බුදුන් වැඳ පැදකුණු කොට සෙනස්න සඟවා තබා පාසිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම්ගම කරා චාරිකායෙහි පිටත් ව ගියහ. අනුක්‍රමයෙන් සැරිසරන්නාහු ථුල්ලකොට්ඨිත නියම්ගම යම් තැනෙක්හි ද එයට වන්හ. එහි දී ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ථුල්ලකොට්ඨිතයෙහි කොරව්‍ය රජු ගේ 'මිගාචීර' නම් උයන්හි වැඩ වෙසෙති. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම්ගමට පිඬු පිණිස පිවිසියහ. ථුල්ලකොට්ඨිතයෙහි ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩනාහු සිය පියාගේ නිවෙස්න කරා එළැඹියහ. එසමයෙහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පිය තෙමේ මධ්‍යම ද්වාරශාලායෙහි (කපුවා ලවා) කෙහෙ පණාගස්වයි. ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පිය තෙමේ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් දුරින් මැ එනුවන් දිට, දැක තෙල බස් කී :"මෙ මුඩු මහණුන් විසින් අප ගේ ප්‍රිය මනාප එක් මැ පුත් පැවිදි කරවන ලද"යි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ සිය පියනිවෙස්නෙහි දන් නො මැ ලද, ප්‍රත්‍යාඛ්‍යාන නො ලද, ඒකාන්තයෙන් ආක්‍රොශ මැ ලත්.

එසමයෙහි වනාහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ ඥාතිදසියක් රැයක් ගෙයි ලැගි යව කොමු බැහැර ලනු කැමැති වෙයි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ඒ ඥාති දසියට තෙල බස් කීහු : "ඉදින් නැගැණියෙනි, ඒ බැහැර ලන දැය මෙහි මාගේ පාත්‍රයෙහි ඔව"යි.

එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ ඥාතිදසී ඒ ආභිදෙසික කුම්මාසය ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පාත්‍රයෙහි ඔවන්නී හස්තපාදයන් ගේ ද ස්වරයා ගේ ද නිමිති ගතු. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ ඥාතිදසී ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ මව කරා එළැඹියා යැ. එළැඹ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ මවට තෙල බස් කියූ. "ආයර්‍යාවෙනි, දන්නාව ද? ආයර්‍යපුත්‍ර රට්ඨපාල පැමිණේ යැ"යි.

"ඉදින් කොල සැබැවක් කියෙහි නම් නොදැසි වෙහි"යයි. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ මව් තොමෝ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පියා වෙත එළැඹියා. එළැඹ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පියහට තෙල බස් කියූ : "ගැහැවියෙනි, දනිවු ද? රට්ඨපාල කුලපුත් පැමිණියේ ල"යි.

එසමයෙහි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ඒ රැයක් ලැගි යව කොමු (ආසනශාලා-යෙකැ) එක්තරා බිතක් නිසා වළඳ කෙරෙති. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් ගේ පිය තෙමේ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් කරා එළැඹියේ යැ, එළැඹ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ට තෙල බස් කී : "පුත රට්ඨපාලයෙනි, රැලැගි යව කොමු වළඳවු ද? (තොප සතන්හි සස්න නිසා ලත් ගුණවෙසෙසෙක්) ඇද්ද? පුත රට්ඨපාලයෙනි, සිය ගෙට යායුතු නො දැ?"යි.

කුතො නො ගහපති, අම්හාකං ගෙහං අගාරස්මා අනගාරියං පබ්බජිතානං, අනගාරා මයං ගහපති, අගම්මහා ඛො තෙ ගහපති ගෙහං, තත්‍ථ නෙව දානං අලත්‍ථම්හ, න පච්චක්ඛානං අඤ්ඤදත්‍ථු[1] අක්කොසමෙව අලත්‍ථම්හා'ති.

'එහි තාත රට්ඨපාල, ඝරං ගමිස්සාමා'ති.

'අලං ගහපති, කතං මෙ අජ්ජ භත්තකිච්ච'න්ති.

'තෙන හි තාත රට්ඨපාල, අධිවාසෙහි ස්වාතනාය භත්ත'න්ති.

අධිවාසෙසි ඛො ආයස්මා රට්ඨපාලො තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මතො රට්ඨපාලස්ස අධිවාසනං විදිත්වා යෙන සකං නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා[2] මහන්තං හිරඤ්ඤසුවණ්ණස්ස පුඤ්ජං කාරාපෙත්වා කිලඤ්ජෙහි පටිච්ඡාදාපෙත්වා ආයස්මතො රට්ඨපාලස්ස පුරාණදුතියිකා[3] ආමන්තෙසි: එථ තුම්හෙ වධුයො[4] යෙන අලඞ්කාරෙන අලඞ්කතා පුබ්බෙ රට්ඨපාලස්ස කුලපුත්තස්ස පියා හොථ මනාපා, තෙන අලඞ්කාරෙන අලඞ්කරොථා'ති.

අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා ආයස්මතො රට්ඨපාලස්ස කාලං ආරොචෙසි: 'කාලො තාත රට්ඨපාල, නිට්ඨිතං භත්ත'න්ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සකපිතුනිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා තං හිරඤ්ඤසුවණ්ණස්ස පුඤ්ජං විවරාපෙත්වා ආයස්මන්තං රට්ඨපාලං එතදවොච: 'ඉදං තෙ තාත රට්ඨපාල, මත්තිකං ධනං, අඤ්ඤං පෙත්තිකං, අඤ්ඤං පිතාමහං. සක්කා තාත රට්ඨපාල, භොගෙ ච භුඤ්ජිතුං, පුඤ්ඤානි ච කාතුං, එහි ත්වං තාත රට්ඨපාල, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු, පුඤ්ඤානි ච කරොහීති.

සචෙ ඛො මෙ ත්වං ගහපති වචනං කරෙය්‍යාසි, ඉමං හිරඤ්ඤසුවණ්ණස්ස පුඤ්ජං සකටෙසු ආරොපෙත්වා නිබ්බාහාපෙත්වා මජ්ඣෙගඞ්ගාය නදියා සොතෙ ඔසීදාපෙය්‍යාසි.[5] තං කිස්ස හෙතු: 'උප්පජ්ජිස්සන්ති හි තෙ ගහපති, තතො නිදානං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති.

---

1. අඤ්ඤදත්‍ථුං - ස්‍යා.
2. හරිතෙන ගොමයෙන පථවියා උපලිම්පෙත්වා මහන්තං හිරඤ්ඤසුවණ්ණස්ස පුඤ්ජං කාරාපෙත්වා, ද්වෙ පුඤ්ජෙ කාරාපෙත්වා එකං හිරඤ්ඤස්ස එකං සුවණ්ණස්ස, මහන්තා පුඤ්ජා අහෙසුං ඔරතො ඨිතො පුරිසො පාරතො ඨිතං පුරිසං න පස්සති, තථා පාරතො ඨිතො පුරිසො ඔරතො ඨිතං. තෙ පුඤ්ජෙ කිලඤ්ජෙහි පටිච්ඡාදාපෙත්වා මජ්ඣෙ ආසනං පඤ්ඤාපෙත්වා තිරොකරණීයං පරික්ඛිපිත්වා ආයස්මතො රට්ඨපාලස්ස පුරාණදුතියිකෙ ආමන්තෙසි - ස්‍යාමපොත්‍ථකෙ දිස්සතෙ.
3. පුරාණදුතියිකෙ - ස්‍යා, PTS.
4. වධුකෙ - ස්‍යා, PTS.
5. ඔපිලාපෙය්‍යාසි - සීමු.

'ගැහැවිය, ගෙන් නික්ම සසුන් වන් අපට ගෙයක් කොයින් වේ ද? ගැහැවිය, අපි ගෙ නැතියම්හ. ගැහැවිය, තොප ගේ ගෙට ගියම්හ. එහි දී දන් නො ලදුම්හ. ප්‍රත්‍යා-ඛ්‍යාන ද නො ලදුම්හ. වැළිත් ආක්‍රොශ මතු ලදුම්හ'යි.

'පුත රට්ඨපාලයෙනි, එව, ගෙට යම්හ'යි.

'ගැහැවිය, කම් නැත, මා විසින් අද බත් කිස කරනලදැ''යි.

'පුත රට්ඨපාලයෙනි, එසේ වී නම් සෙට බත ඉවසව'යි.

ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ තුෂ්ණිම්භාවයෙන් ඉවසූහ. එසඳ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පිය තෙමේ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ ඉවසීම දන සිය නිවෙස්න කරා එළැඹියේ යැ. එළැඹ මහත් රන්සුවන් රැසක් කරවා කලාලින් සොයවා (වස්වා) ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පුරාණදුතියිකාවන් ඇමැතී : ''එව වධූනි, තෙපි යම් අලඞ්කාරයෙකින් සැරසුණාහු පෙර රට්ඨපාල කුලපුත්හට ප්‍රිය මනාප වවු ද, එ අලඞ්කාරයෙන් සැරසෙව''යි.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පිය තෙම එරැය ඇවෑමෙන් සිය නිවෙස්නෙහි ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයන් පිළියෙල කරවා ආයුෂ්මත් රට්ඨපාල තෙරණු-වන්ට කල් දන්වී : ''දරුව රට්ඨපාල තෙරණුවනි, බත නිමියේ යැ''යි. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන සිය පියනිවෙස්න කරා එළැඹියහ. එළැඹ පැනවූ අස්නෙහි වැඩහුන්හ. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පිය තෙම රන්සුවන් රැස විවෘත කරවා ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවනට තෙල බස් කී : දරුව රට්ඨපාලයෙනි, මේ තොප ගේ මව සතු ධනය වෙයි, අනෙක පියා සතු යැ, අනෙක මුත්තා සතු වෙයි. දරුව රට්ඨපාලයෙනි, භොග ද වළඳ කරන්නට හැකි යැ, පින් ද කළ හැක්ක. එව දරුව රට්ඨපාලයෙනි, තෙපි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට පෙරළී භෝග ද වළඳ කරව, පින් ද කරව''යි.

ගැහැවියෙනි, ඉදින් තෙපි මබස් කරවූ නම් මේ හිරණ්‍යසුවර්ණ රාශිය ගැලෙහි නංවා බැහැර කරවා ගඟමැද හෝ දියවැළෙහි ගිල්වාලව. ඒ කවර හෙයින යත් : ගැහැවියෙනි, තොපට ඒ හිරණ්‍යාදි හේතුයෙන් ශෝකපරිදේව දුඃඛදෞර්මනස්‍යඋපායාසයෝ උපදිති'යි,

අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පුරාණදුතියිකායො පච්චෙකං පාදෙසු[1] ගහෙත්වා ආයස්මන්තං රට්ඨපාලං එතදවොචුං: 'කීදිසා නාම තා[2] අය්‍යපුත්තක, අච්ඡරායො, යාසං ත්වං හෙතු බ්‍රහ්මචරියං චරසී'ති?

'න ඛො මයං භගිනී, අච්ඡරානං හෙතු බ්‍රහ්මචරියං චරාමා'ති.

භගිනීවාදෙන නො අය්‍යපුත්තො රට්ඨපාලො සමුදාචරතී'ති තත්ථෙව මුච්ඡිතා පපතිංසු.

අථ ඛො ආයස්මා රට්ඨපාලො පිතරං එතදවොච: සචෙ ගහපති, භොජනං දාතබ්බං දෙථ, මා නො විහෙඨෙථා'ති.

භුඤ්ජ තාත රට්ඨපාල, නිට්ඨිතං භත්තන්ති. අථ ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො ආයස්මා රට්ඨපාලො භුත්තාවී ඔනීතපත්තපාණී ඨිතකොව ඉමා ගාථා අභාසි:

"පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති.

පස්ස චිත්තකතං රූපං මණිනා කුණ්ඩලෙන ච,
අට්ඨිත්තචෙන[3] ඔනද්ධං සහ වත්ථෙහි සොභති.

අලත්තකකතා පාදා මුඛං චුණ්ණකමක්ඛිතං,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

අට්ඨාපදකතා කෙසා නෙත්තා අඤ්ජනමක්ඛිතා,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

අඤ්ජනීව නවා චිත්තා පූතිකායො අලඞ්කතො,
අලං බාලස්ස මොහාය නො ච පාරගවෙසිනො.

ඔදහි මිගවො පාසං නාසදා වාකරං මිගො,
භුත්වා නිවාපං ගච්ඡාම[4] කන්දන්තෙ මිගබන්ධකෙ"ති.

අථ ඛො ආයස්මා රට්ඨපාලො ඨිතකොව ඉමා ගාථා භාසිත්වා යෙන රඤ්ඤො කොරබ්‍යස්ස මිගාචීරං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

1. පුරාණදුතියිකා පච්චෙකපාදෙසු - PTS.
2. තාත - ස්‍යා.
3. {අට්ඨිතචෙන - මජසං, ස්‍යා.
{අට්ඨිතඤ්චෙන - PTS.
4. ගච්ඡාමි - සීමු, මජසං.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පුරාණභාර්‍ය්‍යාවෝ වෙන වෙන පා ගෙන ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවනට තෙල බස් කීහු : "හිමියා පුතණුවෙනි, තෙපි යම් අප්සරසුන් පිණිස බ්‍රහ්මචරියාව වසවු නම් ඒ අප්සරස්හු කෙබඳු වෙත් ද ?"යි.

බුහුනැණියෙනි, අපි අප්සරාවන් හේතු කොට බ්‍රහ්මසර නො පුරම්හ.

හිමියාපුත් රට්ඨපාලයෝ බුහුනැණි බසින් අප බෙණෙති"යි එහි මැ මුසපත් වැ හුණුහු.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ පිය මහසිටාණන්ට තෙල බස් කීහු : "ගැහැවි මයනි, ඉදින් බොදුන් දියයුතු නම් දෙව, නහමක් අප පෙළව"යි.

පුතැ රට්ඨපාලයෙනි, වළඳත්තේ මැනැව, බත නිමියේ යයි. එසඳ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ගේ පියමහසිටාණෝ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් ප්‍රණීත ඛාද්‍යයෙන් භෝජ්‍යයෙන් සියතින් සතපාලූහ, මොනවට පවරා ලූහ. ඉක්බිති වළඳා නිමවූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ සිටිවන සිටියාහු මැ මේ ගාථා කීහ :

"යම් ආත්මභාවයක්හු ගේ නිත්‍යස්ථිතියෙක් නැද්ද, ව්‍රණකාය ඇති ඇට නහර මසින් පුරවාලූ නිත්‍යාතුර වූ (ප්‍රාර්ථනා සංකල්ප වශයෙන්) බහු සංකල්ප ඇති විසිතුරු කළ මේ ආත්මභාවය බලව.

මිණියෙනුදු කොඩොලිනුදු සැරසූ විසිතුරු කළ මේ රූපය බලව. ඇට නහරින් වළඳනා ලදුයේ වස්ත්‍රයන් සහිත වැ මැ බබළයි.

පාදයෝ ලතුයෙන් රඳනාලදහ. මුහුණ සුණුබඩින් ගල්වන ලදී. බාලයාගේ මොහයට පමණ වෙයි. සංසාරපාරය සොයනුවහට පමණ නො වෙයි.

කේශයෝ අෂ්ටපදයෙන් රචනා කරනලදහ, නේත්‍රයෝ අඳුනින් ගල්වන ලදහ, බාලයාගේ මොහොයට පමණ වෙයි, සංසාරපාරය සොයනුවහට පමණ නො වෙයි.

විසිතුරු කළ අභිනව අඳුන්නළ සෙයින් කුණුකය සරසන ලදී, බාලයාගේ මොහයට පමණ වෙයි, සංසාරපාරය සොයනුවහට පමණ නො වෙයි.

මුවවැදි වරදල තැබී යැ, මුවා වරදූල නො සැටී යැ, මුවන් බඳනුවා හඬමින් සිටිය දී ගොදුරු වළඳා යම්හ"යි.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ සිටවන සිටියාහු මැ මේ ගාථා කියා කොරව්‍ය රජුගේ මිගාචිර උයන් කරා වැඩියෝ. වැඩ එක්තරා රුකක් මුල දිවා විහාර සඳහා හුන්හු.

අථ ඛො රාජා කොරබ්‍යො මිගවං ආමන්තෙසි : සොධෙහි සම්ම මිගව, මිගාචීරං, උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායා'ති. එවං දෙවා'ති ඛො මිගවො රඤ්ඤො කොරබ්‍යස්ස පටිස්සුත්වා මිගාචීරං සොධෙන්තො අද්දස ආයස්මන්තං රට්ඨපාලං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නං, දිස්වාන යෙන රාජා කොරබ්‍යො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං කොරබ්‍යං එතදවොච : 'සුද්ධං ඛො දෙව මිගාචීරං, අත්ථි ච තත්ථ රට්ඨපාලො නාම කුලපුත්තො ඉමස්මිංයෙව ථුල්ලකොට්ඨිතෙ අග්ගකුලිකස්ස පුත්තො, යස්ස ත්වං අභිණ්හං කිත්තයමානො අහොසි, සො අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො'ති. තෙන හි සම්ම මිගව, අලං දානජ්ජ උය්‍යානභූමියා, තමෙවදානි මයං භවන්තං රට්ඨපාලං පයිරුපාසිස්සාමා'ති.

අථ ඛො රාජා කොරබ්‍යො 'යං තත්ථ ඛාදනීයං භොජනීයං පටියත්තං තං සබ්බං විස්සජ්ජෙථා'ති වත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි ථුල්ලකොට්ඨිතම්හා නිය්‍යාසි මහච්ච රාජානුභාවෙන[1] ආයස්මන්තං රට්ඨපාලං දස්සනාය. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව උස්සටාය උස්සටාය පරිසාය යෙනායස්මා රට්ඨපාලො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා රට්ඨපාලෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතො ඛො රාජා කොරබ්‍යො ආයස්මන්තං රට්ඨපාලං එතදවොච :

'ඉධ භවං රට්ඨපාලො හත්ථත්ථරෙ නිසීදතූ'ති.

'අලං මහාරාජ, නිසීද ත්වං, නිසින්නො අහං සකෙ ආසනෙ'ති.

නිසීදි ඛො රාජා කොරබ්‍යො පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො රාජා කොරබ්‍යො ආයස්මන්තං රට්ඨපාලං එතදවොච : 'චත්තාරිමානි භො රට්ඨපාල, පාරිජුඤ්ඤානි යෙහි පාරිජුඤ්ඤෙහි සමන්නාගතා ඉධෙකච්චෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජන්ති. කතමානි චත්තාරි : ජරාපාරිජුඤ්ඤං බ්‍යාධිපාරිජුඤ්ඤං භොගපාරිජුඤ්ඤං ඤාතිපාරිජුඤ්ඤං.

කතමඤ්ච පන භො රට්ඨපාල, ජරාපාරිජුඤ්ඤං : ඉධ භො රට්ඨපාල, එකච්චො ජිණ්ණො හොති වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. සො ඉති පටිසඤ්චික්ඛති : 'අහං ඛොම්හි එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, න ඛො පන මයා සුකරං අනධිගතං වා භොගං[2] අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. සො තෙන ජරාපාරිජුඤ්ඤෙන සමන්නාගතො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. ඉදං වුච්චති භො රට්ඨපාල, ජරාපාරිජුඤ්ඤං. භවං ඛො පන රට්ඨපාලො එතරහි දහරො යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, තං භොතො රට්ඨපාලස්ස ජරාපාරිජුඤ්ඤං නත්ථි. කිං භවං රට්ඨපාලො ඤත්වා වා දිස්වා වා සුත්වා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො?

1. මහච්චා රාජානුභාවෙන - සීමු, මජසං.
2. අනධිගතා වා භොගා - සීමු, PTS.

එසඳ කොරව්‍ය රජ මිගව නම් උයන්පල්ලා ඇමැති යැ : "සගය මිගවයෙනි, මිගාචිර උයන්බිම ශුද්ධ කරව. එ මනා බිම දක්නට යම්හ"යි. මිගව උයන්පලු 'දේවයිනි, එසේ යැ"යි කෝරව්‍ය රජුට පිළිවදන් දී මිගාචිර උයන ශුද්ධ කරන්නේ එක්තරා රුකක් මුල දිවාවිහාර පිණිස හුන් රට්ඨපාල තෙරණුවන් දිටී. දක කෝරව්‍ය රජු කරා එළැඹියේ යැ. එළැඹ කෝරව්‍ය රජුට තෙල කී : "දේවයිනි, මිගාචිර උයන පරිශුද්ධ යැ. නුඹ වහන්සේ යම් කුලපුතක්හු ගේ ගුණ නිතර කීර්තනය කරන්නාහු ද, මේ ථුල්ලකොට්ඨිත ගම්හි මැ අග්‍රකුලිකයක්හු ගේ පුත්‍ර වූ රට්ඨපාල නම් කුලපුත්‍රයා එහි ඇත. හේ එක්තරා රුකක් මුල දිවාවිහාර සඳහා හිනැ"යි. සගය මිගවයිනි, එසේ වී නම් දූන් අද උයන්බිමින් කම් නැත, අපි දූන් ඒ භවත් රට්ඨපාලයන් මැ උපාසනා කරම්හ"යි.

ඉක්බිති කෝරව්‍ය රජ එහි යම් ඛාද්‍යභෝජ්‍ය පිළියෙල කරන ලද ද, එහැම තෙරවයි කියා භද්‍ර භද්‍ර යානයන් යොදවා භද්‍රයානයකට නැඟී මහත් රාජානුභාවයෙන් ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් දක්නට භද්‍ර භද්‍රයානයෙන් ථුල්ලකොට්ඨිත නියම්ගමින් නික්මගියේ. යම්තාක් යානභූමි වේ ද, එතාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමන් ඇති වැ මැ පතළ පතළ පිරිසෙන් ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් කරා එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවන් හා සතුටු වී. සම්මොදනයට නිසි සිහි කරනුවට නිසි කථා කොට නිමවා එකත්පසෙක සිටියේ යැ. එකත්පස් වැ සිටි කෝරව්‍ය රජ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවනට තෙල බස් කී :

"භවත් රට්ඨපාලයෙනි, මෙහි ඇත් ඇතිරියෙහි හිඳිනේ මැනැවැ"යි.

"කම් නැත මහරජ, තෙපි හිඳුව, මම සිය අස්නෙහි හුන්මි"යි.

කෝරව්‍ය රජ පැනවූ අස්නෙහි හුන්නේ යැ. හිඳ කෝරව්‍ය රජ ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවනට තෙල බස් කී : "භවත් රට්ඨපාලයෙනි, යම් පිරිහීනෙකින් සමන්වාගත වූ මෙලොව ඇතැම් කෙනෙක් කෙහෙරවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම සසුන් වදිත් ද, එබඳු පිරිහීම් සතරෙක් වෙයි. කවර සතරෙක යත් : ජරායෙන් පිරිහීම යැ ව්‍යාධියෙන් පිරිහීම යැ භෝගයෙන් පිරිහීම යැ ඥතීන්ගෙන් පිරිහීම යි.

භවත් රට්ඨපාලයෙනි, ජරායෙන් පිරිහීම යනු කවරෙ යත් : භවත් රට්ඨපාලයෙනි, මෙලොව ඇතැමෙක් ජරපත් වූයේ වෘද්ධ වූයේ ජාතියෙන් මහලු වූයේ ආයුඃකල්පය ඉක්ම ගියේ පශ්චිම වයසට පැමිණියේ වෙයි. හේ මෙසේ නුවණින් සලකයි : "මම දූන් දිරාගියෙමි, වෘද්ධයෙමි, මහලුයෙමි,ආයුඃකල්පය ඉක්ම සිටියෙමි, පැසුළුවියට පැමිණියෙමි මා විසින් වැළිත් නො ලත් භෝග ලබන්නට හෝ ලබන ලද භෝග වඩන්නට හෝ සුකර නො වෙයි, මම් කෙස්මස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදනෙම නම මැනැවැ"යි. හේ ඒ ජරා පිරිහීනෙන් සමන්වාගත වූයේ කෙස්මස් බහා කහවත් හැඳ-පෙරෙවැ ගෙන් නික්ම සසුන් වදී. භවත් රට්ඨපාලයෙනි, මේ වූකලී ජරායෙන් පිරිහීම යයි කියනු ලැබේ. භවත් රට්ඨපාල වනාහි දූන් තරුණ යැ, යෞවනයෙන් සමන්වාගත යැ, මනා කළුකෙහෙ ඇතියේ ය, භද්‍රයෞවනයෙන් සමන්වාගත යැ, ප්‍රථම වයසින් සමන්වාගත යැ, භවත් රට්ඨපාලයනට ඒ ජරා පිරිහීන නැත. භවත් රට්ඨපාල කුමක් දූන හෝ දක හෝ අසා හෝ ගෙන් නික්ම සසුන් වන්නේ ද?

කතමඤ්ච පන භො රට්ඨපාල, බ්‍යාධිපාරිජුඤ්ඤං: ඉධ භො රට්ඨපාල එකච්චො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. සො ඉති පටිසඤ්චික්ඛති: අහං ඛොම්හි එතරහි ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො න ඛො පන මයා සුකරං අනධිගතං වා භොගං[1] අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකත්තුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය’න්ති. සො තෙන බ්‍යාධිපාරිජුඤ්ඤෙන සමන්නාගතො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. ඉදං වුච්චති භො රට්ඨපාල, බ්‍යාධිපාරිජුඤ්ඤං. භවං ඛො පන රට්ඨපාලො එතරහි අප්පාබාධො අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය. තං භොතො රට්ඨපාලස්ස බ්‍යාධිපාරිජුඤ්ඤං නත්ථි. කිං භවං රට්ඨපාලො ඤත්වා වා දිස්වා වා සුත්වා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො?

කතමඤ්ච පන භො රට්ඨපාල, භොගපාරිජුඤ්ඤං: ඉධ භො රට්ඨපාල, එකච්චො අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො. තස්ස තෙ භොගා අනුපුබ්බෙන පරික්ඛයං ගච්ඡන්ති. සො ඉති පටිසඤ්චික්ඛති: අහං ඛො පුබ්බෙ අඩ්ඪො අහොසිං මහද්ධනො මහාභොගො තස්ස මෙ තෙ භොගා අනුපුබ්බෙන පරික්ඛයං ගතා, න ඛො පන මයා සුකරං අනධිගතං වා භොගං[2] අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකත්තුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය’න්ති. සො තෙන භොගපාරිජුඤ්ඤෙන සමන්නාගතො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. ඉදං වුච්චති භො රට්ඨපාල භොගපාරිජුඤ්ඤං. භවං ඛො පන රට්ඨපාලො ඉමස්මිංයෙව ථුල්ලකොට්ඨිතෙ අග්ගකුලිකස්ස පුත්තො. තං භොතො රට්ඨපාලස්ස භොගපාරිජුඤ්ඤං නත්ථි. කිං භවං රට්ඨපාලො ඤත්වා වා දිස්වා වා සුත්වා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො?

කතමඤ්ච පන භො රට්ඨපාල, ඤාතිපාරිජුඤ්ඤං: ඉධ භො රට්ඨපාල, එකච්චස්ස බහූ හොන්ති මිත්තාමච්චා ඤාතිසාලොහිතා. තස්ස තෙ ඤාතකා අනුපුබ්බෙන පරික්ඛයං ගච්ඡන්ති. සො ඉති පටිසඤ්චික්ඛති: මමං ඛො පුබ්බෙ බහූ අහෙසුං මිත්තාමච්චා ඤාතිසාලොහිතා, තස්ස මෙ තෙ ඤාතකා අනුපුබ්බෙන පරික්ඛයං ගතා, න ඛො පන මයා සුකරං අනධිගතං වා භොගං අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය’න්ති. සො තෙන ඤාතිපාරිජුඤ්ඤෙන සමන්නාගතො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. ඉදං වුච්චති භො රට්ඨපාල, ඤාතිපාරිජුඤ්ඤං. භොතො ඛො පන රට්ඨපාලස්ස ඉමස්මිංයෙව ථුල්ලකොට්ඨිතෙ බහූ මිත්තාමච්චා ඤාතිසාලොහිතා. තං භොතො රට්ඨපාලස්ස ඤාතිපාරිජුඤ්ඤං නත්ථි. කිං භවං රට්ඨපාලො ඤත්වා වා දිස්වා වා සුත්වා වා අගාරස්මා අනගාරියං පබ්බජිතො?

---

1. අනධිගතා වා භොගා - සීමු, PTS.
2. { අනධිගතා වා භොගා - සීමු, PTS.
   { අනධිගතෙ වා භොගෙ - ස්‍යා.

භවත් රට්ඨපාලයෙනි, ව්‍යාධියෙන් පිරිහීම යනු කවරේ යත් : භවත් රට්ඨපාලයෙනි, මෙලොව ඇතැමෙක් හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිගිලන් වෙයි. හේ මෙසේ නුවණින් සලකයි : "මම වූකලි දැන් ආබාධ ඇත්තෙමි, දුකට පැමිණියෙමි, දැඩිගිලන්මි. මා විසින් වැළිත් නො ලත් භෝග ලබන්නට හෝ ලත් භෝග තර කරන්නට හෝ සුකර නො වෙයි. මම කෙහෙරවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදනෙම් නම් යෙහෙකැ"යි. හෙ ඒ ව්‍යාධි පිරිහීමෙන් සමන්වාගත වූයේ කෙහෙරවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදියි. භවත් රට්ඨපාලයෙනි, මෙ වූකලි 'ව්‍යාධි පිරිහිනැ'යි කියනු ලැබේ. භවත් රට්ඨපාල වනාහි දැන් නීරොග යැ, නිදුක් යැ, ඉතා උෂ්ණ නො වූ ඉතා ශීත නො වූ සම වැ (අහර) පැසෙනසුලු ග්‍රහණියෙන් සමන්වාගත වූයේ යි. භවත් රට්ඨපාලහට ඒ ව්‍යාධිපරිහාණි නැත. භවත් රට්ඨපාල කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගෙන් නික්ම සසුන් වන්නේ ද?

භවත් රට්ඨපාලයෙනි, වැළිත් භෝගක්ෂය යනු කවරෙ යත් : භවත් රට්ඨපාලයෙනි, මෙලොව ඇතැමෙක් ආඪ්‍ය (ඊශ්වර) වූයේ මහත් ධන ඇතියේ (පස්කම්ගුණ විසින් එළැඹ සිටි) මහත් භෝග ඇත්තේ වෙයි. ඔහු ගේ ඒ භෝගයෝ අනුක්‍රමයෙන් ක්ෂය බවට යෙති. හේ මෙසේ නුවණින් සලකයි : "මම වනාහි පෙර ආඪ්‍ය වීමි, මහත් ධන ඇති වීමි, මහත් භෝග ඇති වීමි. ඒ මා ගේ ඒ භෝගයෝ අනුක්‍රමයෙන් ක්ෂයභාවයට ගියහ. මා විසින් වැළිත් නො ලත් භෝග ලබන්නට හෝ ලත් භෝග වඩන්නට හෝ සුකර නො වෙයි. මම කෙස්මස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදනෙම් නම් මැනැවැ"යි. හෙ ඒ භෝගපරිහාණියෙන් සමන්වාගත වූයේ කෙස්මස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදි. භවත් රට්ඨපාලයෙනි, මෙ 'භෝගක්ෂය'යයි කියනු ලැබේ. භවත් රට්ඨපාල වනාහි මෙ මැ ථුල්ලකොට්ඨිත නියම්ගම්හි අග්‍රකුල ඇතියාගේ පුත්‍ර වෙයි. භවත් රට්ඨපාලහට ඒ භොගපරිහාණි නැත. භවත් රට්ඨපාල කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගෙන් නික්ම සසුන් වන්නේ ද?

භවත් රට්ඨපාලයෙනි, ඥාතිපරිහානි කවරෙ යත් : භවත් රට්ඨපාලයෙනි, මෙලොව ඇතැම් කෙනකුන්ට මිත්‍රාමාත්‍යයෝ ද නෑ සහලේ නෑයෝ ද බොහෝ වෙති. ඔහු ගේ ඒ නෑයෝ ක්‍රමයෙන් පරික්ෂයට යෙත්. හේ මෙසේ සලකයි : "මට වනාහි පෙර සගයහළුවෝ ද නෑසාලේනෑයෝ ද බොහෝ වූහ. මා ගේ ඒ නෑයෝ ක්‍රමයෙන් ක්ෂය වූහ. මා විසින් නො ලත් භෝග ලබන්නට වේවයි ලත් භෝග දියුණු කරන්නට වේවයි සුකර නො වෙයි. මම කෙහෙමස් බහා කහවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නට වදනෙම් නම් මැනැවැ"යි. හේ ඒ ඥාතිපරිහාණියෙන් සමන්වාගත වැ කෙහෙමස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සස්නට වදනේ යැ. භවත් රට්ඨපාලයෙනි, මෙ වනාහි ඥාතිපරිහාණි නමු. භවත් රට්ඨපාලයන්හට මේ ථුල්ලකොට්ඨිත ගම්හි මැ සගයහළුවෝත් නෑසහලේනෑයෝත් බොහෝ ඇත. භවත් රට්ඨපාලයන්හට ඒ ඥාතිපරිහාණි නැත. භවත් රට්ඨපාලයෝ කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගෙන් නික්ම සස්නට පැමිණියාහු ද ?

ඉමානි බො භො රට්ඨපාල, චත්තාරි පාරිජුඤ්ඤානි යෙහි පාරිජුඤ්ඤෙහි සමන්නාගතා ඉධෙකච්චෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තානි භොතො රට්ඨපාලස්ස නත්ථි. කිං භවං රට්ඨපාලො ඤත්වා වා දිස්වා වා සුත්වා වා අගාරස්මා අනගාරියං පබ්බජිතොති?

අත්ථි බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මුද්දෙසා උද්දිට්ඨා යෙ'හං[1] ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො. කතමෙ චත්තාරො:

'උපනීයති ලොකො අද්ධුවො'ති බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමො ධම්මුද්දෙසො උද්දිට්ඨො, යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො.

'අත්තාණො ලොකො අනභිස්සරො'ති බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දුතියො ධම්මුද්දෙසො උද්දිට්ඨො, යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො.

'අස්සකො ලොකො සබ්බං පහාය ගමනීය'න්ති බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තතියො ධම්මුද්දෙසො උද්දිට්ඨො, යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො.

'ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො'ති බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චතුත්ථො ධම්මුද්දෙසො උද්දිට්ඨො, යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො.

ඉමෙ බො මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මුද්දෙසා උද්දිට්ඨා, යෙ'හං[1] ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතොති.

'උපනීයති ලොකො අද්ධුවො'ති භවං රට්ඨපාලො ආහ. ඉධ පන භො රට්ඨපාල, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බොති? තං කිම්මඤ්ඤසි මහාරාජ, අහොසි ත්වං වීසති වස්සුද්දෙසිකොපි පඤ්චවීසති[2] වස්සුද්දෙසිකොපි හත්ථිස්මිම්පි කතාවී අස්සස්මිම්පි කතාවී රථස්මිම්පි කතාවී ධනුස්මිම්පි කතාවී ථරුස්මිම්පි කතාවී ඌරුබලී බාහුබලී අලමත්තො සඞ්ගාමාවචරොති?

අහොසිං අහං භො රට්ඨපාල, වීසතිවස්සුද්දෙසිකොපි පඤ්චවීසතිවස්සුද්දෙසිකොපි හත්ථිස්මිම්පි කතාවී අස්සස්මිම්පි කතාවී රථස්මිම්පි කතාවී ධනුස්මිම්පි කතාවී ථරුස්මිම්පි කතාවී ඌරුබලී බාහුබලී අලමත්තො සඞ්ගාමාවචරො, අප්පෙකදාහං භො රට්ඨපාල, ඉද්ධිමා ච මඤ්ඤෙ[3] න අත්තනො බලෙන සමසමං[4] සමනුපස්සාමීති.

1. යමහං - ස්‍යා, යෙ අහං - PTS, මජ්සං.
2. පණ්ණවීසති - මජ්සං, ස්‍යා. / පණ්ණුවීසති - PTS.
3. ඉද්ධි මා ච මඤ්ඤෙ - සීමු. / ඉද්ධිමා මඤ්ඤෙ - ස්‍යා.
4. අත්තනො බලෙන සමං - සීමු.

භවත් රට්ඨපාලයෙනි, මෙලොව යම් පරිහානියෙකින් සමන්වාගත වූ කිසි කෙනෙක් කෙසේමස් බහා කහවත් හැදපෙරෙවැ ගෙන් නික්ම සස්නට වදිත් ද (එයට හේතු වූ) මේ සතර පරිහානීහු යි. භවත් රට්ඨපාලයන්හට ඔහු නැත. භවත් රට්ඨපාලයෝ කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගේ පියා සස්නට පැමිණියාහු ද?

මහරජ, මම යම් ධර්මනිර්දේශ කෙනකුන් දැන ද දැක ද අසා ද ගෙන් නික්ම සස්නට පැමිණියෙම් වෙ ද භගවත්වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් වූ ඒ සම්‍යක්සම්බුද්ධ-යන් වහන්සේ විසින් දක්වා වදළ ධර්මනිර්දේශයෝ සතර දෙනෙක් ඇත. කවර සතර දෙනෙක යත්:

මහරජ, මම යම් ධර්මනිර්දේශයක් දැන ද දැක ද අසා ද ගේ පියා සස්නට පැමිණියෙම් වෙ ද, "ලෝකයා ජරාමරණයන් කරා යෙයි (එයින් මැ) 'අධ්‍රැව'යයි. පළමුවන ධර්ම නිර්දේශය භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරන ලද්දේ යැ.

මහරජ, මම යම් (දෙවන) ධර්මනිර්දේශයක් දැන ද දැක ද අසා ද ගේ පියා සස්නට පැමිණියෙම් වෙ ද, "ලොකයා ත්‍රාණ රහිත යැ වෙත පැමිණ අස්වස් දෙන්නට නිසියෙක් නැති'යි, දෙවන ධර්මනිර්දේශය භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරන ලද්දේ යැ.

මහරජ, මම යම් (තෙවන) ධර්මනිර්දේශයක් දැන ද දැක ද අසා ද ගේ පියා සස්නට පැමිණියෙම් ද "ලෝකයා තමා අයත් දය නැත්තේ යැ, හැම හැරපියා යායුතු" යයි. තුන් වන ධර්මනිර්දේශය භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරන ලද්දේ යැ.

මහරජ, මම යම් (සිවුවන) ධර්මනිර්දේශයක් දැන ද දැක ද අසා ද ගේ පියා සස්නට පැමිණියෙම් ද, "ලොකයා ඌන යැ තෘප්ති රහිත යැ තෘෂ්ණාවට දසය"යි සතරවන ධර්මනිර්දේශය භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදරන ලද්දේ යැ.

මහරජ, මම (මෙසේ) යම් ධර්මනිර්දේශ කෙනකුන් දැන ද දැක ද අසා ද ගෙන් නික්ම සස්නට පැමිණියෙම් ද භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ ධර්මනිර්දේශයෝ සතර දෙන වදරන ලදහ.

භවත් රට්ඨපාලයෝ "ලෝකයා ජරාමරණයන් කරා යෙයි (එයින් මැ) අධ්‍රැව"යයි කියත්, භවත් රට්ඨපාලයෙනි, මෙහි දී තෙල භාෂිතයා ගේ අර්ථ කෙසේ දැක්කයුතු ද? මහරජ, ඒ කෙසේ හඟිහි? තෝ විසිවස් ඇතියෙහිත් වීහි ද? පස්විසිවස් ඇතියෙහිත් වීහි ද? හස්තිශිල්පයෙහිත් කළ කරණී ඇතියෙහි අශ්වශිල්පයෙහිත් කළ කරණී ඇතියෙහි රථශිල්පයෙහිත් කළ කරණී ඇතියෙහි ධනුශ්ශිල්පයෙහිත් කළ කරණී ඇතියෙහි ඛඞ්ග ශිල්පයෙහිත් කළ කරණී ඇතියෙහි ඌරුබල ඇතියෙහි බාහුබල ඇතියෙහි සමත් අත්බව ඇතියෙහි සඞ්ග්‍රාමාවචර වූයෙහි වීහි ද?

භවත් රට්ඨපාලයෙනි, මම විසිවස් ඇතියෙම් ද පස්විසිවස් ඇතියෙම් ද වීමි. හස්තිශිල්ප-යෙහිත් කළ කරණී ඇතියෙම් අශ්වශිල්පයෙහිත් කළ කරණී ඇතියෙම් රථශිල්පයෙහිත් කළ කරණී ඇතියෙම් ධනුශ්ශිල්පයෙහිත් කළ කරණී ඇතියෙම් ඛඞ්ගශිල්පයෙහිත් කළ කරණී ඇතියෙම් ඌරුබල ඇතියෙම් බාහුබල ඇතියෙම් සමත් අත්බව ඇතියෙම් සඞ්ග්‍රා-මාවචර වූයෙම් වීමි. භවත් රට්ඨපාලයෙනි, මම කිසි දිනෙක ඍද්ධි ඇතියෙකිම් සිතමි. සියබලය හා සමසමයකු නො දක්මි.

තං කිං මඤ්ඤසි මහාරාජ, එවමෙව ත්වං එතරහි ඌරුබලී බාහුබලී අලමත්තො සඞ්ගාමාවචරොති?

නොහිදං භො රට්ඨපාල, එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, ආසීතිකො මෙ වයො වත්තති. අප්පෙකදාහං භො රට්ඨපාල, ඉධ පාදං කරිස්සාමීති අඤ්ඤෙනෙව පාදං කාරෙමීති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං 'උපනීයති ලොකො අද්ධුවො'ති. යමහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතොති.

අච්ඡරියං භො රට්ඨපාල, අබ්භුතං භො රට්ඨපාල, යාවසුභාසිතමිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උපනීයති ලොකො අද්ධුවොති. උපනීයති හි භො රට්ඨපාල, ලොකො අද්ධුවො.

සංවිජ්ජන්තෙ ඛො භො රට්ඨපාල, ඉමස්මිං රාජකුලෙ හත්ථිකායාපි අස්සකායාපි රථකායාපි පත්තිකායාපි, යෙ අම්හාකං ආපදාසු පරියොධාය වත්තිස්සන්ති. 'අත්තාණො[1] ලොකො අනභිස්සරො'ති භවං රට්ඨපාලො ආහ. ඉමස්ස පන භො රට්ඨපාල, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බොති?

තං කිං මඤ්ඤසි මහාරාජ, අත්ථි තෙ කොචි අනුසායිකො ආබාධොති?

අත්ථි මෙ භො රට්ඨපාල, අනුසායිකො ආබාධො. අප්පෙකදා මං භො රට්ඨපාල, මිත්තාමච්චා ඤාතිසාලොහිතා පරිවාරෙත්වා ඨිතා හොන්ති ඉදානි රාජා කොරබ්‍යො කාලං කරිස්සති, ඉදානි රාජා කොරබ්‍යො කාලං කරිස්සතී'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ලභසි ත්වං තෙ මිත්තාමච්චෙ ඤාතිසාලොහිතෙ 'ආයන්තු මෙ භොන්තො මිත්තාමච්චා ඤාතිසාලොහිතා, සබ්බෙව සන්තා ඉමං වෙදනං සංවිභජථ, යථාහං ලහුකතරිකං වෙදනං වෙදියෙය්‍ය'න්ති, උදාහු ත්වංයෙව තං වෙදනං වෙදියසීති?

නාහං භො රට්ඨපාල, ලභාමි තෙ මිත්තාමච්චෙ ඤාතිසාලොහිතෙ ආයන්තු මෙ භොන්තො මිත්තාමච්චා ඤාතිසාලොහිතා, සබ්බෙව සන්තා ඉමං වෙදනං සංවිභජථ, යථාහං ලහුකතරිකං වෙදනං වෙදියෙය්‍යන්ති. අථ ඛො අහමෙව තං වෙදනං වෙදියාමීති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං 'අත්තාණො[1] ලොකො අනභිස්සරො'ති යමහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතොති.

අච්ඡරියං භො රට්ඨපාල, අබ්භුතං භො රට්ඨපාල, යාවසුභාසිතමිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන 'අත්තාණො ලොකො අනභිස්සරො'ති. අත්තාණො හි භො රට්ඨපාල, ලොකො අනභිස්සරො.

---

1. අතාණෙ – සීමු, මජසං, ස්‍යා .

මහරජ, ඒ කෙසේ හඟිහි ? එපරිදි මැ තෝ දුන් ඌරුබල ඇතියෙහි බාහුබල ඇතියෙහි සමත් අත්බව ඇතියෙහි සඞ්ග්‍රාමාවචරයෙහි ද ?

භවත් රට්ඨපාලයෙනි, එසේ නො වෙමි. දුන් දිරාගියෙමි වෘද්ධ වූයෙමි මහලු වූයෙමි කල් ගැලවූයෙමි පශ්චිම වයසට පැමිණියෙමි වෙමි. මා ගේ අසූවන විය වෙයි. භවත් රට්ඨපාලයෙනි, මම කිසි දිනෙක මෙහි පා තබමියි අන් තැනෙකැ පා තබමි' කී යැ.

මහරජ, භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් ඒ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ කරුණ සඳහා "ලෝකයා ජරාමරණය කරා යෙයි, අධ්‍රැව යැ'යි වදරන ලදි. මම යම් ධර්මනිර්දේශයක් දන ද දක ද අසා ද ගිහිගෙන් නික්ම සස්නට පැමිණියෙම් ද මෙ එයට හෙතු යි.

ආශ්චර්‍ය්‍යී යැ භවත් රට්ඨපාලයෙනි, අද්භූත යැ භවත් රට්ඨපාලයෙනි, ඒ භාග්‍යවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් "ලෝකයා ජරාමරණ කරා යෙයි, අධ්‍රැව යැ"යි වදළ මෙය සුභාෂිතයෙක් මැ යැ, භවත් රට්ඨපාලයෙනි, ලෝකයා ජරාමරණය කරා යේ මැ යැ අධ්‍රැව යි.

භවත් රට්ඨපාලයෙනි, යම් සියුරඟ සෙන්හු අප ගේ විපත්හි දී උවදුරු මැඩගෙන වැටෙත් ද, එ බඳු වූ හස්තිසමූහයෝ ද අශ්වසමූහයෝ ද රථසමූහයෝ ද පදාති සමූහයෝ ද මේ රජකුලයෙහි ඇත් මැ යැ. භවත් රට්ඨපාලයෝ "ලෝකයා ත්‍රාණ රහිත යැ, වෙත පැමිණ අස්වසන්නට තිසියෙක් නැත්තේ යැ"යි කියති. භවත් රට්ඨපාලයෙනි, මේ භාෂිතයාගේ අර්ථ කෙසේ දතයුතු වේ ද?

මහරජ, ඒ කෙසේ හඟිහි ? තට කිසියම් සිරුරෙහි නිධානගත වැ වැටෙන ආබාධයෙක් ඇද්ද ?

භවත් රට්ඨපාලයෙනි, මට අනුසයිත වාතාබාධයෙක් ඇත. භවත් රට්ඨපාලයෙනි කිසි දිනෙකැ සඟයහළුවෝ ද නෑසහලේනැයෝ ද මා වට කොට ගෙන සිටියාහු වෙති, 'දුන් කෝරව්‍ය රජ කළුරිය කෙරෙයි, දුන් කෝරව්‍ය රජ කළුරිය කෙරෙයි" කියා යි.

මහරජ, ඒ කෙසේ හඟිහි ? "භවත් මිත්‍රාමාත්‍යයෝ ද නෑසහලේනැයෝ ද එත්වා, මම යම් පරිදි ලඝුතර වේදනාවක් විඳින්නෙම් නම් එපරිද්දෙන් හැමදෙන මේ වේදනාව බෙදගනුව"යි. ඒ සඟයහළුවන් හා නෑසාලේනැයන් ලබාගන්නෙහි ද? නොහොත් තෙපි මැ ඒ වේදනාව විඳුනහු ද ?යි.

භවත් රට්ඨපාලයෙනි, මා ගේ භවත් මිත්‍රාමාත්‍යයෝ ද නෑසාලේනැයෝ ද එත්වා, "යම් පරිදි මම ලඝුතර වේදනාවක් විඳුනෙම් නම් එපරිදි හැම දෙන මේ වේදනා බෙදගනුව"යි ඒ සඟයහළුවන් හා නෑසාලේනැයන් ලබා නො ගන්නෙමි, වැළිත් මම මැ ඒ වේදනාව විඳගනිමි'යි. කී.

මහරජ, "ලෝකයා ත්‍රාණ රහිත යැ, අනභිස්සර යැ'යි භගවත් වූ වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ කරුණ සඳහා වදරන ලදි. මම යම් ධර්මනිර්දෙශයක් දන ද දක ද අසා ද ගෙන් නික්ම සස්නට පැමිණියෙම් ද මේ එයට හේතු යි.

භවත් රට්ඨපාලයෙනි, ආශ්චර්‍ය්‍යී යැ භවත් රට්ඨපාලයෙනි, අද්භූත යැ "ලෝකයා ත්‍රාණ රහිත යැ, අනභිස්සර යැ"යි භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙය මොනොවට වදරන ලද්දේ මැ යැ.

සංවිජ්ජති ඛො භො රට්ඨපාල, ඉමස්මිං රාජකුලෙ පහූතං හිරඤ්ඤ-සුවණ්ණං භූමිගතඤ්ච වෙහාසගතඤ්ච, ‘අස්සකො ලොකො සබ්බං පහාය ගමනීය’න්ති, භවං රට්ඨපාලො ආහ. ඉමස්ස පන භො රට්ඨපාල, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බොති?

තං කිං මඤ්ඤසි මහාරාජ, යථා ත්වං එතරහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙසි. ලච්ඡසි ත්වං පරත්ථාපි, එවමෙවාහං ඉමෙහෙව පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙමීති. උදාහු අඤ්ඤෙ ඉමං භොගං පටිපජ්ජිස්සන්ති, ත්වං පන යථාකම්මං ගමිස්සසීති.?

යථාහං භො රට්ඨපාල, එතරහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙමි. නාහං ලච්ඡාමි පරත්ථාපි එවමෙවාහං ඉමෙ-හෙව පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙමීති. අථ ඛො අඤ්ඤෙ ඉමං භොගං පටිපජ්ජිස්සන්ති. අහං පන යථාකම්මං ගමිස්සාමීති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: ‘අස්සකො ලොකො සබ්බං පහාය ගමනීය’න්ති. යමහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතොති.

අච්ඡරියං භො රට්ඨපාල, අබ්භූතං භො රට්ඨපාල, යාව සුභාසිතමිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ‘අස්සකො ලොකො, සබ්බං පහාය ගමනීය’න්ති, අස්සකො හි භො රට්ඨපාල, ලොකො සබ්බං පහාය ගමනීයං.

‘ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො’ති භවං රට්ඨපාලො ආහ. ඉමස්ස පන භො රට්ඨපාල, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බොති?

තං කිං මඤ්ඤසි මහාරාජ, ඵීතං කුරුං අජ්ඣාවසසීති?

එවං භො රට්ඨපාල, ඵීතං කුරුං අජ්ඣාවසාමීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ තෙ පුරිසො ආගච්ඡෙය්‍ය පුරත්ථිමාය දිසාය සද්ධායිකො පච්චයිකො. සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ, ජානෙය්‍යාසි, අහං ආගච්ඡාමි පුරත්ථිමාය දිසාය, තත්ථද්දසං මහන්තං ජනපදං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බහුජනං ආකිණ්ණ-මනුස්සං, බහු තත්ථ හත්ථිකායා අස්සකායා රථකායා පත්තිකායා, බහුං තත්ථ ධනධඤ්ඤං[1], බහුං තත්ථ හිරඤ්ඤසුවණ්ණං අකතඤ්චෙව කතඤ්ච, බහු තත්ථ ඉත්ථිපරිග්ගහො. සක්කා ච තාවතකෙන බලමත්තෙන[2] අභිවිජිනිතුං, අභිවිජින මහාරාජා’ති. කින්ති නං කරෙය්‍යාසීති?

තම්පි මයං භො රට්ඨපාල, අභිවිජිය[3] අජ්ඣාවසෙය්‍යාමාති.

---

1. බහු තත්ථ දන්තාජිනං - ස්‍යා, PTS.
2. බලමත්තෙන - PTS.
තාවත්තකෙන බලමත්තෙන ස්‍යා.
3. අභිවිජ්ජිය - ස්‍යා.

Free Distribution www.aathaapi.org

භවත් රට්ඨපාලයෙනි, මේ රාජකුලයෙහි භූමිගත වූ ත් ආකාශගත වූත් ප්‍රභූත හිරණ්‍ය-සුවර්ණ ඇත. "ලෝකයා තමා අයත් කිසිවක් නැත්තේ යැ' හැම හැරපියා යායුතු යැ"යි. භවත් රට්ඨපාලයෝ කියති. භවත් රට්ඨපාලයෙනි, වැළිත් මේ භාෂිතයා ගේ අර්ථය කෙසේ දතයුතු වේ ද ? යි.

මහරජ, ඒ කිමැ යි හඟනෙහි ද? යම්සේ තෙපි දැන් පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්වාගත වැ ඉඳුරන් පිනවවු ද, තෙපි පරලෙව්හිදු "මෙසෙයින් මැ මම මෙ මැ පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්වාගත වැ ඉඳුරන් පිනවමී" ලබවු ද? නොහොත් අන්‍යයෝ මෙ භෝගය පිළිපදනාහු ද, තෙපි වැළිත් කර්මානුරූප වැ යන්නහු දැ ?යි.

භවත් රට්ඨපාලයෙනි, යම්සේ මම දැන් පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්වාගත වැ ඉඳුරන් පිනවම් ද, මම පරලෙව්හිදු "මෙසෙයින් මැ මෙ මැ පස්කම්ගුණයෙන් යුක්ත වැ සමන්වාගත වැ ඉඳුරන් පිනවමී" නො ලැබෙමි, වැළිත් අන්හු මෙ භොග ලබන්නාහ. මම වැළිත් කම්සේ යන්නෙමී"යි.

මහරජ, ඒ භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ සඳහා "ලෝකයා තමා අයත්කිසිවක් නැත්තේ යැ, සියල්ල හැරපියා යායුතු වන්නේ යැ"යි වදාරන ලද. මම යම් දහමක් දැන ද දැක ද අසා ද ගෙන් නික්ම සසුන් වන්නෙම් නම් මේ එය යි.

ආශ්චර්‍ය්‍ය යැ භවත් රට්ඨපාලයෙනි, අද්භූත යැ භවත් රට්ඨපාලයෙනි, ඒ භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් "ලෝකයා තමා අයත් කිසිවක් නැත්තේ යැ, සියල්ල හැරපියා යායුතු වන්නේ යැ"යි වදාළ මේ සුභාෂිත මැ යි. භවත් රට්ඨපාලයෙනි, 'ලෝකයා තමා අයත් කිසිවක් නැත්තේ මැ යැ, සියල්ල හැරපියා යායුතු මැ වන්නේ යි.

"ලෝකයා ඌන යැ, අතෘප්ත යැ, තෘෂ්ණාවට දස යැ"යි භවත් රට්ඨපාලයෝ කියති. භවත් රට්ඨපාලයෙනි, මේ භාෂිතයා ගේ අර්ථ කෙසේ දතයුතු වේ දැ ?යි.

මහරජ, ඒ කිමැ යි හඟිහි ද? සමෘද්ධ වූ කුරු ජනපදයෙහි ඉසුරු වැ වෙසේ දැ ?යි.

එසේ යැ භවත් රට්ඨපාලයෙනි, සමෘද්ධ වූ කුරු ජනපදයෙහි වෙසෙමි'යි.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙහි තොප ගේ හැදහිය හැකි වචන ඇති උපාදේය-වචන ඇති පුරුෂයෙක් පෙරදිගින් එන්නේ යැ. හෙ තොප කරා එළැඹ මෙසේ කියන්නේ යැ: මහාරාජයෙනි, දන්නේ මැනැවි. මම පෙරදිගින් එන්නෙමි. එහි සමෘද්ධ වූත් ඉතා සමෘද්ධ වූ ත් බොහෝ ජනයා ඇති මිනිසුන් ගැවැසිගත් මහත් ජනපදයක් දිටිමි. එහි හස්තිකායයෝ බොහෝහ, අශ්වකායයෝ බොහෝහ, රථකායයෝ බොහෝහ, පදතිකායයෝ බොහෝහ, එහි ධනධාන්‍ය බොහෝ යැ, එහි කළ නො කළ හිරණ්‍යසුවර්ණ බොහෝ යැ, එහි ස්ත්‍රීපරිග්‍රහ බොහෝ යැ, තාවන්මාත්‍රබලයෙකින් දනන්නට හැකි යැ, මහරජ දිනාගනුව"යි. කිම ඒ කෙරෙහි දැ ?යි.

'භවත් රට්ඨපාලයෙනි, අපි එ ද දිනාගෙන වසම්හ'යි.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ තෙ පුරිසො ආගච්ඡෙය්‍ය පච්ඡිමාය දිසාය -පෙ- උත්තරාය දිසාය -පෙ- දක්ඛිණාය දිසාය -පෙ- පරසමුද්දතො සද්ධායිකො පච්චයිකො. සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: යග්ඝෙ මහාරාජ, ජානෙය්‍යාසි, අහං ආගච්ඡාමි පරසමුද්දතො, තත්‍රද්දසං මහන්තං ජනපදං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච බහුජනං ආකිණ්ණමනුස්සං, බහූ තත්‍ර හත්ථිකායා අස්සකායා රථකායා පත්තිකායා, බහුං තත්‍ර ධනධඤ්ඤං, බහුං තත්‍ර හිරඤ්ඤසුවණ්ණං අකතඤ්චෙව කතඤ්ච, බහු තත්‍ර ඉත්ථිපරිග්ගහො. සක්කා ච තාවත්තකෙන බලමත්තෙන අභිවිජිනිතුං. අභිවිජින මහාරාජා'ති කින්ති නං කරෙය්‍යාසීති.

තම්පි මයං භො රට්ඨපාල, අභිවිජිය අජ්ඣාවසෙය්‍යාමාති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'ඌනො ලොකො අතිත්තො තණ්හා-දාසො'ති. යමහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතොති.

අච්ඡරියං භො රට්ඨපාල, අබ්භුතං භො රට්ඨපාල, යාව සුභාසිතමිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන 'ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො'ති. ඌනො හි භො රට්ඨපාල ලොකො අතිත්තො තණ්හාදාසොති.

ඉදමවොචායස්මා රට්ඨපාලො, ඉදං වත්වා අථාපරං එතදවොච:

පස්සාමි ලොකෙ සධනෙ මනුස්සෙ
ලද්ධාන විත්තං න දදන්ති මොහා,
ලුද්ධා ධනං සන්නිචයං කරොන්ති
භිය්‍යොව[1] කාමෙ අභිපත්ථයන්ති.

රාජා පසය්හ[2] පථවිං විජිත්වා[3]
සසාගරන්තං මහිමාවසන්තො,[4]
ඕරං සමුද්දස්ස අතිත්තරූපො
පාරං සමුද්දස්සපි පත්ථයෙථ.

රාජා ච අඤ්ඤෙ ච බහූ මනුස්සා
අවීතතණ්හා[5] මරණං උපෙන්ති,
ඌනාව හුත්වාන ජහන්ති දෙහං
කාමෙහි ලොකම්හි නහත්ථි තිත්ති.

1. භිය්‍යො ච - ස්‍යා.
2. පසය්හා - සිමු, මජසං, PTS.
3. ජිනිත්වා - සිමු.
4. {මහිං ආවසන්තො - PTS. / මහියාවසන්තො - සිමු.
5. අතිත්තතණ්හා - මජසං.

මහරජ, ඒ කෙසේ හඟිහි? මෙහි ශ්‍රාද්ධෙය වචන ඇති විශ්වාසභූමි වූ තොප ගේ පුරුෂයෙක් පැළදිගිනුදු එයි . . . උතුරුදිගිනුදු එයි . . . දකුණුදිගිනුදු එයි . . . පරසමුද්‍රයෙනුදු එයි. හේ තොප කරා එළැඹ මෙසේ බෙණෙයි : දේවයන් වහන්ස, දන්නාව? මම පරසමුද්‍රයෙන් එමි. එහි සමෘද්ධිමත් වූ ද වෘද්ධිමත් වූ ද බොහෝ දෙනා ඇති මනුෂ්‍යගණාකීර්ණ මහත් ජනපදයක් දිටිමි. එහි හස්තිසමූහයෝ බොහෝහ. අශ්වසමූහයෝ බොහෝහ. රථසමූහයෝ බොහෝහ. පදතිසමූහයෝ බොහෝහ. ධනධාන්‍ය බොහෝයැ. එහි කළ නො කළ හිරණ්‍යසුවණ් බොහෝ යැ. එහි ස්ත්‍රීපරිග්‍රහ බොහෝ යැ. තාවත්මාත්‍රබලයෙකින් දනන්නට හැකි යැ. දෙවයිනි, දිනාගනුව''යි. කිම, එය කරන්නාව ?යි.

භවත් රට්ඨපාලයෙනි, අපි එ ද දිනාගෙන වසම්හ'යි.

මහරජ, භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් ''ලොකයා ඌන යැ, තෘප්ති රහිත යැ, තෘෂ්ණාදස යැ යන මෙ බස මෙ කරුණ සඳහා වදරන ලද්දේ යැ. මම යම ධර්මනිර්දෙශයක් දන ද දක ද අසා ද ගිහිගෙන් නික්ම සස්නට පැමිණියෙම් ද මේ එයට හෙතු යි.

භවත් රට්ඨපාලයෙනි, ආශ්චර්‍ය්‍ය යැ, භවත් රට්ඨපාලයෙනි, අද්භූත යැ. භගවත් වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් ''ලොකයා ඌන යැ තෘප්ති රහිත යැ තෘෂ්ණාදස යැ යන මෙ බස මොනොවට වදරන ලද්දේ මැ යැ. භවත් රට්ඨපාලයෙනි, ලොකයා ඌන මැ යැ තෘප්ති රහිත මැ යැ තෘෂ්ණාදස මැ යි.

ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ මේ ධර්මනිර්දේශ කීහ. මේ කියා නැවැත තදන්‍ය තෙල ගාපෙළ ද කීහු :

''ලෝකයෙහි ධනසම්පන්න මිනිසුන් දකිමි. ධන ලැබ මෝහ හේතුයෙන් නො දෙති. ලෝභාභිභූත වූවාහු ධනය රැස් කෙරෙති, පුනපුනා කාමසම්පත් බෙහෙවින් පතත්.

රජ සතුරුමුළු මැඩගෙන සාගරාන්ත සහිත පොළෝ දිනා පොළොව පසස්නේ සමුද්‍රයා ගේ මෙතෙර සියරට ඇත ද (එයින්) අතෘප්තරූප වැ සමුද්‍රයා ගේ පරතෙර (ද්වීපාන්තරය) ද පතන්නේ යැ.

රජු හා තදන්‍ය බොහෝ මනුෂ්‍යයෝ ද අවිගතතෘෂ්ණ වැ මරණයට යෙත්. අපරිපූර්ණ මනෝරථ ඇති වැ මැ දේහය පියත්. මෙලොවැ වස්තුකාමයෙහි තෘප්තියෙක් නම් නැත.

කන්දන්ති නං ඤාති[1] පකිරිය කෙසෙ
අහො වත නො[2] අමරාති චාහු,
වත්ථෙන නං පාරුතං නීහරිත්වා
චිතං සමාධාය තතො ඩහන්ති.

සො ඩය්හති සූලෙහි තුජ්ජමානො
එකෙන වත්ථෙන පහාය භොගෙ,
න මීයමානස්ස භවන්ති තාණා
ඤාතීධ මිත්තා අථ වා සහායා.

දායාදකා තස්ස ධනං හරන්ති
සත්තො පන ගච්ඡති යෙන කම්මං,
න මීයමානං ධනමන්වෙති කිඤ්චි
පුත්තා ච දාරා ච ධනඤ්ච රට්ඨං.

න දීඝමායුං ලභතෙ ධනෙන
න චාපි විත්තෙන ජරං විහන්ති,
අප්පං හිදං[3] ජීවිතමාහු ධීරා
අසස්සතං[4] විපරිණාමධම්මං.

අඩ්ඪා දළිද්දා ච ඵුසන්ති ඵස්සං
බාලො ච ධීරො ච තථෙව ඵුට්ඨො,
බාලො හි බාල්‍යාවධිතොව සෙති
ධීරො ච න වෙධති ඵස්සඵුට්ඨො.

තස්මා හි පඤ්ඤාව ධනෙන සෙය්‍යො
යාය වොසානං ඉධාධිගච්ඡති,
අබ්‍යොසිතත්තා[5] හි භවාභවෙසු
පාපානි කම්මානි කරොන්ති මොහා.

උපෙති ගබ්භඤ්ච පරඤ්ච ලොකං
සංසාරමාපජ්ජ පරම්පරාය,
තස්සප්පපඤ්ඤො අභිසද්දහන්තො
උපෙති ගබ්භඤ්ච පරඤ්ච ලොකං.

චොරො යථා සන්ධිමුඛෙ ගහීතො
සකම්මනා[6] හඤ්ඤති පාපධම්මො,
එවං පජා පෙච්ච පරං හි ලොකෙ
සකම්මනා හඤ්ඤති පාපධම්මො.[7]

---

1. තං ඤාති - සීමු.
2. නෙ - PTS.
3. අප්පකඤ්චිදං - ස්‍යා.
4. අසස්සස්සතං - ස්‍යා.
5. අසොසිතත්තා - සීමු, PTS.
6. සකම්මුනා - මජ්සං, ස්‍යා.
7. පාපධම්මා - ස්‍යා.

ඥතිහු කෙහෙ විසුරුවාගෙන ඔහු ආඞ්වාන කෙරෙති. අහෝ අප ගේ නෑයෝ ඒකාන්තයෙන් නො මැරෙන්නාහු වෙත්ව'යි ද කියති. වස්ත්‍රයෙකින් පොරෝනාලද ඔහු ගෙන් බැහැර කොට චිතකයට නගා ඉක්බිති දවත්.

හේ භෝගයන් හැරපියා එක් මැ වස්ත්‍රයෙකින් යුතු වැ හුලින් පෙළනුලැබෙමින් දැවෙයි. මියනුවහට මෙලොවැ ඥතිහු මිත්‍රයෝ නොහොත් යහළුවෝ ත්‍රාණ නො වෙත්.

ඔහු ගේ ධනය දයාදයෝ ගෙන යති. සත්ත්ව වැළිත් කර්මානුරූප වැ යෙයි. කිසි ධනයක් මිය යනුවහු පසුපස නො එයි. පුත්‍රයෝ ද භාර්‍ය්‍යාවෝ ද ධනය ද රට ද නො එත්.

ධන හේතුයෙන් යම් දීර්ඝායුෂ ලබා ද ඒ ධනයෙන් ජරාව නො ද නස්නේ යැ. බුද්ධාදි ධීරයෝ අල්ප වූ නෙල ජීවිතය පෙරළෙන සැහැවි ඇති (එහෙයින් මැ) අශාශ්වතයක් කොට වදරත්.

ආඪ්‍යයෝ ද දරිද්‍රයෝ ද අනිෂ්ට මරණස්පර්ශයට පැමිණෙත්. බාලයා ද ධීරයා ද එසෙයින් මැ පහළේ වෙයි. (වෙසෙස කිමෙක යත් :) බාලයා වනාහි බාලභාවයෙන් හිංසිත වැ හෝනේ යැ. අනිෂ්ටස්පර්ශයෙන් ස්පර්ශ කරනලද ධීරයා වනාහි නො සැලෙන්නේ යි.

මෙලොව යම් ප්‍රඥයෙකින් ලෝකාන්ත සඞ්ඛ්‍යාත නිර්වාණය ලබා ද එහෙයින් ධනයට වඩා ප්‍රඥව මැ උතුම් වෙයි. අව්‍යවසිත (අර්හත්වප්‍රාප්තියෙන් සසර අවසන් නො කළ) බැවින් මොහ හේතුයෙන් කුදුමහත් භවයෙහි පව්කම් කෙරෙත්.

හේ පුනපුනා සසරට පැමිණ මාතෘගර්භය කරා ද පරලොව කරා ද එළැඹෙයි. ඔහු ගේ ක්‍රියා හදහන මඳනුවණැත්තේ මාතෘගර්භය කරා ද පරලොව කරා ද එළැඹෙයි.

(සන්ධිච්ඡෙද සඞ්ඛ්‍යාත) පාපධර්ම ඇති සොර තෙම යමසේ සන්ධිමුඛයෙහි දී ගන්නා ලද්දේ ස්වකීය කර්ම හේතුයෙන් පෙළනු ලැබේ ද, එසෙයින් මැ පාපස්වභාව ඇති ප්‍රජාව මියැ පරලෙව්හි දී සියකම් හෙයින් පෙළනු ලැබෙයි.

Free Distribution www.aathaapi.org

කාමා හි චිත්‍රා මධුරා මනොරමා
විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා
තස්මා අහං පබ්බජිතොම්හි රාජ.

දුමප්ඵලානීව[1] පතන්ති මානවා
දහරා ච වුඩ්ඪා ච සරීරභෙදා,
එතම්පි දිස්වා[2] පබ්බජිතොම්හි රාජ
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො''ති.

රට්ඨපාලසුත්තං දුතියං

---

1. දුමප්ඵලානෙව - සීමු, මජ්ඣසං, ස්‍යා.
2. {එතං විදිත්වා - ස්‍යා.
   {එවම්පි දිස්වා - සීමු.

යම් හෙයකින් වස්තුකාමයෝ විසිතුරු වූවාහු මධුර වූවාහු (පුහුදුනට) මනරම් වූවාහු විවිධස්වරූපයෙන් සිත අළලත් ද, එහෙයින් මහරජ මම් කාමගුණයෙහි ආදීනව දැක පැවිදි වූයෙමි.

තරුණ වූ ද වෘද්ධ වූ ද සත්ත්වයෝ ශරීරභේදයෙන් වෘක්ෂයන් ගේ ඵල සෙයින් (දිවියෙන්) ගිළිහෙති. මහරජ, මෙසේත් දැක පැවිදි වීමි. නෛර්‍යාණික වූ ශ්‍රමණභාවය මැ උත්තරිතර වේ'' යයි.

දෙ වැනි රට්ඨපාල සූත්‍ර යි.

2. 4. 3

මඛාදෙවසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා මිථිලායං විහරති මඛාදෙවම්බවනෙ.[1] අථ ඛො භගවා අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: කො නු ඛො හෙතු, කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය, න අකාරණෙ[2] තථාගතා සිතං පාතුකරොන්තී'ති. අථ ඛො ආයස්මා ආනන්දො එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො භගවතො සිතස්ස පාතුකම්මාය? න අකාරණෙ[2] තථාගතා සිතං පාතුකරොන්තී'ති.

භූතපුබ්බං ආනන්ද, ඉමිස්සායෙව මිථිලායං රාජා අහොසි මඛාදෙවො[3] නාම ධම්මිකො ධම්මරාජා ධම්මෙ ඨිතො මහාරාජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු[4] චෙව ජානපදෙසු ච. උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්ස.

අථ ඛො ආනන්ද, රාජා මඛාදෙවො බහුන්නං[5] වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන කප්පකං ආමන්තෙසි: 'යදා මෙ සම්ම කප්පක, පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි[6] ජාතානි, අථ මෙ ආරොචෙය්‍යාසී'ති. එවං දෙවාති ඛො ආනන්ද, කප්පකො රඤ්ඤො මඛාදෙවස්ස පච්චස්සොසි. අද්දසා ඛො ආනන්ද, කප්පකො බහුන්නං[5] වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන රඤ්ඤො මඛාදෙවස්ස සිරස්මිං පලිතානි ජාතානි. දිස්වාන රජානං මඛාදෙවං එතදවොච: පාතුභූතා ඛො දෙවස්ස දෙවදූතා, දිස්සන්ති සිරස්මිං පලිතානි[6] ජාතානී'ති. තෙන හි සම්ම කප්පක, තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා මම[7] අඤ්ජලිස්මිං පතිට්ඨාපෙහීති. එවං දෙවාති ඛො ආනන්ද, කප්පකො රඤ්ඤො මඛාදෙවස්ස පටිස්සුත්වා තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා රඤ්ඤො මඛාදෙවස්ස අඤ්ජලිස්මිං පතිට්ඨාපෙසි.

අථ ඛො ආනන්ද, රජා මඛාදෙවො කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං ආමන්තාපෙත්වා එතදවොච: පාතුභූතා ඛො මෙ තාත කුමර දෙවදූතා, දිස්සන්ති සිරස්මිං පලිතානි ජාතානි, භුත්තා ඛො පන මෙ මානුසකා කාමා, සමයො දිබ්බෙ කාමෙ පරියෙසිතුං. එහි ත්වං තාත කුමාර, ඉමං රජ්ජං පටිපජ්ජ, අහං පන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං

1. මඝදෙවම්බවනෙ – මජසං, ස්‍යා.
2. න අකාරණෙන – PTS.
3. මඝදෙවො – මජසං, ස්‍යා.
4. නිගමෙසු – සීමු.
5. බහූනං – මජසං, ස්‍යා.
6. ඵලිතානි – PTS.
7 මමං – PTS.

Free Distribution www.aathaapi.org

2. 4. 3
මඛාදේව සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මියුලුනුවර නිසා මඛාදේව නම් අඹඋයන්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා පියෙසෙක්හි සිනා පහළ කළ සේක. එසඳ ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට තෙල සිත් වී : "භාග්‍යවතුන් වහන්සේ ගේ සිනා පහළ කිරීමට හේතු කවරෙ යැ, ප්‍රත්‍යය කවරෙ යැ? නො කරුණෙහි තථාගතයෝ සිනා පහළ නො කෙරෙති"යි. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සිවුරු එකස් කොට පෙරවැබුදුන් දෙසට ඇදිලි බැඳ වැඳ භාග්‍යවත්හට තෙල බස් සැල කොළෝ : "භාග්‍යවතුන් වහන්සේ ගේ සිනා පහළ කිරීමට හේතු කවරේ යැ, ප්‍රත්‍යය කවරේ යැ? අකාරණයෙහි තථාගතයෝ සිනා පාළ නො කෙරෙති"යි.

ආනන්‍දය, පෙර වූ දයක් කියමි : මෙ මැ මිථිලායෙහි ධාර්මික වූ ධර්මරාජන් වූ මඛාදේව නම් රජ කෙනෙක් වූහ. (දශකුශල කර්මපථ) ධර්මයෙහි සිටි මහරජ බමුණුගැහැවියන් කෙරෙහි ද නියම්ගම්වැසියන් කෙරෙහි ද දනවුවැසියන් කෙරෙහි ද සම වැ හැසිරෙයි. තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අටවක්හි ද පෙහෙවස් ද එළැඹෙයි.

එකල්හි ආනන්‍දය, මඛාදේව රජ බොහෝ වර්ෂශතසහස්‍රයන් ඇවෑමෙන් කපුවා ඇමැතී ය : "සගය කපුව, යම් දිනෙකැ මා හිස නර උපදනේ වේ ද, එසඳ මට සැල කරව"යි කී. ආනන්‍දයෙනි, ඒ කපු "දේවයෙනි, එසේ යැ"යි මඛාදේව රජුට පිළිවදන් දිනි. ආනන්‍දයෙනි ඒ කපු වර්ෂශතසහස්‍රයන් ඇවෑමෙන් මඛාදේව රජුගේ හිසැ උපන් නර දිටි. දක මඛාදේව රජුට තෙල කී : "දේවයන්හට දේවදූතයෝ පහළ වූහ, හිසෙහි උපන් පලිතයෝ පැනෙති" යි. "සගය කපුව, එ කරුණින් ඒ නර මොනොවට හඩුයෙන් උදුරා මා ඇදිලියෙහි තබව"යි. ආනන්‍දයෙනි, ඒ කපුවා "දෙවයිනි, එසේ යැ"යි. මඛාදෙව රජුට පිළිවදන් දී ඒ පලිතයන් මොනොවට අඩුයෙන් උදුරා මඛාදෙව රජු ගේ ඇදිලියෙහි තැබී.

ආනන්‍දය, ඉක්බිති මඛාදේව රජ කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු අමතා තෙල බස් කී : "පුතැ කුමරුවෙනි, මට දේවදූතයෝ පහළ වූහ, හිසෙහි උපන් නර පැනෙයි, මා විසින් මානුෂකාමයෝ වළඳනලදහ, දිව්‍යකාම සොයන්නට කල් වෙයි. පුතැ කුමරුවෙනි, තෙපි එව, මේ රජය පිළිපදුව, මම වනාහි කෙහෙමස් බහා කසාවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම පැවිද්දට පැමිණෙමි. පුතැ කුමරුවෙනි, ඒ කරුණින් මැ තෙපි ද යම් දිනෙකැ

පබ්බජිස්සාමි. තෙන හි තාත කුමාර, යදා ත්වම්පි පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි ජාතානි, අථ කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යාසි. යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං[1] නිහිතං අනුප්පවත්තෙය්‍යාසි. මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසි. යස්මිං ඛො තාත කුමාර, පුරිසයුගෙ වත්තමානෙ එවරූපස්ස කල්‍යාණස්ස වට්ටස්ස සමුච්ඡෙදො හොති, සො තෙසං අන්තිමපුරිසො හොති. තං තාහං තාත කුමාර, එවං වදාමි: 'යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාසි, මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසී'ති.

අථ ඛො ආනන්ද, රාජා මඛාදෙවො කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං[2], ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි, කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, යථා තතියං, තථා චතුත්ථිං[2] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි.

රාජා ඛො පනානන්ද, මඛාදෙවො චතුරසීතිවස්සසහස්සානි කුමාරකීළිතං කීළි, චතුරසීතිවස්සසහස්සානි ඔපරජ්ජං[3] කාරෙසි, චතුරසීතිවස්සසහස්සානි රජ්ජං කාරෙසි, චතුරාසීතිවස්සසහස්සානි ඉමස්මිං යෙව මඛාදෙවම්බවනෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො බ්‍රහ්මචරියං චරි. සො චත්තාරෙ බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

අථ ඛො ආනන්ද, රඤ්ඤො මඛාදෙවස්ස පුත්තො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන කප්පකං ආමන්තෙසි: 'යදා මෙ සම්ම කප්පක, පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි ජාතානි. අථ මෙ ආරොචෙය්‍යාසී'ති. එවං දෙවාති ඛො ආනන්ද, කප්පකො රඤ්ඤො මඛාදෙවස්ස පුත්තස්ස පච්චස්සොසි. අද්දසා ඛො ආනන්ද, කප්පකො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන රඤ්ඤො මඛාදෙවස්ස පුත්තස්ස සිරස්මිං පලිතානි ජාතානි, දිස්වාන රඤ්ඤො මඛාදෙවස්ස පුත්තං එතදවොච: 'පාතුභූතා ඛො දෙවස්ස දෙවදූතා, දිස්සන්ති සිරස්මිං පලිතානි ජාතානී'ති. තෙන හි සම්ම කප්පක, තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා මම අඤ්ජලිස්මිං පතිට්ඨාපෙහී'ති. එවං දෙවාති ඛො අනන්ද, කප්පකො රඤ්ඤො මඛාදෙවස්ස පුත්තස්ස පටිස්සුත්වා තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා රඤ්ඤො මඛාදෙවස්ස පුත්තස්ස අඤ්ජලිස්මිං පතිට්ඨාපෙසි.

---

1. වත්තං - මජසං, ස්‍යා.
2. චතුත්ථං - මජසං, ස්‍යා.
3. උපරජ්ජං - ස්‍යා

හිසෙහි උපන් නර දක්නහු ද, එසඳ කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු මොනොවට රජයෙහි ලා සමනුශාසනා කොට කෙහෙමස් බහා කසාවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම පැවිද්දට පැමිණෙව, මා විසින් මේ කලණ වැටෙක් පිහිටුවන ලද ද, එය පවත්වා ලව. තෙපි මා ගේ අන්තිම පුරුෂ නො වව. පුතැ කුමරුවෙනි, යම් පුරුෂයුගයක් ඇති විට මෙ බඳු කලණ වට සිඳී යේ ද, හේ උන් ගේ අන්තිම පුරුෂ වෙයි. පුතැ කුමරුවෙනි, එහෙයින් මම තොපට මෙසේ කියමි : මා විසින් මේ කලණවැටෙක් පිහිටුවන ලද ද, එය පවත්වා ලව, තෙපි නහමක් මා ගේ අන්තිම පුරුෂ වව''යි.

ඉක්බිති ආනන්‍දයෙනි, මඛාදේව රජ කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු රජයෙහි ලා සමනුශාසනා කොට මේ මුවදෙව් අඹවෙනෙහි මැ කෙහෙමස් බහා කහවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම පැවිද්දට වන. හෙ මෙත්සහගිය සිතින් එක් දිගක් පතුරුවා ගෙන විසී. එසේ දෙවන දිග ද එසේ තුන්වන දිග ද එසේ සතරවන දිග දැ'යි මෙසෙයින් උඩ යට සරස හැම තන්හි සර්‍වාත්මතායෙන් හැම ලොවැ විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ මෛත්‍රී සහගත චිත්තයෙන් ස්පර්‍ශ කොට විසී. කරුණා සහගත සිතින් .... මුදිතාසහගත සිතින් ... උපේක්‍ෂාසහගත සිතින් එක් දිගක් ස්පර්‍ශ කොට විසී. එසේ දෙවන දිග ද එසේ තුන් වන දිග ද එසේ සතර වන දිග දැ'යි මෙසෙයින් උඩ යට සරස හැම තන්හි සර්‍වාත්මතායෙන් හැම ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ උපෙක්ෂා සහගත සිතින් සපර්‍ශ කොට විසී.

ආනන්‍දයෙනි, මඛාදේව රජ සුවාසූදහසක් හවුරුදු කුමර කෙළි කෙළියේ. සුවාසූදහසක් හවුරුදු යුවරජය කෙළේ. සුවාසූදහසක් හවුරුදු රජය කෙළේ. සුවාසූදහසක් හවුරුදු මේ මඛාදේව අඹවෙනෙහි මැ ගෙන් නික්ම ඍෂි ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේ බඹසර පිරී. හෙ සතර බඹවෙහෙර හවා කාබුන් මරණින් මතුයෙහි බඹලෝ කරා ගියේ වී.

ඉක්බිති ආනන්‍දයෙනි, මඛාදේව රජ්ජු පුත් බොහෝ වර්‍ෂශතසහස්‍රයන් ඇවෑමෙන් කපුවා ඇමැති : සගය කපුව, යම් දිනෙක මා ගේ හිසෙහි පලිතයෝ උපදිත් ද, එසඳ මට කියව''යි කී. ආනන්‍දයෙනි, ඒ කපුවා ''දේවයෙනි එසේ යැ ''යි මඛාදේවපුත්‍ර රජුට පිළිවදන් දිනි. ආනන්‍දයෙනි, එ කපුවා බොහෝ වර්‍ෂශතසහස්‍රයන් ඇවෑමෙන් මඛාදෙවපුත්‍ර රජුගේ හිසෙහි පහළ වූ නරකෙස් දිටි. දැක මඛාදේවපුත්‍ර රාජයාහට තෙල බස් කී : ''දේවයන්හට දෙවදූතයෝ පහළ වූහ, හිසෙහි හටගත් පලිතයෝ පැනෙති''යි කී. ''සගය කපුව, එහෙයින් ඒ පලිත මනාකොට අඬුවෙන් උදුරා මා ගේ කරපුටයෙහි තබව''යි. ආනන්‍දයෙනි, 'දේව-යෙනි, එසේ යැ'යි කපුවා මඛාදේවපුත්‍ර රාජයාහට පිළිවදන් දී ඒ නර මනාකොට අඬුවෙන් උදුරා මඛාදේවපුත්‍ර රජුගේ කරපුටයෙහි තැබී.

අථ ඛො ආනන්ද, රඤ්ඤො මඛාදෙවස්ස පුත්තො කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං ආමන්තාපෙත්වා එතදවොච: ‘පාතුභූතා ඛො මෙ තාත කුමාර, දෙවදූතා දිස්සන්ති, සිරස්මිං පලිතානි ජාතානි, භුත්තා ඛො පන මෙ මානුසකා කාමා, සමයො දිබ්බෙ කාමෙ පරියෙසිතුං, එහි ත්වං තාත කුමාර, ඉමං රජ්ජං පටිපජ්ජ, අහං පන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි. තෙන හි තාත කුමාර, යදා ත්වම්පි පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි ජාතානි, අථ කප්පකස්ස ගාමවරං දත්වා, ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යාසි. යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාසි, මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසි. යස්මිං ඛො තාත කුමාර, පුරිසයුගෙ වත්තමානෙ එවරූපස්ස කල්‍යාණස්ස වට්ටස්ස සමුච්ඡෙදො හොති, සො තෙසං අන්තිමපුරිසො හොති. තං තාහං තාත කුමාර, එවං වදාමි: යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාසි, මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසී’ති.

අථ ඛො ආනන්ද, රඤ්ඤො මඛාදෙවස්ස පුත්තො කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. රඤ්ඤො ඛො පනානන්ද, මඛාදෙවස්ස පුත්තො චතුරාසීතිවස්සසහස්සානි කුමාරකීළිතං කීළි, චතුරාසීතිවස්සසහස්සානි ඔපරජ්ජං කාරෙසි, චතුරාසීතිවස්සසහස්සානි රජ්ජං කාරෙසි, චතුරාසීතිවස්සසහස්සානි ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො බ්‍රහ්මචරියං චරි. සො චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

රඤ්ඤො ඛො පනානන්ද, මඛාදෙවස්ස පුත්තපපුත්තකා[2]. තස්ස පරම්පරා චතුරාසීතිඛත්තියසහස්සානි[3] ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිංසු. තෙ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරිංසු. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං[4]. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිංසු. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරිංසු.

1. සබ්බත්ථතාය - සීමු.
2. පුත්තපපුත්තිකා - සීමු.
3. චතුරාසීතිරාජසහස්සානි - මජ්ඣසං; චතුරාසීතිසහස්සානි - ස්‍යා.
4. චතුත්ථං - මජ්ඣසං, ස්‍යා.

Free Distribution www.aathaapi.org

ඉක්බිති ආනන්දයෙනි, මඛාදේව රජු පුත් කපුවාට ගම්වරයක් දී දෙටුපුත්කුමරු අමතා මෙල බස් කී : "පුතැ කුමරුවෙනි, මට දේවදූතයෝ පහළ වූහ. හිසෙහි උපන් පලිතයෝ පැනෙති. මා විසින් වනාහි මානුෂකාමයෝ වළඳන ලදහ. දිව්‍යකාම සොයන්නට කලි. එව දරුව කුමාරයෙනි, තෙපි මේ රජය පිළිගනුව. මම වැළිත් කෙහෙරැවුළු බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම තවුස් පැවිද්දට වදනෙමි. එසේ වී නම් පුතැ කුමරුවෙනි, යම් කලෙකැ තෙපි දු හිසෙහි පලිතයෝ දක්නවු ද, එකල්හි කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු මොනොවට රජයෙහි සමනුශාසනා කොට කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම තවුස්පැවිද්දට වදුව. මා විසින් තබන ලද මේ කලණවැට පවත්වව. තෙපි නහමක් මා ගේ අන්තිමපුරුෂ වව. දරුව කුමාරයෙනි, යම් පුරුෂ යුගයක් පවත්නා කල්හි මෙවන් කලණවැට සිඳේ ද, හෙ ඔවුන් ගේ අන්තිමපුරුෂ වෙයි. එහෙයින් පුතැ කුමරුවෙනි, තොපට මම මෙසේ කියමි : "මා විසින් තබන ලද මේ කලණ වැට පවත්වව. තෙපි නහමක් මා ගේ අන්තිමපුරුෂ වව''යි.

ඉක්බිති ආනන්දයෙනි, මඛාදේව රජු ගේ පුත්‍ර කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු මොනොවට රාජ්‍යයෙහි සමනුශාසනා කොට මෙ මැ මුවදෙව් අඹවෙනෙහි කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම තවුස්පැවිදි වන. හේ මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා විසී. එසේ දෙවන දිග යැ එසේ තුන්වන දිග යැ එසේ සතර වන දිග යැ'යි මෙසෙයින් උඩ යට සරස සියලු තැන්හි සර්වාත්මතායෙන් සියලු ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෙත් සහගිය සිතින් ස්පර්ශ කොට විසී. කරුණා සහගත සිතින් . . මෘදුතාසහගත සිතින් . . . . උපේක්ෂාසහගත සිතින් එක් දිගක් ස්පර්ශ කොට විසී. එසේ දෙවන දිග යැ එසේ තුන්වන දිග යැ එසේ සතර වන දිග යැ යි මෙසෙයින් උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියලු ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ උපෙක්ෂා සහගත සිතින් ස්පර්ශ කොට විසී. ආනන්දයෙනි, වැළිත් මුවදෙව් රජු පුත් සුවාසූදහසක් හවුරුදු කුමරකෙළි කෙළියේ යැ, සුවාසූදහසක් හවුරුදු යුවරජය කෙළේ, සුවාසූදහසක් හවුරුදු රජය කෙළේ, සුවාසූදහසක් හවුරුදු මෙ මැ මුවදෙව් අඹවෙනෙහි ගෙන් නික්ම තවුස්පැවිදි වන්නේ බඹසර සැරි. හෙ සිවුබඹවෙහෙර වඩා කාබුන් මරණින් මතු බඹලොව කරා ගියේ යි.

තවද ආනන්දයෙනි, ඒ මඛාදෙව රජු ගේ දරුමුනුබුරු පරපුරෙහි සුවාසූදහසක් ක්‍ෂත්‍රියයෝ මෙ මැ මඛාදේව අඹවනයෙහි කෙහෙමස් බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම තවුස්පැවිදි වන්හ. ඔහු මෙත් සහගිය සිතින් එක් දිගක් අරමුණු කොට විසූහ. එසේ දෙ වන දිග යැ එසේ තුන් වන දිග යැ එසේ සතර වන දිග යැ'යි මෙසේ උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් සියලු ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෛත්‍රී සහගත චිත්තයෙන් අරමුණු කොට විසූහ. කරුණාසහගත සිතින් . . . මෘදුතාසහගත සිතින් . . . උපේක්ෂාසහගත සිතින් එක් දිගක් ස්පර්ශ කොට විසූහ. එසේ

තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරිංසු. තෙ චතුරසීතිවස්සසහස්සානි කුමාරකීළිතං කීළිංසු, චතුරාසීතිවස්සසහස්සානි ඔපරජ්ජං[1] කාරෙසුං, චතුරසීතිවස්සසහස්සානි රජ්ජං කාරෙසුං, චතුරසීතිවස්සසහස්සානි ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ අගාරස්මා අනගාරියං පබ්බජිතා බ්‍රහ්මචරියං චරිංසු. තෙ චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගා අහෙසුං.

නිමි තෙසං රාජානං[2] පච්ඡිමකො අහොසි ධම්මිකො ධම්මරාජා, ධම්මෙ ඨිතො මහාරාජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච, උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්ස.

භූතපුබ්බං ආනන්ද, දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: 'ලාභා වත භො විදෙහානං, සුලද්ධං වත[3] භො විදෙහානං. යෙසං නිමිරාජා ධම්මිකො ධම්මරාජා ධම්මෙ ඨිතො මහාරාජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච, උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්සාති.

අථ ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි: 'ඉච්ඡෙය්‍යාථ නො තුම්හෙ මාරිසා, නිමිං රාජානං දට්ඨු'න්ති. ඉච්ඡාම මයං මාරිස, නිමිං රාජානං දට්ඨුන්ති. තෙන ඛො පන සමයෙන නිමි රාජා තදහුපොසථෙ පණ්ණරසෙ සසීසං නහාතො[4] උපොසථිකො උපරි පාසාදවරගතො නිසින්නො හොති. අථ ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො නිමිස්ස රඤ්ඤො පමුඛෙ[5] පාතුරහොසි. අථ ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො නිමිං රාජානං එතදවොච: 'ලාභා තෙ මහාරාජ, සුලද්ධං තෙ මහාරාජ, දෙවා තෙ මහාරාජ, තාවතිංසා-සුධම්මායං සභායං කිත්තයමානරූපා සන්නිසින්නා: 'ලාභා වත භො විදෙහානං, සුලද්ධං වත භො විදෙහානං යෙසං නිමි රාජා ධම්මිකො ධම්මරාජා ධම්මෙ ඨිතො මහාරාජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච, උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්සා'ති. දෙවා තෙ මහාරාජ, තාවතිංසා දස්සනකාමා, තස්ස තෙ අහං මහාරාජ, සහස්සයුත්තං ආජඤ්ඤරථං පහිණිස්සාමි, අභිරූහෙය්‍යාසි මහාරාජ, දිබ්බං යානං අවිකම්පමානො'ති

අධිවාසෙසි ඛො ආනන්ද, නිමිරාජා තුණ්හීභාවෙන. අථ ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො නිමිස්ස රඤ්ඤො අධිවාසනං විදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙවං නිමිස්ස රඤ්ඤො පමුඛෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි.

---

1. උපරජ්ජං - ස්‍යා, මජසං.
2. රාජා - ස්‍යා.
3. සුලද්ධලාභාවත - සීමු.
4. සීසන්හාතො - ස්‍යා. / සීසං නහාතො - PTS
5. සම්මුඛෙ - ස්‍යා.

දෙ වන දිග යැ එසේ තුන් වන දිග යැ එසේ සතර වන දිග යැ'යි මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ උපෙක්ෂා සහගත සිතින් අරමුණු කොට විසූහ. ඔහු සුවාසූදහසක් හවුරුදු කුමරකෙළි කෙළියහ, සුවාසූදහසක් හවුරුදු යුවරජය කළහ. සුවාසූදහසක් හවුරුදු මහරජය කළහ. සුවාසූ දහසක් හවුරුදු මෙ මැ මඛාදෙව අඹවෙනෙහි ගෙන් නික්ම පැවිද්දට පැමිණියාහු බඹසර සැරූහ. ඔහු සියුබඹවෙහෙර වඩා කාබුන් මරණින් මතු බඹලොව කරා ගියහ.

ධාර්මික වූ ධර්මරාජන් වූ නිමි එ රජුන් ගේ පැසුළුරජ වී. දහමෙහි සිටි මහරජ බමුණු ගැහැවියන් කෙරෙහි ද නියම්ගම් වැසියන් කෙරෙහි ද දනවුවැසියන් කෙරෙහි ද සම වැ හැසිරෙයි, තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අටවක්හි ද පෙහෙවසු ද වෙසෙයි.

ආනන්‍දයෙනි, භූතපූර්වයක් කියමි : සුදම්සබයෙහි රැස් වැ හුන් තව්තිසාවැසි දෙවියන් කෙරෙහි මේ අතුරු කථාව උපන : ''භවත්නි, විදෙහයනට එකාන්ත ලාභයෙක, භවත්නි, විදෙහයනට එකාන්ත මනා ලාභයෙක. යම් කෙනකුන්ට ධාර්මික වූ ධර්මරාජන් වූ නිමිරජ ඇද්ද, දහමෙහි සිටි මහරජ බමුණුගැහැවියන් කෙරෙහි ද නියම්ගම් වැසියන් කෙරෙහි ද දනවුවැසියන් කෙරෙහි ද සම වැ හැසිරේ ද, තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අටවක්හි ද පෙහෙවසුදු වෙසේ ද, ඒ විදෙහයනට එකාන්ත ලාභයෙකැ''යි.

ඉක්බිති ආනන්‍දයෙනි, සක්දෙවිඳු තව්තිසැවැසි දෙවියන් ඇමැති : ''නිදුකාණෙනි තෙපි අප ගේ නිමිරජු දක්නට කැමැතියවු දැ''යි. එසමයෙහි වනාහි නිමිරජ එ පණුරැයි පොහෝ දවස්හි හිස් සෝධා නහා පෙහෙවස් සමාදන් වැ මතුමහල්තලයට වැද හුන්නේ වෙයි. එසඳ ආනන්‍දයෙනි, සක්දෙවිඳු යම්සේ නම් බලවත් පුරුෂයෙක් වක් කළ අතක් හෝ දික් කරන්නේ ද, දික් කළ අතක් හෝ වක් කරන්නේ ද, එසෙයින් මැ තව්තිසාදෙවියන් කෙරෙහි අතුරුදහන් වූයේ නිමිරජු පෙරට පහළ වී. ඉක්බිති ආනන්‍දයෙනි, සක්දෙවිඳු නිමිරජහට තෙල බස් කී : ''මහරජ, තොපට ලාභයෙක, මහරජ, තොපට මනා ලාභයෙකි මහරජ, තව්තිසැවැසි දෙවියෝ සුදම්සබයෙහි තොප ගේ ගුණකීර්තනය කෙරෙමින් හුන්හ : ''භවත්නි, විදෙහයනට එකාන්ත ලාභයෙක, භවත්නි, විදෙහයනට එකාන්ත මනා ලාභයෙක, යම් කෙනකුන්හට ධාර්මික වූ ධර්මරාජන් වූ නිමිරජ ඇද්ද, දහමෙහි සිටි මහරජ බමුණුගැහැවියන් කෙරෙහි ද නියම්ගම් වැසියන් කෙරෙහි ද දනවවැසියන් කෙරෙහි ද සම වැ හැසිරේ ද, තුදුස්වක්හි ද පසළොස්වක්හි ද අටවක්හි ද පෙහෙවසුදු වෙසේ ද, ඒ වෛදෙහයනට එකාන්ත ලාභයෙකැ'යි ගුණ කීර්තනය කෙරෙමින් හුන්හ. මහරජ, තව්තිසාවැසි දෙවියෝ තොප දක්නා කැමැතියහ. මහරජ, තොපට මම දහසක් අසුන් යෙදූ ආජන්‍ය රථයක් එවන්නෙමි. මහරජ, නො බා දිව්‍යයානයට නැඟෙව''යි කී.

ආනන්‍දයෙනි, නිමිරජ තුෂ්ණීම්භාවයෙන් ඉවසී. එසඳ ආනන්‍දයෙනි, සක්දෙවිඳු නිමිරජු ගේ අධිවාසනා දැන යම්සේ නම් බලවත් පුරුෂයෙක් වක් කළ අතක් හෝ දික් කරන්නේ ද දික් කළ අතක් හෝ වක් කරන්නේ ද, එසෙයින් මැ නිමිරජු හමුයෙහි අතුරුදහන් වූයේ තව්තිසැ දෙවියන් කෙරෙහි පහළ වී.

අථ ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො මාතලිසඞ්ගාහකං[1] ආමන්තෙසි: එහි ත්වං සම්ම මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා නිමිං රාජානං උපසඞ්කමිත්වා එවං වදෙහි: 'අයං තෙ මහාරාජ, සහස්සයුත්තො ආජඤ්ඤරථො සක්කෙන දෙවානමින්දෙන පෙසිතො. අභිරුහෙය්‍යාසි මහාරාජ, දිබ්බං යානං අවිකම්පමානො'ති. එවං භද්දන්තවාති[2] ඛො ආනන්ද, මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා නිමිං රාජානං උපසඞ්කමිත්වා එතදවොච: 'අයං තෙ මහාරාජ සහස්සයුත්තො ආජඤ්ඤරථො සක්කෙන දෙවානමින්දෙන පෙසිතො, අභිරූහ මහාරාජ, දිබ්බං යානං අවිකම්පමානො. අපි ච මහාරාජ, කතමෙන තං නෙමි, යෙන වා පාපකම්මා පාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙන්ති, යෙන වා කල්‍යාණකම්මා කල්‍යාණානං කම්මානං විපාකං පටිසංවෙදෙන්ති'ති.? උභයෙනෙව මං මාතලි නෙහීති. සම්පාපෙසි[3] ඛො ආනන්ද, මාතලිසඞ්ගාහකො නිමිං රාජානං සුධම්මං සභං[4]. අද්දසා ඛො ආනන්ද, සක්කො දෙවානමින්දො නිමිං රාජානං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන නිමිං රාජානං එතදවොච:

එහි ඛො මහාරාජ, ස්වාගතං[5] මහාරාජ, දෙවා තෙ[6] මහාරාජ, තාවතිංසා සුධම්මායං සභායං කිත්තයමානරූපා සන්නිසින්නා, 'ලාභා වත භො විදෙහානං, සුලද්ධං වත[7] භො විදෙහානං, යෙසං නිමි රාජා ධම්මිකො ධම්මරාජා ධම්මෙ ඨිතො මහාරාජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච. උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්සා'ති. දෙවා තෙ මහාරාජ, තාවතිංසා දස්සනකාමා, අභිරම මහාරාජ, දෙවෙසු දෙවානුභාවෙනා'ති. අලං මාරිස, තත්ථෙව මං මිථිලං පටිනෙතු. තත්ථාහං ධම්මං චරිස්සාමි බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච, උපොසථඤ්ච උපවසිස්සාමි චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්සාති අථ ඛො අනන්ද, සක්කො දෙවානමින්දො මාතලි සඞ්ගාහකං ආමන්තෙසි: එහි ත්වං සම්ම මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා නිමිං රජානං තත්ථෙව මිථිලං ජටිනෙහීති. එවං භද්දන්තවාති ඛො ආනන්ද, මාතලිසඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා නිමිං රජානං තත්ථෙව මිථිලං පටිනෙසි.

තත්‍ර සුදං ආනන්ද, නිමිරජා ධම්මං චරති බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච, උපොසථඤ්ච උපවසති චාතුද්දසිං පඤ්චදසිං අට්ඨමිඤ්ච පක්ඛස්ස. අථ ඛො ආනන්ද, නිමිරජා බහුන්නං වස්සසහස්සානං අච්චයෙන කප්පකං ආමන්තෙසි, 'යදා මෙ සම්ම කප්පක, පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි ජාතානි, අථ මෙ ආරොචෙය්‍යාසී'ති. එවං දෙවාති ඛො ආනන්ද, කප්පකො නිමිස්ස රඤ්ඤො පච්චස්සොසි. අද්දසා ඛො ආනන්ද, කප්පකො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන නිමිස්ස රඤ්ඤො සිරස්මිං පලිතානි ජාතානි, දිස්වාන නිමිං රජානං එතදවොච: පාතුභූතා ඛො දෙවස්ස දෙවදූතා, දිස්සන්ති සිරස්මිං පලිතානි ජාතානී'ති. තෙන හි සම්ම

---

1 මාතලිං සඞ්ගාහකං - මජසං, ස්‍යා
2. එවං හොතු භද්දන්තවාති - PTS.
3. සම්පවෙසෙසි - ස්‍යා, මජසං.
4. සුධම්මායං සභායං - ස්‍යා.
5. සාගතං - සීමු. PTS.
6. තෙ දස්සනකාමා - මජසං.
7. සුලද්ධලාභා වත - සීමු.

එසඳ ආනන්‍දයෙනි, සක්දෙව්ඳු මාතලී රියැදුරු ඇමැති : "සගය මතලී, එව තෙපි දහසක් අසුන් යෙදූ ආජන්‍ය රථයක් සද ගෙන නිමිරජු කරා එළැඹ මෙසේ කියව : "මහරජ, මේ දහසක් අසුන් යෙදූ ආජන්‍යරථය තොපට සක් දෙව්ඳු විසින් එවන ලද. මහරජ, නො බා දිව්‍යයානයට නැඟෙව"යි. ආනන්‍දයෙනි, මාතලී සඞ්ග්‍රාහක 'තොපට යහපතෙකි දේවයෙනි'යි සක්දෙව්ඳුහට පිළිවදන් අස්වා දහසක් අසුන් යෙදූ ආජන්‍යරථයක් සදගෙන නිමිරජු කරා එළැඹ තෙල බස් කී : "මහරජ, මේ දහසක් අසුන් යෙදූ ආජන්‍යරථය ශක්‍රදෙවෙන්ද්‍ර විසින් තොපට එවන ලද, මහරජ, නො බා දිව්‍යයානයට නැඟෙව. තවද මහරජ, "යම් මඟෙක්හි හෝ පාපකම් ඇත්තාහු පාපකර්‍මයන් ගේ විපාක විඳිත් ද. යම් මඟෙක්හි හෝ කල්‍යාණකම් ඇත්තාහු කල්‍යාණකර්‍මයන් ගේ විපාක විඳිත් ද, ඒ කවර මඟෙකින් තොප ගෙන යෙම් ද?"යි 'මාතලිය, මා දෙමඟින් මැ ගෙන යව'යි. ආනන්‍දයෙනි, මාතලී රියැදුරු නිමිරජු සුදම්සබයට පැමිණෙවී. ආනන්‍දයෙනි, සක් දෙව්ඳු නිමිරජු දුරින් මැ එන්නා දිටි. දැක නිමිරජුට තෙල බස් කී : "

"එන්නේ යැ මහරජ, සවාගත යැ මහරජ, මහරජ තව්තිසා වැසි දෙවියෝ තොප ගේ ගුණ කීර්තනය කෙරෙමින් හුන්හ : "භවත්නි විදෙහරටවැසියනට එකාන්ත ලාභයෙක, භවත්නි, විදෙහරටවැසියනට එකාන්ත මනා ලාභයෙක, යම් කෙනකුන්ට ධාර්මික වූ ධර්‍මරාජන් වූ නිමිරජ ඇද්ද, දහමෙහි සිටි මහරජ බමුණුගැහැවියන් කෙරෙහි දු නියම්ගම් වැසියන් කෙරෙහි දු දනව්වැසියන් කෙරෙහි දු සම වැ හැසිරේ ද, තුදුස්වක්හි දු පසළොස්-වක්හි දු අටවක්හි දු පෙහෙවසුදු වෙසේ ද, ඒ විදේහරටවැසියනට ඒකාන්ත ලාභයෙකැ"යි. මහරජ, තව්තිසා වැසි දෙවියෝ තොප දක්නා කැමැතියහ. මහරජ දෙවියන් කෙරෙහි දේවානුභාවයෙන් සිත් අලව"යි. කම් නැත නිදුකාණෙනි, එහි මියුලුනුවරට මැ මා පෙරළා පමුණුවාවා. එහි මම් බමුණුගැහැවියන් කෙරෙහි දු නියම්ගම් වැසියන් කෙරෙහි දු දනවුවැසියන් කෙරෙහි දු සම වැ හැසිරෙන්නෙමි. තුදුස්වක්හි හා පසළොස්වක්හි හා අටවක්හි හා පෙහෙවසුදු වෙසෙමි"යි. එසඳ ආනන්‍දයෙනි, සක්දෙව්ඳු මාතලී රියැදුරු ඇමැති : "සගය මාතලී එව. තෙපි අසුන්දහසක් යෙදූ ආජන්‍යරථයක් සදගෙන නිමිරජු එ මිනිස්ලොව්හි මියුලුනුවරට මැ ඇරලව"යි. ආනන්‍දයෙනි, මාතලී සඞ්ග්‍රාහක 'යහපතෙකි තොපට දෙවයෙනි'යි සක්දෙව්ඳුහට පිළිවදන් අස්වා අසුන් දහසක් යෙදූ ආජන්‍යරථයක් යොදගෙන නිමිරජු එ මිනිස්ලොව මියුලු නුවරට මැ ඇරැලී.

ආනන්‍දයෙනි, එහි වූකලි නිමිරජ බමුණුගැහැවියන් කෙරෙහි දු නියම්ගම්වැස්සන් කෙරෙහි දු දනවුවැස්සන් කෙරෙහි දු සම වැ හැසිරෙයි. තුදුස්වක්හි හා පසළොස්වක්හි හා අටවක්හි හා පෙහෙවසුදු වෙසෙයි. එසඳ ආනන්‍දයෙනි, නිමිරජ බොහෝ වර්‍ෂයන් බොහෝ වර්‍ෂශතයන් බොහෝ වර්‍ෂසහස්‍රයන් ඇවෑමෙන් කපුවා ඇමැති : "සගය කපුව, යම් කලෙකැ මා ගේ හිසෙහි උපන් පලිතයෝ දක්නෙහි ද, එකල්හි මට සැල කරව"යි, ආනන්‍දයෙනි, කපු 'එසේ යැ දෙවයෙනි'යි නිමිරජහට පිළිවදන් ඇස්වී. ආනන්‍දයෙනි, කපුවා බොහෝ වර්‍ෂයන් බොහෝ වර්‍ෂශතයන් බොහෝ වර්‍ෂසහස්‍රයන් ඇවෑමෙන් නිමිරජු ගේ සිරසෙහි උපන් පලිතයන් දිටි, දැක නිමිරජහට තෙල බස් කී : "දේවයන්ට දේවදූතයෝ පහළ වූහ, සිරසෙහි උපන් පලිතයෝ පැනෙති"යි, 'එසේ වී නම් සගය කපුව, ඒ පලිතයන්

කප්පක, තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා මම අඤ්ජලිස්මිං පතිට්ඨාපෙහී'ති. එවං දෙවාති ඛො ආනන්ද, කප්පකො නිමිස්ස රඤ්ඤො පටිස්සුත්වා තානි පලිතානි සාධුකං සණ්ඩාසෙන උද්ධරිත්වා නිමිස්ස රඤ්ඤො අඤ්ජලිස්මිං පතිට්ඨාපෙසි. අථ ඛො ආනන්ද, නිමි රාජා කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං ආමන්තාපෙත්වා එතදවොච: 'පාතුභූතා ඛො මෙ තාත කුමාර, දෙවදූතා, දිස්සන්ති සිරස්මිං පලිතානි ජාතානි, භුත්තා ඛො පන මෙ මානුසකා කාමා, සමයො දිබ්බෙ කාමෙ පරියෙසිතුං. එහි ත්වං තාත කුමාර, ඉමං රජ්ජං පටිපජ්ජ, අහං පන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි. තෙන හි තාත කුමාර, යදා ත්වම්පි පස්සෙය්‍යාසි සිරස්මිං පලිතානි ජාතානි, අථ කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යාසි, යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාසි, මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසි. යස්මිං ඛො තාත කුමාර, පුරිසයුගෙ වත්තමානෙ එවරූපස්ස කල්‍යාණස්ස වට්ටස්ස සමුච්ඡෙදො හොති, සො තෙසං අන්තිමපුරිසො හොති. තං තාහං තාත කුමාර, එවං වදාමි: 'යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාසි, මා ඛො මෙ ත්වං අන්තිමපුරිසො අහොසී'ති.

අථ ඛො ආනන්ද, නිමිරාජා කප්පකස්ස ගාමවරං දත්වා ජෙට්ඨපුත්තං කුමාරං සාධුකං රජ්ජෙ සමනුසාසිත්වා ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි.

නිමි ඛො පනානන්ද, රාජා චතුරාසීතිවස්සසහස්සානි කුමාරකීළිතං කීළි, චතුරාසීතිවස්සසහස්සානි ඔපරජ්ජං කාරෙසි, චතුරාසීතිවස්සසහස්සානි රජ්ජං කාරෙසි, චතුරාසීති වස්සසහස්සානි ඉමස්මිංයෙව මඛාදෙවම්බවනෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො බ්‍රහ්මචරියං චරි. සො චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

නිමිස්ස ඛො පනානන්ද, රඤ්ඤො කලාරජනකො නාම පුත්තො අහොසි. සො න අගාරස්මා අනගාරියං පබ්බජි. සො තං කල්‍යාණං වට්ටං සමුච්ඡින්දි. සො තෙසං අන්තිමපුරිසො අහොසි. සියා ඛො පන තෙ ආනන්ද, එවමස්ස: අඤ්ඤො නූන තෙන සමයෙන රාජා මඛාදෙවො,

මොනොවට හඬුයෙන් උදුරා මා ගේ ඇදිලියෙහි තබව'යි. ආනන්දයෙනි, කපු 'එසේ යැ දෙවයෙනි'යි නිමිරජුට පිළිවදන් අස්වා ඒ පලිතයන් මනාකොට හඬුයෙන් උදුරාගෙන නිමිරජු ගේ කරපුටයෙහි තැබී. එසඳ ආනන්දයෙනි, නිමිරජ කපුවාට ගම්වර දී දෙටුපුත් කුමරු අමතා තෙල බස් කී : "පුතැ කුමරුවෙනි, මට දේවදූතයෝ පහළ වූහ, හිසෙහි උපන් පලිතයෝ පැනෙති, මා විසින් මානුෂකාමයෝ වළඳන ලදහ. දන් දිව්‍යකාම පිරියෙස්නට කලි. දරුව කුමාරයෙනි, එව තෙපි මේ රජය පිළිගනුව, මම වැළිත් කෙහෙ-මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම අනාගර තවුස්පැවිදි වදනෙමි. එසේ වී නම් පුතැ කුමරුවෙනි, යම් දවසෙකැ තෙපි දු සිරසෙහි උපන් පලිතයන් දක්නවු නම් එසඳ කපුහට ගම්වර දී දෙටුපුත් කුමරු මොනොවට රජයෙහි සමනුශාසනා කොට කෙස්මස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම තවුස්පැවිදි වදුව. මා විසින් තබනලද මේ කලණවැට පවත්වව, තෙපි නහමක් මා ගේ අන්තිම පුරුෂ වව. පුතැ කුමරුවෙනි, යම් පුරුෂයුගයක් පවත්නා කල්හි මෙවන් කලණවැට සිඳේ ද, හෙ උන් ගේ අන්තිම පුරුෂ වෙයි, එහෙයින් පුතැ කුමරුවෙනි, මම තොපට මෙසේ කියමි : "මා විසින් තබන ලද මේ කලණවැට පවත්වව, තෙපි නහමක් මා ගේ අන්තිම පුරුෂ වව"යි.

ඉක්බිති ආනන්දයෙනි, නිමිරජ කපුහට ගම්වර දී දෙටුපුත් කුමරු මොනොවට රජයෙහි සමනුශාසනා කොට මෙ මැ මුවදෙව් අඹවෙනෙහි කෙහෙරැවුළු බහා කහවත් හැඳපෙරෙව ගෙන් නික්ම තවුස් පැවිදි වී. හෙ මෙත් සහගිය සිතින් එක් දසක් අරමුණු කොට විසී. එසේ දෙවන දස යැ, එසේ තුන් වන දස යැ, එසේ සතර වන දස යැ යි මෙසේ උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් මුළුලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෙත් සහගිය සිතින් අරමුණු කොට විසී. කරුණා සහගත සිතින් . . . මෘදුතා සහගත සිතින් . . . උපේක්ෂා සහගත සිතින් එක් දසක් අරමුණු කොට විසී. එසේ දෙ වන දස යැ එසේ තුන් වන දස යැ එසේ සතර වන දස යැ යි මෙසේ උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් මුළුලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ උපෙක්ෂා සහගත සිතින් අරමුණු කොට වාස කෙළේ යි.

ආනන්දයෙනි, නිමිරජ වූකලි සුවාසූදහසක් හවුරුදු කුමර කෙළි කෙළියේ යැ, සුවාසූ-දහසක් හවුරුදු යුවරජය කෙළේය. සුවාසූදහසක් හවුරුදු මහරජය කෙළේය. සුවාසූ දහසක් හවුරුදු මෙ මැ මඛාදේව අඹවෙනෙහි ගෙන් නික්ම තවුස්පැවිදි වැ බඹසර සැරී. හෙ සියුබඹවෙහෙර වඩා කාබුන් මරණින් මතු බඹලෝ කරා ගියේ යි.

තවද ආනන්දයෙනි, නිමිරජහට කළාරජනක නම් පුතෙක් වී. හේ ගිහිගෙන් නික්ම තවුස්පැවිදි නො වී, හෙ එ කලණවැට සින්දේ යැ, හෙ උන් ගේ අන්තිම පුරුෂ වී. ආනන්ද-යෙනි, තොපට මෙබඳු සිතෙක් විය හෙයි : "එසමයෙහි යමෙක් එ කලණවැට තැබී ද, එ මඛාදෙව රජ අනෙකෙක් වී යැ"යි. ආනන්දයෙනි, තෙල මෙසේ නො දක්කැ යුතු යැ.

අහොසි යෙන[1] තං කල්‍යාණං වට්ටං නිහිතන්ති[2]. න ඛො පනෙතං ආනන්ද, එවං දට්ඨබ්බං. අහං තෙන සමයෙන රජා මඛාදෙවො අහොසිං., අහං තං කල්‍යාණං වට්ටං නිහිතිං[3] මයා තං කල්‍යාණං වට්ටං නිහිතං පච්ජිමා ජනතා අනුප්පවත්තෙසි. තං ඛො පනානන්ද, කල්‍යාණං වට්ටං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා.

ඉදං ඛො පනානන්ද, එතරහි මයා කල්‍යාණං වට්ටං නිහිතං එකන්තනිබ්බදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා චානන්ද, එතරහි මයා කල්‍යාණං වට්ටං නිහිතං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථිදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මා–කම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. ඉදං ඛො ආනන්ද, එතරහි මයා කල්‍යාණං වට්ටං නිහිතං එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තං ඛො අහං ආනන්ද, එවං වදාමි: යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාථ. මා ඛො මෙ තුම්හෙ අන්තිමසුරිසා අහුවත්ථ. යස්මිං ඛො ආනන්ද, පුරිසයුගෙ වත්තමානෙ එවරූපස්ස කල්‍යාණස්ස වට්ටස්ස සමුච්ඡෙදො හොති, සො තෙසං අන්තිමපුරිසො හොති. තං චො අහං ආනන්ද, එවං වදාමි: යෙන මෙ ඉදං කල්‍යාණං වට්ටං නිහිතං අනුප්පවත්තෙය්‍යාථ. මා ඛො මෙ තුම්හෙ අන්තිමපුරිසා අහුවත්ථා’ති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මඛාදෙව[4] සුත්තං තතියං.

---

1. යො - සිමු.
2. නිහිතිති - සිමු.
3. නිහතිං - PTS.
4. මඝදෙව - මජසං, ස්‍යා.

මම එසමයෙහි මඛාදේව රජ වීමි. මම් එ කල්‍යාණවැට තැබීමි. මා විසින් තබන ලද එ කල්‍යාණවැට පශ්චිම ජනතාව පැවැත්වී. ආනන්‍දයෙනි, එ කල්‍යාණවැට එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස නො පවතී, බඹලොව උපත පිණිස පමණක් මැ පවතී.

ආනන්‍දයෙනි, මෙ කල මා විසින් තබන ලද මේ කල්‍යාණවැට එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී. ආනන්‍දයෙනි, මෙකලැ මා විසින් තබන ලද කවර නම් කල්‍යාණවැටෙක් ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවතී ද යත් : මෙ මැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික-මාර්ගය යි. එ කිසේ යැ යත් : සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග් ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි. ආනන්‍දයෙනි, මෙකල්හි මා විසින් තබන ලද මෙ කල්‍යාණවැට එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥා පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවතී. එහෙයින් මැ ආනන්‍දයෙනි, මම් මෙසේ කියමි : ''මා විසින් තැබූ මේ කල්‍යාණ වැට පවත්වවූ, තෙපි නහමක් මා ගේ අන්තිම පුරුෂයෝ වව. ආනන්‍දයෙනි, යම් පුරුෂ යුගයක් පවත්නා කල්හි මෙවන් කල්‍යාණවැට සිඳේ ද, හෙ උන් ගේ අන්තිම පුරුෂ වෙයි. එහෙයින් ආනන්‍දයෙනි, මම තොපට මෙසේ කියමි : ''මා විසින් තබන ලද මෙ කල්‍යාණවැට පවත්වවූ, තෙපි නහමක් මා ගේ අන්තිම පුරුෂයෝ වව''යි.

බුදුහු මෙය වදාළහ. සතුටුසිත් ඇති ආයුෂ්මත් අනද තෙරණුවෝ භාග්‍යවතුන්ගේ භාෂිතය අභිනන්‍දනය කළහ'යි.

තුන් වැනි මඛාදේව සූත්‍ර යි.

2. 4. 4

මධුරසුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා මහාකච්චානො මධුරායං විහරති ගුන්දාවනෙ.[1] අස්සොසි ඛො රාජා මාධුරො[2] අවන්තිපුත්තො: සමණො ඛලු භො කච්චානො මධුරායං විහරති ගුන්දාවනෙ.[1] තං ඛො පන භවන්තං කච්චානං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො වුද්ධො[3] චෙව අරහා ච, සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති. අථ ඛො රාජා මාධුරො[2] අවන්තිපුත්තො භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි මධුරාය නිය්‍යාසි මහච්චරාජානුභාවෙන[4] ආයස්මන්තං මහාකච්චානං දස්සනාය, යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාධුරො අවන්තිපුත්තො ආයස්මන්තං මහාකච්චානං එතදවොච: “බ්‍රාහ්මණා භො කච්චාන, එවමාහංසු· බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති, නො අබ්‍රාහ්මණා. බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදා”ති. ඉධ[5] භවං කච්චානො කිමාහාති[6]. ඝොසොයෙව ඛො එසො මහාරාජ, ලොකස්මිං: බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති, නො අබ්‍රාහ්මණා. බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදා'ති. තදමිනා පෙතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං, යථා ඝොසොයෙව එසො ලොකස්මිං: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඛත්තියස්ස චෙපි ඉජ්ඣෙය්‍ය[7] ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, ඛත්තියොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී, බ්‍රාහ්මණොපිස්සාස්ස -පෙ- වෙස්සොපිස්සාස්ස -පෙ- සුද්දොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදීති?

---

1. ගුන්දවනෙ – සීමු.; ගුන්ධවනෙ – සයා.
2. මධුරො – මජසං, සයා, PTS.
3. වුඩ්ඪො – සයා.
4. මහච්චා රාජානුභාවෙන – සීමු.
5. ඉති – සීමු, ඉදං – සයා.
6. කිමක්ඛායීති – මජසං, සයා.
7. ඉජ්ජෙය්‍ය – සීමු,

Free Distribution www.aathaapi.org

2. 4. 4
මධුර සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ මධුරා පුර ගුන්‍දාවනයෙහි වැඩ වෙසෙති. අවන්තිපුත්‍ර මධුරා පුර වැසි රජ මෙසේ ඇසී: "භවත්නි, ශ්‍රමණ කාත්‍යායන තෙරණුවෝ මධුරා පුර ගුන්‍දාවනයෙහි වැඩ වෙසෙති, ඒ භවත් කාත්‍යායන තෙරණුවන් ගේ මෙවන් කල්‍යාණකීර්තිශබ්දයෙක් උස් වැ නැංගේ යැ: (කාත්‍යායන තෙරණුවෝ) පණ්ඩිතයහ, ව්‍යක්තයහ, නුවණැතියහ, බහුශ්‍රැතයහ, චිත්‍රකථීහ, කලණපිළිබහන් ඇතියහ, වෘද්ධ ද අර්හත් ද වෙති. එබඳු රහතුන් ගේ දර්ශනය මනා මැ නු"යි ඇසී යැ, ඉක්බිති අවන්තිපුත්‍ර, මධුරා පුර වැසි රජ භද්‍ර වූ භද්‍ර වූ යානයන් යොදවා භද්‍රයානයකට නැඟී භද්‍ර වූ භද්‍ර වූ යානයෙන් යුතු වැ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් දක්නට මහත් වූ රාජානුභාවයෙන් යුතු වැ මධුරා පුරයෙන් නික්ම ගියේ යැ. යානභූමි තෙක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් මැ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් කරා එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් හා සමග සතුටු වී. සම්මොදයට නිසි කාලාන්තරයෙහි සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් අවන්තිපුත්‍ර මධුරා පුර වැසි රජ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන්ට තෙල බස් කී: භවත් කාත්‍යායනයෙනි, බමුණෝ මෙසේ කීහු: "බමුණු මැ ශ්‍රෙෂ්ඨවර්‍ණ යැ, තදන්‍ය වූයේ හීනවර්‍ණ යැ. බමුණු මැ ශුක්ලවර්‍ණ යැ, තදන්‍ය වූයේ කෘෂ්ණවර්‍ණ යැ. බමුණුහු මැ ශුද්ධ වෙති, නො බමුණුහු ශුද්ධ නො වෙති, බමුණුහු මැ බඹහු ගේ උරදපුත්හ, මුවින් උපන්හ, (එයින් මැ) බ්‍රහ්මජයහ, බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ"යි. මෙහි ලා භවත් කාත්‍යායනයෝ කුමක් කියති හො'යි? මහරජ, බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්‍ණ යැ, තදන්‍ය වූයේ හීනවර්‍ණ යැ. බ්‍රාහ්මණයෝ මැ ශුක්ලවර්‍ණ යැ, තදන්‍ය වූයේ කෘෂ්ණවර්‍ණ යැ. බ්‍රාහ්මණයෝ මැ ශුද්ධ වෙති, අබ්‍රාහ්මණයෝ ශුද්ධ නො වෙති. බ්‍රාහ්මණයෝ මැ බඹහු ගේ උදරපුත්හ, මුවින් උපන්හ, (එයින් මැ) බ්‍රහ්මජයහ. බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ" යනු ලෝකයෙහි තෙලෙ ඝොෂමාත්‍රයෙක් මැ යැ. මහරජ, "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්‍ණ යැ, තදන්‍ය වූයේ හීනවර්‍ණ යැ .... බ්‍රහ්මදායාදයහ." යන තෙල බස් ලෝකයෙහි යම් පරිදි ව්‍යවහාරමාත්‍රයෙක් මැ වේ ද, තෙල කරුණ මෙ කරුණිනුදු දතයුතු වේ.

මහරජ, ඒ කෙසේ හඟිහි ? කැත්කුල උපන් රජක්හට ද ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රිදියෙන් වේවයි රනින් වේවයි සමෘද්ධි වේ නම් ඒ ඓශ්වර්‍ය්‍යසම්පන්නයාහට ක්‍ෂත්‍රියයා ද කැලැ ම නැඟී සිටිනසුලු වූයේ පසු වැ හෝනාසුලු වූයේ කුම් කෙරෙම් ද යි පිළිවිස කී සේ අසා කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ පියබස් බණනුයේ වේ ද? ඒ ඓශ්වර්‍ය්‍ය සම්පන්නයාහට බමුණු ද ... ප්‍රියවාදී වේ ද? ඒ ඓශ්වර්‍ය්‍යසම්පන්නයාහට වෛශ්‍යයා ද .... ප්‍රියවාදී වේ ද? ඒ ඓශ්වර්‍ය්‍යසම්පන්නයාහට ශූද්‍රයා ද කැල මැ නැඟී සිටිනසුලු වූයේ පැසුළු හෝනාසුලු වූයේ කුම් කෙරෙම් ද යි පිළිවිස කී සේ අසා කරනුයේ මනවඩන සේ හැසිරෙනුයේ ප්‍රිය බස් බණනුයේ වේ ද?

ඛත්තියස්ස චෙපි හො කච්චාන, ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, ඛත්තියොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, බ්‍රාහ්මණොපිස්සාස්ස -පෙ- වෙස්සොපිස්සාස්ස -පෙ- සුද්දොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, බ්‍රාහ්මණස්ස චෙපි ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, බ්‍රාහ්මණොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, වෙස්සොපිස්සාස්ස -පෙ- සුද්දොපිස්සාස්ස -පෙ- ඛත්තියොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති?

බ්‍රාහ්මණස්ස චෙපි හො කච්චාන, ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, බ්‍රාහ්මණොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, වෙස්සොපිස්සාස්ස -පෙ- සුද්දොපිස්සාස්ස -පෙ- ඛත්තියොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, වෙස්සස්ස චෙපි ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, වෙස්සොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, සුද්දොපිස්සාස්ස -පෙ- ඛත්තියොපිස්සාස්ස බ්‍රාහ්මණොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති?

වෙස්සස්ස චෙපි හො කච්චාන, ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා. වෙස්සොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, සුද්දොපිස්සාස්ස -පෙ- ඛත්තියොපිස්සාස්ස -පෙ- බ්‍රාහ්මණොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, සුද්දස්ස චෙපි ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, සුද්දොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, ඛත්තියොපිස්සාස්ස -පෙ- බ්‍රාහ්මණොපිස්සාස්ස -පෙ- වෙස්සොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති?

භවත් කාත්‍යායනයෙනි, ක්‍ෂත්‍රියයක්හට ද ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රජත-යෙන් වේවයි ජාතරූපයෙන් වේවයි සමෘද්ධි වේ නම් ඒ ඉසුරුමත්හට ක්‍ෂත්‍රියයා ද කැල මැ නැඟී සිටිනුයේ පැසුළු හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස කී සේ අසා කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ පිය බස් බණනුයේ වෙයි. ඒ ඉසුරුමත්හට බ්‍රාහ්මණයා ද . . . පිය බස් බණනුයේ වෙයි. ඒ ඉසුරුමත්හට වෛශ්‍යයා ද . . . පිය බස් බණනුයේ වෙයි, ඒ ඉසුරුමත්හට ශුද්‍රයා ද කැල මැ නැඟී සිටිනුයේ පැසුළු හෝනේ කුම් කෙරෙම් ද'යි පිළිවිස කී සේ අසා කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ පියබස් බණනුයේ වෙයි.

මහරජ, ඒ කෙසේ හඟිහි? බමුණක්හට ද ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රජතයෙන් වේවයි ජාතරූපයෙන් වේවයි සමෘද්ධි වේ නම් ඒ ඉසුරුමත්හට බමුණුත් පළමු මැ නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය තෙපුල් බණනුයේ වේ ද? ඒ ඉසුරුමත්හට වෛශ්‍යයා ද . . . ප්‍රියවාදී වේ ද? ඒ ඉසුරුමත්හට ශුද්‍රයා ද . . ප්‍රියවාදී වේ ද? ඒ ඉසුරු-මත්හට ක්‍ෂත්‍රියයා ද පළමු මැ නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය බස් බණනුයේ වේ ද?

භවත් කාත්‍යායනයෙනි, ඉදින් බමුණක්හට ද ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රිදියෙන් වේවයි රනින් වේවයි සමෘද්ධි වේ නම් එ ඉසුරුමත්හට බමුණු ත් පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ පියබස් බණනුයේ වෙයි. එ ඉසුරුමත්හට වෛශ්‍ය ද . . . එ ඉසුරුමත් හට ශුද්‍ර ද . . . එ ඉසුරුමත්හට ක්‍ෂත්‍රියයා ද කැල මැ නැඟී සිටිනුයේ පැසුළු හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ සරනුයේ ප්‍රියබස් බණනුයේ වෙයි.

මහරජ, ඒ කෙසේ හඟිහි ද? වෛශ්‍යයක්හට ද ඉදින් ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රජතයෙන් වේවයි ජාතරූපයෙන් වේවයි සමෘද්ධි වේ නම්, එ ඉසුරුමත්හට වෛශ්‍ය යාත් පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය බස් බණනුයේ වේ ද? ඒ ඉසුරුමත්හට ශුද්‍ර ද . . . එ ඉසුරුමත්හට ක්‍ෂත්‍රියයා ද . . . ඒ ඉසුරුමත්හට බ්‍රාහ්මණ ද පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ සරනුයේ පියබස් බණනුයේ වේ ද?

භවත් කාත්‍යායනයෙනි, වෛශ්‍යයක්හට ත් ඉදින් ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රිදියෙන් වේවයි රනින් වේවයි සමෘද්ධි වේ නම් ඒ ඓශ්වර්‍යවත්හට වෛශ්‍යයා ද පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ සරනුයේ ප්‍රිය බස් බණනුයේ වෙයි, එ ඉසුරුමත්හට ශුද්‍ර ද . . . ඒ ඉසුරු-මත්හට ක්‍ෂත්‍රිය ද, . . . එ ඉසුරුමත්හට බමුණු ද පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය තෙපුල් බණනුයේ යි.

මහරජ, ඒ කෙසේ හඟිහි ද? ශුද්‍රහටත් ඉදින් ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රජතයෙන් වේවයි ජාතරූපයෙන් වේවයි සමෘද්ධ වේ නම්, එ ඉසුරුමත්හට ශුද්‍රයාත් පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය තෙපුල් බණනුයේ වෙයි, එ ඉසුරුමත්හට ක්‍ෂත්‍රියයාත් . . ඒ ඉසුරුමත්හට බ්‍රාහ්මණයාත් . . . එ ඉසුරුමත්හට වෛශ්‍යයා ත් පළමු නැඟී සිටිනුයේ පසු වැ ලා හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය තෙපුල් බණනුයේ වේ ද?

සුද්දස්ස චෙපි හො කච්චාන, ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා, සුද්දොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී, ඛත්තියොපිස්සාස්ස -පෙ- බ්‍රාහ්මණොපිස්සාස්ස -පෙ- වෙස්සොපිස්සාස්ස පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා[1] හොන්ති, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

අද්ධා ඛො හො කච්චාන, එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා[1] හොන්ති. නෙසං[2] එත්ථ කිඤ්චි නානාකරණං සමනුපස්සාමීති.

ඉමිනාපි ඛො එතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං: 'යථා ඝොසොයෙවෙසො ලොකස්මිං, බ්‍රාහ්මණොව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධාස්ස ඛත්තියො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නො වා, කථං වා තෙ එත්ථ හොති'ති?

ඛත්තියොපි හි හො කච්චාන, පාණාතිපාතී අදින්නාදායී කාමෙසු-මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය[3]. එවං මෙ එත්ථ හොති, එවඤ්ච පන මෙ එතං අරහතං සුතන්ති.

සාධු සාධු මහාරජ, සාධු ඛො තෙ එතං මහාරාජ, එවං හොති: සාධු ච පන තෙ එතං අරහතං සුතං, තං කිංමඤ්ඤසි මහාරාජ, ඉධාස්ස බ්‍රාහ්මණො -පෙ- ඉධාස්ස වෙස්සො -පෙ- ඉධාස්ස සුද්දො, පාණාතිපාතී අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

සුද්දොපි හි හො කච්චාන, පාණාතිපාතී අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.[3] එවං මෙ එත්ථ හොති, එවඤ්ච පන මෙ එතං අරහතං සුතන්ති.

සාධු සාධු මහාරජ, සාධු ඛො තෙ එතං මහාරාජ, එවං හොති, සාධු ච පන තෙ එතං අරහතං සුතං. තං කිංමඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

අද්ධා ඛො හො කච්චාන, එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නෙසං එත්ථ කිඤ්චි නානාකරණං සමනුපස්සාමීති.

---

1. සමා හොන්ති - ස්‍යා. 2. නාහං - ස්‍යා.
3. උපපජ්ජෙය්‍ය - PTS.

භවත් කාත්‍යායනයෙනි, ඉදින් ශූද්‍රහටත් ධනයෙන් වේවයි ධාන්‍යයෙන් වේවයි රජතයෙන් වේවයි ජාතරූපයෙන් වේවයි සමෘද්ධ වේ නම්, එ ඉසුරුමත්හට ශූද්‍රයා ත් පළමු නැඟී සිටිනුයේ පැසුළු හෝනේ කුම් කෙරෙම් ද යි පිළිවිස අසා කී සේ කරනුයේ මන වඩන සේ හැසිරෙනුයේ ප්‍රිය තෙපුල් බණනුයේ වෙයි, එ ඉසුරුමත් හට ක්‍ෂත්‍රියයා ත් . . . එ ඉසුරුමත්හට බ්‍රාහ්මණයා ත් . . . ඒ ඉසුරුමත්හට වෛශ්‍යයාත් පළමු නැඟී සිටිනුයේ පැසුළු හෝනේ 'කුම් කෙරෙම් ද'යි පිළිවිස අසා කී සේ කරනුයේ යි.

මහරජ, ඒ කිමැ'යි හඟිහි ද? ඉදින් මෙසේ ඇති කල්හි මේ සතර වර්ණයෝ සමසම වෙති, හෝ නො වෙති හෝ යැ? තොපට මෙහි කෙසේ හෝ වේ ද?යි.

'භවත් කාත්‍යායනයෙනි එකත්තෙන් මැ මෙසේ වත් මෙ සතර වර්ණයෝ සමසම වෙති. මෙහි ලා මොවුන්ගේ කිසි වෙනසක් නො දක්මි'යි.

මහරජ, "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ තදන්‍ය වූයේ හීනවර්ණ යැ . . . බ්‍රහ්මදායාදයහ" යන තෙල බස් ලොකයෙහි යම් පරිදි ව්‍යවහාරමාත්‍රයෙක් මැ වේ ද, තෙල කරුණ මෙ කරුණිනුදු දතයුතු.

මහරජ, ඒ කිමැ'යි හඟී ද? මෙලොවැ ක්‍ෂත්‍රියයෙක් පණිවා කරනුයේ අයිනාදන් කරනුයේ කාමයෙහි මිසහසර ඇතියේ මුසවා බණනුයේ පිසුණුබස් ඇතියේ පරොස්බස් ඇතියේ හිස්බස් තෙපලනුයේ අභිධ්‍යා බහුල වූයේ මෙරමා නසන සිත් ඇතියේ මිසදිටු ඇතියේ වේ ද, හෙ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයෙහි උපදනේ හෝ නූපදනේ හෝ වේ ද? මෙහි ලා තොපට කෙසේ හෝ හැඟෙනු වේ ද? යි.

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ක්‍ෂත්‍රිය තෙමේත් පණිවා කරනුයේ අයිනාදන් කරනුයේ කාමයෙහි මිසහසර ඇතියේ මුසා බණනුයේ පිසුණුබස් ඇතියේ පරොස්බස් ඇතියේ සිස්බස් ඇතියේ අභිධ්‍යා බහුල වූයේ ව්‍යාපාදසිත් ඇතියේ මිසදිටු ඇතියේ වේ ද, හේ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට වදනේ යැ මට මෙහි ලා මෙසේ හැඟෙනුයේ වෙයි. තවද තෙල කරුණ මා විසින් මෙසේ රහතුන් වෙත ද අසන ලද'යි.

සාධු සාධු මහරජ, මහරජාණෙනි, තෙල කරුණ තොපට මෙසේ වන්නේ මැනැවැ. තෙල කරුණ තොප විසින් රහතුන් වෙත අසන ලද්දේ ද මැනැවැ. මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙලොවැ බමුණෙක් . . . මෙලොවැ වෛශ්‍යයෙක් මෙලොවැ ශූද්‍රයෙක් පණිවා කරනුයේ අයිනාදන් කරනුයේ . . . මිසදිටු ඇතියේ වන්නේ ද, හේ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයෙහි උපදනේ හෝ වේ ද? නූපදනේ හෝ වේ ද? මෙහි ලා තොපට කෙසේ හෝ හැඟෙනුයේ වේ ද? යි.

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ශූද්‍ර තෙමේ ත් පණිවා කරනුයේ පරද්‍රව්‍ය ගන්නේ . . . . මිථ්‍යාදෘෂ්ටි ඇතියේ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයට වදනේ යැ. මට මෙහි ලා මෙසේ සිත් වෙයි, තවද මා විසින් මෙසේ තෙල කරුණ රහතුන් හමුයෙහි ද අසනලද'යි.

සාධු සාධු ! මහරජ, මහරජ, තෙල කරුණ තොපට මෙසේ වන්නේ මැනැවැ. තෙල කරුණ තොප විසින් රහතුන් වෙත අසන ලද්දේ ත් මනා මැ යැ. මහරජ, එය කිමැයි හඟනෙහි ද? මෙසේ ඇති කල්හි මෙ සතර වර්ණයෝ සමසම වෙත් ද? නො වෙති හො'යි? මෙහි ලා තොපට කෙසේ හෝ වේ ද? යි.

භවත් කාත්‍යායනයෙනි, එකාන්තයෙන් මෙසේ ඇති කල්හි මෙ සතර වර්ණයෝ සමසම වෙති. මෙහි මොවුන් ගේ කිසි නානාකරණයක් (වෙනසක්) නො දක්මි'යි.

ඉමිනාපි ඛො එතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං: යථා ඝොසො යෙවෙසො ලොකස්මිං 'බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදාති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධාස්ස ඛත්තියො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා[1] පටිවිරතො ඵරුසාවාචා[2] පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලූ අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨි කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

ඛත්තියොපි හි භො කච්චාන, පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා[1] පටිවිරතො ඵරුසාවාචා[2] පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලූ අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, එවං මෙ එත්ථ හොති, එවඤ්ච පන මෙ එතං අරහතං සුතන්ති.

සාධු සාධු මහාරාජ, සාධු ඛො තෙ එතං මහාරාජ, එවං හොති. සාධු ච පන තෙ එතං අරහතං සුතං. තං කිංමඤ්ඤසි මහාරාජ, ඉධාස්ස බ්‍රාහ්මණො -පෙ- ඉධාස්ස වෙස්සො -පෙ- ඉධාස්ස සුද්දො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

සුද්දොපි හි භො කච්චාන, පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, එවං මෙ එත්ථ හොති, එවඤ්ච පන මෙ එතං අරහතං සුතන්ති.

සාධු සාධු මහාරාජ, සාධු ඛො තෙ එතං මහාරාජ, එවං හොති. සාධු ච පන තෙ එතං අරහතං සුතං. තං කිං මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

අද්ධා ඛො භො කච්චාන, එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති. නෙසං[3] එත්ථ කිඤ්චි නානාකරණං සමනුපස්සාමීති.

ඉමිනාපි ඛො එතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං: යථා ඝොසො යෙවෙසො ලොකස්මිං, බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදාති.

---

1. පිසුණාය වාචාය - මජ්ඣං, ස්‍යා. / පිසුණාවාචාය - PTS.
2. ඵරුසාය වාචාය - මජ්ඣං, ස්‍යා. / ඵරුසාවාචාය - PTS.
3. නාසං - සීමු. නාහං - ස්‍යා.

මහරජ, 'බ්‍රාහ්මණ මැ ශ්‍රේෂ්ඨ වර්ණ යැ, තදන්‍ය වූයේ හීනවර්ණ යැ . . . බ්‍රහ්මදායාද යැ' යනු ලෝකයෙහි ඝොෂමාත්‍රයෙක් මැ යැ යන මෙ කරුණ මේ පර්‍යායෙනුදු දතයුතු.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙලොවැ ක්‍ෂත්‍රියයෙක් ප්‍රාණවධයෙන් වෙන් වූයේ අයිනාදනින් වෙන් වූයේ කාමයෙහි මිසහසරින් වෙන් වූයේ මුසවායෙන් වෙන් වූයේ පිසුණුබසින් වෙන් වූයේ පරොස්බසින් වෙන් වූයේ සිස්බසින් වෙන් වූයේ අභිධ්‍යා බහුල නො වූයේ අව්‍යාපාද සිත් ඇතියේ සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වන්නේ ද, හේ කාබුන් මරණින් මතු සුන්‍දරගති ඇති ස්වර්ගලොකයෙහි උපදනේ ද? නූපදනේ හෝ වේ ද? මෙහි ලා තොපට කෙසේ හෝ වේ ද?යි.

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ක්‍ෂත්‍රිය තෙමේ ත් ප්‍රාණවධයෙන් වෙන් වූයේ පරද්‍රව්‍ය ගැන්මෙන් වෙන් වූයේ කාමමිථ්‍යාචාරයෙන් වෙන් වූයේ මෘෂාවාදයෙන් වෙන් වූයේ පිශුනවචනයෙන් වෙන් වූයේ පරුෂවචනයෙන් වෙන් වූයේ සම්ඵප්‍රලාපයෙන් වෙන් වූයේ අභිධ්‍යාබහුල නො වූයේ ව්‍යාපාද සිත් නැත්තේ සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වේ ද, හේ කාබුන් මරණින් මතු සුන්‍දර ගති ඇති ස්වර්ගලොකයට පැමිණෙන්නේ යැ. මට මෙහි මෙසේ සිත් වෙයි. මා විසින් වැළිත් රහතුන් කෙරෙහි ද මෙසේ අසන ලද'යි.

සාධු සාධු මහරජ, මහරජ තෙල කරුණ තොපට මෙසේ වන්නේ මැනැවැ, තොප විසින් වැළිත් රහතුන් කෙරෙහි තෙල කරුණ අසන ලද්දේත් මනා මැ යි. මහරජ, එය කිමැ'යි හඟිනෙහි ද? මෙලොවැ බ්‍රාහ්මණයෙක් . . . මෙලොවැ වෛශ්‍යයෙක් . . . මෙලොවැ ශුද්‍රයෙක් ප්‍රාණවධයෙන් වෙන් වූයේ අදත්තාදානයෙන් වෙන් වූයේ . . . . සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වන්නේ ද, හේ කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට වදනේ ද? නො වදනේ හෝ වේ ද? තොපට මෙහි ලා කෙසේ හෝ වේ ද?යි.

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ශුද්‍ර තෙමේ ත් පණිවායෙන් වෙන් වූයේ අයිනා-දනින් වෙන් වූයේ . . . සම්‍යග්දෘෂ්ටි ඇති වන්නේ ද, හේ කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයෙහි උපදනේ යැ, මෙහි මට මෙසේ සිත් වෙයි. මා විසින් වැළිත් රහතුන් කෙරෙහි ද තෙල කරුණ මෙසේ අසන ලද'යි.

සාධු සාධු මහරජ, මහරජ, තෙල කරුණ තොපට මෙසේ වන්නේ මැනැවැ. තොප විසින් වැළිත් රහතුන් කෙරෙහි තෙල කරුණ අසන ලද්දේත් මනා මැ යි. මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? ඉදින් මෙසේ ඇති කල්හි මේ සතර වර්ණයෝ සමසම වෙති හෝ නො වෙති හෝ යි. තොපට මෙහි ලා කෙසේ හෝ වේ ද?යි.

භවත් කාත්‍යායනයෙනි, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි මේ සතර වර්ණයෝ සමසම වෙති, මෙහි මේ සතර වර්ණයන් ගේ කිසි වෙනසක් නො දක්මි යි.

මහරජ බ්‍රාහ්මණ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ, තදන්‍ය වූයේ හීනවර්ණ යැ . . . බ්‍රහ්මදායාද යැ යනු ලොකයෙහි ඝොෂමාත්‍රයෙක් මැ යැ යන තෙල කරුණ මෙ කරුණිනුදු දතයුතු.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ ඛත්තියො සන්ධිං වා ඡින්දෙය්‍ය, නිල්ලොපං වා හරෙය්‍ය, එකාගාරිකං වා කරෙය්‍ය, පරිපන්ථෙ වා තිට්ඨෙය්‍ය, පරදාරං වා ගච්ඡෙය්‍ය. තං චෙ තෙ පුරිසා ගහෙත්වා දස්සෙය්‍යුං, 'අයං තෙ දෙව, චොරො ආගුචාරී[1], ඉමස්ස යං ඉච්ඡසි, තං දණ්ඩං පණෙහී'ති කින්ති නං කරෙය්‍යාසීති?

ඝාතෙය්‍යාම වා, භො කච්චාන, ජාපෙය්‍යාම[2] වා, පබ්බාජෙය්‍යාම වා, යථාපච්චයං වා කරෙය්‍යාම. තං කිස්ස හෙතු? යා හිස්ස භො කච්චාන, පුබ්බෙ ඛත්තියොති සමඤ්ඤා, සාස්ස අන්තරහිතා, චොරොත්වෙව සඞ්ඛං[3] ගච්ඡති'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ බ්‍රාහ්මණො -පෙ- ඉධ වෙස්සො -පෙ- ඉධ සුද්දො සන්ධිං වා ඡින්දෙය්‍ය, නිල්ලොපං වා හරෙය්‍ය, එකාගාරිකං වා කරෙය්‍ය, පරිපන්ථෙ වා තිට්ඨෙය්‍ය, පරදාරං වා ගච්ඡෙය්‍ය. තං චෙ තෙ පුරිසා ගහෙත්වා දස්සෙය්‍යුං: 'අයං තෙ දෙව, චොරො ආගුචාරී[1], ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහී'ති. කින්ති නං කරෙය්‍යාසීති ?

ඝාතෙය්‍යාම වා භො කච්චාන, ජාපෙය්‍යාම වා පබ්බාජෙය්‍යාම වා යථාපච්චයං වා කරෙය්‍යාම. තං කිස්ස හෙතු? යා හිස්ස භො කච්චාන, පුබ්බෙ සුද්දොති සමඤ්ඤා, සාස්ස අන්තරහිතා, චොරොත්වෙව සඞ්ඛං[3] ගච්ඡතීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ, ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

අද්ධා ඛො භො කච්චාන, එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති නෙසං එත්ථ කිඤ්චි නානාකරණං සමනුපස්සාමීති.

ඉමිනාපි ඛො එතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං: යථා ඝොසොයෙවෙසො ලොකස්මිං, බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදාති.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ ඛත්තියො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො අස්ස, විරතො පාණාතිපාතා විරතො අදින්නාදානා විරතො මුසාවාදා එකභත්තිකො බ්‍රහ්මචාරී සීලවා කල්‍යාණධම්මො, කින්ති නං කරෙය්‍යාසීති?

අභිවාදෙය්‍යාම වා භො කච්චාන, පච්චුට්ඨෙය්‍යාම වා ආසනෙන වා නිමන්තෙය්‍යාම අභිනිමන්තෙය්‍යාම වා නං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, ධම්මිකං වා අස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාම. තං කිස්ස හෙතු? යා හිස්ස භො කච්චාන, පුබ්බෙ ඛත්තියොති සමඤ්ඤා, සාස්ස අන්තරහිතා, සමණොත්වෙව සඞ්ඛං[3] ගච්ඡතීති.

---

1. ආගුං චාරී - ස්‍යා.
2. ථාලෙය්‍යාම - ස්‍යා.
3. සඞ්ඛ්‍යං - මජසං.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙතුවරැ ක්‍ෂත්‍රියයෙක් ගෘහසන්ධි හෝ සිඳුනේ යැ ගම් හෝ පහරනේ යැ, එක් ගෙයක් හෝ වොලොගන්නේ යැ, මං හෝ පහරනේ යැ, පරඹුන් කරා හෝ යන්නේ යැ, උහු ද තෙල පුරුෂයෝ අල්වාගෙන "දෙවයිනි, මෙ සොර තොපට අපරාධකාරී යැ. මුහුට යමක් කැමැත්තවූ නම් එ දඩුවම කරව"යි දක්වන්නාහු නම්, උහුට කුමක් කෙරෙයි ද?යි.

භවත් කාත්‍යායනයෙනි, ප්‍රාණවධ හෝ කරවම්හ, ධනහානි හෝ කරවම්හ, රටින් හෝ නෙරවම්හ, ප්‍රත්‍යය වූ සේ හෝ කරම්හ. ඒ කවර හෙයින යත් : භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් පෙර උහුට 'ක්‍ෂත්‍රිය' යි නමෙක් වී නම් උහු ගේ එ නම අතුරුදහන් වී ද, 'සොර' යැ යන සඞ්ඛ්‍යාවට මැ යේ ද, එහෙයිනි.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙතුවරැ බ්‍රාහ්මණයෙක් . . . මෙතුවරැ වෛශ්‍යයෙක් . . . මෙතුවරැ ශූද්‍රයෙක් ගෘහසන්ධි හෝ සිඳුනේ යැ ගමක් හෝ වොලොගන්නේ යැ, එක් ගෙයක් හෝ වොලොගන්නේ යැ, කඩපළාසොරකම් හෝ කරන්නේ යැ, පරඹුන් කරා හෝ යන්නේ යැ. උහු ද තෙල පුරුෂයෝ අල්වාගෙන "දේවයෙනි, මෙ සොර තොප වහන්සේට අපරාධකාරී යැ මුහුට යමක් කැමැත්තවූ නම් එ දඩ පණව'යි දක්වන්නාහු නම් උහුට කුමක් කෙරෙයි ද?යි.

භවත් කාත්‍යායනයෙනි, ප්‍රාණවධ හෝ කරවම්හ, ධනහානි හෝ කරවම්හ, දෙශත්‍යාග හෝ කරවම්හ. ප්‍රත්‍යය වූ සේ හෝ කරම්හ. ඒ කවර හෙයින යත් : භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් පෙර උහුට 'ශුද්‍ර'යි යම් නමෙක් වී නම් උහු ගේ එ නම අතුරුදහන් වී ද, 'සොර'යැ යන සඞ්ඛ්‍යාවට මැ යේ ද, එහෙයිනැ'යි.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? ඉදින් මෙසේ ඇති කල්හි මෙ සතර වර්ණයෝ සමසම වෙති හෝ නො වෙති හො'යි. තොපට මෙහි ලා කෙසේ හෝ වේ ද?යි.

භවත් කාත්‍යායනයෙනි, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි මේ සතර වර්ණයෝ සමසම වෙති, මෙහි මෙ සතර වර්ණයන් ගේ කිසි වෙනසක් නො දක්මි'යි.

මහරජ, මෙකරුණිනුදු "බමුණු මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ තදන්‍ය වූයේ හීනවර්ණ යැ . . . බ්‍රහ්මදායාද යැ යන තෙල කරුණ ලෝකයෙහි ඝොෂමාත්‍රයෙකැ'යි දතයුතු.

මහරජ, එය කිමැ'යි හඟනෙහි ද? මෙ තුවරැ ක්‍ෂත්‍රියයෙක් කෙහෙරැවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සස්නට වන්නේ පණිවායෙන් වෙන් වූයේ අයිනාදනින් වෙන් වූයේ මුසවායෙන් වෙන් වූයේ එක් වේලේ වළඳනුයේ බඹසර ඇතියේ සිල්වත් වූයේ කලණදහම් ඇති වන්නේ යැ. උහුට කුමක් කරනෙහි ද?යි.

භවත් කාත්‍යායනයෙනි, අභිවාදන හෝ කරම්හ, දුක හුනස්නෙන් හෝ නැඟෙම්හ, අසුනින් හෝ නිමන්ත්‍රණ කරම්හ, උහු සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත් පිරිකරින් හෝ එළවා නිමන්ත්‍රණ කරම්හ, ඔහට ධාර්මික රක්ෂාවරණගොපන සංවිධාන හෝ කරවම්හ, ඒ කවර හෙයින යත් : භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් පෙර උහුට 'ක්‍ෂත්‍රිය' යන නමෙක් වී නම් එ නම ඔහට අතුරුදහන් වී ද, 'ශ්‍රමණ' යන සඞ්ඛ්‍යාවට මැ යේ ද, එහෙයිනැ' යි.

තං කිං මඤ්ඤසි මහාරාජ, ඉධ බ්‍රාහ්මණො-පෙ-ඉධ වෙස්සො-පෙ-ඉධ සුද්දො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො අස්ස, විරතො පාණාතිපාතා විරතො අදින්නාදානා විරතො මුසාවාදා එකභත්තිකො බ්‍රහ්මචාරී සීලවා කල්‍යාණධම්මො, කින්ති නං කරෙය්‍යාසීති?

අභිවාදෙය්‍යාම වා භො කච්චාන, පච්චුට්ඨෙය්‍යාම වා ආසනෙන වා නිමන්තෙය්‍යාම අභිනිමන්තෙය්‍යාම වා නං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, ධම්මිකං වා අස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාම. තං කිස්ස හෙතු? යා හිස්ස භො කච්චාන, පුබ්බෙ සුද්දොති සමඤ්ඤා, සාස්ස අන්තරහිතා, සමණොත්වෙව සඞ්ඛං ගච්ඡතීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

අද්ධා ඛො භො කච්චාන, එවං සන්තෙ ඉමෙ චත්තාරො වණ්ණා සමසමා හොන්ති, නෙසං එත්ථ කිඤ්චි නානාකරණං සමනුපස්සාමීති.

ඉමිනාපි ඛො එතං මහාරාජ, පරියායෙන වෙදිතබ්බං: යථා ඝොසොයෙවෙසො ලොකස්මිං බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනා අඤ්ඤෙ වණ්ණා. බ්‍රාහ්මණාව සුක්කා වණ්ණා, කණ්හා අඤ්ඤෙ වණ්ණා. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති, නො අබ්‍රාහ්මණා. බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදාති.

එවං වුත්තෙ රාජා මාධුරො අවන්තිපුත්තො ආයස්මන්තං මහාකච්චානං එතදවොච: අභික්කන්තං භො කච්චාන, අභික්කන්තං භො කච්චාන, සෙය්‍යථාපි භො කච්චාන, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා කච්චානෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භවන්තං කච්චානං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං කච්චානො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

මා ඛො මං ත්වං මහාරාජ, සරණං අගමාසි, තමෙව ත්වං භගවන්තං සරණං ගච්ඡ යමහං සරණං ගතොති.

කහං පන භො කච්චාන, එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධොති?

පරිනිබ්බුතො ඛො මහාරාජ, එතරහි සො භගවා අරහං සම්මාසම්බුද්ධොති.

Free Distribution www.aathaapi.org

මහරජ, එය කිමැ'යි හඟී ද? මෙ නුවර බ්‍රාහ්මණයෙක් . . . මෙනුවර වෛශ්‍යයෙක් . . . මෙනුවර ශූද්‍රයෙක් කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගෙන් නික්ම සස්නට වන්නේ පණිවායෙන් වෙන් වූයේ අයිනාදනින් වෙන් වූයේ මුසවායෙන් වෙන් වූයේ එක් වේලේ වළඳනුයේ බඹසර ඇතියේ සිල්වත් වූයේ කලණ දහම් ඇතියේ වන්නේ යැ, ඔහට කුමක් කෙරෙහි ද?යි.

භවත් කාත්‍යායනයෙනි, අභිවාදන හෝ කරම්හ, දැක හුනස්නෙන් හෝ නැඟෙම්හ, අසුනින් හෝ නිමන්ත්‍රණ කරම්හ, උහු චීවරපිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් හෝ එළවා නිමන්ත්‍රණ කරම්හ, උහුට ධාර්මික රක්ෂාවරණ-ගොපන සංවිධාන හෝ කරවම්හ. ඒ කවර හෙයින යත්: භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් පෙර ඔහට 'ශූද්‍රය' යන යම් සංඥවක් වූ ද, ඔහුට ඒ සංඥව අතුරු-දහන් වූ ද, 'ශ්‍රමණ' යන සඞ්ඛ්‍යාවට මැ යේ ද, එහෙයිනැ යි.'

මහරජ, එය කිමැ'යි හඟිහි ද? ඉදින් මෙසේ ඇති කල්හි මේ සතර වර්ණයෝ සමසම වෙති හෝ නො වෙති හො?යි. තොපට මෙහි ලා කෙසේ හෝ වෙ ද?යි.

භවත් කාත්‍යායනයෙනි, මෙසේ ඇති කල්හි එකාන්තයෙන් මේ සතර වර්ණයෝ සමසම වෙති. මෙහි ලා මොවුන් ගේ කිසි වෙනසක් නො දක්මි'යි.

මහරජ, මෙ කරුණිනුදු "බ්‍රාහ්මණ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ, තදන්‍ය වූයේ හීනවර්ණ යි, බ්‍රාහ්මණ මැ ශුක්ලවර්ණ යැ තදන්‍ය වූයේ කෘෂ්ණවර්ණ යි, බ්‍රාහ්මණයෝ මැ ශුද්ධ වෙති. අබ්‍රාහ්මණයෝ නො වෙත්. බ්‍රාහ්මණයෝ මැ බඹහු ගේ ඖරසපුත්‍ර යැ, මුවින් උපනුවහ, බ්‍රහ්මජයහ, බඹහු විසින් මවනලදහ, බ්‍රහ්මදායාදයහ" යන මෙ කරුණ ලොකයෙහි 'ඝොෂමාත්‍රයෙකැ'යි දතයුතු.

මෙසේ කී කල්හි අවන්තිපුත්‍ර වූ මධුර පුරාධීශ රජ තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන්ට තෙල බස් කී : "භවත් කාත්‍යායනයෙනි, ඉතා කාන්ත යැ, භවත් කාත්‍යායනයෙනි, ඉතා කාන්ත යැ, භවත් කාත්‍යායනයෙනි, යම්සේ යටිහුරු වූවක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් වූවක් හෝ විවර කරන්නේ ද, මංමුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකිත්ව'යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එසෙයින් මැ භවත් කාත්‍යායනයන් විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද, තෙල මම් භවත් කාත්‍යායනයන් ද, දහම ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යෙමි, භවත් කාත්‍යායනයෝ මා අද පටන් දිවිහිම් කොට සරණගිය උපාසකයකු කොට ධරත්ව'යි.

මහරජ, 'තෙපි මා නහමක් සරණ යව, මම් යමක්හු සරණ කොට ගියෙම් නම් තෙපි එ මැ භාග්‍යවතුන් සරණ යව'යි.

භවත් කාත්‍යායනයෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවත්හු දැන කොහි වෙසෙත් ද?යි.

මහරජ, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවත්හු මෙකලැ පිරිනිවියහ'යි.

සචෙ හි මයං භො කච්චාන, සුණෙය්‍යාම තං භගවන්තං දසසු යොජනෙසු, දසපි මයං යොජනානි ගච්ඡෙය්‍යාම තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං. සචෙ හි මයං භො කච්චාන, සුණෙය්‍යාම තං භගවන්තං වීසතියා යොජනෙසු, තිංසතියා යොජනෙසු, චත්තාළීසාය යොජනෙසු, පඤ්ඤාසාය යොජනෙසු, පඤ්ඤාසම්පි මයං යොජනානි ගච්ඡෙය්‍යාම තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං යොජනසතෙ චෙපි මයං භො කච්චාන, සුණෙය්‍යාම තං භගවන්තං, යොජනසතම්පි මයං ගච්ඡෙය්‍යාම තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං. යතො ච ඛො භො කච්චාන, පරිනිබ්බුතො සො භගවා, පරිනිබ්බුතම්පි මයං තං භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛු-සඞ්ඝඤ්ච. උපාසකං මං භවං කච්චානො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

මධුරසුත්තං චතුත්ථං.

භවත් කාත්‍යායනයෙනි, ඉදින් ඇපි දස යොදනෙක්හි ඒ භාග්‍යවතුන් අසමෝ නම් ඇපි අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් කරා දස යොදන මැ යම්හ. ඉදින් භවත් කාත්‍යායනයෙනි, ඇපි විසි යොදනෙක්හි, තිස්යොදනෙක්හි, සතලිස්යොදනෙක්හි, පනස්-යොදනෙක්හි ඒ භාග්‍යවතුන් අසමෝ නම් ඇපි අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් කරා පනස් යොදන මැ යම්හ. ඉදින් භවත් කාත්‍යායනයෙනි, ඇපි යොදුන් සියයෙකැ ඒ භාග්‍යවතුන් අසමෝ නම් ඇපි අර්හත් සම්‍යක් සම්බුද්ධ ඒ භාග්‍යවතුන් කරා යොදුන් සියය මැ යම්හ. භවත් කාත්‍යායනයෙනි, ඒ බුදුහු යම් දවසෙක පිරිනිවිසේක් ද, ඇපි පිරිනිවියා වූ ද ඒ බුදුන් දහම් හා සඟුන් හා සරණ කොට යෙමි. භවත් කාත්‍යායනයෝ මා අද පටන් දිවිහිම් කොට සරණගත උපාසකයකු කොට ධරත්ව'යි.

සතර වැනි මධුරසූත්‍ර යි.

---

2. 4. 5

බොධිරාජකුමාරසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන බොධිස්ස රාජකුමාරස්ස කොකනදො[1] නාම පාසාදො අචිරකාරිතො හොති අනජ්ඣාවුත්ථො[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන. අථ ඛො බොධි රජකුමාරො සඤ්ජිකාපුත්තං මාණවං ආමන්තෙසි: එහි ත්වං සම්ම සඤ්ජිකාපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද[3], අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ, බොධි භන්තෙ, රාජකුමාරො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී'ති. එවඤ්ච වදෙහි: 'අධිවාසෙතු කිර භන්තෙ, භගවා බොධිස්ස රජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති එවං හොති ඛො සඤ්ජිකාපුත්තො මාණවො බොධිස්ස රජකුමාරස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සඤ්ජිකාපුත්තො මාණවො භගවන්තං එතදවොච: බොධි භො ගොතම, රජකුමාරො[4] භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති එවඤ්ච වදෙති: අධිවාසෙතු කිර භවං ගොතමො බොධිස්ස රජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො සඤ්ජිකාපුත්තො මාණවො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා යෙන බොධි රාජකුමාරො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා බොධිං රාජකුමාරං එතදවොච: "අවොචුම්හා ඛො මයං භොතො වචනෙන තං භවන්තං ගොතමං: බොධි භො ගොතම, රාජකුමාරො භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: 'අධිවාසෙතු කිර භවං ගොතමො බොධිස්ස රාජකුමාරස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා''ති. අධිවුත්ථඤ්ච පන සමණෙන ගොතමෙනාති.

---

1. කොකනුදො - සයා. 2. අනජ්ඣාවුට්ඨො - මජ්ඣසං, සයා.
3. වන්දහි - සීමු. 4. බොධි ඛො රාජකුමාරො - සීමු, මජ්ඣසං.

Free Distribution www.aathaapi.org

2. 4. 5.
බෝධිරාජකුමාර සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්‍ග රට සුංසුමාරගිර නුවර නිසා භේසකලාවන නම් මුවළැව්හි වැඩ වසනසේක. එසමයෙහි වනාහි බෝධිරාජකුමාරයාගේ ‘කොකනද’ නම් පහය අළුතැ කරවනලද්දුයේ මහණක්හු විසින් වේවයි බමුණක්හු විසින් වේවයි මිනිස් වූ කිසිවක්හු විසින් වේවයි නො වසන ලද වෙයි. එකල්හි බොධිරාජ කුමාර තෙම සඤ්ජිකාපුත්‍ර මාණවයා ඇමැති : “එව යහළු සඤ්ජිකාපුත්‍රයෙනි, තෙපි බුදුන් කරා එළැඹෙව. එළැඹ මාගේ බසින් භාග්‍යවතුන් ගේ පාසහළ සිරසින් වඳුව, අරොග බව නිදුක් බව කයෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුස්ව. ‘වහන්ස, බොධිරාජකුමාර බුදුන්ගේ පාසහළ සිරසින් වඳියි, අරොග බව නිදුක් බව කයෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුසී’’ යයි. මෙසේත් කියව : ‘‘වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෙට බොධිරාජ කුමරුගේ බත භික්ෂුසඞ්ඝයා හා සමග ඉවසන සේක්ව’’යි. ‘එසේ යැ භවත්නි’යි සඤ්ජිකාපුත්‍ර මාණව බොධිරාජකුමරහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සඤ්ජිකාපුත්‍ර මාණව භාග්‍යවතුන්ට තෙල බස් සැලකෙළේ : ‘‘භවත් ගෞතමයන් වහන්ස, බෝධිරාජකුමර භවත් ගෞතමයන් ගේ පාසහුළුවන් මුදුනින් වඳියි. ආරෝග්‍යය නිදුක්බව කයෙහි සැහැල්ලුබව කායබල ඵාසුවිහරණ පුළුවුස්යි. මෙසේත් කියයි : ‘‘භවත් ගෞතමයන් වහන්සේ සෙට බොධිරාජ කුමරුගේ බත භික්ෂුසඞ්ඝයා හා සමග ඉවසන සේක්ව’’යි. බුදුහු තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ.

එසඳ සඤ්ජිකාපුත්‍ර මාණව භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනය දැන හුනස්නෙන් නැඟී බෝධිරාජකුමරු වෙත එළැඹියේ යැ. එළැඹ බෝධිරාජ කුමරුට තෙල බස් කී : ‘‘ඇපි භවතුන් ගේ වචනයෙන් ඒ භවත් ගෞතමයන්ට සැලකළම්හ : ‘‘භවත් ගෞතමයන් වහන්ස, බෝධිරාජකුමාර භවත් ගෞතමයන් ගේ පාසහළ සිරසින් වඳියි, ආරොග්‍යය නිදුක්බව කායලඝුත්වය කායබලය පහසුවිහරණ විචාරයි, මෙසේත් කියයි : ‘‘භවත් ගෞතමයන් වහන්සේ සෙට බෝධිරාජකුමරු ගේ බත භික්සඟන හා සමග ඉවසනසේක්ව’’යි. වැළිත් ශ්‍රමණ ගෞතමයන් විසින් ඉවසන ලද ද වේ යයි.

32——ෙක් 13501 (11/72)

Free Distribution www.aathaapi.org

අථ ඛො බොධි රාජකුමාරො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා කොකනදඤ්ච පාසාදං ඔදාතෙහි දුස්සෙහි සන්ථරාපෙත්වා යාව පච්ඡිමා සොපාණකළෙපරා[1] සඤ්ජිකාපුත්තං මාණවං ආමන්තෙසි: 'එහි ත්වං සම්ම සඤ්ජිකාපුත්ත, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙහි: 'කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත'න්ති. එවං භොති ඛො සඤ්ජිකාපුත්තො මාණවො බොධිස්ස රාජකුමාරස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙසි: 'කාලො භො ගොතම[2], නිට්ඨිතං භත්ත'න්ති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන බොධිස්ස රාජකුමාරස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, තෙන ඛො පන සමයෙන බොධි රාජකුමාරො බහිද්වාරකොට්ඨකෙ ඨිතො හොති භගවන්තං ආගමයමානො. අද්දසා ඛො බොධි රාජකුමාරො භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන පච්චුග්ගන්ත්වා භගවන්තං අභිවාදෙත්වා පුරක්ඛත්වා[3] යෙන කොකනදො පාසාදො තෙනුපසඞ්කමි.

අථ ඛො භගවා පච්ඡිමං සොපාණකළෙපරං නිස්සාය අට්ඨාසි. අථ ඛො බොධි රාජකුමාරො භගවන්තං එතදවොච: 'අභිරූහතු භන්තෙ, භගවා දුස්සානි, අභිරූහතු සුගතො දුස්සානි, යං මමං අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො බොධි රාජකුමාරො භගවන්තං එතදවොච: 'අභිරූහතු භන්තෙ, භගවා දුස්සානි, අභිරූහතු සුගතො දුස්සානි, යං මමං අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති. දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි. තතියම්පි ඛො බොධි රාජකුමාරො භගවන්තං එතදවොච: 'අභිරූහතු භන්තෙ, භගවා දුස්සානි, අභිරූහතු සුගතො දුස්සානි, යං මමං අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං අපලොකෙසි. අථ ඛො ආයස්මා ආනන්දො බොධිං රාජකුමාරං එතදවොච: 'සංහරතු[4] රාජකුමාර, දුස්සානි. න ඛො භගවා චෙලපත්තිකං[5] අක්කමිස්සති. පච්ඡිමං ජනතං තථාගතො අපලොකෙතී'ති[6]. අථ ඛො බොධි රාජකුමාරො දුස්සානි සංහරාපෙත්වා උපරි කොකනදෙ පාසාදෙ[7] ආසනානි පඤ්ඤාපෙසි. අථ ඛො භගවා කොකනදං පාසාදං අභිරූහිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො බොධි රාජකුමාරො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. අථ ඛො බොධි රාජකුමාරො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො බොධි රාජකුමාරො භගවන්තං එතදවොච: 'මය්හං ඛො භන්තෙ, එවං හොති, 'න ඛො සුඛෙන සුඛං අධිගන්තබ්බං, දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බ'න්ති.

---

1. සොපාණකළෙවරා - මජසං, සයා, PTS.
2. කාලො භන්තෙ - සීමු.
3. පුරක්ඛිත්වා - PTS.
4. සංහරන්තු - PTS.
5. චෙලපටිකං - සීමු, මජසං, සයා.
6. අනුකම්පතීති - මජසං.
7. කොකනදපාසාදෙ - මජසං.

Free Distribution www.aathaapi.org

එසඳ බෝධිරාජකුමාර එරැය ඇවෑමෙන් සිය නිවෙස්නෙහි ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයන් පිළියෙළ කරවා කොකනද පහයත් හිණග (හිණිපාමුල) දක්වා හෙළ පිළී අතුරුවා සඤ්ජිකාපුත්‍ර මාණවයා ඇමැති : "එව යහළු සඤ්ජිකාපුත්‍රයෙනි, තෙපි භාග්‍යවතුන් කරා එළඹෙව, එළඹ 'වහන්ස, වඩනට කලි, බත නිමියේ යැ'යි භාග්‍යවත්නට කල් දන්ව"යි. 'එසේ යැ භවත්නි'යි සඤ්ජිකාපුත්‍ර මාණව බොධිරාජකුමරහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් කරා එළැඹියේ යැ. එළැඹ 'වහන්ස, වඩනට කලි, බත නිමියේ යැ'යි භාග්‍යවත්නට කල් දන්වී.

එසඳ බුදුහු පෙරවරු වේලෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන බොධිරාජකුමරා ගේ නිවෙස්න කරා එළැඹියහ. එ වේලෙහි බොධිරාජකුමාර බිහිදෙරකොටුවෙහි භාග්‍යවතුන් එනු බලමින් සිටියේ වෙයි. බොධිරාජකුමාර වඩනා භාග්‍යවතුන් දුරදී මැ දිට. දැක පෙරගමන් කොට භාග්‍යවතුන් වැඳ පෙරටු කොට කොකනද පහය කරා එළැඹියේ යැ.

එසඳ බුදුහු හිණිපාමුල නිසා වැඩසිටියහ. ඉක්බිති බොධිරාජකුමර භාග්‍යවත්නට තෙල බස් සැලකෙළේ : "වහන්ස, බුදුහු පියවිල්ලට නැහෙනසේක්වා, සුගතයන් වහන්සේ පියවිල්ලට නැහෙනසේක්වා, යම් හෙයෙකින් එය මට දිගුකලක් හිත පිණිස සුව පිණිස වේ ද, එහෙයිනැ"යි. මෙසේ කී කල්හි බුදුහු නිහඬ වූහ. දෙවනවට ද බොධිරාජකුමර භාග්‍යවතුන්ට තෙල බස් සැලකෙළේ : "වහන්ස, බුදුහු පියවිලියට නැහෙනසේක්වා, සුගතයන් වහන්සේ පියවිලියට නැහෙනසේක්වා, එය මට දිගුකලක් හිත පිණිස සුව පිණිස වේ" යයි. දෙවනවට ද බුදුහු නිහඬ වූහ. තුන් වනවට ද බෝධිරාජකුමර භාග්‍යවතුන්ට තෙල බස් සැලකෙළේ : "වහන්ස, බුදුහු පියවිලියට නැහෙත්වා, සුගත්හු පියවිලියට නැහෙත්වා, එය මට දිගුකලක් හිත සුව පිණිස වේ"යයි.

එසඳ බුදුහු ආයුෂ්මත් අනද තෙරුන් බැලූහ. ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවෝ බෝධිරාජකුමරහට තෙල බස් සැලකළහ : "රජකුමරුවෙනි, පියවිලි හකුළාලව බුදුහු පියවිලි නො ඇක්මෙති, තථාගතයෝ පශ්චිම ජනතාව බලති"යි. එසඳ බෝධිරාජකුමර පියවිලි හකුළුවා කොකනද පහාහි මතුමහල්හි අසුන් පැනවී. ඉක්බිති බුදුහු කොකනද පහයට නැඟී පැනවූ අස්නෙහි භික්ෂුසඞ්ඝයා හා සමග වැඩ හුන්හු. ඉක්බිති බොධිරාජ කුමර බුදුපාමොක් මහසඟන ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් සැතැප්වී, මොනොවට පැවැරී. ඉක්බිති බොධිරාජකුමාර වළඳා නිමවූ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් දැන එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් බෝරජකුමර භාග්‍යවත්නට තෙලබස් සැලකළේ : "වහන්ස, මට මෙසේ සිත් වෙයි, 'සුවයෙන් සුවය නො ලද හැක්ක. දුකින් මැ සුවය ලද හැක්කැ"යි,

මය්හම්පි ඛො රාජකුමාර, පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි : "න ඛො සුඛෙන සුඛං අධිගන්තබ්බං, දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බ''න්ති. සො ඛො අහං රාජකුමාර, අපරෙන සමයෙන දහරො'ව සමානො සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අකාමකානං මාතාපිතුන්නං[1] අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං. සො එවං පබ්බජිතො සමානො කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන ආළාරො කාලාමො තෙනුපසංකමිං, උපසංකමිත්වා ආළාරං කාලාමං එතදවොචං : 'ඉච්ඡාමහං ආවුසො කාලාම, ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු'න්ති. එවං වුත්තෙ රාජකුමාර, ආළාරො කාලාමො මං එතදවොච : 'විහරතායස්මා, තාදිසො අයං ධම්මො, යත්ථ විඤ්ඤූ පුරිසො න චිරස්සෙ'ව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා''ති. සො ඛො අහං රාජකුමාර, න චිරස්සෙ'ව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං රාජකුමාර, තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි. ථෙරවාදඤ්ච, 'ජානාමි, පස්සාමී'ති ච පටිජානාමි, අහඤ්චෙව අඤ්ඤෙ ච. තස්ස මය්හං රාජකුමාර එතදහොසි : "න ඛො ආළාරො කාලාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙති. අද්ධා ආළාරො කාලාමො ඉමං ධම්මං ජානං පස්සං විහරතී''ති.

අථ ඛ්වාහං රාජකුමාර, යෙන ආළාරො කාලාමො තෙනුපසංකමිං. උපසංකමිත්වා ආළාරං කාලාමං එතදවොචං : "කිත්තාවතා නො ආවුසො කාලාම, ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසී''ති. එවං වුත්තෙ රාජකුමාර, ආළාරො කාලාමො ආකිඤ්චඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි : "න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො ආළාරස්සෙ'ව කාලාමස්ස අත්ථි විරියං, මය්හම්පත්ථි විරියං, න ඛො ආළාරස්සෙ'ව කාලාමස්ස අත්ථි සති, මය්හම්පත්ථි සති. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සමාධි, මය්හම්පත්ථි සමාධි. න ඛො ආළාරස්සෙ'ව කාලාමස්ස අත්ථි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා, යන්නූනාහං යං ධම්මං ආළාරො කාලාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙති, තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය''න්ති. සො ඛො අහං රාජකුමාර, න චිරස්සෙ'ව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

අථ ඛ්වාහං රාජකුමාර, යෙන ආළාරො කාලාමො තෙනුපසංකමිං. උපසංකමිත්වා ආළාරං කාලාමං එතදවොචං : "එත්තාවතා, නො ආවුසො කාලාම, ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසී''ති. එත්තාවතා ඛ්වාහං ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී'ති. අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති.

1. මාතාපිතූනං - මජසං.

රජකුමර, සම්බොධියෙන් පෙර මැ ප්‍රතිවේධ නො කළ සිව්සස් ඇති බෝසත් වූ මැ මට ද මෙසේ සිත් වී : ''සුඛයෙන් සුඛය නො ලද හැක්ක, දුඃඛයෙන් මැ සුඛය ලද හැක්කැ''යි. රජකුමර, ඒ මම් මැතභාගයෙහි තරුණ මැ වූයෙම් මනා කළුකෙහෙ ඇතියෙම් හදුයෞවන-යෙන් සමන්වාගත වූයෙම් ප්‍රථම වයසින් සමන්වාගතයෙම් නො කැමැති මාපියන් කඳුළු මුසු මුහුණු ඇති වැ හඬනුවනට අනාදර කොට කෙහෙරැවුළු බහාලා කහවත් හැදපෙරෙවැ ගෙන් නික්ම සසුන් වන්මි. ඒ මම් මෙසේ පැවිදි වූයෙම් කිංකුශලගවෙෂී වැ උත්තම ශාන්ති සඞ්ඛ්‍යාත වරපදය (නිවන) සොයනුයෙම් ආළාරකාලාම (තවුස්) කරා එළැඹියෙමි. එළැඹ ආළාරකාලාමහට මෙසේ බස් කීමි : ''ඇවැත්නි, කාලාමයෙනි, මම් මෙ සස්නෙහි බඹසර සරනට කැමැත්තෙමි''යි. රජකුමරුවෙනි, මෙසේ කී කල්හි ආළාරකාලාම මට මෙසේ බස් කී : ''ඇවැත්නි, වසව, යම් දහමෙකැ නුවණැති පුරිස් නොබෝකලකින් මැ සිය ඇදුරුසමය තමන් විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වසන්නේ නම් මෙ දහම එබඳු යැ''යි. රජකුමර, එ මම් නොබෝකලෙකින් මැ වහා මැ එ දහම අසා උගත්මි. රජකුමර, එ මම් එතෙක් මැ තොල් පහළ පමණින් වදන් පිළිවදන් පමණින් ඥානවාදයත් ස්ථවිරවාදයත් කියමි. 'දනිමි දක්මි'යි ද මමත් පිළින කෙරෙමි. සෙස්සෝත් (කියති.) රජකුමර, ඒ මට මෙසේ සිත් වී : ''ආළාර කාලාම මෙ දහම හුදෙක් සැදැහැ මතුයෙන් තමන් විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසෙමි' නො මැ පවසයි. ඒකාන්තයෙන් ආළාර කාලාම මෙ දහම දනිමින් දක්මින් වාස කෙරේ''යයි.

රජකුමරුවෙනි, එසඳ මම් ආළාරකාලාම කරා එළැඹියෙමි. එළැඹ ආළාරකාලාමහට මෙසේ බස් කීමි : ''ඇවැත්නි කාලාමයෙනි, කිපමණෙකින් අපට මෙ දහම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට ඊට පැමිණ වෙසෙමි' ප්‍රකාශ කරවූ දැ''යි. රාජකුමාරය, මෙසේ කී කල්හි ආළාරකාලාම ආකිඤ්චඤ්ඤායතනය පැවැසී. රජකුමර, ඒ මට මෙසේ සිත් වී : ''ආළාරකාලාමහට මැ ශ්‍රද්ධා නො ද ඇති, මාහට ද ශ්‍රද්ධා ඇති. ආළාරකාලාමහට මැ වීර්‍ය්‍ය නො ද ඇති, මාහට ද වීර්‍ය්‍ය ඇති. ආළාරකාලාමහට මැ නො ද සිහි ඇති, මාහට ද සිහි ඇති, ආළාරකාලාමහට මැ සමාධි නො ද ඇති, මාහට ද සමාධි ඇති. ආළාරකාලාමහට මැ ප්‍රඥා නො ද ඇති, මාහට ද ප්‍රඥා ඇති. ආළාරකාලාම යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන සාක්ෂාත් කොට ඊට පැමිණ වාස කෙරෙමි' පවසා ද මම් එ දහම් පසක් කරනුවට වීර්‍ය්‍ය කෙරෙම් නම් මැනැවැ''යි. රජකුමර, ඒ මම් නොබෝ කලෙකින් මැ වෙලෙව් වැ මැ එ දහම තමන් විසින් වෙසසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කෙළෙමි.

රජකුමර, ඉක්බිති මම් ආළාරකාලාම කරා එළැඹියෙමි, එළැඹ ආළාරකාලාමහට මෙසේ බස් කීමි : ''ඇවැත්නි, කාලාමයෙනි, මෙතෙකින් අපට මෙ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කෙරෙමි' පවසවූ දැ?''යි. ''ඇවැත්නි, මෙතෙකින් මම් මෙ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසෙමි' පවසමි''යි. 'ඇවැත්නි, මමත් මෙතෙකින් මෙ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසෙමි'යි, ඇවැත්නි, අපට ලාභයෙක, ඇවැත්නි, අපට මනා ලාභයෙකි. ඇපි තොප වැනි සබ්‍රම්සර ආයුෂ්මත් කෙනකුන් දක්මහ, මෙසෙයින් මම්

ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම. ඉති යාහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. තමහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි. ඉති යාහං ධම්මං ජානාමි. තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි. තමහං ධම්මං ජානාමි. ඉති යාදිසො අහං, තාදිසො ත්වං. යාදිසො ත්වං, තාදිසො අහං. එහිදානි ආවුසො උභො'ව සන්තා ඉමං ගණං පරිහරාමා'ති. ඉති ඛො රාජකුමාර ආළාරො කාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනො.[1] සමසමං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. යාවදෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියා" ති. සො ඛො අහං රාජකුමාර, තං ධම්මං අනලං කරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

සො ඛො අහං රාජකුමාර, කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන උද්දකො[2] රමපුත්තො තෙනුපසංකමිං. උපසංකමිත්වා උද්දකං රමපුත්තං එතදවොචං: "ඉච්ඡාමහං ආවුසො රාම[3] ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු"න්ති. එවං වුත්තෙ රජකුමාර, උද්දකො රාමපුත්තො මං එතදවොච: "විහරතායස්මා, තාදිසො අයං ධම්මො, යත්ථ විඤ්ඤූ පුරිසො න චිරස්සෙ'ව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා"ති සො ඛො අහං රාජකුමාර. න චිරස්සෙ' ව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං රජකුමාර, තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි. ථෙරවාදඤ්ච, 'ජානාමි පස්සාමී'ති ච පටිජානාමි අහඤ්චෙව අඤ්ඤෙ ච. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "න ඛො රමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන 'සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසි. අද්ධා රමො ඉමං ධම්මං ජානං පස්සං විහාසී"ති.

අථ ඛ්වාහං රාජකුමාර, යෙන උද්දකො රාමපුත්තො තෙනුපසංකමිං, උපසංකමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "කිත්තාවතා නො ආවුසො රාම[4] ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසී"ති. එවං වුත්තෙ රජකුමාර, උද්දකො රාමපුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං රජකුමාර එතදහොසි: "න ඛො රමස්සෙ' ව අහොසි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො රමස්සෙ'ව අහොසි විරියං, මය්හම්පත්ථි විරියං. න ඛො රමස්සෙ' ව අහොසි සති, මය්හම්පත්ථි සති. න ඛො රමස්සෙ'ව අහොසි සමාධි, මය්හම්පත්ථි සමාධි. න ඛො රමස්සෙ'ව අහොසි පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං රමො 'සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසි. තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය"න්ති. සො ඛො අහං රජකුමාර, න චිරස්සෙ' ව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විහාසිං.

---

1. අත්තනා - මජසං.
2. උදකො - මජසං.
3. ආවුසො - මජසං.
4. රාමො - මජසං.

යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා පවසම් ද, තෙපි එ දහම තමන් විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරව. තෙපි යම් දහමක් තමන් විසින් වෙසසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරවු ද, මම් එ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙරෙමි. මෙසෙයින් මම් යම් දහමක් දනිම් ද, තෙපි එ දහම දනිවු. තෙපි යම් දහමක් දනිවු ද, මම් එ දහම දනිමි. මෙසෙයින් මම් යම් බඳුයෙම් ද, තෙපි එ බඳු වව. තෙපි යම් බඳුවවු ද, මම් එ බඳු වෙමි. එව දැන් ඇවැත්නි, දෙදෙනමෝ මෙ ගණය පරිහරණ කරම්හ''යි. රජකුමර, මෙසෙයින් වනාහි ආළාරකාලාම මා ගේ ආචාර්‍ය්‍ය වූයේ මැ අතැවැසි වූ මා තමා හා සමසම කොට තැබී. උදර පූජායෙනුදු මා පිදී යැ. රජකුමර, ඒ මට තෙල සිත් වී : ''මෙ දහම් නිර්වෙදයට නො වැටෙයි, විරාගයට නිරොධයට ව්‍යුපශමයට අභිඥවට සම්බොධයට නිර්වාණයට නො වැටෙයි. ආකිඤ්චඤ්ඤායතනොත්පත්තිය පිණිස මැ පවති'' යයි. රජකුමර, එ මම් එ දහම පිළිකෙව් කොට එ දහමින් කලකිරි බැහැර ගියෙමි.

රජකුමර, එ මම් 'කුසල් කිමැ'යි සොයනු යෙම් අනුත්තර සන්තිවරපදය (නිවන) පිරියෙස්මින් උද්දක රාමපුත්‍ර කරා එළැඹියෙමි. එළැඹ උද්දක රාමපුත්‍රහට තෙල බස් කීමි : ''ඇවැත්නි රාමයෙනි, මම මෙ සස්නෙහි බඹසර සරනු රිසියෙමි''යි. රජකුමර, මෙසේ කී කල්හි රාම පුත් උද තවුස් මට මෙසේ කී : ''ඇවැත්නි, වසව. යම් දහමෙක විඥපුරුෂ නොබෝ කලෙකින් මැ සිය ඇදුරුසමය තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කෙරේ නම් මේ එබඳු දහමෙකි''යි. රජකුමර, එ මම් නොබෝ කලෙකින් මැ වෙලෙව් වැ මැ එ දහම පිරිවැහීමි. රජකුමර, එ මම් එතෙක් තොල් පහළ පමණින් මැ වදන් පිළිවදන් මතුයෙන් මැ ඥනවාදයත් ස්ථවිරවාදයත් කියමි. 'දනිමි දක්මී' ද මමත් පිළින කෙරෙමි. තෙසුවෝත් පිළින කෙරෙති. රජකුමර, ඒ මට තෙල සිත් වී : ''රාම තවුස් මෙ දහම හුදෙක් ශ්‍රද්ධා පමණෙකින් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසෙමී' නො ද පැවැසී. ඒකාන්තයෙන් රාම මෙ දහම දනිමින් දක්මින් විසී''යයි.

එසඳ රාජකුමාරය, මම් රාමපුත් උද තවුස් කරා එළැඹියෙමි. එළැඹ රාම පුත් උද තවුස්හට තෙල බස් කීමි : ''ඇවැත්නි රාමයෙනි, කිපමණෙකින් අපට මෙ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා වාස කෙරෙමි' පවසවු ද''යි, රජකුමර, මෙසේ කී කල්හි රම්පුත් උද තවුස් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ප්‍රකාශ කෙළේ යැ. රජකුමර, ඒ මට තෙල සිත් වී : ''රාමහට මැ ශ්‍රද්ධා නො ද වූ, මට දු ශ්‍රද්ධා ඇත. රාමහට මැ වීර්‍ය්‍ය නො ද වී, මට දු වීර්‍ය්‍ය ඇත. රාමහට මැ ස්මෘති නො ද වූ, මට දු ස්මෘති ඇත. රාමහට මැ සමාධි නො ද වී, මට දු සමාධි ඇත. රාමහට මැ ප්‍රඥ නො ද වූ, මට දු ප්‍රඥ ඇති. රම් තවුස් යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කෙරෙමී ප්‍රකාශ කෙළේ ද, මම් එ දහම් පසක් කරනුවට ප්‍රධන්වීර්‍ය්‍ය කරනෙම් නම් ඉතා මැනැවැ''යි. රජකුමර, ඒ මම් නොබෝ කලෙකින් මැ වහා මැ එ දහම තමා විසින් තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට වාස කෙළෙමී.

අථ ඛ්වාහං රාජකුමාර, යෙන උද්දකො රාමපුත්තො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "එත්තාවතා නො ආවුසො රාම[1] ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්ප පවෙදෙසී"ති. එත්තාවතා ඛො අහං ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී'ති[2]. 'අහම්පි ඛො අවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති. ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම, ඉති යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි. ඉති යං ධම්මං රාමො අභිඤ්ඤාසි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තං ධම්මං රාමො අභිඤ්ඤාසි. ඉති යාදිසො රාමො අහොසි, තාදිසො ත්වං, යාදිසො ත්වං තාදිසො රාමො අහොසි. එහිදානි ආවුසො ත්වං ඉමං ගණං පරිහරා'ති. ඉති ඛො රාජකුමාර උද්දකො රාමපුත්තො සබ්‍රහ්මචාරී මෙ සමානො ආචරියට්ඨානෙ ච[3] මං ඨපෙසි. උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනූපපත්තියා'ති. සො ඛො අහං රාජකුමාර, තං ධම්මං අනලංකරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

සො ඛො අහං රාජකුමාර, කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො මගධෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන උරුවෙලා සෙනානිගමො තදවසරිං. තත්ථද්දසං රමණීයං භූමිභාගං පාසාදිකඤ්ච වනසණ්ඩං නදිඤ්ච සන්දන්තිං, සෙතකං සුපතිත්ථං රමණීයං, සමන්තා ච ගොචරගාමං. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "රමණීයො වත භූමිභාගො, පාසාදිකො ච වනසණ්ඩො නදී ච සන්දති. සෙතකා සුපතිත්ථා රමණීයා, සමන්තා ච ගොචරගාමො. අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානායා"ති. සො ඛො අහං රාජකුමාර, තත්ථෙව නිසීදිං අලමිදං පධානායා'ති.

අපිස්සු මං රාජකුමාර, තිස්සො උපමායො පටිභංසු. අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා: "සෙය්‍යථාපි රාජකුමාර, අල්ලං කට්ඨං සස්නෙහං[4] උදකෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය 'අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතුකරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි රාජකුමාර, අපිනු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං[4] උදකෙ නික්ඛිත්තං, උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො[5] අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතුකරෙය්‍යා'ති. නො හිදං[6] භන්තෙ. තං කිස්ස හෙතු? අදුං හි භන්තෙ[7] අල්ලං කට්ඨං සස්නෙහං[4] තඤ්ච පන උදකෙ නික්ඛිත්තං, යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො රාජකුමාර යෙ හි කෙචි[8] සමණා වා බ්‍රාහ්මණා වා කායෙන චෙව චිත්තෙන ච කාමෙහි[9] අවූපකට්ඨා විහරන්ති. යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමසිනෙහො[10] කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො, සො ච අජ්ඣත්තං න සුප්පහීනො හොති. න

1. රාමො - මජසං.
2. පවෙදෙසී'ති - මජසං.
3. ආචරියට්ඨානෙ - මජසං.
4. සස්සිනෙහං - සීමු.
5. අභිමත්ථෙන්තො - ස්‍යා.
6. නො හෙතං - සීමු.
7. භො ගොතම - සීමු.
8. යෙ කෙචි - සීමු.
9. කායෙන චෙව කාමෙහි - ස්‍යා.
10. කාමස්නෙහො - මජසං.

එසඳ රාජකුමාරයෙනි, මම රාමපුත් උද තවුස් කරා එළැඹියෙමි. එළැඹ රාමපුත් උද තවුස්හට මෙසේ කීමි : ''ඇවැත්නි, රාමයෙනි, මෙතෙකින් අපට මේ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එය උපදවා ප්‍රකාශ කෙරෙහි ද''යි. ඇවැත්නි, මෙතෙකින් මම මේ දහම තමා විසින් වෙසෙසා දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙරෙමි''යි. ''ඇවැත්නි, මෙතෙකින් මමත් මේ දහම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙමි''යි. ඇවැත්නි, අපට ලාභයෙක, ඇවැත්නි, අපට මනා ලාභයෙකි. ඇපි තොප වැනි සබ්‍රම්සර ආයුෂ්මත් කෙනකුන් දකුම්හ. මෙසෙයින් රාම යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙළේ ද, තෙපි ඒ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරව. තෙපි යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාස කරවු ද, ඒ දහම, රාම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ ප්‍රකාශ කෙළේ යැ. මෙසෙයින් රාම යම් දහමක් දත්තේ ද, තෙපි ඒ දහම දන්නාහු යැ. තෙපි යම් දහමක් දන්නාහු ද, ඒ දහම රාම දත්තේ යැ. මෙසේ රාම යම් බඳු වී නම් තෙපි ඒ බඳුව. තෙපි යම් බඳු වවු නම් රාම ඒ බඳු වී. එව දැන් ඇවැත්නි, තෙපි මේ ගණය පරිහරණ කරව''යි. රජකුමරුවෙනි, මෙසෙයින් රාමපුත්‍ර උද්දක මා ගේ සබ්‍රම්සැරි වූයේ මැ මා ඇදුරු තන්හි තැබී. උදර පූජායෙනුදු මා පිදී. රාජකුමාරය, ඒ මට මෙසේ සිත් වී : ''මේ දහම නිර්වේදයට නො වැටෙයි. නො ද විරාගයට නො ද නිරෝධයට නො ද කෙලෙස් සන්හිඳීමට නො ද අභිඥාවට නො ද සම්බෝධයට නො ද නිර්වාණයට වැටෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපත පිණිස මැ වැටේ''යයි. රජකුමර, ඒ මම ඒ දහම ප්‍රතික්‍ෂෙප කොට ඒ දහමින් කලකිරී ඉවත් ව ගියෙමි.

රජකුමර, ඒ මම 'කිංකුශලගවෙෂී වැ අනුත්තර ශාන්තිවරපදය සොයනුයෙම් මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරනුයෙම් උරුවෙලායෙහි සේනා නම් නියම්ගමට (සෙනානී නම් සිටුහුගේ ගමට) බටුයෙමි. එහි රමණීය භූමිභාගය ද ප්‍රසාද එළවන වන ළැහැබ ද සුදු වැලිතලා ඇති මනා තොට ඇති ගලන රමණීය හොය ද හාත්පසැ පිහිටි ගොදුරුගම ද දිටිමි. රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : ''භූමිභාගය රමණීය මැ යැ වනළැහැබ ප්‍රසාද එළවන්නේ මැ යැ. සුදුවැලිතලා ඇති මනා තොට ඇති රමණීය හොය ද ගලයි. හාත්පසැ ගොදුරුගම් ද වෙයි. ප්‍රධන් වීර්‍ය්‍ය කරනු කැමැති කුලපුතකුහට ප්‍රධන් පිණිස මේ තැන සමර්ථ මැ යැ''යි. රජකුමරුවෙනි, මම ''මෙතැන ප්‍රධන් පිණිස සමර්ථ වෙති''යි ඒ බෝපලගෙහි මැ නිෂද්‍යා කෙළෙමි.

තවද රජකුමරුවෙනි, මට පුනපුනා අසිරි එළවන පෙර නො ඇසූවිරූ උපමාවෝ තුන්දෙනෙක් වැටහුණහ : ''රජකුමරුවෙනි, ස්නෙහ සහිත දියෙහි බැහූ තෙත් කාෂ්ට-යෙක් ඇද්ද, ඉක්බිති පුරුෂයෙක් උතුරු රිණි ගෙන ගිනි නිපදවමි, තෙද පහළ කෙරෙමි'යි එන්නේ වේ ද, රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ සනා සහගිය දියෙහි බැහූ තෙල තෙත් කාෂ්ටය උතුරු රිණි ගෙන අළලන්නේ කිම ගිනි නිපදවන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ ද? යි. වහන්ස, මේ කරුණ නො වනසුලු මැ යැ, ඒ කවර හෙයින යත් : වහන්ස, තෙල තෙත් කාෂ්ටය සස්නෙහ වෙයි. ඒ ද දියෙහි බැහුණේ වෙයි. ඒ පුරුෂ ක්ලමථුවට වෙහෙසට හිමි වන්නේ මැ යැ'යි. රජකුමරුවෙනි, එපරිදි මැ යම් කිසි මහණහු වෙත්වයි බමුණහු වෙත්වයි කයිනුදු සිතිනුදු කාමයෙන් නො වෙන් වූවාහු වෙසෙත් ද ඔවුන් ගේ කාමයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාමපිපාසායෙක් කාමපරිදහයෙක් ඇද්ද, ඒ ද සිය සතන්හි සුප්‍රහීණ නො වේ ද, සන්හුන් නො වේ ද, ඒ භවත් මහණ බමුණහු තීව්‍ර කටුක ඖපක්‍රමික වූ ද දුඃඛවෙදනා විඳිති. ඔහු

සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා[1] කටුකා වෙදනා වෙදියන්ති. අභබ්බා ච තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. අභබ්බා 'ව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං රාජකුමාර, පඨමා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

අපරා'පි ඛො මං රාජකුමාර, දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා. සෙය්‍යථා'පි රාජකුමාර, අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි[2] තෙජො පාතුකරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි රාජකුමාර, අපිනු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතුකරෙය්‍යා'ති? නො හිදං භන්තෙ, තං කිස්ස හෙතු? අදුං හි භන්තෙ අල්ලං කට්ඨං සස්නෙහං කිඤ්චා'පි ආරකා උදකා ථලෙ නික්ඛිත්තං යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති. එවමෙව ඛො රාජකුමාර, යෙහි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන ඛො කාමෙහි වූපකට්ඨා විහරන්ති, යො ච තෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො සො ච අජ්ඣත්තං න සුප්පහීනො[3] හොති න සුප්පටිප්පස්සද්ධො[4] ඔපක්කමිකා චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා[1] ඛරා කටුකා වෙදනා වෙදියන්ති[5] අභබ්බා'ව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය, නො චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා ඛරා කටුකා වෙදනා වෙදියන්ති. අභබ්බා'ව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං රාජකුමාර, දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

අපරා පි ඛො මං රාජකුමාර, තතියා උපමා පටිභාසි. අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා. සෙය්‍යථා'පි රාජකුමාර, සුක්ඛං කට්ඨං කොළාපං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං. අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය "අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි තෙජො පාතුකරිස්සාමී"ති. තං කිං මඤ්ඤසි රාජකුමාර, අපි නු සො පුරිසො අමුං සුක්ඛං කට්ඨං කොළාපං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතු කරෙය්‍යාති. එවම්භන්තෙ, තං කිස්ස හෙතු, අදුං හි භන්තෙ සුක්ඛං කට්ඨං කොළාපං, තඤ්ච පන ආරකා උදකා ථලෙ නික්ඛිත්තන්ති. එවමෙව ඛො රාජකුමාර, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන චෙව චිත්තෙන ච[6] කාමෙහි වූපකට්ඨා විහරන්ති. යො ච තෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො, සො ච අජ්ඣත්තං සුප්පහීනො හොති සුප්පටිප්පස්සද්ධො ඔපක්කමිකා චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා ඛරා කටුකා වෙදනා වෙදියන්ති, භබ්බා'ව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා ඛරා කටුකා වෙදනා වෙදියන්ති භබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං රාජකුමාර, තතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා. ඉමා ඛො මං රාජකුමාර, තිස්සො උපමා පටිභංසු අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

---

1. තිබ්බා - මජසං. 2. අග්ගි නිබ්බත්තෙස්සාමි - මජසං.
3. සුපහීනො - මජසං. 4. සුපටිප්පස්සද්ධො - මජසං.
5. වෙදයන්ති - මජසං. 6. කායෙන චෙව - ස්‍යා.

Free Distribution www.aathaapi.org

අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය ද වෙති. ඉදින් ඒ භවත් මහණ බමණුහු තීව්‍ර කටුක දුඃඛවේදනා නො විඳිනාහු නම් වූහු ද, වැළිත් ඔහු අනුත්තර සම්බෝධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙති. රජකුමරුවෙනි, මට පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූවිරූ මෙ පළමු උපමා වැටහිණ.

රජකුමරුවෙනි, මට නැවත නැවත ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූවිරූ අනෙක් දෙවන උපමායෙක් ද වැටහිණ. රජකුමරුවෙනි, යම් පරිදි දියෙන් බැහැර වැ සිටි ගොඩබිමෙහි ලූ ස්නේහ සහිත තෙත් කාෂ්ටයෙක් ඇද්ද, ඉක්බිති පුරුෂයෙක් උතුරු රිණී ගෙන ගිනි නිපදවම්'යි තෙද පහළ කෙරෙම්'යි එන්නේ වේ ද, රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ ස්නේහ සහිත, දියෙන් බැහැර වැ සිටි, ගොඩබිමැ ලූ තෙල තෙත් කාෂ්ටය උතුරු රිණී ගෙන අළලන්නේ කිම ගිනි උපදවන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ දැ'යි. වහන්ස, මෙ කරුණ නො වනපුලු යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, තෙලෙ දියෙන් බැහැර වැ සිටියේ නමුදු ගොඩබිමෙහි ලූයේ නමුදු සස්නේහ වූ තෙත් කාෂ්ටයෙකි. ඒ පුරුෂ ක්ලමථුවට වෙහෙසට හිමි වන්නේ මැ යැ. රජකුමරුවෙනි, එ පරිදි මැ යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි. බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි කාමයෙන් කයින් වෙන් වූවාහු වෙසෙත් ද, ඔවුන් ගේ කාමයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡා-යෙක් කාමපිපාසායෙක් කාමපරිදහයෙක් ඇද්ද, එ ද සිය සතන්හි සුප්‍රහීණ නො වේ ද, සන්හුන් නො වේ ද, ඒ භවත් මහණබමුණෝ තීව්‍ර බර කටුක ඖපක්‍රමික වූ ත් දුඃඛවේදනා-වන් විඳිති. ඔහු අනුත්තර සම්බෝධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙති. ඉදින් ඒ භවත් මහණබමුණුහු තීව්‍ර බර කටුක ඖපක්‍රමික දුඃඛවේදනා නො විඳිනාහු නමුදු ඔහු අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙති. රජකුමරුවෙනි, මට නැවත නැවත ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූ විරූ මේ දෙවන උපමා ද වැටහිණ.

රජකුමරුවෙනි, මට නැවත නැවත ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූ විරූ අනෙක් තුන් වන උපමායෙක් ද වැටහිණ. රජකුමරුවෙනි, යම් පරිදි කොලොපු වූ දියෙන් බැහැර වැ සිටි ගොඩබිමෙහි ලූ වියළි කාෂ්ටයෙක් ඇද්ද, ඉක්බිති පුරුෂයෙක් උතුරු රිණී ගෙන ගිනි උපද-වම්' තෙද පහළ කෙරෙම්' එන්නේ වේ ද, රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂයා කොලොපු වූ දියෙන් බැහැර වැ සිටි ගොඩබිමෙහි ලූ තෙල ශුෂ්කකාෂ්ටය උතුරු රිණී ගෙන මඩනුයේ කිම ගිනි උපදවන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ දැ? යි. වහන්ස, එසේ යැ. ඒ කවර හෙයින යත්; වහන්ස, තෙල ශුෂ්කකාෂ්ටය කොලොපු වෙයි, එ ද දියෙන් බැහැර වැ සිටියේ වෙයි, ගොඩබිමෙහි ලූයේ වෙයි, රජකුමරුවෙනි, එපරිදි මැ යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි, බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි' කයිනුදු සිතිනුදු කාමයෙන් වෙන් වැ වෙසෙත් ද, ඔවුන් ගේ යම් කාමයෙහි කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාම පිපාසායෙක් කාමපරිදහයෙක් ඇද්ද, එ ද සිය සතන්හි සුප්‍රහීණ වූයේ වේ ද, සන්හුන් වේ ද, ඉදින් ඒ භවත් මහබමුණෝ තීව්‍ර බර කටුක ඖපක්‍රමික දුඃඛ වේදනා විඳිනාහු නමුදු ඔහු අනුත්තර සම්බෝධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට භව්‍ය මැ වෙති, ඉදින් ඒ භවත් මහණබමුණෝ තීව්‍ර බර කටුක ඖපක්‍රමික දුඃඛවේදනාවන් නො විඳිනාහු නමුදු ඔහු අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට භව්‍ය මැ වෙති. රජකුමරුවෙනි, මට පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූවිරූ මෙ තුන්වන උපමා වැටහිණ. රජකුමරු-වෙනි, මට පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූවිරූ මෙ තුන් උපමාවෝ වැටහුණහ'යි.

තස්ස මය්හං රාජකුමාර එතදහොසි: "යන්නූනාහං දන්තෙහි දන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හෙය්‍යං අභිනිප්පීළෙය්‍යං අභිසන්තාපෙය්‍ය"න්ති. සො ඛො අහං රාජකුමාර, දන්තෙහිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හාමි අභිනිප්පීළෙමි අභිසන්තාපෙමි. තස්ස මය්හං රාජකුමාර, දන්තෙහිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. සෙය්‍යථා'පි රාජකුමාර, බලවා පුරිසො දුබ්බලතරං පුරිසං සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා අභිනිග්ගණ්හෙය්‍ය අභිනිප්පීළෙය්‍ය අභිසන්තාපෙය්‍ය, එවමෙව ඛො මෙ රජකුමාර, දන්තෙහිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හයතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. ආරද්ධං ඛො පන මෙ රජකුමාර, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා[1], සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "යන්නූනාහං අප්පාණකං ඣානං[2] ඣායෙය්‍ය"න්ති, යො ඛො අහං රජකුමාර, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං, තස්ස මය්හං රාජකුමාර, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. සෙය්‍යථා'පි නාම කම්මාරගග්ගරියා ධම්මානාය අධිමත්තො සද්දො හොති එවමෙව ඛො, රාජකුමාර, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. ආරද්ධං ඛො පන මෙ රාජකුමාර, විරියං හොති අසල්ලීනං උපට්ඨිතා සති අපම්මුට්ඨා සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍ය"න්ති. සො ඛො අහං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධානං[3] ඌහනන්ති[4] සෙය්‍යථා'පි රාජකුමාර, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධානං[3] අභිමත්ථෙය්‍ය, එවමෙව ඛො මෙ රාජකුමාර මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධානං ඌහනන්ති. ආරද්ධං ඛො පන මෙ රාජකුමාර විරියං හොති අසල්ලීනං උපට්ඨිතා සති අපම්මුට්ඨා සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙ'ව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

---

1. අසම්මුට්ඨා - මජසං, අප්පම්මුට්ඨා - ස්‍යා.
2. අප්පාණංයෙව ඣානං - මජසං.
3. මුද්ධනි - මජසං.
4. ඔහනන්ති - ස්‍යා.

Free Distribution www.aathaapi.org

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : ''යටිදත්හි උඩුදත තබා දිවින් තල්ල පැහැර (කුසල්සිතින්) අකුසල්සිත නිගන්නෙම් පෙළෙන්නෙම් තවන්නෙම් නම් මැනැවැ''යි. රජකුමරුවෙනි, මම යටිදතෙහි උඩුදත තබා දිවින් තලු පැහැරගෙන සිතින් සිත නිගන්මි, පෙළමි, තපොවීර්‍ය්‍ය කෙරෙමි. රජකුමරුවෙනි, යටිදතෙහි උඩුදත තබා දිවින් තලු පැහැර ගෙන සිතින් සිත නිගන්නා පෙළන තපොවීර්‍ය්‍ය කරන මා ගේ කච්ඡයෙන් සේවදයෝ මිදෙත්. රජකුමරුවෙනි, බලවත් පුරුෂයෙක් ඉතා දුබල පුරුෂයකු හිසෙහි වේවයි ස්කන්ධයෙහි වේවයි ගෙන නිගන්නේ වේ ද, පෙළන්නේ වේ ද, තාප කරන්නේ වේ ද, රජකුමරුවෙනි, එපරිදි මැ යට දතෙහි උඩුදත තබා දිවින් තලු පැහැරගෙන සිතින් සිත නිගන්නා පෙළන තවන මා ගේ කැසින් සේවදයෝ මිදෙත්, රජකුමරුවෙනි, මා විසින් වැර රැකුළේ වෙයි, සංලීන නො වෙයි, සිහි එළවියා වෙයි, මුෂිත නො වෙයි. ඒ දුක්සහගිය ප්‍රධනින් මැ ප්‍රධන් වැරින් විත් කැවාවූ මැ මා ගේ කය දරථ සහිත වෙයි, නො සන්හුන් වෙයි.

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : ''මම් අප්‍රාණක (නිරාශ්වාස) ධ්‍යාන කරනෙම් නම් මැනැවැ''යි. රජකුමරුවෙනි, ඒ මම් මුවිනුදු නැහැයෙනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළහිමි. රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු අසස්පසස් වැළහු කල්හි මා ගේ කන්සිළින් නික්මෙන වායුහුගේ අධිමාත්‍ර ශබ්දය වෙයි. යම්සේ නම් කඹුරුසම පුඹුනා කල්හි අධිමාත්‍ර ශබ්දයෙක් වේ ද, එසෙයින් මැ රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු ආශ්වාසප්‍රශ්වාස වැළහු කල්හි කන්සිදුින් නික්මෙන වායුහුගේ අධිමාත්‍ර ශබ්දය වෙයි. රජකුමරුවෙනි, මා විසින් වැර රැකුළේ සංලීන නො වෙයි, සිහි එළඹ සිටියා මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන්වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේ ත් නො සන්හුන්නේ ත් වෙයි.

රජකුමරුවෙනි, ''මට මෙසේ සිත් වී : ''මම නිරස්සාසක වූ මැ ධ්‍යානය වඩම් නම් මන මැ නු''යි. රජකුමරුවෙනි, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළකිමි රජකුමරුවෙනි, මට මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළහු කල අධිමාත්‍ර වාතයෝ මුදුන පෙළත්. රජකුමරුවෙනි යම් පරිදි බලවත් පුරුෂයෙක් තියුණු කඩුසිළෙකින් මුදුන පෙළන්නේ ද, එපරිදි මැ රජකුමරුවෙනි, මා ගේ මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළහු කල්හි අධිමාත්‍ර වාතයෝ මුදුන පෙළත්. රජකුමරුවනි, මා විසින් වැර රැකුළේ අසංලීන වෙයි. සිහි එළැඹ සිටියා මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේ ත් වෙයි.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවේදනා හොන්ති. සෙය්‍යථා'පි රාජකුමාර, බලවා පුරිසො දළ්හෙන වරත්තක්ඛන්ධෙන[1] සීසෙ සීසවෙඨං දදෙය්‍ය, එවමෙව ඛො රාජකුමාර මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවේදනා හොන්ති. ආරද්ධං ඛො පන මේ රාජකුමාර විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මේ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙ'ව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. සෙය්‍යථා'පි රාජකුමාර, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. ආරද්ධං ඛො පන මෙ රාජකුමාර, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්ති. සො ඛො අහං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං රාජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති. සෙය්‍යථා'පි රාජකුමාර, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානා බාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං, සම්පරිතාපෙය්‍යුං. එවමෙව ඛො මෙ රජකුමාර, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති. ආරද්ධං ඛො පන මෙ රජකුමාර විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙ'ව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

අපිස්සු මං රජකුමාර, දෙවතා දිස්වා එවමාහංසු: "කාලකතො[2] සමණො ගොතමො"ති එකච්චා දෙවතා එවමාහංසු: "න කාලකතො[2] සමණො ගොතමො අපිච කාලංකරොතී"ති. එකච්චා දෙවතා එවමාහංසු: "න කාලකතො[2] සමණො ගොතමො න'පි කාලං කරොති, අරහං සමණො ගොතමො, විහාරො'ත්වෙවෙසො[3] අරහතො එවරූපො හොතී'ති.

1. වරත්තක්ඛණ්ඩෙන - මජ්ඣං. වරත්තක්ඛන්ධෙන - ස්‍යා.
2. කාලංකතො - මජ්ඣං.
3. විහාරො'ත්වෙවසො - මජ්ඣං, ස්‍යා.

රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''මම අප්‍රාණක වූ මැ ධ්‍යාන වඩනෙම් නම් මනා මැ නු''යි. රජකුමරුවෙනි, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාසප්‍රශ්වාස වැළකීමි. රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළහූ කල්හි මා ගේ ශීර්ෂයෙහි අධිමාත්‍ර ශීර්ෂවේදනාවෝ වෙති. රජකුමරුවෙනි, යම්සේ බලවත් පුරුෂයෙක් දැඩි වූ වරබහනින් හිසෙහි හිස්වෙළුම් බඳනේ ද, එසෙයින් මැ රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළහූ කල්හි ශීර්ෂයෙහි අධිමාත්‍ර ශීර්ෂවේදනාවෝ වෙති. රජකුමරුවෙනි, මා විසින් රුකුළු වැර සංලීන නො වෙයි. සිහි එළැඹ සිටියා මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේ ත් නො සන්හුන්නේ ත් වෙයි.

රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''මම අප්‍රාණක වූ මැ දුහැන වඩනෙම් නම් මනා මැ නු''යි. රජකුමරුවෙනි, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළකීමි. රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාසප්‍රශ්වාස වැළහූ කල්හි මා ගේ කුස අධිමාත්‍ර වාතයෝ සිඳිත්. රජකුමරුවෙනි, යම්සේ දක්ෂ ගොඝාතකයෙක් හෝ ගොඝාතක අතැවැසියෙක් හෝ තිහිණි වූ ගෙරිකපන කැත්තෙකින් කුස කපන්නේ ද, එසෙයින් මැ රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාසප්‍රශ්වාස වැළකූ කල්හි අධිමාත්‍ර වාතයෝ කුස කපත්, එතෙකුදු වත් රජකුමරුවෙනි, මා විසින් වැර රුකුළේ සංලීන නො වෙයි. සිහි එළඹ සිටියා මුෂිත නො වෙයි, එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේ ත් නො සන්හුන්නේත් වෙයි.

රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''මම අප්‍රාණක වූ මැ ධ්‍යාන වඩනෙම් නම් මනා මැ නු''යි. රජකුමරුවෙනි, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළකීමි. රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළහූ කල්හි මා ගේ කයෙහි අධිමාත්‍ර දහය වෙයි. රජකුමරුවෙනි, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුබුල් මිනිසක්හු වෙන් වෙන් අත්හි ගෙන අඟුරු වළෙක තවන්නාහු ද මොනොවට තවන්නාහු ද, එසෙයින් මැ රජකුමරුවෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාසප්‍රශ්වාස වැළහූ කල්හි මා ගේ කයෙහි අධිමාත්‍ර දහය වෙයි. එතෙකුදු වත් රජකුමරුවෙනි, මා විසින් ආරබ්ධවීර්‍ය්‍යය සංලීන නො වෙයි. එළැඹ සිටි සිහි මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේ ත් නො සන්හුන්නේ ත් වෙයි.

තවද රජකුමරුවෙනි, දේවතාවෝ දැක මට මෙසේ කීහ : ''ශ්‍රමණ ගෞතම කලුරිය කළහ''යි. සමහර දේවතාවෝ මෙසේ කීහ : ''ශ්‍රමණ ගෞතමයෝ කලුරිය නො කළහ, එතෙකුදු වත් කලුරිය කෙරෙති''යි. සමහර දේවතාවෝ මෙසේ කීහ : ''ශ්‍රමණ ගෞතමයෝ කලුරිය නො කළහ, නො ද කලුරිය කෙරෙති, ශ්‍රමණ ගෞතමයෝ රහත්හ, රහතුන්ට තෙල මෙබඳු විහාර ඇත්තේ මැ වේ''යයි.

තස්ස මය්හං රජකුමාර, එතදහොසි: "යන්නූනාහං සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජෙය්‍ය"න්ති. අථ ඛො මං රජකුමාර, දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං: "මා ඛො ත්වං මාරිස සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජි, සචෙ ඛො ත්වං මාරිස සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජිස්සසි, තස්ස තෙ මයං දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහරිස්සාම[1] තාය ත්වං යාපෙස්සසී"ති තස්ස මය්හං රජකුමාර, එතදහොසි: "අහඤ්චෙව ඛො පන සබ්බසො අජද්ධුකං[2] පටිජානෙය්‍යං ඉමා ච මෙ දෙවතා දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහරෙය්‍යුං[3] තාය චාහං යාපෙය්‍යං, තං මමාස්ස මුසා"ති. සො ඛො අහං රජකුමාර, තා දෙවතා පච්චාචික්ඛාමි හලන්ති වදමි.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "යන්නූනාහං ථොකං ථොකං ආහාරං ආහාරෙය්‍යං පසතං පසතං, යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං, යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසන්ති. සො ඛො අහං රාජකුමාර ථොකං ථොකං ආහාරං ආහාරෙසිං පසතං පසතං, යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසං. තස්ස මය්හං රාජකුමාර, ථොකං ථොකං ආහාරං ආහාරයතො පසතං පසතං, යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කළායයූසං යදි වා හරෙණුකයූසං, අධිමත්තකසිමානං පත්තො කායො හොති සෙය්‍යථා'පි නාම ආසීතිකපබ්බානි වා කාළපබ්බානි වා. එවමෙවස්සු මෙ අඞ්ගපච්චඞ්ගානි භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථා'පි නාම ඔට්ඨපදං එවමෙවස්සු මෙ ආනිසදං හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථා'පි නාම වට්ටනාවලී එවමෙවස්සු මෙ පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථා'පි නාම ජරසාලාය ගොපානසියො ඔලුග්ගවිලුග්ගා භවන්ති එවමෙවස්සු මෙ ඵාසුලියො ඔලුග්ගවිලුග්ගා භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථා'පි නාම ගම්භීරෙ උදපානෙ උදකතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති, එවමෙවස්සු මෙ අක්ඛිකූපෙසු අක්ඛිතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථා'පි නාම තිත්තකාලාබු ආමකච්ඡින්නො වාතාතපෙන සම්ඵුටිතො හොති සම්මිලාතො එවමෙවස්සු මෙ සීසච්ඡවි සම්ඵුටිතා හොති සම්මිලාතා තායෙවප්පහාරතාය. සො ඛො අහං රාජකුමාර, 'උදරච්ඡවිං පරාමසිස්සා'මීති පිට්ඨිකණ්ටකං යෙව පරිගණ්හාමි. පිට්ඨිකණ්ටකං පරාමසිස්සාමී'ති උදරච්ඡවිංයෙව පරිගණ්හාමි. යාවස්සු මෙ රාජකුමාර, උදරච්ඡවි පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති තායෙවප්පාහාරතාය. සො ඛො අහං රාජකුමාර, 'වච්චං වා මුත්තං වා කරිස්සාමී'ති, තත්ථෙ'ව අවකුජ්ජො පපතාමි තායෙවප්පාහාරතාය. සො ඛො අහං රාජකුමාර, ඉමමෙව කායං අස්සාසෙන්තො පාණිනා ගත්තානි අනුමජ්ජාමි. තස්ස මය්හං රාජකුමාර, පාණිනා ගත්තානි අනුමජ්ජතො පූතිමූලානි ලොමානි කායස්මා පපතන්ති තායෙවප්පාහාරතාය. අපිස්සු මං රාජකුමාර, මනුස්සා දිස්වා එවමාහංසු: 'කාළො සමණො ගොතමො'ති. එකච්චෙ මනුස්සා එවමාහංසු: 'න කාළො සමණො ගොතමො සාමො සමණො ගොතමො'ති. එකච්චෙ මනුස්සා එවමාහංසු: "න කාළො සමණො ගොතමො න'පි සාමො, මඞ්ගුරච්ඡවි සමණො ගොතමො'ති. යාවස්සු මෙ රාජකුමාර, තාව පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො, උපහතො හොති තායෙවප්පාහාරතාය.

---

1. අජ්ඣොහාරෙස්සාම - මජසං.
2. අජජ්ජිතං - මජසං
3. අජ්ඣොහාරෙය්‍යං - මජසං.

Free Distribution www.aathaapi.org

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : "මම සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට පිළිපදනෙම් (බස්නෙම්) නම් මනා මැ නු"යි. එකල්හි රජකුමරුවෙනි, දෙවියෝ මා කරා අවුත් මෙසේ බස් කීහ : "නිදුකාණෙනි, තෙපි සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට නහමක් පිළිපදුව, ඉදින් නිදුකාණෙනි, තෙපි සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට බස්නාහු නම් ඇපි තොපගේ රෝමකූපයෙන් දිව්‍යඔජස් ඇතුළු කරම්හ, එයින් තෙපි යැපෙන්නාහු යැ"යි. රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : "මම වනාහි සර්වප්‍රකාරයෙන් නො වැළඳීම පිළින කරන්නෙමි, මෙ දෙවියෝ ත් මා ගේ රොමකූපයෙන් දිව්‍ය ඔජස් බහාලන්නාහ, එයිනුදු මම් යැපෙම් නම් ඒ මා ගේ මෘෂා වේ"ය යි. රජකුමරුවෙනි, මම් ඒ දෙවියන් ප්‍රතික්ෂේප කෙරෙමි, 'කම් නැතැ'යි කියමි.

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී : "මම මුංයූෂ වේවයි කොල්ලුයූෂ වේවයි කඩල යූෂ වේවයි මැයූෂ වේවයි පතක් පතක් පමණ වූ ටික ටික අහර ගන්නෙම් නම් මනා මැ නු"යි. රජකුමරුවෙනි, ඒ මම මුං යූෂ වේවයි කොල්ලු යූෂ වේවයි කඩල යූෂ වේවයි මැයූෂ වේවයි පතක් පතක් පමණ වූ ටික ටික අහර ගතිමි. රජකුමරුවෙනි, මුංයූෂ වේවයි කොල්ලු යූෂ වේවයි කඩල යූෂ වේවයි මැ යූෂ වේවයි පතක් පතක් පමණ වූ ටික ටික අහර ගන්නා මා ගේ කය අධිමාත්‍ර කෘශත්වයට පැමිණියේ වෙයි. ආසීතික වැල් පුරුක් හෝ කළුවැල් පුරුක් යම්සේ ද එ මැ අල්පාහාරතායෙන් මා ගේ අඞ්ගප්‍රත්‍යඞ්-ගයෝ එබඳු වෙති. ඔටුපිය යම්සේ ද, එ මැ අල්පාහාරතායෙන් මා ගේ නිසීදනමාංසය එබඳු වෙයි. කුරුඳුවැළ යම්සේ (උස්මිටි) වේ ද, එ මැ අල්පාහාරතායෙන් මා ගේ පිටකටුව (වංශාස්ථිය) එසෙයින් මැ උස්මිටි වෙයි. යම්සේ නම් දිරාගිය ශාලායෙකැ ගොනැස්හු එලුණාහු ඇත මැත එලුණාහු වෙත් ද ,එසෙයින් මැ එ මැ අල්පාහාරතායෙන් මා ගේ ඉළඇට එලුණාහු ඇත මැත එලුණාහු වෙත්. යම්සේ නම් ගැඹුරු දියවළෙකැ දියතරු ගැඹුරට ගියාහු යටට පිවිසියාහු දක්නා ලැබෙත් ද, එසෙයින් මැ එ මැ අල්පාහාර-තායෙන් මා ගේ අක්ෂිකූපයන්හි ඇස්තරු ගැඹුරට ගියාහු යටට පිවිසියාහු දක්නා ලැබෙත්. යම්සේ නම් තිත්තලබුපලයක් තරුණ කල්හි සිඳුනා ලද්දේ වා-අවුයෙන් මලාන වැ හැකුළුණේ වේ ද, එසෙයින් මැ එ මැ අල්පාහාරතායෙන් මා ගේ හිසසිවි මලාන වැ හැකුළුණේ වෙයි. රජකුමරුවෙනි, ඒ මම "කුසැසිවි පරාමශී කෙරෙමි"යි පිටකටුව මැ (උදරසිවි හා සමග) ගනිමි. 'පිටකටුව පිරිමසමි"යි උදරසිවි මැ (පිටකටුව හා සමග) ගනිමි. රජකුමරුවෙනි, එ මැ අල්පාහාරතායෙන් මැ මා ගේ උදරසිවි පිටකටුව තාක් ඇලුණේ වෙයි. රජකුමරුවෙනි, මම එ මැ අල්පාහාරතායෙන් මල කිස හෝ මූ කිස හෝ කෙරෙමි'යි එහි මැ මුහුණින් වැටෙමි. රජකුමරුවෙනි, මම මෙ මැ කය අස්වසමින් අත්ලෙන් සිරුරු අවයව පිරිමදිමි. රජකුමරුවෙනි, එ මැ අල්පාහාරතායෙන් අතින් ගාත්‍රයන් පිරිමදිනා මාගේ කයින් කුණු වූ මුල් ඇති ලෝමයෝ ගිලිහෙති. තවද රජකුමරු-වෙනි, මිනිස්සු මා දක මෙසේ කීහ : "ශ්‍රමණ ගෞතම කළුපැහැ ඇතියහ"යි. ඇතැම් මිනිස්සු මෙසේ කීහ : 'ශ්‍රමණගෞතමයෝ කළුපැහැ නො වෙති. ශ්‍රමණ ගෞතම සම්වන්හ"යි. සමහර මිනිස්සු මෙසේ කීහ : "ශ්‍රමණ ගෞතමයෝ කළුපැහැ නො වෙති, නො ද සම්වන්හ, ශ්‍රමණ ගෞතම මඟුරුපැහැ ඇතියහ"යි. රජකුමරුවෙනි, මා ගේ පරිශුද්ධ වූ පර්‍යවදාත වූ සිවිපැහැ එ මැ අල්පාහාරතායෙන් එතෙක් නටුයේ වෙයි.

33—සෙ 13561 (11/72)

තස්ස මය්හං රාජකුමාර එතදහොසි: "යෙ ඛො කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා[1] කටුකා වෙදනා වෙදියිංසු, එතාවපරමං නයිතො භිය්‍යො. යෙ'පි හි කෙචි අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිස්සන්ති, එතාවපරමං නයිතො භිය්‍යො. යෙ'පි හි කෙචි එතරහි සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, එතාව පරමං නයිතො භිය්‍යො. න ඛො පනා'හං ඉමාය කටුකාය දුක්කරකාරිකාය අධිගච්ඡාමි උත්තරිමනුස්ස-ධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. සියා නු ඛො අඤ්ඤො මග්ගො බොධායා'ති?

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "අභිජානාමි, ඛො පනා'හං පිතු සක්කස්ස කම්මන්තෙ සීතාය ජම්බුච්ඡායාය නිසින්නො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතා. සියා නු ඛො එසො මග්ගො බොධායා'ති? තස්ස මය්හං රජකුමාර, සතානුසාරී විඤ්ඤාණං අහොසි: "එසො'ව මග්ගො බොධායා"ති. තස්ස මය්හං රජකුමාර, එතදහොසි: "කින්නු ඛො අහං තස්ස සුඛස්ස භායාමි, යං තං සුඛං අඤ්ඤත්‍රෙ'ව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහී"ති. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "න ඛො අහං තස්ස සුඛස්ස භායාමි, යං තං සුඛං අඤ්ඤත්‍රෙ'ව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහී"ති.

තස්ස මය්හං රජකුමාර, එතදහොසි: "න ඛො තං සුකරං සුඛං අධිගන්තුං එවං අධිමත්තකසිමානං පත්තකායෙන. යන්නූනාහං ඔළාරිකං ආහාරං ආහාරෙය්‍යං ඔදනකුම්මාසන්ති. යො ඛො අහං රාජකුමාර, ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං තෙන ඛො පන මං රජකුමාර, සමයෙන පඤ්චවග්ගියා භික්ඛූ පච්චුපට්ඨිතා හොන්ති: "යං ඛො සමණො ගොතමො ධම්මං අධිගමිස්සති තං නො ආරොචෙස්සතී"ති. යතො ඛො අහං රාජකුමාර, ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං. අථ මෙ තෙ පඤ්චවග්ගියා භික්ඛූ නිබ්බිජ්ජ පක්කමිංසු "බාහුලිකො[2] සමණො ගොතමො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලායා"ති.

සො ඛො අහං රජකුමාර, ඔළාරිකං ආහාරං ආහාරෙත්වා බලං ගහෙත්වා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි, සෙය්‍යථීදං[3] එකම්පි ජාතිං, ද්වෙ'පි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ රජකුමාර, රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

1. තිබ්බා - මජසං. 2. බාහුල්ලිකො - මජසං, ස්‍යා.
3. සෙය්‍යථීදං - මජසං.

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී: "අතීතකාලයෙහි යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවේදනා විඳින්නාහු නම්, (ඒ වේදනාව) මේ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. අනාගත කාලයෙහිදු යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවේදනා විඳින්නාහු නම්, මෙ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. මේ කල්හිදු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවේදනා විඳිත් නම් මේ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. මම වැළිත් මේ කටුක වූ දුෂ්කර ක්‍රියායෙන් මනුෂ්‍ය ධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවයට සමර්ථ ඥානදර්ශනවිශෙෂයක් නො ලබමි. සම්බෝධියට අනෙක් මාර්ගයෙක් ඇද්දැ'යි.

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී: "මම පියාණන් වූ ශාක්‍යයන්ගේ කමත්හි සිහිල් දඹසෙවණෙහි හුන්නෙම් කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාස කෙළෙම් දනිම් මැ යැ, මෙලෙ සම්බෝධියට මාර්ග වන්නේ දැ? යි. රජකුමරුවෙනි, මට සත්‍යානුසාරි (සිහිය අනුව යන) විඥානය පහළ විය: මෙලෙ මැ සම්බොධයට මාර්ග වේ යැ"යි. රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී: "කිමෙක් ද මම කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ යම් සුඛයෙක් වේ නම් ඒ සුඛයට බිය වෙම්දැ"යි. රජකුමරුවෙනි, ඒ මට මෙසේ සිත් වී: "කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ යම් සුඛයෙක් වේ නම් මම ඒ සුඛයට බිය නො වෙම් මැ"යි.

රජකුමරුවෙනි, මට මෙසේ සිත් වී: "මෙසේ අධිමාත්‍ර කෘශභාවයට ගිය කයින් ඒ සුඛය ලබන්නට සුකර නො වෙයි. මම ඕදනකුල්මාෂ සඞ්ඛ්‍යාත ඖළාරික අහර වළඳන්නෙම් නම් මනා මැ නු"යි. රජකුමරුවෙනි, මම භක්තකුල්මාෂ සඞ්ඛ්‍යාත ඖළාරික අහර වැළඳුයෙමි. රජකුමරුවෙනි, එසමයෙහි පස්වග මහණහු 'මහණ ගොයුම්හු යම් දහමක් අධිගම කෙරෙත් ද එ දහම් අපට පවසති'යි මට උවටැන් කළාහු වෙති. රජකුමරුවෙනි, යම් දිනෙකැ මම භක්තකුල්මාෂ සඞ්ඛ්‍යාත ඖළාරික අහර වැළඳුයෙම් ද එකල ඒ පස්වග මහණහු මට කලකිරී නික්ම ගියහ. "මහණ ගොයුම්හු බාහුලිකයහ; ප්‍රධනින් ගිළිහුණහ, ප්‍රත්‍යයබාහුල්‍යයට වැටුණහ"යි කියා යි.

රජකුමරුවෙනි, මම ඖළාරික අහර වළඳා කායබලය ගෙන කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යාන උපයා විසීමි. විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් . . . . ද්විතීයධ්‍යානය . . . තෘතීයධ්‍යානය . . . චතුර්ථධ්‍යානය උපයා ගෙන විසීමි. මම මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ වැ පර්‍ය්‍යවදත වැ අනඞ්ගණ වැ විගතෝපක්ලේශ වැ මෘදුභූත වැ කර්මණ්‍ය වැ ස්ථිත වැ නිශ්චලප්‍රාප්ත වැ සිටි කල්හි ඒ සිත පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස නතු කෙළෙමි. මම අනෙකවිධ පූර්වේනිවාසය සිහි කරමි. ඒ කෙසේ යැ යත්: එක් ජාතියකුදු දෙජාතියකුදු . . . මෙසේ සාකාර සොද්දෙශ අනෙකප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරෙමි. රජකුමරුවෙනි, මා විසින් රය පළමු යමහි මේ පළමු විද්‍යාව අධිගත යැ, අවිද්‍යා විහත විය විද්‍යා උපන, තමස විහත විය, ආලොකය උපන, අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ කායජීවිත නිරපෙක්ෂක වැ වසන්නක්හට යමසේ වේ ද එසෙයිනි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි, චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි. -පෙ- අයං බො මෙ රාජකුමාර, රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං සො 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං අබ්භඤ්ඤාසිං. -පෙ- 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං. 'ඉමෙ ආසවා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං -පෙ- 'අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චිත්ථ, භවාසවා'පි චිත්තං විමුච්චිත්ථ, අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසිං. අයං බො මෙ රාජකුමාර, රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "අධිගතො බො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො, ආලයරාමා බො පනා'යං පජා ආලයරතා ආලයසම්මුදිතා, ආලයරාමාය බො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො, ඉදම්පි බො ඨානං දුද්දසං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අහඤ්චෙව'ච බො පන ධම්මං දෙසෙය්‍යං පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසා"ති. අපිස්සු මං රාජකුමාර, ඉමා අනච්ඡරියා ගාථා[1] පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා.

"කිච්ඡෙන මෙ අධිගතං හලං දානි පකාසිතුං
රාගදොසපරෙතෙහි නා'යං ධම්මො සුසම්බුධො
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති[2] තමොක්ඛන්ධෙන ආවටා[3]" ති

ඉතිහ මෙ රාජකුමාර, පටිසංචික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය.

1. ගාථායො - මජසං.
2. දක්ඛන්ති - මජසං, ස්‍යා.
3. තමොඛන්ධෙන ආවුටා - මජසං, තමොක්ඛන්ධෙන ආවුතා - ස්‍යා.

මම මෙසේ පරිශුද්ධ, පර්‍ය්‍යවදාත, අනඞ්ගණ, විගතෝපක්ලේශ, මෘදුභූත, කර්‍මක්‍ෂම, ස්ථිත නිශ්චලප්‍රාප්ත සමාධිගත චිත්තය ඇති වත් මැ එ සිත සත්ත්වයන් ගේ ච්‍යුතුපපාත ඤාණය පිණිස නතු කෙළෙමි. මම පිරිසුදු වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්‍ණ දුර්වර්‍ණ සුගත දුර්ගත සත්ත්වයන් දක්මි. කම් වූ පරිදි ගිය සතුන් දත්මි . . . රජකුමරුවෙනි, මා විසින් රෑය මැදුම් යමැ මේ දෙවන විද්‍යා අධිගත විය, අවිද්‍යා විහත විය, විද්‍යා උපන, තමස විහත විය, ආලොකය උපන. අප්‍රමත්ත වැ ආතාපන වීර්‍ය්‍ය ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වාස කරන යොගාවචරයක්හට යම්සේ වේ ද එසෙයිනි.

මෙසේ මම සමාධිගත සිත පිරිසුදු වැ ප්‍රභාස්වර වැ නිරඞ්ගණ වැ පහ වූ උපක්ලේශ ඇති වැ මොළොක් වැ කර්මාර්හ වැ ස්ථිත වැ නිසල බවට පැමිණ සිටි කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත නතු කෙළෙමි. මම 'මෙ දුක යැ'යි යථාභූතය දත්මි . . . 'මේ දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපත් යැ'යි යථාභූතය දත්මි. 'මොහු ආස්‍රවයහ'යි යථාභූතය දත්මි . . . 'මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපත් යැ'යි යථාභූතය දත්මි. මෙසේ දන්නා මෙසේ දක්නා මා ගේ සිත කාමාස්‍රවයෙනුදු මිදිණි. සිත භවාස්‍රවයෙනුදු මිදිණ. සිත අවිද්‍යාස්‍රවයෙනුදු මිදිණි. මිදුත් මැ 'මිදිණැ'යි නුවණ විය. ජාති ක්‍ෂීණ විය. බඹසරවස් වැසිණ, කරණී කරන ලදි. මේ රහත් බවට කටයුතු අන් කිසෙක් නැතැ'යි දනිමි. රජකුමරුවෙනි, මා විසින් රෑය පැසුළු යමැ මේ තෙවන විද්‍යා අධිගත වූ යැ. අවිද්‍යා විහත වූ යැ, විද්‍යා උපන, තමස විහත වී, ආලොකය උපන. නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වාස කරන යොගාවචරයක්හට යමසේ වේ ද එසෙයිනි.

රජකුමරුවෙනි, මට මෙල සිත් වී : "මා විසින් ගැඹුරු වූ එයින් මැ දුර්දර්‍ශ වූ දුකින් අවබොධ කළයුතු වූ ශාන්ත වූ ප්‍රණීත වූ තර්කාවචර නො වූ සියුම් වූ පණ්ඩිතයන් විසින් දතයුතු වූ මේ චතුස්සත්‍ය ධර්‍මය අවබෝධ කරන ලදි. මේ සත්ත්වාඛ්‍ය ප්‍රජාව (අෂ්ටශත තෘෂ්ණාවිචරිත සඞ්ඛ්‍යාත) ආලයෙන් රමණය කෙරෙති, ආලයෙහි ඇලුණහ, ආලයෙහි ප්‍රමුදිතයහ. ආලයෙන් රමණය කරන ආලයෙහි ඇලුණු ආලයෙහි ප්‍රමුදිත ප්‍රජාව විසින් මෙ කරුණ නො දක්ක හැකි යැ : යම් ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පාදයෙක් ඇද්ද එය යි. මෙල කරුණ ද නො දක්ක හැකි යැ : යම් සර්‍වසංස්කාරයන් සංහිඳුවන සියලු උපධි නෙරන සියලු තෘෂ්ණා ක්ෂය කරන සියලු ක්ලේශරාගයෙන් මිදී සිටින හැම දුක් නිරුද්ධ කරන සැහැවි ඇති නිවනෙක් ඇද්ද එය යි. මම ද දහම් දෙසම් නම් පරහු එ දහම් නො දන ගන්නාහු නම් ඒ මට කාය ක්ලමථු වෙයි. ඒ මට වෙහෙසෙක් වේ ? යැ කියා යි. තවද රජකුමරුවෙනි, මට පුනපුනා අසිරියට කරුණු වූ පෙර නො ඇසූවිරූ මේ ගාථාවෝ වැටහුණහ :

"මා විසින් දුකසේ අධිගත චතුස්සත්‍ය ධර්‍මය දන් පවසනුවට කම් නැත. රාගද්වේෂ දෙකින් පහළවුන් විසින් මේ සිවසස් දහම් මොනොවට අවබොධ නො කළ හැක්ක. නිත්‍යාදීන්ට පිළිලොම් මහ යන සියුම් ගැඹුරු නො දක්ක හෙන අණුතර වූ මෙ දහම මොහඳුරුකඳින් ආවෘත වූ කාමරාගාදීන් රක්ත ජනයෝ නො දක්නාහ"යි.

රජකුමරුවෙනි, මෙසේ සලකන මා ගේ සිත නිරීහ බවට නැමෙයි, දහම් දෙසනුවට නො නැමෙයි.

අථ ඛො රාජකුමාර, බ්‍රහ්මුනො සහම්පතිස්ස මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය එතදහොසි. "නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකො, යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනායා"ති. අථ ඛො රාජකුමාර, බ්‍රහ්මා සහම්පති සෙය්‍යථා'පි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[1] වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය[2], එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො රාජකුමාර, බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙනා'හං තෙනඤ්ජලිං පණාමෙත්වා මං එතදවොච: දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො"ති. ඉදමවොච රාජකුමාර, බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා අථාපරං එතදවොච:

"පාතුරහොසි මගධෙසු පුබ්බෙ ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො
අවාපුරෙතං[3] අමතස්ස ද්වාරං සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධං.

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථා'පි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු
සොකාවතිණ්ණං[4] ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම
සත්ථවාහ අනණ[5] විචර ලොකෙ
දෙසස්සු[6] භගවා ධම්මං
අඤ්ඤාතාරො භවිස්සන්ති"ති.

අථ ඛ්වාහං රාජකුමාර, බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙසිං. අද්දසං ඛො අහං රාජකුමාර, බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ සුවිඤ්ඤාපයෙ[7] අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[8] විහරන්තෙ. සෙය්‍යථා'පි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි[9] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි. අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙව ඛො අහං

---

1. සමිඤ්ජිතං - මජසං.
2. සමිඤ්ජෙය්‍ය - මජසං.
3. අපාපුරෙතං - මජසං, ස්‍යා.
4. සොකාවකිණ්ණං - ස්‍යා.
5. අණණ - මජසං.
6. දෙසෙතු - ස්‍යා.
7. ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ - මජසං, ස්‍යා.
8. භයදස්සාවිනෙ - ස්‍යා.
9. පොසිතානි - ස්‍යා.

Free Distribution www.aathaapi.org

එසඳ රජකුමරුවෙනි, සහම්පති මහබඹහට ඔහු සිතින් මා ගේ චිත්තපරිවිතර්කය දැන මෙසේ සිත් පහළ වී : "භවත්නි, ලෝකය නස්නේ මැ යැ භවත්නි, ලොකය වෙසෙසින් නස්නේ මැ යැ. යම් ලොවෙකැ අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ ගේ සිත නිරිහ බවට නැමේ ද, දහම් දෙසනුවට නො නැමේ ද, එහෙයිනි"යි. එසඳ රජකුමරුවෙනි, සහම්පති බඹ යම් පරිදි බලවත් පුරුෂයෙක් වක්කළ අත් දිගු කරන්නේ වේ ද, දිගු කළ අත් හෝ වක් කරන්නේ වේ ද, එ පරිදි මැ බඹලොව අතුරුදහන් කොට මා හමුයෙහි පහළ වී. එසඳ රජකුමරුවෙනි, සහම්පති බඹ උතුරුසඟ එකස් කොට මා වෙත ඇඳිලි බැඳ මට මෙසේ බස් කී : "වහන්ස, භගවත්හු දහම් දෙසත්වා, සුගතයෝ දහම් දෙසත්වා, අල්පරජස්ක සැහැවි ඇති සත්ත්වයෝ ඇත. දහම් නො අසන බැවින් පිරිහෙති. දහම් දත හෙන්නාහු ඇතැ"යි. රජකුමරුවෙනි, සහම්පති බඹ මෙ බස් කී. මෙ බස් කියා වැළි මෙසේ අන් ගයකුදු කී යැ :

"පෙර මගධ දනව්වැසියන් කෙරෙහි සමල ෂඩ්ශාස්තෘන් සිතූ අශුද්ධ වූ මිථ්‍යාදෘෂ්ටිධර්මයෙක් පහළ වී. එහෙයින් අමෘතද්වාර වූ මෙසේ ආර්‍යමාර්ගය විවර කළ මැනැව. විමල සම්‍යක් සම්බුද්ධයන් විසින් තුවණින් අවබෝධ කළ චතුස්සත්‍යධර්මය අසත්වා.

ශෛලමය එකඝන පර්වතශිඛරයෙක්හි සිටියෙක් යථාස්ථිත වූයේ මැ පවව වටා සිටි ජනතාව යම්සේ දක්නේ වේ ද, ප්‍රශස්තබුද්ධි ඇති සමතැස් මුනිඳුනි, ශෛලපර්වතොපම වූ ධර්මසඞ්ඛ්‍යාත ප්‍රාසාදයට නැඟී විගතශොක වූ තොප ශොකාවතීර්ණ වූ ජාතිජරාභිභූත වූත් ජනතාව බලනු සේක්වා.

මහාවීරයාණෙනි, දුනු මාරසඞ්ග්‍රාම ඇතියාණෙනි, සාර්ථවාහකයාණෙනි, කාමච්ඡන්ද-ඍණ රහිතයාණෙනි, නැඟී සිටිනු මැනැව, ලෝකයෙහි සැරිසරනු මැනැව, භගවත් ගොයුම්ගොතුව, දහම් දෙසනු සේක්වා; දහම් දැනගන්නාහු ඇතැ"යි.

ඉක්බිති රජකුමරුවෙනි, මම මහබඹහු ගේ අධ්‍යෙෂණය පිළිගෙන සතුන් කෙරෙහිදු කරුණාව පිණිස බුදු ඇසින් ලොව බැලූයෙමි. රජකුමරුවෙනි, මම බුදු ඇසින් ලොව බලනුයෙම් අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රාගාදි රජස් ඇති තියුණු වූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති මෘදු වූ ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති සුන්දර වූ ශ්‍රද්ධාදි ආකාර ඇති සුවසේ අවබොධ කරවාලිය හෙන පරලොව හා වරද භය විසින් දක්නාසුලු වැ වසන කිසි සත්ත්ව කෙනකුන් දිටිමි. යම් පරිදි උපුල් වෙනෙහි වේවයි පියුම් වෙනෙහි වේවයි හෙළපියුම් වෙනෙහි වේවයි ඇතැම් උපුලන් හා පියුම්හු හෝ හෙළ පියුම්හු හෝ දියෙහි සඤ්ජාත වැ දියෙහි සංවර්ධිත වැ දියෙන් නො නැංගාහු දිය තුළ ගැලී පුස්නාහු ඇද්ද, ඇතැම් උපුලන් හා පියුම්හු හෝ හෙළ පියුම්හු හෝ දියෙහි සඤ්ජාත වැ දියෙහි සංවර්ධිත වැ සමෝදක වැ සිටියාහු ඇද්ද, ඇතැම් උපුලන් හා පියුම්හු හෝ හෙළ පියුම්හු හෝ දියෙහි සඤ්ජාත වැ දියෙහි සංවර්ධිත වැ දියතෙලෙන් පැන නැඟී දියෙන් අනුපලිප්ත වැ සිටිනාහු ඇද්ද, එ පරිදි මැ රජකුමරුවෙනි,

රාජකුමාර, බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො අද්දසං සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ සුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අථ ඛ්වාහං රාජකුමාර, බ්‍රහ්මානං සහම්පතිං ගාථාය පච්චභාසිං:

"අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ"ති.

අථ ඛො රාජකුමාර, බ්‍රහ්මා සහම්පති "කතාවකාසො ඛොම්හි භගවතා ධම්මදෙසනායා"ති මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "අයං ඛො ආළාරො කාලාමො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී දීඝරත්තං අප්පරජක්ඛජාතිකො, යන්නූනා"හං ආළාරස්ස කාලාමස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං, සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. අථ ඛො මං රාජකුමාර, දෙවතා උපසඞ්කමිත්වා එතදවොච: "සත්තාහකාලකතො[1] භන්තෙ, ආළාරො කාලාමො"ති ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "සත්තාහකාලකතො ආළාරො කාලාමො"ති. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "මහා-ජානියො ඛො ආළාරො කාලාමො, සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය, ඛිප්පමෙව ආජානෙය්‍යා"ති.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "අයං ඛො උද්දකො[2] රාමපුත්තො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී දීඝරත්තං අප්පරජක්ඛජාතිකො යන්නූනාහං උද්දකස්ස රාමපුත්තස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. අථ ඛො මං රාජකුමාර දෙවතා උපසඞ්කමිත්වා එතදවොච: "අභිදොසකාලකතො[1] භන්තෙ උද්දකො රාමපුත්තො"ති. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අභිදොසකාලකතො උද්දකො රාමපුත්තො"ති. තස්ස මය්හං රාජකුමාර එතදහොසි: "මහාජානියො ඛො උද්දකො රාමපුත්තො, සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය, ඛිප්පමෙව ආජානෙය්‍යා"ති.

තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍ය"න්ති. තස්ස මය්හං රාජකුමාර, එතදහොසි: "කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තී"ති. අද්දසං ඛො අහං රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කාමිං. අද්දසා ඛො මං රාජකුමාර,

1. කාලංකතො - මජසං. 2. උදකො - මජසං.

මම බුදුඇසින් ලොව බලනුයෙම් අල්පරජස්ක වූත් මහාරජස්ක වූත් තීක්ෂණෙන්ද්‍රිය වූත් මෘද්වින්ද්‍රිය වූත් ස්වාකාර වූත් සුවිඥපය වූත් පරලොක හා වද්‍යය භය විසින් දක්නාසුලු වැ වසනා වූත් කිසි සත්ත්ව කෙනකුන් දිටිමි. ඉක්බිති රජකුමරුවෙනි, මම සහම්පති බඹහට ගථායෙන් පිළිවදන් විසින් කීමි :

''බ්‍රහ්මයෙනි, ඒ අල්පරජස්කාදි සත්ත්වයනට අමෘතද්වාර වූ ආයර්‍යමාර්ගයෝ විවෘතයහ, යම් කෙනෙක් කන් ඇත්තාහු නම් ඔහු සැදැහැ මුදත්වා කායවාක් ක්ලමථු සංඥ ඇති වැ සියුම් වූත් තෙල උතුම් දහම මිනිසුන් කෙරෙහි නො කීමි'යි.

ඉක්බිති රජකුමරුවෙනි, සහම්පති මහබඹ 'භගවත්හු විසින් ධම්දෙශනා පිණිස කළ අවකාශ ඇතියෙම් වෙමි'යි මා සකසා වැඳ පැදකුණු කොට එහි මැ අතුරුදහන් කෙළේ'යි.

රජකුමරුවෙනි; මට තෙල සිත් වී : ''කවරක්හට මම් පළමු වැ දහම් දෙසම් ද, කවරෙක් මෙ දහම වෙලෙවි වැ දැනගන්නේ ද?''යි. රජකුමරුවෙනි, මට තෙල සිත් වී : මේ ආළාර කාලාම තවුස් පණ්ඩිත යැ, ව්‍යක්ත යැ, නුවණැත්තේ යැ, දිඝකලක් අල්පරජස්ක සැහැවි ඇතියේ යි. මම ආළාරකලම්හට පළමු වැ දහම් දෙසන්නෙම් නම් මැනැව, හෙ දහම වෙලෙවි වැ දැනගන්නේ යැ''යි. එසඳ රජකුමරුවෙනි, දෙවියෙක් මා කරා එළැඹ තෙල බස් කී : ''වහන්ස, ආළාරකාලාම කලුරිය කළ සත්දවස් ඇතියේ යැ''යි. මට වැළිත් ''ආළාරකාලාම කලුරිය කළ සත්දවස් ඇතියේ යැ''යි ඥනදර්‍ශනය ද උපන. රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''ආළාරකාලාම මහත් හානි ඇතියේ යැ, ඉදින් හේ මෙ දහම අසා නම් වහා මැ දැනගන්නේ යැ''යි.

රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''මම පළමු මැ කවරක්හට දහම් දෙසම් ද, කවරෙක් මෙ දහම වහා මැ දැනගන්නේ වේ ද''යි. රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''රාමපුත්‍ර වූ උද්දක තවුස් පාණ්ඩිත්‍යයෙන් සමන්වාගත යැ, ව්‍යක්තභාවයෙන් සමන්වාගත යැ, සථානොත්පත්තික ප්‍රඥයෙන් සමන්වාගත යැ, නිෂ්ක්ලේශප්‍රකාර ඇත්තේ යැ, මම රාමපුත්‍ර උද්දක තවුස්හට පළමු කොට දහම් දෙසම් නම් මැනැව. හේ මෙ දහම වහා මැ දැනගන්නේ යැ''යි. රජකුමරුවෙනි, එසඳ මා කරා දෙවියෙක් පැමිණ තෙල කී : වහන්ස'', උද්දකරාමපුත්‍ර තවුස් අධිරාත්‍රියෙහි කලුරිය කළැ''යි. මට ද සර්‍වඥතාඥනය පහළ විය : ''උද්දකරාමපුත්‍ර තවුස් මැදිරිය කලුරිය කළැ''යි කියා යි. රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''උද්දක රාමපුත්‍ර තවුස් මහපිරිහිණක් ඇතියෙක, ඉදින් හේ මෙ දහම අසා නම් වහා මැ දැනගන්නේ යැ'යි,

රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''මම කවරක්හට පළමු කොට දහම් දෙසම් ද, කවරෙක් මෙ දහම වහා මැ දැනගන්නේ ද''යි. රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''ප්‍රධන් පිණිස මෙහෙයූ සිත් ඇති මට උවැටන් කළ පස්වග මහණහු මට බොහෝ උපකාර ඇතියහ, මම පස්වග මහණුනට පළමු කොට දහම් දෙසම් නම් මනා මැ නු''යි ,රජකුමරුවෙනි, මට තෙල සිත් වී : ''පස්වග මහණහු මෙ සඳ කොහි වෙසෙත් ද කියා යි. රජකුමරුවෙනි, මම පිරිසුදු, මිනිසැස ඉක්ම සිටි දිවැසින් පස්වග මහණුන් බරණැස ඉසිපතන නම් මුවළැවිහි වසනුවන් දිටිමි. රජකුමරුවෙනි, ඉක්බිති මම උරුවෙල් දනවුයෙහි කැමැතිතාක් වාස කොට බරණැස කරා චාරිකාවට නික්මිණිමි.

උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගපටිපන්නං. දිස්වාන මං එතදවොච: "විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො, කංසි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො, කො වා තෙ සත්ථා, කස්ස වා ත්වං ධම්මං රොචෙසී"ති එවං වුත්තෙ අහං රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං:

"සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො

අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මාසම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං[1] ලොකස්මිං ආහඤ්ඡං[2] අමතදුන්දුභින්"ති.

යථා ඛො ත්වං ආවුසො පටිජානාසි අරහසි අනන්තජිනො"ති,

"මාදිසා වෙ ජිනා හොන්ති යෙ පත්තා ආසවක්ඛයං
ජිතා මෙ පාපකා ධම්මා තස්මාහං උපකා ජිනො"ති.

එවං වුත්තෙ රාජකුමාර, උපකො ආජීවකො "හුවෙය්‍ය පාවුසො"ති වත්වා සීසං ඔකම්පෙත්වා උම්මග්ගං ගහෙත්වා පක්කාමි.

අථ ඛ්වාහං රාජකුමාර, අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී ඉසිපතනං මිගදායො යෙන පඤ්චවග්ගියා භික්ඛූ තෙනුපසංකමිං. අද්දසංසු ඛො මං රාජකුමාර, පඤ්චවග්ගියා භික්ඛූ දූරතො' ච ආගච්ඡන්තං දිස්වාන අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං: "අයං ඛො ආවුසො සමණො ගොතමො ආගච්ඡති බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො, න පච්චුට්ඨාතබ්බො, නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං, අපි ච ඛො ආසනං ඨපෙතබ්බං සචෙ ආකංඛිස්සති නිසීදිස්සතී"ති. යථා යථා ඛො අහං රාජකුමාර, උපසංකමාමි, තථා තථා පඤ්චවග්ගියා භික්ඛූ නාසක්ඛිංසු සකාය කතිකාය සණ්ඨාතුං අප්පෙකච්චෙ මං පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසුං. අප්පෙකච්චෙ ආසනං පඤ්ඤපෙසුං. අප්පෙකච්චෙ පාදොදකං උපට්ඨපෙසුං. අපි ච ඛො මං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති. එවං වුත්තෙ අහං රාජකුමාර, පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: 'මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරිත්ථ[3] අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං, අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි, යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

---

1. අන්ධිභූතස්මිං - මජසං 2. ආහඤ්ඤිං - සත්‍යා.
3. සමුදාචරථ - මජසං.

රජකුමරුවෙනි, උපක නම් ආජීවක ගයාව හා බොධිය හා අතර දී අදන් මහට පිළිපන් මා දිටි. දැක මට තෙල කී : "ඇවැත්නි, තොප ගේ ඉඳුරෝ විප්‍රසන්නයහ. ඡවිවර්ණය පරිශුද්ධ යැ පයර්‍යවදාත යැ. ඇවැත්නි, තෙපි කවර ශාස්තෘවක්හු උදෙසා පැවිදි ව? තොප ගේ ශාස්තෘ හෝ කවරැ? තෙපි කවරක්හුගේ හෝ දහම් රුස්ව? යි. රජකුමරුවෙනි, මෙසේ කී කලැ උපක ආජීවකහට ගාථායෙන් කීම් :

"මම හැම ත්‍රෛභූමක ධර්මය මැඩගෙන සිටියෙමි, හැම චාතුර්භූමක දහම් දත්මි. හැම ත්‍රෛභූමක ධර්මයෙහි ක්ලෙශලෙපනයෙන් උපලිප්ත නො වෙමි, හැම ත්‍රෛභූමක ධර්ම හැරපියා සිටිමි. තෘෂ්ණාක්‍ෂය සඞ්ඛ්‍යාත නිවනෙහි අරමුණු විසින් විමුක්තයෙමි, මෙසේ තමා විසින් මැ හැම චාතුර්භූමකධර්ම දැනගෙන අන් කවරක්හු නම් ගෙන ('මේ මා ආචාර්‍යයහ' යි) උදෙසම් ද?"

(ලොකොත්තර ධර්මයෙහි ලා) මට ඇදුරෙක් නම් නැත, මට සමයෙක් නම් නැත, සදෙවකලොකයෙහි මට සදෘශ පුද්ගලයෙක් ද නැත,

මම වනාහි ලොකයෙහි අර්හත්මි, මම අනුත්තර ශාස්තෘයෙමි, එකලා වැ සිටි සම්‍යක් සම්බුද්ධයෙමි, (සර්වක්ලෙශාග්නි නිර්වාපණ හෙතුයෙන්) ශීතිභූතයෙමි, (එයින් මැ) නිර්වෘතයෙමි.

දම්සක් පවත්වනුවට කසිපුර යෙමි. අන්ධභූත ලෝකයෙහි අමා බෙර වයන්නෙමි"යි.

ඇවැත්නි, තෙපි යම්සේ පිළින කරවූ ද, එසෙයින් අනන්තජින වන්නට නිස්සෙහි"යි.

"යම් කෙනෙක් ආශ්‍රවක්ෂයට පැමිණියාහු ද, මා බඳු ඔහු එකාන්තයෙන් 'ජින' වෙති, මා විසින් පාපධර්මයෝ දිනන ලදහ, එහෙයින් උපකයෙනි, මම 'ජින' වෙමි"යි.

රජකුමරුවෙනි, මෙසේ කී කල්හි උපක ආජීවක 'ඇවැත්නි, එසේත් වියැහෙති "යි කියා හිස සලා සරස්මඟක් ගෙන නික්ම ගියේ යි.

එසඳ රජකුමරුවෙනි, මම අනුක්‍රමයෙන් සැරිසරා යන්නෙම් බරණැස ඉසිපතන නම් මුවළැව්හි පස්වග මහණුන් කරා එළැඹියෙමි. රජකුමරුවෙනි, පස්වග මහණහු දුර දී මැ එන මා දුටහ, දැක අන්‍යො'න්‍ය කතිකාවක් කළහ : "ඇවැත්නි, මේ ශ්‍රමණ ගෞතම ප්‍රත්‍යය බහුලත්‍වයට පැමිණියේ ප්‍රධනින් පිරිහුණේ ප්‍රත්‍යය බාහුල්‍යයට පෙරළුණේ එයි. හේ අභිවාදන නො කටයුත්තේ යැ, දැක හුනස්නෙන් නො නැංගයුත්තේ යැ, ඔවුන් ගේ පාසිවුරු නො පිළිගතයුත්තේ යැ, එතෙකුදු වත් අස්නක් තැබියයුත්තේ යි. ඉදින් රුස්තේ නම් හිඳුනේ යැ"යි. රජකුමරුවෙනි, යම් යම් සෙයෙකින් මම එළැඹෙම් ද, ඒ ඒ සෙයින් පස්වග මහණහු සිය කතිකායෙහි තර වැ සිටින්නට නො හැකි වූහ. ඇතැම් කෙනෙක් මට පෙරගමන් කොට පාසිවුරු පිළිගත්හ. ඇතැම් කෙනෙක් අස්නක් පැනවූහ, ඇතැම් කෙනෙක් පා දෝනා දිය එළවා තැබූහ. එතෙකුදු වත් මා නම්හුදු ආවුසො වාදයෙනුදු අමතත්. මෙසේ කී කල්හි රජකුමරුවෙනි, මම පස්වග මහණුන්ට තෙල බස් කීම් : "මහණෙනි, තථාගතයන් නම්හුදු ආවුසොවාදයෙනුදු නහමක් අමතව. මහණෙනි, තථාගතයෝ රහත්හ, සම්‍යක්සම්බුද්ධයහ. මහණෙනි, කන් නමව, (මා විසින්) අමෘතය ලබන ලද, මම අනුසස්මි, මම දහම් දෙසමි, යම්සේ අනුශාසනා කරනලද නම් එසේ පිළිපදනාහු නොබෝ කලෙකින් මැ යම් අර්ථයකට කුල පුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සසුන් වදිත් ද, ඒ අනුත්තර වූ බ්‍රහ්මචර්‍යපර්‍යවසාන සඞ්ඛ්‍යාත රහත් බව මෙ අත්බැව්හි මැ තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරව"යි.

එවං වුත්තෙ රාජකුමාර, පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: ‘‘තාය’පි ඛො ත්වං ආවුසො ගොතම, ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං, කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙස’’න්ති. එවං වුත්තෙ අහං රාජකුමාර, පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: ‘‘න භික්ඛවෙ තථාගතො බාහුලිකො න පධානවිබ්භන්තො න ආවත්තො බාහුල්ලාය අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි, යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙ’ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙ’ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා’’ති. දුතියම්පි ඛො රාජකුමාර, පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: ‘‘තාය’පි ඛො ත්වං ආවුසො ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙස’’න්ති. දුතියම්පි ඛො අහං රාජකුමාර, පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: ‘‘න භික්ඛවෙ තථාගතො බාහුලිකො න පධානවිබ්භන්තො න ආවත්තො බාහුල්ලාය අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො ඔදහථ භික්ඛවෙ සොතං අමතමධිගතං, අහමනුසාසාමි අහං ධම්මං දෙසෙමි, යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙ’ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙ’ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා’’ති. තතියම්පි ඛො රාජකුමාර, පඤ්චවග්ගියා භික්ඛූ මං එතදවොචුං: ‘‘තාය’පි ඛො ත්වං ආවුසො ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නාජ්ඣගමා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙස’’න්ති. එවං වුත්තෙ අහං රාජකුමාර, පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොචං: අභිජානාථ මෙ නො තුම්හෙ භික්ඛවෙ ඉතො පුබ්බෙ එවරූපං විභාවිතමෙත’න්ති[1] නො හෙතං භන්තෙ න භික්ඛවෙ තථාගතො බාහුලිකො, න පධානවිබ්භන්තො න ආවත්තො බාහුල්ලාය අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො, ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං අහමනුසාසාමි, අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙ’ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙ’ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා’’ති.

අසක්ඛිං ඛො අහං රාජකුමාර, පඤ්චවග්ගියෙ භික්ඛූ සඤ්ඤාපෙතුං. ද්වෙ’පි සුදං රාජකුමාර, භික්ඛූ ඔවදාමි තයො භික්ඛූ පිණ්ඩාය චරන්ති. යං තයො භික්ඛූ පිණ්ඩාය චරිත්වා ආහරන්ති, තෙන ඡබ්බග්ගියා යාපෙම. තයො’පි සුදං රාජකුමාර, භික්ඛූ ඔවදාමි, ද්වෙ භික්ඛූ පිණ්ඩාය චරන්ති. යං ද්වෙ භික්ඛූ පිණ්ඩාය චරිත්වා ආහරන්ති. තෙන ඡබ්බග්ගියා යාපෙම අථ ඛො රාජකුමාර, පඤ්චවග්ගියා භික්ඛූ මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා න චිරස්සෙ’ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙ’ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිංසූ’ති.

---

1. පභාවිතමෙතන්ති - මජසං, භාසිතමෙතන්ති - ස්‍යා.

රජකුමරුවෙනි, මෙසේ කී කල්හි පස්වග මහණුහු මට මෙසේ කීහ : "ඇවැත්නි, ගෞතමයෙනි, තෙපි එවන් (දුෂ්කර) ඊර්‍ය්‍යාපථයෙනුදු එවන් ප්‍රතිපදයෙනුදු එවන් දුෂ්කර ක්‍රියායෙනුදු මිනිස්දහමින් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්‍ථ ඥානදර්‍ශන විශෙෂයකට නො පැමිණියාව, කිම තෙපි දැන් බාහුලික වැ පදහනින් ගිලිහුණාහු බාහුල්‍යාවර්ති වැ මනුෂ්‍ය ධර්‍මයෙන් මතු ආර්‍ය්‍යභාවයට සමර්‍ථ ඥානදර්‍ශනවිශෙෂයක් අධිගම කරහු දැ"යි. මෙසේ කී කල්හි රජකුමරුවෙනි, මම පස්වග මහණුන්ට තෙල බස් කීමි : "මහණෙනි, තථාගතයෝ බාහුලික නො වෙති, නො ද ප්‍රධානවිභ්‍රාන්තයහ, නො ද බාහුල්‍යාවර්තියහ. මහණෙනි, තථාගතයෝ අර්හත් සම්‍යක් සම්බුද්ධයහ. මහණෙනි, කන් යොමව, අමෘතය අධිගත යැ, මම අනුශාසන කෙරෙමි, මම දහම් දෙසමි, යථානුශිෂ්ටය එසේ පිළිපදනාහු නො බෝ කලෙකින් මැ යමකට කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සසුන් වදිත් ද, ඒ අනුත්තර වූ රහත් බව දෘෂ්ටධර්‍මයෙහි මැ තමා විසින් වෙසෙසින් දැන පසක් කොට, උපයා වාස කරව"යි. දෙවනවට ද රජකුමරුවෙනි, පස්වග මහණුහු මට තෙල බස් කීහ : "ඇවැත්නි, තෙපි එවන් ඉරියවුවෙනුදු, එවන් පිළිවෙතිනුදු එවන් දුෂ්කරක්‍රියා යෙනුදු මිනිස්දහමින් මතු අරි බවට සමත් ලොවුතුරුදහමක් අධිගම නො කළහු යැ. කිම තෙපි දැන් බාහුලික වැ ප්‍රධානවිභ්‍රාන්ත වැ බාහුල්‍යාවර්ති වැ මිනිස්දහමින් මතු අරි බවට සමත් ලොවුතුරුදහමක් අධිගම කරවු දැ"යි. දෙවනවට ද රජකුමරුවෙනි, මම පස්වග මහණුනට තෙල බස් කීමි : "මහණෙනි, තථාගතයෝ බාහුලික නො වෙති, නො ද ප්‍රධාන විභ්‍රාන්තයහ, නො ද බාහුල්‍යාවර්තියහ. මහණෙනි, තථාගතයෝ අර්හත් සම්‍යක් සම්බුද්ධයහ, මහණෙනි, කන් නතු කරව, අමෘතය ලබන ලද. මම අනුසස්මි. මම් දහම් දෙසමි, කුලපුත්‍රයෝ යම් අර්හත්වයක් සඳහා නොබෝ කලෙකින් මැ මනා කොට ගෙන් නික්ම සස්නට පැමිණෙත් ද, මාර්‍ගබ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති, මාර්‍ගබ්‍රහ්ම-චර්‍ය්‍යාගේ පර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත් ඵලය අනුශාසනා කළ සැටියෙන් පිළිපදනා තෙපි ඉහාත්මයෙහි මැ තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ගෙන එයට පැමිණ වාස කරව"යි. රජකුමරුවෙනි, තුන් වන වට ද පස්වග මහණුහු මට තෙල කීහු : "ඇවැත්නි, තෙපි ඒ දුෂ්කර ඊර්‍ය්‍යාපථයෙනුදු ඒ දුෂ්කර ප්‍රතිපදයෙනුදු ඒ දුෂ්කර ක්‍රියාවෙනුදු මනුෂ්‍ය ධර්‍මයෙන් මතුයෙහි වූ ආර්‍ය්‍යභාවයට සමර්‍ථ වූ ඥානදර්‍ශන විශෙෂයක් නො ලද්දව. කිම තෙපි දැන් පරිෂ්කාර බාහුල්‍යයට පිළිපන්නාහු ප්‍රධන් වැරෙන් ගිලිහුණාහු ප්‍රත්‍යය බාහුල්‍යය සඳහා වටාලා වැටුණාහු මනුෂ්‍යධර්‍මයෙන් මතුයෙහි වූ ආර්‍ය්‍යභාවකරණයට සමර්‍ථ ඥානදර්‍ශන විශෙෂය ලබන්නාහු දැ"යි. රජකුමරුවෙනි, මෙසේ බුණු කල්හි මම පස්වග මහණුනට තෙල කීමි : "මහණෙනි, තෙපි මෙයින් පෙර මෙබඳු තෙල වාක්‍යභෙදය දන්නාහු ද. (කළ සේ දන්නාහු ද) ? මහණෙනි, තථාගතයන් වහන්සේ බාහුලික නො වෙති, ප්‍රධන් වැරින් ගිලිහුණාහු නො වෙති, ප්‍රත්‍යයබාහුල්‍යයට වටාලා වැටුණාහු නො වෙති. මහණෙනි, තථාගතයන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, මහණෙනි, කන් නතු කරව. නිවන් අවබොධ කරන ලදි. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. අනුශාසනා කළ සේ පිළිපදනා තෙපි නොබෝ කලෙකින් මැ යම් අර්හත්වයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සස්නට වදිත් ද බ්‍රහමචර්‍ය්‍යය පර්‍ය්‍යව-සානය වූ ඒ අනුත්තර අහත් ඵලය ඉහාත්මයෙහි මැ තමන් විසින් මැ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරව"යි.

රජකුමරුවෙනි, මම පස්වග මහණුන් හඟවන්නට හැකි වීමි, රජකුමරුවෙනි, මහණුන් දෙදෙනකුට අවවාද කරමි. මහණුහු තුන් දෙනෙක් පිඩු පිණිස හැසිරෙත්. මහණුහු තුන් දෙනා පිඩු පිණිස හැසිර යම් අහරක් ගෙන එත් ද, එයින් සවග අපි යැපෙම්හ. රජ කුමරුවෙනි, මහණුන් තුන් දෙනකුට අවවාද කරමි. මහණුහු දෙදෙනෙක් පිඩු පිණිස හැසිරෙත්. මහණුහු දෙදෙනා පිඩු පිණිස හැසිර යම් අහරක් ගෙන එත් ද, එයින් සවග අපි යැපෙම්හ. එසඳ රජකුමරුවෙනි, පස්වග මහණුහු මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු නොබෝ කලෙකින් මැ යම් අර්හත්ත්වයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගෙන් නික්ම සස්නට වදිත් ද බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට උපයා වාස කළාහු යැ"යි.

එවං වුත්තෙ බොධිරාජකුමාරො භගවන්තං එතදවොච: 'කිච්චිරෙන නු ඛො භන්තෙ, භික්ඛු තථාගතං විනායකං ලභමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා'ති.

තෙන හි රාජකුමාර, තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි තං කිම්මඤ්ඤසි රාජකුමාර, කුසලො ත්වං හත්ථාරූය්හෙ[1] අඞ්කුසගය්හෙ[2] සිප්පෙ'ති? එවං භන්තෙ, කුසලො අහං හත්ථාරූය්හෙ[1] අඞ්කුසගය්හෙ[2] සිප්පෙ'ති. තං කිම්මඤ්ඤසි රාජකුමාර, ඉධ පුරිසො ආගච්ඡෙය්‍ය 'බොධිරාජකුමාරො හත්ථාරූය්හං[3] අඞ්කුසගය්හං[4] සිප්පං ජානාති. තස්සාහං සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛිස්සාමී'ති. සො චස්ස අස්සද්ධො. යාවතකං සද්ධෙන පත්තබ්බං, තං න සම්පාපුණෙය්‍ය. සො චස්ස බව්හාබාධො, යාවතකං අප්පාබාධෙන පත්තබ්බං, තං න සම්පාපුණෙය්‍ය. සො චස්ස සඨො මායාවී, යාවතකං අසඨෙන අමායාවිනා පත්තබ්බං, තං න සම්පාපුණෙය්‍ය. සො චස්ස කුසීතො, යාවතකං ආරද්ධවිරියෙන පත්තබ්බං, තං න සම්පාපුණෙය්‍ය, සො චස්ස දුප්පඤ්ඤො, යාවතකං පඤ්ඤවතා පත්තබ්බං, තං න සම්පාපුණෙය්‍ය. තං කිම්මඤ්ඤසි රාජකුමාර, අපි නු සො පුරිසො තව සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛෙය්‍යා'ති? එකමෙකෙනපි භන්තෙ, අඞ්ගෙන සමන්නාගතො සො පුරිසො න මම සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛෙය්‍ය. කො පන වාදෙ පඤ්චහඞ්ගෙහී'ති.

තං කිම්මඤ්ඤසි රාජකුමාර, ඉධ පුරිසො ආගච්ඡෙය්‍ය 'බොධිරාජකුමාරො හත්ථාරූය්හං[3] අඞ්කුසගය්හං[4] සිප්පං ජානාති. තස්සාහං සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛිස්සාමී'ති. සො චස්ස සද්ධො යාවතකං සද්ධෙන පත්තබ්බං, තං සම්පාපුණෙය්‍ය. සො චස්ස අප්පාබාධො, යාවතකං අප්පාබාධෙන පත්තබ්බං, තං සම්පාපුණෙය්‍ය. සො චස්ස අසඨො අමායාවී, යාවතකං අසඨෙන අමායාවිනා පත්තබ්බං, තං සම්පාපුණෙය්‍ය. සො චස්ස ආරද්ධවිරියො, යාවතකං ආරද්ධවිරියෙන පත්තබ්බං තං සම්පාපුණෙය්‍ය. සො චස්ස පඤ්ඤවා යාවතකං පඤ්ඤවතා පත්තබ්බං, තං සම්පාපුණෙය්‍ය. තං කිම්මඤ්ඤසි රාජකුමාර, අපි නු සො පුරිසො තව සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛෙය්‍යා'ති? එකමෙකෙනපි භන්තෙ, අඞ්ගෙන සමන්නාගතො සො පුරිසො මම සන්තිකෙ හත්ථාරූය්හං අඞ්කුසගය්හං සිප්පං සික්ඛෙය්‍ය කො පන වාදෙ පඤ්චහඞ්ගෙහී'ති.

---

1. හත්ථාරූළ්හෙ - මජසං, ස්‍යා.
2. අඞ්කුසගණ්හෙ - ස්‍යා.
3. හත්ථාරූළ්හං - මජසං, ස්‍යා.
4. අඞ්කුසගණ්හං - ස්‍යා.

මෙසේ කී කල්හි බෝරජකුමර භාග්‍යවතුන් වහන්සේට මෙලෙස කී : ''වහන්ස විනායක වූ තථාගත කෙනකුන් ලබන මහණ කිපමණ කලෙකින් යම් අර්හත් ඵලයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සස්නට වදිත් ද, බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තමන් විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට උපයා වාස කරන්නේ ද?''යි.

රජකුමරුවෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා තා මැ පුළුවුස්මි. යම්සේ තට රුස්නේ වේ ද, එසේ එය පවසව. රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? තෝ හස්ත්‍යාරොහය නිමිති කොට ඇති අකුසුගැනුම් ශිල්පයෙහි දක්ෂයෙහි? වහන්ස, එසේ යැ. මම හස්ත්‍යාරොහය නිමිති කොට සිටුනා අකුසු ගැනුම් ශිල්පයෙහි දක්ෂයෙමි. රජකුමරුවෙනි ඒ කෙසේ හඟිහි? මෙහි පුරුෂයෙක් එන්නේ යැ : ''බොධිරාජ කුමර හස්ත්‍යාරොහය වූ අකුසු ගැනුම් ශිල්පය දන්නේ යැ මම ඔහු හමුයෙහි හස්ත්‍යාරොහ වූ අකුසුගැනුම් සිප්සතර හික්මෙමි.'' කියා යි. හෙ ද සැදැහැ නැති වෙයි, සැදැහැතියහු විසින් යම් පමණ සිප් ලැබියයුතු වේ ද, ඒ නො ලබන්නේ යැ, හෙ ද බහ්වාබාධ වෙයි, අල්පාබාධයක්හු විසින් යම් පමණ සිප් ලැබියයුතු වේ ද ඵ ද නො ලබන්නේ යැ. හෙ ද ශඨ මායාවී වෙයි. අශඨ අමායාවීහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ ද නො ලබන්නේ යැ, හෙ ද කුසීත වෙයි. රුකුළු වැර ඇතියහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ ද නො ලබන්නේ යැ. හෙ ද දුෂ්ප්‍රාඥ වෙයි, පැනැතියහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ ද නො ලබන්නේ යැ, රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ තා හමුයෙහි හස්ත්‍යාරොහ වූ අකුසු ගැනුම් සිප්සතර හික්මෙන්නේ ද''යි. වහන්ස, එක එක අංගයෙකිනුදු සමන්වාගත ඒ පුරුෂ මා හමුයෙහි හස්ත්‍යාරොහය පිණිස වූ අකුසු ගැනුම් සිප්සතර නො හික්මෙන්නේ යැ. පඤ්චාඞ්ගයෙකින් සමන්වාගත වූයේ නම් කවර කථා යැ?

රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? මෙහි පුරුෂයෙක් එන්නේ යැ; ''බෝධිරාජකුමාර හස්ත්‍යාරොහය පිණිස වූ අකුසු ගැනුම් සිප් දන්නේ යැ මම ඔහු හමුයෙහි හස්ත්‍යාරොහය පිණිස වූ අකුසු ගැනුම් සිප් උගන්මි''යි. හෙ ද සැදැහැති වෙයි, සැදැහැතියහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ හැම ලබන්නේ යැ. හෙ ද අල්පාබාධ වෙයි, අල්පාබාධයක්හු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ හැම ලබන්නේ යැ, හෙ ද අශඨ අමායාවී වෙයි, අමායාවීහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද ඵ හැම ලබන්නේ යැ. හෙ ද ආරබ්ධවීර්‍ය්‍ය වෙයි, ආරබ්ධවීර්‍ය්‍යයා විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ හැම ලබන්නේ යැ හෙ ද පැනැති වෙයි, පැනැතියහු විසින් යම් තාක් සිප් ලැබියයුතු වේ ද, ඵ හැම ලබන්නේ යැ. රජකුමරුවෙනි, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ තා හමුයෙහි හස්ත්‍යාරොහය වූ අකුසු ගන්නා සිප්සතර උගන්නේ වේ ද?යි. වහන්ස, එක එක අංගයෙකිනුදු සමන්වාගත ඒ පුරුෂ මා හමුයෙහි හස්ත්‍යාරොහය වූ අකුසු ගන්නා සිප්සතර උගන්නේ යැ. පසඟෙකින් යුක්ත වූයේ නම් කවර වාදයෙක් ද?

එව මෙව ඛො රාජකුමාර, පඤ්චිමානි පධානියඞ්ගානි. කතමානි පඤ්ච? ඉධ රාජකුමාර, භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං ‘ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා’’ති. අප්පාබාධො හොති අප්පාතඞ්කො, සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා[1] සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උප්පාදය[2] ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. ඉමානි ඛො රාජකුමාර, පඤ්ච පධානියඞ්ගානි. ඉමෙහි ඛො රාජකුමාර, පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤ සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය සත්තවස්සානි.

තිට්ඨන්තු[3] රාජකුමාර, සත්තවස්සානි. ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු -පෙ- විහරෙය්‍ය ඡ වස්සානි -පෙ- පඤ්ච වස්සානි -පෙ- චත්තාරි වස්සානි -පෙ- තීණි වස්සානි -පෙ- ද්වෙ වස්සානි -පෙ- එකං වස්සං. තිට්ඨතු රාජකුමාර, එකං වස්සං. ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු -පෙ- විහරෙය්‍ය සත්තමාසානි. තිට්ඨන්තු රාජකුමාර, සත්ත මාසානි ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු -පෙ- විහරෙය්‍ය ඡ මාසානි -පෙ- පඤ්ච මාසානි -පෙ- චත්තාරි මාසානි -පෙ- තීණි මාසානි -පෙ- ද්වෙ මාසානි -පෙ- එකං මාසං -පෙ- අඩ්ඪමාසං.

තිට්ඨතු රාජකුමාර, අඩ්ඪමාසො. ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය සත්ත රත්තින්දිවානි.

තිට්ඨන්තු රාජකුමාර, සත්ත රත්තින්දිවානි. ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤ සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය ඡ රත්තින්දිවානි: -පෙ- පඤ්ච රත්තින්දිවානි-පෙ-චත්තාරි රත්තින්දිවානි-පෙ-තීණි රත්තින්දිවානි-පෙ-ද්වෙ රත්තින්දිවානි-පෙ-එකං රත්තින්දිවං.

---

1. ආවිකත්වා - සිමු, PTS.
2. උපසම්පදය - මජසං, ස්‍යා, PTS.
3. තිට්ඨතු - PTS.

එසෙයින් මැ රජකුමරුවෙනි, ප්‍රධන් වැර ඇති මහණහට අඞ්ග පසෙක් වෙයි. කවර පසෙක යත්: රජකුමරුවෙනි, මෙ සස්නෙහි මහණ සැහැදැති වෙයි. තථාගතයන් වහන්සේගේ මාර්‍ගඥානය හදහයි: "ඒ භාග්‍යවත්හු මෙ කරුණිනුදු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, (අෂ්ට) විද්‍යා (පසළොස්)චරණ ධර්‍මයෙන් සමන්වාගතයහ, සුන්දරගති ඇතියහ, ලොක දතුවහ, අනුත්තර පුරුෂදම්‍යසාරථීහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, සිව්සස් අවබොධ කළහ. භාග්‍යවත්හ"යි. නිදුක් අරොග වෙයි, ඉතා සිහිල් නො වූ ඉතා උණු නො වූ මධ්‍යස්ථ වූ ප්‍රධන් වැරට සමර්‍ථ වූ සම වැ පැසෙන කර්‍මජතෙජො ධාතුයෙන් සමන්වාගත වෙති. යථාභූත ආත්මය බුදුන් කෙරෙහි හෝ විඥ සබ්‍රම්සරුන් කෙරෙහි හෝ පහළ කරන අශඨ අමායාවී වෙයි. අකුශලධර්‍මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්‍මයන් ගේ උත්පාදය පිණිස රුකුළු වැර ඇති වෙයි. කුසල් දහම්හි නො හළ ධුර ඇතියේ දළ පැරකුම් ඇතියේ ශක්ති ඇතියේ වෙයි. උදයව්‍යය පිරිසිඳුනට සමත් පිරිසුදු ලොහස්කන්ධාදීන් බිඳුනට සමත් මොනොවට දුඃඛක්ෂය කරා යන නුවණින් නුවණැති වෙයි. රජකුමරුවෙනි, ප්‍රධන් වැර වඩන මහණහු ගේ මේ පඤ්චාඞ්ගයෝ වෙති. රජ කුමරුවෙනි, මේ පඤ්චප්‍රකාර පධානියඞ්ගයෙන් සමන්වාගත මහණ විනායක වූ තථාගතයන් වහන්සේ ලබමින් යම් අර්‍ථයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම බ්‍රහමචර්‍ය්‍ය පර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තමන් විසින් සත්වසෙකින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ වාස කරන්නේ යැ.

රජකුමරුවෙනි, සප්තවර්‍ෂයෝ තිබෙත්වා, මේ පඤ්ච පධානියඞ්ගයෙන් සමන්වාගත මහණ . . . සවසෙකින් . . . පස් වසෙකින් . . සතර වසෙකින් . . . තුන් වසෙකින් . . . . දෙ වසෙකින් . . . . එක් වසෙකින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ වාස කරන්නේ යැ.

රජකුමරුවෙනි, එක් වස තිබෙවා, මේ පඤ්ච පධානියඞ්ගයෙන් සමන්වාගත මහණ සත් මසෙකින් . . . වාස කරන්නේ යැ. රජකුමරුවෙනි, සප්ත මාසයෝ තිබෙත්වා, මේ පඤ්ච පධානියඞ්ගයෙන් සමන්වාගත මහණ සමසෙකින් . . . පස් මසෙකින් . . . සාර මසෙකින් . . . තුන් මසෙකින් . . . දෙමසෙකින් . . . . එක් මසෙකින් . . . . අඩ මසෙකින් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එය උපදවා වාස කරන්නේ යැ.

රජකුමරුවෙනි, අඩමස තිබෙවා, මේ පඤ්චපධානියඞ්ගයෙන් සමන්වාගත මහණ විනායක වූ තථාගතයන් වහන්සේ ලැබෙමින් යම් අර්‍ථයක් සඳහා කුලපුත්‍රයෝ මනා කොට ගෙන් නික්ම සස්නට වදිත් ද බ්‍රහමචර්‍ය්‍යපර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත්ඵලය ඉහාත්ම-යෙහි මැ සත් දවරැයෙකින් තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වාස කරන්නේ යි.

රජකුමරුවෙනි, සත් රැදවහල්හු තිබෙත්වා, මේ පඤ්චපධානියඞ්ගයෙන් සමන්වාගත මහණ විනායක වූ තථාගතයන් වහන්සේ ලැබෙමින් යම් අර්‍ථයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සස්නට වදිත් ද බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසානය වූ ඒ අනුත්තර අර්හත් ඵලය දවරැ සයෙකින් තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වාස කරන්නේ යැ, දවරැ පසෙකින් . . . දවරැ සතරෙකින් . . . දවරැ තුනෙකින් . .. දවරැ දෙකෙකින් . . . එක් දවරැයෙකින් තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ඊට පැමිණ වාස කරන්නේ යි.

තිට්ඨතු රාජකුමාර, එකං රත්තින්දිවං,[1] ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො සායමනුසිට්ඨො පාතො විසෙසං අධිගමිස්සති. පාතමනුසිට්ඨො සායං විසෙසං අධිගමිස්සති.

එවං වුත්තෙ බොධි රාජකුමාරො භගවන්තං එතදවොච: අහො බුද්ධො, අහො ධම්මො, අහො ධම්මස්ස ස්වාක්ඛාතතා, යත්‍ර හි නාම සායමනුසිට්ඨො පාතො විසෙසං අධිගමිස්සති, පාතමනුසිට්ඨො සායං විසෙසං අධිගමිස්සතීති.

එවං වුත්තෙ සඤ්ජිකාපුත්තො මාණවො බොධිරාජකුමාරං එතදවොච: එවමෙව පනායං භවං බොධි අහො බුද්ධො, අහො ධම්මො, අහො ධම්මස්ස ස්වාක්ඛාතතාති ච වදෙති[2]. අථ ච පන භවං[3] න තං භවන්තං ගොතමං සරණං ගච්ඡති[4] ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්චාති.

මා හෙවං සම්ම සඤ්ජිකාපුත්ත අවච, මා හෙවං සම්ම සඤ්ජිකාපුත්ත අවච, සම්මුඛා මෙතං සම්ම සඤ්ජිකාපුත්ත, අය්‍යාය සුතං සම්මුඛා පටිග්ගහිතං එකමිදං සම්ම සඤ්ජිකාපුත්ත, සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො මෙ අය්‍යා කුච්ඡිමතී[5] යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො මෙ අය්‍යා භගවන්තං එතදවොච: යො මෙ අයං භන්තෙ, කුච්ඡිගතො කුමාරකො වා කුමාරිකා වා, සො භගවන්තං සරණං ගච්ඡති ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං තං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

එකමිදං සම්ම සඤ්ජිකාපුත්ත, සමයං භගවා ඉධෙව භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. අථ ඛො මං ධාති අඞ්කෙන වාහිත්වා[6] යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො මමං[7] ධාති භගවන්තං එතදවොච: අයං භන්තෙ, බොධිරාජකුමාරො භගවන්තං සරණං ගච්ඡති ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං තං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

එසා'හං සම්ම සඤ්ජිකාපුත්ත, තතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

බොධිරාජකුමාරසුත්තං පඤ්චමං.

---

1. එකො රත්තින්දිවො - මජසං, ස්‍යා, PTS.
2. වදෙසි - සිමු, පවෙදෙති - ස්‍යා.
3. අථ ච පන - මජසං,සිමු, PTS. 4. ගච්ඡාමි - PTS.
5. කුච්ඡිවතී - PTS. 6. පායිත්වා - ස්‍යා හරිත්වා - මජසං.
7. මං ධාති - මජසං. PTS

රජකුමරුවෙනි, එක් දවරය තිබෙවා, මේ පඤ්චපධානියඞ්ගයෙන් සමන්වාගත මහණ විනායක වූ තථාගතයන් වහන්සේ ලැබෙමින් සවස අනුශිෂ්ට වැ උදය විශෙෂාධිගමය කරන්නේ යැ, උදය අනුසස්නා ලදු වැ සවස විශේෂාධිගමය කරන්නේ යි.

මෙසේ වදළ කල්හි බෝධිරාජ කුමර භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : "භගවත්හු ආශ්චර්‍ය්‍යහ, ධර්මය ආශ්චර්‍ය්‍ය යැ, ධර්මයා ගේ ස්වාඛ්‍යාත භාවය ආශ්චර්‍ය්‍ය යි. විස්මයෙකි. සවස අනුසස්නාලදු වැ උදය විශේෂාධිගම කෙරෙයි, උදය අනුසස්නාලදු වැ සවස විශේෂාධිගම කෙරේ"යයි.

මෙසේ කී කල්හි සඤ්ජිකාපුත් මාණවක බෝධිරාජ කුමරහට මෙසේ කී : මෙසෙයින් මැ මේ භවත් බොධිරාජකුමාර තෙමේ "බුදුහු ආශ්චර්‍ය්‍යයහ, ධර්මය ආශ්චර්‍ය්‍ය යැ, ධර්මයා ගේ ස්වාඛ්‍යාතභාවය ආශ්චර්‍ය්‍ය යැ"යි. කියයි. වැළි ඒ භවත් ගොයුමාණන් හා ධර්මය ද බික්සඟන ද සරණ කොට නො යෙති"යි.

සගය, සඤ්ජිකාපුත්‍රයෙනි, මෙසේ නහමක් කියව, සගය, සඤ්ජිකාපුත්‍රයෙනි, මෙසේ නහමක් කියව. සගය සඤ්ජිකාපුත්‍රයෙනි, මැණියන් හමුයෙහි දී මෙසේ අසනලදි. සගය, සඤ්ජිකාපුත්‍රයෙනි, එක් කලෙකැ භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වාස කෙරෙති. එසඳ ගැබිලි වැ සිටි මා ගේ මව භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන. එකත්පස්වැ හුන් මා ගේ මව භගවත්හට මෙසේ කිවු : "වහන්ස, මා ගේ කුක්ෂිගත යම් කුමරෙක් හෝ කුමරියක් හෝ ඇද්ද, හේ බුදුන් සරණ කොට යෙයි, දහම් සරණ කොට යෙයි, බික්සඟන සරණ කොට යෙයි. භගවත්හු ඔහු අද පටන් කොට ප්‍රාණොපෙත සරණයගිය, උපාසකයකු කොට ධරත්ව"යි.

සගය සඤ්ජිකාපුත්‍රයෙනි, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මේ භග්ගජනපදයෙහි මැ සුංසුමාරගිර නුවර භෙසකලාවන නම් මුවළැවහි වාස කෙරෙති. එසඳ කිරිමව මා ඇකයෙන් වඩාගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ සිටගතු. එකත්පස් වැ සිටගත් මා ගේ උපමාතාව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කිවු යැ: වහන්ස, මේ බොධිරාජකුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යෙයි ධර්මය ද සරණ කොට යෙයි, බික්සඟන ද සරණ කොට යෙයි. භාග්‍ය වතුන් වහන්සේ අද පටන් ගෙන ඔහු ප්‍රාණෝපේතසරණය ගිය උපාසකයකු කොට ධරන සේක්ව"යි.

සගය සඤ්ජිකාපුත්‍රයෙනි, මෙසේ මම තුන් වන වට ද භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යෙමි, ධර්මය ද සඞ්ඝයා ද සරණ කොට යෙමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් කොට මා දිවිහිමියෙන් සරණගිය උපාසකයකු කොට ධරන සේක්ව"යි.

පස් වැනි බෝධිරාජකුමාරසූත්‍ර යි.

---

2. 4. 6

අඞ්ගුලිමාල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස විජිතෙ චොරො අඞ්ගුලිමාලො නාම හොති ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගාමාපි අගාමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා. සො මනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලං ධාරෙති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං[1] පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන චොරො අඞ්ගුලිමාලො තෙන'ද්ධානමග්ගං පටිපජ්ජි.

අද්දසංසු[2] ඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො[3] භගවන්තං යෙන චොරො අඞ්ගුලිමාලො තෙනද්ධානමග්ගං පටිපන්නං දිස්වාන භගවන්තං එතදවොචුං: මා සමණ, එතං මග්ගං පටිපජ්ජි, එතස්මිං සමණ, මග්ගෙ චොරො අඞ්ගුලිමාලො නාම ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගාමාපි අගාමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා. සො මනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලං ධාරෙති. එතං හි සමණ, මග්ගං දසපි පුරිසා වීසතිම්පි පුරිසා තිංසම්පි පුරිසා චත්තාරීසම්පි පුරිසා පඤ්ඤාසම්පි පුරිසා සංහරිත්වා සංහරිත්වා[4] පටිපජ්ජන්ති. තෙපි චොරස්ස අඞ්ගුලිමාලස්ස හත්ථත්ථඞ්ගච්ඡන්තී'ති[5]. එවං වුත්තෙ භගවා තුණ්හීභූතො අගමාසි.

දුතියම්පි ඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො[3] භගවන්තං එතදවොචුං: මා සමණ, එතං මග්ගං පටිපජ්ජි. එතස්මිං සමණ, මග්ගෙ-පෙ-හත්ථත්ථඞ්ගච්ඡන්තී'ති[5] දුතියම්පි ඛො භගවා තුණ්හීභූතො අගමාසි.

තතියම්පි ඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො[3] භගවන්තං එතදවොචුං: මා සමණ, එතං මග්ගං පටිපජ්ජි, එතස්මිං සමණ, මග්ගෙ චොරො අඞ්ගුලිමාලො නාම ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගාමාපි අගාමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා. සො මනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලං ධාරෙති. එතං සමණ, මග්ගං දසපි පුරිසා විසතිම්පි පුරිසා තිංසම්පි පුරිසා චත්තාරිසම්පි පුරිසා පඤ්ඤාසම්පි පුරිසා සංහරිත්වා සංහරිත්වා[4] පටිපජ්ජන්ති, තෙපි චොරස්ස අඞ්ගුලිමාලස්ස හත්ථත්ථඞ්ගච්ඡන්තී'ති.[5] තතියම්පි ඛො භගවා තුණ්හීභූතො අගමාසි.

---

1. සාවත්ථියං - සිමු
2. අද්දසාසුං - මජසං, සිමු, PTS
3. පධාවිනො - PTS, සයා.
4. සඞ්කරිත්වා සඞ්කරිත්වා - මජසං. / සඞ්ගරිත්වා සඞ්ගරිත්වා - සයා.
5. හත්ථත්තං ගච්ඡන්ති - සිමු. / හත්ථත්ථං ගච්ඡන්ති - මජසං, සයා, PTS.

Free Distribution www.aathaapi.org

2. 4. 6
අඞ්ගුලිමාල සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහු ගේ අරම්හි වැඩ වසන සේක. එකල පසේනදි කොසොල් රජහුගේ විජිතයෙහි අඟුල්මල් නම් සොරෙක් ඇත. (හේ) දරුණු ය. ලෙහෙ වැකුණු අත් ඇතියේ ය. මෙරමා පැහැරීම්හි හා මැරීම්හි බැස සිටියේ ය. සතුන් කෙරෙහි කරුණා නැත්තේ ය. උහු විසින් ගමුදු නො ගම් කරන ලද. නියම්ගමුදු නො නියම්ගම් කරන ලද. දනවුදු නො දනවු කරන ලදි. හේ මිනිසුන් මරමරා අඟුල්මල් ධරයි. එසඳ භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැත් නුවර පිඩු පිණිස වැඩිසේක. සැවැතෙහි පිඩු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් වැළකිසේක් සෙනසුන් සඟවා තබා අඟුල්මල් සොරු බලා අදන්මඟට පිළිපන් සේක.

ගවයන් රක්නාහු සියුපාවුන් රක්නාහු සීසහන්නාහු ගමන් යන්නාහු අඟුල්මල් සොර සිටුනා අදන්මඟට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ දුටහ. දැක භාග්‍යවතුන් වහන්සේට තෙල කීහු : ''මහණ ඒ මඟට නො යා, මහණ එමඟ අඟුල්මල් නම් සොරෙක, කැකුළු ය. ලෙහෙ මුසු අත් ඇත්තේ ය. පැහැරීම් මැරීම් දෙක්හි බැස සිටියේ ය. සතුන් කෙරෙහි කුළුණු නැතියේ ය. උහු විසින් ගම්හු දු නො ගම් කරන ලදහ, නියම්ගම්හුදු නො නියම්ගම් කරන ලදහ, දනවුහුදු නො දනවු කරන ලදහ. හේ මිනිසුන් මරමරා ඇඟිලි විද මාලා කොට ධරයි. මහණ, තෙල මඟට පුරුෂයෝ දස දෙනා දු විස්-තිස්-සතලිස්-පනස් දෙනා දු වග වග වැ යෙති. ඔහුදු අඟුල්මල් සොරහුගේ අතැ නස්ති''යි. මෙසේ කී කල්හි බුදුහු නො බැණ නැඟී වැඩියෝ.

දෙ වන වට ද ගෙරින් රක්නාහු සියුපාවුන් රක්නාහු සීසහන්නාහු ගමන් යන්නාහු භාග්‍යවතුන් වහන්සේට තෙල කීහු : ''මහණ, තෙල මඟට නො යා. මහණ, තෙල මඟ . . . අත්හි නසිති''යි. දෙ වන වට ද භාග්‍යවතුන් වහන්සේ නො බැණ නැඟී වැඩියෝ.

තුන් වන වට ද ගොන් රක්නාහු සියුපාවුන් රක්නාහු සහන්නාහු ගමන් යන්නාහු භාග්‍යවතුන් වහන්සේට තෙල කීහු : ''මහණ, තෙල මඟට නො යා. මහණ, තෙල මඟෙහි අඟුල්මල් නම් සොරෙක. කැකුළු ය, ලෙහෙ මුසු අත් ඇත්තේ ය, පැහැරීම් මැරීම්හි බැස සිටියේ ය, සතුන් කෙරෙහි දයා නැත්තේ ය. උහු විසින් ගම්හු නො ගම් කරන ලදහ, නියම්ගම්හු නො නියම්ගම් කරන ලදහ, දනවුහු නො දනවු කරන ලදහ. හේ මිනිසුන් මරමරා ඇඟිලි විදගෙන මාලා කොට ධරයි, මහණ, තෙල මඟට පුරුෂයෝ දස දෙනා දු විසි-තිස්-සතලිස්-පනස් දෙනා දු වග වග වැ යෙති. ඔහු දු අඟුල්මල් සොර අතැ නසිති''යි.

අද්දසා ඛො චොරො අඞ්ගුලිමාලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වානස්ස එතදහොසි: අච්ඡරියං වත භො අබ්භුතං වත භො. ඉමං හි මග්ගං දසපි පුරිසා, වීසතිම්පි පුරිසා, තිංසම්පි පුරිසා, චත්තාරීසම්පි පුරිසා, පඤ්ඤාසම්පි පුරිසා සංහරිත්වා සංහරිත්වා පටිපජ්ජන්ති, තෙපි මම හත්ථත්ථඞ්ගච්ඡන්ති. අථ ච පනායං සමණො එකො අදුතියො පසය්හ මඤ්ඤෙ ආගච්ඡති. යන්නූනාහං ඉමං සමණං ජීවිතා වොරොපෙය්‍ය'න්ති.

අථ ඛො චොරො අඞ්ගුලිමාලො අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි[1]. යථා චොරො අඞ්ගුලිමාලො භගවන්තං පකතියා ගච්ඡන්තං සබ්බථාමෙන ගච්ඡන්තො න සක්කොති සම්පාපුණිතුං. අථ ඛො චොරස්ස අඞ්ගුලිමාලස්ස එතදහොසි: අච්ඡරියං වත භො අබ්භුතං වත භො, අහං හි පුබ්බෙ හත්ථිම්පි ධාවන්තං අනුපතිත්වා ගණ්හාමි, අස්සම්පි ධාවන්තං අනුපතිත්වා ගණ්හාමි, රථම්පි ධාවන්තං අනුපතිත්වා ගණ්හාමි, මිගම්පි ධාවන්තං අනුපතිත්වා ගණ්හාමි. අථ ච පනාහං ඉමං සමණං පකතියා ගච්ඡන්තං සබ්බථාමෙන ගච්ඡන්තො න සක්කොමි සම්පාපුණිතු'න්ති ඨිතො භගවන්තං එතදවොච: තිට්ඨ සමණ, තිට්ඨ සමණාති. ඨිතො අහං අඞ්ගුලිමාල, ත්වඤ්ච තිට්ඨාති.

අථ ඛො චොරස්ස අඞ්ගුලිමාලස්ස එතදහොසි: ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සච්චවාදිනො සච්චපටිඤ්ඤා, අථ ච පනායං සමණො ගච්ඡංයෙව සමානො එවමාහ[2] ඨිතො අහං අඞ්ගුලිමාල, ත්වඤ්ච තිට්ඨා'ති. යන්නූනාහං ඉමං සමණං පුච්ඡෙය්‍ය'න්ති. අථ ඛො චොරො අඞ්ගුලිමාලො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

ගච්ඡං වදෙසි සමණ ඨිතොම්හි
මමඤ්ච බ්‍රූසි ඨිතං අට්ඨිතොති,
පුච්ඡාමි තං සමණ එතමත්ථං
කථං ඨිතො ත්වං අහමට්ඨිතොම්හී'ති?

ඨිතො අහං අඞ්ගුලිමාල සබ්බදා
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,
තුවඤ්ච පාණෙසු අසඤ්ඤතොසි
තස්මා ඨිතොහං තුවමට්ඨිතොසී'ති.

චිරස්සං වත මෙ මහිතො මහෙසි
මහාවනං සමණොයං පච්චුපාදි[3],
සොහං චිරස්සාපි පහස්සං[4] පාපං
සුත්වාන ගාථං තව ධම්මයුත්තං.

ඉච්චෙව චොරො අසිආවුධඤ්ච
සොබ්භෙ පපාතෙ නරකෙ අන්වකාරි[5],
අවන්දි චොරො සුගතස්ස පාදෙ
තත්ථෙව නං පබ්බජ්ජං අයාචි.

---

1. අභිසඞ්ඛාරෙසි - ස්‍යා. 2. ගච්ඡංයෙවාහ - මජසං, ස්‍යා, PTS.

3. මහාවනං පාපුණි සච්චවාදී - මජසං.
මහාවනං සමණ පච්චුපාදි - ස්‍යා.
මහාවනං සමණොයං පච්චවාදි PTS.

4. පහාය - මජසං. පජහිස්ස - ස්‍යා.
පහාස්සං - සිමු, PTS.

5. අකිරි - මජසං. අන්වකාරි - ස්‍යා.

අඟුල්මල් සොර වඩනා බුදුන් දුරදී මැ දුට, දැක උහුට තෙල සිත් වී : ''භවත්නි, ආශ්චර්‍ය්‍යයෙක් මැ ය, භවත්නි, අද්භූතයෙක් මැ ය. මේ මඟට පුරුෂයෝ දස දෙන ද විසි-තිස්-සතලිස්-පනස් දෙන ද වග වග වැ වදිත්. ඔහු ද මා අතැ නස්නාහ. වැළිත් මේ මහණ එකලා වැ අද්විතීය වැ අභිභවමින් මෙන් එයි. මම මේ මහණ දිවියෙන් තොර කෙරෙම් නම් මැනැවැ''යි.

එසඳ අඟුල්මල් සොර කඩුපළඟ ගෙන දුනුහියවුරු බැඳ බුදුන් පස් පස් ලුහුබැඳ ගියේ. එසඳ භාග්‍යවතුන් වහන්සේ යම්සේ අඟුල්මල් සොර පියවි ගමනින් වඩනා බුදුන් බල පමණින් දිවෙනුයේ හඹා නො ගත හේ ද, එබඳු අධිෂ්ඨානයක් කළෝ. එසඳ අඟුල්මල් සොරහට තෙල සිත් වී : ''භවත්නි, ආශ්චර්‍ය්‍ය මැ යැ, භවත්නි, අද්භූත මැ යි. මම පෙර දිවෙන ඇතු ද ලුහුබැඳ ගනිම් මැ ය. දිවෙන අසුදු ලුහුබැඳ ගනිම් මැ ය. දිවෙන රථ ද ලුහුබැඳ ගනිම් මැ ය. දිවෙන මුව ද ලුහුබැඳ ගනිම් මැ ය. එතෙකුදු වත් මේ මහණහු පියවිගමනින් යන්නාහු බල පමණින් දිවෙනුයෙම් හඹා නො ගත හෙමි''යි සිටීයේ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''සිට මහණ, සිට මහණැ''යි. අඟුල්මල, මම සිටියෙමි, තො ද සිට'යි වදාළහ.

එසඳ අඟුල්මල් සොරහට තෙල සිත් වී : ''මේ සැහැපුත් මහණහු සත්‍යවාදීහ. සත්‍යප්‍රතිඥ ඇතියහ. වැළිත් මේ මහණ යනුයේ මැ 'අඟුල්මල, මම සිටියෙමි, තො ද සිටැ'යි යෙයි, මම මේ මහණ පුළුවුස්නෙම් නම් මනා මැ තු යි. එ සඳ අඟුල්මල් සොර භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී :

''මහණ, යෙමින් සිටියෙමි'යි කියෙහි, සිටියා වූ මට ද නො සිටියෙහි''යි කියව. මහණ තෙල කරුණ තොප පුළුවුස්මි, තෙපි කෙසේ සිටියහු ද? මම් නො සිටියෙම් ද?යි.

අඟුල්මල, මම හැමද හැම සතුන් කෙරෙහි දඬු බැහැර තබා සිටියෙම් වෙමි. තෝ වනාහි සතුන් කෙරෙහි අසංයතයෙහි, එයින් මම සිටියෙම් වෙමි. තෝ නො සිටියෙහි යි.

දෙවිමිනිසුන් විසින් පූජිත මෙ මහර්ෂි මහණ බොහෝ කල් ඇවෑමෙන් මට වැඩ සඳහා මහවනයට වැඩියේ ය. මම තොප ගේ ධර්ම යුක්ත ගාථා අසා කල් ඇවෑමෙනුදු පව් හරනෙමි.

මෙසේ කියා මැ අඟුලුමල් සොර ඛඩ්ග හා තදන්‍ය ආයුධ අවට බුන් හෙබෙහි එක් පස බුන් ප්‍රපාතයෙහි පැළිගිය බිමෙහි හෙළාපි. (වෙනෙහි බැහී.) සොර සුගතයන් වහන්සේ ගේ පා වැන්දේ යැ. එහි දී මැ උන් වහන්සේ අතින් පැවිදි යැදී.

බුද්ධො ච ඛො කාරුණිකො මහෙසි
යො සත්ථා ලොකස්ස සදෙවකස්ස,
තමෙහි භික්ඛූති තදා අවොච
එසොව තස්ස අහු භික්ඛුභාවො'ති.

අථ ඛො භගවා ආයස්මතා අඞ්ගුලිමාලෙන පච්ඡාසමණෙන යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අන්තෙපුරද්වාරෙ මහාජනකායො සන්නිපතිත්වා උච්චාසද්දො මහාසද්දො හොති. චොරෙ තෙ දෙව, විජිතෙ අඞ්ගුලිමාලො නාම ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගාමාපි අගාමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා, සො මනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලං ධාරෙති. තං දෙවො පටිසෙධෙතූ'ති.

අථ ඛො රාජා පසෙනදි කොසලො පඤ්චමත්තෙහි අස්සසතෙහි සාවත්ථියා නික්ඛමි. දිවාදිවස්ස යෙනාරාමො තෙන පායාසි. යාවතිකා[1] යානස්ස භූමි, යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං පසෙනදිං කොසලං භගවා එතදවොච: කින්නු තෙ මහරජ, රාජා මාගධො සෙනියො බිම්බිසාරෙ කුපිතො, වෙසාලිකා වා ලිච්ඡවී, අඤ්ඤෙ වා පටිරාජානො'ති. න ඛො මෙ භන්තෙ, රාජා මාගධො සෙනියො බිම්බිසාරෙ කුපිතො, නපි වෙසාලිකා ලිච්ඡවී, නපි අඤ්ඤෙ පටිරාජානො. චොරෙ මෙ භන්තෙ, විජිතෙ අඞ්ගුලිමාලො නාම ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගාමාපි අගාමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා. සො මනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලං ධාරෙති. තාහං භන්තෙ පටිසෙධිස්සාමීති.

සචෙ පන ත්වං මහාරජ, අඞ්ගුලිමාලං පස්සෙය්‍යාසි කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතං, විරතං පාණාතිපාතා විරතං අදින්නාදානා විරතං මුසාවාදා එකභත්තිකං බ්‍රහ්මචාරිං සීලවන්තං කල්‍යාණධම්මං, කින්ති නං කරෙය්‍යාසීති? අභිවාදෙය්‍යාම වා මයං භන්තෙ, පච්චුට්ඨෙය්‍යාම වා ආසනෙන වා නිමන්තෙය්‍යාම අභිනිමන්තෙය්‍යාමපි නං චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි, ධම්මිකං වා අස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාම කුතො පනස්ස භන්තෙ, දුස්සීලස්ස පාපධම්මස්ස එවරූපො සීලසංයමො භවිස්සතීති? තෙන ඛො පන සමයෙන ආයස්මා අඞ්ගුලිමාලො භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො භගවා දක්ඛිණං බාහුං[2] පග්ගහෙත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච : එසො මහරජ, අඞ්ගුලිමාලො'ති.

---

1. යාවතිකො - PTS.
2. දක්ඛිණබාහං - PTS.

කාරුණික වූ සදෙවලොකයාගේ ශාස්තෘ වූ මහර්ෂි වූ බුදුහු ද එසඳ 'මහණ එ'යි උහුට වදළහ. තෙල බස් මැ උහුට භික්ෂුභාව වී.''

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භණ්ඩගාහක පසුමහණකු වූ ආයුෂ්මත් අඟුල්මල් තෙරුන් හා සැවැත්නුවර කරා චාරිකා කොට වැඩියෝ. පිළිවෙළින් සැරිසරමින් සැවැත් නුවර වැඩියෝ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති, එකල පසේනදි කොසොල් රජහු ගේ ගෙවත්දෙර මහජනයෝ රැස් වැ ''දෙවයන් වහන්ස, තොප ගේ රට අඟුල්මල් නම් සොරෙක, කැකුළු ය, ලෙහෙ මුසු අත් ඇත්තේ ය. පැහැරීම් මැරීම්හි බැස සිටියේ ය. සතුන් කෙරෙහි කුළුණු නැත්තේ ය. උහු විසින් ගම්හුදු නො ගම් කරන ලදහ, නියම්ගම්හුදු නො නියම්ගම් කරන ලදහ. දනවුහු දු නො දනවු කරන ලදහ. හේ මිනිසුන් මරමරා ඇඟිලි විද මාලා කොට ධරයි. දෙවයන් වහන්සේ ඒ සොර වළකාලන සේක්ව''යි උස්හඬ මහහඬ ඇති වැ ගුගුළෝ.

එසඳ පසේනදි කොසොල් රජ පන්සියක් මත් අසුන් සදගෙන සැවැත් නුවරින් නික්මියේ යැ. දෙවෙන්දවාලෙහි දෙව්රම කරා ගියේ. යානභූමි තාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් මැ බුදුන් කරා එළැඹියේ යැ. එළැඹ බුදුන් වැඳ එකත්පසෙක හින. එකත්පස් වැ හුන් පසේනදි කොසොල්රජහට බුදුහු තෙල කරුණ වදළහ : ''කිමෙක් ද මහරජ, තොපට මගධේශ්වර වූ සේනා බල ඇති බිම්සර මහරජ කිපියේ ද? විසල්පුර ලිච්ඡවීහු හෝ කිපියාහු ද? තදන්‍ය වූ හෝ විරුද්‍ධ රජ කෙනෙක් හෝ කිපියාහු ද?''යි. වහන්ස, මට මගධේශ්වර වූ සේනිය බිම්බිසාර මහරජ කිපියේ නො වෙයි, විසල්පුර ලිච්ඡවීහු ද නො ද කිපියාහු යැ. තදන්‍ය විරුද්‍ධ රජ කෙනෙක් නො ද කිපියහ. වහන්ස, මාගේ විජිතයෙහි අඟුල්මල් නම් සොරෙක, දරුණු යැ, ලෙහෙමුසු අත් ඇත්තේ යැ, පැහැරීම් මැරීම් දෙක්හි බැසගත්තේ යැ, සතුන් කෙරෙහි කුළුණු නැතියේ යි. උහු විසින් ගමුදු නො ගම් කරන ලද, නියම්ගමුදු නො නියම්ගම් කරනලද. දනවුදු නො දනවු කරන ලද. හේ මිනිසුන් මරමරා ඇඟිලි විද මාලා කොට ධරයි. වහන්ස, මම් උහු වළකාලම්'යි.

''මහරජ, ඉදින් තෙපි අඟුල්මල්සොර කෙහෙරවුළු බහා කසාවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සසුන් වැද පණිවායෙන් වෙන් වැ අයිනාදනින් වෙන් වැ මුසායෙන් වෙන් වැ එක්වේලේ වළඳනු වැ බඹසර ඇති වැ සිල්වත් වැ කලණදහම් ඇති වැ සිටියහු දක්නහු නම් ඔහට කුමක් කරන්නාහු ද?''යි. ''වහන්ස, අපි අභිවාදන හෝ කරම්හ, දැක හුනස්-නෙන් හෝ නැඟෙම්හ, අසුනින් හෝ පවරම්හ, ඔහු සිවුරු-පිඩුවා-සෙනසුන්-ගිලන්පස බෙහෙසත් පිරිකරිනුදු නිමන්ත්‍රණ කරම්හ, ඔහට ධාර්මික රක්ෂාවරණගොපන ද සංවිධාන කරම්හ. වහන්ස, මේ දුසිල් පව්වුසැහැවි ඇතියහුට මෙබඳු ශීලසංයමයෙක් කොයින් වන්නේ ද?''යි.

එසමයෙහි වනාහි ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි හුන්නාහු වෙති. එසඳ බුදුහු දකුණත නඟාගෙන පසේනදි කොසොල් රජහට තෙල බස් වදළහ : ''මහරජ තෙලෙ අඞ්ගුලිමාල යැ''යි.

අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අහුදෙව භයං අහු ඡම්භිතත්තං අහු ලොමහංසො. අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං භීතං සංවිග්ගං ලොමහට්ඨජාතං විදිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච: මා භායි මහාරාජ, මා භායි මහාරාජ, නත්ථි තෙ අතො භයන්ති. අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස යං අහොසි භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, සො පටිප්පස්සම්භි. අථ ඛො රාජා පසෙනදි කොසලො යෙනායස්මා අඞ්ගුලිමාලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං අඞ්ගුලිමාලං එතදවොච: අය්‍යො නො භන්තෙ, අඞ්ගුලිමාලොති? එවං මහාරාජාති. කථංගොත්තො භන්තෙ, අය්‍යස්ස පිතා, කථංගොත්තා මාතාති? ගග්ගො ඛො මහාරාජ, පිතා, මන්තානී මාතාති. අභිරමතු භන්තෙ, අය්‍යො ගග්ගො මන්තානීපුත්තො. අහමය්‍යස්ස ගග්ගස්ස මන්තානීපුත්තස්ස උස්සුක්කං කරිස්සාමි චීවර-පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති[1].

තෙන ඛො පන සමයෙන ආයස්මා අඞ්ගුලිමාලො ආරඤ්ඤකො හොති පිණ්ඩපාතිකො පංසුකූලිකො තෙචීවරිකො. අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො රාජානං පසෙනදිං කොසලං එතදවොච : අලං මහාරාජ, පරිපුණ්ණං මෙ තිචීවරන්ති.

අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන භගවා, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච : අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවඤ්චිදං භන්තෙ, භගවා අදන්තානං දමෙතා අසන්තානං[2] සමෙතා අපරිනිබ්බුතානං[3] පරිනිබ්බාපෙතා. යං හි මයං භන්තෙ, නාසක්ඛිම්හා දණ්ඩෙනපි සත්ථෙනපි දමෙතුං. සො භගවතා අදණ්ඩෙන අසත්ථෙනෙව[4] දන්තො. හන්ද ච දානි[5] මයං භන්තෙ, ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්වං මහාරාජ, කාලං මඤ්ඤසීති. අථ ඛො රාජා පසෙනදි කොසලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං[6] පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො ආයස්මා අඞ්ගුලිමාලො සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො අඤ්ඤතරං ඉත්ථිං මූළ්හගබ්භං විඝාතගබ්භං[7] දිස්වාන තස්ස එතදහොසි : කිලිස්සන්ති වත භො සත්තා, කිලිස්සන්ති වත භො සත්තා'ති. අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා අඞ්ගුලිමාලො භගවන්තං එතදවොච : ඉධාහං භන්තෙ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං[6] පිණ්ඩාය පාවිසිං, අද්දසං ඛො අහං භන්තෙ, සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො අඤ්ඤතරං ඉත්ථිං මූළ්හගබ්භං විඝාතගබ්භං[7] දිස්වාන මෙ එතදහොසි : කිලිස්සන්ති වත භො සත්තා, කිලිස්සන්ති වත භො සත්තා'ති.

---

1. පරික්ඛාරෙහීති - සීමු.
2. අසමෙන්තානං - සයා.
3. අප්පරිනිබ්බුතානං - සයා.
4. අසත්ථෙන - සයා.
5. හන්දදානි - සයා, PTS.
6. සාවත්ථියං - සීමු, මජසං.
7. විඝාතගබ්භං - PTS, සයා.

එසඳ පසේනදි කොසොල් රජහට බියෙක් වූයේ මැ යැ තැතිගැන්මෙක් වී. ලොමුදහ වී මැ යි. එසඳ බුදුහු බියපත් තැතිගත් ලොමුදහගත් පසේනදි කොසොල් රජහු දැන පසේනදි කොසොල් රජහට තෙල වදළහ : ''මහරජ, නහමක් බියව, තොපට උහුගෙන් බියෙක් නැතැ''යි. ඉක්බිති පසේනදි කොසොල් රජහට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදහගැන්මෙක් හෝ වී නම් ඒ සන්හින. ඉක්බිති පසේනදි කොසොල් රජ අඟුල්මල් තෙරණුවන් කරා එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවන්ට තෙල බස් කී : ''වහන්ස, අපගේ ආර්‍ය්‍ය වූ අඞ්ගුලිමාල තෙරණුවෝ ද?''යි. 'එසේ යැ මහරජැ'යි. වහන්ස, ආර්‍ය්‍යයන්ගේ පිය තෙම කෙබඳු ගෝත්‍ර ඇත්තේ ද? මව කෙබඳු ගොත්‍ර ඇත්තී ද?'යි. 'මහරජ, පියා ගර්ග නම, මව මන්තානී නමු'යි. වහන්ස, මන්තානී පුත්‍ර ආර්‍ය්‍යගර්ගයෝ සස්නෙහි අභිරමණ කෙරෙත්වා, මම මන්තානීපුත්‍ර ආර්‍ය්‍යගර්ගයනට සිවුරු-පිඩුවා-සෙනසුන්-ගිලන්පස බෙහෙසත් පිරිකරින් උත්සුක කරන්නෙමි' යි.

එසමයෙහි ආයුෂ්මත් අඞ්ගුලිමාල තෙරණුවෝ ආරණ්‍යකාඞ්ග ඇත්තාහු පිණ්ඩපාතිකාඞ්ග ඇත්තාහු පාංශුකූලිකාඞ්ග ඇත්තාහු තෙචීවරිකඞ්ග ඇත්තාහු වෙති. එසඳ අඟුල්මල් තෙරණුවෝ පසේනදි කොසොල්රජහට තෙල බස් කීහ : ''කම්නැත මහරජ, මට තුන්සිවුරු පරිපූර්ණ යැ''යි.

එසඳ පසේනදි කෙසොල් රජ බුදුන් කරා එළැඹියේ යැ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැල කෙළේ : ''වහන්ස, ආශ්චර්‍ය්‍ය යැ, වහන්ස අද්භූත යැ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අදාන්තයන් දමනය කරන සේක් මැ යැ, අශාන්තයන් ශමනය කරන සේක් මැ යැ, නො පිරිනිවියන් පිරිනිවන සේක් මැ යි. වහන්ස, අපි යමක්හු දඬිනුදු සැතිනුදු දමනය කරන්නට නො හැකි වූමෝ ද, හේ භාග්‍යවතුන් විසින් දඬ නැති වැ මැ සැත් නැති වැ මැ දමනය කරනලද. වහන්ස, දැන් අපි යම්හ, අපි බහුකෘත්‍ය බහු කරණී ඇතියම්හ'යි. 'මහරජ, තෙපි එයට කල් දැනැ'යි. එසඳ පසේනදි කෙසොල්රජ හුනස්නෙන් නැඟී බුදුන් වැඳ පැදකුණු කොට නික්ම ගියේ යි.

එසඳ ආයුෂ්මත් අඞ්ගුලිමාල තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැත් නුවරට පිඩු සිඟා වැඩියහ. ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඩු සිඟා වඩනාහු මූඪගර්භ වැ නො වැදිය හෙන එක්තරා මාගමක දුටහ. දැක උන් වහන්සේට තෙල සිත් උපන : ''භවත්නි, ඒකාන්තයෙන් සත්ත්වයෝ කෙලෙසෙති, භවත්නි, ඒකාන්තයෙන් සත්ත්වයෝ කෙලෙසෙති''යි. ඉක්බිති ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ සැවැත්නුවර පිඩු සිඟා වැඩ පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැත්තාහු බුදුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හුන්හ, එකත්පස් වැ හුන් ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කොළෝ : ''වහන්ස, මම් පෙරවරුයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඩු සිඟා යන්නෙම් මූඪගර්භ වැ නො වැදියහෙන එක්තරා මාගමක දිටිමි. දැක මට තෙල සිත් උපන : ''භවත්නි, ඒකාන්තයෙන් සත්ත්වයෝ කෙලෙසෙති, භවත්නි, ඒකාන්තයෙන් සත්ත්වයෝ කෙලෙසෙති''යි.

තෙන හි ත්වං අඞ්ගුලිමාල, යෙන සා ඉත්ථී[1] තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා තං ඉත්ථිං එවං වදෙහි: යතොහං භගිනි ජාතො[2] නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා. තෙන සච්චෙන සොත්ථි තෙ හොතු, සොත්ථි ගබ්භස්සා'ති. සො හි නූන මෙ භන්තෙ, සම්පජානමුසාවාදො භවිස්සති, මයා හි භන්තෙ, බහූ සඤ්චිච්ච පාණා ජීවිතා වොරොපිතාති.

තෙන හි ත්වං අඞ්ගුලිමාල, යෙන සා ඉත්ථී[1] තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා තං ඉත්ථිං එවං වදෙහි: යතොහං භගිනි, අරියාය ජාතියා ජාතො නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා. තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති. එවං භන්තෙති ඛො ආයස්මා අඞ්ගුලිමාලො භගවතො පටිස්සුත්වා යෙන සා ඉත්ථී[1], තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං ඉත්ථිං එතදවොච: යතොහං භගිනි, අරියාය ජාතියා ජාතො, නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා, තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති. අථ ඛො සොත්ථි ඉත්ථියා අහොසි[3] සොත්ථි ගබ්භස්ස.

අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා අඞ්ගුලිමාලො අරහතං අහොසි.

අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි, තෙන ඛො පන සමයෙන අඤ්ඤෙනපි ලෙඩ්ඩු ඛිත්තො ආයස්මතො අඞ්ගුලිමාලස්ස කායෙ නිපතති, අඤ්ඤෙනපි දණ්ඩො ඛිත්තො ආයස්මතො අඞ්ගුලිමාලස්ස කායෙ නිපතති, අඤ්ඤෙනපි සක්ඛරා ඛිත්තා ආයස්මතො අඞ්ගුලිමාලස්ස කායෙ නිපතති. අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො භින්නෙන සීසෙන ලොහිතෙන ගලන්තෙන භින්නෙන පත්තෙන විප්ඵාලිතාය[4] සඞ්ඝාටියා යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මන්තං අඞ්ගුලිමාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන ආයස්මන්තං අඞ්ගුලිමාලං එතදවොච: අධිවාසෙහි ත්වං බ්‍රාහ්මණ, අධිවාසෙහි ත්වං බ්‍රාහ්මණ, යස්ස ඛො ත්වං කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි නිරයෙ පච්චෙය්‍යාසි. තස්ස ත්වං බ්‍රාහ්මණ, කම්මස්ස විපාකං දිට්ඨෙව ධම්මෙ පටිසංවෙදෙසී'ති. අථ ඛො ආයස්මා අඞ්ගුලිමාලො රහොගතො පටිසල්ලීනො විමුත්තිසුඛපටිසංවෙදී තායං වෙලායං ඉමං උදානං උදානෙසි :

යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා.

---

1. සාවත්ථි - PTS. 2. ජාතියා ජාතො - සීමු.
3. අථ ඛ්වාස්සා ඉත්ථියා සොත්ථී අහොසි - සීමු, මජසං.
4. විප්ඵාරිතාය - සීමු.

අඟුල්මල, එසේ වී නම් තෙපි ඒ මාගම කරා එළැඹෙව, එළැඹ ඒ මාගමහට මෙසේ කියව : "නැඟැණියෙනි, මම් උපන් තැන් පටන් කොට දනැදනැ සතක්හු දිවියෙන් ගැළවූයෙම් නො දනිමි, එසයින් තිට සෙත්වේවා, ගබට සෙත් වේවා"යි. වහන්ස, හේ මට සම්පජාන මුසවා වෙයි, වහන්ස, මා විසින් බොහෝ සත්හු දනැදනැ දිවියෙන් ගළවනලදහ"යි.

අඟුල්මල, එසේ වී නම් තෙපි ඒ මාගම කරා එළැඹෙව, එළැඹ ඒ මාගමහට මෙසේ කියව : නැඟැණියෙනි, මම් යම් දවසෙකැ ආර්‍ය්‍යජාතියෙහි උපනෙම් ද එතැන් පටන් කොට දනැදනැ සතක්හු දිවියෙන් ගැළවූයෙම් නො දනිමි. එ සයින් තිට සෙත් වේවා ගබට සෙත් වේව"යි. 'එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ඒ මාගම කරා එළැඹියහ. එළැඹ ඒ මාගමහට තෙල බස් කිහු : "නැඟැණියෙනි, යම් දවසෙක මම් ආර්‍ය්‍යජාතියෙහි උපනෙම් ද, එතැන් පටන් කොට දනැදනැ සතක්හු දිවියෙන් ගැළවූයෙම් නො දනිමි, එ සයින් තිට සෙත් වේවා ගබට සෙත් වේව"යි. එසඳ මාගමහට සෙත් විය, ගබට සෙත් වී.

එසඳ ආයුෂ්මත් අඞ්ගුලිමාල තෙරණුවෝ එකලා වැ (වස්තුකාම ක්ලේශකාමයන් කෙරෙන් කයිනුදු සිතිනුදු) වෙන් වැ (කමටහන්හි) සිහි එළවා කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වාස කරන්නාහු නොබෝ කලෙකින් මැ යම් අර්හත්වයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම සස්නට වදිත් ද, එ අනුත්තර වූ බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසාන සඞ්ඛ්‍යාත අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තමා විසින් වෙසෙසින් දන ප්‍රත්‍යක්ෂ කොට උපයා වාස කළහ, 'ජාතිය ක්ෂය වූ යැ මහබඹසර වැස නිමවන ලද. කරණී කරනලද, මෙ රහත් බවට අන් කිසෙක් නැතැ'යි දතුවහ. ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ ද රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වූහු.

ඉක්බිති ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැත්නුවර පිඩු සිඟා වැඩියහ තවද එසමයෙහි අන් දෙසෙක්හිදු ලූ කැටපහණ ආයුෂ්මත් අඟුල්මල් තෙරුන්ගේ වෙරැ හෙයි. අන් දෙසෙක්හි දු ලූ දඬු ආයුෂ්මත් අඟුල්මල් තෙරුන් ගේ සිරුරෙහි හෙයි. අන් දෙසෙක්හි දු ලූ හකුරු (ගල්කැට) ආයුෂ්මත් අඟුල්මල් තෙරුන් ගේ කයෙහි හෙයි. එසඳ ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ බුන් හිසින්, ගලන ලෙහෙයෙන් , භග්න පාත්‍රයෙන්, හිරුණු සඟළසිවුරින් යුතු වැ බුදුන් කරා එළැඹියහ. බුදුහු දුරින් මැ එන ආයුෂ්මත් අඟුල්මල් තෙරුන් දුටහ, දැක ආයුෂ්මත් අඟුල්මල් තෙරුන්ට තෙල බස් වදළහ : "බ්‍රාහ්මණය, තෙපි අධිවාසනා කරව, (ඉවසව) බ්‍රාහ්මණය, තෙපි අධිවාසනා කරව. තෙපි යම් කර්මයක්හුගේ විපාකයෙන් නො එක් වර්ෂයන් නො එක් වර්ෂශතයන් නො එක් වර්ෂසහස්‍රයන් නිරැහි පැසෙන්නාහු ද, බ්‍රාහ්මණය තෙපි ඒ කර්මයාගේ විපාක මෙ අත්බැව්හි මැ විඳුනාහු යැ"යි. එසඳ ආයුෂ්මත් අඟුල්මල් තෙරණුවෝ රහොගත වැ විවික්ත වැ වැඩහිඳුනාහු ඵලසමවත් සුව විඳුමින් (එයින් නැඟී) එ වේලෙහි මේ උදන් හැනූ :

"යමෙක් පළමු පමා වැ සිට පසු වැ හේ නො පමා වේ ද, හෙතෙමේ අභ්‍ර හිමාදීන් මිදුණු සඳමඬල සෙයින් මෙලොව බබුළුවන්නේ යි.

යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථියති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා.

යො හවෙ දහරෙ භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා

දිසා හි මෙ ධම්මකථං සුණන්තු
දිසා හි මෙ යුඤ්ජන්තු බුද්ධසාසනෙ,
දිසා හි මෙ තෙ මනුජෙ[1] භජන්තු
යෙ ධම්මමෙවාදපයන්ති සන්තො.

දිසා හි මෙ ඛන්තිවාදානං[2] අවිරොධප්පසංසිනං,[3]
සුණන්තු ධම්මං කාලෙන තඤ්ච අනුවිධීයන්තු.

න හි ජාතු සො මමං හිංසෙ අඤ්ඤං වා පන කඤ්චනං[4],
පප්පුය්‍ය පරමං සන්තිං රක්ඛෙය්‍ය තසථාවරෙ

උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා.

දණ්ඩෙනෙකෙ දමයන්ති අඞ්කුසෙහි කසාහි ච,
අදණ්ඩෙන අසත්ථෙන අහං දන්තොම්හි තාදිනා.

අහිංසකොති මෙ නාමං හිංසකස්ස පුරෙ සතො,
අජ්ජාහං සච්චනාමොම්හි න නං හිංසාමි කඤ්චනං[5].

චොරො අහං පුරෙ ආසිං අඞ්ගුලිමාලොති විස්සුතො,
වුය්හමානො මහොඝෙන බුද්ධං සරණමාගමං.

ලොහිතපාණී පුරෙ ආසිං අඞ්ගුලිමාලොති විස්සුතො,
සරණාගමනං පස්ස භවනෙත්ති සමූහතා.

තාදිසං කම්මං කත්වාන බහුං[6] දුග්ගතිගාමිනං,
ඵුට්ඨො කම්මවිපාකෙන අනණො භුඤ්ජාමි භොජනං.

පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා,
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨංව රක්ඛති.

මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං.

---

1. මනුස්සා - සීමු. මනුජා - මජසං, සයා.
   මනුස්සෙ - PTS.
2. ඛන්තිවාදිනං - සයා.
3. අවිරොධප්පසංසනං - සයා, සංසිනං - මජසං.
4. කිඤ්චි නං - මජසං.
5. කඤ්චි නං - සීමු, PTS, සයා.
   කිඤ්චි නං - මජසං.
6. බහු - PTS.

යමක්හු විසින් කළ පව්කම් මාර්ගකුශලයෙන් වසාලනු ලැබේ ද, හේ අභ්‍ර (වලා) හිමාදීන් මිදුණු සඳමඬල සෙයින් මෙලොව බබුළුවන්නේ යි.

යම් දහර මහණෙක් බුද්ධශාසනයෙහි ඒකාන්තයෙන් තුන්දොරින් යුක්තප්‍රයුක්ත වැ වාස කෙරේ ද, හේ අභ්‍ර හිමාදියෙන් මිදුණු සඳමඬල සෙයින් මෙලොව බබුළුවන්නේ යි.

මා ගේ සතුරෝ චතුස්සත්‍යධර්මකථා අසත්වා, මා ගේ සතුරෝ බුද්ධශාසනයෙහි යුක්තප්‍රයුක්ත වෙත්වා ,මාගේ සතුරෝ යම් සත්පුරුෂ කෙනෙක් දහම් මැ සමාදන් කරවත් ද, ඒ මනුෂ්‍යයන් භජනය කෙරෙත්වා.

මා ගේ සතුරෝ ක්ෂාන්තිවාද ඇති මෛත්‍රීගුණ පසස්නා බුදුන්ගේ ක්ෂාන්තිමෛත්‍රීධර්මය ක්ෂණ ක්ෂණ සඞ්ඛ්‍යාත කාලයෙහි අසත්වා. ඒ දහම (අනුක්‍රියා විසින්) පුරත්වා.

මා ගේ ඒ සතුරා ඒකාන්තයෙන් මැ මට හිංසා නො කෙරේවා, අන් සතක්හට ද හිංසා නො කෙරේවා, පරමශාන්ති සඞ්ඛ්‍යාත නිවනට පැමිණ සතෘෂ්ණ නිස්තෘෂ්ණ සත්ත්වයන් රකීවා.

දියාළුවෝ දිය නිසි තැනට ගෙන යත්, ඊවඩුවෝ ඊ කැමැති සේ නමා සෘජු කෙරෙත්, වඩුවෝ දුව අභිමත සේ නමත්, පණ්ඩිතයෝ ආත්මය දමනය කෙරෙත්.

සමහර කෙනෙක් දඬුනුදු අකුස්සෙනුදු කසයෙනුදු දමනය කෙරෙති. මම දඬු නැති සැත් නැති තාදී වූ බුදුන් විසින් දමනය කරන ලදුයෙමි.

පෙර හිංසක වූ මට 'අහිංසක'යි නම් වී. දැන් මම සත්‍ය වූ (අහිංසක) නම් ඇතියෙමි. ඒ කිසිවක්හු නො පෙළමි.

පෙර මම 'අඞ්ගුලිමාල'යි ප්‍රසිද්ධ වූ සොර වීමි. අවිදු මහවතුරින් උසුලාගෙනයනු ලබනුයෙම් බුදුන් සරණ කොට පැමිණියෙමි.

පෙර මම 'අඟුල්මලැ'යි පසිදු ලෙහෙ වැකි අත් ඇතියෙම් වීමි. සරණාගමනඵල බලව, (මා විසින්) භවරජ්ජුව (සසරරැහැන්) නස්නා ලද.

දුගතියට යනසුලු එබඳු බොහෝ පව්කම් කොට (කම් පස්නා හෙයින්) කර්මවිපාක සඞ්ඛ්‍යාත මාර්ගචේතනා විසින් පහස්නා ලදුයෙම් කෙලෙස් ණය නැති වැ බොජුන් වළඳමි.

හිරණප්‍රඥ නැති බාලජනයෝ ප්‍රමාදයෙහි අනුයුක්ත වෙති, එතෙකුදු වත් නුවණැති පුරුෂ අප්‍රමාදය ශ්‍රේෂ්ඨධනයක් සෙයින් රකී.

නහමක් ප්‍රමාදයෙහි යෙදෙව, නහමක් කාමරතිසන්ථව කරව, යම් හෙයෙකින් අප්‍රමත්ත වැ ධ්‍යාන කරන්නේ විපුල සුව ලබා ද, එහෙයිනි.

සාගතං[1] නාපගතං නයිදං දුම්මන්තිතං මම,
සංවිභත්තෙසු[2] ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමං.

සාගතං[1] නාපගතං නයිදං දුම්මන්තිතං මම,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

අඞ්ගුලිමාලසුත්තං ඡට්ඨං.

---

1. ස්වාගතං - මජසං, සයා
2. සුවිභත්තෙසු - සයා.
   පවිභත්තෙසු - PTS.

මා ගේ මේ සස්නට ඊම ස්වාගත (මනා ඊමෙක්) වෙයි. නො මනා ඊමෙක් නො වෙයි. ('පැවිදිවෙමි'යි) නපුරු කොට සිතනලද නො වෙයි. (ලොව උපන්) සංවිභක්ත (විභාග කළ) දහම්හි යම් ශ්‍රේෂ්ඨ නිර්වාණයෙක් ඇද්ද, එය ලදිමි.

මා ගේ මේ ඊම ස්වාගත යැ, අපගත නො වෙයි. මා විසින් (පැවිදි වෙමි'යි) නො මනා කොට සිතනලද නො වෙයි. මා විසින් ත්‍රිවිද්‍යා ලබනලද. බුදුසසුන් (සසුන්හි කළයුතු කිස) කරන ලදි.

සවැනි අඞ්ගුලිමාල සූත්‍ර යි.

2. 4. 7

පියජාතික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස ගහපතිස්ස එකපුත්තකො පියො මනාපො කාලකතො[1] හොති. තස්ස කාලකිරියාය නෙව කම්මන්තා පටිභන්ති, න භත්තං පටිභාති. සො ආළාහනං[2] ගන්ත්වා ගන්ත්වා කන්දති කහං එකපුත්තක, කහං එකපුත්තකා'ති. අථ ඛො සො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං ගහපතිං භගවා එතදවොච: න ඛො තෙ ගහපති, සකෙ චිත්තෙ ඨිතස්ස ඉන්ද්‍රියානි, අත්ථි තෙ ඉන්ද්‍රියානං අඤ්ඤථත්ත'න්ති.

කිං හි මෙ භන්තෙ ඉන්ද්‍රියානං නාඤ්ඤථත්තං භවිස්සති? මය්හං හි භන්තෙ, එකපුත්තකො පියො මනාපො කාලකතො තස්ස කාලකිරියාය නෙව කම්මන්තා පටිභන්ති, න භත්තං පටිභාති. සොහං ආළාහනං[2] ගන්ත්වා ගන්ත්වා කන්දාමි කහං එකපුත්තක, කහං එකපුත්තකා'ති.

එවමෙව ගහපති, පියජාතිකා හි ගහපති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා'ති[3].

කිස්ස නු ඛො[4] නාමෙතං භන්තෙ, එවං භවිස්සති: පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා, පියජාතිකා හි ඛො භන්තෙ, ආනන්දසොමනස්සා පියප්පභවිකාති. අථ ඛො සො ගහපති භගවතො භාසිතං අනභිනන්දිත්වා පටික්කොසිත්වා[5] උට්ඨායාසනා පක්කාමි.

තෙන ඛො පන සමයෙන සම්බහුලා අක්ඛධුත්තා භගවතො අවිදූරෙ අක්ඛෙහි දිබ්බන්ති. අථ ඛො සො ගහපති යෙන තෙ අක්ඛධුත්තා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ අක්ඛධුත්තෙ එතදවොච: ඉධාහං භොන්තො, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා සමණං ගොතමං අභිවාදෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නං ඛො මං භොන්තො, සමණො ගොතමො එතදවොච: න ඛො තෙ ගහපති, සකෙ චිත්තෙ ඨිතස්ස ඉන්ද්‍රියානි අත්ථි තෙ ඉන්ද්‍රියානං අඤ්ඤථත්ත'න්ති. එවං වුත්තෙ අහං භොන්තො, සමණං ගොතමං එතදවොචං: කිං හි මෙ භන්තෙ, ඉන්ද්‍රියානං නාඤ්ඤථත්තං භවිස්සති, මය්හං හි භන්තෙ, එකපුත්තකො පියො මනාපො කාලකතො, තස්ස කාලකිරියාය නෙව කම්මන්තා පටිභන්ති, න භත්තං පටිභාති. සොහං ආළාහනං ගන්ත්වා ගන්ත්වා කන්දාමි: 'කහං එකපුත්තක, කහං එකපුත්තකා'ති. එවමෙතං ගහපති, එවමෙතං ගහපති, පියජාතිකා හි ගහපති, සොකපරිදෙවදුක්ඛදොමස්සුපායාසා පියප්පභවිකාති. කිස්ස[4] නු

---

1. කාලංකතො - මජසං. 2. ආළාහණං - සිමු.
3. පියප්පභූතිකාති - සභා.
4. කස්ස ඛො - මජසං, PTS. කස්ස ඛො - සභා.
5. අප්පටික්කොසිත්වා - සභා.

Free Distribution www.aathaapi.org

2. 4. 7
පියජාතික සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන නම් වූ අනේපිඩු සිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල එක්තරා ගැහැවියක්හුගේ ප්‍රියමනාප වූ එක් මැ පුත් කලුරිය කෙළේ වෙයි. ඔහුගේ කාලක්‍රියායෙන් කර්මාන්තයෝ නො මැ වටහත්. බත ද නො රුස්නේ යැ. හේ සොහොනට පුනපුනා ගොස් හඬයි : ''හා එක් මැ පුතැ කොහි යැ, හා එක් මැ පුතැ කොහි යැ''යි. ඉක්බිති ඒ ගැහැවි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ, භාග්‍යවතුන් වහන්සේ සකසා වැද එකත්පසෙක හින. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් ව හුන් ඒ ගැහැවිහට තෙල වදාළහ : ''ගැහැවිය, සවකීයචිත්තයෙහි සිටුනා තාගේ ඉඳුරෝ ඇත්තාහු නො වෙති, තාගේ ඉඳුරන්ගේ අන්‍යථාත්වයෙකි''යි.

වහන්ස, මා ඉඳුරන්ගේ අන්‍යථාත්වයෙක් කිම නො වේද? වහන්ස, මාගේ ප්‍රියමනාප වූ එක් මැ පුත් කලුරිය කෙළේ යැ. ඔහුගේ කාලක්‍රියායෙන් කර්මාන්තයෝ නො මැ වටහත්, බත නුරුස්නේ යැ, මම සොහොනට පුනපුනා ගොස් හඬමි : ''කොහි යැ හා! එක් මැ පුතැ, කොහි යැ හා!! එක් මැ පුතැ''යි.

ගැහැවිය, එසේ මැ යැ. ගැහැවිය, ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇතියහ.

වහන්ස, කුමට තෙල මෙසේ වේ ද? ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ කුමට ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇති වෙද්ද? කුමට ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇති වෙද්ද? වහන්ස, ආනන්ද-සෞමනස්‍යයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇතියහ''යි. ඉක්බිති ඒ ගැහැවි භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්‍දනා නො කොට පිළිකෙව් කොට බැස ගියේ.

එසමයෙහි බොහෝ දූකෙළින්නෝ භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි පසැටින් කෙළිත්. ඉක්බිති ඒ ගැහැවි ඒ අක්ෂධූර්තයන් කරා එළැඹියේ. එළැඹ ඒ අක්ෂධූර්තයනට තෙල කී : ''භවත්නි, මම මෙහි දී මහණ ගොයුම්හු කරා එළැඹියෙමි. එළැඹ මහණ ගොයුමන් සකසා වැද එකත්පසෙකැ හිනිමි. භවත්නි, එකත්පස් ව හුන් මට මහණ ගොයුම් තෙල කී : 'ගැහැවිය, සවකීය චිත්තයෙහි සිටුනා තාගේ ඉඳුරෝ ඇත්තාහු නො වෙති. තා ඉඳුරන්ගේ අන්‍යථාත්වයෙකැ'යි. භවත්නි, මම මෙසේ කී කල මහණ ගොයුම්හට තෙල කීමි : 'වහන්ස, මා ඉඳුරන්ගේ අන්‍යථාත්වයෙක් කිම නො වේ ද? වහන්ස, මා ගේ ප්‍රිය මනාප වූ එක් මැ පුත් කලුරිය කෙළේ. ඔහුගේ කාලක්‍රියායෙන් කර්මාන්තයෝ නො වටහත්, බත නුරුස්නේ යැ. මම සොහොනට පුනපුනා වැද හඬමි : ''කොහි යැ හා! එක් මැ පුතැ, කොහි යැ හා!! එක් මැ පුතැ'යි. ගැහැවිය, තෙල එසේ මැ යැ. ගැහැවිය, තෙල එසේ මැ යැ. ගැහැවිය, ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇතියහ'යි. වහන්ස, තෙල

ඛො නාමෙතං භන්තෙ, එවං භවිස්සති: පියජාතිකා සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා, පියජාතිකා හි ඛො භන්තෙ, ආනන්දසොමනස්සා පියප්පභවිකාති. අථ ඛ්වාහං[1] භොතො, සමණස්ස ගොතමස්ස භාසිතං අනභිනන්දිත්වා පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමි’න්ති.

එවමෙතං ගහපති, එවමෙතං ගහපති, පියජාතිකා හි ගහපති, ආනන්දසොමනස්සා පියප්පභවිකා’ති. අථ ඛො සො ගහපති, සමෙති මෙ අක්ඛධුත්තෙහීති පක්කාමි. අථ ඛො ඉදං කථාවත්ථුං අනුපුබ්බෙන රාජන්තෙපුරං පාවිසි.

අථ ඛො පසෙනදි කොසලො මල්ලිකං දෙවිං ආමන්තෙසි: ඉදන්තෙ මල්ලිකෙ, සමණෙන ගොතමෙන භාසිතං: ‘පියජාතිකා සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති.

සචෙ තං මහාරාජ, භගවතා භාසිතං, එවමෙතන්ති.

එවමෙවං පනායං මල්ලිකා යඤ්ඤදෙව සමණො ගොතමො භාසති තං තදෙවස්ස අබ්භනුමොදති. සචෙ තං මහාරාජ, භගවතා භාසිතං එවමෙත’න්ති. සෙය්‍යථාපි නාම ආචරියො යඤ්ඤදෙව අන්තෙවාසිස්ස[2] භාසති, තං තදෙවස්ස අන්තෙවාසී අබ්භනුමොදති: එවමෙතං ආචරිය එවමෙතං ආචරියාති. එවමෙවං ඛො ත්වං මල්ලිකෙ, යඤ්ඤදෙව සමණො ගොතමො භාසති. තං තදෙවස්ස අබ්භනුමොදසි. සචෙ තං මහාරාජ, භගවතා භාසිතං එවමෙත’න්ති. චර පරෙ[3] මල්ලිකෙ, විනස්සාති.

අථ ඛො මල්ලිකා දෙවි නාළිජඞ්ඝං බ්‍රාහ්මණං ආමන්තෙසි: එහි ත්වං බ්‍රාහ්මණ, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: ‘මල්ලිකා භන්තෙ, දෙවි භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී’ති. එවඤ්ච වදෙහි: “භාසිතා නු ඛො භන්තෙ, භගවතා එසා වාචා: පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති. යථා ච තෙ භගවා ව්‍යාකරෙති, තථා තං සාධුකං උග්ගහෙත්වා මමං ආරොචෙය්‍යාසි. න හි තථාගතා විතථං භණන්ති”ති. එවං භොතීති ඛො නාළිජඞ්ඝො බ්‍රාහ්මණො මල්ලිකාය දෙවියා පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං විතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො නාළිජඞ්ඝො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: ‘මල්ලිකා භො ගොතම, දෙවි භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: “භාසිතා නු ඛො භන්තෙ, භගවතා එසා වාචා පියජාතිකා සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා”ති.

---

1. අථ ඛොහං - ස්‍යා.
2. අන්තෙවාසිං - සිමු.
3. චර පි රෙ - PTS.

මෙසේ කුමට නම් වේ ද? ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ කුමට ප්‍රිය දයින් උපදනා සැහැවි ඇති වෙද්ද? කුමට ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇති වෙද්ද? වහන්ස, ආනන්‍ද-සෞමනස්‍යයෝ නම් ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ'යි. භවත්නි, එසඳ මම මහණ ගොයුම්හු ගේ භාෂිතය අභිනන්‍දන නො කොට පිළිකෙව් කොට හුනස්නෙන් නැඟී බැස ගියෙමි.

'ගැහැවිය, තෙල එසේ මැ යැ, ගැහැවිය, තෙල එසේ මැ යැ. ගැහැවිය, ආනන්‍ද-සෞමනස්‍යයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ. ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ'යි. ඉක්බිති ඒ ගැහැවි මා අදහස් අක්ෂධූර්තයන් හා එකතු වෙති'යි නික්ම ගියේ. එසඳ මේ කථාවස්තුව ක්‍රමයෙන් රාජාන්තඃපුරය කරා ගියේ.

ඉක්බිති පසේනදි කොසොල්රජ මල්ලිකා දේවිය ඇමැති : "මල්ලිකාවෙනි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් මෙ බස් පැවැසිණ: ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ"යි

මහරජ, ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය වදරන ලද නම් තෙල එසේ මැ යැ යි.

මෙසේ මැ මේ මල්ලිකා දේවි මහණ ගොයුම්හු යම් මැ දයක් කියත් නම් එය මැ අනුමෝදන් වෙයි : "ඉදින් මහරජ, ඒ භාග්‍යවතුන් විසින් වදරන ලද නම් තෙල එසේ මැ යැ"යි. යම්සේ ආචාර්‍ය්‍ය කෙනෙක් අතැවැසියක්හට යම් මැ දයක් කියද්ද, අතැවැසි තෙල එසේ මැ යැ ආචාර්‍ය්‍යයෙනි, තෙල එසේ මැ යැ ආචාර්‍ය්‍යයෙනි"යි එය මැ අනුමෝදන් වේ ද, එසෙයින් මැ මල්ලිකාවෙනි, තෙපි මහණ ගොයුම්හු යම් මැ දයක් කියද්ද, 'ඉදින් මහරජ, භාග්‍යවතුන් විසින් ඒ වදරන ලද නම් තෙල එසේ මැ යැ'යි එය මැ අනුමෝදන් වව. මල්ලිකා, නො පැනී පහව යා"යි.

එසඳ මල්ලිකා දේවි නාළිජඞ්ඝ නම් බමුණු ඇමැතූ : "බමුණ, එව තෙපි භාග්‍යවතුන් කරා එළැඹෙව, එළැඹ මා ගේ බසින් භාග්‍යවතුන්ගේ පාසඟළ මුදුනින් වඳුව, ආරෝග්‍යය නිදුක් බව සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුස්ව : "වහන්ස, මල්ලිකා දේවි භාග්‍යවතුන් වහන්සේගේ පාසඟළ මුදුනින් වඳියි, අරෝගබව නිදුක්බව සිරුරෙහි සැහැල්ලුබව කායබලය පහසුවිහරණ පුළුවුයි"යයි. මෙසේත් කියව : "වහන්ස, භාග්‍යවතුන් විසින් 'ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රියදයින් උපදනාහ, ප්‍රියදයින් උපදනා සැහැවි ඇතියහ, යන තෙල බස් වදරනලද ද?"යි. බුදුහු යම්සේ තොපට පවසත් ද, එය එසේ මනාකොට උගෙන මට දන්ව, තථාගතයෝ මුසා නො මැ බෙණෙති"යි. 'එසේ යැ භවත්නි'යි නාළිජඞ්ඝ බමුණු මල්ලිකාදේවියට පිළිවදන් අස්වා භාග්‍යවතුන් කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය, සතුටු විය යුතු කලතුරුහි සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හින. එකත්පස් වැ හුන් නාළිජඞ්ඝ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැළ කෙළේ : භවත් ගෞතමයන් වහන්ස, මල්ලිකාදේවි භවත් ගෞතමයන්ගේ පාසඟළ සිරසින් වඳියි. අරෝග බව නිදුක් බව කයෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුයි. මෙසේත් කියයි : "වහන්ස, භාග්‍යවතුන් විසින් 'ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනාහ, ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ' යන තෙල බස් වදරන ලද ද?"යි.

එවමෙතං බ්‍රාහ්මණ, එවමෙතං බ්‍රාහ්මණ, පියජාතිකා හි බො බ්‍රාහ්මණ, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකාති.

තදමිනාපෙතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං: ‘යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති. භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්සා[1] ඉත්ථියා මාතා කාලමකාසි. සා තස්සා කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය[2] රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ මාතරං අද්දසථ[3] අපි මෙ මාතරං අද්දසථා’ති?

ඉමිනාපි බො එතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං : යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකාති. භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්සා[1] ඉත්ථියා පිතා කාලමකාසි -පෙ- භාතා කාලමකාසි, -පෙ- භගිනී කාලමකාසි -පෙ- පුත්තො කාලමකාසි -පෙ- ධීතා කාලමකාසි -පෙ- සාමිකො කාලමකාසි. සා තස්ස කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය[2] රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ සාමිකං අද්දසථ, අපි මෙ සාමිකං අද්දසථා’ති?

ඉමිනාපි බො එතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං: ‘යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති. භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්ස පුරිසස්ස මාතා කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය[2] රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ මාතරං අද්දසථ, අපි මෙ මාතරං අද්දසථා’ති?

ඉමිනාපි බො එතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං: යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති. භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්ස පුරිසස්ස පිතා කාලමකාසි. -පෙ-භාතා කාලමකාසි-පෙ-භගිනී කාලමකාසි-පෙ-පුත්තො කාලමකාසි -පෙ-ධීතා කාලමකාසි-පෙ-පජාපති කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය[2] රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ පජාපතිං අද්දසථ, අපි මෙ පජාපතිං අද්දසථා’ති?

ඉමිනාපි බො එතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං: ‘යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා’ති. භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරා ඉත්ථී ඤාතිකුලං අගමාසි. තස්සා තෙ ඤාතකා සාමිකා[4] අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා, සා ච තං න ඉච්ඡති. අථ ඛො සා ඉත්ථී[5] සාමිකං එතදවොච: ‘ඉමෙ මං[6] අය්‍යපුත්ත, ඤාතකා තයා[7] අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා අහඤ්ච

---

1. අඤ්ඤතරිස්සා - මජ්ඣං.
2. රථිකාය රථිකං - මජ්ඣං. රථියා රථියං - සිමු.
3. අදස්සථ - සයා. අද්දස්සථ - මජ්ඣං.
4. සාමිකං - සිමු, මජ්ඣං, සයා, PTS.
5. සාවත්ථි - PTS.
6. මම - සයා, මමං - PTS.
7. තං - සිමු, සයා, PTS. ත්වං - මජ්ඣං.

'බමුණ, තෙල එසේ යැ, බමුණ, තෙල එසේ යි. බමුණ, ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය උපායාසයෝ ප්‍රිය දයින් උපදනාහ, ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ'යි.

බමුණ, 'ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් මැ උපදනාහ, ප්‍රිය දයින් මැ උපදනා සැහැවි ඇතියහ, යන තෙල කාරණය මෙ කරුණිනුදු දත යුතු : 'බමුණ, පෙර මෙ මැ සැවැත්නුවර එක්තරා මාගමක්හුගේ මව කලුරිය කළා. හෝ ඇයගේ කලුරිය කිරීමෙන් උමතු වූවා වික්ෂිප්ත සිත් ඇත්තී වීථියෙන් වීථියට චතුෂ්කයෙන් චතුෂ්කයට එළැඹ : ''මාගේ මව දුටුහු ද, මා ගේ මව දුටුහු ද?''යි මෙසේ කියයි.

බමුණ, 'ශෝක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් මැ උපදනාහ, ප්‍රිය දයින් මැ උපදනා සැහැවි ඇතියහ' යන තෙල කාරණය මෙ කරුණිනුදු දතයුතු. ''බමුණ, පෙර මෙ මැ සැවැත්නුවර එක්තරා මාගමක ගේ පියා කලුරිය කෙළේ. . . . බෑයා කලුරිය කෙළේ. . . . බූනැණියෝ කලුරිය කළ . . . . . පුත් කලුරිය කෙළේ . . . . දූ කලුරිය කළා. . . හිමි කලුරිය කෙළේ. හෝ ඔහු කලුරිය කිරීමෙන් උමතු වූවා වික්ෂිප්ත වූවා වීථියෙන් වීථියට චතුෂ්කයෙන් චතුෂ්කයට එළැඹ 'මා හිමියා දුටුහු ද, මා හිමියා දුටුහු ද?'යි මෙසේ කියයි.

බමුණ, ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ පිය දයින් උපදනාසේ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇති සේ මෙ කරුණිනුදු දතයුතු : බමුණ පෙර මෙ මැ සැවැත්නුවර අන්‍යතර පුරුෂයක්හුගේ මව කලුරිය කළා. හේ ඇයගේ කලුරිය කිරීමෙන් උමතු වූයේ වික්ෂිප්ත සිත් ඇත්තේ වීථියෙන් වීථියට චතුෂ්කයෙන් චතුෂ්කයට එළැඹ මෙසේ කියයි : ''මා ගේ මව දුටුහු ද, මා ගේ මව දුටුහු ද?''යි.

බමුණ, 'ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ යම් පරිදි, ප්‍රිය දයින් උපදනා සැහැවි ඇති වෙද්ද, ප්‍රිය දයින් පහළවන සැහැවි ඇති වෙද්ද' තෙල කරුණ මෙ කරුණිනුදු දතයුතු යැ. බමුණ පෙර වූ දයක් කියමි : මෙ සැවැත්හි මැ එක්තරා පුරුෂයක්හු ගේ පියේ කලුරිය කෙළේ යි . . . සෙහොවුරු කලුරිය කෙළේ. . . . බුහුන කලුරිය කළා. . . . පුත් කලුරිය කෙළේ . . . දුව කලුරිය කළා . . . බිරිය කලුරිය කළා. හේ ඇය කලුරිය කිරීමෙන් උමතු වැ වික්ෂිප්තචිත්ත වැ වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට එළැඹ මෙසේ කී : 'කිම, මා බිරිය දක්නාව? කිම, මා බිරිය දක්නාව'යි?

බමුණ, 'යම් පරිදි ශොක-පරිදෙව -දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇති වෙද්ද, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇති වෙද්ද' තෙල මෙ කරුණිනුදු දතයුතු යැ. බමුණ, වූ වීරි දයෙකි : මෙ සැවැත්නුවර මැ අන්‍යතර ස්ත්‍රියක් නෑකුලන් කරා ගියා. ඇයගේ ඒ නෑයෝ හිමියා කෙරෙන් පැහැර ගෙන අනෙකක්හට දෙනු කැමැති වූහු. ඕ ද එ ය තුරුස්නී වෙයි. ඉක්බිති ඒ ස්ත්‍රී හිමියාට තෙල කිවු: හිමියපුත, මේ නෑයෝ තොප කෙරෙන් මා බැහැර කොට අනෙකක්හට දෙනු කැමැතියහ, මම ද එය තුරුස්නමු.

තං න ඉච්ඡාමී'ති. අථ ඛො සො පුරිසො තං ඉත්ථිං ද්විධා ඡෙත්වා අත්තානං ඔපාදෙසි[1], 'උභො පෙච්ච භවිස්සාමා'ති. ඉමිනාපි ඛො එතං බ්‍රාහ්මණ, පරියායෙන වෙදිතබ්බං: 'යථා පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, පියප්පභවිකා'ති.

අථ ඛො නාළිජඞ්ඝො බ්‍රාහ්මණො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන මල්ලිකා දෙවී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා යාවතකො අහොසි භගවතා සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං මල්ලිකාය දෙවියා ආරොචෙසි. අථ ඛො මල්ලිකා දෙවී යෙන රාජා පසෙනදි කොසලො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච:

තං කිං මඤ්ඤසි මහාරාජ, පියා තෙ වජිරී කුමාරීති?

එවං මල්ලිකෙ, පියා මෙ වජිරී කුමාරීති.

තං කිං මඤ්ඤසි මහාරාජ, වජිරියා තෙ කුමාරියා විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති?

වජිරියා මෙ මල්ලිකෙ, කුමාරියා විපරිණාමඤ්ඤථාභාවා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං, කිම්පන මෙ න උප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති?

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, පියා තෙ වාසභා ඛත්තියාති[2]?

එවං මල්ලිකෙ, පියා මෙ වාසභා ඛත්තියාති.[2]

තං කිං මඤ්ඤසි මහාරාජ, වාසභාය තෙ ඛත්තියාය විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති?

වාසභාය මෙ මල්ලිකෙ, ඛත්තියාය විපරිණාමඤ්ඤථාභාවා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං, කිං පන මෙ න උප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'පියජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා පියප්පභවිකා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, පියො තෙ විඩූඩභො[3] සෙනාපතී'ති?

එවං මල්ලිකෙ, පියො මෙ විඩූඩභො සෙනාපතී'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, විඩූඩභස්ස තෙ සෙනාපතිස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති?

---

1. {උප්ඵාලෙසි - මජසං, සයා. / උප්පාටෙසි - සිමු, PTS.}
2. වාසභඛත්තියාති - සයා.
3. විටටූභො මජසං.

ඉක්බිති ඒ පුරුෂයා ඒ ස්ත්‍රිය දෙකඩ කොට සිද තමා (කඩුවෙන් පළා) හෙළි. දෙදෙනාමෝ පරලොව එක්වම්හ'යි. බමුණ, යම් පරිදි ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇති වෙද්ද, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇති වෙද්ද, මෙල කරුණ මෙ කරුණිනුදු දතයුතු ය.

ඉක්බිති නාළිජඞ්ඝ බමුණු භාග්‍යවතුන් වහන්සේගේ බස සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී මල්ලිකාදේවිය කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග යම් තාක් කථාසල්ලාප වී ද එ හැම මල්ලිකාදේවියට කී : එසඳ මල්ලිකාදේවි පසේනදි කොසොල්රජු කරා එළැඹියා. එළැඹ පසේනදි කොසොල් රජුට මෙල බස් කිවු :

"මහරජ, ඒ කෙසේ හඟිහි? තොපට වජිරී කුමරි ප්‍රිය වේ ද? යි.

මල්ලිකාවෙනි, එසේ යැ, වජිරී කුමරිය මට ප්‍රිය වෙයි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපගේ වජිරී කුමරියගේ (මරණයෙන්) වන විපරිණාමය හා (පැනයැම වන) අන්‍යථාභාවයෙන් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ උපදිත් ද?

මල්ලිකාවෙනි, මා ගේ වජිරීකුමරියගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ජීවිතයාගේත් අන්‍යථාත්වයෙක් වෙයි. කිම, මට ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ නූපදිත් ද? (උපදිත් මැ යි.)

මහරජ, 'ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇතියහ' යනු මෙ කරුණ සඳහා සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලදි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපට වාසභා නම් කැතදු ප්‍රිය වේ ද?

මල්ලිකාවෙනි, එසේ යැ. මට වාසභා කැතදුව ප්‍රිය යැ.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපගේ වාසභා කැතදුව පිළිබඳ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ උපදිත් ද,

මල්ලිකාවෙනි, මා ගේ වාසභා කැතදුව පිළිබඳ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ජීවිතයාගේත් අන්‍යථාත්වයෙක් වෙයි. කිම, මට ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ නූපදිත් ද? (උපදිත් මැ යි.)

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ විසින් 'ශෝක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ ප්‍රිය දූයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දූයින් පහළ වන සැහැවි ඇතියහ' යනු මෙ කරුණ සඳහා වදරන ලදි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපට විඩූඩභ සෙන්පති ප්‍රිය වේ ද?

මල්ලිකාවෙනි, එසේ යැ. මට විඩූඩභ සෙන්පති ප්‍රිය වෙයි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපගේ විඩූඩභ සෙන්පතිහු ගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ උපදිත් ද?

විඩූඩභස්ස මෙ මල්ලිකෙ, සෙනාපතිස්ස විපරිණාමඤ්ඤථාභාවා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං. කිං පන මෙ න උප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති?

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'පියජාතිකා සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා පියප්පභවිකා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, පියා තෙ අහන්ති?

එවං මල්ලිකෙ, පියා මෙසි ත්වන්ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, මය්හං තෙ විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති?

තුය්හං හි මෙ මල්ලිකෙ, විපරිණාමඤ්ඤථාභාවා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං. කිං පන මෙ න උප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොම-නස්සුපායාසා'ති?

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'පියජාතිකා සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා පියප්පභවිකා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, පියා තෙ කාසිකොසලා'ති?

එවං මල්ලිකෙ, පියා මෙ කාසිකොසලා. කාසිකොසලානං මල්ලිකෙ, අනුභාවෙන කාසිකොසලං කාසිකචන්දනං පච්චනුභොම, මාලාගන්ධ-විලෙපනං ධාරෙමා'ති.

තං කිං මඤ්ඤසි මහාරාජ, කාසිකොසලානං තෙ විපරිණාමඤ්ඤථා-භාවා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා'ති?

කාසිකොසලානං හි මෙ මල්ලිකෙ, විපරිණාමඤ්ඤථාභාවා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං. කිං පන මෙ න උප්පජ්ජිස්සන්ති සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා'ති.

ඉදං ඛො තං මහාරාජ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සන්ධාය භාසිතං: 'පියජාතිකා සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා පියප්පභවිකා'ති.

අච්ඡරියං මල්ලිකෙ, අබ්භුතං මල්ලිකෙ, යාවඤ්ච සො භගවා පඤ්ඤාය අතිවිජ්ඣ මඤ්ඤෙ[1] පස්සති. එහි මල්ලිකෙ, ආචාමෙහීති[2]

අථ ඛො රාජා පසෙනදි කොසලො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: 'නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්සා'ති.

පියජාතිකසුත්තං සත්තමං.

---

1 අතිවිජ්ඣ පඤ්ඤාය - PTS.

2. ආචමෙහීති - මජ්සං.

මල්ලිකාවෙනි, මා ගේ විඩූඩභ සෙන්පතිහු ගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ජීවිතයාගේත් අන්‍යථාත්වයෙක් වෙයි. කිම, මට ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ නූපදිත් ද? (උපදිත් මැ යි)

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ විසින් 'ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ' යනු මෙ කරුණ සඳහා වදරනලද.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපට මා ප්‍රිය වේ ද?

මල්ලිකාවෙනි, එසේ යැ. තෝ මට ප්‍රියහු යැ.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොප සතු මා ගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ උපදිත් ද?

මල්ලිකාවෙනි, මා සතු තොප ගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ජීවිතයා ගේ ත් අන්‍යථාත්වයෙක් වෙයි. කිම, මට ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ නූපදිත් ද? (උපදිත් මැ යි.)

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ විසින් 'ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ' යනු මෙ කරුණ සඳහා වදරනලදි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොපට කසිකොසොල් දනව්වැස්සෝ ප්‍රිය වෙත් ද?

මල්ලිකාවෙනි, එසේ යැ, මට කසිකොසොල් දනව්වැස්සෝ ප්‍රිය වෙති. මල්ලිකාවෙනි, කසිකොසොල් වැසියන් ගේ අනුභාවයෙන් කසිකොසොල් කාශිකචන්දන වළඳ කරම්හ, මල්ගඳ විලෙවුන් ධරම්හ'යි.

මහරජ, ඒ කෙසේ හඟිහි? තොප සතු කාශිකොශලයන් ගේ විපරිණාමය හා අන්‍යථාභාවයෙන් ශෝක-පරිදේව-දුඃඛ-දොම්නාස්‍ය-උපායාසයෝ උපදිත් ද?

මල්ලිකාවෙනි, මා සතු කාශිකොශලයන් ගේ විපරිණාමයෙන් හා අන්‍යථාභාවයෙන් ජීවිතයා ගේ ත් අන්‍යථාත්වයෙක් වෙයි. කිම, මට ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ නූපදිත් ද? (උපදිත් මැ යි.)

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ විසින් 'ශෝක-පරිදේව-දුඃඛ-දොම්නස්‍ය-උපායාසයෝ ප්‍රිය දයින් උපදනා සැහැවි ඇතියහ, ප්‍රිය දයින් පහළ වන සැහැවි ඇතියහ' යනු මෙ කරුණ සඳහා වදරනලදි.

මල්ලිකාවෙනි, අසිරි යැ, මල්ලිකාවෙනි, අද්භූත යැ. ඒ භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥයෙන් විනිවිදගත් සෙයින් දක්නාසේක් මැ යැ. මල්ලිකාව, එව, (මුව) දෝනා දිය දෙව'යි.

එසඳ පසේනදි කොසොල්රජ හුනස්නෙන් නැඟී උත්තරාසඞ්ගය එකස් කොට බඟා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇදිලි බැඳ තෙව්ටක් උදන් ඇනි : 'ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා! ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා!! ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා!!!'යි.

සත් වැනි පියජාතිකසූත්‍ර යි.

2. 4. 8
බාහිතික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං[1] පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො, යෙන පුබ්බාරාමො මිගාරමාතු[2] පාසාදො තෙනුපසඞ්කමි දිවාවිහාරාය.

තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො එකපුණ්ඩරීකං නාගං අභිරූහිත්වා සාවත්ථියා නිය්‍යාසි දිවාදිවස්ස. අද්දසා ඛො රාජා පසෙනදි කොසලො ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සිරිවඩ්ඪං මහාමත්තං ආමන්තෙසි: 'ආයස්මා නු ඛො එසො සම්ම සිරිවඩ්ඪ, ආනන්දො'ති? එවං මහාරාජ, ආයස්මා එසො ආනන්දො'ති. අථ ඛො රාජා පසෙනදි කොසලො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: 'එහි ත්වං අම්භො පුරිස, යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දාහි: රාජා භන්තෙ, පසෙනදි කොසලො ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දති'ති.[3] එවඤ්ච වදෙහි[4]: 'සචෙ කිර භන්තෙ, ආයස්මතො ආනන්දස්ස න කිඤ්චි අච්චායිකං කරණීයං, ආගමෙතු කිර භන්තෙ, ආයස්මා ආනන්දො මුහුත්තං අනුකම්පං උපාදායා'ති. එවං දෙවාති ඛො සො පුරිසො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො පුරිසො ආයස්මන්තං ආනන්දං එතදවොච: "රාජා භන්තෙ, පසෙනදි කොසලො ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති: 'සචෙ කිර භන්තෙ, ආයස්මතො ආනන්දස්ස න කිඤ්චි අච්චායිකං කරණීයං, ආගමෙතු කිර භන්තෙ, ආයස්මා ආනන්දො මුහුත්තං අනුකම්පං උපාදායා'"ති. අධිවාසෙසි ඛො ආයස්මා ආනන්දො තුණ්හීභාවෙන.

අථ ඛො රාජා පසෙනදි කොසලො යාවතිකා නාගස්ස භූමි, නාගෙන ගන්ත්වා නාගා පච්චොරොහිත්වා පත්තිකොව යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො රාජා පසෙනදි කොසලො ආයස්මන්තං ආනන්දං එතදවොච: 'සචෙ භන්තෙ, ආයස්මතො ආනන්දස්ස න කිඤ්චි අච්චායිකං කරණීයං, සාධු භන්තෙ, ආයස්මා ආනන්දො යෙන අචිරවතියා නදියා තීරං, තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි ඛො ආයස්මා ආනන්දො තුණ්හීභාවෙන.

1. සාවත්ථියං – සීමු, මජසං.
2. මිගාරමාතුයා – ස්‍යා.
3. වන්දති – සීමු.
4. වදෙති – සීමු.

Free Distribution www.aathaapi.org

2. 4. 8
බාහිතික සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු මහසිටුහු ගේ ජේතවන නම් අරමහි වැඩ වසන සේක. එසඳ ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවතෙහි පිඩු පිණිස පිවිසියහ. සැවතෙහි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකියාහු පුවරම් නම් මුවරමාපහය කරා දිවාවිහාර සඳහා එළැඹියහ.

එසමයෙහි පසේනදි කොසොල් රජ 'එකපුණ්ඩරික' නම් ඇතු නැඟී දෙවෙන් දවලැ සැවැතින් නික්මිණ. පසේනදි කොසොල්රජ වඩනා ආයුෂ්මත් අනඳ තෙරණුවන් දුරදී මැ දිට. දක 'සිරිවඩු' මහමැති ඇමැතී : "සගය සිරිවඩුවෙනි, තෙල ආයුෂ්මත් අනඳ තෙර වේ දැ" යි. "මහරජ, එසේ යැ. තෙල ආයුෂ්මත් අනඳ තෙර" යයි, එසඳ පසේනදි කොසොල් රජ එක්තරා පුරුෂයකු ඇමැතී : "එම්බා පුරුෂය, තෝ එව. ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළැඹෙව, එළැඹ මා ගේ වචනයෙන් ආයුෂ්මත් අනඳ තෙරණුවන් ගේ දෙපා සිරසින් වඳුව : "වහන්ස, පසේනදි කොසොල් රජ ආයුෂ්මත් අනඳ තෙරණුවන් ගේ දෙපා හිසින් වඳිතී කියව." මෙසේත් කියව : "වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවනට ඉදින් ලාහෙළා කළමනා කරණී නැත් නම් වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අනුකම්පා පිණිස මොහොතක් බලන සේක්ව'යි. 'දේවයන් වහන්ස, එසේ යැ'යි කියා ඒ පුරුෂයා පසේනදි කොසොල් රජහට පිළිවදන් දී ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළැඹියේ යි, එළැඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් සකසා වැඳ එකත්පස් වැ සිටියේ යි. එකත්පස් වැ සිටි ඒ පුරුෂ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කී : "වහන්ස, පසේනදි කෙසොල් රජ ආයුෂ්මත් අනඳ තෙරණුවන් ගේ දෙපා හිසින් වඳියි මෙසේත් කියයි: වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවනට ඉදින් ආත්‍යායික කරණී නැත් නම් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අනුකම්පා පිණිස මොහොතක් බලත්ව"යි. ආයුෂ්මත් අනඳ තෙරණුවෝත් තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ.

ඉක්බිති පසේනදි කොසොල් රජ නාගයා (ඇත්හු) යාහෙන භූමිය යම්තාක් ද එතෙක් නාගවාහනයෙන් ගොස් නාගවාහනයෙන් බැස පාගමන් ඇතියේ මැ ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළැඹියේ. එළැඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් සකසා වැඳ එකත්පස් වැ සිටියේ යි. එකත්පස් වැ සිටි පසේනදි කොසොල් රජ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කී : "වහන්ස, ඉදින් ආයුෂ්මත් අනඳ තෙරණුවනට කිසි ආත්‍යායික කරණී නැත් නම්, වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අචිරවතී නදීතීරය කරා අනුකම්පා පිණිස වඩනා සේක් නම් මැනැවැ"යි. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන අචිරවතියා නදියා තීරං, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො රාජා පසෙනදි කොසලො යාවතිකා නාගස්ස භූමි නාගෙන ගන්ත්වා නාගා පච්චොරොහිත්වා පත්තිකොව යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො රාජා පසෙනදි කොසලො ආයස්මන්තං ආනන්දං එතදවොච: ඉධ භන්තෙ, ආයස්මා ආනන්දො හත්ථත්ථරෙ නිසීදතූ'ති. අලං මහාරාජ, නිසීද ත්වං, නිසින්නො අහං සකෙ ආසනෙ'ති. නිසීදි ඛො රාජා පසෙනදි කොසලො පඤ්ඤත්තෙ ආසනෙ, නිසජ්ජ ඛො රාජා පසෙනදි කොසලො ආයස්මන්තං ආනන්දං එතදවොච:

කින්නු ඛො භන්තෙ ආනන්ද, සො භගවා තථාරූපං කායසමාචාරං සමාචරෙය්‍ය යථාස්ස[1] කායසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහීති[2]? න ඛො මහාරාජ, සො භගවා තථාරූපං කායසමාචාරං සමාචරෙය්‍ය යථාස්ස කායසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහී'ති

කිම්පන භන්තෙ ආනන්ද, සො භගවා තථාරූපං වචීසමාචාරං-පෙ-මනොසමාචාරං සමාචරෙය්‍ය යථාස්ස[1] මනොසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහීති[2]? න ඛො මහාරාජ, සො භගවා තථාරූපං මනොසමාචාරං සමාචරෙය්‍ය යථාස්ස මනොසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යං හි මයං භන්තෙ, නාසක්ඛිම්හා පඤ්හෙන පරිපූරෙතුං, තං භන්තෙ, ආයස්මතා ආනන්දෙන පඤ්හස්ස වෙය්‍යාකරණෙන පරිපූරිතං. යෙ තෙ භන්තෙ, බාලා අබ්‍යත්තා අනනුවිච්ච අපරියොගාහෙත්වා පරෙසං වණ්ණං වා අවණ්ණං වා භාසන්ති, න මයං තං සාරතො පච්චාගච්ඡාම. යෙ ච ඛො තෙ[3] භන්තෙ, පණ්ඩිතා බ්‍යත්තා[4] මෙධාවිනො අනුවිච්ච පරියොගාහෙත්වා පරෙසං වණ්ණං වා අවණ්ණං වා භාසන්ති, තං මයං සාරතො පච්චාගච්ඡාම.

කතමො පන භන්තෙ ආනන්ද, කායසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති?.

යො ඛො මහාරාජ, කායසමාචාරෙ අකුසලො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ අකුසලො?

යො ඛො මහාරාජ, කායසමාචාරෙ සාවජ්ජො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ සාවජ්ජො?

යො ඛො මහාරාජ, කායසමාචාරො සබ්‍යාපජ්ජො[5].

කතමො පන භන්තෙ, කායසමාචාරෙ සබ්‍යාපජ්ජො?

යො ඛො මහාරාජ, කායසමාචාරෙ දුක්ඛවිපාකො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ දුක්ඛවිපාකො?

---

1. යථායං - ස්‍යා.
2. බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති - සීමු, PTS.
3. යෙ පන තෙ - මජ්සං.
4. වියත්තා - මජ්සං.
5. සබ්‍යාබජ්ඣො - මජ්සං.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අචිරවතී නදීතීරය කරා එළැඹියහ. එළැඹ එක්තරා රුක්මුලෙක පැන්වූ අස්නෙහි වැඩ හුන්හ. ඉක්බිති පසේනදි කොසොල් රජ හස්තියානය යාහෙන භූමිය යම් තාක් ද එතෙක් හස්තියානයෙන් ගොස් හස්තියානයෙන් බැස පාගමන් ඇතියේ මැ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් කරා එළැඹියේ යි. එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සකසා වැඳ එකත්පස් වැ සිටියේ යි. එකත්පස් වැ සිටි පසේනදි කොසොල්රජ ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට තෙල කී : ''වහන්ස, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මේ ඇත්පලසෙහි හිඳුනා සේක්වා''යි. මහරජ, කම් නැත, තෙපි හිඳුව. මම සිය අස්නෙහි හුන්මි. පසේනදි කොසොල්රජ පැන්වූ අස්නෙහි හින. හිඳ පසේනදි කොසොල්රජ ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට තෙල කී :

''වහන්ස, ආනන්දයෙනි, කිමෙක ඒ භාග්‍යවතුන් වහන්සේ යම් කායසමාචාරයෙක් මහණබමුණන් විසින් පරිභාෂණ කළයුතු වේ නම්, එබඳු කායසමාචාරයක් කරන සේක් ද? මහරජ, ඒ භාග්‍යවතුන් වහන්සේ යම් කායසමාචාරයෙක් නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ කළ යුතු වේ නම් එබඳු කායසමාචාරයක් නො කරන සේක් මැ යැ.

වහන්ස, ආනන්දයෙනි, කිමෙක ඒ භාග්‍යවතුන් වහන්සේ යම් වාක්සමාචාරයෙක් . . . . යම් මනඃසමාචාරයෙක් මහණබමුණන් විසින් නිග්‍රහ කළයුතු වේ නම් එබඳු මනඃසමාචාරයක් කරන සේක් ද? මහරජ, ඒ භාග්‍යවතුන් වහන්සේ යම් මනඃසමාචාරයෙක් නුවණැති මහණබමුණන් විසින් නින්‍දා කළයුතු වේ නම් එබඳු මනඃසමාචාරයක් නො කරන සේක් මැ යැ.

වහන්ස, ආශ්චර්‍ය්‍ය යැ, වහන්ස, අද්භූත යැ, වහන්ස, අපි මුල කී යම් කරුණක් ප්‍රශ්න කිරීමෙන් සපුරාලන්නට නො හැකි වූමෝ ද, වහන්ස, මුල කී එ කරුණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රශ්නව්‍යාකරණයෙන් පුරාලන ලද. වහන්ස, යම් බාල අව්‍යක්ත කෙනෙක් නුවණින් නො විමසා නුවණින් බැස නො ගෙන මෙරමා ගේ ගුණ හෝ අගුණ හෝ බණෙත් ද, අපි එය සාර විසින් නො පිළිගනුම්හ. වහන්ස, යම් ඒ පණ්ඩිත ව්‍යක්ත ප්‍රශස්තබුද්ධි ඇති කෙනෙක් නුවණින් දන නුවණින් බැසගෙන පරාගේ ගුණ හෝ අගුණ හෝ බණෙත් ද, අපි එය සාර විසින් පිළිගනුම්හ.

වහන්ස, ආනන්දයෙනි, නුවණැති මහණබමුණන් විසින් නිග්‍රහ කළයුතු කායසමාචාර නම් කවරේ යැ?

මහරජ, යම් කායසමාචාරයෙක් අකුසල් වේ ද, එය යි.

වහන්ස, අකුශල කායසමාචාර නම් කවරේ යැ?

මහරජ, යම් කායසමාචාරයෙක් සාවද්‍ය වේ ද, එය යි.

වහන්ස, සාවද්‍ය කායසමාචාර නම් කවරේ යැ?

මහරජ, යම් කායසමාචාරයෙක් සදුඃඛ වේ ද, එය යි.

වහන්ස, සදුඃඛ කායසමාචාර නම් කවරේ යැ?

මහරජ, යම් කායසමාචාරයෙක් නිස්සන්‍ද දුඃඛවිපාක වේ ද, එය යි.

වහන්ස, නිස්සන්‍ද දුඃඛවිපාක කායසමාචාර නම් කවරේ යැ?

යො මහාරජ, කායසමාචාරෙ අත්තබ්‍යාබාධායපි සංවත්තති, පරබ්‍යාබාධායපි සංවත්තති, උභයබ්‍යාබාධායපි සංවත්තති. තස්ස අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො ඛො මහාරජ, කායසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති.

කතමො පන භන්තෙ ආනන්ද, වචීසමාචාරෙ-පෙ-මනොසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති?

යො ඛො මහාරජ, මනොසමාචාරෙ අකුසලො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ අකුසලො?

යො ඛො මහාරජ, මනොසමාචාරෙ සාවජ්ජො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ සාවජ්ජො?

යො ඛො මහාරජ, මනොසමාචාරෙ සබ්‍යාපජ්ඣො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ සබ්‍යාපජ්ඣො?

යො ඛො මහාරජ, මනොසමාචාරෙ දුක්ඛවිපාකො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ දුක්ඛවිපාකො?

යො ඛො මහාරජ, මනොසමාචාරෙ අත්තබ්‍යාබාධායපි සංවත්තති -පෙ- උභයබ්‍යාබාධායපි සංවත්තති. තස්ස අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො ඛො මහාරජ, මනොසමාචාරෙ ඔපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති.

කින්නු ඛො භන්තෙ ආනන්ද, සො භගවා සබ්බෙසංයෙව අකුසලානං ධම්මානං පහානං වණ්ණෙතීති?

සබ්බා'කුසලධම්මපහීනො[1] ඛො මහාරජ, තථාගතො කුසලධම්මසමන්නාගතොති.

කතමො පන භන්තෙ ආනන්ද, කායසමාචාරෙ අනොපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති?

යො ඛො මහාරජ, කායසමාචාරෙ කුසලො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ කුසලො?

යො ඛො මහාරජ, කායසමාචාරෙ අනවජ්ජො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ අනවජ්ජො?

යො ඛො මහාරජ, කායසමාචාරො අබ්‍යාපජ්ඣො[2]

කතමො පන භන්තෙ, කායසමාචාරෙ අබ්‍යාපජ්ඣො?

යො ඛො මහාරජ, කායසමාචාරෙ සුඛවිපාකො.

කතමො පන භන්තෙ, කායසමාචාරෙ සුඛවිපාකො?

---

1. සබ්බා අකුසලා ධම්මා පහීණො - සීමු.
2. අබ්‍යාබජ්ඣො - මජසං.

මහරජ, යම් කායසමාචාරයෙක් ආත්මව්‍යාබාධ පිණිස වැටේ ද, පරව්‍යාබාධ පිණිස වැටේ ද, උභය ව්‍යාබාධ පිණිස වැටේ ද, ඔහුට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මහරජ, මෙ බඳු කායසමාචාරය නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ (නින්දා) කළයුතු වෙයි.

වහන්ස, ආනන්දයෙනි, නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ කළයුතු වාක්සමාචාර . . . . මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් අකුසල් වේ ද, එය යි.

වහන්ස, අකුසල මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් සාවද්‍ය වේ ද, එය යි.

වහන්ස, සාවද්‍යමනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් සව්‍යාබාධ වේ ද, එය යි.

වහන්ස, සව්‍යාබාධ මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් දුඃඛවිපාක වේ ද, එය යි.

වහන්ස, දුඃඛවිපාක වූ මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් ආත්මව්‍යාබාධ පිණිසත් පවතී ද, . . . උභයව්‍යාබාධ පිණිසත් පවතී ද, ඔහට අකුශලධර්මයෝ වැඩෙති. කුශලධර්මයෝ පිරිහෙති, මහරජ, මෙ බඳු මනඃසමාචාර නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ කටයුතු වෙයි.

වහන්ස, ආනන්දයෙනි, කිම, ඒ භාග්‍යවත්හු හැම අකුශලධර්මයන් ගේ මැ ප්‍රහාණය වර්ණනා කෙරෙත් ද?යි.

මහරජ, තථාගතයෝ හැම අකුසල්දහම් ප්‍රහීණ කළ කෙනෙක. කුශලධර්ම සමන්වාගත කෙනෙකැ'යි.

වහන්ස, ආනන්දයෙනි, වැළිත් නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ නො කළයුතු කායසමාචාර කවරේ ද?යි.

මහරජ, යම් කායසමාචාරයෙක් කුසල් වේ ද එය යි.

වහන්ස, කුශලකායසමාචාර කවරේ ද?

මහරජ, යම් කායසමාචාරයෙක් අනවද්‍ය වේ ද එය යි.

වහන්ස, අනවද්‍යකායසමාචාර කවරේ ද?

මහරජ, යම් කායසමාචාරයෙක් අව්‍යාබාධ වේ ද, එය යි.

වහන්ස, අව්‍යාබාධ කායසමාචාර කවරේ ද?

මහරජ, යම් කායසමාචාරයෙක් සුඛවිපාක ඇත්තේ ද, එය යි.

වහන්ස, සුඛවිපාක ඇති කායසමාචාර කවරේ ද?

Free Distribution www.aathaapi.org

යො ඛො මහාරාජ, කායසමාචාරෙ නෙවත්තව්‍යාබාධායපි සංවත්තති, න පරව්‍යාබාධායපි සංවත්තති, න උභයව්‍යාබාධායපි සංවත්තති. තස්ස අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො ඛො මහාරාජ, කායසමාචාරෙ අනොපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති.

කතමො පන භන්තෙ ආනන්ද, වචීසමාචාරෙ-පෙ-මනොසමාචාරෙ අනොපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති?

යො ඛො මහාරාජ, මනොසමාචාරෙ කුසලො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ කුසලො?

යො ඛො මහාරාජ, මනොසමාචාරෙ අනවජ්ජො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ අනවජ්ජො?

යො ඛො මහාරාජ, මනොසමාචාරෙ අබ්‍යාපජ්ඣො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ අබ්‍යාපජ්ඣො?

යො ඛො මහාරාජ, මනොසමාචාරෙ සුඛවිපාකො.

කතමො පන භන්තෙ, මනොසමාචාරෙ සුඛවිපාකො?

යො ඛො මහාරාජ, මනොසමාචාරෙ නෙවත්තව්‍යාබාධායපි සංවත්තති න පරව්‍යාබාධායපි සංවත්තති න උභයව්‍යාබාධායපි සංවත්තති. තස්ස අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො ඛො මහාරාජ, මනොසමාචාරෙ අනොපාරම්භො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති.

කිං පන[1] භන්තෙ ආනන්ද, සො භගවා සබ්බසංයෙව කුසලානං ධම්මානං උපසම්පදං වණ්ණෙතීති?

සබ්බා'කුසලධම්මපහීනො ඛො මහාරාජ, තථාගතො කුසලධම්ම-සමන්නාගතොති.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවසුභාසිතඤ්චිදං[2] භන්තෙ, ආයස්මතා ආනන්දෙන. ඉමිනා ච මයං භන්තෙ, ආයස්මතො ආනන්දස්ස සුභාසිතෙන අත්තමනාභිරද්ධා, එවං අත්තමනාභිරද්ධා ච මයං භන්තෙ, ආයස්මතො ආනන්දස්ස සුභාසිතෙන, සචෙ භන්තෙ, ආයස්මතො ආනන්දස්ස හත්ථිරතනං කප්පෙය්‍ය, හත්ථිරතනම්පි මයං ආයස්මතො ආනන්දස්ස දදෙය්‍යාම. සචෙ භන්තෙ. ආයස්මතො ආනන්දස්ස අස්සරතනං කප්පෙය්‍ය, අස්සරතනම්පි මයං ආයස්මතො ආනන්දස්ස දදෙය්‍යාම. සචෙ භන්තෙ, ආයස්මතො ආනන්දස්ස ගාමවරං කප්පෙය්‍ය, ගාමවරම්පි මයං ආයස්මතො ආනන්දස්ස දදෙය්‍යාම. අපි ච භන්තෙ, මයමෙපතං[3] ජානාම: නෙතං ආයස්මතො ආනන්දස්ස කප්පතීති. අයං මෙ භන්තෙ, බාහිතිකා රඤ්ඤෝ[4] මාගධෙන අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන වත්ථනාළියා[5] පක්ඛිපිත්වා පහිතා සොළසසමා ආයාමෙන, අට්ඨසමා විත්ථාරෙන, තං භන්තෙ, ආයස්මා ආනන්දො පතිගණ්හාතු අනුකම්පං උපාදායාති.

---

1. කිං නුඛො පන - ස්‍යා.
2. සුභාසිතමිදං - සීමු.
3. මයමෙපතං තං - සීමු.
4. රඤ්ඤො - PTS.
5. ජත්තනාළියා - ස්‍යා, PTS.

මහරජ, යම් කායසමාචාරයෙක් ආත්මව්‍යාබාධ පිණිසත් නො වැටේ ද, පරව්‍යාබාධ පිණිසත් නො වැටේ ද උභයව්‍යාබාධ පිණිසත් නො වැටේ ද, ඔහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති. මහරජ, මෙබඳු වූ කායසමාචාරය නුවණැති මහණ බමුණන් විසින් උපාරම්භ කටයුතු නො වේ යයි.

වහන්ස, ආනන්දයෙනි, වැළිත් නුවණැති මහණබමුණන් විසින් උපාරම්භ නො කටයුතු වාක්සමාචාර . . . මනඃසමාචාර කවරේ ද? යි.

මහරජ, යම් මනඃසමාචාරයෙක් කුසල් වේ ද, එය යි.

වහන්ස, කුශල වූ මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් අනවද්‍ය වේ ද, එය යි.

වහන්ස, අනවද්‍ය මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් අව්‍යාබාධ වේ ද, එය යි.

වහන්ස, අව්‍යාබාධ මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් සුඛවිපාක ඇත්තේ ද, එය යි.

වහන්ස, සුඛවිපාක ඇති මනඃසමාචාර කවරේ ද?

මහරජ, යම් මනඃසමාචාරයෙක් ආත්මව්‍යාබාධ පිණිසත් නො වැටේ ද, පරව්‍යාබාධ පිණිසත් නො වැටේ ද, උභයව්‍යාබාධ පිණිසත් නො වැටේ ද ඔහට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති. මහරජ, මෙවන් මනඃසමාචාරය නුවණැති මහණ බමුණන් විසින් උපාරම්භ කටයුතු නො වේ යයි.

කිම වහන්ස, ආනන්දයෙනි, ඒ බුදුහු හැම කුශලධර්මයන්ගේ මැ රැස් කිරීම පසසත් ද ? යි.
මහරජ, තථාගතයෝ ප්‍රහීණ කළ හැම අකුසල් දහම් ඇතියහ, කුශලධර්මසමන්වාගතයහ'යි.

වහන්ස, ආශ්චර්ය්‍ය යැ, වහන්ස, අද්භූත යි, වහන්ස, ආයුෂ්මත් ආනන්දයන් විසින් මේ වදළ තාක් සුභාෂිත මැ යි. වහන්ස, ඇපි ආයුෂ්මත් ආනන්දයන් ගේ මේ සුභාෂිතයෙනුදු සතුටුසිත් ඇතියමෝ ආරාධිතයම්හ. වහන්ස, මෙසෙයින් ආයුෂ්මත් ආනන්දයන් ගේ සුභාෂිතයෙන් සතුටු වැ සිත් ඇල වූ ඇපි ඉදින් වහන්ස, ආයුෂ්මත් ආනන්දයනට හස්තිරත්නය කැප වේ නම් ආයුෂ්මත් ආනන්දයනට හස්තිරත්නය ද දෙම්හ. වහන්ස, ඉදින් ආයුෂ්මත් ආනන්දයනට අශ්වරත්නය කැප වේ නම්, ඇපි ආයුෂ්මත් ආනන්දයනට අශ්ව රත්නය ද දෙම්හ. වහන්ස, ඉදින් ආයුෂ්මත් ආනන්දයනට ගම්වර කැප වේ නම් ඇපි ආයුෂ්මත් ආනන්දයනට ගම්වර ද දෙම්හ. එතෙකුදුවත් වහන්ස, තෙලෙ ආයුෂ්මත් ආනන්දයනට කැප නො වේ' යන තෙල කරුණ ඇපි දු දනුම්හ. වහන්ස, මා ගේ මේ බාහිතික වස්ත්‍රය මගධෛශ්වර වූ වෛදෙහි පුත්‍ර අජාතසත්තු රජු විසින් වස්ත්‍රනාළියෙහි බහා එවන ලද්දේ අයමින් සොළොස්හත් විතරින් අටහත් ඇතියේ යැ, වහන්ස, එය ආයුෂ්මත් ආනන්දයෝ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා'යි.

අලං මහාරාජ, පරිපුණ්ණං මෙ තිචීවරන්ති.

අයං භන්තෙ, අචිරවතී නදී දිට්ඨා ආයස්මතා චෙව ආනන්දෙන අම්හෙහි ච, යදා උපරි පබ්බතෙ මහාමෙඝො අභිප්පවුට්ඨො හොති[1] අථායං අචිරවතී නදී උභතො කූලානි සංවිස්සන්දන්ති ගච්ඡති. එවමෙව ඛො භන්තෙ, ආයස්මා ආනන්දො ඉමාය බාහිතිකාය අත්තනො තිචීවරං කරිස්සති. යම්පනායස්මතො ආනන්දස්ස පුරණං තිචීවරං, තං සබ්‍රහ්මචාරීහි සංවිභජිස්සති. එවායං අම්හාකං දක්ඛිණා සංවිස්සන්දන්ති මඤ්ඤෙ ගමිස්සති. පතිගණ්හාතු භන්තෙ, ආයස්මා ආනන්දො බාහිතිකන්ති.

පටිග්ගහෙසි ඛො ආයස්මා ආනන්දො බාහිතිකං. අථ ඛො රාජා පසෙනදි කොසලො ආයස්මන්තං ආනන්දං එතදවොච: 'හන්ද චදානි මයං භන්තෙ ආනන්ද, ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයා'ති. යස්සදානි ත්වං මහාරාජ, කාලං මඤ්ඤසීති.

අථ ඛො රාජා පසෙනදි කොසලො ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ආයස්මා ආනන්දො අචිරපක්කන්තස්ස රඤ්ඤොපසෙනදිස්ස කොසලස්ස යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො යාවතකො අහොසි රඤ්ඤා පසෙනදිනා කොසලෙන සද්ධිං කථාසල්ලාපො. තං සබ්බං භගවතො ආරොචෙසි. තඤ්ච බාහිතිකං භගවතො පාදාසි.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: 'ලාභා භික්ඛවෙ, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස, සුලද්ධලාභා භික්ඛවෙ, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස. යං රාජා[2] පසෙනදි කොසලො ලභති ආනන්දං දස්සනාය. ලභති පයිරුපාසනායාති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

බාහිතිකසුත්තං අට්ඨමං.

1. අභිප්පවාහොති - සිමු.
2. අයං රාජා - සිමු.

මහරජ, කම් නැත. මට තුන්සිවුරු පරිපූර්ණ යැ යි.

වහන්ස, මේ අචිරවතී හොය ආයුෂ්මත් අනඳ තෙරණුවන් විසිනුදු අප විසිනුදු දක්නා ලද. යම් කලෙක පර්වත මස්තකයෙහි මහාමේඝයෙක් මොනොවට වටුයේ වේ ද, එකල මේ අචිරවතී හොය දෙපස ඉවුරු ගලමින් යෙයි. වහන්ස, එපරිදි මැ ආයුෂ්මත් අනඳ තෙරණුවෝ මේ බාහිතික වස්ත්‍රයෙන් තමනට තුන් සිවුරු කරන්නාහ. ආයුෂ්මත් අනඳ තෙරණුවන් ගේ යම් පැරණි තුන්සිවුරෙක් වී නම් එය සබ්‍රම්සරුන් හා බෙදා ගන්නාහ. මෙසේ අප ගේ මේ දක්ෂිණාව ඉතිරී යන්නාක් මෙන් යෙයි. වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවෝ බාහිතික වස්ත්‍ර පිළිගන්නා සේක්වා.

ආයුෂ්මත් අනඳ තෙරණුවෝ බාහිතික වස්ත්‍ර පිළිගත්හ. එසඳ පසේනදි කොසොල්රජ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කී : "වහන්ස, ආනන්‍දයෙනි, අපි දැන් යම්හ, අපි බොහෝ කිස ඇතියම්හ, බොහෝ කරණී ඇතියම්හ යි, මහරජ, තෙපි දැන් එයට කල් දනුව.

ඉක්බිති පසේනදි කොසොල්රජ ආයුෂ්මත් අනඳ තෙරණුවන්ගේ බස අභිනන්‍දනා කොට අනුමෝදනා කොට හුනස්නෙන් නැඟී ආයුෂ්මත් අනඳ තෙරණුවන් සකසා වැඳ පැදකුණු කොට බැස ගියේ,

ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පසේනදි කොසොල් රජු බැස ගිය නොබෝ කල් ඇති කල්හි භාග්‍යවතුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත් පස් වැ හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පසේනදි කොසොල් රජු හා සමග යම් පමණ කථාසල්ලාපයෙක් වී ද එ හැම භාග්‍යවතුන්හට සැලකළහ. එ බාහිතික වස්ත්‍රය ද භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ.

එසඳ බුදුහු භික්ෂූන් ඇමැතූසේක : "මහණෙනි, පසේනදි කොසොල්රජහට ලාභයෙක, මහණෙනි, පසේනදි කොසොල් රජහට මනා ලාභයෙක. යම් හෙයෙකින් පසේනදි කොසොල් රජ ආනන්‍දයන් දක්නට ලැබේ ද පර්යුපාසනයට ලැබේ ද එහෙයිනැ"යි.

බුදුහු මෙය වදළහ. සතුටුසිත් ඇති එ මහණහු භාග්‍යවතුන් ගේ භාෂිතය අනුමෝදන් කළහ'යි.

අට වැනි බාහිතික සූත්‍ර යි.

---

2. 4. 9

ධම්මචෙතිය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති මෙදතළුම්පං[1] නාම සක්‍යානං නිගමො. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො නගරකං[2] අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො රාජා පසෙනදි කොසලො දීඝං කාරායනං ආමන්තෙසි: 'යොජෙහි සම්ම කාරායන, භද්‍රානි භද්‍රානි යානානි, උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායා'ති. එවං දෙවාති ඛො දීඝො කාරායනො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිවෙදෙසි: 'යුත්තානි ඛො දෙව භද්‍රානි භද්‍රානි යානානි, යස්සදානි කාලං මඤ්ඤසී'ති. අථ ඛො රාජා පසෙනදි කොසලො භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි නගරම්හා නිය්‍යාසි මහච්චා[3] රාජානුභාවෙන යෙන ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා, යානා පච්චොරොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි.

අද්දසා ඛො රාජා පසෙනදි කොසලො ආරාමෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කම්මානො අනුවිචරමානො රුක්ඛමූලානි පාසාදිකානි පසාදනීයානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. දිස්වාන භගවන්තංයෙව ආරබ්භ සති උදපාදි: 'ඉමානි ඛො තානි[4] රුක්ඛමූලානි පාසාදිකානි පසාදනීයානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි, යත්ථ සුදං මයං තං භගවන්තං පයිරුපාසාම අරහන්තං සම්මාසම්බුද්ධන්ති

අථ ඛො රාජා පසෙනදි කොසලො දීඝං කාරායනං ආමන්තෙසි: ඉමානි ඛො සම්ම කාරායන, තානි රුක්ඛමූලානි පාසාදිකානි පසාදනීයානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. යත්ථ සුදං[5] මයං තං භගවන්තං පයිරුපාසාම අරහන්තං සම්මාසම්බුද්ධං. කහං නු ඛො සම්ම කාරායන, එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො'ති?

අත්ථි මහාරාජ, මෙදතළුම්පං[1] නාම සක්‍යානං නිගමො. තත්ථ සො භගවා එතරහි අරහං සම්මාසම්බුද්ධො විහරතී'ති. කීව දූරො පන සම්ම කාරායන, නගරකම්හා[6] මෙදතළුම්පං[1] නාම සක්‍යානං නිගමො හොතීති? න දූරෙ මහාරාජ, තීණි යොජනානි. සක්කා දිවසාවසෙසෙන ගන්තුන්ති. තෙන හි සම්ම කාරායන, යොජෙහි භද්‍රානි භද්‍රානි යානානි ගමිස්සාම මයං තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධ'න්ති.

---

1. මෙදළුපං - මජසං, සහා. / මෙදළුම්පං - PTS. / මෙතළුපං - සීමු.
2. නඞ්ගරකං - PTS.
3. මහච්චා - සීමු, මජසං.
4. ඉමානි ඛොදනි - සීමු.
5. යත්ථස්සුදං - PTS.
6. නඞ්ගරම්හා - PTS.

Free Distribution www.aathaapi.org

2. 4. 9.
ධම්මචේතිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි මෙදතළුම්ප නම් සැහැරජුන් ගේ නියම්ගම්හි වැඩ වසන සේක. එසමයෙහි පසේනදි කොසොල් රජ කිසි කටයුත්තෙකින් නගරක නම් ශාක්‍යනිගමයට පැමිණියේ වෙයි. එසද පසේනදි කොසොල් රජ දීඝකාරායන සෙනෙවි ඇමැති : ''සගය කාරායනයෙනි, භද්‍ර භද්‍ර යානයන් යොදව, මනාබිම් වූ උයන්බිම දක්නට යම්හ''යි. 'එසේ යැ දෙවයිනි'යි දීඝකාරායන පසේනදි කොසොල් රජහට පිළිවදන් අස්වා භද්‍රභද්‍ර යානයන් යොදවා පසේනදි කොසොල් රජහට දන්වී: ''දේවයිනි, භද්‍රභද්‍ර යානයෝ යොදනලදහ, එයට දන් කල් දන්නේ යැ'යි. එසද පසේනදි කොසොල් රජ සුන්‍දර යානයෙක නැඟී සුන්‍දර සුන්‍දර යානයෙන් යුතු වැ මහත්වූ රාජානුභාවයෙන් නුවරින් නික්මියේ, ආරාමය කරා ගියේ. යානභූමි තාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් මැ අරමට පිවිසියේ යි.

පසේනදි කොසොල් රජ ආරාමයෙහි ජඞ්ඝාවිහාරයෙහි සක්මන් කරනුයේ ඇවිදිනුයේ දකුම්කලු වූ ප්‍රසාද එළවන්නා වූ නිහඬ වූ නිර්ඝෝෂ රහිත වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්කමට නිසි වූ පිළිසලනට නිසි වූ රුක්මුල් සෙනසුන් දිට. දක බුදුන් මැ ඇරබ සිහි උපන : ''යම් බඳු සෙනසුනෙක අපි ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ පර්යුපාසන කරමෝ නම් මේ එ බඳු දකුම්කලු වූ ප්‍රසාද එළවන්නා වූ නිහඬ වූ අල්පනිර්ඝෝෂ ඇති ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්කමට නිසි වූ පිළිසලනට නිසි වූ රුක්මුල් සෙනසුනැ''යි.

එසද පසේනදි කෙසොල් රජ දීඝකාරායන සෙනෙවි ඇමැති : ''සගය කාරායනයෙනි, යම් බඳු සෙනසුනෙකැ අපි ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ පර්යුපාසන කරමෝ නම් මේ එ බඳු දකුම්කලු වූ ප්‍රසාද එළවන්නා වූ නිහඬ වූ අලපනිර්ඝෝෂ ඇති ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්කමට නිසි වූ පිළිසලනට නිසි වූ රුක්මුල් සෙනසුන. සගය කාරායනයෙනි, දන් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ කොහි වැඩ වෙසෙත් ද ?යි.

මහරජ, මෙදතළුම්ප නම් ශාක්‍යයන්ගේ නිගමයෙක් ඇත. දන් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවත්හු එහි වැඩ වෙසෙති'යි. සගය කාරායනයෙනි, නගරක නියම්ගම්හි සිට මෙදතළුම්ප නම් සැහැරජුන්ගේ නිගමය කොපමණ දුරැති වේ ද ? යි. මහරජ, දුරැ නො වෙයි, තුන් යොදුනෙකැ. දිවසාවශේෂයෙන් යන්නට හැක්කැ'යි. එසේ වී නම් සගය කාරායනයෙනි, භද්‍රභද්‍රයානයන් යොදව. ඇපි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන්

Free Distribution www.aathaapi.org

එවං දෙවාති ඛො දීඝො කාරායනො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිවෙදෙසි: යුත්තානි ඛො තෙ දෙව, භද්‍රානි භද්‍රානි යානානි. යස්සදානි කාලං මඤ්ඤසී'ති. අථ ඛො රාජා පසෙනදි කොසලො භද්‍රං යානං අභිරූහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි නගරකම්හා නික්ඛමිත්වා යෙන මේදතළුම්පං නාම සක්‍යානං නිගමො තෙන පායාසි තෙනෙව දිවසාවසෙසෙන මේදතළුම්පං නාම සක්‍යානං නිගමං සම්පාපුණි යෙන ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි.

තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: කහං නු ඛො භන්තෙ, එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො, දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධ'න්ති. එසො මහාරාජ විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙහි, විවරිස්සති තෙ භගවා ද්වාර'න්ති. අථ ඛො රාජා පසෙනදි කොසලො තත්ථෙව ඛග්ගඤ්ච උණ්හීසඤ්ච දීඝස්ස කාරායනස්ස පාදාසි, අථ ඛො දීඝස්ස කාරායනස්ස එතදහොසි: රහායති ඛොදානි මහාරාජා තෙනිධෙවදානි[1] මයා ඨාතබ්බ'න්ති. අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන සො විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙසි. විවරි භගවා ද්වාරං. අථ ඛො රාජා පසෙනදි කොසලො විහාරං පවිසිත්වා භගවතො පාදෙ සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති. පාණීහි ච පරිසම්බාහති, නාමඤ්ච සාවෙති: රාජාහං භන්තෙ, පසෙනදි කොසලො, රාජාහං භන්තෙ, පසෙනදි කොසලො'ති.

කිං පන ත්වං මහාරාජ, අත්ථවසං සම්පස්සමානො ඉමස්මිං සරීරෙ එවරූපං පරමනිපච්චාකාරං කරෙසි චිත්තූපහාරං[2] උපදංසෙසීති?

අත්ථි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො, හොති සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො[3] භගවතො සාවකසඞ්ඝො'ති. ඉධාහං භන්තෙ, පස්සාමි එකෙ සමණබ්‍රාහ්මණෙ පරියන්තකතං බ්‍රහ්මචරියං චරන්ති. දසපි වස්සානි, විසතිම්පි වස්සානි, තිංසම්පි වස්සානි, චත්තාරීසම්පි වස්සානි. තෙ අපරෙන සමයෙන සුන්හාතා සුවිලිත්තා කප්පිතකෙසමස්සු පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙන්ති[4] ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි යාවජීවං අපාණකොටිකං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තෙ, න ඛො පනාහං භන්තෙ, ඉතො බහිද්ධා අඤ්ඤං එවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං සමනුපස්සාමි. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො, හොති සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝොති[5].

---

1. ඉධෙවදානි - සීමු, මජසං, සය්‍යා, PTS.
2. මිත්තූපහාරං - මජසං, සය්‍යා, PTS.
3 සුප්පටිපන්නො - මජසං.
4. පරිචාරෙන්ති - PTS
5 භගවතො සාවකසඞ්ඝොති - මජසං.

දක්නට යම්හ'යි. 'එසේ යැ දේවයිනි'යි දීඝකාරායන සෙනෙවි පසේනදි කොසොල් රජහට පිළිවදන් දී භද්‍ර වූ භද්‍ර වූ යානයන් යොදවා පසේනදි කොසොල් රජහට දන්වී : "දේවයිනි, භද්‍ර වූ භද්‍ර වූ යානයෝ යොදන ලදහ. එයට දැන් කල් දනැ"යි. එ සඳ පසේනදි කොසොල් රජ සුන්‍දර යානයෙකැ නැඟී සුන්‍දර සුන්‍දර යානයෙන් යුතු වැ නගරක නම් නිගමයෙන් නික්ම මෙදතළුම්ප නම් නියම්ගම කරා පිටත් වැ ගියේ, එ මැ දිවසාවශෙෂයෙන් මෙදතළුම්ප නම් සැහැරජුන්ගේ නියම්ගමට පැමිණියේ, අරම කරා ගියේ යි. යාන භූමි තාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් මැ අරමට පිවිසියේ යි.

එසමයෙහි බොහෝ මහණහු අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙති. එසඳ පසේනදි කොසොල් රජ එ මහණුන් කරා එළැඹියේ යැ. එළැඹ එ මහණුනට මෙල බස් කී : "වහන්ස, දැන් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවත්හු කොහි යැ? අපි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් දක්නා රිසියම්හ"යි. මහරජ, මෙලෙ වෙහෙර පියූ දෙර ඇතියේ යැ. එහෙයින් නිහඩ වැ එළැඹ වෙලෙවි නො වැ අක්දෙරියට පිවිස උකැසි හඬ කොට කවළියෙහි (කෙසි සිද වෙත) අකොළව (සෙමින් පහරව). බුදුහු තොපට දෙර විවර කෙරෙති'යි. ඉක්බිති පසේනදි කොසොල් රජ කඩුවත් නළල්පටත් එහි මැ දීඝකාරායනහට දින. ඉක්බිති දීඝකාරයනහට මෙල සිත් වී : "දැන් කලි මහරජ රහස් බෙණෙයි, එයින් දැන් මා මෙහි මැ සිටියයුතු යැ"යි. එසඳ පසේනදි කොසොල්රජ පියූ දෙර ඇති එ වෙහෙර කරා නිශ්ශබ්ද වැ එළැඹ නො වෙලෙවි වැ අක්දෙරියට වැද උකැසි හඬ නඟා කවුළු පහළේ යැ. බුදුහු දෙර විවර කොළෝ. එසඳ පසේනදි කොසොල් රජ වෙහෙර වැද බුදුන්ගේ පාමුල හිසින් වැටී බුදුන්ගේ පාසඟළ මුවිනුදු සිඹී, දෙඅතිනුදු සම්බාහනා කෙරෙයි, නමුදු අස්වයි : "වහන්ස, මම පසේනදි කෙසොල් රජමි, වහන්ස, මම පසේනදි කොසොල් රජමි"යි.

මහරජ, තෙපි කිනම් කරුණක් දක්මින් මේ සිරුරෙහි ලා මෙ බඳු පරම ගෞරවාකාර කරව. ගෞරවොපහාර දක්වව?

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ධර්මාන්වයෙක් ඇත : "භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාතය. භගවත්හුගේ සවුසඟහු සුපිළිපන්හ" යි. වහන්ස, මම මෙලොව දසවසෙක විසිවසෙක තිස්වසෙක සතළිස්වසෙකැ'යි මෙසේ අවධි සහිත කොට බඹසර පුරන ඇතැම් මහණබමුණු කෙනකුන් දක්මි. පසු කලෙක ඔහු මොනොවට සනහා සිටියාහු විලෙවුන් ගත්තාහු අන්දම් තැබූ කෙහෙමස් ඇත්තාහු පස්කම් ගුණෙන් සමර්පිත වැ සමඞ්ගීභූත වැ ඉඳුරන් පිණවත්, වහන්ස, මම මෙ සස්නෙහි දිවි ඇති තාක් ප්‍රාණපරිත්‍යාගය ඇතුළු කොට ඇති පිරිපුන් පිරිසුදු බඹසර පුරන මහණුන් දක්මි. වහන්ස, මම මෙ සස්නෙන් බැහැර මෙසේ පිරිපුන් පිරිසුදු අන් බඹසරක් නො දක්මි. වහන්ස, භගවත්හු කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : "භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් දහම මොනොවට දෙසන ලද, සඟහු සුපිළිපන්හ"යි.

පුන ච පරං භන්තෙ, රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි. භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනියාපි භාතරා විවදති සහායොපි සහායෙන විවදති. ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති[1]. න ඛො පනාහං භන්තෙ, ඉතො බහිද්ධා අඤ්ඤං එවං සමග්ගං පරිසං සමනුපස්සාමි. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො හොති: සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො සඞ්ඝොති·

පුන චපරාහං භන්තෙ, ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං අනුචඞ්කමාමි අනුවිචරාමි. සොහං තත්ථ පස්සාමි එකෙ සමණබ්‍රාහ්මණෙ කිසෙ ලූඛෙ දුබ්බණ්ණෙ උප්පණ්ඩුප්පණ්ඩුකජාතෙ[2] ධමනිසන්ථතගත්තෙ න විය මඤ්ඤෙ චක්ඛුං බන්ධන්තෙ ජනස්ස දස්සනාය. තස්ස මය්හං භන්තෙ එවං හොති[3] අද්ධා ඉමෙ ආයස්මන්තො අනභිරතා[4] වා බ්‍රහ්මචරියං චරන්ති. අත්ථි වා තෙසං කිඤ්චි පාපං කම්මං කතං පටිච්ඡන්නං තථා ඉමෙ ආයස්මන්තො කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා න විය මඤ්ඤෙ චක්ඛුං බන්ධන්ති ජනස්ස දස්සනායාති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: කින්නු තුම්හෙ ආයස්මන්තො කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා, න විය මඤ්ඤෙ චක්ඛුං බන්ධථ ජනස්ස දස්සනායාති. තෙ එවමාහංසු: බන්ධුකරොගො නො මහාරාජා'ති. ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි හට්ඨපහට්ඨා උදග්ගුදග්ගා අභිරතරූපා පීණිතින්ද්‍රියා අප්පොස්සුක්කා පන්නලොමා පරදවුත්තා මිගභූතෙන චෙතසා විහරන්ති[5] තස්ස මය්හං භන්තෙ එවං හොති[3]. අද්ධා ඉමෙ ආයස්මන්තො තස්ස භගවතො සාසනෙ උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානන්ති, තථා ඉමෙ ආයස්මන්තො හට්ඨපහට්ඨා උදග්ගුදග්ගා අභිරතරූපා පීණිතින්ද්‍රියා අප්පොස්සුක්කා පන්නලොමා පරදවුත්තා මිගභූතෙන චෙතසා විහරන්ති'ති. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො හොති සම්මාසම්බුද්ධො භගවා ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො සඞ්ඝොති.

පුන චපරාහං භන්තෙ, රාජා ඛත්තියො මුද්ධාවසිත්තො පහොමි ඝාතෙතායං වා ඝාතෙතුං ජාපෙතායං වා ජාපෙතුං. පබ්බාජෙතායං වා පබ්බාජෙතුං. තස්ස මය්හං භන්තෙ, අට්ටකරණෙ[6] නිසින්නස්ස අන්තරන්තරා කථං ඔපාතෙන්ති. සොහං න ලභාමි : මා මෙ[7] භොන්තො අට්ටකරණෙ[6] නිසින්නස්ස මෙ අන්තරන්තරා කථං ඔපාතෙථ.[8] කථාපරියොසානං මෙ භවන්තො ආගමෙන්තූති. තස්ස මය්හං භන්තෙ, අන්තරන්තරාව

---

1. සමග්ගෙ සම්මොදමානෙ ඛීරොදකීභූතෙ අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි පස්සන්තෙ විහරන්තෙ - PTS, මජසං.
2. උප්පණ්ඩුපණ්ඩුකජාතෙ - ස්‍යා.
3. එතදහොසි - ස්‍යා.
4. අනභිරතං - සීමු.
5. හට්ඨපහට්ඨෙ උදග්ගුදග්ගෙ අභිරතරූපෙ පණීතින්ද්‍රියෙ අප්පොස්සුක්කෙ පන්නලොමෙ පරදවුත්තෙ මිගභූතෙන චෙතසා විහරන්තෙ - PTS, මජසං.
6. අත්ථකරණෙ - සීමු, PTS.
7. ඉමෙ - සීමු
8. ඔපාතෙන්තු - සීමු.

තවද වහන්ස, රජදරුවෝ ද රජදරුවන් හා විවාද කෙරෙති, කැත්කුල ඇතියෝ ද කැත්කුලැතියන් හා විවාද කෙරෙති, බමුණෝ ද බමුණන් හා විවාද කෙරෙති, ගැහැවියෝ ද ගැහැවියන් හා විවාද කෙරෙති, මව ද පුතු හා විවාද කෙරෙයි, පුත් ද මව හා විවාද කෙරෙයි, පියා ද පුතු හා විවාද කෙරෙයි, පුත් ද පියා හා විවාද කෙරෙයි, සොහොවුරා ද සොහොවුරු හා විවාද කෙරෙයි, බෑයා ද බූහුන හා විවාද කෙරෙයි, බූහුන ද බෑයා හා විවාද කෙරෙයි, යහළු ද යහළු හා විවාද කෙරේ. වහන්ස, මම මෙ සස්නෙහි සමග වූ සතුටු වන විවාද නො කරන කිරි-දිය සේ එක් වූ උනුන් ප්‍රිය ඇසින් දක්මින් වෙසෙන මහණුන් දක්මි. වහන්ස, මම මෙ සස්නෙන් බැහැර මෙසේ සමඟ වූ අන් පිරිසක් නො මැ දක්මි. වහන්ස, භගවත්හු කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : "භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් සිව්සස් දහම් මොනොවට දෙසන ලද, සඟහු සුපිළිපන්හ"යි.

තවද වහන්ස, මම අරමින් අරමට උයනින් උයනට සක්මන් කරමි, ඇවිදුමි. එ මම් එහි කෘශ වූ රළු වූ දුර්වර්ණ වූ හටගත් පඩුපැහැ ඇති නහර ඉල්පුණු සිරුරු ඇති ඇතැම් මහණබමුණු කෙනකුන් පුනපුනා දක්නට ජනයාගේ නෙත් නො බඳනවුන් මෙන් දක්මි. වහන්ස, එ මට මෙසේ සිත් වෙයි : "එකැතින් මේ ආයුෂ්මත්හු අනභිරත වැ හෝ බඹසර සෙරෙති. ඔවුන් විසින් පිළිසන් වැ කළ පවකමෙක් හෝ ඇත. එසේ මැ යැ මේ ආයුෂ්-මත්හු කෘශ වූවාහු රූක්ෂ වූවාහු දුර්වර්ණ වූවාහු හටගත් පඩුපැහැ සිරුරු ඇත්තාහු නහර පැතුරුණු සිරුරු ඇත්තාහු වෙති. ජනයාගේ දර්ශනය පිණිස ඇස් නො බඳනවුන් සෙයින් වෙති"යි. මම ඔවුන් කරා එළැඹ මෙසේ කියමි : "ආයුෂ්මත්නි, තෙපි කවර හෙයකින් කෘශ වව, රූක්ෂ වව, දුර්වර්ණ වව. හටගත් පඩුරෝ ඇතියාව. නහර ඉපිළි සිරුරු ඇතියාව, ජනයාගේ දර්ශනයට ඇස් නො බඳනවුන් සෙයින් වව"යි. ඔහු මෙසේ කීහු : "මහරජ අපට බන්ධු(පරපුරින් ආ) රොගයෙකැ"යි. වහන්ස, මම මෙ සස්නෙහි තුටු පහටු ඔදවැඩි අභිරත රූප ඇති පිණාගිය ඉඳුරන් ඇති අල්පොත්සුක වූ (නිර්භය හෙයින්) හුණුලොම් ඇති පරා දුන් දූයින් වැටුම් ඇති නිරාශයිතින් වසන මහණුන් දක්මි. වහන්ස, මට මෙසේ සිත් වෙයි : "මේ ආයුෂ්මත්හු එකැතින් ඒ භගවත්හුගේ ශාසනයෙහි උදර වූ පළමු ඉපැයූ විශේෂයෙන් වැඩි අපර විශේෂයක් දනිත් මැ යැ. එසේ මැ යි මේ ආයුෂ්මත්හු තුටු පහටු වැ ඔදවැඩි වැ අභිරතරූප ඇති වැ පිණාගිය ඉඳුරන් ඇති වැ ප්‍රත්‍යයොත්පාදයෙහි අල්පොත්සුක වැ (අත්‍රස්ත) හෙයින් පතිතලොම වැ පරා දුන් දූයින් යැපෙත දිවිවැටුම් ඇති වැ නිරාශයිතින් වෙසෙති"යි. වහන්ස, භගවත්හු කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : "භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් ධර්මය මනාකොට දෙසන ලද, සඟහු සුපිළිපන්හ"යි.

තවද වහන්ස, මම මූර්ධනෙහි බිසෙස් කළ කැත් රජ වූයෙම් නස්නට නිසියහු නසන්නට වෙවයි. නිර්ධන කරන්නට නිසියහු නිර්ධන කරන්නට වෙවයි රටින් නෙරනට නිසියහු රටින් නෙරන්නට වෙවයි පොහොමි, වහන්ස, අධිකරණවිනිශ්චයෙහි හිඳුනා මට අතරතුර කථා බහත්. මම "මේ භවත්හු අධිකරණයෙහි හිඳුනා මට අතරතුර කථා නහමක් බහත්වා; මේ භවත්හු මා ගේ කථා පර්‍යවසානය බලා සිටීත්වා" යනු නො ලබමි. වහන්ස, මට අතරතුර කථා බහත්. වහන්ස, යම් දවසෙක භාග්‍යවතුන් වහන්සේ අනෙකශත

කථං ඔපාතෙන්ති. ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි යස්මිං සමයෙ භගවා අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙති, නෙව තස්මිං සමයෙ භගවතො සාවකානං ඛිපිතසද්දො වා හොති උක්කාසිතසද්දො වා. භූතපුබ්බං භන්තෙ, භගවා අනෙකසතාය පරිසාය ධම්මං දෙසෙසි. තත්‍රඤ්ඤතරො භගවතො සාවකො උක්කාසි. තමෙනඤ්ඤතරො සබ්‍රහ්මචාරී ජණ්ණුකෙන ඝට්ටෙසි: 'අප්පසද්දො ආයස්මා හොතු, මායස්මා සද්දමකාසි. සත්ථා නො භගවා ධම්මං දෙසෙතී'ති, තස්ස මය්හං භන්තෙ, එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භූතං වත භො. අදණ්ඩෙන වත කිර භො අසත්ථෙන එවං සුවිනීතා පරිසා භවිස්සතී'ති. න ඛො පනාහං භන්තෙ, ඉතො බහිද්ධා අඤ්ඤං එවං සුවිනීතං පරිසං සමනුපස්සාමි. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො හොති: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති.

පුන චපරාහං භන්තෙ, පස්සාමි ඉධෙකච්චෙ ඛත්තියපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාළවෙධිරූපෙ වොභින්දන්තා[1] මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතීති. තෙ පඤ්හං අභිසඞ්ඛරොන්ති. ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම: 'එවං චෙ නො පුට්ඨො එවං බ්‍යාකරිස්සති, එවමස්ස මයං වාදං ආරොපෙස්සාම. එවං චෙපි නො පුට්ඨො එවං බ්‍යාකරිස්සති, එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමා'ති. තෙ සුණන්ති 'සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටො'ති. තෙ යෙන භගවා තෙනුපසඞ්කමන්ති. තෙ භගවා ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති: තෙ භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව භගවන්තං පඤ්හං පුච්ඡන්ති. කුතො[2] වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු[3] භගවතො සාවකා සම්පජ්ජන්ති. අයම්පි ඛො මෙ භන්තෙ භගවති ධම්මන්වයො හොති. 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති

පුන චපරාහං භන්තෙ, පස්සාමි ඉධෙකච්චෙ බ්‍රාහ්මණපණ්ඩිතෙ -පෙ- ගහපතිපණ්ඩිතෙ-පෙ-සමණපණ්ඩිතෙ නිපුණෙ කතපරප්පවාදෙ වාළවෙධිරූපෙ වොභින්දන්තා[1] මඤ්ඤෙ චරන්ති. පඤ්ඤාගතෙන දිට්ඨිගතානි. තෙ සුණන්ති 'සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසරිස්සතී'ති. තෙ පඤ්හං අභිසඞ්ඛරොන්ති: 'ඉමං මයං පඤ්හං සමණං ගොතමං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාම. එවං චෙ නො පුට්ඨො එවං බ්‍යාකරිස්සති, එවමස්ස මයං වාදං ආරොපෙස්සාම. එවං චෙපි නො පුට්ඨො එවං බ්‍යාකරිස්සති, එවම්පිස්ස මයං වාදං ආරොපෙස්සාමා'ති. තෙ සුණන්ති 'සමණො ඛලු භො ගොතමො අමුකං නාම ගාමං වා නිගමං වා ඔසටො'ති. තෙ යෙන භගවා තෙනුපසඞ්කමන්ති. තෙ භගවා ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. තෙ භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා න චෙව භගවන්තං පඤ්හං පුච්ඡන්ති. කුතො[2] වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු[3] භගවන්තඤ්ඤෙව ඔකාසං යාචන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. තෙ භගවා

---

1. තෙ භින්දන්තා - ස්‍යා, මජසං.
2. කුතස්ස - ස්‍යා.
3 අඤ්ඤදත්ථුං - ස්‍යා.

Free Distribution www.aathaapi.org

පර්ෂද්හි දහම් දෙසන සේක් ද, එදවස්හි භාග්‍යවතුන් වහන්සේ ගේ සව්වන් කිවිස්නා ශබ්දයෙක් වේවයි, උකැසි හඬෙක් වේවයි නැත් ද, එ බඳු මහණුන් මෙ සස්නෙහි දක්මි. වහන්ස, වූවිරි දයක් කියමි : භාග්‍යවතුන් වහන්සේ අනේකශතපර්ෂද්හි දහම් දෙසූ සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේගේ අන්‍යතර ශ්‍රාවකයෙක් උකැසි කෙළේ. එක්තරා සබ්‍රම්-සරෙක් දණින් උහු ගැටී; ''ආයුෂ්මත් නිහඬ වේවා, ආයුෂ්මත් නහමක් ශබ්ද කරන්නේ යැ. අප ගේ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේකැ''යි. වහන්ස, මට මෙල සිත් වී : ''භවත්නි, ආශ්චර්‍ය්‍ය මැ යැ භවත්නි, අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් මෙසේ සුවිනීත පර්ෂද් වේ මැ යයි. වහන්ස, මෙ සස්නෙන් බැහැර මම මෙසේ සුවිනීත අන් පිරිසක් නො දක්මි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : ''භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් ධර්මය මොනොවට දෙසන ලද, සඟහු සුපිළිපන්හ''යි.

තවද වහන්ස, මම් මෙලොව නිපුණ වූ පරා හා කළ වාදපරිචය ඇති වාලවේධි ධනුර්ධරයන් බඳු ඇතැම් ක්ෂත්‍රිය පණ්ඩිත කෙනෙක් ප්‍රඥයෙන් දෘෂ්ටිගතයන් බිඳුනාවුන් මෙන් හැසිරෙති. ඔහු ශ්‍රමණභවත් ගෞතමයෝ අසුවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පිවිසෙත් ල යි අසති. ඔහු පැන සකස් කෙරෙති : ''ඇපි ශ්‍රමණ ගෞතමයන් කරා එළැඹ මේ ප්‍රශ්නය පුළුවුස්මහ, අප විසින් මෙසේත් පුළුවුස්නා ලද්දහු මෙසේ විසඳන්නාහ. මෙසෙයින් ඇපි ඔවුනට වාදාරොපණ කරම්හ. ඉදින් අප විසින් මෙසේ පුළුවුස්නා ලද්දහු මෙසෙයින් විසඳන්නාහු නම් ඇපි මෙසේත් ඔවුනට වාදරොපණ කරම්හ''යි. ඔහු ''මහණ භවත් ගොයුම්හු අසෝ නම් ගමට හෝ නියම්ගමට හෝ වැඩිසේකැ'යි අසත්. ඔහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙත්. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් දහැමි කථායෙන් කරුණු දක්වනසේක. සමාදන් කරවන සේක, තෙද ගන්වන සේක, මොනොවට පහදවන සේක. ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථායෙන් කරුණු දක්වන ලදු වැ සමාදන් කරවන ලදු වැ තෙද ගන්වන ලදු වැ සතුටු කරවන ලදු වැ භාග්‍යවතුන් වහන්සේ අතින් පැන නො පුළුවුස්නාහ. කවර හෙයින් නම් වාදරෝපණ කෙරෙත් ද? ඒකාන්ත-යෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ සවු වෙත්. වහන්ස, මා ගේ මේ ධර්මාන්වය ද ඇත : ''භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත යැ. සඟහු සුපිළි-පන්හ''යි.

තවද වහන්ස, මම මෙලොව නිපුණ වූ පරා හා කළ වාදපරිචය ඇති වාලවේධි ධනුර්ධරයන් බඳු ප්‍රඥයෙන් දෘෂ්ටිගතයන් බිඳුනාවුන් මෙන් හැසිරෙන බ්‍රාහ්මණ පණ්ඩිතයනුදු . . . . ගෘහපති පණ්ඩිතයනුදු . . . . ශ්‍රමණපණ්ඩිතයනුදු දක්මි. ඔහු ශ්‍රමණ භවත් ගොයුම්හු අසෝ නම් ගමට හෝ නියම්ගමට හෝ වඩනාසේකැ'යි අසත්. ඔහු ප්‍රශ්න අභිසංස්කරණ කෙරෙති : ''අපි මෙ පැන මහණ ගොයුම්හු කරා එළැඹ පුළුවුසුම්හ. ඉදින් අප විසින් මෙසේ පුළුවුස්නා ලදු වැ මෙසේ ප්‍රකාශ කෙරෙත් නම් අපි ඔබට මෙසේ වාදරොපණ කරම්හ. අප විසින් මෙසේත් පුළුවුස්නාලදු වැ මෙසේ ව්‍යාකරණ කෙරෙත් නම් අපි මෙසේත් ඔබට වාදරොපණ කරම්හ''යි ඔහු ශ්‍රමණ භවත් ගොයුම්හු අසෝ නම් ගමට හෝ නියම්ගමට හෝ වැඩිසේකැ'යි අසත්, ඔහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙති. භාග්‍ය-වතුන් වහන්සේ ඔවුන් දහැමි කථායෙන් කරුණු දක්වනසේක, සමාදන් කරවනසේක, තෙද ගන්වනසේක, සතුටු කරවනසේක. ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථායෙන් කරුණු දක්වනලදු වැ සමාදන් කරවන ලදු වැ තෙද ගන්වන ලදු වැ සතුටු කරවන ලදු වැ භාග්‍යවතුන් වහන්සේ අතින් පැන නො ද පුළුවුස්නාහු මැ යැ. කවර හෙයින් වාදරෝපණ කෙරෙත් ද? ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ අතින් මැ ගෙන් නික්ම සසුන් වදනු සඳහා අවකාශ යදිත්. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් පැවිදි

පබ්බාජෙති. තෙ තථා පබ්බජිතා සමානා එකා වූපකට්ඨා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරිය-පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. තෙ එවමාහංසු : 'මනං[1] වත භො අනස්සාම, මනං[1] වත භො පනස්සාම. මයං හි පුබ්බෙ අස්සමණාව සමානා සමණම්හාති පටිජානිම්හා, අබ්‍රාහ්මණාව සමානා බ්‍රාහ්මණම්හාති පටිජානිම්හා, අනරහන්තොව සමානා අරහන්තම්හාති පටිජානිම්හා. ඉදානි ඛොම්හ සමණා, ඉදානි ඛොම්හ බ්‍රාහ්මණා, ඉදානි ඛොම්හ අරහන්තො'ති. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො හොති : 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති.

පුන ච පරං භන්තෙ, ඉමෙ ඉසිදත්තපුරාණා ථපතයො මම්භත්තා මමයානා අහං නෙසං ජීවිතස්ස පදාතා[2] යසස්ස ආහත්තා අථ ච පන නො තථා මයි නිපච්චාකාරං කරොන්ති යථා භගවති. භූතපුබ්බාහං භන්තෙ සෙනං අබ්භුය්‍යාතො සමානො ඉමෙච ඉසිදත්තපුරාණෙ ථපතයො වීමංසමානො අඤ්ඤතරස්මිං සම්බාධෙ ආවසථෙ වාසං උපගච්ඡිං. අථ ඛො භන්තෙ, ඉමෙ ඉසිදත්තපුරාණා ථපතයො බහුදෙව රත්තිං ධම්මියා කථාය වීතිනාමෙත්වා යතො අහොසි භගවා තතො සීසං කත්වා මං පාදතො කරිත්වා නිපජ්ජිංසු. තස්ස මය්හං භන්තෙ, එතදහොසි : 'අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, ඉමෙ ඉසිදත්ත-පුරාණා ථපතයො මම්භත්තා මමයානා, අහං නෙසං ජීවිතස්ස පදාතා, යසස්ස ආහත්තා. අථ ච පන නො තථා මයි නිපච්චාකාරං කරොන්ති යථා භගවති. අද්ධා ඉමෙ ආයස්මන්තො තස්ස භගවතො සාසනෙ උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානන්තී'ති. අයම්පි ඛො මෙ භන්තෙ, භගවති ධම්මන්වයො හොති : 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති.

පුන ච පරං භන්තෙ, භගවාපි ඛත්තියො, අහම්පි ඛත්තියො, භගවාපි කොසලකො, අහම්පි කොසලකො, භගවාපි ආසීතිකො, අහම්පි ආසීතිකො යම්පි භන්තෙ, භගවාපි ඛත්තියො, අහම්පි ඛත්තියො, භගවාපි කොසලකො, අහම්පි කොසලකො, භගවාපි ආසීතිකො, අහම්පි ආසීතිකො. ඉමිනාපාරහාමෙවාහං භන්තෙ, භගවති පරමනිපච්චාකාරං කාතුං. මිත්තූපහාරං උපදංසෙතුං. හන්ද ච දානි මයං භන්තෙ, ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණීයා'ති. යස්සදානි ත්වං මහාරාජ, කාලං මඤ්ඤසීති: අථ ඛො රාජා පසෙනදි කොසලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

---

1. මයං - සයා.
2. {ජීවිකාය, දාතා - මජසං. / ජීවිතං දාතා - PTS.}

කෙරෙත්. ඔහු එසේ පැවිදි වූවාහු එකලා වූවාහු වෙන් වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වැර ඇතියාහු ජීවිත නිරපේක්ෂක වැ වසන්නාහු නොබෝ කලෙකින් මැ කුලපුත්‍රයෝ යම් අර්ථයක් සඳහා මොනොවට ගෙන් නික්ම සසුන් වදිත් ද, බ්‍රහ්මචර්‍ය්‍යපර්‍ය්‍යවසාන කොට ඇති ඒ අනුත්තරාර්ථය දිටුදම්යෙහි මැ තමන් විසින් විශිෂ්ටඥනයෙන් දැන පසක් කොට උපයාගෙන විහරණ කෙරෙත්. ඔහු මෙසේ කීහු : ''භවත්නි, මදෙකින් නස්නමෝ මැ යැ, භවත්නි, මදෙකින් විනස්නමෝ මැ යැ. අපි පෙර අශ්‍රමණයමෝ 'ශ්‍රමණයම්හ'යි පිළින කළම්හ, අබ්‍රාහ්මණයමෝ 'බ්‍රාහ්මණයම්හ'යි පිළින කළම්හ, අර්හත් නො වන්නමෝ මැ 'අර්හත් වම්හ'යි පිළින කළම්හ. දැන් කලි ශ්‍රමණයම්හ, දැන් කලි බ්‍රාහ්මණයම්හ, දැන් කලි අර්හත් වම්හ''යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : ''භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් දහම් මොනොවට දෙසන ලද, සඟහු සුපිළිපන්හ'යි.

තවද වහන්ස, ඉසිදත්ත යැ පුරාණ යැ යන මේ දෙවඩුවෝ මා සතු බත් ඇතියාහු මා සතු යාන ඇතියාහු වෙති. මම උන් ගේ ජීවිත දෙන්නෙම් යසස් අරනෙම් වෙමි. එසේ වුව ද භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සෙයින් මා කෙරෙහි ගෞරවාකාර නො කෙරෙති. වහන්ස, පෙර වූ දයක් කියමි : ''මම සෙන් මෙහෙයන්නෙම් මේ ඉසිදත්තපුරාණ දෙවඩු-වනුදු විමසන්නෙම් එක්තරා සසම්බාධ ආවස්ථයෙක වාසයට එළැඹියෙමි. වහන්ස, එසඳ මේ ඉසිදත්තපුරාණ දෙවඩුවෝ රැය බොහෝ වේලාවක් දැහැමි කථායෙන් කල් ඇලවා භාග්‍යවතුන් වහන්සේ වසන දසට හිස කොට මා පාදයෙහි කොට වැදහොත්හ. වහන්ස, මට මෙල සිත්විි : ''භවත්නි, ආශ්චර්‍ය්‍යයෙක් මැ යැ, භවත්නි, අද්භූතයෙක් මැ යැ. මේ ඉසිදත්තපුරාණ දෙවඩුවෝ මා සතු බත් ඇතියාහු මා සතු යාන ඇතියාහු වෙති. මම උනට ජීවිතදයක වෙමි. යශස් අරනෙම් වෙමි. එතෙකුදු වුව භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සෙයින් මා කෙරෙහි නිපත්‍යාකාර නො කෙරෙති. ඒකාන්තයෙන් මේ ආයුෂ්මත්හු දෙදෙන ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ සස්නෙහි උදර වූ කැල මැ ඉපැයූ විශේෂයට වැඩි අපර විශේෂයක් දනිත් මැ යැ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මා ගේ මේ ධර්මාන්වය ද ඇත : ''භගවත්හු සම්‍යක් සම්බුද්ධයහ, භගවත්හු විසින් දහම මොනොවට දෙසන ලද, සඟහු සුපිළිපන්හ''යි.

තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රියයහ, මම ද ක්ෂත්‍රියයෙමි. භාග්‍යවතුන් වහන්සේ ද කොසොල් දනව්වැසියහ, මම ද කොසොල්දනව් වැසියෙමි. භාග්‍යවතුන් වහන්සේ ද අසූවයස් ඇතියහ, මම ද අසූවයස් ඇතියෙමි. වහන්ස, ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රියයහ, මම ද ක්ෂත්‍රියයෙමි. භාග්‍යවතුන් වහන්සේ ද කොසොල් දනව්වැසියහ, මම ද කොසොල්දනව්වැසියෙමි. භාග්‍යවතුන් වහන්සේ ද අසූවයස් ඇතියහ, මම ද අසූවයස් ඇතියෙමි'' යන යම් කරුණෙක් ඇත් ද වහන්ස, මම මෙ කරුණින් මැ පරමගෞරවාකාර කරන්නට ගෞරවොපහාර දක්වන්නට නිසියෙම් මැ යැ. වහන්ස, එයින් දැන් අපි යම්හ. අපි බොහෝ කිස ඇතියමෝ බොහෝ කරණී ඇති-යමෝ යයි. මහරජ, තෙපි දැන් එයට කල් දනැ'යි වදළෝ. එසඳ පසේනදි කොසොල් රජ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැද පැදකුණු කොට බැස ගියේ යි.

අථ ඛො භගවා අචිරපක්කන්තස්ස රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස භික්ඛූ ආමන්තෙසි: 'එසො භික්ඛවෙ, රාජා පසෙනදි කොසලො ධම්මචෙතියානි භාසිත්වා උට්ඨායාසනා පක්කන්තො. උග්ගණ්හාථ[1] භික්ඛවෙ, ධම්මචෙතියානි. පරියාපුණාථ භික්ඛවෙ, ධම්මචෙතියානි. ධාරෙථ භික්ඛවෙ, ධම්මචෙතියානි අත්ථසංහිතානි භික්ඛවෙ, ධම්මචෙතියානි ආදිබ්‍රහ්මචරියකානී'ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ධම්මචෙතියසුත්තං නවමං.

---

1. උග්ගණ්හථ - මජසං, සයා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පසේනදි කොසොල් රජු නික්ම යන්නා හා මැ මහණුන් ඇමැතූසේක : “මහණෙනි, මෙල පසේනදි කොසොල්රජ ධර්මචෛත්‍යයන් කියා හුනස්නෙන් නැඟී නික්ම ගියේ. මහණෙනි, ධර්මචෛත්‍යයන් උගනුව, මහණෙනි, ධර්මචෛත්‍යයන් පුහුණු කරව, මහණෙනි, ධර්මචෛත්‍යයන් ධරව. මහණෙනි, ධර්මචෛත්‍යයෝ අර්ථසංහිතයහ, ආදිබ්‍රහ්මචර්‍ය්‍යකයහ”යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්‍දනා කළහ”යි.

නව වැනි ධම්මචේතිය සූත්‍ර යි.

2. 4. 10

කණ්ණකත්ථල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා උජුඤ්ඤායං[1] විහරති කණ්ණකත්ථලෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො උජුඤ්ඤං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො රාජා පසෙනදි කොසලො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: 'එහි ත්වං අම්භො පුරිස යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ, 'රාජා භන්තෙ, පසෙනදි කොසලො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී'ති. එවඤ්ච වදෙහි: 'අජ්ජ කිර භන්තෙ, රාජා පසෙනදි කොසලො පච්ඡාභත්තං භුත්තපාතරාසො භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. එවං දෙවාති ඛො සො පුරිසො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො භගවන්තං එතදවොච: 'රාජා භන්තෙ, පසෙනදි කොසලො භගවතො පාදෙ සිරසා වන්දති. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: අජ්ජ කිර භන්තෙ, රාජා පසෙනදි කොසලො පච්ඡාභත්තං භුත්තපාතරාසො භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සතී'ති.

අස්සොසුං ඛො සොමා ච භගිනී සකුලා ච භගිනී 'අජ්ජ කිර රාජා පසෙනදි. කොසලො පච්ඡාභත්තං භුත්තපාතරාසො භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. අථ ඛො සොමා ච භගිනී සකුලා ච භගිනී රාජානං පසෙනදිං කොසලං භත්තාභිහාරෙ උපසඞ්කමිත්වා එතදවොචුං: 'තෙන හි මහාරාජ, අම්හාකම්පි වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: 'සොමා ච භන්තෙ, භගිනී සකුලා ච භගිනී භගවතො පාදෙ සිරසා වන්දන්ති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡන්තී'ති.

අථ ඛො රාජා පසෙනදි කොසලො පච්ඡාභත්තං භුත්තපාතරාසො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: 'සොමා ච භන්තෙ, භගිනී සකුලා ච භගිනී භගවතො පාදෙ සිරසා වන්දන්ති. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡන්තී'ති. කිම්පන මහාරාජ, සොමා ච භගිනී සකුලා ච භගිනී අඤ්ඤං දූතං නාලත්ථු'න්ති.

---

1. උරුඤ්ඤායං - මජසං.
උදඤ්ඤායං - ස්‍යා.
උදුඤ්ඤායං - PTS.

2. 4. 10
කණ්ණකත්ථල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ උජ්ජුකා රටැ කණ්ණකත්ථල නම් මුවළැව්හි වැඩ වසනසේක. එසමයෙහි පසේනදි කොසොල් රජ කිසි කටයුත්තෙකින් උජ්ජුකාවට පැමිණියේ වෙයි. එසඳ පසේනදි කොසොල් රජ එක්තරා පුරුෂයකු ඇමැති: එම්බල පුරුෂය, තෝ එව. බුදුන් කරා එළැඹෙව, එළැඹ මාගේ වචනයෙන් බුදුන්ගේ පාසහළ හිසින් වඳු. ''වහන්ස, පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ හිසින් වඳියි. අල්පාබාධ බව නිදුක් බව සිරුරෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුසී'' යයි අල්පා-බාධත්වය නිදුක් බව ශරීරයෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුස. මෙසේත් කියව : ''වහන්ස, අද පසේනදි කොසොල්රජ පසුබතැ. වැළඳූ පෙරවරුබත් ඇතියේ බුදුන් දක්නා සඳහා එළැඹේ''යයි. 'දේවයිනි, එසේ යැ'යි ඒ පුරුෂයා පසේනදි කොසොල් රජහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඒ පුරුෂයා භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ. වහන්ස, පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ හිසින් වඳියි. අල්පා-බාධ බව නිදුක් බව සිරුරෙහි සැහැල්ලු බව කායබලය පහසුවිහරණ පුළුවුසී. මෙසේත් කියයි : ''වහන්ස, පසේනදි කොසොල්රජ අද වැළඳූ පෙරවරුබත් ඇති වැ පසුබත්හි බුදුන් දක්නා සඳහා එළැඹේ''යයි.

සොමා බුහුන ද සකුලා බුහුන ද ''පසේනදි කොසොල් රජ අද වැළැඳූ පෙරවරුබත් ඇති වැ පසුබත්හි බුදුන් දක්නා සඳහා එළැඹෙති'' ඇසූහු. එසඳ සොමා බුහුන ද සකුලා බුහුන ද බත් වඩන තන්හි දී පසේනදි කොසොල් රජු කරා එළැඹ තෙල කීහු : ''මහරජ එසේ හෙයින් අප ගේ වචනයෙනුදු භාග්‍යවතුන් වහන්සේ ගේ පාසහළ හිසින් වඳිනු මැනැව, අල්පාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසු විහරණ පිළිවිසිනු මැනැව : ''සොමා බුහුන ද සකුලා බුහුන ද භාග්‍යවතුන් වහන්සේගේ පාසහළුළුවන් හිසින් වඳිති, අල්පාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුසිත්''යයි..

ඉක්බිති පසේනදි කොසොල්රජ වැළැඳූ පෙරවරුබත් ඇති වැ පසුබත්හි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ : ''වහන්ස, සොමා බුහුන ද සකුලා බුහුන ද භාග්‍යවතුන් වහන්සේ ගේ පාදයන් හිසින් වඳිති. නිරාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුසිත්. කිමෙක මහරජ සොමා බුහුන ද සකුලා බුහුන ද අන්‍යදූතයකු නො ලද්හු ද? යි.

Free Distribution www.aathaapi.org

අස්සොසුං ඛො, භන්තෙ, සොමා ච භගිනී සකුලා ච භගිනී. ‘අජ්ජ කිර රජා පසෙනදි කොසලො පච්ඡාභත්තං භුත්තපාතරාසො භගවන්තං දස්සනාය උපසඞ්කමිස්සතී’ති. අථ ඛො, භන්තෙ, සොමා ච භගිනී සකුලා ච භගිනී මං භත්තාභිහාරෙ උපසඞ්කමිත්වා එතදවොචුං: තෙන හි මහාරජ, අම්හාකම්පි වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ, සොමා ච භන්තෙ, භගිනී සකුලා ච භගිනී භගවතො පාදෙ සිරසා වන්දන්ති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡන්තී’ති.

සුඛිනියො හොන්තු මහාරජ, සොමා ච භගිනී සකුලා ච භගිනීති.

අථ ඛො රජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: “සුතං මෙතං භන්තෙ, සමණො ගොතමො එවමාහ: ‘නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා යො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානිස්සති, නෙතං ඨානං විජ්ජතී’ති. යෙ තෙ භන්තෙ එවමාහංසු: ‘සමණො ගොතමො එවමාහ: නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා යො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානිස්සති. නෙතං ඨානං විජ්ජතීති. කච්චි තෙ භන්තෙ, භගවතො වුත්තවාදිනො, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති. ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොන්ති, න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතී’ති.

යෙ තෙ මහාරජ, එවමාහංසු: ‘සමණො ගොතමො එවමාහ: නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා යො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානිස්සති. නෙතං ඨානං විජ්ජති. න මෙ තෙ වුත්තවාදිනො අබ්භාචික්ඛන්ති ච පන මං තෙ අසතා අභූතෙනා’ති.

අථ ඛො රජා පසෙනදි කොසලො විඩූඩභං[1] සෙනාපතිං ආමන්තෙසි: ‘කො නු ඛොජ්ජ[2] සෙනාපති, ඉමං කථාවත්ථුං[3] රජන්තෙපුරෙ අබ්භුදාහාසීති? ‘සඤ්ජයො මහාරජ, බ්‍රාහ්මණො ආකාසගොත්තො’ති.

අථ ඛො රජා පසෙනදි කොසලො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි, ‘එහි ත්වං අම්භො පුරිස, මම වචනෙන සඤ්ජයං බ්‍රාහ්මණං ආකාසගොත්තං ආමන්තෙසි. රජා තං[4] භන්තෙ, පසෙනදි කොසලො ආමන්තෙතී’ති. එවං දෙවාති ඛො සො පුරිසො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා යෙන සඤ්ජයො බ්‍රාහ්මණො ආකාසගොත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සඤ්ජයං බ්‍රාහ්මණං ආකාසගොත්තං එතදවොච: ‘රජා තං භන්තෙ, පසෙනදි කොසලො ආමන්තෙතී’ති.

අථ ඛො රජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: සියා නු ඛො භන්තෙ, භගවතා අඤ්ඤදෙව කිඤ්චි සන්ධාය වාචා භාසිතා[5], තඤ්ච ජනො අඤ්ඤථා විපච්චාගච්ඡෙය්‍යාති?[6].

අභිජානාමි මහාරජ වාචං භාසිතාති[7]

---

1. විටටූභං - මජසං.
2. කො නු ඛො - මජසං, සයා, PTS.
3. කථාවත්ථු - සිමු.
4. රජා තෙ - PTS.
5. සන්ධාය භාසිතං - මජසං, සයා, PTS.
6. පච්චාගච්ඡෙය්‍ය - මජසං, සයා, PTS.
7. අභිජානාමි මහාරජ වාචං භාසිතාති. මජසං, සයා, PTS, උඵසං.

වහන්ස, සෝමා බුහුන ද සකුලා බුහුන ද "අද පසේනදි කොසොල් රජ වැළැඳූ පෙරවරු බත් ඇති වැ පසුබත්හි බුදුන් දක්නට එළැඹෙලැ"යි ඇසූහ. එසඳ වහන්ස, සෝමා බුහුන ද සකුලා බුහුන ද බත්වඩන තැන්හි මා කරා එළැඹ මෙල කීහු : එසේ වී නම් මහරජ, "වහන්ස, සෝමා බුහුන ද සකුලා බුහුන ද භාග්‍යවතුන් වහන්සේ ගේ පාසඟුළු හිසින් වඳිති, නිරාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුස්ති"යි අපගේ ද බසින් භාග්‍යවතුන්ගේ පාසඟුළු වඳුව, අල්පාබාධ අල්පාතඞ්ක ලඝුත්ථාන කායබල ඵාසුවිහරණ පුළුවුස්ව"යි කීහු.

මහරජ, සෝමා බුහුන ද සකුලා බුහුන ද සුවපත් වෙත්ව'යි.

ඉක්බිති පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙල බස් සැලකෙළේ : "වහන්ස, මා විසින් මෙලෙ අසන ලද, ශ්‍රමණ ගෞතම මෙසේ කියයි : "යමෙක් සියල්ල දන්නේ සියල්ල දක්නේ නිරවශෙෂ ඥානදර්‍ශනය පිළින කරන්නේ නම් එ බඳු මහණෙක් හෝ බමුණෙක් හෝ නැත. මෙල කරුණ විද්‍යමාන නො වේ" යයි. වහන්සේ, යම් කෙනෙක් මෙසේ කීහු නම් : "මහණ ගොයුම් මෙසේ කියයි : 'යමෙක් සියල්ල දන්නේ සියල්ල දක්නේ නිරවශේෂ ඥානදර්‍ශනය පිළින කරන්නේ නම් එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. මෙල කරුණ විද්‍යමාන නො වේ" යයි කීහු නම්, කිම වහන්ස, ඔහු භාග්‍යවතුන් විසින් කියූ දයක් කියන්නාහු ද, භාග්‍යවත්නට අභූතයෙන් නො ද අභිභවා කියත් ද, වදළ කාරණයට අනුකාරණයක් පවසත් ද, කිසි සකාරණ වාදානු-වාදයෙක් නො ද ගැරහියයුතු තැනට ඒ ද?යි.

මහරජ, යම් කෙනෙක් මෙසේ කීහු ද : "මහණ ගොයුම් මෙසේ කියයි : 'යමෙක් සියල්ල දන්නේ සියල්ල දක්නේ නිරවශේෂ ඥානදර්‍ශනය පිළින කරන්නේ නම් එබඳු මහණෙක් හෝ බමුණෙක් හෝ නැත, මෙල කරුණ විද්‍යමාන නො වේ"යයි කීහු නම් ඔහු මට උක්තවාදී නො වෙති, වැළිත් ඔහු මට අසත්‍යයෙන් අභූතයෙන් අභිභවා කියති"යි.

එසඳ පසේනදි කොසොල් රජ විඩූඩභ සෙන්පතිහු ඇමැතී : "සෙන්පතිය, අද කවරෙක් නම් මේ කථාවස්තුව රාජාන්තඃපුරයෙහි පහළ කොට බිණී ද? මහරජ, ආකාශගෝත්‍ර සඤ්ජයබ්‍රාහ්මණ යි.

එසඳ පසේනදි කොසොල් රජ අන්‍යතර පුරුෂයකු ඇමැතී : එම්බා පුරුෂය, තෝ ඒ, මා බසින් අහස්ගොතු සඤ්ජය බමුණු කැඳව. වහන්ස, "පසේනදි කොසොල් රජ මුබ කැඳවති"යි. 'දෙවයෙනි එසේ යැ'යි ඒ පුරුෂයා පසේනදි කොසොල් රජුට පිළිවදන් දී අහස්ගොතු සඤ්ජය බමුණු කරා එළැඹියේ, එළැඹ අහස්ගොතු සඤ්ජය බමුණුට මෙල කී : "වහන්ස, පසේනදි කොසොල් රජ මුබ කැඳවති"යි.

ඉක්බිති පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අන් කිසි දයක් මැ සඳහා වදළ බසෙක් ඇද්ද, ජනයා එ බස අන් සැටියෙකින් වරදවා ගත්තේ යැ'යි.

මහරජ, බසක් කීයෙම් දනිම් මැ යැ.

යථා කථම්පන භන්තෙ, භගවා අභිජානාති වාචං භාසිතාති?[1].

එවං ඛො අහං මහාරාජ, අභිජානාමි වාචං භාසිතා[1] 'නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා, යො සකිදෙව සබ්බං ඤස්සති, සබ්බං දක්ඛිති, නෙතං ඨානං විජ්ජති'ති.

හෙතුරූපං භන්තෙ, භගවා ආහ සහෙතුරූපං භන්තෙ භගවා ආහ: 'නත්ථි සො සමණො වා බ්‍රාහ්මණො වා, යො සකිදෙව සබ්බං ඤස්සති, සබ්බං දක්ඛිති, නෙතං ඨානං විජ්ජතීති.. චත්තාරෙ මෙ භන්තෙ, වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඉමෙසං නු ඛො භන්තෙ, චතුන්නං වණ්ණානං සියා විසෙසො, සියා නානාකරණ'න්ති?

චත්තාරෙ 'මෙ මහාරාජ, වණ්ණා. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඉමෙසං ඛො මහාරාජ, චතුන්නං වණ්ණානං ද්වෙ වණ්ණා අග්ගමක්ඛායන්ති, ඛත්තියා ච බ්‍රාහ්මණා ච. යදිදං අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචි-කම්මානන්ති[2].

නාහං භන්තෙ, භගවන්තං දිට්ඨධම්මිකං පුච්ඡාමි, සම්පරායිකාහං භන්තෙ, භගවන්තං පුච්ඡාමි. චත්තාරෙ මෙ භන්තෙ, වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඉමෙසං නු ඛො භන්තෙ, චතුන්නං වණ්ණානං සියා විසෙසො, සියා නානාකරණන්ති?

පඤ්චිමානි මහාරාජ, පධානියඞ්ගානි. කතමානි පඤ්ච? ඉධ මහාරාජ, භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරෙ පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරීසු. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා ඉමානි ඛො මහාරාජ, පඤ්ච පධානියඞ්ගානි. චත්තාරොමෙ මහාරාජ, වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. තෙ චස්සු ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතා, තං තෙසං[3] අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

චත්තාරො මෙ භන්තෙ වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා, තෙ චස්සු ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතා එත්ථ පන තෙසං භන්තෙ, සියා විසෙසො සියා නානාකරණන්ති?

---

1. වචා භාසිතා - සීමු.
2. සාමීචිකම්මානීති - මජසං.
   සාමීචිකම්මන්ති - ස්‍යා, PTS.
3. එත්ථ පන තෙසං - මජසං.

වහන්ස, බසක් බණන භාග්‍යවතුන් වහන්සේ කෙබඳු බසක් සිහි කරන සේක් ද?

මහරජ, බසක් බණන මම මෙසේ දනිමි : ''යමෙක් එක් වර මැ හැම දන්නේ නම් හැම දක්නේ නම් එබඳු මහණෙක් හෝ බමුණෙක් හෝ නැත, තෙල කරුණ විද්‍යමාන නො වේ''යයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හේතුසවභාවය වදරති, වහන්ස භාග්‍යවතුන් වහන්සේ සකාරණ සවභාවය වදරති. එක් වර මැ හැම දන්නා හැම දක්නා මහණෙක් හෝ බමුණෙක් හෝ නැත, තෙල කරුණ විද්‍යමාන නො වෙති'යි. වහන්ස, මේ සතර වර්ණ කෙනෙක් ඇත : ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහමණයෝ ය. වෛශ්‍යයෝ යැ, ශුද්‍රයෝ යි. වහන්ස, මේ සතර වර්ණයන් ගේ විශේෂයෙක් ඇත නානාත්වයෙක් ඇත?

මහරජ, මේ වර්ණයෝ සතර දෙනෙකි : ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ වෛශ්‍යයෝ යැ ශුද්‍රයෝ යි. මහරජ, මේ සතර වර්ණයන් අතුරින් වර්ණයෝ දෙදෙනෙක් අග්‍රයහ'යි කියනු ලැබෙති. ක්ෂත්‍රියයන් හා බ්‍රාහ්මණයෝ යි. කෙසේ යැ යත් : අභිවාදන උත්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්මයන්ගේ වශයෙනි.

වහන්ස, මම භාග්‍යවත්හු අතින් ඓහලෞකික වෙනස නො පුළුවුස්මි. වහන්ස, මම භගවත්හු අතින් පාරලෞකිකවෙනස පුළුවුස්මි. වහන්ස, මේ වර්ණයෝ සතර දෙනෙකි : ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ වෛශ්‍යයෝ යැ ශුද්‍රයෝ යි. වහන්ස, මේ සතර වර්ණයන්ගේ විශෙෂයෙක් ඇද්ද, නානාකරණයෙක් ඇද්ද?

මහරජ, මේ ප්‍රධන්වියර්යට හිත වූ අඞ්ගයෝ පස් දෙනෙකි : කවර පස් දෙනෙක යත් : මහරජ, මෙ සස්නෙහි මහණ සැදැහැති වෙයි, තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බෝධිය හදහයි : ''මෙ කරුණිනුදු භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ; ලොකවිත්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, සිව්සස් දත්හ, භගවත්හ''යි. අල්පාබාධ වැ අල්පාතඞ්ක වැ නාතිශීත, නාත්‍යුෂ්ණ, මධ්‍යම, ප්‍රධන්වියර්යට නිසි සම වැ පස්නා ග්‍රහණියෙන් සමන්වාගත වැ සිටුනේ වෙයි. අශඨ වෙයි, අමායාවී වෙයි. යථාභූත ආත්මය ශාස්තෘවරයා කෙරෙහිදු විඥ සබ්‍රහ්මචාරීන් කෙරෙහි දු හෙළි කරනු වෙයි. අකුශලධර්මයන් ගේ ප්‍රහාණය සඳහා කුශලධර්මයන්ගේ උපසම්පත් සඳහා බලවත් වැ දෘඪපරාක්‍රම ඇති වැ කුශල් දහම්හි නො හළ ධුර ඇති වැ රුකුළු වැර ඇති වැ වෙසෙයි. ආයර් වූ කෙලෙසුන් බිඳුනා මොනොවට දුක් කිය කරනුවට යන උදවිය කරා දිවෙන ප්‍රඥයෙන් සමන්වාගත වැ ප්‍රඥවත් වෙයි. මහරජ, මේ පස් පධානියඞ්ගයෝ යි. මහරජ, මේ වර්ණයෝ සතර දෙනෙකි : ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ වෛශ්‍යයෝ යැ ශුද්‍රයෝ යි. ඔහු මෙ පස් වැදැරුම් ප්‍රධන් වැරට හිත කරුණින් සමන්වාගත වෙත් ද, එය ඔවුනට දීර්ඝරාත්‍රියෙහි හිතයට සුඛයට වැටෙයි.

වහන්ස, මේ වර්ණයෝ සතර දෙනෙකි : ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ වෛශ්‍යයෝ යැ ශුද්‍රයෝ යි. ඔහුදු මේ පඤ්චප්‍රකාර ප්‍රධන් වැරට හිත වූ කරුණින් සමන්වාගත වෙත් ද, මෙහිදු වහන්ස, උන්ගේ විශෙෂයෙක් ඇද්ද; නානාකරණයෙක් ඇද්දැ ?යි.

එත්ථ ඛො පන නෙසාහං මහාරාජ, පධානවෙමත්තතං[1] වදාමි. සෙය්‍යථාපස්සු[2] මහාරාජ, ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතා, ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා අදන්තා අවිනීතා. තං කිං මඤ්ඤසි මහාරාජ, යෙ තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතා, අපි නු තෙ දන්තාව දන්තකාරණං ගච්ඡෙය්‍යුං. දන්තාව දන්තභූමිං සම්පාපුණෙය්‍යුන්ති?

එවං භන්තෙ.

යෙ පන තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා අදන්තා අවිනීතා, අපි නු තෙ අදන්තාව දන්තකාරණං ගච්ඡෙය්‍යුං. අදන්තාව දන්තභූමිං සම්පාපුණෙය්‍යුං සෙය්‍යථාපි තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතාති?

නොහෙතං භන්තෙ.

එවමෙව ඛො මහාරාජ, යං තං සද්ධෙන පත්තබ්බං අප්පාබාධෙන අසඨෙන අමායාවිනා ආරද්ධවිරියෙන පඤ්ඤවතා, තං වත අස්සද්ධො බව්හාබාධො සඨො මායාවී කුසීතො දුප්පඤ්ඤො පාපුණිස්සතී'ති නෙතං ඨානං විජ්ජතීති.

හෙතුරූපං භන්තෙ, භගවා ආහ. සහෙතුරූපං භන්තෙ භගවා ආහ. චත්තාරොමෙ භන්තෙ, වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා, තෙ චස්සු ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතා, තෙ චස්සු සම්මප්පධානා. එත්ථ පන නෙසං භන්තෙ, සියා විසෙසො, සියා නානාකරණන්ති.

එත්ථ ඛො පන නෙසාහං[3] මහාරාජ, න කිඤ්චි නානාකරණං වදාමි, යදිදං විමුත්තියා විමුත්තිං. සෙය්‍යථාපි මහාරාජ, පුරිසො සුක්ඛං සාකකට්ඨං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතුකරෙය්‍ය. අථ අපරො පුරිසො සුක්ඛං සාලකට්ඨං ආදාය, අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතුකරෙය්‍ය. අථ අපරො පුරිසො සුක්ඛං අම්බකට්ඨං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය. තෙජො පාතුකරෙය්‍ය. අථ අපරො පුරිසො සුක්ඛං උදුම්බරකට්ඨං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍ය. තං කිං මඤ්ඤසි මහාරාජ, සියා නු ඛො තෙසං අග්ගීනං නානාදාරුතො අභිනිබ්බත්තානං කිඤ්චි නානාකරණං, අච්චියා වා අච්චිං වණ්ණෙන වා වණ්ණං, ආභාය වා ආභන්ති?

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො මහාරාජ, යං තං තෙජං විරියං නිප්ඵරති, තං[4] පධානාභිනිබ්බත්තං[5] නාහං තත්ථ කිඤ්චි නානාකරණං වදාමි යදිදං විමුත්තියා විමුත්තින්ති.

---

1. නානත්තං - සීමු. / වෙමත්තං - PTS.
2. සෙය්‍යථාපිස්සු - මජසං, PTS.
3. එත්ථ ඛො නෙසාහං - මජසං, PTS.
4. විරියා නිම්මථිතං - මජසං.
5. පච්ඡාභිනිබ්බත්තං - සීමු.

මහරජ, මෙහිලා උන්ගේ ප්‍රධන්හි වෙනස් බව කියමි. මහරජ, යම් පරිදි නහඹු හස්තිහු දෙදෙනෙක් හෝ නහඹු අශ්වයෝ දෙදෙනෙක් හෝ නහඹු ගවයෝ දෙදෙනෙක් හෝ සුදාන්ත වැ සුවිනීත වැ ඇද්ද, නහඹු හස්තිහු දෙදෙනෙක් හෝ නහඹු අශ්වයෝ දෙදෙනෙක් හෝ නහඹු ගවයෝ දෙදෙනෙක් හෝ අදාන්ත වැ අවිනීත වැ ඇද්ද, මහරජ, ඒ කෙසේ හඟිහි? යම් ඒ නහඹු හස්තිහු දෙදෙනෙක් හෝ නහඹු අශ්වයෝ දෙදෙනෙක් හෝ නහඹු ගවයෝ දෙදෙනෙක් හෝ සුදාන්ත වැ සුවිනීත වැ වැටෙත් ද, කිම ඔහු දාන්ත වූවාහු මැ දාන්තකාරණයට යෙත් ද, දන්ත වූවාහු මැ දාන්තභූමියට පැමිණෙත් ද? යි.

වහන්ස, එසේ යැ.

යම් ඒ නහඹු හස්තිහු දෙදෙනා හෝ නහඹු අශ්වයෝ දෙදෙනා හෝ නහඹු ගවයෝ දෙදෙනා හෝ අදාන්ත වැ මැ යම් පරිදි මුල කී සුදාන්ත සුවිනීත ඒ නහඹු ඇතුන් දෙදෙනා සෙයින් නහඹු අසුන් දෙදෙනා සෙයින් නහඹු ගවයන් දෙදෙනා සෙයින් අදාන්තවූවාහුමැ දාන්තකාරණයට යෙත් ද? අදාන්ත වූවාහු මැ දාන්තභූමියට යෙත් ද? යි.

වහන්ස, නෙල නො වේ මැ යි.

මහරජ, එ පරිදි මැ සැදෑහැති අල්පාබාධ අශඨ, මායා බහුල නො වන, ආරබ්ධවීර්‍ය්‍ය ඇති, ප්‍රඥාසම්පන්න ශ්‍රාවකයා විසින් යම් ඒ ඵලයක් ලැබියයුතු වේ නම් සැදැහැ නැති ආබාධ බහුල වූ ශඨ වූ මායා බහුල වූ කුසීත වූ දුෂ්ප්‍රාඥ වූයේ ඒ ඵලය එකාන්තයෙන් ලබන්නේ යැ යන කරුණ සිදු නො වෙයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හේතුස්වරූපයක් වදරති, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සකාරණස්වරූපය වදරති. වහන්ස, මේ වර්ණයෝ සතර දෙනෙකි: ක්‍ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ වෛශ්‍යයෝ යැ ශූද්‍රයෝ යි. ඔහු ද මේ පස් වැදෑරුම් ප්‍රධන් වැරට හිත කරුණින් සමන්වාගත වෙත් ද, ඔහු දු සම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍ය ඇත්තාහු වෙත් ද, වහන්සෙ, මෙහිලා උන්ගේ විශේෂයෙක් ඇද්ද, නානාත්වයෙක් ඇද්දැ? යි.

මහරජ, මම මෙහි ලා උන්ගේ කිසි නානාත්වයක් නො කියමි. එනම් විමුක්තියෙන් විමුක්තිය යි, (එකක්හු ගේ ඵලවිමුක්තියෙන් අනෙකක්හුගේ ඵලවිමුක්තිය ඇරබැ යැ.) මහරජ, යම් පරිදි පුරුෂයෙක් වියැළි ශාකකාෂ්ටයක් ගෙන ගිනි නිපදවා නම් තෙද පහළ කෙරේ නම් යළි අන් පුරුෂයෙක් වියැළි ශාලකාෂ්ටයක් ගෙන ගිනි නිපදවා නම් තෙද පහළ කෙරේ නම් යළි අන් පුරුෂයෙක් වියැළි ආම්‍රකාෂ්ටයක් ගෙන ගිනි නිපදවා නම් තෙද පහළ කෙරේ නම් යළි අන් පුරුෂයෙක් වියැළි උදුම්බරකාෂ්ටයක් ගෙන ගිනි නිපදවා නම් තෙද පහළ කෙරේ නම්, මහරජ, ඒ කෙසේ හඟිහි? නන් දරින් නිපන් ඒ අග්නීන්ගේ කිසියම් වෙනසෙක් වේ ද: සිළුවෙන් සිළුවෙහි හෝ යැ, පැහැයෙන් පැහැයෙහි හෝ යැ එළියෙන් එළියෙහි හෝ යැ?

වහන්ස, නෙල නො වේ මැ යි.

මහරජ, එපරිදි මැ යම් ඒ තෙදක් වැර අරභයා පැතිර සිටුනේ ද, ඒ ප්‍රධනින් නිපණ. එහිලා මම කිසි නානාත්වයක් නො කියමි. එනම් විමුක්තියෙන් විමුක්තිය ඇරබ යැ.

හෙතුරූපං භන්තෙ, භගවා ආහ, සහෙතුරූපං භන්තෙ, භගවා ආහ කිං පන භන්තෙ, අත්ථි දෙවාති? කිං පන ත්වං මහාරාජ? එවං වදෙසි: කිං පන භන්තෙ, අත්ථි දෙවාති? යදි වා තෙ භන්තෙ, දෙවා ආගන්තාරො ඉත්ථත්තං, යදි වා අනාගන්තාරො ඉත්ථත්තන්ති. යෙ තෙ මහාරාජ? දෙවා සබ්‍යාපජ්ඣා තෙ දෙවා ආගන්තාරො ඉත්ථත්තං යෙ තෙ දෙවා අබ්‍යාපජ්ඣා, තෙ දෙවා අනාගන්තාරො ඉත්ථත්තන්ති.

එවං වුත්තෙ විඩූඩභො[1] සෙනාපති භගවන්තං එතදවොච: 'යෙ තෙ භන්තෙ දෙවා සබ්‍යාපජ්ඣා ආගන්තාරො ඉත්ථත්තං, තෙ දෙවා යෙ තෙ දෙවා අබ්‍යාපජ්ඣා අනාගන්තාරො ඉත්ථත්තං තෙ දෙවෙ තම්හා ඨානා චාවෙස්සන්ති වා පබ්බාජෙස්සන්ති වා'ති.

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: 'අයං ඛො විඩූඩභො සෙනාපති රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පුත්තො. අහං භගවතො පුත්තො. අයං ඛො කාලො යං පුත්තො පුත්තෙන මන්තෙය්‍යා'ති.

අථ ඛො ආයස්මා ආනන්දො විඩූඩභං සෙනාපතිං ආමන්තෙසි: 'තෙනහි සෙනාපති, තං යෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි සෙනාපති, යාවතා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස විජිතං, යත්ථ ච රාජා පසෙනදි කොසලො ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙති. පහොති තත්ථ රාජා පසෙනදි කොසලො සමණං වා බ්‍රාහ්මණං වා පුඤ්ඤවන්තං වා අපුඤ්ඤවන්තං වා බ්‍රහ්මචරියවන්තං වා අබ්‍රහ්මචරියවන්තං වා තම්හා ඨානා චාවෙතුං වා පබ්බාජෙතුං වා'ති?

යාවතා භො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස විජිතං යත්ථ ච රාජා පසෙනදි කොසලො ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙති. පහොති තත්ථ රාජා පසෙනදි කොසලො සමණං වා බ්‍රාහ්මණං වා පුඤ්ඤවන්තං වා අපුඤ්ඤවන්තං වා බ්‍රහ්මචරියවන්තං වා අබ්‍රහ්මචරියවන්තං වා තම්හා ඨානා චාවෙතුං වා පබ්බාජෙතුං වා'ති.

තං කිං මඤ්ඤසි සෙනාපති, යාවතා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අවිජිතං. යත්ථ ච රාජා පසෙනදි කොසලො ඉස්සරියාධිපච්චං රජ්ජං න කාරෙති. පහොති තත්ථ රාජා පසෙනදි කොසලො සමණං වා බ්‍රාහ්මණං වා, පුඤ්ඤවන්තං වා අපුඤ්ඤවන්තං වා බ්‍රහ්මචරියවන්තං වා අබ්‍රහ්මචරිය-වන්තං වා තම්හා ඨානා චාවෙතුං වා පබ්බාජෙතුං වාති.

යාවතා භො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අවිජිතං, යත්ථ ච රාජා පසෙනදිස්ස කොසලො ඉස්සරියාධිපච්චං රජ්ජං න කාරෙති. න තත්ථ පහොති රාජා පසෙනදි කොසලො සමණං වා බ්‍රාහ්මණං වා පුඤ්ඤවන්තං වා අපුඤ්ඤවන්තං වා බ්‍රහ්මචරියවන්තං වා අබ්‍රහ්මචරියවන්තං වා තම්හා ඨානා චාවෙතුං වා පබ්බාජෙතුං වාති.

තං කිං මඤ්ඤසි සෙනාපති, සුතා තෙ දෙවා තාවතිංසාති?

එවං භො, සුතං මෙ දෙවා තාවතිංසා. ඉධාපි භොතා රඤ්ඤා පසෙනදිනා කොසලෙන සුතා දෙවා තාවතිංසා'ති.

1. විටටූභො - මජසං.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හේතුස්වරූපය වදරති. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සහේතුක ස්වරූපය වදරති. වහන්ස, කිම දෙවියෝ ඇද්ද, මහරජ, "වහන්ස, කිම දෙවියෝ ඇද්ද'යි කුමට තෝ මෙසේ කියෙහි? වහන්ස, ඒ දෙවියෝ මේ මිනිසත් බවට ඉදින් එනසුලු හෝ වෙත් ද, ඉදින් මිනිසත් බවට නො එනසුලු හෝ වෙත් ද"යි. මහරජ, යම් දෙවි කෙනෙක් ත්‍රපුහුන් චෛතසික දුක් ඇත්තාහු ද, ඒ දෙවියෝ මිනිසත් බවට (උපපත්ති වශයෙන්) එන සුලු වෙත්. යම් දෙවි කෙනෙක් පුහුන් චෛතසික දුක් ඇත්තාහු ද, ඒ දෙවියෝ මේ මිනිසත් බවට (උපපත්ති වශයෙන්) නො එන සුලු වෙත්.

මෙසේ වදළ කල විඩූඩභ සෙන්පති භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "වහන්ස, දුක්සහගිය මිනිසත් බවට එනසුලු යම් දෙවි කෙනෙක් ඇද්ද, ඒ දෙවියෝ ද, නිදුක් වූ මිනිසත් බවට නො එනසුලු යම් දෙවි කෙනෙක් ඇද්ද, ඒ දෙවියෝ ද'යි ඒ දෙ වැදෑරුම් දෙවියන් ඒ දේවස්ථානයෙන් ච්‍යුත කරවන්නාහු වෙත් ද නොරවන්නාහු හෝ වෙත් ද ?යි.

ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවනට තෙල සිත් වී : "මේ විඩූඩභ සෙන්පති පසේනදි කොසොල් රජුගේ පුත් යැ, මම භාග්‍යවතුන් වහන්සේගේ පුත්මි. පුතෙක් පුතකු හා මන්ත්‍රණ කරන්නේ යැ යන යමෙක් ඇද්ද, මේ එයට කාලය යතු යි.

ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවෝ විඩූඩභ සෙන්පතිහි ඇමැතූහ : සෙන්පතිය, එකරුණින් මෙහි දී තා මැ පුළුවුස්මි. යම් පරිදි තට රුස්නේ නම් එපරිදි එය පවසව. සෙන්පතිය ඒ කෙසේ හඟිහි? පසේනදි කොසොල් රජහු ගේ විජිතය යම් තාක් වේ ද, පසේනදි කොසොල් රජ යම් විජිතයෙක ඉසුරු බව හා ආධිපත්‍යය ඇති රාජ්‍යය කෙරේ ද ඒ විජිතයෙහි දී පසේනදි කොසොල් රජ පුණ්‍යවත් හෝ අපුණ්‍යවත් හෝ බ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ අබ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ මහණකු හෝ බමුණකු හෝ ච්‍යුත කරවන්නට නංවන්නට හෝ හැකි වේ ද?

භවත්නි, පසේනදි කොසොල් රජහු ගේ විජිතය යම් තාක් වේ ද පසේනදි කොසොල් රජ යම් විජිතයෙක ඉසුරු බව හා අධිපති බව ඇති රාජ්‍යය කෙරේ ද, පසේනදි කොසොල් රජ ඒ විජිතයෙහි දී පුණ්‍යවත් හෝ අපුණ්‍යවත් හෝ බ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ අබ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ මහණකු හෝ බමුණකු හෝ එතැනින් ච්‍යුත කරවන්නට හෝ නංවන්නට හෝ හැකි වෙයි.

සෙන්පතිය, ඒ කෙසේ හඟිහි? පසේනදි කොසොල් රජහුගේ විජිත නො වූ රට යම් තාක් ඇද්ද, පසේනදි කොසොල් රජ තමනට අවිෂය වූ යම් රටෙක ඉසුරු බව හා අධිපති බව ඇති රාජ්‍යය නො කෙරේ ද, පසේනදි කොසොල් රජ එහි දී පුණ්‍යවත් හෝ අපුණ්‍යවත් හෝ බ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ අබ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ මහණකු හෝ බමුණකු හෝ එතැනින් ච්‍යුත කරවන්නට හෝ නංවන්නට හෝ හැකි වේ ද? යි.

භවත්නි, පසේනදි කොසොල් රජහු ගේ විජිත නො වූ රට යම් තාක් ඇද්ද, පසේනදි කොසොල් රජ විෂය නො වූ යම් රටෙක අසුරු බව හා අධිපති බව ඇති රාජ්‍යය නො කෙරේ ද, එහි දී පසේනදි කොසොල් රජ පුණ්‍යවත් හෝ අපුණ්‍යවත් හෝ බ්‍රහ්මචර්‍ය්‍යවත් හෝ අබ්‍රහමචර්‍ය්‍යවත් හෝ මහණකු හෝ බමුණකු හෝ ඒ ශ්‍රමණාදි භාවයෙන් ච්‍යුත කරවන්නට හෝ නංවන්නට හෝ නො හැකි යැ යි.

සෙන්පතිය, ඒ කෙසේ හඟිහි? තා විසින් තව්තිසා වැසි දෙවියෝ අසන ලදහු ද?

භවත්නි, එසේ යැ. මා විසින් තව්තිසා වැසි දෙවියෝ අසන ලදහ. මෙහි දී භවත් පසේනදි කොසොල් රජු විසිහුදු තව්තිසා වැසි දෙවියෝ අසනලදහ'යි.

තං කිං මඤ්ඤසි සෙනාපති, පහොති රජා පසෙනදි කොසලො දෙවෙ තාවතිංසෙ තම්හා ඨානා චාවෙතුං වා පබ්බාජෙතුං වාති?

දස්සනායපි භො රජා පසෙනදි කොසලො දෙවෙ තාවතිංසෙ නප්පහොති. කුතො පන තම්හා ඨානා චාවෙස්සති වා පබ්බාජෙස්සති වා'ති.

එවමෙව ඛො සෙනාපති. යෙ තෙ දෙවා සබ්‍යාපජ්ඣා ආගන්තාරෙ ඉත්ථත්තං තෙ දෙවා, යෙ තෙ දෙවා අබාපජ්ඣා අනාගන්තාරෙ ඉත්ථත්තං, තෙ දෙවා දස්සනායපි නප්පහොන්ති, කුතො පන තම්හා ඨානා චාවෙස්සන්ති වා පබ්බාජෙස්සන්ති වා'ති.

අථ ඛො රජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: 'කො නාමො අයං භන්තෙ භික්ඛූති?

ආනන්දො නාම මහාරජාති.

ආනන්දො වත භො ආනන්දරූපො වත භො. හෙතුරූපං භන්තෙ ආයස්මා ආනන්දො ආහ. සහෙතුරූපං භන්තෙ, ආයස්මා ආනන්දො ආහ.

කිං පන භන්තෙ, අත්ථි බ්‍රහ්මාති?

කිං පන ත්වං මහාරජ එවං වදෙසි: කිං පන භන්තෙ, අත්ථි බ්‍රහ්මාති?

යදි වා සො භන්තෙ, බ්‍රහ්මා ආගන්තා ඉත්ථත්තං. යදි වා අනාගන්තා ඉත්ථත්තන්ති.

යො සො මහාරජ බ්‍රහ්මා සබ්‍යාපජ්ඣො, සො බ්‍රහ්මා ආගන්තා ඉත්ථත්තං, යො සො බ්‍රහ්මා අබ්‍යාපජ්ඣො සො බ්‍රහ්මා අනාගන්තා ඉත්ථත්තන්ති.

අථ ඛො අඤ්ඤතරො පුරිසො රාජානං පසෙනදිං කොසලං එතදවොච: 'සඤ්ජයො මහාරාජ, බ්‍රාහ්මණො ආකාසගොත්තො ආගතො'ති.

අථ ඛො රාජා පසෙනදි කොසලො සඤ්ජයං බ්‍රාහ්මණ ආකාසගොත්තං එතදවොච: 'කො නු ඛො බ්‍රාහ්මණ, ඉමං කථාවත්ථුං රාජන්තෙපුරෙ අබ්භුදහාසීති?

'විඩූඩභො මහාරාජ, සෙනාපතී'ති. විඩූඩභො සෙනාපති එවමාහ: සඤ්ජයො මහාරාජ, බ්‍රාහ්මණො ආකාසගොත්තො'ති.

අථ ඛො අඤ්ඤතරො පුරිසො රාජානං පසෙනදිං කොසලං එතදවොච. යානකාලො මහාරාජාති. අථ ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: සබ්බඤ්ඤුතං මයං භන්තෙ භගවන්තං අපුච්ඡිම්හා, සබ්බඤ්ඤුතං භගවා ව්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා චාතුවණ්ණිං සුද්ධිං[1] මයං භන්තෙ, භගවන්තං අපුච්ඡිම්හා, චාතුවණ්ණිං සුද්ධිං භගවා ව්‍යාකාසි තඤ්ච පනම්හාකං රුච්චති. චෙව ඛමති ච. තෙන චම්හා අත්තමනා, අධිදෙවෙ මයං

1. චාතුවණ්ණි සුද්ධිං - මජසං.

සෙන්පතිය, ඒ කෙසේ හඟිහි? පසේනදි කොසොල් රජ තව්තිසා වැසි දෙවියන් ඒ දෙව්සථානයෙන් ච්‍යුත කරවන්නට හෝ නංවන්නට හෝ හැකි වේ ද?

භවත්නි, පසේනදි කොසොල් රජ තව්තිසා වැසි දෙවියන් දක්නට ද නො හැකි වෙයි. ඒ දේවසථානයෙන් ච්‍යුත කරවන්නේ හෝ යැ නංවන්නේ හෝ යි යනු කොයින් ලැබේ ද?

සෙන්පතිය, එපරිදි මැ මිනිසත් බවට එනසුලු යම් දෙවි කෙනෙක් ඇද්ද, ඒ දෙවියෝ යැ නිර්දුඃඛ වූ මිනිසත් බවට එනසුලු යම් දෙවි කෙනෙක් ඇද්ද, ඒ දෙවියෝ යයි ඒ දෙවැදෑරුම් දෙවියන් දක්නට ද නො හැකි යැ. ඒ දේවසථානයෙන් ච්‍යුත කරවන්නේ හෝ යැ නංවන්නේ හෝ යැ යනු කොයින් ලැබේ ද?

එසඳ පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "වහන්ස, මේ මහණ කවරෙක් නම් වේ ද?

මහරජ, ආනන්‍ද නමැ යි.

භවත්නි, එකැතින් ආනන්‍ද යැ, භවත්නි, එකැතින් ආනන්‍ද සවභාව යැ. වහන්ස, ආයුෂ්මත් අනඳ තෙරණුවෝ හේතුසවරූපය කියති. වහන්ස, ආනන්‍ද තෙරණුවෝ සහේතුකසවරූපය කියත්.

වහන්ස, කිම බ්‍රහ්මයෝ ඇද්ද?

"වහන්ස, කිම බ්‍රහ්ම ඇද්ද? යි තෙපි කුමට මෙසේ අසව.

වහන්ස, ඒ බඹ මිනිසත්බවට එනසුලු හෝ වේ ද, මිනිසත් බවට නො එනසුලු හෝ වේ ද?

මහරජ, චෛතසික විසින් සදුඃඛ වූ යම් බඹෙක් ඇද්ද, ඒ බඹ මිනිසත් බවට එනසුලු යැ. නිර්දුඃඛ වූ යම් බඹෙක් ඇද්ද, ඒ බඹ මිනිසත් බවට නො එනසුලු යැ.

එසඳ එක්තරා පුරුෂයෙක් පසේනදි කොසොල් රජහට තෙල කී : "මහරජාණෙනි, ආකාශගෝත්‍ර සඤ්ජය බ්‍රාහ්මණ ආයේ යැ"යි.

එසඳ පසේනදි කොසොල් රජ ආකාශගොත්‍ර සඤ්ජයබ්‍රාහ්මණහට තෙල කී : "බමුණ, කවරෙක් නම් මේ කථාවස්තුව රාජාන්තඃපුරයෙහි පහළ කෙළේ ද?යි.

'මහරජාණෙනි, විඩූඩභ සෙන්පති යැ'යි. විඩූඩභ සෙන්පති මෙසේ කී : "මහරජාණෙනි, ආකාශගොත්‍ර සඤ්ජය බ්‍රාහ්මණ යැ'යි.

එසඳ එක්තරා පුරුෂයෙක් පසේනදි කොසොල් රජුට තෙල කී : "මහරජාණෙනි, ගමන්කල් එළැඹිණැ"යි. එසඳ පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ අතින් සර්වඥතා පුළුවුසුම්හ. භාග්‍යවතුන් වහන්සේ සර්වඥතා ප්‍රකාශ කළසේක. එ ද අපට රුස්නේ ද සභනේ ද වෙයි. එයිනුදු අපි සතුටුසිත් ඇතියම්හ. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ අතින් චතුර්වර්ණයට අයත් ශුද්ධිය පුළුවුසුම්හ. භාග්‍යවතුන් වහන්සේ චාතුර්වර්ණ ශුද්ධිය පැවැසූසේක. එ ද අපට රුස්නේත් සභනේත් වෙයි. එයිනුදු අපි සතුටුසිත් ඇතියම්හ.

භන්තෙ, භගවන්තං අපුච්ඡිම්හා, අධිදෙවෙ භගවා ව්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච. තෙන චම්හා අත්තමනා. අධිබ්‍රහ්මානං මයං භන්තෙ, භගවන්තං අපුච්ඡිම්හා. අධිබ්‍රහ්මානං භගවා ව්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා. යං යදෙව ච පන මයං භන්තෙ, භගවන්තං අපුච්ඡිම්හා තං තදෙව භගවා ව්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා හන්ද චදානි මයං භන්තෙ, ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයාති.

යස්සදානි ත්වං මහාරාජ, කාලං මඤ්ඤසීති.

අථ ඛො රාජා පසෙනදි කොසලො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමීති.

කණ්ණකත්ථල සුත්තං දසමං.

රාජවග්ගො චතුත්ථො

තස්ස වග්ගස්ස උද්දානං.

ඝටීකාරෙ රට්ඨපාලො මඛාදෙවො මධුරියං,
බොධි අඞ්ගුලිමාලො ච පියජාතං බාහිතිකං;
ධම්මචෙතිය සුත්තං ච දසමං කණ්ණකත්ථලං.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අතින් අධිදේවයන් පුළුවුසුම්හ. භාග්‍යවතුන් වහන්සේ අධිදේවයන් පැවැසූසේක. එ ද අපට රුස්නේ ද සහනේ ද වෙයි. අපි එයින්ද සතුටු වූම්හ. වහන්ස, අපි භාග්‍යවතුන් අතින් අධිබ්‍රහ්මයා පුළුවුසුම්හ. භාග්‍යවතුන් වහන්සේ අධිබ්‍රහ්මයා පැවැසූසේක. එ ද අපට රුස්නේ ද සහනේ ද වෙයි. එයින්ද අපි සතුටු වූම්හ. වහන්ස, අපි යම් යම් මැ පැනයක් භාග්‍යවතුන් වහන්සේ අතින් පුළුවුසුමෝ ද එය මැ භාග්‍යවතුන් වහන්සේ පැවැසූසේක. එ ද අපට රුස්නේ ද සහනේ ද වෙයි. එයින්ද සතුටු වූම්හ. වහන්ස, එ බැවින් දැන් අපි යම්හ. අපි බොහෝ කිස ඇතියම්හ, බොහෝ කරණී ඇතියම්හ'යි.

මහරජ, තෙපි එයට කල් දනැ'යි වදළෝ.

එසඳ පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට බැස ගියේ.

දස වැනි කණ්ණකත්ථල සූත්‍ර යි.

සතර වැනි රාජවර්ගය යි.

ඒ වර්ගයාගේ උද්දානය :

ඝටීකාර සූත්‍ර යැ රට්ඨපාල සූත්‍ර යැ මඛාදේව සූත්‍ර යැ මධුර සූත්‍ර යැ බොධිරාජකුමාර සූත්‍ර යැ අඞ්ගුලිමාල සූත්‍ර යැ පියජාතික සූත්‍ර යැ බාහිතික සූත්‍ර යැ ධම්මචෙතිය සූත්‍ර යැ දස වැනි කණ්ණකත්ථල සූත්‍ර යැ යි මේ වර්ගයෙහි සූත්‍ර දසයෙකි.

---

5. බ්‍රාහ්මණවග්ගො

2. 5. 1

බ්‍රහ්මායුසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා විදෙහෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. තෙන ඛො පන සමයෙන බ්‍රහ්මායු නාම බ්‍රාහ්මණො මිථිලායං පටිවසති ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො වීසංවස්සසතිකො ජාතියා, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අස්සොසි ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො: "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො විදෙහෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

තෙන ඛො පන සමයෙන බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස උත්තරො නාම මාණවො අන්තෙවාසී හොති තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උත්තරං මාණවං ආමන්තෙසි: 'අයං තාත උත්තර, සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වීදෙහෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති. එහි ත්වං තාත උත්තර, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණං ගොතමං ජානාහි යදි වා තං භවන්තං ගොතමං තථාසන්තං යෙව සද්දො අබ්භුග්ගතො. යදි වා නො තථා, යදි වා සො භවං ගොතමො තාදිසො, යදි වා න තාදිසො, තථා මයං තං භවන්තං ගොතමං වෙදිස්සාමා'ති. යථා කථම්පනාහං භො තං භවන්තං ගොතමං ජානිස්සාමි: යදි වා තං භවන්තං ගොතමං තථා සන්තං යෙව සද්දො අබ්භුග්ගතො, යදි වා නො තථා, යදි වා සො භවං ගොතමො තාදිසො යදි වා න තාදිසො'ති.

Free Distribution www.aathaapi.org

5. බ්‍රාහ්මණවර්ගය

2. 5. 1.

බ්‍රහ්මායුසූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විදෙහ දනව්වෙහි පන්සියක් පමණ (ගුණ විසින්) මහත් බික්සඟුන් හා සමග සැරිසරන සේක. එකල ජරාජීර්ණ, වෘද්ධ, මහලු, කල් ගැලවූ, පශ්චිම වයසට පැමිණි, උපතින් එක්සිය විසිහැවිරිදි, නිඝණ්ඩු කෛටුභශාස්ත්‍ර සහිත, ශික්‍ෂා නිරුක්ති සහිත, ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවේදයන්ගේ පරතෙර පත්, පද හදරන, ව්‍යාකරණ හදරන, ලෞකායතික මහාපුරුෂලක්ෂණයෙහි පරිපූරකාරී වූ බ්‍රහ්මායු නම් බමුණු මිථිලායෙහි වෙසෙයි. "සැහැ-කුලපුත් මහණ භවත් ගොයුම්හු සැහැකුලින් පැවිදි වැ පන්සියක් පමණ වූ මහත් බික්සඟුන් හා සමග විදේහජනපදයෙහි සැරිසරනසේක්ල" යනු බ්‍රහ්මායු බමුණු ඇසී. ඒ භවත් ගොයුමාණන් ගේ මෙසේ කලණ යසගී උස් වැ නැඟිණ: "මෙ කරුණිනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිත්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ"යි. ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙලොව හා මහණබමුණන් සහිත දෙවි-මිනිසුන් සහිත ප්‍රජාව තමන් විසින් විශිෂ්ටඥනයෙන් දැන පසක් කොට දන්වති. ඔබ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසාන කල්‍යාණ කොට සාර්‍ථ කොට සව්‍යඤ්ජන කොට දහම් දෙසති, කේවලපරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙති. එ බඳු රහතුන් දක්ම මනා මැ නු"යි.

එකල උත්තර නම් මාණවකයෙක් බ්‍රහ්මායු බ්‍රාහ්මණ ගේ අතැවැසි වෙයි. නිඝණ්ඩු කෛටුභශාස්ත්‍ර සහිත, ශික්ෂානිරුක්ති සහිත, ඉතිහාසය පස් වනු කොට ඇති, ත්‍රිවේදයන්ගේ පරතෙර දුටුයෙ වෙයි. පදශාස්ත්‍ර හදරනුයෙ වෙයි, ව්‍යාකරණ හදරනුයෙ වෙයි, ලෝකායත මහාපුරුෂ ලක්ෂණයෙහි පරිපූරකාරී වෙයි. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ උත්තර මාණවකයා ඇමැති: "පුතැ උත්තරයෙනි, මෙ ශාක්‍යපුත්‍රයෝ ශ්‍රමණගෞතමයෝ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වැ විදේහජනපදයෙහි පන්සියක් පමණ මහත් බික්සඟුන් හා සමග සැරිසරන සේක් ල, ඒ භගවත් ගෞතමයන්ගේ මෙසේ කලණ යසගී උස් වැ නැඟිණ: "මෙ කරුණි-නුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, ... එ බඳු රහතුන් දක්ම වේ නම් මනා මැ නු! පුතැ උත්තරයෙනි, තෝ එව. මහණ ගොයුමන් කරා යා. ගොස් ඒ මහණ ගොයුමන් ගේ ඇති සෙයින් මැ යසගී නැඟිණි ද? ඇති සෙයින් නො නැඟිණි ද? යි ඒ මහණ ගොයුමන් දැනගනැ"යි. "ඉදින් ඒ භවත් ගොයුමාණෝ ඒ සැටි මැ වෙත් ද නොහොත් ඒ සැටි මැ නො වෙත් ද? යි තා ගේ වශයෙන් අපි ඒ භවත් ගොයුමාණන් හඳුනාගනුම්හ"යි. භවත්නි, කෙසේ නම් මම ඒ භවත් ගොයුමාණන් හඳුනාගන්නෙම් ද? ඒ භවත් ගොයු-මාණන් ගේ ඇති සැටි මැ යසගී නැඟිණි ද, නොහොත් ඇති සැටි නො නැඟිණි ද, ඒ භවත් ගොයුමාණෝ එ බඳු මැ වෙත් ද, නොහොත් එ බඳු මැ නො වෙත් ද? යි පිළිවිත්.

38—කේ 13561 (11/72)

Free Distribution www.aathaapi.org

ආගතානි ඛො තාත උත්තර, අම්හාකං මන්තෙසු ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි, යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙයෙව ගතියො භවන්ති අනඤ්ඤා, සචෙ අගාරං අජ්ඣාවසති, රජා හොති චක්කවත්තී ධම්මිකො ධම්මරජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති, සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති: සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො[1]. අහං ඛො පන තෙ තාත උත්තර, මන්තානං දාතා, ත්වං මෙ මන්තානං පටිග්ගහෙතා'ති.

එවං හොති ඛො උත්තරො මාණවො බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා උට්ඨායාසනා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා විදෙහෙසු යෙන භගවා තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උත්තරො මාණවො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි සමන්නෙසි. අද්දසා ඛො උත්තරො මාණවො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති: 'කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චා'ති. අථ ඛො භගවතො එතදහොසි: 'පස්සති ඛො මෙ අයං උත්තරො මාණවො ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චා'ති.

අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි[2]. යථා අද්දස උත්තරො මාණවො භගවතො කොසොහිතං වත්ථගුය්හං. අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පරිමසි[3]. උභොපි නාසිකාසොතානි අනුමසි පරිමසි. කෙවලම්පි[4] ලලාටමණ්ඩලං[5] ජිව්හාය ඡාදෙසි.

අථ ඛො උත්තරස්ස මාණවස්ස එතදහොසි: 'සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි. යන්නූනාහං සමණං ගොතමං අනුබන්ධෙය්‍යං ඉරියාපථඤ්චස්ස පස්සෙය්‍ය'න්ති. අථ ඛො උත්තරො මාණවො සත්ත මාසානි භගවන්තං අනුබන්ධි ඡායාව අනපායිනී. අථ ඛො උත්තරො මාණවො සත්තන්නං මාසානං අච්චයෙන විදෙහෙසු යෙන මිපිලා තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන මිපිලා යෙන බ්‍රහ්මායු බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො උත්තරං මාණවං බ්‍රහ්මායු බ්‍රාහ්මණො එතදවොච: කච්චි තාත උත්තර, තං භවන්තං ගොතමං තථා සන්තං යෙව සද්දො අබ්භුග්ගතො නො අඤ්ඤථා, කච්චි ච පන සො භවං ගොතමො තාදිසො, නො අඤ්ඤාදිසො'ති.

---

1. විවත්තච්ඡද්දො - සීමු.
2. අභිසඞ්ඛාරෙසි - ස්‍යා.
3. පරිමයි - මජසං, ස්‍යා, PTS.
4. කෙවලකම්පි - PTS.
5. නලාටමණ්ඩලං - මජසං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

පුතැ උත්තරයෙනි, යම් ලකුණින් සමන්වාගත මහාපුරුෂයක්හට ගතිහු දෙදෙනෙක් මැ ඇද්ද . . . අන් ගතියක් නැද්ද, එ බඳු දෙතිස් මහාපුරුෂලක්ෂණයෝ අපගේ වේදයෙහි ආහ. ඉදින් ගිහිගෙහි වෙසේ නම් දැහැමින් වැටෙන දැහැමින් රජ තන් පත් සතර මුහුදු හිම් කොට ඉසුරු කරන අභ්‍යන්තර බාහිර සතුරන් දිනූ දනව්යෙහි ධ්‍රැවභාවය ලත් සවිරත්න සමන්වාගත වූ සක්විති රජ වෙයි. ඔබ ගේ මේ සප්තරත්නයෝ වෙති. ඔහු කවරහ යත් : චක්‍රරත්න යැ හස්තිරත්න යැ අශ්වරත්න යැ මණිරත්න යැ ස්ත්‍රීරත්න යැ ගෘහපතිරත්න යැ සත් වැනි පුත්‍රරත්න යැ යි. ඔබට ශූර වූ වීර්‍ය්‍යමයශරීර ඇති පරසෙන් මඩනා දහසින් වැඩි පුත්‍රයෝ ඇත. ඔබ සාගර පර්‍ය්‍යන්ත කොට ඇති මේ පොළොව අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් පඤ්චශීලධර්මයෙන් දිනා ගෙන වෙසෙති. ඉදින් ගෙන් නික්ම සසුන් වදනේ නම් ලොකයෙහි කෙලෙස් සියන් පෙරළු අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙති. (එ බඳු මහාපුරුෂ ලක්ෂණයෝ යි.) පුතැ උත්තරයෙනි, මම් කලි තට වෙද දින්මි. තෝ මා ගේ මතුරු පිළිගත්හි''යි.

'භවත්නි, එසේ යැ'යි උත්තර මණෙවු බ්‍රහ්මායු බමුණුහට පිළිවදන් දී හුනස්නෙන් නැඟී බ්‍රහ්මායු බමුණු සකසා වැඳ විදෙහ දනව්යෙහි භාග්‍යවතුන් වහන්සේ කරා චාරිකා කොට ගියේ. පිළිවෙළින් සැරිසරනුයේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹිණ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී. සතුටු වියයුතු සිහි කළයුතු කථා නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් උත්තර මාණවක භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහපුරිස් ලකුණු සමනාගන්නට වී. උත්තර මාණවක භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි දෙතිස් මහපුරිස් ලකුණු බෙහෙවින් දිට, දෙකක් තබා යැ. මහාපුරුෂලක්ෂණ දෙකෙකැ පැතුම් කෙරෙයි, සොයමින් වෙහෙසෙයි, සනිටුහනට නො යෙයි, විමති හෙයින් නො පහදියි. කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යයෙහි යැ ප්‍රභූතජිහ්වතායෙහි යැ යි. එසඳ භාග්‍ය-වතුන් වහන්සේට තෙල සිත් වී : ''මේ උත්තර මාණවක මා ගේ දෙතිස් මහාපුරුෂලක්ෂණ දෙකක් තබා බෙහෙවින් දක්නේ යැ. මහාපුරුෂලක්ෂණ දෙකෙකැ ආකාඞ්ක්ෂා කෙරෙයි, විචිකිච්ඡා කෙරෙයි, අධිමුක්ති නො කෙරෙයි, සම්ප්‍රසාද නො කෙරෙයි. කොෂාවහිත වස්ත්‍රගුහ්‍යයෙහි යැ. ප්‍රභූතජිහ්වතායෙහි යැ යි.

එසඳ භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි උත්තර මාණවක භාග්‍යවතුන් වහන්සේගේ කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යය දිටී ද ඒ පරිදි ඉද්ධියක් කළසේක. එසඳ භාග්‍යවතුන් වහන්සේ දිවනෙරැ දෙකන්සිදුරු අනුමාර්ජන පරිමාර්ජන කළ සේක. දෙ නැහැසිදුරු දු අනුමාර්ජන පරිමාර්ජන කළ සේක. හැම නළල් මඩල ද දිවින් වැසූ සේකි.

ඉක්බිති උත්තර මාණවකයාහට තෙල සිත් වී : ශ්‍රමණ ගෞතමයෝ ද්වාත්‍රිංශත් මහාපුරුෂලක්ෂණයෙන් සමන්වාගතයහ. මම ශ්‍රමණගෞතමයන් លුහුබඳනෙම් නම් ඔබගේ ඉරියවු දක්නෙම් නම් මනා මැ නු යි. ඉක්බිති උත්තර මාණවක සත් මසක් භාග්‍යවතුන් වහන්සේ වෙන් වැ නො යන සේයක් සෙයින් ලුහුබැඳ ගියේ. ඉක්බිති උත්තර මාණවක සත් මස් ඇවෑමෙන් විදෙහ දනව්යෙහි මිථිලාව කරා සැරිසරා ගියේ. පිළිවෙළින් සැරිසරමින් මිථිලාව කරා බ්‍රහ්මායු බමුණු කරා එළැඹිණ. එළැඹ බ්‍රහ්මායු බමුණු සකසා වැඳ එකත්පස් වැ හින. බ්‍රහ්මායු බමුණු එකත්පස් වැ හුන් උත්තර මාණවක-යාහට තෙල කී : ''කිමෙක දරුව උත්තරයෙනි, ඒ භවත් ගෞතමයන්ගේ එසේ ඇති සැටි වූ මැ යසගී නැඟිණි ද? අන් පරිදි නො නැඟිණි ද? කිමෙක ඒ භවත් ගෞතමයෝ එ බඳු මැ වෙත් ද? අන් බඳු නො වෙත් ද?''යි.

තථාසන්තංයෙව භො තං භවන්තං ගොතමං තථා සද්දො අබ්භුග්ගතො, නො අඤ්ඤථා, තාදිසො ච භො සො භවං ගොතමො, න අඤ්ඤාදිසො. සමන්නාගතො ච සො භො භවං ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි.

සුප්පතිට්ඨිතපාදො ඛො පන සො භවං ගොතමො, ඉදම්පි තස්ස[1] භොතො ගොතමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

හෙට්ඨා ඛො පනස්ස භොතො ගොතමස්ස පාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි.

ආයතපණ්හී ඛො පන සො භවං ගොතමො.

දීඝඞ්ගුලී ඛො පන සො භවං ගොතමො.

මුදුතළුණහත්ථපාදො ඛො පන සො භවං ගොතමො.

ජාලහත්ථපාදො ඛො පන සො භවං ගොතමො.

උස්සඞ්ඛපාදො ඛො පන සො භවං ගොතමො.

එණිජඞ්ඝො ඛො පන සො භවං ගොතමො.

ඨිතකොව ඛො පන සො භවං ගොතමො අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති.

කොසොහිතවත්ථගුය්හො ඛො පන සො භවං ගොතමො.

සුවණ්ණවණ්ණො ඛො පන සො භවං ගොතමො කඤ්චනසන්නිභත්තචො.

සුඛුමච්ඡවි ඛො පන සො භවං ගොතමො සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිප්පති.[2]

එකෙකලොමො ඛො පන සො භවං ගොතමො, එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි.

උද්ධග්ගලොමො ඛො පන සො භවං ගොතමො උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි[3] පදක්ඛිණාවත්තකජාතානි.

බ්‍රහ්මුජ්ජුගත්තො ඛො පන සො භවං ගොතමො.

සත්තුස්සදො ඛො පන සො භවං ගොතමො.

සීහපුබ්බද්ධකායො ඛො පන සො භවං ගොතමො.

චිතන්තරංසො ඛො පන සො භවං ගොතමො.

නිග්‍රොධපරිමණ්ඩලො ඛො පන සො භවං ගොතමො, යාවතක්වස්ස කායො තාවතක්වස්ස ව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතක්වස්ස කායො

1. ඉදම්පිස්ස - සීමු.
2. උපලිම්පති - සීමු, මජසං.
3. කුණ්ඩලාවට්ටානි - මජසං, සයා.

භවත්නි, ඒ භවත් ගෞතමයන්ගේ එසේ ඇති සැටි වූ මැ එසේ යසගී නැඟිණ. අත් පරිදි නො වෙයි. භවත්නි, ඒ භවත් ගොයුමාණෝ එ බඳු ද වෙති. අත් බඳු නො වෙති. ඒ භවත් ගොයුමාණෝ දෙතිස් මහපුරිස්ලකුණින් සමන්වාගත ද වෙත් :

ඒ භවත් ගෞතමයෝ කලි සුප්‍රතිෂ්ඨිතපාද ඇතියහ, ඒ භවත් ගොයුමාණන්ගේ මෙ මහපුරිස්ලකුණ ද වෙයි.

ඒ භවත් ගෞතමයන් ගේ යට පාතෙලෙහි දහස් අර ඇති නිම්වළලු සියෝ නැබමඬුලු සියෝ, සර්වාකාර පරිපූර්ණ චක්‍රයෝ උපන්හ.

ඒ භවත් ගෞතමයෝ දික්විලුම් ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ දිගැඟිලි ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ මෘදු තරුණ හස්තපාද ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ ජාලහස්තපාද ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ (උඩ පිහිටි ගොප් ඇට ඇතියෙන්) උස්සඞ්ඛපාදයහ.

ඒ භවත් ගෞතමයෝ (එණිමෘගයන්ට බඳු ජඞ්ඝා ඇතියෙන්) එණිජඞ්ඝයහ.

ඒ භවත් ගෞතමයෝ සිටි වන සිටී සේක් මැ නො නැමෙන්නාහු දෙ අත්ලෙන් දෙ දණ පිරිමදින්නාහ.

ඒ භවත් ගෞතමයෝ (කොෂයෙහි ගිලුණු අඞ්ගජාත ඇතියෙන්) කොෂාවහිතවස්ත්‍ර ගුහ්‍ය ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ ස්වර්ණවර්ණයහ. කසුන් වන් සිවිපැහැ ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ සියුම්සිවි ඇතියහ. සිවි සියුම් වන බැවින් රජස් හා දූලි කයෙහි නො ලැගෙයි.

ඒ භවත් ගෞතමයෝ එකෛකලොමයහ, එක් එක් ලොමෙක් ලොමකූපයෙහි උපන.

ඒ භවත් ගෞතමයෝ ඌර්ධ්වාග්‍රරොම ඇතියහ. නිල්වන් අඳුන්වන් කුණ්ඩලාවර්ත ඇති දක්ෂිණාවර්ත වැ උපන් උඩු අක් ඇති රොමයෝ උපන්හ.

ඒ භවත් ගෞතමයෝ බ්‍රහ්මයාට බඳු ඍජුගාත්‍ර ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ සත් තැනෙක පරිපූර්ණ මාංශොත්සද ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ සිංහයාට බඳු පූර්වාර්ධකාය ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ (මාංශයෙන් පරිපූර්ණ අන්තරාංශ ඇතියෙන්). චිතාන්තරාංශයහ.

ඒ භවත් ගෞතමයෝ න්‍යග්‍රොධපරිමණ්ඩලයහ. ඔබ ගේ කය යම් තාක් වේ ද, ඔබ ගේ ව්‍යාමය ඒ තාක් වෙයි. ඔබ ගේ ව්‍යාමය යම් තාක් වේ ද, ඔබ ගේ කය ඒ තාක් වෙයි.

සමවත්තක්ඛන්ධො ඛො පන සො භවං ගොතමො.

රසග්ගසග්ගී ඛො පන සො භවං ගොතමො.

සීහහනු ඛො පන සො භවං ගොතමො.

චත්තාලීසදන්තො ඛො පන සො භවං ගොතමො.

සමදන්තො ඛො පන සො භවං ගොතමො.

අවිවරදන්තො ඛො පන සො භවං ගොතමො.

සුසුක්කදාඨො ඛො පන සො භවං ගොතමො.

පහූතජිව්හො ඛො පන සො භවං ගොතමො

බ්‍රහ්මස්සරො ඛො පන සො භවං ගොතමො, කරවීකභාණී.

අභිනීලනෙත්තො ඛො පන සො භවං ගොතමො.

ගොපඛුමො ඛො පන සො භවං ගොතමො.

උණ්ණා ඛො පනස්ස භොතො ගොතමස්ස භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූලසන්නිභා

උණ්හීසසීසො ඛො පන සො භවං ගොතමො, ඉදම්පි තස්ස භොතො ගොතමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති. ඉමෙහි ඛො සො භවං ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො.

ගච්ඡන්තො ඛො පන සො භවං ගොතමො දක්ඛිණෙනෙව පාදෙන පඨමං පක්කමති, සො නාතිදූරෙ පාදං උද්ධරති, නාච්චාසන්නෙ පාදං නික්ඛිපති, සො නාතිසීඝං ගච්ඡති, නාතිසනිකං ගච්ඡති, න ච අද්දුවෙන අද්දුවං සඞ්ඝට්ටෙන්තො ගච්ඡති, න ච ගොප්ඵකෙන ගොප්ඵකං සඞ්ඝට්ටෙන්තො ගච්ඡති, සො ගච්ඡන්තො න සත්ථිං උන්නාමෙති, න සත්ථිං ඔනාමෙති, න සත්ථිං සන්නාමෙති, න සත්ථිං විනාමෙති. ගච්ඡතො ඛො පනස්ස භොතො ගොතමස්ස අධරකායොව[1] ඉඤ්ජති. න ච කායබලෙන ගච්ඡති. අවලොකෙන්තො ඛො පන සො භවං ගොතමො සබ්බකායෙනෙව අවලොකෙති. සො න උද්ධං උල්ලොකෙති. න අධො ඔලොකෙති. න ච විපෙක්ඛමානො ගච්ඡති. යුගමත්තඤ්ච පෙක්ඛති. තතො චස්ස උත්තරිං අනාවටං ඤාණදස්සනං භවති.

සො අන්තරඝරං පවිසන්තො න කායං උන්නාමෙති. න කායං ඔනාමෙති. න කායං සන්නාමෙති. න කායං විනාමෙති. සො නාතිදූරෙ නාච්චාසන්නෙ ආසනස්ස පරිවත්තති. න ච පාණිනා ආලම්බිත්වා ආසනෙ නිසීදති. න ච ආසනස්මිං කායං පක්ඛිපති. සො අන්තරඝරෙ නිසින්නො සමානො න හත්ථකුක්කුච්චං ආපජ්ජති. න පාදකුක්කුච්චං ආපජ්ජති. න ච අද්දුවෙන අද්දුවං[2] ආරොපෙත්වා නිසීදති. න ච ගොප්ඵකෙන ගොප්ඵකං ආරොපෙත්වා නිසීදති. න ච පාණිනා හනුකං උපාදියිත්වා[3] නිසීදති. සො අන්තරඝරෙ නිසින්නොව සමානො නච්ඡම්භති න කම්පති න වෙධති න පරිතස්සති. අච්ඡම්භී අකම්පී අවෙධී අපරිතස්සී විගතලොමහංසො. විවෙකාවත්තො ච[4] සො භවං ගොතමො අන්තරඝරෙ නිසින්නො හොති.

---

1. ආරද්ධකායොව - ස්‍යා.
2. අද්ධවෙන අද්ධවං - ස්‍යා.
3. { උපදහිත්වා - මජසං. / උපදහෙත්වා - ස්‍යා. }
4. විවෙකවත්තො - සීමු.

ඒ භවත් ගෞතමයෝ සමවර්තස්කන්ධ ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ රසග්‍රසාග්‍ර ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ සිංහහනු ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ චත්වාරිංශද්දන්ත ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ ගෞතමයෝ සමදන්ත ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ අවිවරදන්ත ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ සුශුක්ලදංෂ්ට්‍රා ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ ප්‍රභූතජිහ්වා ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ බ්‍රහ්මස්වර ඇතියහ. කුරවිකෙවිල්ලන් ස්වර වැනි ස්වර ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ අභිනීලනෙත්‍ර ඇතියහ.

ඒ භවත් ගෞතමයෝ (එ මොහොත උපන් රතුවස්සන් ගේ චක්ෂුර්භණ්ඩ වැනි චක්ෂුර්භණ්ඩ ඇතියෙන්) ගොපක්ෂ්මයහ.

ඒ භවත් ගෞතමයන් ගේ දෙ බැම අතර සුදු මොළොක් පිළින් වැනි ඌර්ණාරොමධා උපන.

ඒ භවත් ගෞතමයෝ උෂ්ණීෂශීර්ෂ ඇතියහ. මෙ ද මහාපුරුෂ වූ ඒ භවත් ගෞතමයන් පග් මහාපුරුෂලක්ෂණ වෙයි. ඒ භවත් ගෞතමයෝ මෙකී දෙතිස් මහපුරිස් ලකුණින් සමන්වාගතයහ.

තවද ඒ භවත් ගෞතමයෝ යන්නාහු දකුණුපයින් මැ පළමු කොට ගමන් අරඹති, ඔබ ඉතා නුදුරෙහි පිය නඟති, ඉතා ළඟ පිය නො තබති, ඔබ ඉතා වෙලෙව් වැ නො යෙති, ඉතා ලැයි වැ නො යෙති, නො ද දණින් දණ ගටමින් යෙති, නො ද ගොප් ඇටයෙන් ගොප් ඇටය ගටමින් යෙති, ඔබ යන්නාහු (ගැඹුරු දියෙහි යනුවන් සෙයින්) කලවෙ උඩට නො නමති, කලවෙ යටට නො නමති, (තෙමුනු තැන පා තබන සෙයින්) තද කොට නො තබති, (පොතැලිරූ කෙළවන සෙයින්) ඔබ මොබ නො කෙළවති, යන්නා වූ භවත් ගෞතමයන් ගේ කලි යටිකය මැ සැලෙයි, නො ද කායබලයෙන් යෙති, භවත් ගෞතමයෝ කලි බලන්නාහු (ග්‍රීවා නො පෙරළා) හැම කයින් මැ බලති, ඔබ (නකත් ගණන සෙයින්) උඩ නො බලති, යට නො බලති, නො ද අවට බලමින් යෙති, වියදඬු පමණ (දුර) බලති, එතෙකුදු වත් එයින් මතු උන් වහන්සේ ගේ අනාවෘත ඥානදර්ශනය වෙයි.

ඔබ ඇතුළුගමට පිවිසෙන්නාහු කය උඩට නො නමති, කය යටට නො නමති, කාය සන්නාමන නො කෙරෙති, කය ඔබ මොබ නො නමති, ඔබ ඉතා දුර සිට ඉතා ළඟ සිට අසුනට නො පෙරළෙති, අතින් එල්බගෙන අස්නෙහි නො ද හිඳිති, අස්නෙහි කය නොද බහාලති, ඔබ ඇතුළුගමැ හුන්නාහු අත්කුකුසට නො පැමිණෙති, පාකුකුසට නො පැමිණෙති, දණින් දණ නහාලා නො ද හිඳිති, ගොප් ඇටයෙන් ගොප්ඇටය නහාලා නො හිඳිති, අත්ලෙන් හණුව ගෙන නො ද හිඳිති, ඔබ ඇතුළුගම හුන්නාහු බිය නො වෙති, නො ගැලෙති, නො සැලෙති, නො තැතිගනිති. ඔබ නො බන්නාහු නො ගැලෙන්නාහු නො සැලෙන්නාහු නො තැතිගන්නාහු පහවූ ලොමුදහ ඇත්තාහු වෙති. ඒ භවත් ගෞතමයෝ නිර්වාණාවතී සිත් ඇති වැ ඇතුළුගම හුන්නාහු වෙත්.

සො පත්තොදකං පතිගණ්හන්තො න පත්තං උන්නාමෙති. න පත්තං ඔනාමෙති. න පත්තං සන්නාමෙති. න පත්තං විනාමෙති. සො පත්තොදකං පතිගණ්හාති නාතිථොකං නාතිබහුං. සො න බුලුබුලුකාරකං[1] පත්තං ධොවති. න සම්පරිවත්තකං පත්තං ධොවති. න පත්තං භූමියං නික්ඛිපිත්වා හත්ථෙ ධොවති. හත්ථෙසු ධොතෙසු පත්තො ධොතො හොති. පත්තෙ ධොතෙ හත්ථා ධොතා හොන්ති. සො පත්තොදකං ඡඩ්ඩෙති නාතිදූරෙ නාච්චාසන්නෙ න ච විච්ඡඩ්ඩයමානො.

සො ඔදනං පතිගණ්හන්තො[2] න පත්තං උන්නාමෙති. න පත්තං ඔනාමෙති. න පත්තං සන්නාමෙති න පත්තං විනාමෙති. සො ඔදනං පතිගණ්හාති නාතිථොකං නාතිබහුං. බ්‍යඤ්ජනං ඛො පන සො භවං ගොතමො බ්‍යඤ්ජනමත්තාය ආහාරෙති, න ච බ්‍යඤ්ජනෙන ආලොපං අතිමානෙති[3]. ද්විත්තික්ඛත්තුං ඛො පන සො භවං ගොතමො මුඛෙ ආලොපං සම්පරිවත්තෙත්වා අජ්ඣොහරති. න චස්ස කාචි ඔදනමිඤ්ජා අසම්භින්නා කායං පවිසති, න චස්ස කාචි ඔදනමිඤ්ජා මුඛෙ අවසිට්ඨා හොති. අථාපරං ආලොපං උපනාමෙති. රසපටිසංවෙදී ඛො පන සො භවං ගොතමො ආහාරං ආහාරෙති නො ච රසරාගපටිසංවෙදී. අට්ඨඞ්ගසමන්නාගතං ඛො පන සො භවං ගොතමො ආහාරං ආහාරෙති. නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති.

සො භුත්තාවී පත්තොදකං පතිගණ්හන්තො න පත්තං උන්නාමෙති න පත්තං ඔනාමෙති. න පත්තං සන්නාමෙති. න පත්තං විනාමෙති. සො පත්තොදකං පතිගණ්හාති නාතිථොකං නාතිබහුං. සො න බුලුබුලුකාරකං[1] පත්තං ධොවති න සම්පරිවත්තකං පත්තං ධොවති. න පත්තං භූමියං නික්ඛිපිත්වා හත්ථෙ ධොවති. හත්ථෙසු ධොතෙසු පත්තො ධොතො හොති. පත්තෙ ධොතෙ හත්ථා ධොතා හොන්ති. සො පත්තොදකං ඡඩ්ඩෙති නාතිදූරෙ නාච්චාසන්නෙ න ච විච්ඡඩ්ඩයමානො. සො භුත්තාවී න පත්තං[4] භූමියං නික්ඛිපති නාතිදූරෙ නාච්චාසන්නෙ. න ච අනත්ථිකො පත්තෙන හොති, න ච අතිවෙලානුරක්ඛී පත්තස්මිං.

සො භුත්තාවී මුහුත්තං තුණ්හී නිසීදති. න ච අනුමොදනස්ස කාලමතිනාමෙති. සො භුත්තාවී අනුමොදති. න තං භත්තං ගරහති. න අඤ්ඤං භත්තං පාටිකඞ්ඛති[5] අඤ්ඤදත්‍ථු ධම්මියා ච කථාය තං පරිසං සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. සො තං පරිසං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කමති.

1. බුලුබුලුකාරකං - මජ්සං, සතා, PTS.
2. පටිග්ගණ්හන්තො - මජ්සං, සතා.
3. අතිනාමෙති - මජ්සං, සතා, PTS.
4. භුත්තාවී පත්තං - PTS.
5. පටිකඞ්ඛී - සිමු.

ඔබ පාත්‍ර දෝනා දිය පිළිගන්නාහු පාත්‍රය උඩට නො නමති, පාත්‍රය යටට නො නමති, පාත්‍රය තද කොට නො ගනිති, පාත්‍රය ඔබ මොබ නො සලති. ඔබ ඉතා මද නො කොට ඉතා බොහෝ නො කොට පාත්‍ර දෝනා දිය පිළිගනිති, ඔබ 'බුලු බුලු' අනුකරණ කොට පාත්‍රය නො දෙවති, පාත්‍රය පෙරළා නො දෙවිති, පාත්‍රය බිමැ බහා අත් නො දෙවිති, දෙ අත් දෙවූ කලැ පාත්‍රය දෝනාලද වෙයි. පාත්‍රය දෙවූ කලැ හස්තයෝ දෝනාලද වෙති, ඔබ පාදෙවූ දිය ඉතා දුර නො වැ ඉතා ළඟ නො වැ නො ද විසුරුවමින් බැහැරලති.

ඔබ බත් පිළිගන්නාහු පාත්‍රය උඩට නො නමති, යටට නො නමති, පාත්‍රය තද කොට නො ගනිති, පාත්‍රය ඔබමොබ නො සලති. ඔබ ඉතා මද නො කොට ඉතා බොහෝ නො කොට බත් පිළිගනිති, යළි ඒ භවත් ගෞතමයෝ ව්‍යඤ්ජනය ව්‍යඤ්ජන පමණින් වළඳති, ව්‍යඤ්ජනයෙන් ආලොපය (බත්පිඩ) නො ද ඉක්මවති, ඒ භවත් ගෞතමයෝ දෙතුන් වරක් මුවෙහි ආලොපය පෙරළා පරහලා කෙරෙති (ගිලිති) කිසි භක්තමජ්ජාවක් අමිශ්‍ර වැ ඔබ ගේ කයට නො ද වදිති, කිසි භක්තමජ්ජාවක් ඔබ ගේ මුවෙහි නො ද ශෙෂ වෙයි. ඉක්බිති අනෙක් ආලොපයක් එළවති. තවද ඒ භවත් ගෞතමයෝ රසවිඳුමින් අහර වළඳති, රසරාගවිඳුමින් නො ද වළඳති. තවද ඒ භවත් ගෞතමයෝ අෂ්ටාඞ්ග සමන්වාගත ආහාරය වළඳති : 'දවයට නො වැ මදයට නො වැ මණ්ඩනයට නො වැ භූෂණයට නො වැ මෙ සිරුරෙහි සිටීමට යැපීමට වෙහෙස සන්හිඳීමට බඹසරට අනුග්‍රහයට පමණ. මෙසේ පැරැණි කුසගිනි වෙදනාවත් නසමි, අළුත් භත්තසම්මද වෙදනාවත් නො උපදවන්නෙමි, මා ගේ ජීවිතයාත්‍රාවත් නිරවද්‍ය භාවයත් පහසුවිහරණයත් වන්නේ යැ''යි.

ඔබ වැළඳූ සේක් පාත්‍ර දෝනා දිය පිළිගන්නාහු පාත්‍රය උඩට නො නහති, යටට නො බහති, පාත්‍රය ලාහෙලා නො නමති, පාත්‍රය ඔබ මොබ නො නමති, ඔබ ඉතා මද නො කොට ඉතා බොහෝ නො කොට පාත්‍ර දෝනා දිය පිළිගනිති. ඔබ 'බුලු බුලු' අනුකරණ කොට පාත්‍රය නො දෙවිති, පාත්‍රය පෙරළා නො දෙවිති, පාත්‍රය බිමැ තබාලා දෙ අත් නො දෙවිති, දෙ අත් දෙවූ කල්හි පාත්‍රය දෝනාලද වෙයි, පාත්‍රය දෙවූ කල්හි හස්තයෝ දෝනා ලද වෙති. ඔබ පාත්‍රය දෙවූ දිය නාතිදූරයෙහි හෝ නාත්‍යාසන්නයෙහි හෝ නො දමති. නො ද විසුරුවමින් දමති, ඔබ වැළඳූ සේක් නාතිදූරයෙහි හෝ නාත්‍යාසන්නයෙහිහෝ පාත්‍රය බිමැ නො තබති. පාත්‍රයෙන් අපි නැත්තාහු නො ද වෙති. පාත්‍රය කල් පන්වා රක්නාහු නො ද වෙති.

ඔබ වැළැඳූසේක් මොහොතක් තුෂ්ණීම්භූත වැ වැඩහිඳිති, අනුමෙවුනියට නො ද කල් ඉක්මවති, ඔබ වැළැඳූසේක් අනුමෝදනා කෙරෙති. එ බත නො ගරහති, අන් බතක් නො පතති. එකත්නෙන් දහැමි කථායෙකින් මැ එ පිරිස කරුණු දක්වති, සමාදන් කරවති, තෙද ගන්වති, සතුටු කරවති. ඔබ එ පිරිස දහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා හුනස්නෙන් නැඟී නික්ම යෙති.

සො නාතිසීඝං ගච්ඡති නාතිසනිකං ගච්ඡති. න ච නිඹුච්චිතුකාමො[1] ගච්ඡති. න ච තස්ස භොතො ගොතමස්ස කායෙ චීවරං අච්චුක්කට්ඨං හොති, න ච අච්චොක්කට්ඨං, න ච කායස්මිං අල්ලීනං, න ච කායස්මා අපකට්ඨං, න ච තස්ස භොතො ගොතමස්ස කායම්හා වාතො චීවරං අපවහති[2]. න ච තස්ස භොතො ගොතමස්ස කායෙ රජොජල්ලං උපලිප්පති[3]

සො ආරාමගතො නිසීදති පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ පක්ඛාලෙති. න ච සො භවං ගොතමො පාදමණ්ඩනානුයොගමනුයුත්තො විහරති. සො පාදෙ පක්ඛාලෙත්වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො නෙව අත්තබ්‍යාබාධාය චෙතෙති න පරබ්‍යාබාධාය චෙතෙති. න උභයබ්‍යාබාධාය චෙතෙති. අත්තහිතං පරහිතං උභයහිතං සබ්බලොකහිතමෙව සො භවං ගොතමො චින්තෙන්තො නිසින්නො හොති.

සො ආරාමගතො පරිසතිං ධම්මං දෙසෙති න තං පරිසං උස්සාදෙති. න තං පරිසං අපසාදෙති. අඤ්ඤදත්‍ථු ධම්මියා ච කථාය තං පරිසං සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති. අට්ඨඞ්ග-සමන්නාගතො ඛො පනස්ස භොතො ගොතමස්ස මුඛතො ඝොසො නිච්ඡරති. විස්සට්ඨො ච විඤ්ඤෙය්‍යො ච මඤ්ජු ච සවනීයො ච බින්දු ච අවිසාරී ච ගම්භීරො ච නින්නාදී ච. යථාපරිසං ඛො පන සො භවං ගොතමො සරෙන විඤ්ඤාපෙති. න චස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති. තෙ තෙන භොතා ගොතමෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා පක්කමන්ති අපලොකයමානායෙව අවිජහන්තා භාවෙන[4]. අද්දසාම ඛො මයං භො තං භවන්තං ගොතමං ගච්ඡන්තං. අද්දසාම ඨිතං. අද්දසාම අන්තරඝරං පවිසන්තං[5] අද්දසාම අන්තරඝරෙ නිසින්නං තුණ්හීභූතං. අද්දසාම භුත්තාවිං අනුමොදන්තං. අද්දසාම ආරාමං ගච්ඡන්තං[6] අද්දසාම ආරාමගතං නිසින්නං තුණ්හීභූතං. අද්දසාම ආරාමගතං පරිසතිං ධම්මං දෙසෙන්තං. එදිසො ච එදිසො ච භො සො භවං ගොතමො, තතො ච භිය්‍යො'ති.

එවං වුත්තෙ බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස. අප්පෙව නාම මයං කදාචි කරහචි තෙන භොතා ගොතමෙන සද්ධිං සමාගච්ඡෙය්‍යාම, අප්පෙව නාම සියා කොචිදෙව කථාසල්ලාපො'ති.

---

1. මුච්චිතුකාමො – මජ්සං, සක්‍යා, PTS. / විමුච්චිතුකාමො – සීමු.
2. අසංවහති – සක්‍යා.
3. උපලිම්පති – සීමු, සක්‍යා, මජ්සං.
4. අවිජහන්තා – මජ්සං.
5. අද්දසාම අන්තරඝරං පවිසන්තං – PTS, ඌනං
6. ආගච්ඡන්තං – සක්‍යා.

ඔබ ඉතා වෙලෙවී වැ නො යෙති, ඉතා ලැසි වැ නො යෙති, (පිරිසෙන්) නැඟී යනු කැමැති වැ නො ද යෙති. ඒ භවත් ගෞතමයන්ගේ කයෙහි සිවුර (හනුඇටය දක්වා නඟා පොරෝනාවුන්ගේ සෙයින්) උඩට නැඟුණේ නො වෙයි, (ගොප්ඇටය දක්වා බහා පොරෝනාවුන් ගේ සෙයින්) නො බැහුණේ වෙයි. නො ද කයෙහි ඇලුණේ වෙයි, නො ද කයින් වෙන් වූයේ වෙයි. ඒ භවත් ගෞතමයන්ගේ කයින් වාතය සිවුර නො නඟයි. ඒ භවත් ගෞතමයන් ගේ කයෙහි නො ද රජස්දූල් තැවැරෙයි.

ඔබ අරමට ගියාහු පැනවූ අස්නෙහි වැඩහිඳිති. හිඳ පාසඟුළුවන් ප්‍රක්ෂාලනා කෙරෙති. ඒ භවත් ගෞතමයෝ නො ද පාද මණ්ඩනයෙහි යෙදී වෙසෙති. ඔබ පාද ප්‍රක්ෂාලනා කොට පලක් අවුළුවා (බැඳ) කය ඍජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා හිඳිති. ඔබ තමහට දුක් පිණිස නො මැ සිතති, පරාහට දුක් පිණිස නො සිතති. තමහට ද පරාහට ද දුක් පිණිස නො සිතති. ඒ භවත් ගෞතමයෝ ආත්මහිතය ද පරහිතය ද උභයහිතය දූ යි (මෙසේ) සර්වලොකහිතය මැ සිතමින් හුන්නාහු වෙති.

ඔබ අරමට ගියාහු පිරිස්හි දහම් දෙසති. එ පිරිස නො හුවති, එ පිරිස නො හෙළති, එකත්නෙන් දැහැමි කථායෙන් මැ එ පිරිස කරුණු දක්වති, සමාදන් කරවති, තෙද ගන්වති සතුටු කරවති. තවද ඒ භවත් ගෞතමයන්ගේ මුවින් (ශ්ලෙෂ්මාදීන්) බාධිත නො වූ විඥෙය වූ මධුර වූ ශ්‍රවණීය වූ සම්පිණ්ඩිත වූ නො විසිරෙනසුලු වූ ගැඹුරු වූ නින්නාද ඇති අෂ්ටාඞ්ගසමන්වාගත ඝොෂය නික්මෙයි. ඒ භවත් ගෞතමයෝ වැළිත් පිරිස් නො ඉක්ම ස්වරයෙන් හඟවති. ඔබගේ ඝොෂය පිරිසෙන් බැහැර නො නික්මෙයි. ඔහු ඒ භවත් ගෞතමයන් විසින් දැහැමිකථායෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු තෙද ගන්වන ලද්දාහු ප්‍රහර්ෂ කරවන ලද්දාහු හුනස්නෙන් නැඟී අවිජහත් ස්වභාවයෙන් අපලොකනය කරන්නාහු මැ බැස යෙති. "භවත්නි, අපි ඒ භවත් ගෞතමයන් වඩනාවුන් දකුම්හ, සිටියවුන් දකුම්හ, ඇත්ගමට වදනාවුන් දකුම්හ, ඇත්ගමෙහි නිහඬ වැ හිඳිනවුන්. දකුම්හ, අනුමොදනා කරන වළඳා නිමවූවන් දකුම්හ, අරම්වදනාවුන් දකුම්හ, ආරාමගත වැ නිහඬ වැ හිඳිනවුන් දකුම්හ, ආරාමගත වැ පිරිස්හි දහම් දෙසනවුන් දකුම්හ" කියායි. භවත් ආචාර්යයෙනි, ඒ භවත් ගෞතමයෝ මෙබඳු මෙබඳු ගුණ ඇතියෝ යි. එයින් වැඩි ගුණ ඇතියෝ ද වෙති.

මෙසේ කී කල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණ හුනස්නෙන් නැඟී උත්තරාසඞ්ගය එකස් කොට බඟා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ තෙව්ටක් උදන් ඇනි : "ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා," ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා" කියා යි. අපි කිසියම් දවසෙක ඒ භවත් ගෞතමයන් හා එක්වන්නමෝ නම් මනා මැ නු, කිසියම් කථාසල්ලාපයෙක් වේ නම් මනා මැ නු"යි.

අථ ඛො භගවා විදෙහෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන මිථිලා තදවසරි. තත්‍ර සුදං භගවා මිථිලායං විහරති මඛාදෙවම්බවනෙ. අස්සොසුං ඛො මෙථිලෙය්‍යකා[1] බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො විදෙහෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි මිථිලං අනුප්පත්තො මිථිලායං විහරති මඛාදෙවම්බවනෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති. අථ ඛො මෙථිලෙය්‍යකා[1] බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරණීයං[2] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

අස්සොසි ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො, 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මිථිලං අනුප්පත්තො, මිථිලායං විහරති මඛාදෙවම්බවනෙ'ති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො සම්බහුලෙහි මාණවකෙහි සද්ධිං යෙන මඛාදෙවම්බවනං තෙනුපසඞ්කමි, අථ ඛො බ්‍රහ්මායුනො බ්‍රාහ්මණස්ස අවිදූරෙ අම්බවනස්ස එතදහොසි: 'න ඛො මෙතං පතිරූපං යොහං පුබ්බෙ අප්පටිසංවිදිතො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමෙය්‍ය'න්ති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො අඤ්ඤතරං මාණවකං ආමන්තෙසි: 'එහි ත්වං මාණවක, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ, බ්‍රහ්මායු භො ගොතම බ්‍රාහ්මණො භවන්තං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී'ති. එවං ච වදෙහි, බ්‍රහ්මායු භො ගොතම, බ්‍රාහ්මණො ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො වීසංවස්සසතිකො ජාතියා, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. යාවතා ඛො බ්‍රාහ්මණගහපතිකා මිථිලායං පටිවසන්ති බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං භොගෙහි. බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං මන්තෙහි. බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං ආයුනා චෙව යසසා ච. සො භොතො ගොතමස්ස දස්සනකාමො'ති.

---

1. මිථිලෙය්‍යකා - මජසං, ස්‍යා.
2. සාරණීයං - මජසං.

Free Distribution www.aathaapi.org

එකල්හි බුදුහු විදේහජනපදයෙහි අනුක්‍රමයෙන් සැරිසරන්නාහු මියුලු නුවරට වැඩියහ. එහි දී බුදුහු මියුලු නුවර මුවදෙව් නම් අඹ උයන්හි වැඩවෙසෙති. මියුලුනුවර වැසි බමුණු ගැහැවියෝ මෙල බස් ඇසූහ : "භවත්නි, ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණ ගෞතමයෝ ශාක්‍යකුල-යෙන් නික්ම පැවිදි වූවාහු පන්සියක් පමණ මහත් භික්ෂුසඞ්ඝයා හා සමග විදේහයෙහි සැරිසරනසේක් මියුලුනුවරට පැමිණියාහු මියුලුනුවර මුවදෙව් නම් අඹඋයන්හි වැඩ වෙසෙති. ඒ භවත් ගෞතමයන් ගේ මෙබඳු කලණ යසශ් උස් වැ නැඟිණ : "මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගත්හ, ලොකවිද්හ, අනුත්තරපුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිසුනට ශාස්තෘයහ, බුද්ධයහ, භාග්‍යවත්හ" ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙලොව හා දෙව්මිනිසුන් සහිත මහණබමුණන් සහිත ප්‍රජාව තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට දන්වත්. ඔබ ආදි කල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍යවසානකල්‍යාණ කොට සාර්‍ථ කොට සව්‍යඤ්ජන කොට කෙවල පරිපූර්ණ කොට දහම් දෙසත්. පිරිසුදු බඹසර පවසත්. එබඳු රහතුන්ගේ දක්මෙක් වෙ නම් මැනැවැ"යි. ඉක්බිති මියුලුනුවර වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ එකත්පස් වැ හුන්හ. කෙනෙක් භාග්‍යවතුන් හමුයෙහි නම්ගොත් අස්වා එකත්පස් වැ හුන්හ. කෙනෙක් තුෂ්ණිම්භූත වැ එකත්පස් වැ හුන්හු.

බ්‍රහ්මායු බමුණු : "සැහැකුලපුත් සැහැකුලින් පැවිදි වූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මියුලු නුවරට වැඩිසේක් මියුලුනුවර මුවදෙව් අඹඋයන්හි වැඩවෙසෙති"යි. ඇසුයේ මැ යි. එසඳ බ්‍රහ්මායු බමුණු බොහෝ මණෙවුවන් හා සමග මුවදෙව් අඹ උයන් කරා ගියේ. ඉක්බිති බ්‍රහ්මායු බමුණුහට අඹඋයන්නුදුරෙහි දී මෙල සිත් වි : "මම කැල මැ නො දන්වන ලදුයෙම් මහණ ගොයුමන් දක්නට එළැඹෙම් නම් මෙල මට නො නිසි යැ" යනු යි. එසඳ බ්‍රහ්මායු බමුණු එක්තරා මාණවයකු ඇමැතී : "මාණවකය තෝ එව. මහණ ගොයුමන් කරා එළැඹෙව. එළැඹ මා බසින් මහණ ගොයුමන්ගේ අතින් අල්පාබාධ අල්පාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුස්ව : "භවත් ගෞතමයන වහන්ස, බ්‍රහ්මායු බමුණු භවත් ගෞතමයන් අතින් නිරාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුසී" කියා යි. මෙසේත් කියව : "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රහ්මායු බ්‍රාහ්මණ ජීර්ණ යැ වෘද්ධ යැ මහලු යැ බොහෝ කල් ගැළවී යැ. පශ්චිම වයසට පැමිණියේ යැ, උපතින් එක්සියවිසිහැවිරිදි යැ, නිඝණ්ඩු කෙටුභශාස්ත්‍ර සහිත ශික්ෂානිරුක්ති සහිත ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවේදයන්ගේ පරතෙර ගියේ යැ-පද හදරන්නේ යැ තදවශේෂ ව්‍යාකරණ හදරන්නේ යැ. ලෝකායතමහාපුරුෂලක්ෂණ-යෙහි පරිපූරකාරී යැ. මියුලු නුවර යම් තාක් බමුණුගැහැවියෝ වෙසෙත් ද, ඔවුනතුරින් බ්‍රහ්මායු බ්‍රාහ්මණ භොගයෙන් අග්‍ර ය'යි කියනු ලැබේ. 'බ්‍රහ්මායු බ්‍රාහ්මණ ඔවුනතුරින් වෙදයෙන් අග්‍ර යැ'යි කියනු ලැබේ. 'බ්‍රහ්මායු බ්‍රාහ්මණ ඔවුනතුරින් ආයුෂ හා යසසිනුදු අග්‍ර යැ'යි කියනු ලැබේ. හේ භවත් ගෞතමයන් වහන්සේ දක්නා කැමැත්තේ යැ"යි.

එවං භොති ඛො සො මාණවකො බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො මාණවකො භගවන්තං එතදවොච: බ්‍රහ්මායු භො ගොතම, බ්‍රාහ්මණො භවන්තං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. බ්‍රහ්මායු භො ගොතම, බ්‍රාහ්මණො ජිණ්ණො -පෙ- ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. යාවතා භො බ්‍රාහ්මණගහපතිකා මිථිලායං පටිවසන්ති, බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං භොගෙහි. බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං මන්තෙහි. බ්‍රහ්මායු තෙසං බ්‍රාහ්මණො අග්ගමක්ඛායති යදිදං ආයුනා චෙව යසසා ච. සො භොතො ගොතමස්ස දස්සනකාමො’ති.

‘යස්සදානි මාණවක, බ්‍රහ්මායු බ්‍රාහ්මණො කාලං මඤ්ඤතී’ති.

අථ ඛො සො මාණවකො යෙන බ්‍රහ්මායු බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං එතදවොච : ‘කතාවකාසො ඛො භවං සමණෙන ගොතමෙන, යස්සදානි භවං කාලං මඤ්ඤතී’ති.

අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. අද්දසා ඛො සා පරිසා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන අථ නං[1] ඔකාසමකාසි යථා තං ඤාතස්ස යසස්සිනො. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො තං පරිසං එතදවොච: අලං භො, නිසීදථ තුම්හෙ සකෙ ආසනෙ, ඉධාහං සමණස්ස ගොතමස්ස සන්තිකෙ නිසීදිස්සාමීති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි සමන්නෙසි. අද්දසා ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි, යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය ච. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවන්තං ගාථාහි අජ්ඣභාසි:

‘යෙ මෙ ද්වත්තිංසාති සුතා මහාපුරිසලක්ඛණා,
දුවෙ තෙසං න පස්සාමි භොතො කායස්මිං ගොතම.

කච්චි කොසොහිතං භොතො වත්ථගුය්හං නරුත්තම,
නාරීසහනාම සව්හයා[2] කච්චි ජිව්හා න රස්සිකා[3]

කච්චි පහූතජිව්හොසි? යථා තං ජානියාමසෙ,
නින්නාමයෙතං තනුකං කඞ්ඛං විනය නො ඉසෙ,

දිට්ඨධම්මහිතත්ථාය සම්පරාය සුඛාය ච,
කතාවකාසා පුච්ඡෙමු[4] යං කිඤ්චි අභිපත්ථිත’න්ති.

---

1. දිස්වාන ඔරමිය - මජසං. / දිස්වා ඔරමන්ථ - ස්‍යා. / දිස්වාන ඔරමන්ථ - PTS.
2. නාරීසමානසව්හයා - සීමු, මජසං.
3. තදස්සිකා - සීමු. / න දස්සකා - මජසං.
4. පුච්ඡෙම - සීමු. / පුච්ඡාම - මජසං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

'එසේ යැ භවත්නි' යි ඒ මාණවු බ්‍රහ්මායු බමුණුහට පිළිවදන් දී භාග්‍යවතුන් කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඒ මාණවු භාග්‍යවතුන් වහන්සේට තෙල බස් කී : ''භවත් ගොයුම්ාණෙනි, බ්‍රහ්මායු බ්‍රාහ්මණ භවත් ගෞතමයන් අතින් නිරාබාධ නිරාතඞ්ක සැහැල්ලු පැවැතුම් කායබල පහසුවිහරණ පුළුවුසි. භවත් ගෞතමයෙනි, බ්‍රහ්මායු බමුණු ජීර්ණ යැ . . . ලොකායතමහාපුරුෂලක්ෂණයෙහි පරිපූරකාරී යැ. මියුලු නුවර යම් තාක් බමුණුගැහැවියෝ වෙසෙත් ද, ඔවුනතුරෙහි 'බ්‍රහ්මායු බමුණු භොගයෙන් අග්‍ර යැ'යි කියනු ලැබේ. ඔවුනතුරින් බ්‍රහ්මායු බමුණු වෙදයෙන් අග්‍ර යැ'යි කියනු ලැබේ. බ්‍රහ්මායු බමුණු ඔවුනතුරින් ආයුෂ හා යසසින්ද අග්‍ර යැ'යි කියනු ලැබේ. හෙ භවත් ගෞතමයන් වහන්සේ දක්නා කැමැත්තේ යැ''යි.

මාණවකය, එයට දැන් බ්‍රහ්මායු බමුණු කල් දන්නේ යැ'යි.

එසඳ ඒ මාණවු බ්‍රහ්මායු බමුණු කරා එළැඹියේ. එළැඹ බ්‍රහ්මායු බමුණුහට තෙල කී : ''භවත් ශ්‍රමණ ගෞතම විසින් කළ අවකාශ ඇත්තේ යැ, එයට දැන් භවත් කල් දන්නේ යැ'යි.

එසඳ බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එ පිරිස බ්‍රහ්මායු බමුණු දුරැ දී මැ එන්නා දුටු. දැක ඉක්බිති යසස්වී ඥාතපුරුෂයකුට සෙයින් ඔහුට අවකාශ කළා. එසඳ බ්‍රහ්මායු බමුණු එ පිරිසට තෙල කී : ''භවත්නි, කම් නැත, තෙපි සිය අස්නෙහි හිඳුව, මෙහි මම් මහණ ගොයුමන් වෙත හිඳිමි''යි. ඉක්බිති බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී. සතුටු වියයුතු සාරාණීය කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේගේ කයෙහි දෙතිස් මහපුරිස් ලකුණු පිරික්සී. බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන්ගේ කයෙහි දෙලකුණක් තබා දෙතිස් මහපුරිස්ලකුණු බෙහෙවින් දිට. මහපු-පුරිස් ලකුණු දෙකක් (දක්නට) පතයි, සොයමින් වෙහෙසෙයි, සනිටුහනට නො යෙයි, (නො දක්මෙන්) නො පහදි. කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යතායෙහි ද ප්‍රභූතජිහ්වතායෙහි ද යන දෙක්හි යැ. ඉක්බිති බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කී :

''ගොයුම්ාණෙනි, මා විසින් යම් මහපුරිස්ලකුණු දෙතිසකැ'යි අසනලද ද ඔවුනතුරින් දෙකක් භවතුන්ගේ කයෙහි නො දක්මි.

නරොත්තමයෙනි, කිම භවත්හුගේ කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යය ඇද්ද? කිම ස්ත්‍රීලිඞ්ග-යෙන් කියයුතු හ්‍රස්ව නො වූ ජිහ්වා ඇද්ද?

කිම ප්‍රභූතජිහ්ව වෙහි ද? භවත් ඍෂිවරයිනි, අපි යම් පරිදි එය දැනුමෝ නම් එ පරිදි තෙල තුනී දිව නෙරුව මැනැවැ. සැක දුරු කළ මැනැවැ.

යම් කිසිවක් පතනලද නම් එය කළ අවකාශ ඇතියමෝ ඓහලෞකිකසුඛය සඳහාත් පාරලෞකිකසුඛය සඳහා ත් පුළුවුසුම්හ.

අථ ඛො භගවතො එතදහොසි: 'පස්සති ඛො මෙ අයං බ්‍රහ්මායු බ්‍රාහ්මණො ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චා'ති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි. යථා අද්දස බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවතො කොසොහිතං වත්ථගුය්හං. අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පරිමසි[1], උභොපි නාසිකාසොතානි අනුමසි පරිමසි. කෙවලම්පි[2] ලලාටමණ්ඩලං[3] ජිව්හාය ඡාදෙසි[4] අථ ඛො භගවා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං ගාථාහි පච්චභාසි.

යෙ තෙ ද්වත්තිංසාති සුතා මහාපුරිසලක්ඛණා,
සබ්බෙ තෙ මම කායස්මිං මා තෙ කඞ්ඛාහු බ්‍රාහ්මණ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීනං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ.

දිට්ඨධම්මහිතත්ථාය සම්පරාය සුඛාය ච,
කතාවකාසො පුච්ඡස්සු යං කිඤ්චි අභිපත්ථිතන්ති.

අථ ඛො බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: 'කතාවකාසො ඛොම්හි සමණෙන ගොතමෙන. කින්නු ඛො අහං සමණං ගොතමං පුච්ඡෙය්‍යං දිට්ඨධම්මිකං වා අත්ථං සම්පරායිකං වා'ති. අථ ඛො බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: 'කුසලො ඛො අහං දිට්ඨධම්මිකානං අත්ථානං, අඤ්ඤෙපි මං දිට්ඨධම්මිකං අත්ථං පුච්ඡන්ති. යන්නූනාහං සමණං ගොතමං සම්පරායිකඤ්ඤෙව අත්ථං පුච්ඡෙය්‍ය'න්ති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවන්තං ගාථාහි අජ්ඣභාසි.

'කථං භො[5] බ්‍රාහ්මණො හොති කථං භවති වෙදගූ,
තෙවිජ්ජො භො කථං හොති සොත්තියො[6] කින්ති වුච්චති.
අරහං භො කථං හොති කථං භවති කෙවලී,
මුනිච්ච[7] භො කථං හොති බුද්ධො කින්ති පවුච්චති'ති.

අථ ඛො භගවා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං ගාථාහි පච්චභාසි.

'පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි.

චිත්තං විසුද්ධං ජානාති මුත්තං රාගෙහි සබ්බසො,
පහීන ජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී
පාරගූ සබ්බධම්මානං බුද්ධො තාදී පවුච්චති'ති.

---

1. පටිමසි - මජසං, සයා, PTS.
2. කෙවලකම්පි - PSS. කෙවලකප්පං - සයා.
3. නලාටමණ්ඩලං - මජසං, සයා, PTS.
4. පච්ඡාදෙසි - PTS.
5. කථං ඛො - මජසං.
6. සොත්ථියො - සිමු, PTS
7. මුනි ච - සිමු, මජසං, සයා, PTS.

Free Distribution www.aathaapi.org

එසඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිත් වී : "මේ බ්‍රහ්මායු බ්‍රාහ්මණ මා ගේ දෙතිස් මහපුරිස් ලකුණු බෙහෙවින් දෙකක් තබා දක්නේ යැ මහපුරිස් ලකුණු දෙකෙක ආකාඞ්ක්‍ෂා කෙරෙයි, විචිකිත්සා කෙරෙයි, සනිටුහන් නො කෙරෙයි, සම්ප්‍රසාද නො කෙරෙයි. කොෂාවහිතවස්ත්‍රගුහ්‍යයෙහි හා ප්‍රභූතජිහ්වතායෙහි යි. එසඳ බුදුහු යමසේ බ්‍රහ්මායු බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේගේ කොෂාවහිතවස්ත්‍රගුහ්‍යය දිටී නම් එබඳු ඉද්ධියක් කොළෝ. ඉක්බිති බුදුහු දිව නෙරැ දෙකන්සිදුත් අනුමඩ පරිමඩ කළහ, දෙනැහැසිදුත් අනුමඩ පරිමඩ කළහ, සියලු නළල්මඬල ද වැසූහ. ඉක්බිති බුදුහු බ්‍රහ්මායු බමුණුහට ගාථායෙන් මෙසේ වදළහ :

"බමුණ තොප විසින් දෙතිසකැ'යි යම් මහපුරිස්ලකුණු කෙනෙක් අසනලදහු නම් එ හැම මා ගේ කයෙහි වෙයි. තොපට නහමක් සැක වේවා.

බමුණ මා විසින් දතයුත්ත දන්නාලද, භාවිතව්‍යය භාවිත යැ, ප්‍රහාතව්‍යය ප්‍රහාණය කරන ලද, එහෙයින් බුද්ධ වෙමි.

ඉහාත්මයෙහි හිතයට ද පරලෙවිහි සුඛයට ද කළ අවකාශ ඇතියම්හ, යම් කිසිවක් පතනලද නම් එය පුළුවුස්ව"යි.

එසඳ බ්‍රහ්මායු බමුණුහට මෙසේ සිත් වී : "ශ්‍රමණ ගෞතමයන් විසින් කළ අවකාශ ඇතියෙමි. මම කුමක් මහණ ගොයුමන් අතින් පුළුවුස්නෙම් ද? ඓහලෞකික අර්ථය හෝ යැ පාරලෞකික අර්ථය හෝ යැ"යි. ඉක්බිති බ්‍රහ්මායු බමුණුහට මෙසේ සිත් වී : "මම වූකලි දෘෂ්ටධාර්මිකාර්ථයෙහි කුශලයෙමි, අන්‍යයෝ ද මා අතින් දෘෂ්ටධාර්මිකාර්ථය පුළුවුසිති. මම මහණ ගොයුමන් අතින් සාම්පරායිකාර්ථය පුළුවුස්නෙම් නම් මනා මැ නු"යි. ඉක්බිති බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කී :

"භවත්නි, කිසෙයින් 'බ්‍රාහ්මණ' වේ ද, කිසෙයින් වෙදගූ වේ ද, කිසෙයින් 'ත්‍රෛවිද්‍ය' වේ ද, කවරෙක් 'සොත්තිය'යි කියනු ලැබේ ද?

භවත්නි, කිසෙයින් අර්හත් වේ ද, කිසෙයින් 'කෙවලී' (සකලගුණසම්පන්න) වේ ද, කිසෙයින් 'මුනි' වේ ද, කවරෙක් 'බුද්ධ'යි කියනු ලැබේ ද?" යි.

එකල්හි බුදුහු බ්‍රහ්මායු බමුණුහට ගාථායෙන් පිළිතුරු වදළහ :

"යමෙක් පූර්වනිවාසය දන්නේ ද, (දිවැසින්) සවර්ගයත් අපායත් දකී ද, යළි ජාතික්‍ෂයට පැමිණියේ ද, (අර්හද්ඥානයෙන්) අභිජානන කොට අවසානයට පැමිණියේ ද, (අර්හත් ඥාන සඞ්ඛ්‍යාත) මුනිභාවයෙන් සමන්වාගත වූයේ ද.

සර්වප්‍රකාරයෙන් රාගයෙන් මිදුණු (එහෙයින් මැ) විශුද්ධ වූ සිත දනී ද, ප්‍රහීණ වූ ජාති හා මරණ ඇත්තේ ද, සියලු සිවමහබඹසර ඇත්තේ ද, සියලු (ලොව්ලොවුතුරු) දහමුන්ගේ පාරයට ගියේ ද, එ බඳු පුද්ගල 'බුද්ධ'යයි කියනු ලැබේ" යයි.

එවං වුත්තෙ බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති. පාණීහි ච පරිසම්බාහති. නාමඤ්ච සාවෙති: බ්‍රහ්මායු චාහං[1] භො ගොතම බ්‍රාහ්මණො, බ්‍රහ්මායු චාහං[1] භො ගොතම බ්‍රාහ්මණො'ති. අථ ඛො සා පරිසා අච්ඡරියබ්භුතචිත්තා ජාතා අහොසි: 'අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා.[2] යත්‍ර හි නාමායං බ්‍රහ්මායු බ්‍රාහ්මණො ඤාතො යසස්සී එවරූපං පරමනිපච්චකාරං[3] කරිස්සතී'ති.

අථ ඛො භගවා බ්‍රහ්මායුං බ්‍රාහ්මණං එතදවොච: 'අලං බ්‍රාහ්මණ, උට්ඨහ, නිසීද ත්වං සකෙ ආසනෙ, යතො තෙ මයි චිත්තං පසන්න'න්ති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨහිත්වා සකෙ ආසනෙ නිසීදි.

අථ ඛො භගවා බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: 'දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි යදා භගවා අඤ්ඤාසි බ්‍රහ්මායුං බ්‍රාහ්මණං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙවං බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො දිට්ඨධම්මො, පත්තධම්මො, විදිතධම්මො, පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණඞ්ගතං. අධිවාසෙතු ච මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත'න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන බ්‍රහ්මායුස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

---

1. බ්‍රහ්මායු අහං - මජ්ඣං, බ්‍රහ්මායවාහං - ස්‍යා, PTS.
2. සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා - මජ්ඣං, උෂනං.
3. පරමනිපච්චාකාරං - සීමු, පරමං නිපච්චාකාරං - ස්‍යා.

මෙසේ වදාළ කල්හි බ්‍රහ්මායු බමුණු හුනස්නෙන් නැඟී උතුරුසඟ එකස් කොට පෙරෙවැ භාග්‍යවතුන් වහන්සේගේ පාසඟුළෙයෙහි හිසින් වැදවැටී භාග්‍යවතුන් වහන්සේ ගේ පාසඟුළුවන් මුවින්නුදු සිඹී. අතින්නුදු සම්බාහන කෙරෙයි; ''භවත් ගොයුමාණෙනි, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයෙමි, භවත් ගොයුමාණෙනි, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයෙමි''යි නමුදු අස්වයි. එසඳ ඒ පිරිස ආශ්චර්‍ය්‍ය අද්භූත සිත් ඇති වූ : ''භවත්නි ආශ්චර්‍ය්‍ය යැ, භවත්නි අද්භූත යි, මහණක්හුගේ මහත් ඍද්ධියක් බලව, මහත් අනුභාවයක් බලව. යම් කරුණෙක්හි ලා ප්‍රකට වූ යසස් ඇති මේ බ්‍රහ්මායු බමුණු මෙ වන් පරමනිපත්‍යාකාරයක් කෙරේ''යයි.

එසඳ බුදුහු බ්‍රහ්මායු බමුණුහට තෙල වදාළහ : බමුණ කම් නැත, නැඟී සිටුව, තෙපි සිය අස්නෙහි හිඳුව, මා කෙරෙහි තොප ගේ සිත් පහන් හෙයිනැ''යි. එකල්හි බ්‍රහ්මායු බමුණු නැඟී සිය අස්නෙහි හින.

ඉක්බිති බුදුහු බ්‍රහ්මායු බමුණුහට අනුපූර්වකථා වදාළහ. ඒ කෙසේ යැ යත් : දානකථා යැ ශීලකථා යැ ස්වර්ගකථා යැ කාමයන් ගේ ආදීනව යැ සංක්ලෙශයන්ගේ ලාමක බව හා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ප්‍රකාශ කළහ. යම් කලෙක බුදුහු බ්‍රහ්මායු බමුණු අරොග සිත් ඇතියහු මෘදු සිත් ඇතියහු විගත නිවරණ සිත් ඇතියහු ඔදවැඩි සිත් ඇතියහු පහන්සිත් ඇතියහු බව දත්සේක් ද එකල්හි බුදුවරුන්ගේ යම් සාමුක්කංසික (සිවුසස්) ධර්මදේශනාවක් වේ ද, ඒ දහම ප්‍රකාශ කළහ : දුඃඛ යැ සමුදය යැ නිරෝධ යැ මාර්ග යැ යි. යම්සේ නම් පහවැ ගිය කළුපැහැ ඇති ශුද්ධ වස්ත්‍රයක් මොනොවට රඳන් ගන්නේ ද එසෙයින් මැ බ්‍රහ්මායු බමුණුහට ඒ අස්නෙහි දී මැ 'යම් කිසි සමුදය ධර්මයෙක් ඇද්ද, ඒ හැම නිරොධස්වභාවය ඇතැ'යි පහ වැ ගිය (රාගාදි) රජස් ඇති පහ වැ ගිය (රාගාදි) මල ඇති දහම් ඇස උපන. ඉක්බිති බ්‍රහ්මායු බමුණු දක්නාලද (ලොවුතුරු) දහම් ඇති වැ, පැමිණි දහම් ඇති වැ දන්නා ලද දහම් ඇති වැ බැසගත් දහම් ඇති වැ තරණය කළ විචිකිත්සා ඇති වැ පහ වැ ගිය සැක ඇති වැ විශාරද බවට පැමිණියේ ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත වූයේ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''භවත් ගොයුමාණෙනි ඉතා කාන්ත යැ, භවත් ගෞතමයෙනි ඉතා කාන්ත යැ. භවත් ගොයුමාණෙනි, යම්සේ යටිහුරු කළ දැයක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් වූවක් හෝ විවර කරන්නේ ද, මුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තාහු රූප දක්නාහ'යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එසෙයින් මැ භවත් ගොයුමාණන් විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද. තෙල මම් භවත් ගෞතමයන් ද දහම් ද බික්සඟන ද සරණ කොට යෙමි. භවත් ගෞතමයෝ මා අද පටන් කොට දිවි හිම් කොට සරණ ගිය උපාසකයකු කොට ධරත්වා. භවත් ගෞතමයෝ බික්සඟන හා සමග සෙට මා ගේ බත ද ඉවසත්ව''යි. බුදුහු තුෂ්ණීම්භාවයෙන් ඉවැසූහ.

එසඳ බ්‍රහ්මායු බමුණු භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනය දැන හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට බැස ගියේ. ඉක්බිති බ්‍රහ්මායු බමුණු ඒ රැය ඇවෑමෙන් සිය නිවෙස්නෙහි ප්‍රණීත ඛාද්‍යභොජ්‍ය පිළියෙල කරවා 'භවත් ගෞතමයන් වහන්ස, බත නිමියේ යැ, වඩනට කලැ'යි භාග්‍යවතුන් වහන්සේට කල් දන් වී. එසඳ බුදුහු පෙරවරු සමයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන බ්‍රහ්මායු බමුණුහුගේ නිවෙස්න කරා එළැඹියහ. එළැඹ පැනැවූ අස්නෙහි බික්සඟුන්

සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො සත්තාහං බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො භගවා තස්ස සත්තාහස්ස අච්චයෙන විදෙහෙසු චාරිකං පක්කාමි. අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො අචිරපක්කන්තස්ස භගවතො කාලමකාසි.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: 'බ්‍රහ්මායු භන්තෙ, බ්‍රාහ්මණො කාලඞ්කතො, තස්ස කා ගති, කො අභිසම්පරායො'ති.

පණ්ඩිතො භික්ඛවෙ, බ්‍රහ්මායු බ්‍රාහ්මණො, පච්චපාදි ධම්මස්සානුධම්මං න ච මං[1] ධම්මාධිකරණං විහෙසෙසි. බ්‍රහ්මායු භික්ඛවෙ, බ්‍රාහ්මණො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

බ්‍රහ්මායුසුත්තං පඨමං.

---

1. නෙව මං - ස්‍යා.

හා සමග වැඩහුන්හ. ඉක්බිති බ්‍රහ්මායු බමුණු සතියක් මුළුල්ලෙහි බුදුපාමොක් භික්සඟුන් ප්‍රණීත ඛාද්‍යයෙන් භෝජ්‍යයෙන් සියතින් සැතැප්වී, පැවැරී. එකල බුදුහු එ සත්දවස ඇවෑමෙන් විදෙහදනව්වෙහි චාරිකාවට නික්ම වැඩියහ. ඉක්බිති බ්‍රහ්මායු බමුණු බුදුන් නික්ම ගිය නොබෝ කල්හි කලුරිය කෙළේ.

එසඳ බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට තෙල කීහු : වහන්ස, බ්‍රහ්මායු බමුණු කලුරිය කෙළේ. ඔහුගේ ගතිය (උපත) කවර? (හෙ) පරලෙව්හි කවරෙක් වේ ද?''යි.

මහණෙනි, බ්‍රහ්මායු බමුණු පණ්ඩිත යැ, ධර්ම (අර්හත්මාර්ග) යාගේ අනුධර්ම (යට තුන්මඟ පල) යට පිළිපන්නේ යැ. ධර්මහෙතුයෙන් මා නො ද වෙහෙසී. මහණෙනි, බ්‍රහ්මායු බමුණු පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය වීමෙන් ඒ සුදවස් බඹලොවැ පිරිනිවෙනසුලු වැ එ ලොවින් පෙරළා නො එන සැහැවි ඇති වැ ඔපපාතික වේ''යයි.

බුදුහු මෙය වදළහ. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්‍දනා කළහ'යි.

පළමු වැනි බ්‍රහ්මායු සූත්‍ර යි.

2. 5. 2

සෙල සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි, යෙන ආපණං නාම අඞ්ගුත්තරාපානං නිගමො තදවසරි. අස්සොසි ඛො කෙණියො ජටිලො සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි ආපණං අනුප්පත්තො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො කෙණියො ජටිලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො කෙණියො ජටිලො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච : 'අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති.

එවං වුත්තෙ භගවා කෙණියං ජටිලං එතදවොච : මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. ත්වඤ්ච ඛො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො'ති. දුතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච : 'කිඤ්චාපි භො ගොතම, මහා භික්ඛුසඞ්ඝො, අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, අහඤ්ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. දුතියම්පි ඛො භගවා කෙණියං ජටිලං එතදවොච : 'මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. ත්වඤ්ච ඛො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො'ති, තතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච : 'කිඤ්චාපි භො ගොතම මහා භික්ඛුසඞ්ඝො, අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. අහඤ්ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන

2. 5. 2
සේල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අඞ්ගුත්තරාප නම් දනව්යෙහි අඩතෙළෙස්යල්සියක් පමණ මහත් වූ බික්සඟුන් හා සමග සැරිසරන සේක් අඞ්ගුත්තරාපදනවූ වැසියන්ගේ ආපණ නම් නියම්ගම කරා වැඩිසේක. කේණිය ජටිල තෙල යසගී ඇසි : "භවත්නි, සැහැපුත් සැහැකුලයෙන් නික්ම පැවිදි වූ මහණ ගොයුම්හු අඩතෙළෙස්යල්සියක් පමණ මහත් වූ බික්සඟුන් හා සමග අඞ්ගුත්තරාප නම් දනව්යෙහි සැරිසරන සේක් ආපණ නම් නිගමයට පැමිණියහ. ඒ භවත් ගොයුමාණන්ගේ කලි මෙ වන් කලණ යසගී උස් වැ නැඟිණ: "මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගත්හ, ලොකවිද්හ, අනුත්තර පුරුෂදම්‍ය සාරථිහ, දෙව්මිනිසුනට ශාස්තෘහ, බුද්ධයහ, භාග්‍යවත්හ"යි. ඔබ දෙව්ලෝ සහිත මරලෝ සහිත බඹලෝ සහිත මෙ ලොව ද, මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ද තමා විසින් විශිෂ්ටඥනයෙන් දන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති. ඔබ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසානකල්‍යාණ කොට අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ දහම් දෙසති. සියල්ල පිරිපුන් පිරිසුදු බඹසර පවසති. එ වන් රහතුන්ගේ දක්ම මනා මැ තු" යි.

එසද කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී. සතුටු වියයුතු කලතුරුහි සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. බුදුහු එකත්පස් වැ හුන් කේණිය ජටිලයාහට දහැමි කථායෙන් කරුණු දක්වූහ, සමාදන් කරවූහ, තෙද ගැන්වූහ, ප්‍රහර්ෂ කරවූහ. ඉක්බිති කේණිය ජටිල භාග්‍යවතුන් විසින් දහැමි කථායෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ මොනොවට තෙද ගන්වන ලද්දේ සම්ප්‍රහර්ෂ කරවන ලද්දේ භාග්‍යවතුන් වහන්සේට තෙල බස් කී : "භවත් ගෞතමයෝ බික්සඟුන් හා සමග සෙට මා ගේ බත ඉවසන සේක්ව"යි.

මෙසේ කී කල්හි බුදුහු කේණිය ජටිලහට තෙල වදළහ : "කේණියෙනි, බික්සඟහු මහත්හ, අඩතෙළෙස්යල්සියක් මහණහු ය, තොයිත් බමුණන් කෙරෙහි අභිප්‍රසන්නයෙහි"යි. දෙවනවට ද කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "භවත්-ගොයුම් ගොතුව, අඩතෙළෙස්යල්සියක් පමණ බික්සඟන මහත් වුව ද, මයිත් බමුණන් කෙරෙහි අභිප්‍රසන්න වුව ද භවත් ගෞතමයන් වහන්සේ සෙට මාගේ බත බික්සඟන හා සමඟ ඉවසන සේක්වා, දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයාහට තෙල වදළ සේක : "කේණියෙනි, බික්සඟහු බොහෝහ, අඩතෙළෙස්යල්සියක් මහණහු ය, තොයිත් බමුණන් කෙරෙහි අභිප්‍රසන්නයෙහි"යි. තෙවනවට ද කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "භවත් ගොයුම් ගොතුව, අඩතෙළෙස්යල්සියක් පමණ බික්සඟන බොහෝ වුව ද මයිත් බමුණන් කෙරෙහි අභිප්‍රසන්න වුව ද භවත් ගෞතමයන් වහන්සේ සෙට මා ගේ බත බික්සඟන හා සමග ඉවසන සේක්ව"යි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

Free Distribution www.aathaapi.org

අථ ඛො කෙණියො ජටිලො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා යෙන සකො අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මිත්තාමච්චෙ ඤාතිසාලොහිතෙ ආමන්තෙසි: සුණන්තු මෙ භොන්තො මිත්තාමච්චා ඤාතිසාලොහිතා, සමණො මෙ ගොතමො නිමන්තිතො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙන. යෙන මෙ කායවෙය්‍යාවටිකං[1] කරෙය්‍යාථා’ති. එවං භොති ඛො කෙණියස්ස ජටිලස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා කෙණියස්ස ජටිලස්ස පටිස්සුත්වා අප්පෙකච්චෙ උද්ධනානි ඛණන්ති, අප්පෙකච්චෙ කට්ඨානි ඵාලෙන්ති, අප්පෙකච්චෙ භාජනානි ධොවන්ති, අප්පෙකච්චෙ උදකමණිකං පතිට්ඨාපෙන්ති, අප්පෙකච්චෙ ආසනානි පඤ්ඤාපෙන්ති, කෙණියො පන ජටිලො සාමඤ්ඤෙව මණ්ඩලමාලං පටියාදෙති.

තෙන ඛො පන සමයෙන සෙලො බ්‍රාහ්මණො ආපණෙ පටිවසති තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. තීණි ච මාණවකසතානි මන්තෙ වාචෙති. තෙන ඛො පන සමයෙන කෙණියො ජටිලො සෙලෙ බ්‍රාහ්මණෙ අභිප්පසන්නො හොති. අථ ඛො සෙලො බ්‍රාහ්මණො තීහි මාණවකසතෙහි පරිවුතො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන කෙණියස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. අද්දසා ඛො සෙලො බ්‍රාහ්මණො කෙණියස්ස ජටිලස්ස අස්සමෙ අප්පෙකච්චෙ උද්ධනානි ඛණන්තෙ, අප්පෙකච්චෙ කට්ඨානි ඵාලෙන්තෙ, අප්පෙකච්චෙ භාජනානි ධොවන්තෙ, අප්පෙකච්චෙ උදකමණිකං පතිට්ඨාපෙන්තෙ, අප්පෙකච්චෙ ආසනානි පඤ්ඤාපෙන්තෙ[2], කෙණියං පන ජටිලං සාමඤ්ඤෙව මණ්ඩලමාලං පටියාදෙන්තං. දිස්වාන කෙණියං ජටිලං එතදවොච: කින්නු භොතො කෙණියස්ස ආවාහො වා භවිස්සති, විවාහො වා භවිස්සති, මහායඤ්ඤො වා පච්චුපට්ඨිතො, රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙනා’ති. න මෙ භො සෙල ආවාහො භවිස්සති, නපි විවාහො භවිස්සති, නපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙන. අපි ච ඛො මෙ මහායඤ්ඤො පච්චුපට්ඨිතො. අත්ථි භො සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි ආපණං අනුප්පත්තො. තං ඛො පන භගවන්තං[3] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ‘ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා’ති. සො මෙ නිමන්තිතො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා’ති. බුද්ධොති භො කෙණිය වදෙසි, බුද්ධොති භො සෙල වදාමි. බුද්ධොති භො කෙණිය වදෙසි, බුද්ධොති භො සෙල වදාමි. බුද්ධොති භො කෙණිය වදෙසි, බුද්ධොති භො සෙල වදාමී’ති.

අථ ඛො සෙලස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: ඝොසොපි ඛො එසො දුල්ලභො ලොකස්මිං යදිදං බුද්ධොති. ආගතානි ඛො පනස්මාකං මන්තෙසු ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි, යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව[4] ගතියො භවන්ති අනඤ්ඤා සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං

1. කායවෙය්‍යාවත්තිකං - ස්‍යා.
2 පඤ්ඤපෙන්තෙ - මජ්සං.
3. භවන්තං - මජ්සං, ස්‍යා.
4. ද්වෙයෙව - මජ්සං.

එසඳ කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනාව ලැබ හුනස්නෙන් නැඟී සිය අසපුව කරා එළැඹියේ යි. එළැඹ මිත්‍රාමාත්‍යයන් හා නෑසාලේනෑයන් ඇමැති: ''භවත් මිත්‍රාමාත්‍යයන් හා නෑසාලේනෑයෝ මබස අසත්වා! මා විසින් මහණ ගොයුම්හු සෙට බතට බික්සඟන හා සමග නිමන්ත්‍රණ කරන ලදහ. එහෙයින් මට කායවතාවත් කරව''යි. ''එසේ යැ භවත්නි''යි කේණිය ජටිලයාගේ මිත්‍රාමාත්‍යයෝ නෑසහලේ නෑයෝ කේණිය ජටිලයාහට පිළිවදන් දී ඇතැම් කෙනෙක් උදුන් කණිති, ඇතැම් කෙනෙක් දර පලති, ඇතැම් කෙනෙක් බඳුන් දෙවිති, ඇතැම් කෙනෙක් දියසැළ පිහිටුවති (තබති) ඇතැම් කෙනෙක් අසුන් පනවති. කේණිය ජටිල වැළිත් තෙමේ මැ මණ්ඩලමාලය (පිළී මඩුව) පිළියෙල කරයි.

එසඳ සේලබ්‍රාහ්මණ ආපණ නම් නියම්ගම්හි වෙසෙයි : නිඝණ්ඩුකෙටුභ සහිත ශික්ෂා නිරුක්ති සහිත ඉතිහාසය පස් වනු කොට ඇති ත්‍රිවෙදයෙහි පාරයට ගියේ යැ. පද හා තදන්‍ය ව්‍යාකරණ හදරනුයේ යැ, ලෝකායත මහාපුරුෂ ලක්ෂණයෙහි පරිපූරකාරී යැ' තුන්සියක් මාණවකයනට වේද හදරවයි. එසඳ කේණියජටිල සේලබ්‍රාහ්මණ කෙරෙහි අභිප්‍රසන්න වෙයි. ඉක්බිති සේලබ්‍රාහ්මණ තුන්සියක් මණෙවුවන් විසින් පිරිවරනලද්දේ ජඞ්ඝාවිහාරයෙහි සක්මන් කරනුයේ ඇවිදුනේ කේණිය ජටිලයාගේ අසපුව කරා එළැඹි-යේ යි. සේලබ්‍රාහ්මණ කේණිය ජටිලයාගේ අසපුවෙහි ඇතැම් කෙනකුන් උදුන් කණනුවන් ඇතැම් කෙනකුන් දරපලනුවන් ඇතැම් කෙනකුන් බඳුන් දේනාවුන් ඇතැම් කෙනකුන් දියසැළ තබනුවන් ඇතැම් කෙනකුන් අසුන් පනවනුවන්, කෙණියජටිල වැළිත් තමා මැ මණ්ඩලමාලය පිළියෙළ කරන්නා දුටුයේ යැ. දැක කේණියජටිලයාහට තෙල කී : ''කිම? භවත් කේණියහට ආවාහයෙක් හෝ වන්නේ ද, විවාහයෙක් හෝ වන්නේ ද, මහායාගයෙක් හෝ එළැඹසිටියේ ද, මගධෙශ්වර සේනියබිම්බිසාර රජ හෝ සෙට දවසට බලකාය හා සමග නිමන්ත්‍රණ කරන ලද ද?''යි. භවත් සේලයෙනි, මට ආවාහයෙක් නො වෙයි, විවාහයෙක් ද නො වෙයි, මගධෙශ්වර සේනිය බිම්බිසාර රජ හෝ සෙට දවසට බලකාය හා සමග නිමන්ත්‍රණ නො කරනලද, එතෙකුදු වත් මට මහායාගයෙක් එළැඹසිටියේ යැ. භවත්නි, සැහැපුත් සැහැකුලයෙන් නික්ම පැවිදි වූ මහණගොයුම්හු ඇත, අඩතෙළෙස් යල්සියක් පමණ මහත් වූ බික්සඟුන් හා සමග අඞ්ගුත්තරාප ජනපදයෙහි සැරිසරන සේක් ආපණ නම් නියම්ගමට වැඩියහ. ඒ භාග්‍යවත් ගොයුම්ගොතුවන්ගේ මෙවන් කලණ යසගී උස් වැ නැඟිණි : මෙ කරුණිනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යා චරණ සමපන්නයහ, සුගත්හ, ලොකවිද්හ, අනුත්තරපුරුෂදම්‍යසාරථියහ, දෙව්මිනිසුනට ශාස්තෲයහ, බුද්ධයහ, භගවත්හ''යි. ඔබ මා විසින් සෙට බතට බික්සඟුන් හා සමග නිමන්ත්‍රණ කරනලදහ''යි. භවත් කේණියෙනි, 'බුදුහ'යි කියෙහි, භවත් සේලයෙනි, 'බුදුහ'යි කියමි. භවත් කේණියෙනි, 'බුදුහ'යි කියෙහි, භවත් සේලයෙනි, 'බුදුහ'යි කියමි. භවත් කේණියෙනි, 'බුදුහ'යි කියෙහි ,භවත් සේලයෙනි 'බුදුහ'යි කියමි''යි.

එසඳ සෙල බ්‍රාහ්මණයාහට තෙල සිත් වි: ''බුදුහු'' යන තෙල ඝෝෂය පවා ලෝකයෙහි දුර්ලභ ය. අපගේ වේදයෙහි දෙතිස් මහාපුරුෂලක්ෂණයෝ ආවාහු ය. එ ලකුණෙන් සමන්වාගත මහපුරිස්හට ගතිහු දෙදෙනෙක් මැ වෙති. අන් ගතියෙක් නො වෙයි. ඉදින් ගිහිගෙයි වෙසේ නම් දැහැමි වූ ධම්රාජන් වූ සියුසයුරු හිම කොට ඇති පෘථිවියට ඊශ්වර වූ පසමිතුරන් දිනූ දනාවූ තහවුරු සේ ලත් සත්රුවනින් සමන්වාගත වූ සක්විති රජ වෙයි. ඔහුට මේ සප්තරත්නයෝ පහළ වෙති : ඒ කෙසේ යැ යත් : ''චක්‍රරත්න යැ හස්තිරත්න යැ

මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවට්ටච්ඡදො[1] කහං පන භො කෙණිය එතරහි සො භවං ගොතමො විහරති අරහං සම්මාසම්බුද්ධො'ති. එවං වුත්තෙ කෙණියො ජටිලො දක්ඛිණං බාහුං පග්ගහෙත්වා සෙලං බ්‍රාහ්මණං එතදවොච: යෙනෙසා භො සෙල නීලවනරාජී'ති. අථ ඛො සෙලො බ්‍රාහ්මණො තීහි මාණවකසතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. අථ ඛො සෙලො බ්‍රාහ්මණො තෙ මාණවකෙ ආමන්තෙසි: අප්පසද්දා භොන්තො ආගච්ඡන්තු පාදෙ පාදං[2] නික්ඛිපන්තා, දුරාසදා හි තෙ භගවන්තො සීහාව එකචරා, යදා චාහං භො සමණෙන ගොතමෙන සද්ධිං මන්තෙය්‍යං, මා මෙ භොන්තො අන්තරන්තරා කථං ඕපාතෙථ, කථාපරියොසානං මෙ භවන්තො ආගමෙන්තූ'ති.

අථ ඛො සෙලො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සෙලො බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි සම්මන්නෙසි[3] අද්දසා ඛො සෙලො බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ, ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය ච'ති. අථ ඛො භගවතො එතදහොසි: පස්සති ඛො මෙ අයං සෙලො බ්‍රාහ්මණො ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ, ද්වීසු මහාපුරිසලක්ඛණෙසු [කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චාති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි යථා අද්දස සෙලො බ්‍රාහ්මණො භගවතො කොසොහිතං වත්ථගුය්හං. අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පරිමසි[4]. උභොපි නාසිකාසොතානි[5] අනුමසි පරිමසි. කෙවලම්පි[6] ලලාටමණ්ඩලං[7] ජිව්හාය ඡාදෙසි.

අථ ඛො සෙලස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහි, නො ච ඛො නං ජානාමි බුද්ධො වා නො වා. සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං. යෙ තෙ භවන්ති අරහන්තො සම්මාසම්බුද්ධා, තෙ සකෙ වණ්ණෙ භඤ්ඤමානෙ අත්තානං පාතුකරොන්ති. යන්නූනාහං සමණං ගොතමං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවෙය්‍ය'න්ති අථ ඛො සෙලො බ්‍රාහ්මණො භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි.

---

1. විවත්තච්ඡදො - සිමු / විවටච්ඡදො - ස්‍යා.
2. පදෙ පදං - මජසං, ස්‍යා.
3. සමන්නෙසි - මජසං.
4. පටිමසි - මජසං.
5. නාසිකසොතානි - මජසං, ස්‍යා.
6. කෙවලකප්පං - ස්‍යා.
7. නලාටමණ්ඩලං - මජසං, ස්‍යා.

අශ්වරත්න යැ මණිරත්න යැ ස්ත්‍රීරත්න යැ ගෘහපතිරත්න යැ සත් වනු වූ පරිනායකරත්න යි. ඔහුට ශූර වූ වීර්‍ය්‍යමය ශරීර බඳු වූ පරසෙන් මඩනා පුත්‍රයෝ දහසින් වඩා ඇත. හේ සයුරු හිම් කොට ඇති මෙ පොළොව දණ්ඩ රහිත වැ ශස්ත්‍ර රහිත වැ දැහැමින් දිනා වෙසෙයි යළි ඉදින් සසුන් වදී නම් ලෝකයෙහි පෙරළ (තෘෂ්ණා) සියත් ඇති අර්හත් සම්‍යක්සම්බුද්ධ වෙයි. භවත් කේණියෙනි, දන් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භවත් ගොයුමාණෝ කොහි වෙසෙත්ද ?''යි. මෙසේ කී කල්හි කේණිය ජටිල දකුණත් පැලා සේල බ්‍රාහ්මණයාහට තෙල කී : ''භවත් සේලයෙනි, තෙල නිල්වනරොදෙහි යැ''යි. එසද සේල බ්‍රාහ්මණ තුන්සියක්මණෙවුවන් හා සමඟ භාග්‍යවතුන් කරා එළැඹියේ. ඉක්බිති සේල බ්‍රාහ්මණ ඒ මණෙවුවන් ඇමැතී : ''භවත්නි, පියවර පමණෙහි පිය තබමින් නිහඬ වැ එත්වා, ඒ භගවත්හු දුරාසද වෙති. ඒකචරසිංහයන් වැන්නහ. භවත්නි යම් කලෙක මම භවත් මහණගොයුම් ගොතුවන් හා සමඟ මන්ත්‍රණ කරනෙම් ද, එකල්හි භවත්හු මට අතුරතුරෙහි කථා නහමක් බහාලව. භවත්හු මාගේ කථා පර්‍ය්‍යවසානය බලත්ව''යි.

ඉක්බිති සේල බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටුවී. සතුටුවියයුතු කලතුරුහි සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සේලබ්‍රාහ්මණ භාග්‍යවතුන්ගේ කයෙහි දෙතිස් මහපුරිස්ලකුණු පිරික්සී. සේලබ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි දෙතිස් මහපුරිස්ලකුණු දෙකක් තබා බෙහෙවින් දිට. දෙමහපුරිස් ලකුණෙකැ කාඞ්ක්‍ෂා කෙරෙයි, සොයමින් වෙහෙසෙයි, සනිටුහනට නො යෙයි, (විමති හෙයින්) නො පහදියි. කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යයෙහි යැ ප්‍රභූත ජිහ්වතායෙහි යි. එසද භාග්‍යවතුන් වහන්සේට තෙල සිත් වි : ''මේ සේල බ්‍රාහ්මණ මා ගේ දෙතිස් මහපුරිස්ලකුණු දෙකක් තබා බෙහෙවින් දක්නේ යැ, මහපුරිස්ලකුණු දෙකෙකැ සැක කෙරෙයි, විචිකිච්ඡා කෙරෙයි, අධිමුක්ති නො කෙරෙයි, සම්ප්‍රසාද නො කෙරෙයි. කෝෂාවහිතවස්ත්‍රගුහ්‍යයෙහි යැ ප්‍රභූතජිහ්වතායෙහි යි. එසද බුදුහු යම්සේ සෙලබ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේගේ කෝෂාවහිත වස්ත්‍රගුහ්‍යය දිටි ද එවන් ඉද්ධයක් කළහ. ඉක්බිති බුදුහු දිව නෙර දෙකන්සිදුරු අනුමාජ්ජන පරිමාජ්ජන කළ සේක. දෙනැහැසිදුරු ද අනුමාජ්ජන පරිමාජ්ජන කළ සේක. හැම නළල්මඩල ද දිවින් වැසූ සේක.

එසද සේල බ්‍රාහ්මණයාහට තෙල සිත් වි : ශ්‍රමණ ගෞතමයෝ අපරිපූර්ණ නො වූ පරිපූර්ණ වූ ද්වාත්‍රිංශද්මහාපුරුෂලක්ෂණයෙන් සමන්වාගතයහ. ඔබ 'බුදුහ'යි හෝ 'නොබුදුහ'යි හෝ නො ද දනිමි, මා විසින් වැඩිහිටි මහලු ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍ය බමුණන් කියනුවන්ගේ තෙල බස් අසනලද : ''යම කෙනෙක් අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙත් ද, ඔහු සිය ගුණකථා කියන කල්හි තමා පහළ කෙරෙති, මම මහණගොයුම්ගොතුවන් හමුයෙහි සාරූප්‍යගාථා යෙන් ස්තුති කරන්නෙම් නම් මනා මැ නු!''යි. ඉක්බිති සේල බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සාරූප්‍ය ගාථායෙන් ස්තුති කෙළේ :

පරිපුණ්ණකායො සුරුචි සුජාතො චාරුදස්සනො,
සුවණ්ණවණ්ණොසි භගවා සුසුක්කදාඨොසි විරියවා.[1]

නරස්ස හි සුජාතස්ස යෙ භවන්ති වියඤ්ජනා[2]
සබ්බෙ තෙ තව කායස්මිං මහාපුරිසලක්ඛණා.

පසන්නනෙත්තො සුමුඛො බ්‍රහා[3] උජු පතාපවා,
මජ්ඣෙ සමණසඞ්ඝස්ස ආදිච්චොව විරොචසි.

කල්‍යාණදස්සනො භික්ඛු කඤ්චනසන්නිභත්තචො,
කිං තෙ සමණභාවෙන එවං උත්තමවණ්ණිනො

රාජා අරහසි භවිතුං චක්කවත්ති රථෙසභො,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[4] ඉස්සරො

ඛත්තියා භොගි රාජානො[5] අනුයුත්තා[6] භවන්තු තෙ,
රාජාභිරාජා මනුජින්දො රජ්ජං කාරෙහි ගොතම.

රාජාහමස්මි සෙලා'ති ධම්මරාජා අනුත්තරො,
ධම්මෙන චක්කං වත්තෙමි චක්කං අප්පතිවත්තියං[7]

සම්බුද්ධො පටිජානාසි ධම්මරාජා අනුත්තරො.
ධම්මෙන චක්කං වත්තෙමි ඉති භාසසි ගොතම.

කො නු සෙනාපති භොතො සාවකො සත්ථුරන්වයො[8],
කො තෙ ඉමං අනුවත්තෙති[9] ධම්මචක්කං පවත්තිතං

මයා පවත්තිතං චක්කං (සෙලාති භගවා) ධම්මචක්කං අනුත්තරං,
සාරිපුත්තො අනුවත්තෙති අනුජාතො තථාගතං.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීනං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ.

විනයස්සු මයි කඞ්ඛං අධිමුච්චස්සු බ්‍රාහ්මණ,
දුල්ලභං දස්සනං හොති සම්බුද්ධානං අභිණ්හසො.

යෙසං වෙ දුල්ලභො ලොකෙ පාතුභාවො අභිණ්හසො,
සොහං බ්‍රාහ්මණ සම්බුද්ධො සල්ලකත්තො අනුත්තරො.

බ්‍රහ්මභූතො අතිතුලො මාරසෙනප්පමද්දනො,
සබ්බාමිත්තෙ[10] වසී කත්වා මොදාමි අකුතොභයො.

ඉමං භොන්තො නිසාමෙථ යථා භාසති චක්ඛුමා,
සල්ලකත්තො මහාවීරො සීහොව නදතී වනෙ.

---

1. { විරියවා - මජසං.
   { සුසුක්කදාඨො සවිරියවො - ස්‍යා.
2. ව්‍යඤ්ජනා - සිමු, වියඤ්ජනා - ස්‍යා.
3. බ්‍රහ්මා - ස්‍යා.
4. ජම්බුමණ්ඩස්ස - සිමු.
5. භොජරාජානො - සිමු.
6. අනුයන්තා - මජසං.
7. අප්පටිවත්තියං - මජසං, ස්‍යා
8. සත්ථුදන්වයො - ස්‍යා.
9. තමනුවත්තෙති - මජසං.
10. සබ්බෙ මිත්තෙ - සිමු.

"භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ (ලක්ෂණ විසින්) පිරිපුන් සිරුරු ඇතියෙහි. මනා සිරුරුපැහැ ඇතියෙහි. සුජාතයහ, මනහර දර්ශන ඇතියෙහි, ස්වර්ණයට බඳු පැහැ ඇතියෙහි, සුසුදු දත් ඇතියෙහි. වීර්‍ය්‍ය ඇතියෙහි.

සුජාත පුරුෂයක්හට යම් ලක්ෂණ කෙනෙක් වෙත් ද, මුඹ වහන්සේගේ සිරුරෙහි එ හැම මහපුරිස් ලකුණු ඇත.

පස්පැදිස්නා නුවන් ඇතියෙහි, සුන්දර වූ මුව ඇතියෙහි, (ආරොහපරිණාහ සම්පත්තියෙන්) මහත්හ. ඍජුගාත්‍ර ඇතියෙහි, ප්‍රතාප ඇතියෙහි, මහණගණ මැද හිරුමඬල සෙයින් බබළන්නාහු.

කසුන් වන් සිවි ඇති කලණ දසුන් ඇති මහණ කෙනෙක්හ. මෙ වන් උතුම් වර්ණ ඇති මුඹ වහන්සේට ශ්‍රමණ භාවයෙන් කවර අර්ථයෙක් ද?

උත්තමරථ ඇති සියුසයුරු හිම් කොට ඇති පොළොවට අධිපති වූ දිනූ පසමිතුරන් ඇති දඹදිවට ඊශ්වර වූ සක්විති රජ වන්නට නිසියාව.

(ජාතියෙන්) ක්ෂත්‍රියයෝ ද භෝගීහු ද රජදරුවෝ ද මුඹ වහන්සේට අනුයුක්ත වෙත්වා. ගොයුම්ගොතුව, රාජාධිරාජ වැ මිනිසුනට පරමෙශ්වර වැ රාජ්‍ය කරව.

සේලයෙනි, මම රජ වෙමි. අනුත්තර ධර්මරාජයෙමි. යම් අණසකක් අනෙකක්හු විසින් ප්‍රවර්තන නො කළ හෙයි ද, එ අණසක දැහැමින් පවත්වමි.

ගොයුම් ගොතුව, අනුත්තර ධර්මරාජන් වූ 'සම්බුද්ධයෙමි'යි පිළිත කරව. 'දැහැමින් අණසක් පවත්වමි'යි කියව.

භවත්හුගේ සෙන්පති කවරෙ යැ? ශාස්තෘහුගේ ධර්මාන්වය ඇති කවර ශ්‍රාවකයෙක් මුඹ වහන්සේ විසින් පවත්වනලද මෙ දම්සක් අනුවර්තන කෙරේ ද?

('සෙලයිනි'යි බුදුහු වදළහ :) මා විසින් පවත්වන ලද අනුත්තර ධර්මචක්‍රය වූ අණසක තථාගතයනට අනුජාත වූ සැරියුත් අනුවර්තන කෙරෙයි.

මා විසින් අභිඥෙය (දතයුතු විද්‍යාවිමුක්ති)ය අභිඥත (දන්නාලද) යැ. භාවිතව්‍ය (මාර්ගසත්‍ය)ය භාවිත යැ. ප්‍රහාතව්‍ය (සමුදයසත්‍ය)ය ප්‍රහීණ යැ. බමුණ, එහෙයින් මම බුද්ධයෙමි.

බමුණ, මා කෙරෙහි සැකය දුරු කරව, සනිටුහනට යව. සම්බුදුන්ගේ එක්වන් දක්ම දුලබ වෙයි.

බමුණ, ලොවැ යම් කෙනකුන් ගේ එක්වන් පහළ වීම ඒකාන්තයෙන් දුර්ලභ වේ ද, මම ඒ අනුත්තර ශල්‍යවෛද්‍ය (රාගාදි හුල් හරනා) වූ සම්බුද්ධයෙමි.

ශ්‍රෙෂ්ඨ වූයෙමි නිරුපම වූයෙමි (කාමාදි මරසෙන් මඩනෙම්) සියලු පසමිතුරන් (පස් මරුන්) වශයෙහි පවත්වා කොයිතුදු බිය නැත්තෙම් සතුටු වෙමි.

භවත්නි, පසැස් ඇති බුදුහු යම්සේ වදරත් ද, තෙපි මෙය අසව. ශල්‍යවෛද්‍ය මහාවීරයෝ වනයෙහි සිංහයකු සෙයින් නාද කෙරෙති.

බ්‍රහ්මභූතං අතිතුලං මාරසෙනප්පමද්දනං,
කො දිස්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභිජාතිකො.

යො මං ඉච්ඡති අන්වෙතු යො වා නිච්ඡති ගච්ඡතු,
ඉධාහං පබ්බජිස්සාමි වරපඤ්ඤස්ස සන්තිකෙ.

එතඤ්චෙ[1] රුච්චති භොතො සම්මාසම්බුද්ධසාසනං[2]
මයම්පි පබ්බජිස්සාම වරපඤ්ඤස්ස සන්තිකෙ.

බ්‍රාහ්මණා තිසතා ඉමෙ යාචන්ති පඤ්ජලීකතා,
බ්‍රහ්මචරියං චරිස්සාම භගවා තව සන්තිකෙ.

ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං (සෙලාති භගවා) සන්දිට්ඨිකමකාලිකං,
යත්ථ අමොඝා පබ්බජ්ජා අප්පමත්තස්ස සික්ඛතො'ති.

අලත්ථ ඛො සෙලො බ්‍රාහ්මණො සපරිසො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අථ ඛො කෙණියො ජටිලො තස්සා රත්තියා අච්චයෙන සකෙ අස්සමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: 'කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත'න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන කෙණියස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො කෙණියො ජටිලො බුද්ධපමුඛං[3] භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො කෙණියො ජටිලො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ඉමාහි ගාථාහි අනුමොදි.

'අග්ගිහුත්තමුඛා යඤ්ඤා සාවිත්ති ඡන්දසො මුඛං,
රාජා මුඛං මනුස්සානං නදීනං සාගරො මුඛං.

නක්ඛත්තානං මුඛං චන්දො ආදිච්චො තපතං මුඛං,
පුඤ්ඤං ආකඞ්ඛමානානං සඞ්ඝො වෙ යජතං මුඛ'න්ති.

අථ ඛො භගවා කෙණියං ජටිලං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා සෙලො සපරිසො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා සෙලො සපරිසො අරහතං අහොසි.

---

1. එවඤ්චෙ - මජ්ඣසං, ස්‍යා. 2. සාසනෙ - මජ්ඣසං.
3. බුද්ධප්පමුඛං - මජ්ඣසං.

ශ්‍රෙෂ්ඨ වූ නිරුපම වූ මරසෙන් මඩනා බුදුන් දැක කවර නම් කෘෂ්ණාභිජාති (නීචකුල උපත්) ඇත්තෙක් පවා නො පහදනේ ද?

යමෙක් රුස්නේ ද හේ මා අනුව ඒවා. යමෙක් නුරුස්නේ හෝ වේ ද හේ යේවා. මම මෙ සස්නෙහි උත්තමප්‍රාඥ බුදුන් වෙත පැවිදි වන්නෙමි.

ඉදින් භවත්හට තෙල සම්බුදු සස්න රුස්නේ නම් උත්තමප්‍රාඥ බුදුන් වෙත අපිදු පැවිදි වම්හ.

මේ තුන්සියක් බමුණෝ මුදුනෙහි ඇඳිලි බැඳ 'භාග්‍යවතුන් වහන්ස, නුඹ වහන්සේ වෙත බඹසර සරම්හ'යි අයදිති.

('සේලයෙනි'යි බුදුහු වදාළහ :)"යම් බඹසර වසෙක්හි අප්‍රමත්ත වැ හික්මෙනුවහට පැවිද්ද නො සිස් වේ ද, ඒ බඹසර මොනොවට පවසන ලද. තමා විසින් (පසක් කොට) දක්කයුතු යැ. කල් නො යවා පල දෙන්නේ යැ"යි.

සේලබ්‍රාහ්මණ පිරිස් සහිත වැ බුදුන් කෙරෙහි පැවිදි ලද. උපසපුව ලත්. ඉක්බිති කේණිය ජටිල එ රය ඇවෑමෙන් සිය අසපුයෙහි ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයන් පිළියෙල කරවා 'භවත් ගොයුම්ගොතුව, වඩනට කලි, බත නිමියේ යැ'යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වී. එ සඳ බුදුහු පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන කේණිය ජටිලයාගේ අසපුව කරා එළැඹියහ. එළැඹ පැනවූ අස්නෙහි බික්සඟුන් හා සමග වැඩ හුන්හ. ඉක්බිති කේණිය ජටිල බුදුපාමොක් මහසඟහ ප්‍රණීත ඛාද්‍යයෙන් භෝජ්‍යයෙන් සියතින් සැතැප්වී මොනොවට පැවැරී. ඉක්බිති කේණිය ජටිල වළඳා නිමවූ, පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති, භාග්‍යවතුන් දැක එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් කේණිය ජටිලයාහට බුදුහු මේ ගාථායෙන් අනුමෝදනා කළහ :

"යාගයෝ අග්නිහෝම ශ්‍රෙෂ්ඨ කොට ඇතියහ, වේදයට සාවිත්‍රී (පළමු හදළ යුතු සූත්‍රය) ශ්‍රේෂ්ඨ වෙයි, රජ මිනිසුනට ශ්‍රේෂ්ඨ වෙයි, සාගරය නදීනට ශ්‍රේෂ්ඨ වෙයි.

චන්ද්‍රයා නක්‍ෂත්‍රයනට ශ්‍රේෂ්ඨ වෙයි, සූර්‍ය්‍යයා දිලියෙනවුනට ශ්‍රේෂ්ඨ වෙයි, පින් කැමැති යාග කරනුවනට ඒකාන්තයෙන් සඞසයා ශ්‍රෙෂ්ඨ වේ"යයි.

එසඳ භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයාහට මේ ගාථායෙන් අනුමෙවුනි කොට හුනස්නෙන් නැඟී වැඩියෝ. ඉක්බිති ආයුෂ්මත් සේලතෙරණුවෝ පිරිස් සහිත වැ එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වසන්නාහු, යම් අර්හත්ත්වයක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ගෙන් නික්ම සස්නට නොබෝ කලෙකින් මැ වදිත් ද, බ්‍රහ්මචර්‍ය්‍යය පර්‍ය්‍යවසාන කොට ඇති ඒ අනුත්තර අර්හත්ඵලය දුටුදැම්යෙහි මැ තමන් විසින් විශිෂ්ටඥනයෙන් දැන පසක් කොට උපයාගෙන විසූහු. ජාතිය ක්‍ෂීණ විය. බඹසර වැස නිමවිණ. කරණී කරනලද මේ අර්හත්ත්වය සඳහා කළමනා අන් දෙයක් නැති'යි වෙසෙසින් දත්හ. පිරිස් සහිත ආයුෂ්මත් සේල තෙරණුවෝ රහතුන් කෙරෙහි අන්‍යතර ද වූහ.

අථ ඛො ආයස්මා සෙලො සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකංසං චිවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

යන්තං සරණමාගම්ම ඉතො අට්ඨමි චක්ඛුමා[1],
සත්තරත්තෙන[2] භගවා දන්තම්හා[3] තව සාසනෙ.

තුවං බුද්ධො තුවං සත්ථා තුවං මාරාභිභූ මුනි,
තුවං අනුසයෙ ඡෙත්වා තිණ්ණො තාරෙසිමං පජං.

උපධි තෙ සමතික්කන්තා ආසවා තෙ පදාලිතා,
සීහොව අනුපාදානො පහීනභයභෙරවො.

භික්ඛවො තිසතා ඉමෙ තිට්ඨන්ති පඤ්ජලීකතා,
පාදෙ වීර පසාරෙහි නාගා වන්දන්තු සත්ථුනො'ති.

සෙලසුත්තං දුතියං.

---

1. චක්ඛුම - ස්‍යා.
2. අනුත්තරෙන - මජසං.
3. දන්තම්හ - සිමු, මජසං.

ඉක්බිති ආයුෂ්මත් සේල තෙරණුවෝ පිරිස් සහිත වැ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ සිවුරු එකස් කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳැ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීහ :

පසැස් ඇත්තව, මෙයින් අට වැනි දින යම් ඒ සරණක් ලදුමෝ ද, භාග්‍යවතුන් වහන්ස, සත් දිනෙකින් තොප සස්නෙහි (පැවිදි වැ) දාන්ත වූම්හ.

මුනීන්ද්‍රයාණෙනි, තොප වහන්සේ බුද්ධයහ, තොප වහන්සේ ශාස්තෘයහ, තොප වහන්සේ මරුන් මැඩ සිටියහ. තොප වහන්සේ අනුශයන් සිඳ උත්තීර්ණ වූ සේක් මේ ප්‍රජාව තරණය කරවන්නාව.

තොප විසින් උපධීහු සමතික්‍රාන්තයහ. තොප විසින් ආස්‍රවයෝ බිඳුණාලදහ. සිංහයකු සෙයින් උපාදාන රහිත වැ සිට පැහූ භය භෛරව ඇත්තාහ.

තුන්සියක් මේ මහණහු කළ බඳදිලි ඇති වැ සිටුනාහ. වීරයාණෙනි, දෙපා දිගු කළ මැනැව. ශ්‍රමණ නාගයෝ ශාස්තෘන් වහන්සේට වඳිත්වා.

දෙ වැනි සේලසූත්‍ර යි.

40—ඓක් 13561 (72/11)

Free Distribution www.aathaapi.org

2. 5. 3

අස්සලායනසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන නානාවෙරජ්ජකානං බ්‍රාහ්මණානං පඤ්චමත්තානි බ්‍රාහ්මණසතානි සාවත්ථියං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො තෙසං බ්‍රාහ්මණානං එතදහොසි: ‘අයං ඛො සමණො ගොතමො චාතුවණ්ණිං සුද්ධිං පඤ්ඤපෙති[1] කො නු ඛො පහොති සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතු’න්ති.

තෙන ඛො පන සමයෙන අස්සලායනො නාම මාණවො සාවත්ථියං පටිවසති දහරො වුත්තසිරො සොළසවස්සුද්දෙසිකො ජාතියා, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අථ ඛො තෙසං බ්‍රාහ්මණානං එතදහොසි: ‘අයං ඛො අස්සලායනො මාණවො සාවත්ථියං පටිවසති දහරො වුත්තසිරො සොළසවස්සුද්දෙසිකො ජාතියා, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. සො ඛො පහොති සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතු’න්ති.

අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන අස්සලායනො මාණවො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා අස්සලායනං මාණවං එතදවොචුං: ‘අයං භො අස්සලායන, සමණො ගොතමො චාතුවණ්ණිං සුද්ධිං පඤ්ඤපෙති[1] එතු භවං අස්සලායනො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතු’ති. එවං වුත්තෙ අස්සලායනො මාණවො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: ‘සමණො ඛලු භො ගොතමො ධම්මවාදී, ධම්මවාදිනො ච පන දුප්පතිමන්තියා භවන්ති. නාහං සක්කොමි සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතු’න්ති. දුතියම්පි ඛො තෙ බ්‍රාහ්මණා අස්සලායනං මාණවං එතදවොචුං: ‘අයං භො අස්සලායන, සමණො ගොතමො චාතුවණ්ණිං සුද්ධිං පඤ්ඤපෙති. එතු භවං අස්සලායනො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතුං. චරිතං ඛො පන භොතා අස්සලායනෙන පරිබ්බාජක’න්ති. දුතියම්පි ඛො අස්සලායනො මාණවො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: ‘සමණො ඛලු භො ගොතමො ධම්මවාදී, ධම්මවාදිනො ච පන දුප්පතිමන්තියා භවන්ති. නාහං සක්කොමි සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතු’න්ති. තතියම්පි ඛො තෙ බ්‍රාහ්මණා අස්සලායනං මාණවං එතදවොචුං: ‘අයං භො අස්සලායන සමණො ගොතමො චාතුවණ්ණිං සුද්ධිං පඤ්ඤපෙති. එතු භවං අස්සලායනො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතුං. චරිතං ඛො පන භොතා අස්සලායනෙන පරිබ්බාජකං, මා භවං අස්සලායනො අයුද්ධපරාජිතං පරාජයී’ති.

1. පඤ්ඤපෙති – මජසං.

Free Distribution www.aathaapi.org

2. 5. 3

අස්සලායන සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඩු සිටුහුගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක. එසමයෙහි (අඞ්ගමගධාදි) නානාප්‍රකාර වෙන් වෙන් රජයෙන් පැමිණි බමුණුදනන් පිළිබඳ පන්සියක් පමණ බමුණෝ සැවැත්නුවර වෙසෙත්. (යඥෙපාසනාදි) කිසියම් කරණී හෙයිනි. එසඳ ඒ බමුණනට මෙතල සිත් වී : ''මේ මහණ ගොයුම්හු චතුර්වර්ණ සාධාරණ ශුද්ධි විධියක් පනවති. මේ වචනයෙහි ලා මහණ ගොයුමන් හා සමග ප්‍රතිමන්ත්‍රණය පිණිස කවරෙක් සමත් වේ ද හෝ යි.

එසමයෙහි අස්සලායන නම් මණෙවු සැවැත්හි වෙසෙයි, දහර යැ, අපහෘතකේශ ඇතියෙ යැ, උපතින් සොළොස් හැවිරිද්ද, නිඝණ්ඩු කේටුභ සහිත වූ අක්ෂරප්‍රභේද සහිත වූ ඉතිහාසය පස් වනු කොට වැටෙන ත්‍රිවේදයන් ගේ පාරයට ගියේ යැ, පද හදරනු වෙයි, ව්‍යාකරණ හදරනු වෙයි, ලෞකිකායතික මහාපුරුෂලක්ෂණයෙහි පරිපූරකාරි වෙයි. එ සඳ ඒ බමුණනට මෙතල සිත් වී : ''මේ අස්සලායන මාණවක සැවැත්හි වෙසෙයි, තරුණ යැ, කේසාපහරණ කෙළේ යැ, උපතින් සොළොස් හැවිරිදි යැ, නිඝණ්ඩු කෙටුභශාස්ත්‍ර සහිත ශික්ෂා සහිත ඉතිහාසය පස්වනු කොට වැටෙන ත්‍රිවේදයන්ගේ පරතෙර දුටුයේ යැ, පද හදරනු වෙයි, ව්‍යාකරණ හදරනු වෙයි, ලෞකික මහා පුරුෂලක්ෂණයෙහි පරිපූරකාරි වෙයි. හේ වනාහි මහණ ගොයුමන් හා සමග මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණ කරන්නට පොහොනේ වෙයි.

ඉක්බිති ඒ බමුණු අස්සලායන මණෙවු කරා එළඹියහ. එළැඹ අස්සලායන මණෙවුහට මෙතල කීහු : ''භවත් අස්සලායනයෙනි, මේ මහණ ගොයුම්හු චතුර්වර්ණ සාධාරණ ශුද්ධි විධියක් පනවති. එව, භවත් අස්සලායනයෝ මහණගොයුමන් හා සමග මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණ කෙරෙත්වා''යි. මෙසේ කී කල අස්සලායන මාණවක ඒ බමුණුහට මෙතල කී : ''භවත්නි, ශ්‍රමණ ගෞතමයෝ ධර්මවාදී වෙති. ධර්මවාදීහු නම් දුකසේ ප්‍රතිමන්ත්‍රණ කළයුත්තාහ. මම වනාහි ශ්‍රමණ ගෞතමයන් හා සමග මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණය කරන්නට නො හැක්කෙමි. දෙවනවට ද ඒ බමුණෝ අස්සලායන මාණවකහට මෙතල කීහු : ''භවත් අස්සලායනයෙනි, මේ මහණ ගොයුම්හු චතුර්වර්ණසාධාරණ ශුද්ධිවිධියක් පනවති. භවත් අස්සලායනයෝ මහණ ගොයුමන් හා සමග ප්‍රතිමන්ත්‍රණය කරන්නට එත්වා, භවත් අස්සලායනයන් විසින් ප්‍රව්‍රජ්‍යාවිධාන ශික්ෂිත වෙයි. දෙවනවට ද අස්ස-ලායන මාණවක ඒ බමුණනට මෙතල කී : ''භවත්නි, ශ්‍රමණ ගෞතමයෝ ධර්මවාදීහ, ධර්මවාදීහු වනාහි දුකසේ ප්‍රතිමන්ත්‍රණ කළයුත්තාහ. මම වනාහි ශ්‍රමණ ගෞතමයන් හා මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණය කරන්නට නො හැක්කෙමි. තුන් වන වට ද ඒ බමුණෝ අස්සලායන මාණවකහට මෙතල කීහු : ''භවත් අස්සලායනයෙනි, මේ මහණ ගොයුම්හු චතුර්වර්ණසාධාරණ ශුද්ධියක් පනවති. භවත් අස්සලායනයෝ මහණ ගොයුමන් හා සමග මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණය කරන්නට එත්වා. භවත් අස්සලායනයන් විසින් ප්‍රව්‍රජ්‍යාවිධාන ශික්ෂිත වෙයි. භවත් අස්සලායනයෝ යුද නො කොට පැරදුමක් නහමක් කෙරෙත්වා.

එවං වුත්තෙ අස්සලායනො මාණවො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: 'අද්ධා ඛො අහං භවන්තො[1] න ලභාමි. සමණො ඛලු භො ගොතමො ධම්මවාදී, ධම්මවාදිනො ච පන දුප්පටිමන්තියා භවන්ති. නාහං සක්කොමි සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතුං. අපි චාහං භවන්තානං[2] වචනෙන ගමිස්සාමී'ති.

අථ ඛො අස්සලායනො මාණවො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අස්සලායනො මාණවො භගවන්තං එතදවොච: 'බ්‍රාහ්මණා භො ගොතම, එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො. හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො, බ්‍රාහ්මණාව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා, බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදා'ති. ඉධ භවං ගොතමො කිමාහා'ති?

දිස්සන්තෙ[3] ඛො පන අස්සලායන, බ්‍රාහ්මණානං බ්‍රාහ්මණියො උතුනියොපි ගබ්භිනියොපි විජායමානාපි පායමානාපි තෙ ච බ්‍රාහ්මණා, යොනිජාව සමානා, එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා, බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදා'ති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ. අථ ඛො බ්‍රාහ්මණා එවමෙතං මඤ්ඤන්ති. 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි අස්සලායන, සුතං තෙ: 'යොනකම්බොජෙසු[4] අඤ්ඤෙසු ච පච්චන්තිමෙසු ජනපදෙසු ද්වෙව වණ්ණා, අය්‍යො චෙව දාසො ච. අය්‍යො හුත්වා දාසො හොති, දාසො හුත්වා අය්‍යො හොතී'ති.

එවං භො සුතං මෙ යොනකම්බොජෙසු අඤ්ඤෙසු ච පච්චන්තිමෙසු ජනපදෙසු ද්වෙව වණ්ණා අය්‍යො චෙව දාසො ච. අය්‍යො හුත්වා දාසො හොති, දාසො හුත්වා අය්‍යො හොතී'ති. එත්ථ අස්සලායන බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදා'ති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ. අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එවමෙතං මඤ්ඤන්ති: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඛත්තියොව නු ඛො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨී, කායස්ස භෙදා පරම්මරණා, අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නො බ්‍රාහ්මණො. වෙස්සොව නු ඛො -පෙ- සුද්දොව නු ඛො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨී, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නො බ්‍රාහ්මණො'ති.

---

1. භන්තෙ - ස්‍යා. භවන්තෙ - PTS. 2. භවතං - ස්‍යා.
3. දිස්සන්ති - මජසං. 4. යොනකකම්බොජෙසු - ස්‍යා.

මෙසේ කී කල්හි අස්සලායන මාණවක ඒ බමුණනට තෙල කී: "ඒකාන්තයෙන් මම භවතුන් නො ලබමි. භවත්නි, මහණ ගොයුම්හු ධර්මවාදීහ, ධර්මවාදීහු වනාහි දුකසේ ප්‍රතිමන්ත්‍රණ කළයුත්තාහ. මම ශ්‍රමණ ගෞතමයන් හා සමග මේ වචනයෙහි ලා ප්‍රතිමන්ත්‍රණය කරන්නට නො හැක්කෙමි. වැළිදු මම භවතුන් ගේ වචනයෙන් එමි.

ඉක්බිති අස්සලායන මාණවක මහත් බ්‍රාහ්මණ ගණයා හා සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී. සතුටු වියයුතු කලක් සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් අස්සලායන මාණවක භාග්‍යවතුන් වහන්සේට තෙල කී: "භවත් ගොයුම් ගොතුව බ්‍රාහ්මණයෝ මෙසේ කියත්: බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවර්ණ යි. අන්‍යවර්ණ හීන යි. බ්‍රාහ්මණයෝ මැ ශුක්ලවර්ණ යි. අන්‍යවර්ණ කෘෂ්ණ යි. බ්‍රාහ්මණයෝ මැ පිරිසුදු වෙත් තදන්‍යයෝ පිරිසුදු නො වෙත්. බ්‍රාහ්මණයෝ මැ බ්‍රහ්මයාගේ පුත්‍රහ, ඖරසයහ, මුඛයෙන් ජාතයහ, එයින් මැ බ්‍රහ්මජයහ, බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ"යි. භවත් ගෞතමයන් වහන්සේ මෙහි ලා කුමක් වදරනසේක් ද?

අස්සලායනයෙනි, බමුණන්ගේ බැමිණියෝ ඍතුනී වූවාහු ද ගැබිනි වූවාහු ද වදන්නාහු ද කිරිපොවන්නාහු ද පැනෙත්, එ බමුණෝ ද යෝනියෙන් උපන්නාහු මැ මෙසේ කිහු: "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවර්ණ යි, අන්‍යවර්ණ හීන යි. බ්‍රාහ්මණයෝ මැ ශුක්ලවර්ණ යි, අන්‍යවර්ණ කෘෂ්ණ යි. බ්‍රාහ්මණයෝ මැ පිරිසුදු වෙත්. තදන්‍යයෝ පිරිසුදු නො වෙත්. බ්‍රාහ්මණයෝ මැ බ්‍රහ්මයාගේ පුත්‍රහ, ඖරසයහ, මුඛයෙන් ජාතයහ, එයින් මැ බ්‍රහ්මජයහ, බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ"යි.

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ වදරතුදු බ්‍රාහ්මණයෝ වැළිත් තෙල කරුණ මෙසේ හඟිති: "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවර්ණ යැ, අන්‍යවර්ණ හීන යි. . . . . . බ්‍රහ්මදායාදයහ"යි.

අස්සලායනයෙනි, ඒ කිමැ'යි හඟිහි? "යෝනකාම්බෝජ දනව්හි දු අන් පසල්දනව්හි දු වර්ණ (කුල) දෙකෙක් මැ යැ: ස්වාමි ද දස ද යන දෙක යි. ස්වාමි වැ දස වෙයි, දස වැ ස්වාමි වේ" යයි තොප විසින් අසනලද ද?

භවත්නි, මා විසින් මෙසේ අසන ලද: "යෝනකාම්බෝජ දනව්හි දු අන් පසල්දනව්හි දු ස්වාමි යැ, දස යැ යි වර්ණ දෙකෙක් මැ යැ. ස්වාමි වැ සිට දස වෙයි, දස වැ සිට ස්වාමි වේ"යයි. අස්සලායනයෙනි, යම් හෙයකින් මෙහි ලා බ්‍රාහ්මණයෝ මෙසේ කියත් ද: "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවර්ණ යැ, අන්‍යවර්ණ හීනවර්ණ යි. . . . . . බ්‍රහ්මදායාදයහ"යි, මෙ කරුණෙහි ලා බමුණනට කවර බලයෙක් ද? කවර ආශ්වාසයෙක් ද?

භවත් ගෞතමයෝ මෙසේ වදරතුදු බ්‍රාහ්මණයෝ වැළිත් තෙල කරුණ මෙසේ හඟිති: "බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවර්ණ යැ, අන්‍යවර්ණ හීන යි . . . බ්‍රහ්මදායාදයහ"යි.

අස්සලායනයෙනි, ඒ කිමැ'යි හඟිහි? ප්‍රාණවධ කරන, නුදුන් දය ගන්නා, කාමයෙහි මිසහසර ඇති, මුසා බණන පිසුණුබස් ඇති පරොස්බස් ඇති සිස්බස් බණන, අභිධ්‍යා බහුල, ව්‍යාපන්න සිත් ඇති ,මිසදිටු ඇති ක්‍ෂත්‍රිය මැ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයෙහි උපදනේ ද? බ්‍රාහ්මණ නුපදනේ ද? වෛශ්‍ය මැ . . . ප්‍රාණවධ කරන, අයිනාදන් කරන, කාමයෙහි මිසහසර ඇති, මුසා බණන, පිසුණුබස් ඇති, පරොස්බස් ඇති, සිස්බස් තෙපලන, අභිධ්‍යා බහුල, ව්‍යාපන්න සිත් ඇති, මිසදිටු ඇති ශුද්‍ර මැ කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරැහි උපදනේ ද? බමුණු නුපදනේ ද? යි.

නො හිදං භො ගොතම, ඛත්තියොපි හි භො ගොතම, පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨී, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, බ්‍රාහ්මණොපි හි භො ගොතම -පෙ- වෙස්සොපි හි භො ගොතම-පෙ-සුද්දොපි හි භො ගොතම -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පාණාතිපාතී[1] අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ බ්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යුං'න්ති.

එත්ථ අස්සලායන, බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො-පෙ-බ්‍රහ්මදායාදා'ති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ, අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එව මෙතං මඤ්ඤන්ති: බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි අස්සලායන, බ්‍රාහ්මණොව නු ඛො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා පටිවිරතො ඵරුසාවාචා පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨී කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය. නො ඛත්තියො, නො වෙස්සො, නො සුද්දො'ති.

නො හිදං භො ගොතම, ඛත්තියොපි හි භො ගොතම, පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා පටිවිරතො ඵරුසාවාචා පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලු අබ්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨී කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය. බ්‍රාහ්මණොපි හි භො ගොතම -පෙ- වෙස්සොපි හි භො ගොතම -පෙ- සුද්දොපි හි භො ගොතම -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා පිසුනාවාචා පටිවිරතා ඵරුසාවාචා පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතා අනභිජ්ඣාලූ අබ්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨී, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යුං'න්ති.

එත්ථ අස්සලායන, බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො-පෙ-බ්‍රහ්මදායාදා'ති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ, අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එවමෙවං මඤ්ඤන්ති: බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

---

1 පාණාතිපාතිනො - මජ්ඣං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

භවත් ගොයුම්මාණෙනි, මෙ කරුණ නො වේ මැ යි. භවත් ගෞතමයන් වහන්ස, ප්‍රාණවධ කරන අයිනාදන් කරන කාමයෙහි මිසහසර ඇති මුසා බණනා පිසුණු බස් ඇති පරොස්බස් ඇති සිස්බස් තෙපලන අභිධ්‍යා බහුල ව්‍යාපන්න සිත් ඇති මිසදුටු ඇති ක්‍ෂත්‍රිය තෙමේත් කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ගති ඇති, විවස වැ පතිත වන නිරැ වදනේ යැ. භවත් ගොයුම්ගොතුව, බ්‍රාහ්මණ තෙමේත් . . . භවත් ගෞතමයන් වහන්ස, වෛශ්‍ය තෙමේත් . . . භවත් ගෞතමයන් වහන්ස, ශුද්‍ර තෙමේත් . . . භවත් ගොයුම්මාණන් වහන්ස, ප්‍රාණවධ කරන අයිනාදන් කරන කාමයෙහි මිසහසර ඇති මුසා බණනා පිසුණුබස් ඇති පරොස්බස් ඇති සිස්බස් තෙපලන අභිධ්‍යා බහුල ව්‍යාපන්න සිත් ඇති මිසදිටුගත් හැම සතර වර්ණයෝ මැ කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට වදනාහ''යි.

අස්සලායනයෙනි, යම් හෙයෙකින් මෙ කරුණෙහි ලා ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ. . . . බ්‍රහ්මදායාදයහ''යි බමුණෝ මෙසේ කීහු නම් මෙහි ලා බ්‍රාහ්මණයන්ට කවර බලයෙක් ද, කවර ආශ්වාසයෙක් ද?

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කියතුදු මෙහි ලා 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ අන්‍යවර්ණයෝ හීන යි . . . බ්‍රහ්මදායාදයහ'යි බ්‍රාහ්මණයෝ හඟිති.

අස්සලායනයෙනි, ඒ කිමැ'යි හඟිති? ප්‍රාණවධයෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ කාමයෙහි මිසහසරින් වෙන් වූ මුසවායෙන් වෙන් වූ පිසුණුබසින් වෙන් වූ පරොස්බසින් වෙන් වූ හිස්බසින් වෙන් වූ අභිධ්‍යා බහුල නො වූ ව්‍යාපන්න සිත් නැති සම්දිටු ඇති බ්‍රාහ්මණ තෙමෙ මැ කාබුන් මරණින් මතු සුඳුරගති ඇති ස්වර්ගලෝකයෙහි උපදනේ ද? ක්‍ෂත්‍රිය නූපදනේ ද, වෛශ්‍ය නූපදනේ ද, ශුද්‍ර නූපදනේ ද? යි.

භවත් ගොයුම්ගොතුව, මේ නො වේ මැ යි. ප්‍රාණවධයෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ කාමයෙහි මිසහසරින් වෙන් වූ මුසවායෙන් වෙන් වූ පිසුණුබසින් වෙන් වූ පරොස්බසින් වෙන් වූ සිස්බසින් වෙන් වූ අභිධ්‍යා බහුල නො වූ ව්‍යාපන්න සිත් නැති සම්දිටු ඇති ක්‍ෂත්‍රිය තෙමේත් කාබුන් මරණින් මතු සුඳුර ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදනේ යැ. භවත් ගොයුම්ගොතුව, බ්‍රාහ්මණ තෙමේත් . . . භවත් ගෞතමයෙනි, වෛශ්‍ය තෙමේත් . . . භවත් ගොයුම්මාණෙනි, ශුද්‍ර තෙමේත් . . . භවත් ගෞතමයන් වහන්ස, පණිවායෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ කාමයෙහි මිසහසරින් වෙන් වූ මුසවායෙන් වෙන් වූ පිසුණුබසින් වෙන් වූ පරොස්බසින් වෙන් වූ සිස්බසින් වෙන් වූ අභිධ්‍යා බහුල නො වූ ව්‍යාපන්න සිත් නැති සම්දිටු ඇති හැම සතර වර්ණයෝ මැ කාබුන් මරණින් මතු සුඳුරගති ඇති ස්වර්ගලෝකයෙහි උපදනාහ''යි.

අස්සලායනයෙනි, යම් හෙයෙකින් මෙ කරුණෙහි ලා ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ අන්‍යවර්ණය හීනවර්ණ යි . . . බ්‍රහ්මදායාදයහ''යි බ්‍රාහ්මණයෝ මෙසේ කීහු නම් මෙහි ලා බමුණනට කවර බලයෙක් ද? කවර ආශ්වාසයෙක් ද?

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කියතුදු මෙහි ලා 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ තදන්‍යවර්ණය හීන යි . . . . බ්‍රහ්මදායාදයහ'යි බ්‍රාහ්මණයෝ මේ මෙසේ හඟිති'යි.

තං කිං මඤ්ඤසි අස්සලායන, බ්‍රාහ්මණොව නු ඛො පහොති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තං චිත්තං භාවෙතුං නො ඛත්තියො නො වෙස්සො නො සුද්දො'ති.

නො හිදං භො ගොතම, ඛත්තියොපි හි භො ගොතම, පහොති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තං චිත්තං භාවෙතුං, බ්‍රාහ්මණොපි හි භො ගොතම -පෙ- වෙස්සොපි හි භො ගොතම -පෙ- සුද්දොපි හි භො ගොතම -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පහොන්ති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තං චිත්තං භාවෙතු'න්ති.

එත්ථ අස්සලායන, බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: 'බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො -පෙ- බ්‍රහ්මදායාදා'ති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ. අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එවමෙතං මඤ්ඤන්ති: 'බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදා'ති.

තං කිං මඤ්ඤසි අස්සලායන, බ්‍රාහ්මණොව නු ඛො පහොති සොත්තිං සිනානිං[1] ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුං, නො ඛත්තියො, නො වෙස්සො නො සුද්දො'ති.

නො හිදං භො ගොතම, ඛත්තියොපි හි භො ගොතම, පහොති සොත්තිං සිනානිං[1] ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුං, බ්‍රාහ්මණොපි හි භො ගොතම, -පෙ- වෙස්සොපි හි භො ගොතම, -පෙ- සුද්දොපි හි භො ගොතම, -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පහොන්ති සොත්තිං සිනානිං ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුන්ති. එත්ථ අස්සලායන බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදාති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ, අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එවමෙතං මඤ්ඤන්ති: බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදාති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නානාජච්චානං පුරිසානං පුරිසසතං සන්නිපාතෙය්‍ය: ආයන්තු භොන්තො, යෙ තත්ථ ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රාජඤ්ඤකුලා උප්පන්නා සාලස්ස වා සලළස්ස වා[2] චන්දනස්ස වා පදුමස්ස[3] වා උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙන්තු, තෙජො පාතුකරොන්තු, ආයන්තු පුන භොන්තො, යෙ තත්ථ චණ්ඩාලකුලා නෙසාදකුලා වෙණකුලා[4] රථකාරකුලා පුක්කුසකුලා උප්පන්නා සාපානදොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එලණ්ඩකට්ඨස්ස වා උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙන්තු, තෙජො පාතුකරොන්තු'ති.

---

1. සොත්තිසිනානිං - මජසං. / සොත්ථිං සිනානිං - සීමු.
2. සාකස්ස වා සලලස්ස වා - මජසං, ස්‍යා.
3. පදුමකස්ස - මජසං, ස්‍යා, PTS.
4. වෙණ්ණුකුලා - ස්‍යා.

අස්සලායනයෙනි, ඒ කිමැ'යි හඟිහි? මෙ පෙදෙසැ අවෛර වූ නිදුක් වූ මෙත්සිත වඩන්නට බ්‍රාහ්මණ මැ පොහොනේ ද? ක්‍ෂත්‍රිය නො පොහොනේ ද, වෛශ්‍ය නො පොහොනේ ද, ශුද්‍ර නො පොහොනේ දූ? යි.

භවත් ගොයුම්ගොතුව, මෙ කරුණ නො වේ මැ යි. භවත් ගෞතමයන් වහන්ස, මෙ පෙදෙස්හි අවෛර වූ නිදුක් වූ මෙත්සිත වඩන්නට ක්‍ෂත්‍රිය ද පොහොනේ යැ. භවත් ගොයුම් ගොතුව, බ්‍රාහ්මණ ද . . . භවත් ගොයුමාණෙනි, වෛශ්‍ය ද . . . භවත් ගෞතමයන් වහන්ස, ශුද්‍ර ද . . . භවත් ගොයුමාණන් වහන්ස, මෙ පෙදෙස්හි අවෛර වූ නිදුක් වූ මෙත්සිත වඩන්නට හැම සතර වර්ණයෝ මැ පොහොනාහ'යි.

අස්සලායනයෙනි, යම් හෙයෙකින් 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ තදන්‍යවර්ණය හීන යි . . . බ්‍රහ්මදායදයහ'යි බ්‍රාහ්මණයෝ මෙසේ කීහු නම් මෙහි ලා බ්‍රාහ්මණයන්ට කවර බලයෙක් ද? කවර ආශ්වාසයෙක් ද?

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කියතුදු මෙහි ලා 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ තදන්‍යවර්ණය හීනවර්ණ යි . . . බ්‍රහ්මදායාදයහ'යි මේ මෙසේ මැ බ්‍රාහ්මණයෝ හඟිති'යි.

අස්සලායනයෙනි, ඒ කිමැ'යි හඟිහි? බ්‍රාහ්මණ මැ නහන කුරුඳුවැල ගෙන නදියට ගොස් රජස්දලි සෝධාලන්නට පොහොනේ ද? ක්‍ෂත්‍රිය නො පොහොනේ ද? වෛශ්‍ය නො පොහොනේ ද? ශුද්‍ර නො පොහොනේ දූ? යි.

භවත් ගොයුම්ගොතුව, මේ නො වේ මැ යි. භවත් ගෞතමයන් වහන්ස, ක්‍ෂත්‍රිය ද නහන කුරුඳුවැල ගෙන නදියට ගොස් රජස්දලි සෝධා හරනට පොහොනේ යැ, භවත් ගොයුමාණෙනි, බ්‍රාහ්මණ ද . . . භවත් ගොයුමාණන් වහන්ස, වෛශ්‍ය ද . . . . භවත් ගෞතමයන් වහන්ස, ශුද්‍ර ද . . . භවත් ගෞතමයන් වහන්ස, හැම සතර වර්ණයෝ මැ නහන කුරුඳුවැල ගෙන නදියට ගොස් රජස්දලි සෝධා හරනට පොහොනාහ'යි. අස්සලායනය, මෙ තන්හි දී බමුණෝ : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ අන්‍යවර්ණ හීන යි . . . . බ්‍රහ්මදායාදය'යි. යමක් කියත් ද, මෙහි ලා ඒ බමුණනට කවර බලයෙක් වේ ද? කවර ආස්වාසයෙක් වේ ද?

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කියතුදු වැළිත් මෙ තන්හි දී බමුණෝ තෙල කරුණ මෙසේ සිතත් : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ, අන්‍යවර්ණ හීන යි . . . . බ්‍රහ්මදායාදය කියා යි.

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ මුදුන්හි බිසෙස් කළ කැත්රජෙක් නන්කුල උපන් පුරුෂයන් අතුරින් පුරුෂයන් සියක් රැස් කරව'යි : 'භවත්නි, එව. එහි කැත්කුලින් හෝ බමුණුකුලින් හෝ රජකුලින් හෝ ක්‍ෂත්‍රියකුලින් හෝ උපන් යම් කෙනෙක් ඇද්ද, ඔහු සාලමය වූ හෝ සලලමය වූ හෝ චන්‍දනමය වූ හෝ ගිනිගානා උතුරුරිණි ගෙන ගිනි දල්වත්වා, තෙද පහළ කෙරෙත්වා. භවත්නි, දෙවනුව එව. එහි චණ්ඩාලකුලයෙන් හෝ නේසාද කුලයෙන් හෝ වෙණකුලයෙන් හෝ රථකාරකුලයෙන් හෝ පුක්කුස කුලයෙන් හෝ උපන් යම් කෙනෙක් ඇද්ද, කුකුරුවන් පැන් බොන දෙණියෙහි දවයෙන් කළ හෝ හූරන් බුදුනා දෙණියෙහි දවයෙන් කළ හෝ රජකයන් අයත් දෙණියෙහි දවයෙන් කළ හෝ එරණ්ඩකාෂ්ඨයෙන් කළ හෝ උත්තරාරණියක් ගෙන ගිනි දල්වත්වා තෙද පහළ කෙරෙත්වා'යි.

තං කිං මඤ්ඤසි අස්සලායන යො එවං නු ඛො සො ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රජඤ්ඤකුලා උප්පන්නෙහි සාලස්ස වා සලළස්ස වා චන්දනස්ස වා පදුමස්ස වා උත්තරරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො, සො එවන්නුඛ්වාස්ස අග්ගි අච්චිමා ච වණ්ණවා ච පභස්සරෙ ච. තෙන ච සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං. යො පන සො චණ්ඩාලකුලා නෙසාදකුලා වෙණකුලා රථකාරකුලා පුක්කුස කුලා උප්පන්නෙහි සාපානදොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එලණ්ඩකට්ඨස්ස වා උත්තරරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො, ස්වාස්ස අග්ගි න චෙව අච්චිමා, න ච වණ්ණවා, න ච පභස්සරෙ, න ච තෙන සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතු'න්ති.

නො හිදං භො ගොතම, යො සො භො ගොතම, ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රාජඤ්ඤකුලා උප්පන්නෙහි සාලස්ස වා සලළස්ස වා චන්දනස්ස වා පදුමස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො. ස්වාස්ස අග්ගි අච්චිමා ච වණ්ණවා ච පභස්සරො ච, තෙන ච සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං. යොපි සො චණ්ඩාලකුලා නෙසාද කුලා වෙණකුලා රථකාරකුලා පුක්කුසකුලා උප්පන්නෙහි සාපාන දොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එලණ්ඩකට්ඨස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො, සො චස්ස අග්ගි අච්චිමා ච වණ්ණවා ච පභස්සරෙ ච. තෙන ච සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං සබ්බොපි හි භො ගොතම, අග්ගි අච්චිමා ච වණ්ණවා ච පභස්සරො ච, සබ්බෙනපි ච සක්කා අග්ගිනා අග්ගිකර ණීයං කාතු'න්ති

එත්ථ අස්සලායන, බ්‍රාහ්මණානං කිං බලං කො අස්සාසො, යදෙත්ථ බ්‍රාහ්මණා එවමාහංසු: බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො බ්‍රාහ්මණාව සුක්කා වණ්ණා, කණ්හා අඤ්ඤෙ වණ්ණා. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා. බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදාති.

කිඤ්චාපි භවං ගොතමො එවමාහ, අථ ඛො එත්ථ බ්‍රාහ්මණා එවමෙතං මඤ්ඤන්ති: බ්‍රාහ්මණාව සෙට්ඨා වණ්ණා, හීනො අඤ්ඤො වණ්ණො-පෙ-බ්‍රහ්මදායාදාති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධ ඛත්තියකුමාරො බ්‍රාහ්මණකඤ්ඤාය සද්ධිං සංවාසං කප්පෙය්‍ය. තෙසං සංවාසමන්වාය පුත්තො ජායෙථ, යො සො ඛත්තියකුමාරෙන බ්‍රාහ්මණකඤ්ඤාය පුත්තො උප්පන්නො සියා, සො මාතුපි සදිසො. පිතුපි සදිසො 'ඛත්තියො' තිපි වත්තබ්බො, 'බ්‍රාහ්මණො' තිපි වත්තබ්බො'ති.

යො සො භො ගොතම, ඛත්තියකුමාරෙන බ්‍රාහ්මණකඤ්ඤාය පුත්තො උප්පන්නො සියා, සො මාතුපි සදිසො, පිතුපි සදිසො, 'ඛත්තියො' තිපි වත්තබ්බො, බ්‍රාහ්මණො' තිපි වත්තබ්බොති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධ බ්‍රාහ්මණකුමාරො ඛත්තියකඤ්ඤාය සද්ධිං සංවාසං කප්පෙය්‍ය. තෙසං සංවාසමන්වාය පුත්තො ජායෙථ. යො සො බ්‍රාහ්මණකුමාරෙන ඛත්තියකඤ්ඤාය පුත්තො උප්පන්නො සියා, සො මාතුපි සදිසො, පිතුපි සදිසො, ඛත්තියොතිපි වත්තබ්බො, බ්‍රාහ්මණොතිපි වත්තබ්බො'ති.

අස්සලායනයෙනි, ඒ කෙසේ හඟිහි? ක්‍ෂත්‍රියකුලයෙන් හෝ බ්‍රාහ්මණකුලයෙන් හෝ රාජන්‍යකුලයෙන් හෝ උපනුන් විසින් සාලමය වූ හෝ සලලමය වූ හෝ චන්‍දනමය වූ හෝ පදුමමය වූ හෝ උත්තරාරණියක් ගෙන මෙසේ ගිනි දල්වූ තෙද පහළ කළ යම් ඒ ගින්නෙක් ඇද්ද, මෙසේ ඒ ගින්න සිළු ඇතියේ වණී ඇතියේ ප්‍රභාස්වර වූයේත් වේ ද, ඒ ගින්නෙනුදු ගිනියෙන් කළයුතු කරණී කරන්නට හැකි වේ ද, චණ්ඩාලකුලයෙන් හෝ නේසාදකුලයෙන් හෝ වෙණකුලයෙන් හෝ රථකාරකුලයෙන් හෝ පුක්කුසකුලයෙන් හෝ උපනුන් විසින් කුකුරුවන් පැන් බොන දෙණියට අයත් දුවයෙන් කළ හෝ හූරන් බුදුනා දෙණියට අයත් දුවයෙන් කළ හෝ රජකයන් සතු දෙණියට අයත් දුවයෙන් කළ හෝ එරණ්ඩකාෂ්ටමය දුවයෙන් කළ හෝ උත්තරාරණියක් ගෙන ගිනි දල්වූ තෙද පහළ කළ යම් ගින්නෙක් ඇද්ද, ඒ ගින්න සිළු ඇතියේ නො ද වේ ද? වණී ඇතියේ නො ද වේ ද? ප්‍රභාස්වර නො ද වේ ද? ඒ ගින්නෙන්, ගින්නෙන් කළයුතු කරණී කරන්නට නො හැකි වේ ද? යි.

භවත් ගෞතමයන් වහන්ස, මේ වෙනස නො වේ මැ යැ, භවත් ගෞතමයන් වහන්ස, ක්‍ෂත්‍රිය කුලයෙන් හෝ බ්‍රාහ්මණකුලයෙන් හෝ රාජන්‍යකුලයෙන් හෝ උපනුන් විසින් සාලමය වූ හෝ සලලමය වූ හෝ චන්‍දනමය වූ හෝ පදුමමය වූ හෝ උත්තරාරණියක් ගෙන දල්වූ පහළ කළ යම් ඒ ගින්නෙක් ඇද්ද, ඒ ගින්න සිළු ඇතියේ ද වණී ඇතියේ ද ප්‍රභාස්වර වූයේ ද වෙයි. ඒ ගින්නෙනුදු ගින්නෙන් කළයුතු කරණී කරන්නට හැකි වෙයි, චණ්ඩාලකුලයෙන් හෝ නේසාද කුලයෙන් හෝ වෙණකුලයෙන් හෝ රථකාර කුලයෙන් හෝ පුක්කුසකුලයෙන් හෝ උපනුන් විසින් කුකුරුවන් පැන් බොන දෙණියට අයත් දුවයෙන් කළ හෝ හූරන් බුදුනා දෙණියට අයත් දුවයෙන් කළ හෝ රජකයන් සතු දෙණියට අයත් දුවයෙන් කළ හෝ එරණ්ඩකාෂ්ටයෙන් කළ හෝ උත්තරාරණියක් ගෙන දල්වූ පහළ කළ යම් ඒ ගින්නෙක් ඇද්ද, ඒ ගින්න ද සිළු ඇතියේත් වණී ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වෙයි. ඒ ගින්නෙනුදු ගින්නෙන් කළයුතු කරණී කරන්නට හැකි වෙයි. භවත් ගෞතමයන් වහන්ස, හැම ගින්න මැ සිළු ඇතියේත් වණී ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වෙයි. හැම ගින්නෙනුදු ගින්නෙන් කළයුතු කරණී කරන්නට ද හැකි වෙයි.

අස්සලායනය, මෙහි ලා බ්‍රාහ්මණයෝ යමක් මෙසේ කියත් ද : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවණී යැ අන්‍යවණීය හීන යි, බ්‍රාහ්මණයෝ මැ ශුක්ලවණී යැ අන්‍යවණීය කෘෂ්ණ යි. බ්‍රාහ්මණයෝ මැ ශුද්ධ වෙති, අබ්‍රාහ්මණයෝ ශුද්ධ නො වෙත්. බ්‍රාහ්මණයෝ මැ බ්‍රහ්මයාගේ පුත්හ, උරද වෙති, මුඛයෙන් ජාතයහ, එයින් මැ බ්‍රහ්මජයහ, බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ''යි. මෙ කරුණෙහි ඒ බමුණනට කිනම් බලයෙක් ඇද්ද, කවර ආස්වාසයෙක් ඇද්ද?

භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කියතුදු වැළිත් මෙහි ලා බමුණෝ තෙල කරුණ මෙසේ හඟිති : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨවණී යැ අන්‍යවණී හීන යි .... බ්‍රහ්මදායාදයහ''යි.

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ ක්‍ෂත්‍රිය කුමාරයෙක් බ්‍රාහ්මණකුමාරියක හා සමග සංවාස කරන්නේ යැ. උන්ගේ සංවාසය නිසා පුතෙක් උපදනේ යැ. ක්‍ෂත්‍රිය කුමාරයකු නිසා බ්‍රාහ්මණකුමාරියකට යම් පුතෙක් උපදනේ වේ ද, හේ මවට ද සමාන යැ පියාට ද සමාන යැ. 'ක්‍ෂත්‍රියහ'යි ද කියයුතු වේ ද? බ්‍රාහ්මණයහ'යි ද කියයුතු වේ ද? යි.

භවත් ගෞතමයන් වහන්ස, ක්‍ෂත්‍රියකුමාරයකු කරණ කොට බ්‍රාහ්මණ කන්‍යාවකට යම් පුතෙක් උපන්නේ වේ ද හේ මවට ද සමාන වෙයි. පියාට ද සමාන වෙයි. (එයින් 'ක්‍ෂත්‍රියහ'යි ද කියයුතු වෙයි, 'බ්‍රාහ්මණයහ'යි ද කියයුතු වේ යි.)

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ බ්‍රාහ්මණකුමාරයෙක් ක්‍ෂත්‍රියකුමාරියක හා සංවාස කරන්නේ යැ, උන්ගේ සංවාසය නිසා පුතෙක් උපදනේ යැ. බ්‍රාහ්මණ කුමාරයා කරණ කොට ක්‍ෂත්‍රියකන්‍යාවට යම් පුතෙක් උපන්නේ වේ ද, හේ මවට ද සමාන යැ පියාට ද සමාන යැ. 'ක්‍ෂත්‍රියහ'යි ද කියයුතු වේ ද? 'බ්‍රාහ්මණයහ'යි ද කියයුතු වේ ද ?යි.

යො සො භො ගොතම, බ්‍රාහ්මණකුමාරෙන ඛත්තියකඤ්ඤාය පුත්තො උප්පන්නො සියා, සො මාතුපි සදිසො, පිතුපි සදිසො, ඛත්තියොතිපි වත්තබ්බො, බ්‍රාහ්මණොතිපි වත්තබ්බො'ති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධ වළවං ගද්‍රභෙන සම්පයොජෙය්‍යුං. තෙසං සම්පයොගමන්වාය කිසොරො ජායෙථ. යො සො වළවාය ගද්‍රභෙන කිසොරො උප්පන්නො සියා, සො මාතුපි සදිසො, පිතුපි සදිසො, අස්සොති වත්තබ්බො, ගද්‍රභොති වත්තබ්බො'ති.

වෙකුරඤ්ජාය හි[1] සො භො ගොතම, අස්සතරො හොති. ඉදං හිස්ස භො ගොතම, නානාකරණං පස්සාමි. අමුත්‍ර ච පනෙසානං[2] න කිඤ්චි නානාකරණං[3] පස්සාමීති.

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධස්සු ද්වෙ මාණවකා භාතරො සඋදරියා, එකො අජ්ඣායකො උපනීතො, එකො අනජ්ඣායකො අනුපනීතො. කමෙත්ථ බ්‍රාහ්මණා පඨමං භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ[4] වාති?

යො සො භො ගොතම, මාණවකො අජ්ඣායකො උපනීතො තමෙත්ථ බ්‍රාහ්මණා පඨමං භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා. කිං හි භො ගොතම, අනජ්ඣායකෙ අනුපනීතෙ දින්නං මහප්ඵලං භවිස්සතී'ති?

තං කිං මඤ්ඤසි අස්සලායන, ඉධස්සු ද්වෙ මාණවකා භාතරො සඋදරියා, එකො අජ්ඣායකො උපනීතො දුස්සීලො පාපධම්මො, එකො අනජ්ඣායකො අනුපනීතො සීලවා කල්‍යාණධම්මො. කමෙත්ථ බ්‍රාහ්මණා පඨමං භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වාති? යො සො භො ගොතම, මාණවකො අනජ්ඣායකො අනුපනීතො සීලවා කල්‍යාණධම්මො, තමෙත්ථ බ්‍රාහ්මණා පඨමං භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා. කිං හි භො ගොතම, දුස්සීලෙ පාපධම්මෙ දින්නං මහප්ඵලං භවිස්සතී'ති?

පුබ්බෙ ඛො ත්වං අස්සලායන, ජාතිං අගමාසි. ජාතිං ගන්ත්වා මන්තෙ අගමාසි. මන්තෙ ගන්ත්වා තපෙ අගමාසි. තපෙ ගන්ත්වා චාතුවණ්ණිං සුද්ධිං පච්චාගතො යමහං පඤ්ඤපෙමී'ති.

එවං වුත්තෙ අස්සලායනො මාණවො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො[5] නිසීදි.

අථ ඛො භගවා අස්සලායනං මාණවං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා අස්සලායනං මාණවං එතදවොච:

---

1. { කුණ්ඩංහි - මජසං. / කුමාරණ්ඩුපිහි - සයා. }
2. අමුත්‍ර ච පන - සානං, සයා.
3. නානාකාරණං - සිමු.
4. පාහුණෙ - සිමු, PTS
5. අපටිභානො - PTS.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණකුමාරයකු නිසා ක්‍ෂත්‍රියකන්‍යාවකට යම් පුතෙක් උපන්නේ වේ ද, හේ මවට ද සමාන වෙයි, පියාට ද සමාන වෙයි, හේ ‘ක්‍ෂත්‍රියහ’යි ද කියයුතු වන්නේ යැ ‘බ්‍රාහමණහ’යි ද කියයුතු වන්නේ යි.

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ වෙළඹක් ගදුබුවකු හා සමග සම්ප්‍රයොග කරන්නාහ. උන්ගේ සම්ප්‍රයෝගය නිසා අස්පොව්වෙක් උපදනේ යැ, වෙළඹට ගදුබුවකු නිසා යම් අස්පොව්වෙක් උපන්නේ වේ ද, හේ මවට ද සමාන වෙයි, පියාට ද සමාන වෙයි. ‘අශ්ව’යයි කියයුතු වේ ද? ‘ගදුභ’යයි කියයුතු වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, වෙකුරඤ්ජාව (වෙළඹ) ගෙන් උපන් හේ ‘අශ්වතර’ වෙයි. භවත් ගොයුම්ගොතුව, උහුගේ මේ වෙනස දක්මි. අසෝ තැන්හි වැළිත් උන් (මාණවකයන්) ගේ කිසි වෙනසක් නො දක්මි’යි.

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ සමාන මාතෘකුක්ෂි ඇති සොහොවුරු මාණවකයෝ දෙදෙනෙක් වෙත්: එකෙක් මන්ත්‍රහදරනුයේ යැ උපනයන කරන ලද්දේයි. එකෙක් වේද නො හදරනුයේ යැ, උපනයන නො කරන ලද්දේ යි. මෙහි බමුණෝ මතකබත්හි වේවයි පඬුරුබත්හි වේවයි, යාගබත්හි වේවයි අමුතුවනට කළ බත්හි වේවයි කවරක්හු පළමු කොට වළඳවන්නාහු ද?යි.

භවත් ගෞතමයන් වහන්ස, යම් මාණවකයෙක් වේද හදරනුයේ ද උපනයන කරන ලද්දේ ද, එ මණෙවු මෙහි බමුණෝ මතකබත්හි වේවයි පඬුරින් අළ බත්හි වේවයි යාග බත්හි වේවයි අමුතුබත්හි වේවයි පළමු කොට වළඳවන්නාහ. භවත් ගොයුමාණෙනි, කිම වේද නො හදරනුවා උපනයන නො කළහු කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වන්නේ ද? යි.

අස්සලායනය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ එක් කුසැ ඔත් සොහොයුරු මණෙවුවෝ දෙදෙනෙක් වෙති: එකෙක් වේද හදරනුයේ යැ උපනීත යැ දුශ්ශීල යැ පාපධර්‍ම ඇත්තේ යි. එකෙක් වේද නො හදරනුයේ යැ උපනීත නො වෙයි, සිල්වත, කළණදහම් ඇතියේ යි. මෙහි කවරක්හු බමුණෝ මතකබත්හි වේවයි පඬුරුබත්හි වේවයි යාගබත්හි වේවයි අමුතුබත්හි වේවයි පළමු කොට වළඳවන්නාහු ද? යි.

භවත් ගෞතමයන් වහන්ස, යම් මාණවකයෙක් වේද නො හදරනුයේ උපනීත නො වූයේ සිල්වත් ද, කළණදහම් ඇතියේ ද, එ මණෙවු මෙහි බමුණෝ මතකබත්හි වේවයි පඬුරුබත්හි වේවයි යාගබත්හි වේවයි අමුතුබත්හි වේවයි පළමු කොට වළඳවන්නාහු යැ. කිම භවත් ගෞතමයන් වහන්ස, දුශ්ශීල වූ පාපධර්‍ම ඇතියා කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වන්නේ ද? යි.

අස්සලායනයෙනි, පළමු තෙපි ජාතියට ගියාව, ජාතියට ගොස් වේදයට ගියාව, වේදයට ගොස් තපසට ගියාව තපසට ගොස් චාතුර්වර්ණශුද්ධියට පෙරළා අව. මම යම් චාතුර් වර්ණශුද්ධියක් පනවම් ද, එයට යි.

මෙසේ වදළ කල්හි අස්සලායන මණෙවු නිහඬ වැ මකු වැ කඳට බහාගෙන යටිමුව වැ සිතිවිලිපර වැ ප්‍රතිභාන රහිත වැ හුන්නේ ය.

එසඳ බුදුහු නිහඬ වූ මකු වූ හෙළාලූ කඳට ඇති අධොමුඛ වූ සිතිවිලිපර වූ ප්‍රතිභාන රහිත වූ අස්සලායන මාණවක දැක අස්සලායන මාණවකහට තෙල කරුණ වදළහ :

භූතපුබ්බං අස්සලායන, සත්තන්නං බ්‍රාහ්මණිසීනං අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු සම්මන්තානං එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො, -පෙ- බ්‍රහ්මදායාදා'ති. අස්සොසි ඛො අස්සලායන, අසිතො දෙවලො ඉසි සත්තන්නං කිර බ්‍රාහ්මණිසීනං අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු සම්මන්තානං එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤො වණ්ණො-පෙ-බ්‍රහ්මදායාදා'ති. අථ ඛො අස්සලායන, අසිතො දෙවලො ඉසි කෙසමස්සුං කප්පෙත්වා මඤ්ජෙට්ඨවණ්ණානි දුස්සානි නිවාසෙත්වා අටලියො[1] උපාහනා ආරුහිත්වා ජාතරූපමයං දණ්ඩං ගහෙත්වා සත්තන්නං බ්‍රාහ්මණිසීනං පත්ථණ්ඩිලෙ පාතුරහොසි.

අථ ඛො අස්සලායන, අසිතො දෙවලො ඉසි සත්තන්නං බ්‍රාහ්මණිසීනං පත්ථණ්ඩිලෙ චඞ්කම්මානො එවමාහ: හන්ද ක්ව නු ඛො[2] ඉමෙ භවන්තො බ්‍රාහ්මණිසයො ගතා. හන්ද ක්ව නු ඛො[2] ඉමෙ භවන්තො බ්‍රාහ්මණිසයො ගතා'ති[3] අථ ඛො අස්සලායන, සත්තන්නං බ්‍රාහ්මණිසීනං එතදහොසි: කො නායං ගාමණ්ඩලරූපො විය සත්තන්නං බ්‍රාහ්මණිසීනං පත්ථණ්ඩිලෙ චඞ්කම්මානො එවමාහ: හන්ද ක්ව නු ඛො ඉමෙ භවන්තො බ්‍රාහ්මණිසයො ගතා, හන්ද ක්ව නු ඛො ඉමෙ භවන්තො බ්‍රාහ්මණිසයො ගතා'ති. හන්ද නං අභිසපාමාති[4]. අථ ඛො අස්සලායන, සත්තබ්‍රාහ්මණිසයො අසිතං දෙවලං ඉසිං අභිසපිංසු: භස්මා වසල හොහීති[5]. යථා යථා ඛො අස්සලායන, සත්ත බ්‍රාහ්මණිසයො අසිතං දෙවලං ඉසිං අභිසපිංසු. තථා තථා අසිතො දෙවලො ඉසි අභිරූපතරො චෙව හොති දස්සනීයතරො ච පාසාදිකතරො ච.

අථ ඛො අස්සලායන, සත්තන්නං බ්‍රාහ්මණිසීනං එතදහොසි: මොඝං වත නො තපො, අඵලං බ්‍රහ්මචරියං, මයං හි පුබ්බෙ යං අභිසපාම භස්මා වසල හොහී'ති භස්මාව භවති එකච්චො. ඉමං පන මයං යථා යථා අභිසපාම, තථා තථා අභිරූපතරො චෙව හොති දස්සනීයතරො ච පාසාදිකතරො චා'ති.

න භවන්තානං මොඝං තපො, නාඵලං[6] බ්‍රහ්මචරියං. ඉඞ්ඝ භවන්තො යො මයි මනොපදොසො, තං පජහථාති.

යො භවති මනොපදොසො තං පජහාම. කො නු ඛො භවං හොතීති?

සුතො නො භවතං අසිතො දෙවලො ඉසී'ති?

එවං භො.

සො ඛ්වාහං හොමීති.

---

1. { පටලියො - මජසං. / අගලියො - ස්‍යා. }
2. හන්ද කො නු ඛො - මජසං, ස්‍යා, PTS.
3. ගතතා - ස්‍යා.
4. අභිසපිස්සාමාති - ස්‍යා.
5. { භස්මා වසළ හොහීති - සිමු. / භස්මා වසල හොති භස්මා වසල හොහීති - මජසං. / භස්මා වපලී හොති භස්මා වපලී හොති භස්මා වපලී හොහීති - ස්‍යා / භස්මා වසලී හොහීති - PTS. }
6. න පනාඵලං - PTS.

''අස්සලායනයෙනි, පෙර වූ දයක් කියමි : අරණ්‍යායතනයෙහි පන්සල්හි මන්ත්‍රණ කරන බ්‍රාහ්මණර්ෂිහු සත් දෙනකුන්ට මෙ බඳු ලාමකදෘෂ්ටියක් උපන : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ අන්‍යවර්ණය හීන යි . . . . . බ්‍රහ්මදායාදහ''යි. අස්සලායනයෙනි, අසිත නම් වූ දේවල ඍෂි අරනෙහි පර්ණකුටින්හි මන්ත්‍රණ කරන බමුණුරුසියන් සත්දෙනාහට මෙ බඳු ලාමකදෘෂ්ටියක් උපන්නේ වේ ලැ'යි ඇසි : ''බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණ යැ අන්‍යවර්ණය හීන යි . . . බ්‍රහ්මදයාදයහ''යි. එසඳ අස්සලායනයෙනි, කාළදේවල ඍෂි කෙස්මස් කපා මදටවන් පිළි හැඳ පෙරෙ වැ ගණ්ඩගණු පාහන පයැලා රන්මුවා සැරයටියක් ගෙන බ්‍රාහ්මණර්ෂීන් සත්දෙනාගේ පන්සල්පිරිවෙන්හි පහළ වි.

එසඳ අස්සලායනයෙනි, කාළදේවල ඍෂි සත් බමුණුරුසියන්ගේ පන්සල්පිරිවෙන්හි සක්මන් කෙරෙමින් මෙසේ කී : ''සොඳේ මේ භවත් බ්‍රාහ්මණර්ෂිහු කොහි ගියාහු ද, සොඳේ මේ භවත් බ්‍රාහ්මණර්ෂිහු කොහි ගියාහු දෑ?''යි. එසඳ අස්සලායනයෙනි, බ්‍රාහ්මණර්ෂීන් සත් දෙනාහට තෙල සිත් වී : ''මේ කවරෙක් ගම්දරුවකු සෙයින් බ්‍රාහ්මණර්ෂීන් සත්දෙනාගේ පන්සල් පිරිවෙන්හි සක්මන් කෙරෙමින් මෙසේ කියා ද : ''සොඳේ මේ භවත් බ්‍රාහ්මණර්ෂිහු කොහි ගියාහුද, සොඳේ මේ භවත් බ්‍රාහ්මණර්ෂිහු කොහි ගියාහු දෑ?''යි 'ඔහට ශාප කරමෝ නම් මැනැවැ'යි. ඉක්බිති අස්සලායනයෙනි, බ්‍රාහ්මණර්ෂිහු සත් දෙන කාළදේවල ඍෂිහට 'වසලය භස්ම වව'යි ශාප කළහ. අස්සලායනයෙනි, බ්‍රාහ්මණ ර්ෂිහු සත්දෙන කාළදේවලහට ශාප කරත් කරත් මැ කාළදේවල ඍෂි අභිරූපතර ද දර්ශනීයතර ද ප්‍රාසාදිකතර ද වෙයි.

එසඳ අස්සලායනයෙනි, බ්‍රාහමණර්ෂීන් සත් දෙනාහට තෙල සිත් වී : ''ඒකාන්තයෙන් අපගේ තපස සිස් යැ, බ්‍රහ්මචර්‍ය්‍යාව එල නැත. අපි වනාහි පෙර යමක්හට 'වසලය භස්මව'යි භවමෝ නම් කිසිවෙක් භළු වේ මැ යි. මොහු වැළිත් අප භවත් භවත් මැ අතිශයින් අභිරූපත් අතිශයින් දර්‍ශනීයත් අතිශයින් ප්‍රාසාදිකත් වේ'යයි.

භවතුන්ගේ තපස මෝඝ නො වෙයි, බ්‍රහ්මචර්‍ය්‍යාව විඵල නො වෙයි, භවත්නි මා කෙරෙහි යම් මනොපදේසයෙක් වේ නම් එය දුරලව'යි.

භවත්හු කෙරෙහි යම් මනොපදෙස්යෙක් වේ නම් එය දුරලම්හ. භවත් කවරෙක් වේ දෑ?යි.

භවතුන් විසින් 'කාළදේවල ඍෂි' අසනලද දෑ? යි.

එසේ යැ භවත්නි,

හේ මම් වෙමි'යි.

අථ ඛො අස්සලායන, සත්ත බ්‍රාහ්මණිසයො අසිතං දෙවලං ඉසිං අභිවාදෙතුං උපසඞ්කමිංසු.

අථ ඛො අස්සලායන, අසිතො දෙවලො ඉසි සත්ත බ්‍රාහ්මණිසයො එතදවොච : 'සුතං මෙතං භො, සත්තන්නං කිර බ්‍රාහ්මණිසීනං අරඤ්ඤායතනෙ පණ්ණකුටීසු වසන්තානං එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං : 'බ්‍රාහ්මණාව සෙට්ඨො වණ්ණො, හීනො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුක්කො වණ්ණො, කණ්හො අඤ්ඤො වණ්ණො. බ්‍රාහ්මණාව සුජ්ඣන්ති, නො අබ්‍රාහ්මණා. බ්‍රාහ්මණාව බ්‍රහ්මුනො පුත්තා[1] ඔරසා මුඛතො ජාතා බ්‍රහ්මජා බ්‍රහ්මනිම්මිතා බ්‍රහ්මදායාදති.

එවමෙභො.

ජානන්ති පන භොන්තො යා ජනිකා මාතා[2] බ්‍රාහ්මණං යෙව අගමාසි. නො අබ්‍රාහ්මණන්ති.

නො හිදං භො.

ජානන්ති පන භොන්තො යා ජනිකාමාතුමාතා යාව සත්තමා මාතාමහයුගා බ්‍රාහ්මණං යෙව අගමාසි, නො අබ්‍රාහ්මණන්ති.

නො හිදං භො.

ජානන්ති පන භොන්තො යො ජනකො පිතා[3] බ්‍රාහ්මණිං යෙව අගමාසි නො අබ්‍රාහ්මණින්ති.

නො හිදං භො.

ජානන්ති පන භොන්තො යො ජනකපිතුපිතා යාවසත්තමා පිතා-මහයුගා බ්‍රාහ්මණිංයෙව අගමාසි, නො අබ්‍රාහ්මණින්ති.

නො හිදං භො.

ජානන්ති පන භොන්තො යථා ගබ්භස්ස අවක්කන්ති හොතීති?

ජානාම මයං භො යථා ගබ්භස්ස අවක්කන්ති හොති. ඉධ මාතා-පිතරො ච සන්නිපතිතා හොන්ති. මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති. එවං තිණ්ණං සන්නිපාතා ගබ්භස්ස අවක්කන්ති හොතීති.

ජානන්ති පන භොන්තො යග්ඝෙ[4] සො ගන්ධබ්බො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වාති?

න මයං භො, ජානාම යග්ඝෙ සො ගන්ධබ්බො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වාති.

---

1. පුත්තො - PTS.
2. ජනිමාතා - ස්‍යා. ජනීමාතා - PTS.
3. ජනීපිතා - ස්‍යා, PTS.
4. තග්ඝෙ - මජ්සං.

එසඳ අස්සලායනයෙනි, බ්‍රාහ්මණර්ෂීහු සත් දෙන කාළදේවල සෘෂීන් වදිනට එළැඹියෝ.

ඉක්බිති අස්සලායනයෙනි, කාළදේවල සෘෂි බමුණු රුසියන් සත්දෙනාහට මෙල කී: ''භවත්නි, මා විසින් තෙල කරුණ අසනලද; අරණ්‍යායතනයෙහි පන්සල්හි වසන බ්‍රාහ්මණර්ෂීන් සත්දෙනාහට මෙ බඳු ලාමකදෘෂ්ටියක් උපන්ලැ'යි. කවර දෘෂ්ටියක යත්: 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රෙෂ්ඨවර්ණී යැ; අන්‍යවර්ණය හීන යි. බ්‍රාහ්මණයෝ මැ ශුක්ලවර්ණී යැ, අන්‍යවර්ණය කෘෂ්ණ යි. බ්‍රාහ්මණයෝ මැ ශුද්ධ වෙති, අබ්‍රාහ්මණයෝ නො වෙත්. බ්‍රාහ්මණයෝ මැ බ්‍රහ්මයාගේ පුත්හ, උරද වෙති, මුඛයෙන් උපනුවහ, එයින් මැ බ්‍රහ්මජයහ, බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ''යි.

එසේ යැ භවත්නි.

භවත්හු තොප වැදූ යම් මවක් ඇද්ද, හෝ බ්‍රාහ්මණයකු මැ කරා ගියා යැ අබ්‍රාහ්මණයකු කරා නො ගියා යැ'යි දනිත් දෑ?යි.

නො දනුම්හ භවත්නි.

භවත්හු, යම් වැදූ මවගේ මවක් සත් වැනි මුත්මුත්තනියයුගය තෙක් 'බමුණකු වෙත මැ ගියා යැ නොබමුණකු වෙත නො ගියා යැ'යි දනිත් ද?

නො දනුම්හ භවත්නි.

භවත්හු තොපගේ ජනක පියෙක් වී ද හේ බ්‍රාහ්මණියක වෙත මැ ගියේ යැ, අබ්‍රාහ්මණියක වෙත නො ගියේ යැ'යි දනිත් ද?

නො දනුම්හ භවත්නි,

භවත්හු යම් ජනක පියාගේ පියේ සත් වැනි මුත්තායුගය තෙක් බැමිණියක වෙත මැ ගියේ යැ, නො බැමිණියක වෙත නො ගියේ යැ'යි දනිත් ද?

නො දනුම්හ භවත්නි.

භවත්හු ගර්භාවක්‍රාන්ති වන සේ දනිත් ද?

භවත්නි ඇපි ගර්භාවක්‍රාන්ති වන සේ දනුම්හ. මෙහි මාපිය දෙදෙන සඞ්ගම වූවාහු වෙති. මව ද සෘතුනී වෙයි, ගන්ධර්ව ද එළැඹසිටියේ වෙයි. මෙසෙයින් තුන් දෙනකුන් එක් වීමෙන් ගර්භාවක්‍රාන්ති වේ''යයි.

භවත්හු ඒ ගන්ධර්ව ක්‍ෂත්‍රියයෙක හෝ යැ බ්‍රාහ්මණයෙක හෝ යැ වෛශ්‍යයෙක හෝ යැ ශුද්‍රයෙක හෝ යි ඒකාන්තයෙන් දනිත් ද?

භවත්නි, ඇපි ඒකාන්තයෙන් ඒ ගන්ධර්ව ක්‍ෂත්‍රියයෙක හෝ යැ බ්‍රාහ්මණයෙක හෝ යැ වෛශ්‍යයෙක හෝ යැ ශුද්‍රයෙක හෝ යි නො දනුම්හ'යි.

එවං සන්තෙ භො ජානාථ කෙ තුම්හෙ හොථාති[1].

එවං සන්තෙ භො, න මයං ජානාම කෙ ච මයං හොමාති.

තෙ හි නාම අස්සලායන, සත්ත බ්‍රාහ්මණිසයො අසිතෙන දෙවලෙන ඉසිනා සකෙ ජාතිවාදෙ සමනුයුඤ්ජියමානා සමනුභාසියමානා සමනුගාහියමානා න සම්පායිස්සන්ති. කිං පන ත්වං එතරහි මයා සකස්මිං ජාතිවාදෙ සමනුයුඤ්ජියමානො සමනුභාසියමානො සමනුගාහියමානො සම්පායිස්සසි. යෙසං ත්වං සාචරියකො න පුණ්ණො දබ්බිගාහොති.

එවං වුත්තෙ අස්සලායනො මාණවො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත'න්ති.

අස්සලායනසුත්තං තතියං.

---

1. හොතිති - සිමු.

භවත්නි, මෙසේ ඇති කල්හි තෙපි කවරහු වව'යි දනිවූ ද ? යි

භවත්නි, මෙසේ ඇති කල්හි ඇපි කවරහු වමෝ ද'යි ඇපි නො දනුම්හ'යි.

අස්සලායනයෙනි, ඒ සප්තබ්‍රාහ්මණර්ෂිහු නමුදු කාළදේවල ඍෂිහු විසින් ස්වකීය ජාතිවාදයෙහි අනුයෝග කරනුලබන්නාහු කරුණු පුළුවුස්නා ලබන්නාහු ලබ්ධි පිහිටුවනු ලබන්නාහු සපයා කියන්නට නො හැකි වෙති. කිම තෙපි වැළිත් දත් මා විසින් ස්වකීය ජාතිවාදයෙහි අනුයෝග කරනු ලබන්නහු කරුණු පුළුවුස්නා ලබන්නහු ලබ්ධි පිහිටුවනු ලබන්නහු සපයා කියහෙව? සාචාර්‍ය්‍යක වූ තෙපි යම් සප්තර්ෂි කෙනකුන්ගේ යාග සැන්ද ගන්නා පූර්ණ ද නො වව! යි.

මෙසේ වදළ කල්හි අස්සලායන මාණව භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''ඉතා මැනැව භවත් ගෞතමයන් වහන්ස, . . . භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවිහිම් වැ සරණගිය උපාසකයකු කොට ධරත්ව'යි.

තුන් වැනි අස්සලායනසූත්‍ර යි.

2. 5. 4

ඝොටමුඛසුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා උදෙනො බාරාණසියං විහරති ඛෙමියම්බවනෙ. තෙන ඛො පන සමයෙන ඝොටමුඛො බ්‍රාහ්මණො බාරාණසිං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො ඝොටමුඛො බ්‍රාහ්මණො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන ඛෙමියම්බවනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ආයස්මා උදෙනො අබ්භොකාසෙ චඞ්කමති.

අථ ඛො සො ඝොටමුඛො බ්‍රාහ්මණො යෙනායස්මා උදෙනො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා උදෙනෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ආයස්මන්තං උදෙනං චඞ්කමන්තං[1] අනුචඞ්කමමානො එවමාහ: අම්භො සමණ, නත්ථි ධම්මිකො පරිබ්බාජො, එවං මෙ එත්ථ හොති, තඤ්ච ඛො භවන්තරූපානං වා අදස්සනා, යො වා පනෙත්ථ ධම්මො’ති.

එවං වුත්තෙ ආයස්මා උදෙනො චඞ්කමා ඔරොහිත්වා විහාරං පවිසිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ඝොටමුඛොපි ඛො බ්‍රාහ්මණො චඞ්කමා ඔරොහිත්වා විහාරං පවිසිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො ඝොටමුඛං බ්‍රාහ්මණං ආයස්මා උදෙනො එතදවොච: සංවිජ්ජන්තෙ ඛො බ්‍රාහ්මණ, ආසනානි සචෙ ආකඞ්ඛසි නිසීද’ති.

එතදෙව ච ඛො පන මයං භොතො උදෙනස්ස ආගමයමානා න නිසීදම. කථං හි නාම මාදිසො පුබ්බෙ අනිමන්තිතො ආසනෙ නිසීදිතබ්බං මඤ්ඤෙය්‍යා’ති. අථ ඛො ඝොටමුඛො බ්‍රාහ්මණො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ඝොටමුඛො බ්‍රාහ්මණො ආයස්මන්තං උදෙනං එතදවොච: අම්භො සමණ, නත්ථි ධම්මිකො පරිබ්බාජො, එවං මෙ එත්ථ හොති, තඤ්ච ඛො භවන්තරූපානං වා අදස්සනා, යො වා පනෙත්ථ ධම්මො’ති.

සචෙ ඛො පන මෙ ත්වං බ්‍රාහ්මණ, අනුඤ්ඤෙය්‍යං[2] අනුජානෙය්‍යාසි, පටික්කොසිතබ්බඤ්ච පටික්කොසෙය්‍යාසි, යස්ස ච පන මෙ භාසිතස්ස අත්ථං න ජානෙය්‍යාසි, මමංයෙව තත්ථ උත්තරිං පටිපුච්ඡෙය්‍යාසි : ඉදං භො උදෙන කථං, ඉමස්ස ක්වත්ථොති? එවං කත්වා සියා නො එත්ථ කථාසල්ලාපොති.

අනුඤ්ඤෙය්‍යං[2] ඛ්වාහං භොතො උදෙනස්ස අනුජානිස්සාමි, පටික්කොසිතබ්බඤ්ච පටික්කොසිස්සාමි. යස්ස ච පනාහං භොතො උදෙනස්ස භාසිතස්ස අත්ථං න ජානිස්සාමි, භවන්තංයෙව තත්ථ උදෙනං උත්තරිං පටිපුච්ඡිස්සාමි : ඉදං භො උදෙන කථං, ඉමස්ස ක්වත්ථො’ති? එවං කත්වා හොතු නො එත්ථ කථාසල්ලාපොති.

---

1. එකමන්තං - PTS. 2. අනුමඤ්ඤෙය්‍යං - PTS.

Free Distribution www.aathaapi.org

2. 5. 4

ඝොටමුඛසූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි ආයුෂ්මත් උදේන තෙරණුවෝ බරණැස් නුවර සමීපයෙහි ඛේමිය නම් අඹවෙනෙහි වැඩ වසන සේක. එසමයෙහි ඝෝටමුඛ බ්‍රාහ්මණ කිසි කටයුත්තෙකින් බරණැස්නුවරට පැමිණියේ යි. එසඳ ඝෝටමුඛ බමුණු ජඞ්ඝාවිහාර පිණිස සක්මන් කරනුයේ ඇවිදූතේ ඛේමිය අඹඋයන් කරා එළැඹියේ. ඒ සමයෙහි ආයුෂ්මත් උදේන තෙරණුවෝ අභ්‍යාවකාශයෙහි සක්මන් කෙරෙති.

ඉක්බිති ඒ ඝෝටමුඛ බමුණු උදේන තෙරුන් කරා එළැඹියේ. එළැඹ ආයුෂමත් උදේන තෙරුන් හා සමග සතුටු විය. සතුටුවියයුතු සාරාණිය කථාකොට නිමවා සක්මන් කරන ආයුෂ්මත් උදේන තෙරුන් අනුව සක්මන් කෙරෙමින් මෙසේ කී : "එම්බා මහණ දැහැමි පැවිදි නැති, මට මෙහි ලා මෙසේ සිත් වෙයි, එ ද භවත්හු වැනියන් හෝ නො දක්මෙන, මෙහි යම් දහමෙක් ඇද්ද, එය හෝ නො දක්මෙනි"යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් උදේන තෙරණුවෝ සක්මනින් බැස වෙහෙරට පිවිස පැනැවූ අස්නෙහි වැඩහුන්හ. ඝෝටමුඛ බමුණු ද සක්මනින් බැස වෙහෙරට පිවිස එකත්පස් වැ සිටියේ යැ. එකත්පස් වැ සිටි ඝෝටමුඛ බ්‍රාහ්මණහට ආයුෂ්මත් උදේන තෙරණුවෝ තෙල කීහ : 'බමුණ, අසුන් ඇත, කැමැත්තෙහි නම් හිඳුව'යි.

ඇපි භවත් උදේන තෙරුන්ගේ තෙල බස මැ අපේක්‍ෂා කරමෝ නො හිඳුම්හ. කෙසේ නම් මා බඳුයෙක් පෙර නිමන්ත්‍රණ නො කරනලද්දේ අසුනෙහි හින්දයුතු කොට සිතා ද ?යි. ඉක්බිති ඝෝටමුඛ බ්‍රාහ්මණ එක්තරා මිටි අස්නක් ගෙන එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඝෝටමුඛ බ්‍රාහ්මණ ආයුෂ්මත් උදේනහට තෙල කී : "එම්බා මහණ, දැහැමි පැවි නැති, මෙහි ලා මට මෙසේ සිත් වෙයි, එ ද භවත්හු වැනියන් හෝ නො දක්මෙන, මෙහි යම් දහමෙක් ඇද්ද, එය හෝ නො දක්මෙනි"යි.

බමුණ, ඉදින් තෝ අනුදතයුතු මබස අනුදන්හි නම්, පිළිකෙව් කළයුතු මබස පිළිකෙව් කරන්නෙහි නම් මා බණන යම් බසක්හුගේ අරුත් නො දන්හි ද "භවත් උදයනයෙනි, තෙල කෙසේ යැ? තෙල බස්හුගේ අරුත් කෙසේ යැ?"යි. එහි ලා මා මැ මතු පුළුවුස්නෙහි නම් මෙසේ කොට අපගේ මෙහි ලා කථාසල්ලාප වන්නේ යැ"යි.

මම භවත් උදයනයන්ගේ අනුදතයුතු බස් අනුදන්මි. පිළිකෙව් කළයුතු බස් පිළිකෙව් කරන්නෙමි. මම භවත් උදයනයන්ගේ යම් බසක්හුගේ අරුත් නො දන්මි ද, "භවත් උදයනයෙනි' තෙල කෙසේ යැ? තෙල භාෂිතයාගේ අරුත් කෙසේ යැ?"යි. එහි ලා භවත් උදයනයන් මැ මතු පුළුවුස්මි. මෙසේ කොට මෙ කරුණෙහි අපගේ කථාසල්ලාපය වේවා.

චත්තාරොමෙ බ්‍රාහ්මණ, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ඉධ බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො. ඉධ පන බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො නෙවත්තන්තපො හොති නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. ඉමෙසං බ්‍රාහ්මණ, චතුන්නං පුග්ගලානං කතමො තෙ පුග්ගලො චිත්තං ආරාධෙතී'ති?

ය්වායං භො උදෙන, පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො, අයං මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භො උදෙන, පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො, අයම්පි මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භො උදෙන, පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො, අයම්පි මෙ පුග්ගලො චිත්තං නාරාධෙති. යො ච ඛො අයං භො උදෙන, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙවධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. අයං මෙ පුග්ගලො චිත්තං ආරාධෙතී'ති

කස්මා පන තෙ බ්‍රාහ්මණ, ඉමෙ තයො පුග්ගලා චිත්තං නාරාධෙන්තී'ති? ය්වායං භො උදෙන, පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො, සො අත්තානං සුඛකාමං දුක්ඛපටික්කූලං ආතාපෙති පරිතාපෙති, ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භො උදෙන, පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො, සො පරං සුඛකාමං දුක්ඛපටික්කූලං ආතාපෙති පරිතාපෙති, ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යොපායං භො උදෙන, පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අත්තානඤ්ච පරඤ්ච සුඛකාමං දුක්ඛපටික්කූලං ආතාපෙති පරිතාපෙති, ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං නාරාධෙති. යො ච ඛො අයං භො උදෙන, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙවධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. සො අත්තානඤ්ච පරඤ්ච සුඛකාමෙ දුක්ඛපටික්කූලෙ නෙව ආතාපෙති, න පරිතාපෙති, ඉමිනා මෙ අයං පුග්ගලො චිත්තං ආරාධෙතී'ති.

බමුණ, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක යත් : බමුණ, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'අත්තන්තප' වෙයි. බමුණ, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'පරන්තප' වෙයි. බමුණ, මෙලොවැ ඇතැම් පුදගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'අත්තන්තප' ද වෙයි, පරපරිතාපනානුයොගයෙහි යෙදුණු 'පරන්තප' ද වෙයි. බමුණ, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු 'අත්තන්තප' නො මැ වෙයි, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු 'පරන්තප' ද නො මැ වෙයි. හේ 'අත්තන්තප' නො වූයේ 'පරන්තප' ද නො වූයේ ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳුනේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත වැ වාස කෙරෙයි. බමුණ, මේ සතර පුඟුලන් අතුරින් කවර පුඟුලෙක් තාගේ සිත් ගන්නේ වේ ද?

භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'අත්තන්තපයෙක්' වේ ද, මේ පුද්ගල මා සිත් නො ගන්නේ යැ. භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'පරන්තපයෙක්' වේ ද, මේ පුද්ගල ද මා සිත් නො ගන්නේ යැ, භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්ම පරිතාපනානුයෝගයෙහි යෙදුණු 'අත්තන්තපයෙකුත් වේ ද, පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු පරන්තපයෙකුත් වේ ද, මේ පුද්ගල ද මා සිත් නො ගන්නේ යැ, භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු අත්තන්තපයෙකුත් නො වේ ද, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු පරන්තපයෙකුත් නො වේ ද, හේ අත්තන්තප නො වූයේ පරන්තප ද නො වූයේ ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වැ නිර්වෘත වැ ශීතිභූත වැ සුව විඳිනාසුලු වැ මෙසේ ශ්‍රෙෂ්ඨ ආත්මයෙන් යුතු වැ වාස කෙරේ ද, මේ පුද්ගල මා සිත් ගන්නේ යැ''යි.

බමුණ, කවර හෙයෙකින් මේ තුන් පුද්ගලයෝ තා සිත් නො ගනිත් ද? භවත් උදයන-යෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු අත්තන්තපයෙක් වේ ද, හේ සුව කැමැති දුක් නො කැමැති ආත්මයා ආතාපන පරිතාපන කෙරෙයි. මෙ කරුණින් මේ පුද්ගල මා සිත් නො ගන්නේ යැ. භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු පරන්තපයෙක් වේ ද, හේ සුව කැමැති දුක් නො කැමැති මෙරමා ආතාපනපරිතාපන කෙරෙයි. මෙ කරුණින් ඒ පුද්ගල මා සිත් නො ගන්නේ යි. භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු අත්තන්තපයෙකුත් වේ ද, පරපරිතාපනානුයෝගයෙහි යෙදුණු පරන්තපයෙකුත් වේ ද, හේ සුව කැමැති දුක් නො කැමැති තමා හා මෙරමා ආතාපනපරිතාපන කෙරෙයි. මෙ කරුණින් මේ පුද්ගල මා සිත් නො ගන්නේ යැ. භවත් උදයනයෙනි, යම් මේ පුද්ගල-යෙක් ආත්මපරිතාපනානුයොගයෙහි නො යෙදුණු අත්තන්තපයකු හා පරපරිතාපනානු යොගයෙහි නො යෙදුණු පරන්තපයෙකුත් නො වේ ද, හේ අත්තන්තප නො වූයේ පරන්තප ද නො වූයේ ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වැ නිර්වෘත වැ සිහිල් වැ සුව විඳුනාසුලු වැ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත වැ වාස කෙරේ ද, හේ සුව කැමැති දුක් නො කැමැති තමා හා මෙරමා ආතාපනපරිතාපන නො මැ කෙරෙයි. මෙ කරුණින් මේ පුද්ගල මා සිත් ගන්නේ යැ.

ද්වෙමා බ්‍රාහ්මණ පරිසා, කතමා ද්වෙ: ඉධ බ්‍රාහ්මණ, එකච්චා පරිසා සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තභරියං පරියෙසති, දාසිදාසං පරියෙසති, ඛෙත්තවත්ථුං පරියෙසති, ජාතරූපරජතං පරියෙසති. ඉධ පන බ්‍රාහ්මණ, එකච්චා පරිසා අසාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තභරියං පහාය දාසිදාසං පහාය ඛෙත්තවත්ථුං පහාය ජාතරූපරජතං පහාය අගාරස්මා අනගාරියං පබ්බජිතා. ය්වායං බ්‍රාහ්මණ, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛප්පටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. ඉමං ත්වං බ්‍රාහ්මණ, පුග්ගලං කතමස්සං පරිසායං බහුලං සමනුපස්සසි:[1] යා චායං[2] පරිසා සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තභරියං පරියෙසති, දාසිදාසං පරියෙසති, ඛෙත්තවත්ථුං පරියෙසති, ජාතරූපරජතං පරියෙසති. යා චායං[2] පරිසා අසාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තභරියං පහාය දාසිදාසං පහාය ඛෙත්තවත්ථුං පහාය ජාතරූපරජතං පහාය අගාරස්මා අනගාරියං පබ්බජිතා'ති.

ය්වායං භො උදෙන, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛප්පටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. ඉමාහං පුග්ගලං යායං පරිසා අසාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තභරියං පහාය දාසිදාසං පහාය ඛෙත්තවත්ථුං පහාය ජාතරූපරජතං පහාය අගාරස්මා අනගාරියං පබ්බාජිතා, ඉමිස්සං පරිසායං බහුලං සමනුපස්සාමී'ති.

ඉදානෙව ඛො පන තෙ බ්‍රාහ්මණ, භාසිතං: මයං එවං ආජානාම, අම්භො සමණ, නත්ථි ධම්මිකො පරිබ්බාජො, එවං මෙ එත්ථ හොති, තඤ්ච ඛො භවන්තරූපානං වා අදස්සනා, යො වා පනෙත්ථ ධම්මො'ති.

අද්ධාමෙසා භො උදෙන, සානුග්ගහා වාචා භාසිතා, අත්ථි ධම්මිකො පරිබ්බාජො, එවං මෙ එත්ථ හොති, එවඤ්ච පන මං භවං උදෙනො ධාරෙතු. යෙචිමෙ හොතා උදෙනෙන චත්තාරො පුග්ගලො සඞ්ඛිත්තෙන වුත්තා විත්ථාරෙන අවිභත්තා, සාධු මෙ භවං උදෙනො ඉමෙ චත්තාරො පුග්ගලෙ විත්ථාරෙන විභජතු අනුකම්පං උපාදායාති

තෙන හි බ්‍රාහ්මණ, සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති.

එවං භොති ඛො ඝොටමුඛො බ්‍රාහ්මණො ආයස්මතො උදෙනස්ස පච්චස්සොසි. ආයස්මා උදෙනො එතදවොච:

1. ඉධ කතමං ත්වං බ්‍රාහ්මණ, පුග්ගලං කතමාය පරිසාය බහුලං සමනුපස්සසි - මජසං.
2. යා වායං - PTS.

බමුණ, මේ පිරිස්හු දෙදෙනෙකි, කවර දෙදෙනෙක යත් : බමුණ, මෙලොවැ කිසි පිරිසෙක් මිණිකොඬොලෙහි සංරක්ත වැ පුත්‍රභාර්‍ය්‍යා පිරියොස්නේ යැ, දසිදස් පිරියොස්නේ යැ, කෙත්වත් පිරියොස්නේ යැ, රන්රිදී පිරියොස්නේ යි. බමුණ, මෙලොවැ කිසි පිරිසෙක් මිණිකොඬොලෙහි සංරක්ත වැ සිට පුත්‍රදාරාවන් හැර දසිදස් හැර කෙත්වත් හැර රන්රිදී හැර ගෙන් නික්ම සසුන් වැදුණේ වෙයි, බමුණ, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු අත්තන්තපයෙකුත් නො මැ වේ ද, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු පරන්තපයෙකුත් නො මැ වේ ද, හේ අත්තන්තප ද නො වී පරන්තප ද නො වී ඉහාත්මයෙහි මැ තෘෂ්ණා රහිත වැ නිර්වෘත වැ සිහිල වැ සුව විඳුනාසුලු වැ ශ්‍රෙෂ්ඨ ආත්මයෙන් යුක්ත වැ වාස කෙරේ ද, බ්‍රාහමණය, තෝ මේ පුද්ගලයා කවර පිරිසෙක්හි ලා බහුල කොට තුවණින් දක්හි? යම් මේ පිරිසෙක් මිණිකොඬොලෙහි සංරක්ත වැ සිට අඹුදරු පිරියොස්නේ වේ ද, දසිදස් පිරියොස්නේ වේ ද, කෙත්වත් පිරියොස්නේ වේ ද, රන්රිදී පිරියොස්නේ වේ ද, යම් මේ පිරිසෙක් මිණිකොඬොලෙහි අසංරක්ත වැ සිට අඹුදරු හැරපියා දසිදස් හැරපියා කෙත්වත් හැරපියා රන්රිදී හැරපියා ගෙන් නික්ම සස්නට පැමිණියේ වේ ද, (මෙ පිරිස් අතුරෙහි) දක්හි?

භවත් උදයනයෙනි, යම් මේ පුද්ගලයෙක් ආත්මපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු අත්තන්තපයෙකුත් නො වේ ද, පරපරිතාපනානුයෝගයෙහි නො යෙදුණු පරන්තපයෙකුත් නො වේ ද, හේ අත්තන්තප ද නො වී පරන්තප ද නො වී ඉහාත්මයෙහි මැ තෘෂ්ණා නැති වැ නිර්වෘත වැ සිහිල් වැ සුව විඳුනාසුලු වැ ශ්‍රෙෂ්ඨ ආත්මයෙන් යුතු වැ වාස කෙරේ ද, මම මේ පුහුල් මිණිකොඬොලෙහි අසංරක්ත වැ අඹුදරුවන් පියා දසිදස් පියා කෙත්වත් පියා රන්රිදී පියා ගෙන් නික්ම සස්නට වැදුණු යම් පිරිසෙක් ඇද්ද, මෙ පිරිස්හි ලා නුවණින් දක්මි.

බමුණ, දන් මෙ වේලෙහි මැ තා විසින් "අපි මෙසේ දන සිටුම්හ. ශ්‍රමණයෙනි, දහැමි පැවිදි නැත. මෙහි ලා මට මෙ බඳු සිත් වෙයි. එ සිතුදු භවද්‍රූපයන් නො දක්මෙතුදු හෝ මෙහි යම් සවභාවයෙක් හෝ වේ ද, ඒ නො දක්මෙතුදු හෝ"යයි, පැවැසිණ.

භවත් උදයනයෙනි, මට ඒකාන්තයෙන් සෝපකාරක වූ තෙල බස පැවැසිණ, දහැමි පැවිදි ඇත, මෙහි ලා මට මෙ බඳු සිත් වෙයි. භවත් උදයනයෝ මෙසෙයින් මා ධරත්වා. භවත් උදයනයන් විසින් යම් මේ පුදගලයෝ සතර දෙනෙක් සැකෙවින් කියන ලදු වැ විස්තර විසින් විභාග නො කරන ලද්දහු ද, යදිම්, භවත් උදයනයෝ මට මේ සතර පුදගල-යන් අනුකම්පා පිණිස විස්තර විසින් බෙද පවසත්වා.

'බ්‍රාහ්මණය, එහෙයින් අසව, මනා කොට මෙනෙහි කරව, කියමි'යි.

භවත්නි, එසේ යැ'යි ඝෝටමුඛ බමුණු ආයුෂ්මත් උදයනයන්හට පිළිවදන් ඇස්වී. ආයුෂ්මත් උදයන්යෝ තෙල කීහු :

කතමො ච බ්‍රාහ්මණ, පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො අචෙලකො හොති මුත්තාචාරො, හත්ථාවලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨභදන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තනං සාදියති, සො න කුම්භිමුඛා පතිගණ්හාති, න ඛලොපිමුඛා පතිගණ්හාති, න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සඞ්කිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති, සො එකාගාරිකො වා හොති එකාලොපිකො වා, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො වා—පෙ—සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො වා, එකිස්සාපි දත්තියා යාපෙති, ද්වීහිපි දත්තීහි යාපෙති—පෙ—සත්තහිපි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වීහිකම්පි ආහාරං ආහාරෙති —පෙ— සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. සො සාකභක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති, නීවාරභක්ඛො වා හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති, කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාකභක්ඛො වා හොති. තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො වා හොති, වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, තිරීටානිපි ධාරෙති, අජිනානිපි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාළකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො, උබ්භට්ඨකොපි[1] හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො, කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති, සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. අයං වුච්චති බ්‍රාහ්මණ, පුග්ගලො අත්තන්තපො අත්තපරිතාපනානුයොගමනුයුත්තො.

කතමො ච බ්‍රාහ්මණ, පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො ඔරබ්භිකො හොති, සූකරිකො සාකුන්තිකො[2] මාගවිකො ලුද්දො මච්ඡඝාතකො චොරො චොරඝාතකො බන්ධනාගාරිකො, යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා. අයං වුච්චති බ්‍රාහ්මණ, පුග්ගලො පරන්තපො පරපරිතාපනානුයොගමනුයුත්තො.

---

1. උබ්භට්ඨකොපි - මජසං; උබ්භත්ථකොපි - සයා.
2. සාකුණිකො - මජසං.

"බ්‍රාහ්මණය, ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු අත්තන්තප පුද්ගල කවරේ යැ: බ්‍රාහ්මණය මෙලොවැ කිසි පුද්ගලයෙක් සෙලු වෙයි, හළ ආචාර ඇති වෙයි, පිඩු නිමි කල අත ලෙවන්නේ වෙයි, 'එව වහන්සැ'යි කී කල නො එනු සිල් කොට ඇත්තේ වෙයි, 'සිටුව වහන්සැ'යි කී කල නො සිටුනාසුලු වෙයි, පළමු එළවූ අහර නො පිළිගන්නේ වෙයි, උදෙසා කළ අහර නො පිළිගන්නේ වෙයි, නිමන්ත්‍රණය නො පිළිගන්නේ වෙයි, හේ කළමුවින් නඟා දුන් අහර නො පිළිගන්නේ වෙයි, සැළමුවින් නඟා දුන් අහර නො පිළිගන්නේ වෙයි, එළිපත අතුරු කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි, දඬු අතුරු කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි, මොහොල අතුරු කොට දෙන අහර නො පිළිගන්නේ වෙයි, වළදන දෙදෙනකුන් අතුරින් එකකු නැඟී දෙන අහර නො පිළිගන්නේ වෙයි, ගැබිනිය දෙන අහර නො පිළිගන්නේ වෙයි, කිරිපොවන්නිය දෙන අහර නො පිළිගන්නේ වෙයි, පිරිමිනීන් අතරට ගිය ස්ත්‍රිය දෙන අහර නො පිළිගන්නේ වෙයි, සමාදන් කොට පිසූයෙහි අහර නො පිළිගන්නේ වෙයි, සුනඛයකු එළැඹසිටි තැන දෙන අහර නො පිළිගන්නේ වෙයි, මැසිමුළු ගළගළ වැ හැසිරෙන තන්හි දෙන අහර නො පිළිගන්නේ වෙයි, මත්ස්‍යමාංස නො පිළිගන්නේ වෙයි, රහ නො බොයි, මෙර නො බොයි, සෝවීරකය නො බොයි, හේ එක් ගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, එක් ආලෝපයෙකින් යැපෙන්නේ හෝ වෙයි, දෙගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, ආලෝප දෙකෙකින් යැපෙන්නේ හෝ වෙයි . . . සත් ගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, ආලෝප සතෙකින් යැපෙන්නේ හෝ වෙයි, එක් දත්තියෙකිනුදු (කුඩා තලියෙනුදු) යැපෙයි, දෙ දත්තියෙකිනුදු යැපෙයි, . . . සත් දත්තියෙකිනුදු යැපෙයි. එක් දවසක් අතුරු කොට ගන්නා අහර ද වළඳයි, දෙ දවසක් අතුරු කොට ගන්නා අහර ද වළඳයි. . . . සත් දවසක් අතුරු කොට ගන්නා අහර ද වළඳයි. මෙසේ මෙ බඳු අඩමසක් අතුරු කොට ගන්නා අහර ද'යි වාරභක්තභෝජනානුයුක්ත වැ වෙසෙයි. හේ පළා වළඳනුයේ හෝ වෙයි. බඩහමු වළඳනුයේ හෝ වෙයි, හුරුහැල් වළඳනුයේ හෝ වෙයි, සම්කසට වළඳනුයේ හෝ වෙයි, ලහටු වළඳනුයේ හෝ වෙයි, කුඩු වළඳනුයේ හෝ වෙයි, දමු බත් වළඳනුයේ හෝ වෙයි, මුරුවට වළඳනුයේ හෝ වෙයි, තෘණ වළඳනුයේ හෝ වෙයි, ගොම වළඳනුයේ හෝ වෙයි, වැටුණු ඵල වළඳනුයේ වනමුල්පල අහර ඇති වැ යැපෙයි. හේ හණ වැහැරි ද දරයි, මුසුහණවැහැරි ද දරයි, මිනියෙන් හළ පිළී ද දරයි, පහුල් ද දරයි, රුක්සුඹුලු ද දරයි, අඳුන්මුවසම් ද දරයි, කුර සහිත අඳුන්දිවිසම් ද දරයි, කුසවැහැරි ද දරයි, වාකචීර ද දරයි, ඵලකචීර ද දරයි, කේශකම්බල ද දරයි, වාලකම්බල ද දරයි, මහමුහුණු පියාපතින් කළ හඳනා ද දරයි. කෙහෙරවුළු උදුරාලීමෙහි යෙදුණේ කෙහෙරවුළු උදුරනුයේ ද වෙයි, අසුන් පිළිකෙව් කෙළේ උඩුහුරු වැ සිටුනේ ද වෙයි, උළුවැර වැඩුමෙහි යෙදුණේ උළුයෙන් සිටුනේ ද වෙයි, කටු ඇතිරිය ඇක්මෙනුයේ ද වෙයි, කටු ඇතිරියෙහි ශයනය ද කෙරෙයි, සවස තුන් වනු කොට තෙවරක් උදකාවගාහයෙහි යෙදුණේ වෙසෙයි. මෙසේ මෙ බඳු අනේකවිධ වූ කය පිළිබඳ ආතාපනපරිතාපනානුයෝගයෙහි යෙදී වෙසෙයි. බමුණ, මේ පුද්ගල ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු 'අත්තන්තප' යයි කියනු ලැබේ.

බමුණ, මෙරමා තවන යෝගයෙහි යෙදුණු පරන්තප පුද්ගල කවරෙ යත්: බමුණ, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් එළුවැදි වෙයි, හූරුවැදි වෙයි, ළිහිණිවැදි වෙයි, මුවවැදි වෙයි, දරුණු වූයේ මස්වැදි (කෙවුළු) වෙයි, සොර වෙයි, චෝරඝාතක වෙයි, බන්ධනාගාර ගොපක වෙයි, යළි අන්‍ය වූ ත් යම්කිසි දරුණුකම් ඇද්ද, එයින් දිවි රක්නේ වෙයි, බමුණ, මේ පුද්ගල මෙරමා තවන යෝගයෙහි යෙදුණු 'පරන්තප' යයි කියනු ලැබේ.

කතමො ච බ්‍රාහ්මණ, පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධ බ්‍රාහ්මණ, එකච්චො පුග්ගලො රාජා වා හොති ඛත්තියො මුද්ධාභිසිත්තො[1], බ්‍රාහ්මණො වා මහාසාලො, සො පුරත්ථිමෙන නගරස්ස නවං සන්ථාගාරං කාරාපෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා ඛරාජිනං නිවාසෙත්වා සප්පිතෙලෙන කායං අබ්භඤ්ජිත්වා මිගවිසාණෙන[2] පිට්ඨිං කණ්ඩුවමානො සන්ථාගාරං පවිසති සද්ධිං මහෙසියා බ්‍රාහ්මණෙන ච පුරොහිතෙන. සො තත්ථ අනන්තරහිතාය භූමියා හරිතුපත්තාය[3] සෙය්‍යං කප්පෙති, එකිස්සා ගාවියා සරූපවච්ඡාය යං එකස්මිං ථනෙ ඛීරං හොති, තෙන රාජා යාපෙති. යං දුතියස්මිං ථනෙ ඛීරං හොති, තෙන මහෙසී යාපෙති. යං තතියස්මිං ථනෙ ඛීරං හොති, තෙන බ්‍රාහ්මණො පුරොහිතො යාපෙති. යං චතුත්ථස්මිං ථනෙ ඛීරං හොති, තෙන අග්ගිං ජුහති. අවසෙසෙන වච්ඡකො යාපෙති. සො එවමාහ: 'එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තිකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා රුක්ඛා ඡිජ්ජන්තු යූපත්ථාය, එත්තකා දබ්භා ලූයන්තු බරිහිසත්ථායා'ති[4]. යෙපිස්ස තෙ හොන්ති දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති. අයං වුච්චති බ්‍රාහ්මණ, පුග්ගලො අත්තන්තපො ච අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො.

කතමො ච බ්‍රාහ්මණ, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙවධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛප්පටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති: 'ඉධ බ්‍රාහ්මණ, තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං කුලෙ පච්චාජාතො, සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

1. මුද්ධාවසිත්තො - මජ්ඣසං.
2. මගවිසාණෙන - මජ්ඣසං.
3. හරිතුපලිත්තාය - මජ්ඣසං, ස්‍යා.
4. පරිසත්ථායාති - ස්‍යා.

බමුණ, කවර පුද්ගලයෙක් තමා තවන යෝගයෙහි යෙදුණේ 'අත්තන්තප' ද මෙරමා තවන යෝගයෙහි යෙදුණේ 'පරන්තප' ද වෙයි යත් : බමුණ, මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් මුදුනෙහි බිසෙස් කළ ක්‍ෂත්‍රිය රජ හෝ වෙයි, බමුණු මහසල් හෝ වෙයි, හේ නුවරට පැදුන්දිග නව යාගහලක් කරවා කෙස්මස් බහා කුර සහිත අඳුන්දිවිසමක් හැඳ ගියෙන් හා තෙලින් සිරුරු තවරා මුවහඟින් පිට කසමින් මෙහෙසිය ද පෙරෙවිබමුණු ද සමග යාගශාලාවට පිවිසෙයි. හේ එහි නො අතුළ ගොමපිරිබඩගත් බිමැ ශයනය කෙරෙයි. සමාන වස්සකු ඇති එක් දෙනකගේ එක් තනයෙකැ යම් කිරෙක් වේ ද, එයින් රජ යැපෙයි. දෙ වැනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් මෙහෙසිය යැපෙයි. තුන් වැනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් පෙරෙවිබමුණු යැපෙයි. සතර වැනි තනයෙහි යම් කිරෙක් වේ ද, එයින් ගිනි පුදති. අවශේෂයෙන් වස්සා යැපෙයි. හේ මෙසේ කියයි : "යාගයට මෙතෙක් වෘෂභයෝ මරනුලැබෙත්වා, යාගයට මෙතෙක් නහඹුවස්සෝ මරනුලැබෙත්වා, යාගයට මෙතෙක් නැහැඹිවස්සෝ මරනුලැබෙත්වා, යාගයට මෙතෙක් තිරෙළුවෝ මරනුලැබෙත්වා, යාගයට මෙතෙක් එළුවෝ මරනුලැබෙත්වා, යාගස්තම්භයට මෙතෙක් වෘක්ෂයෝ සිඳිනුලැබෙත්වා, පිරිකෙව් කරනු පිණිසත් යාගභූමියෙහි අතුරනු පිණිසත් මෙතෙක් කුසතණ කපනුලැබෙත්වා" යි. ඔහට යම් දස් කෙනෙක් හෝ මෙහෙකරු කෙනෙක් හෝ කම්කරු කෙනෙක් හෝ ඇද්ද, ඔහු ද දඬින් තෙදන ලද්දහු භයින් තර්ජන කරනලද්දහු කඳුළුගලනමුහුණු ඇතියාහු හඬමින් පිරියම් කෙරෙති. බමුණ, මේ පුද්ගල ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණු අත්තන්තප ද පරපරිතාපාපනානුයොගයෙහි යෙදුණු පරන්තප ද වේ යැ යි කියනුලැබේ.

බමුණ, තමා තවන යෝගයෙහි නො යෙදුණේ අත්තන්තප නො වූ මෙරමා තවන යෝගයෙහි නො යෙදුණේ පරන්තප නො වූ පුද්ගල කවරෙ යත් : හේ අත්තන්තප නො වූයේ පරන්තප නො වූයේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවියේ සිහිල් වූයේ සුව විඳුනේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුතු වැ වාස කෙරෙයි. 'බමුණ, මෙ ලොවැ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණ සම්පන්න වූ සුගත් වූ ලොකවිද් වූ අනුත්තර පුරුෂදම්‍ය සාරථි වූ දෙව්මිනිසුනට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගත උපදී. ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොව මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තමා විසින් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති. ඔබ ආදිකල්‍යාණ කොට මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසානකල්‍යාණ කොට දහම් දෙසති. සියල්ල පිරිපුන් පිරිසුදු බඹසර පවසති. එ දහම ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ එක්තරා කුලයෙකැ උපන්නෙක් හෝ අසයි. හෙ ඒ දහම අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව ලබයි. හෙ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්වාගත වූයේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි; ගෘහ වාසය සම්බාධයෙක, (රාගාදි) රජසට මාර්ගයෙක, පැවිද්ද අභ්‍යවකාශයෙක, ගිහිගෙයි වසනුවහු විසින් එකාන්තපරිපූර්ණ වූ එකාන්තපරිශුද්ධ වූ ධෞතසඞ්ඛසදෘශ මෙ බඹසර පුරන්නට සුකර නො වෙයි. මම කෙහෙරවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදනෙම් නම් මනා මැ නු"යි. හේ මෑත භාගයෙහි අල්ප වූ හෝ භෝගස්කන්ධය හැරපියා මහත් වූ හෝ භෝගස්කන්ධය හැරපියා අල්ප වූ හෝ නෑපිරිවට හැරපියා මහත් වූ හෝ නෑපිරිවට හැරපියා කෙස්මස් බහා කහවත් හැඳපෙරෙවැ ගෙන් නික්ම සසුන් වදී.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති, අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති, අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා, මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස, පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති, ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති, සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති, එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා, නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති, මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති, උච්චාසයනමහාසයනා පටිවිරතො හොති, ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති, ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති, ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති, ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති, දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති, අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති, කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති, හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති, ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති, දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති, කයවික්කයා පටිවිරතො හොති, තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති, උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති, ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති, සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති, සෙය්‍යථාපි නාම පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති, සපත්තභාරොව ඩෙති. එවමෙවං භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

හෙ මෙසෙයින් පැවිදි වූයේ මැ භික්ෂූන්ගේ ශික්ෂාසාජීවයට පැමිණියේ ප්‍රාණවධ හැරපියා පණිවායෙන් වෙන් වූයේ වෙයි, බහා තබනලද දඬු ඇති වැ බහා තබනලද ආයුධ ඇති වැ ලජ්ජා ඇති වැ මෙත්සිතට පැමිණ හැම සත්නට හිතානුකම්පා ඇති වැ වාස කෙරෙයි. නුදුන් අන් සතු දය හැරපියා අයිනාදනින් වෙන් වූයේ වෙයි, දුන් දය ගනුයේ දුන් දය කැමැති වනුයේ නො සොර වූ පිරිසුදු වූ ආත්මයෙන් යුතු වැ වාස කෙරෙයි. අබ්‍රම්සර හැරපියා බඹසර (ශ්‍රෙෂ්ඨ ආචාර) ඇතියේ වෙයි, අබ්‍රම්සරින් දුරු වූ ආචාර ඇතියේ ග්‍රාම්‍යධර්ම වූ මෛථුනයෙන් වෙන් වූයේ වෙයි. මුසවා හැරපියා මුසවායෙන් වෙන් වූයේ වෙයි, සත්‍යය කියනුයේ සත්‍යය ගළපනුයේ ස්ථිරකථා ඇතියේ හැදහියයුතු කථා ඇතියේ ලෝකයා විසංවාද නො කරනුයේ වෙයි. පිසුණුබස් හැරපියා පිසුණුබසින් වෙන් වූයේ වෙයි, මෙතැනින් අසා මුන් බිඳුනට එ තැන නො කියන්නේ යැ, එ තැන හෝ අසා උන් බිඳුනට මුන්හට නො කියන්නේ යැ, මෙසෙයින් බිඳුණවුන් හෝ ගළපනුයේ සමගවූවන් හෝ දඩි කරනුයේ සමග වූවන් කෙරෙහි සිත් අළවනුයේ සමගයන් කෙරෙහි ඇලුණේ සමගයනට තුටු වූයේ සමග කරන බස් බණනුයේ වෙයි. පරොස්බස් හැරපියා පරොස්බසින් වෙන් වූයේ වෙයි, යම් බසෙක් කෙලතොලු නො වේ ද, කනට සුව එළවනුයේ ද, ප්‍රේමනීය ද, හෘදයඞ්ගම ද, නාගරික ද, බොහෝදෙනාට කාන්ත ද, බොහෝදෙනාගේ මන වඩනුයේ ද, එ බඳු බස් බණනුයේ වෙයි. සිස්බස් හැරපියා සිස්බසින් වෙන් වූයේ වෙයි, නිසි කල්හි කියනුයේ තථ්‍යය කියනුයේ අර්ථසංහිතය කියනුයේ ධර්මනිඃශ්‍රිතය කියනුයේ (සංවර ප්‍රහාණ) විනයනිඃශ්‍රිතය කියනුයේ නිසි කල්හි සකාරණ වූ පිරිසිඳුම් ඇති අර්ථසංහිත වූ (හදවත්හි) නිධන් කළයුතු බස් බණනුයේ යි.

හේ බීජගාමභූතගාම විකෝපනයෙන් වෙන් වූයේ වෙයි, රාත්‍රිභෝජනයෙන් වැළකියේ විකල්බොජුනෙන් වැළකියේ ඒකභක්තික වෙයි. නටනු ගනු වයනු විසුළුදස්නෙන් දුරු වෙයි. මල් ගඳ විලෙවුන් දැරීම හා මණ්ඩන විභූෂණ යන කරුණින් වැළකියේ වෙයි. උසසුන් මහඅස්නෙන් වැළකියේ වෙයි. රන්රිදී පිළිගැන්මෙන් වැළකියේ වෙයි, (සත්වැදෑරුම්) ආමකධාන්‍ය පිළිගැන්මෙන් වැළකියේ වෙයි, අමුමස් පිළිගැන්මෙන් වැළකියේ වෙයි. ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් වැළකියේ වෙයි, දැසිදසුන් පිළිගැන්මෙන් වැළකියේ වෙයි, එළුතිරෙළුවන් පිළිගැන්මෙන් වැළකියේ වෙයි, කුකුළුහූරන් පිළිගැන්මෙන් වැළකියේ වෙයි, ඇත්–ගව–අස්–වෙළඹ පිළිගැන්මෙන් වැළකියේ වෙයි, කෙත්වතු පිළිගැන්මෙන් වැළකියේ වෙයි, දූතකර්ම යැ පහිණගමන යැ යන මෙහි යෙදීමෙන් වැළකියේ වෙයි, ගනුදෙනුයෙන් වැළකියේ වෙයි, තුලාකූට කංසකූට මානකූට යන මෙයින් වැළකියේ වෙයි, අල්ලස් ගැනීම යැ නුළු කිරීම යැ මායා යැ යන සාචියොග (රැවැටිලි) යෙන් වැළකියේ වෙයි, (අත්පා ආදිය) සිඳීම යැ මැරීම යැ බන්ධන යැ සැඟැවී සිට සර්වස්වාපහරණ යැ ගම් වොලොගැන්ම යැ සැහැසිකම් යැ යන මෙයින් වැළැකියේ වෙයි. හේ කය පරිහරණයට පමණ වූ සිවුරින් කුස පරිහරණයට පමණ වූ පිඩුවායෙන් සතුටු වූයේ වෙයි. හේ යම් මැ තැනෙක යේ ද, මහණ පිරිකර (කායපටිබද්ධ කොට) ගෙන මැ යෙයි. යම්සේ පියාපත් ඇති ළිහිණියෙක් යම් යම් තැනෙක ඉගිල යේ නම් සිය පියාපත්බර ඇති වැ මැ ඉගිල යෙයි. එසෙයින් මැ මහණ කායපරිහාරික සිවුරින් කුච්ඡිපරිහාරික පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි. යම් මැ තැනෙකැ යේ ද, මහණ පිරිකර ගෙන මැ යෙයි. හේ මේ ආර්‍ය්‍ය වූ ශීලස්කන්ධයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අනවද්‍යසුඛය විඳියි.

හේ ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ නො වෙයි, අනුබ්‍යඤ්ජන ගන්නේ නො වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත වැ වාස කරන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියය සංවරයට පැමිණෙයි. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට . . . දිවින් රසක් විඳ . . . . කයින් පහසක් පැහැස . . . මනයින් දහමක් දැන නිමිති ගන්නේ නො වෙයි, අනුව්‍යඤ්ජන ගන්නේ නො වෙයි, යම් කරුණෙකින් මනින්ද්‍රියය අසංවෘත වැ වාස කරන මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි, මනින්ද්‍රියය රකියි, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හේ මේ ආර්‍ය්‍යඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වැ අධ්‍යාත්මයෙහි ක්ලෙශාභිෂේක රහිත සුවය විඳී.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පතිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති, බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති, ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති, උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති, විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා සතිපරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති, සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි -පෙ- අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

හේ ඉදිරියට යෑමෙහි පෙරලා ඊමෙහි නුවණින් දන කරනුයේ වෙයි, ඉදිරිය බැලීමෙහි අවට බැලීමෙහි නුවණින් දන කරනුයේ වෙයි, අත්පා හැකිළීමෙහි දිගු කිරීමෙහි නුවණින් දන කරනුයේ වෙයි, සඟළපාසිවුරු දැරීමෙහි නුවණින් දන කරනුයේ වෙයි, කීදීමෙහි පීමෙහි කෑමෙහි ලෙව්මෙහි නුවණින් දන කරනුයේ වෙයි, මලමූ පහ කිරීමෙහි නුවණින් දන කරනුයේ වෙයි, යෑමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි සිනාසීමෙහි තුෂ්ණිම්භාවයෙහි නුවණින් දන කරනුයේ වෙයි.

හේ මේ ආර්‍ය්‍යශීලස්කන්ධයෙනුදු සමන්වාගත වැ මේ ආර්‍ය්‍යඉන්ද්‍රියසංවරයෙනුදු සමන්වාගත වැ මේ ආර්‍ය්‍යස්මෘතිසම්ප්‍රජන්‍යයෙනුදු සමන්වාගත වැ අරණ්‍ය යැ වෘක්‍ෂමූල යැ පර්‍වත යැ කඳුර යැ ගිරිගුහාව යැ සොහොන යැ වනයෙහි දුර සෙනසුන යැ අභ්‍යවකාශ යැ පලාල(පිදුරු) පුඤ්ජයැ යන විවික්ත සෙනසුන භජනය කෙරෙයි. හේ පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරලා ආයේ පලක් අවුළුවා කය සෘජු කොට තබා කම්ඨානාභිමුඛ කොට සිහි එළවා හිඳියි. හේ (කායාදි) ලොකයෙහි අභිධ්‍යාව හැරපියා පහවූ අභිධ්‍යා ඇති සිතින් යුතු වැ වාස කෙරෙයි, අභිධ්‍යායෙන් සිත පිරිසුදු කෙරෙයි. ව්‍යාපාදද්වේෂය හැරපියා අව්‍යාපන්න සිත් ඇති වැ සියලු ප්‍රාණභූතයන් කෙරෙහි අනුකම්පා ඇති වැ වාස කෙරෙයි, ව්‍යාපාදද්වේෂයෙන් සිත පිරිසුදු කෙරෙයි. ථීනමිද්ධය හැරපියා පහවූ ථීනමිද්ධ-යෙන් යුතු වැ ආලොක සංඥ ඇති වැ සිහි ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ වාස කෙරෙයි. ථීනමිද්ධයෙන් සිත පිරිසුදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය හැරපියා අනුද්ධත වැ අධ්‍යාත්ම යෙහි සන්හුන් සිත් ඇති වැ වාස කෙරෙයි, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරෙයි, විචිකිත්සා හැරපියා තරණය කළ විචිකිත්සා ඇති වැ කුසල්දහම්හි කථංකථා (සැක) නැති වැ වාස කෙරෙයි, විචිකිත්සායෙන් සිත පිරිසුදු කෙරෙයි.

හේ සිතට උපක්ලේශ වූ ප්‍රඥව දුර්‍වල කරන මේ පඤ්චනීවරණයන් හැරපියා අකුසල් දහමින් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදය ඇති චිත්තයාගේ එකඟ බව වූ විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්‍ෂා ඇති වැ ද වාස කෙරෙයි. යළි සිහි ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ කයින් සුව ද විඳියි, ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් සඳහා උපෙක්‍ෂා ඇත්තේ යැ, සිහි ඇත්තේ යැ, සුඛවිහාර ඇත්තේ යැ'යි කියත් ද, ඒ තෘතීයධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැල මැ සොම්නස්දොම්නසුන් ගේ අස්තඞ්ගමයෙන් දුක් නැති සුව ඇති උපේක්‍ෂායෙන් උපන් ස්මෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථ ධ්‍යානය උපයා ගෙන වාස කෙරෙයි.

හේ මෙසේ සිත සමාහිත පරිශුද්ධ පර්‍ය්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලෙශ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි තහවුරු බවට පත් කල්හි පූර්‍වේනිවාසානුස්මෘතිඥනයට සිත නමයි. හේ අනේකවිධ පූර්‍වනිවාසය සිහි කෙරෙයි. හේ කෙසේ යැ යත් : "එක් ජාතියකුදු දෙ ජාතියකුදු තුන් ජාතියකුදු . . . නොයෙක් සංවර්ත්තවිවර්ත්තකල්පයනුදු අසෝ තැන්හි මෙ නම් ඇති වීමි, මෙවන් ගෝත්‍ර මෙබඳු පැහැසටහන් මෙබඳු ආහාර ඇති වීමි. මෙබඳු සුවදුක් විඳුනෙම් වීමි. මෙබඳු ආයුෂපර්‍ය්‍යන්ත ඇති වීමි. ඒ මම එයින් ච්‍යුත වූයෙම් මෙහි උපන්මි''යි මෙසේ ආකාර සහිත කොට උද්දේස සහිත කොට නන් වැදෑරුම් පූර්‍වනිවාසය සිහි කෙරේ.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා -පෙ- මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා -පෙ- සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති, සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං වුච්චති බ්‍රාහ්මණ, පුග්ගලො නෙවත්තන්තපො නාත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී'ති.

එවං වුත්තෙ ඝොටමුඛො බ්‍රාහ්මණො ආයස්මන්තං උදෙනං එතදවොච: අභික්කන්තං භො උදෙන, අභික්කන්තං භො උදෙන, සෙය්‍යථාපි භො උදෙන, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා උදෙනෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භවන්තං උදෙනං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං උදෙනො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත'න්ති.

මා ඛො මං ත්වං බ්‍රාහ්මණ, සරණං අගමාසි, තමෙව ත්වං භගවන්තං සරණං ගච්ඡ යමහං සරණං ගතොති.

කහං පන භො උදෙන, එතරහි සො භවං ගොතමො විහරති අරහං සම්මාසම්බුද්ධොති?

පරිනිබ්බුතො ඛො බ්‍රාහ්මණ, එතරහි සො භගවා අරහං සම්මාසම්බුද්ධොති.

හේ මෙසෙයින් සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලේශ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි සත්ත්වයන්ගේ ච්‍යුතිඋපප්‍රාප්ති ඥානයට සිත නමයි. හේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිව ඇසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකියි, කර්මානුරූප වැ යන සත්ත්වයන් දැනගනියි: "මෙ භවත් සත්ත්වයෝ ඒකාන්තයෙන් කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ . . . මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇතියහ. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයට පැමිණියහ. යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්වාගතයහ . . . සම්‍යග් දෘෂ්ටිකර්මසමාදාන ඇතියහ. ඔහු කාබුන් මරණින් මතු සුන්දරගති ඇති ස්වර්ගලෝකයට පැමිණියහ"යි මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවැසින් මියන උපදනා හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුගත සත්ත්වයන් දකී, යථාකර්මොපග සත්ත්වයන් දැනගනී.

හේ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලේශ කල්හි මෘදු වූ කල්හි කර්මාහ වැ සිටි කල්හි අකම්ප්‍යභාවයට පැමිණි කල්හි ආස්‍රවක්ෂයඥානයට සිත නමයි. හෙ 'මෙ (පඤ්චස්කන්ධය) දුකැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ (තෘෂ්ණාසමුදය) දුක් උපදනා කාරණයැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ දුක් නැති කිරීම යැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දැනගනියි. 'මොහු ආස්‍රවයහ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ ආස්‍රවසමුදය'යි ඇති සැටියෙන් දැනගනියි, 'මේ ආස්‍රවනිරෝධ යැ'යි ඇති සැටියෙන් දැනගනියි, 'මෙ ආස්‍රවනිරෝධගාමිනීප්‍රතිපද යැ'යි ඇති සැටියෙන් දැනගනියි. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවයෙනුදු මිදෙයි, භවාස්‍රවයෙනුදු සිත මිදෙයි, අවිද්‍යාස්‍රව-යෙනුදු සිත මිදෙයි. මිදුණු කල්හි 'මිදිණැ'යි ඥානය වෙයි. ජාතිය ක්ෂීණ වූ, බඹසර වැස නිමවන ලදී, කරණී කරනලද, මේ බවට (කළයුතු) අන් කිසෙක් නැතැ'යි දැනගනී. බමුණ, මේ පුද්ගල නො මැ තමා තවනුයේ තමා තවන යෝගයෙහි නො යෙදුණේ මෙරමා නො තවනුයේ මෙරමා තවන යෝගයෙහි නො යෙදුණේ යයි කියනුලැබේ. හේ තමා නො තවනුයේ පරා නො තවනුයේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවියේ සිහිල් වූයේ සුව විඳිනුයේ ශ්‍රේෂ්ඨ වූ ආත්මයෙන් යුතු වැ වාස කෙරේ"යයි.

මෙසේ කී කල්හි ඝෝටමුඛ බ්‍රාහ්මණ ආයුෂ්මත් උදේනහට තෙල කී : "භවත් උදේනයෙනි, ඉතා කාන්ත යැ, භවත් උදේනයෙනි, ඉතා කාන්ත යි. භවත් උදේනයෙනි, යම්සේ යටිහුරු කරනලද්දක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් දැයක් හෝ විවර කරන්නේ ද, මුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකිත්ව'යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එසෙයින් මැ භවත් උදේනයන් විසින් නොයෙක් අයුරින් දහම් පැවැසිණ. තෙල මම් භවත් උදේනයන් දහම් හා භික්සඟන හා සරණ කොට යෙමි, භවත් උදේනයෝ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට ධරත්වා ස්ක්ව"යි.

බමුණ, තෙපි මා නහමක් සරණ යව, මම් යම් කෙනකුන් සරණ ගියෙම් ද, තෙපි එ මැ භාග්‍යවතුන් වහන්සේ සරණ යව'යි.

භවත් උදේනයෙනි, වැළිත් ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ භවත් ගොයුම් ගොතුවෝ දැන් කොහි වැඩවෙසෙත් ද ? යි.

බමුණ, ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ මෙ කල්හි පිරිනිවියහ'යි,

සචෙ හි මයං භො උදෙන, සුණෙය්‍යාම තං භවන්තං ගොතමං දසසු යොජනෙසු, දසපි මයං යොජනානි ගච්ඡෙය්‍යාම තං භවන්තං ගොතමං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං. සචෙ මයං භො උදෙන, සුණෙය්‍යාම තං භවන්තං ගොතමං වීසතියා යොජනෙසු—පෙ—තිංසාය යොජනෙසු-පෙ-චත්තාරීසාය යොජනෙසු-පෙ-පඤ්ඤාසාය යොජනෙසු, පඤ්ඤාසම්පි මයං යොජනානි ගච්ඡෙය්‍යාම තං භවන්තං ගොතමං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං. යොජනසතෙපි මයං භො උදෙන, සුණෙය්‍යාම තං භවන්තං ගොතමං, යොජනසතම්පි මයං ගච්ඡෙය්‍යාම තං භවන්තං ගොතමං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං. යතො ච ඛො භො උදෙන, පරිනිබ්බුතො සො භවං ගොතමො, පරිනිබ්බුතම්පි මයං තං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං උදෙනො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අත්ථි ච මෙ භො උදෙන, අඞ්ගරාජා දෙවසිකං නිච්චභික්ඛං දදාති. තතොහං භොතො උදෙනස්ස එකං නිච්චභික්ඛං දදාමීති.

කිං පන තෙ බ්‍රාහ්මණ, අඞ්ගරාජා දෙවසිකං නිච්චභික්ඛං දදාතීති? පඤ්ච භො උදෙන, කහාපණසතානීති න ඛො නො බ්‍රාහ්මණ, කප්පති ජාතරූපරජතං පටිග්ගහෙතුන්ති.

සචෙ තං භොතො උදෙනස්ස න කප්පති, විහාරං භොතො උදෙනස්ස කාරාපෙස්සාමීති.

සචෙ ඛො මෙ ත්වං බ්‍රාහ්මණ, විහාරං කාරාපෙතුකාමො, පාටලිපුත්තෙ සඞ්ඝස්ස උපට්ඨානසාලං කාරාපෙහීති.

ඉමිනාපහං[1] භොතො උදෙනස්ස භිය්‍යොසොමත්තාය අත්තමනො අභිරද්ධො, යං මං භවං උදෙනො සඞ්ඝෙ දානෙ[2] සමාදපෙති, එසාහං[3] භො උදෙන, එතිස්සා ච නිච්චභික්ඛාය අපරාය ච නිච්චභික්ඛාය පාටලිපුත්තෙ සඞ්ඝස්ස උපට්ඨානසාලං කාරාපෙස්සාමීති.

අථ ඛො ඝොටමුඛො බ්‍රාහ්මණො එතිස්සා ච නිච්චභික්ඛාය අපරාය ච නිච්චභික්ඛාය පාටලිපුත්තෙ සඞ්ඝස්ස උපට්ඨානසාලං කාරාපෙසි. සා එතරහි ඝොටමුඛීති වුච්චතීති.

ඝොටමුඛසුත්තං චතුත්ථං.

---

1. ඉමිනාහං - ස්‍යා, ඉමිනාපහං - PTS.
2. දානං - PTS.
3. සොහං - සීමු.

භවත් උදේනයෙනි, ඉදින් අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ දසයොදනෙක්හි අසන්නමෝ නම් අපි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භවත් ගෞතමයන් දක්නට දසයොදුන් දුර ද යම්හ. භවත් උදේනයෙනි, ඉදින් අපි ඒ භවත් ගෞතමයන් විසියොදනෙක්හි . . . තිස්යොදනෙක්හි . . . . සතලිස්යොදනෙක්හි . . . පනස්යොදනෙක්හි අසන්නමෝ නම් අපි ඒ අර්හත් සම්‍යක්සම්බුද්ධ භවත් ගෞතමයන් දක්නට පනස්යොදුන් දුර ද යම්හ. භවත් උදේනයෙනි, අපි යොදුන් සියයෙක්හිදු ඒ භවත් ගෞතමයන් අසන්නමෝ නම් අපි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භවත් ගෞතමයන් දක්නට සියක් යොදුන් දුර ද යම්හ. භවත් උදේනයෙනි, යම් දවසෙක ඒ භවත් ගෞතමයන් වහන්සේ පිරිනිවියේක් ද, අපි පිරිනිවියා වූ ද ඒ භවත් ගෞතමයන් ධර්මය හා භික්‍ෂුසඞ්ඝයා හා සරණ යම්හ, භවත් උදේනයෝ මා අද පටන් කොට දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට ධරන සේක්වා. භවත් උදේනයෙනි, මට දවස් පතා නිත්‍යභික්ෂා දෙන අඞගරජ ඇත. මම භවත් උදේනහට එයින් එක් නිත්‍යභික්ෂාවක් දෙමි'යි.

බමුණ තොපට අඟුරජ දිනපතා කිනම් නිත්‍ය භික්‍ෂාවක් දේ ද? භවත් උදයනයෙනි, පන්සියක් කහවණු යැ. බමුණ, අපට රන්රිදී පිළිගන්නට කැප නො වෙයි.

ඉදින් භවත් උදයනයන්හට ඒ රන්රිදී නොකැප වේ නම් භවත් උදයනයන්හට වෙහෙරක් කරවමි'යි.

බමුණ, ඉදින් තෙපි මට වෙහෙරක් කරවනු කැමැත්තහු නම් පැළලුප්නුවර සඟනට උපස්ථානශාලාවක් කරව'යි.

මම මෙයිනුදු භවත් උදයනයන්හට බෙහෙවින් සතුටු වීමි. සිත් ඇලවීමි. භවත් උදයනයෝ යම් හෙයෙකින් මා සඟුන් විෂයෙහි දෙන දන්හි සමාදන් කරවත් ද, එහෙයිනි. භවත් උදයනයෙනි, තෙල මම තෙල නිත්‍යභික්‍ෂායෙනුදු අපර නිත්‍යභික්‍ෂායෙකිනුදු පාටලීපුත්‍රයෙහි සඟනට උපස්ථානශාලාවක් කරවමි'යි.

ඉක්බිති ඝොටමුඛ බමුණු තෙල නිත්‍යභික්‍ෂායෙනුදු අන්‍ය නිත්‍යභික්‍ෂායෙකිනුදු පාටලීපුත්‍රයෙහි සඟනට උපස්ථාන ශාලාවක් කරවී. ඒ ශාලාව දැන් 'ඝොටමුඛ'යයි කියනුලැබෙ.

සතර වැනි ඝොටමුඛ සූත්‍ර යි.

2. 5. 5

චඞ්කීසුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන ඕපසාදං[1] නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඕපසාදෙ විහරති උත්තරෙන ඕපසාදං[1] දෙවවනෙ සාලවනෙ. තෙන ඛො පන සමයෙන චඞ්කී බ්‍රාහ්මණො ඕපසාදං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

අස්සොසුං ඛො ඕපසාදකා බ්‍රාහ්මණගහපතිකා : 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං ඕපසාදං අනුප්පත්තො ඕපසාදෙ විහරති උත්තරෙන ඕපසාදං දෙවවනෙ සාලවනෙ

තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො · 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො ඕපසාදකා[2] බ්‍රාහ්මණගහපතිකා ඕපසාදා නික්ඛමිත්වා සඞ්ඝාසඞ්ඝී[3] ගණීභූතා උත්තරෙන මුඛා[4] ගච්ඡන්ති යෙන දෙවවනං සාලවනං. තෙන ඛො පන සමයෙන චඞ්කී බ්‍රාහ්මණො උපරි පාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දසා ඛො චඞ්කී බ්‍රාහ්මණො ඕපසාදකෙ බ්‍රාහ්මණගහපතිකෙ, ඕපසාදා නික්ඛමිත්වා සඞ්ඝාසඞ්ඝී[3] ගණීභූතෙ උත්තරෙන මුඛෙ ගච්ඡන්තෙ යෙන දෙවවනං සාලවනං[5], දිස්වාන ඛත්තං ආමන්තෙසි: කින්නු ඛො භො ඛත්තෙ, ඕපසාදකා බ්‍රාහ්මණගහපතිකා ඕපසාදා නික්ඛමිත්වා සඞ්ඝාසඞ්ඝී[3] ගණීභූතා උත්තරෙන මුඛා[4] ගච්ඡන්ති යෙන දෙවවනං සාලවනන්ති.

අත්ථි භො චඞ්කි, සමණො භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං ඕපසාදං අනුප්පත්තො ඕපසාදෙ විහරති උත්තරෙන ඕපසාදං දෙවවනෙ සාලවනෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො : ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තමෙතෙ භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමන්තී'ති.

---

1. ඕපාසාදං – මජසං, ස්‍යා.
2. ඕජාසාදකා – මජසං, ස්‍යා.
3. සඞ්ඝසඞ්ඝී – ස්‍යා, මජසං.
4. උත්තරෙන මුඛෙ – PTS.
5. උත්තරෙන මුඛං යෙන දෙවවනං සලවනං තෙනුපසඞ්කමන්තෙ – මජසං.

Free Distribution www.aathaapi.org

2. 5. 5

චඞ්කීසූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්සඝන හා සමග කොසොල් දනව්යෙහි සැරිසරා වඩනාසේක් ඕපසාද නම් කොසොල්දනවුවැයි බ්‍රාහ්මණයන්ගේ ගම කරා වැඩිසේකි. භාග්‍යවතුන් වහන්සේ ඒ ඕපසාද බමුණුගම්හි ඕපසාදයට උතුරුදිග දේවවන නම් සල්වෙනෙහි වැඩවාස කෙරෙති. එසමයෙහි චඞ්කී බ්‍රාහ්මණ බහුජනාකීර්ණ වූ තෘණකාෂ්ටොදක සහිත වැ ධාන්‍ය සහිත වැ බ්‍රහ්මදෙය කොට පසේනදි කොසොල්රජු විසින් දෙන ලද රාජදයාද්‍ය වූ රාජභෝග්‍ය වූ ඕපසාද නම් ගමෙහි ඊශ්වර වැ වෙසෙයි.

ඕපසාද ගම්වැසි බමුණුගැහැවියෝ : ''භවත්නි, සැහැකුලපුත් මහණ ගොයුම්ගොතුවෝ සැහැකුලින් නික්ම පැවිදිවැ මහත් වූ භික්සඝන් හා සමග කොසොල් දනව්යෙහි සැරිසරා වඩනාසේක් ඕපසාදයට පැමිණියාහු ඕපසාදබමුණු ගම්හි ඕපසාදයට උතුරුදිගැ දේවවන නම් සල්වෙනෙහි වැඩවෙසෙති''යි ඇසූහ.

ඒ භවත් ගොයුම්ගොතුවන්ගේ වූ කලි මෙබඳු කලණ යසගීහඬෙක් උස් වැ නැඟිණ : ''ඒ භාග්‍යවත්හු මෙ කරුණිනුදු අර්හත්හ සම්‍යක්සම්බුද්ධයහ විද්‍යාවරණ සම්පන්නයහ සුගත්හ ලෝකවිද්හ අනුත්තරපුරුෂදම්‍ය සාරථිහ දෙව්මිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භාග්‍යවත්හ''යි. ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙ ලොව මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තුමූ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති, ඔබ ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ දහම අර්ථ සහිත වැ ව්‍යඤ්ජන සහිත වැ දෙසති, කේවලපරිපූර්ණ වූ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙති. එ බඳු රහතුන්ගේ දැක්ම මනා මැ තූ''යි.

එසඳ ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියෝ ඕපසාදයෙන් නික්ම මුළුමුළු වැ ගොස් ගණ වැ උතුරු දිගට මුහුණලා දේවවන නම් සල්උයන් කරා යෙති. එසමයෙහි චඞ්කී බ්‍රාහ්මණ මතු මහල්හි දිවාශය්‍යාවට එළැඹියේ වෙයි. චඞ්කී බ්‍රාහ්මණ වැළිත් ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියෝ ඕපසාදයෙන් නික්ම මුළුමුළු වැ ගොස් ගණ වැ උතුරුදස බලා දේවවන නම් සල්උයන් කරා යනුවන් දිට. දැක කතු (ඛත්ත) මහඇමැති ඇමැතී : ''භවත් ඛත්තයෙනි, ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියෝ ඕපසාදයෙන් නික්ම මුළුමුළු වැ ගණබැඳී උතුරුදිග බලා දේවවන නම් සල්වනයට කුමට යෙත් ද ?''යි.

භවත් චඞ්කියෙනි, සැහැකුලපුත් සැහැකුලෙන් නික්ම පැවිදි වූ මහණ ගොයුම්ගොතුවෝ ඇත. ඔබ මහත් වූ භික්සඝන් හා සමග කොසොල් දනව්යෙහි සැරිසරනසේක් ඕපසාද නම් බමුණුගමට පැමිණියාහු ඕපසාද බමුණුගම්හි ඕපසාදයට උතුරුදිගැ දේවවන නම් සල්වෙනෙහි වැඩවෙසෙති. ඒ භවත් ගොයුම් ගොතුවන්ගේ මෙවන් කලණ යසගීහඬෙක් උස් වැ නැඟිණ : ''මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ සම්‍යක්සම්බුද්ධයහ විද්‍යාවරණ සම්පන්නයහ සුගත්හ ලෝකවිද්හ අනුත්තරපුරුෂදම්‍යසාරථිහ දෙව්මිනිසුනට ශාස්තෘහ බුද්ධයහ භාග්‍යවත්හ''යි. තුලුහු ඒ භවත් ගොයුම්ගොතුවන් දක්නට එළැඹෙති''යි.

Free Distribution www.aathaapi.org

තෙන හි භො ඛත්තෙ, යෙන ඔපසාදකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා ඔපසාදකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි: චඞ්කී භො බ්‍රාහ්මණො එවමාහ: ආගමෙන්තු කිර භවන්තො, චඞ්කීපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. එවං භොති ඛො සො ඛත්තො[1] චඞ්කිස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන ඔපසාදකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ඔපසාදකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච: චඞ්කී භො බ්‍රාහ්මණො එවමාහ: ආගමෙන්තු කිර භවන්තො, චඞ්කීපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති.

තෙන ඛො පන සමයෙන නානාවෙරජ්ජකානං බ්‍රාහ්මණානං පඤ්චමත්තානි බ්‍රාහ්මණසතානි ඔපසාදෙ පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ බ්‍රාහ්මණා චඞ්කී කිර බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන චඞ්කී බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා චඞ්කිං බ්‍රාහ්මණං එතදවොචුං: සච්චං කිර භවං චඞ්කී සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති.

එවං ඛො මෙ භො හොති, අහම්පි සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සාමීති.

මා භවං චඞ්කී සමණං ගොතමං දස්සනාය උපසඞ්කමි. න අරහති භවං චඞ්කී සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණොත්වෙව ගොතමො අරහති භවන්තං චඞ්කිං දස්සනාය උපසඞ්කමිතුං. භවං හි චඞ්කී උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, යම්පි භවං චඞ්කී උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනාපඞ්ගෙන න අරහති භවං චඞ්කී සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණො ත්වෙව ගොතමො අරහති භවන්තං චඞ්කිං දස්සනාය උපසඞ්කමිතුං. භවං හි චඞ්කී අඩ්ඪො මහද්ධනො මහාභොගො-පෙ-භවං හි චඞ්කී තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො-පෙ-භවං හි චඞ්කී අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී[2] අඛුද්දාවකාසො දස්සනාය-පෙ-භවං හි චඞ්කී සීලවා වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො-පෙ-භවං හි චඞ්කී කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගළාය අත්ථස්ස විඤ්ඤාපනියා-පෙ-භවං හි චඞ්කී බහුන්නං ආචරියපාචරියො තීණි මාණවකසතානි මන්තෙ වාචෙති-පෙ-භවං හි චඞ්කී රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-භවං හි චඞ්කී බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-භවං හි චඞ්කී ඔපසාදං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා[3] පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. යම්පි භවං චඞ්කී ඔපසාදං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං ඉමිනාපඞ්ගෙන න අරහති භවං චඞ්කී සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණොත්වෙව ගොතමො අරහති භවන්තං චඞ්කිං දස්සනාය උපසඞ්කමිතු'න්ති.

1. ඛත්තා - PTS. 2. බ්‍රහ්මවච්ඡසී - සීමු, මජසං, ස්‍යා. 3. රඤ්ඤො - PTS.

එසේ වී නම් භවත් කතුවෙනි, ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියන් කරා එළැඹෙව, එළැඹ ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියනට මෙසේ කියව : ''භවත්නි, චඞ්කීබ්‍රාහ්මණ මෙසේ කියයි : 'භවත්හු මොහොතක් බලත්වා, චඞ්කීබ්‍රාහ්මණ ද මහණ ගොයුම් ගොතුවන් දක්නට එළැඹෙන්නේ ල''යි. එසේ යැ භවත්නි,යි ඒ කතු මහඇමැති චඞ්කිබ්‍රාහ්මණහට පිළිවදන් දී ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියන් කරා එළැඹියේ. එළැඹ ඕපසාද බමුණුගම්වැසි බමුණුගැහැවියනට තෙල කී : ''භවත්නි චඞ්කීබ්‍රාහ්මණ මෙසේ කියයි : භවත්හු මොහොතක් බලත්වා, චඞ්කිබ්‍රාහ්මණ ද මහණ ගොයුම්ගොතුවන් දක්නට එළැඹෙත් ල''යි.

එසමයෙහි වනාහි නොයෙක් වෙන් වෙන් රාජ්‍ය සම්බන්ධී බමුණන් අතුරෙහි පන්සියක් පමණ බමුණෝ ඕපසාද බමුණුගම්හි කිසි කටයුත්තෙකින් වෙසෙති, ඒ බමුණෝ ''චඞ්කි බ්‍රාහ්මණ ශ්‍රමණ ගෞතමයන් දක්නට එළැඹෙන්නේ ල''යි ඇසූහු. එ සඳ එ බමුණෝ චඞ්කි බ්‍රාහ්මණ කරා එළැඹියහ. එළැඹ චඞ්කීබ්‍රාහ්මණහට තෙල කීහු : ''සැබෑවෙක් ද, භවත් චඞ්කීබ්‍රාහ්මණ මහණ ගොයුම් ගොතුවන් දක්නට එළැඹෙන්නේ ල?''යි.

භවත්නි, මට මෙසේ සිත් වෙයි: ''මම ද මහණ ගොයුම් ගොතුවන් දක්නට එළැඹෙන්නෙමි''යි.

භවත් චඞ්කි මහණ ගොයුමන් දක්නට නහමක් එළැඹෙව. භවත් චඞ්කි මහණ ගොයුමන් දක්නට එළැඹෙන්නට නො නිස්ස. මහණ ගොයුමෝ මැ භවත් චඞ්කි දක්නට එළැඹෙන්නට නිසියහ. භවත් චඞ්කි මවුපසින් ද පියපසින් ද'යි දෙපසින් සුජාත මැ යැ, සත් වැනි මුත්තායුගය තෙක් පිරිසුදු මව්කුස් ඇතියෙ යැ, ජාතිවාදයෙන් උපක්‍රොශ නො කරන ලද්දෙ යැ, බැහැර නො ලන ලද්දෙ යැ. යම් හෙයෙකින් භවත් චඞ්කි මවුපසින් ද පියපසින් ද'යි දෙපසින් සුජාත වේ ද, සත් වැනි මුත්තායුගය තෙක් සංශුද්ධග්‍රහණි ඇතියේ ද, ජාතිවාදයෙන් උපක්‍රොශ නො කරන ලද්දේ ද, බැහැර නො ලන ලද්දෙ ද, මෙ කරුණිනුදු භවත් චඞ්කි මහණගොයුමන් දක්නට එළැඹෙන්නට නො නිස්ස. මහණ ගොයුම්හු මැ භවත් චඞ්කි දක්නට එළැඹෙන්නට නිසියහ. භවත් චඞ්කි ආඪ්‍ය යැ, මහත් ධන ඇතියේ යැ, මහත් භෝග ඇතියෙ යැ . . . . භවත් චඞ්කි නිඝණ්ඩු කේටුභ සහිත ශික්‍ෂානිරුක්ති සහිත ඉතිහාසය පස් වනු කොට ඇති ත්‍රිවෙදයෙහි පාරයට ගියේ යැ. පද හදරනුයෙ යැ, ව්‍යාකරණ හදරනුයෙ යැ ලෝකායත මහාපුරුෂ ලක්ෂණයෙහි පරිපූරකාරී යැ . . . භවත් චඞ්කි විශිෂ්ට රූප ඇතියේ යැ දකුම්කලු යැ ප්‍රසාද එළවනුයේ යැ පරම වූ වර්‍ණසෞන්‍දර්‍ය්‍යයෙන් සමන්වාගත යැ. ශ්‍රෙෂ්ඨවර්‍ණ (රන්වන්) ඇතියෙ යැ මහබඹුගේ සිරුරුපැහැ ඇතියේ යැ (භවත්හුගේ සිරුර) දක්නා අවකාශය කුඩා නො වෙයි . . . . භවත් චඞ්කි සිල්වත් යැ වැඩුණුසිල් ඇතියේ යැ වෘද්ධශීලයෙන් සමන්වාගත යැ . . . භවත් චඞ්කි සුන්‍දරවචන ඇතියේ යැ මධුරවාක්කරණ ඇතියේ යැ පලිබෝධ රහිත වූ කෙළතොලු නො වූ අරුත් හැඟවීමෙහි නිසි පෞරවචනයෙන් සමන්වාගත යැ . . . භවත් චඞ්කි බොහෝ දෙනාට ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍ය වෙයි. තුන් සියක් මාණවකයනට මන්ත්‍රහදරවයි. . . . . භවත් චඞ්කි පසේනදි කොසොල් රජහු විසින් සත්කෘත යැ ගරුකෘත යැ මානිත යැ පූජිත යැ අපචායන කරන ලද . . . භවත් චඞ්කි පොක්ඛරසාති බමුණු විසින් සත්කාර ගරුකාර මානන පූජා අපචායන කරන ලද . . . . භවත් චඞ්කි පසේනදි කොසොල් රජහු විසින් තෘණකාෂ්ටොදක සහිත වැ ධාන්‍ය සහිත වැ බ්‍රහ්මදේය කොට දෙනලද රාජදායාද්‍ය වූ රාජභොග්‍ය වූ බහුජනාකීර්‍ණ ඕපසාද බමුණුගම්හි වෙසෙයි. යම් හෙයෙකින් භවත් චඞ්කි පසේනදි කොසොල් රජහු විසින් තෘණකාෂ්ටොදක සහිත වැ ධාන්‍ය සහිත වැ බ්‍රහ්මදේය කොට දෙන ලද රාජදායාද්‍ය වූ රාජභෝග්‍ය වූ බහුජනාකීර්‍ණ ඕපසාද බමුණුගම්හි වෙසේ ද, මෙ කරුණිනුදු භවත් චඞ්කි ශ්‍රමණගෞතමයන් දක්නට එළැඹෙන්නට නො නිස්ස. ශ්‍රමණ ගෞතමයෝ මැ භවත් චඞ්කිහු දක්නට එළැඹෙන්නට නිසියහ''යි.

එවං වුත්තෙ චඞ්කී බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: තෙන හි භො, මමම්පි සුණාථ යථා මයමෙව අරහාම තං භවන්තං ගොතමං[1] දස්සනාය උපසඞ්කමිතුං. න ත්වෙව අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං.

සමණො ඛලු භො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භො සමණො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, ඉමිනාපඞ්ගෙන න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං, අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං.

සමණො ඛලු භො ගොතමො පහූතං හිරඤ්ඤසුවණ්ණං ඔහාය පබ්බජිතො භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච-පෙ-

සමණො ඛලු භො ගොතමො දහරො සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අගාරස්මා අනගාරියං පබ්බජිතො-පෙ-.

සමණො ඛලු භො ගොතමො අකාමකානං මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො -පෙ-

සමණො ඛලු භො ගොතමො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී[2] අඛුද්දාවකාසො දස්සනාය-පෙ-

සමණො ඛලු භො ගොතමො සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො-පෙ-

සමණො ඛලු භො ගොතමො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගළාය අත්ථස්ස විඤ්ඤාපනියා-පෙ-

සමණො ඛලු භො ගොතමො බහූනං ආචරියපාචරියො-පෙ-

සමණො ඛලු භො ගොතමො ඛීණකාමරාගො විගතචාපල්ලො[3] -පෙ-

සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤාය පජාය-පෙ-

සමණො ඛලු භො ගොතමො උච්චාකුලා පබ්බජිතො අසම්භින්නා ඛත්තියකුලා-පෙ-

---

1. සමණං ගොතමං - ස්‍යා. 2. බ්‍රහ්මවච්ඡසී - සීමු, මජසං, ස්‍යා.
3. විගතපපඤ්චො - සීමු.

මෙසේ කී කල්හි චඞ්කීබ්‍රාහ්මණ ඒ බමුණනට මෙසේ කී 'එසේ වී නම් භවත්නි, යම්සේ අපි ම ඒ භවත් ගොයුම්ගොතුවන් දක්නට එළැඹෙන්නට නිසියමෝ ද, ඒ භවත් ගොයුම්ගොතුවෝ අප දක්නට එළැඹෙන්නට නො නිසි වෙත් ද එසේ වූ මබසුදු අසව.

භවත්නි, මහණ ගොයුම්හු වූකලි මව්පසින් ද පියපසින් ද'යි දෙපසින් සුජාතයහ, සත් වැනි මුත්තායුගය තෙක් සංශුද්ධමාතෘකුක්ෂි ඇතියහ, ජාතිවාදයෙන් බැහැර නො ලනලද උපක්‍රෝශ නො කරන ලද. මෙ කරුණිනුදු ඒ භවත් ගෞතමයෝ අප දක්නට එළැ-ඹෙන්නට නො නිසියහ, වැළිත් අපි මැ ඒ භවත් ගෞතමයන් දක්නට එළැඹෙන්නට නිසියම්හ.

භවත්නි, මහණ ගොයුම්හු වූකලි භූමිගත වූ ත් ආකාශගත වූ ත් බොහෝ වූ හිරණ්‍යසුවර්ණ හැරපියා පැවිදි වූහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි තරුණ වූවාහු මැ මනා කළුකෙහෙ ඇතියාහු භද්‍රයෞවන යෙන් සමන්වාගත වූවාහු පළමු වයස්හි ගිහිගෙන් නික්ම සසුන් වන්හ . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි නො කැමැති මව්පියන් කඳුළු වගුළමුහුණු ඇති වැ හඬද්දී කෙස්මස් බහා කහවත් හැද පෙරෙවැ ගෙන් නික්ම සසුන් වන්හ. . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි විශිෂ්ට රූප ඇතියහ දර්ශනීයහ ප්‍රසාද එළවනුවහ පරම වර්ණසෞන්දර්යයෙන් සමන්වාගතයහ, රන්වන්හ මහබඹහු බඳු සිරුරු ඇතියහ කුඩා නො වූ දර්ශනාවකාශ ඇතියහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි සිල්වත්හ ආර්යශීල ඇතියහ කුශල (නිරවද්‍ය) ශීල ඇතියහ කුශලශීලයෙන් සමන්වාගතයහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි කලණබස් ඇතියහ මධුර වාක්කරණ (උසුරුවීම්ගොස) ඇතියහ, පරිබාධ රහිත වූ කෙළතොලු නො වූ අරුත් හඟවනු සමත් පෞරජනයන්ගේ වචනයට බඳු වචනයෙන් සමන්වාගතයහ . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි බොහෝ දෙනාහට ආචාර්යප්‍රාචාර්යයහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු ක්‍ෂය කළ කාමරාග ඇතියහ පහවූ චපල බව ඇතියහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි කර්මවාදීයහ ක්‍රියාවාදීයහ නවලොවුතුරු දහම් පෙරටු කොට ඇතියහ බ්‍රාහ්මණප්‍රජාව පෙරටු කොට ඇතියහ . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි අමිශ්‍ර ක්‍ෂත්‍රියකුල සඞ්ඛ්‍යාත උසස්කුලෙන් නික්ම පැවිදි වූවහ . . . .

සමණො ඛලු භො ගොතමො අඩ්ඪකුලා[1] පබ්බජිතො මහද්ධනා මහාභොගා-පෙ-

සමණං ඛලු භො ගොතමං තිරොරට්ඨා තිරොජනපදා සම්පුච්ඡිතුං ආගච්ඡන්ති-පෙ-

සමණං ඛලු භො ගොතමං අනෙකානි දෙවතාසහස්සානි පාණෙහි සරණං ගතානි-පෙ-

සමණං ඛලු භො ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති-පෙ-

සමණො ඛලු භො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො-පෙ-

සමණං ඛලු භො ගොතමං රාජා මාගධො සෙනියො බිම්බිසාරො සපුත්තදාරො පාණෙහි සරණං ගතො-පෙ-

සමණං ඛලු භො ගොතමං රාජා පසෙනදි කොසලො සපුත්තදාරො පාණෙහි සරණං ගතො-පෙ-

සමණං ඛලු භො ගොතමං බ්‍රාහ්මණො පොක්ඛරසාති සපුත්තදාරො පාණෙහි සරණං ගතො-පෙ-

සමණො ඛලු භො ගොතමො ඔපසාදං අනුප්පත්තො ඔපසාදෙ විහරති උත්තරෙන ඔපසාදං දෙවවනෙ සාලවනෙ. යෙ පන ඛො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අම්හාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති. අතිථී නො තෙ හොන්ති. අතිථී ඛො පනම්හෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා, යම්පි භො සමණො ගොතමො ඔපසාදං අනුප්පත්තො ඔපසාදෙ විහරති උත්තරෙන ඔපසාදං දෙවවනෙ සාලවනෙ. අතිථි අස්මාකං[2] සමණො ගොතමො. අතිථි ඛො පනම්හෙහි සක්කාතබ්බො ගරුකාතබ්බො මානෙතබ්බො පූජෙතබ්බො. ඉමිනාපඞ්ගෙන[3] න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. එත්තකං ඛො අහං භො තස්ස භොතො ගොතමස්ස වණ්ණං පරියාපුණාමි. න ච සො භවං ගොතමො එත්තකවණ්ණො, අපරිමාණවණ්ණො හි සො භවංගොතමො. එකමෙකෙනපි භො, අඞ්ගෙන සමන්නාගතො න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. තෙන හි භො සබ්බෙව මයං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සාමා'ති.

1. අද්ධකුලා - ස්‍යා.
2. අතිථිම්හාකං - මජ්සං. / අතිථිඅස්මාකං - PTS.
3. ඉමිනාපඞ්ගෙන භො - සීමු.

භවත්නි, මහණ ගොයුම්හු වූකලි මහද්ධන ඇති මහද්භෝග ඇති ආඪ්‍යකුලයෙන් නික්ම පැවිදි වූවහ . . . .

භවත්නි, මහණ ගොයුමන් වූකලි (පැන) පුළුවුස්නට පරරටින් පරදනාවියෙන් (ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි පණ්ඩිතයෝ) එති. . . . .

භවත්නි, මහණ ගොයුමන් වූකලි නොයෙක් දහස් ගණන් දෙවියෝ දිවිහිමියෙන් සරණ ගියහ . . . . .

භවත්නි, මහණ ගොයුම්ගොතුවන්ගේ වූකලි මෙ බඳු කලණ යසගී උස් වැ නැඟිණ : "මෙ කරුණිනුදු ඒ භාග්‍යවත්හු අර්හත්හ සම්‍යක් සම්බුද්ධයහ විද්‍යාචරණ සමපන්නයහ සුගත්හ ලොකවිද්හ අනුත්තරපුරුෂදම්‍යසාරථියහ දෙව්මිනිසුනට ශාස්තෲවහ බුද්ධයහ භගවත්හ"යි. . . . .

භවත්නි, මහණ ගොයුම්හු වූකලි දෙතිස් මහපුරිස්ලකුණින් සමන්වාගතයහ . . . .

භවත්නි, මහණ ගොයුමන් මගධෙශ්වර ශ්‍රේනිය බිම්බිසාර රජ පුත්‍රදරාවන් සහිත වැ දිවිහිම් වැ සරණ ගියේ යි . . .

භවත්නි, මහණ ගොයුමන් වූකලි පසේනදි කොසොල් රජ පුත්‍රදරාවන් සහිත වැ දිවිහිම් කොට සරණ ගියේ යි . . . .

භවත්නි, මහණ ගොයුමන් වූකලි පොක්ඛරසාති බමුණු පුත්‍රදරාවන් සහිත වැ දිවිහිමියෙන් සරණ ගියේ යි . . .

භවත්නි, මහණ ගොයුම්ගොතුවෝ ඕපසාද බමුණුගමට පැමිණියාහු ඕපසාදයෙහි ඕපසාදයට උතුරුදික්හි දේවවන නම් සල්වෙනෙහි වැඩවෙසෙති. යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි අපගේ ගම්කෙතට එත් ද, ඔහු අපට ආගන්තුක වෙති, ආගන්තුකයෝ වැළිත් අප විසින් සත්කාර ගරුකාර මානන පූජා කළයුත්තාහ. භවත්නි, යම් හෙයෙකින් මහණ ගොයුම්ගොතුවෝ ඕපසාද බමුණුගමට වැඩියාහු ඕපසාද බමුණුගමැ ඕපසාදයට උතුරුදස දේවවන නම් සල්වෙනෙහි වැඩවෙසෙත් ද, එහෙයින් මහණ ගොයුම්හු අපට අමුතුවහ. අමුතුවෝ වැළිත් අප විසින් සත්කාර ගරුකාර මානන පූජා කළයුත්තාහ. මෙ කරුණිනුදු ඒ භවත් ගෞතමයන් වහන්සේ අප දක්නට එළැඹෙන්නට නො නිසියහ. අපි මැ වැළිත් ඒ භවත් ගෞතමයන් දක්නට එළැඹෙන්නට නිසියම්හ. භවත්නි, මම ඒ භවත් ගෞතමයන්ගේ මෙතෙක් මැ ගුණ දනිමි. ඒ භවත් ගොයුම්ගොතුවෝ මෙතෙක් මැ ගුණ ඇතියාහු නො ද වෙති. ඒ භවත් ගොයු-මාණෝ අපමණ ගුණ ඇතියාහු මැ යි. භවත්නි, එකෙකි අඟිනුදු සමන්වාගත වූ ඒ භවත් ගොයුම්ගොතුවෝ අප දක්නට එළැඹෙන්නට නො නිසියහ. අපි මැ වැළිත් ඒ භවත් ගොයුම්ගොතුවන් දක්නට එළැඹෙන්නට නිසියම්හ, එසේ වී නම් භවත්නි, අපි හැමදෙ-දෙනමෝ මහණ ගොයුමන් දක්නට එළැඹෙම්හ"යි.

අථ බො චඞ්කී බ්‍රාහ්මණො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. තෙන බො පන සමයෙන භගවා වුද්ධෙහි වුද්ධෙහි[1] බ්‍රාහ්මණෙහි සද්ධිං කිඤ්චි කිඤ්චි කථං සාරණීයං වීතිසාරෙත්වා නිසින්නො හොති.

තෙන බො පන සමයෙන කාපටිකො[2] නාම මාණවො දහරො වුත්තසිරො සොළසවස්සුද්දෙසිකො ජාතියා, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො, තස්සං පරිසායං නිසින්නො හොති. සො වුද්ධානං බ්‍රාහ්මණානං භගවතා සද්ධිං මන්තයමානානං අන්තරන්තරා කථං ඔපාතෙති. අථ බො භගවා කාපටිකං මාණවං අපසාදෙසි: මායස්මා භාරද්වාජො වුද්ධානං වුද්ධානං බ්‍රාහ්මණානං මන්තයමානානං අන්තරන්තරා කථං ඔපාතෙතු[3], කථාපරියොසානං ආයස්මා භාරද්වාජො ආගමෙතූ'ති. එවං වුත්තෙ චඞ්කී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: මා භවං ගොතමො කාපටිකං මාණවං අපසාදෙසි, කුලපුත්තො ච කාපටිකො මාණවො බහුස්සුතො ච කාපටිකො මාණවො කල්‍යාණවාක්කරණො ච කාපටිකො මාණවො පණ්ඩිතො ච කාපටිකො මාණවො, පහොති ච කාපටිකො මාණවො භොතා ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතු'න්ති.

අථ බො භගවතො එතදහොසි : 'අද්ධා බො කාපටිකස්ස මාණවස්ස තෙවිජ්ජකෙ පාවචනෙ කථං[4] භවිස්සති. තථා හි නං බ්‍රාහ්මණා සම්පුරෙක්ඛරොන්ති'ති. අථ බො කාපටිකස්ස මාණවස්ස එතදහොසි : 'යදා මෙ සමණො ගොතමො චක්ඛුනා චක්ඛුං උපසංහරිස්සති, අථාහං සමණං ගොතමං පඤ්හං පුච්ඡිස්සාමී'ති. අථ බො භගවා කාපටිකස්ස මාණවස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය යෙන කාපටිකො මාණවො තෙන චක්ඛූනි උපසංහාසි. අථ බො කාපටිකස්ස මාණවස්ස එතදහොසි : 'සමන්නාහරති බො මං සමණො ගොතමො, යන්නූනාහං සමණං ගොතමං පඤ්හං පුච්ඡෙය්‍ය'න්ති. අථ බො කාපටිකො මාණවො භගවන්තං එතදවොච : 'යමිදං භො ගොතම, බ්‍රාහ්මණානං පොරාණානං මන්තපදං ඉතිහිතිහ පරම්පරාය පිටකසම්පදාය, තත්ථ ච බ්‍රාහ්මණා එකංසෙන නිට්ඨං ගච්ඡන්ති. 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති, ඉධ භවං ගොතමො කිමාහා'ති.

කිං පන භාරද්වාජ, අත්ථි කොචි බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යො එවමාහ : 'අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි : 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති

නො හිදං භො ගොතම.

කිං පන භාරද්වාජ, අත්ථි කොචි බ්‍රාහ්මණානං එකාචරියොපි එකාචරියපාචරියොපි යාව සත්තමා ආචරියමහයුගාපි, යො එවමාහ : අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

නොහිදං භො ගොතම.

---

1. වුඩ්ඪෙහි වුඩ්ඪෙහි - ස්‍යා.
2. කාපදිකො - ස්‍යා. කාපඨිකො - PTS.
3. ඔපාතෙතුං - සීමු. ඔපාතෙසි - ස්‍යා.
4. කථං - සීමු, කථා - මජසං.

එසඳ චඞ්කී බ්‍රාහ්මණ මහත් වූ බමුණුගණයා හා සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී. සතුටු වියයුතු සාරාණීය කථා කොට නිමවා එකත්පස් වැ හින. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහලු මහලු බමුණන් හා සමග කිසි කිසි සාරාණීයකථා කොට නිමවා වැඩහුන්නාහු වෙති.

එසමයෙහි තරුණ වූ බහාලූ කෙහෙ ඇති උපතින් සොළොස්වස් පමණ ඇති, නිඝණ්ඩු කේටුභ සහිත ශික්ෂානිරුක්ති සහිත ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවේදයෙහි පාරයට ගිය පද හදරන ව්‍යාකරණ හදරන ලෝකායතමහාපුරුෂලක්ෂණයෙහි අනූන වූ කාපටික නම් මාණව එ පිරිස්හි හුන්නේ වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේ හා සමග මන්ත්‍රණ කරන මහලු බමුණනට අතුරතුරෙහි කථා බහාලයි. එසඳ බුදුහු "ආයුෂ්මත් භාරද්වාජ මන්ත්‍රණ කරන මහලු බමුණනට අතුරතුරෙහි නහමක් කථා බහාලව. ආයුෂ්මත් භාරද්වාජ කථා පර්‍ය්‍යවසානය බලව"යි කාපටික මණවු බැහැර කළහ. මෙසේ වදළ කල්හි චඞ්කී බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙලෙස තෙල සැළ කෙළේ : "භවත් ගෞතමයන් වහන්සේ කාපටික මාණව නහමක් බැහැර ලන සේක්වා. කාපටික මාණව කුලපුත්‍ර ද වෙයි, කාපටික මාණව බහුශ්‍රැත ද වෙයි, කාපටික මාණව කල්‍යාණවාක්කරණ ද වෙයි, කාපටික මාණව පණ්ඩිත ද වෙයි, කාපටික මාණව මේ වචනයෙහි භවත් ගොයුම් ගොතුවන් හා සමග ප්‍රතිමන්ත්‍රණ කරන්නට පොහොනේ යැ"යි.

එසඳ භාග්‍යවතුන් වහන්සේට තෙල සිත් වී : ඒකාන්තයෙන් මැ කාපටික මාණව ත්‍රිවේද සඞ්ඛ්‍යාත ප්‍රවචනය හදළේ වන. එසේ මැ යි බ්‍රාහමණයෝ ඔහු පෙරටු කොට හැසිරෙති"යි. එසඳ කාපටික මාණවහට තෙල සිත් වී : යම් කලෙක ශ්‍රමණ ගෞතම ඔබගේ ඇසින් මාගේ ඇස බලා ද එකල්හි මම් ශ්‍රමණ ගෞතමයන් අතින් පැන පුළුවුස්මි"යි. ඉක්බිති බුදුහු තමන් සිතින් කාපටික මාණවගේ චිත්තපරිවිතර්කය දැන කාපටික මාණව කරා දෙනුවන් එළැවූහ. එසඳ කාපටික මාණවහට තෙල සිත් වී : "මහණ ගොයුම්හු මා මෙනෙහි කෙරෙති, මම් මහණ ගොයුම් ගොතුවන් අතින් පැන පුළුවුස්නෙම් නම් මනා මැ නු"යි. ඉක්බිති කාපටික මාණව භාග්‍යවතුන් වහන්සේට තෙල කී : "භවත් ගෞතමයන් වහන්ස, පැරැණි බමුණන්ගේ පරම්පරායෙහි පිටකසම්ප්‍රදායයෙහි 'මෙසේ මෙසේ වී යැ'යි යම් මන්ත්‍රපදයෙක් වේ ද, එහිදු බ්‍රාහ්මණයෝ 'මේ මැ සත්‍ය යැ, තදන්‍යය සිස් යැ'යි ඒකාන්තයෙන් නිෂ්ඨාවට යෙති. මෙහි ලා භවත් ගෞතමයෝ කුමක් කියත් ද?"යි.

කිම භාරද්වාජයෙනි, බමුණන් අතුරෙහි යමෙක් "මම තෙල කරුණ දනිමි, මම තෙල කරුණ දකිමි, මේ මැ සත්‍ය යැ අන්‍යය සිස් යැ'යි මෙසේ කියා නම් එබඳු කිසි එකද බමුණෙක් ඇද්ද?

මේ නො වේ මැ යි භවත් ගෞතමයෙනි.

කිම භාරද්වාජයෙනි, බමුණන් අතුරෙහි යමෙක් "මම තෙල කරුණ දනිමි. මම තෙල කරුණ දකිමි, මේ මැ සත්‍ය යැ සෙස්ස සිස් යැ'යි මෙසේ කියා නම් එබඳු කිසි එකද ආචාර්‍ය්‍ය-යෙක් එකද ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යයෙක් සත් වැනි ප්‍රාචාර්‍ය්‍යයුගය හිම් කොට පවා ඇද්ද?

මේ නො වේ මැ යි භවත් ගොයුමාණෙනි.

කිං පන භාරද්වාජ, යෙපි තෙ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං[1] : 'අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. තෙපි එවමාහංසු : 'මයමෙතං ජානාම, මයං මෙතං පස්සාම : 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

නො හිදං භො ගොතම.

ඉති කිර භාරද්වාජ, නත්ථි කොචි බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යො එවමාහ : 'අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. නත්ථි කොචි බ්‍රාහ්මණානං එකාචරියොපි එකාචරියපාචරියොපි යාව සත්තමා ආචරියමහයුගා, යො එවමාහ : 'අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. යෙපි තෙ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො. යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං : 'අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු' තෙපි න එවමාහංසු : 'මයමෙතං ජානාම, මයමෙතං පස්සාම, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

'සෙය්‍යථාපි භාරද්වාජ, අන්ධවෙණි[2] පරම්පරාසංසත්තා පුරිමොපි න පස්සති, මජ්ඣිමොපි න පස්සති, පච්ඡිමොපි න පස්සති. එවමෙව ඛො භාරද්වාජ, අන්ධවෙණූපමං මඤ්ඤෙ බ්‍රාහ්මණානං භාසිතං සම්පජ්ජති. පුරිමොපි න පස්සති, මජ්ඣිමොපි න පස්සති, පච්ඡිමොපි න පස්සති. තං කිං මඤ්ඤසි භාරද්වාජ, නනු එවං සන්තෙ බ්‍රාහ්මණානං අමූලිකා සද්ධා සම්පජ්ජතී'ති.

න ඛොත්ථ[3] භො ගොතම, බ්‍රාහ්මණා සද්ධායෙව පයිරුපාසන්ති, අනුස්සවාපෙත්ථ බ්‍රාහ්මණා පයිරුපාසන්තී'ති.

පුබ්බෙව ඛො ත්වං භාරද්වාජ, සද්ධං අගමාසි, අනුස්සවං ඉදානි වදෙසි, පඤ්ච ඛො ඉමෙ භාරද්වාජ, ධම්මා දිට්ඨෙව ධම්මෙ ද්විධා විපාකා. කතමෙ පඤ්ච : සද්ධා රුචි අනුස්සවො ආකාරපරිවිතක්කො දිට්ඨිනිජ්ඣානක්ඛන්ති. ඉමෙ ඛො භාරද්වාජ, පඤ්ච ධම්මා දිට්ඨෙව ධම්මෙ ද්විධා විපාකා. අපි ච භාරද්වාජ, සුසද්දහිතං යෙව හොති, තඤ්ච හොති රිත්තං තුච්ඡං මුසා, නො චෙපි සුසද්දහිතං හොති, භූතං තච්ඡං අනඤ්ඤථා. අපි ච භාරද්වාජ, සුරුචිතං යෙව හොති. -පෙ- ස්වානුස්සුතං යෙව හොති. -පෙ- සුපරිවිතක්කිතං යෙව හොති. -පෙ- සුනිජ්ඣායිතං යෙව හොති. තඤ්ච හොති රිත්තං තුච්ඡං මුසා, නො චෙපි සුනිජ්ඣායිතං හොති, භූතං තච්ඡං අනඤ්ඤථා. සච්චමනුරක්ඛතා භාරද්වාජ, විඤ්ඤුනා පුරිසෙන නාලමෙත්ථ එකංසෙන නිට්ඨං ගන්තුං 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

1. සෙය්‍යථීදං - මජසං. 2. අන්ධවෙණු - සීමු.
3. න ඛෙවත්ථ - සීමු, මජසං, ස්‍යා.

කිම භාරද්වාජයෙනි, මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍රප්‍රවර්තක වූ බමුණන්ගේ යම් පූර්ව ඍෂි කෙනෙක් ඇද්ද, යම් කෙනකුන් විසින් හදළ වාචනා කළ රැස් කොට තැබූ පෞරාණමන්ත්‍රපදයක් මෙකලැ බමුණෝ (ඔවුන් විසින්) ගයනලද්ද අනුව ගයත් ද ඔවුන් අනුව බෙණෙත් ද, බණනලද්ද අනුව බෙණෙත් ද, වාචනා කරන ලද්ද අනුව වාචනා කෙරෙද්ද ඔහු යි. යළි ඔහු කවරහයත් : අට්ටක යැ වාමක යැ වාමදේව යැ වෙස්සාමිත්ත යැ යමතග්ගී යැ අඞ්ගීරස යැ භාරද්වාජ යැ වාසෙට්ඨ යැ කස්සප යැ භගු යැ යන මොහු යි. ඔහුදු 'තෙල කරුණ අපි දනුම්හ, තෙල කරුණ අපි දකුම්හ. මේ මැ සත්‍ය යැ, තදන්‍යය සිස් යැ'යි කීහු ද?

මෙ කරුණ නො වේ මැ යි භවත් ගොයුමාණෙනි.

මෙසෙයින් භාරදවාජයෙනි, බමුණන් කෙරෙහි යමෙක් 'මෙම තෙල කරුණ දනිමි, මම තෙල කරුණ දකිමි, මේ මැ සත්‍ය යැ, අන්‍යය සිස් යැ'යි මෙසේ කියා නම් එ බඳු කිසි එකද බමුණෙක් නැත් ල, බමුණන් කෙරෙහි යමෙක් 'මම තෙල කරුණ දනිමි, මම තෙල කරුණ දකිමි, මේ මැ සත්‍ය යැ සෙස්ස සිස් යැ'යි මෙසේ කියා නම් එ බඳු කිසි එක ද ආචාර්‍ය්‍යයෙක් එක ද ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යයෙක් සත් වැනි ප්‍රාචාර්‍ය්‍යයුගය හිම් කොට නැත් ල, බමුණන්ගේ මන්ත්‍ර කර්තෘ වූ මන්ත්‍රප්‍රවර්තක වූ යම් ඒ පූර්ව ඍෂි කෙනෙකුත් ඇද්ද, යම් කෙනකුන් විසින් හදළ වාචනා කළ රැස් කොට තැබූ මේ පැරණි මන්ත්‍රපදයක් මෙකලැ බමුණෝ ඔවුන් අනුව ගයත් ද ඔවුන් අනුව බෙණෙත් ද, කියනලද්ද අනුව කියත් ද, වාචනා කරන ලද්ද අනුව වාචනා කෙරෙත් ද, ඔහු යි, වැළි ඔහු කවරහයත් : අට්ටක යැ වාමක යැ වාමදෙව යැ විශ්වාමිත්‍ර යැ යමදග්නි යැ අඞ්ගීරස් යැ භාරද්වාජ යැ වාශිෂ්ට යැ කාශ්‍යප යැ භෘගු යැ යන මොහු යි. ඔහුදු ''අපි තෙල දනුම්හ, අපි තෙල දකුම්හ, මේ මැ සත්‍ය යැ තදන්‍ය සිස් යැ'යි මෙසේ නො කීහු.

භාරද්වාජ, යම් පරිදි පරම්පරා විසින් සංසක්ත (බැඳුණු) වූ අන්ධවෙණියෙක් ඇද්ද, එහි පළමු අන්ධයා ද නො දක්නේ යැ මධ්‍යම අන්ධයා ද නො දක්නේ වේ ද, පශ්චිම අන්ධයා ද නො දක්නේ වේ ද, භාරද්වාජය, එ පරිදි මැ බ්‍රාහ්මණයන්ගේ භාෂිතය අන්ධ-වෙණූපමා මෙන් වෙයි. (පළමු කී දස බමුණන් කෙරෙහි) පූර්ව බමුණුදු නො දක්නේ යැ මධ්‍යම බමුණුදු නො දක්නේ යැ පශ්චිම බමුණුදු නො දක්නේ යැ. භාරද්වාජය, ඒ කෙසේ හඟිහි? මෙසේ ඇති වත් මැ බමුණන් ගේ සැදැහැ අමූලික වන්නේ නො වේ ද?

භවත් ගෞතමයෙනි, මෙහි ලා බමුණෝ සැදැහැයෙන් මැ පර්‍ය්‍යුපාසනා නො කෙරෙති. මෙහි ලා අනුශ්‍රවයෙනුදු බමුණෝ පර්‍ය්‍යුපාසනා කෙරෙති.

භාරද්වාජය, පළමු මැ තෝ සැදැහැ කරා ගියෙහි. දන් අනුශ්‍රවය කියහි. භාරද්වාජය, මේ ධර්මයෝ පස් දෙනෙක් දුටුදැම්යෙහි මැ (භූත අභූත විසින්) දෙවැදෑරුම් විපාක ඇත්තාහ. කවර පස්දෙනෙක යත් : ශ්‍රද්ධා යැ රුචි යැ අනුශ්‍රව යැ ආකාරපරිවිතර්ක යැ දිට්ඨිනිජ්ඣාන ඛන්ති යැ යන මොහු යි. භාරද්වාජය, මේ පඤ්ච ධර්මයෝ ඉහාත්මයෙහි මැ දෙවැදෑරුම් විපාක ඇත්තාහ. භාරද්වාජය, මොනොවට අදහනලද නමුදු එ ද රික්ත වෙයි, තුච්ඡ වෙයි, මෘෂා වෙයි. නො අදහනලද නමුදු භූත වෙයි, තථ්‍ය වෙයි, අනන්‍යථා වෙයි. භාරදවාජය, මැනැවින් රුස්නාලද නමුදු . . . මොනොවට අසනලද නමුදු . . . මොනොවට පරිවිතක් කරනාලද නමුදු . . . මොනොවට සිතින් බලනලද නමුදු එ ද රික්ත වෙයි, තුච්ඡ වෙයි, මෘෂා වෙයි. නො බලනලද නමුදු භූත වෙයි, තථ්‍ය වෙයි, අනන්‍යථා වෙයි, භාරද්වාජය, සත්‍යය රක්නා විඥපුරුෂයකු විසින් ''මෙය මැ සත්‍ය යැ අනෙක මොස යැ'යි මෙහි ලා ඒකාන්තයෙන් නිෂ්ඨාවට යනු නො නිසි යැ.

කිත්තාවතා පන භො ගොතම, සච්චානුරක්ඛනා හොති, කිත්තාවතා සච්චමනුරක්ඛති? සච්චානුරක්ඛනං මයං භවන්තං ගොතමං පුච්ඡාමා’ති.

සද්ධා චෙපි භාරද්වාජ, පුරිසස්ස හොති, ‘එවං මෙ සද්ධා’ති ඉති වදං සච්චමනුරක්ඛති, න ත්වෙව තාව එකංසෙන නිට්ඨං ගච්ඡති: ‘ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති. එත්තාවතා ඛො භාරද්වාජ සච්චානුරක්ඛනා හොති. එත්තාවතා සච්චමනුරක්ඛති. එත්තාවතා ච මයං සච්චානුරක්ඛනං පඤ්ඤපෙම. න ත්වෙව තාව සච්චානුබොධො හොති.[1] රුචි චෙපි භාරද්වාජ, පුරිසස්ස හොති, -පෙ- අනුස්සවො චෙපි භාරද්වාජ, පුරිසස්ස හොති, -පෙ- ආකාරපරිවිතක්කො චෙපි භාරද්වාජ, පුරිසස්ස හොති, -පෙ- දිට්ඨිනිජ්ඣානක්ඛන්ති චෙපි භාරද්වාජ, පුරිසස්ස හොති ‘එවං මෙ දිට්ඨිනිජ්ඣානක්ඛන්ති’ති ඉති වදං සච්චමනුරක්ඛති න ත්වෙව තාව එකංසෙන නිට්ඨං ගච්ඡති: ‘ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති. එත්තාවතා ඛො භාරද්වාජ, සච්චානුරක්ඛනා හොති, එත්තාවතා සච්චමනුරක්ඛති, එත්තාවතා ච මයං සච්චානුරක්ඛනං පඤ්ඤපෙම. න ත්වෙව තාව සච්චානුබොධො හොතී’ති.

එත්තාවතා භො ගොතම, සච්චානුරක්ඛනා හොති, එත්තාවතා සච්චමනුරක්ඛති, එත්තාවතා ච මයං සච්චානුරක්ඛනං පෙක්ඛාම. කිත්තාවතා පන භො ගොතම, සච්චානුබොධො හොති, කිත්තාවතා සච්චමනුබුජ්ඣති? සච්චානුබොධං මයං භවන්තං ගොතමං පුච්ඡාමා’ති.

ඉධ[2] භාරද්වාජ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. තමෙනං[3] ගහපති වා ගහපතිපුත්තො වා උපසඞ්කමිත්වා තීසු ධම්මෙසු සමන්නෙසති: ලොභනීයෙසු ධම්මෙසු දොසනීයෙසු ධම්මෙසු මොහනීයෙසු ධම්මෙසු. අත්ථි නු ඛො ඉමස්ස ආයස්මතො තථාරූපා ලොභනීයා ධම්මා යථාරූපෙහි ලොභනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති, අපස්සං වා වදෙය්‍ය පස්සාමීති, පරං වා තථත්තාය[4] සමාදපෙය්‍ය යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති: නත්ථි ඛො ඉමස්සායස්මතො තථාරූපා ලොභනීයා ධම්මා යථාරූපෙහි ලොභනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති අපස්සං වා වදෙය්‍ය පස්සාමීති, පරං වා තථත්තාය[4] සමාදපෙය්‍ය, යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති, තථා[5] ඛො පනිමස්සායස්මතො කායසමාචාරො, තථා වචීසමාචාරො, යථා තං අලුද්ධස්ස: යං ඛො පන අයමායස්මා ධම්මං දෙසෙති, ගම්භීරො සො ධම්මො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො, න සො ධම්මො සුදෙසියො ලුද්ධෙනාති.

---

1. එත්තාවතා -පෙ- හොති - මජසං ඌනං.
2. ඉධ කිර - ස්‍යා.
3. තමෙව - ස්‍යා.
4. තදත්ථාය - සීමු, මජසං
5. තථාරූපො - මජසං.

භවත් ගෞතමයෙනි, කිපමණෙකින් සත්‍යානුරක්ෂණ වේ ද? කිපමණෙකින් සත්‍යය රක්නේ වේ ද? අපි භවත් ගෞතමයන් සත්‍යානුරක්ෂණව පුළුවුසුම්හ'යි.

භාරද්වාජය, ''මා ඇදහිලි මෙසේ යැ''යි ඉදින් පුරුෂයක්හට සැදහැ ඇති වේ නම් මෙසේ බණනුයේ සත්‍යය රක්නේ වෙයි. එසේ වුව ද එතෙකින් ඒකාන්තයෙන් නිෂ්ඨාවට නො මැ යෙයි. 'මෙය මැ සත්‍ය යැ, අනෙක අසත්‍ය යැ' කියා යි. භාරද්වාජය, මෙතෙකින් සත්‍යානුරක්ෂණ වෙයි, මෙතෙකින් සත්‍යය රක්නේ යැ. අපි මෙතෙකින් සත්‍යානු රක්ෂණාව පනවම්හ. එතෙකින් සත්‍යානුබොධය නො වන්නේ මැ යැ. භාරද්වාජය, ඉදින් රුචිය ද පුරුෂයක්හට වේ ද . . . භාරද්වාජය, ඉදින් අනුශ්‍රවය ද පුරුෂයක්හට වේ ද . . . . භාරද්වාජය, ඉදින් පරිවිතර්කය ද පුරුෂයක්හට වේ ද . . . භාරද්වාජය, ඉදින් දිට්ඨිනිජ්ඣානක්ඛන්තිය ද පුරුෂයක්හට වේ ද, මා ගේ දිට්ඨිනිජ්ඣානක්ඛන්තිය මෙසේ යැ' කියා යි. මෙසේ බණනුයේ සත්‍යය රක්නේ යැ. එතෙකින් ඒකාන්තයෙන් නිෂ්ඨාවට නො යන්නේ මැ යැ. 'මෙය මැ සත්‍යය වෙයි. අනෙක අසත්‍යය වේ යැ' කියා යි. භාරද්වාජය, මෙතෙකින් සත්‍යානුරක්ෂණ වෙයි, මෙතෙකින් සත්‍යය රක්නේ යැ, අපි මෙතෙකින් සත්‍යානුරක්ෂණ පනවම්හ. එතෙකින් සත්‍යානුබොධය නො වේ මැ යැ.

භවත් ගෞතමයෙනි, මෙතෙකින් සත්‍යානුරක්ෂණා වෙයි, මෙතෙකින් සත්‍යය රක්නේ යැ, අපි මෙතෙකින් සත්‍යානුරක්ෂණාව දකුම්හ. භවත් ගෞතමයෙනි, කිපමණෙකින් සත්‍යානුබෝධය වේ ද? කිපමණෙකින් සත්‍යය අවබෝධ කරන්නේ වේ ද? අපි භවත් ගෞතමයන් සත්‍යානුබෝධය පුළුවුසුම්හ.

භාරද්වාජය, මෙසස්නෙහි මහණ එක්තරා ගමක් හෝ නියම්ගමක් ඇසුරු කොට වාස කෙරෙයි. ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ තුලුන් කරා එළැඹ තුන් කරුණෙක සමන්නේසනා කෙරෙයි, ලෝභධර්මයෙහි යැ ද්වෙෂධර්මයෙහි යැ මෝහධර්මයෙහි යැ යි. (කෙසේ යැ යත් :) ''යම් බඳු ලෝභධර්මයෙකින් ගත් සිතැත්තෝ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද, නො දක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට අහිත පිණිස දුක් පිණිස වැටේ නම් ඒ පිණිස මෙරමා හෝ සමාදන් කරවා ද මේ ආයුෂ්මත් හට එ බඳු ලෝභධර්මයෝ ඇද්දෝ හො''යි. තුලුන් සමන්නේසණා කරනුයේ මෙසේ දන්නේ යැ: (කෙසේ යැ යත්) ''යම් බඳු ලෝභධර්මයෙකින් ගත් සිතැත්තේ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද නො දක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටේ ද, මෙරමා හෝ එය පිණිස සමාදන් කරවා ද, මේ ආයුෂ්මත්හට එ බඳු ලෝභධර්මයෝ නැති''යි. අලුබ්ධයක්හට යම්සේ වේ ද මේ ආයුෂ්මත්හුගේ කායසමාචාර එසේ වෙයි, වාක්සමාචාර එසේ වෙයි, මේ ආයුෂ්මත් යම් දහමක් දෙසා නම් ඒ දහම ගම්භීර යැ, දුර්දර්ශ යැ, දුරනුබොධ යැ, ශාන්ත යැ' ප්‍රණීත යැ, අතර්කාවචර යැ නිපුණ යැ, පණ්ඩිතයන් විසින් වෙදිතව්‍ය යි. ලුබ්ධයක්හු විසින් ඒ දහම සුවසේ නො දෙසියහැකි යැ.

යතො නං සමන්නෙසමානො විසුද්ධං ලොභනීයෙහි ධම්මෙහි සමනුපස්සති[1]. තතො නං උත්තරිං සමන්නෙසති දොසනීයෙසු ධම්මෙසු: අත්ථි නු ඛො ඉමස්ස ආයස්මතො තථාරූපා දොසනීයා ධම්මා, යථාරූපෙහි දොසනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති, අපස්සං වා වදෙය්‍ය පස්සාමීති, පරං වා තථත්තාය සමාදපෙය්‍ය, යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති : නත්ථි ඛො ඉමස්සායස්මතො තථාරූපා දොසනීයා ධම්මා, යථාරූපෙහි දොසනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති, අපස්සං වා වදෙය්‍ය පස්සාමීති, පරං වා තථත්තාය[2] සමාදපෙය්‍ය යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායා'ති. තථා[3] ඛො පනිමස්සායස්මතො කායසමාචාරො, තථා වචීසමාචාරො, යථා තං අදුට්ඨස්ස. යං ඛො පන අයමායස්මා ධම්මං දෙසෙති. ගම්භීරො සො ධම්මො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො, න සො ධම්මො සුදෙසියො දුට්ඨෙනාති.

යතො නං සමන්නෙසමානො විසුද්ධං දොසනීයෙහි ධම්මෙහි සමනුපස්සති. තතො නං උත්තරිං සමන්නෙසති මොහනීයෙසු ධම්මෙසු : අත්ථි නු ඛො ඉමස්ස ආයස්මතො තථාරූපා මොහනීයා ධම්මා, යථාරූපෙහි මොහනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති, අපස්සං වා වදෙය්‍ය පස්සාමීති. පරං වා තථත්තාය[2] සමාදපෙය්‍ය, යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති. තමෙනං සමන්නෙසමානො එවං ජානාති : නත්ථි ඛො ඉමස්සායස්මතො තථාරූපා මොහනීයා ධම්මා, යථාරූපෙහි මොහනීයෙහි ධම්මෙහි පරියාදින්නචිත්තො අජානං වා වදෙය්‍ය ජානාමීති, අපස්සං වා වදෙය්‍ය පස්සාමීති. පරං වා තථත්තාය[2] සමාදපෙය්‍ය යං පරෙසං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය. තථා[3] ඛො පනිමස්සායස්මතො කායසමාචාරො, තථා වචීසමාචාරො, යථා තං අමූළ්හස්ස. යං ඛො පන අයමායස්මා ධම්මං දෙසෙති. ගම්භීරො සො ධම්මො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො, න සො ධම්මො සුදෙසියො මූළ්හෙනා'ති.

යතො නං සමන්නෙසමානො විසුද්ධං මොහනීයෙහි ධම්මෙහි සමනුපස්සති. අථ තම්හි සද්ධං නිවෙසෙති. සද්ධාජාතො උපසඞ්කමති උපසඞ්කමන්තො පයිරුපාසති. පයිරුපාසන්තො සොතං ඔදහති. ඔහිතසොතො ධම්මං සුණාති. සුත්වා ධම්මං ධාරෙති. ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති. අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති. ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති. ඡන්දජාතො උස්සහති. උස්සහිත්වා තුලයති. තුලයිත්වා පහදති. පහිතත්තො සමානො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති. පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති. එත්තාවතා ඛො භාරද්වාජ, සච්චානුබොධො හොති. එත්තාවතා සච්චමනුබුජ්ඣති. එත්තාවතා ච මයං සච්චානුබොධං පඤ්ඤපෙම. න ත්වෙව තාව[4] සච්චානුපත්ති හොතීති.

---

1. පස්සති සමනුපස්සති - ස්‍යා.
2. තදත්ථාය - සිමු.
3. තථාරූපො - මජසං.
4. න හෙව - PTS.

යම් හෙයකින් ඔහු සොයා බලනුයේ ලෝභධර්මයෙන් විශුද්ධ වූවහු නුවණින් දක්නේ වේ ද, එහෙයින් ඔහු මතුයෙහි ද්වේෂධර්මයෙහි ලා පරීක්ෂා කෙරෙයි. (කෙසේ යැ යත් : ''යම් බඳු ද්වේෂධර්මයෙකින් ගත් සිතැත්තේ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද, නො දක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටේ ද, මෙරමා හෝ ඒ පිණිස සමාදන් කරවා ද, මේ ආයුෂ්මත්හට එ බඳු ද්වේෂධර්මයෝ ඇද්දෝ හො''යි. තුලුන් මෙසේ සොයනුයේ මෙසේ දන්නේ යැ : කෙසේ යැ යත් :) ''යම් බඳු ද්වේෂධර්මයෙකින් ගත් සිතැත්තේ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද, නො දක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටේ නම් මෙරමා හෝ ඒ පිණිස සමාදන් කරවා ද, මේ ආයුෂ්මත්හට එ බඳු ද්වේෂධර්මයෝ නැති''යි, ද්වේෂ රහිතයක්හට යම්සේ වේද, මේ ආයුෂ්මත්හු ගේ කායසමාචාර එසේ වෙයි, වාක් සමාචාර එසේ වෙයි. මේ ආයුෂ්මත් යම් දහමක් දෙසා නම් එ දහම් ගම්භීර යැ දුර්දශී යැ දුරනුබොධ යැ ශාන්ත යැ ප්‍රණීත යැ අතර්කාවචර යැ නිපුණ යැ පණ්ඩිතයන් විසින් වේදිතව්‍ය යි. ද්වේෂ සහගතයකු විසින් එ දහම සුවසේ නො දෙසිය හැකි යැ.

යම් හෙයෙකින් ඔහු සොයා බලනුයේ ද්වේෂධර්මයෙන් විශුද්ධ වූවහු නුවණින් දක්නේ වේ ද, එහෙයින් ඔහු මතුයෙහි මෝහධර්මයෙහි ලා පරීක්ෂා කෙරෙයි. (කෙසේ යැ යත් :) ''යම් බඳු මෝහධර්මයෙකින් ගත් සිතැත්තේ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද, නොදක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටේ ද, මෙරමා හෝ ඒ පිණිස සමාදන් කරවා ද, මේ ආයුෂ්මත්හට එ බඳු මෝහධර්මයෝ ඇද්දෝ හො''යි. තුලුන් මෙසේ සොයනුයේ මෙසේ දක්නේ යැ : (කෙසේ යැ යත් :) ''යම් බඳු මෝහධර්මයෙකින් මැඩගත් සිතැත්තේ නො දන්මින් හෝ 'දන්මි'යි බෙණේ ද, නො දක්මින් හෝ 'දක්මි'යි බෙණේ ද, යම් කරුණෙක් මෙරමාහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වැටේ නම් මෙරමා හෝ ඒ පිණිස සමාදන් කරවා ද, මේ ආයුෂ්මත්හට එ බඳු මෝහධර්මයෝ නැති''යි. මෝහ රහිතයක්හට යම්සේ වේ ද, මේ ආයුෂ්මත්හු ගේ කායසමාචාර එසේ වෙයි, වාක් සමාචාර එසේ වෙයි, මේ ආයුෂ්මත් යම් දහමක් දෙසා නම් එ දහම ගම්භීර යැ දුර්දශී යැ දුරනුබෝධ යැ ශාන්ත යැ ප්‍රණීත යැ අතර්කාවචර යැ නිපුණ යැ පණ්ඩිතයන් විසින් වේදිතව්‍ය යි. මොහ සහගතයක්හු විසින් එ දහම සුවසේ නො දෙසිය හැක්ක.

යම් හෙයකින් ඔහු සොයා බලනුයේ මෝහ ධර්මයෙන් විශුද්ධ වූවහු නුවණින් දක්නේ වේ ද, එ සඳ ඔහු කෙරෙහි සැදැහැ පිහිටුවයි. හටගත් සැදැහැ ඇතියේ එළැඹෙයි, එළැඹෙනුයේ පර්යුපාසන කෙරෙයි, පර්යුපාසන කරනුයේ කන් නතු කෙරෙයි, නතු කළ කන් ඇතියේ දහම් අසයි, අසා දහම් ධරයි. ධැරූ දහම්හි අරුත් පිරික්සයි. අරුත් පිරික්සනුවහට ධර්මයෝ වටහති, දහම් වැටහීම (ධම්මනිජ්ඣානක්ඛන්ති) ඇති කල්හි කර්තුකම්‍යතා ඡන්දය උපදි, හටගත් ඡන්ද ඇතියේ උත්සාහ කෙරෙයි, උත්සාහ (වැයම්) කොට තුලනය (අනිත්‍යාදි විසින් තීරණය) කෙරෙයි, තුලනය කොට ප්‍රධන්වීර්‍ය කෙරෙයි, නිවනට මෙහෙයූ සිත් ඇත්තේ මැ (නාම) කයිනුදු සත්‍යය(නිවන) ප්‍රත්‍යක්ෂ කෙරෙයි, ප්‍රඥයෙනුදු කෙලෙස් විනිවිද දකි. භාරද්වාජයෙනි, මෙතෙකින් මැ සත්‍යානුබෝධය වෙයි මෙතෙකින් සත්‍යය අනුබෝධ කෙරෙයි, මෙතෙකින් වැළිත් අපි සත්‍යානුබෝධය පනවම්හ. එපමණෙකින් සත්‍යානුප්‍රාප්ති නො වේ මැ යි.

එත්තාවතා භො ගොතම, සච්චානුබොධො හොති, එත්තාවතා සච්චමනුබුජ්ඣති, එත්තාවතා ච මයං සච්චානුබොධං පෙක්ඛාම. කිත්තාවතා පන භො ගොතම, සච්චානුපත්ති හොති? කිත්තාවතා සච්චමනුපාපුණාති? සච්චානුපත්තිං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති

තෙසංයෙව ඛො භාරද්වාජ, ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මා සච්චානුපත්ති හොති, එත්තාවතා ඛො භාරද්වාජ, සච්චානුපත්ති හොති, එත්තාවතා සච්චමනුපාපුණාති, එත්තාවතා ච මයං සච්චානුපත්තිං පඤ්ඤපෙමාති.

එත්තාවතා භො ගොතම, සච්චානුපත්ති හොති, එත්තාවතා සච්චමනුපාපුණාති, එත්තාවතා ච මයං සච්චානුපත්තිං පෙක්ඛාම. සච්චානුපත්තියා පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? සච්චානුපත්තියා බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

සච්චානුපත්තියා ඛො භාරද්වාජ, පධානං බහුකාරං. නො චෙතං පදහෙය්‍ය, නයිදං සච්චං අනුපාපුණෙය්‍ය. යස්මා ච ඛො පදහති, තස්මා සච්චං අනුපාපුණාති. තස්මා සච්චානුපත්තියා පධානං බහුකාරන්ති.

පධානස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? පධානස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

පධානස්ස ඛො භාරද්වාජ, තුලනා බහුකාරා. නො චෙතං තුලෙය්‍ය, නයිදං පදහෙය්‍ය. යස්මා ච ඛො තුලෙති, තස්මා පදහති. තස්මා පධානස්ස තුලනා බහුකාරාති.

තුලනාය පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? තුලනාය බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

තුලනාය ඛො භාරද්වාජ, උස්සාහො බහුකාරො. නො චෙතං උස්සහෙය්‍ය, නයිදං තුලෙය්‍ය. යස්මා ච ඛො උස්සහති, තස්මා තුලෙති. තස්මා තුලනාය උස්සාහො බහුකාරොති.

උස්සාහස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? උස්සාහස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති

උස්සාහස්ස ඛො භාරද්වාජ, ඡන්දො බහුකාරො. නො චෙතං ඡන්දො ජායෙථ, නයිදං උස්සහෙය්‍ය. යස්මා ච ඛො ඡන්දො ජායති, තස්මා උස්සහති. තස්මා උස්සාහස්ස ඡන්දො බහුකාරොති.

ඡන්දස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? ඡන්දස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

ඡන්දස්ස ඛො භාරද්වාජ, ධම්මනිජ්ඣානක්ඛන්ති බහුකාරා. නො චෙතං ධම්මනිජ්ඣානං ඛමෙය්‍යුං, නයිදං ඡන්දො ජායෙථ. යස්මා ච ඛො ධම්මනිජ්ඣානං ඛමන්ති, තස්මා ඡන්දො ජායති. තස්මා ඡන්දස්ස ධම්මනිජ්ඣානක්ඛන්ති බහුකාරාති.

භවත් ගෞතමයන් වහන්ස, මෙපමණෙකින් සත්‍යානුබෝධය වෙයි, මෙපමණෙකින් සත්‍යානුබෝධය කෙරෙයි, මෙපමණෙකින් වැළිත් අපි සත්‍යානුබෝධය දක්මහ. භවත් ගෞතමයෙනි, කිපමණෙකින් වැළිත් සත්‍යානුප්‍රාප්ති වේ ද? කිපමණෙකින් සත්‍යයට පැමිණේ ද? අපි සත්‍යානුප්‍රාප්තිය භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ''යි.

භාරද්වාජයෙනි, එ මැ ධර්මයන් ගේ ආසේවනයෙන් භාවනායෙන් බහුලීකරණයෙන් සත්‍යානුප්‍රාප්තිය වෙයි. භාරද්වාජයෙනි, මෙපමණෙකින් මැ සත්‍යානුප්‍රාප්තිය වෙයි, මෙපමණෙකින් සත්‍යයට පැමිණෙයි. මෙපමණෙකින් වැළිත් අපි සත්‍යානුප්‍රාප්තිය පනවම්හ'යි.

භවත් ගෞතමයෙනි, මෙපමණෙකින් සත්‍යානුප්‍රාප්තිය වෙයි, මෙපමණෙකින් සත්‍යයට පැමිණෙයි, මෙපමණෙකින් වැළිත් අපි සත්‍යානුප්‍රාප්තිය දකුම්හ. භවත් ගෞතමයෙනි, වැළිත් සත්‍යානුප්‍රාප්තියට (ඵලප්‍රත්‍යක්‍ෂයට) කවර ධර්මයෙක් බහුකාර වේ ද? සත්‍යානුප්‍රාප්තියට බහුකාරධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, සත්‍යානුප්‍රාප්තියට ප්‍රධානය (මාර්ග ප්‍රධානය) බහුකාර වෙයි. ඉදින් තෙල මාර්ගප්‍රධානය නො කෙරේ නම් මේ සත්‍යයට නො පැමිණෙන්නේ යැ. යම් හෙයකින් මාර්ගප්‍රධානය කෙරේ ද, එහෙයින් සත්‍යයට පැමිණෙයි (සත්‍යය ලබයි). එහෙයින් සත්‍යානුප්‍රාප්තියට ප්‍රධානය බහුකාර වේ යයි.

භවත් ගෞතමයෙනි, වැළිත් මාර්ගප්‍රධානයට කවර දහමෙක් බහුකාර වේ ද? මාර්ග ප්‍රධානයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, ප්‍රධානයට තුලනාව බහුකාර වෙයි. ඉදින් තුලනා නො කෙරේ නම් මේ ප්‍රධන් වීර්‍ය්‍ය නො කරන්නේ යැ. යම් හෙයකින් වැළිත් තුලනා කෙරේ ද, එහෙයින් මාර්ගප්‍රධානය කෙරෙයි. එහෙයින් ප්‍රධානයට තුලනාව බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, තුලනාවට වැළිත් කවර ධර්මයෙක් බහුකාර වේ ද? තුලනාවට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, තුලනාවට ව්‍යායාමය බහුකාර වෙයි. ඉදින් ව්‍යායාම නො කෙරේ නම් මේ තුලනාව නො කරන්නේ යැ. යම්හෙයෙකින් වැළිත් ව්‍යායාම කෙරේ ද, එහෙයින් තුලනය කෙරෙයි. එහෙයින් තුලනාවට ව්‍යායාමය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, ව්‍යායාමයට කවර ධර්මයෙක් බහුකාර වේ ද? ව්‍යායාමයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුස්මහ'යි.

භාරද්වාජයෙනි, ව්‍යායාමයට (කර්තුකම්‍යතා) ඡන්දය බහුකාර වෙයි. ඉදින් ඡන්දය නූපදී නම් මේ ව්‍යායාමය නො කරන්නේ යැ. යම් හෙයකින් වැළිත් ඡන්දය උපදී ද, එහෙයින් ව්‍යායාම කෙරෙයි. එහෙයින් ව්‍යායාමයට ඡන්දය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, ඡන්දයට කවර දහමෙක් බහුකාර වේ ද? ඡන්දයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, ඡන්දයට ධම්මනිජ්ඣානක්ඛන්තිය (දහම් වැටහීම) බහුකාර වෙයි. ඉදින් ධර්මයෝ බැලීම නො සහත් (නො වටහත්) නම් මේ ඡන්දය නූපදනේ යැ. යම් හෙයකින් වැළිත් ධර්මයෝ වටහත් ද, එහෙයින් ඡන්දය උපදී. එහෙයින් ඡන්දයට ධර්මනිධ්‍යානක්‍ෂාන්තිය බහුකාර වෙයි.

ධම්මනිජ්ඣානක්ඛන්තියා පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? ධම්මනිජ්ඣානක්ඛන්තියා බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

ධම්මනිජ්ඣානක්ඛන්තියා ඛො භාරද්වාජ, අත්ථූපපරික්ඛා බහුකාරා. නො චෙතං අත්ථං උපපරික්ඛෙය්‍ය, නයිදං ධම්මනිජ්ඣානං ඛමෙය්‍යුං. යස්මා ච ඛො අත්ථං උපපරික්ඛති, තස්මා ධම්මනිජ්ඣානං ඛමන්ති. තස්මා ධම්මනිජ්ඣානක්ඛන්තියා අත්ථූපපරික්ඛා බහුකාරාති.

අත්ථූපපරික්ඛාය පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? අත්ථූපපරික්ඛාය බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

අත්ථූපපරික්ඛාය ඛො භාරද්වාජ, ධම්මධාරණා බහුකාරා. නො චෙතං ධම්මං ධාරෙය්‍ය, නයිදං අත්ථං උපපරික්ඛෙය්‍ය. යස්මා ච ඛො ධම්මං ධාරෙති, තස්මා අත්ථං උපපරික්ඛති. තස්මා අත්ථූපපරික්ඛාය ධම්මධාරණා බහුකාරාති

ධම්මධාරණාය පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? ධම්මධාරණාය බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

ධම්මධාරණාය ඛො භාරද්වාජ, ධම්මසවනං බහුකාරං නො චෙතං ධම්මං සුණෙය්‍ය, නයිදං ධම්මං ධාරෙය්‍ය. යස්මා ච ඛො ධම්මං සුණාති, තස්මා ධම්මං ධාරෙති තස්මා ධම්මධාරණාය ධම්මසවනං බහුකාරන්ති.

ධම්මසවනස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? ධම්මසවනස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

ධම්මසවනස්ස ඛො භාරද්වාජ, සොතාවධානං බහුකාරං. නො චෙතං සොතං ඔදහෙය්‍ය, න ඉදං ධම්මං සුණෙය්‍ය. යස්මා ච ඛො සොතං ඔදහති, තස්මා ධම්මං සුණාති තස්මා ධම්මසවනස්ස සොතාවධානං බහුකාරන්ති.

සොතාවධානස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? සොතාවධානස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

සොතාවධානස්ස ඛො භාරද්වාජ, පයිරුපාසනා බහුකාරා. නො චෙතං පයිරුපාසෙය්‍ය, නයිදං සොතං ඔදහෙය්‍ය. යස්මා ච ඛො පයිරුපාසති. තස්මා සොතං ඔදහති. තස්මා සොතාවධානස්ස පයිරුපාසනා බහුකාරාති.

පයිරුපාසනාය පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? පයිරුපාසනාය බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

පයිරුපාසනාය ඛො භාරද්වාජ, උපසඞ්කමනං බහුකාරං. නො චෙතං උපසඞ්කමෙය්‍ය, නයිදං පයිරුපාසෙය්‍ය. යස්මා ච ඛො උපසඞ්කමති, තස්මා පයිරුපාසති. තස්මා පයිරුපාසනාය උපසඞ්කමනං බහුකාරන්ති.

උපසඞ්කමනස්ස පන භො ගොතම, කතමො ධම්මො බහුකාරො? උපසඞ්කමනස්ස බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං පුච්ඡාමාති.

භවත් ගෞතමයෙනි, ධර්මනිධ්‍යානක්ෂාන්තියට කවර දහමෙක් බහුකාර වේ ද? ධර්මනිධ්‍යානක්ෂාන්තියට බහුකාර දහම අපි භවත් ගෞතමයන් අතින් පුළුවුස්මහ'යි.

භාරද්වාජයෙනි, ධර්මනිධ්‍යානක්ෂාන්තියට අරුත් විමසීම බහුකාර වෙයි. ඉදින් අරුත් නො විමසා නම් මේ ධර්මයෝ නො වටහත්. යම් හෙයකින් වැළිත් අරුත් විමසා ද, එහෙයින් ධර්මයෝ වටහති. එහෙයින් දහම්වැටහීමට අරුත් විමසීම බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, අරුත් පිරික්සීමට කවර දහමෙක් බහුකාර වේ ද? අරුත් පිරික්සීමට බහුකාර දහම අපි භවත් ගෞතමයන් අතින් පුළුවුස්මහ'යි.

භාරද්වාජයෙනි, අරුත් පිරික්සීමට වැළිත් දහම් ධැරීම බහුකාර වෙයි. ඉදින් දහම් නො ධරා නම් මේ අරුත් නො පිරික්සන්නේ යැ. යම් හෙයකින් වැළිත් දහම් ධාරණ කෙරේ ද, එහෙයින් අරුත් පිරික්සයි. එයින් අරුත් පිරික්සීමට ධර්මධාරණය බහුකාර වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, වැළිත් ධර්මධාරණයට කවර දහමෙක් බහුකාර වේ ද? ධර්මධාරණයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුස්මහ'යි.

භාරද්වාජයෙනි, ධර්මධාරණයට ධර්මශ්‍රවණය බහුකාර වෙයි. ඉදින් දහම් නො අසා නම් මේ දහම් නො ධරන්නේ යැ. යම්හෙයකින් වැළිත් දහම් අසා ද, එහෙයින් දහම් ධරයි. එයින් ධර්මධාරණයට ධර්මශ්‍රවණය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, වැළිත් ධර්මශ්‍රවණයට කවර දහමෙක් බහුකාර වේ ද? ධර්මශ්‍රවණයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුස්මහ'යි.

භාරද්වාජයෙනි, ධර්මශ්‍රවණයට ශ්‍රෝත්‍රාවධානය (කන් නතු කිරීම) බහුකාර වෙයි. ඉදින් කන් නතු නො කෙරේ නම් මෙ දහම් නො අසන්නේ යැ. යම් හෙයෙකින් වැළිත් කන් නමා ද, එහෙයින් දහම් අසයි. එයින් ධර්මශ්‍රවණයට ශ්‍රොත්‍රාවධානය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, ශ්‍රොත්‍රාවධානයට කවර දහමෙක් බහුකාර වේ ද? ශ්‍රොත්‍රාවධානයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, ශ්‍රොත්‍රාවධානයට පර්යුපාසනය (ඇසුරු කිරීම) බහුකාර වෙයි. ඉදින් පර්යුපාසන නො කෙරේ නම් මේ ශ්‍රෝත්‍රාවධාන නො කරන්නේ යැ. යම් හෙයෙකින් වැළිත් පර්යුපාසන කෙරේ ද, එහෙයින් ශ්‍රෝත්‍රාවධාන කෙරෙයි. එයින් ශ්‍රෝත්‍රාවධානයට පර්යුපාසනය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, පර්යුපාසනයට කවර දහමෙක් බහුකාර වේ ද? පර්යුපාසනයට බහුකාර ධර්මය අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

භාරද්වාජයෙනි, පර්යුපාසනයට එළැඹීම බහුකාර වෙයි. ඉදින් නො එළැඹේ නම් පර්යුපාසනා නො කරන්නේ යැ. යම් හෙයෙකින් වැළිත් එළැඹේ ද, එහෙයින් පර්යුපාසනා කෙරෙයි. එයින් පර්යුපාසනයට උපසංක්‍රමණය බහුකාර වෙයි.

භවත් ගෞතමයෙනි, උපසංක්‍රමණයට කවර දහමෙක් බහුකාර වේ ද? උපසංක්‍රමණයට බහුකාර කරුණ අපි භවත් ගෞතමයන් අතින් පුළුවුසුම්හ'යි.

උපසඞ්කමනස්ස ඛො භාරද්වාජ, සද්ධා බහුකාරා. නො චෙතං සද්ධා ජායෙථ, නයිදං උපසඞ්කමෙය්‍ය. යස්මා ච ඛො සද්ධා ජායති, තස්මා උපසඞ්කමති. තස්මා උපසඞ්කමනස්ස සද්ධා බහුකාරාති.

සච්චානුරක්ඛනං මයං භවන්තං ගොතමං අපුච්ඡිම්හ. සච්චානුරක්ඛනං භවං ගොතමො බ්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා. සච්චානුබොධං[1] මයං භවන්තං ගොතමං අපුච්ඡිම්හ. සච්චානුබොධං[1] භවං ගො ගොතමො බ්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා. සච්චානුපත්තිං මයං භවන්තං ගොතමං අපුච්ඡිම්හ. සච්චානුපත්තිං භවං ගොතමො බ්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා. සච්චානුපත්තියා බහුකාරං ධම්මං මයං භවන්තං ගොතමං අපුච්ඡිම්හ. සච්චානුපත්තියා බහුකාරං ධම්මං භවං ගොතමො බ්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා. යං යදෙව ච පන මයං භවන්තං ගොතමං අපුච්ඡිම්හ, තං තදෙව භවං ගොතමො බ්‍යාකාසි. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා.

මයං හි භො ගොතම, පුබ්බෙ එවං ජානාම: කෙ ච මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධුපාදපච්චා, කෙ ච ධම්මස්ස අඤ්ඤාතාරොති. අජනෙසි වත මෙ භවං ගොතමො සමණෙසු සමණපෙමං, සමණෙසු සමණපසාදං, සමණෙසු සමණගාරවං. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

චඞ්කීසුත්තං පඤ්චමං

---

1. සච්චමනුබොධං - ස්‍යා.

භාරද්වාජයෙනි, උපසංක්‍රමණයට ශ්‍රද්ධාව බහුකාර වෙයි, ඉදින් ශ්‍රද්ධා නූපදී නම් උපසංක්‍රමණ නො කරන්නේ යැ. යම් හෙයෙකින් වැළිත් ශ්‍රද්ධා උපදනේ ද, එහෙයින් උපසංක්‍රමණ කෙරෙයි. එකරුණින් උපසංක්‍රමණයට ශ්‍රද්ධා බහුකාර වෙයි.

අපි සත්‍යානුරක්ෂණය භවත් ගෞතමයන් අතින් පිළිවිසියම්හ. භවත් ගොයුම් ගොතුවෝ සත්‍යානුරක්ෂණය පැවැසූහ. එ ද අපට රුස්නේත් සහනේත් වෙයි. එයිනුදු සතුටු වූම්හ. අපි සත්‍යානුබොධය භවත් ගෞතමයන් අතින් පිළිවිසියම්හ. භවත් ගෞතමයෝ සත්‍යානුබොධය ප්‍රකාශ කළහ. එ ද අපට රුස්නේත් සහනේත් වෙයි, එයිනුදු සතුටු වූම්හ. අපි සත්‍යානුප්‍රාප්තිය භවත් ගෞතමයන් අතින් පිළිවිසියම්හ. භවත් ගෞතමයෝ සත්‍යානුප්‍රාප්තිය ප්‍රකාශ කළහ. එ ද අපට රුස්නේත් සහනේත් වෙයි, එයිනුදු සතුටු වූම්හ. අපි සත්‍යානු ප්‍රාප්තියට බහුකාර කරුණු භවත් ගෞතයයන් අතින් පිළිවිසියම්හ. භවත් ගෞතමයෝ සත්‍යානුප්‍රාප්තියට බහුකාර කරුණු ප්‍රකාශ කළහ. එ ද අපට රුස්නේත් සහනේත් වෙයි, එයිනුදු සතුටු වූම්හ. අපි වැළිත් යම් යම් මැ දූයක් භවත් ගෞතමයන් අතින් විචාළමෝ ද, භවත් ගෞතමයෝ ඒ ඒ දූය මැ ප්‍රකාශ කළහ. එ ද අපට රුස්නේත් සහනේත් වෙයි, එයිනුදු සතුටුසිත් ඇති වූම්හ.

භවත් ගෞතමයන් වහන්ස, අපි වනාහි පෙර මෙසේ දතුම්හ : 'මුණ්ඩකයෝ ශ්‍රමණකයෝ ගෘහපතිහු කෘෂ්ණයෝ බඹහුගේ පිටිපයින් උපන් දරුවෝ කවරහු ද? දහම් දන්නාහු කවරහු ද''යි. භවත් ගෞතමයෝ ඒකාන්තයෙන් මට ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණප්‍රේමය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණප්‍රසාදය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණගෞරවය ඉපැදවූහ. භවත් ගෞතමයෙනි, ඉතා කාන්ත යැ, භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යි. . . . භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට ධරත්ව'යි.

පස් වැනි චඞ්කීසූත්‍ර යි.

2. 5. 6

එසුකාරීසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො එසුකාරී බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො එසුකාරී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච :

බ්‍රාහ්මණා භො ගොතම, චතස්සො පාරිචරියා පඤ්ඤපෙන්ති. බ්‍රාහ්මණස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති, ඛත්තියස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති, වෙස්සස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති, සුද්දස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා බ්‍රාහ්මණස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති, බ්‍රාහ්මණො වා බ්‍රාහ්මණං පරිචරෙය්‍ය, ඛත්තියො වා බ්‍රාහ්මණං පරිචරෙය්‍ය, වෙස්සො වා බ්‍රාහ්මණං පරිචරෙය්‍ය. සුද්දො වා බ්‍රාහ්මණං පරිචරෙය්‍යාති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා බ්‍රාහ්මණස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා ඛත්තියස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. ඛත්තියො වා ඛත්තියං පරිචරෙය්‍ය, වෙස්සො වා ඛත්තියං පරිචරෙය්‍ය, සුද්දො වා ඛත්තියං පරිචරෙය්‍යාති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා ඛත්තියස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. තත්‍රිදං භො ගොතම බ්‍රාහ්මණා වෙස්සස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. වෙස්සො වා වෙස්සං පරිචරෙය්‍ය, සුද්දො වා වෙස්සං පරිචරෙය්‍යාති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා වෙස්සස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා සුද්දස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. සුද්දො වා සුද්දං පරිචරෙය්‍ය. කො වා පනඤ්ඤො සුද්දං පරිචරිස්සතීති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා සුද්දස්ස පාරිචරියං පඤ්ඤපෙන්ති. බ්‍රාහ්මණා භො ගොතම, ඉමා චතස්සො පාරිචරියා පඤ්ඤපෙන්ති. ඉධ භවං ගොතමො කිමාහාති?

කිං පන බ්‍රාහ්මණ, සබ්බො ලොකො බ්‍රාහ්මණානං එතදබ්භනුජානාති ඉමා චතස්සො පාරිචරියා පඤ්ඤපෙන්තී'ති[1]

නොහිදං භො ගොතම.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසො දළිද්දො අස්සකො අනාළ්හියො, තස්ස අකාමකස්ස බිලං ඔලග්ගෙය්‍යුං: ඉධ තෙ අම්භො පුරිස, මංසං ඛාදිතබ්බං, මූලඤ්ච අනුප්පදාතබ්බ'න්ති. එවමෙව ඛො බ්‍රාහ්මණ, බ්‍රාහ්මණා අප්පටිඤ්ඤාය[2] තෙසං සමණබ්‍රාහ්මණානං. අථ ච පනිමා චතස්සො පාරිචරියා පඤ්ඤපෙන්ති නාහං බ්‍රාහ්මණ, සබ්බං පරිචරිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ, සබ්බං න පරිචරිතබ්බන්ති වදාමි. යං හිස්ස බ්‍රාහ්මණ, පරිචරතො, පාරිචරියාහෙතු පාපියො අස්ස න සෙය්‍යො. නාහන්තං පරිචරිතබ්බන්ති වදාමි. යඤ්ච ඛ්වාස්ස බ්‍රාහ්මණ, පරිචරතො පාරිචරියාහෙතු සෙය්‍යො අස්ස න පාපියො, තමහං පරිචරිතබ්බන්ති වදාමි.

---

1. { පඤ්ඤපෙන්තූති - මජ්ඣං, ස්‍යා.
{ පඤ්ඤපෙන්තූති - PTS.

2. අප්පටිඤ්ඤාය - සීමු, මජ්ඣං.

Free Distribution www.aathaapi.org

2. 5. 6
ඒසුකාරීසූත්‍රය

මා විසින් මෙසේ අසනලදී : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු මහසිටාණන් ගේ අරම්හි වැඩ වාස කෙරෙත්. එසඳ ඒසුකාරී බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටු වී. සතුටු වියයුතු කලක් සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් ඒසුකාරී බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ :

භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ පරිචර්‍ය්‍යා සතර දෙනකුන් පනවත්. බමුණුහට පරිචර්‍ය්‍යා පනවති, ක්‍ෂත්‍රියයාහට පරිචර්‍ය්‍යා පනවති, වෛශ්‍යයාහට පරිචර්‍ය්‍යා පනවති, ශූද්‍රයාහට පරිචර්‍ය්‍යා පනවත්. භවත් ගෞතමයෙනි, එහි දී බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයන්හට මේ පරිචර්‍ය්‍යාව පනවති, (කෙසේ යැ යත් :) බමුණෙක් හෝ බමුණුහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, ක්‍ෂත්‍රියයෙක් හෝ බමුණුහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, වෛශ්‍යයෙක් හෝ බමුණුහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, ශූද්‍රයෙක් හෝ බමුණුහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ යි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයාහට මේ පරිචර්‍ය්‍යා පනවත්. භවත් ගෞතමයෙනි, එහි දී බ්‍රාහ්මණයෝ ක්‍ෂත්‍රියයාහට මේ පරිචර්‍ය්‍යා පනවති, (කෙසේ යැ යත් :) ක්‍ෂත්‍රියයෙක් හෝ ක්‍ෂත්‍රියයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, වෛශ්‍යයෙක් හෝ ක්‍ෂත්‍රියයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, ශූද්‍රයෙක් හෝ ක්‍ෂත්‍රියයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යයි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ ක්‍ෂත්‍රියයාහට මේ පරිචර්‍ය්‍යා පනවති. භවත් ගෞතමයෙනි, එහි දී බ්‍රාහ්මණයෝ වෛශ්‍යයාහට මේ පරිචර්‍ය්‍යා පනවති, (කෙසේ යැ යත් :) වෛශ්‍යයෙක් හෝ වෛශ්‍යයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ, ශූද්‍රයෙක් හෝ වෛශ්‍යයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ වෛශ්‍යයාහට මේ පරිචර්‍ය්‍යා පනවත්. භවත් ගෞතමයෙනි, එහි දී බ්‍රාහ්මණයෝ ශූද්‍රයාහට මේ පරිචර්‍ය්‍යා පනවති : (කෙසේ යැ යත් :) ශූද්‍රයෙක් මැ ශූද්‍රයාහට පරිචර්‍ය්‍යා කරන්නේ යැ. අන් කවරෙක් නම් ශූද්‍රයාහට පරිචර්‍ය්‍යා කරන්නේ වේ ද? යි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ ශූද්‍රයාහට මේ පරිචර්‍ය්‍යා පනවත්. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ මේ සතර පරිචර්‍ය්‍යාවන් පනවත්. භවත් ගෞතමයෝ මෙහි ලා කුමක් වදරත් ද?

කිම බමුණ, සියලු ලෝකයා 'මෙ සතර පරිචර්‍ය්‍යා පනවත්'යි බමුණනට මෙල අනුදනී ද? යි.

භවත් ගෞතමයෙනි, මෙ කරුණ නො වේ මැ යි.

බමුණ, යම්සේ සහල් නැළියෙක ධනයකුදු නැති, තමා සතු කිසිවක් නැති දිළිඳු පුරුෂයෙක් වේ ද, ඔහු නො කැමැතියාහට 'එම්බා පුරුෂය, මෙහි තා විසින් මස් කැයුතු යැ (මස්) මිල ද දියයුතු යැ'යි කොටස නංවා ද, එසෙයින් මැ බමුණ, බ්‍රාහ්මණයෝ ඒ මහණ බමුණන්ගේ ප්‍රතිඥ නැති වැ එතෙකුදු වත් මෙ සතර පරිචර්‍ය්‍යාවන් පනවත්. බමුණ, මම හැම පරිචර්‍ය්‍යා කළ යුතු යයි නො කියමි, බමුණ, වැළිත් මම හැම පරිචර්‍ය්‍යා නො කළයුතු යයි නො කියමි. බමුණ, යමක්හු පරිචර්‍ය්‍යා කරන ඔහට පරිචර්‍ය්‍යා හේතුයෙන් පාපයෙක් වේ ද, හිතයෙක් නො වේ ද, ඔහු පරිචර්‍ය්‍යා කළයුතු යැ යි මම නො කියමි. බමුණ, යමක්හු වැළිත් පරිචර්‍ය්‍යා කරන ඔහට පරිචර්‍ය්‍යා හේතුයෙන් හිතයෙක් වන්නේ ද, පාපයෙක් නො වන්නේ ද, ඔහු පරිචර්‍ය්‍යා කළයුතු යැ යි මම කියමි.

ඛත්තියස්සෙවපි බ්‍රාහ්මණ, එවං පුච්ඡෙය්‍යුං: යං වා තෙ පරිචරතො පාරිචරියාහෙතු පාපියො අස්ස න සෙය්‍යො, යං වා තෙ පරිචරතො පාරිචරියාහෙතු සෙය්‍යො අස්ස න පාපියො. කමෙත්ථ පරිචරෙය්‍යාසීති? ඛත්තියොපි හි බ්‍රාහ්මණ, සම්මා බ්‍යාකරමානො එවං බ්‍යාකරෙය්‍ය: යං හි මෙ පරිචරතො පාරිචරියාහෙතු පාපියො අස්ස න සෙය්‍යො, නාහං තං පරිචරෙය්‍යං. යඤ්ච ඛො මෙ පරිචරතො පාරිචරියාහෙතු සෙය්‍යො අස්ස න පාපියො, තමහං පරිචරෙය්‍ය'න්ති.

බ්‍රාහ්මණස්සෙවපි බ්‍රාහ්මණ, -පෙ- වෙස්සස්සෙවපි බ්‍රාහ්මණ, -පෙ- සුද්දස්සෙවපි බ්‍රාහ්මණ, එවං පුච්ඡෙය්‍යුං: යං වා තෙ පරිචරතො පාරිචරියාහෙතු පාපියො අස්ස න සෙය්‍යො, යං වා තෙ පරිචරතො පාරිචරියාහෙතු සෙය්‍යො අස්ස, න පාපියො. කමෙත්ථ පරිචරෙය්‍යාසී'ති? සුද්දොපි හි බ්‍රාහ්මණ, සම්මා බ්‍යාකරමානො එවං බ්‍යාකරෙය්‍ය: යං හි මෙ පරිචරතො පාරිචරියාහෙතු පාපියො අස්ස න සෙය්‍යො, නාහං තං පරිචරෙය්‍යං. යඤ්ච ඛො මෙ පරිචරතො පාරිචරියාහෙතු සෙය්‍යො අස්ස න පාපියො, තමහං පරිචරෙය්‍ය'න්ති.

නාහං බ්‍රාහ්මණ, උච්චාකුලීනතා සෙය්‍යංසොති වදාමි. න පනාහං බ්‍රාහ්මණ, උච්චාකුලීනතා පාපියංසොති වදාමි. නාහං බ්‍රාහ්මණ උළාරවණ්ණතා සෙය්‍යංසොති වදාමි. න පනාහං බ්‍රාහ්මණ, උළාරවණ්ණතා පාපියංසොති වදාමි. නාහං බ්‍රාහ්මණ, උළාරභොගතා සෙය්‍යංසොති වදාමි. න පනාහං බ්‍රාහ්මණ, උළාරභොගතා පාපියංසොති වදාමි.

උච්චාකුලීනොපි හි බ්‍රාහ්මණ, ඉධෙකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසුමිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, බ්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨි හොති. තස්මා න උච්චාකුලීනතා සෙය්‍යංසොති වදාමි. උච්චාකුලීනොපි හි බ්‍රාහ්මණ ඉධෙකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨි හොති. තස්මා න උච්චාකුලීනතා පාපියංසොති වදාමි.

උළාරවණ්ණොපි හි බ්‍රාහ්මණ, -පෙ- උළාරභොගොපි හි බ්‍රාහ්මණ, ඉධෙකච්චො පාණාතිපාතී -පෙ- මිච්ඡාදිට්ඨි හොති. තස්මා න උළාරභොගතා සෙය්‍යංසොති වදාමි. උළාරභොගොපි හි බ්‍රාහ්මණ, ඉධෙකච්චො පාණාතිපාතා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨි හොති. තස්මා න උළාරභොගතා පාපියංසොති වදාමි.

නාහං බ්‍රාහ්මණ, සබ්බං පරිචරිතබ්බන්ති වදාමි. න පනාහං බ්‍රාහ්මණ, සබ්බං න පරිචරිතබ්බන්ති වදාමි. යං හිස්ස බ්‍රාහ්මණ, පරිචරතො පාරිචරියාහෙතු සද්ධා වඩ්ඪති, සීලං වඩ්ඪති, සුතං වඩ්ඪති, චාගො වඩ්ඪති, පඤ්ඤා වඩ්ඪති. තමහං පරිචරිතබ්බන්ති වදාමි. යං හිස්ස බ්‍රාහ්මණ පරිචරතො පාරිචරියා හෙතු න සද්ධා වඩ්ඪති, න සීලං වඩ්ඪති, න සුතං වඩ්ඪති, න චාගො වඩ්ඪති, න පඤ්ඤා වඩ්ඪති. නාහං තං පරිචරිතබ්බන්ති වදාමී'ති

බමුණ, ඉදින් ක්‍ෂත්‍රියයකුදු මෙසේ පුළුවුස්නාහු නම් : (කෙසේ යැ යත් :) යමක්හු හෝ පරිචර්‍යා කරන තට පරිචර්‍යා හේතුයෙන් පාපයෙක් වන්නේ යැ, හිතයෙක් නො වන්නේ යි. යමක්හු හෝ පරිචර්‍යා කරන තට පරිචර්‍යා හේතුයෙන් හිතයෙක් වන්නේ යැ, පාපයෙක් නො වන්නේ යි. මෙහි දී කවරක්හු පරිචර්‍යා කරන්නෙහි ද?''යි. බමුණ, ක්‍ෂත්‍රිය තෙමේත් මොනොවට ප්‍රකාශ කරනුයේ මෙසේ කියන්නේ යැ : ''යමක්හු පරිචර්‍යා කරන මට පරිචර්‍යා හේතුයෙන් පාපයෙක් වන්නේ ද හිතයෙක් නො වන්නේ ද, මම ඔහු පරිචර්‍යා නො කරන්නෙමි. යමක්හු වැළිත් පරිචර්‍යා කරන මට පරිචර්‍යා හේතුයෙන් හිතයෙක් වන්නේ ද පාපයෙක් නො වන්නේ ද, ඔහු මම පරිචර්‍යා කරන්නෙමි''යි.

බමුණ, ඉදින් බ්‍රාහ්මණයකුදු . . . . බමුණ, ඉදින් වෛශ්‍යයකුදු . . . . බමුණ, ඉදින් ශූද්‍රයකුදු මෙසේ විචාරන්නාහු නම් : (කෙසේ යැ යත් :) ''යමක්හු හෝ පරිචර්‍යා කරන තට පරිචර්‍යා හේතුයෙන් පාපයෙක් වන්නේ ද හිතයෙක් නො වන්නේ ද, යමක්හු හෝ පරිචර්‍යා කරන තට පරිචර්‍යා හේතුයෙන් හිතයෙක් වන්නේ ද පාපයෙක් නො වන්නේ ද, මෙහි දී කවරක්හු පරිචර්‍යා කරන්නෙහි ද?''යි. බමුණ, ශූද්‍ර තෙමේත් මොනොවට ප්‍රකාශ කරනුයේ මෙසේ කියන්නේ යැ : ''යමක්හු පරිචර්‍යා කරන මට පාරිචර්‍යා හේතුයෙන් පාපයෙක් වන්නේ ද හිතයෙක් නො වන්නේ ද, මම ඔහු පරිචර්‍යා නො කරන්නෙමි. යමක්හු වැළිත් පරිචර්‍යා කරන මට පාරිචර්‍යා හේතුයෙන් හිතයෙක් වන්නේ ද පාපයෙක් නො වන්නේ ද, ඔහු මම පරිචර්‍යා කරන්නෙමි''යි.

බමුණ, මම 'උසස් කුල ඇති බව ප්‍රශස්ත යැ'යි නො කියමි. බමුණ, වැළිත් මම 'උසස්කුල ඇති බව ලාමක යැ'යි ද නො කියමි. බමුණ, මම 'උදරවර්‍ණ ඇති බව උතුම් යැ'යි නො කියමි. බමුණ, මම 'උදරවර්‍ණ ඇති බව පාපක යැ'යි නො කියමි. බමුණ, මම 'උදරභෝග ඇති බව උත්තම යැ'යි නො කියමි. බමුණ, මම 'උදරභෝග ඇති බව පාපක යැ'යි නො කියමි.

බමුණ, උසස්කුල ඇති වූත් මෙලොවැ කිසිවෙක් පණිවා කරනු වෙයි, අයිනාදන් කරනු වෙයි, කාමයෙහි මිසහසර ඇති වෙයි, මුසවා බණනු වෙයි, පිසුණු තෙපුල් ඇති වෙයි, පරොස්බස් ඇති වෙයි, පලප් ඇති වෙයි, අභිධ්‍යා බිහිලි වෙයි, ව්‍යාපන්න සිත් ඇති වෙයි, මිසදිටු වෙයි. එහෙයින් උසස්කුල ඇති බව අතිශය ශ්‍රේෂ්ඨ යැ'යි නො කියමි. බමුණ, උසස්කුල ඇති වූත් මෙලොවැ කිසිවෙක් පණිවායෙන් වැළකියේ වෙයි, අයිනාදනින් වැළකියේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළකියේ වෙයි, මුසවායෙන් වැළකියේ වෙයි, පිසුණුබසින් වැළකියේ වෙයි, පරොස්බසින් වැළකියේ වෙයි, පලපින් වැළකියේ වෙයි, අභිධ්‍යා බහුල නො වෙයි, අව්‍යාපන්න සිත් ඇති වෙයි, සම්දිටු වෙයි. එහෙයින් උසස්කුල ඇති බව අතිශය පාපක යැ'යි නො කියමි.

බමුණ උදරවර්‍ණ ඇති වූත් . . . බමුණ, උදරභෝග ඇති වූත් මෙලොවැ කිසිවෙක් පණිවා කරනු වෙයි . . . මිසදිටු ඇති වෙයි. එහෙයින් 'උදරභෝග ඇති බව ශ්‍රේෂ්ඨ යැ'යි නො කියමි. බමුණ, උදරභෝග ඇති වූත් මෙලොවැ කිසිවෙක් පණිවායෙන් වෙන් වූයේ වෙයි . . . සම්දිටු ඇති වෙයි. එහෙයින් 'උදරභෝග ඇති බව පාපක යැ'යි නො කියමි.

බමුණ, මම හැම පරිචර්‍යා කටයුතු යැ'යි නො කියමි. බමුණ, වැළිත් මම හැම පරිචර්‍යා නො කටයුතු යැ'යි නො කියමි. බමුණ, යමක්හු පරිචර්‍යා කරන ඔහට පරිචර්‍යා හේතුයෙන් ශ්‍රද්ධාව වැඩේ ද, ශීලය වැඩේ ද, ශ්‍රුතය වැඩේ ද, ත්‍යාගය වැඩේ ද, ප්‍රඥාව වැඩේ ද, මම ඔහු පරිචර්‍යා කටයුතු යැ යි කියමි. බමුණ යමක්හු පරිචර්‍යා කරන ඔහට පරිචර්‍යා හේතුයෙන් ශ්‍රද්ධාව නො වැඩේ ද, ශීලය නො වැඩේ ද, ශ්‍රුතය නො වැඩේ ද, ත්‍යාගය නො වැඩේ ද, ප්‍රඥාව නො වැඩේ ද, මම ඔහු පරිචර්‍යා නො කටයුතු යැ'යි කියමි'යි.

එවං වුත්තෙ එසුකාරී බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: බ්‍රාහ්මණා භො ගොතම, චත්තාරි ධනානි පඤ්ඤපෙන්ති. බ්‍රාහ්මණස්ස සන්ධනං පඤ්ඤපෙන්ති, ඛත්තියස්ස සන්ධනං පඤ්ඤපෙන්ති. වෙස්සස්ස සන්ධනං පඤ්ඤපෙන්ති. සුද්දස්ස සන්ධනං පඤ්ඤපෙන්ති.

තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා බ්‍රාහ්මණස්ස සන්ධනං පඤ්ඤපෙන්ති භික්ඛාචරියං. භික්ඛාචරියඤ්ච පන බ්‍රාහ්මණො සන්ධනං අතිමඤ්ඤමානො අකිච්චකාරී හොති ගොපොව අදින්නං ආදියමානොති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා බ්‍රාහ්මණස්ස සන්ධනං පඤ්ඤපෙන්ති.

තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා ඛත්තියස්ස සන්ධනං පඤ්ඤපෙන්ති ධනුකලාපං. ධනුකලාපඤ්ච පන ඛත්තියො සන්ධනං අතිමඤ්ඤමානො අකිච්චකාරී හොති. ගොපොව අදින්නං ආදියමානො'ති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා ඛත්තියස්ස සන්ධනං පඤ්ඤපෙන්ති.

තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා වෙස්සස්ස සන්ධනං පඤ්ඤපෙන්ති කසිගොරක්ඛං. කසිගොරක්ඛඤ්ච පන වෙස්සො සන්ධනං අතිමඤ්ඤමානො අකිච්චකාරී හොති ගොපොව අදින්නං ආදියමානො'ති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා වෙස්සස්ස සන්ධනං පඤ්ඤාපෙන්ති.

තත්‍රිදං භො ගොතම, බ්‍රාහ්මණා සුද්දස්ස සන්ධනං පඤ්ඤාපෙන්ති අසිතබ්‍යාභඞ්ගිං. අසිතබ්‍යාභඞ්ගිඤ්ච පන සුද්දො සන්ධනං අතිමඤ්ඤ-මානො අකිච්චකාරී හොති ගොපොව අදින්නං ආදියමානො'ති. ඉදං ඛො භො ගොතම, බ්‍රාහ්මණා සුද්දස්ස සන්ධනං පඤ්ඤාපෙන්ති බ්‍රාහ්මණා භො ගොතම, ඉමානි චත්තාරි ධනානි පඤ්ඤාපෙන්ති. ඉධ භවං ගොතමො කිමාහාති.

කිං පන බ්‍රාහ්මණ, සබ්බො ලොකො බ්‍රාහ්මණානං එතදබ්භනුජානාති. ඉමානි චත්තාරි[1] ධනානි පඤ්ඤාපෙන්තීති[2] නො හිදං භො ගොතම.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසො දළිද්දො අස්සකො අනාළ්හියො තස්ස අකාමස්ස බිලං ඔලග්ගෙය්‍යුං: ඉදං තෙ අම්භො පුරිස, මංසං ඛාදිතබ්බං මූලඤ්ච අනුප්පදාතබ්බන්ති. එවමෙව ඛො බ්‍රාහ්මණ, අප්පටිඤ්ඤාය තෙසං[3] සමණබ්‍රාහ්මණානං. අථ ච පනිමානි චත්තාරි ධනානි පඤ්ඤාපෙන්ති:

අරියං ඛො අහං බ්‍රාහ්මණ, ලොකුත්තරං ධම්මං පුරිසස්ස සන්ධනං පඤ්ඤාපෙමි. පොරාණං ඛො පනස්ස මාතාපෙත්තිකං කුලවංසං අනුස්සරතො යත්ථ යත්ථෙව අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. ඛත්තියකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, ඛත්තියොත්වෙව සඞ්ඛං ගච්ඡති. බ්‍රාහ්මණකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, බ්‍රාහ්මණොත්වෙව සඞ්ඛං ගච්ඡති. වෙස්සකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, වෙස්සොත්වෙව සඞ්ඛං ගච්ඡති සුද්දකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, සුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡති.

---

1. චත්තාරි - PTS, ඌනං. 2. පඤ්ඤාපෙතූති - මජසං, ස්‍යා, PTS.
3. අප්පටිඤ්ඤායෙ තෙසං - PTS.

මෙසේ වදාළ කල්හි ඒසුකාරි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙල කී : ‘භවත් ගෞතමයෙනි, බමුණෝ සතර ධන කෙනකුන් පනවති : බමුණුහට ස්වකීය ධනයක් පනවති, ක්‍ෂත්‍රියහට ස්වකීය ධනයක් පනවති, වෛශ්‍යහට ස්වකීය ධනයක් පනවති, ශූද්‍රහට ස්වකීය ධනයක් පනවති.

භවත් ගෞතමයෙනි, එහි ලා බමුණෝ බ්‍රාහ්මණහට මේ ස්වකීය ධනය පනවති. භික්ෂා චර්‍ය්‍යාව යි. බමුණු වැළිත් ස්වකීය ධනය වූ භික්ෂාචර්‍ය්‍යාව ඉක්මවා සිතනුයේ (රැක්කයුතු බඩු) නෙනාගන්නා අරක් මෙමෙහ නියුතුවකු සෙයින් නොකටයුතු කරන්නේ වෙයි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ බමුණුහට මේ ස්වකීයධනය පනවති.

භවත් ගෞතමයෙනි, එහි ලා බ්‍රාහ්මණයෝ ක්‍ෂත්‍රියහට මේ ස්වකීය ධනය පනවති : දුනුහියවුරු යි. ක්‍ෂත්‍රිය වැළිත් ස්වකීය ධනය වූ දුනුහියවුරු ඉක්මවා සිතනුයේ (රැක්කයුතු බඩු) නෙනාගන්නා අරක් මෙමෙහ නියුතුවකු සෙයින් නොකටයුතු කරනුයේ වෙයි.

භවත් ගෞතමයෙනි, එහි ලා බ්‍රාහ්මණයෝ වෛශ්‍යහට මේ ස්වකීයධනය පනවති : කෘෂිකම හා ගෝරක්ෂා යි. වෛශ්‍ය වැළිත් ස්වකීය ධනය වූ කෘෂිගෝරක්ෂා ඉක්මවා සිතනුයේ (රැක්කයුතු බඩු) නෙනාගන්නා අරක්මෙමෙහ නියුතුවකු සෙයින් නො කටයුතු කරනුයේ වෙයි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ වෛශ්‍යහට මේ ස්වධනය පනවති.

භවත් ගෞතමයෙනි, එහි ලා බ්‍රාහ්මණයෝ ශූද්‍රහට මේ ස්වධනය පනවති : (තණ කපන) දෑකැත්ත හා කද යි. ශූද්‍ර වැළිත් ස්වධනය වූ දෑකැත්ත හා කද ඉක්මවා සිතනුයේ (රැක්කයුතු බඩු) නෙනාගන්නා අරක්මෙමෙහ නියුතුවකු සෙයින් නොකටයුතු කරනුයේ වෙයි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයෝ ශූද්‍රහට මේ ස්වධනය පනවති. භවත් ගෞතමයෙනි, බ්‍රාහමණයෝ මේ සතර ධනයන් පනවති. මෙහි ලා භවත් ගෞතමයෝ කුමක් කියත් ද? යි.

කිම බමුණ, ‘මෙ සතර ධනයන් පනවති’යි සියලු ලෝකයා බමුණන්ගේ මෙල පැනවීම අනුදනී ද?යි. භවත් ගෞතමයෙනි, මෙ කරුණ නො වේ මැ යි.

බමුණ, යම්සේ සහල් නැළියෙක ධනයකුදු නැති ස්වකීය වූ කිසිවක් නැති දිළිඳු පුරුෂයෙක් වේ ද, නො කැමැති ඔහට ‘එම්බා පුරුෂය, තා විසින් මේ මස් කැයුතු යැ, මස්මිළ ද දියයුතු යැ’යි මිළ කොටස නංවන්නාහු ද, එසෙයින් මැ බමුණ, ඒ මහණබමුණන්ගේ පිළිත නැති වැ එතෙකුදු වත් මේ සතර ධනයන් පනවති.

බමුණ, මම ආර්‍ය්‍ය වූ ලෝකොත්තර ධර්‍මය පුරුෂයාගේ ස්වධන කොට පනවමි. පැරැණි වූ මව්පිය සතු කුලවංසය සිහි කරන ඔහුගේ ආත්මභාවය යම් යම් කුලවංසයෙක මැ ඉපැත්ම වේ ද, ඒ ඒ කුලවංසයෙන් මැ ගිණීමට යෙයි. ඉදින් කැත්කුලයෙහි ආත්මභාවයාගේ ඉපැත්ම වේ ද, ‘ක්‍ෂත්‍රියහ’යි මැ ගිණීමට යෙයි. ඉදින් බමුණුකුලයෙහි ආත්මභාවයාගේ ඉපැත්ම වේ ද, ‘බ්‍රාහ්මණයහ’යි මැ ගිණීමට යෙයි, ඉදින් වෛශ්‍යකුලයෙහි ආත්මභාවයාගේ ඉපැත්ම වේ ද, ‘වෛශ්‍යයහ,යි මැ ගිණීමට යෙයි, ඉදින් ශූද්‍රකුලයෙහි ආත්මභාවයාගේ ඉපැත්ම වේ ද, ‘ශූද්‍රයහ’යි මැ ගිණීමට යේ.

44—ජෝ 13561 (11/72)

සෙය්‍යථාපි බ්‍රාහ්මණ යඤ්ඤදෙව පච්චයං පටිච්ච අග්ගි ජලති, තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. කට්ඨඤ්චෙ පටිච්ච අග්ගි ජලති, කට්ඨග්ගිත්වෙව සඞ්ඛං ගච්ඡති. සකලිකඤ්චෙ පටිච්ච අග්ගි ජලති, සකලිකග්ගිත්වෙව සඞ්ඛං ගච්ඡති. තිණඤ්චෙ පටිච්ච අග්ගි ජලති, තිණග්ගිත්වෙව සඞ්ඛං ගච්ඡති. ගොමයඤ්චෙ පටිච්ච අග්ගි ජලති, ගොමයග්ගිත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො අහං බ්‍රාහ්මණ, අරියං ලොකුත්තරං ධම්මං පුරිසස්ස සන්ධනං පඤ්ඤාපෙමි. පොරාණං ඛො පනස්ස මාතාපෙත්තිකං කුලවංසං අනුස්සරතො යත්ථ යත්ථෙව අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. ඛත්තියකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, ඛත්තියොත්වෙව සඞ්ඛං ගච්ඡති. බ්‍රාහ්මණකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, බ්‍රාහ්මණොත්වෙව සඞ්ඛං ගච්ඡති. වෙස්සකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, වෙස්සොත්වෙව සඞ්ඛං ගච්ඡති. සුද්දකුලෙ චෙ අත්තභාවස්ස අභිනිබ්බත්ති හොති, සුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඛත්තියකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, අබ්‍රහ්මචරියා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුණා වාචා පටිවිරතො හොති, ඵරුසා වාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති. අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨි හොති, ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. බ්‍රාහ්මණකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- සම්මාදිට්ඨි හොති, ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. වෙස්සකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- සම්මාදිට්ඨි හොති, ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. සුද්දකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- ඤායං ධම්මං කුසලං.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, බ්‍රාහ්මණොව නු ඛො පහොති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙතුං. නො ඛත්තියො, නො වෙස්සො, නො සුද්දොති?

නො හිදං භො ගොතම, ඛත්තියො පි හි භො ගොතම, පහොති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙතුං. බ්‍රාහ්මණොපි හි භො ගොතම, -පෙ- වෙස්සොපි හි භො ගොතම, -පෙ- සුද්දොපි හි භො ගොතම, -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පහොන්ති අස්මිං පදෙසෙ අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙතු'න්ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, ඛත්තියකුලා චෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- ඤායං ධම්මං කුසලං. බ්‍රාහ්මණකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- වෙස්සකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- සුද්දකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච

බමුණ, යම් පරිදි යම් යම් මැ ප්‍රත්‍යයක් පිණිස ගිනි දිලේ ද, ඒ ඒ ප්‍රත්‍යයෙන් මැ ගිණීමට යෙයි. ඉදින් කාෂ්ඨය නිසා ගිනි දල්වේ ද, ‘කාෂ්ඨාග්නි’ යයි මැ ගිණීමට යෙයි, ඉදින් පතුරු නිසා ගිනි දල්වේ ද, ‘පතුරුගිනි’යයි මැ ගිණීමට යෙයි, ඉදින් තෘණ නිසා ගිනි දල්වේ ද, ‘තෘණාග්නි’යයි මැ ගිණීමට යෙයි, ඉදින් ගොම නිසා ගිනි දල්වේ ද, ‘ගොමයාග්නි’ යයි මැ ගිණීමට යේ. බමුණ, එපරිදි මැ මම ආර්‍ය වූ ලෝකෝත්තර ධර්මය පුරුෂයාගේ ස්වධන කොට පනවමි. පැරැණි වූ මව්පියන්ගෙන් පැවැත එන කුලවංසය සිහි කරන ඔහුගේ ආත්මභාවොත්පත්තිය යම් යම් කුලවංශයකැ මැ වේ ද, ඒ ඒ කුලවංශයෙහි මැ ගිණීමට යෙයි, ඉදින් ක්‍ෂත්‍රියකුලයෙහි ආත්මභාවෝත්පත්ති වේ නම් ‘ක්‍ෂත්‍රියහ’යි මැ ගිණීමට යෙයි, ඉදින් බ්‍රාහ්මණකුලයෙහි ආත්මභාවෝත්පත්ති වේ නම් ‘බ්‍රාහ්මණයහ’යි මැ ගිණීමට යෙයි, ඉදින් වෛශ්‍යකුලයෙහි ආත්මභාවෝත්පත්ති වේ නම් ‘වෛශ්‍යයහ’යි මැ ගිණීමට යෙයි, ඉදින් ශූද්‍රකුලයෙහි ආත්මභාවෝත්පත්ති වේ නම් ‘ශූද්‍රයහ’යි මැ ගිණීමට යේ.

බමුණ, ඉදින් ක්‍ෂත්‍රියකුලයෙනුදු ගිහිගෙන් නික්ම සස්නට වැදුණේ වේ ද, හෙ ද තථාගත-ප්‍රවිදිත ධර්මවිනය ලැබ පණිවායෙන් වැළකියේ වේද. අයිනාදනින් වැළකියේ වේ ද, අබ්‍රම්සරින් වැළකියේ වේ ද, මුසවායෙන් වැළකියේ වේ ද, පිසුණුබසින් වැළකියේ වේ ද, පරොස් බසින් වැළකියේ වේ ද, පලපින් වැළකියේ වේ ද, අභිධ්‍යා බහුල නො වේ ද, ව්‍යාපන්නයිත් නැතියේ වේ ද, සම්දිටු වේ ද, න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරධනා කරනු වෙයි. බමුණ, බ්‍රාහ්මණකුලයෙනුදු ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, හෙ ද තථාගතප්‍රවිදිත ධර්මවිනයට පැමිණ පණිවායෙන් වැළකියේ වේ ද . . . සම්දිටු වේ ද, (හේ) න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි. බමුණ ඉදින් වෛශ්‍ය කුලයෙනුදු ගිහිගෙන් නික්ම සස්නට පැමිණියේ වේ ද, හෙ ද තථාගතප්‍රවිදිත ධර්මවිනයට පැමිණ පණිවායෙන් වැළකියේ වේ ද . . . සම්දිටු වේ ද, හේ ද න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි. බ්‍රාහ්මණය, ශූද්‍රකුලයෙනුදු ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, හේ ද තථාගතප්‍රවිදිත ධර්මවිනයට පැමිණ පණිවායෙන් වැළකියේ වේ ද, ... හේ ද න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වේ.

බමුණ, ඒ කෙසේ හඟිහි? බමුණෙක් මැ මෙපෙදෙසෙහි අවෛර නිර්දුඃඛ මෛත්‍රී චිත්තය වඩන්නට පොහොනේ වේ ද, ක්‍ෂත්‍රියයෙක් පොහොනේ නො වේ ද, වෛශ්‍යයෙක් පොහොනේ නො වේ ද, ශූද්‍රයෙක් පොහොනේ නො වේ ද?

භවත් ගෞතමයෙනි, මේ නොවන්නෙකි, භවත් ගෞතමයෙනි, ක්‍ෂත්‍රියයෙකුදු මෙ පෙදෙස්හි අවෛර නිර්දුඃඛ මෛත්‍රීචිත්තය භවන්නට පොහොනේ ය. භවත් ගෞතම-යෙනි, බ්‍රාහ්මණයෙකුදු . . . භවත් ගෞතමයෙනි, වෛශ්‍යයෙකුදු . . . භවත් ගෞතමයෙනි, ශූද්‍රයෙකුදු . . . භවත් ගෞතමයෙනි, හැම චතුර්වර්ණයෝ මැ මෙපෙදෙසෙහි අවෛර නිර්දුඃඛ මෛත්‍රීචිත්තය භවන්නට පොහොනාහු වෙත්.

බමුණ, එ පරිදි මැ කැත්කුලිනුදු වෙවයි ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, හෙ ද තථාගතප්‍රවිදිත දහම්විනය දන පණිවායෙන් වැළකියේ වේ ද, ... න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි බමුණ, බමුණුකුලෙනුදු වෙවයි . . . බමුණ, වෛශ්‍ය කුලයෙනුදු වෙවයි . . . බමුණ, ශූද්‍රකුලයෙනුදු වෙවයි ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ

තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, අබ්‍රහ්මචරියා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනා වාචා පටිවිරතො හොති, ඵරුසා වාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති. අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨී හොති, ආරාධකො හොති ඤායං ධම්මං කුසලං.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, බ්‍රාහ්මණොව නු ඛො පහොති සොත්තිං සිනානිං[1] ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුං. නො ඛත්තියො, නො වෙස්සො, නො සුද්දොති?

නො හිදං භො ගොතම, ඛත්තියොපි හි භො ගොතම, පහොති සොත්තිං සිනානිං[1] ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුං. බ්‍රාහ්මණොපි හි භො ගොතම -පෙ- වෙස්සොපි හි භො ගොතම -පෙ- සුද්දොපි හි භො ගොතම -පෙ- සබ්බෙපි හි භො ගොතම, චත්තාරො වණ්ණා පහොන්ති සොත්තිං සිනානිං ආදාය නදිං ගන්ත්වා රජොජල්ලං පවාහෙතුන්ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, ඛත්තියකුලා චෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. බ්‍රාහ්මණකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- වෙස්සකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- සුද්දකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, -පෙ- ආරාධකො හොති ඤායං ධම්මං කුසලං.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, ඉධ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නානාජච්චානං පුරිසානං පුරිසසතං සන්නිපාතෙය්‍ය, ආයන්තු භොන්තො යෙ තත්ථ ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රජඤ්ඤකුලා උප්පන්නා සාකස්ස වා[2] සාලස්ස වා, සලලස්ස වා චන්දනස්ස වා පදුමකස්ස වා උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙන්තු තෙජො පාතුකරොන්තු. ආයන්තු පන භොන්තො යෙ තත්ථ චණ්ඩාලකුලා නෙසාදකුලා වෙණකුලා[3] රථකාරකුලා පුක්කුසකුලා උප්පන්නා, සාපානදොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එළණ්ඩකට්ඨස්ස වා උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙන්තු තෙජො පාතුකරොන්තූති. තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, යො එව නු ඛො සො ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රජඤ්ඤකුලා උප්පන්නෙහි සාකස්ස වා සාලස්ස වා සලලස්ස වා චන්දනස්ස වා පදුමකස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො, සොව නු ඛ්වස්ස අග්ගි අච්චිමා චෙව වණ්ණිමා ච පභස්සරො ච, තෙන ච සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං. යො පන සො චණ්ඩාලකුලා නෙසාදකුලා වෙණකුලා[3] රථකාරකුලා පුක්කුසකුලා උප්පන්නෙහි සාපානදොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එළණ්ඩකට්ඨස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තො තෙජො පාතුකතො. ස්වාස්ස අග්ගි න චෙව අච්චිමා න ච වණ්ණිමා න ච පභස්සරො, න ච තෙන සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුන්ති.

---

1. සොත්තිසිනානිං - මජසං.
2. සාකස්ස වා - සිමු, තජී.
3. වෙණුකුලා - සිමු.

වේ ද, මෙ ද තථාගතප්‍රවිදිත ධර්මවිනයට පැමිණ පණිවායෙන් වැළකියේ වේ ද, අයිනාදනින් වැළකියේ වේ ද, අබ්‍රම්සරින් වැළකියේ වේ ද, මුසවායෙන් වැළකියේ වේ ද, පිසුණුබසින් වැළකියේ වේ ද, පරොස්බසින් වැළකියේ වේ ද, පලපින් වැළකියේ වේ ද, අභිධ්‍යාබහුල නො වේ ද, අව්‍යාපන්න චිත්ත ඇති වේ ද, සම්දිටු වේ ද, හේ න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි.

බමුණ, ඒ කෙසේ හඟිහි? බමුණෙක් මැ නහන්නට කළ කුරුඳුවැළ ගෙන හොයට ගොස් රජස් දූලි සෝධා ලන්නට පොහොනේ වේ ද, ක්‍ෂත්‍රියයෙක් පොහොනේ නො වේ ද, වෛශ්‍යයෙක් පොහොනේ නො වේ ද, ශුද්‍රයෙක් පොහොනේ නො වේ ද?

භවත් ගෞතමයෙනි, මේ නොවන්නෙක් මැ යි. භවත් ගෞතමයෙනි, ක්‍ෂත්‍රියෙකුදු නහන්නට කළ කුරුඳුවැළ ගෙන හොයට වැද රජස්දූලි සෝධාලන්නට පොහොනේ යැ. භවත් ගෞතමයෙනි, බමුණෙකුදු . . . භවත් ගෞතමයෙනි, වෛශ්‍යයෙකුදු . . . භවත් ගෞතමයෙනි, ශුද්‍රයෙකුදු . . . භවත් ගෞතමයෙනි, හැම චතුර්වර්ණයෝ මැ නහන කළ කුරුඳුවැළ ගෙන හොයට වැද රජස්දූලි බහන්නට පොහොනාහු වෙති.

බමුණ, එ පරිදි මැ කැත්කුලෙනුදු වෙවයි ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, මෙ ද තථාගතයන් වහන්සේ විසින් වදහළ දහම්විනය දූන පණිවායෙන් වෙන් වූයේ වේ ද . . . . (හෙ) න්‍යායසඞ්ඛ්‍යාතකුශල ධර්මය ආරාධනා කරනු වෙයි. බමුණ බමුණුකුලෙනුදු වෙවයි . . . . බමුණ. වෛශ්‍යකුලයෙනුදු වෙවයි . . . බමුණ, ශුද්‍රකුලයෙනුදු වෙවයි ගිහිගෙන් බැස පැවිද්දට පැමිණියේ වේ ද, මෙ ද බුදුන් වදහළ දහම්විනය දූන පණිවායෙන් වෙන් වූයේ වේ ද, . . . (හෙ) න්‍යායසඞ්ඛ්‍යාතකුශලධර්මය ආරාධනා කරනු වෙයි.

බමුණ, ඒ කෙසේ හඟිහි? මෙලොවැ මුදුනෙහි බිසෙස් කළ කැත්රජෙක් නානා ජාතියෙහි උපන් සියක් පුරුෂයන් මුළු දෙවන්නේ යැ, භවත්හු අප කරා එත්වා, ඒ මුළුයෙහි කැත්කුල බමුණුකුල රජකුල උපන් යම් කෙනෙක් ඇද්ද, ඔහු සල්මුවා හෝ සලලමුවා හෝ සඳුන්මුවා හෝ පියුමුමුවා හෝ උතුරුරිණි ගෙන ගිනි දල්වත්වා තෙද නහත්වා භවත්හු අප කරා එත්වා, ඒ මුළුයෙහි සැඬල්කුල වැදිකුල කුලුපොතුකුල රියකරු කුල පුප්සඩුකුල උපන් යම් කෙනෙක් ඇද්ද, බලුදෙණිමුවා හෝ හූරුදෙණිමුවා හෝ රදදෙණි මුවා හෝ එරණඩකාෂටමය හෝ උතුරුරිණි ගෙන ගිනි දල්වත්වා, තෙද පහල කෙරෙත්වා. බමුණ, ඒ කෙසේ හඟිහි? කැත්කුල හෝ බමුණුකුල හෝ රජකුල හෝ උපනුන් විසින් ශාකමය වූ හෝ සාලමය වූ හෝ සලලමය වූ හෝ චන්‍දනමය වූ හෝ පද්මකමය වූ හෝ උතුරුරිණි ගෙන ඉපැයූ පහළ කළ යම් ඒ ගින්නෙක් තෙදෙක් වේ ද, ඒ ගිනි මැ සිළු ඇතියේත් වර්ණ ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වේ ද, ඒ ගින්නෙන් ගිනිකරණී කරන්නට හැකි වේ ද, සැඬල්කුල හෝ වැදිකුල හෝ කුලුපොතුකුල හෝ රියකරුකුල හෝ පුප්සඩුකුල හෝ උපනුන් විසින් බලුදෙණිමුවා හෝ හූරුදෙණිමුවා හෝ රදදෙණිමුවා හෝ එරණඩ කාෂටමය වූ හෝ උතුරුරිණි ගෙන ඉපැයූ පහළ කළ යම් ගින්නෙක් තෙදෙක් වේ ද, ඒ ගිනි ද සිළු ඇතියේ නො වේ ද, වර්ණ ඇතියේ නො වේ ද, ප්‍රභාස්වර නො වේ ද, ඒ ගින්නෙන් ගිනිකරණී කරන්නට නො හැකි වේ ද?

නො හිදං භො ගොතම, යො සො භො ඛත්තියකුලා බ්‍රාහ්මණකුලා රාජඤ්ඤකුලා උප්පන්නෙහි සාකස්ස වා සාලස්ස වා සලළස්ස වා චන්දනස්ස වා පදුමකස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තෙන්තො, තෙජො පාතුකතො. ස්වාස්ස අග්ගි අච්චිමා චෙව වණ්ණිමා ච පභස්සරො ච. තෙන ච සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං. යොපි සො චණ්ඩාලකුලා නෙසාදකුලා වෙණකුලා රථකාරකුලා පුක්කුසකුලා උප්පන්නෙහි සාපානදොණියා වා සූකරදොණියා වා රජකදොණියා වා එළණ්ඩකට්ඨස්ස වා උත්තරාරණිං ආදාය අග්ගි අභිනිබ්බත්තෙන්තො, තෙජො පතුකතො. ස්වාස්ස අග්ගි අච්චිමා චෙව වණ්ණිමා ච පභස්සරො ච. තෙනපි ච[1] සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුං. සබ්බොපි භො ගොතම, අග්ගි අච්චිමා චෙව වණ්ණිමා ච පභස්සරො ච සබ්බෙනපි ච[2] සක්කා අග්ගිනා අග්ගිකරණීයං කාතුන්ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, ඛත්තියකුලා චෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති-පෙ-ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. බ්‍රාහ්මණකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- වෙස්සකුලා චෙපි බ්‍රාහ්මණ, -පෙ- සුද්දකුලා චෙපි බ්‍රාහ්මණ, අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, අබ්‍රහ්මචරියා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨි හොති, ආරාධකො හොති ඤායං ධම්මං කුසලන්ති.

එවං වුත්තෙ එසුකාරි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම-පෙ-උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත’න්ති.

එසුකාරිසුත්තං ඡට්ඨමං.

---

1. තෙන ච - මජ්සං.
2. සබ්බෙනපි - මජ්සං.

භවත් ගෞතමයෙනි, මේ නොවන්නෙක් මැ යි. භවත් ගෞතමයෙනි, ක්ෂත්‍රියකුලයෙන් හෝ බ්‍රාහ්මණ කුලයෙන් හෝ රාජන්‍යකුලයෙන් හෝ උපනුන් විසින් ශාකමය වූ හෝ සාලමය වූ හෝ සලළමය වූ හෝ චන්‍දනමය වූ හෝ පදුමකමය වූ හෝ උතුරුරිණි ගෙන පහළ කළ යම් ඒ ගින්නෙක් තෙදෙක් වේ ද, ඒ ගිනි සිළු ඇතියේත් වණි ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වෙයි, ඒ ගින්නෙනුදු ගිනිකරණි කරන්නට හැකි යැ. චණ්ඩාලකුලයෙන් ව්‍යාධ කුලයෙන් වේණකුලයෙන් රථකාරකුලයෙන් පුක්කුසකුලයෙන් උපනුන් විසින් බලුදෙණිමුවා හෝ හූරුදෙණිමුවා හෝ රදදෙණිමුවා හෝ එරණඩකාෂ්ඨමය හෝ උතුරුරිණි ගෙන උපදවනලද ප්‍රාදුර්භූත කළ යම් ඒ ගින්නෙක් තෙදෙක් ඇද්ද, ඒ ගිනි අර්චිෂ්මත් වූයේත් වණිවත් වූයේත් ප්‍රභාස්වර වූයේත් වෙයි. ඒ ගින්නෙනුදු ගිනිකරණි කරන්නට හැකි යැ. භවත් ගෞතමයෙනි, හැම ගිනි මැ අර්චිෂ්මත් ද වණිවත් ද ප්‍රභාස්වර ද වෙයි, හැම ගින්නෙනුදු ගිනිකරණි කරන්නට හැකි යැ.

බමුණ, එපරිදි මැ ක්ෂත්‍රියකුලයෙනුදු ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, හෙ ද තථාගතයන් වහන්සේ විසින් වදළ දහම්විනය දන පණිවායෙන් දුරු වූයේ වේ ද . . . . (හෙ) න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි. බමුණ, බ්‍රාහ්මණකුලයෙනුදු . . . . . බමුණ, වෛශ්‍යකුලයෙනුදු . . . . බමුණ, ශූද්‍රකුලයෙනුදු ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වේ ද, හෙ ද තථාගතප්‍රවිදිත ධර්මවිනයට පැමිණ ප්‍රාණවධයෙන් වැළකියේ වේ ද, අදත්තාදනයෙන් වැළකියේ වේ ද, අබ්‍රහ්මචය්‍ර්‍යයෙන් වැළකියේ වේ ද, මෘෂාවාදයෙන් වැළකියේ වේ ද, පෛශුන්‍ය බසින් වැළකියේ වේ ද, පරුෂ බසින් වැළකියේ වේ ද, සම්ඵප්‍රලාපයෙන් වැළකියේ වේ ද, අභිධ්‍යාබහුල නො වේ ද, අව්‍යාපන්න සිත් ඇතියේ වේ ද, සම්‍යග්දෘෂ්ටික වේ ද, හෙ න්‍යාය සඞ්ඛ්‍යාත කුශලධර්මය ආරාධනා කරනු වෙයි.

මෙසේ වදළ කලැ එසුකාරී බ්‍රාහ්මණ භගවත්හට තෙල කී : ''භවත් ගෞතමයෙනි, ඉතා මැනැවැ, භවත් ගෞතමයෙනි, ඉතා මැනැවැ. . . . . භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට මා දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට ධරන සේක්වයි.

සවැනි එසුකාරිසූත්‍ර යි.

2. 5. 7

ධනඤ්ජානිසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො දක්ඛිණාගිරිස්මිං චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. අථ ඛො අඤ්ඤතරො භික්ඛු රාජගහෙ වස්සං වුත්ථො යෙන දක්ඛිණාගිරි යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො තං භික්ඛුං ආයස්මා සාරිපුත්තො එතදවොච:

කච්චාවුසො, භගවා අරොගො ච බලවා චා’ති?

අරොගො චාවුසො, භගවා බලවා චා’ති.

කච්චි පනාවුසො, භික්ඛුසඞ්ඝො අරොගො ච බලවා චා’ති?

භික්ඛු සඞ්ඝොපි ඛො ආවුසො, අරොගො ච බලවා චා’ති.

එත්ථාවුසො, තණ්ඩුලපාලද්වාරයං[1] ධනඤ්ජානි[2] නාම බ්‍රාහ්මණො අත්ථි. කච්චාවුසො, ධනඤ්ජානි නාම බ්‍රාහ්මණො අරොගො ච බලවා චාති.

ධනඤ්ජානිපි ඛො අවුසො, බ්‍රාහ්මණො අරොගො ච බලවා චාති.

කච්චි පනාවුසො ධනඤ්ජානි බ්‍රාහ්මණො අප්පමත්තොති.

කුතො නො ආවුසො, ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස අප්පමාදො? ධනඤ්ජානි ආවුසො, බ්‍රාහ්මණො රාජානං නිස්සාය බ්‍රාහ්මණගහපතිකෙ විලුම්පති. බ්‍රාහ්මණගහපතිකෙ. නිස්සාය රාජානං විලුම්පති. යාපිස්ස භරියා සද්ධා සද්ධාකුලා[3] ආනීතා, සාපිස්ස කාලකතා, අඤ්ඤා’ස්ස[4] භරියා අස්සද්ධා අස්සද්ධාකුලා[5] ආනීතා’ති.

දුස්සුතං වතාවුසො අස්සුම්හා, දුස්සුතං වතාවුසො අස්සුම්හා, යෙ මයං ධනඤ්ජානිං බ්‍රාහ්මණං පමත්තං අස්සුම්හා. අප්පෙවනාම මයං කදාචි කරහචි ධනඤ්ජානිනා බ්‍රාහ්මණෙන සද්ධිං සමාගච්ඡෙය්‍යාම. අප්පෙවනාම සියා කොචිදෙව කථාසල්ලාපො’ති.

---

1. තණ්ඩුලපාලිද්වාරයං - මජසං.
2. ධානඤ්ජානි - PTS.
3. සද්ධකුලා - මජසං.
4. අඤ්ඤස්ස - සිමු, මජසං.
5. අස්සද්ධකුලා - මජසං.

Free Distribution www.aathaapi.org

2. 5. 7
ධනඤ්ජානි සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කළන්‍දකනිවාප නම් වූ වේළුවන විහාරයෙහි වැඩ වාස කරන සේක. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ දක්ඛිණාගිරි දනව්වෙහි මහත් භික්ෂුසඝයා හා සමග සැරිසරන සේක. එසඳ එක්තරා මහණෙක් රජගහනුවර වස් විසුයේ දක්ඛිණාගිරි දනව්ය කරා ගියේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් කරා එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමග සතුටු වී. සම්මොදනායට නිසි සිහි කරනුවට නිසි කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඒ මහණහට ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහු :

"කිම ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නිරොග සේක් ද? කායබල ඇති සේක් ද?"

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නිරොග සේක. කායබල ඇති සේකැ'යි.

කිම ඇවැත්නි, භික්ෂුසඞ්ඝයා නිරොග වේ ද? කායබල ඇති වේ ද?

ඇවැත්නි, භික්ෂුසඞ්ඝයා ද නිරොග වෙයි කායබල ඇති වේ'යයි.

ඇවැත්නි, මෙහි තණ්ඩුලපාලද්වාරයෙහි ධනඤ්ජානි නම් බමුණෙක් ඇත. කිම ඇවැත්නි, ධනඤ්ජානි නම් බමුණු නිරොග වේ ද, කායබල ඇති වේ ද?

ඇවැත්නි, ධනඤ්ජානි බමුණුත් නිරොග වෙයි, කායබල ඇති වේ'යයි.

කිම ඇවැත්නි, ධනඤ්ජානි බමුණු අප්‍රමත්ත වේ ද?

ඇවැත්නි, කොයින් නම් ධනඤ්ජානි බමුණුහට අප්‍රමාදයෙක් ඇද්ද? ඇවැත්නි, ධනඤ්ජානි බමුණු රජු ඇසිරි කොට බමුණුගැහැවියන් විලුම්ප න කෙරෙයි. බමුණුගැහවි-යන් ඇසිරි කොට රජු අසිදගනී. උහුගේ සැදැහැතිකුලෙන් ගෙන ආ යම් සැදැහැති බිරියක් වූ ද උහුගේ ඒ බිරිය ද කලුරිය කළා. උහුට සැදැහැ නැති කුලයෙකින් සැදැහැ නැති අන්බිරියක් ගෙන එනලදු.

අපි ධනඤ්ජානි බමුණු අප්‍රමත්ත වූවහු ඇසුමෝ වේ ද, එහෙයින් ඇවැත්නි, නපුරු ඇසුමක් ඇසුමෝ මැ යැ, ඇවැත්නි, නපුරු ඇසුමක් ඇසුමෝ මැ යි. අපි කිසියම් දිනෙකැ ධනඤ්ජානි බමුණු හා සමග එකතු වන්නමෝ නම් මැනැවැ. එසඳ කිසියම් කථා සල්ලාපයෙක් වෙ නම් මැනැවැ යි.

අථ ඛො ආයස්මා සාරිපුත්තො දක්ඛිණාගිරිස්මිං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං ආයස්මා සාරිපුත්තො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය රාජගහං පිණ්ඩාය පාවිසි.

තෙන ඛො පන සමයෙන ධනඤ්ජානි බ්‍රාහ්මණො බහිනගරෙ ගාවො ගොට්ඨෙ දොහාපෙති[1] අථ ඛො ආයස්මා සාරිපුත්තො රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන ධනඤ්ජානි බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. අද්දසා ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො ආයස්මන්තං සාරිපුත්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: ඉතො භො සාරිපුත්ත, පයො පීයතං තාව භත්තස්ස කාලො භවිස්සතී’ති.

අලං බ්‍රාහ්මණ, කතමෙව අජ්ජ භත්තකිච්චං. අමුකස්මිං මෙ රුක්ඛමූලෙ දිවාවිහාරො භවිස්සති. තත්‍ථ ආගච්ඡෙය්‍යාසී’ති.

එවං භොති ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසි. අථ ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො පච්ඡාභත්තං භුත්තපාතරාසො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ධනඤ්ජානිං බ්‍රාහ්මණං ආයස්මා සාරිපුත්තො එතදවොච:

කච්චිසි ධනඤ්ජානි, අප්පමත්තො’ති?

‘කුතො භො සාරිපුත්ත, අම්හාකං අප්පමාදො යෙසං නො මාතාපිතරො පොසෙතබ්බා, පුත්තදාරා පොසෙතබ්බා, දාසකම්මකරපොරිසං පොසෙතබ්බං, මිත්තාමච්චානං මිත්තාමච්චකරණීයං කාතබ්බං ඤාතිසාලොහිතානං ඤාතිසාලොහිතකරණීයං කාතබ්බං, අතිථීනං අතිථිකරණීයං කාතබ්බං, පුබ්බපෙතානං පුබ්බපෙතකරණීයං කාතබ්බං, දෙවතානං දෙවතාකරණීයං කාතබ්බං, රඤ්ඤො රාජකරණීයං කාතබ්බං, අයම්පි කායො පීනෙතබ්බො බ්‍රූහෙතබ්බො’ති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො මාතාපිතුන්නං[2] හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං. ලභෙය්‍ය නු ඛො සො ‘අහං ඛො මාතාපිතුන්නං හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා’ති. මාතාපිතරො වා පනස්ස ලභෙය්‍යුං ‘එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා’ති.

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තං[3]යෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

---

1. දුහාපෙති - මජසං, ස්‍යා.
2. මාතාපිතුනං - ස්‍යා, මජසං.
3. වික්කන්දන්තං - ස්‍යා, PTS.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ දක්ඛිණාගිරි දනව්වෙහි කැමැති තාක් වාස කොට රජගහනුවර කරා චාරිකා කොට ගියහ. පිළිවෙළින් සැරිසරනුවෝ රජගහ නුවර කරා වැඩියෝ, එහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ රජගහනුවර කළන්දකනිවාප නම් වෙළුවන වෙහෙරෙහි විහරණ කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පෙරවරුයෙහි සකසා හැඳ පාසිවුරු ගෙන රජගහාවට පිඬු පිණිස වැඩියෝ.

එකලැ ධනඤ්ජානි බමුණු පිටිනුවරෙහි ගොවුදෙකු ගෙරින් දොවවයි. එසඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ රජගහනුවර පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළකියාහු ධනඤ්ජානි බමුණු කරා එළැඹියෝ. ධනඤ්ජානි බමුණු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුර දී මැ තමන් කරා එන්නවුන් දිට. දැක ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් කරා එළැඹියේ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට තෙල කී : භවත් ශාරිපුත්‍රයෙනි, මෙයින් ධාරොෂ්ණ පයස බොන්නේ මැනැව. එ විට මැ බතට කල් වේ'යයි.

බමුණ, කම් නැත. මා විසින් අද බත් කිස කරන ලද. තෙල වෘක්‍ෂමූලයෙහි මාගේ දිවාවිහාර වෙයි. එහි එව'යි.

'භවත්නි, එසේ යැ'යි ධනඤ්ජානි බමුණ ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට පිළිවදන් දීත, ඉක්බිති ධනඤ්ජානි බමුණු පසුබතැ වැළඳූ ප්‍රාතරාස ඇති වැ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් කරා එළැඹියේ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සතුටු වී. තුස්නට නිසි සිහි කරන්නට නිසි කථා කොට නිමවා එකත්පස් වැ හිත. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ එකත්පස් වැ හුන් ධනඤ්ජානි බමුණුට තෙල කී :

''කිම ධනඤ්ජානියෙනි, අප්‍රමත්තයෙහි?''

භවත් ශාරිපුත්‍රයෙනි, අප යම් කෙනකුන් විසින් දෙමාපියෝ පෝෂණ කළයුතු වෙත් ද, පුත්‍රදාරාවෝ පෝෂණ කළයුතු වෙත් ද, දසිකම්කරුපුරිස් පෝෂණ කළයුතු වේ ද, මිත්‍රාමාත්‍ය යන්ගේ මිත්‍රාමාත්‍යකරණී කළයුතු වේ ද, නැසාලේනැයන්ගේ නැසාලේනැකරණී කළයුතු වේ ද, අතිථින්ගේ අතිථිකරණී කළයුතු වේ ද, පූර්වප්‍රේතයන්ගේ පූර්වප්‍රේතකරණී කළයුතු වේ ද, දේවතාවන්ගේ දේවතා කරණී කළයුතු වේ ද, රජුගේ රජකරණී කළයුතු වේ ද, මේ කයත් පිණවියයුතුත් වැඩියයුතුත් වේ ද, ඒ අපට කොයින් නම් අප්‍රමාදයෙක් ඇද්ද?යි කී.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසි එකෙක් මවපියන් නිසා අධර්මචාරි විෂමචාරි වේ ද, තුලුහු අධර්මචර්‍යා විෂමචර්‍යා හේතුයෙන් නිරපල්හු නිරයට ඇදගන්නාහු නම් හේ ''මම වනාහි මවපියන් හේතු කොට අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා'' යනු ලබා ද? ඔහුගේ මවපියෝත් ''තෙලෙ වනාහි අප හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වී. නිරපල්හු උහු නිරයට නො ගනිත්වා''යනු ලබත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මෙය නො වන්නේ මැ යැ. වැළිදු නිරපල්හු වික්‍රන්දන කරන්නා වූ මැ ඔහු නිරයට බහත් මැ යැ.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො පුත්තදාරස්ස හෙතු ධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං. ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො පුත්තදාරස්ස හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං. මා මං නිරයං නිරයපාලා'ති. පුත්තදාරා වා පනස්ස ලභෙය්‍යුං[1] 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො දාසකම්මකරපොරිසස්ස හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියා හෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං. ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො දාසකම්මකරපොරිසස්ස හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. දාසකම්මකරපොරිසං වා පනස්ස ලභෙය්‍ය 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො මිත්තාමච්චානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං. ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො මිත්තාමච්චානං හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. මිත්තාමච්චා වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො ඤාතිසාලොහිතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං. ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො ඤාතිසාලොහිතානං හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං. මා මං නිරයං නිරයපාලා'ති. ඤාතිසාලොහිතා වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි. මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො අතිථීනං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං, ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො අතිථීනං හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. අතිථී වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තං යෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

---

1. ලභෙය්‍ය - සීමු.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මොලොවැ කිසි එකෙක් පුත්‍රදර හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරපල්හු නිරයට ඇදගන්නාහු නම් හේ "මම වනාහි පුත්‍රදරා හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලබා ද? ඔහුගේ පුත්‍රදර හෝ "තෙලෙ අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී නිරපල්හු උහු නිරයට නො ගනිත්වා" යනු ලබා ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයට බහත් මැ යැ.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසි එකෙක් දසිකම්කරුපුරිස් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි දසිකම්කරුපුරිස් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලබා ද? ඔහුගේ දසිකම්කරුපුරිස් හෝ "තෙලෙ වනාහි අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු උහු නිරයට නො ගනිත්වා" යනු ලබා ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත් මැ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසි එකෙක් මිත්‍රාමාත්‍ය හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි මිත්‍රාමාත්‍ය හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා"යනු ලබා ද? ඔහුගේ මිත්‍රාමාත්‍යයෝ හෝ "තෙලෙ වනාහි අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා"යනු ලබත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසි එකෙක් නැසාලේනැ හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචාර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි නැසාලේනැ හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලබා ද? ඔහුගේ නැසාලේනැයෝ හෝ "තෙලෙ වනාහි අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා" යනු ලබත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසිවෙක් අතිථීන් (ආගන්තුකයන්)ගේ හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හෙතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි අතිථීන්ගේ හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි, නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලබා ද? ඔහුගේ අතිථීහු හෝ "තෙලෙ වනාහි අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී, නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා" යනු ලැබෙත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො පුබ්බපෙතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියා හෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං, ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො පුබ්බපෙතානං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා මං නිරයං නිරයපාලා'ති. පුබ්බපෙතා වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තං යෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො දෙවතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියා හෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං, ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො දෙවතානං හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. දෙවතා වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො රඤ්ඤො හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං, ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො රඤ්ඤො හෙතු අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. රාජා වා පනස්ස ලභෙය්‍ය 'එසො ඛො අම්හාකං හෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, ඉධෙකච්චො කායස්ස පීණනහෙතු[1] බ්‍රෑහනහෙතු[2] අධම්මචාරී විසමචාරී අස්ස. තමෙනං අධම්මචරියා විසමචරියාහෙතු නිරයං නිරයපාලා උපකඩ්ඪෙය්‍යුං, ලභෙය්‍ය නු ඛො සො 'අහං ඛො කායස්ස පීණනහෙතු[1] බ්‍රෑහනහෙතු[2] අධම්මචාරී විසමචාරී අහොසිං, මා මං නිරයං නිරයපාලා'ති. පරෙ වා පනස්ස ලභෙය්‍යුං 'එසො ඛො කායස්ස පීණනහෙතු බ්‍රෑහනහෙතු අධම්මචාරී විසමචාරී අහොසි, මා නං නිරයං නිරයපාලා'ති?

නො හිදං භො සාරිපුත්ත, අථ ඛො නං වික්කන්දන්තංයෙව නිරයෙ නිරයපාලා පක්ඛිපෙය්‍යුං.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා මාතාපිතුන්නං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස. යො වා මාතාපිතුන්නං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, මාතාපිතුන්නං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, මාතාපිතුන්නං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, බ්‍රහ්මචරියා සමචරියා සෙය්‍යො'ති.

---

1. පීණනාහෙතු - මජසං, ස්‍යා, PTS
2. බ්‍රෑහනාහෙතු - මජසං, ස්‍යා, PTS.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසිවෙක් පූර්වප්‍රේතයන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි පූර්වප්‍රේතයන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලබා ද? ඔහුගේ පූර්වප්‍රේතයෝ හෝ "තෙලෙ අප හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා" යනු ලැබෙත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසිවෙක් දෙවියන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හෙතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි දෙවියන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා." යනු ලබා ද? ඔහුගේ දෙවියෝ හෝ "තෙලෙ අපහේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා" යනු ලැබෙත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. වැළිදු නිරපල්හු වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ කිසිවෙක් රජු හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු තුලුහු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් නිරයට අදනාහු නම් හේ "මම වනාහි රජු නිසා අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා" යනු ලැබේ ද? ඔහුගේ රජ හෝ "තෙලෙ අප නිසා අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා" යනු ලැබේ ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නේ මැ යි. එතෙකුදුවත් වික්‍රන්‍දන කරන්නා වූ මැ ඔහු නිරපල්හු නිරයෙහි බහත්.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ එකෙක් කය පිනවීම වැඩීම හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, නිරපල්හු අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යා හේතුයෙන් තුලුහු නිරයට අදනාහු නම් හේ 'මම වනාහි කය පිනවීම වැඩීම හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වීමි. නිරපල්හු මා නිරයට නො ගනිත්වා' යනු ලබා ද? පරහු හෝ 'තෙලෙ වනාහි කය පිනවීම වැඩීම හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වී. නිරපල්හු ඔහු නිරයට නො ගනිත්වා' යනු ලබත් ද?

භවත් ශාරිපුත්‍රයෙනි, මේ නො වන්නෙකි. වැළිත් නිරපල්හු වික්‍රන්‍දනය කරන්නා වූ මැ ඔහු නිරයෙහි බහත්.

ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? යමෙක් මව්පියන් හෙතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද? යමෙක් හෝ මව්පියන් හේතුයෙන් ධර්මචාරී සමචාරී වේ ද, කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද?

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් මව්පියන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වේ ද, ඒ ශ්‍රෙෂ්ඨ නො වේ. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් වනාහි මව්පියන් හේතුයෙන් ධර්මචාරී සමචාරී වේ ද, මෙහි එය මැ ශ්‍රෙෂ්ඨ වේ. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රෙෂ්ඨ වේ.

අත්ථි ඛො ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා මාතාපිතරො චෙව පොසෙතුං. න ච පාපං කම්මං කාතුං[1], පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා පුත්තදාරස්ස හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා පුත්තදාරස්ස හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යො'ති?

යො හි භො සාරිපුත්ත, පුත්තදාරස්ස හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, පුත්තදාරස්ස හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචාරියා හි භො සාරිපුත්ත, ධම්මචාරියා සමචාරියා සෙය්‍යො'ති.

අත්ථි ඛො ධනඤ්ජානි අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා පුත්තදාරෙ[2] චෙව පොසෙතුං, න ච පාපං කම්මං කාතුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා දාසකම්මකරපොරිසස්ස හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා දාසකම්මකරපොරිසස්ස හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, දාසකම්මකරපොරිසස්ස හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, දාසකම්මකරපොරිසස්ස හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති?

අත්ථි ඛො ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා දාසකම්මකරපොරිසඤ්චෙව පොසෙතුං, න ච පාපං කම්මං කාතුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා මිත්තාමච්චානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා මිත්තාමච්චානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, මිත්තාමච්චානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, මිත්තාමච්චානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති.

අත්ථි ඛො ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා මිත්තාමච්චානඤ්චෙව මිත්තාමච්චකරණීයං කාතුං, න ච පාපං කම්මං කාතුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා ඤාතිසාලොහිතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා ඤාතිසාලොහිතානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, ඤාතිසාලොහිතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, ඤාතිසාලොහිතානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති.

---

1. පාපකම්මං කාතුං - මජසං, PTS.
2. පුත්තදාරං - සයා.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් මව්පියන් පුස්නට හැකි වේ ද, පව්කම්කරන්නට නො හැකි වේ ද, පුණ්‍යප්‍රතිපද ද පිළිපදනාට හැකි වේ ද, එ බඳු අන්‍ය සහෙතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් පුත්‍රදර හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, යමෙක් හෝ පුත්‍රදර හෙතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, මෙහි කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද? යි

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් පුත්‍රදර හෙතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, ඒ ශ්‍රෙෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් වනාහි පුත්‍රදර හෙතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, මෙහි එය මැ ශ්‍රෙෂ්ඨ වේ. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රෙෂ්ඨ වේ.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් පුත්‍රදරයන් පුස්නට හැකි වේ ද, පව්කම් කරන්නට නො හැකි වේ ද, පුණ්‍යප්‍රතිපද ද පිළිපදනාට හැකි වේ ද, අන්‍ය එ බඳු සහෙතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් හෝ දස්කම්කරුපුරිස් හෙතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, යමෙක් හෝ දස්කම්කරුපුරිස් හෙතුයෙන් ධර්මචාරි සමචාරි හෝ වේ ද, මෙහි කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් දස්කම්කරුපුරිස් හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, ඒ ශ්‍රෙෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් වනාහි දස්කම්කරුපුරිස් හේතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, මෙහි එය මැ ශ්‍රෙෂ්ඨ වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රෙෂ්ඨ වේ.

ධනඤ්ජානියෙනි, දස්කම්කරුපුරිස් පුස්නට හැකි වේ ද, පව්කම් කරන්නට නො හැකි වේ ද, පුණ්‍යප්‍රතිපදත් පිළිපදනාට හැකි වේ ද, එ බඳු අන්‍ය සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් හෝ මිත්‍රාමාත්‍ය හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, යමෙක් හෝ මිත්‍රාමාත්‍ය හේතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, මෙහි කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද,

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් මිත්‍රාමාත්‍ය හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, ඒ ශ්‍රෙෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් වනාහි මිත්‍රාමාත්‍ය හේතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, මෙහි ඒ මැ ශ්‍රෙෂ්ඨ වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචාර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රෙෂ්ඨ වේ.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් මිත්‍රාමාත්‍යයන්ගේත් මිත්‍රාමාත්‍ය කරණී කරන්නට හැකි වේ ද, පව්කම් කරන්නට නො හැකි වේ ද, පුණ්‍යප්‍රතිපදත් පිළිපදනාට හැකි වේ ද, එ බඳු අන්‍ය වූ ත් සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානිය, ඒ කෙසේ හඟිහි? යමෙක් නෑසාලේනෑයන් හේතුයෙන් හෝ අධර්මචාරි විෂමචාරි වේ ද, යමෙක් නෑසාලේනෑයන් හේතුයෙන් හෝ ධර්මචාරි සමචාරි වේ ද, මෙහි කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද?යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් නෑසාලේනෑයන් හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වේ ද, එය ශ්‍රෙෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් නෑසාලේනෑයන් හේතුයෙන් ධර්මචාරි සමචාරි වේ ද, එය මැ මෙහි ශ්‍රෙෂ්ඨ වෙයි, භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා විෂම චර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රෙෂ්ඨ වේ.

45—කේ 13561 (11/72)
Free Distribution www.aathaapi.org

අත්ථි ඛො, ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා ඤාතිසාලොහිතානඤ්චෙව ඤාතිසාලොහිතකරණීයං කාතුං, න ච පාපං කම්මං කත්තුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා අතිථීනං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා අතිථීනං හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, අතිථීනං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, අතිථීනං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති.

අත්ථි ඛො, ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා අතිථීනඤ්චෙව අතිථිකරණීයං කාතුං, න ච පාපං කම්මං කත්තුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා පුබ්බපෙතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා පුබ්බපෙතානං හෙතු ධම්මචාරී සමචරී අස්ස. කතමං සෙය්‍යො’ති?

යො හි භො සාරිපුත්ත, පුබ්බපෙතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, පුබ්බපෙතානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති

අත්ථි ඛො, ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා පුබ්බපෙතානඤ්චෙව පුබ්බපෙතකරණීයං කාතුං, න ච පාපං කම්මං කත්තුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා දෙවතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා දෙවතානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, දෙවතානං හෙතු අධම්මචාරී විසමචාරී අස්ස. න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, දෙවතානං හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො, අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යොති.

අත්ථි ඛො, ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා දෙවතානඤ්චෙව දෙවතාකරණීයං කාතුං, න ච පාපං කම්මං කත්තුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා රඤ්ඤො හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා රඤ්ඤො හෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

යො හි භො සාරිපුත්ත, රඤ්ඤො හෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, රඤ්ඤො හෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො. අධම්මචරියා විසමචරියා හි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යො’ති

අත්ථි ඛො ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා රඤ්ඤො චෙව රාජකරණීයං කාතුං, න ච පාපං කම්මං කත්තුං, පුඤ්ඤඤ්ච පටිපදංපටිපජ්ජිතුං. තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, යො වා කායස්ස පීණනහෙතු බ්‍රෑහනහෙතු අධම්මචාරී විසමචාරී අස්ස, යො වා කායස්ස පීණනහෙතු බ්‍රෑහනහෙතු ධම්මචාරී සමචාරී අස්ස. කතමං සෙය්‍යොති?

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් නෑසාලේනෑයන් ගේ නෑසාලේනෑකරණී කරන්නට හැකි වේ ද, පවකම් කරන්නට නො හැකි වේ ද, පුණ්‍යප්‍රතිපදත්, පිළිපදනට හැකි වේ ද, එ බඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් අතිථීන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී හෝ වේ ද, යමෙක් අතිථීන් හේතුයෙන් ධර්මචාරී සමචාරී හෝ වේ ද, එහි කුමක් ශ්‍රේෂ්ඨ වේ ද? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් අතිථීන් හේතුයෙන් අධර්මචාරීන් විෂමචාරී වේ ද, එය ශ්‍රේෂ්ඨ නො වෙයි, භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් අතිථීන් හේතුයෙන් ධර්මචාරී සමචාරී වේ ද, මෙහි එය මැ ශ්‍රේෂ්ඨ වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රේෂ්ඨ වේ.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් අතිථීන්ගේ අතිථිකරණී ත් කරන්නට හැකි වේ ද, පවකම් කරන්නට නො ද හැකි වේ ද, පුණ්‍යප්‍රතිපදත් පිළිපදනට හැකි වේ ද, එ බඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් පූර්වප්‍රෙතයන් හෙතුයෙන් හෝ අධර්මචාරී විෂමචාරී වන්නේ යැ, යමෙක් පූර්වප්‍රේතයන් හේතුයෙන් හෝ ධර්මචාරී සමචාරී වන්නේ යැ. කුමක් ශ්‍රේෂ්ඨ වේ ද?යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් පූර්වප්‍රේතයන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වන්නේ ද, එය ශ්‍රේෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් පූර්වප්‍රේතයන් හේතුයෙන් ධර්මචාරී සමචාරී වන්නේ ද, මෙහි එය මැ ශ්‍රේෂ්ඨ යි. භවත් ශාරිපුත්‍රයෙනි, අධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රේෂ්ඨ වන හෙයිනි.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් පූර්වප්‍රේතයන්ගේ පූර්වප්‍රෙතකරණී කරන්නටත් පවකම් නො කරන්නටත් පුණ්‍ය ප්‍රතිපද පිළිපදනටත් හැකි වේ ද, එබඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් දෙවියන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී හෝ වන්නේ යැ. යමෙක් දෙවියන් හේතුයෙන් ධර්මචාරී සමචාරී හෝ වන්නේ යැ. කුමක් ශ්‍රේෂ්ඨ වේ ද? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් දෙවියන් හේතුයෙන් අධර්මචාරී විෂමචාරී වන්නේ ද, එය ශ්‍රේෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් දෙවියන් හේතුයෙන් ධර්මචාරී සමචාරී වන්නේ ද, මෙහි එය මැ ශ්‍රේෂ්ඨ යි. භවත් ශාරිපුත්‍රයෙනි, යම් හෙයෙකින් අධර්ම චර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රේෂ්ඨ වේ ද, එහෙයිනි.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් දෙවියන්ගේ දේවකරණී කරන්නටත් පවකම් නො කරන්නටත් පුණ්‍යප්‍රතිපද පිළිපදනටත් හැකි වේ ද, එ බඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් රජු හේතුයෙන් අධර්මචාරී විෂමචාරී හෝ වන්නේ යැ, යමෙක් රජු හේතු කොට ධර්මචාරී සමචාරී හෝ වන්නේ යැ. කුමක් ශ්‍රේෂ්ඨ වේ ද? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් රජු හේතු කොට අධර්මචාරී විෂමචාරී හෝ වේ ද, එය ශ්‍රේෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් රජු හේතු කොට ධර්මචාරී සමචාරී වන්නේ ද, මෙහි එය මැ ශ්‍රේෂ්ඨ යි. භවත් ශාරිපුත්‍රයෙනි, යම් හෙයෙකින් අධර්මචර්‍ය්‍යා විෂමචර්‍ය්‍යායෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රේෂ්ඨ වේ ද, එහෙයිනි.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් රජුගේ රාජකරණී කරන්නටත් පවකම් නො කරන්නටත් පුණ්‍යප්‍රතිපද පිළිපදනටත් හැකි වේ ද, එ බඳු අන්‍ය වූ සහෙතුක ධාර්මික කර්මාන්තයෝ ඇත. ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? යමෙක් කය පිනැවීම් හේතුයෙන් වැඩීම් හෙතුයෙන් අධර්මචාරී විෂමචාරී හෝ වන්නේ යැ, යමෙක් කය පිනැවීම හේතුයෙන් වැඩීම හේතුයෙන් ධර්මචාරී සමචාරී හෝ වන්නේ යැ. කුමක් ශ්‍රේෂ්ඨ වේ ද? යි.

යො හි භො සාරිපුත්ත, කායස්ස පීණනහෙතු බ්‍රෑහනහෙතු අධම්මචාරී විසමචාරී අස්ස, න තං සෙය්‍යො. යො ච ඛො භො සාරිපුත්ත, කායස්ස පීණනහෙතු බ්‍රෑහනහෙතු ධම්මචාරී සමචාරී අස්ස, තදෙවෙත්ථ සෙය්‍යො, අධම්මචරියා විසමචරියාහි භො සාරිපුත්ත, ධම්මචරියා සමචරියා සෙය්‍යාති.

අත්ථි ඛො ධනඤ්ජානි, අඤ්ඤෙ සහෙතුකා ධම්මිකා කම්මන්තා, යෙහි සක්කා කායඤ්චෙව පීණෙතුං බ්‍රෑහෙතුං, න ච පාපං කම්මං කාතුං, පුඤ්ඤඤ්ච පටිපදං පටිපජ්ජිතුන්ති.

අථ ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො අපරෙන සමයෙන ආබාධිකො අහොසි දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, 'ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති. යෙන චායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දාහි, 'ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දතී'ති. එවඤ්ච වදෙහි: 'සාධු කිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති.

එවං භන්තෙති ඛො සො පුරිසො ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සො පුරිසො භගවන්තං එතදවොච 'ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති. යෙන චායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: 'ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති. 'සාධු කිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති. අධිවාසෙසි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හීභාවෙන.

අථ ඛො ආයස්මා සාරිපුත්තො නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි නිසජ්ජ ඛො ආයස්මා සාරිපුත්තො ධනඤ්ජානිං බ්‍රාහ්මණං එතදවොච: 'කච්චි තෙ ධනඤ්ජානි, ඛමනීයං කච්චි යාපනීයං කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති, නො අභික්කමොති?

භවත් ශාරිපුත්‍රයෙනි, යමෙක් කය පිනැවීම හේතුයෙන් වැඩීම හේතුයෙන් අධර්මචාරි විෂමචාරි වන්නේ ද, එය ශ්‍රේෂ්ඨ නො වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යමෙකුත් කය පිනැවීම හෙතුයෙන් වැඩීම හේතුයෙන් ධර්මචාරි සමචාරි වන්නේ ද, මෙහි එය මැ ශ්‍රේෂ්ඨ යි. භවත් ශාරිපුත්‍රයෙනි, යම් හෙයකින් අධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යාවෙන් වඩා ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ශ්‍රේෂ්ඨ වේ ද, එහෙයිනි.

ධනඤ්ජානියෙනි, යම් කර්මාන්තයෙකින් කය පිනවන්නට වඩන්නටත් පවිකම් නො කරන්නටත් පුණ්‍යප්‍රතිපද පිළිපදනාටත් හැකි වේ ද, එබඳු අන්‍ය වූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත.

එසඳ ධනඤ්ජානි බමුණු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ භාෂිතය අභිනන්දනා කොට අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී බැස ගියේ.

ඉක්බිති ධනඤ්ජානි බමුණු මැත භාගයෙහි ආබාධ ඇතියේ දුඃඛිත වූයේ දැඩිගිලන් ඇති වී. එසඳ ධනඤ්ජානි බ්‍රාහ්මණ එක්තරා පුරුෂයකු ඇමැති : ''එම්බා පුරුෂය, එව තෙපි භාග්‍යවතුන් කරා එළඹෙව. එළඹ මා ගේ බසින් භාග්‍යවතුන් වහන්සේ ගේ පාසඟළ සිරසින් වඳුව, ''වහන්ස, ධනඤ්ජානි බමුණු ආබාධ ඇතියේ දුඃඛිත වූයේ දැඩිගිලන් වෙයි. හේ භාග්‍යවතුන්ගේ පාසඟල සිරසින් වඳී''යයි වඳුව. 'වහන්ස, ධනඤ්ජානි බමුණු ආබාධ ඇතියේ දුඃඛිත වූයේ දැඩිගිලන් වෙයි. හේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ දෙපා සිරසින් වඳී'යයි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ ද පාසඟුළු සිරසින් වඳුව. මෙසේත් කියව : වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ධනඤ්ජානි බමුණුගේ නිවෙස්න කරා අනුකම්පා පිණිස එළැඹෙනසේක්ව''යි.

'එසේ යැ වහන්සැ,යි එ පුරිස් ධනඤ්ජානි බමුණුහට පිළිවදන් අස්වා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හිඳ. එකත්පස් වැ හුන් එ පුරිස් භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''වහන්ස, ධනඤ්ජානි බමුණු ආබාධ ඇතියේ දුඃඛිත වූයේ දැඩිගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේ ගේ පාසඟුළුවන් සිරසින් වඳී''යයි. ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා ද එළැඹියේ, එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඳ එකත්පස් වැ හිඳ. එකත්පස් වැ හුන් එ පුරිස් ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට තෙල කී : ''වහන්ස, ධනඤ්ජානි බමුණු ආබාධ ඇතියේ දුඃඛිත වූයේ දැඩිගිලන් වෙයි. හේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් ගේ පාසඟුළු සිරසින් වඳී, මෙසේත් කියයි : ''වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරුණුවෝ අනුකම්පා පිණිස ධනඤ්ජානි බමුණුගේ නිවෙස්න කරා එළැඹෙන සේක්ව''යි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තුෂ්ණිම්භාවයෙන් ඉවසූහ.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ හැඳපෙරෙවැ පාසිවුරු ගෙන ධනඤ්ජානි බමුණුගේ නිවෙස්න කරා එළැඹියහ. එළැඹ පැනවූ අස්නෙහි වැඩහුන්හු. වැඩහිඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ධනඤ්ජානි බමුණුහට තෙල කී : ''ධනඤ්ජානියෙනි, කිම තොපට සහනු හැකි ද? කිම යැපෙනු හැකි ද? කිම දුක් වේදනාවෝ බැස යෙත් ද? නො වැඩෙත් ද? වැඩීම නො වැ සන්හිඳීම පැනේ ද?''යි.

න මෙ හො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති. සෙය්‍යථාපි හො සාරිපුත්ත, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධනි[1] අභිමත්ථෙය්‍ය.[2] එවමෙව ඛො මෙ හො සාරිපුත්ත, අධිමත්තා වාතා මුද්ධනි[1] ඌහනන්ති[3] න මෙ හො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි හො සාරිපුත්ත, බලවා පුරිසො දළ්හෙන වරත්තඛණ්ඩෙන[4] සීසෙ සීසවෙඨනං[5] බන්ධෙය්‍ය[6], එවමෙව ඛො මෙ හො සාරිපුත්ත, අධිමත්තා සීසෙ සීසවෙදනා හොති. න මෙ හො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා. අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි හො සාරිපුත්ත, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකත්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය. එවමෙව ඛො මෙ හො සාරිපුත්ත, අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. න මෙ හො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි හො සාරිපුත්ත, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං සම්පරිතාපෙය්‍යුං, එවමෙව ඛො මෙ හො සාරිපුත්ත, අධිමත්තො කායස්මිං දාහො, න මෙ හො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, නිරයො වා තිරච්ඡානයොනි වා ති?

නිරයා හො සාරිපුත්ත, තිරච්ඡානයොනි සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, තිරච්ඡානයොනි වා පෙත්තිවිසයො[7] වා ති?

තිරච්ඡානයොනියා හො සාරිපුත්ත, පෙත්තිවිසයො සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, පෙත්තිවිසයො වා මනුස්සා වාති?

පෙත්තිවිසයා හො සාරිපුත්ත, මනුස්සා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, මනුස්සා වා චාතුම්මහාරාජිකා දෙවා වාති?

---

1. මුද්ධානං - ස්‍යා,
2. අභිමත්ථෙය්‍ය - මජසං, PTS.
3. ඔහනන්ති - ස්‍යා.
4. වරත්තබන්ධෙන - ස්‍යා.
5. සීසවෙධනං - ස්‍යා. / සීසවෙඨං - මජසං.
6. දදෙය්‍ය - මජසං, ස්‍යා.
7. පිත්තිවිසයො - ස්‍යා.

භවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැක්ක. නො යැපිය හැක්ක. මා ගේ දැඩි දුඃඛවේදනාවෝ වැඩි යෙත්, බැස නො යෙත්. වැඩුම පැනෙයි, බැසයනු නො පැනෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි බලවත් පුරුෂයෙක් තියුණු සිරියෙකින් මුදුන අළලන්නේ වේ ද, භවත් ශාරිපුත්‍රයෙනි, එ පරිදි මැ අධිමාත්‍ර වාතවේදනාවෝ මා ගේ මුදුන පහරත්. භවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැක්ක, නො යැපිය හැක්ක. මා ගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟියෙත්, නො ගිලිහෙත්. නැඟියනු පැනේ, බැසයනු නො පැනේ.

භවත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි බලවත් පුරුෂයෙක් දළ වරබහනින් හිසෙහි හිස්වෙළුම් බඳනේ වේ ද, භවත් ශාරිපුත්‍රයෙනි, එපරිදි මැ මා ගේ හිසෙහි අධිමාත්‍ර ශිරෝවේදනාවෝ වෙති. භවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැක්ක, නො යැපිය හැක්ක. මා ගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟියෙත්, නො සන්හිඳෙත්. නැඟයනු පැනේ, බැසයනු නො පැනේ.

භවත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි දක්ෂ ගෝඝාතකයෙක් හෝ ගෝඝාතක අතවැසියෙක් හෝ තියුණු වූ ගෙරි කපන කැත්තෙන් කුස විවර කොට කපන්නේ වේ ද, භවත් ශාරිපුත්‍රයෙනි, එ පරිදි මැ අධිමාත්‍ර වාතවේදනාවෝ මා කුස සිඳිත්, භවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැක්ක. නො යැපිය හැක්ක. මා ගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟියෙත්. බැස නො යෙත්, නැඟයනු පැනේ, ගැලයනු නො පැනේ.

භවත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වලතර පුරුෂයකු දෙඅත් ගෙන අඞ්ගාරකර්ෂියෙහි තවන්නාහු ද මොනොවට තවන්නාහු ද, භවත් ශාරිපුත්‍රයෙනි, එ පරිදි මැ මා ගේ කයෙහි අතිමාත්‍ර දාහය වෙයි. භවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැක්ක. නො යැපිය හැක්ක. මා ගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟයෙත්, බැස නො යෙත්. නැඟයනු පැනේ, බැසයනු නො පැනේ.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? නිරය හෝ තිරිසන් යෝනි හෝ කුමක් ශ්‍රේෂ්ඨ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, නිරයට වඩා තිරිසන්යෝනිය ශ්‍රේෂ්ඨ වෙයි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? තිරිසන් යෝනි හෝ ප්‍රේතවිෂය හෝ කුමක් ශ්‍රේෂ්ඨ වේ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, තිරිසන්යොනට වඩා ප්‍රේතවිෂය ශ්‍රේෂ්ඨ වෙයි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? ප්‍රේතවිෂය හෝ මිනිස්බව හෝ කුමක් ශ්‍රේෂ්ඨ වේ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, ප්‍රේතවිෂයට වඩා මිනිස්හු ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? මිනිස්හු හෝ සියුමහරදවැසි දෙවියෝ හෝ කුමක් ශ්‍රේෂ්ඨ වේ දැ? යි.

මනුස්සෙහි භො සාරිපුත්ත, චාතුම්මහාරාජිකා දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, චාතුම්මහාරාජිකා වා දෙවා තාවතිංසා වා දෙවාති?

චාතුම්මහාරාජිකෙහි භො සාරිපුත්ත, දෙවෙහි තාවතිංසා දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, තාවතිංසා වා දෙවා යාමා වා දෙවාති?

තාවතිංසෙහි භො සාරිපුත්ත, දෙවෙහි යාමා දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, යාමා වා දෙවා තුසිතා වා දෙවාති?

යාමෙහි භො සාරිපුත්ත, දෙවෙහි තුසිතා දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, තුසිතා වා දෙවා නිම්මානරතී වා දෙවාති?

තුසිතෙහි භො සාරිපුත්ත, දෙවෙහි නිම්මානරතී දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, නිම්මානරතී වා දෙවා පරනිම්මිතවසවත්තී වා දෙවාති?

නිම්මානරතීහි භො සාරිපුත්ත, දෙවෙහි පරනිම්මිතවසවත්තී දෙවා සෙය්‍යොති.

තං කිං මඤ්ඤසි ධනඤ්ජානි, කතමං සෙය්‍යො, පරනිම්මිතවසවත්තී වා දෙවා බ්‍රහ්මලොකොවාති?

බ්‍රහ්මලොකොති භවං සාරිපුත්තො ආහ, බ්‍රහ්මලොකොති භවං සාරිපුත්තො ආහාති

අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි : ඉමෙ ඛො බ්‍රාහ්මණා බ්‍රහ්මලොකාධිමුත්තා. යන්නූනාහං ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගං දෙසෙය්‍යන්ති. බ්‍රහ්මානං තෙ ධනඤ්ජානි සහව්‍යතාය මග්ගං දෙසිස්සාමි. තං සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති. එවම්භොති ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසි.

ආයස්මා සාරිපුත්තො එතදවොච : 'කතමො ච ධනඤ්ජානි, බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො? ඉධ ධනඤ්ජානි, භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. අයම්පි ඛො ධනඤ්ජානි, බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

1. සබ්බත්ථතාය – සීමු, ස්‍යා.

භවත් ශාරිපුත්‍රයෙනි, මිනිසුනට වඩා සියුමහරදවැසි දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද? චතුර්මහාරාජික දෙවියෝ හෝ තාවතිංස දෙවියෝ හෝ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, චාතුර්මහාරාජික දෙවියනට වඩා තාවතිංස දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද; තාවතිංස දෙවියෝ හෝ යාම දෙවියෝ හෝ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, තාවතිංස දෙවියනට වඩා යාම දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද, යාම දෙවියෝ හෝ තුෂිත දෙවියෝ හෝ දැ?යි.

භවත් ශාරිපුත්‍රයෙනි, යාම දෙවියනට වඩා තුෂිත දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද, තුෂිත දෙවියෝ හෝ නිම්මානරතී දෙවියෝ හෝ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, තුෂිත දෙවියනට වඩා නිම්මානරතී දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද, නිම්මානරතී දෙවියෝ හෝ පරනිම්මිතවසවත්ති දෙවියෝ හෝ දැ? යි.

භවත් ශාරිපුත්‍රයෙනි, නිර්මාණරතී දෙවියනට වඩා පරනිර්මිතවශවර්ති දෙවියෝ ශ්‍රේෂ්ඨයහ යි.

ධනඤ්ජානියෙනි, ඒ කෙසේ හඟිහි? කුමක් ශ්‍රෙෂ්ඨ වේ ද, පරනිර්මිතවශවර්ති දෙවියෝ හෝ බ්‍රහ්මලෝකය හෝ දැ? යි.

භවත් ශාරිපුත්‍ර තෙමේ බ්‍රහ්මලෝකය යි කියයි, භවත් ශාරිපුත්‍ර තෙමේ බ්‍රහ්මලෝකය යි කියයි.

එසඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්හට මෙතෙල සිත් වී : "මේ බමුණෝ නම බ්‍රහ්ම-ලෝකාධිමුක්තයහ, මම ධනඤ්ජානි බමුණහට බ්‍රහ්මයන් හා එක්ව විසීම සඳහා මඟ දෙසම් නම මනා මැ තු"යි. ධනඤ්ජානියෙනි, තොපට බ්‍රහ්මය හා එක්ව විසීම සඳහා මඟ දෙසමි. ඒ අසව. මොනොවට මෙනෙහි කරව. කියමි යි. 'භවත්නි, එසේ යැ'යි ධනඤ්ජානි බමුණු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්හට පිළිවදන් දුන්.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙතෙල කීහු : "ධනඤ්ජානියෙනි, බ්‍රහ්මයන් හා සහවාසය සඳහා මාර්ගය කවරේ යැ? ධනඤ්ජානියෙනි, මෙ සස්නෙහි මහණ මෛත් සහගිය සිතින් එක් දිගක් ස්පර්ශ කොට ගෙන වාස කෙරෙයි. දෙවන දිග ද එසේ යැ, තුන්වන දිග ද එසේ යැ, සතරවන දිග ද එසේ යැ. මෙසේ උඩ යට සරස හැම තැන සර්වාත්මසමතායෙන් සියලු සතුන් ඇති ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ මෛත් සහගිය සිතින් අරමුණු කොට වාස කෙරෙයි. ධනඤ්ජායෙනි, මෙ ද බ්‍රහ්මයන්ගේ සහභාවය සඳහා මාර්ග යි.

පුන ච පරං ධනඤ්ජානි, භික්ඛු කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. අයම්පි ඛො ධනඤ්ජානි, බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගොති.

තෙන හි ත්වං සාරිපුත්ත, මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, 'ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො ධනඤ්ජානිං බ්‍රාහ්මණං සති උත්තරිං කරණීයෙ හීනෙ බ්‍රහ්මලොකෙ පතිට්ඨාපෙත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ධනඤ්ජානි බ්‍රාහ්මණො අචිරපක්කන්තෙ ආයස්මන්තෙ සාරිපුත්තෙ කාලමකාසි, බ්‍රහ්මලොකඤ්ච උපපජ්ජි.[1]

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: එසො භික්ඛවෙ, සාරිපුත්තො ධනඤ්ජානිං බ්‍රාහ්මණං සති උත්තරිං කරණීයෙ, හීනෙ බ්‍රහ්මලොකෙ පතිට්ඨාපෙත්වා උට්ඨායාසනා පක්කන්තොති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ධනඤ්ජානි භන්තෙ, බ්‍රාහ්මණො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දතීති.

කිං පන ත්වං සාරිපුත්ත, ධනඤ්ජානිං බ්‍රාහ්මණං සති උත්තරිං කරණීයෙ, හීනෙ බ්‍රහ්මලොකෙ පතිට්ඨාපෙත්වා උට්ඨායාසනා පක්කන්තොති?

මය්හං ඛො භන්තෙ, එවං අහොසි: ඉමෙ ඛො බ්‍රාහ්මණා බ්‍රහ්මලොකාධිමුත්තා යන්නූනාහං ධනඤ්ජානිස්ස බ්‍රාහ්මණස්ස බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගං දෙසෙය්‍යන්ති.

කාලඞ්කතො ච සාරිපුත්ත, ධනඤ්ජානි බ්‍රාහ්මණො බ්‍රහ්මලොකඤ්ච උපපන්නොති[2].

ධනඤ්ජානි සුත්තං[3] සත්තමං.

---

1. උපපජ්ජි - සිමු, PTS.
2. උපපන්නොති - සිමු, PTS
3. ධානඤ්ජානිසුත්තං - PTS.

තවද ධනඤ්ජානියෙනි, අන් මගක් කියමි, මහණ කුළඹු සහගිය සිතින් . . . . . මුදිතාසහගත සිතින් . . . . උපේක්ෂාසහගත සිතින් එක් දිශක් අරමුණු කොට වාස කෙරෙයි. දෙවන දිග ද එසේ යැ, තෙවන දිග ද එසේ යැ, සිවවන දිග ද එසේ යැ. මෙසේ උඩ යට සරස හැම තැන සර්වාත්මසමතායෙන් සියලු සතුන් ඇති ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ උපේක්ෂා සහගත සිතින් පැතැසගෙන වාස කෙරෙයි. ධනඤ්ජානියෙනි, මෙ ද බ්‍රහ්මයන් හා සහභාවය සඳහා මාර්ග යි.

භවත් ශාරිපුත්‍රයෙනි, එහෙයින් මා බසින් භගවත්හුගේ පාදයන් හිසින් වඳුව : “වහන්ස, ධනඤ්ජානි බමුණු ආබාධික යැ දුඃඛිත යැ දැඩිගිලන. හේ භගවත්හුගේ පාසඟුළුවන් හිසින් වඳී”යයි.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ධනඤ්ජානි බමුණු මතු කරණීය තිබිය දී හීන බ්‍රහ්මලෝකයෙහි පිහිටුවා හුනස්නෙන් නැඟී වැඩියෝ.

එසඳ ධනඤ්ජානි බමුණු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වැඩි නොබෝ වේලෙහි කලුරිය කෙළේ. බඹලෝ ගියේ ද වී.

එසඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූ සේක : “මහණෙනි, තෙල සැරියුත් ධනඤ්ජානි බමුණු මතු කරණීය තිබිය දී හුනු බඹලොව පිහිටුවා හුනස්නෙන් නැඟී ගියේ යැ”යි වදළෝ.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැද එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළෝ : “වහන්ස, ධනඤ්ජානි, බමුණු ආබාධික යැ දුඃඛිත යැ දැඩිගිලන. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසඟුළු හිසින් වඳී”යයි.

ශාරිපුත්‍රය, තෝ ධනඤ්ජානි බමුණු මතු කරණීය තිබිය දී හුනු බඹලොව පිහිටුවා හුනස්නෙන් නැඟී කිම බැස ගියෙහි?

වහන්ස, මට මෙ සිත් වී : “මෙ බමුණෝ නම බ්‍රහ්මලෝකාධිමුක්තයහ, මම ධනඤ්ජානි බමුණුව බ්‍රහ්මයන්ගේ සහභාවය සඳහා මඟ කියම් නම මනා මැ නූ” යනු යි.

ශාරිපුත්‍රය, ධනඤ්ජානි බමුණු කලුරිය කෙළේ යැ. බඹලොව ගියේ ද වී”යයි වදළෝ.

සත් වැනි ධනඤ්ජානිසූත්‍ර යි.

---

2. 5. 8

වාසෙට්ඨසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා ඉච්ඡානඞ්ගලෙ පටිවසන්ති. සෙය්‍යථිදං: චඞ්කී බ්‍රාහ්මණො, තාරුක්ඛො බ්‍රාහ්මණො, පොක්ඛරසාති බ්‍රාහ්මණො, ජානුස්සොණි බ්‍රාහ්මණො, තොදෙය්‍යො බ්‍රාහ්මණො, අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණ මහාසාලා.

අථ ඛො වාසෙට්ඨභාරද්වාජානං මාණවානං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානානං අනුවිචරමානානං[1] අයමන්තරා කථා උදපාදි: 'කථම්භො බ්‍රාහ්මණො හොතී'ති. භාරද්වාජො මාණවො එවමාහ: යතො ඛො භො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. එත්තාවතා ඛො භො, බ්‍රාහ්මණො හොතී'ති. වාසෙට්ඨො මාණවො එවමාහ: 'යතො ඛො භො, සීලවා ච හොති වතසම්පන්නො[2] ච එත්තාවතා ඛො භො, බ්‍රාහ්මණො හොතී'ති. නෙව ඛො අසක්ඛි භාරද්වාජො මාණවො වාසෙට්ඨං මාණවං සඤ්ඤාපෙතුං. න පන අසක්ඛි වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං සඤ්ඤාපෙතුං.

අථ ඛො වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං ආමන්තෙසි: 'අයං ඛො භො භාරද්වාජ, සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. ආයාම භො භාරද්වාජ, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමිස්සාම. උපසඞ්කමිත්වා සමණං ගොතමං එතමත්ථං පුච්ඡිස්සාම. යථා නො සමණො ගොතමො බ්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමා'ති. එවම්භොති ඛො භාරද්වාජො මාණවො වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සොසි.

අථ ඛො වාසෙට්ඨ, භාරද්වාජා මාණවා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො වාසෙට්ඨො මාණවො භගවන්තං ගාථාහි අජ්ඣභාසි:

---

1. අනුචඞ්කමන්තානං අනුවිචරන්තානං - මජසං, ස්‍යා.
2. වත්තසම්පන්නො - මජසං, සිමු, ස්‍යා.

Free Distribution www.aathaapi.org

2. 5. 8
වාසෙට්ඨ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානඞ්ගල ගම්හි ඉච්ඡානඞ්ගල වන ලැහැබ්හි වැඩවසනසේක. එසමයෙහි බොහෝ වූ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ වූ බමුණුමහසල්හු ඉච්ඡානඞ්ගලගම්හි වෙසෙති, ඔහු කවරහ යත් : චඞ්කීබ්‍රාහ්මණ යැ තාරුක්ඛබ්‍රාහ්මණ යැ පොක්ඛරසාතිබ්‍රාහ්මණ යැ ජානුස්සොණිබ්‍රාහ්මණ යැ තොදෙය්‍ය බ්‍රාහ්මණ යැ අන්‍ය වූ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණමහාසාරයෝ යි.

එසඳ ජඞ්ඝාවිහරණ කොට ඔබ මොබ ඇවිදුනා වාසෙට්ඨභාරද්වාජ දෙමාණවකයන්ගේ මේ අතුරුකථා උපන : ''භවත්නි, කෙසේ බමුණු නම් වේ ද ?''යි. භාරද්වාජ මාණවක මෙසේ කී : ''භවත, යම් හෙයෙකින් 'මව්පස හා පියපසිනැ'යි දෙපසින් සුජාත වේ ද, සත්වන පිතාමහයුගය දක්වා පිරිසුදු කුක්‍ෂි ඇති වේ ද, ජාතිවාදයෙන් නො නොරනලදු වැ උපක්‍රෝශ නො කරනලදුයේ වේ ද, භවත මෙතෙකින් බ්‍රාහ්මණ නම් වෙයි'' කියායි. වාසෙට්ඨ මාණව මෙසේ කී : ''භවත යම් හෙයෙකින් සිල්වත් වේ ද, ආචාරසම්පන්න වේ ද, මෙතෙකින් බ්‍රාහ්මණ නම් වේ යැ'' කියායි. භාරද්වාජ මාණවක වාසෙට්ඨ මාණවකයා හඟවන්නට නො මැ හැකි වී. වාසෙට්ඨ මාණවක භාරද්වාජ මාණවකයා හඟවන්නට ද නො හැකි වී.

ඉක්බිති වාසෙට්ඨ මාණවක භාරද්වාජ මාණවකයා ඇමැතී : ''භවත් භාරද්වාජයෙනි, සැහැකුලපුත් වූ සැහැකුලින් නික්ම පැවිදි වූ මේ මහණ ගොයුම්හු ඉච්ඡානඞ්ගලගම්හි ඉච්ඡානඞ්ගල වනලැහැබ්හි විහරණ කෙරෙති. ඒ භගවත් ගෞතමයන් වහන්සේ ගේ කලණ යසගී මෙසේ උස් වැ නැඟිණ : ''මෙ කරුණිනුදු ඒ භගවත්හු අර්හත්හ සම්‍යක් සම්බුද්ධයහ විද්‍යාචරණ සම්පන්නයහ සුගතයහ ලොකවිද්හ අනුත්තර පුරුෂදම්‍ය සාරථීයහ දෙවිමිනිස්නට ශාස්තෲයහ බුද්ධයහ භගවත්හ'' කියා යි. යම්හ භවත් භාරද්වාජයෙනි, මහණ ගොයුමන් කරා එළැඹෙම්හ. එළඹ මහණ ගොයුමන් තෙල කරුණ පුළුවුසුම්හ. යම් පරිදි මහණ ගොයුම්හු පවසත් ද, එසේ එය ධරම්හ''යි. 'භවත්නි, එසේ යැ'යි කියා භාරද්වාජ මාණවක වාසෙට්ඨ මාණවකයාහට පිළිවදන් දින.

ඉක්බිති වාසෙට්ඨභාරද්වාජ මාණවකයෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු වියයුතු කලක් සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හුන්හු. එකත්පස් වැ හුන් වාසෙට්ඨ මාණවක භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් සැළ කෙළේ :

Free Distribution www.aathaapi.org

අනුඤ්ඤාතපටිඤ්ඤාතා තෙවිජ්ජා මයමස්මු භො
අහං පොක්ඛරසාතිස්ස තාරුක්ඛස්සායං මාණවො.

තෙවිජ්ජානං යදක්ඛාතං තත්‍ර කෙවලිනො'ස්මසෙ
පදකස්මා වෙය්‍යාකරණා[1] ජප්පෙ ආචරියසාදිසා.

තෙසං නො ජාතිවාදස්මිං විවාදො අත්ථි ගොතම,
ජාතියා බ්‍රාහ්මණො හොති භාරද්වාජො ඉති භාසති
අහඤ්ච කම්මනා බ්‍රූමි එවං ජානාහි චක්ඛුම.

තෙ න සක්කොම ඤාපෙතුං අඤ්ඤමඤ්ඤං මයං උභො
භගවන්තං පුට්ඨුමාගම්ම[2] සම්බුද්ධං ඉති විස්සුතං.

චන්දං යථා ඛයාතීතං පෙච්ච පඤ්ජලිකා ජනා
වන්දමානා නමස්සන්ති එවං ලොකස්මිං ගොතමං
චක්ඛුං ලොකෙ සමුප්පන්නං මයං පුච්ඡාම ගොතමං.

ජාතියා බ්‍රාහ්මණො හොති උදාහු භවති කම්මනා
අජානතං නො පබ්‍රෑහි යථා ජානෙමු බ්‍රාහ්මණන්ති.

තෙසං වොහං ව්‍යාක්ඛිස්සං[3] (වාසෙට්ඨාති භගවා)
අනුපුබ්බං යථාතථං
ජාතිවිභඞ්ගං පාණානං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

තිණරුක්ඛෙපි ජානාථ න චාපි පටිජානරෙ
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

තතො කීටෙ පටඞ්ගෙ[4] ච යාව කුන්ථකිපිල්ලිකෙ
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

චතුප්පදෙපි ජානාථ ඛුද්දකෙ ච මහල්ලකෙ
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො

පාදූදරෙපි ජානාථ උරගෙ දීඝපිට්ඨිකෙ[5]
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

තතො මච්ඡෙපි ජානාථ උදකෙ වාරිගොචරෙ
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

තතො පක්ඛීපි ජානාථ පත්තයානෙ විහඞ්ගමෙ
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

යථා එතාසු ජාතීසු ලිඞ්ගං ජාතිමයං පුථු
එවං නත්ථි මනුස්සෙසු ලිඞ්ගං ජාතිමයං පුථු.

---

1. නො බ්‍යාකරණා - සීමු.
2. පුට්ඨුමාගමා - මජසං. / පුට්ඨුං ආගම්ම - ස්‍යා.
3. වො අහං බ්‍යක්ඛිස්සං - මජසං.
4. පතඞ්ගෙ - සීමු.
5. දීඝපිට්ඨකෙ - සීමු.

''භවත් ගෞතමයෙනි, අපි (තොප ශික්‍ෂිතයහ''යි) ඇදුරන් විසින් අනුඥත වැ ('එසේ යැ ශික්‍ෂිතයම්හ'යි තමන් විසින්) ප්‍රතිඥත වූ ත්‍රිවිද්‍යා පාරගත බ්‍රාහ්මණයම්හ. මම පොක්ඛරසාති බමුණුගේ ශිෂ්‍යයෙමි. මේ මාණවු තාරුක්ඛ බමුණුහුගේ ශිෂ්‍යයෙක.

ත්‍රිවේද පාරගත බමුණන් විසින් යමක් අර්ථ ව්‍යඤ්ජන විසින් පැවැසිණි ද, එහි ලා (එහැම දන නිෂ්ඨාගත වූ) කෙවලී වම්හ. පදශාස්ත්‍ර හදරන්නම්හ, ව්‍යාකරණ හදරන්නම්හ. ජල්පයෙහි ලා ස්වීය ආචාර්‍ය්‍යයන් වැනියම්හ.

ගෞතමයන් වහන්ස, ඒ අප අතර ජාතිවාදයෙහි ලා විවාදයෙක් ඇත. භාරද්වාජ මාණවක 'ජාතියෙන් බ්‍රාහ්මණ වේ'යයි කියයි. මම වනාහි 'කර්‍මයෙන් බ්‍රාහ්මණ වේ'යයි කියමි, පසැස් ඇත්තව, (තෙල විවාදය) මෙසේ දනුමැනැවැ.

ඒ අපි දෙදෙනමෝ උනුන් හඟවන්නට නො හැක්කම්හ. ලෝවැසි දෙව්යෝ බැදදිලි වූවාහු වෙත එළඹ පරිපූර්ණ චන්ද්‍රමණ්ඩලය වඳනා සෙයින් මෙසේ ගෞතමයන් වහන්සේ පසසමින් නමදිත් ද, මෙසේ විශ්‍රුත වූ ලෝකයෙහි පහළ ඇසක් වැනි වූ භගවත් සම්බුද්ධ ගෞතමයන් වහන්සේ පුළුවුස්නට අවුදු අපි පුළුවුසුම්හ :

ජාතියෙන් බ්‍රාහ්මණ වේ ද, නොහොත් කර්‍මයෙන් බ්‍රාහ්මණ වේ ද ?යි බ්‍රාහ්මණ විනිශ්චය යම් පරිදි දනුමෝ ද, එපරිදි, නො දන්නා අපට වදළ මැනැවි.

('වාසෙට්ඨයෙනි'යි බුදුහු ඇමැතූසේක.) මම ඒ තොපට ප්‍රාණයන්ගේ ජාති විභාගය (ජාතිවිස්තරය) ඇති සැටි අනුපූර්‍ව කොට විවරණ කරමි. ජාතීහු අන්‍යොන්‍යයහ. (නානාප්‍රකාරයහ).

('අපි තෘණයම්හ' 'අපි වෘක්‍ෂයම්හ'යි) යම් තෘණ වෘක්‍ෂ කෙනෙක් වෙන වෙන නො දනිත් ද, ඒ තෘණ වෘක්‍ෂයනුදු දනුව. උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

ඉන් මතු (උපාදින්නකයන් කෙරෙහි) කුරුකුහුඹුවන් තෙක් පණුවනුදු පළඟැටියනුදු දනුව. උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

(ලෙහෙනුන් ආදි, කුඩාසතුනුදු (බළලුන් ආදි) මහසතුනුදු මෙසේ චතුෂ්පදජාතීනුදු දනුව. උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

දික් පිටු ඇති උරින් යන විෂධරයනුදු දනුව. උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

ඉක්බිති දියෙහි උපන් ජලය ගෝචර කොට ඇති මසුනුදු දනුව. උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

ඉක්බිති පියාපත් යාන කොට ඇති අහසැ ඇවිදනා ලිහිණිනුදු දනුව . උන්ගේ ජාතිමය ලිඞ්ග ඇත. (කවර හෙයින යත්:) ජාතීහු නානාප්‍රකාරයහ.

යම් පරිදි තෙල ජාතියෙහි වෙන වෙන ජාතිමය ලිඞ්ග ඇත්ද, එපරිදි මිනිසුන් කෙරෙහි වෙන වෙන ජාතිමය ලිඞ්ග නැත.

න කෙසෙහි න සීසෙහි න කණ්ණෙහි න අක්ඛිහි,
න මුඛෙන න නාසාය න ඔට්ඨෙහි භමූහි වා.

න ගීවාය න අංසෙහි න උදරෙන න පිට්ඨියා
න සොණියා න උරසා න සම්බාධෙ න මෙථුනෙ.

න හත්ථෙහි න පාදෙහි නාඞ්ගුලීහි නඛෙහි වා,
න ජඞ්ඝාහි න ඌරූහි න වණ්ණෙන සරෙන වා
ලිඞ්ගං ජාතිමයං නෙව යථා අඤ්ඤාසු ජාතිසු.

පච්චත්තං ච සරීරෙසු මනුස්සෙස්වෙතං න විජ්ජති
වොකාරඤ්ච මනුස්සෙසු සමඤ්ඤාය පවුච්චති.

යො හි කොචි මනුස්සෙසු ගොරක්ඛං උපජීවති
එවං වාසෙට්ඨ ජානාහි කස්සකො සො න බ්‍රාහ්මණො

යො හි කොචි මනුස්සෙසු පුථුසිප්පෙන ජීවති
එවං වාසෙට්ඨ ජානාහි සිප්පිකො සො න බ්‍රාහ්මණො.

යො හි කොචි මනුස්සෙසු වොහාරං උපජීවති
එවං වාසෙට්ඨ ජානාහි වාණිජො සො න බ්‍රාහ්මණො.

යො හි කොචි මනුස්සෙසු පරපෙස්සෙන ජීවති
එවං වාසෙට්ඨ ජානාහි පෙස්සිකො සො න බ්‍රාහ්මණො.

යො හි කොචි මනුස්සෙසු අදින්නං උපජීවති
එවං වාසෙට්ඨ ජානාහි චොරො එසො න බ්‍රාහ්මණො.

යො හි කොචි මනුස්සෙසු ඉස්සත්ථං උපජීවති
එවං වාසෙට්ඨ ජානාහි යොධාජීවො න බ්‍රාහ්මණො

යො හි කොචි මනුස්සෙසු පොරොහිච්චෙන ජීවති
එවං වාසෙට්ඨ ජානාහි යාජකො සො න බ්‍රාහ්මණො

යො හි කොචි මනුස්සෙසු ගාමං රට්ඨඤ්ච භුඤ්ජති
එවං වාසෙට්ඨ ජානාහි රාජා එසො න බ්‍රාහ්මණො.

න චාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං
භොවාදි නාම සො හොති සචෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

සබ්බසඤ්ඤොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති
සඞ්ගාතිගං විසඤ්ඤුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දානං සහනුක්කමං
උක්ඛිත්තපළිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

(ලිඞ්ගභෙදයෙක්) කේශයෙන් නැත, හිසින් නැත, කනින් නැත, ඇසින් නැත, මුවින් නැත, නැහැයෙන් නැත, තොලින් නැත, බැමිතුඩු නැත.

ග්‍රීවායෙන් නැත, අංශයෙන් නැත, උදරයෙන් නැත, පිටින් නැත, ශ්‍රොණියෙන් නැත, උරයෙන් නැත, සම්බාධයෙහි නැත, මෛථුනයෙහි නැත.

අතින් නැත, පයින් නැත, ඇඟිල්ලෙන් නැත, නියෙන් නැත, දඟින් නැත, කලවෙයින් නැත, පැහැයෙන් නැත, ස්වරයෙන් අන්‍යජාතීන්හි සෙයින් ජාතිමය ලිඞ්ග නැත් මැ යි.

(බ්‍රාහ්මණාදි භෙදවත්) මිනිස් සිරුරුහි වෙන වෙන තෙල (ජාතිමය ලිඞ්ගය) නො පැනේ. මිනිසුන් කෙරෙහි නානාත්වය ද ව්‍යවහාරමාත්‍රයෙන් කියනු ලැබේ.

මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් කෘෂිකර්මයෙන් දිවිරක්නේ ද, වාසෙට්ඨයෙනි, මෙසේ, හේ "ගොවියෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් නොයෙක් ශිල්පයෙන් දිවි රක්නේ ද, මෙසෙයින් හේ "ශිල්පියෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් වෙළෙඳහමින් දිවි රක්නේ ද, මෙසෙයින් හේ වෙළෙඳෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් පරනට මෙහෙ කිරීමෙන් දිවි රක්නේ ද මෙසෙයින් හේ "මෙහෙකරුවෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් අයිනාදනින් දිවි රක්නේ ද, මෙසෙයින් හේ "සොරෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් ආයුධයෙන් දිවි රක්නේ ද, මෙසෙයින් හේ "යොධාජීව යෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් පෙරෙවිකමින් දිවි රක්නේ ද, මෙසෙයින් හේ "යාජකයෙක, බමුණු නො වේ"යයි දනුව.

වාසෙට්ඨයෙනි, මිනිසුන් කෙරෙහි යම් කිසිවෙක් ගමත් රටත් පරිභෝග කෙරේ ද, මෙසෙයින් හේ "රජෙක, බමුණු නො වේ"යයි දනුව.

මම යොනිජමාතෘසම්භව මාත්‍රයෙන් 'බමුණු'යයි නො කියමි. ඉදින් හේ (රාගාදි) පලිබෝධ සහිත වේ නම් 'භො වාදී' නම් වෙයි. (රාගාදි පලිබොධ නැති ආදන නැති (ග්‍රහණ හැරපී) ඔහු 'බ්‍රාහ්මණ' යයි මම කියමි.

යමෙක් ඒකාන්තයෙන් සියලු සංයෝජනයන් සිඳ තෘෂ්ණා නො කෙරේ ද, (රාගාදි) සඞ්ගයන් ඉක්ම ගිය (සතර යෝනියෙන් හා සියලු කෙලෙසුන් කෙරෙන්) වෙන් වූ ඔහු 'බ්‍රාහ්මණ'යයි මම කියමි.

(බද්ධවෛර සඞ්ඛ්‍යාත) බහන ද (තෘෂ්ණා සඞ්ඛ්‍යාත) වරපට ද (දෘෂ්ටිපර්යුත්ථාන සඞ්ඛ්‍යාත) පාශය ද (දෘෂ්ට්‍යනුශය සඞ්ඛ්‍යාත) ගණ්ඨිය ද සිඳ නඟා හළ (අවිද්‍යා සඞ්ඛ්‍යාත) අගුළු ඇති, චතුස්සත්‍යය අවබෝධ කළ ඔහු 'බ්‍රාහ්මණ'යයි මම කියමි.

46—මෙක් 13561 (11/72)

Free Distribution www.aathaapi.org

අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති
ඛන්තිබලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සදං
දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො
යො න ලිප්පති[1] කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො
පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං
උත්තමත්ථමනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං
සාදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච ඔහිතො
සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

අකක්කසං විඤ්ඤාපනිං[2] ගිරං සච්චං උදීරයෙ
යාය නාභිසජෙ[3] කිඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යො ච දීඝං ව රස්සං වා අණුං ථූලං සුභාසුභං
ලොකෙ අදින්නං නාදියති[4] තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච
නිරාසයං[5] විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී[6].
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

චන්දංව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

1. ලිම්පති - සීමු, මජසං, සයා. 2. විඤ්ඤපනිං - සීමු, මජසං, සයා.
3. නාභිසජ්ජෙ - මජසං, සයා. 4. නාදෙති - මජසං, සයා.
5. නිරාසාසං - මජසං, සයා. 6. අකථංකථි - සීමු.

යමෙක් අදූෂ්ට වැ අක්‍රෝශ හා වධ බන්ධ සෙහේ ද, ක්ෂාන්තිබල ඇති ක්ෂාන්ති සඞ්ඛ්‍යාත බල ඇණි ඇති, ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

ක්‍රෝධ රහිත වූ ධුතාඞ්ග ඇති ධුතාඞ්ගව්‍රත ඇති, සිල්වත් වූ ගුණවත් වූ (රාගාදි) උත්සද නැති, දාන්ත වූ අන්තිමශරීරධර වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

පොකුරුපත හුන් දිය සෙයින් හිදි අග හුන් හබ සෙයින් යමෙක් කාමයෙහි නො ලැගේ ද, ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක් දුඃඛය දන්නේ ද, මෙ අත්බැව මැ තමා ගේ දුඃඛක්‍ෂය දන්නේ ද, බහා තැබූ කෙලෙස් බර ඇති, සියලු කෙලෙසුන් කෙරෙන් විසංයුක්ත වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

ගැඹුරු අරමුණෙහි පැවැති පැන ඇති ප්‍රකෘති ප්‍රඥයෙන් ප්‍රඥවත් වූ මාර්ගාමාර්ග පිළිබඳ කෝවිදයකු වූ උත්තමාර්ථ සඞ්ඛ්‍යාත අර්හත්වයට පැමිණි ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

ගෙවැසියන් හා ද අනාගාරිකයන් හා ද'යි දෙපස හා නො හැනුණු පඤ්චකාමගුණයෙහි නො ඇලුණු අල්පෙච්ඡ වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

භූත තස ථාවර සත්ත්වයන් කෙරෙහි දඬුවම් බහා තබා යමෙක් හිංසා නො කෙරේ ද, ඝාතන නො කෙරේ ද, මම ඔහු 'බ්‍රාහ්මණ'යයි කියමි.

දඬුගත් වෛරීන් කෙරෙහි අවිරුද්ධ වූ (ක්ලේශනිර්වාණයෙන්) නිවුණු උපාදාන සහිතයන් කෙරෙහි අනුපාදාන වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමක්හුගේ රාගද්වේෂමාන හා ම්‍රක්ෂය ද හිදි අගින් ගිලිහුණු අබැටක් සෙයින් බහා තැබිණි ද ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යම් වචනයෙකින් කිසිවකුත් නො සටා ද, කැකුළ නො වූ පෙහෙසුන් නො වූ එ බඳු සත්‍ය වචන බෙණේ නම් මම ඔහු 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක් ලෝකයෙහි වැටෙන දිග වූ ත් හ්‍රස්ව වූ ත් සියුම් වූ ත් දළ වූ ත් ශුභාශුභ අයිනාදන් නො ගනී ද, මම ඔහු 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක්හට මෙලොවෙහි දු පරලොවෙහි දු ආශාවෝ නැද්ද, තෘෂ්ණා රහිත වූ එහෙයින් මැ විසංයුක්ත වූ ඔහු මම 'බ්‍රාහ්මණ' යයි කියමි.

යමෙක්හට තෘෂ්ණාලයයෝ නැද්ද, දැනීම හේතු කොට කථංකථා සඞ්ඛ්‍යාත සැක නැද්ද, අමා තුළට පැමිණි ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

මෙලොවැ යමෙක් පුණ්‍යපාප සඞ්ඛ්‍යාත උභය සඞ්ගය ඉක්ම ගියේ වේ ද, ශෝක රහිත වූ රජස් රහිත වූ ශුද්ධ වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

විමල පරිශුද්ධ චන්ද්‍රමණ්ඩලය සෙයින් විප්‍රසන්න වූ (රාගාදීන්) අනාවිල වූ ක්‍ෂය කළ තෘෂ්ණාව හා භවය ඇති ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යො ඉමං පලිපථං දුග්ගං සංසාරං මොහමච්චගා
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යොධ කාමෙ පහත්වාන අනාගාරෙ පරිබ්බජෙ
කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යොධ තණ්හං පහත්වාන අනාගාරෙ පරිබ්බජෙ
තණ්හා භවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

හිත්වා රතිඤ්ච අරතිං සීතීභූතං නිරූපධිං
සබ්බාලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

චුතිං යො වෙදි සත්තානං උපපත්තිඤ්ච සබ්බසො
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

සමඤ්ඤා' හෙසා ලොකස්මිං නාමගොත්තං පකප්පිතං
සමුච්ච[1] සමුදාගතං තත්ථ තත්ථ පකප්පිතං

දීඝරත්තමනුසයිතං දිට්ඨිගතමජානතං
අජානන්තා[2] නො පබ්‍රෑවන්ති[3] ජාතියා හොති බ්‍රාහ්මණො.

න ජච්චා බ්‍රාහ්මණො[4] හොති න ජච්චා හොති අබ්‍රාහ්මණො[5]
කම්මනා බ්‍රාහ්මණො[4] හොති කම්මනා හොති අබ්‍රාහ්මණො[5]

කස්සකො කම්මනා හොති සිප්පිකො හොති කම්මනා
වාණිජො කම්මනා හොති පෙස්සිකො හොති කම්මනා.

චොරොපි කම්මනා හොති යොධාජීවොපි කම්මනා
යාජකො කම්මනා හොති රාජාපි හොති කම්මනා.

---

1. සම්මුච්චා - සීමු.
2. ජානන්තා - සීමු.
3. පබ්‍රෑන්ති - මජසං.
4. වසලො - ස්‍යා.
5. බ්‍රාහ්මණො - ස්‍යා

යමෙක් විසංවාදකාත්මයෙන් පලිපථ වූ දුර්ග වූ සංසරණයට කාරණ වූ මෝහය ඉක්ම සිටියේ වේ ද, චතුරෝඝය තරණය කොළේ නිර්වාණ පාරයට ගියේ ධ්‍යාන කරනුයේ නිෂ්තෘෂ්ණ වූයේ විමති නැතියේ උපාදාන වශයෙන් නො ගෙන පිරිනිවියේ වේ ද, ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක් මෙලොවැ කාම හැර පියා ගිහිගෙයින් නික්මියේ පැවිද්දට පැමිණෙන්නේ වේද, ක්‍ෂය කළ කාම හා භව ඇති ඔහු මම 'බ්‍රාහ්මණ' යයි කියමි.

යමෙක් මෙලොවැ තෘෂ්ණාව පියා ගිහිගෙයින් නික්මියේ පැවිද්දට පැමිණෙන්නේ වේ ද, ක්‍ෂය කළ තෘෂ්ණා හා භව ඇති ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

මානුසක පස්කම්ගුණ යෝගය පියා දිව්‍ය පඤ්චකාමගුණ යෝගය ඉක්ම ගියේ වේ ද, මෙසේ සර්වයොග විසංයුක්ත වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

පඤ්චකාමගුණ රතිය හා කුශලභාවනායෙහි අරතිය පියා ශීතිභූත වූ උපධි රහිත වූ සියලු ලොව මැඩසිටුනා වැඩූ වැර ඇති ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක් සත්ත්වයන්ගේ ච්‍යුතිය දත්තේ වේ ද, සර්වප්‍රකාරයෙන් උප්පත්තිය ද දත්තේ වේ ද, නො ලැගුණු මනා ගති ඇති, සිව්සස් දත් ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

දෙවියන් හා ගන්ධර්වමනුෂ්‍යයෝ යමක්හුගේ නිෂ්පත්තිය නො දනිත් ද, ක්‍ෂීණාස්‍රව වූ අර්හත් වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

අතීතයෙහිත් අනාගතයෙහිත් ප්‍රත්‍යුත්පන්නයෙහිත් යමක්හුගේ කිඤ්චනාඛ්‍ය කෙලෙස් නැද්ද, කිඤ්චන රහිත වූ (කෙලෙස් විසින්) ආදාන රහිත වූ ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

ශ්‍රෙෂ්ඨ වූ ප්‍රවර වූ වැඩූ වැර ඇති, මහර්ෂි වූ දිනූ සඞ්ග්‍රාම ඇති නිෂ්තෘෂ්ණ වූ සෝධා හළ කෙලෙස් ඇති සිව්සස් දත් ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

යමෙක් පූර්වනිවාසය දන්නේ ද ස්වර්ගාපාය දෙකත් දක්නේ ද, ඉක්බිති ජාතික්‍ෂයට පැමිණියේ වේ ද, ඔහු මම 'බ්‍රාහ්මණ'යයි කියමි.

(නෑසහලේනෑ ආදීන් විසින්) කරනලද නාමගෝත්‍රයෙක් ඇද්ද ලෝකයෙහි තෙල ව්‍යවහාර මාත්‍රයෙකි. දීර්ඝරාත්‍රයෙහි අනුශය වශයෙන් බැස සිටි දෘෂ්ටිගතය නො දත් නෑයන් විසින් ඒ ඒ තන්හි (ජාත කාලයෙහි) කරනලද (නාමගොත්‍රය) සමනුඥයෙන් පහළ වූයෙකි. එය නො දන්නාහු 'ජාතියෙන් බ්‍රාහ්මණයහ'යි කියත්.

ජාතියෙන් බ්‍රාහ්මණ නො වෙයි, ජාතියෙන් අබ්‍රාහ්මණත් නො වෙයි, කර්මයෙන් බ්‍රාහ්මණ වෙයි, කර්මයෙන් අබ්‍රාහ්මණත් වෙයි.

(කෘෂිකර්මාදිය නිපයන චෙතනා) කර්මයෙන් කෘෂික වෙයි, කර්මයෙන් ශිල්පික වෙයි, කර්මයෙන් වාණිජ වෙයි, කර්මයෙන් ප්‍රෙෂ්‍යක වෙයි.

කර්මයෙන් චෞර වෙයි, කර්මයෙන් යොධාජීව ද වෙයි, කර්මයෙන් යාජක (යාග කරනු) වෙයි, කර්මයෙන් රජත් වෙයි.

එවමෙතං යථාභූතං කම්මං පස්සන්ති පණ්ඩිතා
පටිච්චසමුප්පාදදසා කම්මවිපාකකොවිදා.

කම්මනා වත්තති ලොකො කම්මනා වත්තති පජා
කම්මනිබන්ධනා සත්තා රථස්සාණීව යායතො.

තපෙන බ්‍රහ්මචරියෙන සංයමෙන දමෙන ච
එතෙන බ්‍රාහ්මණො හොති එතං බ්‍රාහ්මණමුත්තමං.

තීහි විජ්ජාහි සම්පන්නො සන්තො ඛීණපුනබ්භවො,
එවං වාසෙට්ඨ ජානාහි බ්‍රහ්මා සක්කො විජානතන්ති.

එවං වුත්තෙ වාසෙට්ඨභාරද්වාජා මාණවා භගවන්තං එතදවොචුං: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරේ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙති.

වාසෙට්ඨසුත්තං අට්ඨමං.

මෙසේ ප්‍රතීත්‍යසමුත්පාදය දක්නා කර්මවිපාකඥානයෙහි කෝවිද වූ පණ්ඩිතයෝ මෙල යථාභූත කර්මාර්ථය දක්නාහ.

ලෝකය කර්මයෙන් වැවේ. ප්‍රජාව කර්මයෙන් වැවෙයි. යන රථයක්හුගේ අකුරඟ ඇණය සෙයින් සත්ත්වයෝ කර්මය නිබන්ධන කොට ඇත්තාහ.

ධුතාඞ්ග තපසිනුදු මෛථුන විරතියෙනුදු ශීලයෙනුදු ඉන්ද්‍රියදමනයෙනුදු මෙසේ මෙයින් බ්‍රාහ්මණ වේ. මෙල කර්මය උතුම් බ්‍රාහ්මණභාව එළවන ගුණ යි.

ත්‍රිවිද්‍යායෙන් සමෘද්ධ වූ සන්හුන් කෙලෙස් ඇති ක්‍ෂය කළ පුනර්භවය ඇති යමෙක් වේ ද, ඔහු වාසෙට්ඨය, මෙසේ 'බ්‍රහ්මයහ'යි ද 'ශක්‍රයහ'යි ද නුවණැතියන්ගේ බසින් දනුව.

මෙසේ වදළ කල 'වාසෙට්ඨ'යැ 'භාරද්වාජ'යැ යන දෙමණෙවුහු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළෝ : ''භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවැ ,භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවැ. භවත් ගෞතමයන් වහන්ස, යම් පරිදි යටිහුරු කළ බඳුනක් හෝ උඩුහුරු කරන්නේ වේ ද, පිළිසන් දයක් හෝ විවර කරන්නේ වේ ද, මංමුළාවූවක්හට හෝ මාර්ගය කියන්නේ වේ ද, ''ඇස් ඇත්තෝ රූප දක්නාහ''යි අඳුරෙහි හෝ මෙල්පහනක් ධරන්නේ වේ ද, එපරිදි මැ භවත් ගෞතමයන් වහන්සේ විසින් අනේකප්‍රකාරයෙන් දහම් දෙසිණ. මෙල අපි භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්‍ෂුසඞ්ඝයා ද සරණ යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට අප ප්‍රාණෝපෙත සරණ ගිය උපාසකයන් කොට ධරත්වා.

අට වැනි වාසෙට්ඨසූත්‍ර යි.

---

2. 5. 9

සුභසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන සුභො මාණවො තොදෙය්‍යපුත්තො සාවත්ථියං පටිවසති අඤ්ඤතරස්ස ගහපතිස්ස නිවෙසනෙ කෙනචිදෙව කරණීයෙන. අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො යස්ස ගහපතිස්ස නිවෙසනෙ පටිවසති, තං ගහපතිං එතදවොච: සුතං මෙතං ගහපති, අවිවිත්තා සාවත්ථි අරහන්තෙහී'ති. කන්නු ඛ්වජ්ජ සමණං වා බ්‍රාහ්මණං වා පයිරුපාසෙය්‍යාමා'ති?

අයං භන්තෙ, භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තං භන්තෙ, භගවන්තං පයිරුපාසස්සූ'ති.

අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො තස්ස ගහපතිස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච:

බ්‍රාහ්මණා භො ගොතම, එවමාහංසු: ගහට්ඨො ආරාධකො හොති ඤායං ධම්මං කුසලං, න පබ්බජිතො ආරාධකො හොති ඤායං ධම්මං කුසල'න්ති. ඉධ භවං ගොතමො කිමාහාති?

විභජ්ජවාදො ඛො අහමෙත්ථ මාණව, නාහමෙත්ථ එකංසවාදො, ගිහිස්ස වාහං මාණව, පබ්බජිතස්ස වා මිච්ඡාපටිපත්තිං න වණ්ණෙමි. ගිහී වා හි මාණව, පබ්බජිතො වා මිච්ඡාපටිපන්නො මිච්ඡාපටිපත්තාධිකරණහෙතු න ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. ගිහිස්ස වාහං මාණව, පබ්බජිතස්ස වා සම්මාපටිපත්තිං වණ්ණෙමි. ගිහී වා හි මාණව, පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණහෙතු ආරාධකො හොති ඤායං ධම්මං කුසල'න්ති.

බ්‍රාහ්මණා භො ගොතම, එවමාහංසු : 'මහට්ඨමිදං[1] මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං ඝරාවාසකම්මට්ඨානං මහප්ඵලං හොති අප්පට්ඨමිදං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං පබ්බජ්ජාකම්මට්ඨානං අප්පඵලං හොතී'ති. ඉධ භවං ගොතමො කිමාහාති?

---

1. මහට්ඨං – ස්‍යා

Free Distribution www.aathaapi.org

2. 5. 9

සුභ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදැ: එක් සමයෙක්හි අප බුදුහු සැවැත්නුවර නිසා ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එසමයෙහි තෝදෙය්‍ය බමුණුහුගේ පුත් සුභ මණෙවු කිසි කටයුත්තෙකින් සැවැත්නුවර එක්තරා ගෘහපතියක්හුගේ නිවෙස්නෙහි වෙසෙයි. එසඳ තොදෙය්‍යපුත්‍ර සුභ මාණව යම් ගැහැවියක්හු ගේ නිවෙස්නෙහි වෙසේ ද, එ ගැහැවිහට තෙල කී : ''ගැහැවියෙනි, සැවැත්නුවර රහතුන්ගෙන් වෙන් නො වේ'' යන තෙල බස මා විසින් අසන ලද. අද කවර නම් මහණකු හෝ බමුණකු හෝ පර්යුපාසන කරමෝ ද?''යි.

''ස්වාමීනි, මේ භගවත්හු සැවැත්නුවර ජේතවන නම් වූ අනෝවඩුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. ස්වාමීනි, ඒ භාග්‍යවතුන් වහන්සේ පර්යුපාසන කරව''යි.

එසඳ තෝදෙය්‍යපුත්‍ර සුභ මාණව ඒ ගැහැවිහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී. සතුටු වියයුතු කාලාන්තර යෙහි සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් තෝදෙය්‍යපුත්‍ර සුභ මාණව භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ :

''භවත් ගෞතමයෙනි, බමුණෝ මෙසේ කීහු : ගෘහස්ථ තෙමේ අනවද්‍ය න්‍යාය (කාරණ) ධර්මය පුරන්නේ වෙයි, ප්‍රව්‍රජිත තෙමේ අනවද්‍ය න්‍යායධර්මය පුරන්නේ නො වේ''යයි. මෙහි ලා භවත් ගෞතමයෝ කුමක් කියත් ද?යි.

මාණවකය, මම මෙහි දී විභජ්ජවාදයෙමි. මම මෙහි දී ඒකාන්තවාද නො වෙමි. මාණවකය, මම ගිහියක්හුගේ වේවයි, පැවිද්දක්හුගේ වේවයි, මිථ්‍යාප්‍රතිපත් නො වනමි. මාණවකය, ගිහියෙක් වේවයි පැවිද්දෙක් වේවයි, වරදවා පිළිපන්නේ වරදවා පිළිපැදීම් හේතු කොට ගෙන අනවද්‍ය වූ කාරණ ධර්මය සපයන්නේ නො වේ. මාණවකය, මම ගිහියකුගේ වේවයි, පැවිද්දකුගේ වේවයි, මනා පිළිවෙත වනමි. මාණවකය, ගිහියෙක් වේවයි පැවිද්දෙක් වේවයි මොනොවට පිළිපන්නේ මොනොවට පිළිපැදීම් හේතුයෙන් අනවද්‍ය වූ න්‍යායධර්මය සපයන්නේ වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මෙසේ කීහු : ''බොහෝ වූ (මෙහෙකරුවන් විසින් හෝ උවරණ විසින්) අර්ථ ඇති මහත් වූ නාමග්‍රහණාදි කිස ඇති මහත් වූ අධිකාර ඇති මහත් වූ (පීඩා සඞ්ඛ්‍යාත) සමාරම්භ ඇති මේ ගෘහාවාස කර්මය මහත්ඵල වෙයි. අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකාර ඇති අල්ප සමාරම්භ ඇති මේ ප්‍රව්‍රජ්‍යාකර්මය අල්පඵල වේ ය කියා යි. මෙහි ලා භවත් ගෞතමයන් වහන්සේ කුමක් වදරනසේක් ද?

එත්ථාපි ඛො අහං මාණව, විභජ්ජවාදො, නාහමෙත්ථ එකංසවාදො: අත්ථි මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති. අත්ථි මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති. අත්ථි මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති. අත්ථි මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති.

කතමඤ්ච[1] මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති: කසි ඛො මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති.

කතමඤ්ච මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති: කසියෙව ඛො මාණව, කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං සම්පජ්ජ-මානං මහප්ඵලං හොති.

කතමඤ්ච මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති: වණිජ්ජා ඛො මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති.

කතමඤ්ච මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති: වණිජ්ජායෙව ඛො මාණව, කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති.

සෙය්‍යථාපි මාණව, කසි කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධි-කරණං මහාසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති. එවමෙව ඛො මාණව, ඝරාවාසකම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහා-සමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති.

සෙය්‍යථාපි මාණව, කසියෙව කම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති. එවමෙව ඛො මාණව, ඝරාවාසකම්මට්ඨානං මහට්ඨං මහාකිච්චං මහාධිකරණං මහාසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති.

1. කතමං - ස්‍යා.

මාණවකය, මම මෙහි ද විභජ්ජවාදයෙමි. මම මෙහි ඒකාන්තවාද නො වෙමි. මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකාර ඇති මහාසමාරම්භ ඇති කර්මාන්තයෙක් වනසට යන්නේ අල්පඵල වේ ද, එබඳු කර්මස්ථානයෙක් ඇත. මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකාර ඇති මහාසමාරම්භ ඇති කර්මාන්තයෙක් සම්පාදනා කරනුලබනුයේ මහත්ඵල වේ ද, එබඳු කර්මස්ථානයෙක් ද ඇත. මාණවකය, අල්පාර්ථ වූ අල්ප කෘත්‍ය වූ අල්පාධිකාර ඇති අල්පසමාරම්භ ඇති කර්මාන්තයෙක් වැනසෙනුයේ අල්පඵල වේ ද, එබඳු කර්මස්ථානයෙක් ද ඇත. මාණවකය, අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකාර ඇති අල්පසමාරම්භ ඇති කර්මාන්තයෙක් සපයනුලබන්නේ මහත්ඵල වේ ද, එ බඳු කර්මස්ථානයෙක් ද ඇත.

මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති කවර නම් කර්මස්ථානයෙක් වනසට යන්නේ අල්පඵල වේ ද යත්: මාණවකය, කෘෂිකර්මාන්තය මහාර්ථ වූයේ මහාකෘත්‍ය වූයේ මහාධිකරණ ඇත්තේ මහාසමාරම්භ ඇත්තේ වනසට යන්නේ අල්පඵල වෙයි.

මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති කවර නම් කර්මාන්තයෙක් සමෘද්ධ වනුයේ මහත්ඵල වේ ද යත්: මාණවකය, කෘෂිකර්මාන්තය මැ මහාර්ථ වූයේ මහාකෘත්‍ය වූයේ මහාධිකරණ ඇත්තේ මහාසමාරම්භ ඇත්තේ සමෘද්ධ වනුයේ මහත්ඵල වෙයි.

මාණවකය, අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පා ධිකරණ ඇති අල්පසමාරම්භ ඇති කවර නම් කර්මස්ථානයෙක් වනසට යනුයේ අල්පඵල වේ ද යත්: මාණවකය, වෙළෙඳාම් කර්මාන්තය අල්පාර්ථ වූයේ අල්පකෘත්‍ය වූයේ අල්පාධිකරණ ඇතියේ අල්පසමාරම්භ ඇතියේ වනසට යන්නේ අල්පඵල වෙයි.

මාණවකය, අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අලපාධිකරණ ඇති අල්පසමාරම්භ ඇති කවර නම් කර්මාන්තයෙක් සමෘද්ධ වනුයේ මහත්ඵල වේ ද යත්: මාණවකය, වෙළෙඳාම් කර්මාන්තය මැ අල්පාර්ථ වූයේ අල්පකෘත්‍ය වූයේ අල්පාධිකරණ ඇතියේ අල්ප සමාරම්භ ඇතියේ සමෘද්ධ වන්නේ මහත්ඵල වෙයි.

මාණවකය, යම්සේ මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති කෘෂිකර්මාන්තය වැනැසෙනුයේ අල්පඵල වේ ද, එසෙයින් මැ මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති ගෘහවාසකර්මය වැනැසෙනුයේ අල්පඵල වෙයි.

මාණවකය, යම්සේ මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති කෘෂිකර්මය මැ සමෘද්ධ වනුයේ මහත්ඵල වේ ද, එසෙයින් මැ මාණවකය, මහාර්ථ වූ මහාකෘත්‍ය වූ මහාධිකරණ ඇති මහාසමාරම්භ ඇති ගෘහවාසකර්මය සමෘද්ධ වන්නේ මහත්ඵල වෙයි.

සෙය්‍යථාපි මාණව, වණිජ්ජා කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති. එවමෙව ඛො මාණව, පබ්බජ්ජාකම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං විපජ්ජමානං අප්පඵලං හොති.

සෙය්‍යථාපි මාණව, වණිජ්ජායෙව කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොති. එවමෙව ඛො මාණව, පබ්බජ්ජා කම්මට්ඨානං අප්පට්ඨං අප්පකිච්චං අප්පාධිකරණං අප්පසමාරම්භං සම්පජ්ජමානං මහප්ඵලං හොතී'ති.

බ්‍රාහ්මණා භො ගොතම, පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනායාති.

යෙ තෙ මාණව, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. සචෙ තෙ අගරු, සාධු තෙ පඤ්ච ධම්මෙ ඉමස්මිං පරිසතිං භාසස්සූති.

න ඛො මෙ භො ගොතම, ගරු, යත්ථස්සු භවන්තො වා නිසින්නා භවන්තරූපා වාති.

තෙන හි මාණව, භාසස්සූති.

සච්චං ඛො භො ගොතම, බ්‍රාහ්මණා පඨමං ධම්මං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. තපං ඛො භො ගොතම, බ්‍රාහ්මණා දුතියං ධම්මං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. බ්‍රහ්මචරියං ඛො භො ගොතම, බ්‍රාහ්මණා තතියං ධම්මං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. අජ්ඣෙනං ඛො භො ගොතම, බ්‍රාහ්මණා චතුත්ථං ධම්මං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. චාගං ඛො භො ගොතම, බ්‍රාහ්මණා පඤ්චමං ධම්මං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. බ්‍රාහ්මණා භො ගොතම, ඉමෙ පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනායාති. ඉධ භවං ගොතමො කිමාහාති?

කිං පන මාණව, අත්ථි කොචි බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යො එවමාහ : 'අහං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමී'ති?

නො හිදං භො ගොතම.

කිං පන මාණව, අත්ථි කොචි බ්‍රාහ්මණානං එකාචරියොපි එකාචරිය පාචරියොපි යාවසත්තමා ආචරියමහයුගා, යො එවමාහ: අහං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමී'ති.

නො හිදං භො ගොතම.

මාණවකය, යම්සේ අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකරණ ඇති අල්පසමාරම්භ ඇති වෙළෙඳහම් කර්මස්ථානය නස්නේ අල්පඵල වේ ද, එසෙයින් මැ මාණවකය, අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකරණ ඇති අල්පසමාරම්භ ඇති ප්‍රව්‍රජ්‍යාකර්මය නස්නේ අල්පඵල වෙයි.

මාණවකය, යම්සේ අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකරණ ඇති අල්පසමාරම්භ ඇති වෙළෙඳහම් කර්මය මැ සමෘද්ධ වනුයේ මහත්ඵල වේ ද, එසෙයින් මැ මාණවකය, අල්පාර්ථ වූ අල්පකෘත්‍ය වූ අල්පාධිකරණ ඇති අල්පසමාරම්භ ඇති ප්‍රව්‍රජ්‍යාකර්මය සමෘද්ධ වනුයේ මහත්ඵල වේ''යයි.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට පස්දහමක් පනවති'යි.

මාණවකය, යම් බ්‍රාහ්මණ කෙනෙක් පින් කිරීමට කුසල් සැපයීමට පස්දහමක් පනවත් ද, ඉදින් තොපට නො බැරි වේ නම් එ පස්දහම් මෙ පිරිස්හි කියව'යි.

භවත් ගෞතමයන් වහන්ස, යම් තැනෙක භවත්හු වෙත්වයි භවතුන් බඳුහු වෙත්වයි හුන්නාහු ද, එහි මට බැරි නො වේ යයි.

එසේ වී නම් මාණවකය, කියව'යි.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට වාක්සත්‍යය පළමු වන කරුණ කොට පනවති. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට තපස දෙවන කරුණ කොට පනවති. භවත් ගෞතමයන් වහන්ස, පින් කරනුවට කුසල් සපයනුවට බ්‍රහ්මචර්‍ය්‍යය තුන් වන කරුණ කොට පනවති. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට වේද හැදෑරීම සතර වන කරුණ කොට පනවති. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට ත්‍යාගය පස් වන කරුණ කොට පනවති. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට මෙපස් දහමුන් පනවති. මෙහි ලා භවත් ගෞතමයන් වහන්සේ කුමක් වදරනසේක් ද? යි.

කිම මාණවකය, බමුණන් කෙරෙහි යමෙක් 'මම මෙපස්දහමුන් තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට විපාක ප්‍රකාශ කෙරෙමි'යි මෙසේ කියා නම් එ බඳු කිසි එක ද බමුණෙක් ඇද්ද? යි.

භවත් ගෞතමයන් වහන්ස, මේ නො වේ මැ යි.

කිම මාණවකය, බමුණන් කෙරෙහි යමෙක් 'මම මේ පස්දහමුන් තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට විපාක ප්‍රකාශ කෙරෙමි'යි මෙසේ කියා නම් එ බඳු කිසි එක ද ආචාර්‍ය්‍යයෙක් එක ද ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යයෙක් සත් වැනි ආචරියමහයුගය තෙක් ඇද්ද?යි.

භවත් ගෞතමයන් වහන්ස, මේ නො වේ මැ යි.

කිං පන මාණව, යෙපි තෙ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. තෙපි එවමාහංසු: මයං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමා’ති?

නො හිදං භො ගොතම.

ඉති කිර මාණව, නත්ථි කොචි බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යො එවමාහ: අහං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමීති. නත්ථි කොචි බ්‍රාහ්මණානං එකාචරියොපි එකාචරියපාචරියොපි යාවසත්තමා ආචරියමහයුගා, යො එවමාහ: ‘අහං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමී’ති. යෙපි තෙ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. තෙපි එවමාහංසු: මයං ඉමෙසං පඤ්චන්නං ධම්මානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා විපාකං පවෙදෙමා’ති.

නො හෙතං භො ගොතම.

සෙය්‍යථාපි මාණව, අන්ධවෙණිපරම්පරා සංසත්තා:?[1] පුරිමොපි න පස්සති, මජ්ඣමොපි න පස්සති, පච්ඡිමොපි න පස්සති. එවමෙව ඛො මාණව, අන්ධවෙණූපමං මඤ්ඤෙ බ්‍රාහ්මණානං භාසිතං සම්පජ්ජති· පුරිමොපි න පස්සති, මජ්ඣිමොපි න පස්සති, පච්ඡිමොපි න පස්සතීති.

එවං වුත්තෙ සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවතා අන්ධවෙණූපමෙන වුච්චමානො කුපිතො අනත්තමනො භගවන්තංයෙව ඛුංසෙන්තො භගවන්තංයෙව වම්භෙන්තො භගවන්තංයෙව වදමානො ‘සමණො ගොතමො පාපිතො භවිස්සතී’ති. භගවන්තං එතදවොච: බ්‍රාහ්මණො භො ගොතම, පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො එවමාහ: එවමෙව පනිමෙකෙ[2] සමණබ්‍රාහ්මණා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං පටිජානන්ති. තෙසමිදං භාසිතං හස්සකංයෙව සම්පජ්ජති, නාමකංයෙව සම්පජ්ජති, රිත්තකංයෙව සම්පජ්ජති, තුච්ඡකංයෙව සම්පජ්ජති. කථං හි නාම මනුස්සභූතො උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං ඤස්සති වා දක්ඛිති[3] වා සච්ඡි වා කරිස්සති. නෙතං ඨානං විජ්ජතී’ති.

---

1. සම්භත්තා - ස්‍යා.
2. පනිමෙකච්චෙ - මජ්සං
3. දක්ඛති - මජ්සං. දක්ඛිස්සති - සිමු.

කිම මාණවකය, බමුණන්ගේ මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍ර ප්‍රවක්තෘ වූ යම් ඒ පූර්ව ඍෂි කෙනෙක් ඇද්ද, මෙ කල්හි බමුණෝ යම් කෙනකුන් විසින් හදළ වාචනා කළ සංහිතා (පිඩු) කළ පැරැණි වේද සඞ්ඛ්‍යාත මන්ත්‍රපදය ඔවුන් අනුව ගයත් ද, ඔවුන් අනුව කියත් ද, කියූ සේ කියත් ද, වාචනා කළ සේ වාචනා කෙරෙත් ද, ඔහු කවරහ යත් : අට්ටක යැ වාමක යැ වාමදෙව යැ විශ්වාමිත්‍ර යැ යමදග්නි යැ අඞ්ගිරස් යැ භාරද්වාජ යැ වාසිෂ්ට යැ කාශ්‍යප යැ භෘගු යැ යන මොහු යි. ඔහු දු 'අපි මෙ පස්කරුණු තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට විපාක පවසම්හ'යි මෙසේ කීහු ද?

භවත් ගෞතමයන් වහන්ස, මෙ නො වේ මැ යි.

මාණවකය, මෙසෙයින් බමුණන් කෙරෙහි යමෙක් 'මම මෙ පස්දහම් තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට විපාක පවසම්'යි මෙසේ කියා නම් එ බඳු කිසි එක ද බමුණෙක් නැත් ල, බමුණන් කෙරෙහි 'මම මෙ පස්දහම් තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට විපාක පවසම්'යි මෙසේ කියා නම් එ බඳු කිසි එක ද ආචාර්යයෙක් එක ද ආචාර්යප්‍රාචාර්යයෙක් සත් වැනි ආචරියමහයුගය තෙක් නැත් ල, මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍රප්‍රවක්තෘ වූ බමුණන් ගේ යම් පූර්ව ඍෂි කෙනෙක් වූහු ද, මෙ කල්හි බමුණෝ යම් කෙනකුන් විසින් ගයනලද, කියනලද රැස් කරනලද පැරැණි මන්ත්‍රපද ඒ අනුව ගයත් ද, ඒ අනුව කියත් ද, කියනලද්ද අනුව කියත් ද වාචනා කරනලද්ද අනුව වාචනා කෙරෙද්ද, ඔහු කවරහ යත් : 'අට්ටක යැ වාමක යැ වාමදෙව යැ විශ්වාමිත්‍ර යැ යමදග්නි යැ අඞ්ගිරස් යැ භාරද්වාජ යැ වාසිෂ්ට යැ කාශ්‍යප යැ භෘගු යැ යන මොහු යි. ඔහු දු 'අපි මෙ පස්දහමුන්ගේ විපාක තමන් විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පවසම්හ'යි මෙසේ කීහු ද?

භවත් ගෞතමයන් වහන්ස, තෙල නො වේ මැ යි.

මාණවකය, යම්සේ සංසක්ත වූ අන්ධවේණියෙක් ඇද්ද එහි ප්‍රථමයාත් නො දකී ද මධ්‍යමයාත් නො දකී ද පශ්චිමයාත් නො දකී ද, එසෙයින් මැ මාණවකය, බමුණන්ගේ 'ප්‍රථමයාත් නො දකී, මධ්‍යමයාත් නො දකී, පශ්චිමයාත් නො දකී.' යන භාෂිතය 'අන්ධ-වේණූපමාව සපයතී' සිතමි.

මෙසේ වදළ කල්හි තෝදෙය්‍යපුත්‍ර සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේ විසින් අන්ධ-වේණූපමායෙන් කියනුලබන්නේ කිපියේ නො සතුටු වූයේ භාග්‍යවතුන් වහන්සේට මැ වුංසන කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේට මැ ගර්හා කෙරෙමින් ශ්‍රමණ ගෞතම නො දන්නා බවට පමුණුවන ලද්දේ වනැ'යි භාග්‍යවතුන් වහන්සේට මැ කියමින් භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ කී : 'භවත් ගෞතමයෙනි, උපමඤ්ඤ ගෝත්‍ර ඇති සුභගවනයට ඊශ්වර වූ පොක්ඛරසාති බ්‍රාහ්මණ මෙසේ කියයි : ''මෙසෙයින් මැ ඇතැම් මහණබමුණෝ මනුෂ්‍යධර්මයෙන් මත්තෙහි ආර්යභාවකරණයට සමර්ථ ඥානදර්ශනය පිළිත කෙරෙති. උන්ගේ මේ භාෂිතය හාස්‍යය මැ උපදවයි, ලාමක බව මැ උපදවයි, නිස්සාරභාවය මැ උපදවයි, සිස් බව මැ උපදවයි. කෙසේ නම් මනුෂ්‍ය වූයෙක් මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්යභාව කරණයට සමත් ඥානදර්ශනවිශේෂයක් දන්නේ හෝ දක්නේ හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේ හෝ වේ ද, තෙල කරුණ විද්‍යමාන නො වේ'යයි.

කිං පන මාණව, බ්‍රාහ්මණො පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො සබ්බෙසංයෙව සමණබ්‍රාහ්මණානං චෙතසා චෙතො පරිච්ච පජානාතී'ති?

සකායපි හි භො ගොතම, පුණ්ණිකාය දාසියා බ්‍රාහ්මණො පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො න චෙතසා චෙතො පරිච්ච පජානාති, කුතො පන සබ්බෙසංයෙව සමණබ්‍රාහ්මණානං චෙතසා චෙතො පරිච්ච පජානිස්සතී'ති.

සෙය්‍යථාපි මාණව, ජච්චන්ධො පුරිසො න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි, න පස්සෙය්‍ය නීලකානි රූපානි, න පස්සෙය්‍ය පීතකානි රූපානි, න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි, න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨකානි රූපානි, න පස්සෙය්‍ය සමවිසමං[1], න පස්සෙය්‍ය තාරකරූපානි, න පස්සෙය්‍ය චන්දිමසුරියෙ. සො එවං වදෙය්‍ය: නත්ථි කණ්හසුක්කානි රූපානි, නත්ථි කණ්හසුක්කානං රූපානං දස්සාවී, නත්ථි නීලකානි රූපානි, නත්ථි නීලකානං රූපානං දස්සාවී, නත්ථි පීතකානි රූපානි, නත්ථි පීතකානං රූපානං දස්සාවී, නත්ථි ලොහිතකානි රූපානි, නත්ථි ලොහිතකානං රූපානං දස්සාවී, නත්ථි මඤ්ජෙට්ඨිකානි රූපානි, නත්ථි මඤ්ජෙට්ඨිකානං රූපානං දස්සාවී, නත්ථි සම විසමං, නත්ථි සමවිසමස්ස දස්සාවී, නත්ථි තාරකරූපානි, නත්ථි තාරකරූපානං දස්සාවී, නත්ථි චන්දිමසුරියා, නත්ථි චන්දිමසුරියානං දස්සාවී, අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමි, තස්මා නත්ථීති. සම්මා නු ඛො සො මාණව, වදමානො වදෙය්‍යාති?

නො හිදං භො ගොතම, අත්ථි කණ්හසුක්කානි රූපානි, අත්ථි කණ්හසුක්කානං රූපානං දස්සාවී, අත්ථි නීලකානි රූපානි, අත්ථි නීලකානං රූපානං දස්සාවී, අත්ථි පීතකානි රූපානි, අත්ථි පීතකානං රූපානං දස්සාවී, අත්ථි ලොහිතකානි රූපානි, අත්ථි ලොහිතකානං රූපානං දස්සාවී. අත්ථි මඤ්ජෙට්ඨිකානි රූපානි, අත්ථි මඤ්ජෙට්ඨිකානං රූපානං දස්සාවී, අත්ථි සමවිසමං, අත්ථි සමවිසමස්ස දස්සාවී, අත්ථි තාරකරූපානි, අත්ථි තාරකරූපානං දස්සාවී, අත්ථි චන්දිමසුරියා[2], අත්ථි චන්දිමසුරියානං දස්සාවී, අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමි තස්මා නත්ථීති න හි සො භො ගොතම, සම්මා වදමානො වදෙය්‍යාති.

එවමෙව ඛො මාණව, බ්‍රාහ්මණො පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො අන්ධො අචක්ඛුකො. සො වත උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං ඤස්සති වා දක්ඛිති[3] වා සච්ඡි වා කරිස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

තං කිං මඤ්ඤසි මාණව, යෙ තෙ කොසලකා[4] බ්‍රාහ්මණමහාසාලා සෙය්‍යථීදං: 'චඞ්කී බ්‍රාහ්මණො තාරුක්ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති බ්‍රාහ්මණො ජානුස්සොණී බ්‍රාහ්මණො පිතා ච, තෙ තොදෙය්‍යො. කතමා නෙසං සෙය්‍යා'යං වා තෙ සම්මුච්චා[5] වාචං භාසෙය්‍යුං. යං වා අසම්මුච්චාති[6]

සම්මුච්චා භො ගොතම.

---

1. සමවිසමාති - ස්‍යා, PTS.
2. චන්දිමසුරියො - සිමු.
3. දක්ඛති - මජසං.
4. යෙ පන තෙ කොසලිකා - ස්‍යා.
5. සම්මුසා - සිමු, PTS, සම්මුච්ජා - ස්‍යා.
6. අසම්මුසාති - සිමු, PTS.

Free Distribution www.aathaapi.org

කිම මාණවකය, උපමඤ්ඤ ගොත් ඇති සුභගවනයට ඊශවර වූ පොක්ඛරසාති බමුණු හැම මහණබමුණන්ගේ මැ සිය සිතින් උන් සිත පිරිසිඳ දන්නේ වේ ද ? යි.

භවත් ගෞතමයන් වහන්ස, උපමඤ්ඤ ගෝත්‍ර ඇති සුභගවනාධිපති පොකබරසාති බමුණු සිය පුණ්ණිකා දස්සගේ වුව ද සිය සිතින් ඇය සිත පිරිසිඳ නො දන්නේ යැ. කොයින් නම් හැම මහණබමුණන්ගේ මැ සිත සිය සිතින් පිරිසිඳ දන්නේ වේ ද ? යි.

මාණවකය, යම් පරිදි ජාත්‍යන්ධ පුරුෂයෙක් කළුසුදු රූපායතන නො දක්නේ වේ ද, නිල්වන් රූපායතන නො දක්නේ වේ ද, පීත රූපායතන නො දක්නේ වේ ද, ලෙහෙවන් රූපායතන නො දක්නේ වේ ද, මදට වන් රූපායතන නො දක්නේ වේ ද, සමවිෂම ස්ථාන නො දක්නේ වේ ද, තාරකරූප නො දක්නේ වේ ද, සඳහිරු නො දක්නේ වේ ද, (එහෙත්) හේ මෙසේ බෙණේ ද : ''සුදුකළු රූපායතන නැත, සුදුකළු රූපායතන දක්නාසුල්ලෙක් නැත, නිල්වන් රූපායතන නැත, නිල්වන් රූපායතන දක්නා සුල්ලෙක් නැත, පීතවර්ණ රූපායතන නැත, පීතවර්ණ රූපායතන දක්නාසුල්ලෙක් නැත. ලෙහෙවන් රූපායතන නැත, ලෙහෙවන් රූපායතන දක්නාසුල්ලෙක් නැත. මදට වන් රූපායතන නැත, මදටවන් රූපායතන දක්නාසුල්ලෙක් නැත. සමවිෂම ස්ථාන නැත, සමවිෂමස්ථාන දක්නාසුල්ලෙක් නැත. තාරකරූප නැත, තාරකරූප දක්නාසුල්ලෙක් නැත. සඳහිරු නැත, සඳහිරු දක්නාසුල්ලෙක් නැත. 'මම තෙල නො දන්මී, මම තෙල නො දක්මී. එහෙයින් නැතැ'යි බෙණේ ද, මාණවකය, මෙසේ බණනා හෙතෙම මැනැවක් බණනේත් වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, මැනැවක් නො බණන්නේ මැ යැ. කෘෂ්ණශුක්ල රූපායතන ඇත, කෘෂ්ණශුක්ල රූපායතන දක්නෙක් ඇත. නීලරූපායතන ඇත, නීල රූපායතන දක්නෙක් ඇත. පීතරූපායතන ඇත. පීතරූපායතන දක්නෙක් ඇත. රක්තරූපායතන ඇත, රක්තරූපායතන දක්නෙක් ඇත. මාඤ්ජිෂ්ටරූපායතන ඇත, මාඤ්ජිෂ්ටරූපායතන දක්නෙක් ඇත. සමවිෂමඥාන ඇත, සමවිෂමඥාන දක්නෙක් ඇත. තාරකරූප ඇත, තාරකරූප දක්නෙක් ඇත. චන්ද්‍රසූර්‍ය්‍යයෝ ඇත, චන්ද්‍රසූර්‍ය්‍යයන් දක්නෙක් ඇත. භවත් ගෞතමයන් වහන්ස, මොනොවට බණන්නෙක් 'තෙල මම නො දන්මී, තෙල මම නො දක්මී, එහෙයින් නැතැ'යි නො කියන්නේ මැයි.

මාණවකය, එපරිදි මැ උපමඤ්ඤ ගොත්‍ර ඇති සුභගවනයට ස්වාමි වූ පොකබරසාති බමුණු අන්ධ යැ අවක්ඛුක යැ. හේ මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට සමර්ථඥානදර්ශනවිශෙෂයක් දන්නේ හෝ දක්නේ හෝ ප්‍රත්‍යක්‍ෂ කරන්නේ හෝ යැ යන තෙල කරුණ නො වන්නේ මැ යි.

මාණවකය, ඒ කෙසේ හඟිහී? යම් ඒ කොසොල්රට වැසි බමුණුමහසල්කුලෝ ඇද්ද, ඔහු කවරහ යත් : 'චඞ්කී බ්‍රාහ්මණ යැ, තාරුක්ඛ බ්‍රාහ්මණ යැ පොක්ඛරසාති බ්‍රාහ්මණ යැ තාගේ පිය වූ තොදෙය්‍ය බ්‍රාහ්මණ හෝ යි. ඔහු සම්මුතියෙන් (ලොකව්‍යවහාරයෙන්) යම් බසක් හෝ බෙණෙත් ද, අසම්මුතියෙන් යම් බසක් හෝ බෙණෙත් ද, උන්ගේ කවර බසෙක් ශ්‍රෙෂ්ඨ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, සම්මුතියෙන් බණනා බස යි.

කතමා තෙසං සෙය්‍යො, යං වා තෙ මන්තා වාචං භාසෙය්‍යුං. යං වා අමන්තාති?

මන්තා භො ගොතම.

කතමා තෙසං සෙය්‍යො, යං වා තෙ පටිසඞ්ඛාය වාචං භාසෙය්‍යුං යං වා අපටිසඞ්ඛායාති?

පටිසඞ්ඛාය භො ගොතම.

කතමා තෙසං සෙය්‍යො, යං වා තෙ අත්ථසංහිතං වාචං භාසෙය්‍යුං. යං වා අනත්ථසංහිතන්ති?

අත්ථසංහිතං භො ගොතම.

තං කිං මඤ්ඤසි මාණව, යදි එවං සන්තෙ බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා ඔපමඤ්ඤෙන සුභගවනිකෙන සම්මුච්චා වාචා භාසිතා, අසම්මුච්චා වාති?

අසම්මුච්චා භො ගොතම.

මන්තා වාචා භාසිතා, අමන්තා වාති?

අමන්තා භො ගොතම.

පටිසඞ්ඛාය වාචා භාසිතා, අපටිසඞ්ඛාය වාති?

අපටිසඞ්ඛාය භො ගොතම.

අත්ථසංහිතා වාචා භාසිතා, අනත්ථසංහිතා වාති?

අනත්ථසංහිතා භො ගොතම.

පඤ්ච ඛො ඉමෙ මාණව, නීවරණා. කතමෙ පඤ්ච: කාමච්ඡන්දනීවරණං බ්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං. ඉමෙ ඛො මාණව, පඤ්චනීවරණා. ඉමෙහි ඛො මාණව පඤ්චහි නීවරණෙහි බ්‍රාහ්මණො පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො ආවුතො[1] නිවුතො ඔවුතො[2] පරියොනද්ධො. සො වත උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං ඤස්සති වා දක්ඛිති වා සච්ඡි වා කරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

---

1. ආවටො - PTS.
2. ඔවුටො - මජ්සං, ස්‍යා.
   ඔවුතො - PTS.

ඔහු තුලනා කොට යම් බසක් හෝ බෙණෙත් ද, තුලනා නො කොට යම් බසක් හෝ බෙණෙත් ද, ඔවුන් ගේ කවර බසෙක් ශ්‍රේෂ්ඨ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, තුලනා කොට බණනා බස යි.

ඔහු නුවණින් දත යම් බසක් හෝ බෙණෙත් ද, නුවණින් නො දත යම් බසක් හෝ බෙණෙත් ද, ඔවුන් ගේ කවර බසෙක් ශ්‍රේෂ්ඨ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, නුවණින් දත බණනා බස යි.

ඔහු අර්ථසංහිත වූ යම් බසක් හෝ බෙණෙත් ද, අනර්ථසංහිත වූ යම් බසක් හෝ බෙණෙත් ද, ඔවුන් ගේ කවර බසෙක් ශ්‍රේෂ්ඨ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, අර්ථසංහිත කොට බණනා බස යි.

මාණවකය, ඒ කෙසේ හඟිහි? ඉදින් මෙසේ වත් මැ උපමඤ්ඤ ගෝත්‍රජ වූ සුභගවනයට අධිපති වූ පොක්ඛරසාති බමුණු විසින් සම්මුතියෙන් බස බැණිණි ද, අසම්මුතියෙන් හෝ බැණිණි ද? යි.

භවත් ගෞතමයන් වහන්ස, අසම්මුතියෙන් බස් බැණිණ.

තුලනා කොට බස් බැණිණි ද, තුලනා නො කොට හෝ බැණිණි ද ?යි.

භවත් ගෞතමයන් වහන්ස, තුලනා නො කොට බස් බැණිණ.

නුවණින් දත බස් බැණිණි ද, නුවණින් නො දත හෝ බැණිණි ද ?යි.

භවත් ගෞතමයන් වහන්ස, නුවණින් නො දත බස් බැණිණ.

අර්ථසංහිත වූ බස් බැණිණි ද, අනර්ථසංහිත වූ හෝ බස් බැණිණි ද ?යි.

භවත් ගෞතමයන් වහන්ස, අනර්ථසංහිත බස් බැණිණ.

මාණවකය, මේ පඤ්චනීවරණ කෙනෙක් ඇත. කවර පසෙක යත් : කාමච්ඡන්ද-නීවරණ යැ ව්‍යාපාද නීවරණ යැ ථිනමිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යි. මාණවකය, මේ පඤ්චනීවරණයෝ යි. මාණවකය, උපමඤ්ඤ ගෝත්‍රජ වූ සුභගවනෛශ්වර වූ පොක්ඛරසාති බ්‍රාහ්මණ මේ පඤ්චනීවරණයන් විසින් (ආවරණ වශයෙන්) වළඳනාලද්දේ යැ. අවුරන ලද්දේ යැ, වටාගන්නා ලද්දේ යැ, හාත්පස බඳනා ලද්දේ යැ. හේ මිනිස්දහමින් මතුයෙහි ආර්‍ය්‍යභාවකරණයට පොහොසත් ඥානදර්ශන විශෙෂය දන්නේ හෝ යැ දක්නේ හෝ යැ ප්‍රත්‍යක්‍ෂ කරන්නේ හෝ යැ යන තෙල කරුණ නො වන්නේ මැ යි.

පඤ්ච ඛො ඉමෙ මාණව, කාමගුණා, කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො මාණව, පඤ්ච කාමගුණා. ඉමෙහි ඛො මාණව, පඤ්චහි කාමගුණෙහි බ්‍රාහ්මණො පොක්ඛරසාති ඔපමඤ්ඤො සුභගවනිකො ගධිතො[1] මුච්ඡිතො අජ්ඣොපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. සො වත උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං ඤස්සති වා දක්ඛිති වා සච්ඡි වා කරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

තං කිං මඤ්ඤසි මාණව, යං වා තිණකට්ඨුපාදානං පටිච්ච අග්ගිං ජාලෙය්‍ය, යං වා නිස්සට්ඨතිණකට්ඨුපාදානං අග්ගිං ජාලෙය්‍ය, කතමො නු ඛ්වාස්ස අග්ගි අච්චිමා ච වණ්ණිමා ච පභස්සරො චාති?

සචෙ තං භො ගොතම, ඨානං නිස්සට්ඨතිණකට්ඨුපාදානං අග්ගිං ජාලෙතුං, ස්වාස්ස අග්ගි අච්චිමා ච වණ්ණිමා ච පභස්සරො චාති.

අට්ඨානං ඛො එතං මාණව, අනවකාසො, යං නිස්සට්ඨතිණකට්ඨුපාදානං අග්ගිං ජාලෙය්‍ය අඤ්ඤත්‍ර ඉද්ධිමතා. සෙය්‍යථාපි මාණව, තිණකට්ඨුපාදානං පටිච්ච අග්ගි ජලති, තථූපමාහං මාණව, ඉමං පීතිං වදාමි. යායං පීති පඤ්චකාමගුණෙ පටිච්ච. සෙය්‍යථාපි මාණව, නිස්සට්ඨතිණකට්ඨුපාදානං පටිච්ච අග්ගි ජලති. තථූපමාහං මාණව, ඉමං පීතිං වදාමි, යායං පීති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි.

කතමා ච මාණව, පීති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි: ඉධ මාණව, භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, අයම්පි ඛො මාණව, පීති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි. පුනචපරං මාණව, භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, අයම්පි ඛො මාණව, පීති අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහි.

යෙ තෙ මාණව, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. කතමෙත්ථ බ්‍රාහ්මණා ධම්මං මහප්ඵලතරං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනායාති?

යෙමෙ භො ගොතම, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය, චාගමෙත්ථ බ්‍රාහ්මණා ධම්මං මහප්ඵලතරං පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනායාති.

---

1. ගථිතො - ස්‍යා.

Free Distribution www.aathaapi.org

මාණවකය, මේ කාමගුණ පසෙකි. කවර පසෙක යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රාගොත්පත්ති කාරණ වූ චක්ෂුර්විඥෙය රූපායතනයෝ යැ ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයතනයෝ යැ . . . ඝ්‍රාණවිඥෙය ගන්ධායතනයෝ යැ . . . ජිහ්වාවිඥෙය රසායතනයෝ යැ. . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රාගොත්පත්තිකාරණ වූ කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යායතනයෝ යි. මාණවකය, මේ පඤ්ච කාමගුණයෝ යි. මාණවකය, උපමඤ්ඤ ගෝත්‍රජ වූ සුභගවනෙශ්වර වූ පොක්ඛරසාති බමුණු මෙසේ මේ පඤ්චකාමගුණයන් විසින් ග්‍රථිත වැ මූර්ඡිත වැ ගැලගත්තාලදු වැ ආදීනව නො දක්නාසුලු වැ නිස්සරණප්‍රඥ රහිත වැ වළඳ කෙරෙයි. හේ මිනිස්දහමින් මතුයෙහි ආයර්‍යභාවකරණයට පොහොසත් ඥානදර්‍ශනවිශේෂයක් දන්නේ හෝ දක්නේ හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේ හෝ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වේ මැ යි.

මාණවකය, ඒ කෙසේ හඟිහි? තෘණකාෂ්ට සඞ්ඛ්‍යාත දර නිසා යම් ගින්නක් හෝ දල්වන්නේ වේ ද, පහ කළ තෘණකාෂ්ට සඞ්ඛ්‍යාත දර ඇති යම් ගින්නක් හෝ දල්වන්නේ වේ ද, එහි කවර නම් ගින්නෙක් ජ්වාල ඇතියේත් වර්‍ණ ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, ඉදින් හළ තෘණකාෂ්ට සඞ්ඛ්‍යාත දර ඇති ගින්නක් දල්වන්නට ඒ තැනෙක් ඇද්ද, එ ගිනි ජ්වාල ඇතියේත් වර්‍ණ ඇතියේත් ප්‍රභාස්වර වූයේත් වෙයි.

මාණවකය, යම් හෙයෙකින් ඍද්ධිමතකු විනා (අනෙකෙක්) හළ තෘණකාෂ්ට සඞ්ඛ්‍යාත දර ඇති ගින්නක් දල්වන්නේ යැ යන තෙල කරුණ නො වනසුලු යැ වන්නට අවකාශ ද නැත. මාණවකය, යම් පරිදි තෘණකාෂ්ඨොපාදන නිසා ගිනි දල්වා ද, මාණවකය පස්කම් ගුණ නිසා උපන් යම් ඒ ප්‍රීතියෙක් ඇද්ද, මම මේ ප්‍රීතිය එ බඳු යැ යි වදරමි. මාණවකය, යම් පරිදි හළ තෘණකාෂ්ඨොපාදන නිසා ගින්නක් දල්වා ද, මාණවකය, පස්කම්ගුණ පියා අකුසල්දහම් පියා නිපන් යම් ඒ ප්‍රීතියෙක් ඇත් නම් මම මේ ප්‍රීතිය එ බඳු යැ යි කියමි.

මාණවකය, කාමයෙන් වෙන් වූ අකුසල්දහමින් වෙන් වූ ප්‍රීතිය කවර යත් : මාණවකය, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ. . . . ප්‍රථමධ්‍යානය උපදවාගෙන වාස කෙරෙයි. මාණවකය, මෙ ද කාමයෙන් වෙන් වූ මැ අකුසල්දහමින් වෙන් වූ මැ ප්‍රීතියෙක. තවද මාණවකය, මහණ තෙම විතර්කවිචාරයන් සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානය උපදවා ගෙන වාස කෙරෙයි. මාණවකය, මෙ ද කාමයෙන් වෙන් වූ මැ අකුසල්දහමින් වෙන් වූ මැ ප්‍රීතියෙකි.

මාණවකය, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් සැපයීමට යම් ඒ පඤ්චධර්මයක් පනවත් ද, බ්‍රාහ්මණයෝ මෙහි පුණ්‍යක්‍රියාවට කුශලසම්පාදනයට කවර දහමක් ඉතා මහත්ඵල කොට පනවත් ද ?යි.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පුණ්‍යක්‍රියාවට කුශලපරිපූරණයට යම් පඤ්චධර්මයක් පනවත් ද, බ්‍රාහ්මණයෝ මෙහි පුණ්‍යක්‍රියාවට කුසලසම්පාදනයට ත්‍යාගධර්ම ඉතා මහත්ඵල කොට පනවති'යි.

තං කිං මඤ්ඤසි මාණව, ඉධඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤො පච්චුපට්ඨිතො අස්ස. අථ ද්වෙ බ්‍රාහ්මණා ආගච්ඡෙය්‍යුං: 'ඉත්ථන්නාමස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤං අනුභවිස්සාමා'ති. තත්‍රෙකස්ස බ්‍රාහ්මණස්ස එවමස්ස: 'අහො වත අහමෙව ලභෙය්‍යං භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං, නාඤ්ඤො බ්‍රාහ්මණො ලභෙය්‍ය[1] භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩන්ති. ඨානං ඛො පනෙතං මාණව, විජ්ජති: 'යං අඤ්ඤො බ්‍රාහ්මණො ලභෙය්‍ය භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං, න සො බ්‍රාහ්මණො ලභෙය්‍ය භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. අඤ්ඤො බ්‍රාහ්මණො ලභති භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං, නාහං ලභාමි භත්තග්ගෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩ'න්ති, ඉති සො කුපිතො හොති අනත්තමනො. ඉමස්ස පන මාණව, බ්‍රාහ්මණා කිං විපාකං පඤ්ඤපෙන්ති'ති?

න ඛොපන[2] භො ගොතම, බ්‍රාහ්මණා එවං දානං දෙන්ති: 'ඉමිනා පරො කුපිතො හොතු අනත්තමනො'ති අථ ඛොවන බ්‍රාහ්මණා අනුකම්පාජාතිකංයෙව දානං දෙන්ති'ති.

එවං සන්තෙ ඛො මාණව, බ්‍රාහ්මණානං ඉදං ඡට්ඨං පුඤ්ඤකිරියාවත්ථු හොති යදිදං අනුකම්පාජාතිකන්ති.

එවං සන්තෙ භො ගොතම, බ්‍රාහ්මණානං ඉදං ඡට්ඨං පුඤ්ඤකිරියාවත්ථු හොති යදිදං අනුකම්පාජාතිකන්ති.

යෙ තෙ මාණව, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. ඉමෙ ත්වං පඤ්ච ධම්මෙ කත්ථ බහුලං සමනුපස්සසි[3] ගහට්ඨෙසු වා පබ්බජිතෙසුවා'ති?

යෙමෙ භො ගොතම, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය, ඉමාහං පඤ්ච ධම්මෙ පබ්බජිතෙසු බහුලං සමනුපස්සාමි අප්පං ගහට්ඨෙසු. ගහට්ඨො හි භො ගොතම, මහට්ඨො මහාකිච්චො මහාධිකරණො මහාසමාරම්භො, න සතතං සමිතං සච්චවාදී හොති. පබ්බජිතො ඛො පන භො ගොතම, අප්පට්ඨො අප්පකිච්චො අප්පාධිකරණො අප්පසමාරම්භො, සතතං සමිතං සච්චවාදී හොති. ගහට්ඨො හි භො ගොතම, මහට්ඨො මහාකිච්චො මහාධිකරණො මහාසමාරම්භො, න සතතං සමිතං තපස්සී හොති. බ්‍රහ්මචාරී හොති. සජ්ඣාය බහුලො හොති. චාගබහුලො හොති. පබ්බජිතො ඛො පන භො ගොතම, අප්පට්ඨො අප්පකිච්චො අප්පාධිකරණො අප්පසමාරම්භො, සතතං සමිතං තපස්සී හොති-පෙ-බ්‍රහ්මචාරී හොති-පෙ-සජ්ඣායබහුලො හොති -පෙ- චාග බහුලො හොති. යෙමෙ භො ගොතම, බ්‍රාහ්මණා[4] පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති. පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. ඉමාහං පඤ්ච ධම්මෙ පබ්බජිතෙසු බහුලං සමනුපස්සාමි, අප්පං ගහට්ඨෙසූති.

---

1. න අඤ්ඤෙ බ්‍රාහ්මණා ලභෙය්‍යුං - සමු.
2. නඛොවන - මජසං, සමු, PTS.
3. සමනුපස්සති - සීමු.
4. සමණබ්‍රාහ්මණා - PTS.

Free Distribution www.aathaapi.org

මාණවකය, ඒ කෙසේ හඟිහි? මෙලොවැ එක්තරා බමුණෙක්හට මහායාගයෙක් එළැඹ සිටියේ වෙයි. එසඳ බමුණෝ දෙදෙනෙක් එති : ''මෙ නම් බමුණුගේ මහායාග වළඳ කරම්හ''යි. ඔවුන් කෙරෙහි එක් බමුණෙක්හට මෙවන් සිතෙක් වෙයි : ''මම මැ භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ ලබම් නම් මනා මැ යැ. අන් බමුණා භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ නො ලබා නම් මනා මැ නූ''යි. මාණවකය, යම් හෙයෙකින් අන්‍ය බ්‍රාහ්මණයා භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ ලබා ද ඒ බමුණා භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ නො ලබා ද, තෙල කරුණ වෙයි. අන්‍ය බ්‍රාහ්මණයා භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ ලබයි. 'මම භක්තග්‍රයෙහි අග්‍රාසන අග්‍රෝදක අග්‍රපිණ්ඩ නො ලබමි'යි මෙසේ හේ කිපියේ නො සතුටු සිත් ඇතියේ වෙයි. මාණවකය, මොහුට බමුණෝ කිනම් විපාකයක් පනවත් ද?

භවත් ගෞතමයන් වහන්ස, මෙහි බමුණෝ මෙසේ දන් නො දෙත්. (කෙසේ යැ?) මේ දනින් අනෙකා කුපිත වේවා, නො සතුටු සිතැති වේවා, කියා යි. වැළි මෙහි දී බමුණෝ අනුකම්පාජාතික වූ මැ දනක් දෙත්.

මාණවකය, මෙසේ වත් මැ යම් අනුකම්පාසවභාවයෙක් ඇද්ද? බමුණන්ගේ මේ සවන පුණ්‍ය ක්‍රියාවස්තු වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, එසේ වත් මැ යම් අනුකමපා සවභාවයෙක් ඇද්ද, බමුණන්ගේ මේ සවන පුණ්‍යක්‍රියාවස්තු වෙයි.

මාණවකය, බ්‍රාහ්මණයෝ පුණ්‍යක්‍රියාව පිණිස කුශලයාගේ ආරාධනා පිණිස යම් පඤ්චධර්ම කෙනකුන් පනවත් ද, තෝ මේ පඤ්චධර්මයන් කවුරුන් කෙරෙහි බහුල කොට නුවණින් දක්හි? ගිහියන් කෙරෙහි දක්හි හෝ? පැවිද්දන් කෙරෙහි දක්හි හෝ? යි.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ පුණ්‍යක්‍රියා පිණිස කුශලසම්පාදනය පිණිස යම් පඤ්චධර්ම කෙනකුන් පනවත් ද, මම මේ පස්දහම් පැවිද්දන් කෙරෙහි බහුල වැ දක්මි, ගිහියන් කෙරෙහි අල්ප වැ දක්මි. භවත් ගෞතමයන් වහන්ස, ගෘහස්ථ තෙමේ මහාර්ථ මහාකෘත්‍ය මහාධිකරණ මහාසමාරම්භ ඇත්තේ මැ යැ, නිරතුරු එක්වන් සත්‍යවාදී නො වෙයි. එතෙකුදු වත් භවත් ගෞතමයන් වහන්ස, ප්‍රව්‍රජිත තෙමේ අල්පාර්ථ අල්පකෘත්‍ය අල්පාධිකරණ අල්පසමාරම්භ ඇත්තේ යැ. නිරතුරු එක්වන් සත්‍යවාදී වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ගැහැවි තෙම මහාර්ථ මහාකෘත්‍ය මහාධිකරණ මහාසමාරම්භ ඇත්තේ මැ යැ. නිරතුරු එක්වන් තපස්වී නො වෙයි, බ්‍රහ්මචාරී නො වෙයි, සවාධ්‍යාය (හැදෑරීම්) බහුල නො වෙයි. ත්‍යාග බහුල නො වෙයි. එතෙකුදු වත් භවත් ගෞතමයන් වහන්ස, පැවිදි තෙම අල්පාර්ථ අල්පකෘත්‍ය අල්පාධිකරණ අල්පසමාරම්භ ඇත්තේ යැ. නිරතුරු එක්වන් තපස්වී වෙයි. බ්‍රහ්මචාරී වෙයි, සවාධ්‍යායබහුල වෙයි, ත්‍යාගබහුල වෙයි. එහෙයිනි. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ පින් කිරීමට කුසල් සැපැයීමට යම් පඤ්චධර්ම කෙනකුන් පනවත් ද, මම මෙ පස් දහමුන් පැවිද්දන් කෙරෙහි බහුල වැ දක්මි, ගැහැවියන් කෙරෙහි අල්ප වැ දක්මි.

යෙ තෙ මාණව, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. චිත්තස්සාහං එතෙපරික්ඛාරෙ වදාමි. යදිදං චිත්තං අවෙරං අබ්‍යාපජ්ඣං තස්ස භාවනාය.

ඉධ මාණව, භික්ඛු සච්චවාදී හොති. සො සච්චවාදීම්හීති[1] ලභති අත්ථවෙදං ලභති, ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං[2] යත්තං කුසලූපසංහිතං පාමුජ්ජං, චිත්තස්සාහං එතං පරික්ඛාරං වදාමි. යදිදං චිත්තං අවෙරං අබ්‍යාපජ්ඣං තස්ස භාවනාය.

ඉධ මාණව, භික්ඛු තපස්සී හොති -පෙ- බ්‍රහ්මචාරී හොති -පෙ- සජ්ඣායබහුලො හොති -පෙ- චාගබහුලො හොති. සො චාගබහුලොම්හීති ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං, යත්තං කුසලූපසංහිතං පාමුජ්ජං, චිත්තස්සාහං එතං පරික්ඛාරං වදාමි යදිදං චිත්තං අවෙරං අබ්‍යාපජ්ඣං තස්ස භාවනාය.

යෙ තෙ මාණව, බ්‍රාහ්මණා පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. චිත්තස්සා'හං එතෙ පරික්ඛාරෙ වදාමි යදිදං චිත්තං අවෙරං අබ්‍යාපජ්ඣං තස්ස භාවනායාති.

එවං වුත්තෙ සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච: සුතං මෙතං භො ගොතම, සමණො ගොතමො බ්‍රහ්මානං සහබ්‍යතාය මග්ගං ජානාතීති.[3]

තං කිං මඤ්ඤසි මාණව, ආසන්නෙ ඉතො නළකාරගාමො, නයිතො දූරෙ නළකාරගාමොති?

එවං භො, ආසන්නෙ ඉතො නළකාරගාමො, නයිතො දූරෙ නළකාරගාමොති.

තං කිං මඤ්ඤසි මාණව, ඉධස්ස[4] පුරිසො නළකාරගාමෙ ජාතවද්ධො[5] තමෙනං නළකාරගාමතො තාවදෙව අවසටං[6] නළකාරගාමස්ස මග්ගං පුච්ඡෙය්‍යුං. සියා නු ඛො මාණව, තස්ස පුරිසස්ස නළකාරගාමෙ ජාතවද්ධස්ස නළකාරගාමස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වාති?

නො හිදං භො ගොතම, තං කිස්ස හෙතු: අමු හි භො ගොතම, පුරිසො නළකාරගාමෙ ජාතවද්ධො තස්ස සබ්බානෙව නළකාරගාමස්ස මග්ගානි සුවිදිතානී'ති.

---

1 සච්චවාදිම්හීති - සිමු, සත්‍යා.
2. පාමොජ්ජං - මජසං.
3. පජානාතීති - සත්‍යා.
4. ඉධබ්බස්ස - සත්‍යා.
5. ජාතසංවද්ධො - සත්‍යා.
6. අපසත්තං - සත්‍යා.

මාණවකය, යම් බ්‍රාහ්මණ කෙනෙක් පුණ්‍යක්‍රියා පිණිස කුශලාරාධනය පිණිස පඤ්චධර්ම කෙනකුන් පනවත් ද, මම තෙල ධර්මයන් මෛත්‍රීචිත්තයාගේ පරිෂ්කාර කොට කියමි. අවෛර අව්‍යාපාද සිතෙක් වේ ද, ඒ මෛත්‍රීචිත්තයාගේ භාවනා පිණිස යි.

මාණවකය, මෙ සස්නෙහි මහණ සත්‍යවාදී වෙයි, හේ 'සත්‍යවාදීයෙමි'යි අර්ථවේදය ලබයි, ධර්මවේදය ලබයි, කුශලොපසංහිත ප්‍රමොදයෙක් ඇද්ද, ඒ කුශලධර්මොපසංහිත ප්‍රමෝදය ලබයි. මම තෙල සත්‍යවාදී බව චිත්තයාගේ පරිෂ්කාර කොට කියමි. අවෛර අව්‍යාපාද සිතෙක් ඇද්ද, ඒ මෛත්‍රීචිත්තයාගේ භාවනා පිණිසයි.

මානවකය, මෙ සස්නෙහි මහණ තපස්වී වෙයි..... බ්‍රහ්මචාරී වෙයි..... ස්වාධ්‍යාය බහුල වෙයි....ත්‍යාග බහුල වෙයි. හේ 'ත්‍යාග බහුල වෙමි' යි අර්ථවෙදය ලබයි, ධර්මවෙදය ලබයි, කුශලොපසංහිත ප්‍රමෝදයෙක් ඇද්ද, ඒ කුශලධර්මෝපසංහිත ප්‍රමෝදය ලබයි. මම තෙල ත්‍යාග බහුලබව චිත්තයාගේ පරිෂ්කාර කොට කියමි. අවෛර අව්‍යාපාද සිතෙක් ඇද්ද, ඒ මෛත්‍රීචිත්තයාගේ භාවනා පිණිසයි.

මාණවකය, යම් බමුණු කෙනෙක් පුණ්‍යක්‍රියා පිණිස, කුශලාරාධන පිණිස පඤ්චධර්ම කෙනකුන් පනවත් ද, මම තෙල දහමුන් චිත්තයාගේ පරිෂ්කාර කොට කියමි. අවෛර අව්‍යාපාද සිතෙක් වේ ද, ඒ මෛත්‍රීචිත්තයාගේ භාවනා පිණිස යි.

මෙසේ වදළ කල්හි තොදෙය්‍ය බමුණුපුත් සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ; "භවත් ගෞතමයන් වහන්ස, මා විසින් තෙල කරුණ අසනලදී: "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහමයන්ගේ සහභාවය පිණිස මාර්ගය දනිති" යනුයි.

මාණවකය, එය කෙසේ හඟිහි? මෙයින් අසල නළකාර ගමෙක් වේ ද, මෙයින් දුරෙහි ඒ නළකාරගම නො වන්නේ වේ ද?

භවත්නි, එසේ යැ. මෙයින් නුදුරෙහි නළකාරගම ඇත. මෙයින් දුරෙහි නළකාරගම නො වන්නේ වෙයි.

මාණවකය, ඒ කෙසේ හඟිහි? මෙහි යම් පුරුෂයෙක් නළකාරගමෙහි ඉපදී වැඩුණේ වේ ද, නළකාරගමින් එකෙණෙහි බැසගිය තුලුන් අතින් නළකාරගම පිළිබඳ මඟ පුළුවුස්නාහු යැ, මාණවකය, නළකාරගමෙහි ඉපදී වැඩුණු, නළකාරගම පිළිබඳ මඟ පුළුවුස්නාලද ඒ පුරුෂයාහට (සැක විසින්) ලැඝි බවක් හෝ සිරුරු තද වන බවක් හෝ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, මෙ නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : භවත් ගෞතමයන් වහන්ස, තෙල පුරුෂයා නළකාරගමෙහි ඉපදී වැඩිණ. ඔහු විසින් නළකාරගම පිළිබඳ සියලු මාර්ගයෝ සුවිදිත වෙති.

සියා නු ඛො මාණව, තස්ස පුරිසස්ස නළකාරගාමෙ ජාතවද්ධස්ස නළකාරගාමස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා, න ත්වෙව තථාගතස්ස බ්‍රහ්මලොකං වා බ්‍රහ්මලොකගාමිනිං වා පටිපදං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා. බ්‍රහ්මානං චාහං මාණව, පජානාමි, බ්‍රහ්මලොකඤ්ච බ්‍රහ්මලොකගාමිනිඤ්ච පටිපදං. යථා පටිපන්නො ච බ්‍රහ්මා බ්‍රහ්මලොකං උපපන්නො, තඤ්ච පජානාමී'ති.

'සුතං මෙතං භො ගොතම, සමණො ගොතමො බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගං දෙසෙතී'ති. සාධු මෙ භවං ගොතමො බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගං දෙසෙතූ'ති.

තෙන හි මාණව, සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති.

එවං භොති ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි.

භගවා එතදවොච: 'කතමො ච මාණව, බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො: ඉධ මාණව, භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. එවං භාවිතාය ඛො මාණව, මෙත්තාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති. න තං තත්‍රාවතිට්ඨති

සෙය්‍යථාපි මාණව, බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසා[2] විඤ්ඤාපෙය්‍ය. එවමෙව ඛො මාණව, එවං භාවිතාය මෙත්තාය චෙතොවිමුත්තියා, යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති. න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො මාණව, බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

පුනචපරං මාණව, භික්ඛු කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. එවං භාවිතාය ඛො මාණව, උපෙක්ඛාය චෙතොවිමුත්තියා යංපමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. සෙය්‍යථාපි මාණව, බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසා විඤ්ඤාපෙය්‍ය. එවමෙව ඛො මාණව, එවං භාවිතාය උපෙක්ඛාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො මාණව, බ්‍රාහ්මානං සහව්‍යතාය මග්ගොති.

1. සබ්බත්ථතාය - සීමු, ස්‍යා. 2. චාතුද්දිසා - ස්‍යා.

මාණවකය, නළකාරගමහි ඉපදී වැඩුණු, නළකාරගම පිළිබඳ මඟ පුළුවුස්නා ලද ඒ පුරුෂයාහට දන්ධබවක් හෝ සිරුරු තද වන බවක් හෝ විය හෙතුදු බඹලොව හෝ බඹලොව යන පිළිවෙත හෝ පුළුවුස්නාලද තථාගතයන්හට දන්ධ බවෙක් හෝ සිරුරු තද වන බවෙක් හෝ නො වේ මැ යැ. මාණවකය, මම බ්‍රහ්මයන් පිළිබඳ බඹලොව ද බඹලොව යන පිළිවෙත ද දනිමි. යම් පරිදි යම් පිළිවෙතක පිළිපන් බඹ බඹලොවට පැමිණි ද එ ද දනිමි''යි වදළහ.

භවත් ගෞතමයන් වහන්ස, මා විසින් තෙල කරුණ අසන ලදී : ''මහණ ගොයුම්හු බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මාර්ගය දෙසති'' යනු යි. භවත් ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මට මාර්ගය දෙසන සේක්වා'යි යදිමි.

'මාණවකය, එසේ වී නම් අසව. මොනොවට මෙනෙහි කරව. කියමි'යි.

'භවත්නි, එසේ යැ'යි තොදෙයා බමුණුපුත් සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දින.

බුදුහු මෙසේ වදළහ : ''මාණවකය, බ්‍රහ්මයන් හා සහවාසයට මාර්ගය කවරෙ යත් : මාණවකය, මෙ සස්නෙහි මහණ මෙත් සහගිය සිතින් එක් දෙසක් අරමුණු කොට වෙසෙයි. දෙ වන දිග ද එසේ යැ තුන්වන දිග ද එසේ යැ සතර වන දිග ද එසේ යි. මෙසෙයින් උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් සියලු සතුන් ඇති ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ මෛත්‍රීසහගත සිතින් අරමුණු කොට වාස කෙරෙයි. මාණවකය, මෙසේ මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලද කල්හි ප්‍රමාණකෘත (කාමාවචර වූ) යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය එහි (රූපාවචරකර්මයෙහි) ශේෂ නො වෙයි. එය එහි බැසගෙන නො සිටී.

මාණවකය, යම්සේ බලවත් සක් පුඹුනා පුරුෂයෙක් නිදුකින් මැ සතරදිග (ස්වරයෙන්) හඟවන්නේ ද, එසෙයින් මැ මාණවකය, මෙසේ මෛත්‍රීචිත්තවිමුක්තිය වැඩූ කල්හි යම් කාමාවචර කර්මයෙක් ඇද්ද, එය එහි ශේෂ නො වෙයි. එය එහි බැසගෙන නො සිටී. මාණවකය, මෙ ද බ්‍රහ්මයන් හා සහවාසයට මඟෙකි.

තවද මාණවකය, මහණ කරුණාසහගත සිතින් මුදිතාසහගත සිතින් උපෙක්ෂා සහගත සිතින් එක් දිගක් අරමුණු කොට වාස කෙරෙයි. දෙ වන දිග ද එසේ යැ තුන් වන දිග ද එසේ යැ, සතර වන දිග ද එසේ යැ. මෙසෙයින් උඩ යට සරස හැම තන්හි සර්වාත්මතායෙන් සියලු සතුන් ඇති ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ උපෙක්ෂා සහගත සිතින් අරමුණු කොට වාස කෙරෙයි. මාණවකය, මෙසේ උපෙක්ෂාචිත්ත විමුක්තිය වැඩූ කල්හි යම් කාමාවචරකර්මයෙක් ඇද්ද,එය එහි ශේෂ නො වෙයි. එය එහි බැසගෙන නො සිටී. මාණවකය, යම්සේ ශක්ති ඇති සක් පුඹුනා පුරුෂයෙක් නිදුකින් මැ සතරදිග (ස්වරයෙන්) හඟවා ද ,මාණවකය, එපරිදි මැ මෙසේ උපෙක්ෂාචිත්තවිමුක්තිය වැඩූ කල්හි යම් කාමාවචරකර්මයෙක් ඇද්ද, එය එහි ශේෂ නො වෙයි. එය එහි බැසගෙන නො සිටී. මාණවකය, මෙ ද බ්‍රහ්මයන් හා සහවාසයට මාර්ගයෙකි'යි.

එවං වුත්තෙ සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය. මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති[1]. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. හන්ද චදානි මයං භො ගොතම, ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති.

යස්සදානි ත්වං මාණව, කාලං මඤ්ඤසීති.

අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

තෙන ඛො පන සමයෙන ජාණුස්සොණි බ්‍රාහ්මණො සබ්බසෙතෙන වළභීරථෙන[2] සාවත්ථියා නිය්‍යාති දිවාදිවස්ස. අද්දසා ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො සුභං මාණවං තොදෙය්‍යපුත්තං එතදවොච: 'හන්ද කුතො නු භවං භාරද්වාජො ආගච්ඡති දිවාදිවස්සාති?

ඉතො හි ඛො භො, අහං ආගච්ඡාමි සමණස්ස ගොතමස්ස සන්තිකාති.

තං කිං මඤ්ඤසි භවං භාරද්වාජො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං පණ්ඩිතො මඤ්ඤෙති?

කො චාහං භො, කො ච සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමි. සොපි නූනස්ස තාදිසොව, යො සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානෙය්‍යාති.

උළාරාය ඛලු භවං භාරද්වාජො සමණං ගොතමං පසංසාය පසංසතීති.

කො චාහං භො, කො ච සමණං ගොතමං පසංසිස්සාමි. පසත්ථපසත්ථො ච සො භවං ගොතමො, සෙට්ඨො දෙවමනුස්සානං, යෙ චිමෙ භො බ්‍රාහ්මණ, පඤ්ච ධම්මෙ පඤ්ඤපෙන්ති පුඤ්ඤස්ස කිරියාය කුසලස්ස ආරාධනාය. චිත්තස්ස තෙ සමණො ගොතමො පරික්ඛාරෙ වදෙති, යදිදං චිත්තං අවෙරං අබ්‍යාපජ්ඣං තස්ස භාවනායාති.

1. දක්ඛන්තීති - සයා.
2. වළවාභිරථෙන - මජ්සං, PTS.

Free Distribution www.aathaapi.org

මෙසේ වදාළ කල්හි තොදෙය්‍යා බමුණුපුත් සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : ''භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යැ, භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිහුරු කළ දයක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් දයක් හෝ විවර කරන්නේ ද, මුළාවූවකුට හෝ මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තාහු රූප දකිත්ව'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද, එසෙයින් මැ භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද. මෙසේ මම් භවත් ගෞතමයන් වහන්සේ ධර්මය හා භික්ෂුසඞ්ඝයා හා සරණ කොටයෙමි. භවත් ගොයුම්ගොතුවෝ මා අද පටන් දිවිහිම් වැ සරණගිය උපාසකයකු කොට ධරත්වා භවත් ගෞතමයන් වහන්ස, දැන් අපි යම්හ. ඇපි බොහෝ කටයුතු බොහෝ කරණී ඇතියම්හ''යි.

'මාණවකය, තෙපි දැන් ඊට කල් දනුව'යි.

එසඳ තොදෙය්‍යාපුත්‍ර සුභ මාණවක, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කොට අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට බැහැගියේ.

තවද එසමයෙහි ජාණුස්සොණි බ්‍රාහ්මණ සර්වශ්වෙත වළවාරථයෙන් දෙවෙන්දවහල්හි සැවැත්නුවරින් නික්මෙයි. ජාණුස්සොණි බ්‍රාහ්මණ තොදෙය්‍යාපුත්‍ර සුභමාණවකයා දුරින් මැ එන්නා දිට. දැක තොදෙය්‍යාපුත්‍ර සුභ මාණවකහට මෙසේ කී : ''භවත් භාරද්වාජ දෙවෙන් දවහල්හි කොහි සිට එයි'ද? යි.

භවත්නි, මම මෙහි ශ්‍රමණගෞතමයන් වෙතින් එමි'යි.

ඒ කෙසේ හඟිහි? භවත් භාරද්වාජ තෙමේ ශ්‍රමණ ගෞතමයන් ගේ ප්‍රඥව්‍යක්තභාවය හඟනේ ද, පණ්ඩිතයෙකැ'යි හඟනේ ද?

භවත්නි, මම කවරෙකිම් ද? කෙසේ නම් ශ්‍රමණ ගෞතමයන් ගේ ප්‍රඥව්‍යක්තභාවය දනිම් ද? යමෙක් ශ්‍රමණ ගෞතමයන් ගේ ප්‍රඥව්‍යක්තභාවය දන්නේ ද, හේ එකැතින් ශ්‍රමණ භවත් ගෞතමයන් වැනි මැ වෙයි.

භවත් භාරද්වාජ තෙමේ ශ්‍රමණ ගෞතමයන් උදර ප්‍රශංසායෙන් පසස්නේ මැ යැ

භවත්නි, මම කවරෙකිම් ද, කිනම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයන් පසස්නෙම් ද? ඒ භවත් ගෞතමයෝ ප්‍රශස්තගුණයෙන් මැ ප්‍රශස්තයහ. දෙව්මිනිස්නට ශ්‍රේෂ්ඨයහ. භවත්නි බ්‍රාහ්මණයෝ පුණ්‍යක්‍රියා පිණිස කුශලාරාධනය පිණිස යම් පස්ව ධර්ම කෙනකුන් පනවත් ද, ශ්‍රමණ ගෞතමයෝ ඒ පස්ව ධර්මයන් අවෛර අව්‍යාපාද යම් සිතෙක් ඇද්ද, ඒ මෛත්‍රීචිත්තයා ගේ භාවනා පිණිස චිත්තපරිෂ්කාර කොට වදරන සේක.

එවං වුත්තෙ ජාණුස්සොණි බ්‍රාහ්මණො සබ්බසෙතා වළභීරථා[1]. ඔරොහිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා උදානං උදානෙසි. ලාභා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස සුලද්ධලාභා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස, යස්ස විජිතෙ තථාගතො විහරති අරහං සම්මාසම්බුද්ධො'ති.

සුභසුත්තං නවමං.

---

1. වළවාභිරථා - මජසං, PTS.

මෙසේ කී කල ජාණුස්සෝණි බමුණු සව්සුදු වළභිරථයෙන් බැස උත්තරාසඞ්ගය එකස් කොට බහා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ උදන් ඇනී : "යම් රජක්හුගේ විජිතයෙහි අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගතයන් වහන්සේ වැඩවසනසේක් ද, ඒ පසේනදි කොසොල්රජහට ලාභයෙක. කල්‍යාණ ලාභයෙකැ"යි.

නව වැනි සුභසූත්‍ර යි.

2. 5. 10

සඞ්ගාරවසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං තෙන ඛො පන සමයෙන ධනඤ්ජානී[1] නාම බ්‍රාහ්මණී මණ්ඩලකප්පෙ[2] පටිවසති අභිප්පසන්නා බුද්ධෙ ච ධම්මෙ ච සඞ්ඝෙ ච අථ ඛො ධනඤ්ජානී බ්‍රාහ්මණී උපක්ඛලිත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: 'නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්සා'ති.

තෙන ඛො පන සමයෙන සඞ්ගාරවො[3] නාම මාණවො මණ්ඩලකප්පෙ පටිවසති තිණ්ණං වෙදානං පරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අස්සොසි ඛො සඞ්ගාරවො මාණවො ධනඤ්ජානියා බ්‍රාහ්මණියා එවං වාචං භාසමානාය, සුත්වා ධනඤ්ජානිං බ්‍රාහ්මණිං එතදවොච: අවභූතාව අයං ධනඤ්ජානී බ්‍රාහ්මණී පරිභූතාව අයං ධනඤ්ජානී බ්‍රාහ්මණී විජ්ජමානානං බ්‍රාහ්මණානං. අථ ච පන තස්ස මුණ්ඩකස්ස සමණකස්ස වණ්ණං භාසතීති[4].

න හි පන ත්වං තාත භද්‍රමුඛ, තස්ස භගවතො සීලපඤ්ඤාණං ජානාසි. සචෙ ත්වං තාත භද්‍රමුඛ, තස්ස භගවතො සීලපඤ්ඤාණං ජානෙය්‍යාසි, න ත්වං තාත භද්‍රමුඛ, තං භගවන්තං අක්කොසිතබ්බං පරිභාසිතබ්බං මඤ්ඤෙය්‍යාසීති.

තෙන හි භොති, යදා සමණො ගොතමො මණ්ඩලකප්පං අනුප්පත්තො හොති. අථ මෙ[5] ආරොචෙය්‍යාසීති. එවං භද්‍රමුඛාති ඛො ධනඤ්ජානී බ්‍රාහ්මණී සඞ්ගාරවස්ස මාණවස්ස පච්චස්සොසි.

අථ ඛො භගවා කොසලෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන මණ්ඩලකප්පං තදවසරි. තත්‍ර සුදං භගවා මණ්ඩලකප්පෙ විහරති තොදෙය්‍යානං බ්‍රාහ්මණානං අම්බවනෙ. අස්සොසි ඛො ධනඤ්ජානී බ්‍රාහ්මණී. 'භගවා කිර මණ්ඩලකප්පං අනුප්පත්තො මණ්ඩලකප්පෙ විහරති තොදෙය්‍යානං බ්‍රාහ්මණානං අම්බවනෙ'ති.

---

1. ධානඤ්ජානී – PTS.
2. චඤ්චලිකප්පෙ – මජසං. / පච්චලකප්පෙ – සයා. / චණ්ඩලකප්පෙ – සීමු.
3. සඟාරවො – සයා.
4. භාසිස්සතීති – මජසං.
5. අථ ඛො, මෙ – සීමු.

Free Distribution www.aathaapi.org

2. 5. 10

සඞ්ගාරව සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි මහබික්සඟුන් හා සමග සැරිසරනසේක. එසමයෙහි ධනඤ්ජානී නම් බැමිණි මණ්ඩලකප්ප නම් ගම්හි වෙසෙයි. බුදුන් කෙරෙහි ද දහම් කෙරෙහි ද සඟුන් කෙරෙහි ද (අවෙත්‍යප්‍රසාද වශයෙන්) පහන, එකල ධනඤ්ජානී බැමිණි පය පැකිල තුන් වරක් උදන් ඇනූ : ''ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා, ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා'' කියායි.

එසමයෙහි සඞ්ගාරව නම් මාණවක මණ්ඩලකප්ප නම් ගම්හි වාස කෙරෙයි. හේ නිඝණ්ඩු කෙටුභශාස්ත්‍ර සහිත අක්ෂරප්‍රභෙද සහිත ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවේදයන්ගේ පරතෙර ගියේ පද ශාස්ත්‍ර හදරනුයේ ව්‍යාකරණ හදරනුයේ ලොකායතික මහාපුරුෂලක්ෂණයෙහි පරිපූරකාරී වූයේ වෙයි. සඞ්ගාරව මාණවක මෙසේ නමස්කාරපාඨ බණන ධනඤ්ජානී බැමිණියගේ බස් ඇසී. අසා ධනඤ්ජානී බැමිණියට තෙල කී : ''බමුණන් විද්‍යමාන වැ සිටිය දී මේ ධනඤ්ජානී බැමිණි අවෘද්ධිමත් වූ යැ, විනාශප්‍රාප්ත වූ යැ. තවද ඒ මුණ්ඩක ශ්‍රමණයන් ගේ ගුණ කියා''යනු යි.

'පුත භද්‍රමුඛය, තෝ ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ සිල් හා නුවණ නො දන්හි. පුත භද්‍රමුඛය, ඉදින් තෝ ඒ භාග්‍යවතුන් වහන්සේගේ සිල් හා නුවණ දන්හි නම්, පුත භද්‍රමුඛය, තෝ ඒ භාග්‍යවතුන් වහන්සේ ආක්‍රොශ කළ යුත්තකු කොට පරිභාෂණ කළ යුත්තකු කොට නො හඟිහි.

'භවතිය, එසේ වී නම් යම් දිනෙක ශ්‍රමණ ගෞතමයෝ මණ්ඩලකප්ප ගමට පැමිණියාහු වෙත් ද, එකල මට දන්වන්නේ යැ'යි කී. 'භද්‍රමුඛය, එසේ යැ'යි ධනඤ්ජානී බැමිණි සඞ්ගාරව මාණවකයාහට පිළිවදන් දින්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි පිළිවෙළින් සැරිසරනසේක් මණ්ඩලකප්ප ගම කරා වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ මණ්ඩලකප්ප ගම්හි තෝදෙය්‍ය බමුණන්ගේ අඹ වෙනෙහි වැඩ වාස කෙරෙති. ධනඤ්ජානී බැමිණි භාග්‍යවතුන් වහන්සේ මණ්ඩලකප්ප ගමට වැඩිසේක් මණ්ඩලකප්ප ගම්හි තෝදෙය්‍ය බමුණන්ගේ අඹ වෙනෙහි වැඩ වාස කෙරෙත් ලැ'යි ඇසූ යැ.

48—ශේ 13561 (11/73)

Free Distribution www.aathaapi.org

අථ ඛො ධනඤ්ජානී බ්‍රාහ්මණී යෙන සඞ්ගාරවො මාණවො, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සඞ්ගාරවං මාණවං එතදවොච : 'අයං තාත මුද්දමුඛ, සො භගවා මණ්ඩලකප්පං අනුප්පත්තො, මණ්ඩලකප්පෙ විහරති තොදෙය්‍යානං බ්‍රාහ්මණානං අම්බවනෙ. යස්සදානි ත්වං[1] තාත භද්‍රමුඛ, කාලං මඤ්ඤසීති.

'එවං භොති'ති[2] ඛො සඞ්ගාරවො මාණවො ධනඤ්ජානියා බ්‍රාහ්මණියා පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො මාණවො භගවන්තං එතදවොච :

'සන්ති ඛො භො ගොතම, එකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මාභිඤ්ඤා-වොසානපාරමිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති. තත්‍ර භො ගොතම, යෙ තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාරමිප්පත්තා ආදි-බ්‍රහ්මචරියං පටිජානන්ති, තෙසං භවං ගොතමො කතමො'ති?

දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාරමිප්පත්තානං ආදිබ්‍රහ්මචරියං පටිජා-නන්තානම්පි ඛො අහං භාරද්වාජ, වෙමත්තතං[3] වදාමි. සන්ති භාරද්වාජ, එකෙ සමණබ්‍රාහ්මණා අනුස්සවිකා, තෙ අනුස්සවෙන දිට්ඨධම්මාභිඤ්ඤා-වොසානපාරමිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති සෙය්‍යථාපි බ්‍රාහ්මණා තෙවිජ්ජා. සන්ති පන භාරද්වාජ, එකෙ සමණබ්‍රාහ්මණා කෙවලං සද්ධාමත්තකෙන දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාරමිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති සෙය්‍යථාපි තක්කී වීමංසී. සන්ති භාරද්වාජ, එකෙ සමණබ්‍රාහ්මණා පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමංයෙව ධම්මං අභිඤ්ඤාය දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාරමිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති.

තත්‍ර භාරද්වාජ, යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමංයෙව ධම්මං අභිඤ්ඤාය දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාර-මිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති. තෙසාහමස්මි. තදමිනාපෙතං භාරද්වාජ, පරියායෙන වෙදිතබ්බං: යථා යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමංයෙව ධම්මං අභිඤ්ඤාය දිට්ඨධම්මා-භිඤ්ඤාවොසානපාරමිප්පත්තා ආදිබ්‍රහ්මචරියං පටිජානන්ති, තෙසාහ-මස්මීති.

---

1. යස්සදානි - මජසං.
2. එවං භොති - මජසං.
3. වෙමත්තං - මජසං.

එසඳ ධනඤ්ජානී බැමිණි සඞ්ගාරව මාණවකයා කරා එළැඹියා. එළඹ සඞ්ගාර මාණවකයාට මෙසේ කීවු : ''පුත භද්‍රමුඛය, ඒ භාග්‍යවතුන් වහන්සේ මණ්ඩලකප්ප ගමට වැඩීසේක් මණ්ඩලකප්ප ගම්හි තොදෙය්‍ය බමුණන්ගේ අඹ වෙනෙහි වැඩවෙසෙති. පුත භද්‍රමුඛය, තෝ දත් යමක් ගැන සිතෙහි නම් එයට කල් දතැ''යි කීවු.

'භවතිය, එසේයැ'යි සඞ්ගාරව මාණවකයා ධනඤ්ජානී බැමිණියට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ, එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී. සතුටු වියයුතු සිහි කළ යුතු කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සඞ්ගාරව මාණවක භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ :

''භවත් ගෞතමයන් වහන්ස, ඉහාත්මයෙහි මැ දන ව්‍යවසිත වැ පාරමී සඞ්ඛ්‍යාත 'නිර්වාණයට පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් ද එබඳු මහණ බමුණු කෙනෙක් ඇත. භවත් ගෞතමයන් වහන්ස, යම් මැ මහණ බමුණු කෙනෙක් ඉහාත්ම යෙහි මැ දන ව්‍යවසිත වැ පාරමී සඞ්ඛ්‍යාත නිවනට පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් නම් ඔවුනතුරෙන් භවත් ගෞතමයන් වහන්සේ කවරහ?

භාරද්වාජය, ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි බණන ආදි බ්‍රහ්මචර්‍ය්‍යය පිළින කරන ඔවුන්ගේ ද වෙනස කියමි. භාරද්වාජය, අනුශ්‍රවකථා ගත් කිසි මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු අනුශ්‍රව වශයෙන් ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙති. තෙවිජ්ජබ්‍රාහ්මණයන් සෙයිනි. භාරද්වාජය, හුදු ශ්‍රද්ධාමාත්‍ර වශයෙන් ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් ද, එ බඳු කිසි මහණ බමුණු කෙනෙක් ඇත. තර්කග්‍රාහී වූ විමංසක වූ බ්‍රාහ්මණයන් සෙයිනි. භාරද්වාජය, පෙර නො ඇසූවිරූ දහම්හි තමන් විසින් මැ දහම් දන ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් ද, එ බඳු කිසි මහණ බමුණු කෙනෙක් ඇත,

භාරද්වාජය, එහි යම් ඒ මහණ බමුණු කෙනෙක් අනනුශ්‍රැත ධර්මයෙහි තමන් විසින් මැ දහම් දන ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් ද, ඒ සම්බුද්ධයන් අතුරෙන් මම අන්‍යතරයෙක්මි. භාරද්වාජය, යම් පරිදි යම් ඒ මහණ බමුණු කෙනෙක් පෙර නො ඇසූවිරූ දහම්හි තමන් විසින් මැ දහම් දන ඉහාත්මයෙහි මැ දන පර්‍ය්‍යවසිත වැ 'නිවන් පැමිණියම්හ'යි කියා ආදිබ්‍රහ්මචර්‍ය්‍යය පිළින කෙරෙත් ද, ඒ සම්බුද්ධයන් අතුරින් මම අන්‍යතරයෙක්මි යන ඒ මේ කරුණ මේ කාරණයෙනුදු දතයුතු යැ.

ඉධ මෙ භාරද්වාජ, පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය''න්ති. සො ඛො අහං භාරද්වාජ, අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං. සො එවං පබ්බජිතො සමානො කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: ''ඉච්ඡාමහං ආවුසො කාලාම, ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු''න්ති. එවං වුත්තෙ භාරද්වාජ, ආළාරො කාලාමො මං එතදවොච: ''විහරතායස්මා, තාදිසො අයං ධම්මො, යත්ථ විඤ්ඤූ පුරිසො න චිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා''ති. සො ඛො අහං භාරද්වාජ, නචිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං· සො ඛො අහං භාරද්වාජ, තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච 'ජානාමි පස්සාමී''ති ච පටිජානාමි අහඤ්චෙව අඤ්ඤෙ ච. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: ''න ඛො ආළාරො කාලාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන 'සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී''ති පවෙදෙති. අද්ධා ආළාරො කාලාමො ඉමං ධම්මං ජානං පස්සං විහරතී''ති.

අථ ඛ්වාහං භාරද්වාජ, යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: ''කිත්තාවතා නො ආවුසො කාලාම, ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙමී''ති. එවං වුත්තෙ භාරද්වාජ, ආළාරො කාලාමො ආකිඤ්චඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: ''න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො ආළාරස්සෙව කාලාමස්ස අත්ථි විරියං -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං ආළාරො කාලාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙති, තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය''න්ති. සො ඛො අහං භාරද්වාජ, න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

---

1. උදකො - මජසං. 2. අත්තනා - මජසං

Free Distribution www.aathaapi.org

භාරද්වාජය, සම්‍යක්සම්බෝධියෙන් පෙර මැ චතුස්සත්‍යාවබෝධය නො කළ බෝධිසත්ත්ව වූ මැ මට මෙසේ සිත් වී : "ගෘහවාසය සම්බාධ යැ රාගාදිරජස් එන මඟැ, පැවිද්ද අභ්‍යවකාශ යැ, ගිහිගෙහි වසනහු විසින් ඒකාන්ත පරිපූර්ණ වූ ඒකාන්ත පරිශුද්ධ වූ ධෞතශඞ්ඛ සදෘශ වූ මේ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නට සුකර නො වෙයි. මම කෙසෙමස් බහා කසවත් හැද පෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නට පැමිණෙම් නම් මැනවි මැ නු"යි. භාරද්වාජය, මම පසු කලෙකැ දහර වූයෙම් මැ මනා කළුකෙසැ ඇත්තෙම් භද්‍රයෞවන හා ප්‍රථම වයසින් සමන්වාගත වූයෙම් නො කැමැති කඳුළුමුසු මුහුණු ඇති දෙමාපියන් හඬමින් සිටිය දී කෙසෙරවුළු බහා කසවත් හැද පෙරෙවැ ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙමි. මම මෙසේ පැවිදි වැ කිඞ්කුශලගවෙෂී වැ අනුත්තර ශාන්තිවරපදය සොයන්නෙම් ආළාරකාලාම තවුසන් කරා පැමිණියෙමි. පැමිණ ආළාරකාලාම තවුස්නට මෙසේ කීමි : "ඇවැත කාලාමයෙනි, මම මේ තොප සතු ධර්මවිනයෙහි බඹසර පුරන්නට කැමැතියෙමි"යි. භාරද්වාජය, මෙසේ කී කල ආළාරකාලාම තවුස් මට මෙසේ කී : "ආයුෂ්මත් මෙහි වසන්නේ මැනැව. යම් දහමෙකැ විඥ පුරුෂයෙක් නොබෝ දිනෙකින් ස්වකීය ආචාර්‍ය්‍යෝද්ග්‍රහණය තමා විසින් මැනැවින් දැන පසක් කොට එයට පැමිණ වාසය කරන්නේ වේ ද, මේ එබඳු දහමෙකැ"යි. භාරද්වාජය, මම නොබෝ කලෙකින් මැ වහා මැ ඒ දහම පුහුණු කෙළෙමි. භාරද්වාජය, මම එතෙක් තොල් පහළ පමණින් මැ බස් බිණු පමණින් මැ ඥානවාදය ද ථෙරවාදය ද කියමි, "දනිමි, දක්මි"යි ද මම ද පිළින කරමි. සෙස්සෝ ද පිළින කෙරෙත්. භාරද්වාජය, මට මෙසේ සිත් වී : "ආළාරකාලාම තවුස් මේ දහම හුදෙක් සැදැ පමණෙකින් 'තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වෙසෙමි"යි නො දන්වයි, ඒකාන්තයෙන් ආළාරකාලාම තවුස් මෙ දහම දන්මින් දක්මින් වාස කෙරේ"යනු යි.

භාරද්වාජය, ඉක්බිති මම ආළාරකාලාම තවුස් කරා එළැඹියෙමි. එළැඹ ආළාරකාලාම තවුස්හට මෙසේ කීමි : "ඇවැත, කාලාමයෙනි, කෙතෙකින් මෙ දහම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙමි'යි දන්වම් ද? යි. භාරදවාජය, මෙසේ කී කල ආළාරකාලාම තවුස් ආකිඤ්චඤ්ඤායතනය කී. භාරද්වාජය, මට මෙසේ සිත් වී : "ආළාරකාලාම තවුස්හට මැ සැදැහැ ඇත්තේ නො වෙයි. මට ද සැදැහැ ඇත. ආළාරකාලාම තවුස්හට මැ වැර ඇතියේ නො වෙයි; . . . සිහිය . . . සමාධිය . . . ප්‍රඥ ඇත්තේ නො වෙයි, මට ද ප්‍රඥ ඇත. මම, ආළාරකාලාම තවුස් යම් දහමක් තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයා ගෙන වාස කරමි'යි දන්වා ද, ඒ දහම පසක් කරනු පිණිස ප්‍රධන් වැර වඩම් නම් මනා මැ නු"යි. භාරද්වාජය, මම නොබෝ කලෙකින් මැ වහා මැ එ දහම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙළෙමි.

අථ ඛ්වාහං භාරද්වාජ, යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොචං: "එත්තාවතා නො ආවුසො කාලාම, ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති. එත්තාවතා ඛො අහං ආවුසො, ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී'ති. අහම්පි ඛො ආවුසො එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති. ලාභා නො අවුසො, සුලද්ධං නො ආවුසො යෙ මයං ආයස්මන්තං තාදිසං සබ්‍රහ්මචාරිං පස්සාම ඉති, යාහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තමහං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමි. ඉති යාහං ධම්මං ජානාමි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තමහං ධම්මං ජානාමි. ඉති යාදිසො අහං, තාදිසො තුවං. යාදිසො තුවං, තාදිසො අහං. එහි දානි ආවුසො, උභො'ව සන්තා ඉමං ගණං පරිහරාමා'ති. ඉති ඛො භාරද්වාජ, ආළාරො කාලාමො ආචරියො මෙ සමානො අත්තනො අන්තෙවාසිං මං සමානං අත්තනො සමසමං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව ආකිඤ්චඤ්ඤායතනූපපත්තියා"ති. සො ඛො අහං භාරද්වාජ, තං ධම්මං අනලඞ්කරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

සො ඛො අහං භාරද්වාජ, කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන උද්දකො[2] රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "ඉච්ඡාමහං ආවුසො රාම[1] ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මචරියං චරිතු"න්ති. එවං වුත්තෙ භාරද්වාජ, උද්දකො රාමපුත්තො මං එතදවොච: 'විහරතායස්මා, තාදිසො අයං ධම්මො, යත්ථ විඤ්ඤූ පුරිසො න චිරස්සෙව සකං ආචරියකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යා"ති. සො ඛො අහං භාරද්වාජ, න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං පරියාපුණිං. සො ඛො අහං භාරද්වාජ, තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච 'ජානාමි පස්සාමී'ති ච පටිජානාමි අහඤ්චෙව අඤ්ඤෙ ච. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "න ඛො රාමො ඉමං ධම්මං කෙවලං සද්ධාමත්තකෙන සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී"ති. පවෙදෙසි, අද්ධා රාමො ඉමං ධම්මං ජානං පස්සං විහාසී'ති.

අථ ඛ්වාහං භාරද්වාජ, යෙන උද්දකො[2] රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "කිත්තාවතා නො ආවුසො, රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසී"ති. එවං වුත්තෙ භාරද්වාජ, උද්දකො රාමපුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං පවෙදෙසි. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "න ඛො රාමස්සෙව අහොසි සද්ධා, මය්හම්පත්ථි සද්ධා. න ඛො රාමස්සෙව අහොසි විරියං. -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා, මය්හම්පත්ථි පඤ්ඤා. යන්නූනාහං යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති පවෙදෙසි. තස්ස ධම්මස්ස සච්ඡිකිරියාය පදහෙය්‍ය"න්ති. සො ඛො අහං භාරද්වාජ, න චිරස්සෙව ඛිප්පමෙව තං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසිං.

---

1. ආවුසො - මජසං. 2. උදකො - මජසං.

භාරද්වාජය, ඉක්බිති මම ආළාරකාලාම තවුස් කරා එළැඹියෙමි. එළැඹ ආළාරකාලාම තවුස්හට තෙල කීමි : ''ඇවැත කාලාමයෙනි, මෙතෙකින් මෙ දහම තමන් විසින් වෙසෙසින් දැන උපයාගෙන ප්‍රකාශ කෙරෙහි ද?යි. ඇවැත, මම මෙ පමණෙකින් මෙ දහම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන දන්වමි'යි කී. ඇවැත්නි, මම ද මෙපමණෙකින් මෙ දහම තමන් විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙමි'යි කීමි. මම යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන දන්වම් ද, තොයිත් එ දහම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට වාස කෙරෙහි, තෝ යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙහි ද, මම එ දහම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන දන්වමි. මෙසේ මම යම් දහමක් දන්මි නම් තොයින් එ දහම දන්හි. තො යම් දහමක් දන්හි නම් මමත් එ දහම දන්මි. මෙසේ මම යම් බඳුයෙම් ද, තො ද එබඳුයෙහි. තෝ යම් බඳුයෙහි ද, මම එ බඳුයෙමි. (මෙසේ) අපි තා බඳු සබ්‍රම්සර ආයුෂ්මතකු දක්මෝ ද, ඇවැත්නි, අපට ලාභයෙකැ, ඇවැත්නි, අපට මනා ලාභයෙකි. ඇවැත්නි, දන් එව දෙදෙනාමෝ මෙ ගණයා පරිහරණ කරම්හ'යි කී. භාරද්වාජය, මෙසේ ආළාරකාලාම තවුස් මාගේ ආචාර්‍ය වූයේ මැ තමා අතැවැසි වූ මා තමහට සමසම කොට තැබී. උදර පූජායෙනුදු මා පිදී. භාරද්වාජය, මට තෙල සිත් වී : ''මෙ දහම නිර්විද පිණිස නො වැටෙයි. විරාග පිණිස නො වැටෙයි, නිරොධ පිණිස නො වැටෙයි, උපයිම පිණිස නො වැටෙයි, අභිඥ පිණිස නො වැටෙයි, සම්බොධ පිණිස නො වැටෙයි, නිර්වාණ පිණිස නො වැටෙයි. ආකිඤ්චඤ්ඤායතනුප්පත්තිය පිණිස මැ වැටෙයි'' කියා යි. භාරද්වාජය, මම එ දහම පමණ නො කොට එ දහමින් කලකිරී බැසගියෙමි.

භාරද්වාජය, ඒ මම 'කුසල් කිමැ'යි සොයනුයෙම් අනුත්තරසන්තිවරපදය (නිවන) සොයමින් උද්දක රාමපුත්‍ර කරා එළැඹියෙමි. එළැඹ උද්දක රාමපුත්‍රහට තෙල කීමි : ''ඇවැත්නි රාමපුත්‍රයෙනි, මම මෙසස්නෙහි බඹසර සරනු රිසියෙමි''යි. භාරද්වාජය, මෙසේ කී කල්හි රාමපුත් උද තවුස් මට මෙසේ කී : ''ඇවැත්නි, වාස කරව. යම් දහමෙක විඥ පුරුෂ නොබෝ කලෙකින් මැ සිය ඇදුරුසමය තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාස කෙරේ නම් මේ එ බඳු දහමෙකැ''යි. භාරද්වාජය, මම් නොබෝ කලෙකින් මැ වහා මැ එ දහම පිරිවැහීමි. භාරද්වාජය, එ මම් එතෙක් තොල් පහළ පමණින් මැ වදන්පිළිවදන් මතුයෙන් මැ ඥනවාදයත් ස්ථවිරවාදයත් කියමි, 'දන්මි දක්මි'ද මමත් පිළින කෙරෙමි, සෙසුවෝත් පිළින කෙරෙති. භාරද්වාජය, ඒ මට තෙල සිත් වී : ''රාම තවුස් මෙ දහම හුදෙක් ශ්‍රද්ධා පමණෙකින් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට උපයා වාස කෙරෙමි' නො ද පැවැයි, එකාන්තයෙන් රාම තවුස් මෙ දහම දන්මින් දක්මින් වියි''යයි.

එසඳ භාරද්වාජය, මම් රාමපුත් උද තවුස් කරා එළැඹියෙමි. එළැඹ රාමපුත් උද තවුස්හට තෙල බස් කීමි : ''ඇවැත්නි, රාමයෙනි, කිපමණෙකින් අපට මෙදහම තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙම්, පවසවු ද?''යි, භාරද්වාජය, මෙසේ කී කල්හි රම්පුත් උද තවුස් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ප්‍රකාශ කෙළේ යැ. භාරද්වාජය, එ මට තෙල සිත් වී : ''රාමහට් මැ ශ්‍රද්ධා නො ද වූ, මටත් ශ්‍රද්ධා ඇත. රාමහට මැ වීර්‍ය නො ද වී. . . . සති . . . සමාධි . . . රාමහට මැ ප්‍රඥ නො ද වූ, මටත් ප්‍රඥ ඇති. රම් තවුස් යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන පසක් කොට එළැඹ වාස කෙරෙමි' ප්‍රකාශ කෙළේ ද මම් එ දහම පසක් කරනුවට ප්‍රධන්වීර්‍ය කරනෙම් නම් මනා මැ නු''යි භාරද්වාජය, එ මම් නොබෝ කලෙකින් මැ වහා මැ එ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට වාස කෙළෙමි.

අථ ඛ්වාහං භාරද්වාජ, යෙන උද්දකො රාමපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා උද්දකං රාමපුත්තං එතදවොචං: "එත්තාවතා නො අවුසො රාම[1] ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී"ති. එත්තාවතා ඛො අහං ආවුසො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙමී'ති[2]. 'අහම්පි ඛො ආවුසො, එත්තාවතා ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමී'ති. ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං බ්‍රහ්මචාරිං පස්සාම ඉති යං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි, තං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි. යං ත්වං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරසි, තං ධම්මං රාමො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසි. ඉති යං ධම්මං රාමො අභිඤ්ඤාසි, තං ත්වං ධම්මං ජානාසි. යං ත්වං ධම්මං ජානාසි, තං ධම්මං රාමො අභිඤ්ඤාසි. ඉති යාදිසො රාමො අහොසි, තාදිසො තුවං. යාදිසො තුවං, තාදිසො රාමො අහොසි. එහි දානි ආවුසො, තුවං ඉමං ගණං පරිහරා'ති. ඉති ඛො භාරද්වාජ, උද්දකො රාමපුත්තො සබ්‍රහ්මචාරී මෙ සමානො ආචරියට්ඨානෙ මං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "නායං ධම්මො නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපපත්තියා"ති. සො ඛො අහං භාරද්වාජ, තං ධම්මං අනලංකරිත්වා තස්මා ධම්මා නිබ්බිජ්ජ අපක්කමිං.

සො ඛො අහං භාරද්වාජ, කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො මගධෙසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන උරුවෙලා සෙනානිගමො තදවසරිං. තත්ථද්දසං රමණීයං භූමිභාගං පාසාදිකඤ්ච වනසණ්ඩං නදිඤ්ච සන්දන්තිං සෙතකං සුපතිත්ථං රමණීයං සමන්තා ච ගොචරගාමං. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "රමණීයො වත භො භූමිභාගො, පාසාදිකො ච වනසණ්ඩො, නදී ච සන්දති සෙතකා සුපතිත්ථා රමණීයා, සමන්තා ච ගොචරගාමො, අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානායා"ති. සො ඛො අහං භාරද්වාජ, තත්ථෙව නිසීදිං 'අලමිදං පධානායා'ති.

අපිස්සු මං භාරද්වාජ, තිස්සො උපමායො පටිභංසු අනච්ඡරියා, පුබ්බෙ අස්සුතපුබ්බා:

සෙය්‍යථා'පි භාරද්වාජ, අල්ලං කට්ඨං සස්නෙහං උදකෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතුකරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි භාරද්වාජ, අපි නු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං උදකෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යා'ති?

---

3. රාමො - මජසං.
2. එත්තාවතා ඛො ආවුසො රාමො ඉමං ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ පවෙදෙසී'ති - මජසං.

එසඳ භාරද්වාජය, මම උද්දක රාමපුත්‍ර කරා එළැඹියෙමි. එළැඹ උද්දක රාමපුත්‍රහට තෙල බස් කීමි : "ඇවැත්නි, රාමයෙනි මෙතෙකින් අපට මෙදහම, තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන පවසවු ද?"යි. "ඇවැත්නි, මෙතෙකින් මම මෙ දහම, තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වෙසෙමි"යි. "ඇවැත්නි, මෙතෙකින් මමත් මෙ දහම, තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කෙරෙමි"යි. ඇවැත්නි, අපට ලාභයෙකැ, ඇවැත්නි, අපට මනා ලාභයෙකි. ඇපි තොප වැනි සබ්‍රම්සර ආයුෂ්මත් කෙනකුන් දකුම්හ. මෙසෙයින් රාම යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට උපයාගෙන ප්‍රකාශ කෙළේ ද, තෙපි එ දහම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට උපයාගෙන වාස කරව. තෙපි යම් දහමක් තමා විසින් වෙසෙසින් දැන පසක් කොට උපයාගෙන වාස කරවු ද, එ දහම රාම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්‍ෂ කොට උපයාගෙන ප්‍රකාශ කෙළේ යැ. මෙසෙයින් රාම යම් දහමක් දත්තේ ද, තෙපි එ දහම දත්තහු යැ. තෙපි යම් දහමක් දත්තහු ද, එ දහම රාම දත්තේ යැ. මෙසේ රාම යම් බඳු වී නම් තෙපි එ බඳු ව. තෙපි යම් බඳු වවු නම් රාම එ බඳු වී. එව දැන් ඇවැත්නි, තෙපි මේ ගණයා පරිහරණ කරව"යි. භාරද්වාජය, මෙසෙයින් රම්පුත් උදු තවුස් මා ගේ සබ්‍රම්සැරි වූයේ මැ මා ඇදුරු තැන්හි තැබී. උදර පූජායෙනුදු මා පිදී. භාරද්වාජය, ඒ මට තෙල සිත් වී: "මෙ දහම නිර්වේදයට නො වැටෙයි, නො ද විරාගයට නො ද නිරොධයට නො ද කෙලෙස් සන්හිඳීමට නො ද අභිඥවට නො ද සම්බොධයට නො ද නිර්වාණයට වැටෙයි. නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයෙහි උපත පිණිස මැ වැටේ"යයි. භාරද්වාජය, ඒ මම එ දහම පිළිකෙව කොට එ දහමින් කලකිරී බැස ගියෙමි.

භාරද්වාජය, ඒ මම 'කිංකුශලගවෙෂී වැ අනුත්තර ශාන්තිවරපදය පිරියෙස්මින් මගධ දනව්යෙහි අනුක්‍රමයෙන් සැරිසරනුයෙම් උරුවෙලායෙහි සෙනා නම් නියම්ගමට (සෙනානී නම් සිටුහුගේ ගමට) බටුයෙමි. එහි රමණී භූමිභාගය ද ප්‍රසාද එළවන වනලැහැබ ද ගලන, සුදුවැලිතලා ඇති, මනා තොට ඇති, රමණී හොය ද හාත්පසැ පිහිටි ගොදුරුගම ද දිටිමි. භාරදවාජය, මට තෙල සිත් වී : "භූමිභාගය රමණීය මැ යැ. වන ලැහැබ ප්‍රසාද එළවන්නේ මැ යැ, සුදුවැලිතලා ඇති මනා තොට ඇති රමණී හොය ද ගලයි, හාත්පස්හි ගොදුරුගම ඇත. ප්‍රධන්වීර්‍ය්‍ය කරනු කැමැති කුලපුතක්හට මෙ තැන සමත් වේ මැ"යි. භාරදවාජය, ඒ මම මෙ තැන ප්‍රධන් පිණිස සමත් වෙති ඒ බෝපලගෙහි මැ නිෂදාා කෙළෙමි.

තවද භාරද්වාජයෙනි, මට පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන, පෙර නො ඇසූවිරූ උපමාවෝ තුන් දෙනෙක් වැටහුණහ :

"යම්සේ භාරද්වාජයෙනි, ස්නෙහ සහිත, දියෙහි බැහූ, තෙත් කාෂ්ටයෙක් ඇද්ද, ඉක්බිති පුරුෂයෙක් උතුරුරිණී ගෙන ගිනි නිපදවමි, තෙද පහළ කෙරෙමි'යි එන්නේ වේ ද, භාරද්වාජය, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ ස්නෙහ සහිත, දියෙහි බැහූ, තෙල තෙත් කාෂ්ටය උතුරුරිණී ගෙන අළලන්නේ කිම ගිනි නිපදවන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ ද ?යි.

නො හිදං භො ගොතම. තං කිස්ස හෙතු: අදුං හි භො ගොතම, අල්ලං කට්ඨං සස්නෙහං. තඤ්ච පන උදකෙ නික්ඛිත්තං. යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති.

එවමෙව ඛො භාරද්වාජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන චෙව කාමෙහි අවූපකට්ඨා විහරන්ති, යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො, සො ච අජ්ඣත්තං න සුප්පහීනො හොති, න සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා[1] කටුකා වෙදනා වෙදියන්ති, අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. නො චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා, ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං භාරද්වාජ, පඨමා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

අපරා'පි මං භාරද්වාජ දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා: සෙය්‍යථා'පි භාරද්වාජ, අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතුකරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි භාරද්වාජ, අපිනු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යා'ති?

නො හිදං භො ගොතම, තං කිස්ස හෙතු: අදුං හි භො ගොතම, අල්ලං කට්ඨං සස්නෙහං. කිඤ්චාපි ආරකා උදකා ථලෙ නික්ඛිත්තං යාවදෙව ච පන සො පුරිසො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සා'ති.

එවමෙව ඛො භාරද්වාජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන ඛො කාමෙහි වූපකට්ඨා විහරන්ති. යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමසිනෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො, සො ච අජ්ඣත්තං න සුප්පහීනො හොති න සුප්පටිප්පස්සද්ධො, ඔපක්කමිකා චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. අභබ්බා ච තෙ ඤාණය දස්සනාය අනුත්තරාය සම්බොධාය නො චෙ'පි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති[2], අභබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං භාරද්වාජ, දුතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

අපරා'පි ඛො මං භාරද්වාජ, තතියා උපමා පටිභාසි, අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා: සෙය්‍යථාපි භාරද්වාජ, සුක්ඛං කට්ඨං කොළාපං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං. අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි, තෙජො පාතුකරිස්සාමී'ති. තං කිං මඤ්ඤසි භාරද්වාජ, අපිනු සො පුරිසො අමුං සුක්ඛං කට්ඨං කොළාපං ආරකා උදකා ථලෙ නික්ඛිත්තං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය, තෙජො පාතුකරෙය්‍යා'ති?

1 තිබ්බා ඛරා - මජ්සං. 2. වෙදයන්ති - මජ්සං.

භවත් ගෞතමයන් වහන්ස, මෙ කරුණ නො වන්නේ මැ යි. ඒ කවර හෙයින යත් : ‘‘භවත් ගෞතමයෙනි, තෙල තෙත් කාෂ්ටය සස්නෙහ වෙයි, එ ද දියෙහි බහනලද වෙයි. තෙල පුරුෂ වැළිත් ඇළලූ තාක් ක්ලාන්තයට වෙහෙසට හිමි වන්නේ යැ’’යි.

භාරවාද්ජයෙනි, එපරිදිමැ යම්කිසි මහණ කෙනෙක් වෙත්වයි බමුණු කෙනෙක් වෙත්වයි කයිනුදු සිතිනුදු කාමයෙන් නො වෙන් වැ වෙසෙත් ද, ඔවුන්ගේ යම් කාමයෙහි කාමච්ඡන්දයෙක් කාමසෙනහයෙක් කාමමූර්ඡායෙක් කාමපිපාසායෙක් කාමපරිදාහයෙක් ඇද්ද, එ ද සිය සතන්හි සුප්‍රහීණ නො වේ ද, මොනොවට සන්හුන් නො වේ ද, ඒ භවත් මහණ බමණහු ඉදින් ඖපක්‍රමික වූත් තීව්‍ර කටුක දුඃඛ වෙදනා විඳිත් ද, ඔහු අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙති. ඉදින් ඒ මහණ බමුණෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවෙදනා නො විඳිත් ද, ඔහු අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ යි. භාරද්වාජයෙනි, මට පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූවිරූ මෙ පළමු උපමා වැටහිණ.

භාරද්වාජය, මට නැවත නැවත අසිරි එළවන පෙර නො ඇසූවිරූ අනෙක් දෙවන උපමායෙක් ද වැටහිණ : භාරද්වාජය, යම් පරිදි දියෙන් බැහැර වැ සිටි ගොඩබිම්හි ලූ ස්නෙහ සහිත තෙත් කාෂ්ටයෙක් ඇද්ද, ඉක්බිති පුරුෂයෙක් උතුරුරිණී ගෙන ‘ගිනි උපදවමි’යි ‘තෙද පහළ කෙරෙමි’යි එන්නේ වේ ද, භාරද්වාජය, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ ස්නෙහ සහිත, දියෙන් බැහැර වැ සිටි, ගොඩබිම්හි ලූ, තෙල තෙත් කාෂ්ටය උතුරු-රිණී ගෙන අළලන්නේ කිම ගිනි උපදවන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ ද ?යි.

භවත් ගෞතමයෙනි, තෙල නො වේ මැ යි. ඒ කවර හෙයින යත් : ‘‘භවත් ගොයුම් ගොතුව, තෙලෙ දියෙන් බැහැර වූයේ නමුදු ගොඩබිම්හි ලූයේ නමුදු සෙනහ සහිත තෙත් කාෂ්ටයෙකි. ඒ පුරුෂ වැළිත් ඇළලූ තාක් ක්ලමථුවට වෙහෙසට හිමි වන්නේ යැ’’යි.

එපරිදි මැ භාරද්වාජය, යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි කයින් කාමයෙන් වෙන් වැ වෙසෙත් ද, ඔවුන්ගේ යම් කාමයෙහි කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාමපිපාසායෙක් කාමපරිදාහයෙක් ඇද්ද, එ ද සිය සතන්හි සුප්‍රහීණ නො වේ ද, සන්හුන් නො වේ ද, ඉදින් ඒ භවත් මහණබමුණෝ ඖපක්‍රමික වූත් තීව්‍ර කටුක දුඃඛවේදනා විඳිත් ද, ඔහු අනුත්තර සම්බොධසඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙති. ඉදින් ඒ භවත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවෙදනා නො විඳිත් ද, ඔහු අනුත්තර සම්බොධසඞ්ඛ්‍යාත ඥානදර්ශනයට අභව්‍ය මැ වෙත්. භාරදවාජය, පුනපුනා අසිරි එළවන පෙර නො ඇසූවිරූ මේ දෙවන උපමාව මට වැටහිණ.

භාරද්වාජය, පුනපුනා අසිරි එළවන පෙර නො ඇසූ විරූ අනෙක් තුන් වැනි උපමායෙක් ද මට වැටහිණ; යම්සේ භාරද්වාජය, කොලපු වූ, දියෙන් බැහැර වූ, ගොඩබිම්හි ලූ වියළි කාෂ්ටයෙක් ඇද්ද, එසද පුරුෂයෙක් උතුරුරිණී ගෙන ‘ගිනි උපදවමි, තෙද පහළ කෙරෙමි’ එන්නේ වේ ද, භාරද්වාජය, ඒ කෙසේ හඟිහි? ඒ පුරුෂ කොලොපු වූ, දියෙන් බැහැර වූ, ගොඩබිම්හි ලූ, තෙල වියළි කාෂ්ටය උතුරුරිණී ගෙන අළලනුයේ කිම ගිනි උපද-වන්නේ වේ ද, තෙද පහළ කරන්නේ වේ ද ? යි.

එවං භො ගොතම, තං කිස්ස හෙතු: අදුං හි භො ගොතම, සුක්ඛං කට්ඨං කොළාපං, තඤ්ච පන ආරකා උදකා ථලෙ නික්ඛිත්ත’න්ති.

එවමෙව ඛො භාරද්වාජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා කායෙන චෙව චිත්තෙන ච කාමෙහි වූපකට්ඨා විහරන්ති. යො ච නෙසං කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපිපාසා කාමපරිළාහො, සො ච අජ්ඣත්තං සුප්පහීනො හොති සුප්පටිප්පස්සද්ධො. ඔපක්කමිකා චෙපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති, භබ්බාව තෙ ඤාණාය දස්සනාය අනුත්තරාය සම්බොධාය. අයං ඛො මං භාරද්වාජ, තතියා උපමා පටිභාසි අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා. ඉමා ඛො මං භාරද්වාජ, තිස්සො උපමා පටිභංසු අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: “යන්නූනාහං දන්තෙභිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හෙය්‍යං අභිනිප්පීළෙය්‍යං අභිසන්තාපෙය්‍ය”න්ති. සො ඛො අහං භාරද්වාජ, දන්තෙභිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හාමි අභිනිප්පීළෙමි අභිසන්තාපෙමි. තස්ස මය්හං භාරද්වාජ, දන්තෙභිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. සෙය්‍යථාපි භාරද්වාජ, බලවා පුරිසො දුබ්බලතරං පුරිසං සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා අභිනිග්ගණ්හෙය්‍ය අභිනිප්පීළෙය්‍ය අභිසන්තාපෙය්‍ය, එවමෙව ඛො මෙ භාරද්වාජ, දන්තෙභිදන්තමාධාය ජිව්හාය තාලුං ආහච්ච චෙතසා චිත්තං අභිනිග්ගණ්හතො අභිනිප්පීළයතො අභිසන්තාපයතො කච්ඡෙහි සෙදා මුච්චන්ති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: “යන්නූනාහං අප්පාණකං[1] ඣානං ඣායෙය්‍ය”න්ති. සො ඛො අහං භාරද්වාජ, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං භාරද්වාජ, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. සෙය්‍යථාපි නාම කම්මාරගග්ගරියා ධමමානාය අධිමත්තො සද්දො හොති එවමෙව ඛො මෙ භාරද්වාජ, මුඛතො ච නාසතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු කණ්ණසොතෙහි වාතානං නික්ඛමන්තානං අධිමත්තො සද්දො හොති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා[2], සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

---

1. අප්පාණකංයෙව - මජසං. 2. අසම්මුට්ඨා - මජසං.

Free Distribution www.aathaapi.org

එසේ යැ භවත් ගෞතමයෙනි, ඒ කවර හෙයින යත් : භවත් ගොයුම්ගොතුව, තෙල ශුෂ්කකාෂ්ටය කොලොප්පු වෙයි, එ ද දියෙන් බැහැර වූයේ වෙයි, ගොඩබිම්හි බහාලන ලද වෙ''යයි.

එසෙයින් මැ භාරද්වාජයෙනි, යම්කිසි මහණ කෙනෙක් වෙත්වයි බමුණු කෙනෙක් වෙත්වයි කයිනුදු සිතිනුදු කාමයෙන් වෙන් වැ වෙසෙත් ද, ඔවුන්ගේ යම් කාමයෙහි කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ජායෙක් කාමපිපාසායෙක් කාමපරිදාහයෙක් ඇද්ද, එ ද සිය සතන්හි මොනොවට ප්‍රහීණ වූයේ වේ ද, සන්හුන් වේ ද, ඉදින් ඒ භවත් මහණබමුණෝ තීව්‍ර කටුක ඖපක්‍රමික දුඃඛවෙදනා විඳුනාහු නමුදු ඔහු අනුත්තර සම්බොධ සඞ්ඛ්‍යාත ඥනදර්ශනයට භව්‍ය මැ වෙති, ඉදින් ඒ භවත් මහණබමුණෝ තීව්‍ර කටුක ඖපක්‍රමික දුඃඛවෙදනා නො විඳුනාහු නමුදු ඔහු අනුත්තර සම්බොධසඞ්ඛ්‍යාත ඥනදර්ශනයට භව්‍ය මැ වෙති. භාරද්වාජය, පුනපුනා අසිරි එළවන පෙර නො ඇසූවිරූ මෙ තුන් වැනි උපමා මට වැටහිණ. භාරද්වාජය, පුනපුනා ආශ්චර්‍ය්‍ය එළවන පෙර නො ඇසූ විරූ මේ තුන් උපමාවෝ මට වැටහුණහ'යි.

භාරද්වාජය, මට තෙල සිත් වී; ''යටිදත්හි උඩුදත තබා දිවින් තලු පැහැර (කුසල්සිතින්) අකුසල්සිත නිගන්නෙම් පෙළන්නෙම් තවන්නෙම් නම් මැනැවැ''යි. භාරදවාජය, මම යටිදතෙහි උඩුදත තබා දිවින් තලු පැහැර ගෙන සිතින් සිත නිගන්මි, පෙළමි, තපොවීර්‍ය්‍ය කෙරෙමි. භාරද්වාජය, යටිදතෙහි උඩුදත තබා දිවින් තලු පැහැරගෙන සිතින් සිත නිගන්නා පෙළන තපොවීර්‍ය්‍ය කරන මා ගේ කච්ඡයෙන් ස්වෙදයෝ මිදෙත්, භාරදවාජය, බලවත් පුරුෂයෙක් ඉතා දුබල පුරුෂයකු හිසෙහි වේවයි ස්කන්ධයෙහි වේවයි ගෙන නිගන්නේ වේ ද, පෙළන්නේ වේ ද, තාප කරන්නේ වේ ද, භාරද්වාජය, එපරිදි මැ යටදතෙහි උඩුදත තබා දිවින් තලු පැහැරගෙන සිතින් සිත නිගන්නා පෙළන තවන මා ගේ කැසින් ස්වෙදයෝ මිදෙත්. භාරද්වාජය, මා විසින් වැර රැකුළේ වෙයි, සංලීන නො වෙයි, සිහි එළවියා වෙයි, මුෂිත නො වෙයි. ඒ දුක් සහගිය ප්‍රධනින් මැ ප්‍රධන්වැරින් විත් කැවා වූ මැ මා ගේ කය දරථ සහිත වෙයි, නො සන්හුන් වෙයි.

භාරද්වාජය, මට තෙල සිත් වී : ''මම් අප්‍රාණක (නිරාශ්වාස.) ධ්‍යාන කරනෙම් නම් මැනැවැ''යි. භාරදවාජය, ඒ මම මුවිනුදු නැහැයෙනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළැක්මි, භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු අසස්පසස් වැළැකූ කල්හි මා ගේ කන්සිළින් නික්මෙන වාතයන්ගේ අධිමාත්‍ර ශබ්දය වෙයි. යම්සේ නම් කඹුරුසමක් පුඹුනා කල්හි අධිමාත්‍ර ශබ්දයෙක් වේ ද, එසෙයින් මැ භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු ආශ්වාසප්‍රශ්වාස වැළැකූ කල්හි කන්සිදුරින් නික්මෙන වාතයන් ගේ අධිමාත්‍ර ශබ්දය වෙයි. භාරද්වාජය, මා විසින් වැර රැකුළේ සංලීන නො වෙයි. සිහි එළඹ සිටියා, මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය ඒ දුක්සහගිය පදහනින් ප්‍රධන්වීර්‍ය්‍යයෙන් විත් කෑයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේත් වෙයි.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්"ති. සො ඛො අහං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධානං[1] ඌහනන්ති. සෙය්‍යථාපි භාරද්වාජ, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධනි අභිමත්ථෙය්‍ය, එවමෙව ඛො මෙ භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා මුද්ධනි ඌහනන්ති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්"ති. සො ඛො අහං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවෙදනා හොන්ති. සෙය්‍යථාපි භාරද්වාජ, බලවා පුරිසො දළ්හෙන වරත්තක්ඛණ්ඩෙන[2] සීසෙ සීසවෙඨං දදෙය්‍ය, එවමෙව ඛො භාරද්වාජ මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා සීසෙ සීසවෙදනා හොන්ති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්"ති සො ඛො අහං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති, සෙය්‍යථාපි භාරද්වාජ, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො මෙ භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: යන්නූනාහං අප්පාණකංයෙව ඣානං ඣායෙය්‍යන්"ති. සො ඛො අහං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙ උපරුන්ධිං. තස්ස මය්හං භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති, සෙය්‍යථාපි භාරද්වාජ, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං සම්පරිතාපෙය්‍යුං. එවමෙව ඛො මෙ භාරද්වාජ, මුඛතො ච නාසතො ච කණ්ණතො ච අස්සාසපස්සාසෙසු උපරුද්ධෙසු අධිමත්තො කායස්මිං ඩාහො හොති. ආරද්ධං ඛො පන මෙ භාරද්වාජ, විරියං හොති අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, සාරද්ධො ච පන මෙ කායො හොති අප්පටිප්පස්සද්ධො තෙනෙව දුක්ඛප්පධානෙන පධානාභිතුන්නස්ස සතො.

---

1. මුද්ධනි - මජසං. 2. වරත්තක්ඛණ්ඩෙන - මජසං.

භාරද්වාජය, මට මෙසේ සිත් වී : "මම නිරස්සාසක වූ මැ ධ්‍යානය වඩම් නම් මනා මැ නු" යි. භාරද්වාජය, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළකීමි. භාරද්වාජය, මා විසින් මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළැහූ කල අධිමාත්‍ර වාතයෝ මුදුන පෙළත්. භාරද්වාජය, බලවත් පුරුෂයෙක් යම් පරිදි තියුණු කඩුයිළෙකින් මුදුන පෙළන්නේ ද එ පරිදි මැ භාරදවාජය, මා විසින් මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශවාස ප්‍රශවාස වැළහූ කල්හි අධිමාත්‍ර වාතයෝ මුදුන පෙළත්, භාරද්වාජය, මා විසින් වැර රුකුළේ අසංලීන වෙයි. සිහි එළැඹ සිටියා මුෂත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක්සහගිය පදහනින් ප්‍රධන්වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේත් වෙයි.

භාරද්වාජය, මට මෙසේ සිත් වී : "මම අප්‍රාණක වූ මැ ධ්‍යාන වඩනෙම් නම් මනා මැ නු" යි භාරද්වාජය, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාසප්‍රශ්වාස වැළැකීමි. භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළැහූ කල මා ගේ ශීෂයෙහි අධිමාත්‍ර ශිරෝවේදනාවෝ වෙති, භාරද්වාජය, යම්සේ බලවත් පුරුෂයෙක් දළ වරබහනින් හිසෙහි හිස්වෙළුම් බඳනේ වේ ද, එසෙයින් මැ භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළැහූ කල හිසෙහි අධිමාත්‍ර ශිරොවෙදනාවෝ වෙති, භාරද්වාජය, මා විසින් රුකුළු වැර සංලීන නො වෙයි, සිහි එළැඹ සිටියා මුෂිත නො වෙයි. එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක්සහගිය පදහනින් වැරින් විත් කැයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේත් වෙයි.

භාරද්වාජය, මට මෙසේ සිත් වී : "මම අප්‍රාණක වූ මැ දුහැන් වඩනෙම් නම් මනා මැ නු" යි. භාරද්වාජය, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළකීමි, භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළැහූ කල්හි මා ගේ කුස අධිමාත්‍ර වාතයෝ සිඳිත්. භාරද්වාජය, යම්සේ දක්ෂ ගෝඝාතකයෙක් හෝ ගෝඝාතක අතැවැසියෙක් හෝ තිහිණි වූ, ගෙරිකපන කැත්තෙකින් කුස කපන්නේ ද, එසෙයින් මැ භාරදවාජයෙනි, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු අසස්පසස් වැළහූ කල්හි අධිමාත්‍ර වාතයෝ කුස කපත්. එතෙකුදු වත් භාරද්වාජය, මා විසින් වැර රුකුළේ සංලීන නො වෙයි, සිහි එළැඹ සිටියා මුෂිත නො වෙයි, එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන්වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේත් වෙයි.

භාරද්වාජය, මට මෙසේ සිත් වී : "මම අප්‍රාණක වූ මැ ධ්‍යාන වඩනෙම් නම් මනා මැ නු" යි. භාරද්වාජය, මම මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළැකීමි. භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළැහූ කල්හි මාගේ කයෙහි අධිමාත්‍ර දහය වෙයි. භාරදවාජය, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුබුල් මිනිසක්හු වෙන් වෙන් අත්හි ගෙන අඟුරු වළෙක තවන්නාහු ද මොනොවට තවන්නාහු ද, එසෙයින් මැ භාරද්වාජය, මුවිනුදු නැහැයෙනුදු කනිනුදු ආශ්වාස ප්‍රශ්වාස වැළැහූ කල්හි මා ගේ කයෙහි අධිමාත්‍ර දහය වෙයි. එතෙකුදු වත් භාරද්වාජය, මා විසින් ආරබධවීර්‍ය්‍යය සංලීන නො වෙයි. එළැඹසිටි සිහි මුෂිත නො වෙයි, එතෙකුදු වත් මා ගේ කය එ මැ දුක් සහගිය පදහනින් ප්‍රධන් වීර්‍ය්‍යයෙන් විත් කැයේ දරථ සහිත වූයේත් නො සන්හුන්නේත් වෙයි.

අපිස්සු මං භාරද්වාජ, දෙවතා දිස්වා එවමාහංසු: "කාලකතො[1] සමණො ගොතමො"ති. එකච්චා දෙවතා එවමාහංසු: "න කාලකතො සමණො ගොතමො, අපි ච කාලඞ්කරොතී"ති. එකච්චා දෙවතා එවමාහංසු: "න කාලකතො සමණො ගොතමො, න'පි[2] කාලඞ්කරොති. අරහං සමණො ගොතමො, විහාරොත්වෙවෙසො[3] අරහතො එවරූපො හොතී"ති.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යන්නූනාහං සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජෙය්‍යන්"ති. අථ ඛො මං භාරද්වාජ, දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං: "මා ඛො ත්වං මාරිස, සබ්බසො ආහාරූ-පච්ඡෙදාය පටිපජ්ජි. සචෙ ඛො ත්වං මාරිස, සබ්බසො ආහාරූපච්ඡෙදාය පටිපජ්ජිස්සසි, තස්ස තෙ මයං දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහාරෙස්සාම[4] තාය ත්වං යාපෙස්සසී"ති. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: 'අහඤ්චෙව ඛො පන සබ්බසො අජද්ධුකං[5] පටිජානෙය්‍යං, ඉමා ච මෙ දෙවතා දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහාරෙය්‍යුං, තාය චාහං යාපෙය්‍යං, තං මමස්ස මුසා"ති. සො ඛො අහං භාරද්වාජ, තා දෙවතා පච්චා-චික්ඛාමි, හලන්ති වදාමි.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යන්නූනාහං ථොකං ථොකං ආහාරං ආහාරෙය්‍යං පසතං පසතං යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කලායයූසං යදි වා හරෙණුකයූසන්"ති. සො ඛො අහං භාරද්වාජ, ථොකං ථොකං ආහාරං ආහාරෙසිං පසතං පසතං යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කලායයූසං යදි වා හරෙණුකයූසං. තස්ස මය්හං භාරද්වාජ, ථොකං ථොකං ආහාරං ආහාරයතො පසතං පසතං යදි වා මුග්ගයූසං යදි වා කුලත්ථයූසං යදි වා කලායයූසං යදි වා හරෙ-ණුකයූසං අධිමත්තකසිමානං පත්තො කායො හොති. සෙය්‍යථාපි නාම ආසීතිකපබ්බානි වා කාලපබ්බානි වා, එවමෙවස්සු මෙ අඞ්ගපච්චඞ්ගානි භවන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම ඔට්ඨපදං, එවමෙවස්සු මෙ ආනිසදං හොති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම වට්ටනාවලී, එවමෙවස්සු මෙ පිට්ඨිකණ්ටකො උන්නතාවනතො හොති තායෙවප්පා-හාරතාය. සෙය්‍යථාපි නාම ජරසාලාය ගොපානසියො ඔලුග්ගවිලුග්ගා භවන්ති, එවමස්සු මෙ ඵාසුලියො ඔලුග්ගවිලුග්ගා භවන්ති තායෙවප්පා-හාරතාය. සෙය්‍යථාපි නාම ගම්භීරෙ උදපානෙ උදකතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති, එවමෙවස්සු මෙ අක්ඛිකූපෙසු අක්ඛිතාරකා ගම්භීරගතා ඔක්ඛායිකා දිස්සන්ති තායෙවප්පාහාරතාය. සෙය්‍යථාපි නාම

1. කාලඞ්කතො - මජසං.
2. නාපි - මජසං.
3. විහාරොත්වෙව සො - මජසං.
4. අජ්ඣොහාරෙස්සාම - මජසං.
5. අජජ්ජිතං - මජසං

Free Distribution www.aathaapi.org

තවද භාරද්වාජය, දෙවතාවෝ දැක මට මෙසේ කීහ: "ශ්‍රමණ ගෞතම කලුරිය කළහ"යි. සමහර දෙවතාවෝ මෙසේ කීහ : "ශ්‍රමණ ගෞතමයෝ කලුරිය නො කළහ, එතෙකුදු වත් කලුරිය කෙරෙති"යි. සමහර දෙවතාවෝ මෙසේ කීහ : "ශ්‍රමණ ගෞතමයෝ කලුරිය නො කළහ, නො ද කලුරිය කෙරෙති, ශ්‍රමණ ගෞතමයෝ රහත්හ, රහතුන්ට තෙල මෙ බඳු විහාර ඇත්තේ මැ වේ"යයි.

භාරද්වාජය, මට තෙල සිත් වී : "මම සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට පිළිපදනෙම් (බස්නෙම්) නම් මැනැවැ"යි. එකල්හි භාරද්වාජය, දෙවියෝ මා කරා අවුත් තෙල බස් කීහු : "නිදුකාණෙනි, තෙපි සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට නහමක් පිළිපදුව, ඉදින් නිදුකාණෙනි, තෙපි සර්වප්‍රකාරයෙන් ආහාරොපච්ඡෙදයට බස්නහු නම් අපි තොප වහන්සේ ගේ රොමකූපයෙන් දිව්‍යඕජස් ඇතුළු කරම්හ, එයින් තෙපි යැපෙන්නහු යැ"යි. භාරද්වාජය, මට තෙල සිත් වී : "මම වනාහි සර්වප්‍රකාරයෙන් නො වැළඳීම පිළිින කරන්නෙමි, මෙ දෙවියොත් මා ගේ රොමකූපයෙන් දිව්‍යඕජස් බහාලන්නාහ. එයිනුදු මම යැපෙම් නම් ඒ මා ගේ මෘෂා වෙයි, භාරද්වාජය, මම ඒ දෙවියන් ප්‍රතික්ෂෙප කෙරෙමි, 'කම් නැතැ'යි කියමි.

භාරද්වාජය, මට තෙල සිත් වී : "මම මුංයූෂ වේවයි කොල්ලුයූෂ වේවයි කඩලයූෂ වේවයි මැයූෂ වේවයි පතක් පතක් පමණ වූ ටික ටික අහර ගන්නෙම් නම් මනා මැ නු"යි. භාරද්වාජය, ඒ මම මුංයූෂ වේවයි කොල්ලුයූෂ වේවයි කඩලයූෂ වේවයි මැයූෂ වේවයි පතක් පතක් පමණ වූ ටික ටික අහර ගතිමි. භාරද්වාජය, මුංයූෂ වේවයි කොල්ලුයූෂ වේවයි කඩලයූෂ වේවයි මැයූෂ වේවයි පතක් පතක් පමණ වූ මද මද අහර ගන්නා මා ගේ කය අධිමාත්‍ර කෘශත්වයට පැමිණියේ වෙයි. ආසීතික වැල් පුරුක් හෝ කළුවැල් පුරුක් යම්සේ ද, එ මැ අල්පාහාරතායෙන් මා ගේ අඞ්ගප්‍රත්‍යඞ්ගයෝ එ බඳු වෙති. ඔටුපිය යම්සේ ද, එ මැ අල්පාහාරතායෙන් මා ගේ නිසීදනමාංශය එ බඳු වෙයි. කුරුඳුවැල යම්සේ (උස්මිටි) වේ ද, එ මැ අල්පාහාරතායෙන් මා ගේ පිටකටුව (වංශාස්ථිය) එසෙයින් මැ උස්මිටි වෙයි. යම්සේ නම් දිරාගිය ශාලායෙකැ ගොනැස්හු එලුණාහු ඇත මැත එලුණාහු වෙත් ද, එසෙයින් මැ එ මැ අල්පාහාරතායෙන් මා ගේ ඉළ ඇටඑලුණාහු ඇත මැත එලුණාහු වෙති. යම්සේ නම් ගැඹුරු දියවළෙකැ දියතරු ගැඹුරට ගියාහු යටට පිවිසියාහු දක්නා ලැබෙත් ද, එසෙයින් මැ එ මැ අල්පාහාරතායෙන් මා ගේ අක්ෂිකූපයන්හි ඇස්තරු ගැඹුරට ගියාහු යටට පිවිසියාහු දක්නා ලැබෙති. යම්සේ නම් තිත්තලබු එලයක්

Free Distribution www.aathaapi.org

තිත්තකා ලාබු ආමකච්ඡින්නො වාතාතපෙන සම්පුටිතො හොති සම්මිලාතො, එවමෙවස්සු මෙ සීසච්ඡවි සම්පුටිතා හොති සම්මිලාතා තායෙවප්පාහාරතාය. සො ඛො අහං භාරද්වාජ, උදරච්ඡවිං පරාමසිස්සාමී'ති පිට්ඨිකණ්ටකංයෙව පරිග්ගණ්හාමි. 'පිට්ඨිකණ්ටකං පරාමසිස්සාමී'ති උදරච්ඡවිංයෙව පරිග්ගණ්හාමි. යාවස්සු මෙ භාරද්වාජ, උදරච්ඡවි පිට්ඨිකණ්ටකං අල්ලීනා හොති තායෙවප්පාහාරතාය, සො ඛො අහං භාරද්වාජ, 'වච්චං වා මුත්තං වා කරිස්සාමී'ති තත්ථෙව අවකුජ්ජො පපතාමි තායෙවප්පාහාරතාය. සො ඛො අහං භාරද්වාජ, ඉමමෙව කායං අස්සාසෙන්තො පාණිනා ගත්තානි අනුමජ්ජාමි. තස්ස මය්හං භාරද්වාජ, පාණිනා ගත්තානි අනුමජ්ජතො පූතිමූලානි ලොමානි කායස්මා පපතන්ති තායෙවප්පාහාරතාය. අපිස්සු මං භාරද්වාජ, මනුස්සා දිස්වා එවමාහංසු : "කාළො සමණො ගොතමො"ති. එකච්චෙ මනුස්සා එවමාහංසු : "න කාළො සමණො ගොතමො, සාමො සමණො ගොතමො"ති එකච්චෙ මනුස්සා එවමාහංසු : "න කාළො සමණො ගොතමො, න'පි සාමො, මඞ්ගුරච්ඡවි සමණො ගොතමො"ති. යාවස්සු මෙ භාරද්වාජ, තාව පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො උපහතො හොති තායෙවප්පාහාරතාය.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි: "යෙ ඛො කෙචි අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා[1] කටුකා වෙදනා වෙදියිංසු,[2] එතාව පරමං නයිතො භිය්‍යො. යෙ'පි හි කෙචි අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා[1] කටුකා වෙදනා වෙදියිස්සන්ති,[3] එතාව පරමං නයිතො භිය්‍යො. යෙ'පි හි කෙචි එතරහි සමණා වා බ්‍රාහ්මණා වා ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති,[4] එතාව පරමං නයිතො භිය්‍යො. න ඛො පනාහං ඉමාය කටුකාය දුක්කරකාරියාය අධිගච්ඡාමි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. සියා නු ඛො අඤ්ඤො මග්ගො බොධායා"ති?

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි : "අභිජානාමි ඛො පනා'හං පිතු සක්කස්ස කම්මන්තෙ සීතාය ජම්බුච්ඡායාය නිසින්නො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතා. සියා නු ඛො එසො මග්ගො බොධායා"ති. තස්ස මය්හං භාරද්වාජ, සතානුසාරි විඤ්ඤාණං අහොසි : "එසො'ව[5] මග්ගො බොධායා"ති. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි : "කිං නු ඛො අහං තස්ස සුඛස්ස භායාමි, යං තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහී"ති. තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි : "න ඛො අහං තස්ස සුඛස්ස භායාමි, යං තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍ර අකුසලෙහි ධම්මෙහී"ති.

---

1. තිබ්බා ඛරා - මජ්සං.
2. වෙදයිංසු - මජ්සං.
3. වෙදයිස්සන්ති - මජ්සං.
4. වෙදයන්ති - මජ්සං
5. එසෙව - මජ්සං.

තරුණ කල්හි සිඳුනා ලද්දේ වා–අව්වෙන් මලාන වැ හැකුළුණේ වේ ද, එසෙයින් මැ එ මැ අල්පාහාරතායෙන් මා ගේ හිසසිව් මලාන වැ හැකුළුණේ වෙයි. භාරද්වාජය, ඒ මම ‘කුසැසිව් පරාමර්ශ කෙරෙමි’යි පිටකටුව මැ (උදරසිව් හා සමග) ගනිමි. ‘පිටකටුව පිරිමසමි’යි උදරසිව් මැ (පිටකටුව හා සමග) ගනිමි. භාරද්වාජය, එ මැ අල්පාහාරතායෙන් මා ගේ උදරසිව් පිටකටුව තාක් ඇලුණේ වෙයි. භාරද්වාජය, මම එ මැ අල්පාහාරතායෙන් ‘මලකිස හෝ මූකිස හෝ කෙරෙමි’යි එහි මැ මුහුණින් වැටෙමි. භාරද්වාජය, මම මෙ මැ කය අස්වසමින් අත්ලෙන් සිරුරු අවයව පිරිමදිමි, භාරදවාජය, එ මැ අල්පාහාරතායෙන් අතින් ගාත්‍රයන් පිරිමදනා මා ගේ කයින් කුණු වූ මුල් ඇති ලෝමයෝ ගිලිහෙති, තවද භාරද්වාජය, මිනිස්සු මා දක මෙසේ කිහ: “ශ්‍රමණ ගෞතම කළුපැහැ ඇතියහ”යි, ඇතැම් මිනිස්සු මෙසේ කිහ; ශ්‍රමණ ගෞතමයෝ කළුපැහැ නො වෙති. ශ්‍රමණ ගෞතමයෝ සම්වන්හ”යි. සමහර මිනිස්සු මෙසේ කිහ : “ශ්‍රමණ ගෞතමයෝ කළුපැහැ නො වෙති, නො ද සම්වන්හ, ශ්‍රමණ ගෞතම මඟුරුපැහැ ඇතියහ”යි. භාරද්වාජය, මා ගේ පරිශුද්ධ වූ පර්යවදත වූ සිව්පැහැ එ මැ අල්පාහාරතායෙන් එතෙක් නටුයේ වෙයි.

භාරද්වාජය, මට තෙල සිත් වී : අතීතකාලයෙහි යම්කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවෙදනා වින්දහු නම් (එ වෙදනාව) මේ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. අනාගතකාලයෙහි දු යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක වෙදනා විඳුනාහු නම් මේ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. මෙ කල්හි දු යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඖපක්‍රමික වූ තීව්‍ර කටුක දුඃඛවෙදනා විඳිත් නම් මේ මැ පරම කොට ඇති, මෙයින් වැඩි නො වෙයි. මම වැළිත් මේ කටුක වූ දුෂ්කරක්‍රියායෙන් මනුෂ්‍යධර්මයෙන් මතු ආර්යභාවකරණයට සමර්ථ ඥානදර්ශනවිශෙෂයක් නො ලබමි. සම්බොධයට අනෙක් මාර්ගයෙක් ඇද්දැ ? යි.

භාරද්වාජයෙනි, මට තෙල සිත් වී : “මම වනාහි පිතෘශාක්‍යයන්ගේ කමත්හි සිහිල් දඹසෙවනෙහි හුන්නෙම් කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ප්‍රථමධ්‍යානය උපයා වාස කෙළෙම් දනිම් මැ යැ. තෙල සම්බෝධයට මාර්ග වන්නේ ද? යි. භාරද්වාජය, මට සතානුසාරි (සිහිය අනුව යන) විඥානය පහළ විය. ‘තෙලෙ මැ සම්බොධයට මාර්ග වේ යැ’යි. භාරද්වාජය, මට තෙල සිත් වී : “කිමෙක් ද මම කාමයෙන් වෙන් වැ මැ අකුශල ධර්මයෙන් වෙන් වැ මැ යම් සුඛයෙක් වේ නම් ඒ සුඛයට බිය වෙම් ද ?”යි. භාරද්වාජය, එ මට තෙල සිත් වී : “කාමයෙන් වෙන් වැ මැ අකුශලධර්මයෙන් වෙන් වැ මැ යම් සුඛයෙක් වේ නම් මම ඒ සුඛයට බිය නො වෙම් මැ”යි.

තස්ස මය්හං භාරද්වාජ, එතදහොසි. "න ඛො තං සුකරං සුඛං අධිගන්තුං එවං අධිමත්තකසිමානං පත්තකායෙන. යන්නූනාහං ඔළාරිකං ආහාරං ආහාරෙය්‍යං ඔදනකුම්මාස"න්ති. සො ඛො අහං භාරද්වාජ, ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං. තෙන ඛො පන මං භාරද්වාජ, සමයෙන පඤ්චවග්ගියා භික්ඛූ පච්චුපට්ඨිතා හොන්ති, "යං ඛො සමණො ගොතමො ධම්මං අධිගමිස්සති, තං නො ආරොචෙස්සතී"ති. යතො ඛො අහං භාරද්වාජ ඔළාරිකං ආහාරං ආහාරෙසිං ඔදනකුම්මාසං. අථ මෙ තෙ පඤ්චවග්ගියා භික්ඛූ නිබ්බිජ්ජ පක්කමිංසු "බාහුලිකො[1] සමණො ගොතමො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලායා"ති.

සො ඛො අහං භාරද්වාජ, ඔළාරිකං ආහාරං ආහාරෙත්වා බලං ගහෙත්වා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ අනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ භාරද්වාජ, රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විහතො අලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. -පෙ- අයං ඛො මෙ භාරද්වාජ, රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

---

1 බාහුල්ලිකො - මජසං.

භාරද්වාජය, මට තෙල සිත් වී: "මෙසේ අධිමාත්‍ර කෘශභාවයට ගිය කයින් ඒ සුඛය ලබන්නට සුකර නො වෙයි, මම ඔදනකුම්මාස සඞ්ඛ්‍යාත ඖළාරික අහර වළඳනෙම් නම් මනා මැ නු"යි. භාරද්වාජය, මම ඔදනකුම්මාස සඞ්ඛ්‍යාත ඖළාරික අහර වැළඳුයෙමි. භාරදවාජය, එසඳ පස්වග මහණහු 'මහණ ගොයුම්හු යම් දහමක් අධිගම කෙරෙත් ද, එ දහම අපට පවසති' මට උවැටන් කළාහු වෙති. භාරද්වාජය, යම් දිනෙකැ මම බත්කොමු-පිඩු සඞ්ඛ්‍යාත ඖළාරික අහර වැළඳුයෙම් ද, එකල ඒ පස්වග මහණහු මට කළකිරී නික්ම ගියහ. "මහණ ගොයුම්හු බාහුලිකයහ, ප්‍රධනින් ගිලිහුණහ, ප්‍රත්‍යය බාහුල්‍යයට වැටුණහ' යි කියා යි.

භාරද්වාජය, ඒ මම ඖළාරික අහර වළඳා කායබල ගෙන කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යාන උපයාගෙන විසීමි, විතර්කවිචාරයන් ගේ ව්‍යුපශමයෙන් . . . ද්විතීය ධ්‍යානය . . . තෘතීයධ්‍යානය . . . චතුර්ථධ්‍යානය උපදවා ගෙන විසීමි.

මම මෙසේ සමාහිතචිත්තය පරිශුද්ධ වැ පර්‍ය්‍යවදත වැ අනඞ්ගණ වැ විගතොපකෙලශ වැ මෘදු වැ කර්මණ්‍ය වැ ස්ථිත වැ නිශ්චලප්‍රාප්ත වැ සිටි කල්හි ඒ සිත පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස නතු කෙළෙමි. මම අනෙකවිධ පූර්වේනිවාසය සිහි කරමි. ඒ කෙසේ යැ යත්: එක් ජාතියකුදු දෙජාතියකුදු . . . මෙසේ සාකාර සොද්දෙශ අනෙප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරෙමි, භාරද්වාජය, මා විසින් රැය පළමු යමහි මේ පළමු විද්‍යාව අධිගත යැ, අවිද්‍යා විහත වූ විද්‍යා උපන, තමස විහත විය, ආලොකය උපන, අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ කායජීවිත නිරපෙක්‍ෂක වැ වසනුවක්හට යම්සේ වේ ද එසෙයිනි.

මෙසේ මම පරිශුද්ධ පර්‍ය්‍යවදත අනඞ්ගණ විගතෝපකෙලශ මෘදුභූත කර්මක්‍ෂම ස්ථිත නිශචලප්‍රාප්ත සමාධිගත චිත්තය ඇති වත් මැ එ සිත සත්ත්වයන්ගේ ච්‍යුතූපපාතඥානය පිණිස නතු කෙළෙමි. මම පිරිසුදු වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දක්මි. කම් වූ පරිදි ගිය සතුන් දන්මි . . . භාරද්වාජය, මා විසින් රැය මැදුම් යමැ මේ දෙවන විද්‍යා අධිගත වූ, අවිද්‍යා විහත වූ, විද්‍යා උපන, තමස විහත වී, ආලෝකය උපන. අප්‍රමත්ත වැ ආතාපන වීර්‍ය්‍ය ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වාස කරන යෝගාවචරයක්හට යම්සේ වේ ද, එසෙයිනි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං. -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං. -පෙ- අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ. භවාසවාපි චිත්තං විමුච්චිත්ථ. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසිං. අයං ඛො මෙ භාරද්වාජ, රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතොති.

එවං වුත්තෙ සඞ්ගාරවො මාණවො භගවන්තං එතදවොච: අට්ඨිතවතං භොතො ගොතමස්ස පධානං අහොසි. සප්පුරිසවතං භොතො ගොතමස්ස පධානං අහොසි, යථා තං අරහතො සම්මාසම්බුද්ධස්ස.

කින්නු ඛො භො ගොතම, අත්ථි දෙවාති. ඨානසො මෙතං භාරද්වාජ, විදිතං යදිදං අත්ථි දෙවාති.

කින්නු ඛො භො ගොතම, අත්ථි දෙවාති පුට්ඨො සමානො, ඨානසො මෙතං භාරද්වාජ, විදිතං යදිදං අත්ථි දෙවාති[1] වදෙසි? න නු ඛො භො ගොතම, එවං සන්තෙ තුච්ඡා[2] මුසා හොතී'ති.

අත්ථි දෙවා'ති භාරද්වාජ, පුට්ඨො සමානො, අත්ථි දෙවා'ති යො වදෙය්‍ය. ඨානසො මෙ විදිතාති යො වදෙය්‍ය, අථ ඛෙවත්ථ විඤ්ඤුනා පුරිසෙන[3] එකංසෙන නිට්ඨං ගන්තබ්බං[4] යදිදං අත්ථි දෙවාති.

කිස්ස පන මෙ භවං ගොතමො, ආදිකෙනෙව න බ්‍යාකාසීති.

උච්චෙන සම්මතං ඛො එතං භාරද්වාජ, ලොකස්මිං යදිදං අත්ථි දෙවා'ති.

---

1. අධිදෙවාති - සීමු.
2. තුච්ඡා - සීමු.
3. විඤ්ඤුපුරිසෙන PTS, ස්‍යා.
4. ගන්තුං වා - ස්‍යා.

Free Distribution www.aathaapi.org

මෙසේ මම සමාහිත සිත පිරිසුදු වැ ප්‍රභාස්වර වැ නිරඞ්ගණ වැ පහවූ උපක්ලේශ ඇති ව මොළොක් වැ කර්මණ්‍ය වැ ස්ථිත වැ නිසල බවට පැමිණ සිටි කල්හි ආස්‍රවක්ෂයඥනය පිණිස සිත නතු කෙළෙමි, මම 'මේ දුකැ'යි ඇති සැටියෙන් දත්මි . . . මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත් යැ'යි ඇති සැටියෙන් දත්මි. 'මොහු ආස්‍රවයහ'යි ඇති සැටියෙන් දත්මි . .. මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත් යැ'යි ඇති සැටියෙන් දත්මි. මෙසේ දන්නා මෙසේ දක්නා මා ගේ සිත කාමාස්‍රවයෙනුදු මිදිණ. සිත භවාස්‍රවයෙනුදු මිදිණ. සිත අවිද්‍යාස්‍රවයෙනුදු මිදිණ. මිදුත් මැ 'මිදිණැ'යි නුවණ විය. ජාති ක්ෂීණ වූ, බඹසරවස් වැස නිමවන ලද, කරණී කරනලදි. මේ රහත් බවට අන් කිසෙක් නැතැ'යි දතිමි. භාරද්වාජය, මා විසින් රැය පැසුළු යමැ මේ තුන් වන විද්‍යා අධිගත යැ. අවිද්‍යා විහත වූ යැ, විද්‍යා උපන, තමස විහත වී, ආලොකය, උපන. නො පමාව කෙලෙස් තවන වැර ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වාස කරන යෝගාවචරයක්හට යම්සේ වේ ද එසෙයිනි.

මෙසේ වදළ කල්හි සඞ්ගාරව මාණවක භාග්‍යවතුන් වහන්සේට මෙතෙල කරුණ සැල කෙළේ : "භවත් ගෞතමයන් වහන්සේ ගේ අස්ථිත (නො සිටි) ප්‍රධානයෙක් මැ විය, භවත් ගෞතමයන් වහන්සේ ගේ සත්පුරුෂ ප්‍රදහනයෙක් මැ වී. අර්හත් සම්‍යක් සම්බුද්ධයක්හට යම්සේ ද එසෙයිනි.

කිම භවත් ගෞයුම්ගොතුවෙනි, දෙවියෝ ඇද්ද? යි. භාරද්වාජය, 'දෙවියෝ ඇද්ද, යන යමක් වේ ද, තෙල මා විසින් කරුණු විසින් දන්නා ලද.

කිම භවත් ගෞතමයන් වහන්ස, 'දෙවියෝ ඇද්දැ'යි පුළුවුස්නා ලද්දහු "භාරද්වාජය, 'දෙවියෝ ඇද්ද? යන යමක් වේ ද තෙල කරුණ මා විසින් කරුණු විසින් දන්නාලද්ද"යි කියව, භවත් ගෞතමයෙනි, මෙසේ ඇති කල්හි සිස් මුසවා නො මැ වේ නු? යි.

භාරද්වාජය, 'දෙවියෝ ඇද්දැ'යි පුළුවුස්නාලද යමෙක් 'දෙවියෝ ඇතැ'යි කියන්නේ ද, යමෙක් 'මා විසින් කරුණු හෙයින් දන්නාලද්දැ'යි කියන්නේ ද, එසඳ මෙහි නුවණැති පුරුෂයක්හු විසින් 'දෙවියෝ ඇත' යන මෙ කරුණ ඒකාන්තයෙන් නිෂ්ඨාවට යායුතු යැ.

කුමක් හෙයින් මට භවත් ගෞතමයෝ මුලදී මැ ප්‍රකාශ නො කළාහු ද? යි.

භාරද්වාජය, ලෝකයෙහි 'දෙවියෝ ඇද්ද' යන යමක් වේ ද තෙල කරුණ උස්හඬින් සම්මත යැ : යි.

එවං වුත්තෙ සඞ්ගාරවො මාණවො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණඞ්ගත'න්ති.

සඞ්ගාරවසුත්තං දසමං

බ්‍රාහ්මණවග්ගො පඤ්චමො

තස්ස වග්ගස්ස උද්දානං

බ්‍රහ්මායු සෙලස්සලායනො, ඝොටමුඛො ච බ්‍රාහ්මණො
එසු චඞ්කී ධනඤ්ජානි වාසෙට්ඨො සුභ ගාරවොති.

ඉදං වග්ගාන'මුද්දානං

වග්ගො ගහපති භික්ඛු පරිබ්බාජකනාමකො
රජවග්ගො බ්‍රාහ්මණොති පඤ්ච මජ්ඣිමආගමෙ.

මජ්ඣිමපණ්ණාසකං සමත්තං

මෙසේ වදළ කල්හි සඞ්ගාරව මාණවක භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''හවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යැ, හවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යි. යම්සේ හවත් ගොයුම් ගොතුවෙනි, යටිහුරු කරනලද්දක් හෝ උඩුහුරු කරන්නේ ද, පිළිසන් දයක් හෝ විවර කරන්නේ ද, මං මුළා වූවක්හට මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තාහු රූප දකිත්ව'යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එ පරිදි මැ හවත් ගෞතමයන් විසින් නොයෙක් අයුරින් දහම් පවසනලද, තෙල මම් හවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යෙමි, දහම් හා සඟුන් හා සරණ කොට යෙමි, හවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් වැ සරණ ගිය උපාසකයකු කොට ධරනසේක්ව'යි.

දස වැනි සඞ්ගාරවසූත්‍ර යි.

පස් වැනි බ්‍රාහ්මණවර්ග යි.

ඒ වර්ගයෙහි උද්දානය :

බ්‍රහ්මායු සූත්‍ර යැ සේලසූත්‍ර යැ අස්සලායනසූත්‍ර යැ ඝෝටමුඛසූත්‍ර යැ චඞ්කීසූත්‍ර යැ ඒසුකාරී සූත්‍ර යැ ධනඤ්ජානිසූත්‍ර යැ වාසෙට්ඨසූත්‍ර යැ සුභසූත්‍ර යැ සඞ්ගාරවසූත්‍ර යැ යි.

මේ වර්ගයන්ගේ උද්දානය :

ගහපතිවර්ග යැ භික්ඛුවර්ග යැ පරිබ්බාජකවර්ග යැ රාජවර්ග යැ බ්‍රාහ්මණවර්ග යැ යි මජ්ඣිමාගමයෙහි වර්ග පසෙකි.

මජ්ඣිමපණ්ණාසකය සමාප්ත යි.

මජ්ඣිමනිකායෙ මජ්ඣිමපණ්ණාසකො

අනුක්කමණිකා

ගාථාදිපාදානුක්කමණිකං 763 – 768

සඤ්ඤානාමානුක්කමණිකං 769 – 773

විසෙසපදානුක්කමණිකං 774 – 782

ගාථාදිපාදානුක්කමණිකා

පිට්ඨඞ්කං

අ

අකක්කසං විඤ්ඤාපනිං 706
අකට්ඨකපිස්ස තුසිතස්ස 80
අක්කොධනං වතවන්තං 706
අක්කොසං වධබන්ධං ච 706
අග්ගිහුත්තමුඛා යඤ්ඤා 606
අඤ්ජනීව නවා චිත්තා 434
අට්ඨිපාදකතා කෙසා 434
අඩ්ඪා දලිද්දා ච ඵුසන්ති ඵස්සං 408
අනුඤ්ඤාතපටිඤ්ඤාතා 702
අපාරුතා තෙසං අමතස්ස ද්වාරා 504
අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං 592,604
අරහං හො කථං හොති 592
අරියස්ස භාවිතත්තස්ස 80
අලත්තකකතා පාදා 434
අවිරුද්ධං විරුද්ධෙසු 706
අසංසට්ඨං ගහට්ඨෙහි 706
අසංසයස්ස කුලස්ස 80
අහං හි අරහා ලොකෙ 506
අහිංසකොති මෙ නාමං 526

ආ

ආරොග්‍යපරමා ලාභා 298, 300
ආසා යස්ස න විජ්ජන්ති 706

ඉ

ඉතෙව චොරෙ අසිආවුධඤ්ච 518
ඉමං හොන්තො නිසාමෙථ 604
ඉසිසත්තමස්ස අකුහස්ස 80

උ

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම 502
උදකං හි නයන්ති නෙත්තිකා 526
උපධී තෙ සමතික්කන්තා 608
උපෙති ගබ්භං ච පරං ච ලොකං 408
උසභං පවරං වීරං 708

පිට්ඨඞ්කා

එ

එතං වෙ රූපවති හොතො 606
එවමෙතං යථාභූතං 710

ඔ

ඔදහි මිගවො පාසං 434

ක

කච්චි කොසොහිතං හොතො 590
කච්චි පහූතජ්වෙහාති 590
කථං හො බ්‍රාහ්මණො හොති 592
කන්දන්ති තං ඤාති පකිරිය කෙසෙ 448
කම්මනා වත්තති ලොකො 710
කල්‍යාණදස්සනො භික්ඛු 604
කස්සකො කම්මනා හොති 710

කා

කාමා හි චිත්‍රා මධුරා මනොරමා 450

කි

කිච්ඡෙන මෙ අධිගතං 500

කො

කො නු සෙනාපති හොතො 604

ඛ

ඛත්තියා හොගී රාජානො 604
ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං 36

ග

ගච්ඡං වදෙසි සමණ ඨිතොම්හි 518
ගම්භීරපඤ්ඤං මෙධාවිං 706

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

ච

චතුප්පදෙපි ජානාථ 702
චන්දං යථා ඛයාතීතං 702
චන්දංව විමලං සුද්ධං 706

චි

චිත්තං විසුද්ධං ජානාති 592
චිරස්සං වත මෙ මහිතො මහෙසී 518

චු

චුතිං යො වෙදි සත්තානං 708

චො

චොරෙ අහං පුරෙ ආසිං 526
චොරෙපි කම්මනා හොති 708
චොරෙ යථා සන්ධිමුඛෙ ගහිතො 448

ජෙ

ජෙත්වා නන්දිං වරත්තං ච 704

ජා

ජාතියා බ්‍රාහ්මණො හොති 702

ඤා

ඤාතො අහං අඞ්ගුලිමාල සබ්බදා 518

ත

තණ්හච්ඡිදස්ස බුද්ධස්ස 80
තතො කීටෙ පටඞ්ගෙ ච 702
තතො පක්ඛීපි ජානාථ 702
තතො මච්ඡෙපි ජානාථ 702
තපෙන බ්‍රහ්මචරියෙන 710
තස්මා හි පඤ්ඤාව ධනෙන සෙය්‍යො 448

තා

තාදිසං කම්මං කත්වාන 526

ති

තිණරුක්ඛෙපි ජානාථ 702

තී

තීහි විජ්ජාහි සම්පන්නො 710

පිට්ඨඞ්කං

තු

තුවං බුද්ධො තුවං සත්ථා 608

තෙ

තෙ න සක්කොම ඤාපෙතුං 702
තෙවිජ්ජානං යදක්ඛාතං 702
තෙසං නො ජාතිවාදස්මිං 702
තෙසං වොහං ව්‍යාචික්ඛිස්සං 702

ද

දණ්ඩෙනෙකෙ දමයන්ති 526

දා

දායාදකා තස්ස ධනං හරන්ති 448

දි

දිට්ඨධම්මහිතත්ථාය 590, 592
දිසා හි මෙ ඛන්තිවාදානං 526
දිසා හි මෙ ධම්මකථං සුණන්තු 526

දී

දීඝරත්තමනුසයිතං 708

දු

දුමප්ඵලානීව පතන්ති මාණවා 450

ධ

ධම්මචක්කං පවත්තෙතුං 506

ධී

ධීරස්ස විගතමොහස්ස 80

න

නක්ඛත්තානං මුඛං චන්දො 606
න කෙසෙහි න සීසෙහි 704
න ගීවාය න අංසෙහි 704
න චාහං බ්‍රාහ්මණං බ්‍රූමි 704
න ජච්චා බ්‍රාහ්මණො හොති 708
න දීඝමායුං ලභතෙ ධනෙන 448
න මෙ ආචරියො අත්ථි 506
නරස්ස හි සුජාතස්ස 604
න හත්ථෙහි න පාදෙහි 704
නහි ජාතු සො මමං හිංසෙ 526

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

නා

නාගස්ස පත්තනෙතස්ස 80

නි

නිධාය දණ්ඩං භූතෙසු 706
නිසභස්ස අප්පමෙය්‍යස්ස 80

ප

පච්චත්තං ච සරීරෙසු 704
පටිසොතගාමිං නිපුණං 500
පමාදමනුයුඤ්ජන්ති 526
පරිපුණ්ණකායො සුරුචි 604
පස්ස චිත්තකතං බිම්බං 434
පස්ස චිත්තකතං රූපං 434
පස්සාමි ලොකෙ සධනෙ මනුස්සෙ 446
පසන්නනෙත්තො සුමුඛො 604

පා

පාතුරහොසි මගධෙසු පුබ්බෙ 502
පාදුද්දරෙපි ජානාමි 702

පු

පුබ්බෙනිවාසං යො වෙදි 592, 708

බ්‍ර

බ්‍රහ්මභූතං අතිතුලං 606
බ්‍රහ්මභූතො අතිතුලො 604, 606
බ්‍රාහ්මණා තිසතා ඉමෙ 606

බු

බුද්ධො ච ඛො කාරුණිකො මහෙසි 520

භි

භික්ඛවො තිසතා ඉමෙ 608

ම

මයා පවත්තිතං චක්කං 604

පිට්ඨඞ්කා

මා

මාදිසා වෙ ජිනා හොන්ති 506
මා පමාදමනුයුඤ්ජෙථ 526

ය

යථා එතාසු ජාතිසු 702
යස්ස ගතිං න ජානන්ති 708
යස්ස පාපං කතං කම්මං 526
යස්ස පුරෙ ච පච්ඡා ච 708
යස්ස රාගො ච දොසො ච 706
යස්සාලයා න විජ්ජන්ති 706
යං තං සරණමාගම්ම 706

යෙ

යෙ තෙ ඡත්තිංසාති සුතා 592
යෙ මෙ ඡතිංසාති සුතා 590
යෙසං වෙ දුල්ලභො ලොකෙ 604

යො

යො ඉමං පලිපථං දුග්ගං 708
යො ච දීඝං ච රස්සං ච 706
යො ච පුබ්බෙ පමජ්ජිත්වා 524
යො දුක්ඛස්ස පජානාති 706
යොධ කාමෙ පහත්වාන 708
යොධ තණ්හං පහත්වාන 708
යොධ පුඤ්ඤං ච පාපං ච 706
යො මං ඉච්ඡති අන්වෙතු 606
යො හවෙ දහරො භික්ඛු 526
යො හි කොචි මනුස්සෙසු 704

රා

රාජා අරහසි භවිතුං 604
රාජා ච අඤ්ඤෙ ච බහූ මනුස්සා 446
රාජා පසය්හ පථවිං විජිත්වා 446
රාජාහමස්මි සෙලාති 604

ලො

ලොහිතපාණී පුරෙ ආසිං 526

පිට්ඨඞ්කා

වා

වාරිපොක්ඛරපත්තෙව 706

වි

විනයස්සු මයි කඞ්ඛං 604

ස

ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං 606
සත්තස්ස භූරිපඤ්ඤස්ස 80
සබ්බසඤ්ඤොජනං ඡෙත්වා 704
සබ්බාභිභූ සබ්බවිදූහමස්මි 506
සමඤ්ඤා හෙසා ලොකස්මිං 708
සම්බුද්ධො පටිජානාසි 604
සම්මග්ගතස්ස ඣායිස්ස 80

පිට්ඨඞ්කා

සා

සාගතං නාපගතං 528

සෙ

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො 502

සො

සො ඣායති සූලෙහි තුජ්ජමානො 448

හි

හිත්වා මානුසකං යොගං 708
හිත්වා රතිං ච අරතිං 708

සඤ්ඤානාමානුක්කමණිකා

පිට්ඨඞ්කං

අ

අඞ්ග 644
අඞ්ගීරස 656, 718
අඞ්ගුත්තරාප 38, 190, 598
අඞ්ගුලිමාල 516
අචිරවතී 542
අජාතසත්තු 546
අට්ඨක 656, 718
අත්තභාර 332
අනාථපිණ්ඩික 142, 152, 164, 174, 256, 336, 394, 516, 530, 540, 570, 610, 668, 712
අනුරුද්ධ 216
අභය 92
අම්බලට්ඨිකා 130
අස්සජි-පුනබ්බසුක 236
අස්සලායන 610
අසිත 622
අහිංසක 526

ආ

ආකාසගොත්ත 564
ආනන්ද 20, 30, 100, 166, 216, 308, 404, 418, 452, 482, 540
ආපණ 38, 190, 598
ආළාරකාලාම 484, 504, 740
ඉච්ඡානඞ්ගල 700
ඉසිදත්ත-පුරාණ 558
ඉසිපතන 410, 504

උ

උග්ගමාන 366
උජ්ජුක 562
උත්තර 578
උද්දකරාමපුත්ත 486, 504, 742

පිට්ඨඞ්කං

උ

උදායි 100, 190, 378
උදෙන 628
උපක 64
උපාලි 62, 628
උරුවෙලා 504, 744

එ

එකපුණ්ඩරීක 252, 540
එසුකාරී 668, 678

ඔ

ඔපමඤ්ඤ 718
ඔපසාද 644

ක

කණ්ණකත්ථල 562
කන්දරක 2
කපිලවත්ථු 28
කම්මාස්සදම්ම 288
කම්බොජ 612
කලාරජනක 462
කස්සප 404, 656, 718
කාපථික 654
කාලිඞ්ගාරඤ්ඤ 68
කාසි 236, 538
කිකී 410
කිම්බිල 216
කිසසඞ්කිච්ච 230

කී

කීටාගිරි 236

කු

කුණ්ඩධාන 216
කුරු 288, 420

50—ජෝ 13561 (72/11)

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

කූ

කූටාගාරසාලා 252

කෙ

කෙණිය 598

කො

කොකනද 480
කොරබ්‍ය 436
කොලිය 84, 404
කොසම්බි 308
කොසල 108, 216, 404, 540, 550, 562, 646, 736

ඛෙ

ඛෙමියම්බවන 628

ග

ගඞ්ගා 522
ගග්ගරාපොක්ඛරණී 2
ගඞ්ගානදී 274, 432

ගි

ගිජ්ඣකූට 280

ගු

ගුන්දාවන 466
ගුලිස්සානි 228

ගො

ගොතම 256, 266, 332, 420, 576, 610, 642, 646, 668, 710, 712, 736

ඝ

ඝටිකාර 404

ඝො

ඝොටමුඛ 628, 642
ඝොටමුඛී 644
ඝොසිතාරාම 308

පිට්ඨඞ්කං

ච

චඞ්කී 646, 700, 720
චම්පා 2, 4
චාතුම්මහාරාජික 696
චාතුමා 206

ජා

ජානුස්සොණි 700, 720, 732

ජී

ජීවක 54

ජෙ

ජෙතවන 142, 152, 164, 174, 256, 366, 394, 516, 530, 540, 610, 668, 712

ජො

ජොතිපාල 404

ත

තණ්ඩුලපාලද්වාර 680

තා

තාරුක්ඛ 700, 720
තාවතිංස 696

ති

තින්දුකාචීර 366

තු

තුසිත 696

තො

තොදෙය්‍ය 700, 712, 720, 736

ථු

ථුල්ලකොට්ඨිත 420

ද

දක්ඛිණාගිරි 680
දණ්ඩකාරඤ්ඤ 68
දසමගහපති 20, 26

පිට්ඨඞ්කා

දී

දීඝකාරායන 550
දීඝතපස්සී 60
දීඝනඛ 280

දෙ

දෙවකූටසොභිත 308
දෙවල 622
දෙවවන 646

ධ

ධනඤ්ජානි 680
ධනඤ්ජානී 736

න

නන්දවච්ඡ 330
නලකපාන 216
නළකාරගාම 728

නා

නාගරක 550
නාලන්දා 60
නාලිජඞ්ඝ 532

නි

නිග්‍රොධාරාම 28
නිගණ්ඨනාතපුත්ත 60, 92
නිම්මාණරතී 696
නිමි 458

ප

පඤ්චකඞ්ගථපති 100
පරනිම්මිතවසවත්තී 696
පසෙනදි 516, 520, 532, 540, 550, 562, 648, 734

පා

පාටලිපුත්ත 20, 644
පාටලිපුත්තක 26
පාවාරිකම්බවන 60

පි

පිලක්ඛගුහා 308

පිට්ඨඞ්කා

පු

පුණ්ණ 84

පූ

පූරණකස්සප 334

පෙ

පෙස්ස 2

පො

පොක්ඛරසාති 648, 700, 720
පොතලිය 38

බ්‍ර

බ්‍රහ්මායු 576

බා

බාරාණසී 410, 504, 628
බාහිතික 546

බො

බොධිරාජකුමාර 480

බි

බිම්බිසාර 520, 600

බෙ

බෙලුවගාම 20

භ

භග්ග 480
භග්ගව 414
භගු 216, 656, 718
භද්දිය 216
භද්දාලි 174

භා

භාරද්වාජ 656, 700, 718
භාරද්වාජගොත්ත 290

භෙ

භෙසකලාවන 480

පිට්ඨඞ්කා

ම

මක්ඛලිගොසාල 308, 336
මඛාදෙව 452, 588
මගධ 744
මණ්ඩලකප්ප 736
මධුර 466
මන්තානි 522
මනොසත්ත 66
මල්ලිකා 366, 532
මහාකච්චාන 466
මහානාම 30
මහාවන 252

මා

මාගධ 520
මාගන්දිය 288
මාතඞ්ගාරඤ්ඤ 68
මාතලි 460
මාධුර 466
මාලුඞ්ක්‍යපුත්ත 152, 164

මි

මිගව 452, 576
මිගාචිර 436

මෙ

මෙජ්ඣාරඤ්ඤ 68
මෙදතළුම්ප 550

මො

මොග්ගල්ලාන 206, 234
මොරනිවාප 332, 376

ය

යමතග්ගි 656, 718

යා

යාම 696

යො

යොන 612

පිට්ඨඞ්කා

ර

රට්ඨපාල 420

රා

රාජගහ 54, 92, 130, 228, 266 280, 376, 680
රාහුල 130, 142

රෙ

රෙවත 216

රෝ

රෝරුව 158

ල

ලටුකිකා 194

ලි

ලිච්ඡවි 520

ව

වච්ඡගොත්ත 252, 266
වජිරී 536
වරධර 332

වා

වාමක 656, 718
වාමදෙව 656, 718
වාසභක්ඛත්තියා 536
වාසෙට්ඨ 656, 700, 718

වි

විඩූඩභ 536, 564
විදෙහ 458, 576

වෙ

වෙඛනස්ස 394
වෙස්සාමිත්ත 656, 718
වෙසාලි 20, 252
වෙසාලික 26
වෙහලිඞ්ග 404, 412
වෙළුවන 92, 130, 228, 332, 266, 376, 680

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

ස

සක්ක 28, 458, 460, 550
සකුලා 562
සකුලුදායි 332, 376
සඞ්ගාරව 736
සඤ්ජය 564
සඤ්ජිකාපුත්ත 480
සන්දක 308
සනඞ්කුමාර 36
සමණමණ්ඩිකාපුත්ත 284
සහම්පති 502
සාරිපුත්ත 206, 228, 284, 680
සාලා 108
සාවත්ථි 142, 152, 164, 256, 366, 394, 428, 516, 530, 540, 610, 668, 712

පිට්ඨඞ්කං

සි

සිපිලහත්ථු 156
සිරිවඩ්ඪ 540

සු

සුධම්ම 460
සුභ 712
සුභගවනිය 718
සුංසුමාරගිර 480

සෙ

සෙනානිගාම 744
සෙනිය 84
සෙල 600

සො

සොමා 562

හ

හලිද්දවසන 84

විසෙසපදානං අනුක්කමණිකා

පිට්ඨඞ්කො

අ

අක්ඛස්ස 156
අක්ඛිහාරකො 76
අකක්කසං 706
අකටවිධා 316, 318
අකටා 316, 318
අකසිරලාභී 30
අකිච්ඡලාභී 30
අඞ්කුසග්ගහො 510
අඞ්ගාරකාසුයා 294, 296
අච්චුක්කට්ඨං 586
අච්ඡිද්දං 384, 386
අචෙලකො 634
අජ්ඣොසානාය 282
අජ්ඣුකං 496, 752
අඤ්ජනං 302
අඤ්ඤතිත්ථියා 26
අඤ්ඤාරධනා 248
අට්ටකරණෙ 554
අට්ඨපාදකතා 434
අට්ඨපුරිසභූමියො 318
අට්ඨිකඞ්කලං 46
අටලියො 622
අඩ්ඪකම්මෙ 318
අත්තන්තපො 6, 10, 630, 636
අත්තාණො 440
අතක්කාවචරෙ 660
අද්ධුවං 582
අධිමත්තකසිමානං 752
අධිසයිතානි 34
අධොවිරෙචනං 302
අනත්තවා 256

පිට්ඨඞ්කො

අ

අනඛවෙණී 656, 718
අනන්තරහිතාය 426
අනන්තවා 256, 258
අනභිස්සරො 440
අනලං 204
අනස්සාසිකං 324
අනාළ්හියො 196
අනිම්මාතා 316, 318
අනුපුබ්බපටිපදා 248
අනුමත්තෙසු වජ්ජෙසු 30
අනුවිච්චකාරං 70
අනුස්සවිකො 322
අනුස්සවො 656
අනෙකධාතුපටිවෙධාය 274
අප්පටිවිනීතො 166
අප්පමාදඵලං 242
අප්පරජක්ඛජාතිකා 502
අප්පාටිහීරකං 380, 394
අප්පාණකං ඣානං 492, 748
අප්පොස්සුක්කා 194, 196
අපණ්ණකො ධම්මො 108
අපරප්පච්චයා 268
අපහත්තා 190
අපාපපුරෙක්ඛාරෙ 650
අපුච්චණ්ඩතාය 32
අපූතිකං බන්ධනං 192, 198
අබ්භුතං 192
අබ්භුය්‍යාතෙ 558
අබ්භුසිතෙන 312, 314, 316
අබලා 314, 316
අභිජාතිසු 314, 316
අභිඤ්ඤාපාරමිවොසානප්පත්තා 346, 348

Free Distribution www.aathaapi.org

	පිට්ඨඞ්කං
අ	
අභිඤ්ඤාය	464
අභිදො	384, 398
අභිදොසකාලකතො	504
අභිවිනයෙ	232
අමතද්වාරං	26
අමරාවික්ඛෙපං	324
අයුද්ධපරජිතං	610
අයොපිණ්ඩං	368, 370
අයොසිඞ්ඝාටකං	92
අරියකන්තානි	412
අරුකායං	434
අරුගත්තො	294, 296
අවක්කන්ති	624
අවගුතා	730
අවසා	314, 316
අවිනිපාතධම්මො	222
අවිරියා	314, 316
අවෙච්චප්පසාදෙන	412
අලක්ඛිකා	338
අලමත්තො	440
අසඤ්ඤිගබ්භා	318
අස්සකො	196
අසස්සතො	256, 258
අසහිතං	196
අඤ්ඤින්ද්‍රියං	358
ආ	
ආකාරවතී පටිපදා	384
ආකාසානඤ්චායතනං	24, 740
ආඛිලායති	28
ආගුචාරිං	474
ආචරියධනං	26
ආචාමභක්ඛා	634
ආචාරගොචරසම්පන්නො	30
ආචිණ්ණං තෙ	336
ආජඤ්ඤං	458
ආතුමාරි	192
ආදිබ්‍රහ්මචරියං	738
ආනන්දරූපො	572

	පිට්ඨඞ්කා
ආ	
ආනන්දසොමනස්සා	532
ආනාපානසති	148
ආනිසදං	496, 752
ආභිචෙතසිකානං	30
ආමකධඤ්ඤපටිග්ගහනා	12, 638
ආමකමංසපටිග්ගහනා	12, 638
ආලයරතා	500
ආවට්ටභයං	210, 212
ආවරණීයෙහි	30
ආවෙසනං	416
ආසන්දිපඤ්චමං	310, 312
ආසවක්ඛයඤාණාය	18, 642, 758
ඉ	
ඉඤ්ජිතස්මිං	202
ඉණට්ටා	216
ඉත්තරජච්චා	404
ඉන්ද්‍රියවෙමත්තතං	172, 198
ඉන්ද්‍රියසංවරෙන	14, 638
ඉරියාය	508
ඉස්සත්ථං	704
ඊ	
ඊසාදන්තො	130, 194
ඊසිකං	358
උ	
උක්කංසාවක්කංසං	318
උක්කුටිකප්පධානං	312, 314, 320
උක්කොටන-සාචියොගා	12, 638
උච්ඡින්නමූලා	218, 264
උඤ්ඤෙපකෙ	342
උත්තමපත්තිපත්තං	368, 370
උත්තමෙ ජවෙ	188
උත්තරාරණිං	488, 616, 676, 744
උත්තරිමනුස්සධම්මා	508, 718, 754
උදකඵුසිතකානි	200
උදකමණිකං	28, 392, 600
උදඤ්චනිකො	392
උදයත්ථගාමිනී	566

පිට්ඨඞ්කා

උ

උද්දිස්සකතං 54
උද්ධවිරෙචනං 302
උපධි 198
උපධිසඞ්ඛයෙ 200
උපවිජඤ්ඤා 78
උපසමාය 464
උපහතතා 190
උබ්බට්ටකො 634
උබ්බුල්ලාවා 130, 194
උභතොභාගවිමට්ටං 350, 352
උභතොභාගවිමුත්තො 178, 242

ඌ

ඌමිභයං 210, 212

එ

එකධම්මො 20, 22
එකභත්තිකො 12
එකමංසබලං 68
එකාගාරිකො 8
එකාලොපිකො 8
එකාසනභොජනං 174
එසිකට්ඨායිට්ඨිතා 316, 318
එළණ්ඩකවට්ඨස්ස 616, 676

ඔ

ඔක්ඛායිකා 496
ඔට්ඨපදං 496, 752
ඔදනකුම්මාසූපචයො 350
ඔදරිකත්තස්ස 212
ඔදතවසනා 366
ඔපපාතිකො 22
ඔපාරම්භො 542
ඔරබ්භිකො 126
ඔරම්භාගියානි 164
ඔරමත්තකස්ස 192, 194
ඔලිගල්ලෙ 192
ඔලුග්ගවිලුග්ගං 196, 752
ඔවට්ටිකං 406
ඔවුතො 722
ඔසධිතාරකා 382

පිට්ඨඞ්කා

ක

කටග්ගහො 122
කණ්ටකාවට්ටං 192
කණ්ඩුවනහෙතු 296
කණ්හගක්ඛො 634
කතපරප්පවාද 554
කතිකාය 506
කප්පකො 452, 462
කප්පියං 58
කම්මට්ඨානං 712
කම්මාරගග්ගරියා 492, 748
කරණ්ඩමකා 358
කලායපටිභයන්ති 414
කලායයූසං 496, 752
කලිඞ්ගරෙ 192, 198

කා

කාකාතිදූසිං 196
කාමග්ගසුඛං 400
කාමගුණා 200
කාමසිනෙහො 488
කායදණ්ඩං 60
කායසක්ඛි 242
කාසිකචන්දනං 312

කි

කිංකුසලගවෙසී 484, 742
කිත්තයමානරූපා 458

කු

කුච්ඡිහෙතු 192
කුතුහලසාලා 334
කුම්භිලභයං 210, 212
කුම්මාසං 414
කුලත්ථයූසං 496, 752

කූ

කූටට්ඨා 316, 318
කූලපලුග්ගං 414

කෙ

කෙවලිනො 702
කෙසමස්සුලොචනං 312, 314, 320

පිට්ඨඞ්කා

කො

කොදණ්ඩො 156
කොධූපායාසො 40, 44
කොලාපං 746
කොසකාරන්ති 340
කොසියා 358

ඛ

ඛජ්ජොපණකො 382, 384, 396
ඛටොපිකා 196
ඛත්තො 648
ඛළොපියා 414

ඛී

ඛීණාසවා 4, 708
ඛීරපණ්ණිනො 156

ග

ගන්ධකුටි 416
ගන්ධබ්බො 624
ගලප්පවෙධකෙන 58
ගහනියා 438

ගා

ගාමණ්ඩලරූපො 622
ගාමවරං 462
ගාළ්හපවෙධනෙන 156

ගි

ගිද්ධිලොභො 40, 42
ගිහිසංයොජනං 254

ච

චත්තාරො වණ්ණා 566
චතුත්ථං ඣානං 6, 22, 32, 640, 724, 754
චන්දනිකං 192
චරණසම්බං 34

චා

චාතුම්මහාභූතිකො 310
චාතුයාමසංවරසංවුතො 66
චාතුවණ්ණිසුද්ධි 570, 610

චි

චිත්තුපහාරං 558

පිට්ඨඞ්කා

චු

චුතූපපාතඤාණාය 16, 642, 756
චුල්ලාසීතිමහාකප්පුනො 318

චෙ

චෙතොවිමුත්ති 254, 268, 720
චෙලපත්තිකං 482

ඡ

ඡවො 62, 62
ඡළාභිජාතියො 318

ජ

ජඞ්ඝාවිහාරං 38
ජනකපිතුපිතා 624
ජනකුහනත්ථං 226
ජනපදකල්‍යාණී 380, 394
ජනලපනත්ථං 226
ජනිකාමාතුමාතා 624
ජරුපාරිජුඤ්ඤං 436

ජා

ජාගරියං අනුයුත්තො 30
ජාපෙතා 554
ජාසිතා 196

ජී

ජීසවජා 46

ජී

ජීවෙ 316

ඤා

ඤාණදස්සනං 252, 328, 378, 564
ඤාණවාදං 484, 486
ඤාතිපරිවට්ටං 12, 636
ඤාතිපාරිජුඤ්ඤං 436
ඤායං ධම්මං කුසලං 674, 712

ත

තක්කපරියාහතං 322
තචප්පටිකං 264
තණ්ඩුලපටිභස්තානි 414
තතියං ඣානං 16, 22, 32, 640, 724, 754
තථාගතො 152, 256
තදූපියඤ්ච 416

පිට්ඨඞ්කං

තං

තාලාවත්ථුකතො 56, 264

ති

තිණ්ඩුක්කං 46
තිරච්ඡානකථං 308, 366, 376

තු

තුලනා 662

තෙ

තෙලමක්ඛිතෙන 300, 302

ථං

ථාලිපාකෙ 620

ථෙ

ථෙරවාදං 484, 486

ද්වා

ද්වාසට්ඨන්තරකප්පා 318
ද්වාසට්ඨිපටිපදා 318
ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි 580, 652

ද

දන්තියා 634
දන්තූපක්ඛන්දනං 312
දද්දුලභක්ඛා 634
දබ්බිගාහො 626

දි

දිට්ඨං 54
දිට්ඨධම්මාභිඤ්ඤාවොසාන-
පාරමිප්පත්තා 738
දිට්ඨප්පත්තො 242, 244
දිට්ඨිකන්තාරං 260
දිට්ඨිගතං 260
දිට්ඨිගහනං 260
දිට්ඨිනිජ්ඣානක්ඛන්ති 656
දිට්ඨිවිප්ඵන්දිතං 260
දිට්ඨිවිසූකං 260
දිවාවිකාලභොජනං 190, 192

දී

දීඝපිට්ඨිකො 702

පිට්ඨඞ්කං

දු

දුක්ඛං 18, 642, 758
දුක්ඛනිරොධො 18, 642
දුක්ඛනිරොධගාමිනීපටිපදා 18, 642, 758
දුක්ඛසමුදයො 18, 642
දුක්ඛුද්‍රයං 132
දුක්ඛො 316
දුතියං ඣානං 16, 22, 32, 640, 724, 754
දුප්පරියොගාහො 264

දෙ

දෙවදූතෙ 454

දො

දොණමිතෙ 318, 320

ධ

ධම්මචක්කං 284, 594
ධම්මචෙතියානි 560
ධම්මුද්දෙසො 440
ධම්මධාතු 98
ධම්මන්වයො 552
ධම්මනිජ්ඣානක්ඛන්ති 248, 660
ධම්මසමුදිතො 290
ධම්මාධිකරණං 596
ධම්මානුසාරී 242, 246

න

නග්ගියං 312, 314, 320
නත්ථුකම්මං 302
නන්තකානි 340

නා

නාගාවාසසතෙ 318
නානාබාහාසු 296

නි

නිකතො 302
නිකාමලාභී 30
නිගණ්ඨිගබ්භා 318
නිඝාතං 158
නිච්ඡාතො 6, 10, 630, 632
නිත්ථාරං 182
නිධිමුඛං 26
නිද්දරෙසො 44

පිට්ඨඞ්කා

නි

නිබ්බිදාය 464
නිබ්බුතො 6, 10, 630, 636
නියතිසඞ්ගතිභාවපරිණතා 314, 316
නිරයපාලා 682
නිරුපධි 200
නිරොධාය 464
නිල්ලොපං 474
නිස්සරණපඤ්ඤා 56

නී

නීවරණං 640, 722
නීවාරභක්ඛා 634

නෙ

නෙවසඤ්ඤානාසඤ්ඤායතනං 24, 742

ප

පක්කගත්තා 294, 296
පච්චඤ්ජනං 302
පච්ඡාසමණෙන 520
පඤ්චනීවරණෙ 16
පඤ්චසතං විහාරං 26
පඤ්ඤාවිමුත්තිං 254, 268
පඤ්ඤාවිමුත්තො 242
පටිච්චකම්මං 54
පටිමුක්කො 76
පඨමං ඣානං 16, 22, 32, 640, 724, 754
පණ්ඩිතෙ 312
පණ්ඩුමුටිකස්ස 410
පත්තයානෙ 702
පත්ථණ්ඩිලෙ 622
පතිකිට්ඨතරෙ 384
පථාවිනො 516
පදරසමාචාරෙ 228
පදුමකස්ස 616, 676
පධානවිබ්භන්තො 508
පධානියඞ්ගානි 514, 566
පන්නමූසලො 414
පන්නලොමො 194, 196, 198
පබ්බජ්ජා 12, 636, 740
පබ්බතසඞ්ඛෙපෙ 364

පිට්ඨඞ්කං

ප

පරදවුත්තා 194, 196, 198, 554
පරධම්මාවසාදනා 330
පරන්තපො 6, 10, 18, 630
පරපෙස්සෙන 704
පරමකුසලං 368, 370
පරමසච්චං 660
පරිපොසකං 354
පරියන්තකටෙ 318, 320
පරිබ්බාජෙ 628
පරියාදනං 200
පරිසඞ්කිතං 54
පරිසතිං 716
පරිසෙවිතානි 34
පලිතානි 452, 454
පලුද්ධො 302
පවුටා 318
පළිබාදනෙතා 46

පා

පාතිමොක්ඛසංවරසංවුතො 30
පාරිචරියා 668
පාවචනං 264

පි

පිඤ්ඤාකභක්ඛා 634
පිටකසම්පදාය 322, 654
පිසාචා 192

පු

පුග්ගලවෙමත්තතා 90
පුථුජ්ජනසුඛං 200
පුබ්බෙනිවාසං 16, 640, 708, 756
පුරිසයුගෙ 454, 456

පූ

පූතිලතා 194

පො

පොනොභවිකා 218
පොරෙසෙය්‍යං 48
පොරෙගිච්චන 204

ඵ

ඵන්දිතමත්තා 368

ඵා

ඵාසුලියො 752

පිට්ඨඞ්කා

ඵෙ

ඵෙග්ගු 264

බ්‍යා

බ්‍යාධිපාරිජුඤ්ඤං 436

බ්‍ර

බ්‍රහ්මචරියං 216, 324, 622, 636, 716, 740
බ්‍රහ්මවිහාරෙ 462

බ

බඬුකරොගො 554
බරිහිසත්ථා 636
බලවං බන්ධනං 122

බා

බාලකිනියා 62
බාලෙ 312
බාහං 458
බාහුල්ලාය 508

බි

බිලං 672

බී

බීජගාමභූතගාමසමාරම්භා 12, 638

බු

බුද්ධචක්ඛුනා 504

බෙ

බෙලුවාහාරුපි 340

භ

භගවන්නෙත්තිකා 220
භගවම්පටිසරණා 220
භගවම්මූලකා 220
භබ්බා අභිනිබ්බිදාය 30
භවන්තරූපානං 632

භි

භික්ඛුසඞ්ඝො පටිපාදිතො 2

භූ

භූනහුනො 288

පිට්ඨඞ්කා

භො

භොගපාරිජුඤ්ඤං 436
භොජනෙමත්තඤ්ඤු 30

ම

මඛුරවජ්ජි 156, 196, 757
මණ්ඩලමාලං 600
මණ්ඩලෙ 188
මත්තා 722
මනං 558
මනුස්සකසටෙ 4
මනොදණ්ඩං 60
මනොභාවනීයා 366
මරුවාය 156
මහානාති 8, 634
මහච්චරජානුභාවෙන 436

මා

මාතාපෙත්තිකසම්භවො 356
මාතුමාරි 192
මාරිසා 458, 496

මි

මිගවො 434

මී

මීළ්හසුඛං 200

මු

මුඛසත්තීහි 102
මුඛාධානෙ 186
මුග්ගපටිහඤ්ඤාති 414
මුඤ්ජම්භා 358
මුණ්ඩියං 312, 314, 320
මුත්තාචාරෙ 634

මූ

මූසිකකුක්කුරෙ 414

මෙ

මෙත්තාචෙතොවිමුත්ති 22

මො

මොමූහො 324

යො

යොගක්ඛෙමං 20, 22
යොධාජීවො 708
යොනිපමුඛසතසහස්සානි 318

පිට්ඨඞ්කා

ර

රජකදොණියා 616, 676
රජොජල්ලං 586, 616
රජොධාතුයො 318
රත්තන්ධකාරතිමිසායං 192, 382
රත්තිභොජනා 238
රවසො 188

රා

රාජගුණෙ 188
රාජදූතං 646
රාජවංසෙ 188

රු

රුම්හනියං 248

රූ

රූපසඞ්ඛාවිමුත්තා 264
රූපසම්මුදිතං 290

රො

රොදිතමත්තා 368

ලෙ

ලෙඩ්ඩු 524

ලො

ලොකාමිසූපාදානා 46, 50
ලොකායතමහාපුරිසලක්ඛණෙසු 576, 600, 610, 648

ව

වචීදණ්ඩං 60
වඤ්ඣා 316, 318
වට්ටං 454, 456
වට්ටනාවළී 496, 752
වඵනාලි 546
වනසණ්ඩා 190
වලහිරඵෙන 732

වා

වාකරං 434
වාදසඞ්ඝාටෙන 76
වාදානුවාදං 564
වාලවෙධිරූපෙ 556

වි

විකාලභොජනං 192
විකූජිතමත්තා 368
විඝාතගබ්භං 522
විඝාතපරිළාහා 40, 42
විජ්ජන්තරිකාය 192

පිට්ඨඞ්කා

වි

විජ්ජාය 36
විජනවාතානි 550
විඤ්ඤාණඤ්චායතනං 24, 742
විධෙ 382, 396
විප්පතවජ්ජමානො 294, 296
විප්ඵාලිතාය 524
විපරාමොසං 12
විපරාවත්තං 336
විපෙක්ඛමානො 582
විභජ්ජවාදෙ 714
විමුත්තිසුඛපටිසංවෙදී 524
විරාගාය 464
විවිත්තං සෙනාසනං 14
විවෙකාවත්තා 582
විසඤ්ඤුත්තා 198, 200
විස්සරං 192

වී

වීමංසානුචරිතං 322
වීරඞ්ගරූපා 578

වු

වුත්තසිරෙ 610, 654

වෙ

වෙකණ්ඩං 158
වෙකුරඤ්ජාය 620
වෙස්සී 380, 394

වො

වොභින්දන්තා 556
වොරොපෙතා 524
වොහාරසමුච්ඡෙදං 40, 44, 50

ස

ස්වාගතං 460
සක්කායදිට්ඨි 166
සක්ඛරකඨල්ලං 364
සක්ඛිදිට්ඨා 56
සක්ඛිභබ්බතං 274
සඞ්ඛතියො 192
සඞ්ඛලිඛිතං 420, 636, 740
සඞ්ඝාභෙදකො 460
සච්චානුපත්ති 660, 666
සඤ්ඤාවෙදයිත නිරොධං 106, 204, 350

	පිට්ඨඞ්කා
ස	
සඤ්ඤාසඞ්ඛාවිමුත්තො	264
සඤ්ඤාසමුට්ඨානා	370
සඤ්ඤදීගබ්භා	318
සඤ්ඤුළුහා	82
සඤ්ඤොජනං	204
සණ්ඨස්ස	156
සණ්ඩාසෙන	452
සණ්ඨොවිතං	64
සත්තිමෙ කායා	316
සතිපට්ඨානා	4
සද්ධානුසාරී	242
සද්ධාවිමුත්තො	242
සද්ධෙ	620
සධම්මොක්කංසනා	330
සන්තිවරපදං	484, 742
සන්ථාගාරං	28
සන්ථුතං	704
සන්ධිතං	672
සබ්බවාරිවාරිතො	66
සමණපෙමං	52, 666
සමතික්කමො	202
සමයප්පවාදකා	366
සම්පජානකාරී	14
සමුප්පිතො	754
සම්බොධාය	464
සම්මුච්චා	720
සරසඞ්කප්පා	198, 200
සල්ලකත්තං	156, 294
සවිතං	328
සසක්කං	328
සස්සතො	256, 258
සහිතං තෙ	336
සංයොජනං	40, 42, 704
සා	
සාකභක්ඛා	634
සාවියොගො	12
සාණානි	634
සාති	48
සාමඤ්ඤං	196
සාමාකභක්ඛා	634
සාහුළචීවරෙන	300, 302
සාපානදොණියා	616, 676
සාමුක්කංසිකා	594
සාරත්තරත්තා	632

	පිට්ඨඞ්කං
සි	
සික්ඛාකාමා	192, 194
සික්ඛාසාජීවසමාපන්නො	12
සිඛරෙන	492, 694, 750
සිඞ්ඝාටකං	534
සිප්පිසම්බුකං	364
සී	
සීතිභූතෙන	6, 10, 630
සීලක්ඛන්ධෙන	14, 344, 640
සීහසෙය්‍යං	28
සු	
සුඛදුක්ඛෙ	318, 320
සුඛධම්මානං	190
සුඛපරිහතො	424
සුඛෙ	316
සුඛෙධිතො	424
සුතං	54
සුද්ධී	380, 394
සුතිකන්තන්තිකන්තං	46
සුසුකාභයං	210, 214
සූ	
සූකරදොණියා	616, 676
සූකරිකො	126
සූපෙය්‍යං	192
සෙ	
සෙඛා	4
සෙඛො පාටිපදො	28
සෙම්හාරස්ස	158
සො	
සොණ්ඩිකාකිලඤ්ජං	64
සොත්ථිං සිනාතිං	406, 616
සොත්ති	524
හ	
හටභක්ඛා	634
හතපහතෙ	516
හත්ථකුක්කුච්චං	582
හත්ථත්ථරෙ	436, 542
හත්ථාරුය්හ	510
හත්ථාවලෙඛනො	634
හත්ථිධම්මං	4
හරෙණුකයූසං	496, 752
හි	
හිතාහිතං	4
හෙ	
හෙතුරූපං	568
හෙවං	318, 320

Free Distribution www.aathaapi.org